පරමාර්ථප්‍රදීප

නාම්

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහ

## විස්තර භාවසන්නය.


මාතර මාරඹ විහාරවාසී

දෙහිගස්පේ පියදස්සි මහාස්ථවිරපාදයන්

වහන්සේ හා

නෑදිමාලේ විහාරවාසී

පැපිලියානේ සෝමානන්ද ස්ථවිරයන්

වහන්සේ විසින් ද

ලේඛක දෝෂාපහරණයෙන් සකස්කරණලදී.


---


අත්තිඩියේ මාලිගාවත්තේ විහාරාධිපති

ආචාර්ය්‍ය ආභිධර්ම්මික

වැබොඩ සඞ්ඝරතන මහාස්ථවිරපාදයන්

වහන්සේ විසින්

සංශෝධිතයි.


---


ජී. ඇෆ්ජ්. මුතුසිංහ අප්පුහාමි විසින්

සමයවර්ධන යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

---

බු: ව: 2473.

ක්‍රි: ව: 1931.

මහනුවර

උභයපාර්ශ්වික පුෂ්පාරාම විහාරමහාධිපති

# පහමුණේ ධර්මකීර්ති

# ශ්‍රී සරණංකර සුමඞ්ගලාභිධාන

මහාවිහාර වංශික

ස්‍යාමෝපාලිමහානිකායේ මහානායක

මාහිමියන් වහන්සේ හා

බේරුවල සපුගොඩ විහාරාධිපති

ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාරානන්ද ධර්මවිනයාචාර්ය

# බදුරලියේ ශ්‍රී ධීරානන්දාභිධාන

ස්‍යාමෝපාලිවංශික ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම

මහාසඞ්ඝසභාවෙහි

මහානායක මාහිමියන් වහන්සේ විසින්ද

සමාදරයෙන් පිළිගන්නාලදී.

# විඥාපනය.

## නමො බුද්ධාය.

ශ්‍රී සද්ධර්මරාජන්වූ අප තථාගත බුදුරජාණන්වහන්සේ පෑරුම් බිම්හී මීට සාරාසැකිකප්සුවහසකින් මතු ලොවැ නිදනය. පහළවූ දිවකුරු නම් බුදුන් දවසැ වෙදත්‍රයෙහි පාර ප්‍රාප්තවූ සුමෙධ නම් මහපඬි වැ සත්මුතුපරපුරෙන් ආ සියලු ධනය දන් දී හිමව් පියසට වැද තවුස් වෙස් ගෙණැ පඤ්චාභිඥා-අෂ්ටසමාපත්ති ලාභීව අහසින් වඩිනුයේ දිව කුරු බුදුන් රම්‍යගම් නුවරට වඩනා බැවින් මහජනයා රැස් වැ ඒ සඳහා මග සරසන බැව් දැකැ අහසින් බැසැ බිම්පෙදෙසක් ඉල්වා මඩවගුරු සහිත පෙදෙසක් ලැබැ මග සකස් කරණුයේ ඒ නො නිමිතාක් මහරහතුන් පිරිවරණ ලද බුදුන් වඩනා බව දැකැ මඩ මත්තෙහි සම්කාඩ අතුරා සිය සිරුර හෙයක් කොටැ වතුරුවා හුන්නේ සර්වඥයන් වහන්සේ අනාගතාංශඥානයෙන් බලා වදාරා බුද්ධාංකුරයෙක් බව දැකැ "මේ මහතා අනාගතයෙහි ගෞතම නමින් බුදු වන්නේය"යි යනාදීන් නියත විවරණ ශ්‍රී දෙවා වදාරා දැ සමන් අටමිටකින් පිදූ සේක. තදනන්තර වැ මහරහතුන් ප්‍රමුඛවූ දෙව්බඹුන් විසින් පුදන ලදුවැ බුදුන්වෙතැ පැවිදිවැ අනතව පන් තිවන් සැපත් හැර අනාථ සත්ත්වප්‍රජාව කෙරෙහි පතල මහකුලුණුනැණින් මෙහෙයන ලදුවැ සියලු බුදුකුරැ දම් පිරික්සා කොටැ සසරසයුරට වැද එතැන් පටන් ලෝ පහළවූ කොණ්ඩඤ්ඤ 2. නම් බුදුන් සමයෙහි විජිතාවී නම් සක් විතිරජවැද, සුමඞ්ගල 3. බුදුන් කලැ සුරුචි බ්‍රාහ්මණවැද, සුමන 4. බුදුන් කලැ අතුල නාරද වැද, රෙවත 5. බුදුන් කලැ අතිදෙව බමුණුවැද, සොභිත 6. බුදුන් කලැ අජිත බමුණුවැද අනවමදර්ශී 7. බුදුන් කලැ යක් සෙනෙවි රද වැද, පදුම 8. බුදුන් කලැ අභිඥා ලාභී තවුසෙක් වැද, නාරද 9 බුදුන් කලැ ජටිල තවුස් වැද, පියුමතුරා 10 බුදුන් කලැ ජටිල මහරැටි වැද, සුමෙධ 11. බුදුන් කලැ උතුරු මෙණෙවි වැද, සුජාත 12. බුදුන් කලැ සක්විතිරජ වැද, පියදස්සී 13. බුදුන් කලැ කසුප්මෙණෙවි වැද, අත්ථදස්සී 14. බුදුන් කලැ සුසීම තවුස් වැද, ධම්මදස්සී 15 බුදුන් කලැ සක්දෙව්රජ වැද, සිද්ධත්ථ 16 බුදුන් කලැ මඞ්ගල තාපස වැද, තිස්ස 17 බුදුන් කලැ සුජාත රාජර්ෂිවැද, ඵුස්ස 18. බුදුන් කලැ විජිතාවීරජ වැද, විපස්සී 19 බුදුන් කලැ අතුල නාරද වැද, සිඛී 20. බුදුන් කලැ අරින්දම

රජ වැද, වෙසසභූ 21 බුදුන් කලැ සුදසුන්රද වැද, කකුසඳ 22. බුදුන් කලැ ඛෙමරජ වැද, කොණාගමන 23. බුදුන් කලැ පබ්බත රජ වැද, කසුප් බුදුන් 24 කලැ ජෝපල් මෙණෙවි වැද, ඉපිද ඒ තෙවිසි බුදුවරයන් විෂයෙහිද මහදන් පැවැත්වීම් ආදියෙන් ප්‍රමාණාතික්‍රාන්ත පින්කම් කොටැ “තොප අනාගතයෙහි ගෞතම නමින් බුදු වන්නෙහ”යි යනාදියෙන් මෙසේ සූවිසි නියත විවරණ ශ්‍රී ලැබැ ගණනපථාතික්‍රාන්තජාතිකොටි සත සහශ්‍රයෙහි පුරණලද සමතිස් පෑරුම් මුදුන් පමුණුවා පඤ්චමහා පරිත්‍යාගයෙන් මේ මහපොළොව සතරවසහශ්‍රරුවයෙන්කම්පා කරවා වෙසතුරු අත් බැවින් චුතවැ තුසී පුරයෙහි ඉපිද දස දහසක් සක්වළැ දෙවිබඹුන් විසින් බුදුබව පිණිස සමාරාධිත වූයේ පස්මහබැලුම් බලා දෙව්ලොවින් සැවැ කිඹුල්වත්පුර සුදොදු වුන් මහරජහු නිසා මහාමායාදේවීන් කුසැ පිළිසිඳගෙණැ දස එකඩමසක්හුගේ ඇවැමෙන් මව් කුසින් බිහිවැ අනුක්‍රමයෙන් වැඩී යොවුන්විය පැමිණැ සතළිස් දහසක් දෙවඟනන් වැනි වරඟනන් පිරිවර කොට ඇති යශෝධරා දේවීන් හා සරණබන්ධ නයට පැමිණැ රජසිරි අනුභව කරණුයේ උද්‍යානක්‍රීඩාගමනසම යෙහි කෙමෙන් තුන් පෙර නිමිති දැකැ සඤ්ජාත සංවෙග ඇත්තේ පෙරළා අවුත් පැවිදිරුව දැකැ පැවිද්ද මැනවැ යන සිත උපදවා උයනට ගොස් එහි දහවල් දවස ගතකොටැ මගුල් පොකුණු ඉවුරෙහි හුන්නේ මඟුල් කපුවෙස් ගෙණැ ආ විශ්වකර්ම දෙව් පුත් විසින් සරසන ලද්දේ රහල් කුමරු උපන් හසුන් අසා පුත් සෙනෙහෙ බලවත් බව දැනැ මෙය වැඩෙන්ට මත්තෙන් සිඳිම්හයි සිතා සවස නුවරට එනුයේ කිසාගොතමී විසින් අස්වන ලද නිබ්බුතපදය ඇත්තේ ලක්ෂයක් අගනා මුත්හර ගෙළෙන් ගළවා ඈට සතුටු පඬුරු කොටැ යවා තමාගේ භවනයට වැද සිරියහන් මතැ වැද හොත්තේ මැදුම් රැයැ නිදි ගත් නළඟනන්ගේ විකාර දැකැ කලකිරුණු සිත් ඇත්තේ ඡන්න නම් ඇමතියන් බණවා කන්ථක නම් අසු එළවා ඒ අසුපිට පැන නැගී ඡන්නයන් සහාය කොටැ ගෙණැ දඹුවැට පහන් ගත් දසදහස්ලෝදෑවැසි දෙවියන් පිරිවරා දෙවියන් විසින් ම හරණලද මහදොරින් මහබිනික්මන් කොටැ අනොමා නම් ගඟින් එතරවැ මඟුල්කඩුවෙන් හිසකේ වැටිය කපා අහසට දමා හත්පළහ් වස්ත්‍රාභරණ පොදියක් කොටැ අසුත් සමඟ ඡන්නට පාවාදී නුවරට යවා මහබඹු විසින් පිළිගන්වන ලද අටපිරිකර පිළිගෙණැ පැවිදිවැ අනුක්‍රමයෙන් රජගහනුවරට වැඩැ පිඬු සිඟා පාණ්ඩව පබ්බතච්ඡායාවෙහි වැඩහුන්නේ

බිම්බිසර මහරජු විසින් රාජ්‍යයෙන් නිමන්ත්‍රණය කරණු ලබනුයේ ඒ පිළිකෙව් කොට, බුදුව, පළමුව, ඔහුගේ විජිතයට වඩනා පිණිස දෙනලද ප්‍රතිඥා ඇතිව, සාවුරුද්දක් මහා ප්‍රධන්වීර්‍යය කොට, වෙසක් මස පුණුපොහෝ දවස්හි උදෑසනම සුජාතා නම් සිටුදියණියන් විසින් පිළිගන්වන ලද ක්ෂීරපායාසය වළඳා නෙරඤ්ජරා ගඞ්ගාවෙහි උඩුගං බලා රන්තලිය යවා එම ගංතෙර මහවනලැහැබෙහි දවල් දවස ගෙවා සවස සොත්ථිය නම් බමුණහු විසින් පිළිගන්වන ලද කුසතණ පිළිගෙණ, බෝමැඩට වැඩ, එය අතුට, පැන හැංගාවූ තුදුස්රියන් විදුරසුන් අරා චතුරාඞ්ගවීර්‍යාධිෂ්ඨානයෙන් පළඟ බැඳ, වැඩහිඳ, හිරු අස්තයට යන්ට මත්තෙන් මරයෙන් පිරිවැරූ, දෙවපුත්‍ර මාරබල විධ්වංසනය කොට, පෙරයම, පූර්වේනිවාසානුස්මෘතිඥානයද, මැදුම්යම, ච්‍යුතූපපාතඥානයද, ලැබ, පශ්චිමයාමාවසානයෙහි දශබලචතුර්වෛශාරද්‍යඥානාදී සකල බුද්ධගුණප්‍රතිමණ්ඩිත සර්වඥතාඥානය පිළිවිදීමෙන්ම අබිඳුම්තයසුරව බැස ගත් සේක.

තදනන්තරව, ඒ පළඟින් නොනැගී එතැතින් මා විසින් මේ පළඟ හිඳ, සව්නෙන් ගෙවා දතිමි. එයින් කෘතඥවිය යුතුයි සිතා වදාරා සමවත් සමවදිමින් සතියක් එහිම වැඩසිටිසේක.

තදනන්තරව, "අදත් සිදුහත්කුමරුන්ගේ කිස එතැතින් නොනිමිය-පළඟෙහි ආලය මේතාක් නොහළේවනැයි" දෙවතාවන්ට උපන් විතර්කය දුනවදුරා ඔවුන්ගේ කාංක්ෂා විනොදනය පිණිස අහසට නැගී යමාමහපෙළහර දක්වා එයින් බැස, අනිමිෂලොචනයෙන් බෝදුම්ඳුන් දෙස බලා සතියක් වැඩසිටි සේක.

නැවත පළඟට හා සිටි තැනටද අතර රුවන්සක්මණක් මවා එහි සතියක් සක්මන් කළසේක.

සිව්වන සතියෙහි වයඹදිග, දෙවනිර්මිත රුවන්ගෙහි වැඩහිඳ, ධර්මසම්මශීනය කළසේක.

**අභිධර්මසම්මශීනයෙන් බුදුරැස් නික්මීම.**

එහි වැඩහිඳ, වීජම්පෙළ සම්මශීනය කරණසේක් යම් කාලෙක, මහාප්‍රකරණයට බැස, සූවිසි ප්‍රත්‍යයයෙන් සමන්විතවූ අනන්තනයසමන්ත පට්ඨාන මහාප්‍රකරණය සම්මශීනය කරත් කරත් තථාගතයන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් සත බුදුරැස් නික්මෙන්නට වන්හ.

එහෙත් යටින් පස්පොළොව ජලපොළොව වා පොළොව විනිවිද අජටාකාශය දක්වා වන්හ. උඩින් නෛවසඤ්ඤානාස-

ස්කන්ධායතනයෙන් පැණ ගොස් අජටාකාශයට වන්හ. වටින් අනන්තාප්‍රමාණ ලෝකධාතූන්දැයි මෙසේ දශදිගුන් එකළු කොටැ බැබලූහ.

මේ බුඬරශ්මීන්ගේ පැතිරීමට කාරණ කවර යත්? සූක්ෂම නිපුණවූ අභිධර්මපිටකය සම්මර්ශනය කරණ සර්වඥයන් වහන්සේගේ සෞමනස්සමය ඥාණය කරණකොටගෙණ හෘදයවස්තු-ලෝහිතය ප්‍රසන්නවිය. ප්‍රණීත චිත්තජ රූපයන්ගේ පැතිරයා මෙන් ඡව්වණ්ණීය ප්‍රසන්නාවූයේය. ඒ හෙතුවෙන් චිත්තපච්චය උතුසමුට්ඨාන ෂණ්ණායතනය හාත්පසින් අසූරියන් පමණ පෙදෙසැ නිශ්චලවැ සිටියේය.

**දෙව්ලොව අභිධර්මදෙශනාව**

තථාගතයන් වහන්සේ බුදුවූ සත්වෙනි වසැ තීර්ථකමර්ථනය පිණිස ගණ්ඩ නම් අඹරුකමූල යමාමහපෙළ කර පා තුන්පියවරින් තව්තිසා වැඩැ සක් දෙව්රජහුගේ පඬුඇඹුල්සලස්තෙහි වැඩ හිඳැ දසදහසක් සක්වළින් රැස්වූ දෙව් බඹුන් මැද මාතෘදිව්‍යරාජයා ප්‍රමුඛ කොටැ තෙමසක් මුරැතට අබිදම් දෙසී

**මිනිස් ලොව අබිදම් දෙසීම.**

ධර්මදෙශනා කරණ භාග්‍යවත් තෙමේ උතුරු කුරුදිවයිනට වැඩැ පිඬු සිඟා අනවතප්තවිල සමීපයෙහි වළඳා දිවාවිහාරය පිණිස සඳුන් වනයට වඩනේය. ධර්මසෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ එහි වැඩැ තථාගතයන් වහන්සේට වත් සපයා වැඩසිටි කල්හි ශාරිපුත්‍රය! අද මා විසින් මෙපමණ ධර්මයක් දෙවියන්ට දෙශිතයයි වදාරා තව්තිසා භවනයට වඩනේය.

සැරියුත් මහතෙරුන් වහන්සේ උගත් උගත් ධර්මය තමන් වහන්සේගේ අතවැසි පන්සියයක් භික්ෂූන්ට දෙශනා කළසේක.

මෙසේ අභිධර්මය සැරියුත් මහතෙරුන් වහන්සේගේ පටන් ශිෂ්‍යානු ශිෂ්‍යස්ථවිරපරම්පරාවෙන් වාචොද්ගතවම උපාලිය දාසක සොණක සිග්ගව මොග්ගලීපුත්තතිස්සය යනාදී මහ රහත්පරපුර දක්වා ත්‍රිවිධ සංගායනාරූඪව සුපරිසුඬවැ දඹදිවැ පැවැත්තේය.

**දඹදිවින් ලක්දිවට අභිධර්මය උදාවීම**

තවද බුදුන් පිරිනිවී දෙසියසතිස් වනවසැ ලක්දිවැ රජ පැමිණි දෙවන පෑතිස් මහරජු දවසැ සිංහලයෑ බුදුසසුන් පිහිටුවා වදාළ දම්සෝ මහරජාණන්පිත් මහමිහිඳු මහ රහතන්වහන්සේගේ පටන් ඉට්ටිය මහා

ස්ථවිරාදී*ථෙරපරපුරෙන් මුඛපාලි වශයෙන් ලක්දිවැ පැවත ආ ත්‍රිපිටකධර්මය සිරිලකැ රජ පැමිණි වළගම් අබා මහරජු දවසැ එක්තරා ජනපදාධිපතියෙකුගේ ආරක්ෂාවෙන් පන් සියයක් මහරහතුන් වහන්සේ මාතුල දනව්වෙහි අළුලෙණැ වැඩහිඳැ සඞ්ගායනා කොටැ පුස්තකාරූඪ කරවී.

ලක්දිවැ මහාමහින්දස්ථවිරයන් වහන්සේ ආදී මහරහතුන් විසින් ප්‍රතිෂ්ඨාපිත මහාවිහාරාභ්‍යාගත ලඞ්කාද්වීපදක්ෂිණ ජම්බුද්වීපවාසී මහාස්ථවිරපරම්පරාව විසින් මෙසේ නොයෙක් අභිධර්මඅට්ඨකථා ටීකානුටීකා ප්‍රකරණ ග්‍රන්ථිපද අර්ථ ව්‍යාඛ්‍යානා දිය උපදවා මේ අභිධර්මපිටකය ගෙණෙන ලදැයි දතයුතු.

මෙසේ ලක්දිවැ ඇදුරු පරපුරෙන් පැවත ආ වාචනාමාර්ග සහිත අභිධර්මපිටකය ඇතුළු පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති ශාසනද්වය ලක්දිවින් දඹදිවට නැවත සංක්‍රමණය කළ පරිදි සැකෙවින් මතු දක්වමි:—

**ලක්දිවින් දඹදිවට අභිධර්මය ගෙණයාම.**

බුරුමරට අරිමද්දන නුවර උත්තරජීව මහතෙරුන් වහන්සේ බොහෝ භික්ෂූන් හා ඡපදසාමණේරයන් ද කැටුව චෛත්‍යය වඳිනු පිණිස ලක්දිව් බැසැ වන්දනාදී කිස නිමවා සියරට වනිනු වෝ ජයවර්ධනපුරැ ශ්‍රී සඞ්ඝබෝධි විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂාපරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ මාහිමිපාණන් වහන්සේට අත වැසි ඡපද හෙරණුන් භාරකොටැ බුරුමරට වැඩියෝය.

ඉක්බිති ඡපදසාමණේරයන් වහන්සේ විජයබාපිරුවෙන්හි වැසැ ත්‍රිපිටකධර තොටගමුවේ ශ්‍රී රාහුල සඞ්ඝරාජ මාහිමිපාණන් වෙතින් අටුවා ටීකා සහිත පිටකත්‍රය හා සියලු ථෙරවාදයන් මොනවට ඉගෙණැ තත්කාලශාසනානුශාසක ත්‍රිපිටකධර විදාගම මෛත්‍රෙය මහාස්ථවිරයන් වහන්සේ ද ඇසුරු කොටැ ව්‍යක්තබහුශ්‍රැත වූයේ කල්‍යාණීනදී උදකුක්ෂෙපසීමාවෙහි උපසම්පදාව ලැබැ දසවස් පිරුණේ ථෙරසම්මුතියෙන් ''සද්ධම්මවර ජොතිපාල'' යන උපාධිය ලැබැ "සඞ්ඛේපවණ්ණනා" නම් අභි

---

* ඉට්ටිය උත්තිය සම්බල භද්‍රසාල අරිට්ඨ තිස්සදත්ත කාළ සුමන දීඝනාම දීඝසුමන ii කාළසුමන මහානාග බුද්ධරක්ඛිත තිස්ස දෙව සුමන චූලනාග ධම්මපාලිත ඛෙම උපතිස්ස ඵුස්සදෙව ii සුමන පුප්ඵනාම මහාසීව ii උපාලි ii මහානාග අභය ii තිස්ස ii ඵුස්සනාම චූලාභය iii තිස්ස චූලදෙව සීවස්ථවිර.

ධර්මාර්ථසංග්‍රහ ටීකාව රචනා කොට ග්‍රන්ථ කර්තෘත්වයට පැමිණ අරිමද්දන නගරයට පෙරළා යනු කැමතිව තාම්‍රලිත්තපටුනැ ඉඳද ලක්දිව මහාවිහාරයෙහි වැඩුනු සීවලි තෙරුන්ද, කාඤ්චිපුරික ආනන්ද තෙරුන්ද, සීහලික රාහුල තෙරුන්ද යන මේ ත්‍රිපිටකධර සිව් මහතෙරුන් සමග නැව්නැගී ක්‍රමයෙන් අරිමද්දන නුවරට සම්ප්‍රාප්ත වූවෝය.

මෙසේ ඡපදාචාර්යාදී ත්‍රිපිටකධර මහතෙරුන් පස්දෙනා වහන්සේ විසින් ලක්දිව පැවති මහීන්ද්‍රවංශාගතත්‍රිපිටකවාචනාමාර්ගය හා පාළ්‍යර්ථකථා-ටීකානුටීකා-ප්‍රකරණාදිය දඹදිවට ගෙණගිය නියා දතයුතු.

**ලක්දිව නෂ්ටප්‍රාය අභිධර්ම දඹදිවින් ගෙනවුත් ව්‍යාප්තකිරීම**

තවද බුදුවසින් දෙදහස් එක්සිය පන්තිස් වැන්නෙහි යට පිතෘඝාතක සීතාවක රාජසිංහ රජුගේ ශාසන විලෝපයෙන් ලක්දිව දුලබ වූ අභිධර්මය සුලබ කරණු පිණිස ඇම. ධර්මරත්න පඬිතුමාණෝ බුරුම රට ගොස් අටුවා-ටීකා සහිත අභිධර්මපිටකය ඇදුරු පරපුරෙන් මොනවට ඉගෙන ව්‍යක්ත බහුශ්‍රැත වූයේ "බුද්ධශාසන මහාසුරසෙනාපති" යන රාජදත්තඋපාධිධාරීව ලක්දිව් බැස බොහෝ ගිහි පැවිදි ශිෂ්‍යවරයන් ඇතිකරමින් පරමාර්ථ ධර්මයාගේ සංවර්ධනය කරණුවෝ "මූලමහාෂාමිය" මෙම අභිධර්මාර්ථසංග්‍රහසාර්ථව්‍යාඛ්‍යාව හෙළදිව්බසට පෙරළා අධ්‍යාපනය කරවමින් විශුද්ධිමාර්ග සන්නය, පරමාර්ථසුධානිධිය, බුද්ධාගම, ප්‍රත්‍යය සමුත්පාද විභාගය, සත්තවාතපත්ති විනිශ්චය ප්‍රතිසන්ධිදීපනිය, අභිධර්මාර්ථසංග්‍රහප්‍රශ්නෝත්තරය, රූපපරිච්ඡේදය, සීලපරිච්ඡේදය, භාවනාපරිච්ඡේදය ආදී ග්‍රන්ථනිර්මාණයෙන් හා ශෝධනයෙන් ද බොහෝ ශාසනසංග්‍රහ කළෝය.

**පරමාර්ථප්‍රදීප නම් අභිධර්මාර්ථ සංග්‍රහ විස්තර භාවසන්නය.**

අබිදම් සයුරෙන් එතර වන්නවුන්ට කුඩා සවණ් නෞකාවක් වැනි අනුරුද්ධ මහාස්ථවිර ප්‍රණීත අභිධර්මාර්ථසංග්‍රහයෙහි පරිවාර ග්‍රන්ථ රත්නයක් වූ මෙය වනාහි භාවාර්ථව්‍යාඛ්‍යානශෛලියෙන් සම්පාදිත වුවත් සංක්ෂිප්තපදාර්ථව්‍යාඛ්‍යානයකින් හා සප්තප්‍රකරණාගත පාළ්‍යර්ථකථා ටීකා නයින් සමුපලක්ෂිත බැවින් මෙය පරිශීලනයෙහි නියැලියන්ට සාකල්‍යයෙන් ම අවිකලවූ චතුරතර පරමාර්ථධර්මඥානාලෝකයක උදාවීමෙහි ප්‍රදීපායමාන වෙයි.

ශතවර්ෂයක් ප්‍රමාණයෙන් පැරණිවූ මේ ග්‍රන්ථරත්නය කවර කාලෙක කිනම් ආචාර්යවරයෙක් විසින්

**ග්‍රන්ථ කර්තෘ හා නිර්මාණ කාලය.**

ග්‍රථිතදැයි අවිනිශ්චිත යි. එහෙත් ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස් දෙසියහැටකින් මොබ යටකී නොවලා දත් ගන්කරු මහතෙරුන් මෙන් ම ස්වසමයසමයාන්තරයන්හි විශාරද බුද්ධිමත් සම්භාව්‍ය තර පඬිරුවනක් බැව් ග්‍රන්ථවිෂයෙහි නිර්දිෂ්ට ගම්භීරසාරධර්මාර්ථයන්ගෙන් හා උපමාහෙතොදාහරණාදියෙන් මොනාවට හැඟේ.

**ශෝධනය.**

පණ්ඩිතාචාර්ය්‍ය ඇම්. ධර්මරත්න ලක්මිණිපහන් කතුතුමාණන්ගේ අධ්‍යාපනාවසරයෙහි දී ලිඛිත පිටපත් කීපයක් ස්වල්ප දෙනෙක් අතර ගුප්තව තිබී මෙන මහජනයාගේ ධර්මාවබෝධයට බාධා බැවින් මෙය මුද්‍රණයෙන් ප්‍රකට් කරනු සඳහා සංශෝධනය කළ නොහැක්මැනවැයි බොහෝ ගිහි පැවිදි භවතුන් විසින් සමාරාධිතවූ අපි චිරාගත ලේඛකාදීන් දූෂ්‍ය දෝෂාපහරණයෙන් හුදු ශාසනාලය පෙරදූරිව සංශෝධනය කොළෙමු.

**ප්‍රමාණසහා ප්‍රමුඛාර්ථ.**

පරිසිඳීම් නවයකින් පරිමිත වූ මෙහි 1-වැන්නෙන් චිත්තොත්පාද ක්‍රමය ද, 2-චෛතසිකොත්පාද ක්‍රමය ද, 3-චිත්ත චෛතසිකයන්ගේ ම වේදනාදී භෙදභින්න වූ මිශ්‍රක ක්‍රමය ද, 4-පස්දොර හා මූනිදොර පැවති චිත්තවීථික්‍රමය ද; 5-භූමි-ප්‍රතිසන්ධි-කර්ම-මරණ යන සිව්චතුෂ්කයන්ගේ විභජනය ද, 6-රූපය හා නිර්වාණයාගේ විභාගය ද, 7-චිත්ත-චෛතසික-නිෂ්පන්නරූප-නිර්වාණ වශයෙන් දෙසැත්තැවක් ප්‍රභේද වූ ස්වභාව ධර්මයන්ගේ අකුශල-මිශ්‍රක-බොධිපාක්ෂික-සර්වසංග්‍රහ යන සිව් පරිද්දකින් බෙදීම ද, 8-ප්‍රත්‍යය-ප්‍රත්‍යයොත්පන්න නාමරූප ධර්මයන්ගේ ප්‍රතීත්‍යසමුත්පාද න්‍යාය-ප්‍රස්ථානන්‍යාය වශයෙන් ප්‍රත්‍යයාකාරය දක්වීම ද, 9-සමථවිදර්ශනාකර්මස්ථාන භාවනාවන්ගේ විභජනය ද, ප්‍රකාශ වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ.**

තවද මෙම ව්‍යාඛ්‍යානය සම්බන්ධයෙන් ආශ්‍රිතවූ ග්‍රන්ථයෝ නම්:- ධර්මසඞ්ගණී ප්‍රකරණය, 2-විභඞ්ග ප්‍රකරණය, 3-මධ්‍යම නිකාය, 4-යමකප්‍රකරණය, 5-විභාවනිය, 6-අභිධර්මාවතාරය, 7-සුචිත්තාලඞ්කාරය, 8-දීඝනිකාය, 9-ප්‍රතිසම්භිදාව, 10-නිර්දේශය, 11-අත්ථසාලිනිය, 12-විශුද්ධිමාර්ගය, 13-සත්‍යසංක්ෂෙපය, 14-නාමරූපපරිච්ඡේදය, 15=සංක්ෂෙපවර්ණනාව, 16-මූලටීකාව, 17-මණිසාරමඤ්ජූසාව, 18=අභිධර්මාර්ථවිකාශනිය, 19-අභිධර්මඅනුටීකාව, 20-ප්‍රස්ථානප්‍රකරණය, 21-විශුද්ධිමාර්ගටීකාව, 22-පරමාර්ථවිනිශ්චය, 23-ධාතුකථාප්‍රකරණය, 24-සමන්තපාසාදිකාව යනාදීහු වෙත්.

ලිහිල් බසින් රචිතවූ මෙය සමුද්‍රග්‍රහණයෙන් සාමාන්‍යයෙන් පරමාර්ථධර්මාභිලාෂී සකල බෞද්ධ මහජනයාට සවස

**ප්‍රයෝජනය.** මෙය විෂයෙහි පවත්නා තත්ත්වඥානාභිවෘද්ධිය පිණිසද, විශේෂයෙන් ධර්මකථිකයන්වහන්සේලාට සතරපරමාර්ථ ධර්මයෙහි මනාපටුත්වයක් ඇතිකර ගැනීමට හා ඥප්තිප්‍රකරණය පිළිබඳ ප්‍රාමාණික දැනීමකටත් ආභිධර්මික සම්මුතියට බැසගැනීමටත් අතිශයෝපකාර බැවි අතිශයෝක්තියක් නොවේ.

මේ සද්ව්‍යාපාරයෙහි ලා බෙල්ලන්විල ශ්‍රී මහාබෝධි සමීපවිහාරාධිපතිව වැඩවිසූ ශ්‍රී කල්‍යාණීසාමග්‍රී

**ආචාර්‍ය්‍යානුස්මරණය.** ධර්ම මහාසඞ්ඝසභාවෙහි ගණාචාර්‍ය්‍යවූ අස්මදාචාර්‍ය්‍ය ගෞරවණීය උඩුගම්පල ධම්මක්ඛන්ධාභිධාන මාහිමියන් වහන්සේද, රත්මලානේ පරමධම්මචේතිය පරිවෙණාධිපතිව වැඩවිසූ ආචාර්‍ය්‍ය ගෞරවණීය වලානේ ශ්‍රී ධර්මානන්දාභිධාන නායක මාහිමියන් වහන්සේද බුද්ධශාසනමහාසුර සෙනාපති ආභිධර්මිකාචාර්‍ය්‍ය පණ්ඩිතශිරෝමණී ඇම්. ධර්මරතන ලක්මිණී පහන් සතු තුමාණන්ද, පුණ්‍යානුමෝදනා පූර්වකව අනුස්මරණය කෙරෙමින් කෘතඥ වෙමු.

අපගේ මේ කෘතිය සම්බන්ධයෙන් නැදිමාලේ විහාරාධිපති ගරු නාවල ධම්මානන්ද මහාස්ථවිරයන්

**උපකාරානුස්මරණය.** වහන්සේගෙන් තදධීන කෘත්‍යසම්පාදන-සංවිධානාදී බොහෝ ආධාර ලැබුනුබවත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

කාලාන්තරයක් නිසරුවූ මසුරුපටලෙන් වැසී තුබූ ඒ මේග්‍රන්ථය පරමාර්ථ ධර්මාභිලාෂී ගිහි පැවිදි සියල්ලන්ගේ

**ඉෂ්ටාශංසනය.** චිත්තාරාධනය කෙරෙමින් නොමසුරුවූ භාවිතයට භාජනව ලෝසසුන් චිරකලක් වැඩීමෙහි සමත් වේවා යනු අපගේ ඉෂ්ටාශංසනයයි.

අසමත්හුගේ මේ ශෝධනය සර්වතෝභද්‍රයයි අපි නොකියමු. කෘතීන් පිළිබඳ සර්වතෝභද්‍රභාවය බුද්ධවරයන්ටම ආවේණිකවූවකි සියලු පුහුදුන් වරදිනසුල්ලන් බැවි තත්ත්වඥයන්ගේ නිගමනයයි. ඉදින් මෙහි අපගේ ප්‍රමාදාදියෙන් ජනිත අශුද්ධ ස්ථානයක් දුටහොත් ලෝසසුන් වැඩ කැමති සුධීහු සමාධිව අප වෙත දන්වත්වා. එය මතු මුද්‍රණවාරයේදී ඇතුලත් කරන්නෙමු.

වෑබොඩ සඞ්ඝරතන ස්ථවිර.

W. Sangaratana.

ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස්සාරසිය නෙසැත්තෑ
වැන්නෙහි දුරුතුමස පුරපසළොස්වක්
ලත් සඳුදින අත්තිඩියේ මාලිගාවත්තේ
විහාරස්ථානයේදීය.

# සූචි පත්‍රය.

## (1) වෙනි පරිච්ඡේදය.


| | | | පිට |
|---|---|---|---|
| ප්‍රාරම්භ ගාථා | | වර්ණනා | 1 |
| උද්දෙස ගාථා | | " | 5 |
| අකුශල චිත්ත | | " | 12 |
| අහෙතුක චිත්ත | | " | 22 |
| කාමාවචර කුශල චිත්ත | | " | 34 |
| රූපාවචර චිත්ත | | " | 41 |
| අරූපාවචර චිත්ත | | " | 53 |
| අෂ්ටඅභිභායතන | | " | 64 |
| අෂ්ටවිමොක්ෂ | | " | 71 |
| ලොකොත්තර චිත්ත | | " | 78 |
| ශුෂ්කවිදර්ශක පුද්ගල | | " | 91 |
| සමථයානික පුද්ගල | | " | 94 |


## (2) වෙනි පරිච්ඡේදය.


| | | | |
|---|---|---|---|
| සර්වචිත්ත සාධාරණ චෛතසික | | වර්ණනා | 100 |
| ප්‍රකීර්ණක | " | " | 110 |
| අකුශල | " | " | 119 |
| ශොභන සාධාරණ | " | " | 126 |
| විරති | " | " | 134 |
| අප්‍රමාණ්‍ය | " | " | 142 |
| ප්‍රඥා | " | " | 144 |
| චිත්ත චෛතසිකයන්ගේ සම්ප්‍රයොග ක්‍රමය | | | 149 |
| අකුශල චිත්තොත්පත්ති | | " | 157 |
| අහෙතුක චිත්ත විභාගය | | | 163 |
| අන්ධපංගුන්‍යාය | | | 166 |
| කාමාවචර කුශල විපාක ක්‍රියා විභාගය | | | 168 |
| රූපාවචර කුශල | | " | 175 |
| අරූපාවචර | | " | 182 |
| ලොකොත්තර චිත්ත | | " | 185 |
| ලෞකික ලොකොත්තරවිරතීන්ගේ වෙනස | | | 207 |
| අප්‍රමාණ්‍ය චෛතසිකයන්හි මත භෙද | | | 210 |
| මහද්ගත චිත්තයෙහි සඞ්ග්‍රහනය | | | 212 |
| මහාකුශල | " | | 221 |
| කාමාවචර ක්‍රියා | " | | " |
| කාමාවචර මහාවිපාක | " | | " |
| අකුශල | " | | 223 |
| අහෙතුක ක්‍රියා විපාක | " | | " |

## (3) වෙනි පරිච්ඡේදය.


| | | | පිට |
|---|---|---|---|
| වේදනා | සඞ්ග්‍රහ | විභාගය | 226 |
| හේතු | " | " | 230 |
| කෘත්‍ය | " | " | 237 |
| ද්වාර | " | " | 242 |
| ආරම්මණ | " | " | 248 |
| වස්තු | " | " | 256 |


## (4) වෙනි පරිච්ඡේදය.


| | |
|---|---|
| පඤ්චද්වාරයෙහි වීථි චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය | 263 |
| පරිත්තජවනවාරය | 275 |
| මනොද්වාරයෙහි වීථි චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය | 279 |
| තදාලම්බන නියමය | 282 |
| ජවන නියමය | 288 |
| භූමිවිභාගය | 296 |


## (5) වෙනි පරිච්ඡේදය.


| | | |
|---|---|---|
| භූමි චතුෂ්කය | | 300 |
| ප්‍රතිසන්ධි | " | 329 |
| කර්ම | " | 337 |
| ච්‍යුතිප්‍රතිසන්ධි ක්‍රමය | | 367 |


## (6) වෙනි පරිච්ඡේදය.


| | |
|---|---|
| රූපසමුද්දේශය | 390 |
| රූපවිභාගය | 398 |
| රූපසමුට්ඨාන ක්‍රමය | 400 |
| කලාපයොජනා | 407 |
| රූපප්‍රවෘත්තික්‍රමය | 409 |
| නිර්වාණවර්ණනා | 413 |


## (7) වෙනි පරිච්ඡේදය.


| | | |
|---|---|---|
| අකුශල | සංග්‍රහය | 417 |
| මිශ්‍රක | " | 425 |
| බොධිපාක්ෂික | " | 445 |
| සර්ව | " | 453 |


## (8) වෙනි පරිච්ඡේදය.


| | | |
|---|---|---|
| ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමය | | 464 |
| ප්‍රස්ථාන | " | 501 |


## (9) වෙනි පරිච්ඡේදය.


| | | |
|---|---|---|
| සමථකර්මස්ථාන | සංග්‍රහය. | 514 |
| විදර්ශනා | " | 531 |

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අසුද්ධ | සුද්ධ |
|---|---|---|---|
| 2 | 10 | තථාගතෙහි | තථාගතෙන |
| 6 | 3 | බජ්ඣාදිවසෙන | බජ්ඣාදිවසෙන ච |
| 7 | 4 | ලොභසහගතවෙයි. | ලොභසහගත වෙත්. |
| 17 | 33 | චිත්තයෝ | චිත්තයන් |
| 18 | 5 | ශොදනලද්දේයයි | ශොදනලද්දේයි. |
| 19 | 8 | යනුවෙ | යනුවෙන් |
| 20 | 15 | නොපවත්නාහෙයින් | පවත්නාහෙයින් |
| ,, | 25 | යෙදෙත් | යෙදේ. |
| 23 | 4 | ව්‍යභිචාරෙ | ව්‍යභිචාරෙ ච |
| ,, | 23 | සත්වයෝම | සත්වයන් |
| 25 | 17 | චිත්තවිපල්ලාස වශයෙන් | චිත්තවිපල්ලාසාදී වශයෙන් |
| 28 | 19 | සඛාරයෙහි | ෂඩ්වාරයෙහි |
| 32 | 10 | එකුන්සැටක් හෝ | එකුන්සැටක් හෝ; අථ, නැවත; එකූනනවුතිවා, එකුන්අනූවක් හෝ; |
| 41 | 8 | නවානුපූර්විහාර සමාපත්තියයි කියති | ‘නවානුපූර්විහාර සමාපත්තිය”යි ද චතුෂ්කනයින් අෂ්ට සමාපත්තිය හා නිරොධ සමාපත්තියද නවානුපූර්විහාර සමාපත්තිය යි කියති. |
| 41 | 11 | වදුරණලද්දේයි | වදුරණලදහ. |
| ,, | 13 | දෙශනකාරණලද්දේයි | දෙශනානාරණලදහ. |
| ,, | 14 | සුඛෙඛකාග්‍රතා | උපෙක්ෂාඑකාග්‍රතා |
| 52 | 37 | තෙල | තෙල් |
| 54 | 27 | සත්වයෝචුමූ | සත්වයන් |
| 55 | 27 | නිත්තිකාය | නිකානත්තිය |
| 56 | 37 | මාවිසිබනලද්දාවූ | මාවිසින් ලබනලද්දාවූ |
| 59 | 24 | නොකට හැක්කේය. | නොකට හැක්කෝය. |
| 66 | 15 | නිමිත්තාලම්බණයෝ | නිමිත්තාලම්බණයන් |
| 67 | 14 | ධ්‍යානයෝත් | ධ්‍යානයනුත් |
| 72 | 5 | සත සතරවණී | සතරවණී |
| 112 | 36 | චිතකීයට අපීණායයි නොකියති. | චිතකීයට අපීණායයි කියති. |
| 121 | 30 | කටුලුකරති | කටුලුකරණ ලද්දේද වෙත්. |
| 123 | 31 | මාවිසින් | මම |
| 131 | 36 | කැඞීම | කැලඹීම |
| 133 | 15 | ශුඩකිරීමට | සිඩකිරීමට |

| පිට | පෙළ | අසුඩ | සුඩ |
| --- | --- | --- | --- |
| 144 | 8 | වඝඟයෙහි | වසඟයෙහි පැවැත්වීම |
| 151 | 22 | නවයක් | සතක් |
| 152 | 18 | මනොචාරාවජීත | පචචාරාවජීත |
| 156 | 3 | නියාවෙන්සොළොස් | නියාවෙන් පසළොස් |
| 161 | 14 | සඳාලම්බණ | ෂඩාලම්බණ |
| ,, | 19 | අනන්තාපරිමාණවෙයි | අනන්තාපරිමාණ වෙත්. |
| 164 | 24 | ක්ෂුද්‍රාෂ්ට | ශුඩාෂ්ටක |
| 170 | 22 | සියක්අවිරුද්දක් | අසූඅවුරුද්දක් |
| ,, | 24 | මහාලොකොත්තර | ලොකොත්තර |
| 181 | 5 | ලද්දේයි | ලද්දාහුය. |
| 182 | 11 | දතයුතුයි | දතයුත්තාහුය. |
| 186 | 21 | නොලැබෙත්තේයයි | නොලැබෙත්යයි |
| 187 | 4 | නොලැබෙත්තේමැයි | එකවිට නොලැබෙත්මැයි. |
| 207 | 8 | බබන | සබබන |
| ,, | 26 | අජීයෝ | අජීයත් |
| 224 | 13 | තෙපසැදෑ | තෙපසැදෑස |
| ,, | 17 | හෙය | හෙදය |
| 226 | 29 | එවැදෑරුම් | එක් වැදෑරුම් |
| 232 | 14 | කුසලාකුසල | කුසල |
| 237 | ,, | ජලශ්‍රොතය මෙන්ද | ජලශ්‍රොතසය මෙන්ද |
| 257 | 6 | සත්වයන් | සත්වයන් විසින් |
| ,, | 10 | නොවන්නාහුදයත්? | නොවේදයත්? |
| 260 | 16 | වැටහෙන්නාවූ | ප්‍රකටව වැටහෙන්නා වූ |
| ,, | 17 | නොවැටහෙන්නාවූ | ප්‍රකටව නොවැටහෙන්නා වූ |
| 262 | 31 | මොසවාය | මොසවාරය |
| 263 | 28 | කියතලදී | කියන ලදහු. |
| 264 | 31 | එක එකක්ෂණයකට | උත්පාදභඞ්ගක්ෂණ දෙකකට |
| 274 | 12 | අභිභූතාලම්බණ නම්වෙයි. | අභිභූතාලම්බණ නම් වෙත්. |
| 279 | 1 | පෙකඛානව | සෙකඛානව |
| 289 | 8 | උපදනාහු වෙත් | උපදනේ වෙයි. |
| 294 | 27 | වෙදිතබ්බා | වෙදිතබ්බං |
| 296 | 31 | විශුක්තවූ | යුක්ත වූ |
| 304 | 34 | මහාශ්‍රාවකාතුමූදිහු | මහාශ්‍රාවකාදීහු තුමූ |
| 362 | 25 | අභිමුඛීතභූං | අභිමුඛීභූතං |
| 264 | 29 | පචචාරගහිතං | ජවාරගහිතං |

අක්ෂර යොජකයන්ගේ වර්ණවිපර්‍ය්‍යාස ඌනාධික-භ්‍රමාදී තවත් බොහෝ ප්‍රමාද දොෂ ඇතත් එය ප්‍රාඥයන්ට සුබොධ බැවින් මෙහි සඳහන් නොකෙළෙමු.

# ප්‍රාරම්භ ගාථාවෙහි

## (භා ව ය.)

---

සුපරිසුද්ධබුද්ධි ගොචර පරමවිචිත්‍රපිටකත්‍රය සහිත සකල ශාස්ත්‍රපාරාවාර දර්ශී සුප්‍රසිද්ධාචාර්ය්‍ය **අනුරුද්ධමහාස්ථවිරපාද යාණෝ** ආශීර්නමස්ක්‍රියා වස්තුනිර්දේශ මුඛත්‍රය අතුරෙන් නමස්ක්‍රියාමුඛයෙන් ග්‍රන්ථාරම්භය කටැවිව ඉෂ්ටදේවතානුස්මරණ මඞ්ගලාචරණය සදචාරානුරක්ෂණයටද, විශෙෂයෙන් අභීෂ්ට ග්‍රන්ථයාගේ විඝ්නවිරහයෙන් පරිසමාප්තියටද, හෙතුයයි විශිෂ්ට ඉෂ්ටදෙවතා සංඛ්‍යාත රත්නත්‍රයප්‍රණාමය i පූර්වකොට ඇති අභිධෙය්‍ය ii කරණප්‍රකාර iii ප්‍රකරණාභිධාන iv ප්‍රයොජන v යන අර්ථපඤ්චකය දක්වනුවෝ "සම්මාසම්බුද්ධමතුලං" යනාදී ප්‍රාරම්භ ගාථාව වදාළෝ.

"සම්මාසම්බුද්ධමතුලං සසද්ධම්මගණුත්තමං අභිවාදිය" යන පාඨයෙන් රත්නත්‍රයප්‍රණාමයද, "අභිධම්මත්ථ සඞ්ගහං" යන පාඨයෙන් ග්‍රන්ථාර්ථයද, කරණප්‍රකාරයද, ප්‍රකරණාභිධානයද, ප්‍රයොජනයද, යන අර්ථචතුෂ්කය දර්ශිතය.

"තස්සං පටිපාදෙතබ්බ භාවදස්සනතො ච" යනු විභාවනී ටීකා හෙයින් අභිධර්මාර්ථයන් ප්‍රතිපාදනය කටයුතු බව දැක්වීමෙන් අභිධෙයාර්ථය දර්ශිතය. වාග්භෙද ශබ්දයාගේද අර්ථ වශයෙන් අවිනාභාවය ඇති හෙයින් අභිධෙය්‍ය නම්වූ සතර පරමාර්ථ ඇති ග්‍රන්ථාර්ථයද "දස්සත" ශබ්දයෙන් වාච්‍යවේ.

"එකත්ථ සඞ්ගයහ කථනාකාරදීපනතො ච" යනු ටීකා හෙයින් අභිධර්මසප්තප්‍රකරණයෙහි විස්තරයෙන් දෙශිතවූ සතර අභිධර්මාර්ථයන් සැකෙවින් මෙහි දක්වන ලද හෙයින් කරණ ප්‍රකාරය වනාහි "සඞ්ගහ" ශබ්දයෙන් වාච්‍යවේ.

"අත්ථානුගතසමඤ්ඤා පරිදීපනතො ච" යනු ටීකා හෙයින් "අභිධම්මත්ථා සඞ්ගය්හන්ති එත්ථ එතෙනාති වා-අභිධම්මත්ථසඞ්ගහො. තං අභිධම්මත්ථසඞ්ගහං" යන නිර්වචනයට සුදුසුවූ නාමය ප්‍රකාශ කරණ හෙයින් "අභිධම්මත්ථසඞ්ගහං" යන ප්‍රකරණාභිධානය වාච්‍යවෙයි.

ග්‍රන්ථකරණ ප්‍රයොජනය කවර පාඨයකින් කථිතද? යත්: “පයොජනම්පන-පෙ-දස්සිතමෙව” යනු ටීකා හෙයින් ග්‍රන්ථකරණප්‍රයොජනය “සඞ්ගහං” යන පදය කර්‍මකොටගෙණ ශබ්ද ශක්තියෙන් දර්ශිත මැයි. කෙසේද? යත්: සප්තප්‍රකරණයෙහි විස්තරදෙශිත අභිධර්‍මාර්ථයන් එකම අභිධර්‍මාර්ථ නම් ප්‍රකරණයෙහි සංක්‍ෂෙපසංග්‍රහනයක් ඇති කල්හි ඒ අභිධර්‍මාර්ථසංග්‍රහ නම් ප්‍රකරණය උද්ග්‍රහණපෘච්ඡාප්‍රතිපෘච්ඡාදියෙන් ඒ සතර අභිධර්‍මාර්ථයන්ගේ ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානාවබොධයටද, ඒ ලක්‍ෂණාදී අවබොධයෙන් වර්‍තමාන ආත්මභාවයෙහි හටගන්නාවූ අර්ථසංසිද්ධිය නිරායාසයෙන් සිඬවන හෙයින්ද, “සඞ්ගහං” යන පෙදෙන් ප්‍රයොජනය දර්ශිත මැයි.

ඒ ප්‍රයොජනය වනාහි:-මුඛ්‍යප්‍රයොජනය ආනුෂංගික ප්‍රයොජනයයි දෙවැදෑරුම්. ඒ දෙකින් සතර පරමාර්ථාවබොධය මුඛ්‍ය ප්‍රයොජනයවේ. ඒ හෙතුවෙන් ඇති වන දෘෂ්ටධාර්මික-සාම්පරායික අර්ථසංසිද්ධිය ආනුෂංගික ප්‍රයොජනයවේ.

උක්තප්‍රකාර රත්නත්‍රය ප්‍රණාමාදීන් අතුරෙන් ග්‍රන්ථාරම්භයෙහි රත්නත්‍රයට ප්‍රණාමයෙහි ප්‍රයොජනය වනාහි අන්තරාය නිවාරණ ප්‍රයොජනය-විශුද්ධිප්‍රතිවෙධ ප්‍රයොජනය-පණ්ඩිතයන්ගේ ගෞරවභාජනප්‍රයොජනය-රත්නත්‍රය කෙරෙහි ශ්‍රොතෘජනයාගේ ප්‍රසාදජනනප්‍රයොජනය යනාදී නොයෙක් ප්‍රයොජනයන් අතුරෙන් අන්තරායනිවාරණ ප්‍රයොජනය විශෙෂයෙන් අර්ථකථාචාර්‍ය්‍යවරයෝ කැමති වෙති.
එයින් කීහු:-

“ඉච්චෙවමච්චන්තනමස්සනීයං-පෙ-තස්සානුභාවෙන හතන්තරායො” යි ප්‍රණාමචෙතනාසාමර්ථ්‍යයෙන් නසන ලද අන්තරාය ඇතිව යනාර්ථයි.

ප්‍රණාමස්වභාවවූ විඥප්තිරූපය හා ප්‍රණාමචෙතනාව ද යන දෙකින් කවරක් මෙහි ප්‍රණාම නම් වේද? යත්: “රතනත්තයපණාමො, ති-පෙ-කුසලචෙතනා” යනු ටීකා හෙයින් ප්‍රණාම ක්‍රියාව නිපදවන කාමාවචර කුශලචෙතනා තොමෝ රත්නත්‍රය ප්‍රණාම නම් වන්නීය. විඥප්තිවය සමුත්ථාපක චෙතනාව හා මනොචාරික කාමාවචරකුශලචෙතනා තොමෝද ප්‍රණාම නම් වන්නීය. ඒ ප්‍රණාමචෙතනා තොමෝ වන්දනය-වන්දකයන්ගේ

ක්ෂෙත්‍රාධ්‍යාශය සම්පත්තියෙන් ඉහාත්මභාවයෙහි විපාකය දෙන්නීය,

තවද යථාලබ්ධවූ සම්පත්තියට හේතුවූ පුරාණ කර්මවිපාක පරම්පරාවට රුකුල්දීමෙන්ද, ඒ පුරාණ කර්මය විසින් උපදවන ලද විපාකපරම්පරාවට අන්තරායකරවූ උපපීඩක-උපච්ඡෙදකාදී කර්මයන් ප්‍රතිබාහනය කිරීමෙන් යථාභිප්‍රේතවූ ග්‍රන්ථපරිසමාප්තිය සිඳින රෝගාදී අනේකප්‍රකාර අන්තරාය නිවාරණයද සිද්ධකරන්නීය.

ඒ රෝගාදීන්ගේ අප්‍රවෘත්තිය සිද්ධකළහැකි බැවින් ග්‍රන්ථාරම්භයෙහි තුණුරුවන්ට වැඳීම යථාරබ්ධප්‍රකරණය නිරායාසයෙන් සමාප්තකිරීම පිණිසද ආචාර්‍ය්‍ය අනුරුද්ධ මහා ස්වාමිපාදයන් වහන්සේගේ ස්තුති නමස්කාර පූජාඞ්ගමවූ ප්‍රතිපදාවෙන් අන්තරායකර ධර්මයන් නොපැවැත්මෙන්ද ධර්මාභිලාෂීන්ගේ ඉගෙණීම්-දැරීමාදිය සිද්ධකිරීම පිණිසද වෙයි.

අභිධෙය දක්වීම කිමෙක්ද? යත්: "අභිධෙය්‍ය කථනං-පෙ-පටිපජ්ජනබ්භාවතො" යනු ටීකා හෙයින් අභිධෙය කථනය වනාහි විදිතාර්ථග්‍රන්ථය ප්‍රාඥයන් විසින් උද්ග්‍රහණාදියෙන් නැවත නැවත භාවිතයෙන් පිළිපැදිය යුතු හෙයිනි.

කරණප්‍රකාර ප්‍රයෝජනය හා අභිධානකථනප්‍රයෝජනය කෙසේද? යත්: "කරණප්පකාර-පෙ-සුඛත්ථං" යනු විභාවනී ටීකා හෙයින් ග්‍රන්ථකරණපරිදිය ග්‍රන්ථකරණයාගේ ප්‍රයෝජනය යන මොවුන්ගේ දක්වීම ශ්‍රොතෘජනයාගේ මේනවට උත්සාහ දනවීම ප්‍රයෝජනකොට ඇත්තේවේ.

ග්‍රන්ථනාම කථනය වනාහි ව්‍යවහාර කෞශල්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ වෙයි. එසේ අන්තරාය නිවාරණයෙන් ග්‍රන්ථපරිසමාප්තිය ආදී අර්ථයන්ගේ නිෂ්පත්තිය වන හෙයින් රත්නත්‍රය ප්‍රණාමාදී අර්ථපංචකය අනුරුද්ධාචාරීන්වහන්සේ විසින් දර්ශිතයි. මේ "සම්මාසම්බුද්ධ මතුලං" යනාදී වාක්‍යයෙහි පිණ්ඩාර්ථය වෙයි.

එහි "සම්මාසම්බුද්ධ" ශබ්දය විස්තර කෙරෙමි:—බුද්ධ ශබ්දයෙන් වාච්‍යවූ "සුත බුද්ධ-චතුසච්චබුද්ධ" යන්ද, "සම්බුද්ධ ශබ්දයෙන් වාච්‍යවූ ප්‍රත්‍යෙකබුද්ධයන්ද, "සම්මාසම්බුද්ධ" ශබ්දයෙන් වලක්වා සර්වඥබුද්ධ තෙමේම වාච්‍යවේ.

බුදුහු සම්‍යක් සම්බුද්ධ වන පරිදි මෙසේ දක්වත්:–"බුධ" ධාතුහුගේ ඥානාර්ථ වශයෙන්:–ඒ භාග්‍යවත් තෙමේ සංඛත-අසංඛත ප්‍රභේදවූ සියලු ධර්මසමූහයම ලක්ෂණාදී සතත්වාකාර පිළිවිදීමෙන් අවිපරීතකොට තමන්වහන්සේ විසින්ම උපචිත-සමුපචිත පාරමිතා බලයෙන් මෝහවට පහලවූ පරෝපදේශ රහිත සර්වඥතඥානයෙන් තෙමේම අවබෝධ කළසේක්ද එයින් සම්‍යක්සම්බුද්ධයහ. තමන්වහන්සේගේම රුචිවශයෙන් සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්වාණ-ප්‍රඥප්තිසංඛ්‍යාත සකලඥෙය ධර්ම මණ්ඩලය අවබෝධකළ පරිදි "සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං" යන ශ්‍රී මුඛදේශනාපාඨයෙන් ප්‍රකාශවේ.

"බුධ" ධාතුහුගේ ජාගරණාර්ථ වශයෙන්:—"සම්මා සාමඤ්ච සවාසනසම්මෝහනිද්දාය පටිබුද්ධො විගතොති=සම්මාසම්බුද්ධො" යනු විග්‍රහහෙයින් "එකාන්තයෙන් අනිකෙකු විසින් නුපුබුදුවනු ලදුව තෙමේම වාසනා සහිතවූ මෝහනිද්‍රායෙන් අතිශයින් පහවූ හෙයින් සම්‍යක්සම්බුද්ධයහ.

"බුධ" ධාතුහුගේ විකසනාර්ථ වශයෙන්:—"සම්මාසාමඤ්ච බුද්ධො විකසිතොති=සම්මාසම්බුද්ධො" යනු විග්‍රහහෙයින් සූර්යරශ්මිසම්පර්කයෙන් අතිශයින් සිත්කළුවූ ශ්‍රී ශෝභාග්‍යයට පැමිණීමෙන් පද්මයක් ප්‍රබෝධවූවාක් මෙන් අභිත්මාහිඥාතාය හා එක්වීමෙන් ප්‍රමාණාතික්‍රාන්තවූ ගුණ සමූහයෙන් සමලඞ්කෘතවූ සර්වඥතාඥාන යට පැමිණීමෙන් මනාකොට තෙමේම ප්‍රබෝධවූ සේක්ද ප්‍රබෝධයට පැමිණ වදාළසේක්ද එයින් සම්‍යක්සම්බුද්ධයහ.

සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට විශේෂ ගුණයකින් ස්තුති කරණු කැමති අනුරුද්ධාචාරීන් වහන්සේ විසින් "අතුලං" යන ප්‍රයෝෂණය කරණලදී. යම් පුද්ගලයෙක් තෙම මහත්වූ තරාදිය කට සමානවූ ප්‍රඥාමෙන් කිරණ ලද්දේවේද, නොහොත් යමෙක් තරාදියෙන් කිරණ ලද්දේවේද, එයින් ඒ පුද්ගල තෙමේ තුල නම්වේ. යම් සම්‍යක්සම්බුද්ධයෙක් තෙම යම්කිසි පුද්ගලයෙකු හා සදෘශවූයේ නොවේද එයින් ඒ සම්‍යක්සම්බුද්ධ තෙමේ අතුල නම්වේ.

භාග්‍යවත් තෙමේ දෙවියන් සහිත සර්වලොකයෙහි අසදෘශ උත්තම පුද්ගලයෙක් වෙයි. "යාවතා-පෙ-අසමාසති" යනාදී ශ්‍රී මුඛපාලිය ඊට සාධකයි.

ආදෑ ම්මත් අනුරුඬාචාරීන් වහන්සේ විසින් "සම්මා සම්බුඩ මතුලං" යන දෙපෙදින් හෙතුසම්පද-ඵලසම්පද-සත්වොපකාර සම්පදුවන්ගේ වශයෙන් තුන්ප්‍රකාර ගුණයකින් භාග්‍යවත්හට සතුති කරණලදී.

ඒ ත්‍රිවිධසම්පත්තීන් අතුරෙන් මහාකාරුණාසමාපත්ති යෙහි නැවත නැවත යෙදීමද, සර්වඥතාඥානනිෂ්පත්තියට හෙතු වූ සමත්‍රිංශත් පාරමී ධර්මයන්ගේ සම්පූර්ණ කිරීමද, හෙතුසම්පද නම්වේ. ඵලසම්පද තොමෝ ඥානසම්පද-ප්‍රහාණසම්පද-ආනුභාවසම්පද-රූපකායසම්පදුවන්ගේ වශයෙන් සිව්වැදෑරුම් වන්නීය. ඒ ඵලසම්පද සතරෙන් සර්වඥතාඥානයට ආසන්න කාරණාවූ අභිඥාමාර්ගඥනයද, ඒ අභිඥාමාර්ගඥානයම මුල්කොට ඇති දශබල-චතුවෛශාරද්‍යඥානාදී අනන්තාපරිමාණඥනයෝද, ඥාණසම්පත්ති නම්වේ. කාය-වාග්වාසනා සහිතවූ ක්ලෙශ ධර්මයන් නැවත අතිශයින් නූපදනා සවභාවයට පැමිණවීම් ප්‍රහාණසම්පත්ති නම්වේ. යථාභිමතාර්ථනිෂ්පාදනයෙහි ඊශ්වරභාවය ආනුභාවසම්පත්ති නම්වේ. සියලු සත්වයන්ට නෙත් තෙපුලක් බඳුවූ ද්වාත්‍රිංශත්වරමහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්ද සර්ජිතවූ ආත්මභාවසම්පත්ති තොමෝ රූපකාය සම්පත්ති නම්වේ:

සත්වොපකාරසම්පත්තිය වනාහි උත්තමාධ්‍යාශය උත්තම වීර්‍ය්‍යයයි දෙවැදෑරුම්වේ. ඒ දෙවැදෑරුම් ආශය-ප්‍රයොගයන් අතුරෙන් දෙව්දත් ආදී නිත්‍ය විරොධි ප්‍රතිවිරොධි සත්වයන් කෙරෙහි පවා නිරන්තරයෙන් හිතාධ්‍යාශය ඇතිබවද, නොමුහු කළ ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන් ඇති සත්වයන්ගේ ඉන්ද්‍රියපරිපාකාගමනයද, ආශයසම්පත්ති නම්වේ. ඒ දෙවදත්තාදී ප්‍රතිපක්ෂසත්වයන් කෙරෙන් අන්‍ය සත්ත්වයන්ට ලාභවිශෙෂ පූජා සත්කාරාදියෙහි නිරපෙක්ෂතාව සියලු වෘත්ත දුඃඛනිර්‍ගමනයට හෙතුවූ ධර්මදෙශනා තොමෝ ප්‍රයොගසම්පත්ති නමු.

ඒ ත්‍රිවිධ වූ හෙතු-ඵල-සත්වොපකාරසම්පත්තීන් අතුරෙන් පූර්ව වූ ඥාණ-ප්‍රහාණ යන ඵලසම්පත්තීහු දෙදෙන "සම්මා සම්බුඩං" යන පෙදින් දක්වන ලදහ. මෙහින් අන්‍යවූ ආනුභාව-රූපකායසම්පත්තීහු දෙදෙනද, ඔවුන් කෙරෙන් අන්‍ය වූ සත්වොපකාරසම්පත්තියද, "අතුලං" යන පෙදින් දක්වන ලදහ. ඒ දෙවැදෑරුම් ඵලසම්පද-සත්වොපකාරසම්පදුවන්ට කාරණා වූ

හෙතුසම්පත්තිය වනාහි දෙපෙදින්ම අවිශෙෂතියෙන් දක්වන ලදී.

කුමක්හෙයින් හෙතුසම්පත්තිය දෙපෙදින්ම දක්වනලදද? යත්: එබඳු ස්වභාව ඇති මහාකරුණාසමායොගය- බොධිසම්භාරසම්භරණය යි කියනලද හේතූන්ගේ විරහයෙන් ඒ විප්‍රකාරවූ ඵලසම්පත්ති- සත්ත්වොපකාරසම්පත්තීන්ගේ සම්භවප්‍රසඞ්ගය වන හෙයින් ද දෙපෙදින්ම හෙතුසම්පත් තොමෝ දක්වන ලද්දීය.

“සම්මාසම්බුද්ධමතුලං” යන දෙපෙදෙන් බුද්ධරත්නය ත්‍රිවිධාකාර සම්පත්තියකින් මොනවට සංග්‍රහකොට දැන් ඉතර රත්නයන්ට ද ප්‍රණාමය කරණු කැමති අනුරුද්ධාචාර්‍ය්‍ය මාහිමියෝ “සසද්ධම්මගණුත්තමං” යි කිහු.

අන්‍යවූ ධර්ම සඞ්ඝ රත්නයන්ට ද නමස්කාර කටයුතු බව “සසද්ධම්මගණුත්තම” ශබ්දයෙන් දක්වයි. “සපුත්තදාරො ආගතො”යි ටීකාවෙහි ආ සාධකපාඨයෙන් “පුත්‍රදාර භාර්‍ය්‍යාවන් සමග ආයේය”යි කී තන්හි මෙන් “සසද්ධම්මගණුත්තමං” යන පදයාගේ සහ ශබ්දය හා යෙදීමෙහි ලැබෙන ගුණ-ද්‍රව්‍ය-ක්‍රියා යන ත්‍රිවිධ සමවායයන් අතුරෙන් නමස්කාර කටයුතුබව සමාන හෙයින් ක්‍රියා සමවායයේ ස්වභාව දක්වනලදී.

දැන් වනාහි “සසද්ධම්මගණුත්තමං” යන පදයෙහි ඇතුලත් “ධම්ම” ශබ්දයාගේ වචනාර්ථය දක්වනු කැමති ටීකාචාරීන් විසින් “තාප-පෙ-ධම්මො” යන පාඨය කියනලදී. යම් ස්වභාව ධර්මයක් තෙමේ තමා දරණ සත්ත්වයන් සිව් අපායෙහිද ජාත්‍යාදී ව්‍යසනදුඃඛයෙහිද නො වැටෙන්නවුන් කොට දරන්නේ වේද එයින් ඒ ස්වභාවධර්මතෙමේ “ධම්ම” නම් වේ. ඒ ධර්ම ශබ්දයෙන් සතරමග- සතරඵල- නිර්වාණයන්ගේ වශයෙන් නවප්‍රකාර වූ ධර්මය නොහොත් ත්‍රිපිටකපර්‍ය්‍යාප්තිය සමග දශප්‍රකාර වූ ධර්මය ලැබේ. මෙහි සතර අපායෙහි නොවැටෙන බව සෝවාන්මාර්ගය සඳහාද, ජාත්‍යාදී ව්‍යසන දුක්ඛයෙහි නොවැටෙන බව සතරමාර්ගයන් සඳහාද දක්වනලදී. “ධාරණ කුවපණෙනතස්ස-පෙ-විධංසනං” යනු ටීකා හෙයින් “අපායාදියෙහි ඉපදවිය හැකිවූ කෙලෙසුන්ගේ නැසීම ම ඒ ධර්මයාගේ දැරීමද” වෙයි.

තවද ආර්‍ය්‍ය මාර්ගය හා නිර්වාණය කාරණකොටගෙණ ඒ කෙලෙසුන් අනුත්පාද නිරොධයෙන් නසන හෙයින්ද නිර්වාණය

අරමුණුකිරීමෙන්ද කෙලෙසුන් අනුත්පාද නිරොධයෙන් නැසීමය යි කියනලද අර්ථසිද්ධියට කාරණාවන බැවින්ද ආර්යමාර්ගයට හා නිර්වාණයට මුඛ්‍යවශයෙන් ධර්ම ශබ්දය ලැබේ. සතර ඵලයෙන් ක්ලේශයන් සංසිඳවීම් වශයෙන් මාර්ගයට සුදුසු පරිද්දෙන් පවත්නා හෙයින් ද ත්‍රිපිටකපර්යාප්තිය තදර්ථසිද්ධිහෙතුබවයෙන්ද ඒ ආර්යමාර්ගඵල-නිර්වාණයන්ට පැමිණීමට හෙතුවන බැවින්ද පර්යාප්තිය අමුඛ්‍යවශයෙන් ධර්ම නම් වේ.

මෙසේ ධර්ම "ශබ්දයාගේ වචනාර්ථ දක්වා දැන් වනාහි "සද්ධම්මං" යන පදයෙහි "ස" ශබ්දයාගේ නොහොත් "සත" ශබ්දයාගේ වචනාර්ථ දක්වනු කැමති ටීකාචාර්යයෝ "සතං සප්පුරිසානං-පෙ-සද්ධම්මො" යන පාඨය කීහු

"සතං ධම්මො=සද්ධම්මො"යි විග්‍රහ හෙයින් සාධුසත්පුරුෂවූ බුද්ධාදී ආර්ය පුද්ගලයන්ගේ ධර්මයක් නුයි; නොහොත් "සංවිජ්ජමානො ධම්මො=සද්ධම්මො" යන විග්‍රහ නයින් තීර්ථකයන් විසින් පරිකල්පිතවූ ආත්මයක් මෙන් නොව අවිපරීතාර්ථයෙන් විද්‍යමානවූ ධර්මයක් නුයි; නොහොත් "පසත්ථො ධම්මො=සද්ධම්මො" යන විග්‍රහ නයින් ස්වාක්ඛාතාදී ගුණයෙන් යුක්තබැවින් බුද්ධාදීන් විසින් පසස්නාලද ධර්මයක් නුයි සද්ධර්ම නම් වේ.

මෙසේ සද්ධර්මශබ්දයාගේ වචනාර්ථ දක්වා දැන් වනාහි ගණුත්තම ශබ්දයාගේ වචනාර්ථය දක්වනු කැමති ටීකාචාර්යයෝ "ගණො ච-පෙ-ගණුත්තමො" යන පාඨය කීහු.

"ගණො ච සො උත්තමො චා'ති=ගණුත්තමො" යනු විග්‍රහ හෙයින් අෂ්ටාර්යපුද්ගලයන්ගේ සමුදායවූ හෙයින්ද ඒ සමූහය සුපිළිපන් බැව් ආදී විවිධගුණගණාභිසම්පන්න හෙයින් උතුම් වූයේ වේද එයින් ගණුත්තම නම් වේ. නොහොත් "ගණානං උත්තමො=ගණුත්තමො" යනු විග්‍රහ හෙයින් දිව්‍ය මනුෂ්‍යාදී සමූහයා අතුරෙන් උතුම්වූ හෙයිනුදු නොහොත් "ගණෙසු උත්තමො=ගණුත්තමො" යනු විග්‍රහ හෙයින් දිව්‍ය මනුෂ්‍ය සමූහවූ ගණයන් අතුරෙහි යථොක්ත ගුණසමූහ විද්‍යමානත්වයෙන් උතුම් වේද එයින් ගණුත්තම නම් වේ.

"අභිවාදිය" යන පූර්වක්‍රියාවෙන් දර්ශිතවූ විශෙෂ ප්‍රණාමය නම්:—භය-ලාභ-කුලා'චාරාදී විරහයෙන් අතිශය භක්තියෙන් කායාදී ද්වාරත්‍රයෙන් වැඳ යන අර්ථයි.

"අභිධම්මත්ථසඞ්ගහං" යන්නෙහි විස්තර දක්වමි:- "අභිවිසිට්ඨා ධම්මා එත්ථා'ති අභිධම්මො"යි විග්‍රහ හෙයින් ඒ අභිධර්ම පිටකයෙහි අවිපරීතවූ පරමාර්ථයාගේ ස්වභාවයෙන් අතිශයෙන් විශිෂ්ටවූ ධර්මයතෙම වදාරණලද්දේ වේද, එයින් ඒ පිටකය තෙම අභිධර්ම නම් වේ. ධම්සඟුණු ආදි සප්තප්‍රකරණයයි කියනලද අභිධර්මපිටකය ලැබේ. එහෙයින් අර්ථකථාචාර්ය බුද්ධඝොෂ මාහිමියෝ:—

"ධම්මසඞ්ගණි විභඞ්ගඤ්ච — කථාවත්ථු ච පුග්ගලං,
ධාතුයමකපට්ඨානං — අභිධම්මොති වුච්චති"යි කීහු.

"සඞ්ඛෙපවණ්ණනා" ටීකායෙහි "අභි අතිරෙකො ධම්මො සුත්තවිනයාධිකා පාළී'ති අත්ථො" යනුවෙන් මෙහි "අභි" ශබ්දය අධිකාර්ථ බැවින් "සූත්‍ර විනය දෙකට අධික (උතුම්) වූ පාළිය" අභිධර්මය යි කීහ. නුමුත් අට්ඨසාලිනියෙහි:— "කෙනට්ඨෙන අභිධම්මො? ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙන" යනුවෙන් සූත්‍රාන්තයට මුත් විනයට අධික බවක් අභිධර්මයේ ඇති බව නොකීය යි. එම අර්ථය මූලටීකාවෙහි:—"ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙනා'ති එත්ථ ධම්මො අතිරෙකො=ධම්මාතිරෙකො. සුත්තන්තාධිකා පාළී'ති අත්ථො" යනු කීහ. සමන්තපාසාදිකාවෙහි:—"යතො පණීතතරො වා විසිට්ඨතරො වා නත්ථි" යනුවෙන් "විනයට වඩා විශිෂ්ට ධර්මයක් නැති" බව කීබැවින් හා බුදුන්ගේ මාතෘකාව ආශ්‍රයකොට ගෙණ කථාවත්ථු ප්‍රකරණය මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේ විසින් දෙශනා කළාක්මෙන් මාතෘකා පදයක් ආශ්‍රයකොටගෙණ ප්‍රත්‍යෙකබුද්ධ-මහාශ්‍රාවකාදීන්ට පවා විනයශික්ෂාවක් නො පැණවිය හැකි බැවින් හා විනයපිටකයෙහි වරදට සුදුසු ශික්ෂා පැණවීම සර්වඥවරයන්ටම විෂය බැවින් ද සඞ්ඛෙපවණ්ණනා ආචාරීන්ගේ මතය පිළිගැණීමට කරුණු නො පැණේ යි.

"අභිධම්මෙ වුත්තා අත්ථා=අභිධම්මත්ථා" යනු විග්‍රහ හෙයින් "ඒ අභිධර්මසප්තප්‍රකරණයෙහි වදාළ අර්ථයෝ අභිධර්මාර්ථ නම් වෙත්. 'අභිධම්මත්ථා සඞ්ගය්හන්ති එත්ථ එතෙනා'ති වා=අභිධම්මත්ථසඞ්ගහො" යි විග්‍රහ හෙයින් "මේ අභිධර්මාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයෙහි නොහොත් මේ ප්‍රකරණයෙන් ඒ අභිධර්මසප්ත ප්‍රකරණයෙහි විස්තරයෙන් වදාරණලද අභිධර්මාර්ථයෝ සැකෙවින් සංග්‍රහකරණු ලැබෙත්නුයි අභිධර්මාර්ථසංග්‍රහ නම්.

# පරමාර්ථ ප්‍රදීප

නාම

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහ විස්තර භාවසන්නය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සම්මා සම්බුද්ධ මතුලං සසද්ධම්මගණුත්තමං,
අභිවාදිය භාසිස්සං අභිධම්මත්ථසඞ්ගහං.

තත්ථවුත්තාභිධම්මත්ථා චතුධා පරමත්ථතො,
චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා.

## පදගතාර්ථ

**අහං**, මම; **සසද්ධම්මගණුත්තමං**,* සත්පුරුෂයන්ගේ ධර්මය; පරමාර්ථයෙන් ප්‍රකටව පවත්නාවූ ධර්මය, ස්තුතිකටයුතුවූ ධර්මය, ප්‍රසිද්ධවූ පෘථුජ්ජන පුද්ගලයන් කෙරෙන් විශෙෂයෙන් ප්‍රසිද්ධවූ ප්‍රහාණය කරණලද අවිද්‍යාව ඇත්තාවූ උතුම්වූ ආර්ය පුද්ගල සමූහයා සමග හටගත්තාවූ නොහොත් සසද්ධම්මගණුත්තමං, සත්පුරුෂයන්ගේ ධර්මය, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ධර්මය, පසස්නාලද ධර්මය, දිව්‍ය මනුෂ්‍ය සමූහයා අතුරෙන් නොහොත් දිව්‍ය මනුෂ්‍ය සමූහයා කෙරෙහි උතුම්වූ ආර්යපුද්ගලයන් හා සමග පැවැත්තාවූ; **අතුලං**, සිලාදී ගුණසමූහයෙන් යම්කිසිවෙක් හා සදෘශ නොවන්නාවූ නොහොත් ශීලාදිගුණයන් හෙතුකොටගෙණ තුලාවකට බඳුවූ ඥානය කරණකොටගෙණ යම්කිසිවෙක්හා සදෘශ නොකොටහැකිවූ නොහොත්ශීලාදී ගුණයන්ගෙන් තුලාවකට බඳුවූ කාරණයෙන් සදෘශකටයුතුවූ යම්කිසිවෙක් නැත්තාවූ; **සම්මා සම්බුද්ධං**, සඞ්ඛත අසඞ්ඛතාදී වශයෙන් ප්‍රභෙදවත්වූ සියලු ධර්ම සමූහය අවිපරීතකොට ස්වයම්භූ ඥානයෙන් තමන්වහන්සේම දැනවදාලාවූ භාග්‍යවතුන්වහන්සේ නොහොත් අනන්‍යප්‍රතිබොධිතව තමන්වහන්සේම වාසනා සහිතවූ මොහනිද්‍රාවෙන් එකාන්තයෙන් පිබිදගියාවූ නොහොත් සූර්යරශ්මිසමාගමයෙන් පරම රුචිර ශ්‍රීසෞභාග්‍යයට පැමිණි මෙන් ප්‍රබොධවී ගියාවූ පද්මයක් මෙන් අර්හත්මාර්ගඥාන සමාගමයෙන් අපරිමිත ගුණසමූහයෙන් සැරසුනාවූ සර්වඥතාඥානයට පැමිණීමෙන් තමන්වහන්සේම අවබොධකොට වදාලාවූ

තථාගතයන්වහන්සේ; අභිවාදිය, අභිවන්දිත්වා, විශෙෂයෙන් නමස්කාරකොට; නොහොත් භය, ලාභ, කුල, චාරවශයෙන් නොසලකා සර්වඥ ගුණවශයෙන් මෙනෙහිකොට ත්‍රිවිධවාරයෙන් විශෙෂයෙන් නමස්කාරකොට; අභිධම්මත්ථසඞ්ගහං, අභිධර්ම සප්ත ප්‍රකරණයෙහි දෙශනා කොට වදාළාවූ; අභිධර්මාර්ථයන් සංක්ෂෙප වශයෙන් සඞ්ග්‍රහකොට රචනා කාරණහෙයින් අභිධර්මාර්ථ සංග්‍රහ නම්වූ ප්‍රකරණයක්; භාසිස්සං, කථෙස්සාමි, කියන්නෙමි

තත්‍ර, තස්මිං අභිධම්මෙ, ඒ අභිධර්ම සප්තප්‍රකරණයෙහි; සබ්බථා, සබ්බප්පකාරෙන, කුශලාදිවූද, ස්කන්ධාදිවූද, සියලු ප්‍රභෙදයන් කාරණකොටගෙණ: තථාගතෙහි, තථාගතයන් විසින්; වුත්තා, වදාරණලද්දාවූ; අභිධම්මත්ථා අභිධර්ම සප්ත ප්‍රකරණයෙහි වදාළාවූ අර්ථයෝ තුමූ; පරමත්ථතො, පරමත්ථවසෙනෙව, නොපෙරළෙන්නාවූ උතුම් ස්වභාවයාගේ වශයෙන්ම නොහොත් උතුම්වූ සර්වඥතාඥානයට ගොචරවීම් වශයෙන්ම නොහොත් සම්මුති ප්‍රඥප්තිය තබා සම්මුති ප්‍රඥප්තියෙන් වෙන වෙනම උද්ධරණයකොට ගන්නාලද්දාවූ පරමාර්ථයාගේ වශයෙන්ම; චිත්තං, විඤ්ඤාණක්ඛන්ධො, එකුන්අනූවක් චිත්තයයි කියනලද විඥානස්කන්ධයද; චෙතසිකං, වෙදනාදිඛන්ධත්තයං, වෙදනාදීස්කන්ධත්‍රයාගේ සමූහයද, රූපං, භූතොපාදායභෙදභින්නොරූපක්ඛන්ධො, භූතොපාදාය භෙදවශයෙන් වෙනස්වූ හෙවත් සතරභූතරූපය සුවිසිඋපාදාය රූපය යන ප්‍රභෙදයෙන් වෙනස්වූ රූපස්කන්ධයද; මග්ගඵලානමාලම්බණභූතො අසඞ්ඛතධම්මො, මාර්ගඵලයන්ට අරමුණුවන්නාවූ නිර්වාණ සඞ්ඛ්‍යාතවූ අසඞ්ඛතධර්මයද; ඉතිඉමිනාපභෙදෙන, මේ ප්‍රභෙදය කාරණකොටගෙණ; චතුධා, චතූහිආකාරෙහි, සතරුකාරයකින්; ඨිතා සිටියාහුය. තත්‍ර, තෙසු යථාඋද්දිට්ඨෙසු චතුසු අභිධම්මත්ථෙසු, යම් යම් ප්‍රකාරයකින් සංක්ෂෙපයෙන් උදෙසන ලද්දාවූ, ඒ සතරුකාරවූ අභිධර්මයෙහි දෙශනාකර වදාරණලද්දාවූ අර්ථයන් අතුරෙන්; තාව, පළමුකොට; මයා, මාවිසින්; උද්දිට්ඨං, සංක්ෂෙප වශයෙන් දක්වනලද්දාවූ; චිත්තං; චිත්තය තෙමේ; කාමාවචරඤ්ච, කාමාවචර චිත්තයද; රූපාවචරඤ්ච, රූපාවචරචිත්තයද; අරූපාවචරඤ්ච, අරූපාවචර චිත්තයද, ලොකුත්තරඤ්ච, ලොකොත්තර චිත්තයද; මේ ච ශබ්දය ලුප්ත නිර්දිෂ්ටයි. ඉතිඉමිනා පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; චතුබ්බිධං හොති, සතරවැදෑරුම්වේ, තත්‍ර තෙසු චතුසු චිත්තෙසු, ඒ සතර වැදෑරුම් චිත්තයන් අතුරෙන්; කතමං චිත්තං, කවරචිත්තයක් තෙමේ; කාමාවචරං, කාමාවචරනම් වන්නේද; නොහොත් කාමාවචරං, කාමාවචර චිත්තයතෙමේ; කතමං, කවරයත් :—

සොමනස්සසහගතං, සොම්නස්වේදනාව හා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ නොහොත් සොම්නස්වේදනාවහා එකොත්පාදාදිභාවයට පැමිණියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටියහ එකොත්පාදාදි ප්‍රභෙදයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; සොමනස්සසහගතං, සොම්නස්වේදනාවහා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් සොම්නස්වේදනාවහා එකොත්පාදාදිභාවයට පැමිණියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටියහා එකොත්පාදාදිප්‍රභෙදයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තයා එකං, එකෙකි; සොමනස්සසහගතං, සොම්නස්වේදනාවහා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් සොම්නස්වේදනාවහ; එකොත්පාදාදිභාවයටගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා යුක්තනොවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං චිත්තය; එකං එකෙකි; සොමනස්සසහගතං, සොම්නස්වේදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදි භාවයට ගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා යුක්ත නොවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම සහිතවූ; චිත්තං, චිත්තය; එකං එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාවේදනාව හා එකොත්පා, දාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයටගියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටියහා එකොත්පාදාදිභාවයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය: එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිවශයෙන්, මිශ්‍රවූ නොහොත් උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයටගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටියහා නොයෙදුනාවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් උපෙක්‍ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයටගියාවූ; දිට්ඨිගතවිප්ප යුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රනොවූ නොහොත් මිථ්‍යාදෘෂ්ටියහා එකොත්පාදාදි භාවයට නොගියාවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; ඉති ඉමිනා පභෙදෙන,; මේ ප්‍රභෙදයෙන් අට්ඨපි, අෂ්ටප්‍රකාරවූ ද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; ලොභසහගත චිත්තානි නාම, ලොභසහගිය චිත්තය යන නම් ඇත්තාහු; හොනති, වෙත්.

දෞමනස්සසහගතං, දෞම්නස්වෙදනාවහා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ නොහොත් දෞම්නස්වෙදනා වහා එකොත්පාදාදී භාවයට පැමිණියාවූ; පටිඝසම්පයුත්තං, ද්වෙෂය හා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; එකං, එක් චිත්තයෙකි; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය එකං,එකෙකි; ඉති ඉමිනා පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; ද්වෙපි, ද්විප්‍රකාරද්ද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; පටිඝසම්පයුත්තචිත්තානි නාම, ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තය යන නම් ඇත්තාහු; හොන්ති, වෙත්.

උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාවහා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ; නොහොත් එකොත්පාදාදිභාවයට ගියාවූ; විචිකිච්ඡාසම්පයුත්තං, විචිකිච්ඡාව හා එකොත්පාදාදි වශයෙන් යුක්තවූ; චිත්තං, චිත්තය තෙමේ; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාවහා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදි භාවයටගියාවූ; උද්ධච්චසම්පයුත්තං, උද්ධච්චයහා එකොත්පාදාදි භාවයෙන් යුක්තවූ; චිත්තං, චිත්තය තෙම; එකං, එකෙකි; ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභෙදයෙන් ද්වෙපි, දෙවැදෑරුම්වූ; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; මොමූහචිත්තානිනාම, මොහමූලික චිත්තයෝය යන නම් ඇත්තාහු හොන්ති, වෙත්.

ඉච්චෙවං, ඉති'එවං යථාවුත්තනායෙන, යම් යම් පරිද්දකින් කියනලද ක්‍රමයෙන්; සොමනස්ස උපෙක්ඛාදිභිසම්ප්‍රයොගාදි දොළොස්අකුශලචිත්තයෝතුමූ; සමත්තානි, සමාප්තකරණලද්දාහුය. නොහොත් සමත්තානි, සංක්ෂෙපවශයෙන් සංග්‍රහකොට අභිගන්නාලද්දාහුය.

---

ලොභමූලානි, ලොභසඞ්ඛ්‍යාත මූල්ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝතුමූ; වෙදනාදි භෙදතො, වෙදනාදි ප්‍රභෙද වශයෙන්; අට්ඨධා, අෂ්ටප්‍රකාර ඇත්තාහු; සියුං, වන්නාහුය; දොසමූලානි, ද්වෙෂසඞ්ඛ්‍යාත මූල්ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝද; සඞ්ඛාරභෙදතො, සංස්කාරප්‍රභෙදයෙන්; ද්විධා, ද්විප්‍රකාරවූවාහු; සියුං, වන්නාහුය; මොහමූලානි, මොහසහගත මූල්ඇත්තාවූ; චිත්තානිච, චිත්තයෝද; සම්පයොගභෙදතො, සම්ප්‍රයොගභෙද වශයෙන්; ද්වෙ, ද්විප්‍රකාරවූවාහු; සියුං, වන්නාහුය; ඉති, මෙසේ; අකුශලා, අකුසලභූතානි, අකුශල්නම්වූ හෙවත් අකුශල ස්වභාව ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝතුමූ; ද්වාදස, ද්වාදසඑව, දොළොස් දෙනෙක්ම; සියුං, වන්නාහුය; තතො, ඒ දොළොස්දෙනා කෙරෙන් අඩුවූහෝ නොහොත් දොළොස්දෙනාකෙරෙන් වැඩිවූහෝ; ඌනාධිකානි, ඌනාධිකවූවාහු; න සියුං, නොවන්නාහුය;

# මෙහි භාවාර්ථ.

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි උද්දෙශ ගාථාවෙහිවූ "**තත්‍ථවුත්තාභි ධම්මත්‍ථා**" යනාදී ගාථාවෙහි භාවය කෙසේදයත්? "වුත්තා" යන පදයට "**කුසලාදිවසෙන ඛන්ධාදිවසෙන**" යනුවෙන් ටීකාවෙහි කුමක්හෙයින් අර්ථ වර්ණනා කෙළේදයත්? අභිධර්ම සප්තප්‍රකරණ යන් අතුරෙන් ධර්මසඞ්ගණිප්‍රකරණය සඳහා "කුසලාදිවසෙන" යනුද විභඞ්ගප්‍රකරණය සඳහා ඛන්ධාදිවසෙන යනුද කීහ. කුමක් හෙයිනයත් ? ධම්මසඞ්ගණිප්‍රකරණයෙහි "**කුසලා ධම්මා-පෙ-අබ්‍යාකතා ධම්මා**" යනුවෙන් කුසලය මූලභූතකොට චිත්තචෛත සික රූප නිර්වාණසඞ්ඛ්‍යාත සතර පරමාර්ථයන්ගේ ප්‍රභෙද දක්වා වදාළහ. විභඞ්ගප්‍රකරණයෙහි "**රූපක්ඛන්ධො-පෙ-විඤ්ඤාණක්ඛන්ධො**" යනුවෙන් රූපමූලභූතකොට චිත්තචෛතසික රූප ධර්ම යන්ගේ විභාගය ප්‍රකාශකොට වදාළහ. එහෙයින් 'කුසලාදිවසෙන ඛන්ධාදිවසෙන' යනුවෙන් වදාළහෙයින් ධම්මසඞ්ගණි. විභඞ්ග යන ප්‍රකරණද්වය මූලභූතකොටගෙණ එම අර්ථකථාවන්ගේ ව්‍යාම ප්‍රමාණ ප්‍රදෙශයෙක්හි වියයුතු අර්ථය කතිපයාඞ්ගුලිමාත්‍රයක සංග්‍රහ කිරීම් වශයෙන් අනුරුද්ධාචාරීන් වහන්සේ විසින් මේ අභිධර්මාර්ථ සංග්‍රහ නම්වූ අඞ්ගුලයාර්ථකථාසංග්‍රහව රචනා කරණ ලද්දේයි. අභිධර්මසප්ත ප්‍රකරණයෙහි දෙශනාකරණලද්දාවූ සියලු අර්ථයන් පරමාර්ථයයි ව්‍යවහාරකෙරෙයි. කුමක්හෙයින් පරමාර්ථ වන්නේදයත්? "පරමො අත්‍ථො අවිපරීතොති-පරමත්‍ථො," යනු නිර්වචන බැවින් නොපෙරළීමෙන් උතුම්වූ හෙයින් පරමාර්ථයම වන්නේයි. නොපෙරළීමෙන් උතුම්වූ අර්ථය නොසලකා උත්තමාර්ථයෙන්ම පරමාර්ථයයි ගත්තේනම් භාග්‍යවතුන්වහන්සේ විසින් "අභිධර්මමාතෘකාව" වදාරණ සමයෙහි "**හීනා ධම්මා මජ්ඣිමා ධම්මා පණීතා ධම්මා**" යනුවෙන් වදාළාවූ හීනත්‍රිකයෙහි හීනධර්ම යෝනම් දොළොස්අකුශල චිත්තයෝය. ඒ දොළොස් අකුශල චිත්තයෙහි යෙදුනාවූ සත්විසිචෛතසිකයෝය යන මෙතෙක් ධර්මයෝ ලැබෙත්. ඒ ධර්මයෝ උත්තමාර්ථයෙන් පරමාර්ථයයි ගතහොත් සතරඅපායෙහි උපදවන්නාවූ ධර්මයෝද උතුම්වූ පරමාර්ථ ධර්මයෝය යන දොෂප්‍රසඞ්ගය පැමිණෙන්නේයි. එහෙයින් ඒ දොළොස් අකුශල චිත්තයෝ විපාක දීම් වශයෙන් උත්තමය හීනය යන විශෙෂය කල්පනා නොකොට නාම වශයෙන් අවිපරීතවන සවභාව වශයෙන් උත්තමනම්වෙයි කීයේයි, කුමක් හෙයින් නාම වශයෙන් විපරීත නොවන්නේදයත්? ඒ පරමාර්ථ තෙමේ ප්‍රඥප්තියමෙන් නොවෙයි, ප්‍රඥප්තිය වනාහි නාමසඞ්ඛ්‍යා

තවූ වස්තුව වනාහි යම්කිසි උපකරණයක් සදනු පිණිස කම්කරුවන්ට දුන්කල්හි ඔවුන් විසින් පහන් පඩික්කම් ආදීවූ යම්කිසි භාණ්ඩයක් නිපදවූකල්හි ඒ නාමු යන නාමය පෙරළී පහන් පඩික්කම් ආදීවූ නාම ලැබෙයි ඒ පහන්පඩික්කම් ආදී භාණ්ඩයන් කැඩී බිඳීගිය කල්හි නැවතත් උදුනෙහි දමා විරීගිය කල්හි පහන් පඩික්කම් යන ප්‍රඥප්තිය විනාශවී නාමු යන ප්‍රඥප්තියට පැමිණේ. පරමාර්ථය වනාහි එසේ නොවෙයි. මනුෂ්‍ය සන්තානයෙහි විද්‍යමානවූ ලොභය ලොභනම් වෙයි. සුනඛසන්තානයෙහි විද්‍යමානවූ ලොභය දෙසනම්වෙයි, මෙසේ පෙරළීමෙක් නොවෙයි, කවර පුද්ගලයෙකුගේ සන්තානයෙහි වූවත් අරමුණෙහි ඇලෙන්නාවූ සවභාව ඇති ලොභය ලොභනම්වෙයි, මෙසේ විකාරනොවෙන්නාවූ නම් වශයෙන් නොපෙරළෙන්නේයයි කීහ. හෙවත් මනුෂ්‍ය සන්තානයෙහි විද්‍යමානවූ ලොභය සතර අපා දුක එලවන්නාක්මෙන් සියලු සත්වයන්ගේ සන්තානයෙහිම විද්‍යමානවූ ලොභය තෙමේ අනිෂ්ට විපාක එලවන්නේමවෙයි. මෙසේ තමාගේ සවභාව නොපෙරළීමෙන් උතුම්වන හෙයින් පරමාර්ථ නම්වෙයි. මේ පරමාර්ථ ශබ්දයාගේ නිෂ්පත්‍යර්ථය විග්‍රහ යයි. පදාර්ථය විග්‍රහය මෙසේයි. "පරමස්ස සබ්බඤ්ඤුත ඤාණස්ස ගොචරො අත්ථො පරමත්ථො" යනුයි. භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේට අරමුණුවනහෙයින් නොහොත් සර්වඥතාඥානයෙන් ම මේ ධර්මත්‍රය දතයුතු හෙයින් පරමාර්ථ නම්වෙයි. එසේගත් කල්හි මධ්‍ය පදලොප සමාසවශයෙන් කල්පනා කටයුතුයි. පරමාර්ථයෙන් අන්‍යවූ ප්‍රඥප්ති ධර්මය තථාගතයන්වහන්සේට අරමුණු නොවන්නේදයත් ? අරමුණු වන්නේමැයි. කුමක්හෙයින් පරමාර්ථ ධර්මයම විශෙෂ වශයෙන් සර්වඥතාඥානයට ගොචර වන්නේයයි කීයේදයත් ? සර්වඥතාඥානයට ප්‍රඥප්තිධර්මය අරමුණුවන්නේනමුදු අප්‍රකටවෙයි. පරමාර්ථ ධර්මයම ප්‍රකට වශයෙන් අරමුණු කරණ හෙයින් උතුම්වූ සර්වඥතාඥානයට අරමුණුවන ධර්මය නිසයි. ඊට උපමා කවරයත් ? "පඞ්කජාතං පඞ්කජං' "මහියාරවතීති මයූරො" යනාදී උදාහරණයෙහි මඩෙහිහටගන්නා බැවින් පඞ්කජයයි නොයෙක් වස්තූන්ට සාධාරණවූ නාමය එකම පද්ම විශෙෂයෙහි ආරොපණයකොට ව්‍යවහාර කරන්නාක්මෙන්ද, පොළොවෙහි ශබ්දකරණ අර්ථයෙන් මයූරනම් වෙයි. ඒ මයූර ශබ්දය නොයෙක් සතුන්ට සාධාරණ වන නමුදු මයූර සඞ්ඛ්‍යාත පක්ෂි විශෙෂයෙහි ආරොපණයකොට ව්‍යවහාර කරන්නාක්මෙන්ද, සර්වඥයන් වහන්සේගේ සර්වඥතාඥානය පරමාර්ථ ධර්මයෙහි ප්‍රකටව පවත්නාහෙයින්ද, සර්වඥතාඥානයට

ගොචරවූ ධර්මය යන අර්ථයෙන් පරමාර්ථයයි රූඪිවශයෙන් ව්‍යවහාර කෙරෙත්. චිත්ත චෛතසික රූප සඞ්ඛ්‍යාත ධර්මයෝතුමූ ප්‍රඥප්ති ධර්ම නම්වෙයි. ඒ ප්‍රඥප්තීන් අතුරෙන් ඒ පුද්ගලතෙමේ ලොභසහගතවෙයි. ඒ ලොභයෙන්ද අසඞ්ඛාරික සිත්වෙයි. සසඞ්ඛාරික සිත්වෙයි යනාදීන් පෘථුජ්ජනයන් විසින් නොදත යුත්තේය. නොදක්ක යුත්තේය. තථාගතයන් වහන්සේගේම සර්වඥතාඥානයට ඒ අර්ථය ගොචරවෙයි. නොහොත් සම්මුති ප්‍රඥප්තීන් කෙරෙන් සර්වඥතාඥානය වෙන්කොට නිදර්ශන කටයුතුහෙයින් පරමාර්ථයයි ව්‍යවහාරකෙරෙයි ඒ කෙසේමෙනෙහි කටයුතු වන්නේදයත්? විහාර ප්‍රාසාද ගෘහාදිය සම්මුති ප්‍රඥප්ති යයි ව්‍යවහාර කෙරෙති, ඒ සම්මුති ප්‍රඥප්ති සඞ්ඛ්‍යාතවූ විහාරාදියෙහි ඇත්තාවූ ධර්මය නම් අවිනිර්භොගශුද්ධාෂ්ටක රූපමාත්‍රයකි. ඒ රූපය යන ව්‍යවහාරය කිසිකලෙකත් විපරීතනොවෙයි, මනුෂ්‍ය සඞ්ඛ්‍යාත ප්‍රඥප්තියෙහි විද්‍යමානවූ චිත්ත චෛතසික රූප සඞ්ඛ්‍යාත ධර්මයෝතුමූ පරමාර්ථනම්වෙයි. ඒ පරමාර්ථ ධර්මතෙමේ ප්‍රභෙද හැත්තේද යන චොදනාව මෙනෙහි කොට ‘චතුබ්බිධං” යනු කීහ. එහි අභිප්‍රාය චිත්තචෛතසික රූපනිර්වාණ සඞ්ඛ්‍යාතවූ සතරාකාරවූ අර්ථය පරමාර්ථ නම් වෙයි යනුයි. ඒ සතර පරමාර්ථයන් අතුරෙන් උතුම්වූ නිර්වාණ ධර්මය ආදියෙහි නොයොදා අවසානයෙහි කුමක්හෙයින් යෙදූසේක්ද යත් ? ඒ ඒ චිත්ත චෛතසිකයන්ගේ නිරොධය නිර්වාණ ධර්මාවබොධයෙන් වන්නේයයි යන අර්ථය හඟවනු පිණිස අවසානයෙහි යොදනලද්දේයයි දතයුතුයි. ඉදින් නිර්වාණ ධර්මය ආදියෙහි යෙදූසේක්වීනම් චිත්ත චෛතසික රූප ධර්මයෝතුමූ නොවිය යුත්තාහුය. එහෙයින් නිර්වාණධර්මය ආදියෙහි නොයොදා අවසානයෙහිම යොදනලද්දේයි. නිර්වාණධර්මය වනාහි සියලු ධර්මයන්ගේ නිරොධස්ථානයවන හෙයින් අවසානයෙහි තබනලද්දේයයි කීයේනම් එසේ කියනසේක්වා. රූපය ආදියෙහි තබා චිත්ත චෛතසික නිර්වාණධර්මයෝ අවසානයෙහි තබා ගාථාව රචනා කෙළේවීනම් නිර්වාණය අවසානයෙහි යෙදෙන්නේවැයි. නාමධර්මයෝ තුන්දෙන එකසම්බන්ධයෙන් තැබියයුතු නොවේදැයි ප්‍රශ්න කටයුතුවෙයි. එසේතැබූ කල්හි මූලභූතවූ විභඞ්ග ප්‍රකරණය සඳහා ‘ඛන්ධාදිවසෙන”යනු කීහ. ඒ විභඞ්ග ප්‍රකරණයද “රූපක්ඛන්ධො”යනාදීන් රූපය ආදියෙහි තබා දෙශනා කළහෙයින් මේ ප්‍රකරණයද ඒ විභඞ්ග ප්‍රකරණයට අනුව රූපය ආදියෙහි තබා දෙශනා නොකොට ධම්මසඞ්ගණී ප්‍රකරණය නිශ්‍රය කොටගෙණ චිත්තචෛතසික ධර්මවද

ආදියෙහි තබා විභඞ්ග ප්‍රකරණය ආශ්‍රය කොටගෙණ තදනන්තරව රූපය තබා මේ ප්‍රකරණය රචනාකෙළේයයි දතයුතුයි. තවද ධම්මසඞ්ගණී ප්‍රකරණය වනාහි අභිධර්ම සප්ත ප්‍රකරණයාගේ මූලයක්මෙන්ද, විභඞ්ග ප්‍රකරණය වනාහි ශාඛාවක් මෙන්ද, වනහෙයින් ඒ මූලභූතවූ ධම්සඞ්ගණී ප්‍රකරණය ආදියෙහි තබා "චිත්තං චෙතසිකං" යන පදයද ශාඛාවකට බඳුවූ විභඞ්ග ප්‍රකරණය තදනන්තරව තබා "රූපං"යනුද යොද මේ ප්‍රකරණය රචනා කෙළේයයි දතයුතුයි. "චිත්තං චෙතසිකංරූපං නිබ්බානං"යන උද්දෙශ ගාථාවෙහි "චිත්තං" යන්නට සිතයයි අර්ථනොදී "චිත්තං විඤ්ඤාණක්ඛන්ධො"යනු කුමක්හෙයින් අර්ථ වර්ණනා කෙළේදයත්? "චිත්ත" ශබ්දතෙමේ විචිත්‍රාර්ථය, චිත්‍ර කර්මාන්තය, චිත්‍රානම් නක්ෂත්‍රය, චිත්‍රනම් වෘෂභයාය. චිත්‍රනම් ගෘහපතියාය,චිත්‍රනම් උද්‍යානයයන මෙතෙක් අර්ථයෙහි පවත්නා හෙයින් ඒ අර්ථයෙන් වලක්වා ආලම්බණ විජානනස්වභාව ඇත්තාවූ චිත්තයෙහි පවත්නා බව හඟවන පිණිස ,,විඤ්ඤාණක්ඛන්ධො"යනු කීහ. ඒ විඤ්ඤාණක්ඛන්ධ පදයෙන් විචිත්‍රාර්ථය යනාදී අවශෙෂ අර්ථයන් වලක්වයි. "චෙතසිකං" යන පදයෙහි චෛතසිකයයි අර්ථනොදී "වෙදනාදී ඛන්ධත්තයං"යි කුමක් හෙයින් අර්ථවර්ණනා කෙළේදයත්? නිශ්‍රය නිශ්‍රිත දෙදෙනා අතුරෙන් චිත්තය නිශ්‍රය නම්වෙයි. චෛතසිකය නිශ්‍රිත නම් වෙයි. ඒ නිශ්‍රිතවූ චෛතසිකය වනාහි සිත හා එක්ව උපදනා හෙයින් චෛතසික නම්වෙයි අර්ථගන්නා කල්හි "ජායන්තමෙව සමුට්ඨාපෙති"යන වචනය සවන පරිච්ඡෙදයෙහි කීහෙයින් සිත හා එක්ව උපදනාවූ චිත්තජ රූපයද, චිත්තයාගේ උත්පාදක්ෂණයක් පාසා උපදනා හෙයින් චෛතසිකයන්ට ඇතුලත්වෙයි. මෙසේ චෛතසිකය යන පරනාමධෙයයක් ඇත්තාවූ චිත්තජ රූපය චෛතසිකය ගන්නාහෙයින් ඒ චිත්තජරූපය වලක්වනු පිණිස "වෙදනාදි ඛන්ධත්තයං"යි අර්ථවර්ණනාකෙළේය. "රූපං" යන්නට රූපයයි අර්ථනොදී "රූපං භූතොපාදාය භෙදභින්නො රූපක්ඛන්ධො"යයි කුමක්හෙයින් අර්ථවර්ණනා කෙළේදයත්? ප්‍රිය වඩන්නාවූ මනවඩන්නාවූ ස්වරූපයද, "පියරූපං සාතරූපං' යනුවෙන් ව්‍යවහාර කෙරෙති. විකාරවීම ලක්ෂණකොටඇත්තාවූ භූතරූපය උපාදාය රූප වශයෙන් විප්‍රකාරවූ රූපස්කන්ධයද මෙම රූපශබ්දයෙන් වාචකවෙයි එහෙයින් "පියරූපං සාත රූපං" යන රූපය වලක්වන පිණිස "භූතොපාදාය භෙදභින්නො රූපක්ඛන්ධො" යනුවෙන් අර්ථවර්ණනා කෙළේයි. "නිබ්බානං" යන්නට නිවනැයි අර්ථනොදී "මග්ගඵලානමාලම්බනං භූතො

අසඞ්ඛතධම්මො" යනුවෙන් කුමක්හෙයින් අර්ථ වර්ණනා කෙළේද යත්? මේ "නිබ්බාණ" ශබ්දය තෙමේ සන්සුන්වීමට ඇත්තාවූ ප්‍රත්‍යයද, හෙවත් එකොළොස්ගිනි නිවීමට හේතුවූ උප්පාදඨිති භඞ්ගයන්ගෙන් විරහිතවූ නිර්වාණ ධර්මයද, උප්පාදඨිති භඞ්ගයන්ගෙන් විරහිතවූ ප්‍රඥප්තියද, උප්පාදඨිති භඞ්ගයන්ගෙන් විරහිතවූ බැවින් නිර්වාණනම් වේදෝහෝයි යන චෝදනාව වලක්වන පිණිස මාර්ගඵලයන්ට අරමුණු වන්නාවූ නිර්වාණ ධර්මයම ගන්නා පිණිස ප්‍රඥප්තිය නොගන්නා පිණිස "නිබ්බාණං -පෙ- අසඞ්ඛත ධම්මො" යනුවෙන් අර්ථවර්ණනාකෙළේය. "නිබ්බාණං මග්ගඵලානං ආලම්බනභූතො" යන මාත්‍රයක්හි පමණකින් අභිප්‍රෙතාර්ථය නොලැබෙන්නේද "අසඞ්ඛත ධම්මො"යන පදය කුමක්හෙයින් කියන ලද්දේද යත්? "නිර්වාණය" යනු තෘෂ්ණාවෙන් වෙන්වූ හෙයින්ද තෘෂ්ණාවෙන් වෙන්වීමට ප්‍රත්‍යයවූහෙයින්ද නිර්වාණයයි කියත්. ඉදින් තෘෂ්ණාවෙන් වෙන්වූ මාත්‍රයකින් නිර්වාණයයි කියන්නේනම් අර්හත්මාර්ග අර්හත්ඵලයෝද තෘෂ්ණාවෙන් වෙන්වූවාහුය. තෘෂ්ණාවෙන් වෙන්වීමට කාරණත්වෙයි. කර්ම චිත්ත ඍතු ආහාර සඞ්ඛ්‍යාතවූ සතර ප්‍රත්‍යයන් විසින් සකස් කරණලද්දවූ අර්ථයම මාර්ග ඵලයන්ට ඇතිහෙයින් අසඞ්ඛත ධර්මයයි නොකියත්. සඞ්ඛත ධර්මයෝමවෙත්. නිර්වාණය වනාහි තෘෂ්ණාවෙන් නික්ම ගියේය. තෘෂ්ණාවෙන් නික්මීමට කාරණත් වෙයි. එතකුදුවුවත් කර්ම චිත්ත ඍතු ආහාර සඞ්ඛ්‍යාත සතර ප්‍රත්‍යයන් විසින් නොසකස්කළ බැවින් අසඞ්ඛත ධර්ම නම් වෙයි. අර්හත්මාර්ග අර්හත්ඵලයෝ තුමූ අසඞ්ඛත නොවෙත්. සඞ්ඛතමවෙත්. එහෙයින් අර්හත්මාර්ග ඵලයෝ තුමූ තෘෂ්ණාවෙන් නික්මීමට කාරණාවුවද තෘෂ්ණාවෙන් නික්ම ගියේත්වේද, එතකුදුවුවත් නිර්වාණනම් නොවෙත්. ඒ අර්හත් මාර්ග ඵලයන් වලක්වන පිණිස "අසඞ්ඛත ධම්මො" යනු කීහ. මැදුම් සඟියෙහි රාධ සූත්‍රයෙහි අර්හත්මාර්ග ඵලයෝද නිර්වාණයයි ව්‍යවහාරකෙරෙත්. එතකුදු වුවත් සතරවන පරමාර්ථයවූ අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණය ඒ මාර්ග ඵලයන්ට අරමුණුවන්නාවූ ධර්මයවෙයි දතයුතුයි. ඒ සතර පරමාර්ථයන් පළමුකොට වදාළේදැයි යන චොද්‍යය සඳහා "තාව චිත්තං" යන වචනය කීහ. ඒ වචනයාගේ අභිප්‍රාය නම්:- චෛතසිකාදීන්ට පූර්වයෙහි චිත්තය කීයේය යනුයි. ඒ චෛතසිකාදීන්ට පූර්වයෙහි දක්වනලද්දවූ චිත්තය තෙමේ ප්‍රභෙදයක් නැත්තේදැයි යන චොද්‍යය සඳහා "චතුබ්බිධං" යනවචනය කීහ. එහි අභිප්‍රාය නම්:-ඒ චිත්තය වනාහි සතරාකාරවන්නේය

යනුයි. නොහොත් "චතුබ්බිධං" යන සඞ්ඛ්‍යාවගේ සඞ්ඛෙය වනාහි කෙසේදැයි යන චෝද්‍යය සඳහා "**කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරං**" යන පාඨය කීහ. ඒ පාඨයාගේ අභිප්‍රායනම්:-කාමාවචර චිත්තය,රූපාවචර චිත්තය, අරූපාවචර චිත්තය,ලොකුත්තර චිත්තයයි සතරාකාර වන්නේය යනු භාවයි. ඒ සතරාකාර චිත්තය අතුරෙන් පළමුවන චිත්තය කුමක්හෙයින් කාමාවචර වන්නේද යත්? "කාමෙ අවචරතීති කාමාවචරං" යනු නිර්වචන බැවින් කාමාවචර භූමියෙහි බොහෝසෙයින් හැසිරෙන බැවින් කාමාවචරයයි කියත්. කාම භූමියෙහි හැසි රෙන හෙයින් කාමාවචර නම්වූ චිත්තය රූපාරූප භූමියෙහිත් නොහැසිරෙන්නේදයත්? ස්වල්ප වශයෙන් රූපාරූප භූමියෙහිද කාමාවචර චිත්තය හැසිරෙන්නේමැයි ඒ චිත්තය තෙම රූපා රූප භූමියෙහි ස්වල්ප වශයෙන් හැසිරෙන නමුත් කාමාවචර නාමය අත්නොහරීමැයි. ඊට උපමා කවරයත්? වනයෙහි ඇවිද උවරු මුව ගොණාදී සිව්පාවන් මරා ජීවත්වෙන වැදී තෙමේ බොහෝසෙයින් වනයෙහි හැසිරෙන බැවින් වනචරක යයි ව්‍යවහාර කරණු ලැබෙයි. එතකුදු වුවත් ඒ වැදි පුරුෂ තෙම කලින් කල නගර ග්‍රාමාදියෙහි හැසිරෙන කල්හිද වනචරක නාමය අත්නොහරීමැයි. එපරිද්දෙන්ම රූපාරූප භූමියෙහි මඳවශයෙන් හැසිරෙන්නාවූ මේ කාමාවචර චිත්තය කාමාවචර නාමය අත්නොහරියි. තවද යුද්ධභූමියෙහි හැසිරෙන් නාවූ හස්ති සමූහයා අතුරෙන් අතිශයින් දක්ෂවූ හස්ති තෙමේ සඞ්ගාමාවචරයයි ව්‍යවහාර කරණු ලැබේ. එතකුදුවුවත් ඒ හස්තිතෙමේ නගර ග්‍රාමාදියෙහි හැසිරෙන කල්හිද සඞ්ගාමාවචර නාමය අත්නොහරියි. එපරිද්දෙන්ම රූපාවචර භූමියෙහි මඳ වශයෙන් උපදනාවූ කාමාවචර චිත්තය කාමාවචර නම අත් නොහරියි. තවද දියෙහි හැසිරෙන්නාවූ හංස තෙමේ ජලචර යයි ව්‍යවහාර කරයි. එතකුදුවුවත් ඒ හංසතෙමේ ගොඩ භූමි යෙහිද හැසිරෙයි. එසේවුවත් ජලචර නාමය අත්නොහරියි. එපරිද්දෙන්ම රූපා රූප භූමියෙහි මඳවශයෙන් උපදනාවූ මේ කාමාවචර චිත්තය තෙමේ කාමාවචර නම අත්නොහරීමැයි. ලොකොත්තර චිත්තය වනාහි කවර අර්ථයකින් ලොකොත්තර දැයි ව්‍යවහාරකරන්නේද යත්? "ලොකතො උත්තරතීති ලොකු ත්තරෝ" යනු නිර්වචන බැවින් ලොකය එතරකරණ අර්ථයෙන් ලොකුත්තර නම්වෙයි. ඒ ලොකය තෙමේ සඞ්ඛාර ලොකය සත්ව ලොකය, ඔකාසලොකයයි තුන්වැදෑරුම්වේ. ඒ ත්‍රිවිධ ලොක යෙන් එතරවන අර්ථයෙන් ලොකොත්තරයයි ව්‍යවහාරකරයි,

"සඞ්ඛාරලෝකය" යනු උප්පාද, ඨිති, භඞ්ග, සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධ ලක්ෂණයන් අතුරෙන් භඞ්ගාභිමුඛ අවස්ථා තොමෝ සඞ්ඛාර ලෝකයයි කියත්. සත්වලෝකය යනු එක්තිස් භූමියෙහි උපදනාවූ නරක තිරිසන් ප්‍රේත අසුර දිව්‍ය බ්‍රහ්මාදී සත්වයෝ සත්ව ලෝක නම්වෙයි. ඕකාසලෝකය යනු ඒ එක්තිස් භූමියයි. එහෙයින් ලෝකොත්තර චිත්තය වනාහි මේ ත්‍රිවිධ ලෝකයෙන්ම එතර කරයි. එහෙයින් ලෝකොත්තරයයි ව්‍යවහාරකරත්. එතර වීමට කාරණාවූහෙයින්ද, එතරවූ ධර්මයද, ලෝකුත්තරයයි ව්‍යවහාරකරත්නම් එහෙවත් රාග ද්වෙෂ මොහාදී කෙලෙස් නැසීමෙන් ලෝකය එතරකරණහෙයින් ලෝකුත්තරවන්නේ නම් කාමාවචර මහග්ගත ධර්මයෝද, තදඞ්ග ප්‍රහාණ විෂ්කම්භන ප්‍රහාණවශයෙන් කෙලෙස් නැසීමට හෙතුවෙයි. එහෙයින් ඒ කාමාවචර මහද්ගත ධර්මයන්ට ලෝකුත්තරයයි ව්‍යවහාර නොකොට මේ සතරමග ඵල චිත්තයන්ටම ලෝකුත්තර නාමය කුමක්හෙයින් ව්‍යවහාරකෙළේද යත්? කාමාවචර මහද්ගත කුශලයෝ තුමූ තදඞ්ග විෂ්කම්භණාදීවශයෙන් කෙලෙස් නසත්මැයි. එතකුදු වුවත් හෙතු ඵල දෙදෙනාගේ සම්බන්ධය ඉතා දුරවෙයි. ලෝකොත්තර ධර්මයෝ වනාහි එසේ නොවෙත්. හෙතු ඵල සම්බන්ධය අතිශයින් ළංව පවතිත්. එහෙයින් ලෝකොත්තර චිත්තයෝම චෙතම උද්ධරණයකොට ලෝකය එතර කරන්නාහුයයි කීවාහුය. ඊට උපමා කවර යත්? භාග්‍යවතුන්වහන්සේ වනාහි සච්චයමක යෙහි අනාගත පුද්ගලවාර දෙශනාකරන්නාවූ අර්හත්මාර්ගය යම් පුද්ගලයෙකු විසින් ලබන ලද්දේනම් ඒ පුද්ගලයාගේ විභඞ්ග වාරයෙහි උද්ධරණයකරන්නාහු "යස්සචිත්තස්ස අනන්තරං අග්ගමග්ගං පටිලභිස්සති" යනුවෙන් අර්හත්මාර්ගයට පූර්වභාගයෙහිවූ වොදාන චිත්තයෙන් සම්පූර්ණවූ අනාගාමි ඵලය උද්ධරණයකොට දෙශනාකෙළේයි. ඒ අනාගාමි පුද්ගල තෙමේ අර්හත්මාර්ගය ලබන්නේනොවෙයි. පශ්චිම භවික පුද්ගල තෙමේද අර්හත්මාර්ගය ලබන්නේමැයි. එතකුදුවුවත් විභඞ්ගවාරයෙහි ඒ පශ්චිමභවික පුද්ගලයා උද්ධරණය නොකොට අනාගාමි පුද්ගලයාම උද්ධරණය කොට සච්චයමකය වදාළේයි. ඒ පුද්ගලයා වනාහි "යස්සමග්ගං පටිලභිස්සති" යනුවෙන් විභඞ්ගවශයෙන් මාර්ගය ලබන්නාවූ පුද්ගලයාම උද්ධරණයකොට දෙශනාකෙළේයි. එපරිද්දෙන්ම ලෞකික කුශලයන් නොවදාරාම ලෝකොත්තර චිත්තයම ත්‍රිවිධ ලෝකය එතරකිරීමට හෙතුයයි දෙශනාකෙළේයි. මේ වනාහි සුතර ඒකාන්තයෙන් විශෙෂාර්ථයි.

ආයුෂ්මත්වූ අනුරුද්ධාචාරීන්වහන්ස! සතරාකාරයයි කිය කලද චිත්තයන් අතුරෙන් කවර චිත්තයක් පළමුකොට දක්වන ලද්දේදැයි යන චොද්‍යය සඳහා "තත්‍ථ කතමං කාමාවචරං" යනපාඨය කීහ. ඒ පාඨයෙහි අභිප්‍රාය නම්:-සූපණස් කාමාවචර චිත්තය කවරේද යනුයි. මේ "තත්‍ථ කතමං" යන පාඨය ආචාර්‍ය්‍ය අනුරුද්ධ මහාසවාමිපාදයන් විසින් මේ ප්‍රකරණයෙහි නොදක් වන ලද්දේය. ඊට හෙතු කවරේද යත්? විභාවනී ටීකාවෙහි වනාහි සඞ්ග්‍රහයෙහි ආවාවූ සියලු පදයන්ගේ ක්‍රමයෙන් අර්ථ වර්ණනා කෙරෙති. එතකුදුවුවත් පළමු අර්ථවර්ණනා කළ පදයක් නැවත අර්ථ වර්ණනානොකිරීම අර්ථකථා ටීකාචාරීන්ගේ සවභාව ධර්මයක්වෙයි. එතකුදුවුවත් මේ "තත්‍ථකතමං" යන පදය විභා වනී ටීකායෙහි වර්ණනා නොකළ බැවින් විභාවනීටීකාවෙන් මෑත භාගයෙහි යම්කිසිවෙකු විසින් ඇතුලත්කරණලද වචනයකැයි හැගේ. ඒ සූපණස් ප්‍රකාරවූ කාමාවචර චිත්තයන් අතුරෙන් නොහොත් දොළොස් අකුශල්ය, අටළොස් අහෙතුක චිත්තය, සූවිසි කාමාවචර සොභන චිත්තය, යන මොවුන් අතුරෙන් අකු ශල චිත්තය දක්වනලද්දේය. ඒ අකුශල චිත්තය කොතෙක් ප්‍රකාරවන්නේදැයි යන චොද්‍යය සඳහා දොළොස් ප්‍රකාරයයි කීහ. ඒ දොළොස් ප්‍රකාරවූ චිත්තයන් අතුරෙන් ලොභ මූලික ද්වෙෂ මූලික මොහ මූලික චිත්තයන්ගේ වශයෙන් මූල භෙද යෙන් ත්‍රිවිධාකාරවෙයි. ඒ ත්‍රිවිධාකාර චිත්තයන් අතුරෙන් කවර චිත්තයක් පළමුකොට දක්වනලද්දේද යත්? ද්වෙෂ මූලික මොහ මූලික චිත්තයන්ට පූර්වභාගයෙහි ලොභ මූලික චිත්තය දක්වන ලද්දේයයි කීනියායි. ලොභ මූලික චිත්තය පළමුකොට නොදක්වා ද්වෙෂ මූලික මොහ මූලික චිත්තයන් පළමුකොට කුමක්හෙයින් නොදක්වන ලද්දේද යත්? ලොභය වනාහි සියලු සත්වයන්ගේ පටිසන්ධිචිත්තයට අනතුරුව භවාඞ්ග සිත් පසළොසක් හෝ සොළසක් හෝ තදනන්තරව මනොවාරාවර්ජන චිත්තය ඉපිද තමා උපන් භවයට ඇලුම්කිරීම්වශයෙන් මේ ලොභ මූලික සිත් අටදෙනා අතුරෙන් යම්කිසි චිත්තයක් භවනිකාන්ති ජවන වශ යෙන් සත්වරක් ඉපිද නිරුද්ධවේ. අවීචිමහානරකයෙහි උපන් සත්වයාගේ පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඞ්ඛ්‍යාත භවා ග්‍රයෙහි උපන්නාවූ සත්වයාහටද පළමුකොට වීථි චිත්තවශයෙන් මේ ලොභ මූලික චිත්තය ඉපදීම සවභාව ධර්මයක්වේ. මෙසේ භව යෙහි උපදනා සත්වයන්ට පළමුකොට ලොභ ජවනයම උපදනා හෙයින් මේ ප්‍රකරණයෙහිද ද්වෙෂ මූලික මොහ මූලික චිත්ත යන්ට පූර්වභාගයෙහි ලොභ මූලික චිත්තයම දක්වන ලද්දේයි.

ලොභ මූලික චිත්තයට අනතුරුව ද්වේෂ මූලික චිත්තය කවර අර්ථයක් සඳහා දක්වන ලද්දේද යත්? ලොභමූලික චිත්තය "ලොභ මොහ" යන හෙතුවයකින් යුක්තවූවාක්මෙන්ම ද්වේෂ මූලික චිත්තයද "ද්වේෂ, මොහ" යන හෙතුවයකින් යුක්තවෙයි. එහෙයින් හෙතූන්ගේ සමානත්වය කරණකොටගෙණ ද්වේෂ මූලික චිත්තය තදනන්තරව දක්වනලදී. මොහ මූලික චිත්තයද ද්විහෙතුක චිත්තයට අනතුරුව එකහෙතුක චිත්තය දැක්වීම යුක්ති යුක්ත බැවින් මොහ මූලික චිත්තවය අවසානයෙහි දක්වනලදී. ඒ ලොභ මූලික චිත්තයද සොම්නස් උපෙක්ෂාවයකින් යුක්ත හෙයින් කවර වෙදනාවකින් යුක්තවූ චිත්තය ආදියෙහි යොදන ලද්දේදැයි යන ප්‍රශ්නයට පරිහාරවශයෙන් "සොමනස්ස සහ ගතං" යනාදිය කීහ. ඒ සොම්නස් උපෙක්ෂාවය අතුරෙන් සොම් නස් වෙදනාව පළමුකොට කුමක්හෙයින් කියනලද්දේද යත්? භාග්‍යවතුන්වහන්සේ විසින් අභිධර්ම මාතෘකාවෙහි "සුඛාය වෙද නාය සම්පයුත්තා ධම්මා" යනුවෙන් සොම්නස් වෙදනාව පළමු කොට වදාළහෙයින් මේ ප්‍රකරණයෙහිද සොම්නස් වෙදනාව පළමුකොට තබනලද්දේයි. "දිට්ඨිගත සම්පයුත්ත විප්පයුත්ත,, යන දෙයාකාරයකින් යුක්තවූ චිත්තයන් අතුරෙන් දෘෂ්ටිසම්ප්‍ර යුක්තවූ චිත්තය පළමුකොට කුමක්හෙයින් කීනලද්දේද යත්? දෘෂ්ටිය විද්‍යමානවූ චිත්තය දැක්වූකල්හි දෘෂ්ටිය අවිද්‍යමානවූ චිත්තයද සුඛාවබොධවනහෙයින් දෘෂ්ටි සම්ප්‍රයුක්තවූ චිත්තයම ආදියෙහි කියනලදී. දෘෂ්ටිය විද්‍යමානවූ චිත්තය පළමුකොට දැක්වීමෙන් දෘෂ්ටි විප්‍රයුක්තවූ චිත්තයද සුඛොධවන්නේයයි කීයේනම් අසඞ්ඛාරික සසඞ්ඛාරික චිත්තයන් දෙදෙනා අතුරෙන් දෘෂ්ටියට කීවාක්මෙන්ම සඞ්ඛාරය විද්‍යමානවූ චිත්තය පළමු කොට නොදක්වා අසඞ්ඛාරික චිත්තය කුමක්හෙයින් පළමුකොට කීයේදැයි චොද්‍යයක්වෙයි අසඞ්ඛාරික චිත්තය තෙමේ මෙර මාගේ මෙහෙයුම් රහිතව උපදී. එහෙයින්ම ඒ චිත්තය අති ශයින්ම බලවත්වේ. සසඞ්ඛාරික චිත්තය වනාහි අනුන්ගේ මෙහෙයුම් සහිතව උපදී. එහෙයින් ඒ චිත්තය අතිශයින් දුර්ව ලවේ. බලසම්පන්න දුර්වල දෙදෙනා අතුරෙන් කිසිකලෙකත් දුර් ලයා ඉදිරියෙහි ගමන් නොකරයි. බලසම්පන්නයා දැක්වීමෙන් දුර්වලයාද හැඟේ. එහෙයින් ඒ අසඞ්ඛාරික චිත්තයම පළමුකොට දක්වනලදැයි දතයුතු. ආයුෂ්මත් අනුරුද්ධාචාරීන්වහන්ස! ඒ ලොභ මූලික චිත්තය හා යෙදුනාවූ ස්පර්ශාදිවූ ධර්මයන් නොගෙණ "සොමනස්සසහගතං" යනාදීන් වෙදනාව කරණකොටගෙණ කුමක්හෙයින් වෙසෙසන්නේවේදැයි චොද්‍යයක්වේ. ඊට පරිහාර

මෙසේයි. වේදනාව වනාහි සොම්නස් වේදනාය, දොම්නස්වේදනාය, උපෙක්ෂා වේදනායයි ප්‍රභෙදවෙති. එසේ ප්‍රභෙදවත්වූ වේදනාවෙන්ම චිත්තයාගේ වෙනස දැක්වීම මුත් ප්‍රභෙද නැත්තාවූ ස්පර්ශයෙන් චිත්තයාගේ වෙනස දැක්වීම නොයෙදෙයි. ඉදින් ස්පර්ශයෙන් මේ චිත්තය වෙනස් කෙළේනම් මේ චිත්තයන්ගේ නිගමනයෙහි "අඨ" යන සඞ්ඛ්‍යාවගේ සඞ්ඛ්‍යයය විසඳිය නොහැකිවෙයි. කුමක්හෙයින යත්? ස්පර්ශය අටක් නොව එකුන් අනූවක් හෝ එකසිය විසිඑකක් හෝ වෙයි. එහෙයින් ඒ චිත්තයාගේ සඞ්ඛ්‍යය විසඳිය නොහැකිවෙයි. වේදනාව වනාහි සොම්නසෙහි යෙදුනාවූ වේදනාව සෞමනස්ස වේදනාය උපෙක්ෂාවෙහි යෙදුනාවූ වේදනාව උපෙක්ෂාවේදනාවයයි යනාදීන් ප්‍රභෙදවත්වූහෙයින් ප්‍රභෙද නැත්තාවූ ස්පර්ශය නොගෙණ ප්‍රභෙදවත්වූ වේදනාවෙන්ම වෙනස දක්වනලද්දේයි. මේ 'සොමනස්ස සහගතං දිඨිගත සම්පයුත්තං අසඞ්ඛාරිකං සසඞ්ඛාරිකං" යන පාඨ සමුදය අතුරෙන් අසඞ්ඛාරික සසංඛාරිකයම මෙහි අභිමතාර්ථවෙයි. එහෙයින් ඒ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයම නොදක්වා කුමක්හෙයින් අනභිමතවූ "සොමනස්සසහගතං" යනාදී වචනය යෙදූයේද යත්? සෞමනස්සය වනාහි මෙහි අභිමතාර්ථය නොවෙයි. එතකුදුවුවත් අසඞ්ඛාරික සසඞ්ඛාරිකය සෞමනස්සයාගේ අසඞ්ඛාරිකය, සසඞ්ඛාරිකය; උපෙක්ෂාවගේ අසඞ්ඛාරිකය සසඞ්ඛාරිකයයි ප්‍රභෙදවත්වෙයි. එසේ ප්‍රභෙදවනහෙයින් මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය සොම්නස්වේදෝ උපෙක්ෂාවේදෝ යන සැකයට කාරණාවනහෙයින් ඒ සැකය වලක්වනු පිණිස අසඞ්ඛාරික සසඞ්ඛාරිකයෝ තුමූ සොම්නස් උපෙක්ෂා දෙකම ඇත්තේ නමුදු මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය උපෙක්ෂා සහගත නොවෙයි. සොම්නස් සහගතමවෙයි. යන බව හඟවන පිණිස "සොමනස්ස සහගතං" යනුකීහ. මෙසේ සොමනස්ස උපෙක්ෂා යන වේදනාවගේ විප්‍රකාරය ඇතිහෙයින් සොමනස්සය ලබන පිණිස "සොමනස්ස සහගතං" යනු කීහ. අසඞ්ඛාරික සසඞ්ඛාරිකයාගේ සොමනස්සය වලක්වනු පිණිස එසේ කීයේනම් එසේ කියනසේක්වා, 'දිඨිගත සම්පයුත්තං" යනාදී පාඨය කුමක්හෙයින් කීයේදැයි යන චොද්‍යය සඳහා මේ "දිඨිගත සම්පයුත්තං" යන පාඨය දැක්වීම සෞමනස්සයාගේ අසඞ්ඛාරික සසඞ්ඛාරික තෙමේ දිඨිහුගේ අසඞ්ඛාරික සසඞ්ඛාරික විප්‍රයුක්තයයි. මෙසේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකවශයෙන් විප්‍රකාරවත්තේයයි කීහ. ඒ විප්‍රකාරයන් අතුරෙන් මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය තොමෝ දෘෂ්ටියෙන් යුක්තවූ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයද, දෘෂ්ටියෙන් විප්‍රයුක්තවූ

අසංඛාරික සසංඛාරිකයදැයි මෙබඳු සංසයක් වියයුතුහෙයින් ඒ සංසය වලක්වනු පිණිස මේ අසංඛාරික සසංඛාරිකය දෘෂ්ටියෙන් යුක්තයයි හඟවනු පිණිස "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය කීහ සොමනස්සයාගේ අසංඛාරිකය සසංඛාරික තෙමේ දිට්ඨිහුගේ අසංඛාරික සසංඛාරිකය, දිට්ඨිවිප්පයුත්තයාගේ අසංඛාරික සසංඛාරිකයදැයි දෙවැදෑරුම්වේ. ඔවුන් අතුරෙන් මේ අසංඛාරික සසංඛාරික තෙමේ දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරිකදෝහෝයි සැකයක් ඉපදිය යුතුහෙයින් ඒ සංසය වලක්වනු පිණිස මේ අසංඛාරික සසංඛාරික තෙමේ දෘෂ්ටිසම්ප්‍රයුක්තවූ අසංඛාරික සසංඛාරිකයයි හඟවනු පිණිස "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය කීහ ඊට උපමා කවරයත්? එකාවීකාදී සංඛ්‍යාක්ෂරයක් පූර්වයෙන් යම් වචනයක් නොමැතිව යෙදූයේවී නම් කවර වස්තුවෙක සංඛ්‍යාවෙක්දැයි නොදතහැකිවේ. එහෙයින් ඒ සංඛ්‍යාක්ෂරයන්ට මුලින් රන් රිදී ආදී ද්‍රව්‍යයන් සඳහන් කොළේනම් එක් කාර්ෂාපණය, කාර්ෂාපණ දෙකය, යනාදීන්ද, මනුෂ්‍යාදී යම් නමක් යෙදූයේනම් එකෙක්ය දෙදෙනෙක්ය යනාදීන් ව්‍යවහාර කරන්නාක්මෙන්ද මෙහි උපමා උපමෙය සම්බන්ධ දත යුතුයි, දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත චිත්තයද කවර දෘෂ්ටියකැයි නියමයක් නැතිව "දිට්ඨි" යන සාමාන්‍යය යෙදූහෙයින් සම්‍යක් දෘෂ්ටියදෝ මිථ්‍යාදෘෂ්ටියදෝයි සැකකටයුතුවෙයි "මිච්ඡා" යන විශෙෂණය යෙදූසේක්වීනම් සම්‍යක් දෘෂ්ටිය නොවනබවද, "සම්මා" යන විශෙෂණය යෙදූයේනම් මිථ්‍යාදෘෂ්ටිය නොවන බවද, අවබොධවෙයි. මෙහි වනාහි විශෙෂණ පදයක් නොයොදා "දිට්ඨි" යන සාමාන්‍යය යෙදූහෙයින් කවර දිට්ඨියක් ගතයුත්තේදැයි චොද්‍යයක්වේ. මේ චිත්තයන්ගේ නිගමනයෙහි වනාහි "ඉමානි අට්ඨ ලොභසහගත චිත්තානි නාම" යන්නෙහි ලොභය දුටුකල්හි ඒ ලොභය සමග මිථ්‍යාදෘෂ්ටියමුත් සම්‍යක්දෘෂ්ටිය නොයෙදෙනබව හැඟෙයි. ඊට උපමා කවරයත්? කෙතක් වපුරන්නාවූ යම් කස්සකයෙක් තෙමේ ඒ කෙත් සම්පන්නකොට තමාගේ ස්වකීය ගෙදරට පැමිණිකල්හි මහත් මෙඝයක් නැගී වස්නට පටන්ගත්කල්හි ඒ ගොවි තෙමේ මාගේ කෙතෙහි දණක් පමණ හෝ උකුලක් පමණ හෝ ජලය ගලා ඇත්තේයයි මෙනෙහිකරයි. ඔහු නැවත පහන්වූකල කෙතට යන්නාහු සියලු ජලය සිඳීගොස් වියලී තිබෙයි එතකුදුවුවත් ගංඉවුරු ආදියෙහි රැඳී තිබෙන්නාවූ පරඬලාපත් දියසෙවෙල් ආදිය දැක මේ කෙතෙහි මෙපමණ ජලය ගැලූයේයයි දතගණිද, එපරිද්දෙන්ම දිට්ඨි සාමාන්‍යය කීයේද නිගමනයෙහි ලොභපදය දුටු පමණකින් සම්මා

දිඨිය නොව මිථ්‍යාදෘෂ්ටියයි දතගණිද, ඒ කුඹුරෙහි ජලය නැති කලක්මෙන් දිඨි ශබ්දයාගේ මිච්ඡා යන විශෙෂණ පදය නැති බවද, ගංඉවුරු ආදියෙහි රැඳී තිබෙන්නාවූ දියසෙවෙල් ආදිය මෙන් නිගමනයෙහි ලොභ සහගත පදයද, ගොවියෙකුමෙන් මේ ප්‍රකරණය අධ්‍යයනයකරන්නාවූ ආධුණික ජනයාද, උපමා උපමෙය සම්බන්ධකොට අර්ථ දතයුතුයි. "ඉමානි අට්ඨපි ලොභ සහගත චිත්තානිනාම" යන්නෙහි "පි"ශබ්දය කුමක් අර්ථකොට ඇත්තේද යත්? මේ ලොභ සහගත චිත්තයාගේ අනන්ත අප්‍රමාණවූ භෙදය සම්පිණ්ඩණය කෙරේ. අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාච, සම්ඵප්‍රලාප, අභිද්‍යා මිථ්‍යාදෘෂ්ටි, යන සප්තකර්මපථයෙහි මේ එකී එකී අකුශල චිත්තයක් යෙදෙන හෙයින් පළමුකොට මේ අට සතින් ගිණිය යුතුයි. ඒගුණිතකළාවූ සඞ්ඛ්‍යාව අතීතානාගත වර්තමාන යන කාලත්‍රයවශයෙන් පවත්නාහෙයින් තුණින් ගිණියයුතුයි. ඒ තුණින් ගුණිතකළ සඞ්ඛ්‍යාව ස්වසන්තාන පරසන්තානවශයෙන් පවත්නාහෙයින් දෙකින් ගිණියයුතුයි ඒ දෙකින් ගුණිතකළ සඞ්ඛ්‍යාව රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන ෂාරම්මණුවශයෙන් පවත්නා හෙයින් සයින් ගිණිය යුතුයි. ඒ සයින් ගුණිතකළ සඞ්ඛ්‍යාව නගර ජනපදවශයෙන් පවත්නා හෙයින් දෙකින් ගිණියයුතුයි. මෙසේ ගුණිතකරණලද සඞ්ඛ්‍යාවන් අතුරෙන් අතීතානාගත යනකාල වශයෙන් ලැබියයුතු ගණන් මාත්‍රයම අනන්ත අප්‍රමාණ වෙයි. ඒ සියලු සංඛ්‍යාවෝ මේ "පි"ශබ්දයෙන් සංග්‍රහවෙත්. මේ ලොභ මූලික චිත්තයෝ අටදෙනාවනාහි ලොභ, මොහ, යන හෙතු මූලවයකින් යුක්තවූවද මොහය නොගෙණ ලොභය කුමක්හෙයින් ගත්තේද යත්? මොහය වනාහි සර්වාකුශලසාධාරණවෙයි. ලොභය මේ සිත් අටෙහිම යෙදෙයි. එහෙයින් සර්වාකුශල සාධාරණවූ මොහය නොගෙණ ලොභයෙන්ම විශෙෂය දක්වූයේයි. සෞම්නස්වීමට හේතු තුණක්වෙයි. ඒ කවර තුනෙක්ද යත්? සොමනස්සසහගත පටිසන්ධි සතරින් යම්කිසි චිත්තයකින් පිළිසිඳීමය, ඉෂ්ටාලම්බනයක්වීමය, නොගැඹුරු ප්‍රඥා ඇති බවය, මේ කාරණාත්‍රයයි. උපෙක්ෂාසහගත වීමට හෙතුත්‍රයක් ඇතිවේ. කවර තුණක්ද යත? උපෙක්ෂා සහගත පටිසන්ධි සදෙන අතුරෙන් යම්කිසි චිත්තයකින් පටිසන්ධිගැණීමය, මධ්‍යස්ථවශයෙන් යහපත් අරමුණක් ලැබීමය, ගැඹුරු නුවණ ඇති බවය, යන මේ කාරණා තුනයි. දෘෂ්ටි සම්ප්‍රයුක්තවීමට කාරණා දෙකක් ඇතිවෙයි. එනම්:-තමාත් චිත්තවිපල්ලාසාදී විපල්ලාසයකින් යුක්තව ශාස්වත උච්ඡේද අදහස් ඇත්තෙක්වේද,එබඳුවූ

චිත්තවිපල්ලාසාදිය ඇත්තාවූ මිසදිටු පුද්ගලයන් භජනාදිය කිරීමය, යන මේ කාරණාදෙකින් දිට්ඨිගතසම්ප්‍රයුක්ත සිත් උපදී. මේ කාරණාදෙකින් යුක්තවීනම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුශල්උපදී. ඒ දෙකින් වෙන්වීනම් දෘෂ්ටිවිප්‍රයුක්ත අකුශල් උපදී. අසඞ්ඛාරික සසඞ්ඛාරික සිත් ඉපදීමට හෙතු පසක් ඇති වේ. ඒ කවරහුද යත්? ඊට යොග්‍යවූ ඍතුවක් ලැබීමය, ඊට යොග්‍යවූ වාසස්ථානයක් ලැබීමය, ඊට යොග්‍යවූ භොජනයක් ලැබීමය, ඊට යොග්‍යවූ චීවර වස්ත්‍රාදිය ලැබීමය, ඊට යොග්‍යවූ මිත්‍රයන් ලැබීමය, යනමේ කාරණා පස ඇතිකල්හි අසඞ්ඛාරික අකුශල් සිත් උපදී. මෙයින් යමක් අඩුවීමෙන් සසඞ්ඛාරික සිත් උපදී. මේ පළමුවන දෙවන අකුශල් දෙක කෙසේ උප දනේදයත්? යමෙක් සන්තක යම් වස්තුවක් දැක ඒ වස්තුව ප්‍රණීතවීනම් සොම්නස් සහගතවෙයි. ඊට අනතුරුව ඒ වස්තුව පැහැරගණිමියි සිතා ඒ වස්තු ස්වාමි පුද්ගලයා අතීත ජාතියෙහි මාසතුවස්තුව පැහැරගත්තේයයි. එහෙයින් මම දූන් මොහුගේ වස්තුව ණය ගැණීම්වශයෙන් පැහැරගත්තොත්නම් වරද නොවේ යයි යනමේ මිථ්‍යාදෘෂ්ටිය පෙරටුකොටගෙණ ඒ වස්තුව පැහැර ගන්නාකල්හි සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත පළමුවන අකුශල චිත්තය සත්වරක් ජවන්වශයෙන් උපදී. ඒ පැහැර ගැණීම යමෙක් විසින් නො මෙහෙයනලද්දේවීනම් අසඞ්ඛාරික සිත්වෙයි. මෙහෙයනලද්දේවීනම් සසඞ්ඛාරික සිත්වෙයි. ඒ අනුන් සන්තක වස්තුව දැක පෙරමෙන්ම සොම්නස්සහගත ලොභයෙන් පැහැරගන්නාවූකල්හි මේ අන්වස්තුව පැහැර ගැණීම අකුශල්වෙයි. එතකුදුවුවත් මේ වස්තු ස්වාමියාහට බොහෝ වස්තු ඇත්තේය. මාගේ හෝ අඹුදරුවන්ගේ හෝ ජීවිත ආරක්‍ෂාවට මේ වස්තුව පැහැරනොගෙණ ජීවත්විය නොහැකියයි සිතා පෙරමෙන්ම අනුන්ගේ මෙහෙයුම් රහිතව පැහැරගන්නාකල්හි සොමනස්සසහගත දිට්ඨිගත විප්පයුත්ත අකුශල චිත්තය උපදී. ඒ වස්තුව අනුන්ගේ මෙහෙයීමෙන් පැහැරගන්නාකල්හි සසඞ්ඛාරික චිත්තය උපදී. මේ සතරස්ථාන යෙහිම ඒ අනුන් සන්තක වස්තුව අප්‍රණීතවීනම් උපෙක්‍ෂා සහ ගතවෙයි. අනුන්ගේ මෙහෙයීමක් ඇතිකල්හි සසඞ්ඛාරිකවෙයි. මෙසේ ඒ ලොභ මූලික චිත්තයෝ අටදෙන අවබොධකොට දෙමනස්සසහගත පටිඝසම්ප්‍රයුක්ත චිත්තයද, ලොභසහගත චිත්තයට හීනයින් යොදගතයුතුයි. දොම්නස් පටිඝදෙදෙනා ඒකාන්ත සහචාරී ධර්මවනහෙයින් දෙමනස්සය හෝ ප්‍රතිඝය හෝ යෙදූකල්හි අනික් ධර්මය අත්නොහැර පවත්නාහෙයින්

අභිමතාර්ථය ලැබේ. එසේවීනම් කුමක්හෙයින් මේ පාඨය යෙදූයේදැයි ප්‍රශ්නයක් වෙයි. ඊට පරිහාරනම්:—සියලු චිත්තයන්ගේ වේදනාභෙද දැක්වීම උපලක්ෂණ බැවින් හෙවත් සිත් ඇඳිනීමට කාරණයක්වන බැවින් “දොමනස්සසහගත” පදය හා “පටිඝසම්පයුත්ත, පදයද යොදනලද්දේයයි. ඒ දෞර්මනස් පටිඝදෙදෙනාගේ ඉපදීමට හෙතුහු කවරහුයත්? තමන්ට නොකැමති යම් අරමුණක්ලැබීමය, නවප්‍රකාර ආඝාතවස්තූන්ගෙන් යම් වස්තුවක් හා ගැටීමය යන කාරණාවයෙන් මේ චිත්තය උපදනේයි. ඒ නවවිධ ආඝාත වස්තුහුනම්:- තමා නිසා තුණෙක, තමාගේ හිත මිත්‍රයන් නිසා තුණෙක, තමාගේ සතුරන් නිසා තුණෙකැයි, මෙසේ නවයක් වෙත්. තමානිසාවන්නාවූ ආඝාතවස්තුහු තුණනම්:-මේ තෙමේ අතීතජාතියෙහිත් මට නිග්‍රහා කෙළේය අනභිවෘද්ධියක් කෙළේය, දැනුදු එසේ කරයි. මතුමත්තෙහිත් එසේමකරණවා ඇතැයි මෙසේ ආඝාතවස්තු තුණක්වෙති. මේ තෙමේ මාගේ හිතමිත්‍රයන්ට ජාතිජාතියෙහි නිග්‍රහා කෙළේය, අනභිවෘද්ධියක් කෙළේය, දැනුදු එසේම කරයි. මතුමත් තෙහිත් එසේම කරණවාඇතැයි මෙසේ ආඝාත වස්තුතුණෙක, මේ තෙමේ මාගේ සතුරාට අතීතජාතියෙහිත් සතුති ප්‍රශංසා කෙළේය, අභිවෘද්ධියක්කෙළේය, දැනුදු එසේම කරයි, මතුමත් තෙහිත් එසේම කරණවාඇතැයි මෙසේ ආඝාත වස්තු තුණෙකැයි නවාඝාතවස්තුහු වෙත්. අසඞ්ඛාරික සසඞ්ඛාරිකයට කියන නයින් “ඉමානිවෙපි” යන තන්හි “පි” ශබ්දයෙන් මෙහි නොකී අනන්ත ප්‍රමාණ අකුශල චිත්තයන් සම්පිණ්ඩනය කෙරේ ඒ කෙසේ සම්පිණ්ඩනකරන්නේද යත්? මේ දෞර්මනස්සහගත දෙසිත ප්‍රාණඝාත ඵරුෂ වචන, ව්‍යාපාද, යන කර්ම පථත්‍රයෙහි පවත්නා බැවින් තුණින් ගුණිතවේ. ඒ තුණින් ගුණිතකළ සඞ්ඛ්‍යාව අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙන් ගිණියයුතුවෙයි. ඉක්බිති ඒ ගුණිතකළ සඞ්ඛ්‍යාව ස්වසන්තාන පරසන්තාන වශයෙන් පවත්නා හෙයින් දෙකින් ගිණියයුතුයි. නැවත ඒ ගුණිත කළ සඞ්ඛ්‍යාව රූපාදී ෂාරමුණු වශයෙන් පවත්නා හෙයින් සයින් ගිණියයුතුයි. ඒ ගුණිතකළ සඞ්ඛ්‍යාව නගර ජනපදවශයෙන් පවත්නාහෙයින් දෙකින් ගිණියයුතුයි. මේ ගුණිතකළ චිත්තයන් අතුරෙන් එක් සත්ත්වයෙක්හට අනාදිමත් සංසාරයෙහි උපන්නාවූ අතීතවූ චිත්තයන්ට සතරමහ සාගරජලය අබපියල්ලකින් මැන්නේද මහාපෘථිවියෙහි සියලු පස අබඇට ප්‍රමාණ ගුලිකෙළේද අතීතවූ දෞර්මනස් සහගත චිත්තයන්ට උපමානොවෙයි. මෙසේ අනන්ත අපරිමාණ දෞ

මූලික චිත්තයන් “පි” ශබ්දයෙන් සංග්‍රහ කෙරේ. උපෙක්ෂා සහගත අකුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් දොළොස්වන චිත්තය පමණක් සර්වාකුශල සාධාරණ උද්ධච්චයෙන් කුමක් හෙයින් වෙසෙසා වදාළේද යත්? ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි වනාහි සෙසු එකොළොස් චිත්තයෙහි මේ උද්ධච්චය අප්‍රධාන බැවින් “යංවාපනකාකුසලමපි” යන වචනයට ඇතුලත්කොට යෙවාපනක දෙශනාවශයෙන් වදාළේය. මේදොළොස්වන චිත්තයෙහිම “තස්මිං සමයෙ-පෙ-උද්ධච්චං උප්පජ්ජති” යනුවෙ සරූපදෙශනාවෙන් වදාරණලද්දේය. මෙසේ දොළොස්වන චිත්තයෙහිම උද්ධච්චය බලවත් බැවින් ප්‍රධාන බැවින් “උද්ධච්ච සම්පයුත්තං” යනුවෙන් අනුරුද්ධාචාරීන් විසින් මෙසේකොට දක්වනලදී. මේ ප්‍රකරණයෙහි වනාහි විස්තර රුචික මන්දප්‍රාඥ පුද්ගලයන් සඳහා “සොමනස්ස සහගතං” යනාදී පාඨයෙන් දොළොස් අකුශල චිත්තයන්ගේ විස්තර කථාව දක්වා සංක්ෂෙප රුචික තීක්ෂ්ණ ප්‍රාඥපුද්ගලයන් සඳහා ඒ දොළොස් චිත්තය හකුළුවා “අට්ඨධා ලොභමූලානි” යනාදී ගාථාව දක්වනලද්දේයයි දතයුතුයි. ඒ දොළොස් අකුශල චිත්තයෝනම් කවරහයත්? සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික එක්චිත්තයෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික එක් චිත්තයෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික එක්චිත්තයෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛාසහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික එක් චිත්තයෙක්දැයි මෙසේ සොම්නස් සහගත සතරෙක, උපෙක්ෂාසහගත සතරෙකැයි ලොභ මූලික චිත්තයෝ අටදෙනෙක් වෙති. දොම්නස්සහගත පටිඝසම්පයුත්ත අසංඛාරික චිත්තයෙක, දොම්නස් සහගත පටිඝසම්පයුත්ත සසංඛාරික චිත්තයෙක්දැයි මෙසේ ද්වෙෂ මූලික චිත්තයෝ දෙදෙනෙක් වෙති. උපෙක්ෂාසහගත විචිකිච්ඡාසම්ප්‍රයුක්ත එක්සිතෙක, උපෙක්ෂාසහගත උද්ධච්චසම්ප්‍රයුක්ත එක් සිතෙක්දැයි මෙසේ මෝහ මූලික චිත්තයෝ දෙදෙනෙක් වෙති. එහෙයින් අභිධර්මාර්ථ සංග්‍රහයෙහි “අට්ඨධා ලොභමූලානි” යනාදී සංග්‍රහ ගාථාව දක්වනලදී. ඒ ගාථායෙහි අභිප්‍රාය මෙසේයි:-ලොභ මූලික චිත්තයෝ තුමූ සොමනස්ස වෙදනා සහගත සතරෙක, උපෙක්ෂා වෙදනාසහගත සතරෙකැයි යන අටදෙනාගේවශයෙන්ද, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සතරෙන, දිට්ඨි

ගත විප්‍රයුක්ත සතරෙකැයි යන අටදෙනාගේ වශයෙන්ද, අසඞ්ඛාරික සතරෙක, සසඞ්ඛාරික සතරෙකැයි යන අට දෙනාගේවශයෙන්දැයි මෙසේ ත්‍රිවිධාකාරයකින්ම අටවැදෑරුම් වෙත්. ද්වෙෂ මූලික චිත්තයෝ තුමූ අසඞ්ඛාරික එකෙක, සසඞ්ඛාරික එකෙකැයි යනදෙදෙනාගේවශයෙන් දෙවැදෑරුම් වෙත්. මොහමූලික චිත්තයෝ තුමූ විචිකිච්ඡාසම්ප්‍රයුක්ත එකෙක, උද්ධච්චසම්ප්‍රයුක්ත එකෙකැයි යන දෙදෙනාගේවශයෙන් දෙවැදෑරුම් වෙත්, මේ දොළොස් චිත්තයන් අතුරෙන් ලොභ ද්වෙෂ මූලික චිත්තයෝ දසදෙන කායකර්ම වචිකර්මවශයෙන් පවත්නා හෙයින් දශාකුශල කර්මාදිවශයෙන් අනෙක ප්‍රකාර වෙති. මොහ මූලික චිත්තයෝ දෙදෙන කායකර්ම වචීකර්මවශයෙන් නොප වත්නාහෙයින් සුද්ධමනොද්වාරිකනම වෙති. ඔවුන් අතුරෙන් විචිකිච්ඡා සම්ප්‍රයුක්ත චිත්තය ෂොඩෂවිධ කාංක්‍ෂාවශයෙන් පවත්නා හෙයින් සොළොස් වැදෑරුම් වෙත්. ඒ මොහමූලික චිත්තයෝ දෙදෙනවහාහි සවභාවයෙන් තීක්‍ෂණව නොපවත්නාහෙයින් අසඞ්ඛාරිකයයිද නොකියයුතුයි. උත්සාහකටයුතු නොවන හෙයින් සසඞ්ඛාරිකයයිද නොකියයුතුයි. එහෙයින් ටීකායෙහි "තෙසං එවච සභාවතික්ඛතාය උස්සාහෙතබ්බතාය අභාවතො සඞ්ඛාරභෙදොපි තෙසං නත්ථි" යනු කියනලදී.

**මේ දොළොස් අකුශල චිත්තයන්ගේ ස්වරූප විභාගයයි.**

---

## පදගතාර්ථ.

උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂා වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට පැමිණියාවූ; චක්ඛුවිඤ්ඤාණංච, චක්‍ෂුර්විඥාන චිත්තයෙක්ද; මෙහි නිගමන යෙහි,, "ච" ශබ්දය සිංහාවලොකනන්‍යායෙන් ප්‍රථම පදාදියෙහිද යෙදෙත්; තථා, එපරිද්දෙන්, සොතවිඤ්ඤාණංච, ශ්‍රොත්‍ර විඥානචිත්තයෙක්ද; ඝාණවිඤ්ඤාණංච, ඝ්‍රාණවිඥාන චිත්තයෙක්ද; ජිව්හාවිඤ්ඤාණංච; ජිව්හාවිඥාන චිත්තයෙක්ද; දුක්ඛසහගතං දුක්ඛවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදී බවටගියාවූ; කායවිඤ්ඤාණංච, කායවිඥානචිත්ත යෙක්ද;උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාවෙදනාව හා එකොත්පාදදී වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; සම්පටිච්ඡන චිත්තංච, අරමුණු පිළිගැනීම් වශයෙන් පවත්නාසම්ප්‍රතීච්ඡන චිත්තයෙක්ද; උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂාවෙදනාව හා

එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදී බවට ගියාවූ; සන්තීරණ චිත්තංච, අරමුණුතීරණය කරගැණීම්වශයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මෙකීය තලද ප්‍රභෙදයෙන්ද; සත්තාපි, සත්දෙනෙක් ප්‍රභෙදවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; අකුශල විපාක චිත්තානිනාම, අකුශල විපාක චිත්තයෝ නම්වූවාහු; හොන්ති, වෙත්. උපෙක්ඛා සහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; කුසල විපාකං, කාමාවචර කුශලයන්ගේ විපාකවූ; චක්ඛුවිඤ්ඤාණංච, චක්ෂුර්විඥාන චිත්තයෙක්ද; තථා, එපරිද්දෙන්; සොතවිඤ්ඤාණංච, ශ්‍රොත්‍ර විඥාන චිත්තයෙක්ද; ඝාණවිඤ්ඤාණංච, ඝ්‍රාණවිඥාන චිත්තයෙක්ද; ජිව්හාවිඤ්ඤාණංච, ජිව්හාවිඥාන චිත්තයෙක්ද, සුඛසහගතං,සුඛවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; කායවිඤ්ඤාණංච; කායවිඥානචිත්තයෙක්ද; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ; නොහොත් එකොත්පාදදීබවට ගියාවූ: සම්පටිච්ඡන චිත්තංච, අරමුණුපිළිගන්නා ආකාරයෙන් පවත්නා සම්ප්‍රත්‍යෙෂණ චිත්තයෙක්ද: සොමනස්ස සහගතං, සොමනස්ස වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; සන්තීරණ චිත්තංච, අරමුණුතීරණයකරගන්නා ආකාරයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද, උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදී වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ සන්තීරණ චිත්තංච, අරමුණු තීරණයකරගන්නාවූ ආකාරයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද; ඉති ඉමිනා පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අට්ඨපි, අෂ්ටප්‍රකාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; කුසල විපාක අහෙතුක චිත්තානි නාම, කුශල විපාක අහෙතුක චිත්තයෝනම්වූවාහු; හොන්ති, වෙත්. උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; පඤ්චද්වාරාවජ්ජන චිත්තංච, චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි රූපාදී ආලම්බණයන් ආවර්ජනාකරන්නාවූ පඤ්චද්වාරාවර්ජනනම් චිත්තයෙක්ද; තථා, එපරිද්දෙන්; මනොද්වාරාවජ්ජන චිත්තංච; පඤ්චද්වාරයෙහි වැටහුනාවූ ඒ අරමුණු නැවත මනොද්වාරයෙන් ආවර්ජනාකිරීම් වශයෙන් පවත්නාවූ වොත්ථපනයත පරනාමධෙයකින් යුක්තවූ මනොද්වාරාවර්ජනනම් චිත්තයෙක්ද; සොමනස්සසහගතං, සොම්නස්වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ;

හසිතුප්පාද චිත්තච, රහතුන්ට අනෞලාරික අරමුණෙහි සිනා උපදවන්නාවූ හසිතුප්පාදනම් චිත්තයෙක්ද; ඉති ඉමිනා පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; තීණිපි, තුන්වැදැරුම්වූද, ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ, අහෙතුක ක්‍රියා චිත්තානි නාම, සම්ප්‍රයුක්ත හෙතු රහිත බැවින් අහෙතුක ක්‍රියා චිත්තයෝනම්වූවාහු; හොන්ති, වෙත්. ඉච්චෙවං ඉති එවං යථාවුත්තනයෙන, මෙසේ මේකියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, අකුශල විපාකය, කුශල විපාකය, ක්‍රියාය යන සර්වප්‍රකාරයෙන්ද, අඨාරස, අටළොස් වැදැරුම්වූ; අහෙතුක චිත්තානි, අහෙතුක චිත්තයෝ තුමූ; සමත්තානි, සමාප්තකරණලද්දැහුය. නොහොත් අඨාරස, අටළොස් ප්‍රකාරවූ; අහෙතුක චිත්තානි, අහෙතුක චිත්තයෝ; සමත්තානි, සංක්ෂෙපයෙන් සංග්‍රහකොටගන්නාලද්දැහුය. අකුසලපාකානි, අකුශල විපාක චිත්තයෝ තුමූ; චක්ඛාදිනිස්සය සම්පටිච්ඡනාදි කිච්චභෙදතො, චක්ෂුරාදී නිශ්‍රය සම්ප්‍රත්‍යෙෂණාදී කෘත්‍යය යන මොවුන්ගේ ප්‍රභෙදයෙන්; සත්තසියුං, සත්දෙයෙක්වෙති. පුඤ්ඤපාකානි, අහෙතුක කුසල විපාක චිත්තයෝ තුමූ; චක්ඛාදිනිස්සය සම්පටිච්ඡනාදි කිච්චභෙදතො, චක්ෂුරාදී නිශ්‍රයන්ගේද, සම්ප්‍රත්‍යෙෂණාදී කෘත්‍යයන්ගේද, ප්‍රභෙදවශයෙන්; අඨසියුං, අටදෙනෙක්වෙත්. අහෙතුක ක්‍රියා චිත්තානි; අහෙතුක ක්‍රියා චිත්තයෝ තුමූ; ආවජ්ජනාදි භෙදතො, ආවර්ජනාදී කෘත්‍ය භෙදවශයෙන්; තීණි සියුං, තුන්දෙනෙක්වෙති. ඉති, මෙසේ "අහෙතුකා, අහෙතුක භූතානි, අහෙතුකවූ: චිත්තානි, චිත්තයෝ තුමූ; අඨාරස, අඨාරස එවසියුං, අටළොස්දෙනෙක්ම වෙති. තතො, ඒ අටළොසින්; ඌනාධිකානි, ඌනාධිකවූවාහු; නසියුං, නොවෙත්.

## මෙහි භාවය.

මේ අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් අකුශල විපාකයෝ සත්දෙන අහෙතුක ශබ්දයෙන් නොවෙසෙසා "සත්තාපි අකුශල විපාක චිත්තානිනාම" යනුවෙන් සංක්ෂෙපයෙන් දක්වා කුශල විපාක නිගමනයෙහි හා ක්‍රියානිගමනයෙහිද, "ඉමානි අඨපි කුසල විපාකා හෙතුකචිත්තානී නාම" ඉමානි තීනිපි අහෙතුක ක්‍රියා චිත්තානි නාම" යනුවෙන් අහෙතුක ශබ්දයෙන් කුමක්හෙයින් වෙසෙසකලද්දේද යත්? අකුශලවිපාකයෝ වනාහි එකාන්ත අහෙතුකමවෙති. එහෙයින් අකුශල විපාකයන්ගේ සහෙතුක විපාක ඇත්තේදෝයි ව්‍යභිචාරය නැත්තේයි. කුශල විපාකයන්ගේ හා ක්‍රියාවන්ගේද සහෙ

තුක විපාකය, සහෙතුක ක්‍රියාය යන භෙදය ඇත්තේවෙයි. එහෙයින් කුශල විපාක ක්‍රියාවන්ගේ අහෙතුකදෝහෝයි සහෙතුකදෝහෝයි ව්‍යභිචාරය ඇතිවේ. "සති හි සම්භවෙ ව්‍යභිචාරෙ විශෙෂණං සාත්‍ථකංසියා" යනුන්‍යාය බැවින් ව්‍යභිචාරය ඇත්තාවූ කුශල විපාක ක්‍රියාවන් හා අහෙතුක යන විශෙෂණයකොළේයයි දතයුතු. යට දක්වනලද දොළොස් අකුශලයන් අතුරෙන් එකෙකි අකුශල චිත්තයට පටිසන්ධි ප්‍රවෘත්ති විපාකවශයෙන් මේ අකුශල විපාකයෝ සත් දෙනම ලැබෙත්. ඒ කෙසේ ලැබෙන්නේද යත්? දොළොස් අකුශලයන් අතුරෙන් යම්කිසි අකුශලකර්මයක් රැස්කළාවූ සත්‍වයාගේ මරණින් මත්තෙහි නරකතිර්යග්‍යොනි ප්‍රෙත අසුර නිකායයි කියනලද්දාවූ සතර අපායෙන් යම් අපායකපටිසන්ධිය ගන්නේවීනම් මේ සප්තාකුශල විපාකයන්කෙරෙන් අවසානයෙහි කී උපෙක්ඛාසන්තීරණ චිත්තයෙන් පටිසන්ධිය ලැබ ඒ භවයෙහි වසනතාක්කල් එම චිත්තයම භවාඞ්ගවශයෙන් ඉපිද ඒභවයෙන් චුතවන්නාවූකල්හි එම චිත්තයම චුතිවශයෙන් ඉපිද නිරුද්ධවේ. ඒ සත්‍වයා අපායෙහි වසනතාක්කල් මුලුල්ලෙහි ලැබෙන්නාවූ නොකැමතිවූ රූපාදී අරමුණු පස හෙතුකොටගෙණ ඒ විපාක චිත්තයෝ සත්දෙනම ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදිත්. සතරඅපායෙහි ගණන පථාතික්‍රාන්තවූ නොයෙක් සත්‍වයන්ගේ පටිසන්ධිය මේ උපෙක්ඛාසන්තීරණයෙන් හටගන්නා බැවින් ඒ සියලු සත්‍වයෝම එක්කොට "නානත්තකායා එකත්තසඤ්ඤී"යයි ව්‍යවහාර කෙරෙත්. නොහොත් නානාප්‍රකාර ශරීර ඇත්තාවූ එකම චිත්තයකින් පටිසන්ධිගන්නා සත්‍වයෝයයි කියත්. මෙහි "චක්ඛුවිඤ්ඤාණං" යන්නට අනතුරුව යොදනලද්දාවූ 'තථා" ශබ්දයෙන් දර්ශන කෘත්‍යය ඇත්තාවූ ශ්‍රොතවිඥානාදිහුයයි අර්‍ථගන්නාලැබේද යත්? එසේ අර්‍ථනොගතයුතුයි."උපෙක්ඛාසහගතං" යන පාඨය පමණක් සොතවිඤ්ඤාණාදීයෙහිද යෙදෙන බව දතයුතුයි. එහෙයින් ටීකායෙහි "තථාතිඉමිනා උපෙක්ඛාසහගත භාවං අතිදිසති" යනුකීහ. කුශල විපාකවාරයෙහි යොදනලද්දාවූ තථා ශබ්දය උපෙක්ඛාසහගතං කුසල විපාකං" යන දෙපදයම "සොතවිඤ්ඤාණං" යනාදීයෙහිත් අතිදෙශය කෙරෙයි. ක්‍රියාවාරයෙහි දක්වනලද්දාවූ තථා ශබ්දයෙන් උපෙක්ඛාසහගත භාවමාත්‍රයක් අතිදෙශ කෙරෙයි. මෙසේ මේ තුන් තන්හි යොදනලද්දාවූ "තථා"ශබ්දයෝ තුන්දෙන ත්‍රිප්‍රකාරවූ අර්‍ථයක්ම අතිදෙශකරණ බව සැලකියයුතුයි. කුශල විපාකවූ චක්ඛු විඤ්ඤාණාදී අටදෙන ව්‍යාභි

ත්‍රිහෙතුක උත්කෘෂ්ටය, ත්‍රිහෙතුක ලාමකය, ද්විහෙතුක උත්කෘෂ්ටය, ද්විහෙතුක ලාමකය,යි යන සිව් වැදෑරුම් කාමාවචර කුශලයන්ගේම සාධාරණ විපාකයයි දතයුතුය. ඔවුන් අතුරෙන් දානානිශංස නොදන්න මිථ්‍යාවෙන් උපයනලද්දාවූ වස්තූන් ගෙන් දුශ්ශීලයන් විෂයෙහි දෙනලද්දාවූ දානාදීවූ ද්විහෙතුක ලාමක කුශලකර්මයන්ගේ බලයෙන් මේ මනුෂ්‍ය භූමියෙහිම ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිමූග ජාතිපණ්ඩක පීඨසප්පි ආදීවූ අඟ විකල සත්වයන්ගේ හා සම්පූර්ණ අවයව ඇත්තාවූ වැදි කෙවුල් චණ්ඩාලාදී හීන සත්වයන්ගේද, අනුන්ට බැලමෙහෙකොට ජීවත් වන්නාවූ කාලකණ්ණි මනුෂ්‍යයන්ගේද, විනිපාතික අසුරසඞ්ඛ්‍යාතවූ ක්ෂුතිප්‍රෙත මලයකුන්ගේද, පටිසන්ධිය මේ අහෙතුක විපාකයන් අටදෙනා අතුරෙන් උපෙක්ඛාසහගත සන්තීරණ චිත්තයෙන්ම ලැබේ. සතරාකාරවූ, කාමාවචර කුශලකර්මයන්ටම ප්‍රවෘත්ති විපාකවශයෙන් මේ විපාක අටම ලැබේ. ත්‍රිහෙතුක උත්කෘෂ්ට, ත්‍රිහෙතුක ලාමක, ද්විහෙතුක උත්කෘෂ්ට, යන මේ ත්‍රිවිධ කාමාවචර කුශලකර්මයන්ට විපාක හා විපාක ආනිශංසයෝද ඇත්තාහුයි. විපාක ආනිශංසයෝ නම්:- ගම් බිම් කෙත්වත් රන්රිදී මුතු මැණික් ආදීවූ උපභොග පරිභොග සම්පත් යනාදියයි. යටකී දුගති අහෙතුක විපාකයට හා සුගති අහෙතුක විපාකයටද විපාක ආනිශංස නැත්තේමැයි. එහෙයින් මේ විපාකවශයෙන් පටිසන්ධිගත්තාවූ ආපායික සත්වයන්ට හා සුගති අහෙතුක නීචසත්වයන්ටද රන්රිදී මුතු මැණික් ආදීවූ උපභොග පරිභොග සම්පත් නොලැබෙන්නේමැයි. චක්ෂුරාදී සතරඋභය විපාකයෝ දුක්ඛ සුඛ සහගතනොවී කුමක්හෙයින් උපෙක්ඛා සහගතමවූවාහුද යත්? චක්ඛු, සොත, ඝාණ ජිව්හා, යන සතර උභය විපාකවිඤ්ඤාණයන්ට නිශ්‍රයස්ථානවූ චක්ෂුරාදී ප්‍රසාදයෝ සතරදෙනද, ඔවුන්ට ගොචරවන්නාවූ, රූපාදී ආලම්බණයෝ සතරදෙනද, සතරමහාභූතයන් නිසා පවත්නා උපාදාරූපයෝ අටදෙනෙක්මැයි. ඒ උපාදාරූපයෙන් උපාදාරූපයගැටීම පුළුන් පිඩකින් පුළුන් පිඩක් ගැටීමක්මෙන් ඉතාසෙමින් ගැටෙයි. ඒ ගැටීම කාරණකොටගෙණ දුක්වේදනාවක් හෝ සැප වේදනාවක් හෝ නොවියයුතුයි. එහෙයින් මේ උභයවිපාකයෝ සතරදෙන උපෙක්ඛාසහගතවෙති. එසේවීනම් කායවිඤ්ඤාණයෝ දෙදෙන උපෙක්ඛාසහගතනොවී අකුශල පක්ෂයෙහි දුක්ඛවේදනාව හා කුශලපක්ෂයෙහි සුඛවේදනාවත් කුමක්හෙයින් වන්නේදයත්? කායප්‍රසාදයට නිශ්‍රයස්ථානවූ සසම්භාර කායසඞ්ඛ්‍යාතවූ මේ ශරීරය සතරමහාභූතයන්ගේම සමූහයක්වෙයි. තදාලම්බණවූ ස්පර්ශය ආපොධාතු වර්ජිතකොට ඇත්තාවූ භූතත්‍රයක්ම වෙයි.

කිණිහිරක් පිට පුළුන් පිඩක් තබා යකුළකින් පහලකල්හි පුළුන් පිඩ විනිවිදගෙණගොස් යකුළ කිණිහිරේ හැපේද, එපරිද්දෙන්ම ආපොධාතු වර්ජිත භූතත්‍රය සංඛ්‍යාත සපර්ශනාමති යකුළ සසම්භාර කාය සංඛ්‍යාතවූ ශරීර නැමති කිණිහිරට හැපෙනකල්හි කායප්‍රසාද සංඛ්‍යාතවූ පුළුන් පිඩ විනිවිදගෙණගොස් සසම්භාරකායෙහිම හැපිසිටීද, එපරිද්දෙන්ම අකුශල පක්ෂයෙහි දුක්සහගතවූද, කුශලපක්ෂයෙහි සුඛසහගතවූද කායවිඥානය උපදනේයයි දතයුතුයි අකුශල විපාකයෝ සත්දෙනහට අනිෂ්ටවූ නොහොත් නොකැමැතිවූ අරමුණක්ම අරමුණුවෙයි. කුශලවිපාක අටදෙනාහට ඉෂ්ටවූ නොහොත් කැමතිවූ අරමුණක්ම අරමුණුවෙයි මේ ඉෂ්ටානිෂ්ටයවෙන්කිරීමද සංඥාවිපල්ලාස චිත්ත විපල්ලාසයන්ගෙන් ඉෂ්ටවූ අරමුණත් අනිෂ්ටවෙයි. අනිෂ්ටවූ අරමුණත් ඉෂ්ටවෙයි. ඒ කෙසේයත්? ගෙරිකුණු අසුචි ආදී අපවිත්‍රය ප්‍රකෘතියෙන් අනිෂ්ටවූවද ඔවුන්ගේ සංඥාවිපල්ලාස වශයෙන් පෙරළී ඉෂ්ටාලම්බණ වශයෙන් වැටහී කුශල විපාක චක්ඛු විඥාණාදිය උපදී. ප්‍රකෘතියෙන් ඉෂ්ටාලම්බණවූ බුද්ධරූපාදිය ඔවුන්ගේ චිත්තවිපල්ලාස වශයෙන් පෙරළී අනිෂ්ටාලම්බණවශයෙන් වැටහී අකුශල විපාක චක්ඛුවිඥාණාදිය උපදී. එහෙයින් මේ ඉෂ්ටානිෂ්ටාලම්බණ වෙන්කිරීම මධ්‍යස්ථ සත්වයන්ගේවශයෙන් දතයුතුයි. ඒ ඉෂ්ටාලම්බණයද එක්වාරයකට ඉෂ්ටාලම්බණව අනික් වාරයකට අනිෂ්ටාලම්බණවන්නාවූ අරමුණුද ඇතිවෙයි. ඒ කෙසේදයත්? රන්රිදී මුතුමැණික් ආදියෙන් කරණලද්දාවූ කඩු දුනු තුවක්කු ආදී ආයුධයෝ චක්ෂුවාරයට ඉෂ්ටාලම්බණවශයෙන් වැටහී කායවාරයට අනිෂ්ටාලම්බණවශයෙන් වැටහේ. ඉතා සියුම්වූ අසුචි ආදී ද්‍රව්‍යය කායවාරයට ඉෂ්ටාලම්බණ වශයෙන් වැටහී ඝ්‍රාණවාරයට අනිෂ්ටාලම්බණවශයෙන් වැටහේ. ඊට උපමා කවරයත්? පෘථග්ජනයෙක්හට අසුචි මලමූත්‍රාදිය චක්ෂුවාරයට හමුවූකල්හි අකුශල විපාක චක්ෂුර්විඥානය උපදී. ඊට අනතුරුව ද්වෙෂමූලික ජවන් උපදී. ඒ අසුචි මලමූත්‍රාදිය සුනඛ සූකරාදීන්ට හමුවූකල්හි කුශල විපාක චක්ඛුවිඥාණය උපදී. ඊට අනතුරුව ලොභ සහගත ජවන් උපදී. යම්කිසි පෘථග්ජනයෙක්හට ඒ අසුචි දර්ශනයෙන් මාගේ ශරීරාභ්‍යන්තරයෙහිත් මෙබඳු අසුචි ඇත්තේය. එහෙයින් මාගේ ශරීරය පිළිකුල්යයි මෙනෙහිකොට හැකිවේනම් කාමාවචර කුශල් ජවන් උපදී. බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ මහරහතුන්ට ඒ අසුචි දර්ශනයෙන් අකුශල විපාක චක්ඛු

විඤ්ඤාණයම ඉපද කාමාවචර මහාක්‍රියාජවන් උපදී. ඒ රහතුන්ට චෛෂමූලික ලෝභ මූලික ජවන් හෝ කාමාවචර කුශල් හෝ නූප දිත්. එහෙයින් ජවනයන්ගේ නියමකිරීම මේ විපාකයෙන් වියයුතුයි. මේ චක්ෂුරාදී පංචවිඤ්ඤාණයන්ගේ ඉපදීමට හෙතු කවරයත්? චක්ෂුප්‍රසාදයාගේ නොපිරිහීමය, රූපාලම්බණයක් හමුබවට පැමිණීමය. ආලෝකයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යයලැබීමය, මනසකාර හෙතුය යනමේ සතරකාරණයන්ගේ එක්වීමෙන්ම සසම්ප්‍රයුක්ත චක්ෂුර්විඥානය උපදී. එහෙයින් කීහ. අභිධර්මාව තාරයෙහි:—

අසම්මොහදෙන චක්ඛුස්ස රූපාපාථ ගමේනච
ආලෝකනිස්සයෙනාපි සමනක්කාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ චක්ඛුවිඤ්ඤාණං සමපයුතෙතහිතං සහ.

— ·o— —

## ශ්‍රොත විඥානය ඉපදීමට හෙතුහු කවරයත්?

ශ්‍රොත ප්‍රසාදයාගේ නොපිරිහීමය, ශබ්දාලම්බණයක් හමු බවට පැමිණීමය, කණිච්ඡිද්‍රයෙහි විවරාකාශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය යනමේ හෙතුන් සතරදෙන එක්වූකල්හි සසම්ප්‍රයුක්ත ශ්‍රොත විඥාන චිත්තය උපදී. එසින් කීහ:—

අසම්මොහදෙන සොතස්ස සද්දාපාථගමෙනච
ආකාසනිස්සයෙනාපි සමනක්කාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ සොත විඤ්ඤාණං සම්පයුතෙතහිතංසහ.

— —o— —

## ඝ්‍රාණ විඥාණය ඉපදීමට හෙතුහු කවරයත්?

ඝ්‍රාණ ප්‍රසාදයාගේ නොපිරිහීමය, ගන්ධාලම්බණයක් හමු වීමය, නාසිකාච්ඡිද්‍රයෙන් වැදගන්නාවූ වායොධාතුහුගේ උප නිශ්‍රයලැබීමය මනසකාරය යනමේ හෙතුන් සතරදෙනාගේඑක්වී මෙන් සසම්ප්‍රයුක්තවූ ඝ්‍රාණවිඥාන චිත්තය උපදී. එසින් කීහ:—

අසම්මොහදෙන ඝාණස්ස ගන්ධාපාථගමෙනච
වායොසන්නිස්සයෙනාපි සමනක්කාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ ඝාණ විඤ්ඤාණං සම්පයුතෙතහිතංසහ.

——o——

## ජිව්හා විඤ්ඤාණය ඉපදීමට හෙතු කවරයත්?

ජිහ්වාප්‍රසාදයාගේ නොපිරිහීමය, රසාලම්බණයක් හමුවීමය, මුඛගත බෙලසඞ්ඛ්‍යාතවූ ආපොධාතුහුගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය යනමේ හෙතුන් සතරදෙනාගේ එක්වීමක් ඇතිකල්හි සසම්ප්‍රයුක්තවූ ජිහ්වාවිඥානය උපදී. එහෙයින් කීහ:—

අසම්මොහදෙන ජිව්හාය රසාපාථගමෙනච
ආපොසන්නිස්සයෙනාපි සමන්නාහාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතුහිපි
හොති ජිව්හාය විඤ්ඤාණං සම්පයුත්තෙහිතංසහ.

---

## කාය විඥානය ඉපදීමට හෙතු කවරයත්?

කාය ප්‍රසාදයාගේ නොපිරිහීමය, භූතත්‍රය සඞ්ඛ්‍යාතස්පර්ශය හමුවීමය, තමාගේ සසම්භාරකායෙහි පෘථුවී ධාතුහුගේ උපනිශ්‍රය ලැබීමය, මනසිකාරය යන මේ හෙතුන් සතරදෙනාගේ එක්වීමෙන් සසම්ප්‍රයුක්තවූ කාය විඥාන චිත්තය උපදී. මේ පචවිඥාන යන්ට කියනලද්දවූ සතර ප්‍රත්‍යයයන්ගෙන් එක එකක්වත් අඩුවූයේවීනම් විඥානය නූපදී. එහෙයින් කීහ:—

අසම්මොහදෙන කායස්ස ඵොට්ඨබ්බාපාථ සඞ්ගමා
පඨවීනිස්සයෙනාපි සමන්නාහාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතුහිපි
ජායතෙ කාය විඤ්ඤාණං සම්පයුත්තෙහිතංසහ.

---

හෘදය වස්තුව ආශ්‍රයකොටගෙණ පවත්නාවූ මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන්ගේ ඉපදීමට හෙතු කවරයත්? භවාඞ්ග චිත්තයාගේ නොපිරිහීමය, ධර්මාලම්බණයක් හමුවීමය, හෘදය වස්තුහුගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය, යනමේ හෙතූන් සතරදෙනාගේ එක්වීමක් ඇතිකල්හී සසම්ප්‍රයුක්තවූ මනො විඤ්ඤාණ ධාතුචිත්තය උපදී. එහෙයින් කීහ:-

අසම්මොහදෙ මනස්සාපි ධම්මාපාථගමෙනච
වත්ථුසන්නිස්සයෙනාපි සමන්නාහාර හෙතුනා.
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතුහිපි
මනොවිඤ්ඤාණ මෙවනතු සම්පයුතෙහි ජායතෙ සහ.

---

මෙහි "අඤ්ඤමෙහදෙ මනස්සාපි" යන තන්හි 'මනස්ස' යනු භවාඞ්ග චිත්තයයි [illegible] විසින් දතයුතුයි. චක්ෂුරාදී පඤ්චවිඥානයන්ගේ ඉපැදීමෙහි "සමනකකාරො" යන පදයෙන් පඤ්චද්වාරාවර්ජන ක්‍රියාචිත්තය දක්වනලදී. මනොවිඥාන ධාතුහුගේ උත්පත්තිය දක්වන තන්හි "සමනකකාර හෙතුනා" යන පදයෙන් මනොද්වාරාවර්ජන චිත්තයලැබේ. "චක්ඛුසන්නිස්සයෙන" යන පදය පඤ්චවොකාර භවයෙහි මුත් චතුවොකාර සඞ්ඛ්‍යාතවූ සතර අරූතලයෙහි නොලැබේ. එහෙයින් "චක්ඛුසන්නිස්සයෙන" යන පදය රූපය සමග හටගන්නාවූ පඤ්චවොකාර භවය සඳහාම දක්වනලදී. චතුවොකාර භවයෙහි ධර්මාලම්බනයක්හුගේ හමුබවට පැමිණීමය, භවාඞ්ගයාගේ නොපිරිහීමය, මනොද්වාරාවර්ජන සඞ්ඛ්‍යාතවූ මනස්කාරය යන ප්‍රත්‍යයන් තුන්දෙනාගේ එක්වීමක් ඇතිකල්හිම මනොවිඥාන ධාතුව උපදනේයි. එහෙයින් කීහ:—

මනොභවඞ්ග චිත්තන්ති වෙදිතබ්බං විභාවිනා
ආවජ්ජනං ක්‍රියා චිත්ත සමනකකාරොති සඤ්ඤිතං.
චක්ඛුසන්නිස්සයෙනාති නායං සබ්බත්ථ ගච්ඡති
භවන්තු පඤ්චවොකාරං සන්ධාය කථිතොපන.

මෙසේ සඞ්ඛාරයෙහි සත්තවිඥාන ධාතූන්ගේ හටගැණීම දතයුතුයි.

තදාලම්බණවන ක්‍රමය කෙසේ යත්? අනිෂ්ටාලම්බණයෙක් හමුවීනම් ජවන්කෙළවර අකුශල විපාක සන්තීරණ චිත්තය තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ටාලම්බණයක් හමුවූ කල්හී ජවන් කෙළවර අවශෙෂ තදාලම්බණ දසදෙනා අතුරෙන් එකක් තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ටාලම්බණය වනාහි අතිඉෂ්ටය, ඉෂ්ටමධ්‍යස්ථයයි දෙයාකාරවනහෙයින් අතිඉෂ්ටාලම්බණයක් හමුවීනම් ජවන් කෙළවර සොම්නස් සහගත මහාවිපාක සතරය සොම්නස් සහගත සන්තීරණය යන පස්දෙනා අතුරෙන් එක්තරා චිත්තයක් තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ටමධ්‍යස්ථාලම්බණයක් හමුවීනම් ජවන්කෙළවර උපෙක්ඛා සහගත මහාවිපාකයෝ සතරදෙනාය, උපෙක්ඛා සහගත කුශල විපාක සන්තීරණය, යන පස්දෙනා අතුරෙන් එක්තරා චිත්තයක් තදාලම්බනවශයෙන් උපදී. අතිඉෂ්ට ඉෂ්ටමධ්‍යස්ථ ආලම්බණයන්ට උදාහරණයක් නම්:—ජීවමානවූ සම්බුදුයන්වහන්සේගේ රූපය අතිඉෂ්ටාලම්බණයයි. සම්බුදුප්‍රතිමාව ඉෂ්ටමධ්‍යස්ථාලම්බණය. මේ ක්‍රමයෙන් අතිඉෂ්ට ඉෂ්ටමධ්‍යස්ථ සියලු අරමුණුවෙන්

කරගතයුතුයි. පඤ්චද්වාරාවර්ජනය යනු චක්ෂුරාදී පඤ්චද්වාරයන්ට ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ අරමුණු ගැටුණුකල්හි ස්වාධාරණවශයෙන් ඒ අරමුණු ආවර්ජනාකිරීම්වශයෙන් උපදනා අහේතුක ක්‍රියා චිත්තයයි. මනොද්වාරාවර්ජනය යනු මනොද්වාරයෙහි ගැටෙන්නාවූ ඉෂ්ට අනිෂ්ට සියලු අරමුණු ආවර්ජනාකිරීම්වශයෙන් උපදනා ක්‍රියා හෙතුක මනොවිඤ්ඤාණ ධාතු චිත්තයයි. ඒ චිත්තයම චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි සන්තීරණ ජවන චිත්තයන්ගේ මධ්‍යයෙහි අරමුණු නියමකරගැණීම් වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන චිත්තයයි ව්‍යවහාරකරත්. යම්සේ රජගෙයි දොර ආරක්ෂාකරන්නාවූ දෞවාරික තෙමේ ඒ ද්වාරය ආරක්ෂා කරණකල්හි දෞවාරිකයයි කියාද, ප්‍රත්‍යන්තයෙන් ගෙණෙන්නාවූ පුදපඬුරු ආදිය ඔහුම ඔසවාගෙණ රජගෙට යන්නාවූ කල්හි පඩිහාරයයි ඔහුට ව්‍යවහාර කරන්නාක්සේමන්ද මෙම චිත්තය මනොද්වාරයෙහි උපදනාකල්හි මනොද්වාරාවර්ජනනම් න්ද, පඤ්චද්වාරයෙහි අරමුණු නියමකරගැණීම්වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන නමින්ද, ව්‍යවහාරකොරෙත්. මේ චක්ඛු විඤ්ඤාණාදී දෙපස් විඤ්ඤාණයන් අතුරෙන් චක්ෂුර්විඥානය සර්පයෙකුට බඳු උපමා ඇත්තේවෙයි. කුමක්හෙයින යත්? සර්ප තෙමේ සුනුපිරියම් ආදිය කරණලද්දාවූ මට සිලුටු භූමිප්‍රදෙශාදියෙහි නොලැග තුඹස් රූස් සිදුරු ආදී සම්බාධස්ථානයෙහි සිත් අලවා වාසයකෙරේද, එසේම චක්ෂුර්විඥානයද මට සිලුටු භිත්තිආදියෙහි නොඇලී නොයෙක් මාලාකම් ලතාකර්මාන්තාදියෙන් විසිතුරුවූ ආකිණිස්ථානාදියෙක්හිම ඇලෙයි. සොත විඤ්ඤාණ තෙමේ කිඹුලෙකුට බඳු උපමා ඇත්තේවෙයි. කුමක් හෙයින යත්? කිඹුල් තෙමේ නොගැඹුරු දියෙහි හෝ දියපිට හෝ සිත් නොඅලවා අතිශයින් ගැඹුරුවූ දියෙහි ගල්සිදුරු ගල්බෙන් ආදියෙහිම සිත් අලවාවෙසේද, එපරිද්දෙන් සොත විඤ්ඤාණයද ශ්‍රොතබිලය ඇතුලත්හි සිහින් තඹවන් රොම යෙන් ගැවසීගත්තාවූ ඇඟිලි මුදුවකට බඳු සටහන් ඇත්තාවූ ශ්‍රොත ප්‍රසාදයෙහිම සිත් අලවා වෙසේ. ඝ්‍රාණ විඥාන තෙමේ උකුසුපක්ෂියෙකුට බඳු උපමා ඇත්තේවෙයි. කුමක්හෙයින යත්? උකුසු පක්ෂියා මේ පෘථිවියෙහි සිත් නොඅලවා ඉහල ආකාශ කුක්ෂියෙහිම වායො ධාතුවෙන් උපනිශ්‍රය ලැබ පියාසම මින් සිත් අලවා වෙසේ. එපරිද්දෙන් ඝ්‍රාණ විඥානයද නාසා බිලයට ඇතුල්ව වසන්නාවූ වායොධාතු උපනිශ්‍රය ලැබ සිත් අලවාවෙසේ. ජිව්හා විඤ්ඤාණයවනාහි ගෘහ සුනඛයෙකුට බඳු උපමා ඇත්තේවෙයි. ගෘහ සුනඛ තෙමේ කොට්ට මෙට්ට ඇඳ

ඇතිරිලි ආදියෙහි සයනයකරවූයේද, එහි නොඇලී උදුනක් සාරාවකගසා වැදහොත්කල්හිම සිත් ඇලෙයි. එපරිද්දෙන් ජිව්හාවිඤ්ඤාණයද සසම්භාර ජිව්හාවගේ මධ්‍යයෙහි තිලුපුල් මල්පෙති අගක් බඳුවූ ජිව්හාප්‍රසාදය පැතිරපවත්නා තන්හිම සිත් අලවාවෙසේ. කායවිඤ්ඤාණය වනාහි වන සුනඛයෙකුට නොහොත් සිවලෙකුට බඳු උපමා ඇත්තේවෙයි. ඒසිවල්තෙමේ ගම් ගෙවතු ආදියෙහි සිත් නොඅලවා අමුසොහොනටවැද මිනීමස් බුදිමින් මළසිරුරු පහසලබමින් වැදහොත්කල්හිම සිත් ඇලෙයි. එසේම කායවිඤ්ඤාණයද භූතත්‍රය සඞ්ඛ්‍යාතවූ ස්පර්ශාලම්බණ සඞ්ඛ්‍යාතවූ උපාදින්නකාය ස්පර්ශයෙහි ඇලීපවත්නේයි.
හසිතොත්පාද චිත්තය වනාහි බුදුන් රහතුන්ටම ෂට්ද්වාරයෙහිම සිනාපහළවනකල්හි උපදනේයයි කුමක්හෙයින් විශේෂකියන ලද්දේදැයි සිනා පහලකරන්නාවූ සිත් වනාහි තෙළෙස් දෙනෙක්වෙත්. ඒ තෙළෙස් චිත්තයෝ මෙහිකුමක්හෙයින් සංග්‍රහනොකළාහුද යත්? සිනාපහලකරන්නාවූ තෙළෙස් චිත්තයෝනම් සොම්නස්සහගත ලෝභ මූලික අකුශල් සතරය, සොම්නස් සහගත මහාකුශල් සතරය, සොම්නස් සහගත මහාක්‍රියා සතරය, මෙම හසිතොත්පාද චිත්තය, යන තෙළෙස් චිත්තයෝ සිනාපහලකරණ චිත්තයෝනම්වෙත්. ඔවුන් අතුරෙන් ලෝභ මූලික අකුශල චිත්තයෝ සතරය, මහාකුසල් සතරය යන චිත්තයෝ අටදෙන සියලු පෘථග්ජන සත්වයන්ට සිනාපහලකරන්නාවූ චිත්තයෝනම්වෙත්. සෝවාන් ශකෘදාගාමි අනාගාමි යන ශෛක්‍ෂ්‍ය පුද්ගලයන්ට දිට්ඨිවිප්‍රයුක්ත සොම්නස් සහගත අකුශල් සිත්දෙකින් හා සොම්නස් සහගත මහාකුශල්සතරින්ද සිනාපහල කෙරෙත්. සියලු රහතුන්ට හා පසේ බුදුවරයන්ටද සොම්නස් සහගත මහාක්‍රියා සතරින් හා මෙම හසිතොත්පාද චිත්තයෙන්ද සිනාපහලකෙරෙත්. ලොවුතුරා බුදුවරයන්ට වනාහි සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා දෙසිතෙන් සිනාපහලකෙරෙත්. මේ තෙළෙස් චිත්තයන් අතුරෙන් හසිතොත්පාද චිත්තය හැර අවශේෂ චිත්තයෝ තුමූ සිනාමාත්‍රයක්ම නොව අවශේෂ නොයෙක් ක්‍රියාවන්දකරවත්. මේ හසිතොත්පාද චිත්තය වනාහි පවවාරයෙහි රහතුන්ට සිනාපහළකිරීම්වශයෙන්ම උපදී. මේ චිත්තයෝ අන් ක්‍රියාවක්නොකොට හැකිවෙයි. එහෙයින් හසිතුප්පාද යන නාමය මෙම චිත්තයටම අයිතිවෙයි. සම්ප්‍රයුක්ත හෙතු රහිත බැවින් අහෙතුකාධිකාරයෙහි දක්වනලදී. රහතුන්ට පවවාරයෙහි කෙසේ සිනාපහල කෙරේදයත්? ප්‍රධන්විඝීයට සරුප්වූ ෂසහසූනක් දුවූයෙහි

මේ සෙනසුන විදශීනා භාවනාකරන්නවුන්ට යොග්‍යයයි චක්ෂු ද්වාරයෙහි සිනාපහලකිරීම්වශයෙන් උපදී. පෘථග්ජන භික්ෂූන්ගේ භණ්ඩභාජන ස්ථානයෙහි ඔසුන් අසුවූ කෙවුලූන්ගේ ශබ්දයක්මෙන් මගත්වූ උස්වූ ශබ්දය අසා අහෝ මේ ලොලුප්ප තෘෂ්ණාව මා විසින් නසනලද්දේ නොවේදැයි සොත ද්වාරයෙහි සිනාපහලකිරීම්වශයෙන් උපදී. කස්තුරි කපුරු සුවඳමල් ආදී සුගන්ධයක් රහතුන්ගේ ඝ්‍රාණප්‍රසාදයෙහි ගැටුනුකල්හි අහෝ මේ සුගන්ධය බුද්ධපූජාවට ලැබුනේනම් මැනවැයි ඝ්‍රාණද්වාරයෙහි සිනාපහලකිරීම්වශයෙන් උපදී. රහතුන්ට රසසම්පන්නවූ පිණ්ඩපාතයක් ලැබී සබ්‍රහ්මචාරීන් සමග බෙදා වළඳනකල්හි ජිව්හා ද්වාරයෙහි සිනාපහලකිරීම් වශයෙන් උපදී. රහතුන්ට සබ්‍රහ්මචාරීන් විසින් අත් පා මිරිකීම් ආදී කායික කවතාවත්කරණකල්හි කායද්වාරයෙහි සිනාපහලකිරීම් වශයෙන් උපදී. මෙසේ මේ චිත්තය පඤ්චද්වාරයෙහි කුඩා අරමුණෙහි සිනාපහලකිරීම්වශයෙන්මමුත් සෙසු දොළොස් චිත්තයන්මෙන් දශඅකුශල කර්මපථාදිවශයෙන් හෝ නූපදනාහෙයින් හසිතුප්පාදයයි නම්කරණලද්දේයි. මේ සිනාවචනාහි සිතය, හසිතය, විහසිතය, උපහසිතය, අපහසිතය, අතිහසිතයයි සංඛ්‍යාකාරවේ. ඔවුන් අතුරෙන් මුඛනයනාදියෙහි ප්‍රීතිමත් ආකාර දක්වීම සිතනම්වෙයි. සර්වඥවරයන්ට වනාහි ඒ සිතයමුත් අවශෙෂ පස් සිනාව නූපදී. එහෙයින් "සිතං පාත්වාකාසි" යනාදීන් පාළියෙහි ආයේය සර්වඥයන්වහන්සේගේ ශ්වේතවර්ණවූ දන්තරශ්මිය රාජහංස ධේනුවක්මෙන් සිරොධාතුව ප්‍රදක්ෂිණාකරණකල්හිම සර්වඥයන්වහන්සේ සිනාසුනේයයි දැනගන්නේයි දත්විවෘත කොට සිනාසීම "හසිත" නම්වෙයි මිහිරිහඩින් සිනාසීම විහසිතනම්වෙයි. දෙඋරහිස සැලෙනසේ සිනාසීම. උපහසිතනම් වෙයි කඳුලුධාරා වගුරුවා සිනාසීම අපහසිතනම්වෙයි. ශරීරය ඉදිරියට හෝ පසුභාගයට පෙරළ පෙරළා සිනාසීම අතිහසිත නම්වෙයි. මෙසේ සිනාව සැවදෑරුම්වන්නේයයි දතයුතුයි. මේ අහෙතුක ක්‍රියා චිත්තයන් තුන්දෙනා අතුරෙන් පාළි අට්ඨකථාදියෙහි "උපෙක්ඛා සහගතං ක්‍රියාහෙතුක මනොධාතු චිත්තං" යන්නෙන් වදාළ චිත්තය පඤ්චද්වාරාවර්ජනනමින්ද, "උපෙක්ඛා සහගතං ක්‍රියාහෙතුක මනොවිඤ්ඤාණ ධාතු චිත්තං" යන්නෙන් වදාළ චිත්තය මනොද්වාරාවර්ජනනමින්ද, "සොමනස්ස සහගතං ක්‍රියාහෙතුක මනොවිඤ්ඤාණ ධාතුචිත්තං" යනුවෙන් වදාළ චිත්තය හසිතුප්පාද නමින්ද, ආයුෂ්මත් අනුරුද්ධාචාරීන්

විසින් සංක්ෂෙපකරණු පිණිස මේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි යොදනලද්දේයි. මේ ප්‍රකරණයවනාහි අර්ථවශයෙන් හකුළුවා රචනාකළාක්මෙන්ම ග්‍රන්ථවශයෙන්ද හකුළුවා රචනාකරණු පිණිස දෙශනා පාළියෙහි ආවාවූ මේ දීසීවූ නම් තුණින් හකුළුවා මෙසේ රචනාකළපසු පශ්චිමාචාරීන් විසිනුදු ඒ නම් තුණ පිළිගන්නාලද්දේයි.

## අටලොස් අහෙතුක චිත්තයන්ගේ සංක්ෂෙප විස්තර කථාව නිමියේයි.

පාපාහෙතුක මුත්තානි, අකුශල චිත්ත අහෙතුක චිත්තයන්ගෙන් මිදුනාවූ; ඒකූනසඨි, එකුන්සැටක් හෝ; චිත්තානි, චිත්තයෝ; සොභනානීති, සොභනනම් ඇත්තාවූ චිත්තයෝයයි; වුච්චරෙ, (වුච්චන්ති) කියනුලැබෙත්. සොමනස්ස සහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදි වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදාදි ප්‍රභෙදයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං; මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; සොමනස්ස සහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ නොහොත් මෙහෙයුම් සහිතව හටගන්නාවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; සොමනස්ස සහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්තනොවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි, සොමනස්සසහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්ත නොවූ; සසඞ්ඛාරික, මෙහෙයුම් සහිතවූ නොහොත් මෙහෙයුම් සමග හටගන්නාවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂා වෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදාදිවශයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදාදිවශයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා

එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානයෙන් වියුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛා සහගතං, උපෙක්ෂා වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්තනොවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; මේ "ච" ශබ්දය සිංහාව ලොකනන්‍යායෙන් මූලසප්තසථානයෙහිද යෙදේ. ඉති ඉමිනා පභෙදෙන, මේ කියනලද ක්‍රමයෙන්; අඨපි, අෂ්ටප්‍රකාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; කාමාවචර කුසලචිත්තානි නාම, කාමාවචර කුශල චිත්තයෝය යන නම් ඇත්තාහු; හොන්ති, වෙත්. ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අඨපි ඉමානි චිත්තානි, මේ චිත්තයෝ අටදෙන; සහෙතුකාමාවචර විපාක චිත්තානි නාම, සහෙතුකවූ කාමාවචර විපාක චිත්ත යෝය යන නම් ඇත්තාහු; හොන්ති, වෙත්. ඉති ඉමිනාප භෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අඨපි ඉමානි චිත්තානි, අෂ්ට ප්‍රකාර වූද මේ චිත්තයෝ තුමූ; සහෙතුකාමාවචර ක්‍රියා චිත්තානිනාම, සහෙතුකවූ කාමාවචර ක්‍රියා චිත්තයෝය යන නාම ඇත්තාහු; හොන්ති, වෙත්. ඉච්චෙවං, ඉති එවං යථාවුත්තනයෙන) මෙසේ කියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, කුශලය, විපාකය, ක්‍රියාය, යන සර්වප්‍රකාරයෙනුදු; චතුවීසති, සූවිස්සක් ප්‍රභෙදවූ: සහෙතු කාමාවචර පුඤ්ඤපාකක්‍රියා චිත්තානි, කාමාවචර කුශල්ය, සහෙ තුක කාමාවචර විපාකය, සහෙතුක කාමාවචර ක්‍රියාචිත්තයෝය යන චිත්තයෝ තුමූ; සමත්තානි, සංක්ෂෙපයෙන් සංග්‍රහකොට අභිගන්නාලද්දහුය. නොහොත් චතුවීසති, සූවිස්සක් ප්‍රභෙදවූ; සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, සහෙතුක කාමාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ; සමත්තානි, සංග්‍රහ කොට අභිගන්නාලද්දහුය; සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියා, කාමාවචර කුශල්ය, සහෙතුකකාමාවචර විපාකය, සහෙ තුක කාමාවචර ක්‍රියාය යන චිත්තයෝ; වෙදනාඤාණ සඞ්ඛාර භෙදෙන, වෙදනා ඥානසංස්කාරයන්ගේ ප්‍රභෙදයෙන්; පච්චෙ කං, වෙන වෙනම; ද්විධත්තාව, ද්විප්‍රකාරවූහෙයින්ද; චතුබ්බි ධත්තාව, සතරාකාරවූහෙයින්ද; අඨවිධත්තාව, අෂ්ටප්‍රකාරවූ හෙයින්ද: සම්පිණ්ඩිතා සියල්ල පිඩුකොටගෙණ; ජව, සදෙන කැයි කියාද; වාදසව, දොළොස් දෙනෙකැයිකියාද; චතුවීසති, සූවිසිදෙනෙකැයි කියාද; පණ්ඩිතෙහි, විජම් ඇදුරන් විසින්; මුනා, දන්නාලද්දහුය.

කාමෙ, එකොළොස් කාමභවයෙහි; අවචරානි, යෙභුය්‍ය වශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයෝ තුමූ; තෙවීස පාකානිච, තෙවිසි විපාක සිත්කෙනෙක්ද; වීසති පුඤ්ඤාපුඤ්ඤානිච, විංශති ප්‍රභෙදවූ කුශලාකුශල සිත්කෙනෙක්ද; එකාදස ක්‍රියාච ඉති, එකොළොස් ක්‍රියා සිත්කෙනෙක්දැයි; සබ්බථාපි, කුශලාකුශල විපාක ක්‍රියාවන්ගේ අභ්‍යන්තරයෙහි ඇතුලත්වූ සියලු ප්‍රභෙදයෙන්ද; චතුපඤ්ඤාස එව, සූපණස් දෙනෙක්ම; සියුං, වන්නාහුය; තතො, ඒ සූපණස් චිත්තයන් කෙරෙන්; ඌනාධිකානි, ඌනාධිකවූවාහු; නසියුං, නොවෙත්.

## ශෙම්හි භාවය.

කාමාවචර කුශල චිත්තයෙහි සංක්ෂෙප භාවය කෙසේ යත්? කාමාවචර කුශල චිත්තයෙහි "ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර කුසල චිත්තානි නාම" යනුවෙන් සහෙතුක යන විශෙෂණ පදය නොයොදා විපාක ක්‍රියා නිගමනයෙහිම සහෙතුක විපාක ක්‍රියාචිත්තානි, සහෙතුක ක්‍රියා චිත්තානි" යනුවෙන් සහෙතුක ශබ්දය කුමක්හෙයින් විශෙෂණකළාහුද යත්? එසේම කුශල චිත්තයෙහිත් සහෙතුක ශබ්දය විශෙෂණය කොළේ කවර දෙසක් වන්නේද යත්? කාමාවචර කුශලයෝ වනාහි ඒකාන්ත සහෙතුකමවෙති. ඉදින් අහෙතුකවූ කාමාවචර කුසල් සිත් කෙනෙකුන් විද්‍යමානවෙත්නම් එසේ ඇති කල්හි කාමාවචර කුශල චිත්තයන්ගේ ව්‍යභිචාරය ඇත්තේවෙයි. එකල්හි "සම්භවෙ ව්‍යභිචාරෙ ච විසෙසනං සාත්ථකං සියා" යනුන්‍යාය බැවින් "සහෙතුක" ශබ්දය විශෙෂණ කටයුතුමවෙයි. එබඳු අහෙතුක කාමාවචර කුසල් සිත් කෙනෙක් නැති බැවින් "සහෙතුක" යන විශෙෂණය යෙදූයේනම් ඒකාන්තයෙන් නිෂ්ප්‍රයොජනවෙයි. එහෙයින් කාමාවචර කුසල චිත්තයන් හා සමග සහෙතුක යන විශෙෂණය නොයොදන ලද්දේයයි දතයුතු. එසේවීනම් කාමාවචර විපාක ක්‍රියාවන් හා සමග ඒ සහෙතුක යන විශෙෂණය කුමක්හෙයින් යෙදූයේද යත්? අහෙතුකාධිකාරයෙහි දක්වනලද්දාවූ කාමාවචර විපාකයෝ අටදෙනෙක් සහ ක්‍රියාවෝ තුන්දෙනෙක්ද කියනලද්දාහුය. එහෙයින් මේ කාමාවචර විපාක ක්‍රියාවන්ගේද අහෙතුකත්‍වෙ සහෙතුකත්‍වෙ හෝයි ව්‍යභිචාරය ඇත්තේයි. එහෙයින් ඒ ව්‍යභිචාරය වලක්වනු පිණිස විපාක ක්‍රියාවන් හා සමග සහෙතුක ශබ්දය විශෙෂණකළහයි දතයුතු. මේ කාමාවචර කුශලයන්ටම ඉදිනා මෙසේ වියයුතුනම් සියලු චිත්තයන්ගේ නිගමනයෙහි "චතුවී

සතිසහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි” යන වාක්‍යයෙහි ව්‍යභිචාරය නැතිවම කුශල ශබ්දයට පූර්වභාගයෙහි සහෙතුක යන විශෙෂණය කුමක්හෙයින් යෙදූසේක්ද යත්? එසේ යෙදූයේ නමුදු ඒ සහෙතුක යන විශෙෂණපදය යථාලාභ න්‍යායවශයෙන් සහෙතුක විපාකය සහෙතුකක්‍රියාය යනුවෙන් විපාකක්‍රියාවන් හා යෙදෙන පමණමුත් කුශල ශබ්දය හා නොයෙදේමැයි කුමක්මෙන්ද යත්? සාමඤ්ඤඵල සූත්‍රපාළියෙහි “සක්ඛරකඨලිකම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි” යන උදාහරණයෙහි වචනපටිපාටියවශයෙන් චරණ ක්‍රියාව සක්ඛරකඨලිකා ශබ්දය හා සමගද, තිෂ්ඨමාන ක්‍රියාව මච්ඡගුම්බ ශබ්දය හා සමගද යෙදියයුතුවෙයි. ඉදින් එසේ යෙදූයේනම් හැසිරෙන්නාවූ කැටකැබිලිත්ත, සිටින්නාවූ මත්ස්‍යගුල්මය, හෙවත් මසුන් රංචුවය, යන විපරීතාර්ථයක් හැගේ. එහෙයින් යථාලාභන්‍යායවශයෙන් වචන පටිපාටිය නොසලකා සක්ඛර කඨලිකා ශබ්දය හා සමග තිෂ්ඨමාන ක්‍රියාවද, මච්ඡගුම්බ ශබ්දය හා චරණ ක්‍රියාවද යෙදූකල්හී ඉෂ්ටාර්ථයලැබේ. එපරිද්දෙන්ම මෙහි වචන පටිපාටිය නොසලකා “සහෙතු” යන විශෙෂණ පදය විපාක ක්‍රියා ශබ්දය හා සමග යොජනාකොට අර්ථගත යුතුයි. මහා යන විශෙෂණයකොට කාමාවචර චිත්තයන් කෙරෙන් අධිකයින් පූජ්‍යවූ මහද්ගත ලොකොත්තර චිත්තයන් සමග ඒ මහා යන විශෙෂණය කුමක්හෙයින් නොයෙදූසේක්ද යත්? ඒ මහද්ගත කුශලයන් අතුරෙන් ප්‍රථමධ්‍යාන කුශල ප්‍රථම ධ්‍යාන භූමියෙහිද, ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ ඒ ඒ භූමියෙහිද, සතර අරූපාවචර ධ්‍යානයෝ සතර අරූපභූමියෙහිද, විපාකදෙත්මය. සොවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමාර්ග කුශල චිත්තයෝ තමතමන්ගේ විපාක චිත්තයම උපදවත්. මෙසේ මහද්ගත ලොකොත්තර චිත්තයන්ගේ විපාක දානස්වභාව සංක්ෂෙප බැවින් මහා යන විශෙෂණය නොකරණලද්දේයි. කාමාවචර කුශලය වනාහි එසේනොවෙයි. ප්‍රතිසන්ධි වශයෙන් කාමාවචර ප්‍රතිසන්ධිහු නවදෙනෙක්ද, කාමසුගති භූමිහු සත්දෙනෙක්ද දියහැක්වෙති. ප්‍රවෘත්ති විපාකයවනාහි අවීචිමහා නරකය පටන් භවාග්‍රය දක්වා එක්තිස් භූමියෙහිම සුදුසු පරිද්දෙන් දියහැකිවෙයි. එසේම මනුෂ්‍ය ලොකයෙහි ප්‍රවෘත්ති කාලයෙහි චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය, මණ්ඩලිකරාජ්‍ය සම්පත්තිය ප්‍රදෙශ රාජ්‍ය සම්පත්තිය, ඒකරාජ රාජ්‍ය සම්පත්තිය, බ්‍රාහ්මණ මහාසාර, ගෘහපති මහාසාර, ක්ෂත්‍රිය මහාසාර සම්පත් ආදියදෙති. මෙසේ කාමාවචර කුශලයන්ගේ විෂය මහත්තවය

හෙතුකොටගෙණ "මහා" යන විශෙෂණයකළ පමණමුත් පූජ්‍යාර්ථයෙන් මහායයි අර්ථනොගතයුතුයි. කාමාවචර විපාකය කුමක්හෙයින් මහාවිපාකයයි ව්‍යවහාරකොළේද යත්? මහද්ගත ලොකොත්තර විපාකයන්ට වඩා මහත්වූ විපාකදෝහෝයි සැකකටයුතුවේ. මහාකුශලයන්ගේ විපාකහෙයින් මහාවිපාකයයි ව්‍යවහාරකළ පමණමුත් මහද්ගත ලොකොත්තර විපාකයන්කෙරෙත් මහත්වූ අර්ථයෙන් මහාවිපාකයයි ව්‍යවහාර නොකෙරෙත්. එසේම කාමාවචර විපාකයන්ටද "මහා" යන විශෙෂණය මහාකුශලයන්ට බඳු බැවින් මහාක්‍රියායයි ව්‍යවහාරකෙරෙත්. ඒ මහාක්‍රියාවෝ වනාහි වට්ටූපච්ඡෙදයකළාවූ බුදු පසේබුදු මහරහතුන්ට පමණක් උපදනාහුය. ඉදින් ඒමහාක්‍රියා චිත්තයෝ පෘථග්ජන ශෛක්ෂ්‍ය සන්තානයෙහි උපදිත්නම් එකාන්තයෙන් විපාකදෙත්මැයි. එහෙයිනුදු මහාක්‍රියායයි ව්‍යවහාරකෙරෙත්. ඒමහාක්‍රියා චිත්තයෝවනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි උපදිත්නම් විපාක ලැබෙත්යයි කීවාක්මෙන් පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන චිත්තයෝ තුමූ පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි ඉපිද කුමක්හෙයින් විපාකනොදෙන්නාහුද යත්? පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තානයෙහි උපදනාවූ ඒ අහෙතුක ක්‍රියාවෝ දෙදෙන ආසෙවන ප්‍රත්‍යය නොලබනහෙයින් විපාක නොදෙන්නේයයිද දතයුතු. ඊට උපමා කවරයත්? කිසිකලෙක මල්ඵල හටනොගන්නාවූ වෘක්ෂයක් වැසිනැත්තාවූ කාලයෙක්හි අකල් මල්ගත්තේද එයින් ඵලය නුපදී. එපරිද්දෙන්ම පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි උපදනාවූ පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන දෙදෙන සමාන චිත්තයකින් ආසෙවන ප්‍රත්‍යය නොලබනහෙයින් අකල් මල්මෙන් විපාක නූපදවන්නාහුයයි දතයුතුයි. ඉදින් ආසෙවන ප්‍රත්‍යය ලැබීමෙන් විපාකදියයුතුනම් රහතුන්ට උපදනා මහාක්‍රියා චිත්තයෝ සමාන ජාතික සිතින් ආසෙවන ප්‍රත්‍යය ලැබ කුමක්හෙයින් විපාක නූපදවන්නාහුද යත්? වෘතමූලය සමූල ඝාතනයකළාවූ බුදුන් රහතුන්ගේ සන්තානයෙහි නූපදනාහෙයින් ආසෙවන ප්‍රත්‍යය ලැබුවාවූද මහාක්‍රියා චිත්තයෝ විපාක නූපදවන්නාහුයයි. දතයුතු. කුමක්මෙන්ද යත්? මුලින් උදුරාගන්නාලද වෘක්ෂයෙක්හි මල් පිපියේද ඒමල් වියලීම පමණමුත් එයින් ඵලය නූපදවත්. එහෙයින් වෘතමූලොපච්ඡෙදනයකළාවූ බුදුන් රහතුන්ගේ සන්තානයෙහිම උපදනාහෙයින් ආසෙවන ප්‍රත්‍යය ලැබුවාවූද මහාක්‍රියා චිත්තයෝ විපාක නූපදවත්යයිදතයුතු. මහාකුශලය සොම්නස්වීමට හෙතුහු නුවූ

දෙනෙක්වෙති. ඒ කවරහුදයත්? යොග්‍යවූ දනවස්තුවක් ලැබීමය, යොග්‍යවූ ප්‍රතිග්‍රාහකයෙක් ලැබීමය, යොග්‍යවූකාලසම්පත්තියක් ලැබීමය යොග්‍යවූ ප්‍රතිරූපදෙශයක් ලැබීමය, යහපත් කල්‍යාණ මිත්‍රයන් ලැබීමය, පිරිසිදු සම්‍යක්දෘෂ්ටිය ඇතිබවය, ප්‍රතිග්‍රාහකයාගේ ගුණදැනීමය, දනයෙහි අනුසස්දැනීමය, සොම්නස් සහගත සතරපටිසන්ධියෙන් යම් සිතකින් පටිසන්ධිගැණීමය යනමේ කාරණා නවයෙන් සම්පූර්ණවූකල්හි සොම්නස්වෙදනාවෙන් උතුම්වූ මහාකුශල චිත්තය උපදී. මේකාරණා නවයෙන් එකක් හෝ බොහෝ ගණනක් හෝ අඩුවීනම් උපෙක්‍ෂාසහගත කුශල චිත්තය උපදී. මහාකුශල චිත්තය ඥානසම්ප්‍රයුක්තවීමට හෙතු පසෙක් ඇත්තේය. ඒ කවරහුද යත්? අතීතජාතියෙහි ප්‍රඥාව ලබම්වා යන ප්‍රාර්ථණාවෙන් ධර්මවිනය උගන්වා දීම හා නිරවද්‍ය ශිල්පශාස්ත්‍රාදිය උගන්වාදීමද එක්කාරණයකි, ප්‍රඥාසංවර්තනිකවූ හෙවත් ප්‍රඥාව ලබම්වායන ප්‍රාර්ථණාවෙන් ධර්මදෙශකාදීන්ට හෝ ධර්මය ඉගෙණගන්නාවුන්ට හෝ තෙල් පහන් දනවස්තු ආදියපිදීම එක්කාරණයකි, තමාද නිරවද්‍යවූ ගණිතමිනිත ලිපිලෙඛක්‍ය චිත්‍රකර්මාන්තාදී නිරවද්‍ය ශිල්පයන් උගන්නේවේද, ප්‍රඥාදශකයට පැමිණ ප්‍රඥෙන්ද්‍රියය මුහුකෙළේවේද, ඒදනවස්තුව දෙන්නාවූකල්හි ලොභ වෙෂ මොහයන් ගෙන් ඒදනමය කුශලචිත්තය පිරිවරකොට නොගත්තාලද්දේවේද යනමේ කාරණාපසින් සම්පූර්ණවීනම් උත්කෘෂ්ටවූ ඥානසම්ප්‍රයුක්ත කුශලචිත්තය උපදී. මේ පසින් එකක් හෝ කීපයක් හෝ අඩුවීනම් ඥානවිප්‍රයුක්තවේ. මේ මහාකුශලය අසංස්කාරිකවීමට හෙතුදෙකක් ඇත්තේවේ. ඒකවර දෙකක්ද යත්? දනවස්තුව මුක්තත්‍යාගතාවයෙන් යුක්තව ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි පිහිටුවන්නේවේද එකාන්තයෙන් ඒ දනයාගේ කුශලානිශංසය ලබම්හයි යන දෘඪතර කල්පණාවක් ඇත්තේවේද යනමේ අඞ්ගවයෙන් සම්පූර්ණවීනම් මහාකුශලය අසංස්කාරිකවෙයි. මේ අඞ්ගවයෙන් හෝ එකකින් හෝ අඩුවීනම් සසංස්කාරික කුශලචිත්තයවෙයි. මේ කාමාවචර මහාකුශල චිත්තයෙහි සපර්ශාදීවූ චෛතසික ධර්මයෝ අටතිස්දෙනෙක් යෙදෙන්නාහුද කුමක්හෙයින් වෙදනා ඥානදෙකින්ම භෙදය දක්වූයේද යත්? සපර්ශාදීවූ ධර්මයෝවනාහි සර්වචිත්තසාධාරණයෝවෙති. එබඳු ධර්මයන්ගෙන් විශෙෂය නොපෙන්විය හැකිවෙයි. වෙදනා ඥානයෝවනාහි සර්වචිත්තසාධාරණ නොවන හෙයින් ඔවුන්ගෙන්ම විශෙෂය දක්වූහයි දතයුතුයි. වෙදනා භෙදයවනාහි සොම්නස් උපෙක්‍ෂාවශයෙන් දෙයාකාර බැවින්

වේදනා භේදය ලැබෙන්නේමැයි. ඥානභේදය වනාහී ඥාන සම්ප්‍රයුක්ත චිත්තයෙහි මුත් ඥානවිප්‍රයුක්ත චිත්තයෙහි කෙසේ ලැබෙන්නේද යත්? "ඵස්සකාලෙ සුඛිතොවා දුක්ඛිතොවා" යන උදාහරණයෙහි වර්ණව ඇතිකල්හි ලැබෙන්නාවූ සුඛිත්වයද, වර්ණව නැතිකල්හි ලැබෙන්නාවූ දුඛිත්වයද, යනදෙකම වර්ණව විසින් කරන්නාක්මෙන් ඥාණය ඇතිනැතිකල්හිවන්නාවූ භේදයද ඥානය විසින්ම කරණලද්දේයයි දතයුතුයි. සංස්කාරය වනාහි ඒ චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයක්දෝ හෝයි සැක නොකටයුතුයි. මෙරමාගේ සන්තානයෙහි හෝ තමාහට පූර්වභාගයෙහි උපදින්නාවූ චිත්තයකින් හෝ සංස්කාරය චිත්තයට ලැබෙන බැවින් චිත්තයාගේ ඇදීම නොහොත් සැරසීම සංස්කාරයයි දතයුතුයි. කුශල්කිරීමෙහි පුරුද්ද ඇත්තාවූ සත්වයෝ තමාගේ සිතින් සිතා මනා දන්දීම කෙරෙති. වස්තු තෘෂ්ණාව ආදී උපද්‍රව නිසා දන්දීමට මැලිවූවන්ට අනුන්ගේ අවවාද අනුශාසනාවෙන් දානාධ්‍යාශය උපදවා දන්දෙති. එහෙයින් තියුණු මුවහත් ඇති ශස්ත්‍රයකින් කැපීමක්මෙන්ද, මොටවූ ශස්ත්‍රය මුවහත් තබා කැපීමක්මෙන්ද, මේ අසංස්කාර සසංස්කාර චිත්තවය උපදින සැටි දතයුතුයි. මේකාමාවචර කුශල චිත්තය චක්‍ෂුරාදී පඤ්චද්වාරයෙහිද, මනොද්වාරයෙහි අභිනිෂ්පත්තිය නොවීම්වශයෙන්ද, මනොද්වාරයෙහි අභිනිෂ්පත්තිය වීම්වශයෙන්දැයි ත්‍රිවිධාකාරයකින් උපදී. ඔවුන් අතුරෙන් පඤ්චද්වාරයෙහි උපදනා මේ මහාකුශල චිත්තවීථිය වෘක්ෂයෙක්හි හට ගත්තාවූ වාතපුෂ්පයන්මෙන්ද, මනොද්වාරයෙහි අභිනිෂ්පත්තිය නොවීම්වශයෙන් උපදනා කුශලය එම වෘක්ෂයෙහි ගැටකාලයෙහි වැටෙන්නාවූ ඵලමෙන්ද, අභිනිෂ්පත්තිවීම්වශයෙන් උපදනා කුශල චිත්තය සම්පූර්ණකල් ඉක්මවා වර්ණ ගන්ධ රසයෙන් සම්පූර්ණව විලිකුම්ව ගිය ඵලමෙන්ද දතයුතුයි. එපරිද්දෙන් පඤ්චද්වාරයෙහි උපදනා කාමාවචර කුශලයන්ගේ විපාකවශයෙන් අනුන්ගේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන පඤ්චකාම සම්පත්තීන් දැකීම් මාත්‍රයකින් කුශල විපාක අහේතුක ප්‍රවෘත්තිඵල මාත්‍රයක් ලැබේ. මනොද්වාරයෙහි අභිනිෂ්පත්තිනොවීම්වශයෙන් උපන් කුශලයාගේ විපාකයෙන් අනුන්ට බැලමෙහෙකිරීම් ආදියෙන් උපදවාගන්නාලද්දාවූ දුක්ඛජීවිකා සංඛ්‍යාත ඵලයඋපදී. මනොද්වාරයෙහි අභිනිෂ්පත්ති වශයෙන් උපන් කාමාවචර මහාකුශලයාගේ අත්උත්කෘෂ්ට කුශලය සදිව්‍යලොකයෙහි මහෙශාක්‍ය දෙවියන්ගේ හා මනුෂ්‍ය ලොකයෙහි සක්විති ආදී රජුන්ගේද කාමීඵලූප ජීවී සංඛ්‍යාතවූ නිරායාසයෙන් සිතූ පැතූ සියලු සම්

පත් ලැබීමද, උත්කෘෂ්ට මධ්‍යමවශයෙන් රැස්කළාවූ කාමාවචර කුශලය උත්‍ථාන ඵලූප ජීවී සඞ්ඛ්‍යාතවූ ගොවිකම් වෙළඳම් ආදීවූ තමාගේ වියහියෙන් සම්පත් උපදවයි.

---

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං, විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛෙකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ග පඤ්චකයකින් යුක්තව හටගත්තාවූ: පඨමජ්ඣානකුසල චිත්තම, ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශලචිත්තයෙක්ද; විචාර පීති සුඛෙකග්ගතා සහිතං, විචාර, පීති, සුඛ, එකග්ගතා, යන ධ්‍යානාඞ්ග චතුෂ්කයකින් යුක්තව හටගත්තාවූ; දුතියජ්ඣාන කුසල චිත්තං, ද්විතීයධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; පීතිසුඛෙකග්ගතාසහිතං, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධ්‍යානාඞ්ගත්‍රයකින් යුක්තව හටගත්තාවූ; තතියජ්ඣාන කුසල චිත්තම, තෘතීය ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; සුඛෙකග්ගතා සහිතං, සුඛෙකාග්‍රතා සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ගවයකින් යුක්තව හටගත්තාවූ; චතුත්ථජ්ඣාන කුසල චිත්තම, චතුර්ථධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; උපෙක්ඛෙකග්ගතා සහිතං, උපෙක්ෂාඑකාග්‍රතා සඞ්ඛ්‍යාත අතික් ධ්‍යානාඞ්ගවයකින් යුක්තව හටගත්තාවූ; පඤ්චමජ්ඣානකුසල චිත්තම, පඤ්චමධ්‍යානයෙන් යුක්තවූ කුශලචිත්තයෙක්ද; මෙ "ච" ශබ්දය මුලසතර තන්හිද සිංහාව ලොකනත්‍යායෙන් යෙදෙයි; ඉති ඉමිනාපභෙදෙන, මෙසේ මේ ප්‍රභෙදයෙන්; පඤ්චපි, පස්වැදෑරුම්වූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; රූපාවචර කුසල චිත්තානි නාමහොන්ති, රූපාවචර කුශල චිත්තයෝනම්වෙති. ඉච්චෙවං, (ඉති එවං යථා වුත්තනයෙන) මෙසේ මේකියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, කුශල විපාක ක්‍රියා සඞ්ඛ්‍යාත සර්වප්‍රකාරයෙන්ද; පණ්ණරස, පසළොසක්වූ; රූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, රූපාවචර කුශලය, රූපාවචර විපාකය, රූපාවචර ක්‍රියාය යන මේ චිත්තයෝ තුමූ; සමත්තානි, සම්පූර්ණකාරණලද්දහුය; නොහොත් සංග්‍රහකොට සංක්ෂෙපයෙන් අර්ථ ගන්නාලද්දහුයයි දතයුතුයි.

රූපාවචර මානසං, රූපාවචර චිත්තය තෙමේ; ඣාන භෙදෙන, ප්‍රථමධ්‍යානාදී ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයුක්තවූ ප්‍රභෙද වශයෙන්; පඤ්චධා, (පඤ්චවිධංභවෙ) පස්ප්‍රකාරවන්නේයි. පුඤ්ඤපාකක්‍රියා භෙදා, කුශල විපාක ක්‍රියාවන්ගේ ප්‍රභෙදවශයෙන් නොහොත් කුශල භෙදය, විපාක භෙදය, ක්‍රියාභෙදය, යනභෙදත්‍රයෙන්; තං, ඒ රූපාවචර චිත්තය තෙමේ; පඤ්චදසධා, පඤ්චදසවිධංභවෙ, පසළොස් ප්‍රකාරවන්නේයි.

ආකාසානඤ්චායතන කුසල චිත්තඤ්ච, ආකාශානඤ්චායතන ධ්‍යානයෙන් සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද, නොහොත් අනන්තාකාශ ප්‍රඥප්තියම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තඤ්ච, විඤ්ඤාණඤ්චායතනය හා යුක්තවූ කුශල චිත්තයෙක්ද නොහොත් අනන්තාකාස ප්‍රඥප්තියෙහි හටගත් බැවින් අනන්ත නම්වූ ප්‍රථමාරූප්‍යවිඤ්ඤාණයම අරමුණුකොට ඇත්තාවූධ්‍යානය හා යෙදුනාවූ කුශල චිත්තයෙක්ද නොහොත් ද්විතීයාරූප්‍ය විඤ්ඤාණය විසින් පැමිණිය යුතුවූ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්ත යෙක්ද, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තඤ්ච, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද, නොහොත් යටත් පිරිසෙයින් භඞ්ගමාත්‍රය කුදු අවශිෂ්ටව නැත්තාවූ ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාව සඞ්ඛ්‍යාතවූ නත්ථිභාව ප්‍රඥප්ති යම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා යෙදුනාවූ කුශලචිත්ත යෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තඤ්ච, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය හා යුක්තවූ කුශල චිත්ත යෙක්ද නොහොත් ඖදාරිකවූ සංඥාදී නාම ධර්මයක් නැත්තාවූද, සියුම්වූ සංඥාදී නාම ධර්මයන් නැත්තේත් නොවන්නාවූ මනායතන ධර්මායතනයෙහි අන්තර්ගතවූ ධ්‍යානය හා යුක්තවූ කුශල චිත්තයෙක්ද ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභේදයෙන්; චත්තාරිපි, සතරකාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; අරූපාවචර කුශල චිත්තානි නාමහොන්ති, අරූපාවචර කුශල චිත්තයෝ නම්වෙත්.

ඉච්චෙවං, (ඉති එවං යථාවුත්තනයෙන) කියනලද මේ ක්‍රමයෙන්; සබ්බථාපි, කුසල විපාක ක්‍රියා සඞ්ඛ්‍යාත සියලු ආකාර යෙන්ද; ද්වාදස, දොළසක් ප්‍රභේදවූ; අරූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, අරූපාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ තුමූ; සමත්තානි, සම්පූර්ණකරණලද්දහුය; නොහොත් සංග්‍රහකොට අර්ථගන්නාලද්දහුය. "සමත්තානි," යන තන්හි "සං අත්තානි" යනු පදච්ඡේදයි. "සං" ශබ්දය සංක්ෂෙපයෙන් සංග්‍රහකිරීමද "අත්තානි" යන්නෙන් ගැණීමද වාචකවෙති. "අත්ත" ශබ්දය "අර ගතියං" යන ධාතුවෙන් නිෂ්පන්නයි.

ආරුප්පමානසං, අරූපාවචර චිත්තය තෙමේ ආලම්බණප්පභෙදෙන, කසිණුග්ඝාටිමාකාසාදී ආලම්බණයන්ගේ ප්‍රභේද යෙන්: චතුධා, (චතූහිපකාරෙහි) සතරකාරයකින්; ඨිතං, සිටියේයි. පුන, නැවත; පුඤ්ඤපාක ක්‍රියා භෙද, කුශල විපාක

ක්‍රියාචිත්තයන්ගේ ප්‍රභෙදයෙන්; නොහොත් කුශල භෙදය, විපාක භෙදය, ක්‍රියාභෙදය යන භෙදත්‍රයෙන්; ද්වාදසධා (ද්වාදසහි පකාරෙහි) දොළොස් ප්‍රකාරයකින්; ඨිතං, සිටියේයි.

---

## භා ව ය.

මේ රූපාවචර කුශල චිත්තයෝ පස්දෙන චතුෂ්කනයින් ගෙණ සතරක්ද, අරූපාවචර චිත්තයෝ සතරදෙනාදැයි යන අටදෙන අෂ්ටසමාපත්තීහුයයි කියති. ඒ රූපාවචර චිත්තයෝ පස්දෙනය, අරූපාවචර චිත්තයෝ සතරදෙනදැයි යන නවය එක්කොටගෙණ "නවානුපූර්විහාර සමාපත්තිය"යි කියති. මේ ධ්‍යානයන්ගේ චතුෂ්කපංචකනයය යනු සර්වඥයන්වහන්සේ විසින් සියලු අෂ්ටසමාපත්තීහු තීක්ෂ්ණප්‍රාඥයන්ගේ වැඩ පිණිස සියලු ධ්‍යානයෝ සතරින් සංග්‍රහකොට වදාරණලද්දේයි. මන්දප්‍රාඥයන්ගේ වැඩ පිණිස සියලු ධ්‍යානයෝ පංචකනයින් පසෙකැයි දෙශනාකරණලද්දේයි. ඒ චතුෂ්කපංචකනය සංග්‍රහය යනු සුඛෛකාග්‍රතා සංඛ්‍යාත අංගවයකින් යුක්තවූ රූපාවචර පඨම ධ්‍යානය හා එම අංගවයෙන්ම යුක්තවූ අරූප ධ්‍යාන සතරද බහා සියලු ධ්‍යානයෝ සතරෙකැයි අංගසමානත්වය හෙතුකොටගෙණ චතුෂ්කනය වදාරණලද්දේයි. මේ චතුර්ථධ්‍යාන පඨමධ්‍යාන අරූපධ්‍යානයෝ සදෙන අංගයන්ගේ ගණන්වශයෙන් සමානවූවද සුඛෛකාග්‍රතා දෙකින් යුක්තවූ ධ්‍යානය චතුර්ථධ්‍යානයයි කියාද රූපාවචර පඨමධ්‍යානය හා අරූපධ්‍යානයෝ සතරදෙන උපෙක්ෂා එකාග්‍රතා යන අංගයන්ගේ සමානත්වයෙන් හා ගණනින්ද සමාන බැවින් පඨම ධ්‍යානයයි දෙශනාකොළේයි. මේ චතුෂ්කනය පංචකනය එක් කොටගත්කල්හි සුද්ධික නවකයයි කියති. ඒ සුද්ධිකනවකය පරිත්තාලම්බනාදී ආලම්බණ චතුෂ්කයෙන් හා දුක්ඛාපටිපදාදී ප්‍රතිපත්ති චතුෂ්කයෙන්ද, නැවත ඒ ආලම්බණ ප්‍රතිපදාදෙක මිශ්‍රකිරීමෙන්වූ පස්විසිනවකයෙක් ධ්‍යාන විභංගයෙහි දෙශනා කරණලදී. මේ ධ්‍යානයන් උපදවන්නාවූ යොගාවචර තෙමේ විපාකාවරණ කර්මාවරණ, ක්ලෙශාවරණ, සංඛ්‍යාත ආවරණත්‍රයෙන් මුවහණනාවූ කල්‍යාණ පෘථග්ජනයෙක්ව "විශුද්ධිමාර්ග පෘථුවීකසිණ නිර්දේශයෙහි" ආක්‍රමයෙන් සියල්ල සම්පූර්ණකොට සංසාරයෙහිකළ පූරුද්ද ඇතිව ධ්‍යානලාභිවූ ආචාර්යවරයෙක් කරා එළඹ පළමුකොට සතරසංවර සීලයෙහි පරිපූරකාරීභාවයෙන් යුක්තව පළමුකොට ඒ ආචාරීන්වහන්සේගෙන් උපනිශ්‍රය

ලැබ කාවේරිගඩගා ඉවුරෙහි හෝ වෙන යම්කිසි තැනක හෝ හටගත්තාවූ අරුණුවන් මැටියෙන් එක්වියත් සාගුලක් ප්‍රමාණවූ පඨවීකසිණ පරිකර්ම නිමිත්ත ඉදිකොටගෙණ සුදුසුවූ සේනාසනයෙක්හි "නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුංකායං" යනාදීන් ආවාවූ පද්මාසනයෙන් වැඩහිඳ තමාගේ ජීවිතය හා ආත්මයද බුදුන්ට පුදා තමාගේ සමීපයෙන් වියදණ්ඩක් පමණ දුරින් ඒ කසිණ පරිකර්ම නිමිත්ත තබා "පඨවීකසිණං පඨවීකසිණං" යනාදීන් භාවනාකටයුතු. ඒ භාවනාව පරිකර්ම භාවනායයිද, ඒ නිමිත්ත පරිකර්ම නිමිත්තයයිද කියත්. ඒ භාවනායෙහි අභිප්‍රායනම්:—නොයෙක් අරමුණෙහි විසිර පවත්නාවූ චිත්තය ඒ අරමුණෙන් වලක්වා මේ පෘථුවිකසිණ පරිකර්ම නිමිත්තෙහි සිතනැවැත්වීමයි. එහි "කසිණ" ශබ්දය සකලාර්ථවාචී වෙයි. එහෙයින් ඒ යොගාවචරයාහට පරිකර්ම නිමිත්තෙහි සිත භාවිතාවීමෙන් යම්සේ පෘථුවිය කිමිදගත්තාවූ පුරුෂයෙකුට සියලු දිසාවෙන් පෘථුවියයි වැටහෙන්නාක්මෙන් ඒ යොගාවචරයාහටද මාගේ සියලුදිසාවෙහි පෘථුවියයි වැටහුනිනම් එකල්හි උග්ගහනිමිත්ත උපදී. ඒ උග්ගහනිමිත්තය යනු පෘථුවිකසිණ පරිකර්ම නිමිත්තෙන් සියලු වර්ණසංස්ථානාදිය සමගගත්තාවූ ප්‍රතිබිම්බයක්මෙන් මනොද්වාරයට වැටහෙයි. ඒ උග්ගහනිමිත්තෙහි පරිකර්මනිමිත්තෙහි තුබූ සියලු වර්ණසටහන් ආදිය සම්පූර්ණව වැටහෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ යටකීපරිකර්ම නිමිත්ත හැරදමා විවේකවූ ගල්ගුහා ඇතුල් ගබඩාදීවූ සේනාසනයකට වැද ඒ මනොද්වාරයට වැටහුනාවූ පරිකර්ම නිමිති ඡායාව සඞ්ඛ්‍යාතවූ උග්ගහ නිමිත්ත අරමුණුකොටගෙණ "පඨවීකසිණං පඨවීකසිණං" යනාදීන් පෙරසේම භාවනාකටයුතුයි. එසේ භාවනාකරණකල්හි ඒ භාවනාව පරිකර්ම භාවනානම්වෙයි. නිමිත්ත උග්ගහනිමිත්තනම්වෙයි. ඒ උග්ගහනිමිත්ත උපන්නාද නැද්ද යනු දැනගැණිමට ඇත්තාවූ උපායනම්:—ඇතුල්ගම් ආදීයෙහි පිඬු පිණිස ගියකල්හිත් ඇස් වසා බැලූකල්හිත් ඒ පරිකර්ම නිමිත්තයාගේ ඡායාව සිහිනෙන් දකින්නාක්මෙන් මනොද්වාරයට වැටහෙයි. එසේ භාවනාකරණකල්හි යම්විටක ඒ උග්ගහ නිමිත්ත පිරිහීයේවීනම් නැවතත් පරිකර්ම නිමිත්ත තුබූතැනට ගොස් පෙරසේම භාවනාකොට උග්ගහනිමිත්ත උපදවාගතයුතුයි. නැවත නැවතත් එසේ පිරිහියයේනම් පෙරසේම භාවනාකොට උග්ගහනිමිත්ත උපදවාගතයුතුයි. ඒ උග්ගහනිමිත්ත අරමුණුකොට භාවනාකරණකල්හි පඤ්චනීවරණ ධර්මයන්ගේ මුවහුවීම කාරණකොටගෙණ වලාගැබක් විවෘතකොටගෙණ

චන්ද්‍රමණ්ඩලය නික්මෙන්නාක්මෙන්ද, පසුඹියකින් කැඩපතක් නිකුත්කර ගන්නාක්මෙන්ද, ඒ උග්ගහනිමිත්ත විවෘතකොට ගෙණ පළමුවාරයෙහි සහමැදිරි ආලෝකයක් ප්‍රමාණවූ දෙසැත්තෑවක් වස්තු ධර්මයන්ගෙන් මිදුනාවූ මේ ලෝකයෙහි ඇත්තාවූ සියලු ආලෝකයන්ට වඩා අතිශයින් ප්‍රසන්නවූ කසිණ ප්‍රතිභාගනිමිත්තයයි කියනලද්දාවූ කසිණාලෝකය උපදී. ඒ කසිණාලෝකය උපන් මාත්‍රයකින් ධ්‍යානය නූපදී. ඒ ආලෝකය මහත්වේවායි යන නිකාන්තිය උපදවාගෙණ ඒකසිණාලෝකය අරමුණුකොටගෙණ “පඨවීකසිණං පඨවීකසිණං” යනාදීන් භාවනාකරණකල්හී ඒ ආලෝකය අඟුලක් හෝ දෑඟුලක් හෝ ප්‍රමාණවෙයි. ඒ අරමුණට පරිත්තාලම්බනයයි කියති. එපමණ වැඩුනකල්හි ධ්‍යානය ඉපදවිය හැකිවෙයි. ඉදින් එපමණින් තෘප්තියකට නොපැමිණ ඒකසිණා ලෝකය මහත්කරණු කැමැත්තෙන් භාවනාකරන්නේවීනම් සරාවක් පමණ හෝ වට්ටියක් පමණ හෝ මහත්වෙයි. ඒ අරමුණ මධ්‍යාලම්බණනම් වෙයි. ඒ අරමුණෙහිදු ධ්‍යානය ඉපදවිය හැකිවෙයි. ඉදින් මෙපමණකින් තෘප්තියකට නොපැමිණ තමාගේ සේනාසනය පමණට හෝ ආරාමය පමණට හෝ ග්‍රාමය නගරය විෂය චක්‍රවාලය පමණට හෝ ඒ කසිණා ලෝකය වැඩිය හැකිවේ. ඒ අරමුණ අප්පමාණාලම්බණනම්වේ මේ කසිණාලෝකය උපන් යොගාවචර තෙමේ සක්විති කුමරෙකු මව්කුස පිළිසිඳගත් මවෙකුමෙන් ඒ කසිණාලොක සංඛ්‍යාතවූ අරමුණ මහත් ගෞරවයෙන් ආරක්ෂාකෙරෙයි. කුමන අර්ථයක් පිණිස ආරක්ෂාකරන්නේදයත්? ඒකසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ රූපාවචර පඨමධ්‍යානය දක්වා ධ්‍යාන පඤ්චකය උපදවා නැවත ඒ පඨම ධ්‍යානයෙන්ම ඉර්ද්ධිවිධඥානාදී පඤ්චාභිඥාවන්ද ඒ යොගාවචරයාහට ඉපදවිය හැකිවේ. නැවත අරූපධ්‍යාන උපදවනු කැමතිනම් ඒ කසිණාලෝකය ආකාසයෙහි එක් ප්‍රදෙශයක පතුරුවා කසිණාලෝකය උගුලුවා ලබාගන්නාවූ කිසුණු ඉගුළු ආකාශ ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ ආකාශානඤ්චායතන ධ්‍යානයද, ඒ ආකාශානඤ්චායතනධ්‍යානකුශලය අරමුණුකොට ගෙණ විඤ්ඤාණඤ්චායතනධ්‍යානයද, ඒ ආකාශානඤ්චායතන ධ්‍යානයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයද, ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය අරමුණු කොටගෙණ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයද, මේ අෂ්ට සමාපත්තීන් අතුරෙන් කිසියම් සමාපත්තියකට සමවැද එයින් නැගිට ඒ ධ්‍යානයෙහි අන්තර්ගතවූ ධර්මයන් අනිච්ච දුක්ඛ අනාත්ම

වශයෙන් විදර්ශනාකොට සොවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන සතර මග සතර ඵලයද, අනාගාමි අර්හත් පුද්ගලයන්ගේ ඉහාත්මයෙහි නිවන් සැප විඳීමයයි කියනලද්දවූ නිරොධ සමාපත්තියට සමවැදීමද, යනමේ සියලු ලෞකික ලොකොත්තර ගුණධර්මයන්ගේ ලැබීමට ප්‍රතිභාගනිමිත්තම අරමුනුවනහෙයින් ඒ නිමිත්ත උපන්නාවූ යොගාවචර තෙමේ සක්විති රජකුම රෙකු මව්කුස පිළිසිඳගත් සක්විති මවෙකු විසින් මහොත්සාහ යෙන් ඒ ගර්භය ආරක්ෂාකරන්නාක්මෙන් ප්‍රතිභාග නිමිත්තද, මහොත්සාහයෙන් ආරක්ෂාකටයුතුයි. ඒ ආරක්ෂාකිරීමය යනු පෙට්ටි පියලි ආදියෙහි බහා ආරක්ෂාකිරීමක් නොව ප්‍රතිභාග නිමිත්ත පිළිබඳවූ චිත්තය ඒ ප්‍රතිභාග නිමිත්ත හැර රූපාදී යම් අරමුණක් කරාගියකෙණෙහිම ඒ ප්‍රතිභාග නිමිත්තනමුයේ නම්වෙයි. ප්‍රතිභාග නිමිත්ත උපන් තැන්පටන් ප්‍රථම ධ්‍යාන අර්පණා චිත්තය දක්වා උපදින්නාවූ සියලු භාවනාමය කාමාවචර කුශල චිත්තයෝ තුමූ දශපුණ්‍ය ක්‍රියාවස්තූන් අතුරෙහි ආවාවූ කාමාවචර භාවනාමය කුශල්නම්දවෙයි. උපචාරසමාධිය, උපචාරභාවනාවය යනුද ඊටමනම්වෙති. රූපාවචර අර්පණාධ්‍යානය වනාහි කෙසේ උපදනේද යත්? ප්‍රථමධ්‍යානය, ද්විතියධ්‍යානය, තෘතියධ්‍යානය, චතුර්ථධ්‍යානය, පඤ්චමධ්‍යානයයි පස්වැදෑරුම්වෙත්. ඔවුන් අතුරෙන් ප්‍රථමධ්‍යානය කෙසේයත්? යටකී ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ ප්‍රථමධ්‍යානය ලබම්වායන නිකාන්තිය උපදවාගෙණ “පඨවීකසිණං පඨවීකසිණං” යනාදීන් භාවනාකරණකල්හි ඒ යොගාවචර තෙමේ මන්දප්‍රාඥයෙක්වීනම් මනොවාරාවර්ජන සිත එක්වරක් ඉපිද ඥානසම්ප්‍රයුක්ත කාමාවචර මහාකුශල් සතරින් එක්තරාකුශල චිත්තයක් තෙමේ පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූයනනමින් සතරවරක් හෝ තීක්ෂප්‍රාඥයෙක්වීනම් උපචාර අනුලොම ගොත්‍රභූ යනනමින් තුන්වරක් හෝ උපචාර සමාධිභාවනා සිත් ඉපිද පස්වැනිව හෝ සතරවැනිව විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධ්‍යානාඞ්ගපඤ්චකයකින් යුක්තවූ රූපාවචර ප්‍රථමධ්‍යාන අර්පණා සිත එක්වරක් ඉපිද ඊට අනතුරුව සුදුසු පමණක් භවාඞ්ග සිත් උපදී. ඒ ප්‍රථමධ්‍යානලාභී පුද්ගලතෙමේ ඒ ධ්‍යානය ආවර්ජනවසී, සමාපජ්ජනවසී, අධිෂ්ඨානවසී, උඨ්ඨාන වසී, පච්චවෙක්ඛනවසී, යන පස්ආකාරයෙන් පුරුදුකොට ඉක්බිති ඒ ප්‍රථම ධ්‍යානය පඤ්චනීවරණ සතුරන්ට ආසන්නය, විතර්ක නැමති ඖදාරිකාඞ්ගයකින් යුක්තය යනාදීන් ප්‍රථම ධ්‍යානයෙහි දොස් දැක යම්කිසි මාගමක් සරණ පාවාගත් පුරුෂයෙක් තෙමේ

අනිත් මාගමක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිකල්හි පළමු මාගම
ගෙන් වෙන්වෙනු කැමතිකල්හි ඒ මාගමගේ දොස් කල්පනා
කොට ඈ කෙරෙහි තුබූ පිළිබඳ සිත දුරුකටයුතුවෙයි. එපරිද්
දෙන් ප්‍රථම ධ්‍යානයෙහි දොස් දුටුයොගාවචර තෙමේ ප්‍රථම
ධ්‍යානනිකාන්තිය දුරුකොට ද්විතීයධ්‍යාන නිකාන්තිය උපදවා
ගෙණ චතුරාඞ්ගයකින් යුක්තවූ ද්විතීයධ්‍යානය ලබම්වායි අභිනී
හාරකොට නැවතත් "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන්
භාවනාවැඩියයුතුයි. එසේ භාවනාකරණකල්හි ප්‍රථමධ්‍යානයට
කී සියලු අඞ්ගයන්ගෙන් යුක්තව ඖදාරිකවූ විතර්කාඞ්ගයෙන්
තොරවූ විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන චතුරාඞ්ගයකින්
යුක්තවූ ද්විතීය ධ්‍යාන අර්පනාසිත එක්වරක් ඉපිද සුදුසු පමණ
භවාඞ්ගසිත් උපදී. නැවත ඒ ද්විතීය ධ්‍යානයද යටකී පඤ්චවසිතා
වන්ගෙන් පුරුදුකොටගෙණ කල්පනාකරණකල්හි මාගේ මේ
ද්විතීයධ්‍යානයට ආසන්නවූ විතර්ක නැමති සතුරෙක් ඇත්තේය.
විචාර නැමති ඖදාරික ධ්‍යානයකින් යුක්තය, එහෙයින් යටකී
මාගම් උපමාව පරිද්දෙන් ද්විතීය ධ්‍යාන නිකාන්තිය දුරුකොට
තෘතීය ධ්‍යාන නිකාන්තිය උපදවාගෙණ අඞ්ගත්‍රයකින් යුක්තවූ
තෘතීය ධ්‍යානය ලබම්වායි අභිනීහාරකොට යටකී නයින්
"පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන් භාවනාකරණකල්හි
ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන අඞ්ගත්‍රයකින් යුක්තවූ රූපාවචර
තෘතීය ධ්‍යාන අර්පණා සිත එක්වරක් ඉපිද සුදුසු පරිද්දෙන් භවා
ඞ්ගවශයෙන් උපදී. ඒ තෘතීය ධ්‍යානයද යටකී පඤ්චවශිතාවන්
ගෙන් පුරුදුකොටගත්කල්හි මාගම් උපමාවෙහි කීපරිද්දෙන්
මාගේ මේ තෘතීය ධ්‍යානයෙහි ප්‍රීති සඞ්ඛ්‍යාතවූ ඖදාරිකාඞ්ග
යෙක් ඇත්තේය. එහෙයින් ඒ ධ්‍යානය හැර සුඛඑකාග්‍රතා
යන අඞ්ගද්වයකින් යුක්තවූ චතුර්ථධ්‍යානය උපදවම්වායි අභිනී
හාරකොට යටකී නයින් "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන්
භාවනා වඩනකල්හි සුඛඑකාග්‍රතා යන අඞ්ගද්වයකින් යුක්තවූ
රූපාවචර චතුර්ථධ්‍යාන අර්පණා චිත්තය එක්වරක් ඉපිද සුදුසු
පමණ භවාඞ්ග සිත් උපදී. ඒ ධ්‍යානයද පඤ්චවශිතාවන්ගෙන්
පුරුදුකොටගෙණ කල්පනාකරණකල්හි මේ සුඛය චනාපෙර
ලේහ සූළුය ඖදාරිකයයි යනාදීන් චතුර්ථධ්‍යානයෙහි දොස් දැක
පඤ්චම ධ්‍යානය ශාන්තවශයෙන් මෙනෙහිකොට යටකී නයින්ම
භාවනාකරණකල්හි උපෙක්ෂා එකාග්‍රතා යන අනිත් අඞ්ගද්වය
කින් යුක්තවූ පඤ්චමධ්‍යාන අර්පණා සිත එක්වරක් ඉපිද ඒ පඤ්චම
ධ්‍යානයද පඤ්චවශිතාවන්ගෙන් පුරුදුකොට රූපාවචර ධ්‍යාන
යන්ගේ මුදුන්පත්වූහෙයින් ඉන් ඔබ්බට නොයාහැකිව ඒ රූපා
වචර පඤ්චම ධ්‍යානයාගේ ආනිශංස විශේෂයකැයි කියනලද්දාවූ

පඤ්චාභිඥා චිත්තය උපදවයි. ඒ පඤ්චාභිඥාවද උපදවන්නාවූ යෝගාවචරයා විසින් යටකී නයින් ඒ කසිණපටිභාග නිමිත්ත අරමුණුකොටගෙණ සෘද්ධිවිධඥානය උපදවම්හයි යන නිකාන්තිය පෙරටුකොටගෙණ "සතං හොමි සහස්සං හොමි" යනාදීන් භාවනාකරණකල්හි ඒ පඤ්චමධ්‍යාන කුශල චිත්තය උපදී. ඊට අනතුරුව ප්‍රත්‍යවෙක්ෂාජවන චිත්තයන්ගේ සොළොවර කොමාරරූප සියයක් හෝ දහසක් හෝ යනාදී ක්‍රමයෙන් අභිමතවූ යම්කිසි රූපයක් හෝ පෘථිවිය නිමිදගෙණ යාමක් හෝ අහසට නැගී යාමක් හෝ පොළොවෙහිමෙන් දියෙහි ගමන්කිරීමක් හෝ ඉර සඳ අතින් පිරිමැදීම් ආදියක් හෝ යනාදී ලෞකික පඤ්චාභිඥාවන් උපදී. මේ විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධර්මයෝ පස්දෙන ධ්‍යානාඞ්ගයෝ නම්වෙත්. එතකුදුවුවත් ඒ ධර්මයන් පස්දෙනාගේ එක්වීමක් ඇතිකල්හිම ධ්‍යානයයි කියතුලැබේ. යම්සේ නිම්වලලු රථ චක්‍ර ආදීවූ රථාවයවයෝ වෙන්වෙන්ව පවත්නාකල්හි රථාවයවයෝයයි කියත්ද, ඒ රථාවයවයෝ එක්කොට සුදුසු පරිද්දෙන් යෙදූකල්හිම රථයයි කියත්ද, එපරිද්දෙන්ම විතර්කාදී ධ්‍යානාඞ්ගයන් එක්ව යෙදුනාවූ කල්හිම ධ්‍යානයයි කියති. ඒ ධ්‍යානාඞ්ගයන් පස්දෙනා එක්වූ කල්හි කුමක්හෙයින් ධ්‍යානයයි ව්‍යවහාර කෙරේද යත්? "ආරම්මණං උපනිජ්ඣායතීති ඣානං" පච්චනීක ධම්මෙ ඣාපෙතීති ඣානං" යන නිර්වචනවශයෙන් ධ්‍යානයයි ව්‍යවහාරකෙරෙත්. ඒ ආරම්මණූපනිජ්ඣාන ලක්ෂණය කුමක්ද යත්? ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ විතර්ක තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසික ධර්මයන් ප්‍රතිභාග නිමිත්ත සංඛ්‍යාත අරමුණට නන්වයි. විචාර තෙමේ ඒ ඒ ධර්මයන් අරමුණ හා ගලපවයි. ප්‍රීති තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන් ඒ කසිණ ප්‍රතිභාග නිමිති සංඛ්‍යාතවූ අරමුණෙහි පිණවීමකරවයි. සුඛවේදනා තොමෝ තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් උපබෘංහන සංඛ්‍යාතවූ මහත්වීම කරවයි. එකාග්‍රතා තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසික ධර්මයන් කසිණප්‍රතිභාග නිමිත්ත සංඛ්‍යාතවූ එකම අරමුණෙහි නවත්වයි. මෙසේ මේ ධ්‍යානයෝ පස්දෙන පස්ආකාරයකින් ආරම්මණූපනිජ්ඣානය හෙවත් අරමුණලං කොටබැලීම කරවත්. සතුරුවූ නීවරණධර්මයන් දවනාර්ථයෙන් කෙසේ ධ්‍යානනම්වේද යත්? විතර්ක සංඛ්‍යාත ධ්‍යානාඞ්ග තෙමේ ථිනමිද්ධ නීවරණයයි කියනලද්දවූ චිත්ත චෛතසික ධර්මයන්ගේ අලසගතියදවයි. විචාර ධ්‍යානාඞ්ග තෙමේ විචිකිච්ඡා නීවරණය දවයි. ප්‍රීතිධ්‍යානාඞ්ග තෙමේ ව්‍යාපාදනීවරණය දවයි.

සුඛධ්‍යානාඞ්ග තෙමේ උද්ධච්චකුක්කුච්චනීවරණය දවයි. එකාග්‍ර
තාධ්‍යානාඞ්ග තෙමේ කාමච්ඡන්ද නීවරණය දවයි. නැවත මේ
ධ්‍යානාඞ්ගයෝ පස්දෙනම එක්වී අවිද්‍යානීවරණය දවයි. මෙසේ
ආරම්මණූපනිජ්ඣාන ලක්ෂණයෙන් හා ප්‍රතිපක්ෂ ධර්මයන් දව
නාර්ථයෙන්ද ධ්‍යානනම් වන්නාහුය දතයුතුයි. කුශල ධර්මයන්
විසින් අකුශල ධර්මයන්ගේ දූවීම හෙවත් ප්‍රහාණයකිරීම සතරා
කාරවෙයි. ඒ කවරසතරාකාරයෙක්ද යත්? තදඞ්ගප්‍රහාණය,
විෂ්කම්භනප්‍රහාණය, සමුච්ඡේදප්‍රහාණය, පටිප්පස්සද්ධිප්‍රහාණ
යයි යන සතරාකාරයයි. ඔවුන් අතුරෙන් කාමාවචරකුශලය
න්ගේ ක්ලේශප්‍රහාණය තදඞ්ගප්‍රහාණයනම්වෙයි. මේ මහද්ගත
කුශලයන් නවදෙනාගේ ක්ලේශප්‍රහාණය විෂ්කම්භණ ප්‍රහාණ
නම්වෙයි. සතරමාර්ගී කුශලයන්ගේ ක්ලේශප්‍රහාණය සමුච්ඡේද
ප්‍රහාණනම්වෙයි. සතරඵලයන්ගේ ක්ලේශ විඩාසන්සිඳවීම පටි
ප්පස්සද්ධිප්‍රහාණනම්වෙයි. ඔවුන් අතුරෙන් කාමාවචර කුශල
යන් විසින් තමතමාට ප්‍රතිපක්ෂවූ අකුශලාඞ්ගයන් ප්‍රහාණය
කිරීම තදඞ්ගප්‍රහාණයයි. ඒ තදඞ්ග ප්‍රහාණයද කාමාවචර කුශල
යන් පවත්නා ක්ෂණයෙහිම ප්‍රහාණයවී ඒ කුශලයන්ගේ නිරුද්ධ
වීමෙන් නැවතත් ඒ ක්ලේශයන් වැතිරෙයත්? ඊට උපමා
කවරේ යත්? අතිශයින් අන්ධකාරවූ ගබඩාවක්හි තෙල්
පහනක් දැල්වූ ක්ෂණයෙහි ඒ අන්ධකාරය දුරුවී පහන
නිවීගියකල්හි නැවතත් අන්ධකාරය වැතිරයේද
එපරිද්දෙන්ම කාමාවචර කුශලයන් උපදනා ක්ෂණය
තෙල් පහන් දැල්වූ කලක්මෙන්ද, ඒකාමාවචර කුශලයාගේ
උප්පාදස්ථිති භඞ්ග සඞ්ඛ්‍යාතක්ෂණත්‍රය ඇතුලෙහි පාප ධර්මයන්ගේ
දුරුවීම අඳුරු නැසීමක්මෙන්ද, පහන නිවීගියකල්හි අන්ධකාරය
වැතිරයාමක්මෙන් කාමාවචර කුශලයන්ගේ නිරුද්ධවීමට අන
තුරුව පෙර තුබූ ක්ලේශයන් නැවතත් වැතිරයාමද උපමා උප
මෙය සංසන්දනයකොට දතයුතුයි. මේ තදඞ්ග ප්‍රහාණයවනාහි
නවමහද්ගත අර්පණාවීථින්ගේ පූර්වභාගයෙහිද, ලෝකෝත්තර
කුශල චිත්ත වීථින්ගේ පූර්වභාගයෙහිද, පරිකර්ම උපචාර අනු
ලෝම ගෝත්‍රභූ යනනමින් උපදනා කාමාවචර කුශල චිත්තයන්
ටමලැබේ. විෂ්කම්භණ ප්‍රහාණය යනු නවමහද්ගත කුශල චිත්ත
යන් විසින් කෙලෙසුන් ප්‍රහාණයකිරීමයි. ඒ කෙසේද යත්?
ජලයෙන් පිරීපවත්නාවූ විල් පොකුණු වැව් ආදියෙහි දියපිට
හටගත්තාවූ දියසෙවෙල් දියපරඬලාදින්ගෙන් වැසී තිබෙන්
නාවූ ජලය කළාදියෙන්ගන්නාවූකල්හිද දඬු මුගුරු ආදියෙන්
ගරණාකල්හිද ඒ දියසෙවෙල් පරඬලාදිය යම්සේ ඉවත්ව

යෙත්ද, එපරිද්දෙන් රූපාවචර ධ්‍යානාදිය උපදනාකල්හි චිත්ත නැමති ජලය වශාගෙණ පවත්නාවූ කෙලශ නැමති දිය සෙවෙල් පරඬලාදිය ඈත්ව යන නුමුත් ඒ ධ්‍යානලාභී පුද්ගලයාගේ සන්තානයෙහි යම්තාක්කල් ධ්‍යාන චිත්තය නොපිරිහී පවත්නේද? එතාක්කල් රාගාදී කෙලශයෝ දුරුව පවතිත්. එසේදවුවත් යම්කලෙක ධ්‍යානයෙන් පිරිහීගියේවීනම් නැවත වතුර නොගන්නාවූ ජලයෙහි දියසෙවෙල් පැතිරයාමක්මෙන් රාගාදී කෙලශයෝ නැවත මුවහකරගණිත්. මේ කෙලශප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණයයි දතයුතුයි. සමුච්ඡෙද ප්‍රහාණය යනු කෙසේද යත්? ලොකොත්තර කුශලයන්ගෙන් ඒ ඒ මාර්ගයෙන් වධ්‍යවූ කෙලශයන් නැවත නූපදනා පරිද්දෙන් කෙලෙස්නැසීම සමුච්ඡෙද ප්‍රහාණ නම්වෙයි. ඊට උපමා කවරයත්? යම් වෘක්ෂයකට අසනිප්‍රහාරයක්වත්කල්හි ඒ වෘක්ෂයාගේ මුල් හා සමග විනාසවීමක්මෙන් ඒ ඒ මාර්ගයෙන් වධ්‍යවූ අකුශලධර්මයෝ ඉතුරුනොකොට හාත්පසින්ම ප්‍රහාණයකෙරෙත්. ඊට අනතුරුව ඒ කෙලශයන්ගේ විඩාව සන්සිඳුවීම්වශයෙන් ඵලසිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද කෙලශ විඩාව සන්සිඳවීම පටිපස්සද්ධිප්‍රහාණයයි දතයුතුයි. ඒ පටිප්පස්සද්ධිප්‍රහාණයට උදාහරණනම්:—යම් ගෙයක් තුල රැස්වූ කැලිකසලාදිය ගින්නෙන් දවා භස්මකොට නැවත ඒ ගිනිකල භූමියෙහි උෂ්ණය සන්සිඳවීම පිණිස පැන් බඳුන් කීපයක් වත්කිරීමක්මෙනි. සතරමාර්ග කුශලයන්ගේ සමුච්ඡෙද ප්‍රහාණය හා සතර ඵලයන්ගේ පටිපස්සද්ධිප්‍රහාණයද මාර්ගයට අනතුරුව ඵලය ලැබෙන බැවින් ඒ ඒ ක්ෂණයෙහිම ලැබෙත්, ඒකෙසේයත්? අනාදිමත් සංසාරයෙහි අනුසයවශයෙන් පැවත ආවාවූ උද්ධච්ච සම්ප්‍රයුක්ත අකුශල චිත්තය හැර අවශෙෂ එකොළොස් චිත්තයන්ගේ සතර අපාය ගමනීය ශක්තියෙන් යුක්තවූ එකොළොස් අකුශල් සිත් නැමති ආත්මාබ්‍යන්තර නැමති ගෘහයෙහි කැලිකසලසොවාන් මාර්ග ඥාන නැමති ගින්නෙන් දැවූකල්හි ඒ කෙලශයන්ගේ විඩාව සන්සිඳවීම පිණිස සොවාන් ඵල සිත්දෙකක් හෝ තුණක් හෝ උපදිත්. ඊට අනතුරුව කාමධාතුවෙහි උපදවා කටුක විපාක දියයුතුවූ දිෂ්ඨිවිප්‍රයුක්ත සිත් සතරය, දෙම්නස් සහගත දෙසිතය යන ආත්ම ගෘහයෙහි පවත්නාවූ කසල ගොඩවල් සය ශක්‍රෘදගාමි මාර්ග නැමති ගින්නෙන් දැවූකල්හි එම ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද ඒදැවූ කෙලෙසුන්ගේ විඩාව සන් සිඳුවයි. ඊට අනතුරුව කාමරාගයෙන් යුක්තවූ යථොක්ත අකුශල් සිත් සය නැමති කසල ගොඩවල් සය අනාගාමි මාර්ග

නැමති ගින්නෙන් දැවූකල්හි එම ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද ඒ කෙලශ විඩාවන් සන්සිඳුවයි. ඊට අනතුරුව දිඨි විප්‍රයුක්ත අකුශල් සතර හා උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතද යන ආත්මාභ්‍යන්තරයෙහි පවත්නා සකල ගොඩවල් පස අහීතමාගීනැමති ගින්නෙන් දැවූකල්හි ඒ ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද කෙලශ විඩාව සන්සිඳුවයි, මෙසේ සමුච්ඡෙද ප්‍රහාණය හා පටිප්පස්සද්ධිප්‍රහාණයද සතර මාගී ඵලයන්ගේ වශයෙන් සතර සතර ආකාරවෙති. මේ ප්‍රථම ධ්‍යානය ඉපදවීමට පස්විසි කමටහන් කෙනෙක්වෙති. ඒ කවරහුද යත්? දශකසිණය, දසඅසුභය, කායගතාසති කම්ස්ථානය, ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥපතිය, මෛත්‍රී බ්‍රහමවිහාරයට අරමුණුවූ සියලු සුඛිත දුඃඛිත සත්වප්‍රඥපතිය, මුදිතා බ්‍රහමවිහාරයට අරමුණුවන්නාවූ සියලු සුඛිත සත්වප්‍රඥපතිය, කරුණාබ්‍රහමවිහාරයට අරමුණුවන්නාවූ සියලු දුඃඛිත සත්වප්‍රඥපතිය යනමේ පස්විසි කමටහන් අතුරෙන් තමාගේ චරිතානුකූලවූ කමටහනකින් ප්‍රථම ධ්‍යානය ඉපදවිය හැකිවේ.

ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය යනමේ ධ්‍යානයන් තුන්දෙන උපදවන්නාවූ කම්ස්ථානයෝනම්:—දස කසිණය ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥපතිය, මෛත්‍රා කරුණා මුදිතා යන අප්‍රමාණ්‍ය ධර්මයෝය, යනමේ තුදුස් කම්ස්ථානයන්ගෙන් චරිතානුකූලවූ කමටහනකින් ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ ලැබෙත්.

පඤ්චමධ්‍යානය උපදවන්නාවූ කම්ස්ථානයෝනම්:—දස කසිණය ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්තිය උපෙක්ෂා බ්‍රහමවිහාරයට අරමුණුවන්නාවූ දුඃඛිත සුඛිත සත්ව ප්‍රඥප්තිය, යනමේ දොළොස් අරමුණු අතුරෙන් යම්කිසි කම්ස්ථානයක පඤ්චමද්ධ්‍යානය උපදී. ප්‍රථමද්ධ්‍යානයට අරමුණුවන්නාවූ පස්විසිකමටහන් අතුරෙන් තමාගේ චරිතානුකූලවූ යම්කිසි කමටහනක් භාවනාකිරීමෙන්ම ප්‍රථමද්ධ්‍යානය උපදවන පමණමුත් පස්විසිකමටහන් අතුරෙන් එක්තරා කමටහනක් අරමුණුකොටගෙණ යොගාවචරයෙක් විසින් භාවනා කටයුතුනොවේ. ඒ ප්‍රථමද්ධ්‍යානයටකී පස්විසිකමටහන් කෙරෙන් අන්‍යවූ කමටහනක් ජීවිතාන්තය මුලුල්ලෙහි භාවනා කෙළේ නමුදු ප්‍රථම ධ්‍යානය නූපදී, ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයන්ට නියමවූ තුදුස්කම්ස්ථානයන් කෙරෙන් අන්‍යවූ කමටහනක් ජීවිතාන්තය මුලුල්ලෙහි

භාවනාකොටත් එකී ධ්‍යානයක් නොලැබිය හැකිවේ. පඤ්චම ධ්‍යානයට නියමවූ දෙළොස් කමටහන් කෙරෙන් අන්‍යවූ කමටහනක් ජීවිතාන්තය මුලුල්ලෙහි භාවනාකොටත් පඤ්චමධ්‍යානය නොලැබිය හැකිවේ. ප්‍රථමද්ධ්‍යානයට නියමිතවූ පස්විසි කමටහන් අතුරෙන් යම්කිසි කමටහනක් භාවනාකරන්නාවූ ත්‍රිහෙතුක පුද්ගලයෙක්හටම ප්‍රථමධ්‍යානය උපදී. සුගති අහෙතුක දුගති අහෙතුක දුහෙතුක පුද්ගලයෙක් තෙමේ ශීලවිශුද්ධිය මස්තකප්‍රාප්තකොට සර්වඥයන්වහන්සේම ආචාර්යකොටගෙණ තමාගේ චරිතානුකූලවූ සුදුසු කමටහනක් රැගෙණ ජීවිතාන්තය මුලුල්ලෙහි භාවනාකෙළේ නමුදු ඒධ්‍යානය නොලැබේ. ඉදින් එබඳු පුද්ගලයෙක් ධ්‍යානය උපදවමියි වාචකාල උපාසකාදීන්මෙන් අස්ථානයෙහි උත්සාහකොට උත්තරී මනුෂ්‍ය ධර්මය නොලැබුනුකල්හි උන්මාදබවට හෝ වෙහෙසට හෝ චිත්ත විපර්යාසයට හෝ පැමිණ මේ ශාසන බ්‍රහ්මචර්යාව හෝසයසි වරදවා දෘෂ්ටිගෙණ මරණින් මත්තෙහි සතර අපායොත්පත්තියට පැමිණෙයි. සුගති අහෙතුක දුහෙතුක පුද්ගලතෙමේ ඉහාත්මයෙහි ධ්‍යානය නොලැබෙන බැව් දැන දැන චිත්ත විපර්යාසාදියට නොපැමිණ මතු භවයෙහි ධ්‍යාන ලබමියි යන උත්සාහයෙන් භාවනාකරන්නේවීනම් ඔහුගේ භාවනාව මොඝනොවේ. ඉදින් ඒ පුද්ගල තෙමේ දෙවෙනි තුන්වෙනි අත්බැව්හි ත්‍රිහෙතුකව ඉපිද භාවනාවඩන්නේනම් වහාම ධ්‍යානය උපදී. සංසාරයෙහි භාවනාකළ පුරුදු සත්වයන්ට ගොයම්කමත් ආදියෙහි පඨවි කසිණනිමිත්ත ලැබ ධ්‍යාන උපදී. එසේම සෙසු කසිණයෝත් සංසාර පුරුද්ද කාරණකොටගෙණ වහාම උපදිත්. ඒ කෙසේද යත්? තමාගේ ශරීරයෙහි නීලවර්ණවූ හිසකේ ආදියෙහි නීලකසිණයද රන්වන්වූ ශරීර වර්ණයෙහි පීත කසිණයද ඇස්නුවන් වලාදියෙහි ලොහිත කසිණයද දන්තාදියෙහි ඔදාත කසිණයද උපදී. මේ ආකාරයෙන් සංසාරයෙහි ධ්‍යාන භාවනාකළ පුරුද්ද ඇත්තවුන්ට ත්‍රිහෙතුක පටිසන්ධිය ලැබූ අත්බැව්හී වහාම ධ්‍යානයලැබීමට උපනිශ්‍රයවෙයි. ත්‍රිහෙතුක පුද්ගලයෝම ධ්‍යානය ලබත්යයි කීනමුදු ඉහාත්මයෙහි පඤ්චානන්තරී කර්මකළවුන්ට ත්‍රිහෙතුක වුවද ධ්‍යානය නොලැබේ. රජ යුවරජ ආදී මහත් ධන සම්පත් ඇත්තවුන්ට ඒ ධනයෙහි ඇත්තාවූ දළලොභය කාරණකොටගෙණ ඒ ආත්මයෙහි ත්‍රිහෙතුකවූවත් ධ්‍යානය නොලැබේ. උපසපන් භික්ෂූහු පාරාජිකාපත්තියට පැමිණ ශ්‍රමණප්‍රතිඥවෙන් ශාසනයෙහි වසනතාක්කල් ත්‍රිහෙතුකවුවද ධ්‍යානය නොලැබෙයි. ඉදින් ගිහිගෙට පැමිණ පඤ්චශීල දශශීලාදියෙහි සංවරනිෂ්ඨා

කොට ශීලවිශුද්ධිය ලැබ භාවනාකරන්නේවීනම් එබන්දන්ට ධ්‍යානයලැබේ. පස්විසි කමටහනෙක ප්‍රථමධ්‍යානය උපදනේය. තුදුස් කමටහනෙක ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ උපදනාහුය. දොළොස් කමටහනෙක පඤ්චමධ්‍යානය උපදනේයයි කුමක් හෙයින් මෙසේවෙන්කොට කීයේද යත්? දශඅසුභය කායකොට්ඨාශය යනමේ එකොළොස් කම්සථානයෙහි ද්විතීයධ්‍යානාදී ධ්‍යානයෝ සතරදෙන නූපදනාහුය. ඒ එකොළොස් කම්සථානයෙහි ප්‍රථම ධ්‍යාන මාත්‍රයක් උපදනේය. කුමක්හෙයින යත්? දශ අසුභකාය කොට්ඨාසයෝ තුමූ අතිශයින් ඖදාරිකවූ කමටහන් වෙති. ඒ ඖදාරිකවූ කමටහනෙහි විතර්කධ්‍යානාඞ්ගය නැත්තාහු සෙසු ධ්‍යානය නොලැබේ. කුමක්මෙන්ද යත්? අතිශයින් බල වත්වූ සැඩ පහර ඇති ගඞ්ගාවෙක රිටින් මිස හබලින් ඔරුව නොනැවැත්විය හැකිවෙයි. එපරිද්දෙන්ම දශ අසුභ කාය කොට්ඨාසයන් සැඩ පහර ඇති ගංගාවක්මෙන්ද විතර්කය රිටක් මෙන්ද දතයුතුයි. එහෙයින් ඒ විතර්ක සහිතවූ ප්‍රථම ධ්‍යානයම දශඅසුභකාය කොට්ඨාස ප්‍රඥප්තියෙහි අපීණාවශයෙන් පිහිටිය හැක්වෙයි. රිටිනැත්තාවූ හබල් මාත්‍රයක් ඇත්තාවූ ඔරුමෙන් ද්විතීය තෘතීය චතුර්ථ පචමද්ධ්‍යානයෝ ඒ දශඅසුභකාය කොට්ඨාස සඞ්ඛ්‍යාතවූ ඖදාරික ප්‍රඥපතියෙහි අපීණාවශයෙන් නොපිහිටිය හ කිවෙති.

තවද මේ දශ අසුභකාය කොට්ඨාසයෝ වනාහි සවභාව යෙන් අනිෂටාලම්බණවෙති. අවශෙෂවූ කසිණාලම්බණයෝ සවභාවයෙන් ඉෂටාලම්බණවෙති. සවභාවයෙන් අනිෂටාලම්බ ණවූ දශඅසුභකාය කොට්ඨාස ප්‍රඥපතියෙහි දොම්නස් ජවන් උපදිති. ඒ දොම්නස් ජවන් උපදනාවූ දශඅසුභ කායකොට්ඨාස යෙහි සොම්නස් වේදනාවෙන් යුක්තවූ ප්‍රථමද්ධ්‍යානය කෙසේ උපදනේදයි සැකකටයුතුවෙයි. එතකුදුවුවත් ඒ අරමුණ වඩා ලබන්නාවූ ධ්‍යානය සොම්නස් සහගතමවෙති. ඊට උපමා කවර යත්? වැසිකිළි ඉස්නා පුරුෂයෙක් තෙමේ ඒ වැසිකිළිය ඉස් නාවූකල්හි ඒකාන්තයෙන්ම සොම්නස් සහගත නොවෙයි. එත කුදුවුවත් එමබල පුරුෂය තට මසුරන් දහසක් දෙම්සිතිකල්හි මම මේ අමෙධ්‍යය ඉවත්කොට කැමති කැමතිදෙයක්ගෙණ සැපසේ ජීවත්වෙමි යන උත්සාහය පෙරටුකොටගෙණ කිසි පිළිකුලක්නොවී ඒ අමෙධ්‍යරාශිය ඉවත්කොට මසුරන් දහසක් ලබාගෙණ කැමති කැමති දෙයක් රැගෙණ සැපසේ ජීවත්වෙයි. මේ උපමාවෙහි දශඅසුභකාය කොට්ඨාස ප්‍රඥපතිය අමෙධ්‍ය වල කට උපමාවෙයි. ඒ අමෙධ්‍ය ඉවත්කරන්නාවූ පුරුෂයෙකුමෙන්

ප්‍රථමධ්‍යානය ලබනු පිණිස භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගල තෙමේ සමානවෙයි. ඒ අමෙධ්‍ය රාශිය ඉවත්කිරීමෙන් ලබන්නාවූ මසුරන් දහසමෙන් දශඅශුභකාය කොඨාස ප්‍රඥප්තින් භාවනාකොට ලබන්නාවූ ප්‍රථමද්ධ්‍යානය සමානවෙයි. ඒ මසුරන් දහස ලැබූ පුරුෂයා කැමති කැමති දෙයක් රැගෙණ සැපසේ ජීවත්වන්නාක්මෙන් ප්‍රථමද්ධ්‍යානලාභී යොගාවචර තෙමේ ඒධ්‍යානයට සමවැදීමෙන් ලබන්නාවූ ධ්‍යාන සැපය සමානවෙයි. එසේහෙයින් සොම්නස් වෙදනා සහගතවූ රූපාවචර ප්‍රථමද්ධ්‍යානය ඒකාන්තප්‍රතික්කූල සවභාව ඇත්තාවූ දසඅසුභ කාය කොඨාස ප්‍රඥප්තියෙහි රූපාවචර ප්‍රථමද්ධ්‍යානය ලබන්නේයයි සැකහැර දතයුතුයි. මේ රූපාවචර ධ්‍යාන පවකයලැබූ යොගාවචර තෙමේ ඒ පඨමධ්‍යානය පඤ්චප්‍රකාරයෙන් වසීභූත කොටගෙණ අභිඥා උපදවන්නේයයි දතයුතු. එසේවුවත් පඨම ධ්‍යානය ලැබූ මාත්‍රයකින් අභිඥාව ලැබෙන්නේ නොවෙයි. ඒ උපදවන්නාවූ පඨමධ්‍යානයට සියක්වර දහස්වර ලක්ෂයක්වර සමවැද ඒ පඨමධ්‍යානයෙන් නැගිට එහි යෙදූනාවූ උපෙක්ෂා ඒකාග්‍රතාවන් ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන්ම තමාගේ ප්‍රාර්ථනා පරිද්දෙන් ශතසහශ්‍රාදී නිර්මිත රූපාදිය ඉපදවීමෙහි දක්ෂවූ පඨම ධ්‍යාන කුශල චිත්තය හෝ ක්‍රියා චිත්තය හෝ එක්වරක් ඉපිද නිරුඬවේ. ඉක්බිති ඒ ධ්‍යානලාභී පුද්ගල තෙමේ අධිෂ්ඨානකල පරිද්දෙන් ඒ රූපාලම්බනාදිය දක්නහැකිවෙයි. එහෙයින් පඤ්චාභිඥාවයයි කියනලද්දවූ මේ අභිඥශකතිය රූපාවචර පඨම ධ්‍යානයාගේම ආනිශංස බලයකැයි දතයුතුයි. “පුබ්බේනිවාසං ඡන්තා අනුස්සරන්ති” යනාදියෙහි මේ අභිඥාබලය ලබන්නාවූ පුද්ගලයෝ සදෙනෙක් ඇතැයි කියත්. ඒ සදෙනානම් කවරහුද යත්? කම්වාදී ක්‍රියාවාදී තීර්ථක තවුසාය, තීර්ථක තවුසා ආදීවූ පෘථග්ජනයාය, සාමාන්‍ය රහතුන්වහන්සේය, අසූමහා ශ්‍රාවක යෝය, අග්‍රශ්‍රාවකයෝ දෙදෙනාවහන්සේය, පසේබුදුන්ය, ලොව්තුරු බුදුන්ය, යන මේ සදෙනායි. කම්වාදී ක්‍රියාවාදී තීර්ථ කයා පටන් නොරහත්වූ සියලුදෙනාම පූර්වේනිවාසානුස්මෘති ඥානය උපදවනු කැමතිකල්හි රූපාවචර ප්‍රථමද්ධ්‍යානය පටන් පඤ්චමද්ධ්‍යානය දක්වා උපදවා ඒ උපදවාගත්තාවූ රූපාවචර පඤ්චමධ්‍යාන කුශල චිත්තය අභිඥාබවට පමුණුවා පූර්වේනිවාසය දැනගණී. ඔවුන්ගේ ඥානය කද්‍යොපැණියෙකුගේ ආලෝකයට බඳුවේ. සාමාන්‍ය රහතුන්වහන්සේ ප්‍රථමද්ධ්‍යාන ක්‍රියාචිත්තය පටන් පඤ්චමද්ධ්‍යාන ක්‍රියාචිත්තය දක්වා උපදවා අභිඥාබවට පමුණුවා පූර්වේනිවාසය දැනගණී උන්වහන්සේගේ ඥානය තෙල

පහන් ආලොකයට සමානවෙයි. අසූමහාශ්‍රාවකයෝද එසේම පඤ්චමධ්‍යාන ක්‍රියාචිත්තය අභිඥාබවට පමුණුවා පූර්වේනිවාසය දැනගණී. උන්වහන්සේගේ ඥාණය උල්කාලොකයකටහෙවත් පන්දම් එළියකට සමානවෙයි. අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේගේ ඒ පඤ්චමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවාගන්නාවූ අභිඥාබලය ඖෂධීතාරකාවට නොහොත් පහන්තරුඑළියට සමානවෙයි. පසේබුදුවරයන්ගේ ඒ පඤ්චමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවාගන්නාවූ පූර්වේනිවාසඥානය සම්පූර්ණ චන්ද්‍රයාගේ චන්ද්‍රාලොකයට බඳුවෙයි. සර්වඥ බුදුවරයන්ගේ පඤ්චමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවාගන්නාවූ පූර්වේනිවාසඥානය ඉල්මස අවපසලොස්වක් දවස්හී පඤ්චොපක්ලෙශයන්ගෙන් විනිර්මුක්තවූ මධ්‍යාහ්න සූර්‍ය්‍යයාගේ ආලොකයට බඳුවෙයි. ඒමධ්‍යාහ්න සූර්‍ය්‍යාලොකය රූපශබ්දාදියෙහි පවා පැතිරයන්නාක්මෙන් සර්වඥයන්වහන්සේගේ පූර්වේනිවාස ඥානයට හමුනොවන්නාවූ ධර්මයක්නම් නැත්තේයි. මෙසේ එකම රූපාවචර පඤ්චමධ්‍යාන කුශලචිත්තය හා ක්‍රියාචිත්තයද ඒ ඒ පුද්ගලයන්ගේ සමාධීහුගේ බලවත් බැවින් විශෙෂවන්නේයයි දතයුතුයි. මේ රූපාවචර කුශලයන් පස්දෙනාගේ විපාක චිත්තයෝ පස්දෙන පෘථග්ජන ශෛක්‍ෂ්‍ය පුද්ගලයන්ට සොළොස් රූපාවචර භූමියෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාකවශයෙන් උපදිති. රූපාවචර ක්‍රියාවෝ පස්දෙන ක්ෂීණාශ්‍රව රහතුන්ටම උපදිති.

මේ පසලොස් රූපාවචර කුශල විපාක ක්‍රියාවන්ගේ සංක්ෂෙප විභාගයයි.

අරූපාවචර චිත්තයන්ගේ සංක්ෂෙපවිභාගය කෙසේයත්? කුශල විපාක ක්‍රියාවන්ගේවශයෙන් දොළොස් වැදෑරුම්වූ මේ අරූපාවචර ක්‍රියාචිත්තය සොමනසස උපෙක්ෂාවෙදනා වශයෙන් උපෙක්ෂාවෙදනාවෙන්ම යුක්තවෙයි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත දෙදෙනාගේ වශයෙන් සම්ප්‍රයුක්තමවෙයි. ප්‍රථම ධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන පඤ්චමධ්‍යාන යන් අතුරෙන් පඤ්චමධ්‍යානයමවෙයි. එහෙයින් යටරූපධ්‍යාන පසළොස හා මේ අරූපධ්‍යාන දොළසද එක්කොට මහද්ගත ධ්‍යානයෝ සත්විසිදෙනෙකැයි කියත්. මේ අරූපධ්‍යානයාගේ ඉපදීමට හෙතුවූ කර්මස්ථානයන් අතුරෙන් මේ දොළොස් අරූපාවචර චිත්තයම ප්‍රඥප්තිය හා මහද්ගත ධර්මයම අරමුණුකොට

ඇත්තාහුවෙත්. ඒ අරමුණුදෙක හැර අන්කිසි අරමුණෙක්හි මේ අරූපධ්‍යානයෝ නූපදිත්මැයි. එහෙයින් රූපාවචර පඤ්චමධ්‍යානලාභිවූ යොගාවචර තෙමේ මෙ ශරීරය ඇතිකල්හි දඹුමුගුරු අවිආවුධාදියගෙණ කයින් සිඩවියයුතුවූ ප්‍රාණඝාතාදී දුශ්චරිතයන් හා මුඛය ඇතිකල්හී මුසවා කීම් ආදී වචීදුශ්චරිත යන්ද කරන්නාවු සත්‍වතෙමේ මරණින් මතු සතරඅපායාදීයෙහි උපදී. එහෙයින් සත්‍වයාගේ සංසාර දුකට මූල්හෙතුව මේරූප යයි සලකා "ධිරූපං ධිරූපං"යනුවෙන් රූපයට නින්දාකොට රූපධ්‍යාන නිකාන්තිය හැර අරූපධ්‍යාන නිකාන්තිය උපදවා අරූපධ්‍යානය උපදවයි. ඒ කෙසේ උපදවන්නේද යත්? තමාගේ රූපාවචරධ්‍යානය ඉපදවීමට හෙතුවූ ආකාශකසිණවර්ජිත නව කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක් භාවනාකොට උපදවා ගන්නාලද ප්‍රතිභාගනිමිත්ත සංඛ්‍යාත කසිණාලොකය ආකාශයෙහි කැමති පමණ ප්‍රදෙශයක පතුරුවා ඒ කසිණාලොකය උගුළුවා ලබාගන්නාවූ කසිණුග්ඝාටිමාකාශ ප්‍රඥප්තිය ආකාශානඤ්චායතනධ්‍යානයාගේ අරමුණවෙයි. විඤ්ඤාණඤ්චායතනධ්‍යානයට ඒආකාශානඤ්චායතන කුශල චිත්තය අරමුණුවෙයි. විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදනාකල්හි ආකාශානඤ්චායතනධ්‍යානය නැති බැවින් ඒ ආකාශානඤ්චායතනධ්‍යානයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයට අරමුණුවෙයි. ඒ ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන කුශල චිත්තය නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන කුශල චිත්තයට අරමුණුවෙයි. මෙසේ ආකාශානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන දෙදෙන ප්‍රඥප්තාලම්බණවෙති. විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙදෙන මහද්ගතාලම්බණවෙති. ඒ ආකාශානඤ්චායතනාදිධ්‍යානය උපදවන්නාවූ යොගාවචර තෙමේ දණ්ඩාදාන ශස්ත්‍රාදානාදියඹන්නේයයි කරජකාය රූපයෙහිම ආදීනවදැක "ධිරූපං ධිරූපං" යනුවෙන් රූපයට නින්දාකොට කුමක්හෙයින් භාවනාවඩන්නේද යත්? මේ ලොකවාසීවූ සත්‍වයෝ තුමූ මාතෘ පිතෘන්ගේ ශුක්ල ශ්‍රොණිත දෙකින් හටගත්තාවූ කරජකාය සංඛ්‍යාතවූ මේ රූපය පොෂ්‍යයකරනු පිණිස අන් සත්‍වයන්ගේ ජීවිත විනාශකොට මේ කරජකාය රූපය පොෂ්‍යයකටයුතුයි. එතකුදුවුවත් අටඅනූවක් රොගනවානූවක් ව්‍යාධි දෙසියතුණක් අනතුරුවන්ට මෙම කරජකාය රූපයම භාජනවෙයි. එහෙයින් මේ කරජකාය රූපයට පිළිකුල් කිරීම් යුක්ති යුක්තවෙයි. කසිණ මණ්ඩලයෙහි පැතිර පවත්නාවූ කසිණාලොක සංඛ්‍යාතවූ රූපය මව්පියන්ගේ ශුක්ල ශ්‍රොණිතයෙන් හටගත්තේද නොවෙයි. භාවනාවෙන් හටගත්

නාවූ දෙසැත්තෑවක් වස්තුධර්මයන්ගෙන් මිදුනාවූ කෙලශවිෂකා මහනයට උපකාරවූ ප්‍රණීත රූපයක් වෙයි. එබඳු උතුම්වූ රූපය අරූපධ්‍යාන ලබන්නාවූ යොගාවචර තෙමේ කුමක්හෙයින් පිළිකුල්කොට උගුළුවන්නේද යත්? කරජකාය රූපයමෙන් කසිණාලොක රූපය දුකට හෙතුනොවන්නේ නමුදු රූපවශයෙන් සමාන බැවින් මේ කසිණාලොකරූපයද කරජකාය රූපය මෙන් භයඋපදවන්නේද්‍යහෝයි සිතා කසිණාලොකයද දුරුකරන්නේයයි දතයුතුයි. ඊට උපමා කවර යත්? රාත්‍රි දවස තල්ගසක්මෙන් උස්වූ යක්ෂයෙක් දැක භයපත්වූ පුරුෂයෙක් තෙමේ ඊට මෑත භාගයෙහි නුපුරුදු මාර්ගයක යන්නාහු හිස නැත්තාවූ තල්කඳක් දැක එදවස රාත්‍රියෙහි භයකළාවූ යක්ෂයා මොහුමයයි සිතා පසුභාගය බලබලා දිව ඒ භයින් ගැලවේද, එපරිද්දෙන්ම ආකාශානඤ්චායතනධ්‍යානය ලබනු කැමතිව භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගලයා හා ඒ යකුන්ට භයවූ පුද්ගලයාද උපමාකටයුතුවේ. කරජකාය රූපය හා තියම ජීවමාන යක්ෂයාද උපමාකටයුතුවෙයි. කසිණ මණ්ඩලයෙහි කසිණාලොකය හා නුපුරුදු මාර්ගයෙහි සමහවූ හිසනැති තල්ගසද උපමා උපමෙය සම්බන්ධකොට අඟීදතයුතුයි. රූපාවචර පචමධ්‍යානයෙහි දොස් දැක අරූපාවචරධ්‍යානය උපදවනු කැමතිව ආකාශයෙහි කැමති ප්‍රදෙශයක ඒ කසිණාලොකය පතුරුවා "පඨවි පඨවි ආකාස ආකාසා" යනාදීන් භාවනාවැඩීමෙන්ම තමා විසින් නියමකරගන්නාලද්දාවූ ආකාශ ප්‍රදෙශය හාත්පසින් කසිණාලොකයෙන්ම වැසීයෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ මාගේ භාවනාවට පූර්වයෙහි මේ ආකාශයෙහි චන්ද්‍ර මණ්ඩල තාරකා රූපාදිය විද්‍යමානව තිබුනේය. දැන් වනාහි මාගේ කසිණාලොකයෙන් ඒ තාරකා රූපාදිය වැසීගියේයයි සිතා ඒ කසිණාලොකයෙහි නිනාතිකාය දුරුකොට පළමු තිබුනාවූ තාරකා රූපාදිය දක්නට කැමැත්ත උපන් බැවින් හා කසිණාලොකයෙහි නිකාන්තිය හලබැවින්ද, ඒකසිණාලොකය අතුරුදන්වීයෙයි. මෙසේ කිසුණු ඉගුළුවීම මූත් තබලකින් පූවක් උගුල්ලන්නාක්මෙන් හෝ කලාලයක් අකුලන්නාක්මෙන් ඉගුළුවීමක් නොවෙයි. තමා විසින් පතුරුවනලද්දාවූ කසිණාලොකයෙහි නිකාන්තිය හැර ඊට යටවූ අවකාශ ප්‍රදෙශයෙහි තාරකා රූපාදිය දකිනු කැමතිකල්හි ඒ කසිණාලොකය නැත්වීයෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ ඒ කසිණාලොකයෙන් වැසී තිබුනාවූ ප්‍රකෘති අවකාශය හා මිශ්‍රනොවූ ජනේල කවුළුවකට බඳුවූ ඒකිසුණු ඉගුළු අවකාශය අරමුණුකොටගෙණ

"අනන්තො ආකාසො අනන්තො ආකාසො" යනුවෙන් භාවනා වඩන කල්හි ඒ කසිණුගුළු අහස අරමුණුකොටගෙණ මනොද්වාරාවර්ජන චිත්තයක් ඉපිද ඊට අනතුරුව ත්‍රිහෙතුක උපෙක්ෂා සහගත මහාකුසල චිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ පරිකර්මාදී නමින් සතර වරක් හෝ උපචාරාදී නමින් තුන්වරක් හෝ උපචාර සමාධි ජවනකෘත්‍යය සිඩකළ කල්හි පස්වැනිව හෝ සතර වැනිව උපෙක්ෂාඑකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාංගය ප්‍රධානකොට ඇති සමතිස් චෛතසිකයකින් යුක්තවූ ආකාශානඤ්චායතන කුශලචිත්තය ආදිකර්මික වශයෙන් එක්වරක් ඉපිද නිරුද්ධවේ. ඉක්බිති ඒ ආකාශානඤ්චායතන ධ්‍යාන ලාභීයොගාවචර තෙමේ ඒධ්‍යානය යටකී පඤ්චාකාරයෙන් පුරුදු කොට යම්කිසි පුරුෂයෙකු විසින් අල්ලාගන්නාලද්දාවූ රන්මිල පොදියක් නැවත නැවත මුදාබලන්නාක්මෙන් මේ යොගාවචරයා විසින් උපදවාගන්නාලද්දාවූ ආකාශානඤ්චායතන කුශල චිත්තයෙහි යෙදුනාවූ උපෙක්ෂා එකාග්‍රතාවන් නැවත නැවත ප්‍රත්‍යවෙක්ෂාකොට බලන්නාවූකල්හි මේ ආකාශානඤ්චායතන කුශල චිත්තයවනාහී රූපාවචර පඤ්චමධ්‍යාන සංඛ්‍යාත සතුරෙකුට ආසන්නවෙයි. කසිණාලොක නැමති රූපය පතුරුවනලද අවකාශයෙහි මේ ධ්‍යානය ලැබූ බැවින් මේ ධ්‍යානය ප්‍රණීත නොවෙයි, විඥානඤ්චායතනධ්‍යානය ප්‍රණීතයයි එහි නිකාන්තිය උපදවාගෙණ විඥානඤ්චායතනධ්‍යානයට භාවනාවඩයි. කෙසේ භාවනාවඩන්නේද යත්? පළමු උපදවාගන්නාලද ආකාශානඤ්චායතන කුශලචිත්තයම "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් භාවනාවඩයි. මෙසේ භාවනාවඩන්නාවූ ඒයොගාවචරයාහට ආකාශානඤ්චායතනධ්‍යානය අරමුණුකොට ගෙණ මනොද්වාරාවර්ජන සිතක් ඉපිද පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යනනමින් සතරවරක් හෝ උපචාර අනුලොම ගොත්‍රභූ යනනමින් තුන්වරක් හෝ ත්‍රිහෙතුක උපෙක්ෂා සහගත කාමාවචර කුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ උපචාර සමාධි ජවන කෘත්‍යවශයෙන් සතර වරක් හෝ තුන්වරක් ඉපිද නිරුද්ධවූකල්හි පස්වෙනුව හෝ සතරවෙනුව උපෙක්ෂා එකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාංගය ප්‍රධාන කොට ඇත්තාවූ සමතිස් චෛතසික ධර්මයකින් සම්පූර්ණවූ විඥානඤ්චායතන අර්පණා කුශලචිත්තය අර්පණාවීථියට බස්නේයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ ආකාශානඤ්චායතනයෙහි කීනයින්ම පඤ්චාකාරයකින් පුරුදුකොට නැවත නැවත ඒ ධ්‍යානයට සමවදිනාකල්හි මාවිසින් ලබනලද්දාවූ මේධ්‍යානයාගේ

අරමුණ ඖදාරිකයයි මා විසින් අත්හරනලද්දාවූ ආකාසානඤ්චායතනධ්‍යාන කුශලචිත්තයමවෙයි. එහෙයින් මේ ධ්‍යානය අප්‍රණීතවෙයි. මීට වඩා සියුම්වූ ප්‍රණීතවූ ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය ලැබුයේනම් මැනවැයි. මෙසේ ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන නිකාන්තිය උපදවාගෙණ යට ආකාසානඤ්චායතනධ්‍යානයාගේ නැතිවීම් සංඛ්‍යාතවූ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ "නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි" යනුවෙන් භාවනාවඩනකල්හි ඒ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ මනොද්වාරාවර්ජනචිත්තය ඉපිද නැවත ඒ අරමුණම එල්බගෙණ උපෙක්ෂාසහගත ත්‍රිහෙතුක කාමාවචර කුශලයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ සතරවරක් හෝ තුන්වරක් හෝ උපචාර සමාධි ජවනකෘත්‍යවශයෙන් ඉපිද නිරුද්ධවූකල්හි උපෙක්ෂාඑකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාංගද්වය ප්‍රධානකොට ඇත්තාවූ සමතිස් චෛතසිකයකින්යුක්තවූ ආකිඤ්චඤ්ඤායතන අර්පණා කුශලචිත්තය අර්පණා වීථියට බස්නේයි. ඉක්බිති ඒ ලැබූවාවූ ධ්‍යානචිත්තය රන්මිල පොදියක් ඇහිඳගත් පුරුෂයෙක් තෙමේ නැවත නැවත උනාබලන්නාක්මෙන් ඒ ලැබූ ධ්‍යානයට නොයෙක්වර සමවදිමින් නැවත ඒ ධ්‍යානය විඤ්ඤාණඤ්චායතනධ්‍යාන නැමති සතුරෙකුට ආසන්නය. එහෙයින්ම අප්‍රණීතවෙයි. නෛවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය වනාහී අතිශයින් ප්‍රණීතයයි ධ්‍යාන නිකාන්තිය උපදවාගෙණ එම ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන චිත්තය අරමුණුකොටගෙණ "සන්තමෙතං පණීතමෙතං" යනුවෙන් නැවත නැවත භාවනාවඩන්නාවූ යොගාවචරයාහට යටකී නයින් ඒ ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන චිත්තය අරමුණුකොටගෙණ මනොද්වාරාවර්ජන සිතක් ඉපිද උපෙක්ෂා සහගත කාමාවචර ත්‍රිහෙතුක කුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා චිත්තයක් තෙමේ සතරවරක් හෝ තුන්වරක් හෝ උපචාර සමාධි ජවන කෘත්‍යය සිද්ධකොරෙමින් ඉපිද නිරුද්ධවේ. තදනන්තරව උපෙක්ෂා එකාග්‍රතා යන ධ්‍යානාංගද්වය ප්‍රධානකොට ඇත්තාවූ සමතිස් චෛතසිකයකින් සම්පූර්ණවූ නෛවසඤ්ඤානාසඤ්ඤායතන අර්පණාධ්‍යාන චිත්තය පස්වැනිව හෝ සතරවැනිව එක්වරක් ඉපිද නිරුද්ධවේ. ඒ ධ්‍යානචිත්තයද යටකීනයින් පඤ්චාකාරයකින් පුරුදුකොට අභිමත කාලයෙහි ධ්‍යාන සමාපත්ති සැපයෙන් දවස්යවයි. මෙහි වනාහි විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබන්නාවූ යොගාවචර පුද්ගලතෙමේ මා විසින් ලබනලද්දාවූ ආකාසානඤ්චායතනධ්‍යානය රූපාවචර පඤ්චමධ්‍යානනැමති සතුරෙකුටආසන්නය, එසේම අඞ්ගයෝද දුර්වල වන්නාහුය,

විඤ්ඤාණඤ්චායතනධ්‍යානය වනාහි අතිශයින් සියුම්ය ප්‍රණීත යයි යනාදීන් විඤ්ඤාණඤ්චායතනධ්‍යානයෙහි ගුණදැක ආකාසානඤ්චායතනධ්‍යානය කෙලපිඩක් මෙන් පිළිකුල්කොට අත්හරියි. එතකුදුවුවත් විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවනු පිණිස ඒ පිළිකුල්කටයුතුවූ ආකාසානඤ්චායතනධ්‍යානයම නැවත "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් ඒ පිළිකුල්වූ ධ්‍යානයම කුමක්හෙයින් අරමුණුකොට භාවනාවඩන්නේද යත්? විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබනු කැමති යොගාවචරයා විසින් ඒ ධ්‍යානය ඉපදවීම පිණිස ආකාසානඤ්චායතන කුශලවිඤ්ඤාණය හැර භවත්‍රයෙහිම වෙන අරමුණක් නැත්තේය. ඉදින් ඒ විඤ්ඤාණඤ්චායතනය උපදවන්නේවීනම් ඒධ්‍යානයෙන් විෂ්කම්භනය කටයුතුවූ කෙලෙසුන් ප්‍රහාණයකිරීමට අතිකුත් ධ්‍යානයෙක්ද නැත්තේය. ඒධ්‍යානයෙහි ඇත්තාවූ උපෙක්ෂා එකාග්‍රතාවන් ප්‍රත්‍යවෙක්ෂා නොකොට හැක්කේය. මෙසේ විඤ්ඤාණඤ්චායතනයෙහි ඇත්තාවූ අනුශස් දැක මුලපටන් පිළිකුල්කොට හරනලද්දවූ ආකාසානඤ්චායතනධ්‍යානයම අරමුණුකොට භාවනා වඩා ප්‍රණීතවූ විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවයි. ඊට උපමාකවර යත්? තමාගේ රාජ්‍යයෙහි අනුශාසනාකරන්නාවූ රජ තෙමේ වනාහි ප්‍රාණඝාතාදී දුශ්චරිතයෙහි හැසිරෙන්නේය. දශරාජධර්මයෙන් හාත්පසින් දුරුව සතර සඟරාවතින්මෙන්ව රාජ්‍යය අනුශාසනාකරයි. ඒ රජහට අධර්මයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාවූ එක්තරා අමාත්‍යයෙක් තෙමේ හාත්පසින්ම ඒ රජහුගේ දුශ්චරිතයන්ට පිළිකුල්කරයි. එතකුදුවුවත් ඒරජහට සෙවානොකොට තමාගේ අඹුදරුවන් පොෂ්‍යයනොකොට හැකිවෙයි. ඇත් අස් රන්රිදී ආදීවූ උපභොග පරිභොග වස්තුවද නොලැබිය හැකිවෙයි. මෙසේ ධාර්මිකවූ අමාත්‍ය තෙමේ ඒ දුෂ්ටවූ පිළිකුල්වූ රජහු තමාගේ ඓහලෞකික අර්ථය සලකා ඒ රජහට සෙවාකොට සිත්වූ පරිද්දෙන් පස්කම්සැප අනුභවකරයි. එපරිද්දෙන්ම ආකාසානඤ්චායතනධ්‍යානයට පිළිකුල්කරන්නාවූ විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබනු කැමති යොගාවචර තෙමේ ඒ ධාර්මිකවූ රාජාමාත්‍යයා මෙන්ද, පිළිකුල්වූ රජහු ආකාසානඤ්චායතනධ්‍යානය මෙන්ද, ඒ රජහට සෙවාකිරීමක්මෙන් තමාගේ සිත නොකැමතිවම අතික් අරමුණක් නැතිහෙයින් ආකාසානඤ්චායතනධ්‍යානයම අරමුණුකොට භාවනාකිරීමද, ඒරජහට සෙවාකිරීමෙන් ලබනලද්දවූ උපභොග පරිභොග සම්පත්තියක් මෙන් විඤ්ඤාණඤ්චායතනධ්‍යාන ලාභයද, ඒ අමාත්‍යතෙමේ රජහු කෙරෙන් ලබනලද්දවූ ධනයෙන් තමාගේ අඹුදරු දැසිදසාදීන්

පොෂණයකිරීමක්මෙන් විඥ්ඥාණඤ්චායතනධ්‍යානයෙන් කෙලශ විෂ්කම්භනය හා ඒ සමාපත්ති සැපයෙන් දවස් යැවීමද උපමා උපමෙය සම්බන්ධයෙන් අවබෝධකටයුතුයි. මේ රාජෝපමාවචනාංහි අතිකුදු මෙබදු කන්හි යොදා අවබෝදකයුත්තේයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය ලබනු පිණිස භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගලතෙමේ මාවිසින් ලබනලද්දාවූ ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය සට විඥ්ඥාණඤ්චායතනධ්‍යාන සංඛ්‍යාතවූ සතුරෙක් ලංව ඇත්තේය. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය වනාහි අතිශයින් ප්‍රණීතවන්නේය. සියුම්වන්නේය. එහෙයින් ඒප්‍රණීත ධ්‍යානයලැබූයේනම් යෙහෙකැයි සිතා ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය වැසිකිළියක්මෙන් පිළිකුල්කොට හැරදමාගියාවූ යොගාවචර පුද්ගලතෙමේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය ලබනු පිණිස අප්‍රණීත ඖදාරිකයයි දොස් දක්වා හැර ගියාවූ ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයම නැවතත් "සන්තමේතං පණීතමේතං" යනුවෙන් පෙරළා කුමක්හෙයින් භාවනාවඩන්නේද යත්? නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය ලබනු කැමති යොගාවචරයා විසින් මේ ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන චිත්තය හැර අන්කිසි අරමුණක් ජීවිතාන්තය දක්වා භාවනාකෙළේ නමුදු නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය නූපදවිය හැකිවෙයි. ඉදින් පිළිකුල්කොට හැරදමූ ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන නැමති කර්මස්ථානය නොවැඩූසේක්නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන නැමති උතුම්වූ ගුණධර්මයෙන් පරිබාහිරවෙයි. ඒධ්‍යානයෙන් විෂ්කම්භණයකටයුතුවූ කෙලශයෝ අනික්ධ්‍යානයකින් විෂ්කම්භනය නොකටහැක්කේය. මේආදී අනුසස් සලකා පළමුවෙන් පිළිකුල්කරණලද්දාවූ ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයම නැවතත් "සන්තමේතං පණීතමේතං" යනාදීවූ පෙරළා භාවනාකිරීමෙන් ඒඋතුම්වූ ධ්‍යානසමාපත්තිය ලබන්නේවෙයි. ඊට උපමාකවර යත්? මුලුරට අනුශාසනාකරන්නාවූ රජතෙමේ චතුරඞ්ගිනී සේනාව හා රාජාමාත්‍යයන් විසින් පිරිවරණු ලැබ තමාගේ බිසව හා සමග ස්වර්ණාභරණයෙන් සරසනලද්දාවූ හස්තිවාහනාරූඪව නුවර පැදකුණුකරන්නාවූකල්හි එක්තරා වීථියක ඇත්දත් ලියන්නාවූ ඇත්දත් වඩුවෙක් දැක ඔහුගේ කර්මාන්ත දකිණුකැමතිව හස්තියානාවෙන් බැස ඒ සියලඟ දූවිලි තවරාගෙණ කර්මාන්ත කරන්නාවූ ඒ ඇත්දත් වඩුවා ලඟට පැමිණ ඔහු විසින් කරණලද්දාවූ ඇත්දළ කර්මාන්තයක් අතින්ගෙණ ඒ ශිල්පයෙහි අතිශයින් පැහැදී සගය! තොපගේ මේ කර්මාන්තය ඉතාම දක්ෂය. මා කිසිකලෙකත් තොප වැනි කර්මාන්තකාරයෙක් නොදුටුවෙමි.

යනාදීන් ඒ ශිල්පීහට සතුතිකරණකල්හී එහි බලාසිටි එක්තරා අමාත්‍යයෙක් තෙමේ රජ්ජුරුවන්වහන්ස! එසේවීනම් තුඹවහන්සේගේ රාජ්‍යය මේ ශිල්පීහට පාවාදී ඔහුගේ ශිල්පය තුඹවහන්සේ විසින් කටයුතුදැයි වීචාළේනම් ඒකාන්තයෙන්ම රාජ්‍යය ඒශිල්පයට හුවමාරුකරන්ට කැමතිනොවෙයි. මේ උපමාවෙහි ආකිඤ්චඤ්ඤායතනයට හස්තිදන්ත ශිල්පීහු සමානවෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය ලබනු කැමති යොගාවචරයාහට මහරජහු උපමාවෙයි. ඒරාජ්‍ය සම්පත්තියට නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය උපමාවෙයි. මෙසේ උපමා උපමෙය්‍ය සම්බන්ධය දතයුතුයි. ඒ සතර අරූපධ්‍යානයට සමානවූ උපමාවක් නම් කවරයත්? ගේ දොර ආදිය නැත්තාවූ මහත්කාන්තාර මාර්ගයෙක්හි එක්තරා මණ්ඩපයක් ඇතිවෙයි. ඒ මණ්ඩපය යට භූමියෙහි පාදය තැබීමට පවා ස්ථානයක් නැතිව අසූචියෙන් පිරීතිබෙයි. ඉක්බිති එක්තරා පුරුෂයෙක් තෙමේ මහත්වූ සූර්‍ය්‍යතාපයෙන් ක්ලාන්තවූ ශරීර ඇතිව විඩාසන්සිඳවීමට ස්ථානයක් සොයමින් යනුයේ මණ්ඩපය දැක වහාම මණ්ඩපයකරා ගොස් බැලූකල්හි යටභාගයෙහි පාදය පමා තැබීමට අවකාශනොමැතිව අශුචියෙන් පිරීතිබෙයි. එබැවින් විඩාසන්සිඳුවීමට අතික් ස්ථානයකුත් නැතිහෙයින්ද මණ්ඩපය යට අශුචියෙන් පිරීතිබෙනහෙයින්ද ඒපුරුෂතෙමේ මණ්ඩපයෙහි කොණක එල්ලිබිම පාදයන් සපර්ශනොකොට සිටියේයි. ඉක්බිති දෙවෙනි පුරුෂයෙක්ද ඒ මාර්ගයෙහි අවුත් සූර්‍ය්‍යතාපයෙන් මහත්ක්ලාන්තයට පැමිණ පළමු පුරුෂයාමෙන්ම මණ්ඩපයකරාගොස් යටභාගය අශුචියෙන් පිරීතිබෙනු දැක පළමුවෙන් එල්ලී සිටින්නාවූ පුරුෂයාගේ එක් පාදයක එල්ලීසිටියේයි. ඉක්බිති තුන්වැනි පුරුෂයෙක්ද ඒ කාන්තාරමාර්ගයෙහි යනුයේ පෙරසේම සූර්‍ය්‍යතාපයෙන් ක්ලාන්තවී මේ මණ්ඩපය දැක විඩාසන්සිඳුවීම සඳහා මණ්ඩපය කරාගොස් බැලූකල්හි යටභාගය අශුචියෙන් පිරීතිබුනු බැවින් පයතබාසිටීමට අවකාශයක් නැත්තෙන් ඒමණ්ඩපයාගේ අතික් මුල්ලෙහි එල්ලීසිටගත. ඉක්බිති සතරවැනි පුරුෂයෙකුත් ඒකාන්තාර මාර්ගයෙහි ගමන්කොට සූර්‍ය්‍යතාපයෙන් විඩාවට පැමිණ පෙර තුන්දෙනාමෙන්ම ඒ මණ්ඩපයකරාගොස් බැලූකල්හි යටභාගය අශුචියෙන් පිරීතිබෙනුබව දැක තුන්වැනි පුරුෂයාගේ පාදයක එල්ලීසිටගත්තේයි. මේ උපමාවෙහි දීඝීවූ කාන්තාර මාර්ගයමෙන් සංසාරයද, යටභාගය අශුචියෙන් පිරීතිබෙන්නාවූ ප්‍රදෙශයමෙන් කාමලොකයද ඒඅශුචිගොඩ මත්තෙහි මණ්ඩපයමෙන් සතර අරූපභවයද, පළමුවැනි පුරුෂ

තෙමේ මණ්ඩපයෙහි එල්ලීසිටගත්තාක්මෙන් ආකාශානඤ්චාය තනධ්‍යානලාභී තෙමේද. පළමුවැනි පුරුෂයාගේ පාදයෙහි එල්ලීසිටගත් පුරුෂයාමෙන් ආකාශානඤ්චායතනධ්‍යානය අරමුණුකොට විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලැබූ යෝගාවචරතෙමේද ඒ මණ්ඩපයේ අනික් පැත්තේ එල්ලීසිටගත් පුරුෂයාමෙන් ආකිඤ්චඤ්ඤායතනධ්‍යානලාභී යෝගාවචර තෙමේද, තුන්වැනි පුරුෂයාගේ පාදයෙහි එල්ලීසිටගත් පුරුෂයාමෙන් ආකිඤ්චඤ්ඤායතනධ්‍යානචිත්තයෙහි එල්බගෙණ නේවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවාගත් යෝගාවචර තෙමේද, උපමා උපමෙය්‍ය සම්බන්ධ කටයුතුයි. තවද උස්වූ පර්වතයකට නගින්නාවූ පුරුෂයෙක් තෙමේ තමාගේ දෙපය වෙලෙනකල්හී දෙඅත දෙදණෙහි තබා නගින්නාක්මෙන්ද, දෙදණ වෙලෙනකල්හී දෙඅත බිමගසාද, පර්වතයට නගින්නාක්මෙන් දෙදණෙහි දෙඅත තබා නැගීමක්මෙන් විඤ්ඤාණඤ්චායතනධ්‍යානයද, දෙඅත බිමගසා නගින්නාක්මෙන් ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයද, දතයුත්තේයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයෙහි ඇත්තාවූ චිත්ත චෛතසික ධර්මයෝ තුමූ මනායතන ධර්මායතන ධර්මයන්ට ඇතුළත්වන පමණමුත් අතිශයින් සියුම්ය. ඒ චිත්තය වනාහි මනායතන ස්වභාවයෙන් වෙන්නොවූ මාත්‍රයක් ඇත්තේයි. එහෙයින් මනායතනයයි කියත් එහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයෝද ධර්මායතන ස්වභාවයෙන් වෙන්නොවීම් මාත්‍රයක් ඇත්තාහුය "නේවසඤ්ඤා නාසඤ්ඤා" යන පදයෙහි අර්ථය නම්:—ඖදාරිකවූ සංඥාවක්ද නැත්තේය. සංඥා නොමෝ නැත්තේත් නොවෙයි. යන අර්ථයි. "නේවසඤ්ඤා නාසඤ්ඤා" යනුවෙන් සංඥාව ප්‍රධාන කොට වදාළේ නමුදු 'නේව චිත්තං නාචිත්තං" නේව ඵස්සො නාඵස්සො" යනාදීන් මෙහි විද්‍යමානවූ සමස්ත ධර්මයන්ගේ විග්‍රහ අර්ථදතයුතුයි "නේවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යාන චිත්තයෙහි විද්‍යමාන වූ චිත්ත චෛතසික ධර්මයෝවනාහි විදර්ශනාවඩන්නාවූ යෝගාවචර භික්ෂූන්ගේ තිලකුණු භාවනාවට අරමුණුනොවේ. කුමක්හෙයින යත්? ඉතා සියුම් බැවිනැයි දතයුතුයි. මේ චිත්තයෙහි විද්‍යමානවූ ධර්මයන්ගේ ස්වභාව දක්වීමට මතු ප්‍රකාශවන්නාවූ උපමාවෝ දතයුත්තාහුය. ඒ කෙසේ යත්? උපාධ්‍යායයන් හා සමග අන්තෙවාසිකයාද දීර්ඝමාර්ගයෙහි යන්නාවූකල්හි පෙරටුව ගියාවූ අන්තෙවාසිකයා ඉදිරි මාර්ගයෙහි ස්වල්ප දියත්තක් දැක ස්වාමීනි! වහන් මුදව ජලය ඇත්තේයයි කීකල්හි උපාධ්‍යාය තෙමේ ඇවැත්නි! එසේවීනම් ජලශාටිකාව ගණුවයි පැන් සනාගමහයි කීකල්හි ස්වාමීනි! ජලය නැතැයි

කියයි. මේ උපමාවෙහි වහන් තෙමෙන පමණ ස්වල්ප දියක් ඇතිහෙයින් ජලයයි කීහ. නැවනු නාහන පමණ ජලයක් නැතිහෙයින් ජලයනැතැයි කීහ. එපරිද්දෙන් විදර්ශනාවට ගොචර වියයුතුවූ පටුසංඥාවක් නැතිහෙයින් "නෙවසඤ්ඤා" කියාද සංඥාව හාත්පසින් නැත්තේත් නොවනහෙයින් "නාඅසඤ්ඤා" කියාද ව්‍යවහාර කෙරෙත්. තවද උදෘතන්හි උපාධ්‍යයන්වහන්සේ හුළුකැන් වළඳනු පිණිස අනෙතවාසිකයාහට බණවා ඇවැත්නි! පාත්‍රය ගෙණෙවයි කීකල්හි ස්වාමීනි! පාත්‍රයෙහි තෙලැ සිකීයේය. ඉක්බිති ඇවැත්නි! පාත්‍රයෙහි තෙල් ඇත්තේවීනම් පයමකාන තෙල් කුලාව ගෙණෙව තෙල් පුරවාගණිම්හයි කී කල්හි ස්වාමීනි! තෙල්නැතැයි කියයි. එපරිද්දෙන්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතන පදයාගේ සඤ්ඤාව ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යන අර්ථය තේරුම්ගතයුතුයි. මෙහි පාත්‍රයෙහි තෙල් ඇතිබැවින් හුළුකැන් නොවැළඳියනැකියයි කීතැන්හි ඊයේ දවස් පිළිගත්තාවූ තෙල අද්‍යාවකාලිකවූ හුළුකැත හා සමග එක්කොට වැළඳීමෙන් සන්නිධිකාර පරිභොගය වියයුතුහෙයින් ස්වාමීනි! පාත්‍රයෙහි තෙලැයි කීයේයයි දතයුතුයි.

## මේ අරූපද්ධ්‍යානයන්ගේ සංක්ෂෙප විභාගයයි.

ධ්‍යාන චිත්තයන් හා සම්බන්ධයි. අෂ්ටඅභිභායතනයෝ නම් කවරහ යත්? අට්ඨ ඛො ඉමානි ආනන්ද! අභිභායතනානි; කතමානි අට්ඨ? අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඨමං අභිභායතනං — අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං — අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං — අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදංච තුත්ථං අභිභායතනං — අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි සෙය්‍යථාපිනාම උමමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්ස

නං නීලනිභාසං සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං — අජ්ඣත්තං අරූප සඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං ඡට්ඨං අභිභායතනං — අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං, සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං සත්තමං අභිභායතනං — අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි සෙය්‍යථාපි නාම ඔසධිතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාග විමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති, ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. "ඉදං අට්ඨමං අභිභායතනං" — ඉමානි ඛො ආනන්ද! අට්ඨ අභිභායතනානි යනුවෙන් මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි ආවාවූ අභිභායතනයෝ අටදෙන දතයුත්තාහුය.

විමොක්ෂයෝ අටදෙනනම් කවරහයත්? අට්ඨ ඛො ඉමෙ ආනන්ද! විමොක්ඛා, කතමෙ අට්ඨ? රූපී රූපානි පස්සති, අයං පඨමො විමොක්ඛො — අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති,

අයං දුතියො විමොක්ඛො – සුභන්තෙව අධිමුත්තො හොති අයං තතියො විමොක්ඛො – සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො විමොක්ඛො – සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො – සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථිකිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො – සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො – සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත නිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො – "ඉමෙ ඛො ආනන්ද! අට්ඨවිමොක්ඛා" යනුදු මහාපරිනිර්වාණ සූත්‍රයෙහි ආවාවූ විමොක්ෂයෝ අටදෙනායි.

## භා ව ය.

ආනන්දය! මේ අභිභායතනයෝ අටදෙනෙක්වෙත්. ඒ කවර අටදෙනෙක්ද යත්? "අභිභායතනය" යනු මැඩපවත් වන්නාවූ කාරණය යනාර්ථයි. කුමක් මැඩපවත්නාහුද යත්? සතුරුවූ නීවරණ ධර්මයන් හා පරිකර්ම ප්‍රතිභාග ආලම්බණයෝත් මැඩපවත්නාහුය යන අර්ථයි. අභිභායතනයෝ වනාහි ඉදුරු ප්‍රතිපක්ෂභාවයෙන් නීවරණ ධර්මයන් මැඩපවත්වන්නාහුය. පුද්ගලයාගේ ඥානුත්තරිතර භාවයෙන් පරිකර්ම ප්‍රතිභාගාලම්බණයන් මැඩපවත්වන්නාහුය. පරිකර්ම නිමිත්ත හෝ ධ්‍යානය මැඩපවත් වන්නේනුයි අභිභූනම්වේ. මැඩ පැවැත්විය යුතු අරමුණු සඞ්ඛ්‍යාත ආයතනයක් ඇත්තේනුයි අභිභායතන නම්. නොහොත් අරමුණු මැඩපවත්වනයෙයින් අභිභූනම්ද, යොගීන්ගේ සුඛ විශෙෂයට ආධාරවන බැවින් මනායතන ධර්මායතන බැවින් හෝ සසම්ප්‍රයුක්ත ධ්‍යානචිත්තය අභිභායතන නම්වේ. මේ ඥානුත්තරිය භාවය ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩපැවැත්මෙහිද, අරමුණු මැඩපැවැත්වීමෙහිද, යන දෙතැන්හි යෙදිය යුතුයි. හේ කෙසේයත්? පුද්ගලයාගේ ඥානුත්තරිය භාවයෙන් සතුරුවූ නීවරණ ධර්මයන්ද මැඩපවත්වයි. ඒ ඥානුත්තරිය භාවයෙන්ම අරමුණද මැඩපවත්වයි. මේ අභිභායතන යන්නෙහි අර්ථයි. "අජ්ඣත්තං රූපසඤ්ඤී" යනාදියෙහි භාවය කෙසේයත්? අධ්‍යාත්මරූපයෙහි හෙවත් තමාගේ ශරීරගතවූ රූපයෙහි පරිකර්මභාවනා

කිරීම්වශයෙන් උපදවාගන්නාලද්දවූ චතුර්ථධ්‍යානඇත්තාවූ යොගාවචර තෙමේ අධ්‍යාත්ම රූපසංඥීනම්වන්නේයි. අධ්‍යාත්මයෙහි නීලකසිණයට පිරියම්කරණ යොගීතෙමේ නිල්වන්වූ කෙසයෙහි හෝ පිතෙහි හෝ ඇස් මිගිරියෙහි හෝ නීලවර්ණය ගෙණ නීලකසිණයට පිරියම් භාවනාකරයි. පීතකසිණයට ශරීරඡවියට යටභාගයෙහි පිහිටි මේදතෙලෙහි හෝ රන්වන්වූ ඡවියෙහි හෝ අත්පාපිටුවල හෝ අක්ෂීන්ගේ රන්වන් තැන හෝ පීතවර්ණයගෙණ පීතකසිණයට පිරියම්භාවනාකරයි. ලොහිතකසිණයට මාංසයෙහි හෝ ලෙහෙයෙහි හෝ දිවෙහි හෝ අක්ෂීන්ගේ රක්තවර්ණ තැන හෝ රක්තවර්ණයගෙණ පිරියම්භාවනාකරයි. ඔදාතකසිණයට ඇටයෙහි හෝ දන්තයෙහි හෝ නියපිට හෝ අක්ෂියෙහි සෙවත මණ්ඩලයෙහි හෝ ශ්වෙතවර්ණයගෙණ පිරියම්භාවනාකරයි. ඒ සතරාකාර පරිකර්මනිමිත්තම පිරිසිදු නීලවර්ණය හෝ පිරිසිදු පීතවර්ණය හෝ පිරිසිදු රක්තවර්ණය හෝ පිරිසිදුවූ ශ්වෙතවර්ණය හෝ නොවෙයි. අපිරිසිදු වර්ණයමවේ. මෙසේ පරිකර්මභාවනාවශයෙන් උපදවාගන්නාලද්දවූ පරිකර්මනිමිත්ත ඇත්තාවූ යොගාවචර තෙමේ අධ්‍යාත්ම රූප සංඥ ඇත්තේනම්වේ. අර්පණාවශයෙන් නොවේ. ප්‍රතිභාග නිමිත්තාලම්බණවූ අර්පණා නොමෝ අධ්‍යාත්මයෙහිවූ අරමුණු ගොචරකොට නූපදනේමැයි. ඒ අධ්‍යාත්මයෙහි කෙසාදීන්ගේ නීලවර්ණාදිය නීලකසිණ පරිකර්මවශයෙන් භාවනාවඩා ලබනලද්දවූ කසිණනිමිත්තය අපිරිසිදුමවන්නේයි. බාහිරවූ නීලවර්ණ පුෂ්ප නීලවර්ණ කසී සළු නීලමාණික්‍යාදී කසිණනිමිත්ත භාවනාකොට උපදවාගන්නාලද නිමිත්තමෙන් පිරිසිදු නොවේමැයි. “එකොබහිද්ධා රූපානි පස්සති” යනු යමෙක්හට මේ පරිකර්ම නිමිත්ත අධ්‍යාත්මයෙහි උපන්නේවේද ඔහුට උපදනා ප්‍රතිභාග නිමිත්ත බාහිරවම උපදනේයි. ඒ යොගාවචර තෙමේ මෙසේ අධ්‍යාත්මයෙහි උපන් පරිකර්ම නිමිත්තගේ හා බාහිරව උපන් ප්‍රතිභාග නිමිත්ත අරභයා උපදවාගන්නාලද අර්පණාධ්‍යානයාගේදවශයෙන් අධ්‍යාත්ම රූප සංඥඇත්තාවූ බහිර්ධාරූප සඞ්ඛ්‍යාතවූ ප්‍රතිභාගනිමිත්ත සඞ්ඛ්‍යාතවූ රූපයන් ධ්‍යාන නැමති චක්ෂුෂින් දක්නාවූ එකෙකැයි කියනුලැබේ. හෙවත් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්මභාවනාවශයෙන් පහළවූ බාහිරවූ ප්‍රතිභාගනිමිත්ත සඞ්ඛ්‍යාත රූපය චතුර්ථධ්‍යාන නැමති ඇසින් බලන්නාවූ යොගාවචරයයි කියනුලැබේ. “පරිත්තානි” යනු යම් යම් පරිච්ඡෙදකින් කුළු වට්ටි පමණවූ හෝ සරාව මාත්‍රවූ හෝ නොවඩනාලද පළමු කටගත් ප්‍රමාණවූ පිරිසිදු වර්ණඇත්තාවූ හෝ දුර්වර්ණවූ හෝ ආලු

ම්බණයෝයි. මේ අභිභායතනයන්හි වර්ණවශයෙන් මෙනෙහි කිරීම් ඇත්තේ නමුදු පරිත්තවශයෙන් හෙවත් ස්වල්පවශයෙන්ම වදාරණලද්දේයි. ඒ එසේමැයි. මේ ධ්‍යානාලම්බණයෙහි පරිත්තතාවය ඒ අරමුණ මැඩපැවැත්වීමට හෙතුවූයයි කියනු ලැබේ. වර්ණවශයෙන් මෙනෙහිකිරීම ඇතිවුවත් නැතිවූවත් අභිභායතන භාවනාවනම් තීක්ෂ්ණප්‍රාඥයාහටම නොහොත් බුද්ධානුබුද්ධ ශ්‍රාවකයන්ටම ලැබෙන්නේවෙයි. සෙස්සන්ට නොලැබෙන්නේය යන අදහස ඥාණුත්තරික පුද්ගලයාය යන්නෙන් හැඟේ. **“ඤාණී අභිභුය්‍ය”** යනු යම්සේ සම්පූර්ණ කුක්ෂියක් ඇත්තාවූ පුරුෂයෙක් තෙමේ සැන්දක් පමණ බතක් ලැබ මෙහි වැළඳිය යුතු කුමක් ඇද්දැයි හකුළුවා එක් පිඩක්කොට ගිලින්නේවේද, එපරිද්දෙන්ම ඥාණයෙන් උත්තරිතරවූ විශදප්‍රඥාඇත්තාවූ බුද්ධානුබුද්ධාදී පුද්ගලතෙමේ මේ ස්වල්පාලම්බණයෙහි සමවැදිය යුතු කුමක් ඇත්තේදැයි මේමට බැරෑරුම්නොවෙයි සිතා ඒ කසිණ ප්‍රතිභාග නිමිත්තාලම්බණයෝ මැඩපවත්වා ධ්‍යානයට සමවදන්නේයි. හෙවත් ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමගම මේ අරමුණෙහි අර්පණාවට පැමිණෙන්නේය. යන අදහසි. මෙහි මැඩපැවැත්වීම හා සමවැදීමය යනු උපචාරධ්‍යානාධිගමයට අනතුරුවම අර්පණාධ්‍යානයාගේ ඉපදීමයයි දතයුතුයි. එහෙයින් ප්‍රතිභාගනිමිත්තොත්පාදය හා සමග මෙහි අර්පණාවට පැමිණෙන්නේයයි කීහ. නිමිත්තොත්පත්තිය හා සමග යන අටුවා වචනයෙන් අර්පණාවට මුලින් උපදනා පරිකර්මාදි චිත්තයන්ගේ අභාවය දක්වයි. යමෙක් ක්ෂිප්‍රාභිඥයයි කියනුලැබේද, ඔහට වනාහි උපචාර අනුලෝම, ගොත්‍රභූ, යන උපචාර ධ්‍යානයෝ තුන්දෙනෙක්වෙති. ඔහුටත් වඩා ඥාණුත්තරිය පුද්ගලයාහටම අභිභායතන භාවනාව සමුඬවියයුතුහෙයින් මේ ප්‍රතිභාගනිමිත්ත ඉපදීම හා සමගම උපචාරධ්‍යානයෝ නොයිපදම අර්පණාවට පමුණුවන්නේය යන අදහසි. මෙහි සමහර ආචාර්‍ය්‍යවරයෝවනාහි උපචාරධ්‍යානය උපන්කල්හී ඒ ධ්‍යානය අරභයා යටත්පිරිසෙයින් දෙතුන්ජවන් කෙනෙක් උපදිත්ද, ඒජවනයෝත් උපචාරධ්‍යාන පක්ෂයෙහිම වෙත්. ඊට අනතුරුව භවාඞ්ගපරිවාශයෙන් හෝ උපචාරසෙවනයෙන් හෝ තොරව අර්පණාධ්‍යානයාගේ ඉපදීම නිමිත්තොත්පත්තිය හා සමග අර්පණාවට පැමිණවීමයයි කියත්. ඒ ඔවුන්ගේ මතිමාත්‍රයකි. භවාඞ්ගපරිවාසයෙන් හෝ පරිකර්මාසෙවනයෙන් හෝ අර්පණවාරය නොකැමතිවනලද්දෙය. මහද්ගත අප්‍රමාණ්‍යධ්‍යානයෙහිමෙන් උපචාරධ්‍යානයෙහි එකාන්තයෙන් ප්‍රත්‍යවෙක්ෂාජවනයෝද නොදකැමතිවියයුත්තාහුය. එහෙයින්

උපචාරධ්‍යානයට පැමිණීමෙන් මතුභවාංග කීපයක්හුගේ කෙළවර අර්පණාවට පැමිණෙන්නාහු නිමිත්තොත්පත්තිය හා සමග අර්පණාවට පැමිණීමයයි කියනලද්දෙයි. "සහනිමිත්තුප්පාදෙනෙව" යන අටුවා වචනය අභිප්‍රාය සහිත වචනයක්වෙයි. හෙවත් නෙයාර්ථ වචනයක්වෙයි. නීතාර්ථවචනයක් නොවේමැයි. එහි අභිප්‍රාය යටකියනලද ක්‍රමයෙන්දතයුතුයි. එකල්හි එබඳු ආභොගයක්නැති බැවින් සමවත් ඇතුළුවනොවෙයි. සමවතින් නැංගාහුගේ ආභොගය පූර්වභාග භාවනාවශයෙන් ධ්‍යානක්ෂණයෙහි පැවති අභිභවනාකාරයගෙණ පැවැත්තේයයිදතයුතුයි. අභිධර්ම අටුවාවෙහිවනාහි මෙයින් ඒධ්‍යානයාගේ පූර්වභාගය කියනලද්දේයයි දක්වනලදී. සමාපත්ති අභ්‍යන්තරයෙහි එබඳු ආභොගයක් හැතිකල්හි කුමක්හෙයින් ධ්‍යානසංඥාවෙන්යුක්ත කියනලද්දේදැයි යන චොද්‍යය සඳහා 'අභිභවනං–පෙ–අත්ථි" යනු අටුවායෙහි කීහ. මෙසේ පරිත්තාලම්බණයන් හා ධ්‍යානයෝත් මැඩපවත්වා ධ්‍යාන නැමත් නුවණින්දනිමියි ධ්‍යාන නැමති ඇසින් දක්නෙමියි යන සංඥා ඇත්තේවෙයි.

## මේ පළමුවන අභිභායතනයයි.

දෙවෙනි අභිභායතනයෙහි "අප්පමාණානි" යනු උපන්නාවූ ප්‍රතිභාගනිමිත්ත වැඩීමෙන් අප්‍රමාණවූ මහත්වූ යනඅර්ථයි. එකඟුලවඟුලාදීවශයෙන් වැඩීමට නොපමුණුවනලද්දවූ යන අර්ථයි. එබඳු වැඩීමෙක් මෙහි නොලැබෙනහෙයින් "මහන්තානි" යනු අටුවායෙහි කියනලදී. "තානි අභිභුය්‍ය" යන්නෙහි අර්ථ මෙසේයි:—යම්සේ බොහෝ කනු කැමත්වූ සම්පූර්ණ කුක්ෂියක් ඇත්තාවූ පුරුෂයෙක් තෙමේ එක් වේලකට කෑයුතු ආහාරයෙන් කොටසක් බත් වස්නෙක බෙදූ එළවූකල්හි අන්‍යත් අන්‍යත් බතකුත් ලැබූයේනම් යෙහෙක, මෙ සවල්පවූ බත මට කුමක් කරන්නේදැයි ඒබත් වස්ත සවල්පවශයෙන් දක්නේද එපරිද්දෙන් උත්තරිතර ඥාණවන්ත පුද්ගල තෙමේ මෙහි සමවැදිය යුතු කුමක් ඇත්තේද, මේ ප්‍රතිභාග නිමිත්ත අප්‍රමාණනොවෙයි. මාගේ සිත එකඟකිරීම බැරරුම් නොවන්නේයයි ඒ පරිකර්ම ප්‍රතිභාග නිමිති මැඩපවත්වා සමාපත්තියට සමවදනේය හෙවත් ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමඟ අර්පණාවට පැමිණෙන්නේය යන අර්ථයි. මෙසේ ධ්‍යාන නැමති නුවනන් ප්‍රතිභාග නිමිත්තදන්නෙමියි ධ්‍යාන නැමති චක්ෂුසින් ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත රූපාලම්බණය දක්නෙමියි යන මෙබඳු සංඥා ඇත්තේවේද, මේ දෙවෙනි අභිභායතනයයි.

තුන්වෙනි අභිභායතනයෙහි "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනු නොලැබුනු බැවින් හෝ නොකැමති බැවින් හෝ අධ්‍යාත්ම රූපයෙහි හෙවත් ස්වකීය ශරීරයෙහි කේසාදියෙහි නීලවර්ණාදිය පරිකර්මනිමිත්තවශයෙන් නොගත්හෙයින් අධ්‍යාත්මරූපයෙහි පරිකර්ම සංඥා විරහිතවූ යන අර්ථයි. "එකොබහිද්ධා රූපානි පස්සති" යනු යමෙක්හට පරිකර්මනිමිත්ත හා ප්‍රතිභාගනිමිත්ත බාහිරව උපන්නේවේද, ඒ යෝගාවචර තෙමේ මෙසේ බාහිර පරිකර්මය හා බාහිරප්‍රතිභාග නිමිත්තෙහි උපදවනලද්දාවූ අර්පණාවශේදවශයෙන් අනාධ්‍යාත්ම රූපසංඥාඇත්තාවූ බාහිරවූ ප්‍රතිභාගනිමිති සංඛ්‍යාත රූපයන් ධ්‍යානචක්ෂුසින් දක්නාවූ යෝගාවචර එකෙකැයි කියනුලැබේ. ඒ යෝගාවචර තෙමේ පරිත්තවූ නොහොත් ස්වල්පවූ පිරිසිදුවර්ණවත්වූ හෝ දුර්වර්ණවූ හෝ පරිකර්ම ප්‍රතිභාගනිමිතිහු මැඩපවත්වා චතුර්ථධ්‍යානනැමති නුවනින් ප්‍රතිභාගනිමිති සංඛ්‍යාත රූපය දනිමියිකියාද චතුර්ථධ්‍යානනැමති ඇසින් ප්‍රතිභාගනිමිති සංඛ්‍යාත රූපයන් දකිමියි කියාද යන මෙබඳු සංඥා ඇත්තේවෙයි.

## මේ තුන්වන අභිභායතනයයි.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනාදී සතරවන අභිභායතනයෙහි අර්ථකෙසේයත්? අනාධ්‍යාත්ම රූපසංඥාඇත්තාවූ සමහර යෝගාවචරයෙක් තෙමේ අප්‍රමාණවූ සුවර්ණවූ හෝ දුර්වර්ණවූ හෝ යම් කසිණපරිකර්ම නිමිතිකෙනෙක් භාවනාකොට ප්‍රතිභාග නිමිති උපදවන්නාහුවෙත්ද, ඒකසිණ නිමිතිහු මැඩපවත්වා ප්‍රතිභාගනිමිත්තොත්පාදනසන්තතිය හා සමග චතුර්ථධ්‍යානයට සමවදනේවේද ඒ යෝගාවචර තෙමේ චතුර්ථ ධ්‍යාන නැමති නුවණින් කසිණප්‍රතිභාග නිමිතිහු දන්නෙමියිකියාද, චතුර්ථධ්‍යාන නැමති ඇසින් කසිණ රූපයන් දක්නෙමියි කියාද යන මෙබඳු සංඥා ඇත්තේවෙයි.

## මේ සතරවන අභිභායතනයයි.

මේ අභිභායතනයන් සතරදෙනා අතුරෙන් පළමුවන දෙවන අභිභායතන සංඛ්‍යාතවූ චතුර්ථධ්‍යානය තමාගේ ශරීරාභ්‍යන්තරයෙහිවූ නීල පීත ලෝහිත අවදාත වස්තුහු පරිකර්මනිමිත්තිවශයෙන් භාවනා කොට ඒ පරිකර්ම නිමිත්තයේවශයෙන් ආත්මයෙන් පිටතහි උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිත්ත අරයා

උපදවාගන්නාලද්දාවූ චතුර්ථධ්‍යානය දක්වනලද්දේයි. තුන්වන සතරවන අභිභායතනවය අනුන්ගේ ශරීරයෙහි ඇතුලත්වූ නීල පීත ලෝහිතාවදාත වර්ණවත්වූ වස්තූන් පරිකර්මනිමිතිවශයෙන්ගෙණ භාවනා වඩා උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ උපදවාගන්නාලද්දාවූ චතුර්ථධ්‍යානය දක්වනලදී. මේ සතරෙහි පරිකර්මනිමිති සතරම දුර්වර්ණවද ප්‍රතිභාග නිමිති සතර සුවර්ණවද ලැබෙන සැටි දතයුත්තේයි. තමාගේ ශරීරයෙහි උපදවනලද්දාවූ පරිකර්ම ප්‍රතිභාගනිමිතීහු පරිත්තවශයෙන් හා අප්‍රමාණවශයෙන්ද අනුන්ගේ ශරීරයෙහි උපදවනලද පරිකර්ම ප්‍රතිභාග නිමිතීහු පරිත්තවශයෙන් හා අප්‍රමාණවශයෙන්ද ලැබියයුතුහෙයින් සතර අභිභායතනයයි වදාරණලදී. මේ අභිභායතනයන් සතරදෙනා අතුරෙන් පරිත්තාලම්බණ අභිභායතනය විතර්ක චෛතසිකයන්ගේවශයෙන්ද, අප්‍රමාණාලම්බණ අභිභායතනය මෝහ චරිතයාගේවශයෙන්ද, යහපත් පිරිසිදුවර්ණවත්වූ අභිභායතනය වෙෂ චරිතයාගේ වශයෙන්ද, දුර්වර්ණවූ අභිභායතනාලම්බණය රාගචරිතයාගේවශයෙන්ද, වදාරණලද්දේයි. ඒ ඒ චරිතයන්ට සුදුසු පරිද්දෙන් සත්ප්‍රාය භේදය විශුද්ධිමාර්ගයෙහි කසිණනිර්දේශය බලාදතයුතුයි. පස්වන අභායතනයෙහි විශේෂ කවරේත්? අනාධ්‍යාත්මරූප සංඥා ඇත්තාවූ නොහොත් ආත්මයෙහි රූපයන් නොගෙණ බාහිරවූ රූපයන් පරිකර්මවශයෙන් භාවනා වඩා බාහිරවූ ප්‍රතිභාග නිමිත්ත උපදවාගෙණ එහි චතුර්ථධ්‍යානය උපදවන්නාවූ ඇතැම් ධ්‍යානලාභියෙක් තෙමේ සර්නීලවූ නීලවර්ණවූ අසමහිතන නීලවර්ණ ඇත්තාවූ නීල ප්‍රභාවෙන් යුක්තවූ බාහිරවූ නීල කසිණයන් ධ්‍යාන චක්ෂුසින් බලන්නේයි. යම්සේ සර්නීලවූ නීලවර්ණවූ අසමහිනන නීලවර්ණයෙන් යුක්තවූ නීලප්‍රභා ඇත්තාවූ දියබෙරලිය මල් හෝ යම්සේ කාසීරට උපදනා දෙපිටමට සිලුටුවූ සර්නීලවූ නීලවර්ණ ඇත්තාවූ අසමඝ්තන නීලවර්ණයෙන් යුක්තවූ නීලප්‍රභා ඇත්තාවූ වස්ත්‍රයක් හෝ නිර්දොෂවූ ඉන්ද්‍රනීල මාණික්‍යරත්නයක් හෝවේද, එබඳුවූ බාහිරවූ රූපයන් පරිකර්මවශයෙන් භාවනා වඩා බාහිරවූ ප්‍රතිභාග නිමිත්ත උපදවා ඒ අරමුණුකොට උපදවනලද්දාවූ චතුර්ථධ්‍යානඇත්තාවූ යෝගාවචර තෙමේ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩපවත්වා ධ්‍යානයට සමවදනේය. නොහොත් ප්‍රතිභාග නිමිත්තෙනා තපත්තිය හා සමය අර්පණාවට පැමිණෙන්නේය. ඉක්බිති සමවතින් නැංගාවූ යෝගාවචරයාහට ප්‍රත්‍යවෙක්ෂා ජවන් පවත්නා, හූ. අභිභවන සංඥාව සමාපත්ති ඇතුලෙහිද ආභෝගසංඥාව

සමවතින් නැඟාහටදවන්නේයි. මේ අභිභවන සංඥාවෙන් හා ආභොග සංඥාවෙන්ද ඒ යොගී තෙමේ මෙබඳු සංඥා ඇත්තේ යයි දතයුතුයි.

## මේ පස්වෙනි අභිභායතනයයි.

සවෙනි අභිභායතනය කෙසේ යත්? අනාධ්‍යාත්මවූ හෙවත් බාහිරවූ සර්‍වපීතවූ පීතවර්ණවූ අසම්භින්න පීතවර්ණ ඇත්තාවූ පීතවර්ණ කාන්තිඇත්තාවූ පීතකසිණාලම්බණයන් අරමුණුකොට ධ්‍යාන උපදවන්නාවූ ඇතැම් යොගාවචරයෙක් තෙමේ සර්‍වපීතවූ පීතවර්ණවූ අසම්භින්න පීතවර්ණඇත්තාවූ පීතවර්ණ කාන්තිඇත්තාවූ කිණිහිරි මල් හෝ කසීරට උපදනා දෙපිටමට සිලුටුවූ සර්‍වපීතවූ පීතවර්ණඇත්තාවූ අසම්භින්න පීතවර්ණවූ පීතාවභාසවූ වස්ත්‍රයක් හෝ පුෂ්පරාග මාණික්‍ය රත්නයක් හෝ පරිකර්මවශයෙන් භාවනා වඩා උපදවාගන්නාලද ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ ලබනලද චතුර්ථධ්‍යාන ඇති යොගාවචර තෙමේ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩපවත්වා ප්‍රතිභාගනිමිත්තොත්පත්තිය හා සමග අර්පණාවට පැමිණේයි. සෙස්ස නීලකසිණයට කීනයින් යොදගතයුතුයි.

## මේ සවෙනි අභිභායතනයයි.

සත්වන අභිභායතනයෙහි ස්වරූප කෙසේයත්? අනාධ්‍යාත්මවූ හෙවත් බාහිරවූ සර්‍වලොහිතවූ ලොහිතවර්ණඇත්තාවූ අසම්භින්න ලොහිතවර්ණයෙන් යුක්තවූ ලොහිතාවභාසඇත්තාවූ ලොහිතකසිණාලම්බණයන් අරමුණුකොටගෙණ ධ්‍යානලබන්නාවූ යොගාවචර තෙමේ යම්සේ සර්‍වලොහිතවූ ලොහිත වර්ණ ලොහිත නිදර්ශන ලොහිත අවභාෂඇත්තාවූ බඳුවද මලක් හෝ කසීරට උපදනා දෙපිට මට සිලුටුවූ ලොහිත වස්ත්‍රයක් හෝ ලොහිතාඞ්ක මාණික්‍යරත්නයක් හෝ පරිකර්මනිමිත්තවශයෙන් භාවනා වඩා එයින් උපදවනලද්දාවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ රූපාවචර චතුර්ථධ්‍යානය ලැබුවාවූ ඇතැම් ධ්‍යාන ලාභියෙක් තෙමේ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩ පවත්වා ධ්‍යානයට සමවදනේයි. සෙස්ස නීලකසිණයට කීනයින් දතයුතුයි.

## මේ සත්වන අභිභායතනයයි.

අටවෙනි අභිභායතනයෙහි ස්වරූප කෙසේයත්? අධ්‍යාත්මවූ හෙවත් බාහිරවූ සර්වශ්වේතවූ ශ්වේතවර්ණවූ ශ්වේත අසම්භිත්ත ශ්වේත නිදර්ශන ඇත්තාවූ ශ්වේතාවභාසඇත්තාවූ ඔදාතකසිණාලම්බණයන් අරමුණුකොට භාවනා වඩා ලබනලද චතුර්ථධ්‍යානඇත්තාවූ ඇතැම් යොගාවචරයෙක් තෙමේයම් සේ සර්වශ්වේතවූ ශ්වේතවර්ණ ශ්වේතනිදර්ශන ශ්වේතාවභාසඇත්තාවූ ඕෂධීතාරකාව හෝ කාසිරට උපන් දෙපිට මට සිලුටුවූ වස්ත්‍රයක් හෝ එසේම සර්වශ්වේතවූ ශ්වේතවර්ණ ශ්වේතනිදර්ශන ශ්වේතාව භාසඇත්තාවූ මුක්තාඵලයක් හෝ වජ්‍රමාණික්‍යයක් හෝ පරිකර්මභාවනාවශයෙන් වඩා උපදවාගන්නාලද්දවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොට ලබනලද චතුර්ථධ්‍යානඇත්තාවූ ඇතැම් ධ්‍යානලාභියෙක් තෙමේ ඒ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩපවත්වා ධ්‍යානයට සමවදනේයි. එතාහොත් ප්‍රතිභාග නිමිත්තොත්පත්තිය හා සමග අර්පණාවට පැමිණෙන්නේයි. ඉක්බිති සමවතින් නැංගාවූ යොගාවචරයාහට ප්‍රත්‍යවෙක්ෂා ජවන් පවත්නාහුය. අභිභවන සංඥාව සම්පත්ති ඇතුලෙහිද, ආභොග සංඥාව සමවතින් නැංගාහටවන්නේයි. මේ අභිභවන සංඥාවෙන් හා ආභොග සංඥාවෙන්ද ඒ යොගී තෙමේ මෙබඳු සංඥා ඇත්තේයයි දතයුතුයි.

## මේ අටවෙනි අභිභායතනයයි.

එම්බා ආනන්දය! මේ විමොක්ෂයෝ අටදෙනෙක්වෙති. ඒ විමොක්ෂයෝ අටදෙනනම් කවරහුදයත්? කවරාර්ථයකින් විමොක්ෂනම්වෙත්දයත්? අධිමුච්නාර්ථයෙන් හෙවත් නිශ්චය කරණාර්ථයෙන් විමොක්ෂනම්වෙති. අධිමුච්නාර්ථය යනු කිමෙක්දයත්? සතුරුනිවරණ ධර්මයන්ගෙන් මොනවට මිදෙන අර්ථයෙන් හා ධ්‍යානාලම්බණයෙහි විශෙෂයෙන් ඇලෙනාර්ථයෙන්ද සුඹුමුච්නාර්ථය දතයුත්තේයි. පියාගේ අංකයෙහි දිගහරණ ලද ,ත්පා ඇත්තාවූ ලදරුවාගේ සයනයක්රීමක්මෙන් අනිග්‍රහිතභාවයෙන් හා නිරාසඞ්කාභාවයෙන් පැවැත්මයයි කියනලද්දේවෙයි. මේ අර්ථය වනාහි පශ්චිමවූ අටවෙනි විමොක්ෂයෙහි නොලැබෙන්නේයි. අවශෙෂවූ සප්තවිමොක්ෂයෙහිම ලැබෙන්නේයයි දතයුතුයි. "රූපී රූපානි පස්සති" යනු අධ්‍යාත්ම

යෙහිවූ හිසකෝ ආදී නීලකසිණාදියෙහි හෙවත් යට පළමුවෙනි අභිභායතනයෙහි කීපරිද්දෙන් හිසකෝ ආදීවූ නීලකසිණයෙහිද, මේද තෙල් ආදීවූ පීතකසිණයෙහිද, ලේ ආදීවූ ලෝහිත කසිණයෙහිද ශ්වේතවර්ණ චක්ෂු මණ්ඩලාදීවූ අවදාත කසිණයෙහි දැයි යන සත සතරවර්ණ කසිණයෙහි පිරියම් භාවනාකොට උපදවාගන්නාලද්දාවූ බාහිරවූ ප්‍රතිභාගනිමිත්තයෙහි ලබන ලද්දාවූ සතර රූපධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ ධ්‍යාන නැමති ඇසින් කසිණප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන් දක්නේ වේද මේ පළමුවන විමොක්ෂයයි දතයුතුයි. "රූපී රූපානි පස්සති" යනමෙහි උත්තරපද ලොපයෙන් රූපධ්‍යාන ශබ්දයාගේ ධ්‍යානයන්න ලොප්කොට අස්සත්ථිතද්ධිතයෙහි ඊ ප්‍රත්‍යයකොට රූපී ශබ්දය නිපන්නේයයි දතයුතුයි. එහි අර්ථය රූපධ්‍යාන ලාභීවූ යොගාවචරය යනුයි. "රූපානි" යන්නෙහි කසිණ රූප ශබ්දයාගේ කසිණ යන පූර්වපදය ලොප්කොට රූපානි යනු නිපන්නේයයි දතයුතුයි. එහෙයින් මේ වාක්‍යයාගේ අර්ථය රූපධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ කසිණප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන් ධ්‍යාන නැමති ඇසින් දක්නේය යනුයි. "රූපූපපත්තියා මග්ගං භාවෙති" යන තන්හි ධ්‍යාන ශබ්දය ලොප්කලාක්මෙන් අනන්තයෙහිවූ ධ්‍යාන ශබ්දයකොට අස්ත්‍යාර්ථයෙහි ඊ ප්‍රත්‍යයවශයෙන් රූපී ශබ්දයද, "දෙවදත්තො" යන උදාහරණයෙහි දෙව ශබ්දය ලොප්කොට දත්ත ශබ්දය නිපන්නාක්මෙන් කසිණ රූපානි යන්නෙහි මූලකසිණ ශබ්දය ලොප්කොට "රූපානි" යන්නද නිපන්නේයයි දතයුතුයි.

## මේ පළමුවන විමොක්ෂයයි.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති" යන මෙහි අනාධ්‍යාත්මවූ හෙවත් තුන්වෙනි අභිභායතනයෙහි කී බැවින් තමාගේ ආත්මයෙන් පිට අනුන්ගේ ආත්මය පිළිබඳවූ හිසකෝ මේද තෙල් ලෝහිත අක්ෂිමණ්ඩල සඞ්ඛ්‍යාතවූ සතරවර්ණ කසිණයන් පිරියම් භාවනාකොට උපදවාගන්නාලද්දාවූ බාහිරප්‍රතිභාග නිමිත්තෙහි රූපාවචර චතුර්ථධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ බාහිරවූ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන් චතුර්ථධ්‍යාන නැමති ඇසින් දක්නේවේද, මේ දෙවෙනි විමොක්ෂයයි දතයුතුයි.

"සුභන්තෙව අධිමුත්තො හොති" යනු තුන්වෙනි විමොක්ෂයයි. එහි අර්ථ කවරයත්? යට පස්වෙනි අභිභායතනයෙහි පටන් අටවෙනි අභිභායතනය දක්වා කියනලද්දාවූ අතිශයින් පවිත්‍ර නීලවර්ණවූ දියබෙරලියමල් නිල් කසී සළු නිල්මැණික් ආදීවූ නීලකසිණයෙහිද, කිණිහිරියමල් රන්වන්කසී සළු පුෂ්පරාග මාණික්‍යාදීවූ පීතකසිණයෙහිද බඳුවදමල් රක්තවර්ණකසී සළු ලොහිතඞ්ක මාණික්‍යාදීවූ ලොහිත කසිණයෙහිද, ඖෂධී තාරකා සුදුවන් කසීසළු මුක්තාඵල වජ්‍රමාණික්‍යාදීවූ අවදාත කසිණයෙහිද යන සතරවර්ණ කසිණයෙහි පිරියම් භාවනාකොට උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාතවූ අතිශයින් පවිත්‍ර නීලවර්ණ ප්‍රතිභාගනිමිත්තද, එසේම අතිශයින් පවිත්‍රවූ පීතකසිණ ලොහිත කසිණ අවදාත කසිණ සඞ්ඛ්‍යාතවූ ප්‍රතිභාග නිමිත්හුද සුභයයි ව්‍යවහාරකෙරෙත්. ඒසතරාකාර සුභනිමිත්තෙහි අධිමුත්ති සඞ්ඛ්‍යාතවූ රූපාවචර චතුර්ථධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ සුභයයිකියාම අධිමුත්තිය ලැබූ යොගාවචරයයි කියනුලැබේ. ඒ යොගාවචරයා විසින් උපදවාගන්නාලද්දාවූ රූපාවචර චතුර්ථධ්‍යානය තුන්වෙනි විමොක්ෂනම්වන්නේයි. ප්‍රතිසම්භිදා මාර්ගයෙහි වනාහි මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාර භාවනාවෙන් අප්‍රමාණ සත්ත්වයන් විෂයෙහි බ්‍රහ්මවිහාරය පතුරුවා වාසයකෙරේද ඒ යොගාවචරයාහට සියලු සතුන් අප්‍රතිකූලව වැටහෙන බැවින් ඒසතර බ්‍රහ්මවිහාරයෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිත්හුද සුභයයි ව්‍යවහාරකෙරෙත්. ඒ සුභසඞ්ඛ්‍යාතවූ අරමුණෙහි රූපාවචර චතුර්ථධ්‍යානයෙන් සතුරුවූ නීවරණ ධර්මයන්ගෙන් මිදීම වේද ප්‍රතිසම්භිදානයින් මේ තුන්වන විමොක්ෂයයි කියත්.

සූත්‍රාන්තයෙහි නීලාදී වර්ණකසිණයන්ගෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිත්හු සුභයයිකියාද, පටිසම්භිදාමාර්ගයින් මෛත්‍රී ආදී සතරබ්‍රහ්මවිහාරයෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිත්හු ශුභයයි කියාද, ඒ ඒ දෙශනා නයින් ධර්මස්වාමීවූ තථාගතයන්වහන්සේ විසින් විනය ජනයන්ගේ අදහස් පරිද්දෙන්ද දෙශනා විලාසවශයෙන්ද, වදාළ බැවින් අර්ථ විරොධයක් නැතැයි දතයුතුයි. මේ විප්‍රකාරවූ ශුභසඞ්ඛ්‍යාතවූ අරමුණෙහි උපදවාගන්නාලද්දාවූ රූපාවචර චතුර්ථධ්‍යානයෝ ශුභ විමොක්ෂයයි ව්‍යවහාරකෙරෙත්. මේ ශුභ විමොක්ෂ සඞ්ඛ්‍යාතවූ රූපාවචර චතුර්ථධ්‍යානයෙන් ලබනලද්දාවූ බ්‍රහ්මලොකත්‍රයද පරිත්ත සුභ අප්පමාණසුභ සුභකිණ්හයයි ව්‍යවහාරකෙරෙත්, "සුභය" යනු එකාග්‍රවූ නිශ්චලවූ ප්‍රභාමත්වූ ආලො

කායට නමකි. ඒ බ්‍රහ්මලෝකත්‍රයෙහි උපන්නාවූ බ්‍රහ්මයන්ගේ ශරීර ප්‍රභා විද මීදුමක් ගලාසිටින්නාක්මෙන් ශෛලව එකඝනව පවත්නාහෙයින් පරිත්ත සුභ අප්පමාණ සුභ සුභ කිණ්ණය යන නම් ලබනනාහුවෙත්.

## මේ තුන්වන විමෝක්ෂයයි.

සර්වප්‍රකාරයෙන් රූපසංඥා සඞ්ඛ්‍යාත රූපධ්‍යානයන් ඉක්මවීමෙන් හා ප්‍රතිඝසංඥාවන්ගේ විනාශයෙන්ද හෙවත් දෞර්මනස් සහගත දෙසිත විෂකම්භන ප්‍රහාණවශයෙන් නැසීමෙන්ද නානත්වසංඥාවන්ගේ මෙනෙහිනොකිරීමෙන්ද රූපාවචර පඨමධ්‍යානලාභී යෝගාවචර තෙමේ ඒ ධ්‍යානයට අරමුණුවූ ප්‍රතිභාග නිමිත්ත ආකාශයෙහි කැමති ප්‍රදේශයක පතුරුවා ඒ කසිණ ප්‍රතිභාග නිමිත්ත මෙනෙහි නොකිරීමෙන් කිසුණු ගෙලු එවිං ලබනලද්දාවූ කසිණුග්ඝාටිමාකාසය අරමුණුකොටගෙණ “අනන්තො ආකාසො” යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ෂාඑකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද මේ සතරවන විමෝක්ෂයයි දතයුතු.

සර්වප්‍රකාරයෙන් ඒ ආකාශානඤ්චායතන ධ්‍යානය ඉක්මවා අභ්‍යන්තර පැවති විඥානය හෙවත් ආකාශානඤ්චායතන ධ්‍යාන චිත්තය “අනන්තං විඤ්ඤාණං” යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ගවයකින් යුක්තවූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද මේ පස්වන විමෝක්ෂයයි දතයුතු.

සර්වප්‍රකාරයෙන් ඒ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ඉක්මවා හෙවත් ආකාශානඤ්චායතන ධ්‍යානයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ “නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි” යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ගවයකින් යුක්තවූ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද, මේ සවෙනි විමෝක්ෂයයි දතයුතුයි.

ඉක්බිති සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ඉක්මවා ඒ ධ්‍යාන චිත්තය අරමුණුකොටගෙණ “සන්තමෙතං පණීතමෙතං” යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ෂා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද, මේ සත්වෙනි විමෝක්ෂයයි දතයුතුයි.

ඉක්බිති සම්‍ප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා හෙවත් අනාගාමි අර්හත් ආර්‍ය්‍යයෝ තුමූ ප්‍රථමධ්‍යානාදී අෂ්ටසමාපත්තීන්ට ක්‍රමයෙන් සමවැද වැදගොස් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට දෙවරක් සමවැද සම්‍ප්‍රකාරයෙන් ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය ඉක්මවා සියලු නාමස්කන්ධයන් නිරුද්ධකිරීමෙන් සඤ්ඤාවෙදයිත නිරොධයයි කියනලද්දාවූ නිරොධ සමාපත්තියට සමවැද වාසයකෙරේද, මේ අටවෙනි විමොක්ෂයයි දතයුතුයි.

මේ විමොක්ෂයන් අටදෙනා අතුරෙන් ආකාශානඤ්චායතන ධ්‍යානය සියලු රූපධ්‍යානයන්ගෙන් මිදුනුහෙයින්ද, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ආකාශානඤ්චායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තිය නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයෙන් හා සියලු නාමස්කන්ධයන්ගෙන්ද විශෙෂයෙන් මිදුනු බැවින් විමොක්ෂයයි ව්‍යවහාරකෙරෙත්. මේ විමොක්ෂයන් අටදෙනා අතුරෙන් අටවෙනි විමොක්ෂය හැර අවශෙෂ සප්තවිමොක්ෂයෙහිම අරමුණු නැමති ලදරු තොමේ ධ්‍යාන චිත්ත නැමති පියාගේ ඇකයෙහි කැමති පරිද්දෙන් අතපය දිගහැර නිරාසඞ්කභාවයෙන් සයනයකරයි. අටවෙනි විමොක්ෂයෙහි එබඳු අරමුණක්නැති බැවින් ඒ අර්ථය නොලැබෙන්නේමැයි. සූත්‍රාන්තදෙශනාව පර්‍ය්‍යාය කථාවයි. හෙවත් අප්‍රධාන කථාවෙයි. අභිධර්මදෙශනාව නිෂ්පර්‍ය්‍යාය හෙවත් ප්‍රධාන කථාවවෙයි. එහෙයින් වර්ණාභොගය නැත්තාවූ අභිභායතනයෝ වෙනම කියන ලද්දාහුය. එසේම වර්ණාභොග සහිතවූ අභිභායතනයෝද වෙනම කියනලද්දාහුය. ඒ එසේමැයි. ඒ දෙයාකාර අභිභායතනයෙහිම අභිභවනාර්ථයක් ඇත්තේයි. එසේම මේ සූත්‍රයෙහි හෙවත් මේ මහාපරිනිර්වාණ සූත්‍රයෙහි පර්‍ය්‍යාය දෙශනා බැවින් විමොක්ෂයන්ගේද අභිභවනාර්ථයක් ඇත්තේනුයි "අජ්ඣත්තං රූපසඤ්ඤී" යනාදී ක්‍රමයෙන් පළමුවන දෙවන අභිභායතනයෙහි පළමුවන විමොක්ෂයද, තුන්වන සතරවන අභිභායතනයෙහි දෙවෙනි විමොක්ෂයද, වර්ණාභිභායතන සතරෙහි තුන්වන විමොක්ෂයද, අභිභවනාර්ථය ලැබෙනහෙයින් සංග්‍රහකරණලද්දේයි. අභිධර්මය ප්‍රධාන දෙශනාව බැවින් විමොක්ෂ අභිභායතනයන් අමිශ්‍රවශයෙන් දක්වනු පිණිස විමොක්ෂයන් හැර

අභිභායතනයෝ වදාරණලද්දාහුය. සියලු විමොක්ෂ කෘත්‍යය ඇත්තාවූ ධ්‍යානයෝ විමොක්ෂදෙශනාවෙහි වදාරණ ලද්දාහුයයි දතයුතුයි.

## පදාර්ථ.

සොතාපත්ති මග්ගචිත්තං, සොවාන් මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රයකරා වහනයවන්නාවූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ග සංඛ්‍යාතවූ ශ්‍රොතයට පළමුවම පැමිණීමෙන් ලැබියයුතුවූ මාර්ගසම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද, නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගනැමති ශ්‍රොත්‍රයට පළමුවෙනි පැමිණීමෙන් යුක්තවූ පුද්ගලයාගේ මාර්ගසම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද, සකදාගාමි මග්ගචිත්තං, ශකෘදාගාමි මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ මනුෂ්‍ය ලොකයට එක්වරක්ම එන්නාවූ පුද්ගලයාගේ මාර්ගසම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; අනාගාමි මග්ගචිත්තං, අනාගාමිමාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමධාතුවට නොඑන්නාවූ පුද්ගලයාගේ මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; අරහත්ත මග්ගචිත්තං, අර්හත් මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් පූජා විශෙෂය ඉවසීමට සුදුසුවූ රහත් පුද්ගලයාගේ ස්වභාවයයි කියනලද්දාවූ අර්හත්ඵලයට හෙතුභූතවූ මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; චත්තාරිපි ඉමානිචිත්තානි, සතර ආකාරවූද මේචිත්තයෝ තුමූ; ලොකුත්තර කුශලචිත්තානි නාමහොන්ති, ලොකොත්තර කුශල චිත්තයෝනම් ඇත්තාහුවෙත්; සොතාපත්ති ඵලචිත්තං, සෝවාන් ඵලචිත්තයෙක්ද; නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගනැමති ශ්‍රොතයට පළමුකොට පැමිණීම්වශයෙන් ලබනලද්දාවූ විපාක චිත්තයෙක්ද නොහොත් අභිවෘද්ධි සංඛ්‍යාතවූ සම්මාදිට්ඨි ආදීවූ මාර්ගාඞ්ගයන් හා එක්වයෙදුනාවූ චිත්තයෙක්ද නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍ය්‍යමාර්ග ශ්‍රොතයට පළමුවෙනි පැමිණීම ඇත්තාවූ පුද්ගලයාගේ විපාක භූත චිත්තයෙක්ද; සකදාගාමි ඵලචිත්තං, ශකෘදාගාමි ඵලචිත්තයෙක්ද නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ මනුෂ්‍ය ලොකයට එක්වරක්ම පැමිණියයුතුවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විපාක භූතවූ චිත්තයෙක්ද; අනාගාමි ඵලචිත්තං, අනාගාමි ඵලචිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමධාතුවට නොඑන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විපාකභූතවූ චිත්තයෙක්ද; අරහත්තඵල චිත්තං, අර්හත්ඵල

චිත්තයෙක්ද; නොහොත් පූජාවිශෙෂය ඉවසීමට සුදුසුවූ රහතුන්ගේ ස්වභාවයි කියනලද විපාක භූතවූ චිත්තයෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මෙ කියනලද ප්‍රභෙදයෙන්; චත්තාරිපි ඉමානි චිත්තානි, සතරවැදෑරුම්වූද මේ චිත්තයෝ තුමූ; ලොකුත්තර විපාක චිත්තානිනාම හොන්ති, ලොකුත්තර විපාක චිත්තයෝය යනනම් ඇත්තාහුවෙත්. ඉති එවං යථාවුත්තනයෙන, මේ කියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, කුශල විපාක සංඛ්‍යාතවූ සර්ව ප්‍රකාරයෙන්ද; අට්ඨලොකුත්තර කුසල විපාක චිත්තානි, ලොකුත්තර කුශල චිත්තයෝ සතරදෙනය, ලොකොත්තර විපාක චිත්තයෝ සතරදෙනදැයි යන මේ ලොකොත්තර චිත්තයෝ අටදෙන; සමත්තානි, සම්පූර්ණකරනලද්දාහුය; නොහොත් සංග්‍රහකොට අර්ථගන්නාලද්දාහුය.

## ගා ථා වෝ.

කුසලං, ලොකොත්තර කුශල චිත්තය; චතුමග්ගප්ප භෙදෙන, සතරුකාර ප්‍රභෙද ඇත්තාවූ සොතාපත්ති මාර්ගාදී ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයෙන් යුක්තවූ ප්‍රභෙදවශයෙන්; චතුධා, චතුබ්බිධංහොති, සතරුකාරවන්නේයි; තථා, එපරිද්දෙන්; පාකං, ලොකොත්තර විපාක චිත්තය තෙමේ; තස්ස එව, ඒ ලොකොත්තර කුසල චිත්තයාගේම; ඵලත්තා, විපාකවූහෙයින් චතුධා, චතුබ්බිධංහොති, සතර ආකාරවන්නේයි; ඉති, මෙසේ; අනුත්තරං, ලොකොත්තර චිත්තය; අට්ඨවිධං ඉති, අටවැදෑරුම්යයි; මතං, දන්නාලදි; එවං, යථාවුත්තනයෙන, කියනලද යම් යම් පරිද්දකින්; අකුසලානි, අකුශලචිත්තයෝ තුමූ; ද්වාදස එව සියුං, දොළොස් දෙනෙක්මවෙත්; කුසලානි, කුසල චිත්තයෝ තුමූ; එකවීසති සියුං, එක්විස්සෙක්වෙති; පාකානි, විපාක චිත්තයෝ තුමූ; ඡත්තිංසසියුං, සතිසෙක්වෙති; ක්‍රියා චිත්තානි, ක්‍රියාචිත්තයෝ තුමූ; වීසතීඑව සියුං, විස්සෙක්මවෙති; කාමෙ, එකොළොස් කාමභූමියෙහි; අවචරන්ති, බොහෝසෙයින් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයෝ; චතුපඤ්ඤාසධා, සූපණස් ප්‍රකාරවෙත්යයි; පරමත්ථවිදූ; පරමාර්ථඥවූ භාග්‍යවත්තෙමේ; ඊරයෙ, දෙශනාකරයි. රූපෙ, අසංඥසත්ත්වවර්ජිතවූ පසළොස් රූපභූමියෙහි; අවචරන්ති, යෙභුය්‍යවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයන්; පරමත්ථවිදූ පණ්ණරස ඊරයෙ, යනුසම්බන්ධ කරනු. අරූපෙ, සතර අරූප භූමියෙහි; අවචරන්ති, යෙභුය්‍ය වශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයන්; පරමත්ථවිදූ

වාදස ඊරයෙ, යනු සම්බන්ධකරනු. තථාපන, මුඛ්‍යවාරයෙන් අන්‍යවූ; උපචාරවාරය කියමි; අනුත්තරෙ, නවිලොකොත්තර ධර්මසමූහයෙහිවූ; චිත්තානි චිත්තයන්; පරමත්ථවිදූ අඩ්ඪා ඊරයෙ යනු සම්බන්ධකරනු. නොහොත් කාමෙ කාමාවචරානි, එකොළොස් කාමභූමියෙහි යෙභුය්‍යවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චතුපඤ්ඤාසධා පරමත්ථවිදූ ඊරයෙ" යනු සම්බන්ධකරණු. රූපෙ, රූපාවචරානි, අසංඥසත්ත්වර්ජිතවූ පසළොස් රූපභූමියෙහි යෙභුය්‍යවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, "පරමත්ථවිදූ පණ්ණරස ඊරයෙ" යනු සම්බන්ධකරනු. අරූපෙ, අරූපාවචරානි, අරූපභූමියෙහි බොහෝසෙයින් හැසිරෙන්නාවූ; චිත්තානි පරමත්ථවිදූ වාදස ඊරයෙ, යනු සම්බන්ධකරනු. අනුත්තරෙ අනුත්තරානි, නවවිධ ලොකොත්තර ධර්මසමුදයෙහි ලොකොත්තරවූ; චිත්තානි තථා, චිත්තානිපන, චිත්තයන් චතාභි; අඩ්ඪා පරමත්ථ විදූ ඊරයෙ, යනු සම්බන්ධකරනු. පන, එකදෙශයහැර සමුදායාර්ථය කියමි. මානසං, චිත්තය, ඉත්ථං යථාවුත්තභෙදෙන, කියනලද්දාවූ ජාතිභෙද භූමිභෙදවශයෙන්; එකූනනවුතිප්පභෙදං කත්වා; එකූන් අනූවක් ප්‍රභෙද කොට; විචක්ඛණා, ආභිධම්මික පණ්ඩිතයෝ තුමූ; විභජන්ති විභාගකෙරෙත්. අථවා, නොහොත් එකවීස සතංකත්වා, එක්සිය එක්විස්සක්කොට; විචක්ඛණා, විශෙෂාර්ථවක්ෂණයෙහි දක්ෂ පණ්ඩිතයෝ තුමූ විභජන්ති, විභාගකෙරෙත්. එකූනනවුතිවිධං එකුන්අනූවක් ප්‍රභෙදවූ; චිත්තං, චිත්තයතෙමේ; එකවීසසතං හොති, එකසිය විසිඑකක්වන්නේ; කථං? කෙසේද යත්?

## ලොකොත්තර චිත්තයෙහි විශෙෂ විභාග කෙසේ යත්?

ලොකොත්තර චිත්තයන් අටදෙනා අතුරෙන් සොතාපත්ති මාර්ගතෙමේ නිර්වාණනැමති මහාසමුද්‍රය තරා අතරතුර නොනැවතී යන්නාහෙයින් සොතාපත්ති මාර්ගනම්වෙයි. නිර්වාණයවනාහි මහාසමුද්‍රයාගේ එතරට බඳුවෙයි. සංසාරයවනාහි මහාසමුද්‍රයට බඳුවෙයි. සම්මාදිට්ඨි ආදී ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ඒ මුහුද තරණයකරන්නාවූ නැවකට බඳු උපමා ඇතිවෙයි. විදර්ශනාවඩන්නාවූ යොගාවචර පුද්ගලතෙමේ වනාහි ඒ නැවට නැගී යාත්‍රාකරන්නාවූ පුරුෂයෙකුට බඳුවෙයි. ශ්‍රොතාපත්ති මාර්ගය විසින් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්සතරය, විචිකිච්ඡා සහගත චිත්තය යනමේ අකුශල පචකය ඉතුරු නොකොට නසනු ලැබෙයි. එසේම අපාය ගමනීය ශක්තිඇත්තාවූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත්සතරය, වෙෂ මූලික දෙසිත්ය යන අකුශල ෂට්කය

ඒ ශ්‍රොතාපත්ති මාර්ගය විසින්ම තුනීකිරීම්වශයෙන් ප්‍රහාණය කරනු ලැබෙයි. සකෘදාගාමි මාර්ගය විසින් ඖදාරිකවූ කාමධාතුවෙහි උපදවා සාවුන විපාක දීයයුතුවූ දිට්ඨිගත විප්‍රයුක්තසතරය ද්වෙෂ මූලික දෙසිතය යන අකුශල ෂට්කය තුනීකිරීම්වශයෙන් ප්‍රහාණයකරණුලැබෙයි. සකෘදාගාමි මාර්ගය විසින් යම්කිසි අකුශල ධර්මයක් නිරවශෙෂයෙන් ප්‍රහාණයකරනු නොලැබෙයි. අනාගාමි මාර්ගය විසින් ප්‍රවෘත්ති කාලයෙහි සියුම් විපාක දියහැකිවූ ද්වෙෂ මූලික දෙසිත නිරවශෙෂයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර ඒ අනාගාමි මාර්ගය විසින්ම තුනීකිරීම්වශයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. අර්හත්මාර්ග චිත්තය විසින් රූපාරූප භූමියෙහි විපාක දියයුතුවූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරය, උද්ධච්ච සහගතචිත්තය යන මේ පංචකය නිරවශෙෂයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. මේ මාර්ගයෙන් ප්‍රහාණය කරන්නාවූ අකුශලයන් අතුරෙන් එකම මාර්ගයක්හු විසින් අකුශල ධර්මයෝ සදෙනෙක් ප්‍රහාණයකරනු ලැබෙත්. ඒ සදෙන නම්:–දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුශල්සතරය, විචිකිච්ඡාසම්ප්‍රයුක්ත අකුශලය, උද්ධච්චසම්පයුත්ත අකුශලය යන සදෙනායි. මාර්ගයන් තුන්දෙනෙකු විසින් ප්‍රහාණයකටයුතුවූ අකුශලයෝ දෙදෙනෙක්වෙති. ඒ දෙදෙනා නම්:–ද්වෙෂ මූලික දෙදෙනායි. සතරමාර්ගය විසින්ම ප්‍රහාණය කටයුතුවූ අකුශලයෝ නම්:–සතරදෙනෙකි. ඒ සතරදෙනා නම්–දිට්ඨිගත විප්පයුත්ත සතරදෙනායි. මෙසේ මාර්ගයන්ගේවශයෙන් අකුශලප්‍රහාණය දතයුතුයි. ශ්‍රොතාපත්ති මාර්ගය ලබන්නාවූ ක්ෂණයෙහි ත්‍රෛභූමික සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයන් ගෙන් යම්කිසි ලක්ෂණයක් අරමුණුකොටගෙණ මනොද්වාරාවජ්ජන සිත එක්වරක් ඉපිද පරිකම් උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් මන්දප්‍රාඥයාහට සතරවරක් හෝ උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් තීක්ෂණප්‍රාඥයාහට තුන්වරක් හෝ පූර්වභාගවිදර්ශණා සිත් ඉපිද පස්වෙනුව හෝ සතරවෙනුව උප්පාද ඨිතිභඞ්ගයන්ගෙන් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාර්ගචිත්තය එක්වරක් උපදී. ඒ මාර්ගචිත්තයෙහි සපර්යාදවූ සතිස් චෛතසික ධර්මකොතෙක් ලැබෙත්. ඔවුන්ගෙන් ඇතැම් ධර්මයන්ට සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝයයි කියති. ඒ ශ්‍රොතාපත්ති මාර්ග චිත්තයෙහි යෙදුනාවූ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යන නමින් ප්‍රසිද්ධවූ ප්‍රඥාචෛතසික තෙමේ දුඃඛසත්‍යය පිරිසිඳ දැනීමය සමුදය සත්‍යය නැතිකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂව දැකීමය, මාර්ගසත්‍යය වැඩීමය, යන සතර කෘත්‍යය එකක්ෂණිකව සිද්ධ

කෙරේ. කුමක්මෙන්දයත්? තෙල් පහණක් දල්වූකල්හි අන්ධ
කාරය නැසීමය, ආලෝකය පැතිරයාමය, තෙල්ක්ෂයවීමය,
පහන්වැටිය දැවීමය, යනමේ සතර කෘත්‍යය ඉදිරිපසුනොවී
එකක්ෂණිකව කරන්නාක්මෙන් මේ ශ්‍රොතාපත්ති මාර්ගචිත්ත
යෙහි යෙදුනාවූ ප්‍රඥාචෛතසික නැමැති ප්‍රදීපයද, එකක්ෂණි
කව සතරකෘත්‍යයක් සිඬකෙරේ. ඊට චතුස්සත්‍යාවබොධයයි
කියති. මෙසේ ශ්‍රොතාපත්ති මාර්ගචිත්තයට අනතුරුව ශ්‍රොතා
පත්තිඵල සිත්දෙකක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උප
දිත්. ඒ ශ්‍රොතාපත්ති ඵලසථපුද්ගලයාහට නැවතත් චතුස්ස
ත්‍යය නොපෙණියයි. කුමක්මෙන්දයත්? දල්වූ පහණ නිවී
ගියකල්හී නැවතත් අන්ධකාරය පැතිරයාමක්මෙනි. ඒ යොගා
වචරතෙමේ පෙරසේම අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ
භාවනාවට පටන්ගත්කල්හි ශ්‍රොතාපත්ති මාර්ගයෙහි කීනයින්ම
මනොද්වාරාවර්ජන චිත්තය එක්වරක් ඉපිද පරිකර්ම උපචාර අනු
ලොම වොදාන යන නමින් සතරවරක් හෝ උපචාර අනුලොම
වොදාන යන නමින් තුන්වරක් හෝ මන්දප්‍රාඥතීක්ෂ්ණප්‍රාඥයන්ගේ
වශයෙන් පූර්වභාග විදර්ශණා සිත් උපන්කල්හි පස්වනුව හෝ
සතරවනුව උප්පාදස්ථිති භඞ්ගයන්ගෙන් සම්පූර්ණවූ ශකෘදාගාමි
මාර්ගචිත්තය එක්වරක්ම උපදී. ඒ මාර්ගචිත්තක්ෂණයෙහි දුඃඛ
සත්‍යය වෙන්වෙන්කොට දැනීමය, සමුදයසත්‍යය දුරුකිරීමය,
නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන
කෘත්‍යය සතර ඉදිරි පසුනොවී ඒ ශකෘදාගාමි මාර්ග චිත්තයෙහි
යෙදුනාවූ අඤ්ඤින්ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෛතසිකය යටකී ප්‍රදී
පන්‍යායමෙන් එක්විට සිඬකොරේ, ඊට අනතුරුව ශකෘදාගාමි
ඵලසිත්දෙකක් හෝ තුණක් සුදුසු පරිද්දෙන් උපදීත්. දල්වූ
පහණ නිවීගියකල්හී නැවතත් අන්ධකාරය පැතිරීයාමක්මෙන්
ශකෘදාගාමි ඵලචිත්තය පටන් අනාගාමි මාර්ගය දක්වා නැවතත්
නොදුනීම සිඬවේ. ඒ ශකෘදාගාමි ඵලසථ යොගාවචරතෙමේ
නැවතත් අනිත්‍ය දුඃඛ අනාත්ම භාවනාවඩනකල්හී යටකී
පරිද්දෙන් මනොද්වාරාවර්ජන චිත්තය ඉපිද පරිකර්ම උපචාර අනු
ලොම වොදාන යන නමින් සතරවරක් හෝ උපචාර අනු
ලොම වොදාන යන නමින් තුන්වරක් හෝ පූර්වභාග විදර්ශණා
කෘත්‍යවශයෙන් උපන්කල්හී පස්වෙනුව හෝ සතරවෙනුව
උප්පාදස්ථිතිභඞ්ගයන්ගෙන් සම්පූර්ණවූ අනාගාමි මාර්ගචිත්තය
එක්වරක් ඉපිද නිරුඬවේ. ඒමාර්ගචිත්තයෙහි යෙදුනාවූ අඤ්ඤි
න්ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෛතසික තෙමේ දුඃඛසත්‍යය හාත්
පසින්දැනීමය, සමුදය සත්‍යය දුරුකිරීමය, නිරොධ සත්‍යය

ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන සතරකෘත්‍යය ඒමාර්ගචිත්තයෙහි යෙදුනාවූ අඤ්ඤින්‍ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෛතසිකතෙමේ ඉදිරිපසුනොවී එකාවිට සිඬකෙරේ. ඊට අනතුරුව අනාගාමි ඵලසිත් දෙකක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උපදිත්. ඒ අනාගාමි ඵලචිත්තය පටන් අර්හත්මාර්ග චිත්තක්ෂණය දක්වා දල්වූ පහණ නිවීගියකලක්මෙන් නැවතත් දැකීමවළකී. ඊට අනතුරුව ඒ අනාගාමී යොගාවචර තෙමේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන තිලකුණු වඩනකල්හි යටකී නයින්ම මනොවාරවර්ජන චිත්තයක් ඉපිද පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් සතරවරක් හෝ, උපචාර අනුලොම ගොත්‍රභූ යනනමින් තුන්වරක් හෝ, පූර්වභාගවිදර්ශනා කෘත්‍යවශයෙන් උපන්කල්හි පස්වනුව හෝ සතරවනුව උප්පාදක්ෂීති භඞ්ගයන්ගෙන් සම්පූර්ණවූ එකම අර්හත්මාර්ග චිත්තක්ෂණය උපදී. ඒ මාර්ගචිත්තක්ෂණයෙහි යෙදුනාවූ අඤ්ඤින්‍ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෛතසිකය තෙමේ දුඃඛසත්‍යය වෙන්වෙන්කොටදැනීමය සමුදය සත්‍යයදුරුකිරීමය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන, චතුස්සත්‍යාවබොධය ඉදිරිපසුනොවී එකක්ෂණිකව සිඬකෙරේ. ඊට අනතුරුව අර්හත්ඵල සිත්දෙකක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උපදිත්. ඒ අර්හත්ඵල චිත්තයෙහි යෙදුනාවූ අඤ්ඤාතාවින්‍ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෛතසිකය ඒ මහරහතන්වහන්සේගේ සකන්ධපරිනිර්වාණය දක්වා හෙවත් පිරිනිවීමදක්වා ඒ දුඃඛසත්‍යය පිරිසිඳදැකීමය, සමුදයසත්‍යය දුරුකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය, යන චතුස්සත්‍යයන්ගේ දැනීම නිරන්තරයෙන් පවත්නේයි. සොවාන් සකෘදාගාමි අනාගාමි යන ත්‍රිවිධ මාර්ගක්ෂණයෙහි චතුරාර්‍ය්‍ය සත්‍යයධර්මයන්ගේදැකීම ඒ මාර්ගචිත්තක්ෂණයෙහිම සිඬකෙරේ. අවශෙෂ කාලයෙහි පහණ නිවීගියකලක්මෙන් චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේදැකීම සිඬනොකෙරෙයි. අර්හත්මාර්ගක්ෂණයෙහිහටගන්නාවූ චතුස්සත්‍යයදැකීම ඒ රහතන්වහන්සේගේ පිරිනිවීම දක්වා නිරන්තරයෙන් දල්වාතිබෙන්නාවූ පහණක්මෙන් ඒ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේදැකීම පවත්නේයි. මේ සතරමාර්ගක්ෂණයෙහි හට ගන්නාවූ කෘත්‍යයෝ සොළොස්දෙන සොළොස් මාර්ගකෘත්‍යයයි දතයුතු.

තවද මේ සතර මාර්ගයන්ගෙන් දෙළොස් අකුශලයන්ගේ ප්‍රහාණය හැඟවීමට උපමාවක් දක්වනුලැබේ. ඒකෙසේ යත්? එක්තරා රජකෙනෙක් තමාගේ සියලු අමාත්‍යාදීන් රැස්කොට ඒ අමාත්‍යයන් අතුරෙන් යුඬදක්ෂවූ එක්තරා නුවනැති අමාත්‍ය

යෙක් තෝරා තොපි මාගේ ආඥාව පවත්නාවූ දෙශයාගේ කෙළවර නොහොත් ප්‍රත්‍යන්තදෙශයෙහි අමාත්‍යධුරයෙහි තබමියි ඒ පසල්දනව්වාසීන්ට නිරන්තරයෙන්ම දමරික සොරුන්ගෙන් පීඩාලැබෙත්නේය. තොපි ඒ දමරික සොරුන් සමග යුධකොට පසල්දනව් වාසීන්ට අභයදෙව්යයි කියා ඒ පසල්දනව්වෙහි අමාත්‍යධුරයට පත්කෙළේයි. ඊට නොබෝකලකට පසු නොයෙක් බලසෙනගින් පිරිවරණලද්දාවූ දමරික සොරු දොළොස්දෙනෙක් ඒ පසල්දනව්වට ආවාහුය. ඉක්බිති අමාත්‍යධුරයට පත්කරණලද්දාවූ ඒ අමාත්‍යතෙමේ වහාම මහරජහුකරා අවුත් දෙවයෙනි! මහත් සෙනග විසින් පිරිවරණලද්දාවූ දමරික සොරුන් දොළොස්දෙනෙක් ආවාහුය. කුමක්කෙරෙම්දැයි විචාළේය. ඉක්බිති මහරජතෙමේ ඔහට නිඥකොට එම්බල අඥානය! තොපට මහසැපත්දී පසල්දනව්වෙහි අමාත්‍ය ධුරයට පත්කෙළේ කා බී සැපසේ දවස් යවන්ටද? ඔවුන් හා සමග යුධකරන්ටදැයි ඔහුට අවවාදකොට බලවාහන සමග යුධාවුදපාවාදී වහාමගොස් යුධකරවයි අණකෙළේයි. ඉක්බිති ඒඅමාත්‍යතෙමේ මහරජහු විසින් දෙනලද්දාවූ යුධාවුදාදියගෙණගොස් ඒ මහසෙන් පිරිවරණලද්දාවූ දමරික සොරු දොළොස්දෙන සමග යුධකොට පළමුවෙනි යුධයෙන්ම දමරික සොරදෙටුවන් පස්දෙනෙක් හා ඔවුන්ගේ බලසෙනගද මරාදමා ඉතිරිවූ සත්දෙනාගේද සෙනග මැරීමෙන් දුර්වලකෙළේය. නැවත ඒසත්දෙන ගල්ගුහාදියෙහි සැඟවීගත්තාහුය. අමාත්‍යතෙමේ දෙවෙනිවත් රජහුකරා අවුත් දෙවයෙනි! අපගේ පළමුවෙනි යුධයෙන්ම බලසෙන් සහිතවූ සොරදෙටුවන් පස්දෙනෙක් හාත්පසින් විනාශකරණලද්දාහුය. ඉතිරිවූ සත්දෙනාගේද සෙනග මරා දුර්වලකරණලද්දේයයි සැලකලකල්හී මහරජතෙමේ ඒ අමාත්‍යයාහට මඳක් සතුතිකොට නැවතත් යුධාවුද සම්පත් ආදියදී වහාම ගොස් යුධකරවයි අණකෙළේයි. ඉක්බිති ඒ අමාත්‍යතෙමේ මහරජහුගේ අණපරිද්දෙන් දෙවෙනි වාරයෙහි ගොස් ඒ ඉතිරිවූ සත්දෙනා සමග යුධකොට ඔවුන්ගේ සෙනග මරා බොහෝසෙයින් දුර්වලකෙළේය. එසේදවුවත් ඒදෙවෙනි යුධයෙන් එක සොරදෙටුවෙකුදු විනාශනොකොට හැකිවිය. ඔව්හු දුර්වලව ගල්ගුහාදියෙහි සැඟවීගත්හ. ඉක්බිති අමාත්‍ය තෙමේ නැවතත් මහරජහුකරා අවුත් දෙවයෙනි! අපගේ දෙවෙනි යුධයෙන් එකෙකුදු විනාශනොකොට හැකිවිය. එසේදවුවත් ඔව්හු හාත්පසින් දුර්වලව ගල්ගුහාදියෙහි සැඟවීගියාහයි සැලකෙළේයි. නැවතත් රජතෙමේ අමාත්‍යයාහට සෙනාවාහන සම්පත් ආදිය

දී තුන්වෙනි වරත් ගොස් යුඬකරවයි අණකෙළේයි. අමාත්‍ය තෙමේද රාජාඥාව පරිද්දෙන් තුන්වෙනිවර ගොස් යුඬකිරිමෙන් ඒ දුම්ලවූ සොරදෙටුවන් සත්දෙනා අතුරෙන් සෙනා සහිත දෙදෙනෙකුන් විනාශකෙළේය. ඉතිරිවූ පස්දෙනාද අතිශයින් දුම්ලව ගල්ගුහාදියෙහි සැඟවීගත්හ. ඉක්බිති අමාත්‍ය තෙමේ සතරවෙනි වාරයෙහිත් මහරජහුකරා අවුත් දෙවයෙනි! අපගේ තුන්වෙනි යුඬයෙන් සෙනා සහිතවූ සොරදෙටුවන් දෙදෙනෙක් විනාශවූහ. ඉතිරිවූ පස්දෙන අතිශයින් දුම්ලව සැඟවීගියාහයි සැලකෙළේයි. නැවතත් මහරජතෙමේ සෙනා වාහන සම්පත් ආදීයදී නොබාගොස් යුඬකරවයි ආඥාකෙළේය. ඉක්බිති ඒ අමාත්‍යතෙමේ සතරවෙනි වාරයෙහි මහරජහුවිසින් දෙනලද සෙනා වාහන පිරිවරාගෙණගොස් ඒ දුම්ලවූ සොර දෙටුවන් පස්දෙනා හා සමග යුඬකොට හාත්පසින්ම සෙනා වාහන සහිතවූ ඔවුන් පස්දෙන විනාශකෙළේයි. ඉක්බිති ඒ පසල්දනව්වාසී මනුෂ්‍යයෝ අපගේ පසල්දනව්ව ක්ෂෙමය නිර්භය යයි තමතමන්ගේ දරුවන් ලෙළිනටවමින් ප්‍රීතියෙන් දවස් යවන්ට පටන්ගත්හ. ඒ අමාත්‍යතෙමේද මහරජහුකරා අවුත් මේ සියලු ප්‍රවෘත්ති සැළකළකල්හි අමාත්‍ය මණ්ඩලයාගේ මධ්‍යයෙහි ඔහුට සතුටුකොට නොයෙක් උපභොග පරිභොගසම්පත් ත්‍යාගිවශයෙන් දුන්හ. ඒ අමාත්‍යතෙමේද මහරජහු හා සමග රාජප්‍රාශාදයෙහි ජයපානයකරමින් ප්‍රීතියෙන් දවස් යවන්ට පටන්ගත්තේයි. මේ උපමාවෙන් කවරාර්ථයක් ප්‍රකාශකළසේක්දයත්? එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ගේ මැද ධර්මාසනාරූඪව වැඩහිඳ මහණෙනි! ග්‍රාමාන්ත සෙනාසනයට වඩා ආරණ්‍ය සෙනාසනය උතුම්යයි වදාළ වචනය අසා එක්තරා භික්ෂුකෙනෙක් සර්වඥයන්වහන්සේ විසින් ආරණ්‍ය සෙනාසනය උතුමයයි වර්ණනාකෙළේ නොව්දැයි සිතා වස්විසීමට ලංවූකාලයෙහි ආරණ්‍යසෙනාසනයකට වැද දායකයන් විසින්දෙන්නාවූ ප්‍රණීත ආහාර වළඳමින් නිතර නිදාගැණීමෙන් තුන්මස පසුකොට කාමවිතර්කාදිය ඉපිද ග්‍රාමාන්තයෙහි සිටිකාලයටත් වඩා කෙලෙසුන් විසින් මැඩපවත්වනලද සිත් ඇතිව වස් පවරා බුදුන් කරා අවුත් ස්වාමීනි! නුඹවහන්සේ විසින් ආරණ්‍ය සෙනාසන උතුමැයි වදාරණලද්දාවූ වචනය අසා මම අරණ්‍ය සෙනාසනයෙහි වස්තුන්මස පසුකෙළෙමි. එතකුදුවුවත් කිසි ගුණධර්මයක් නූපන්නේයයි සැලකෙළේයි. ඉක්බිති සර්වඥයන්වහන්සේ එම්බල මොඝ පුරුෂය! ආරණ්‍යයට වැද යහපත් ආහාර පානවශීාදිය අනුභවකෙරෙමින් දවස් යැවීමෙන් කවර ගුණ

ධර්මයක් උපදින්නේද? නොපි මේ පඤ්චස්කන්ධය අනිත්‍යය දුඃඛය අනාත්මය යනාදීන් විදර්ශනාකාරවයි මෙය වදාරා කමටහන් දුන්කල්හි ඒ භික්ෂුතෙමේ පළමු සිටි ආරණ්‍යයටම වැද සර්වඥයන් වහන්සේ විසින් දෙනලද කමටහන් වඩා සෝවාන් මාර්ගයට පැමිණීමෙන් බලසෙන් සහිතවූ සොරදෙටුවන් පස්දෙනෙකුට බඳු උපමා ඇත්තාවූ දිට්ඨිසම්ප්‍රයුක්ත අකුශල් සතරය, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුශලය, යනමේ පස්දෙන සමුච්ඡේද ප්‍රහාණයෙන් නසා සෙසු අකුශලයන් සත්දෙනාගේ අපායගමනීය ශක්තිය තුනීකොට නැවතත් අවුත් භාග්‍යවත්හට සැළකෙළේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සකෘදාගාමී මාර්ගයට කමටහන්දී නැවතත් ගොස් භාවනාකරවයි වදාළේයි. ඉක්බිති ඒ සෝවාන් ඵලස්ථ ආර්යතෙමේ නැවතත් ගොස් භාවනාවඩා සකෘදාගාමි මාර්ගයට පැමිණ කාමධාතුවෙහි කටුක විපාකදීමට ශක්තිඇත්තාවූ ඒ අකුශලයන් සත්දෙනාගේ ශක්තියතුනීකොට නැවතත් අවුත් භාග්‍යවතුන්හට සැළකෙළේයි. ඉක්බිති භාග්‍යවත් තෙමේ තුන්වෙනිවර අනාගාමි මාර්ගයට කමටහන්දී භාවනාකරවයි පිටත්කෙළේයි. ඒ භික්ෂුතෙමේ තුන්වෙනිවරත්ගොස් භාවනාවඩා අනාගාමි මාර්ගයට පැමිණීමෙන් සොරදෙටුවන් දෙදෙනෙකුට බඳුවූ ද්වේෂ මූලික ප්‍රතිඝසම්ප්‍රයුක්තවූ අකුශලයන් දෙදෙන සමුච්ඡේද ප්‍රහාණයෙන් නැසූයේයි. නැවතත් ඒ භික්ෂුතෙමේ බුදුන්සාරා අවුත් මෙපවත් සැළකළකල්හි අර්හත්මාර්ගයට කමටහන්දී පිටත්කෙළේයි. ඒ භික්ෂුතෙමේ භාවනාවඩා අර්හත්මාර්ගයට පැමිණීමෙන් දුර්වලවූ සොරදෙටුවන් පස්දෙනෙකුට බඳුවූ දෘෂ්ටිවිප්‍රයුක්ත අකුශල් සතර හා උද්ධච්චසම්ප්‍රයුක්ත අකුශලයද යන අකුශල් පස සමුච්ඡේද ප්‍රහාණවශයෙන් නැසූයේයි. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සිව්පිරිස් මධ්‍යයෙහි ඒ භික්ෂූන්වහන්සේට සුප්‍රතිපන්නවූ ආර්ය ශ්‍රාවකයාය යනාදීන් ස්තුතිකොට වදාළේයි. ඒ මහරහතුන්වහන්සේ නිර්වාණනැමති මහාප්‍රාසාදයෙහි ධර්මරාජන්වූ ශාස්තෲන්වහන්සේ හා සමග සදාකාලික සැපවිඳිනේයයි දතයුතු. මෙසේ මේ උපමා උපමෙයයන්ගේ සම්බන්ධයෙන් සතරආර්යමාර්ගයන්ගෙන් දෙළොස් අකුශලයන්ගේ ප්‍රහාණීය ගලපාදතයුතුයි. සොළොස් වැදෑරුම් මාර්ගකෘත්‍යයන්ට සාධාරණවූ උපමාවක් දක්වන්නෙම්, ඒකෙසේයත්? මහරජතෙමේ එක් දවසක් රාත්‍රී භාගයෙහි රජවාසල ආරක්ෂාකරන්නාවූ රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු කැමතිව භාණ්ඩාගාරික අමාත්‍යයාට කථාකොට සගයෙනි! රජවාසල රාත්‍රි දවස සැතපෙන්නාවූ රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු

කැමැත්තෙමි, රාජභාණ්ඩාගාරයෙහි දොර හැර හඳනා පිළිගෙණෙවයි නියොගකෙළේයි. ඉක්බිති භාණ්ඩාගාරික තෙමේ රාජභාණ්ඩාගාරයට වැද පහණක් දල්වා රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රන්රුවන් මුතු මැණික් වස්ත්‍රාභරණාදී නොයෙක් සම්පත් බලා වස්ත්‍ර පමණක් රැගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම ඉණිහිසට පැමිණෙනතාක් ඒ වස්තුවදක්නේය. ඉණිහිසින්බිමට බටකල්හී ඒ වස්තුව නොපෙනීයන්නේය. මෙසේ ඒ භාණ්ඩාගාරිකතෙමේ හඳනා පිළිගෙණගොස් රජහුට දක්වාළීය. නැවතත් රජතෙමේ භාණ්ඩාගාරිකයාට කථාකොට භාණ්ඩාගාරයට ගොස් හිස්වෙළුම් ගෙණෙවයි නියොගකෙළේය. භාණ්ඩාගාරික තෙමේ දෙවෙනි වාරයෙහිත් භාණ්ඩාගාරයටවැද පහණක් දල්වා ඒ ප්‍රදීපාලොකයෙන් රාජභාණ්ඩාගාරයෙහි තුබූ රන්රුවන් ආදී වස්තුවබලා හිස්වෙළුම් පමණක්ගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම එනකල්හී ඉණිහිසට පැමිණෙනතාක් ඒවස්තුව දක්නේය. ඉණිහිසින් බිමට බස්නාකල්හී ඒවස්තුව නොපෙනීයයි. රාජපුරුෂතෙමේ හිස්වෙළුම් ගෙණගොස් රජ්ජුරුවන්ට දක්වාලයි. රජතෙමේ තුන්වෙනි වාරයෙහිත් රාජපුරුෂයන්ට සතුටුපඬුරු දෙනු පිණිස රාජභාණ්ඩාගාරයට වැද සැට්ටගෙණෙවයි නියොගකෙළේයි. භාණ්ඩාගාරිකතෙමේ තුන්වෙනි වාරයෙහිත් භාණ්ඩාගාරයටවැද පහණක් දල්වා භාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රන් රුවන් ආදීවූ නොයෙක් වස්තුව බලා සැට්ට පමණක්ගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම එනකල්හි ඉණිහිස දක්වා ඒභාණ්ඩාගාරයෙහි තුබූ වස්තුව දක්නේයි. ඉණිහිසින් බිමටබස්නාකල්හි නැවතත් ඒවස්තුව නොපෙණීයයි. රාජපුරුෂ තෙමේ සැට්ට ගෙණවුත් රජහට දක්වාලයි. මහරජතෙමේ සතරවෙනි වාරයෙහි රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු පිණිස උතුරු සළු ගෙණෙවයි නියොගකරයි. භාණ්ඩාගාරික තෙමේ සතරවෙනි වාරයෙහි භාණ්ඩාගාරයට වැද පහණක්දල්වා එහි තිබෙන්නාවූ නොයෙක් වස්තුවබලා උතුරුසළු පමණක් රැගෙණ ඉණිහිසට පැමිණෙනකල සූර්යයා උදාවෙයි. එහෙයින් සූර්යොදය පටන් හසතඛගමනය දක්වා ඒ රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ වස්තුවදක්ණේයි. මේ උපමාවෙහි පළමුවෙනි වාරයෙහි පහණක් දල්වා රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ අප්‍රමාණ වස්තුව බැලීමක්මෙන් ශ්‍රොතාපත්ති මාර්ගක්ෂණයට පැමිණ ඒමාර්ගක්ෂණයෙහි දුඃඛසත්‍යයාගේ පිරිසිඳදැනීමය. සමුදය සත්‍යයාගේ දුරුකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන චතුස්සත්‍යය ධර්මයන්ගේ කෘත්‍යයෝ රාජභාණ්ඩාගාරයෙහි පහු

ණක් දල්වා එහි තිබෙන්නාවූ රන්රුවන් ආදීවූ වස්තුව දකීමක් වැනිවූවාහුය. නැවත සෝතාපත්ති මාර්ගයට අනතුරුව දෙතුන් සෝතාපත්ති ඵලචිත්තක්ෂණ කෙනෙකුන්ගේ ඉපදීම භාණ්ඩාගාරයෙහි ඉණිහිසට පැමිණීමක් වැනිවෙයි. භාණ්ඩාගාරයෙහි පටන් ඉණිහිස දක්වා ඒ වස්තුව දකිමින් අවුත් ඉණිහිසින් බිමට බටකල්හි නැවත නොපෙනීයාමක්මෙන් දෙතුන් ඵලචිත්තක්ෂණය දක්වා චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ කෘත්‍යය සිද්ධකොට නැවත නොපෙනීයාමක්මෙන් දතයුතු. දෙවෙනි වාරයෙහිත් තුන්වෙනි වාරයෙහිත් පළමුවෙනි වාරයට කීනයින්ම උපමා උපමෙය්‍ය සම්බන්ධකටයුතු. සතරවෙනි වාරයෙහි වනාහි භාණ්ඩාගාරයට වැද පහණක් දල්වීමෙන් එහි ඇත්තාවූ සියලු වස්තුව එකෑමට දක්නාක්මෙන් අර්හත්මාර්ගක්ෂණයෙහි ඉදිරිපසුනොවී චතුස්සත්‍යයන්ගේ කෘත්‍යය සිද්ධකිරීමදතයුතු. සතරවෙනි වාරයෙහි ඉණිහිසට පැමිණිකල්හි සූර්‍ය්‍යයාගේ උදාවීමෙන් රාජභාණ්ඩාගාරයෙහි සියලුවස්තුව දවස මුළුල්ලෙහි දක්නාක්මෙන් අර්හත්ඵල නැමැති සූර්‍ය්‍යයාගේ උදාවීමෙන් ඒ චතුස්සත්‍යයන්ගේ කෘත්‍යය නිරන්තරයෙන් සිද්ධවීමදතයුතු. මේ උපමාවෙහි රාජභාණ්ඩාගාරයෙහි සතරවරක් ප්‍රදීපසතරක් දල්වීමමෙන් සතරමාර්ගයන්ගේ කෘත්‍යයදතයුතුයි. ඒ රාජභාණ්ඩාගාරයෙහි රන්රුවන් ආදී නොයෙක් වස්තුවමෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයෝ දතයුත්තාහුය. රාජභාණ්ඩාගාරය බලන්නාවූ භාණ්ඩාගාරික අමාත්‍යයාමෙන් මාර්ගඵලාධිගමය කරනුකැමති ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් විදර්ශනා කරන්නාවූ යොගාවචර මහණතෙම දතයුතුය. සතරවෙනි වාරයෙහි සූර්‍ය්‍යයාගේ පහළවීමමෙන් අර්හත්ඵලයාගේ පහළවීම දතයුතුයි. සූර්‍ය්‍යොදය පටන් අස්තඞ්ගමනය දක්වා ඒ රාජභාණ්ඩාගාරයෙහි වස්තුව දකීමක්මෙන් අර්හත් ඵලාවබොධය පටන් පිරිනිවන් පෑම දක්වා නිරන්තරයෙන් චතුස්සත්‍යයාගේ කෘත්‍යය සිද්ධකරනබව දතයුතුයි. ඒ සූර්‍ය්‍යයා අස්තඞ්ගතවන්නාක්මෙන් ඒ රහතුන්වහන්සේගේ පිරිනිවීම දතයුතුයි. මේ සොළොස් මාර්ගකෘත්‍යයන්ට සාධාරණවූ උපමාවයි. යටදැක්වූ කාමරූප අරූප කුශලචිත්තයන්ටමෙන් මෙලොකොත්තරචිත්තයන්ට ක්‍රියානැත්තේ කුමක්නිසාදයත්? ලොකොත්තරමාර්ග චිත්තයවනාහි එකක්ෂණිකාවෙයි. ඉදින් කාමරූප අරූප චිත්තයන්ටමෙන් නොයෙක්වර උපදනාහුවීනම් පළමුව උපදනා චිත්තය කුශලයයිකියාද දෙවනුව උපදින්නාවූ චිත්තයෝ ක්‍රියායයිකියාද කියයුත්තාහුය. මාර්ගචිත්තයවනාහි නොයෙක්වර නූපදින්නේ කුමක්නිසාදයත්? සතරමාර්ගයෙන් නැසිය

යුතුවූ ඒ ඒ අකුශල ධර්මයෝවනාහි එකම මාර්ගක්ෂණයෙහිම විනාශවෙති. යම් වෘක්ෂයකට අසනිප්‍රහාරයක් වදිනාකල්හි ඒ වෘක්ෂයෙහි ඇතැම් කොඩස විනාශවී ඇතැම් කොඩශ ජීවත්නොවෙති. අසනිප්‍රහාරයාගේ ප්‍රකෘතිසවභාව යම් වෘක්ෂාග්‍රයකට අසනිප්‍රහාරය සපශීවීනම් ඒවෘක්ෂයාගේ සියක් රියන් දිගඇත්තාවූ මුල්පවා පෘථුවි ගර්භයතුළම විනාශවීයෙති. අසනිප්‍රහාරය වන්නාවූ යම්වෘක්ෂයක මුලක් නැවත ජීවත්නොවෙයි. එපරිද්දෙන්ම මාර්ගයෙන් වධ්‍යවූ කෙලශයන් අසනිප්‍රහාරයක් වැනිවූ මාර්ගචිත්තය සපශීවීමෙන් අනාදිමත් සංසාරයෙහි අනුසයවශයෙන් පැවැත්තාවූ සියලු කෙලෙසුන් නැවත නූපදනාපරිද්දෙන් විනාශවීයෙති. එහෙයින් මාර්ගචිත්තය එක් සත්ත්වයෙකුගේ සන්තානයෙහි එක්වරක්මුත් කිපවරක් නූපදනාහෙයින් ක්‍රියාසිත්නැත්තේයයි දතයුතුයි. තවද කාමරූප අරූප චිත්තයෝවනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තානයෙහි උපදනාකල්හි කුශල්නම්වෙති. බුදුන් රහතුන්ගේ සන්තානයෙහි උපදනාකල්හි කුශලය විපාක නොදියයුතුහෙයින් ක්‍රියායයි ව්‍යවහාරකරති. මාර්ගචිත්තයවනාහි ශෛක්ෂ්‍යසන්තානය හැර අශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි නොඋපදී. එහෙයින් මාර්ගක්‍රියාසිත් නැත්තේයයි දතයුතු. තවද කාමරූපාරූපකුශලයෝ වනාහි නැවත නැවත උපන්නාහු නමුදු තදඞ්ගප්‍රහාණ විෂ්කම්භන ප්‍රහාණවශයෙන් කෙලෙස් නැසීම සිඩකෙරෙති. මාර්ගචිත්තයවනාහි එක්වරක්ම උපදනාහෙයින් කෙලශධර්මයන් නිරවශෙෂයෙන් ප්‍රහාණය කෙරේ, එහෙයින් ක්‍රියාසිත් නැතැයිදතයුතු. ඊට උපමාකවරයත්? යම් ප්‍රත්‍යය දායකයෙක් තෙමේ අපගේ විහාරයෙහි වසන භික්ෂුන්වහන්සේ එක්වේලු වළඳන්නේයයි කීකල්හි අතික් උපාසකයෙක් තෙමේ කිමෙක්ද? පින්වත! තොපගේ භික්ෂුන්වහන්සේ එකාසනිකාංගධාරීද පත්තපිණ්ඩිකාංගධාරීදැයි විචාළකල්හි පින්වත! අපගේ භික්ෂුන්වහන්සේ අඞ්ගධාරිනොවෙයි. දන්නොලැබෙනහෙයින් නොවළඳන්නේයයි පිළිතුරුදෙයි. එපරිද්දෙන්ම මාර්ගචිත්තය තෙමේ නැවත උපදනැසිය යුතුකෙලෙස් නැතිහෙයින් නැවත නැවත මාර්ග චිත්තය නූපදන්නේයයි දතයුතු.

## තදනන්තරවූ සංග්‍රහ ගාථාවන්ගේ භාවය මෙසේයි.

යටකීයනලද්දාවූ චිත්තයෝවනාහි දොළොස් අකුශලය, එක්විසිකුශලය, සතිස්විපාකය, විසිඳ්ක්‍රියායයි මෙසේ අකුශල් අකු

ශල් හා සමඟද කුශල් කුශල් හා සමඟද විපාක විපාක හා සම ඟද ක්‍රියාචිත් ක්‍රියාචිත් හා සමඟද සමාන ජාතිකවූ ඒ ඒ චිත්ත යන් ඒ ඒ ජාතියෙහි සංග්‍රහකොට ගත්කල්හි ඒ සියලු චිත්තයෝ එකූන් අනූවක්වෙත්. ඒ එකූන් අනූවක් චිත්තයෝ එකාසූවක් ලෞකික චිත්තය, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක්දැයි යන දෙයාකාරයකින්ද, කාමාවචර චිත්තයෝ සූපණසෙක, මහග්ගත චිත්තයෝ සත්විස්සෙක, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක්දැයි යනමේ සතරාකාර සංග්‍රහයෙන්ද; අශොභන චිත්තයෝ සමතිසෙක, නොහොත් දොළොස් අකුසල් හා අකුසල විපාක සතදැයි යන එකූන්විසි අශොභන චිත්තයෝද, ශොභන චිත්තයෝ එකූන්සැටෙක, යනමේ දෙයාකාරයකින්ද; අකුශල චිත්තයෝ දොළොස් දෙනෙක, අහෙතුක චිත්තයෝ අටළොසෙක, කාමාවචර චිත්තයෝ සූවිස්සෙක, රූපාවචර චිත්තයෝ පසළොසෙක, අරූපාවචර චිත්තයෝ දොළොස්දෙනෙක, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක, යනමේ සයාකාර ක්‍රමයෙන්ද; ලොභ මූලික චිත්තයෝ අටදෙනෙක, ද්වෙෂ මූලික චිත්තයෝ දෙදෙනෙක, මොහ මූලික චිත්තයෝ දෙදෙනෙක, අහෙතුක අකුශල විපාකයෝ සත්දෙනෙක, අහෙතුක කුශල විපාකයෝ අටදෙනෙක. අහෙතුක ක්‍රියාවෝ තුන්දෙනෙක, කාමාවචර කුශල් අටෙක, කාමාවචර විපාක අටෙක, කාමාවචර ක්‍රියා අටෙක, රූපාවචර කුශල් පසෙක, රූපාවචර විපාක පසෙක, රූපාවචර ක්‍රියා පසෙක, අරූපාවචර කුශල් සතරෙක, අරූපාවචරවිපාක සතරෙක, අරූපාවචර ක්‍රියා සතරෙක, මාර්ගචිත්තයෝ සතරෙක, ඵලචිත්තයෝ සතරදෙනෙකැයි යනමේ සංග්‍රහයෙන්ද, නොයෙක් නාමයන්ගෙන් හා ලක්ෂණයන්ගෙන්ද, දක්වනලද්දාවූ චිත්තයෝ සර්වප්‍රකාරයෙන් එකූන්අනූවක්මවෙත්.
"ද්වාදසාකුසලානෙවං" යනාදී සංග්‍රහ ගාථාවෙහි අභිප්‍රායනම්:- ජාතිභෙදවශයෙන් සංග්‍රහකරනකල්හි අකුශලජාතිය, කුශල ජාතිය, විපාකජාතිය, ක්‍රියාජාතිය,යි යන සතරාකාරවන්නේය යතුයි. "චතුපඤ්ඤාසධා කාමෙ" යනාදී ගාථාවෙහි අභිප්‍රාය නම්:-චිත්තය තෙමේ කාමාවචරචිත්තය, රූපාවචරචිත්තය, අරූපාවචරචිත්තය, ලොකොත්තරචිත්තයයි මෙසේ භූමිවශයෙන් සතරාකාරවන්නේය යතුයි. භූමිතොමෝ ස්ථානභූමිය අවස්ථාභූමියයි දෙවැදෑරුම්වේ. ඒ දෙවැදෑරුම් භූමීන් අතුරෙන් ස්ථානභූමිය යනු ඒ ඒ චිත්තයන් එකාන්තයෙන් ලැබිය යුතුවූ භූමියයි. අවස්ථාභූමිය යනු ඒ ඒ චිත්තයන් උපදනාකාලය සඳහා කීහ. කාමභූමිය රූපභූමිය අරූපභූමිය යනමේ භූමිත්‍රය

ඒ ඒ චිත්තයන් බොහෝසෙසින් හැසිරෙන ස්ථාන බැවින් ස්ථාන
භූමිනම්වේ. ඒ ඒ චිත්තයන් හටගන්නාවූ අවස්ථාව අවස්ථා භූමි
නම්වෙයි ලෝකොත්තර චිත්තය වනාහි කාමභූමින්මෙන් හටග
න්නාභූමියක් නැතිහෙයින් බුඩාදීන්ගේ පහලවීම ඇතිකල්හි අධි
ගම අන්තර්ධානය නොවනතාක්කල් ලෝකොත්තර භූමියකි
අවස්ථාවශයෙන්ගතයුත්තේයි. ලෝකොත්තර චිත්තය හටගන්
නාවූ භූමියක්නම් ඒකාන්තයෙන්ම නැත්තේයි. එතකුදුවුවත්
අධිගම අන්තර්ධානය නොවනතාක්කල් ඒ ත්‍රිවිධභූමියම අවස්ථා
භූමිවශයෙන් ගතයුත්තේයි. ජාතිභෙද භූමිභෙදවශයෙන් දෙවැ
දැරුම්වූ චිත්තය ආභිධර්මික නුවනැති පණ්ඩිතයන් විසින් එක
සියවිසිඑකෙකැයි කියාද බෙදනලද්දේයි.

---

## අ ත්ථ.

කථං? හොති, කෙසේ එකසියවිසිඑකක්වන්නේද යත්?
විතක්කවිචාරපීති සුඛෙකග්ගතා සහිතං, විතර්ක විචාර ප්‍රීතිසුඛ
එකාග්‍රතා යන ධ්‍යානාංග පසකින් යුක්තවූ; පඨමජ්ඣාන සොතා
පත්තිමග්ග චිත්තඤ්ච, ප්‍රථමධ්‍යාන සෝවාන් මාර්ගචිත්තයෙක්ද;
විචාර පීති සුඛෙකග්ගතා සහිතං, විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන
ධ්‍යානාඞ්ග සතරකින් යුක්තවූ; දුතියජ්ඣාන සොතාපත්තිමග්ග
චිත්තඤ්ච, ද්විතීයධ්‍යාන සෝවාන් මාර්ගචිත්තයෙක්ද; පීතිසුඛෙ
කග්ගතා සහිතං, ප්‍රීතිය සැපය එකාග්‍රතාය යන ධ්‍යානාඞ්ගත්‍රය
කින් යුක්තවූ; තතියජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තඤ්ච, තෘතීය
ධ්‍යාන සෝවාන් මාර්ගචිත්තයෙක්ද; සුඛෙකග්ගතා සහිතං, සුඛ
එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ; චතුත්ථජ්ඣාන සොතා
පත්ති මග්ගචිත්තඤ්ච, චතුර්ථධ්‍යාන සෝවාන් මාර්ගචිත්තයෙක්ද;
උපෙක්ඛෙකග්ගතා සහිතං, උපෙක්ෂා එකාග්‍රතා යන අතික් අඞ්ග
වයකින් සම්ප්‍රයුක්තවූ; පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තඤ්ච,
පඤ්චමධ්‍යාන සෝවාන් මාර්ගචිත්තයෙක්ද; ඉති, ඉමිනාපභෙදෙන,
මේ කියනලද ප්‍රභෙදය කාරණකොටගෙණ; පඤ්චපි ඉමානි
චිත්තානි, මේ චිත්තයෝ පස්දෙනද; සොතාපත්ති මග්ගචිත්තානි
නාමහොන්ති, සොවාන් මාර්ගචිත්තයෝනම්වෙත්. සකෘදාගාමි
මග්ග අනාගාමිමග්ග අරහත්තමග්ගචිත්තඤ්ච, සකෘදාගාමී මාර්ග
චිත්තය, අනාගාමි මාර්ගචිත්තය අර්හත්මාර්ගචිත්තය යන මාර්ග
චිත්තයෝද; තථා, එපරිද්දෙන්; පඤ්ච, (පඤ්චවිධංහොති,) පස් පස්
ප්‍රකාරවන්නේයි. ඉති, මෙසේ; සමවීසතිමග්ගචිත්තානි, සමවිසි
මාර්ගසිත්කෙනෙක්ද; තථා, එසේම විසිආකාරවූ; ඵලචිත්තානිච,

ඵලචිත්තයෝද; ඉති, මෙසේ; ලොකුත්තර චිත්තානි, ලොකොත්තර චිත්තයෝ තුමූ; සම්චත්තාළීස භවන්ති; සමසාළිසෙක් වෙත්. ඉති, තස්මා, එසේහෙයින් නොහොත් මාර්ගඵලචිත්තයන් සමසාළිසක් ප්‍රභෙදවනහෙයින්; එකූනනවුතිවිධං, එකුන් අනූවක් ප්‍රභෙදවූ; චිත්තං, චිත්තය තෙමේ; එකවීසසතංහොත්, එකසිය විසිඑකක්වන්නේයි.

1. පාදකජ්ඣාන සම්මසිතජ්ඣාන පුග්ගලජ්ඣාසයෙසු, පාදකධ්‍යානය සම්මසිතධ්‍යානය පුද්ගලධ්‍යාශයධ්‍යානය යනමොවුන් අතුරෙන්; එකෙත සදිසත්තා, එකී එකී ධ්‍යානය හා සදෘශ බැවින්; එකෙකං, එකී එකී ලොකොත්තර චිත්තය; ඣානඞ්ගයොග භෙදෙන, ප්‍රථමධ්‍යානාදීවූ ධ්‍යානාඞ්ගයන් හා යුක්තවන ප්‍රභෙදයෙන්; පඤ්චධාකත්වා එව, පස් පස් ප්‍රකාරකොටම; අනුත්තරං චිත්තං, ලොකොත්තරවූ චිත්තය; චත්තාළීසවිධං ඉතීච, සතළිස් ප්‍රභෙද ඇත්තේයයිද; වුච්චති, කියනුලැබේ.

2. යථාච-රූපාවචරංච, රූපාවචර චිත්තයද; අනුත්තරම, ලොකොත්තර චිත්තයද; පඨමාදිඣාන භෙදෙන, ප්‍රථමධ්‍යානාදීවූ ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයුක්ත ප්‍රභෙදයෙන්; ගය්හතියථා, යම්සේගණුලැබේද; තථා, එපරිද්දෙන්; ආරුප්පචාපි, දොළොස් අරූපාවචර චිත්තයද; උපෙක්ඛකාග්ගතායොගෙන, උපෙක්ෂා එකාග්‍රතාවන් හා යුක්තහෙයින්; අඞ්ගසමතාය, අඞ්ගයන්ගේ සමානත්වයෙන්; පඤ්චමෙ, පඤ්චමජ්ඣාන භාවෙන, පඤ්චමධ්‍යානයාගේ ස්වභාවයයි කියනලද ව්‍යවහාරයෙන්; යස්මාගය්හති, යම්සේ ගන්නාලැබේද;

3. තස්මා, එසේහෙයින්; පඨමාදිකං, ප්‍රථමධ්‍යානාදීවූ; එකෙකංඣානං, එකෙකී ධ්‍යානචිත්තය; එකාදසවිධං, එකොළොස් වැදෑරුම්යයි; ඊරිතං, කියනලද්දේයි. අන්තෙතු, අන්තංපන, පඤ්චමධ්‍යාන චිත්තයවනාහි; තෙවීසති විධංභවෙ, තෙවිසි වැදෑරුම්වන්නේයි.

4. පුඤ්ඤං, කුශලචිත්තය තෙමේ; සත්තතිංස විධං භවෙ, සත්තිස් වැදෑරුම්වෙයි. තථා, එපරිද්දෙන්; පාකං, විපාක චිත්තය තෙමේ; ද්විපඤ්ඤාසවිධං භවෙ, දෙපණස් වැදෑරුම්වේ. ඉති, තස්මා, එසේ කුශලචිත්තය සත්තිස් වැදෑරුම් හා විපාක චිත්තය දෙපණස් වැදෑරුම් වනහෙයින්; චිත්තානි, චිත්තයෝ; එකවීසසතං, එකසිය විසිඑකක් ප්‍රභෙදඇත්තේයයි. බුධා, ආභිධම්මික පණ්ඩිතයෝ තුමූ; ආහු, කීවාහුය. අභිධම්මත්ථසඞ්ගහෙ, අභිධර්මසප්තප්‍රකරණයෙහි වදාළාවූ අර්ථයන් සංක්ෂෙපයෙන් සං

ග්‍රහණකිරීමක්වූහෙයින් අභිධම්මත්ථසඞ්ගහනම්වූ ප්‍රකරණයෙහි; චිත්තසඞ්ගහ විභාගොනාම, චිත්තසංග්‍රහය බෙදීමට කාරණාවූ; පඨමො පරිච්ඡෙදො, පළමුවන පරිච්ඡේදය; ඉති, මෙසේ සමාප්ත කරනලද්දේයි.

## මෙහි භාවය මෙසේයි,

ලොකොත්තර සිත්තෙමේ ශ්‍රොතාපත්ති මාර්ගයෙහි ප්‍රථම ධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය පචම ධ්‍යානය යන මොවුන්ගේවශයෙන් පසෙක; එපරිද්දෙන් සකෘදාගාමි අනාගාමි මාර්ගයෙහිද අර්හත්මාර්ගයෙහිද පසක් පසක් වන හෙයින් ඒසතරමාර්ගයෙහි ලැබෙන්නාවූ චිත්තයෝ විසිදෙනෙක් වෙත්. එපරිද්දෙන්ම සොතාපත්තිඵලය සකෘදාගාමිඵලය අනාගාමිඵලය අර්හත්ඵලය යන සතර ඵලයෙහිද සිත් පසක් පසක්ම ලැබෙනහෙයින් ඵලචිත්තයෝද විසිදෙනෙක් වෙති. මෙසේ ලොකොත්තර චිත්තයෙහි ධ්‍යානාඞ්ගයන්ගෙන් වැඩිකොට සමසාළිස් සිත් කෙනෙක්වෙත්. එකාසූවක් ලෞකික චිත්තයන් අතුරෙහි මේ සමසාළිස් ලොකොත්තර චිත්තය එක්කොටගත්කල්හි එකසිය විසිඑකක්වෙති. කුසල් හා විපාකයන්ද වැඩෙනහෙයින් සතළොස් ලෞකික කුසලයන් කෙරෙහි විසිමාර්ගකුසල චිත්තය යෙදූකල්හි කුශල චිත්තයෝම සත්තිස් කෙනෙක්වෙති. ලෞකික දෙතිස්විපාක යන් කෙරෙහි ඵලවිපාකවිසිචිත්තය යෙදූකල්හි දෙපණස් විපාක චිත්තයක්වෙති. ලෞකිකවූ ප්‍රථමධ්‍යාන තුණෙක ද්විතීයධ්‍යාන තුණෙක තෘතීයධ්‍යාන තුණෙක චතුර්ථධ්‍යාන තුණෙක පචම ධ්‍යාන තුණෙකැයි මෙසේ ලෞකිකධ්‍යානයෝ පසළොසෙක් වෙති. ලොකොත්තර ධ්‍යානයන්ගේවශයෙන් සොතාපත්ති මාර්ගය හා ඵලය සකෘදාගාමිමාර්ගය හා ඵලය අනාගාමිමාර්ගය හා ඵලය අර්හත්මාර්ගය හා ඵලය යනමේ ලොකොත්තර සිත් අටෙහි ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය පචම ධ්‍යානය යන ධ්‍යානාඞ්ගයන්ගෙන් වැඩිකොටගත්කල්හි ලොකොත්තර ක්‍රමයෙහිම ප්‍රථමධ්‍යානයෝ අටදෙනෙක, ද්විතීය ධ්‍යානයෝ අටදෙනෙක, තෘතීයධ්‍යානයෝ අටදෙනෙක, චතුර්ථධ්‍යානයෝ අටදෙනෙක, පචමධ්‍යානයෝ අටදෙනෙකැයි ප්‍රභෙදවන්නාහුය. මෙසේ ප්‍රභෙදවනහෙයින් ලෞකිකප්‍රථම ධ්‍යානයෝ තුන්දෙනෙක, ලොකොත්තර ප්‍රථමධ්‍යානයෝ අට දෙනෙකැයි මෙසේ ප්‍රථමධ්‍යාන එකොළොසක්වෙති. එසේම ලෞකික ද්විතීයධ්‍යානයෝ තුන්දෙනෙක, ලොකොත්තර ද්විතීය

ධ්‍යානයෝ අටදෙනෙකැයි මෙසේ ද්විතීයධ්‍යාන එකොළොසෙක්
වෙති. ලෞකික තෘතීයධ්‍යාන තුනෙක, ලොකොත්තර තෘතීය
ධ්‍යානයෝ අටදෙනෙකැයි මෙසේ තෘතීයධ්‍යානයෝද එකොළො
සෙක්වෙති. ලෞකික චතුර්ථධ්‍යානයෝ තුන්දෙනෙක, ලොකො
ත්තර චතුර්ථධ්‍යානයෝ අටදෙනෙකැයිද මෙසේ චතුර්ථධ්‍යාන
යෝද එකොළොසෙක්වෙති. ලෞකික රූපාවචර පඤ්චමධ්‍යා
නයෝ තුන්දෙනෙක, ලෞකික අරූපධ්‍යානයෝ දොළොස්
දෙනෙක, පඤ්චමධ්‍යාන ලොකොත්තර අටදෙනෙකැයි මෙසේ
පඤ්චමධ්‍යානයෝ තෙවිස්සෙක්වෙති. ප්‍රථමධ්‍යානය පටන්චතුර්ථ
ධ්‍යානය දක්වා සොමනස්සධ්‍යානයයිද තෙවිසිපඤ්චමධ්‍යානයෝ
උපෙක්ෂාධ්‍යානයයිද කියත්. "ඣානඞ්ගයොගභෙදෙන කත්වෙකෙ
කන්තු" යනාදී ගාථාවෙහි අභිප්‍රාය මෙසේයි. ධ්‍යානයවනාහි
පාදකධ්‍යානය සම්මසිතධ්‍යානය පුද්ගලාධ්‍යාශයධ්‍යානය,යි තුන්
වැදෑරුම්වේ. ඒ මේ තුන්වැදෑරුම් ධ්‍යානයන් අතුරෙන් පාද
කධ්‍යානය යනු ලෞකිකධ්‍යානයක්මවෙයි. ලොකොත්තරධ්‍යාන
යෙහිවනාහි ධ්‍යානයෙන් ලැබියයුතුවූ ඵලය නොකැමැත්තවෙයි.
පාදකධ්‍යානයවනාහි පාදයට බඳු උපමා ඇතිවෙයි. සම්මසිත
ධ්‍යානය හස්තයට බඳු උපමා ඇතිවෙයි. පුද්ගලාධ්‍යාශයධ්‍යානය
වනාහි පාදයෙන් පෘථිවියෙහි පිහිටා සිටගෙණ හස්තයෙන් අභි
මත යම්දෙයක්කිරීමක වැනිවේ. ධ්‍යානලාභී පුද්ගලතෙමේ
මාර්ගය ලබනුකැමතිකල්හි ඒ ධ්‍යානයට සමවැද ඒ සමාපත්ති
යෙන් නැගිට ඒ ධ්‍යානයෙහි අන්තර්ගතවූ නාමරූප ධර්මයන්
අනිත්‍ය දුඃඛ අනාත්මවශයෙන් විදර්ශනා වඩා අභිමතවූ මාර්ගය
උපදවයි. සම්මසිතධ්‍යානයවනාහි යම්ධ්‍යානයකට සමවැදඅතික්
ධ්‍යානයක් සම්මර්ශනයකොට පෙරමෙන්ම මාර්ගය උපදවයි. පුග්ග
ලජ්ඣාසය ධ්‍යානයවනාහි ධ්‍යානලාභී යොගාවචර තෙමේ යම්
ධ්‍යානයකට බඳුවූ මාර්ගයක්ලබම්හයි:අදහස්කෙළේවිනම් ඒධ්‍යාන
යට බඳු මාර්ගයලබයි. පාදකධ්‍යානයෙන් ලබන්නාවූ මාර්ගය පාද
කධ්‍යානයමෙන් පඤ්චඞ්ගිකාදී අඞ්ග ඇතිවෙයි. සම්මසිතධ්‍යාන
ලාභියාද ඒ සම්මර්ශනයකළාවූ ධ්‍යානයට බඳුවූ අඞ්ගඇත්තාවූ
මාර්ගයලබයි. පුග්ගලජ්ඣාසය ධ්‍යානලාභී තෙමේද ඒ තමා අද
හස්කළ ධ්‍යානයට බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගයලබයි.
මේ ත්‍රිවිධාකාරයම ධ්‍යානලාභීන්ට මුත් ශුෂ්ක විදර්ශකයන්ට
නොලැබේ. එසේදවුවත් ශුෂ්කවිදර්ශකයා විසින් ලබන්නාවූ
මාර්ගය එකාන්තයෙන් ප්‍රථම ධ්‍යානයට සමානවූ අඞ්ගපසකින්
යුක්තවන්නේයි. එහෙයින් ශුෂ්ක විදර්ශකයාට හෝ සමථයානික
යාට හෝ ලැබෙන්නාවූ මාර්ගය එකාන්තයෙන් ධ්‍යානාඞ්ගයන්

ගෙන් නොම්දෙන්නේමැයි, ශුෂ්ක විදර්ශකවූ අනාගාමී පුද්ගලයෙක් තෙමේ දිවිහිම්යෙන් ධ්‍යාන නූපදවා හිඳ කාලක්‍රියාකොළේ විනම් ඔහුගේ කාමරාගය නැතිබැවින් කාමධාතුවෙහිද පටිසන්ධිය නොගණී. ධ්‍යානයක් නොලැබූහෙයින් බ්‍රහ්මලොකයෙහිද පටිසන්ධිය නොගන්නේයි. එසේවීනම් ඔහුගේ පටිසන්ධිය කෙසේ වන්නේද යත්? ශුෂ්ක විදර්ශක අනාගාමී තෙමේ සමසිසිව තුර්ථධ්‍යානලාභිව නොහොත් චුතියට පූර්වභාගයෙහි චතුර්ථධ්‍යානය ලබා එයින් චුතව ශුද්ධාවාසයෙහි උපදින්නේයි. සත්‍රිහු තුමූ අනාගාමීවූවද සත්‍රී ආත්මය ඉතා නිහීනවූ බැවින් ඒ නිහීනවූ ආත්ම භාවයෙට අනතුරුව ශ්‍රෙෂ්ඨවූ ශුද්ධාවාස භූමියෙහි පටිසන්ධිය නොගන්නේයි. එසේවීනම් අනාගාමී සත්‍රිහු ශුද්ධාවාස භූමියට කෙසේ යන්නාහුද යත්? ධ්‍යානලාභීවූ සියලු සත්‍රීන්ට නියමවූ බ්‍රහ්මපාරිෂද්‍යයෙහි ප්‍රථමධ්‍යානය උපදවාගෙණ ඒ අනාගාමී සත්‍රිහු පළමුවෙන් ඉපිද ඒ බ්‍රහ්මපාරිෂද්‍යයෙහි සිටගෙන චතුර්ථධ්‍යානය උපදවා බ්‍රහ්මපාරිෂද්‍යයෙන් චුතව ශුද්ධාවාස භූමියෙහි උපදින්නේයයි දතයුතුයි. අනාගාමීවූ ආයතීයන්ට ඔවුන්ගේ අභිප්‍රායානුකූල පරිද්දෙන් පළමුවෙන් ප්‍රථමධ්‍යාන භූමියෙහි ඉපිද එතැන් පටන් සියලු බ්‍රහ්මලොකයෙහි උර්ධංසොත අකනිෂ්ඨගාමීවශයෙන් ඉපිද ඉපිදගොස් අකනිටා තලයෙහිදී රහත්ව පිරිණිවන් පානාහුය. සොවාන් සකෘදාගාමී අනාගාමී යන ත්‍රිවිධ ආයතීයන්ටම ප්‍රථමධ්‍යාන තලය පටන් මතු මතු බ්‍රහ්මලොකයෙහි ඉපිද ඉපිද බ්‍රහ්ම සම්පත්විඳීමට බාධාවක්නැත්තේයි. ලෝකොත්තර සිත් අටය යනු විදර්ශනා නියමවශයෙන් ශුෂ්කවිදර්ශක පුද්ගලයන් දෙදෙනා සඳහා කියනලදී. ලෝකොත්තරසිත් සතළිසය යනු ධ්‍යානනියමවශයෙන් සමථයානික පුද්ගලයන් දෙදෙනා සඳහා කියනලදී. ලෞකිකධ්‍යානය උපදවනු කැමතිකල්හි ප්‍රථමධ්‍යානය ලැබීමට හෙතුවූ පස්විසි කම්ස්ථානයන් අතුරෙන් යම්කිසි කමටහනක් "පඨවි පඨවි" යනුවෙන් භාවනාකළ පමණකින් ප්‍රථමධ්‍යානයලැබේ. විතීයධ්‍යානාදියෙහිද එපරිද්දෙන්ම විදර්ශනාවට නොනගා විතීයධ්‍යානාදිය ලැබීමට හෙතුභූතවූ කර්මස්ථානාදිය "පඨවි පඨවි" යනාදීන් භාවනාවඩා විතීයධ්‍යානාදිය පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය දක්වා සියලු මහද්ගත ධ්‍යානයෝ උපදවන්නාහුවෙත්. මාර්ගභාවනාකරන්නාවූකල්හි මෙසේ "පඨවි පඨවි" යනාදීන් භාවනාවඩා මාර්ගය නොලැබිය හැක්කේය; මාර්ගය ලබනු කැමති යොගාවචරයා විසින් ඒ තමන් විසින් උපදවනලද්දාවූ ධ්‍යානයෙහි ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් ආරෝපණය කොට

"පඨවී අනිච්චං පඨවී අනිච්චං" යනාදී වශයෙන් හෝ "රූපං අනිච්චං රූපං අනිච්චං" යනාදීවශයෙන් හෝ නාමරූප ධර්ම සමුදාය අනිච්ච දුක්ඛ අනාත්මාදී වශයෙන් විවිධාකාරයෙන් බලා මාර්ගඵලය ඉපදවිය යුත්තේය. විදර්ශනා නියමවශයෙන් ශුෂ්කවිදර්ශක පුද්ගලයෝ දෙදෙනාය යනු නවවිධ ලෞකික ධ්‍යානයම ලැබුවාවූ යොගාවචරයෙක්වූයේද ඒධ්‍යානය පාදක වශයෙන් හෝ සම්මර්ශනයවශයෙන් හෝ ධ්‍යානය අපෙක්ෂා නොකොට මාර්ගයලබනු කැමතිකල්හි හුදෙක් ත්‍රෛභූමක සංස්කාරධර්ම මාත්‍රයක්ම විදර්ශනාකොට මාර්ගයලබන්නාවූ පුද්ගලයාය චක්ඛුපාල ස්ථවිරාදීන්මෙන් හාත්පසින් ධ්‍යානයක් නොලැබ නාමරූප ධර්මමාත්‍රයම විදර්ශනාකොට මාර්ගයලබන්නාවූ පුද්ගලයාය යනදෙදෙන ශුෂ්කවිදර්ශක පුද්ගලයෝ දෙදෙනානම්වෙත්. එක් ශුෂ්කවිදර්ශක පුද්ගලයෙකු විසින් ලබනලද්දාවූ සොවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන මාර්ගඵල ධර්මයෝ කවරධ්‍යානය කට බඳුව හටගන්නාහුද යත්? ඒශුෂ්කවිදර්ශකයා විසින් උපදවන්නාවූ සෝවාන් මාර්ගය සියලු ධ්‍යානයන්ට මුල්වන්නාවූ ප්‍රථම ධ්‍යානයෙහි විද්‍යමානවූ විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ගපඤ්චකයකින් යුක්තවම උපදී. ඒශුෂ්කවිදර්ශකයා විසින් උපදවනු ලබන්නාවූ සකෘදාගාමී අනාගාමී අර්හත් යන මාර්ගත්‍රයද ප්‍රථමධ්‍යානයෙහි ඇත්තාවූ පඤ්චාඞ්ගයෙන් යුක්තවම උපදී. ඒ ඒ මාර්ගවීථියෙහි මන්දප්‍රාඥයන්ට උපදින්නාවූ ඵලසිත් දෙදෙනාද තීක්ෂ්ණප්‍රාඥයන්ට උපදනා ඵලසිත් තුන්දෙනාද මුඛයෙහි ඇත්තාවූ අවයව කැඩපත්තලයෙහි පිළිබිඹුවන්නාවූ මුඛනිමිත්තෙහි පෙණෙන්නාක්මෙන් ඒ ඒ මාර්ග චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගපඤ්චකය ඒ ඒ ඵලචිත්තයෙහිත් ඇත්තේමැයි. මේ ශුෂ්කවිදර්ශක පුද්ගලයන් දෙදෙනාගේ විභාගයයි.

ධ්‍යාන නියමයෙන් ලැබෙන්නාවූ සමථයානික පුද්ගලයන් දෙදෙනාගේ විභාගකවර යත්? නවවිධ ලෞකික ධ්‍යානලාභීවූ යොගාවචර පුද්ගල තෙමේ මාර්ගය ලබනු කැමතිව භාවනාවඩන කල්හි තමා විසින් ලබන ලද්දාවූ ප්‍රථම ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙන් නැගිට ත්‍රෛභූමක සංස්කාර ධර්ම සමූහය ඒ ප්‍රථම ධ්‍යානයෙහි ආරොපණයකොට "පඨමජ්ඣානං අනිච්චං" පඨමජ්ඣානං දුක්ඛං පඨමජ්ඣානං අනත්තං" කියා හෝ සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ සඞ්ඛාරා අනත්තා" යනුවෙන් හෝ භාවනා වඩා සෝවාන් මාර්ගය ලබන කල්හි තමා විසින් සමවද්නලද පාදක ප්‍රථමධ්‍යානයෙහි යෙදු

නාවූ ධ්‍යානාඞ්ගයන්ට සමානවූ ධ්‍යානාඞ්ගපඤ්චකින් යුක්තවූ ශ්‍රොතාපත්ති මාර්ගචිත්තයද, ඒ මාර්ග චිත්තයට සුදුසු පරිද්දෙන් එම මාර්ග වීථියෙහි උපදින්නාවූ ඵලසිත් දෙක හෝ තුණ හෝ ධ්‍යානාඞ්ගපඤ්චකින් යුක්තවම උපදිත්. මේ පුද්ගල තෙමේවනාහි පාදකධ්‍යාන මාත්‍රයක් ඇතිව සම්මසිත අජ්ඣාසය දෙක නැත්තාවූ පුද්ගලයා නම්වේ.

## මේ එක් ක්‍රමයකි,

තවද නවවිධ ලෞකික ධ්‍යානලාභිවූ පුද්ගල තෙමේ ධ්‍යානයකට සමනොවැද ප්‍රථමධ්‍යානයෙහිත් ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් ආරොපණයකොට "පඨමජ්ඣානං අනිච්චං" යනාදීවශයෙන් හෝ "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදීවශයෙන් හෝ සම්මර්ශනයකොට මාර්ගය ලබන්නේවේද ඒපුද්ගල තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි තමා විසින් සම්මර්ශනයකළාවූ ධ්‍යානයට බඳුවූ ධ්‍යානාඞ්ගපඤ්චකයකින් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාර්ගයද ඒ මාර්ගයට සුදුසු පරිද්දෙන් ධ්‍යානාඞ්ගපඤ්චකයකින් යුක්තවූ ශ්‍රොතාපත්ති ඵල චිත්තයද ලබන්නේයි. මේ පුද්ගල තෙමේ වනාහි සම්මසිත ධ්‍යාන මාත්‍රයක්ඇතිව පාදක අජ්ඣාසයදෙක නැත්තාවූ පුද්ගලයා නම්වේ.

## මේ දෙවෙනි ක්‍රමයයි.

නවවිධවූ ලෞකික ධ්‍යානය ලැබුවාවූ අනික් පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙන් නැගිට ඒධ්‍යානයෙහි ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් ආරොපණයකොට ත්‍රිලක්ෂණසම්මර්ශනයකරන්නේවේද, ඒ පුද්ගලතෙමේ මාර්ගය ලබන්නාවූ කල්හි තමා සමවැද සම්මර්ශනයකළාවූ පාදකසම්මසිත ධ්‍යානයට සමානවූ ධ්‍යානාඞ්ගපඤ්චකින් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාර්ගයද ඒ මාර්ගවීථියෙහි උපදනා ඵලචිත්තයෝ දෙදෙන හෝ තුන්දෙන මාර්ග චිත්තයෙහිමෙන් ධ්‍යානාඞ්ගපඤ්චකින් යුක්තවම උපදිත්. මේ පුද්ගල තෙමේවනාහි පාදකසම්මසිත දෙක ඇත්තාවූ අධ්‍යාශය නැත්තාවූ පුද්ගලයා නම්වේ.

## මේ තුන්වෙනි ක්‍රමයයි.

එසේම ලෞකික නවවිධ ධ්‍යානලාභීවූ අනික් පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙන් නැගීට ඒ ධ්‍යාන

යෙහිම ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් ආරෝපණයකොට ත්‍රිලක්ෂණ භාවනා වඩා දුන් මා විසින් පාදකකරගන්නා ලද් දුවූ ධ්‍යානාංගපඤ්චකයකින් යුක්තවූ ප්‍රථමධ්‍යානයට බඳුවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලැබූයේනම්, මැනවැයි යන අධ්‍යාශය නියමකර ගන්නේවේද ඒපුද්ගල තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි පාදක අධ්‍යාශය දෙකට සමානවූ ධ්‍යානාංගපසකින් යුක්තවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලබන්නේවෙයි. ඒ මාර්ග වීථියෙහි උපදනා ඵල සිත්දෙක හෝ තුණ හෝ මාර්ගයෙහිමෙන් පඤ්චාංගයකින් යුක්තවම උපදිත්. මේ පුද්ගල තෙමේ වනාහි පාදකඅජ්ඣාශය දෙක ඇත්තාවූ සම්මසිත ධ්‍යානය නැත්තාවූ පුද්ගලයානම්වේ.

මේ සතරවන ක්‍රමයයි.

තවද නවවිධවූ ලෞකික ධ්‍යානලාභිවූ පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානය "අනිච්ච දුක්ඛ අනාත්මය"යි ලක්ෂණත්‍රයට නංවා සම්මර්ශනයකෙරේද මා විසින් දූන් සම්මර්ශනයකළාවූ ධ්‍යානයට බඳුවූ පඤ්චාංගයකින් යුක්තවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලැබූයේනම් මැනවැයි අධ්‍යාශය නියමකරන්නේවේද ඒපුද්ගල තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි සම්මසිත අධ්‍යාශය දෙකට සදෘශවූ ධ්‍යානාංගපසකින් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාර්ගයද, ඒමාර්ගයට සුදුසු පරිද්දෙන් ඵලචිත්තයද උපදනේයි. මේ පුද්ගලතෙමේ සම්මසිත අජ්ඣාසය දෙකම ඇත්තාවූ පාදකය නැත්තාවූ පුද්ගලයා නම්වෙයි.

මෙ පස්වෙනි ක්‍රමයයි.

අජ්ඣාසය මාත්‍රයක් ඇත්තාවූ පාදක සම්මසිත දෙක නැත්තාවූ පුද්ගලයෙක් නොලැබිය යුත්තේයි. ප්‍රථමධ්‍යානය පාදක කොටගෙණ ද්විතීයධ්‍යානය සම්මර්ශනයකෙරේද ඒ පඤ්චප්‍රකාර ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් අජ්ඣාසයවශයෙන් නියමකොට නොගන්නේවේද එසේ නියමකොට නොගත්තේ වීනම් හීන ප්‍රණීත දෙදෙනා අතුරෙන් ප්‍රථම ධ්‍යානයට වඩා ද්විතීයධ්‍යානය ප්‍රණීතවෙයි. ද්විතීය ධ්‍යානයට වඩා තෘතීය ධ්‍යානය ප්‍රණීතවෙයි. තෘතීය ධ්‍යානයට වඩා චතුර්ථධ්‍යානය ප්‍රණීත වෙයි. චතුර්ථධ්‍යානයට වඩා පඤ්චමධ්‍යානය ප්‍රණීතවෙයි. එහෙයින් සම්මර්ශනයකළාවූ ධ්‍යානයට බඳුවූ ධ්‍යානාංග සතරකින් යුක්තවූ මාර්ගය ලබන්නේවෙයි. ඊට අනතුරුව ඵලචිත්තයද ඒ මාර්ගචිත්තයමෙන් ධ්‍යානාංග සතරකින් යුක්තවම උපදී.

මේ ක්‍රමය වනාහි පාදක සම්මසිත ධ්‍යානාඞ්ගවය අධ්‍යාශය නියම නොකොට භාවනාවඩනකල්හි පාදක සම්මසිතධ්‍යාන දෙදෙනාගේ හීන ප්‍රණීතභාවයෙන් ලැබෙන්නේයි. මේ වනාහී හීන ප්‍රණීත ක්‍රමයයි.

පාදකධ්‍යානය ප්‍රණීතවීනම් පාදකධ්‍යානයට බඳුවූ මාර්ගීයද සම්මසිත ධ්‍යානය ප්‍රණීතවීනම් සම්මසිත ධ්‍යානයට බඳුවූ මාර්ගීයද කියයුත්තේයි. මේ ක්‍රමය පරිද්දෙන් පාදකධ්‍යානය හා සම්මසිත ධ්‍යානය යන ධ්‍යානාඞ්ගවය පමණක් පෙරළ පෙරළා ගතයුතුයි. ප්‍රථමධ්‍යානය පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය දක්වා පාදක සම්මසිත ක්‍රමය ගතයුත්තේයි.

## මේද එක් ක්‍රමයකි.

ප්‍රථමධ්‍යානය පාදකකොට ද්විතීය ධ්‍යානය සම්මර්ශණය කෙළේවීනම් ඒධ්‍යාන දෙදෙනා අතුරෙන් ප්‍රථමධ්‍යානය අදහස් කෙළේනම් පාදකධ්‍යානයට බඳුවූ ධ්‍යානාඞ්ග පඤ්චකයකින් සම්පූර්ණවූ මාර්ගය හා ඊට සුදුසුවූ ඵලචිත්තයද උපදනේයි. මෙ ක්‍රමය වනාහි පාදකධ්‍යානය හා සම්මසිත ධ්‍යානය යන දෙදෙනා අතුරෙන් එක්තරා ධ්‍යානයක් අධ්‍යාශය නියමකොට ඒනියම කළ පරිද්දෙන් පාදකධ්‍යානය නියමකෙළේවීනම් පාදකධ්‍යානයට බඳුවූ මාර්ගීය කියයුක්තේය. සම්මසිත ධ්‍යානය නියමකෙළේවීනම්ද සම්මසිත ධ්‍යානයට බඳුවූ මාර්ගීය කියයුත්තේයි. ප්‍රථම ධ්‍යානය සමාපජ්ජනවසී අධිෂ්ඨානවසී වුෂ්ඨානවසී යන ත්‍රිවිධාකාර යෙන් අරුණෝද්ගමන කාලයෙහි පටන් ඉරමුදුන් වනකාලය දක්වා හෝ අධිෂ්ඨානකළ පරිද්දෙන් සමවදිනේයි. අරුණෝදයෙහි පටන් ඉරමුදුන්වන කාලය දක්වා මේ කාලය මුළුල්ලෙහි අනික් චිත්තයක් නොඉපද ධ්‍යාන ජවනයන්ගෙන් ඉක්මවන්නේයි. ඉරමුදුන්වූ කාලයෙහි අධිෂ්ඨානකළ පරිද්දෙන් ධ්‍යාන ජවනයන් සිඳ භවාඞ්ගයෙහි වැටුනුකල්හි සුදුසු පරිද්දෙන් අනාවූ වීථි චිත්තයෝ උපදනාහුය. කුමක්හෙයින් මාර්ගීය ඉපදවීමට භාවනා නොකරණකල්හි ධ්‍යානයට සමවදිනේදයත්? මහද්ගතධ්‍යාන තෙමේ ක්ලේශ ධර්මයන් විෂ්කම්භන ප්‍රහාණවශයෙන් ප්‍රහාණය කටහැකි බැවින් නීවරණ ධර්මයන්ගේ සන්සිඳීමවීමෙන් සමාධි යගේ බලවත්බවවෙයි. සමාධිය බලවත්වූකල්හිම මාර්ගීය ඉපද වීමට සුකරවෙයි. එහෙයින් ධ්‍යානලාභිවූ යෝගාවචර තෙමේ

ඒ ධ්‍යානය ලැබූකල් තැන් පටන් බොහෝ කාලයක් මුලුල්ලෙහි
අරුණෝදය පටන් මධ්‍යාහ්නය දක්වා ධ්‍යානයට සමවැද වැද
ස්ථිරවූ බලවත්වූ සමාධිය ඇතිකෙරෙයි. සමාධිය වනාහි මාර්ගයට
පාදයක්වැනි හෙයින් පාදකධ්‍යානයයි කියනලදී. ලොකොත්තර
ධ්‍යානයයන ව්‍යවහාරය ලෞකික ධ්‍යානය සඳහාම කරනලදී. නව
ලොකොත්තර ධර්මයෙන් අන්‍යවූ ලොකොත්තර ධ්‍යානයෙක් නම්
මුඛ්‍යවශයෙන් නැත්තේමැයි. මේ කියනලද්දාවූ නිශ්චයවනාහි
ආචාර්ය්‍ය බුද්ධඝොෂ මහාස්ථවිරයන්වහන්සේ විසින් ඒ ඒ අටුවා
යෙහි කියනලද්දාවූ දීර්ඝවිස්තරයන්ගෙන් සංග්‍රහකොට ගන්නා
ලදී. පුරාතන අර්ථකථාචාර්ය්‍යවරයෝ වනාහි ලෞකිකධ්‍යාන
යන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක්ම සම්මසිත අධ්‍යාශයවශ
යෙන් නියමකරන්නාහු නමුදු පාදකධ්‍යානයම ප්‍රධානහෙයින්
පාදකධ්‍යානයට බඳුවූ මාර්ගයද ඒමාර්ගයට සුදුසු ඵලයද ලැබෙ
න්නේයයි කියත්. නොහොත් ලෞකික ධ්‍යානයන් අතුරෙන්
අනියමිතවූ යම්කිසි ධ්‍යානයක් පාදක අජ්ඣාසය වශයෙන්
නියමකරන්නාහු නමුදු සම්මසිත ධ්‍යානයම ප්‍රධානහෙයින් සම්ම
සිත ධ්‍යානයට බඳුවූ මාර්ගය හා තත් සදෘශවූ ඵලයද ලැබෙන්
නේයයි කියති. නොහොත් ලෞකික ධ්‍යානයන් අතුරෙන් යම්
කිසි ධ්‍යානයක් පාදක හෝ සම්මර්ශනය කෙළේ නමුදු අජ්ඣා
සයම ප්‍රධාන වනහෙයින් අජ්ඣාසය ධ්‍යානයට බඳුවූ මාර්ගය හා
තත් සදෘශවූ ඵලයද ලැබෙන්නේයයි කියති. මේ වනාහි සමථ
යානිකයන් දෙදෙනාගේ විභාගයයි.

---

නවවිධ ලෞකික ධ්‍යානය ලැබුවාවූ පුද්ගලතෙමේද තමා
විසින් ලබනලද්දාවූ ඒ ධ්‍යානයන් පාදක හෝ සම්මර්ශනය හෝ
නොකොට ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් අතුරෙන් යම්කිසි
ධර්මයක් ලක්ෂණත්‍රයට නංවා සම්මර්ශනය කෙරේද ඒ පුද්ගල
තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි ලෞකික ප්‍රථමධ්‍යානය හා සදෘ
ශවූ ධ්‍යානාඞ්ගපසකින් සම්පූර්ණවූ මාර්ගය හා තත් සදෘශවූ ඵල
යද ලබන්නේයි. මේ පුද්ගල තෙමේ විදර්ශනා නියම පුද්ගල
යායි. "පාදක ධ්‍යානය" යනු කුමකට පාදකවන්නේද යත්?
වුට්ඨානගාමිනී විදර්ශනාවට පාදකවන්නේයයි. ඒ පාදකවූද
පාදකනුවූද ලෞකිකවූද ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් ලක්ෂණ
ත්‍රය ආරොපණයකොට භාවනාකරන්ට පටන් ගත් තැන් පටන්
මාර්ගයට පළමු උපදනාවූ ගොත්‍රභූ චිත්තය දක්වා හටගන්නාවූ
සියලු ජවනයෝ ත්‍රිවිධ ලොකයෙන් නැගිට යාමට හෙතුවන

හෙයින් උපචාර වශයෙන් වුඨානගාමිනී විදර්ශනා ජවනයයි සම්මතකරණ ලද්දැහුය. මේ වනාහි ලොකොත්තර චිත්තයන්ගේ සංක්ෂෙප විභාගයයි.

## අභිධර්මාර්ථ සංග්‍රහ නම්වූ ප්‍රකරණයෙහි චිත්ත සංග්‍රහ විභාග නම්වූ පළමුවෙනි පරිච්ඡෙදය නිමි.

එකුප්පාද නිරොධාච එකාලම්බණ වත්ථුකා,
චෙතො යුත්තා ද්විපඤ්ඤාස ධම්මා චෙතසිකා මතා.

කථං? ඵස්සො, වෙදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්ද්‍රියං, මනසිකාරොචෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්ත සාධාරණා නාම.

විතක්කො, විචාරො, අධිමොක්ඛො, විරියං, පීති, ඡන්දො චාතිඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම. එවමෙතෙ තෙරස චෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා.–

එකුප්පාද නිරොධාච, සිත හා එක්ව ඉපදීම හා නිරුද්ධවීම ඇත්තාවූද; එකාලම්බණවත්ථුකා, සිතට සමාන අරමුණු ඇත්තාවූද සිතට සමානවූ නිශ්‍රයස්ථාන ඇත්තාවූද; චෙතොයුත්තා, සිතෙහි යෙදුනාවූ; ද්විපඤ්ඤාසධම්මා, දෙපණසක් ස්වභාව ධර්මයෝ; චෙතසිකා, චෛතසිකනම් ඇත්තාහුයයි; මතා, දන්නාලද්දැහුය; කථං? මතා; කොයේ දන්නාලද්දැහුද යත්? ඵස්සොච, අරමුණට වැදගැන්ම ලක්ෂණකොට ඇත්තාවූ ස්පර්ශ චෛතසිකයෙක්ද; වෙදනාච, අරමුණුරස විඳගැනීම ලක්ෂණකොට ඇත්තාවූ වේදනා චෛතසිකයෙක්ද; සඤ්ඤාච, අරමුණු ස්වභාව නියමකරගැනීම ලක්ෂණකොට ඇත්තාවූ සංඥා චෛතසිකයෙක්ද; චෙතනාච, අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් මෙහෙයීම ලක්ෂණකොට ඇත්තාවූ චේතනා චෛතසිකයෙක්ද; එකග්ගතාච, එක අරමුණක්ම ගන්නාහෙයින් ඒ අරමුණෙහි පිහිටුවම හා තමා අරමුණෙහි නොදූම්ම ලක්ෂණකොට ඇත්තාවූ ඒකාග්‍රතා චෛතසිකයෙක්ද; ජීවිතින්ද්‍රියච, සහජාතවූ නාම රූපධර්මයන් ආරක්ෂාකිරීමය, සහජාතවූ නාමරූප ධර්මයන්ට අධිපතිබවකිරීම ලක්ෂණකොට ඇත්තාවූ ජීවිතෙන්ද්‍රිය චෛතසිකයෙක්ද; මනසිකාරොච, අරමුණු මෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තාවූ මනස්කාර චෛතසිකයෙක්ද; ඉති ඉම්නාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; ඉමෙ සත්තචෙතසිකා, මේ චෛතසික ධර්මයෝ සත්දෙනා වූහු; සබ්බචිත්ත සාධා

රණා නාම, සබ්බ චිත්ත සාධාරණ චෛතසිකනම් ඇත්තාහු නොහොත් සියලු චිත්තයන් හා සාධාරණ බැවින් සබ්බචිත්ත සාධාරණ චෛතසික නම් ඇත්තාහු; හොන්ති, වෙත්.

විතක්කො, සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණට අභිමුඛකොට නැන්වීම ලක්ෂණකොට ඇත්තාවූ විතර්ක චෛතසිකයෙක්ද; විචාරොච, ඒධර්මයන් අරමුණෙහි හැසිරවීම ලක්ෂණකොට ඇත් තාවූ විචාර චෛතසිකයෙක්ද; අධිමොක්ඛොච, අරමුණුනිශ්චය කිරීම ලක්ෂණකොට ඇත්තාවූ අධිමොක්ෂ චෛතසිකයෙක්ද; විරියංච, සම්ප්‍රයුක්ත ධර්මයන්ට රුකුල්දීම ලක්ෂණකොට ඇත් තාවූ විරියචෛතසිකයෙක්ද; පීතිච, අරමුණෙහි පිණවීම ලක්ෂ ණකොට ඇත්තාවූ ප්‍රීති චෛතසිකයෙක්ද, ඡන්දොච, කරනු කැමති බැව් මාත්‍රයක් ලක්ෂණකොට ඇත්තාවූ ඡන්දචෛතසික යෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; ඡඉමෙ චෙතසිකා, මේ චෛතසික ධර්මයෝ සදෙන; පකිණ්ණ කානාම, නොයෙක් චිත්තයෙහි නොයෙක් ප්‍රකාරයෙන් විසිර පවත්නාහෙයින් පකිණ්ණක චෛතසිකනම් ඇත්තාහු; හොන්ති වෙත්; එවං, මෙසේ; එතෙතෙරස චෙතසිකා, මේ තෙළෙස් චෛතසිකයෝ; අඤ්ඤසමානාති, අඤ්ඤසමාන චෛතසිකයෝ යයි නොහොත් ශොභන චිත්තයෙහි යෙදෙන කල්හි අශො භන චිත්තයෙන් අන්‍යවූ ශොභන චිත්තයන් හා සමානහෙයින් අශොභන චිත්තයෙහි යෙදෙනකල්හි ශොභන චිත්තයෙන් අන්‍යවූ අශොභන චිත්තයන් හා සමානවනහෙයින්ද අඤ්ඤ සමාන චෛතසිකනම් ඇත්තාහුයයි; වෙදිතබ්බා, දතයුත්තා හුයි.

---

සතර පරමාර්ථයන් අතුරෙන් "චිත්තං" යන උද්දෙස පදයාගේ නිර්දේශය සැකෙවින් දක්වා දැන් වනාහි "චෛතසිකං" යන උද්දෙශපදයාගේ නිර්දේශය දක්වන්නාවූ අනුරුද්ධාචාරීන් වහන්සේ "එකුප්පාද නිරොධාච" යනාදී ගාථාව කීහ. මෙහි අභි ප්‍රාය:-සපර්ශාදීවූ දෙපණසක් සවභාව ධර්මයෝ තුමූ සිත හා එක්ව හටගැණීමය, සිත හා එක්ව බිඳීමය, සිත හා එක්ව එක් අර මුණක එල්ලීමය, සිත හා සමානවූ නිශ්‍රය ඇතිබවය යන මේ සම්ප්‍රයොග ලක්ෂණ සතරින් යුක්තවූකල්හිම චෛතොයුක්ත නම්වෙයි. චිත්තයාගේ උප්පාදස්ථිති භඞ්ග යන ක්ෂණත්‍රය අතු රෙන් චිත්තය හටගන්නා කල්හිම ඉදිරිපසුනොවී තමා හා සම්ප්‍රයුක්තවූ චෛතසික ධර්මයෝද හටගන්නාහුවෙති. මෙසේ හටගැණීම එකුප්පාද ලක්ෂණනම්වෙයි. චිත්තය නිරුද්ධවන

කල්හි ඒ හා සමග යෙදුනාවූ චෛතසික ධර්මයෝද ඉදිරිපසු නොවී නිරුද්ධවීයෙති. මේ වනාහි එක නිරෝධ ලක්ෂණනම් වෙයි. චිත්තය වනාහි රූපාලම්බණය, සද්දාලම්බණය, ගන්ධාලම්බණය, රසාලම්බණය, ස්පර්ශාලම්බණය, ධර්මාලම්බණය, ප්‍රත්‍යුත්පන්න අතීතානාගත ධර්මයෝය, කාලවිමුක්තවූ ප්‍රඥප්තිය චිත්ත චෛතසික සංඛ්‍යාත නාමධර්මය ආධ්‍යාත්මික බාහිරධර්මය නිර්වාණය යනමේ ධර්මයන් අතුරෙන් යම්කිසි ධර්මයක් අරමුණු කොටගෙණ උපදනේයි. තමා හා සම්ප්‍රයුක්තවූ චෛතසිකයෝද රූපාලම්බණය පටන් නිර්වාණය අවසන්කොට ඇත්තාවූ චිත්තයාගේ අරමුණක්ම අරමුණුකරත්. මේ වනාහි එකාලම්බණ ලක්ෂණයයි. චක්ෂුර්විඥානයෝ දෙදෙන වනාහි චක්ෂුප්‍රසාද සංඛ්‍යාතවූ වස්තුව නිශ්‍රයකොටගෙණ උපදිත්. ඒ චක්ෂුර්විඥාන චිත්තයෙහි යෙදුනාවූ ස්පර්ශාදිවූ සර්වචිත්තසාධාරණ චෛතසිකයෝ සත්දෙනද ඒ චක්ෂු වස්තුවම නිසා පවත්නාහුමවෙති. ශ්‍රොතවිඥාණ ධාතුය, ඝ්‍රාණවිඥාණ ධාතුය, ජිව්හා විඥාණ ධාතුය, කායවිඥාණ ධාතුය යන මේ විඥාණධාතු සතර දෙනද චක්ෂුවස්තුවට කී නයින් දතයුතුයි. මනොධාතු මනොවිඥාණධාතු සංඛ්‍යාතවූ අවශෙෂවූ එකුන් අසූවක් චිත්තයෝ තුමූ හෘදය වස්තුව නිසා පවත්නාහුවෙති. ඒ සිත් හා උපදනා චෛතසිකයෝද එසේම හෘදය වස්තුව නිසා පවතිත්. මේ වනාහී එක වස්තුක ලක්ෂණයයි. මේ සතර සම්ප්‍රයොග ලක්ෂණ සතරයයි දතයුතුයි. සර්වඥයන්වහන්සේ විසින් "සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා" යනාදී පාලියෙහි 'සං" ශබ්දයෙන් ඉදිරිපසුනොවී චිත්ත චෛතසිකයන්ගේ එකවිට ඉපදීමද, "ප" ශබ්දයෙන් මේ සතර ප්‍රකාරයද දක්වනලද්දේයි. කුමක්හෙයින් මේධර්මයන්ට චෛතසිකයයිව්‍යවහාරකෙරෙත්දයත්? "චිත්තෙන සහවත්තන්තීති චෙතසිකො, චෙතසිනියුත්තංවා චෙතසිකං" යනාදී වචනාර්ථ පරිද්දෙන් සිත හා සමග හටගන්නාහෙයින්ද, සිතෙහි නියුක්තවූහෙයින්ද, චෛතසිකයයි ව්‍යවහාරකරන්නේනම් චිත්තජරූපයද සිත හා සමග හටගන්නාහෙයින් චෛතසිකයයිකුමක්හෙයින්ව්‍යවහාර නොකරන්නේදයත්?මෙසේ සිත හා සමග හටගත් පමණකින් චෛතසිකයයි නොකියයුත්තේයි. මේකී සම්ප්‍රයොග සතරින් සම්පූර්ණකල්හිම චෛතසිකයයි කියයුතුවෙයි. සිත හා සමග හටගන්නා බැවින් චෛතසිකයයි කියන්නේනම් චිත්තජ රූප තෙමේ එකුප්පාද මාත්‍රයකින් සමානව එකනිරෝධ එකාලම්බණ ලක්ෂණවලයන් අසමානවෙයි. කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති යන රූපයන් දෙදෙන වනාහි "චිත්තානුපරිවත්තිනො ධම්මා" චිත්තසහභුනො ධම්මා"

යනාදී දුකයෙහි සිතට සමානව ඉපිද සිතට සමානව නිරුද්ධ වනහෙයින් ඒ රූපවය චෛතසිකයන්ට ඇතුළත් නොවන්නේ දැයි ප්‍රශ්නයක්වේ. ඒ රූපවය ලක්ෂණවයකින් සමානවුවද ඒකාලම්බණ ඒකවස්තුක යන වශයෙන් අසමානවෙයි. එහෙයින් ඒ රූපවයද නොගතහැකිවෙයි. චිත්තයවනාහි |උප්පාදස්ථිති භඞ්ග යන ලක්ෂණත්‍රයකින් යුක්තවෙයි. විඤ්ඤත්ති රූපවය හැර අවශෙෂවූ චිත්තජ රූපයෝ වනාහි එබඳු ලක්ෂණයන් එක් පණසකට හෝ මහාචිත්තක්ෂණයන් සතළොසකට හෝ ආයුෂ ඇතිවෙයි. එපමණක් නොව චිත්තජරූපයෝ අනාරම්මණික වෙති. හෙවත් අරමුණු නොගතහැකිවෙති. චිත්තය වනාහි අරමුණුගතහැකිවෙති. තවද චිත්තයෝ වනාහි චක්ඛු වස්තු ආදිවූ වස්තු ආශ්‍රයකොටගෙණ පවතිත්. උපාදරූපවූ චිත්තජ රූපයෝ වනාහි තම තමාගේ කලාපයෙහි සතරමහා භූතයන් ආශ්‍රයකොටගෙණ පවතිත්. මෙසේ චිත්තජ රූප තෙමේ එකුප්පාද ලක්ෂණමාත්‍රයකින් යුක්තව ඒකනිරොධ ඒකාලම්බණ ඒකවස්තුක යන ලක්ෂණත්‍රයෙන්ම විසදෘශවෙති.එහෙයින් චිත්තජරූපයෝ චෛතසික නොවෙත්. ඒ චෛතසිකයෝ තුමූ කෙතෙක් ප්‍රභෙද වන්නේදැයි යන චොද්‍යය සඳහා "විපඤ්ඤාස විධං" යනු කීහ: එහි අභිප්‍රාය:—චෛතසිකයෝ දෙපණස් වැදෑරුම්වෙත් යනුයි. ඒ "විපඤ්ඤාස විධං" යන සංඛ්‍යාවගේ සංඛෙයය කවරේද යන චොද්‍යයට පරිහාරවශයෙන් "එසෙසා-පෙ-පචවීසත්මෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා" යන පාඨය කීහ. ඒ දෙපණස් චෛතසිකයන් අතුරෙන් තෙළෙස් චෛතසිකකෙතෙක් අන්‍ය සමාන රාශියයි කියාද, තුදුස් චෛතසික කෙතෙක් අකුශල රාශියයි කියාද පස්විසි චෛතසික කෙතෙක් ශොභන චෛතසික රාශියයි කියාද රාශිත්‍රයකට බෙදන්නේයි. ඒ රාශීන් අතුරෙන් අකුශල රාශියට හා ශොභන රාශියට හා පූර්වයෙහි පළමුකොට අඤ්ඤසමාන රාශිය දක්වනලදී. ඒ අඤ්ඤසමාන රාශියෙහිද සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනය, ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙනයයි යන තෙළෙස අඤ්ඤසමාන රාශිනම්වේ. ඒ අඤ්ඤසමාන රාශියෙහි සපශීය කුමක්හෙයින් දක්වනලද්දේද යත්? සිතෙහි හටගන්නාවූ සියලු චෛතසිකයෝ ඉදිරිපසු නොවී එකවිට උපදින්නාහු නමුදු චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි වැදගැන්මහැමට පළමුව සිද්ධවිය යුතුහෙයින් සියලු චෛතසිකයන්ගේ ඒ ඒ කෘත්‍යවශයෙන් යථා ක්‍රමයෙන් සිද්ධවියයුතුහෙයින් සපශීය පටන් සියලු චෛතසික ධර්මයන්ගේ පිළිවෙළින් යොදනලද්දැහුයයි දතයුතුයි. සබ්බචිත්ත සාධාරණවූ සත්දෙනා අතුරෙන්

කුමක්හෙයින් ස්පර්ශයයි කියන්නේද යත්? අරමුණුව වැදගන්නා ස්වභාව ලක්ෂණකොට ඇතිහෙයින් ස්පර්ශයයි කියනලද්දේයි. අරමුණට කෙසේ වැදගන්නේද යත්? ඇඹුල් ඵල කන්නහු දුටුවාවූ පුරුෂයාගේ මුඛයෙහි කෙළ ඉනීමක්මෙන්ද යම්කිසි පුරුෂයෙක් උස්වූ ගසකට නැගී සියුම්වූ අතු පතර ආදියට නගින්නාවූ බව දක්නාවූ බිම සිටින පුරුෂයාගේ හෘදය වස්තුව සැළිමහාරෝමෝද්ගමනයදවී වැටෙන්නේයයි සිතා භයවන්නාවූ පුරුෂයෙකුමෙන්ද සණ්ගලෙහි වැලිදමා ආවුධ මුවහත්කරන කල්හි ලඟ සිටියාවූ පුරුෂයාගේ හෝ හුනබට ආදිය ආවුධයෙන් මදින්නාවූ පුරුෂයාගේ ලඟ සිටියාවූ හෝ පුරුෂයාගේ දත් හිරිවැටීමක්මෙන්ද, මේ ස්පර්ශයාගේ වැදගැණීම දතයුතුයි. මේ උපමාවන්හි දක්වූ න්‍යායෙන් ස්පර්ශය සඞ්ඛ්‍යාතවූ නාමධර්මය හිකති ආදියෙහි හිරුරැස් වැදගැණීමක්මෙන් සසම්ප්‍රයුක්තවූ චිත්තය අරමුණෙහි හැපීම ස්පර්ශයයි දතයුත්තේයි. මෙහි එකාන්තයෙන් වැදගන්නාවූ රූපධර්මයට බඳු වස්තුවක් නැත්තේ නමුදු ඉතා සියුම්වූ නාමධර්ම ස්වභාවයක් අරමුණෙහි වැදගන්නා ආකාරයෙන් පවත්නේයි. මේ අමිශ්‍රවූ ස්පර්ශයට කී උපමාවයි. ස්පර්ශවේදනා දෙදෙන මිශ්‍රවගටගන්නාකල්හි ඒ දෙදෙනාගේ ස්වභාව දක්වීමට මින්මතු උපමාවක් දක්වනු ලැබේ. වේදනා තොමෝ ආලම්බණයාගේ රසය අනුභවකිරීම ලක්ෂණකොට ඇත්තීය. ස්පර්ශ තෙම් අරමුණට වැදගැන්ම ලක්ෂණකොට ඇත්තේයි. එහෙයින් ස්පර්ශය හා වේදනාවඑක්වූ කල්හි නිශ්චර්මගාවියෙකුට බඳු උපමා ඇත්තේයි කුමක්හෙයින්දයත්? නිශ්චර්මගාවි තොමෝ වන ලැහැබ් ආදියෙහි ආහාර සොයමින් යන්නාවූකල්හි වෘක්ෂයන්ගේ අතු පතර තමාගේ නිශ්චර්මශරීරයේ වැදගැන්මද ඩැහැ ලේ බොන මැස්සන් වැදගැන්මද අතිශයින් භයවන්නේයි. ඉදින් අතුපතරාදියක් වැදගැණීමක් හෝ මැසි මදුරු ආදීන් ශරීරයෙහි වැසීමක් හෝ වීනම් මහත්වූ දුක් වේදනාවක් අනුභවකොරෙයි. එහෙයින්ස්පර්ශ තෙමේ නිශ්චර්මගාවියෙකුට බඳු උපමා ඇතිවෙයි. වනාදීයෙහි ඇවිදිනාකල්හි අතුපතර වැදීමක් හෝ මැසි මදුරු වැසීමක් හෝ සිඬවූකල්හි හටගන්නාවූ වේදනාව වේදනා චෛතසිකයට බඳුවෙයි. එහෙයින් නිශ්චර්මගාවී තොමෝ වනයෙහි ඇවිදිනාකල්හි අතුපතර හැපීමෙන් හා මැසි මදුරුවන් වැහීමෙන්දවන්නාවූ දුක් වේදනා තොමෝ මේස්පර්ශයට හා වේදනාවට බඳු උපමා ඇතිවෙයි. ආයුෂ්මත් අනුරුඬාචාරීන්වහන්ස! යුෂ්මත්හු විසින් වේදනාව රසානුභවනය කරන්නේයයි

කිරේය. එහෙයින් ස්පර්ශාදිවූ සෙසු චෛතසිකයෝ ආලම්බණරසානුභවනය නොකරන්නාහුදැයි චොද්‍යයක්වේ. ඊට පිළිතුරු මෙසේයි. ස්පර්ශාදිවූ සියලු චෛතසිකයෝම අරමුණුරස අනුභවකරන්නාහුයයි. එතකුදුවුවත් වේදනාව මෙන් සර්වප්‍රකාරයෙන් අනුභව නොකෙරෙති. වේදනාව වනාහි ඊශ්වර භාවයෙන් අරමුණුරස අනුභවකරයි. ස්පර්ශාදිවූ චෛතසිකයෝ වනාහි එකදෙශයකින් අරමුණුරස අනුභවකෙරෙති එහෙයින් වේදනාවගේ හා ස්පර්ශාදිවූ අවශෙෂ සියලු චෛතසිකයන්ගේත් අරමුණුරස අනුභවකිරීම "සුභොජනරසස්සාදකො රාජාවිය" යන උපමාවෙන් දතයුතුයි. ඒ එසේමැයි. මධුර ලවන කටුක තික්තාදී නානාග්‍රරසයෙන් යුක්තවූ රසභොජනය එළවූකල්හි ඒ රසභොජනයෙහි විසඇත්තේදෝහොයි පරීක්ෂාකරනු පිණිස අරක්කැමි අමාත්‍යයා විසින් පළමුකොට ඒ රාජභොජනයෙහි සියලු ද්‍රව්‍යයන්ගෙන් මද මද අනුභවකොට විෂනැතිබව දැනගත්කල්හිම රජතෙමේ ඒ රාජභොජනය රිසිසේ අනුභවකෙරෙයි, එපරිද්දෙන්ම ස්පර්ශාදී අවශෙෂ සියලු චෛතසික ධර්මයන්ගේ ආලම්බණ රසානුභවනය රාජභොජනය දිවහා බලන්නාවූ අරක්කැමි අමාත්‍යයාගේ අනුභවයක්මෙන්ද වේදනාවගේ ආලම්බණ රසානුභවනය රජහුගේ රිසියතනාක් රාජභොජනය අනුභවකිරීමක් වැනිවේ. එහෙයින් ආලම්බණරසානුභවනයෙහි වේදනාව රජෙකුමෙන්ද ස්පර්ශාදීහු අරක්කැමි අමාත්‍යයාමෙන්ද දතයුතුයි. සංඥාව වනාහි ආලම්බණ ස්වභාව හැඳිනීම ලක්ෂණකොට ඇත්තීය ඒ කෙසේදයත්? සංඥා තොමෝ වනාහි සුදුය රතුය නිල්ය කසාවන්ය යනාදී ඒ ඒ ආලම්බණයන්ගේ සලකුණුගැණීම් මාත්‍රයකින්ම අරමුණහඳුනයි. එසේදවුවත් කුමක්හෙයින් සුදුවූයේද කුමක්හෙයින් රතුවූයේද යනාදීවශයෙන් ඒ ඒ ආලම්බණලක්ෂණයන්ගේ උප්පත්තිනොදනී කුමක්මෙන්දයත්? ළදරුවෙක් පළමුකොට අං ඇත්තාවූ ගවයෙක් දැක මෑනියෙනි! මූ කවර සතෙක්දැයි විචාළකල්හි පුත! මූ ගවයායයි මව උත්තරදෙයි. ඉක්බිති ඒ ළදරු තෙමේ මෙබඳු අං දෙකක් ඇත්තාවූ සත්වයා ගවයායයි හැඳිනගනී. එතකුදුවුවත් ඒ ගවයා ගව දෙනගෙන් හටගන්නේද අස්වෙළඹෙකුගෙන් හටගන්නේද ඇතින්තියෙකුගෙන් හටගන්නේද මේ මහා පෘථුවියෙන් හැරගන්නේදැයි විශෙෂයක් නොදනී. එහෙයින් මේ සංඥා තොමෝ නැවත දුටුකල්හි හැඳිනගන්නා පිණිස සලකුණක්ගෙණම හැඳිනගන්නේවෙයි. නොහොත් සංඥාව වඩුවෙකුට බඳුවූ උපමා ඇත්තේවෙයි. වඩුවෙකුට කෙසේ සමානවන්නේද යත්?

පැතලි රූපාදිය කපන්නාවූ වඩුතෙමේ පළමුකොට දණ්ඩක් ගෙණ රූපයක් කපනු කැමතිව දැලි නූල් ආදියෙන් මෙතැන්හි හිසවෙයි. මෙතැන්හි අත් පා ආදියවෙයි. යනාදීන් සලකුණු කිරීම් මාත්‍රයක් කෙරෙයි. එතකුදුවුවත් ඒ රූපය නොනිමියේ වෙයි. එසේම සංඥාවද නීල පීතාදි සලකුණුගැණීම් මාත්‍රයක් කොට අරමුණු හැඳිනීම් මාත්‍රයක් කෙරෙයි. අං ඇති ගවයෙක් දුටු ළදරු තෙමේ ඒ ගවයා කවර හෙතුවකින් හටගත්තේද යනබව හෝ රූපයක් ඉදිකරනු කැමති වඩුතෙමේ සලකුණු කිරීම් මාත්‍රයක් විනා ඒ රූපයාගේ සටහන්මෙන් නොකළහැකි වාක්මෙන්ද මේ සංඥාව සලකුණක්කොට අරමුණුහැඳිනීම් මාත්‍රයක්කෙරෙයි. සංඥාවට විඥානය එකතුවූකල්හි ගවයා ගවදෙනාගෙන් උපන්නේයයි. දැනගන්නාක්මෙන්ම මේ නාමරූප ධර්මයන්ගේ විශෙෂ හැඳිනගැණීම කෙරෙයි. ඒ සංඥා විඥාන දෙකට ප්‍රඥාව එක්වූකල්හි ඒ ගවයා අසවල් ජාතියෙහි ගමගෙක්ය මෙබඳු ජවඇත්තාවූ වර්ගයක යනාදී විවිධාකාර දැනගන්නාක්මෙන් සංඥා විඥානයන්ට ප්‍රඥාව එක්වූකල්හි මේ නාමරූපදෙක අනිත්‍යය දුඃඛය අනාත්මයයි යනාදී අනෙක ප්‍රකාරයෙන් දැන මාර්ගඵලාධිගමය පවා එළවිය හැකිවෙයි. ගවයෙක් නුදුටුවාවූ ළදරු තෙමේ පළමු ගවයා දුටු දවස්හි ඒ ගවයාගේ අං දෙක ගවයාබවම සලකුණයයි දැන හැඳිනගත්තාව පසු නැවත ගවයා දුටු දවසක ඒ අංදෙක සලකුණක්කොටගැණීම වන්නේද නොවන්නේදැයි සැකයක් ඉපදිය යුතුවෙයි. ඉදින් පළමු දවස්හි ඒ අරමුණ දැක සංඥාව උපන්කල්හි නැවත නැවතත් ඒ අරමුණ දුටුකල්හි සංඥාවගේ ඉපදීම නිෂ්ප්‍රයොජනදෝහෝයි සැකකටයුතුවෙයි. එසේ සැකනොසිතියයුත්තේයි. යම් වස්තුවක් දවසකට දහස්වරක් දුටුයේ නමුදු පළමුවාරයෙහි ගන්නාවූ සලකුණෙන් දෙවෙනි වාරයෙහි හැඳිනීමසිඩකෙරෙයි. දෙවෙනි වාරයෙහි ගන්නාවූ සලකුණෙන් තුන්වෙනි වාරයෙහි හැඳිනීම සිඩකෙරෙයි මෙසේ පළමු පළමු ගන්නාලද සංකෙතයෝ නැවත නැවත දුටුකල්හි හැඳිනීමට ප්‍රත්‍යයවෙති. එහෙයින් සංඥාවන්ගේ කිසි නොලැබීමක් නොවන්නේයි. චෙතනා තොමෝ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් තා සපර්ශකරව තා රස විඳුව තා හැඳිනගණුවයි යනාදීන් සියලු චෛතසික ධර්මයන් ඒ ඒ කෘත්‍යයෙහි මෙහෙයන්නාවූ ධර්මය චෙතනානම් වෙයි. එහෙයින් චෙතනා තොමෝ යුඩයෙහි බලනායකයෙක් මෙන් දතයුතුයි. යම්සේ යුඩයෙහි බලනායක තෙමේ තමාගේ බලසෙනග මෙහෙයමින් තමාත් යුඩා යුඩකතාබව යුඩකෙරේ

ද එපරිද්දෙන් චේතනා තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන් ඒ ඒ කටයුත්තෙහි යොදවමින් තෙමේත් අරමුණෙහි යෙදෙන්නේවෙයි. නොහොත් පාඨශාලාවෙක්හි ප්‍රධාන ශිෂ්‍යයෙක්මෙන්ද කර්මාන්තශාලාවෙක්හි ප්‍රධාන වඩුවෙක්මෙන්ද චේතනාව දතයුතුයි. පාඨශාලාවෙහි ප්‍රධාන ශිෂ්‍යතෙමේතමාත් ඉගෙණීමෙහි නියුක්තවෙමින් අනබාල ශිෂ්‍යයන්ද ඉගෙණීමෙහි යොදවයි. කර්මාන්තශාලාවෙහි ප්‍රධාන වඩු ශිෂ්‍යතෙමේ තමාත් කර්මාන්තයෙහි යෙදෙමින් අවශෙෂ වඩුවන්ද ඒ ඒ කර්මාන්තයෙහි යොදවයි. සංස්කාරස්කන්ධයතෙම දෙසන්නාවූ සර්වඥයන්වහන්සේ විසින් විභඞ්ගප්‍රකරණයෙහි "චක්ඛුසම්ඵස්සජා චේතනා" යනාදීන් පළමුකොට මේ චේතනාව වදුරා ඊට අනතුරුව ස්පර්ශාදිවූ එකුන්පණස් චෛතසිකයන් ක්‍රමයෙන් වදාළ හෙයින් මේ චේතනාව සංස්කාරස්කන්ධයෙහි ප්‍රධාන ධර්මයවෙයි. ස්පර්ශාදිවූ ඒ ඒ චෛතසිකයන් ඒ ඒ ක්‍රියාවෙහි යොදවා සිඬකරගන්නාවූ ශක්තිය නොහොත් දන්දීම් ප්‍රාණඝාතකිරීම්වශයෙන් සිඬකරගන්නාවූ අර්ථය මේ චේතනාව පිළිබඳව පවත්නීය. එහෙයින් කර්මය සංස්කාරය ආයූහනය චේතනාය යනාදී නම් මේ ධර්මයට පර්යායවෙයි. යම්කුශලා කුශල කර්මයක්කරන්නාවූ කල්හි ස්පර්ශාදීන්ගේ උපකාරයෙන් ලබාගන්නාවූ අර්ථය මේ චේතනාවෙහි පවත්නේයි. එතකුදුවුවත් චේතනාවක්ෂණභඞ්ග වෙයි. යම් ණයක්ගන්නාවූකල්හි ඒ ණයගැණීම ක්ෂණයකින් සිඬවන්නාක්මෙන් මේ කර්මසංඛ්‍යාත චේතනාවද චිත්තක්ෂණයකට සමාන ආයුෂඇති බැවින් වහා බිඳී යන සුළුවෙයි. ඒ වහා බිඳීගිය චේතනාවගේ ශක්තියෙන් කෙසේ විපාකය උපදවන්නේද යත්? ණයගත්තාවූ පුරුෂයා ඒණයින් බඬවන්නාක්මෙන්ම නොහොත් ඒ ණයගෙවනතුරුම ඔහු ණයගැතියායයි ව්‍යවහාරකරන්නාක්මෙන්ද ඒ ණයින් නිදහස් නොවියහැකි බැවින්ද, යම් කාලපරිච්ඡේදයක්කොට ණයගත්තේවීනම් ඒ කාලයෙහි ගෙවියයුතුබවද කාලපරිච්ඡේදයක් නොකොට ණය ගත්තේවීනම් කවර කාලයකවුවත් ඒ ණය ගෙවියයුතුවාක්මෙන්ද කුශලා කුශල ජවනවීථීන්ගේ පළමුවන සත්වන ජවනසඞ්ඛ්‍යාතවූ චේතනාවෝ කාලපරිච්ඡේදයෙන්ගත්තාවූ ණයමෙන් ඉහාත්මයෙහි හෝ අනතුරු අත්බැව්හි හෝ තම තමන්ගේ විපාක උපදවත්. කාලපරිච්ඡේදය නැතුවගත්තාවූ ණයමෙන් මධ්‍යයෙහිවූ ජවන් පස්දෙන පිළිබඳවූ චේතනාවෝ පස්දෙන සංසාරයෙහි අවකාශ ලැබුනු පරිද්දෙන් ඒකාන්තයෙන් විපාක උපදවන්නාහුවෙත්. මේ ණයගැණීම සංඛ්‍යාතවූ ලොක

ව්‍යවහාරය ඒකාන්තයෙන් නිෂ්ප්‍රයොජන නොවන්නාක්
මෙන්ම කුශලාකුශල චෙතනාවන්ගේ කර්මශක්තියද කල්පකොටි
ශතසහශ්‍රයකිනුත් බොල්නොවන්නේයයි දතයුතුයි. ශ්‍රද්ධාචෙ
තනාදෙදෙනාගේ විශෙෂ කවරේද යත්? යම් පුරුෂයෙක්
තෙමේ අනික් පුරුෂයෙක්හට ආභරණ වස්ත්‍රාදිය දෙනු කැමති
වේද ආහාරපානාදියෙන් සංග්‍රහකරනු කැමතිවේද චෙතනාව
එබඳු අදහස් ඇති පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. ශ්‍රද්ධාව
වනාහි මේ ආත්මයෙහි දානමානාදී කුශල ක්‍රියාකිරීමෙන් මතු
සංසාරයෙහි මහත් වස්තු සම්පත් ලබන්නේය යන විශ්වාසය
ඇත්තාවූ පුරුෂයෙකුට සමානවෙයි. මේ වනාහි මේධර්මදෙදෙ
නාගේ වෙනසයි. "ඒකාග්‍රතාව" යනු එකම අරමුණක් ගැණීම
ලක්ෂණකොට ඇත්තාවූද එකම අරමුණෙක්හි සිත පිහිටුවීම
ලක්ෂණකොට ඇත්තාවූද සිත කම්පානොවීම ලක්ෂණකොට
ඇත්තාවූද ස්වභාව ධර්මයක්වේ. ඊට උපමා කවරයත්? පෘථුවිය
යට කැන සිටවනලද්දාවූ ගල්ටැඹකට බඳු උපමා ඇත්තේවෙයි.
ඒ ගල්ටැඹ වනාහි සතරදිගින් හමන්නාවූ පවනින් නොසැ
ලෙන්නාක්මෙන් ඒකාග්‍රතා චෛතසිකය හෙතුකොටගෙණ
සිත එකඅරමුණෙක්හි පිහිටන්නේවෙයි. අන්‍යවූ ස්පර්ශාදීවූ චෛත
සිකයන්ද නන් අරමුණෙහි විසිරයා නොදී එකඅරමුණෙක්හි
ස්ථිරවශයෙන් පැවතීම ඒකාග්‍රතාව හෙතුකොටගෙණවේ. ඒකා
ග්‍රතාව වනාහි නිර්වාතස්ථානයෙහි දැල්වූ පහන් සිළුවකට බඳු
උපමා ඇතිවෙයි. නොහොත් ඒකාග්‍රතා කොමෝ ජලයකට
බඳු උපමා ඇතිවෙයි. ස්පර්ශාදීවූ අවශෙෂ චෛතසිකයෝ තුමූ
කොකුම් සුණු කසා සුණු ආදී චූර්ණයකට බඳු උපමා ඇත්තේ
වෙයි. ඒ චූර්ණයට වනාහි ජලයවත්කොට හනාගුළිකළකල්හි
විසිරයානොදී එකට හැනීපවත්නේයි. එහෙයින් කසාසුණු
කොකුම්සුණු ආදීන්ට බඳුවූ ස්පර්ශාදීවූ චෛතසිකතෙමේ ඒකා
ග්‍රතා නැමති ජලයවත්කළකල්හි එකාබද්ධව නොවිසිර පවත්
නේයි දතයුතුයි. ජීවිතෙන්ද්‍රිය තෙමේ නාමජීවිතෙන්ද්‍රිය රූප
ජීවිතෙන්ද්‍රියයයි දෙවැදෑරුම්වේ. ඒ දෙදෙන අන්‍යොන්‍ය විරුද්ධ
ධර්මදෙකක්වූයේ නමුදු උපමා ලක්ෂණාදීන්ගේ වශයෙන් සාධා
රණවේ. 'නාමජීවිතෙන්ද්‍රියය" යනු එකුන් අනූවක් චිත්තයෙහි
සාධාරණවශයෙන් ලැබෙන්නාවූ ජීවිතයයි. "රූප ජීවිතය" යනු
නවකර්මජ රූපකලාපයෙහි ඒ ඒ රූපකලාපයන් ජීවත්කරමින්
නාවූ ජීවිතයයි. එක් රූප ජීවිතයක් තුළ නාම ජීවිත සතළොස
ක් ඉපිද නිරුද්ධවීයෙති. එහෙයින් නාම ජීවිතය අරූපවූ නාම
ධර්මයක්වා පමණක් නොව උප්පාද ඨිති භඞ්ග සඞ්ඛ්‍යාතවූ ක්‍ෂුද්‍ර

ක්ෂණත්‍රයක් හෝ මහාචිත්තක්ෂණයක් හෝ ආයුෂ ඇත්තාවූ ධර්මයකි. රූපජීවිතය වනාහි උපාදා රූපයක්වූ කුඩා ක්ෂණ එක් පණසකට හෝ මහා චිත්තක්ෂණ සතළොසකට හෝ ආයුෂ ඇත්තේය. මෙහි දක්වනු ලබන්නේ නාමජීවිතයයි. ඒ නාම ජීවිතය තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් ජීවත්කරණහෙයින් ජීවිතකියාද තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් තමාගේ වසඟයෙහි පවත්වනහෙයින් ඉන්ද්‍රියකියාද ව්‍යවහාරකරත්. එහෙසින් මේ ජීවිතෙන්ද්‍රියය සම්ප්‍රයුක්ත ධර්මයන් ආරක්ෂාකිරීම හා වසඟයෙහි පැවැත්වීම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? පියුම් නැටි හෙළුඹු දූලියෙහි පවත්නාවූ ජලය ඒ පියුම්මල් ආරක්ෂාකරන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රියයද තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් ජීවත්කරවන්නේයි. ඒ පියුම් නැටි හෙළුඹු දූලි අභ්‍යන්තරයෙහි පවත්නාවූ ජලය යම්තාක් කල් පවත්නේවේද එතාක්කල් පියුම්මල් නොවියලී පවත්නේයි. යම් දවසක ඒ ජලය සිඳීගියේවීනම් පියුම්මල් වියලීයෙති. එපරිද්දෙන් සත්ත්වයන්ගේ ස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාතවූ මේ ශරීරය නොවියලී කුණුනොවී මේ ජීවිතෙන්ද්‍රිය හෙතුකොටගෙණ පවත්නේයි. ශරීරයෙහි යම්තැනක චර්මය කැඞීගියේවීනම් චර්මය වියලී කුණුවීයෙයි. එසේවන්නේ කුමක්නිසාද යත්? සිඳී බිඳී ගිය අවයවයෙහි ජීවිතෙන්ද්‍රිය නැත්හෙයිනි. මේස්කන්ධපඤ්චක සඞ්ඛ්‍යාතවූ ශරීරය නොවියලී කුණුනොවී යහපත්වර්ණයෙන් යුක්තව යාම් ඊම් ඉඳුම් සිටුම් ආදීවූ සියලු ක්‍රියාවන්ගේ පැවැත්මට මේ ජීවිතෙන්ද්‍රිය හෙතුවන්නේයි. මනුෂ්‍යයාගේ ප්‍රතිසන්ධි විඥානය පටන් සතළොස් චිත්තක්ෂණය සම්පූර්ණවූකල්හි කර්මජ රූපකලාප නවය අතුරෙන් එක් එක් කලාපයක්හුගේ රූප ජීවිතෙන්ද්‍රියයෝ එක්පණසක් සම්පූර්ණවෙති. එහෙයින් ප්‍රතිසන්ධිය පටන් සතළොස් චිත්තක්ෂණයක් සම්පූර්ණවනකල්හි ස්ත්‍රීපුරුෂ දෙපක්ෂය අතුරෙන් එක්පක්ෂයකට ජීවිතෙන්ද්‍රියයෝසාරසියඅටක් සම්පූර්ණවෙති.එතැන් සිටසත්ත්වයාගේ චුතියපටන් ආපසු ගිනූකල්හිසතළොස්වන චිත්තක්ෂණය දක්වා රූපජීවිතෙන්ද්‍රියයෝ සාරසිය අටදෙනෙක් දිවාරෑ දෙක්හි කිසි මොහොතක අඩු නොවීපවතිත්.ඒ ජීවිතෙන්ද්‍රියයෝ සාරසියඅටදෙන හෙතුකොටගෙණ මේ සත්ත්ව ශරීරය ජීවත්වෙයි. චුතිචිත්තයට සතළොස්වන චිත්තය පටන් කර්මජරූපයන්ගේ පහළවීම නොවන හෙයින් චුතිචිත්තයට සමකාලිකව නොහොත් චුතිචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි සියලුම කර්මජරූප පිළිබඳවූ රූපජීවිතෙන්ද්‍රියය හා නාමජීවිතෙන්ද්‍රියයද එකක්ෂණිකව නිරුද්ධවීයෙති.

එහෙයින් සත්ත්වයාගේ මරණය ජීවිතෙන්ද්‍රියුපච්ඡේදයයි ව්‍යවහාරකෙරෙති. සමහර අඥාන සත්ත්වයෝ ජීවිතෙන්ද්‍රියය නොමැරෙන්නේයයි ව්‍යවහාර කෙරෙති. එතකුදුවුවත් ජීවිතෙන්ද්‍රියය ඒකාන්තයෙන් මැරෙන්නේමැයි. ඉදින් ජීවිතෙන්ද්‍රිය මෙළේනම් චුතිචිත්තයට අනතුරුව හටගන්නාවූ ප්‍රතිසන්ධි චිත්තයාගේ උප්පාදක්ෂණයෙහි නැවත ජීවිතෙන්ද්‍රියය හට නොගන්නේවේද යත්? සත්ත්වයන්ගේ පටිසන්ධිචිත්තය හා සමග නාමජීවිතෙන්ද්‍රිය එකක් හා ජලාබුජ සත්ත්වයන්ගේ රූපජීවිතෙන්ද්‍රිය තුණක්ද ඉදිරිපසුනොවී එකක්ෂණිකව පහළවෙති. ඉදින් ජීවිතෙන්ද්‍රිය මෙළේනම් ප්‍රතිසන්ධි චිත්තය හා සමග නැවත ජීවිතෙන්ද්‍රියය කෙසේ උපදනේද යත්? චුතිචිත්තය හා සමග නිරුද්ධවන්නාවූ ජීවිතෙන්ද්‍රියය ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි නැවත උපදීයි. එහෙයින් ජීවිතෙන්ද්‍රියය නෙලුම් දඹු ආදියෙහි පවත්නාවූ ජලය නෙලුම් මල් ආරක්ෂාකරන්නාක්මෙන් පඤ්චස්කන්ධය ආරක්ෂාකරන්නේවෙයි. ජීවිතෙන්ද්‍රියය ජලයකට බඳු උපමා ඇතිවෙයි. ඒ ජලය නෙලුම් දඹු ආදියෙහි නැතිකල්හි නෙලුම් මල් වියලියන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රියය සංඛ්‍යාතවූ ආයුෂය නිරුද්ධව ගියකල්හි සකන්ධපඤ්චක සංඛ්‍යාතවූපද්මය වියලි දුර්වලවීයේ. එහෙයින් මේ ජීවිතෙන්ද්‍රියය නැව නිසා යන්නාවූ නැවියෙකුට බඳු උපමා ඇතිවෙයි. නෞකා තොමෝ නැවියා විසින් ගෙණයනු ලැබෙයි. ඒ නැවියාද නෞකාව ආධාරකොට ගෙණසිටී, එපරිද්දෙන්ම ජීවිතෙන්ද්‍රියය හෙතුකොටගෙණ කර්මජ රූපකලාපහා නාම ධර්මයෝද පවතිත්. ඒ නාම ධර්ම හා රූපකලාප ආධාරකොටගෙණ ජීවිතෙන්ද්‍රියය පවත්නේයි. කර්මචිත්ත ඍතු ආහාර සංඛ්‍යාතවූ ප්‍රත්‍යය සතරකින් උපදින්නාවූ එක්විසිරූප කලාපයන් අතුරෙන් කර්මජ රූපකලාප නවයෙහි පමණක් ජීවිතෙන්ද්‍රියය පවතින්නට හා සෙසු ප්‍රත්‍යය තුණෙන් හටගන්නාවූ රූප කලාපයන්ගේ පැවතීමට ජීවිතෙන්ද්‍රියය නැත්තේ කුමක්නිසාද යත්? දරුවන් අටදෙනෙකු වදා යම් මවෙක් කලුරියකෙළ්වීනම් ඒ දරුවන් අටදෙනාවැඩිවර්ධණයකරණු පිණිස කිරිමව්වරු අටදෙනෙක් ඇතිවියයුත්තාහුය. එපරිද්දෙන්ම පූර්වජාතියෙහි කර්ම නැමති මව් විසින් කර්මජ රූපකලාප අටක් සමග ප්‍රතිසන්ධිනාමස්කන්ධ සතරද උපදවනවා සමගම ඒ පටිසන්ධි කර්මශක්තිය නැතිවීයෙයි. එබැවින් ඒ මව් මළ දරුවන් අටදෙනා පොෂ්‍යකිරීම පිණිස කිරිමව්වරු අට දෙනෙක්මෙන් කර්මජ රූපකලාප පැවැත්වීම පිණිස ජීවිතෙන්ද්‍රියය අටක් ඇතිවියයුතුවෙත්. අවශෙෂ ඍතු චිත්ත ආහාර

ඝන රූප ජනක ප්‍රත්‍යයයෝ තුන්දෙන නිරන්තරයෙන් විද්‍යමාන බැවින් ඒ රූපකලාපයන් ආරක්ෂාකිරීමට ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයෝජන නැතැයි දතයුතුයි. මනසිකාරය වනාහි අරමුණ සිත්හිකිරීම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? ආජානීය ශෛන්ධව අශ්වයන් දෙදෙනෙකු යොදනලද රථාචාර්‍යයාට බඳු උපමා ඇතිවෙයි. ඒ ආජානීය අසුන් දෙදෙනකුන් යොදනලද රථයෙහි රථාචාර්‍ය තෙමේ ඒ අසුන් දෙදෙනා එකසමව යාම නිතර සිත්හිකොට බලා හිඳිනේවෙයි. එපරිද්දෙන්ම මනසිකාර නැමති රථාචාර්‍ය තෙමේ ආජානීය අසුන් නැමති සපර්ශාදීවූ ඒ ඒ චෛතසික ධර්මයෝ අරමුණෙහි වැදගැණීම් ආදීවූ ඒ ඒ කෘත්‍යය ඉදිරිපසුනොවී එකවිට සිඬකරන්නාහුදැයි බලාහිඳින්නේවෙයි. නවද මනසිකාර තෙමේ වනයෙහි ඌරු මුව ගොනාදී සිව්පාවුන් තුවක්කු දුනු ආදියෙන් මරන්නාවූ දුණුවායෙකුට සමාන උපමා ඇතිවෙයි. වනයෙහි සිව්පාවුන්ට කුරුමානම් බලන්නාවූ වැදි තෙමේ යම් සිව්පාවෙක් මරණු කැමතිවීනම් ඊතලය නොවරදිනා පිණිස සිත්හිකරයි. එපරිද්දෙන්ම මනසිකාරය නැමති වැදි තෙමේ අරමුණු නැමති සිව්පාවුන් විදගන්නා පිණිස සපර්ශාදී චෛතසික නැමති ඊතලයන් නොවරදිනා පිණිස සිත්හිකරයි. එහෙයින් මනසිකාර තෙමේ අරමුණුමෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තේයයි කියනලදී. සපර්ශය ආදීකොට මනසිකාරය අවසන් කොට ඇත්තාවූ මේ චෛතසික ධර්මයෝ සත්දෙන එකුන් අනූවක් චිත්තයෙහි එකාන්තයෙන් සාධාරණවශයෙන් යෙදෙන හෙයින් සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝයයි කියත්. ප්‍රකීර්ණක චෛතසිකයන් සදෙනාගේ ලක්ෂණාදියකෙසේ යත්? විතර්ක තෙමේ අරමුණට අභිමුඛව සපර්ශාදීවූ චෛතසික ධර්මයන් නැන්වීම ලක්ෂණකොට ඇත්තේයි. එහෙයින් මේ විතර්ක තෙමේ එක් පුරුෂයෙකු විසින් තමහට ඉසිලිය නොහැකි බරක් ඉසපිටට හෝ කරපිටට හෝ ගැණීමට අල්වා දෙන්නාවූ පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. විචාර තෙමේ විතර්කය විසින් අරමුණට නන්වනලද්දවූ චෛතසිකයන් ඒ ඒ ක්‍රියායෙහි හැසිරවීම ලක්ෂණකොට ඇත්තේයි. විතර්කය වනාහි ඖදරිකවූ සවභාව ඇතිවෙයි. විචාර තෙමේ සියුම් සවභාව ඇතිවෙයි. එහෙයින් විතර්කය ඝණ්ඨාර ලොහොබෙර ආදියද ගැසීමෙන් හට ගන්නාවූ ඖදරික ශබ්දයක්මෙන් විතර්කයද ඖදරිකවූ පැතිරීම ඇතිවෙයි. විතර්ක විප්ඵාර ශබ්දය වනාහි අභිඥාලාභීන්ගේ දිව්‍ය ශ්‍රොත්‍රඥානයට ඇසෙයි. ඉක්බිති ඒ විතර්ක විප්ඵාර ශබ්දය

අසා මෝහට මෙනම් චිත්තයක් උපන්නේයයි දැනගණී. එහෙයින් මේ විතර්ක විප්ඵාර ශබ්දයට ඝණ්ඨාර ලොහෝ බෙර ආදියෙන් හටගන්නාවූ ඖදාරිකවූ ශබ්දය සර්වඥයන්වහන්සේ විසින් උපමාකොට දෙශනාකරණලද්දේයි. "විචාරය" යනු ඒ ඝණ්ඨාර ලොහො බෙර ආදියෙන් පසුව හටගන්නාවූ සියුම්වූ ශබ්දයට බඳු උපමා ඇතිවෙයි. නොහොත් විතර්ක තෙමේ අහසට නගිනු කැමතිවූ රාජාලි උකුසු පක්ෂියෙක් අහසට නගිනකල්හි පියාපත් වෙගයෙන් පැහැර අහසට නැගීමක්මෙන්ද ඒ අහසට නැගුනාවූ රාජාලි උකුසු පක්ෂි තෙමේ පියාපත් නොපැහැර නිශ්චලව පියාහමන්නාක්මෙන් විචාරය සන්හුන් පැවතුම් ඇත්තේවෙයි. නොහොත් විතර්ක තෙමේ පියුම් විලකට අහසින් බස්නා භෘඞ්ග රාජයක්හුගේ වෙගවත්වූ පහළට බැසීමක් මෙන්ද ඒ පියුම් විලට බටුවාවූ භෘඞ්ගරාජතෙමේ පියුම්මල් හාත්පස සතුරන් නැත්තේදෝහෝයි සුවඳ ඇත්තේදෝහෝයි පරීක්ෂාකරමින් සෙමින් සෙමින් සිසැරීමක්මෙන් විචාරය සාන්තවූ පැවතුම් ඇත්තේවෙයි. නොහොත් ලොහෝතලියක් මදින්නාවූ පුරුෂයෙකු විසින් එක් අතකින් තරයේ අල්වාගෙණ අනිත් අතින් ලොහෝතලිය සෙමින් සෙමින් මදින් නාවූකල්හි අල්වාගත් අතමෙන් විතර්කයද මදින්නාවූ අතමෙන් විචාරයද දතයුත්තේයි. මේ විතර්ක තෙමේ අරමුණට අභිමුඛකොට සම්ප්‍රයුක්තවූ චෛතසිකයන් නැන්වීම ලක්ෂණකොට ඇත්තේයි. විචාර තෙමේ ඒ විතර්කය හා එක්ව යෙදුනාවූ කල්හි අරමුණු පිරිමැදීම ලක්ෂණකොට ඇත්තේයි. එසේහෙයින් දෙපස්විඥාන වර්ජිතකොට ඇත්තාවූ සුසාලිස් කාමාවචර චිත්තය, ප්‍රථමධ්‍යාන එකොළොසය, යන පස්පණස් චිත්තය සවිතර්ක සවිචාර සිත්නම්වෙත්. මේ පස්පණස් චිත්තයෙහි යෙදෙන්නාවූකල්හි අරමුණට නන්වාදෙන්නාවූ විතර්කය ඇතිහෙයින් විචාරය හා යුක්තව සවිතර්ක සවිචාර චිත්තයෝයයි කියත්. ඒ පස්පණස් චිත්තයන් අතුරෙහි විතීය ධ්‍යාන එකොළොස බහාලැබෙන්නාවූ අවිතර්ක සවිචාර සසැට චිත්තයෙහි අරමුණට නන්වාදෙන්නාවූ විතර්කය නැතිහෙයින් කෙසේඅරමුණටනගින්නේදයත්? පූර්වයෙහි අරමුණට නන්වාදෙන්නාවූ විතර්කය හා සමග පවත්නාවූ සවිතර්ක සවිචාර සිත් පස් පණස චිත්ත සන්තානයෙහි නිරන්තරයෙන් හටගත් බැවින් ඒ පුරුද්ද කරණකොටගෙණ අරමුණට නන්වාදෙන්නාවූ විතර්කයෙන් තොරවද, විචාර තෙමේ අවිතර්ක සවිචාර සසැට චිත්තයෙහි අරමුණු ගනහැකිවෙයි. ඊට උපමා කවර යත්? පිටිඹර ගම්වැසි පුරුෂ

සෙක් තෙමේ යම්කිසි කෙත්වත් ආදීවූ භූමියක් අරභයා අධිකරණයක් පැමිණිකල්හි ගම්මුදලියාට කියා ඒ අධිකරණය විනිශ්චය කරගණු කැමත්ව ගම්මුදලියාට කීකල්හි ගම්මුදලිතෙමේද අධිකරණය නිසිසේ විනිශ්චය නොකෙළේයි. ඉක්බිති මහානගරයට පැමිණ යුවරජහට කියා මේ අධිකරණය විනිශ්චයකර ගණිමැයි සිතා මහානගරයට ආයේ තමුදු යුවරජුගේ රජ වාසල කවර තැනෙක්හිවේද යනාදිය නොදන පළමුකොට යුවරජුගේ අමාත්‍යයෙක් කරා එළඹ ඔහු සහායකොටගෙණ ඔහුගේ පසුපස්සෙහි ගොස් යුවරජුගේ වාසලට පැමිණ තමාගේ අධිකරණය දන්වූකල්හි යුවරජුද නිසිසේ අධිකරණය විනිශ්චයකොට දුන්නේයි. නැවත ඒ පිටිසරවැසි පුරුෂතෙමේ සවකීය ග්‍රාමයට පැමිණ වසනකල්හි නැවතත් එබඳු අධිකරණයක්වී මහානගරයෙහි යුවරජුකරා නැවතත් එන්ට සිදුවූකල්හි ඒ පිටිසර වැසි පුරුෂ තෙමේ පළමු වාරයෙහිමෙන් යුවරජුගේ අමාත්‍යයාකරා නොගොස් පළමුවෙනි වාරයෙහි පුරුද්ද හේතුකොටගෙණ එකවරටම යුවරජුකරා පැමිණ අධිකරණය සැළකෙළේයි. මේ උපමායෙහි අරමුණ හා යුවරජුද යුවරජුගේ අමාත්‍යයා හා විතර්කයද පිටිසර වැසි පුරුෂයා හා සෙසු චෛතසිකයන්ද උපමා උපමෙය සම්බන්ධකොට අර්ථදතයුත්තේයි. මෙහි විතර්කය වනාහි තර්කය, විතර්කය, සංකල්පය, අප්පණාය, ව්‍යප්පණාය, ඌහායයි නොයෙක් නාමයෙන් තිපිටකයේ ආයේයි. මේ විතර්ක තෙමෙ ධ්‍යානාඞ්ගයන්ගෙන් පළමුවැනි ධ්‍යානාඞ්ගයවෙයි. ධ්‍යාන චිත්ත වීථියෙහි පරිකර්ම උපචාර අනුලොමගොත්‍රභූ යන කාමාවචර සිත් සතර හා යෙදුනාවූ විතර්කය විතර්කයයි ව්‍යවහාරකෙරෙත්. පස්වෙනුව හටගන්නාවූ ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ විතර්කය අප්පණාය ව්‍යප්පණායයි ව්‍යවහාර කෙරෙති. මාර්ග චිත්තයෙහි උපදනා පරිකර්මාදී සිත් හා එක්ව යෙදුනාවූ විතර්කය විතර්කයයි ව්‍යවහාරකෙරෙති. මාර්ගඵල චිත්තයෙහි යෙදුනාවූ එම විතර්කය සම්මාසඞ්කප්පයයිකියාද අප්පණා ව්‍යප්පණායයි කියාද ව්‍යවහාරකෙරෙත්. සියලු උත්තරි මනුෂ්‍ය ධර්මයන්ගෙන් පළමුවන ධර්මය මේ ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ විතර්කයයි. ඒ විතර්කයාගේ අර්පණා යන නාමය සියලු අෂ්ටසමාපත්තීන්ට හා ඛිානසමාපත්තීන්ටද සියලු අභිඥාවන්ටද සියලු ලොකොත්තර චිත්තයන්ටද සියලු ඵලසමාපත්තීන්ටද මේඅර්පණා නාමය ව්‍යවහාර කෙරෙත්. එතකුදුවුවත් කාමාවචර චිත්තයෙහි යෙදුනාවූ විතර්කයට අර්පණායයි නොකියති.

අධිමොක්ෂ චෛතසික තෙමේ අරමුණු නිශ්චයකිරීම් ලක්ෂණ
කොට ඇත්තේසි. ඊට උපමා කවරයත්? අධිකරණ නායකමහා
මාත්‍යයෙකුට බඳු උපමා ඇතිවේ. අධිකරණ නායක මහාමාත්‍ය
තෙමේ රාජනීති ලෝකනීති ධර්මනීතීයෙහි පාරප්‍රාප්තවූ බැවින්
අධිකරණ නායක විනිශ්චයකාර ධුරය ලැබෙයි. එබඳු අධිකරණ
නායක තෙමේ යම් අධිකරණයක් ඇසූ කෙණෙහිම මෙබඳු අප
රාධයක්කළ තැනැත්තෝ මෙබඳු දඬුවමක් ලැබියයුත්තෝයයි
කියා හෝ දඬුවම් නොලැබියයුත්තෝයයි කියා හෝ ඇසූ මාත්‍රය
කින්ම විනිශ්චයකට හැකිවෙයි. එපරිද්දෙන්ම මේ අධිමොක්ෂ
චෛතසිකය යම් සිතක යෙදුනුකල්හි මේ අරමුණ නිල්පැහැය
ඇත්තේය. මෙය රතු පැහැය ඇත්තේය. මෙය සුදුපැහැය
ඇත්තේය යනාදිවශයෙන් අරමුණෙහි ඇත්තාවූ තත්වාකාරය
තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසික ධර්මයන්ටද නියම
කරදෙන්නේවෙයි. මේ අධිමොක්ෂ තෙමේ විචිකිච්ඡාවට ප්‍රති
පක්ෂවෙයි. එහෙයින් අධිමොක්ෂය දොරබාව සවිකරන්නාවූ වැඹ
කට බඳු උපමා ඇතිවෙයි. විචිකිච්ඡාව දොරබාවට බඳු උපමා
ඇතිවෙයි. එහෙයින් අධිමොක්ෂ තෙමේ නිශ්චලවූ දොරබාව සවි
කරන්නාවූ වැඹක්මෙන් ස්ථිරව පිහිටයි. විචිකිච්ඡාව එහි සවි
කරන්නාවූ දොරබාවක්මෙන් නිතරම චංචලගතියෙන් පවත්
නේය. තවද නගරවාරය තහවුරුවීම පිණිස සොළොස්රියන්
තැන් පොළොව කැන නගරවාර එලිපත සවිකරන පිණිස සිටු
වන්නාවූ මහවැඹකට බඳු උපමා ඇතතේයයි යනු සමහර
ආචාර්යවරයින්ගේ මතයි. එහෙයින් අධිමොක්ෂය ඉන්ද්‍රඛීලයක්
මෙන්ද, සප්‍රයෝගී චෛතසිකයන්ගෙන් යුක්තවූ චිත්තය නගර
වාරයෙහි එලිපතට බඳු උපමා ඇතිවෙයි. යම්සේ ඒ නගර
වාරයෙහි එලිපත එසිකාසථම්භය හෙතුකොටගෙණ නොසැලී
පවත්නේවේද, එපරිද්දෙන් සසම්ප්‍රයුක්තවූ චිත්තයද අධි
මොක්ෂය හෙතුකොටගෙණ අරමුණෙහි අරමුණු විනිශ්චයකර
ගැණිමවශයෙන් ස්ථිරව පවත්නේයයි දතයුතු.

වීර්‍ය තෙමේ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ චිත්ත
යට අරමුණෙහි ස්ථිරව පිහිටාසිටීමට රුකුල්දීම ලක්ෂණකොට
ඇත්තේසි. ඊට උපමා කවරයත්? පුරාණවූ විහාර ප්‍රාසාදගෙහ
මණ්ඩපාදියට පිටින්දෙන්නාවූ බලකාරු නොහොත් උපස්ථ
ම්භක යන්ත්‍රයන්මෙන් චිත්ත චෛතසික ධර්මයන්ගේ පසුබට
නොවීම පිණිස මේ වීර්‍ය චෛතසිකය රුකුල්දෙන්නේවෙයි.
එහෙයින් වීර්‍යය උපස්ථම්භක සංඛ්‍යාතවූ බලකාරුමෙන්ද
සසම්ප්‍රයුක්තවූ චිත්තය ඒ බලකාරු යන්ත්‍ර රුකුල් ලැබීමෙන්

නොවැටීපවත්නා ප්‍රාශාද විහාර මණ්ඩපාදියකට බඳු උපමා ඇතිවෙයි. නොහොත් යුද්ධයෙහි යෙදුනාවූ බලසෙනඟට පසුබට නොවීම පිණිස යුද්ධායුධ ආහාර පානාදියෙන් අනුබලදෙන්නාවූ යුද්ධනායකයෙකුට බඳු උපමා ඇතිවෙයි. එහෙයින් සසම්ප්‍රයුක්තවූ චිත්තය බලසෙනඟ විසින් පිරිවැරූ ප්‍රමාණ යුද්ධභට යෙකුමෙන්ද, වීර්‍ය්‍ය චෛතසිකය ඔවුන්ගේ පසුබට නොවීම පිණිස යුද්ධොපකරණාදියෙන් අනුබලදෙන්නාවූ යුද්ධනායක යෙකුමෙන්ද දතයුතුයි.

ප්‍රීති තොමෝ ආලම්බන සවභාව ප්‍රියකිරීම ලක්ෂණකොට ඇත්තීය. මේ ප්‍රීතිය කරණකොටගෙණ විඤ්ඤාණක්ඛන්ධ සංඛ්‍යාතවූ චිත්තයද, වේදනා සඤ්ඤා සංඛාර සංඛ්‍යාතවූ නාමකාය පිණවීම නොහොත් සන්තර්පණයකිරීම මේ ප්‍රීතිහුගේ සවභාවයි. ඊට උපමා කවර යත්? කාන්තාර මාර්ගයෙහි යන්නාවූ පුරුෂයෙක් තෙමේ අතිශයින් පිපාසිතව වෙහෙසට පත්ව ජලය සොයමින් යන්නාවූකල්හී ඉදිරි මාර්ගයෙහි ආවාවූ යම් පුරුෂයෙක් දැක එම්බාසඟය! ජලය කොතැන්හි ඇත්තේදැයි විචාළකල්හී පින්වත! තොපි මේ යන්නාවූ මාර්ගයෙහි මඳක් දුර යනකල්හි පස්පියුමෙන් සැදුම් ලත් සිහිල් ජලයෙන් පිරීගියාවූ පොකුණක් සම්භවෙයි කීකල්හී වහ වහා යනුයේ ඒ මඟී පුරුෂයා කී පරිද්දෙන් පස් පියුමෙන් සැදුම් ලත් සිහිල් ජලයෙන් පිරීගියාවූ ඒ පොකුණ දකින්ට ලැබුනේයි. පිපාසිතවූ ඒ පුරුෂයාහට පස්පියුමෙන් සැදුම් ලත් ඒ සිහිල් පැන් පොකුණ දුටු මාත්‍රයකින් ඔහුගේ සිත පිළිබඳවූ යම් සවභාවක් උපදනේද ඒ ප්‍රීතියයි දතයුතුයි. මේ ප්‍රීතිය වනාහි සම්ප්‍රයුක්ත චිත්තයෙහි උපන්කල්හීසිහින්වූකපුපුළුන්පටලයක තලතෙල්වත් කළාක්මෙන්වෙයි. සසම්ප්‍රයුක්තවූ චිත්තය කපුපුළුන් පටලයක් මෙන්ද, ප්‍රීතිය තලතෙලක්මෙන්ද දතයුතුයි. මේ ප්‍රීතිතොමෝ ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඔක්කන්තික ප්‍රීතිය, උබ්බෙග ප්‍රීතිය, ඵරණ ප්‍රීතියයි පස් ආකාරවේ. ඔවුන් අතුරෙන් ලොමුදැහැගැණීම් මාත්‍රයක් උපදවන්නාවූ ප්‍රීති තොමෝ ඛුද්දක ප්‍රීති නම්වේ, විදුලිය ගසන්නාක්මෙන් ක්ෂණ ක්ෂණයෙන් ශරීරයෙහි ලොමුදැහැගැණීම් උපදවන්නාවූ ප්‍රීති තොමෝ ඛණික ප්‍රීති නම්වෙයි. සමුද්‍රයෙහි රළ පතර වෙලාන්තයෙහි බිඳී බිඳී යන්නාක්මෙන් සකල ශරීරයෙහි පැතිර යන්නාවූ ප්‍රීති තොමෝ ඔක්කන්තික ප්‍රීතිනම්වෙයි. වාතවෙගයෙන් අහසට නගන්නාවූ කපුපුළුන් පටලයක්මෙන් ප්‍රීතිවෙගය කාරණකොටගෙණ චතුර්ත්ථ ධ්‍යානයත් නොලැබම තමා අභිමත ස්ථානයට අහසින් ගෙණ

ඝොස් සිටුවීම් කරන්නාවූ ප්‍රීති තොමෝ උවෙග ප්‍රීතිනම්වෙයි. මහත්වූ ගංවතුරක් අවුත් ස්වල්පවූ විල් පොකුණු පතුරුවාගෙණ යන්නාක්මෙන් සුළන් පිරූ හසත්‍රාවක් නොහොත් සම්පසුඹියක් මහත්වෙන්නාක්මෙන් සකල ශරීරයෙහි පැතිරයන්නාවූ ප්‍රීති තොමෝ ඵරණ ප්‍රීතිනම්වන්නේය. උවෙග ප්‍රීතියට උපමාවශයෙන් මහසෑ වඳිනු පිණිස මව්පියන්ගේ පැමිණීමට මත්තෙන් ගබ්භිණියකගේ පැමිණි කථාවදතයුතුයි.

“ඡන්ද චෛතසිකය” යනු අරමුණුගැණීමෙහි කැමති මාත්‍රයක්වෙයි. එහෙයින් ඡන්දය අරමුණුගැණීම ලක්ෂණකොට ඇත්තේවෙයි. ඊට උපමා කවරයත්? දුනුවායා විසින් විදින්නාවූ ඊතලය අයිතිකාරයාවූ එම දුන්න තමාගෙන් ඈතට දමාගැසීම පිණිස ඒ දුණුදිය නැමී උපකාරවෙයි. මේ ලෝභය හා ඡන්දයද තෘෂ්ණා පර්යායවූ ශබ්දයෝවෙති. එතකුදුවුවත් ඡන්ද චෛතසිකය අරමුණුගැණීම් මාත්‍රයක් කැමැත්තෙය. ලෝභය වනාහි විශේෂයෙන් ඒ අරමුණෙහි ගිජුව ඇලෙයි. එහෙයින් මේ ඡන්ද චෛතසිකය කළාල පැදුරෙක්හි දමතලද්දාවූ කැටකැබලිතිමෙන්ද ලෝභය ඒ කළාල පැදුරෙහි දමතලද්දාවූ වඳුරු ලභටුවකට බඳු උපමා ඇතිවෙයි. නැවත ඒ කැබිලිති හා වඳුරු ලභටුවද කළාල පැදුරෙන්ගනු කැමතිකල්හී කැටකැබිලිති ආදිය පහසුවෙන් අවිලාගත හැකිවෙයි. වඳුරු ලභටුව වනාහි නැවත ඒ කළාලයෙන් නොගතහැකි පරිද්දෙන් ඇලියෙයි. එබැවින් මේ දෙදෙනාගේ විශේෂය කැටකැබිලිති හා වඳුරු ලභටුවමෙන්ද අවබොධකටයුතුය. තවද මෙ ධර්මදෙදෙනාගේ විශේෂය දැක්වීමට උදාහරණයක්නම්:-අනුන්ගේ ගෙයක් ඔඳ අන්‍යතු වස්තුවක් පැහැරගන්නාකල්හි ලෝභ මූලික අකුශල චිත්තය උපදී. එසේම තමන් සතු වස්තුවක් දන්දෙන්නාවූ කල්හී අලෝභ ප්‍රධානවූ මහාකාමාවචර කුශල චිත්ත විථියක් උපදී. යම් කුශලාකුශල චිත්තවීථියෙක්හි ඒ ඡන්දචෛතසිකය සමානවශයෙන් යෙදේදැයි මෙ උදාහරණයෙන් ලෝභ ඡන්ද දෙදෙනාගේ විශේෂය අවබොධකටයුතුයි. මේ විතර්කාදී චෛතසිකයෝ සදෙන වනාහි නොයෙක් චිත්තයෙහි සයාකාරයකින් යෙදෙනහෙයින් ප්‍රකීර්ණක චෛතසිකයෝයයි කියත්. පළමු කියනලද්දාවූ සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන දෙවනු කියනලද්දාවූ ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන යනමේ දෙකොටස එක්කොටගත්කල්හි ඒ තෙළෙස් චෛතසිකයන් අන්‍ය සමාන රාශියයි කියත්. මොවුන් තෙළෙස්දෙනාහට

කුමක්හෙයින් අන්‍ය සමාන රාශියයි කියත්තේද යත්? මේ තෙළෙස් ධර්මයෝ ශොභන සිත් හා එක්ව යෙදෙන්නාවූකල්හී අශොභනයන්ගෙන් අන්‍යවූ ශොභනයන් හා සමාන බැවින්ද, අශොභන චිත්තයෙහි යෙදෙනකල්හී ශොභනයන්ගෙන් අන්‍යවූ අශොභන සිත් හා සදෘශහෙයින්ද, අන්‍ය සමාන චෛතසික යෝයයි ව්‍යවහාරකෙරෙත්. ඊට උපමා කවරයත්? මිත්‍රසන්ථව යෙහි දක්ෂවූ කෛරාටික මිත්‍රයෙක් තෙමේ ප්‍රාණඝාත අදත්තා දානාදීවූ දුශ්චරිත ක්‍රියාවෙහි හැසිරෙන්නාවූ පාපකාරී පුද්ගල යන් හා සමානවම ප්‍රණඝාතාදියෙහි හැසිරෙයි. ඒ පුරුෂ තෙමේම දානාදි පුණ්‍ය ක්‍රියාදියෙහි හැසිරෙන්නාවූ යහපත් මනුෂ්‍යයන් හා මිත්‍රසන්ථවය පවත්වන්නාවූකල්හී ඔවුන් හා සමග විහාරාරාමාදියට එළඹ මල් පහන් පිදීම් බණ ඇසීම් ආදී කුශල ක්‍රියාවෙහි හැසිරෙයි. එහෙයින් ස්පර්ශාදී අන්‍ය සමාන චෛතසිකයෝ තෙළෙස්දෙන දොළොස් අකුශල් සිත් හා එක්ව යෙදුනාවූකල්හි ඒ ධර්මයෝද ඒකාන්ත අකුශල්නම්වෙත්. කාම රූපාරූප ලෝකොත්තර කුශල් සිත් හා එක්ව යෙදුනුකල්හී ඒ ධර්මයෝද ඒකාන්ත කුශල්නම්වෙති. විපාක ක්‍රියාවන් හා එක්ව යෙදෙනකල්හී කුසලුත් නොවූ අකුශලුත් නොවූ අව්‍යාකෘත සවභාව ඇත්තාවූ ධර්මයෝනම්වෙති, එහෙයින් ස්පර්ශය තෙමේ අකුශල් සිත් හා යෙදුනුකල්හී අකුශල ස්පර්ශනම්වෙයි, කුශල් සිත් හා එක්ව යෙදුනුකල්හී කුශල ස්පර්ශනම්වෙයි. විපාක ක්‍රියාවන් හා එක්ව යෙදුනුකල්හී අව්‍යාකෘත ස්පර්ශනම්වෙයි. එහෙයින් පටිසම්භිදා මාර්ගයෙහි 'ඵස්සොසියා කුසලං සියාඅ කුසලං, සියා අව්‍යාකතං'' යනාදිය වදාරණලද්දේයි. වේදනාව ආදී අවශෙෂ දොළොස් චෛතසිකයන්ගේද කුශලා කුශල අව්‍යාකෘත භාවය මෙසේ දතයුතුයි.

මොහොව ආලම්බණ සවභාව මුවහකිරීම ලක්ෂණකොට ඇත්තාවූ මොහ චෛතසිකයෙක්ද; අහිරිකව, කායදුශ්චරිතාදි යෙන් ලජ්ජානොවීම ලක්ෂණකොට ඇත්තාවූ අහිරිකචෛත සිකයෙක්ද: අනොත්තප්පව, කායදුශ්චරිතාදියෙන් භයනොවීම ලක්ෂණකොට ඇත්තාවූ අනොත්තප්ප චෛතසිකයෙක්ද: උද්ධච්චව, නොසන්හුන්බව හා වික්ෂිප්තබව නොහොත් දමාගසන බව ලක්ෂණකොට ඇත්තාවූ උද්ධච්චචෛතසිකයෙක්ද;ලොභොව, අරමුණෙහි ඇලීම්වශයෙන් ගිජුවනබව ලක්ෂණකොට ඇත්තාවූ ලොභ චෛතසිකයෙක්ද; දිට්ඨිව, පෙරළීම්වශයෙන් මෙනෙහි කිරීම ලක්ෂණකොට ඇත්තාවූ දිට්ඨිචෛතසිකයෙක්ද; මානොව, තමාම උත්තමයෙකැයි සිතා ආත්මය ධවජයක්සේ ඔසවා ගත්තාවූ මානචෛතසිකයෙක්ද; දොසොච, චණ්ඩස්වභාවයෙන් වර

දවා පැවැත්ම ලක්ෂණකොට ඇත්තාවූ ද්වෙෂ චෛතසිකයෙක්ද; ඉස්සාව, අනුන්ගේ සම්පත්තියට රවාබැලීම ලක්ෂණකොට ඇත්තාවූ ඉස්සා චෛතසිකයෙක්ද; මච්ඡරියව, තමාගේ සම්පත් සඟවා තැබීම ලක්ෂණකොට ඇත්තාවූ මච්ඡරිය චෛතසිකයෙක්ද; කුක්කුච්චව, පසුගිය කාලයෙහි කරණලද්දාවූ දුශ්චරිතයන් හා නොකරණලද සුචරිතයන් ගැන නැවත නැවත පසුතැවිලිවීම ලක්ෂණකොට ඇත්තාවූ කුක්කුච්ච චෛතසිකයෙක්ද; ථීනව; චිත්තයාගේ අරමුණෙහි නොඉවසීම ලක්ෂණකොට ඇත්තාවූ ථීන චෛතසිකයෙක්ද; මිද්ධව, වෙදනා සඤ්ඤා සංඛාර සංඛ්‍යාත ස්කන්ධත්‍රයාගේ අරමුණු නොඉවසීම ලක්ෂණකොට ඇත්තාවූ මිද්ධ චෛතසිකයෙක්ද; විචිකිච්ඡාව, අරමුණු නිශ්චයකිරීමෙහි අදක්ෂබව ලක්ෂණකොට ඇත්තාවූ විචිකිච්ඡා චෛතසිකයෙක්ද; ඉති, මෙසේ; චුද්දස ඉමෙ චෙතසිකා, තුදුසක් ප්‍රභේදවූ මේ චෛතසිකයෝ තුමූ; අකුසලා නාම, අකුශල චෛතසිකනම් ඇත්තාහු නොහොත් අන්‍ය සමාන චෛතසිකයන්මෙන් කුශල අව්‍යාකෘත චිත්තයන්ගෙන් අන්‍යවූ අකුශල චිත්තයෙහිම යෙදෙනහෙයින් අකුසලනම් ඇත්තාහු; හොන්ති, වෙත්; සද්ධාව, බුද්ධාදීවූ ඉෂ්ටාලම්බණයෙහි තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසිකයන් රාගාදී ක්ලේශ නැමැති මඩ බොරයෙන්වෙන් කොට පැහැදවීම ලක්ෂණකොට ඇත්තාවූ ශ්‍රද්ධා චෛතසිකයෙක්ද: සතිව, බුද්ධාදීවූ ඉෂ්ටාලම්බණය තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන්ට සිහිකරවීම ලක්ෂණකොට ඇත්තාවූ; ස්මෘති චෛතසිකයෙක්ද; හිරිව, කායදුශ්චරිතාදියෙන් ලජ්ජාවීම ලක්ෂණකොට ඇත්තාවූ හිරි චෛතසිකයෙක්ද; ඔත්තප්පව; කායදුශ්චරිතාදියෙන් භයවීම ලක්ෂණකොට ඇත්තාවූ ඔත්තප්ප චෛතසිකයෙක්ද; අලොභව, අරමුණෙහි නොඇලීම ලක්ෂණකොට ඇත්තාවූ අලොභ චෛතසිකයෙක්ද; අදොසව, කර්කශභාවයෙන් වරදවා නොපැවැත්ම ලක්ෂණකොට ඇත්තාවූ අද්වෙෂ චෛතසිකයෙක්ද; තත්‍රමජ්ඣත්තතාව, ඒ ඒ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ මැදහත්ව නැංවීම සිද්ධකිරීම ලක්ෂණකොට ඇත්තාවූ තත්‍රමජ්ඣත්තතා චෛතසිකයෙක්ද; කායපස්සද්ධිව, වෙදනාදී ස්කන්ධත්‍රයාගේ සන්සිඳීම ලක්ෂණකොට ඇත්තාවූ කායපස්සද්ධි චෛතසිකයෙක්ද; චිත්තපස්සද්ධිව, විඤ්ඤාණස්කන්ධයාගේ සන්සිඳීම ලක්ෂණකොට ඇත්තාවූ චිත්තපස්සද්ධි චෛතසිකයෙක්ද; කායලහුතාව, වෙදනාදී ස්කන්ධත්‍රයාගේ සැහැල්ලු බව ලක්ෂණකොට ඇත්තාවූ කායලහුතානම් චෛතසිකයෙක්ද; චිත්තලහුතාව, විඥානස්කන්ධයාගේ සැහැල්ලුබව ලක්ෂණ

කොට ඇත්තාවූ චිත්තලහුතා චෛතසිකයෙක්ද; කායමුදුතාව, වෙදනාදී ස්කන්ධත්‍රයාගේ මොළොක්බව ලක්ෂණකොට ඇත්තාවූ කායමුදුතා චෛතසිකයෙක්ද; චිත්තමුදුතාව, විඤ්ඤාණස්කන්ධයාගේ මොළොක්බව ලක්ෂණකොට ඇත්තාවූ චිත්තමුදුතා චෛතසිකයෙක්ද; කායකම්මඤ්ඤතාව, වෙදනාදීස්කන්ධත්‍රයාගේ අරමුණුගැණීමෙහි සාධුත්වය ලක්ෂණකොට ඇත්තාවූ කායකම්මඤ්ඤතා චෛතසිකයෙක්ද; චිත්තකම්මඤ්ඤතාව, විඥානස්කන්ධයාගේ අරමුණුගැණීමෙහි සාධුත්වය ලක්ෂණකොට ඇත්තාවූ චිත්තකම්මඤ්ඤතා චෛතසිකයෙක්ද; කායපාගුඤ්ඤතාව, වෙදනාදිස්කන්ධත්‍රයාගේ අරමුණුගැණීමෙහි පුහුණු බැව් ලක්ෂණකොට ඇත්තාවූ කායපාගුඤ්ඤතා චෛතසිකයෙක්ද; චිත්තපාගුඤ්ඤතාව, විඤ්ඤාණස්කන්ධයාගේ අරමුණුගැණීම ලක්ෂණකොට ඇත්තාවූ චිත්තපාගුඤ්ඤතා චෛතසිකයෙක්ද; කායුජ්ජුකතාව, වෙදනාදිස්කන්ධත්‍රයාගේ අරමුණුගැණීමෙහි අවඞ්කබව ලක්ෂණකොට ඇත්තාවූ කායුජ්ජුකතා චෛතසිකයෙක්ද; චිත්තුජ්ජුකතාව, විඥානස්කන්ධයාගේ අරමුණුගැණීමෙහි නොඇද බැව් ලක්ෂණකොට ඇත්තාවූ චිත්තුජ්ජුකතා චෛතසිකයෙක්ද; ඉති, මෙසේ; එකූනවීසති ඉමෙ චෙතසිකා, එකුන්විස්සක් ප්‍රභෙදවූ මේ චෛතසිකයෝ තුමූ; ශොභන සාධාරණාති, සියලු එකුන්සැටක් ශොභන චිත්තයෙහි යෙදෙන බැවින් ශොභන සාධාරණනම් ඇත්තාහු; හොන්ති, වෙත්; සම්මාවාචාව, ආජීවහෙතුව අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාවම කාරණකොට නොගෙණ මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්‍රලාප යන සතරවාග් දුශ්චරිතයෙන් වෙන්වීම ලක්ෂණකොට ඇත්තාවූ චෛතසිකයෝද; සම්මාකම්මන්තො, ආජීවහෙතු අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාව කරණකොට නොගෙණ පාණාතිපාත අදින්නාදාන කාමමිච්ඡාචාර සංඛ්‍යාතවූ ත්‍රිවිධකාය දුශ්චරිතයෙන් වැලක්ම ලක්ෂණකොට ඇත්තාවූ සම්මාකම්මන්ත චෛතසිකයෙක්ද; සම්මාආජීවොච, ආජීවහෙතු අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාව කාරණාකොටනොගෙණ යථොක්ත සප්තවිධ දුශ්චරිතයෙන් වැලකීම ලක්ෂණකොට ඇත්තාවූ සම්මාආජීව චෛතසිකයෙක්ද, ඉති, මෙසේ; තිස්සො ඉමා චෙතසිකා, මේචෛතසිකයෝ තුන්දෙන; විරතියො නාම, විරතිනම් ඇත්තාහු; නොහොත් විරමිතව්‍ය වස්තූන්ගෙන් වැලකීමට හෙතුවනහෙයින් විරති චෛතසිකනම් ඇත්තාහු; හොන්ති, වෙත්; කාරුණාච, අප්‍රමාණ දුඃඛිත සත්ව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ අනුකම්පාකිරීම ලක්ෂණකොට

ඇත්තාවූ කරුණා චෛතසිකයෙක්ද; මුදිතාච අප්‍රමාණවූ සුඛිත සත්ව ප්‍රභූපතිය අරමුණුකොට පැවැත්වීම ලක්‍ෂණකොට ඇත්තාවූ මුදිතා චෛතසිකයෙක්ද; ඉති ඉමෙ චෙතසිකා, මෙසේ මේ චෛතසිකයෝ ද්‍වූ; අප්පමඤ්ඤා යොනාම, අප්‍රමාණ සත්වයන් අරමුණුකොට පවත්නාහෙයින් අප්‍රමාණ්‍ය නම් ඇත්තාහු; හොනති. චෙත්; ඉති, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙන්ද; පඤ්ඤින්ද්‍රියෙන සඞ්ං, අනිත්‍යාදිවශයෙන් ප්‍රතිවෙධකොට දනගැණීමෙහි ඊශ්වරභාවය ලක්‍ෂණකොට ඇතිහෙයින් පඤ්ඤින්ද්‍රියනම්වූ අමෝහ චෛතසිකයා හා සමග; පඤ්චවීසති ඉමෙ චෙතසිකා, පස්විසි මේ චෛතසිකයෝ; සොභන චෙතසිකා හොනති, ශොභන චෛතසිකනම් ඇත්තාහුයයි; වෙදිතබ්බා, දතයුත්තාහුය. ච, විස්තරය හැර සංක්‍ෂෙපයෙන් දක්වමි: එත්තාවතා, එත්තාවනෙතන වචනකතමෙන, මෙපමණවූ ශබ්ද පන්තියකින්; මයාවුත්තා, මා විසින් කියනලද්දාවූ; චෙතසිකා, චෛතසිකයෝ; තෙරස අඤ්ඤසමානාච, තෙලෙස් අන්‍ය සමාන චෛතසික කෙනෙක්ද; චුද්දසා අකුසලා, තුදුස් අකුශල චෛතසිකකෙනෙක්ද; තථා, මොවුන් හැර; පඤ්චවීසති ශොභනා, පස්විසිශොභන චෛතසිකකෙනෙක්ද; ඉති, මෙසේ; චිපඤ්ඤාස දෙපණසෙක්වෙත්යයි; පවුච්චරෙ, කියනුලැබෙත්.

අන්‍ය සමාන තෙලෙස් චෛතසිකයන්ගේ විභාග දක්වා දුන් තුදුස් අකුශල චෛතසිකයන්ගේ විභාග දක්වනුලැබේ. මොහ තෙමේ ආලම්බණ සවභාව මුවහකිරීම ලක්‍ෂණකොට ඇත්තේයි. ආලම්බණ සවභාව කෙසේ මුවහකරන්නේදයත්? පූර්වාන්තය නොදැනීමය, අපරාන්තය නොදැනීමය, පූර්වාපරාන්තය නොදැනීමය, ඉදප්‍රත්‍යතා සඞ්ඛ්‍යාත පටිච්චසමුප්පාදය නොදැනීමය, යනමේ සතර තැන මුවහකිරීම මොහයාගේ ලක්‍ෂණයයි. යම්සේ වලාලැහැබය, අවපක්‍ෂලොස්වක දවසය, මධ්‍යම රාත්‍රිය, මෙඝයෙන් වැසීමය, යන චතුරාඞ්ගයෙන් යුක්තවූ අන්ධකාරය නීල පීතාදිවූ රූපයන් මුවහකෙරේද එපරිද්දෙන් පූර්වාන්තාදී සතරතැන්හි නොදැනීම් සඞ්ඛ්‍යාතවූ මොහය අනිත්‍යාදී ලක්‍ෂණය මුවහකෙරෙයි. ලොකයෙහි වනාහි චතුරාඞ්ගයෙන් යුක්තවූ අන්ධකාරය හෙතුකොට ගණ නොයායුතුවූ කුමාර්ගාදියෙහි ගමන්කරවයි. එපරිද්දෙන් මේ චතුරාඞ්ගයෙන් යුක්තවූ මොහ සඞ්ඛ්‍යාතවූ සිත පිළිබඳවූ අන්ධකාරය කාරණකොටගෙණ සත්වයා සතර අපායට හෙළයි.

අහිරික තෙමේ කායදුශ්චරිතාදියෙන් ලජ්ජානොවීම ලක්ෂණකොට ඇත්තේය. ඒ අහිරිකතෙමේ ගම්වාසීන්ගේ හූරෙකුට බඳු උපමා ඇතිවෙයි. ග්‍රාමාන්තයෙහි පහරන්නාවූ මළ මූත්‍රාදිය කාරණකොටගෙණ ග්‍රාමවාසී මනුෂ්‍යයෝ ඒ දිග් භාගයට පවා යාමට පිළිකුල් වෙති. එතකුදුවුවත් ගම් හූරා තෙමේ අභිමතාලම්බණයවූ ඒ අමේධ්‍යය භොජනයාගේ අභිමුඛ යෙහිම මිහිරක් අනුභවකරන්නාක්මෙන් රසාස්වාදයකරමින් අනුභවකෙරෙයි. එපරිද්දෙන්ම මනුෂ්‍ය තෙමේ මේ අහිරික චෛතසිකය කාරණකොටගෙණ ආත්ම ගෞරවය අපෙක්ෂා නොකොටම තමාගේ ආත්මය කෙලෙසේයයි ලජ්ජානොවී මහ ජනයා අභිමුඛයෙහිම ප්‍රාණඝාත සුරාපානාදී දුශ්චරිතයෙහි හැසිරෙයි.

අනොත්තප්ප චෛතසික තෙමේ කායාදී දුශ්චරිතයෙන් තැතිනොගැණීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ අනොත්තප්ප චෛතසික තෙමේ පළඟැටියෙකුට බඳු උපමා ඇත්තේවෙයි. කෙසේ පළඟැටියෙකුට සමානවන්නේදයත්? තෙල් පහනක් දල්වූකල්හී ඒ පහන් සිළුව සපශීකිරීමට සමත්නොවෙයි. ඉදින් මේ පහන් දළුව සපශීකෙළේනම් අනදවන්නේයයි භය පත්ව එහි ආදීනව දක්නාවූ මනුෂ්‍යයෝ දුරින්ම දුරුවෙති. එතකුදුවුවත් පළඟැටි තෙමේ පහනක් දල්වූකල්හී ඒ පහන් සිළු ආලොකයට රුචිවී රූපතෘෂ්ණාවෙන් මුළාවී ඒ පහන් වැටි යෙහි වැටී දිවිනසාගණී. එපරිද්දෙන්ම මනුෂ්‍ය තෙමේ ප්‍රාණ ඝාත කාමමිථ්‍යාචාර සුරාපානාදී නානාවාග් දුශ්චරිතයන් ඉතා සැපවෙත්යයි රුචිවී මේ අනොත්තප්පය හේතුකොටගෙණ දුශ්චරිත නැමති ගින්නෙහිගෙලතුලැබේ. එහෙයින් අනොත්ත ප්පය පළඟැටියෙකුට බඳු උපමා ඇතිමෙයි.

උද්ධච්ච චෛතසිකය තෙමේ චිත්තයාගේ නොසන්හුන් බව හා වික්ෂිප්තබවකිරීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ උද්ධච්චය තෙමේ අළු රැසකට කැටයකින්ගැසීමට බඳු උපමා ඇතිමෙයි. අළු රැසකට කැටයකින් පහර දුන්කල්හී ඒඅලු අහසට නැගීබමමින් පවත්නේයි. එපරිද්දෙන්ම මේ උද්ධච්චය නැමති කැටින් සම් ප්‍රයුක්ත චිත්ත නැමති අලු රැසට පහරදුන්කල්හී ඒ චිත්ත චෛතසික ධර්මයෝ නොසන්හුන් භාවයෙන් හා වික්ෂිප්තභාව යෙන් යුක්තව පවතිත්.

ලොභ තෙමේ අරමුණෙහි ගිජුවශයෙන් ඇලීම ලක්ෂණ කොට ඇත්තේයි. එහෙයින් මේ ලොභ තෙමේ වඳුරු ලහට්ටුව

කට බඳු උපමා ඇත්තේවේ. යම්සේ මිඳුරන්යණ්තාවූ මංතල යෙහි පුවරුකඩක වඳුරුලහට්ටුව ගාතබා වඳුරන් ප්‍රියකරන්තාවූ පුෂ්පඵලාදිය දමූකල්හි යම්කිසි වඳුරෙක් අවුත් ඒ ලහටුවෙහි අතතැබූකල්හි ඒ අත ඇලීයයි. නැවත අනික් අත තැබූකල්හි ඒ අතත් ඇලීයයි. ඉක්බිති පයත් තැබූකල්හි ඒපය ඇලීයයි. අනික් පයත් තැබූකල්හි ඒපයත් ඇලීයයි. මෙසේ අත්පා ඇලී ගියකල්හි පඤ්චවෙනුව මුඛය තබයි. ඒ මුඛයත් ඇලීගියකල්හි වඳුරුවැදි තෙමේ දිවඅවුත් දඬුමුගුරු ආදියෙන් තලා මරා ගෙණගොස් මස් අනුභවකරයි. එපරිද්දෙන්ම මනුෂ්‍ය තෙමේ රූපාදී පචකාම නැමති ලහටුවෙහි චක්ෂුරාදී පස්තැනින් ඇලී ගියකල්හි වසවර්තිමාරතෙමේ අවුත් අපායට ගමාගනයි. එහෙ සින් ලොභතෙමේ වඳුරු ලහටුවකට බඳු උපමා ඇතිවෙයි.

දෘෂ්ටි තොමෝ වරදවා දැක්ම හා වරදවා මෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තීය. ඒ මිථ්‍යාදෘෂ්ටි තොමෝ ඉන්ද්‍රජාලය කට බඳු උපමා ඇත්තීවෙයි. නොහොත් ජීවිතාරක්ෂාව සඳහා පිශාච නගරයකට යායුතුවූ උන්මාර්ගීයකට බඳුවෙයි. යම්සේ ඉන්ද්‍රජාලික තෙමේ කැටකැබිලිති ආදිය රත්රුවන් මුතුමැණික් කොට පෙන්වාද එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි සඬ්ඛ්‍යාත වරදවූ දැකීම හෙතුකොටගෙණ අනාත්මය ආත්මයක්කොට සිතා ගණී. ඒකාන්තසාවද්‍යවූ සත්වඝාතන සුරාපානාදිය ඒකාන්ත අනවද්‍යවූ කුශල ධර්මයයි සිතාගණී. මෙයින් මතු සදාකාලික ස්වර්ගීයෙහි හෝ බ්‍රහ්මලොකයෙහි හෝ උපදිමියි වරදවා මෙනෙ හිකරයි. එසේම නොමැරෙනු කැමතිවූ සැප කැමතිවූ පුරුෂ යෙක් බොහෝකල් සැපසේ ජීවත්වෙනු සඳහා පිශාච නගර ගාමී මාර්ගයකට පැමිණෙයි. ඒ පුරුෂ තෙමේ පිශාච නගරයට පැමිණිකල්හි ඒ පිශාචයෝ මේ පුරුෂයා අල්වා ලේ බී මස් අනු භවකෙරෙති. එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි මනුෂ්‍ය තෙමේ සදා කාලික සැප ලබනු පිණිස මිථ්‍යාදෘෂ්ටි නැමති මාර්ගයෙහි ගොස් අපායට වැටුනුකල්හි නිරිසතුන් විසින් නොයෙක් දුක්කම් කටුලුකරති.

මානතෙමේ මම උතුමැයි තමා ධජයක්කරනු කැමැත්ත ලක්ෂණකොට ඇත්තේයි. ඒමානයකිරීමට හෙතුහුනම්:–තමාගේ ශරීර ලක්ෂණය හෙතුකොටගෙණද මානයකරයි. ධනසම්පත්තිය හෙතුකොටගෙණද මානයකරයි. වයසෙන් හා ගුණයෙන් වැඩි සිටීම ද හෙතුකොටගෙණද මානයකරයි. ජාතිගොත්‍රය හෙතු කොටගෙණද මානයකරයි. උතුම්වූහෙයින් මානයකරයි. කුලෙ

කර්මඋපනිශ්‍රයකොටගෙණද මානයකරයි. මේ මාන තෙමේ ජාති මානය පුණ්‍යමානය ගුණමානයයි තුන්වැදෑරුම්වේ. මම වනාහි රජකුලයෙන් පැවත එන්නෙමියි සිතා මානයකරයි. මම වනාහි කුශලකර්මහෙතුවෙන් ධනසම්පත් ලැබීමියි සිතාමානය කරයි. මම වනාහි ශීල සමාධි ගුණයෙන් යුක්තයයි සිතා මානය කරයි. නොහොත් හීනමානය, සදිසමානය, ප්‍රණීතමානයයි කියා තුන්වැදෑරුම්වේ. නීච මනුෂ්‍යයෙක් තෙමේ උතුම් මනුෂ්‍යයෙකුට මානකිරීම හීනමානයයි. මමද ඔහුද ධනකුලශීලාදීයෙන් සමානයයි සිතා මානකිරීම සදෘශමානයයි. රජ බමුණු වෙළඳ ආදීවූ උත්තම මනුෂ්‍යයන් විසින් හීන සම්මත මනුෂ්‍යයන්ට මානයකිරීම පණීතමානයයි. සෙය්‍යමානය යනු මීටම නමකි.

ද්වේෂ තෙමේ කර්කශවශයෙන් වර්දවා පැවතීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ ද්වේෂ තෙමේ ගස්බෙනයක සයනයකරන්නාවූ උග්‍රවූ ඝොරවූ විෂඇත්තාවූ සර්පයෙකුට බඳුඋපමා ඇතිවෙයි. යම්සේ ගස්බෙනයෙහි වැදහොත්තාවූ සර්පයාහට දඬු මුගුරු කැටකැබිලිති ආදියෙන් පහරදුන්නේවේද එකල්හි ඒ සර්පතෙමේ ගස්බෙනයෙන් පිටතට අවුත් පහරදුන් පුරුෂයා දෂ්ටකොට ජීවිතක්ෂයට පමුණුවයි. එපරිද්දෙන්ම හෘදයාභ්‍යන්තර නැමති ගස්බෙනයෙහි අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය නොකිරීමෙන් අනුසයවශයෙන් සයනයකළාවූ ද්වේෂ නැමති සර්පයාහට නවවිධ ආඝාත වස්තුවය, අස්ථානකොපය යන දශ ප්‍රකාරවූ කැටකැබිලිති දඬු මුගුරු ආදියෙන් පහරදුන්කල්හි ආත්මාභ්‍යන්තරයෙන් මැතට අවුත් අනුන්ගේ ජීවිතය පවා විනාශකෙරෙයි. නොහොත් මේ ද්වේෂ තෙමේ යකඩයේ නැංගාවූ මලයක්සෙයින් ඒ ද්වේෂ සහගත පුද්ගලයාම විනාශකෙරෙයි. නොහොත් ගිනිගානා දඬෙන් හටගත්තාවූ ගින්නකට බඳු උපමා ඇත්තේවෙයි. එපරිද්දෙන්ම මේ ද්වේෂ තෙමේද සත්වයන්ගේ අධ්‍යාත්මසන්තානය නිශ්‍රයකොටගෙණ ඉපිද ද්වේෂයාගේ අන්තිම ඵලය ස්වකීය ජීවිත විනාශය බැවින් මේ ජාතියෙහි තමාගේ ආත්මය විනාශකොටගෙණ මරණින් මතු සතර අපායෙහි ඉපිද මහත් අනයව්‍යසනයට භාජනවෙයි. එහෙයින් යකඩෙහි උපන්මලය යකඩය විනාශකරන්නාක්මෙන්ද, ගස්බෙනයෙන් හටගත්තාවූ ගින්න ගස දවන්නාක්මෙන්ද, ගිනිගානාදණ්ඩෙන් හටගත්තාවූ ගින්න ඒගිනිගානා දඬුදවන්නාක්මෙන්ද සත්වයාගේ ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත්තාවූ ද්වේෂ තෙමේ මේ ජාතියෙහිත් තමාගේ ආත්මය විනාශකොට මරණින් මතු අපාය දුකට භාජනවෙයි.

ඊෂ්‍යා තොමෝ අනුන්ගේ සම්පත්තියට රවාබැලීම ලක්ෂණකොට ඇත්තීය. මාත්ෂර්යයතෙමේ තමාගේ සම්පත් සැඟවීම ලක්ෂණකොට ඇත්තේසි. ඊෂ්‍යාව වනාහි බාහිර ධර්මයන්ම අරමුණුකොට පවත්නීය. අධ්‍යාත්මය අරමුණුනොකරන්නීය. මාත්සර්යය අධ්‍යාත්මයම අරමුණුකරන්නේය. බාහිරය අරමුණුනොකරන්නේය. ඊෂ්‍යා තොමෝ අනුන්ගේ වස්ත්‍රාභරණ ධනසම්පත් පිරිස්සම්පත් ආදිය නුරුස්නා සුළුව රවා බලන්නාවූ කල්හි බාහිරධර්මය අරමුණුකරන්නේනම්වෙයි. මාත්සර්යතෙමේ තමාගේ ධනසම්පත් ඇත්තේ නමුදු අනුන්ටදීමට ප්‍රස්තාවක් පැමිණිකල්හි සියයක් ඇත්තේ නමුදු පණසක් ඇත්තේයයිද පණසක් ඇත්තේ නමුදු පස්විස්සක් ඇත්තේමයයිකියාද තමන්ගේ සැඟවීම මාත්සර්යයාගේ ලක්ෂණයවෙයි. මේ ධර්මයෝ දෙදෙනම වෙෂයාගේ යහළුවෝ දෙදෙනෙක්මවෙති. ඊෂ්‍යාව උපදනාකල්හිද වෙෂය සමඟම උපදී. මාත්ෂර්යය උපදනා කල්හිද වෙෂය සමගම උපදී. එහෙයින් මේ දෙදෙන වෙෂයාගේ යහලුවන්මෙන් දතයුතුයි.

කුක්කුච්චය තෙමේ පසුගිය කාලයෙහි රුස්කළාවූ කායාදී දුශ්චරිතයන්ද පසුගියකාලයෙහි රුස්නොකළාවූ දානාදී කුශල කර්මයන්ද සාලපණාකරමින් නැවත නැවත පසුතැවීම ලක්ෂණකොට ඇත්තේසි. ඒ කෙසේයත්? ළදරු කාලයෙහි වැදි කෙවුල් කර්මාන්තයෙන් හෝ සොරකම්කිරීම් බොරුසාක්ෂිකීම් ආදියෙන් හෝ ජීවත්වී වයස්ගතවූකල්හි සත්පුරුෂවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදිවූ පණ්ඩිතයන් හා එක්ව ඒ පාපක්‍රියාවන් අත්හැර රත්නත්‍රයෙහි සරණගොස් ධර්මය අසන්නාවූකල්හි ඒ දුශ්චරිතයෙහි යෙදුනාවූ පුරුෂ තෙමේ අහෝ! මාගේ මරණින් මත්තෙහි අසවල් අසවල් අපායෙහි ඉපිද මෙබඳු මෙබඳු දුක් අනුභවකරන්නටවේයයි පසුතැවෙන්නේසි. එසේම දානාදී පින්කම් කළාවූ සත්වයෝ මරණින් මතු අසවල් අසවල් සුගතියෙහි ඉපිද මෙසේ මෙසේ දිව්‍යශ්‍රීසම්පත් වළඳන්නාහුයයි ධර්මදේශනාකාලයෙහි ඇසීමෙන් ඒ පාපකාරී වැදි කෙවුල් කර්මාන්තකළාවූ පුරුෂ තෙමේ මා විසින් මෙබඳු කුශලකර්මයක් නොකෙළෙම්යි සිතා පසුතැවෙන්නේවෙයි. මෙසේ අකුශල කර්මයන් සඳහාද කුශල කර්මයන් සඳහාද පසුතැවීම කුක්කුච්චනම්වෙයි. නොකරනලද්දවූ සුචරිත කර්මයන් අරභයා පසුතැවෙන්නාවූ අතික් පුද්ගලයෙක්ද මහධනසම්පත් ඇත්තාවූ කුලයෙහි ඉපිද තරුණවූ කාලයෙහි ඒ ධනය විසඳා කාමමිථ්‍යාචාර සුරාපානාදී

නොයෙක් පවිරුස්කොට වෘද්ධිභාවයට පැමිණිකල්හි ඒ සම්පත් විනාශවීගියකල්හි දානාදී පින්කම්කිරීමට සිත උපන්නේ නමුදු තමා සන්තකවූ ධනයනැති බැවින් පසුතැවීමට පැමිණේ. මේ කුක්කුච්ච තෙමේ ඒකාන්තයෙන් අතීතකාලයම අරමුණු කෙරෙයි. ප්‍රත්‍යුත්පන්න අනාගත කාලයන් අරමුණුනොකරයි. නොහොත් කුක්කුච්ච තෙමේ ස්වාමියා පිළිබඳව පවත්නාවූ දාසයෙකුට බඳු උපමාවෙයි. ඒ දාස තෙමේ තමාගේ කැමැත්තක් නොකොට හැකිවෙයි. ස්වාමියා විසින් මේ දේකරව මේ දේ නොකරවයි ආඥා දුන්කල්හිම ඒ කෘත්‍යය කට හැකිවෙයි. එපරිද්දෙන්ම මේකුක්කුච්ච චෛතසික තෙමේ අතිශයින් බලවත්වූ කල්හි ඒ කුක්කුච්ච සහිත පුද්ගල තෙමේ තමාගේ කල්පණාවෙන්ම සුචරිත ධර්මයෙහි නොහැසිරිය හැකිවෙයි. බුද්ධප්‍රත්‍යෙක බුද්ධආර්යශ්‍රාවකාදී කල්‍යාණ මිත්‍රයන් ඇතිකල්හිම කුශලක්‍රියාවෙහි හැසිරියයුතුවෙයි. කුක්කුච්ච තෙමේ සන්හුන් පැවතුම් ඇතිවෙයි. එහෙයින් මේ කුක්කුච්ච තෙමේ ස්වාමියා පිළිබඳවූ සන්සුන් දාසයෙකුට බඳුවූ උපමා ඇතිවෙයි.

ථීන තෙමේ තමා හා පවත්නාවූ චිත්තය හැකිලවීම ස්වභාවකොට ඇත්තේවෙයි. මිද්ධචෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වේදනාසඤ්ඤාසංස්කාර යන ස්කන්ධත්‍රය හකුලුවන ස්වභාව ලක්ෂණකොට ඇත්තේවෙයි. එහෙයින් මේ ථීනමිද්ධ දෙදෙන ගින්නට බඳු උපමා ඇතිවෙත්. චිත්ත චෛතසිකයෝ කුමු කුකුළුපක්ෂපත්‍රයකට බඳු උපමා ඇතිවෙත්. යම්සේ ගින්නටපානාලද කුකුළුපක්ෂපත්‍රය හැකිලියේද එපරිද්දෙන්ම ථීනමිද්ධදෙන හා සමග යෙදුනාවූ චිත්තචෛතසිකවය කුකුළුපක්ෂපත්‍රයකට බඳුවෙයි. මේ ථීනමිද්ධයන ධර්මයෝ දෙදෙන ඒකාන්ත නිත්‍ය ද්වන්ද්ව සමාසයෙන් සියලු දේශනාපාළියෙහි කුමක්හෙයින් දක්නාලැබෙත්ද යත්? මේ ධර්මදෙදෙනාගේ කෘත්‍යය හා ප්‍රතිපක්ෂ ධර්මයෝ සමාන බැවින් නිරන්තරයෙන්ම ද්වන්ද්වසමාසවශයෙන් පවතිත්. මේ ථීනමිද්ධ දෙදෙනාගේ කෘත්‍යය චිත්තචෛතසිකයන්ගේ සැඟවෙනබවයි. මේ ධර්මදෙදෙනාට ප්‍රතිපක්ෂ ධර්මය වීර්‍ය චෛතසිකයයි. මෙසේ කෘත්‍යය හා ප්‍රතිපක්ෂධර්මයන්ද සමාන බැවින් ථීනමිද්ධ නීවරණ නාමයෙන් සියලු දේශනාපාළියෙහි නිත්‍ය ද්වන්ද්වසමාසවශයෙන් වදාරණලද්දේය මේ ධර්මදෙදෙනා අතුරෙන් මිද්ධයවනාහි නාමමිද්ධය රූපමිද්ධයයි දෙයාකාරවෙයි. ඔවුන් දෙදෙනා අතුරෙන් රූපමිද්ධය අකුශල ධර්මයන්කෙරෙහි සංග්‍රහනොවෙයි. දවල් දවස නොයෙක් කටයුතු කර්මාන්තකිරීමෙන් විඩාවට පත්වූ රූපස්කන්ධය දවල් දවස

සූර්‍ය්‍යතාපයෙන් තැවුනාවූ මහනෙල් උපුල් ආදීවූ පුෂ්පයන් රාත්‍රි දවස හැකිලී පවතින්නාක්මෙන් මනුෂ්‍යයාගේ රූපස්කන්ධයද රාත්‍රි දවස හැකිලීමට පැමිණෙයි. ඊට රූපමිද්ධය නොහොත් නිද්‍රාවයයි ව්‍යවහාරකෙරේ. ඒ රූපමිද්ධ වාචකවූ මිද්ධශබ්දය පීනශබ්දය හා කිසිකලෙකත් සමාසනොවී "සෙය්‍යසුඛං මිද්ධසුඛං" යනාදියෙහිමෙන් ඒ මිද්ධශබ්දය හුදකලාව පවත්නේයි. එතකුදුවුවත් අකුශල ධර්මයන් කෙරෙහි ඇතුලත් මිද්ධය හෙතුකොටගෙණ රූපස්කන්ධයෙහි හටගන්නාවූ නිද්‍රාවක්ද ඇත්තේයි. ඒකෙසේ හටගන්නේදත්? පීනමිද්ධනීවරණයෙන් යුක්තවූ සසංඛාරික අකුශල පඤ්චකය නිරන්තරයෙන් නැවත නැවත උපදනාකල්හි නාමමිද්ධ සඞ්ඛ්‍යාතවූ වෙදනාදීවූ ස්කන්ධත්‍රය පිළිබඳවූ අලසභාවය නොහොත් සසංඛාරික අකුශල පඤ්චකය හා සමග උපදනා චිත්තජ රූපධර්මයන් ශරීරයෙහි පැතිරයාමෙන් රූපස්කන්ධයද නිද්‍රාවට පැමිණෙයි. ඒ නිද්‍රාවට හෙතුව පීනමිද්ධ නීවරණය බැවින් "පචලායිකානිද්දා පච්චුපට්ඨානං" යනු අට්ඨසාලිනී අටුවායෙහි දක්වනලදී. එතකුදුවුවත් මේ රූපනිද්‍රාව අකුශල ධර්මයන්කෙරෙහි ඇතුලත්නොවේ. මේ දෙයාකාරවූ නිද්‍රාවම හෙවත් රූපධර්මයන්ගේ දෙහෙසවී හැකිලීමෙන් වන්නාවූ නිද්‍රාවය, සසංඛාරික අකුශල පඤ්චකයෙන්වන්නාවූ නිද්‍රාවය යනමේ නිද්‍රා දෙකම පෘථග්ජනයන්ට හා ශෛක්‍ෂ්‍යයන්ට ලැබෙත්. රහතුන්ටවන්නාවූ නිද්‍රාව දවල් දවස සූර්‍ය්‍යතාපයෙන් මිරිකී රාත්‍රි දවස හැකිලෙන්නාවූ පද්මයක්මෙන් දවල් දවස පිඩු සිඟීමාදියෙන් මිරිකුණාවූ රූපස්කන්ධය රාත්‍රි දවස හැකිලීම්වශයෙන් රහතුන්ට නිද්‍රාව පැමිණේ. විචිකිච්ඡා තොමෝ රූපාදී අරමුණු නිශ්චයකොට නොගතහැකිබව ලක්‍ෂණකොට ඇත්තීය. ඊට උපමා කවරයත්? විචිකිච්ඡාව වනාහි දෙමංසන්ධියකට බඳු උපමා ඇතිවෙයි. කිසිකලෙක ඒ මාර්ගයෙහි නොගිය ඪීරූ පුරුෂයෙක් තෙමේ දෙමංසන්ධියට පැමිණිකල්හි මේමාර්ගයෙන් යෙම්දෝ අනික් මාර්ගයෙන් යෙම්දෝහෝයි යායුතුමාර්ගය නිශ්චයකොට නොගතහැකිවෙයි. තවද විචිකිච්ඡා තොමෝ සුසානභූමියෙහි දෙදත තවාගෙණ උඩුබැලිව සයනයකරන්නාවූ පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. ඒ පුරුෂ තෙමේ රාත්‍රිභාගයෙහි නින්දෙන් පිබිද බැලූකල්හි තමාගේ දෙදනම යකුන්දෙන්නෙකැයි සිතා භයපත්වන්නේයි. එපරිද්දෙන්ම විචිකිච්ඡා සම්ප්‍රයුක්තවූ චිත්තය නිරන්තරයෙන් පවත්නා පුද්ගල තෙමේ අකුශල් නොවන්නාවූ ක්‍රියාවෙහි අකුශල්යයි භයවෙයි. කුශල්නොවන්නාවූ ක්‍රියායෙහි කුශල්යයි වරදවා පිළි-

පදියි. එබැවින් විචිකිච්ඡා චෛතසික තෙමේ ෂොඩශවිධකාංශායෙහි යෙදී පමණක් නාහෙයින් සොළොස් ප්‍රකාරඇත්තේයි. මේ විචිකිච්ඡාසම්ප්‍රයුක්තවූ චිත්තය මහාසාවද්‍ය බැවින් සෝවාන් මගින් ප්‍රහාතව්‍යවෙයි. එහෙයින් මිථ්‍යාදෘෂ්ටියට බඳු මහාසාවද්‍ය අකුශල ධර්මයක්බව දතයුත්තේයි. තුදුස් අකුශල චෛතසිකයන් අතුරෙන් උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන අකුශල චෛතසිකයෝ තුන්දෙන බොහෝසෙයින් සමාන ස්වභාව ඇත්තාහු වෙත්. මේතුදුස් අකුශල චෛතසිකයන්ගේ සංක්‍ෂෙප විභාගයයි.

තුදුස් අකුශල චෛතසිකයන්ට අනතුරුව පස්විසි ශොභන චෛතසිකයන්ගේ ලක්‍ෂණ දක්වනුලැබේ ඔවුන් අතුරෙන් ශ්‍රද්ධාචෛතසිකතෙමේ බුද්ධාදී ඉෂ්ටාලම්බණයෙහි තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන් පැහැදවීම ලක්‍ෂණකොට ඇත්තේයි. මේ ශ්‍රද්ධාව චක්‍රවර්ති රජහුගේ සප්තරත්නයන් අතුරෙන් මාණික්‍ය රත්නයට බඳු උපමා ඇතිවෙයි. සක්විතිවන පුරන්නාවූ රජුන්ට වෙපුල්ලපර්වතය යටභාගයෙහි දහසක් කුම්භාණ්ඩයන් විසින් ආරක්‍ෂාකරනලද්දාවූ මාණික්‍ය රත්නය අහසින් අවුත් රජහුගේ අතෙහි පිහිටයි. ඒ රජුන් මරණයෙන් පසු නැවතත් ඒ මාණික්‍ය රත්නය වෙපුල්ලපර්වතය යටටම පැමිණේයි. එහෙයින් මේ මාණික්‍ය රත්නය සක්විති රජුන් හැර අනිකෙකුට නොලැබෙන්නාවූ උතුම්වූ රත්නයකි. සක්විති රජතෙමේ සමහර කාලෙක්හි ජනපදචාරිකාව පිණිස සිව්රඟසෙන් පිරිවරායන්නාවූකල්හි ඒ මාර්ගයෙහි සමහවූ කුඩා ගංගාවකට බැස සිව්රඟ සෙනග එතරවී සක්විතිරජහට පැන්පවස් ඇතිකල්හි ඒකුඩා ගංගාවෙහි බොරවූ ජලය ස්වර්ණ භාජනයෙන් ගෙණවුත් රජුට පිළිගන්වයි. ඉක්බිති සක්විති රජහුගේ අඬපැලඳී ඒමාණික්‍යරත්නය බඳනාලද පෙහෙරස්මුදුව ගලවා ඒපැන් බඳුනෙහි දමනවා හා සමගම සියලු මඩබොරයට පත්ව ජලය ප්‍රසන්නවීයෙයි. එපරිද්දෙන්ම රාග ද්වෙෂ මොහාදී මඩබොර හෙතුකොටගෙණ සැලැත්වූ ජලයක් මෙන් පවත්නාවූ චිත්තයෙහි ශ්‍රද්ධාචෛතසික නැමති මාණික්‍ය රත්නය දමූකල්හි ඒක්ලේශ නැමති මඩබොරයට පත්වී චිත්තය ප්‍රසන්නභාවයට පැමිණේයි. එහෙයින් ශ්‍රද්ධාචෛතසිකය මාණික්‍ය රත්නයක්මෙන්ද, ලොභාදී පාපචෛතසිකයන් මඩබොරමෙන්ද, චිත්තයජලයමෙන්ද, උපමා උපමෙය සම්බන්ධකොට අර්ථ දතයුතුයි.

ස්මෘති චෛතසික තෙමේ යම් සිතක යෙදුනේද ඒසිත හා එක්ව යෙදුනාවූ ධර්මයන්ටද බුද්ධාදි රත්නත්‍රය ගුණසමූහය

හා නාමරූපධර්මයන්ගේ අනිත්‍යාදී ස්වභාවයද සිහිකරවීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ සමෘති තොමෝ සක්විතිරජහුගේ පරිනායක රත්නය නොහොත් භාණ්ඩාගාරික අමාත්‍යයාට බඳු වෙයි. සක්විතිරජහුගේ භාණ්ඩාගාරිකතෙමේ රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රන්රුවන් මුතු මැණික් ආදී වස්තූන්ගේ ලේඛණය හා ඒ ඒ රාජාමාත්‍යාදීන්ට දියයුතු වැටුප් ආදිය ඒ අමාත්‍යයා ප්‍රවේසම්කරන්නේය. සක්විතිරජතෙමේ පඤ්චකාමයෙන් ප්‍රමාදවීමෙන් තමාගේ භාණ්ඩාගාරයෙහි ඇත්තාවූ ධනරාශියෙහිද අමාත්‍යාදීන්ට දියයුතු වැටුප් ආදියෙහිද මුළාවෙයි. ඉක්බිති ඒ භාණ්ඩාගාරික අමාත්‍යතෙමේ සක්විතිරජහුගේ විවේකකාලයබලා ඒ ගණන් පොත් ආදිය ගෙණගොස් නුඹවහන්සේගේ භාණ්ඩාගාරයෙහි මෙතෙක් වස්තු ඇත්තේය. මේ මේ අමාත්‍යාදීන්ට වැටුප්දියයුතුය. මෙබඳු මෙබඳු කුශලකර්මකට යුතුය යනාදීන් ඒ ගණන් ලේඛණය කියවූකල්හි සක්විතිරජතෙමේ මාගේ ධනය මෙපමණ ඇත්තේය. මාවිසින් මෙතෙක් කුශලකර්මකරණලද්දේය. අමාත්‍යාදීන්ට මෙතෙක් මෙතෙක් වැටුප්දියයුතුවන්නේයයි සිහිඑලවා සතුටුවන්නේයි. භාණ්ඩාගාරික අමාත්‍ය තෙමේ එතැනින් නික්ම ගියකල්හි නැවතත් සක්විති රජහුගේ පඤ්චකාමානුභවය කාරණකොටගෙණ ඒ අමාත්‍යයා විසින් දක්වනලද සියල්ල මතකනැතිවෙයි. නැවත නැවතත් ඒ අමාත්‍ය තෙමේ අවුත්කීකල්හි සිහිඑලවයි. එපරිද්දෙන්ම මේ සත්වතෙමේ රූපාදී පඤ්චකාමයෙහි ඇලීම හෙතුකොටගෙණ ලෝභ ද්වේෂ මෝහයන්ගෙන් මුවහවනලද සිත්සතන්ඇත්තේ තමා විසින් රැස්කළ විරූ කුශලකර්මාදියෙහි මුළාවෙයි. නාමරූපධර්මයෙහි ඇත්තාවූ අනිත්‍යාදිලක්ෂණය මුවහවෙයි. ඉක්බිති සමෘති චෛතසික නැමති භාණ්ඩාගාරික තෙමේ ඉදිරියට පැමිණිකල්හි ඒ ධර්මයන් සිහිපත්වෙයි. එහෙයින් මේ සත්ව සන්තානයෙහි ඇත්තාවූ ලෝභ ද්වේෂ මෝහයන්ගෙන් මුවහවීම චක්‍රවර්ති රජහුගේ සම්පත්විඳීම හෙතුකොටගෙණ තමාගේ ධනසම්පත් හා කටයුතු රාජකෘත්‍යය මුළාවීමද භාණ්ඩාගාරික අමාත්‍යයාගේ ගණන් පොත් කියවීමක්මෙන් සමෘති චෛතසිකයාගේ එළඹසිටීමද ඒ අමාත්‍ය තෙමේ බැහැරගියකල්හි සක්විතිරජහුගේ මුළාවීමක්මෙන් සමෘති චෛතසිකය පහවගියකල්හි ලෝභ ද්වේෂ මෝහයන්ගේ පැතිරයාමද උපමා උපමෙය සම්බන්ධයෙන් දතයුත්තේයි. තවද සමෘති චෛතසිකතෙමේ ඒ ඒ අරමුණු මුළානොවන පිණිස සවිරවශයෙන් පවත්වන හෙයින් මේ සමෘති චෛතසිකය ශිලාලේඛණස්ථම්භයකට බඳු

උපමා ඇතිවෙයි. ශිලාලෙඛණයෙහි ආරොපණයකළාවූ යම් කාරණයක් නොනසින්නාක්මෙන්ම සමෘති චෛතසිකය සථිර වශයෙන් පුද්ගලයාහට ලදරු කාලයෙහි ඉගෙණගන්නාලද්දාවූ ශිල්පශාස්ත්‍රාදීහු මුළානොවී පවතිත්. ඒ සමෘති චෛතසිකය පචමධ්‍යානයෙහි ආරොපණයකොට වැඩූකල්හි අතීතජාතියෙහි පැවති අරමුණු පවා සිහිකළහැකිවෙයි. බුඩප්‍රත්‍යෙක බුඩආයර්‍ය ශ්‍රාවකයන්ගේ පෙර විසූ කඳපිළිවෙළ සිහිකරන්නාවූ සිහියද අතිශයින් උත්කෘෂ්ටභාවයට පැමිණියාවූ සමෘති චෛතසික යයි. තවද මේ සමෘති චෛතසිකය වනාහි දොරටුසයක් ඇත්තාවූ ගෘහයක දොරටු පාලයෙකුට බඳු උපමා ඇතිවෙයි. දොරටු සයක් ඇත්තාවූ ගෘහය රක්නාවූ දොරටු පාලතෙමේ ඒ දොරටු සයෙන්ම සොර සතුරන්ට ඇතුල්වියනොදී ආරක්‍ෂාකරන්නාක් මෙන්ම චක්‍ෂුරාදී ෂඩ්වාරයකින් යුක්තවූ මේ ආත්මභාව නැමති ගෘහයට පාප ධර්ම නැමති සොරුන් වැද්දනොදී ආරක්‍ෂාකරන් නාවූ දොරටු පාලකානම් මෙම සමෘතිචෛතසිකයයි.

හිරිචෛතසික තෙමේ කායදුශ්චරිතාදියෙන් ලජ්ජාවීම ලක්‍ෂණකොට ඇත්තීය. ඔත්තප්ප චෛතසික තෙමේ ඒ කාය දුශ්චරිතාදියට ත්‍රාසනවීම ලක්‍ෂණකොට ඇත්තෝයි. හිරි තොමෝ අධ්‍යාත්මය අපෙක්‍ෂාකොට ලජ්ජාවීම්වශයෙන් අකුශලයෙන් වලක්නේයි. ඔත්තප්ප තෙමේ බාහිරය අපෙක්‍ෂාකොට සතර අපායකට භයවීම්වශයෙන් අකුශලයෙන් වලක්නේයි. හිරිය වනාහි ගෞරවය පෙරටුකොට ඇතිබව ලක්‍ෂණකොට ඇත් තීය ඔත්තප්පතෙමේ වරදට හා භයට ත්‍රාසනවීම ලක්‍ෂණකොට ඇත්තේයි. හිරිතොමෝ ආත්මගෞරවය සඳහා පාපයෙන්වල ක්නේයි. ඔත්තප්ප තෙමේ ලොකගෞරවය සඳහා අකුශලයෙන් වලක්නේයි. හිරිතොමෝ අශුචියෙන් වැකුනාවූ සිහිල් අයස්ක ඛණ්ඩයකට බඳුවූ උපමා ඇතිවෙයි. ඒ සිහිල් අයස්කඛණ්ඩයවනාහි සිහිල්වූයේ නමුදු තමාගේ අත්පාදාදියෙහි අශුචිවැකේයයි යන භයින් නොඇල්විය හැකිවෙයි. ඔත්තප්ප තෙමේ ගිනියෙන් දිලියෙන්නාවූ අයස්කඛණ්ඩයකට බඳු උපමා ඇතිවෙයි ඒඅයස්කඛණ්ඩය වනාහි අතින් ඇල්වීමෙන් අශුචිනොවැකෙන්නේ නමුදු අතදවන්නේය යනභයින් අතින් නොඇල්විය හැකිවෙයි. තවද හිරි තොමෝ උත්තම කුලකාන්තාවකට බඳු උපමා ඇතිවෙයි. ඒකුල කාන්තාවකරා පරපුරුෂයෙක් පැමිණිකල්හි මම උතුම් කුල කාන්තාවක්වෙමි. මොහු නීච මනුෂ්‍යයෙකි. එසේහෙයින්නොව මාගේ මාතෘ පිතෘ ආදී සත්මුතු පරම්පරාවෙන්ම උත්තම සම්මතව පැවතඑන්නේය. මාගේ පරම්පරාවෙහි කිසි සත්‍රියෙක් පරපුරුෂ

සේවනය නොකළවිරූය. මා විසින් දූත් එබඳු පාපයක් කෙළේවී නම් සියලු ලෝවැසි තෙමේ මට ගරහන්නේය. මාගේ උතුම්වූ කුලයද කෙලෙසෙන්නේයයි යනාදීන් තමාගේ කුලගොත්‍රාදිය සලකා පාපයෙන් වළකින්නාක්මෙන් හිරිචෛතසිකය කාරණකොටගෙණ ආත්මගෞරවය අපෙක්ෂාකොට පාපයෙන් වළක්නේයි. ඔත්තප්පතෙමේ සිල්රක්ෂාකරන්නාවූ වෙසඟනකට බඳු උපමා ඇතිවෙයි. සිල්රක්ෂාකරන්නාවූ වෙසඟන කරා යම් පුරුෂයෙක් පැමිණිකල්හී තමාගේ ආත්මගෞරවය අපෙක්ෂානොකාරන්නේ නමුදු සිල් හෙදයට භයින් දුශ්චරිතයෙන් වලක්නේයි. තවද ඇතැම් වෛශ්‍යා ස්ත්‍රීහු යම් පුරුෂයෙකුගේ පණයම්ගත් කල්හී ඒ පණයම්ගත් පුරුෂයා හැර අනික් පුරුෂයෙක් පිළිනොගණිත්. එපරිද්දෙන්ම ඔත්තප්පතෙමේ කායදුශ්චරිතාදියට භයනොවන්නේද අපාය භය හෙතුකොටගෙණ පාපයෙන් වලක්නේයි. හිරි චෛතසිකය වනාහි සතරකාරණයක් කාරණකොටගෙණ උපදනේයි. ඒ සතරකාරණයනම් ගොත්‍රය, වයසය, සූරභාවය, බහුශ්‍රැතභාවය, යනසතරයි. ඔත්තප්පයද සතරකාරණයකින් උපදී. ඒකවර සතරෙක්ද යත්? ශීලය, දෙශය, ප්‍රඥාවය, භික්ෂුභාවය යන සතරවෙත්. හිරියෙහි සතර කාරණයන් අතුරෙන් උතුම්වූ කුලගොත්‍රයෙහි උපන් මනුෂ්‍ය තෙමේ වැදි කෙවුල් කර්මාන්තාදියකිරීම හෝ සුරාපානාදී දුශ්චරිතකිරීමක් හෝ කටයුතු තැනක් පැමිණිකල්හි මම වනාහි මෙබඳු උතුම් ගොත්‍රයක උපන්නෙක්වෙමි. මෙවැනි කෙවුල් ආදී කර්මාන්ත නීචවූ මනුෂ්‍යයන්ට අයත් කර්මාන්තවෙති. එහෙයින් මාගේ ගොත්‍රයට මෙබඳුවූ නීචවූ පාපධර්ම නොකටයුතුයයි සිතා පාපයෙන් වලක්නේයි. එසේම සුදුසු වයසට පැමිණි පුරුෂතෙමේ මේ සත්වඝාතන සුරාපානාදිය මාගේ වයසට සුදුසුනොවෙයි සිතා දුශ්චරිතයෙන් වලක්නේයි. අනික් සත්වයෙක් තමාගේ සූරවීරභාවයට මෙබඳු දුශ්චරිත නොකටයුතුය ගොවිකම් වෙළඳාම් ආදී යහපත් රක්ෂාවකින් ධනය උපයන්ට නොහැකි අලසයන්ගේ ක්‍රියාවකැයි සිතා දුශ්චරිතයෙන් වලකී. අනික් පුරුෂයෙක්ද දුශ්චරිතයක්කිරීමට ප්‍රස්තාව පැමිණිකල්හී මාගේ මාතෘ පිතෘන් විසින් මේ මේ ශිල්පශාස්ත්‍ර උගන්වා මා බහුශ්‍රැතභාවයට පමුණුවනලද්දේයි. මෙබඳු අකුශල ධර්ම වනාහි කිසි ශිල්පශාස්ත්‍රයක් නූගත්තාවූ අඥාන මනුෂ්‍යයන්ට අයිති ක්‍රියාවෙයි. යනාදීන් සිතා දුශ්චරිතයෙන් වලක්නේයි. මෙසේ ගොත්‍ර වයස් සූරභාව බහුශ්‍රැතභාවය යන කාරණා සතර හෙතුකොටගෙණ දුශ්චරිතයෙන් වලක්නේයි, ඔත්තප්පයාගේ සතරකාර

ණයතම්:-යම්කිසිවෙක් දුශ්චරිතයක්කිරීමට ප්‍රස්තාව පැමිණි කල්හි ලොකයෙහි ශීලවන්තවූ ශ්‍රමණ බ්‍රාහ්මණදිව්‍යබ්‍රහ්මාදීහුඑකාන්තයෙන් මට නින්දාකරන්නාහුයයි සිතා හයින්වලක්නේයි. "දෙශය" යනු රත්නත්‍රයට ගෞරවකරන්නාවූ මනුෂ්‍යයන් වාසය කරන්නාවූ ප්‍රතිරූපදෙශයෙහි මාවිසින් දුශ්චරිතය රැස්කෙළේ වීනම් නුසුදුසුයයි සිතා දෙශයට භයින් දුශ්චරිතයෙන් වලකී. ප්‍රඥාව හෙතුකොටගෙණ කෙසේ දුශ්චරිතයෙක්වලක්නේද යත්? පණ්ඩිත ජනයන් වාසයකරන්නාවූ යම් ප්‍රදෙශයෙක්හි වසන්නාවූ පුද්ගලතෙමේ තමා විසින් රැස්කරනලද්දවූ දුශ්චරිතයන් අසවල් අසවල් පණ්ඩිතයන් විසින් නින්දාකරනුලැබේයයි සිතා ප්‍රඥාවන්තයින්ට භයින් දුශ්චරිතයෙන්වලකී. භික්ෂුභාවයට පැමිණියේ යම් දුශ්චරිතයක්කිරීමට ප්‍රස්තාව පැමිණිකල්හි මාගේ භික්ෂුභාවයට නුසුදුසුයයි සිතා අකුශලයෙක් වලක්නේයි මේ ඔත්තප්පයාගේ හෙතුසතරයි. මේ හිරිඔත්තප්ප දෙදෙන වනාහි දුශ්චරිතයන් රැස්කිරීමෙහි ලජ්ජාභය උපදවන හෙයින් මූලභූතවශයෙන් පවත්නේයි. එහෙයින් මේ හිරිඔත්තප්ප දෙදෙන දෙවධර්මයයි කියාද ලොකපාලක දුකයයි කියාද ව්‍යවහාරකෙරෙත්.

අලොභ චෛතසික තෙමේ රූපාදී අරමුණෙහි නොඇලීම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවර යත්? ගෙවන ලද ආශ්‍රව ඇත්තාවූ මහරහත්කෙනෙකුට බඳු උපමා ඇත්තේවෙයි. ඒ අලොභය මහරහතුන්ට කෙසේ උපමාවන්නේදයත්? මහරහතුන්වහන්සේ වනාහි යම් උපාසකයෙකුගේ විහාරයෙහි වෙසෙමින් ඔහුගේ සිව්පසය අනුභවකොට ඒ විහාරයෙන් නික්මයන්නාවූකල්හි කුලයාකෙරෙහිද ගණයාකෙරෙහිද නොඇලීපවත්නාහෙයින් තමාගේ ප්‍රත්‍යදායකයාට පවා නොදන්වාම විහාරයෙන් නික්මයෙයි. එබඳු නොඇලෙන්නාවූ ස්වභාව මේ අලොභයෙහි විද්‍යමානහෙයින් මහරහතුන්ට උපමා කෙරෙයි. නොහොත් පද්මපත්‍රයෙහි ජලය දමූකල්හි එක්දිය බින්දුව කුඩු පත්‍රයෙහි නොඇලී පෙරලීවැටෙයි.එපරිද්දෙන් අලොභචෛතසික තෙමේ රූපාදී අරමුණෙහි නොඇලෙන්නේයි. නොහොත් අසුචිවළෙක්හි වැටුනාවූ පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. අසුචිවළෙහි වැටුනාවූ පුරුෂ තෙමේ තමාගේ ශරීරයෙහි වැකුනාවූ අශුචිය වහාම පිරිසිදුකරගැණීමට උත්සාහ කෙරෙයි. එපරිද්දෙන්ම කාමලොක නැමති අශුචි වළෙහි වැටුනාවූ පුරුෂයාගේ ශරීරයෙහි තැවරුනාවූ අශුචියක් වැනිවූ මේ

පඤ්චකාමසම්පත්තිය වහාම දනමුඛයෙහි විසඳීමට මේ අලොභ චෛතසිකය උත්සාහකරෙයි.

අද්වේෂ චෛතසිකය තෙමේ අරමුණෙහි රළු පරුෂ ආකාරයෙන් වරදවා නොපැවැත්ම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? වැලිකෙළියෙහි මිත්‍රවූ යම්කිසි මිත්‍රයෙක් අන් රටකට ගොස් බොහෝකලක් සිට නැවත ආකල්හි ඒ මිත්‍රයා පිළිගැණීමට වැලිකෙළියෙහි මිත්‍රවූ අනික් මිත්‍ර තෙමේ අතිශයින් සතුටුවෙයි. ආහාරපාන භොජනාදියෙන් සංග්‍රහකිරීමට අතිශයින් උත්සාහකෙරෙයි. එපරිද්දෙන් අද්වේෂ චෛතසික තෙමේ අන්රටකට ගොස් බොහෝකලක් වැස නැවත ආ මිත්‍රයාට බඳු උපමා ඇතිවෙයි. ඒ චිත්තයෙහි යෙදුනාවූ අද්වේෂ පූරුදු චිත්ත චෛතසිකාදීහු පුරාණ වැලිකෙළියෙහි මිත්‍රවූ මිත්‍රයන්ට බඳුවෙත්. තවද ගොශීර්ෂ චන්දනයකට බඳු උපමා ඇතිවෙයි. තක්කියන්නාවූ ජලයෙහි ගොශීර්ෂ චන්දනය දැමූකල්හි ඒ තක්කියන්නාවූ ජලය වහාම සිහිල්වෙයි. එපරිද්දෙන්ම දෞර්මනස් ප්‍රතිඝ නැමති ගින්නෙන් තක්කියන්නාවූ චිත්තයෙහි අද්වේෂය යෙදුනු කල්හි වහාම සීතල භාවයට පැමිණෙයි. එහෙයින් අද්වේෂචෛතසිකය ගොසීස චන්දන ඛණ්ඩයකට බඳු උපමා ඇතිවෙයි. කෙලශයන්ගෙන් තක්කියන්නාවූ චිත්තය උණුජලයකට බඳු උපමා ඇතිවෙයි. මේ අද්වේෂය ස්වභාවවශයෙන් මෛත්‍රියට සමානවෙයි. එහෙයින් මෛත්‍රිය මේ චෛතසිකයන් කෙරෙහි නොගන්නාලදී.

තත්‍රමජ්ඣත්තතා චෛතසිකය තෙමේ මැදහත් ආකාරයෙන් අරමුණුහැරගීම ලක්ෂණකොට ඇත්තීය. ඊට උපමා කවරයත්? ආජානීය ශෛන්ධවයන් දෙදෙනෙකු යොදනලද්දාවූ රථයෙහි රථාචාර්‍ය්‍යයාට බඳු උපමා ඇතිවෙයි. ආජානීය ශෛන්ධව අසුන් දෙදෙන යොදනලද රථයෙහි රථාචාර්‍ය්‍ය තෙමේ ඒ අසුන්දෙදෙනාගේ කටකලියා රැහැන් දැඩිනොකොට හෝ ලිහිල්නොකොට හෝ මැදහත් ආකාරයෙන් අල්වාගෙණ අසුන් දෙදෙනාගේ සමවූ ගමනබලාසිටින්නේවේද එපරිද්දෙන් අරමුණුකරායන්නාවූ චිත්ත චෛතසිකයන් අතුරෙන් යම්කිසි චෛතසිකයක් පසුබට වෙන්නට හෝ යම්කිසි චෛතසිකයක් ලිහිල්වෙන්නට හෝ නොදී මේ තත්‍රමජ්ඣත්තතා නැමති චෛතසික තෙමේ අරමුණ කරා ස්පර්ශාදීන්ගේ සමවූ ගමන බලාසිටින්නේවෙයි.

කායපස්සද්ධි චෛතසික තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ වෙදනා සඤ්ඤාසංඛාර යන ස්කන්ධත්‍රයාගේ කැළඹීම සන්සිඳුවන බව ලක්ෂණකොට ඇත්තේවෙයි.

**චිත්තපස්සද්ධි** චෛතසික තෙමේ චිත්තයාගේ කැළඹීම සංසිඳුවනබව ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? බලවත්වූ සූර්ය්‍යතාපයෙන් මිරිකෙමින් එන්නාවූ පුරුෂයෙක් තෙමේ මහත්වූ ඡායාවකට ප්‍රවිෂ්ටවූකල්හි ඒ ශරීර විඩාව සංසිඳීමකට බඳු උපමාඇතිවෙයි. එහෙයින් කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙදෙන මහත් ඡායාවකට පැමිණීමෙන් සිහිල්බව ලැබීමක්මෙන් චිත්ත චෛතසිකයන්ගේ සන්සිඳීම සිද්ධකෙරෙයි. උද්ධච්ච චෛතසික තෙමේ සූර්ය්‍යතාපයට බඳු උපමා ඇතිවෙයි. එහෙයින් මේ පස්සද්ධි චෛතසිකය උද්ධච්චයට ඉඳුරා ප්‍රතිපක්ෂවෙයි. මේ කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙදෙන එකාන්තවීකාමාවචර චිත්තයෙහිම කැළඹීම් සංඛ්‍යාතවූ උද්ධච්චයට අවකාශ නොදෙන්නාහුය. එතකුදුවූවත් ලෝකෝත්තර චිත්තයෙහි ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගවශයෙන් එකක්මවන්නේයි. ඉදින් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයෝ දෙදෙනකුවියයුතුනම් සත්තිස් බොධිපාක්ෂික ධර්මයන්ට එකක් අධිකවීමෙන් අටතිසක්වියයුත්තේය. කායලහුතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වේදනාදී නාමස්කන්ධයන් තුන්දෙනාගේ බරබව සංසිඳුවන්නේයි. **චිත්තලහුතා** චෛතසික තෙමේ තමා හා යෙදුනාවූ චිත්තයාගේ බරබව සංසිඳුවන්නේයි. ඊට උපමා කවර යත්? යම්කිසි බරක් ඔසවාගෙණ බොහෝ දුරක සිට අවුත් ඒ බරවහාතැබීමකට බඳු උපමා ඇතිවෙයි. එපරිද්දෙන් කායලහුතා චිත්තලහුතා දෙදෙන එක්ව මහත්වූ බරක් දෙදෙනෙක් විසින් අල්වා බහා තබන්නාක්මෙන් ථිනමිද්ධනීවරණ නැමැති බර බහා තබන්නේවෙයි. එහෙයින් මිප්‍රකාරවූ ලහුතා චෛතසිකයෝ දෙදෙන ථිනමිද්ධ දෙදෙනාගේ සතුරෝවෙත්. කායමුදුතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වේදනා නාමස්කන්ධයන් තුන්දෙනාගේ සියුම්බව මොළොක්බව ඇතිකෙරෙයි. චිත්ත මුදුතා චෛතසිකය තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ කර්කශබව සංසිඳුවා මෘදු මොළොක්බවට පමුණුවන්නේයි. ඊට උපමා කවර යත්? යම්කිසි ගව එළු ආදීවූ චර්මයක් මෙහිනා කම් ආදිවූ අභිමත වස්තුවක් ඉදිකරගැණීමට නොහැකිවන්නේ අතිශයින් කර්කශව පවත්නාකල්හි සම්මඩින්නාවූ පුරුෂයන් දෙදෙනෙකු කැඳවා වතුර තෙල් ආදීවූ ද්‍රව්‍ය බහමින් අතින් පයින් මැඩ ඒ චර්මය මොළොක්කෙරෙත්ද? එපරිද්දෙන් මේ කාය ලහුතා චිත්තලහුතා දෙදෙන එකතුව මිථ්‍යාදෘෂ්ටි නැමති කර්කශභාවය පහකොට අරමුණුගැණීමෙහි මෘදු මොළොක්බවට පමුණුවත්. එහෙසින් කාය මුදුතා චිත්ත මුදුතා දෙදෙන මිථ්‍යාදෘෂ්ටියට විරුද්ධවෙත්.

කායකම්මඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වේදනාදී නාමස්කන්ධයන්ගේ ගිලන්කම සිංසිඳුවා අරමුණුගැණීමට සුදුසුබවකෙරෙයි.

චිත්තකම්මඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ ගිලන්කම සන්සිඳුවා අරමුණුගැණීමෙහි යොග්‍යබව සිඩකෙරෙයි. ඊට උපමා කවරයත්? යම්සේ තඹ පිත්තලාදී ලොහොයෙන් මිශ්‍රවූ සවර්ණය තැලීමට හෝ මැකීමට නුසුදුසුවේද එබැවින් ඒ රත්රන මිශ්‍ර ලොහයන් දැඩිවෙනතාක් නැවත නැවත පිඹගත්කල්හි ඒ සවර්ණය අභිමත කුණ්ඩලාභරණ අඞ්ගුලීයාදී කැමති කැමති ආභරණයක් ඉදිකළහැකිංවිද තැලීම් මැකීම් ආදීවූ සියල්ල ඉවසන්නේවේද, එපරිද්දෙන්ම මේ චිත්තය යෙදුනාවූ නීවරණාදීවූ සොළශ නැමති තඹ ලොහො ආදිය මේ කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා දෙදෙන නැමති ගින්නෙන් දවාගත්කල්හි දානාදී පුණ්‍යක්‍රියා නැමති ආභරණ විශෙෂයන් ශුඩකිරීමට චිත්තය නැමති සවර්ණය යොග්‍යවන්නේයි. එහෙයින් මේ කම්මඤ්ඤතා චෛතසික දෙදෙන නීවරණාදී සියලු කෙලෙසුන්ට සතුරුවන්නාහුය. කායපාගුඤ්ඤතා චෛතසික තෙමේ වේදනාදී සකන්ධත්‍රයාගේ මහත්වූ අනතුරායෙන් මිදවීම ලක්ෂණකොට ඇත්තේයි. චිත්ත පාගුඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ මහත් අනතුරායකින් මිදවීම ලක්ෂණකොට ඇත්තේයි.යම්සේ රොගාදී අනෙක ප්‍රකාර අනතුරායට පැමිණියාවූ පුරුෂයෙක් තෙමේ අනතුරායෙන් වලක්වා නිරොගිභාවයට පමුණුවාද, එපරිද්දෙන්ම මේ පාගුඤ්ඤතා චෛතසිකයෝ දෙදෙන අශ්‍රඬාවය, මුළුසසතිය, නීවරණ ධර්මයෝය, යනාදී මහත් අනතුරායන්ගෙන් වලක්වා කුශල කර්මනැමති යහපත් ක්‍රියාකිරීමෙහි පුහුණුකරන් නාහුය.

කායුජ්ජුකතා චෛතසික තෙමේ වේදනාදී සකන්ධත්‍රය සම්බන්ධවූ වඞකභාවය දුරුකිරීම ලක්ෂණකොට ඇත්තේයි. චිත්තුජ්ජුකතා චෛතසික තෙමේ චිත්තය සම්බන්ධවූ වඞකභාවය පහකිරීම ලක්ෂණකොට ඇත්තේය. ඒ වඞකභාවය යනු චන්‍ද්‍ර වඞකය, නඟල කොටිවඞකය, ගොමුත්‍රකාවඞකය, යන ත්‍රිවිධාකාරවූ වඞකයයි. මේ කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා දෙදෙනාහට උපමා කවරයත්? දුන්නෙන් විදිනා වැද්දතෙමේ ඒ තමාවිදිනා ඊය ඇදවූකල්හි අභිමත සථානයට නොවිදියහැකි බැවින් ඒ ඊය ඇදහැර අභිමත සථානයට යම්සේ විදිනේද, එපරිද්දෙන්

දෙළොස් අකුශල් සිත් නැමති වඩකයන් මේ කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා නැමති වැදිහු විසින් සෘජුකළකල්හී කාමාවචර ශොභන සිත් නැමති ඊසැරය විදියහැකිවෙයි. එහෙයින් මේ කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා දෙදෙන සියලු දෙළොස් අකුශල යන්ට ප්‍රතිවිරුඬවෙත්. අකුශල පක්‍ෂයෙහි ථිනමිඬ නීවරණ යුගලයමෙන්ම කුශල පක්‍ෂයෙහි මේ ධර්මයුගලයෝ සදෙන තම තමාගේ සතුරු ධර්මයන් සදෙන පහකරණහෙයින් විප්‍රකාරබව වදරණලද්දේයි. යම්සේ ථිනමිඬ නීවරණ සහිතවූ චිත්තයෙන් උපදවන්නාවූ චිත්තජරූපයන් පැතිරයෑමෙන් රූපස්කන්ධය තින්දට යන්නාක්මෙන්ම මේ කායපස්සඬි ආදිවූ ධර්මයුගලයෝ සදෙන සම්ප්‍රයුක්තවූ ශොභන චිත්තයන්ගෙන් හටගන්නාවූ චිත්තජ රූජයන් ශරීරයෙහි පැතිරයාම හෙතුකොටගෙණ රූප ස්කන්ධයාගේ සන්සිඳීම මොළොක්වීම ආදිවූ ස්කන්ධයෝද හට ගණිති. ඒ අර්ථය හැඟවීම පිණිසත් කායපස්සඬි යනාදීන් දෙශනාකරනලද්දේයයි දතයුතුයි. ශ්‍රද්ධාව ආදිකොට චිත්තුජ්ජුකතාව අවසන්කොට ඇත්තාවූ මේ ධර්මයන් එකුන්විසිදෙන එකුන් සැටක් ශොභන චිත්තයෙහි අනුනව එකාන්තයෙන් යෙදෙන හෙයින් ශොභණ සාධාරණ ධර්මයන්යයි කියත්.

ත්‍රිවිධ විරතීන් අතුරෙන් සම්මාවාචා විරති චෛතසික තෙමේ ආජීවහෙතු අපෙක්‍ෂානොකොට මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්පලාප සඞ්ඛ්‍යාතවූ සතරාකාර වාග්දුශ්චරිත යෙන් වැළකීම ලක්‍ෂණකොට ඇත්තේයි. සම්මාකම්මන්ත චෛතසික තෙමේ ආජීවහෙතුව අපෙක්‍ෂානොකොට පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධකාය දුශ්චරිත යෙන් වැළකීම ලක්‍ෂණකොට ඇත්තේයි. සම්මාආජීව චෛතසික තෙමේ ආජීවහෙතුව අපෙක්‍ෂාකොට සම්මාවාචාවිරති යෙන් වළක්නාවූ සතරාකාර වචීදුශ්චරිතය සම්මාකම්මන්ත විරතියෙන් වලක්නාවූ ත්‍රිවිධාකාර කායදුශ්චරිතය යන සප්ත ප්‍රකාරවූ දුශ්චරිතයන්ගෙන් වැළකීම ලක්‍ෂණකොට ඇත්තේයි. සම්මාවාචාවිරතිය හා සම්මාකම්මන්ත විරතියද යන විරතීහු දෙදෙන බහිද්ධා සන්තානය අපෙක්‍ෂාකොට අකුශල ධර්මයෙන් වළක්නාහුවෙති. සම්මාආජීව චෛතසික තෙමේ අධ්‍යාත්ම සන්තානය අපෙක්‍ෂාකොට අකුශල ධර්මයන් වලක්නේයි. මේ සම්මාවාචා සම්මාකම්මන්ත චෛතසික දෙදෙන වනාහි රාජ භයින් නොහොත් රජහු විසින් මේ මේ අපරාධයන් කළකල්හී මෙබඳු මෙබඳු දඬුවම්කරන්නෝයයි යන භයින් සොරකම්කිරී

මෙන් හා මිනිමැරීම් ආදීවූ අපරාධයෙන් වලක්නා සොරෙකුට
බඳු උපමා ඇතිවෙයි. ඒ රාජභයින් භයපත්ව සොරකම් ආදි
යෙන් වලක්නාවූ සොරතෙමේ තමාගේ අඹුදරුවන් පොෂ්‍යය
කරනු පිණිස අන් සතු රන් රුවන් මුතු මැණික් ආදී වසතුව
සොරකම්කිරීමෙහි සම්පූර්ණශක්තිය ඇත්තේ තමුදු මේ කාල
යෙහි විනිශ්චයකාර තෙමේ පලාකොල මිටක් පවා සොරකම්
කළාවූ සොරහු දිවස්හුල තිබුවන්නේයයි මාගේ ආවුදය මුවහත්
ඇත්තේ තමුදු මෙබඳු සවල්පවූ සොරකම් හෙතුකොටගෙණ
මාගේ ධාර්මිකවූ ජීවිතය විනාශවෙයි. මෙසේ ඒ සොරතෙමේ
රාජදණ්ඩනයට භයින් ඒ රාජදණ්ඩනය සංඛ්‍යාතවූ බහිඩා
සනතානය අපෙක්ෂාකිරීම්වශයෙන් සොරකමින් වලක්නාක්
මෙන් සමමාවාච සමමාකමමනත චෛතසිකයෝ දෙදෙනාද
අපායභය සඞ්ඛ්‍යාතවූ බහිඩාසනතානය අපෙක්ෂාකොට මුසා
වාදදී සතරාකාරවූ වාග්දුශ්චරිතය, පණිවා ආදී ත්‍රිවිධාකාර
කායදුශ්චරිතය යනාමේ සපතප්‍රකාර දුශ්චරිතයන්ගෙන් වලකින්
නේයි. මේසමමාවාචා සමමාකමමනත දෙදෙනාහට සාධාරණ උප
මායි.සමමා ආජීව චෛතසිකතෙමේ ශම්විෂ ඵල අනුභවකෙරෙම්
නම් මාගේ ජීවිතය විනාශවෙයි යන භයින් අඩ්‍යාත්මය අපෙ
ක්ෂාකොට විෂඵල නුබුදින්නාවූ පුරුෂයෙකුමෙන් තමාගේ ජීවි
කාවෘතති සඞ්ඛ්‍යාතවූ අඩ්‍යාත්මය අපෙක්ෂාකොට සපතප්‍රකා
රවූ කායවචී දුශ්චරිතයන්කෙරෙන් එනම්:-එකානතයෙන් අන
තුරු අත් බැව්හි සතර අපායෙහි මෙබඳු මෙබඳු දුක් ලැබෙයි.
යනාදීන් සලකා සපතප්‍රකාර දුශ්චරිතයන්ගෙන් වලක්නේයි.
සමමාආජීවයද එම සතරාකාරවූ වචිදුශ්චරිතයෙන් වලක්නේයි.
සමමාකමමනත චෛතසිකයද ත්‍රිවිධාකාර දුශ්චරිතයෙන් වලක්
නේයි. ඒ විරතීහු තුමූ කෙසේ සමානවන්නාහුද යත්? ධර්මවශ
යෙන් විශෙෂ නොවන්නාහුද යත්? සමමාවාචා විරතිතොමෝ
සතරාකාර වචිදුශ්චරිතයෙන් වලක්නාවූකල්හි ජීවිකාවෘතති
සංඛ්‍යාතවූ ආජීවහෙතුව අපෙක්ෂානොකොට අපායභය සඞ්ඛ්‍යාත
බහිඩාසනතානය අපෙක්ෂාකිරීමවන්නේයි. අකුශලකර්මයෙන්
වලක්නේයි. සමමාආජීව තෙමේද සතරාකාර වචිදුශ්චරිතයෙන්
වලක්නාකල්හි ජීවිකාවෘතති සංඛ්‍යාතවූ ආජීවහෙතු අඩ්‍යාත්
මය අපෙක්ෂාකොට අකුශලකර්මයෙන් වලක්නේයි. සමමාකමමනත
චෛතසික තෙමේ ත්‍රිවිධාකාර කායදුශ්චරිතයෙන් වලක්නා
කල්හි ජීවිකාවෘතති සංඛ්‍යාතවූ ආජීවහෙතුව අපෙක්ෂානො
කොට අපායභය සඞ්ඛ්‍යාතවූ බහිඩාසනතානයම අපෙක්ෂාකිරීම්
වශයෙන් ත්‍රිවිධාකාර දුශ්චරිතයෙන් වලක්නේයි. සමමාආජීව

චෛතසික තෙමේ ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් වළක්නාකල්හී
ජීවිකාවෘත්ති සංඛ්‍යාතවූ අධ්‍යාත්ම සන්තානය අපෙක්‍ෂාකොට
කායදුශ්චරිතයෙන් වළක්නේයි. මේ අධ්‍යාත්ම අපෙක්‍ෂාකිරීමය
නොකිරීමය බහිර්ධාසන්තානය අපෙක්‍ෂාකිරීමය නොකිරීමය
යනමේ සතරකාරණය සමානමැයි. සම්මාආජීව චෛතසිකය
කරණකොටගෙණ දුශ්චරිතයෙන් වළක්නාකල්හි පළමුකොට
අපායහා සඞ්ඛ්‍යාතවූ බහිර්ධාසන්තානයම අපෙක්‍ෂාකොළේ නමුදු
පසුභාගයෙහි අධ්‍යාත්ම සන්තානයම අපෙක්‍ෂාකරමින්පවත්
නේයි. සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන ත්‍රිවිධවිර
තීන්ගේ අපෙක්‍ෂාකිරීම හා නොකිරීමද උපමාවෙන් දක්වනු
ලැබේ. එක්තරා පුරුෂයෙක් තෙමේ අන්සතු කෙත් වතු ආදී
යක් අඳලබාගන්නා පිණිස තාවකාලිකවශයෙන් ඉල්වාගෙණ
බොහෝකලක් මුළුල්ලෙහි ශස්‍යාදියකොට මෑතභාගයෙහි ඒ
කෙත්වත් හිමියාගෙන් උදුරාගනු කැමතිව මේ කෙත්වත් ආදී
යෙහි අඳය තොපට නොදෙමියි මාගේ පියමුතුන් පරම්පරාවෙන්
හිමිව මා විසින් බුක්තිවිඳගන්න එනලද්දෙයයි කීකල්හී ඒ කෙත්
වත්හි නියම ස්වාමිතෙමේ අධිකරණ ශාලාවට පැමිණ අධිකර
ණයක්කොළේයි. ඉක්බිති ඒ වචාමෙන් අසිතිකරගණු කැමති
පුරුෂතෙමේ අහිමියන් හිමිකිරීමෙහි දක්‍ෂවූ නීතිඥයෙක් කරා
එළඹ පින්වත්නි! මට මෙබඳු අධිකරණයක්ව තිබෙයි. ඒ කෙත්
වත් ආදිය ඒකාන්තයෙන් මාසතුනොවෙයි. එතකුදුමුත් පින්
වත්නු විසින් අධිකරණශාලාවෙහි මිතති බැණ ඒ කෙත්වත්
ආදිය මට හිමිකරදෙන්නෝනම් තොපට සතුටු පඬුරු පිණිස
කහවණු පන්සියයක් දෙමියිකීකල්හී ඒනීතිඥතෙමේද ඒකාන්ත
යෙන් ඒ කෙත්වත් ආදිය තොපට හිමිනොවූයේද මාගේ දක්‍ෂ
කමින් තොපට හිමිකරදෙමියි ප්‍රතිඥාදී ඒ කහවණුපන්සියය
ඉල්වාගත්තේයි. මෑතභාගයෙහි ඒ නීතිඥයාහට මෙබඳු කල්ප
ණාවක් පහළවිය. අන්සතු යම් වස්තුවක් අහිමියකුට හිමිකර
දීම මුසාවාද අකුශල කර්මයක්යයි බුඬාදී උතුමන් විසින් පණවා
වදාරණලද්දේය. ඒ අකුශල කර්මයෙන් මරණින් මතු සතර අපා
දුක්විඳ කර්මාවශෙෂයෙන් මිනිසත්බව ලැබුයේද මුසාවාද කර්ම
යෙන් පීඩාකරණලද්දාවූ කාමාවචර කුශලකර්මයෙන් උපදින්
නාවූ මනුෂ්‍ය තෙමේ විරූපරූපයක් ඇත්තේවෙයි. වැදි කොවුල්
චණ්ඩාලාදී නීචකුලයෙහි උපදින්නේවෙයි. තමාගේ වචනය
ලෝකයා පිළිනොගන්නේවෙයි. තමාගේ දූ දරුවන් පවා වචන
යට කීකරුනොවෙයි. දුර්ගන්ධවූ මුඛයක් ඇත්තේවෙයි. දරුවන්
ලබන්නේ නමුදු පිරිමිපුතුන් නොලැබ ගාලකණ්ණිවූ දියනිවරුම

ලබන්නේවෙයි. මෙසේ බුඩාදී උතුමන් විසින් කර්මාවශෙෂයාගේ විපාක පණවා වදාරණලද්දේය. එහෙයින් මා විසින් මේ මුසාවාදය කියමියි ප්‍රතිඥාදී ගන්නාලද කහවණු පන්සියය ආපසු පෙරළාදෙමියි සිතා ඒ කහවණු පන්සියය ඔහුට නැවතදී මුසාවාදයෙන් වලක්නේවේද, මේ චිත්තයෙහි හටගන්නා විරති තොමෝ සම්මාවාචා විරතිනම්වෙයි. සම්මාආජීවය හෙතුකොට ගෙණ මුසාවාදයෙන් වැලකීම කෙසේවන්නේද යත්? ඒ නීතිඥතෙමේම අනික් පුරුෂයෙකුගෙන් බොරු කියා අනුන් සන්තක වස්තුවක් හිමිකරදෙමියි ප්‍රතිඥාදී ඔහුගෙන් කහවණු පන්සියයක් ලබාගෙණ නැවත මෙසේ කල්පනාකරන්නේවෙයි. මා විසින් බොරුකීම පිණිස ලබාගන්නාලද්දාවූ කහවණු පන් සියය බොහෝකලක් ජීවත්වීමටද නොපොහෝනේය. මේ කහවණු පන්සියයෙන් මම පමණක්නොව මාගේ අඹුදරු ආදී හුද ජීවත්වෙත්මය. එතකුදුවුවත් මේ පාපයෙන් අපාය දුක් විඳින්නාවූකල්හි තනිවම ඒ දුකට භාජනවන්නෙමියි ඒ වස්තුව අනුභවකලාවූ සියලුදෙනාම අපාය දුකට හිමිනොවෙති. එහෙයින් මම අනුන් නිසා බොරු කියා කුමට වස්තුව රැස්කෙරෙම්දැයි අනික් ධාර්මිකවූ රක්ෂාවකින් ජීවත්වෙමියි සිතා ඒ කහවණුපන්සියය වස්තු ස්වාමියාට භාරදී බොරුකීමෙන් වලක්නේවේද, මෙසේ වලකින්නාවූ පුද්ගලයාහට ආජීවහෙතුව අපෙක්ෂාකොට සම්මාආජීවයෙන් හටගන්නාවූ සම්මාවාචාවිරතිය උපදනේයි. මුසාවාද සඞ්ඛ්‍යාතවූ එකම විරමිතව්‍ය වස්තුවෙක්හි සම්මාවාචාවිරතිය හටගන්නා ක්‍රමයයි. පිසුනවාචා සංඛ්‍යාතවූ විරමිතව්‍ය වස්තුවෙහිද සම්මාවාචා විරතිය හා සම්මාආජීව විරතිය හටගන්නා ක්‍රමයද, සම්ඵප්පලාප සඞ්ඛ්‍යාතවූ විරමිතව්‍ය වස්තුවෙහිද සම්මාවාචා විරතිය හා සම්මාආජීව විරතිය හටගන්නා ක්‍රමයද මුසාවාද විරතියට කී උපමාවෙන් නිසියේ යොදා අව දතයුත්තේයි. සම්මාකම්මන්ත විරතිය හා සම්මා ආජීව විරතියද අපෙක්ෂාකිරීමට හා නොකිරීමටද උපමාවක් දක්වනුලැබේ. ඒ කෙසේ යත්? යම්කිසි පුරුෂයෙක් තෙමේ ගෙරිමස් බුදිනු කැමතිව අනික් පුරුෂයෙකුට කථාකොට පින්වත්නි! අසවල් ගවයා මරාදෙව තොපට දසදෙලොස් කහවණුවක්දෙමියි කීකල්හි ඒ පුරුෂතෙමේ යහපතැයි ගිවිස්නේයි. ඉක්බිති ඒ දසදෙලොස් කහවණුව පිළිගෙණ ගවයා මරණු පිණිස ආයුධයක් රැගෙණ ගවයා ලඟට පැමිණිකල්හි මෙබඳු කල්පනාවක්හට ගන්නේයි. ඉදින් මම මේ කහවණු දසදෙළසකට ආසාවෙන් මේ ගවයා මැරුයේවීනම් එකාන්තයෙන් මහාසාවද්‍යවූ ප්‍රාණ

ඝාත අකුශල කර්මයකින් බඳවෙමියි ඒ කර්මය හේතුකොටගෙණ මරණින් මතු එකාන්තයෙන් අපා දුකට භාජනවන්නෙමියි ඒ අඥානයෙන් මිදී මිනිසත් බව ලබනකල්හි ඒ අකුශල කර්මයෙන් පීඩිතවූ කාමාවචර කුශල කර්මයෙන් උපදිනා බැවින් මනුෂ්‍යයක වෙයි. අනුන්ගේ ශස්ත්‍රයකින් හේතුකොටගෙණ මරණය පැමිණෙයි. ඝාපිපාසාදෙකින් පීඩිතවෙයි. මේ ආදී නොයෙක් දුක් විපාක ලබන්නේයයි ආදීනව සලකා ඒ භවයෙහි නොමරා අවුත් ඔහුගේ කහවණු ආපසු භාරදී ඒ ප්‍රාණඝාත කර්මයෙන් වලක්නේවෙයි. එකල්හි ඔහුට සම්මාකම්මන්ත විරතිය ලැබෙන්නේයි. සම්මාආජීවයට උපමා කවරයත්? එක්තරා පුරුෂයෙකුට හූරු මස් කනු කැමතිව අනික් පුරුෂයෙකු බණවා එම්බල! මේහූරා මරාදෙන්නේවීනම් තොපට දසදොළොස් කහවණුවක්දෙන්නෙමියි කීකල්හි ඒ කහවණු ලබන ආශාවෙන් ආවුදයක් රැගෙණ හූරු ලඟට ගියකල්හි මෙබඳු කල්පණාවක් පහළවෙයි. ඉදින් මා විසින් මේ හූරා මරණලද්දේවීනම් කහවණු දසදොළසක් පමණ ලැබෙයි. ඒ සවල්පවූ මුදල මාගේ ජීවිකාවටද නොපොහොනේවෙයි. ඒ මුදලින් මා පමණක් නොව මාගේ අඹුදරුවෝද ජීවිකාවකෙරෙති. එතකුදුවුවත් මේ ප්‍රාණඝාත පාපය හේතුකොටගෙණ අපාය දුක් විඳිනාකල්හි මා තනිවම ඒ දුකට භාජනවෙමියි මාගේ අඹුදරුවෝ හෝ අන්කිසි නෑයෙක් හෝ මා වෙනුවට ඒදුක් අනුභවනොකෙරෙත්. මෙසේ සලකා ඒ හූරා නොමරා අවුත් කහවණු දසදොළස ආපසුදෙයි. මෙසේ උපදනාකල්හි සම්මාආජීව විරතිය ලැබෙන්නේයි. මේ පාණාතිපාත කර්මයට දක්වූ ක්‍රමය උපනිශ්‍රයකොටගෙණ අදින්නාදානයෙන් වැලකීමෙන් ලැබෙන්නාවූ සම්මාකම්මන්ත විරතිය හා සම්මාආජීවවිරතියද, කාමෙසුමිච්ඡාචාරයෙන් වැලකීමෙන් ලැබෙන්නාවූ සම්මාකම්මන්ත විරතිය හා සම්මාආජීව විරතියද උපමා උපමෙය සම්බන්ධකොට දතයුත්තේය. මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්පලාප පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර යන මේ සප්ත දුශ්චරිතයෝ තුමූ වැලකියයුතු ධර්ම බැවින් විරමිතබ්බවත්ථුනම්වෙත්. විරති චෛතසිකයෝ තුන්දෙන වනාහි ඒසප්තප්‍රකාරවූ දුශ්චරිත සංඛ්‍යාතවූ විරමිතව්‍ය වස්තූන්ගෙන් වලක්නාහෙයින් විරතිනම්වෙත්. මෙසේ කීකල්හි ඒ ඒ දුශ්චරිතයන්ගේ අඟසම්පූර්ණවූකල්හි ඒ ඒ දුශ්චරිතයෙන් වැලකීම විරතිනම්වෙයි. විරමිතව්‍ය වස්තූන්ගෙන් වැලකීමෙන්ම එකාන්තයෙන් විරති ලැබෙයි. විරමිතව්‍ය වස්තූන්ගෙන් වැලකීමක් නැතිකල්හි විරතිනම් නොවෙයි. එහෙයින් යහපත් සුභාෂිත

වචනකීමද, බුද්ධාදී රත්නත්‍රයට කටයුතුවූ අපචායන පුණ්‍ය ක්‍රියාවන්ද, යහපත් වචන යහපත් කර්මාන්තවන්නේ නමුදු විරමිතව්‍යවස්තූන්ගෙන් වැලකීමක් නැතිහෙයින් ඒකාන්ත විරතිනම් නොවේත්. එහෙයින් මුසාවාදාදී සතරාකාර වාග්දුශ්චරිතයෙන් වැලකීම හැර අනික් සුභාෂිත වචන කීම් ආදියද බුද්ධාදී රත්නත්‍රය ගුණ කථනයද වොහාර සම්මාවාචා විරති නම්වෙයි. ප්‍රාණඝාතාදී ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැලකීම හැර අනික් යහපත් කර්මාන්තකිරීම වොහාර සම්මාකම්මන්ත විරතිනම්වෙයි. ඒ විරතීහු තුන්දෙනද සම්පත්ත විරති සමාදාන විරති සමුච්ඡෙද විරතියයි එක් එක් විරතියක් තුන් තුන් ආකාරවන්නේයි. ඔවුන් අතුරෙන් සමාදාන විරති තොමෝ අනාගතයම අපෙක්ෂාකරන්නේ වෙයි. අවශෙෂ විරතීහු දෙදෙන ප්‍රත්‍යුත්පන්නයම අපෙක්ෂා කරන්නේවෙයි. ඔවුන් තුන්දෙනා අතුරෙන් සම්පත්ත විරතිය කෙසේය යත්? යම්කිසි ප්‍රත්‍යයයක් හෝ වස්තුවක් හෝ ලැබෙන්නට මත්තෙන් ආචාර්‍ය්‍යයන් ළඟ පාණාතිපාතා වෙරමණී යනාදිවශයෙන් සමාදන්නොවීම බොරු කීම් ආදීයට සුදුසු කාලයක් පැමිණිකල්හී ප්‍රත්‍යක්ෂයෙහිම ඒ බොරුකීම් ආදියෙන් වලක්නේයි. එකල්හි උපදනා කාමාවචර මහාකුශල චිත්ත වීථියෙහි එක එක සම්පත්ත විරතිය ලැබෙන්නේයි. සමාදාන විරතිය කෙසේයත්? වස්තු ප්‍රත්‍යාදිය නොදැක නොලැබ අද පටන් මුසාවාදාදී වචී දුශ්චරිතයෙන් වලකින්නෙමියි ප්‍රාණඝාතාදී කායදුශ්චරිතයෙන් වලකින්නෙමියි යනාදී අධිෂ්ඨාන කොටගෙණ ආචාරීන් ළඟ ශික්ෂාපද සමාදන්වේද, එසමයෙහි උපදනා කුශල චිත්ත වීථියෙහි සමාදාන විරතිය ලැබෙන්නේයි. "සමුච්ඡෙද විරතිය" යනු සැදෑතිස්ස මහරජු විසින් සෝවාන්වූ තිස්සනම් අරක්කැමියාහට ජීවමාන කුකුළෙක් යවා ඉඳින් තෝ මේ කුකුළා නොමරන්නේවීනම් මේ වධකයන් සමග ගොස් දන්ගෙඩියේ ඉසතබවයි නියොගකළකල්හි යහපත දන්ගෙඩියේ හිසතබමියි කුකුළා නොමරමියි කියා වධකයන් සමග ගොස් ආඝාතනයෙහි තුබූ දන්ගෙඩියේ හිස තුබූ උදාහරණ කථාවෙහි මෙන් තමාගේ ජීවිත හානියවූ නමුදු ප්‍රාණඝාතාදී සප්තවිධ දුශ්චරිතයන් නොකරන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විරති තොමෝ සමුච්ඡෙද විරතිනම්වෙයි. සමාදාන විරතියට උපමාවක් දක්වනුලැබේ. පුරාතන කාලයෙහි එක්තරා බමුණෙක් තමන්ගේ ආචාරීන් ළඟ "පාණාතිපාතා වෙරමණී" යනාදී පන් ශික්ෂාපදය සමාදන්වී යම්කිසි කර්මාන්තයක් පිණිස පොරෝවක් හා කෙවිරියක්ද රැගෙණ වනයට ගියේය. ඉක්බිති එක්

තරම් පිඹුරෙක් අවුත් මේ බමුණාගේ දෙපතුල පටන් සකල ශරීරය වෙළාගත්තේයි. ඉක්බිති ඒ බමුණු තෙමේ මෙසේ කල්පනාකෙරෙයි. මා අත තිබෙන්නාවූ මේ ඝෝරවූ කෙටේරියෙන් එකාවරටම මේ සර්පයාගේ ජීවිතය විනාශකොටහැක්කේය. එසේකෙළේනම් මා විසින් වනයට එන්නාවූකල්හි සමාදන් වනලද්දාවූ පංචශීලය බිඳියන්නේය. එහෙයින් මාගේ ජීවිත හානිවූයේ නමුදු ශික්ෂාපදය නොබිඳිමියි සිතුයේය. මෙසේ තුන් වරක්ම ඒ බමුණාහට සර්පයා මරා ජීවිතය ආරක්ෂාකරමියි සිතූ නමුත් තුන්වාරයෙහිම තමාගේ ශීලභේදයට භයින් ඒ සර්පයා නොමරා ඉදින් මේ ඝෝරවූ කෙටේරිය මා අත තුබූයේනම් සර්පයා මැරීමට සිත් උපදින්නේයයි සිතා අත තිබූ ඝෝරවූ කෙටේරිය දමාගැසීය. ඉක්බිති ඒ පිඹුරු සර්ප තෙමේ වෙළීම හැර සෙමින් සෙමින් යන්නට ගියේයි. එකල්හි ඒ බමුණාහට උපන්නාවූ විරතී තොමෝ සමාදාන විරතිනම්වේ. සමුච්ඡේද විරතියට උදාහරණ කෙසේ යත්? පුරාතනයෙහි එක්තරා ස්ත්‍රියක්හට පුත්‍රයන් දෙදෙනෙක් ඇතිවූහ. මෑත භාගයෙහි ඒ ස්ත්‍රී මහලු වියසට පැමිණිකල්හි නොඉවසිය හැකිවූ මහත්වූ වාතරෝගය කින් පෙළෙන්නට පටන්ගත්තීය. ඉක්බිති වෙදකු කැඳවා ගෙණවුත් ඒ රෝගාතුරයා පෙන්වූකල්හි රෝගය පරීක්ෂාකොට මෙසේ කීයේයි. පින්වත්නි! තොපගේ මෑණියන්ගේ රෝගය අන්කිසි ඖෂධයකින් පිළියම් නොකොටහැක්කේය. සාවෙකුගේ ලේ හෙයින් ඖෂධයක්කරණු කැමැත්තෙම්නයි කීහ. ඉක්බිති මෑණිමහලු සහෝදර තෙමේ බාල සොහොයුරාට කථාකොට වනයට ගොස් සාවෙක් අල්වා මරාගෙණෙමයි නියෝගකෙළේයි. ඉක්බිති බාලසොහොයුරු තෙමේ වනයට ගොස් සාවුන් මත්ත ලකා දලක් ඇද වනයට වැද එලවාගෙණ ගියකල්හි පැටවුන් සහිතවූ සාදෙනෙක් ඒ දලෙහි අසුවිය. ඒ පැටව්ද මෑනියන් කෙරෙහි ඇත්තාවූ ආලය හෙතුකොටගෙණ ඒ සාදෙන ළඟ හැසිරෙමින් සිටියෝය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ සාදෙන මරණු පිණිස මුගුරක් රැගෙණ වහාම ගොස් ඒ සාදෙන මරන්නට සැලූකල්හි ළඟ හැසිරෙන්නාවූ පැටවුන් දුක මෙසේ කල්පනා වීය. ඉදින් අපගේ මෑණියෝ කාලක්‍රියාකෙළේනම් අපට යට ගන්නාවූ දුකමෙන්ම මේ සාදෙන මැරූකල්හි ඇගේ පුත්‍රයන් වද මහත්වූ දුකහටගන්නෝය. වෛද්‍යාචාරී තෙමේ සාලෙයන් කාරන්නාවූ ඖෂධයෙන්ද අපගේ මෑණියන්ගේ රෝගය එකාන්තයෙන් ව්‍යුපසමනයවීම්ද නොසිතිය හැක්කේය. එහෙයින් මේ සාදෙන මැරීමෙන් මට ප්‍රයෝජනනැතැයි සිතා සාදෙන

දුලින් මුදු පැටවුන් සමග වනයට යන්නට ඇරියේයි. ඉක්බිති ඒ පුරුෂතෙමේ පෙරළා ගෙට අවුත් වැඩිමල් සොහොයුරුට මෙපවත් කිකල්හි නොයෙක් වචනයෙන් නින්දාගෙනකොළේයි. ඉක්බිති ඒ බාල මලණු තෙමේ මව් ලඟට ගොස් මෑනියෙනි! මට අද නුබවහන්සේගේ ජීවිතය වෙනුවෙන් මැරියයුතු පැටවුන් සහිතවූ සාදෙනාගේ ජීවිත දානයදීම හෙතුකොටගෙණ එම සත්‍ය වචන බලයෙන් නුබගේ රොගය සංසිද්දේවයි කියා මෑනියන්ගේ පිට පිරිමැද්ද ක්‍ෂණයෙහි ඒ රොගය අලපත වැකි දියබිඳුවක් සේවාම ව්‍යපශමනයවී ගියේයි. මේ පුරුෂයාට හටගත්තාවූ ප්‍රාණාතිපාත විරතිය සම්පත්ත විරති නම්වෙයි දතයුතුයි.

සමුච්ඡෙද විරතියවනාහි ආයර්‍ය මාර්‍ගයෙහි ලැබෙන්නාවූ විරතියයි. සෝවාන් මාර්‍ගය ලැබූකල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරය, විචිකිච්ඡා සහගත චිත්තය යනමේ අකුශල් පස සමුච්ඡෙදවශයෙන් නසන්නේයි. අනාගාමි මාර්‍ගයෙන් කාම රාගය හා පටිඝසම්ප්‍රයුක්ත දෙසිත සමුච්ඡෙදවශයෙන් නසන්නේයි. අර්හත් මාර්‍ගයෙන් රූපරාග අරූපරාග සම්ප්‍රයුක්තවූ දිට්ඨි ප්‍රයුක්තසිත් සතරය,උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තය,යන සිත් පස සමුච්ඡෙද ප්‍රහාණවශයෙන් නසන්නේයි.මේවිරතීහු තුන්දෙනවනාහි කවර ප්‍රඥාවෙක්හි කවර චිත්තයක ලැබෙන්නේද යත්? අෂ්ඨ මිච්ඡත්ව සංඛ්‍යාතවූ ප්‍රාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්පලාප මිච්ඡාජීව සංඛ්‍යාතවූ අෂ්ටප්‍රකාරවූ පාපධර්මයන්ගෙන් වැලකීම්වශයෙන් "පාණාතිපාතා වෙරමණි අදින්නාදානා වෙරමණි කාමෙසුමිච්ඡාචාරා වෙරමණි මුසාවාදා වෙරමණි පිසුනාවාචා වෙරමණි ඵරුසාවාචා වෙරමණි සම්ඵප්පලාපා වෙරමණි මිච්ඡාජීවා වෙරමණි සික්ඛාපදං සමාදියාමි "යනුවෙන් ආජීවාෂ්ටමක සීලය සමාදන්වන්නාවූකල්හි එකි එකී ශික්ෂාපදය පිළිබඳව උපදනා කාමාවචර කුශල චිත්ත විසි අටෙහි මේ විරතීහු අටදෙන ක්‍රමයෙන් ලැබෙත්. පංචශීල අෂ්ටාංගශීල සමාදානාදියෙහිදු සුදුසු පරිද්දෙන් එකොක දශයකින් ලැබෙත්. සාමණෙර උපසම්පදා ශීලදෙක්හි විශුද්ධිමාර්‍ගයෙහි ප්‍රකාශවූ සප්තප්‍රකාරවූ කුහක වස්තූන්ගෙන් වෙන්වීම්වශයෙන් සම්මාආජීව චෛතසිකයලැබේ. මෙසේ දශ පුණ්‍ය ක්‍රියාවස්තූන්වශයෙන් පවත්නාවූ කාමාවචර කුශලචිත්ත යන් ශීලමය පුණ්‍යක්‍රියා වස්තුවශයෙන් පවත්නාවූ කාමාවචර කුශල චිත්තයෙහි මුත් දානාදිවශයෙන් පවත්නාවූ අවශෙෂ නව ප්‍රකාර පුණ්‍ය ක්‍රියා වස්තුවෙහිම නොලැබේ. කාමාවචර විපාක

චිත්තයෙහි වනාහි කායවාග් විඥප්ති ජනක නොවන බැවින් විරතීහු නොලැබෙත්. කාමාවචර මහාක්‍රියා චිත්තයෝ වනාහි රහතුන්ට ආවේණිකව උපදනා බැවින් මේ විරතීහු නොලැබෙත්. රූපාරූප මහග්ගත චිත්තයෙහි වනාහි ශීලවිශුද්ධිය නොලැබෙන බැවින් එකද විරතියකුත් නොලැබෙන්නේමැයි. සෝවාන් ආදී සතරමාර්ග චිත්තයෙහි සියලු දුශ්චරිත දුරාජීවයන්ගෙන් වැලකීම ලැබියයුතුහෙයින් අපායගාමිනීවූ සියලු විරතීහු සෝවාන් මාර්ග චිත්තක්ෂණයෙහිද කාමරාග ප්‍රතිඝය හා එක්ව හටගන්නාවූ සියලු විරතීහු අනාගාමි මාර්ග චිත්තක්ෂණයෙහිද රූපරාග අරූපරාගයෙන් යුක්තවූ සියලු විරතීහු අර්හත් මාර්ග ක්ෂණයෙහිද ලැබිය යුතුවෙත්. තවද මේ විරතීහු තුන්දෙන ආජීවාෂ්ටමක ශීලයෙහි එක එකක් ලැබියයුතුවූවද ලෝකෝත්තර චිත්තයෙහි ලැබියයුතුවූ සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන මාර්ගාංගයෝ තුන්දෙනෙක්ද ලැබියයුතුහෙයින් මේ ධර්මයන්ගේ නානත්වයක් නැත්තේයයි සැලකියයුතුවෙයි. කාමාවචර චිත්තයෙහි ලැබෙන්නාවූ විරතීහු අවිද්‍යාප්‍රත්‍යයෙන් ලැබෙන්නාවූ කුශල සංස්කාරයන්ට උපකාරවෙති. එහෙයින් ඒධර්මයෝ පටිච්චසමුප්පාද චක්‍රයෙහි අංගයෝවෙති, හෙවත් මතු සංසාරයෙහි ඉපදීමට හෙතුහුවෙති. මාර්ග චිත්තයෙහි ලැබෙන්නාවූ මාර්ගාංගයෝ වනාහි ඒ පටිච්චසමුප්පාද චක්‍රයෙන් බැහැරයාමට හෙතුවූ නෛර්‍යාණිකාංගයෙන් යුක්තවූ මාර්ගාංගයෝවෙති. මෙසේ මේ කාමාවචර විරතීහු ලෝකෝත්තර විරතීන්ට ඉදුරා ප්‍රතිපක්ෂ වන්නාහු නමුදු පිදුරු විකිණීමෙන් ලැබියයුතුවූ රන්කහවණු මෙන් කාමාවචර විරතීහු ලෝකෝත්තර විරතීන්ගේ ප්‍රතිලාභයට ඒකාන්තයෙන් උපනිශ්‍රයවන්නබව දතයුතුයි.

## මේ ත්‍රිවිධ විරතීන්ගේ සංක්ෂේප විභාගයයි.

අප්‍රමාණ්‍ය ධර්මයන් දෙදෙනා අතුරෙන් කරුණා චෛතසිකතෙමේ අප්‍රමාණවූ දුඃඛිතවූ සත්ව ප්‍රඥප්තිය, අරමුණුකොට ගෙණ පවත්නාහෙයින් අනුන් කෙරෙහිද අනුකම්පාකිරීම ලක්ෂණකොට ඇත්තේයි. තමාගේ දූ දරුවන් කෙරෙහි බලවත් රෝගාතුරකමක් පැමිණිකල්හි ඒ දූ දරුවන්ගේ මව්තොමෝ මාගේ දරුවන්ගේ රෝගය කවර කාලෙක්හි ව්‍යපශමනයවන්නේද දූන් දූන් ව්‍යපශමනය වන්නේනම් යහපතැයි, යම්සේ අනුකම්පාකෙරේද, එපරිද්දෙන් සතුරු මිතුරු උදාසීන දුකට පත්වූ සකල සත්වයන් කෙරෙහි අනේ! මේ සත්වයෝ කවර

කාලෙක්හි දුකින් මිදෙත්ද දූන් දූන් දුකින් මිදුනේනම් යහ
පතැයි මෙසේ සටගන්නා කාරුණික සවභාව කරුණා චෛත
සිකනම්වේ, මුදිතා චෛතසිකා තෙමේ සුවපත්වූ සකල සත්ව
ප්‍රඥපතිය අරමුණුකොටගෙණ සතුටුවීම සවලක්ෂණකොට ඇත්
තේයි. දූ දරුවන් ඇත්තාවූ මවෙක් තොමෝ ඒ දූ දරුවන්ගේ
ධනසම්පත්තියද ඒ දූදරුවන්ගේ යහපත්වූ වර්ණ සංස්ථානාදියද
දුටුකල්හි යම්සේ සතුටුවන්නේද, එපරිද්දෙන් සතුරු මිතුරු
උදාසීන සියලු සුවපත්වූ සත්වයන් කෙරෙහි ඒකාකාරය පවත්
වන්නාවූ සතුටුවීම ලක්ෂණකොට ඇත්තාවූ මේ මුදිතා චෛත
සිකය දරුවන් කෙරෙහි මෑනියන්ගේ පවත්නාවූ මුදිතාවට උප
මාඇතිවේ. මේ කරුණා මුදිතා චෛතසිකයෝ දෙදෙන බාහි
රවූ සත්ව ප්‍රඥපතියම අරමුණුකොට පවත්නාහුවෙත්. තමන්ගේ
දූ දරුවන් කෙරෙහි හෝ තමන්ගේ ඥාති මිත්‍රාදීන් හා සම්බ
පවත්නා කරුණා චෛතසිකය හා මුදිතා චෛතසිකයද ගෙහ
සිත ලොභයාගේ විශෙෂයක්මවෙත් එහෙයින් සතරදිගය.
සතර අනුදිගය, උඩය, යටය, යන දසදිසාවෙහි වාසයකරන්නාවූ
ශත්‍රු මිත්‍ර උදාසීනාදිවූ කිසි විභාගයක් නොකොට සමානවශ
යෙන් පවත්වන්නාවූකල්හිම අප්‍රමාණ්‍ය ධර්මනම්වෙත්. "විශුද්ධි
මාර්ගී විහාරභාවනාවෙහි" අප්‍රමාණ්‍ය ධර්මයෝ සතරදෙනෙකැයි
දක්වා තිබියදී මෙහි කුමක්හෙයින් දෙදෙනෙක්ම දක්වනලද්
දාහුද යත්? යට ශොභන චෛතසිකයන් අතුරෙන් අද්වෙෂ
චෛතසික තෙමේ මෙත්තා චෛතසිකනම්වෙයි. තත්‍රමජ්ඣත්ත
තාචෛතසික තෙමේ උපෙක්ෂානම්වෙයි. එහෙයින් නැවත ඒ
ධර්මදෙදෙනා මෙහි නොගන්නාලද්දාහුයයි දතයුතුයි එහෙයින්
අද්වෙෂ සංඛ්‍යාත මෙත්තා චෛතසිකයද, කරුණාචෛතසික
යද, මුදිතා චෛතසිකයද, තත්‍රමජ්ඣත්තතා සංඛ්‍යාත උපෙක්ෂා
චෛතසිකයද, යන මේධර්මයෝ සතරදෙන බුද්ධාදීන්ගේ උත්තම
විහාරයක් බැවින් බ්‍රහමවිහාරයයි ව්‍යවහාරකෙරෙත්. තමන්ගේ
දූ දරුවන් ලදරු අවස්ථාවෙහි මව්පියන්ට පවත්නාවූ සවභාව
මෛත්‍රීකරුණාදෙකම සමානවෙයි. ඒ දූ දරුවන්ගේ අභි
වෘද්ධියට පැමිණිකල්හි මව්පියන් කෙරෙහි ඇත්තාවූ සවභාව
මුදිතා උපෙක්ෂා බ්‍රහමවිහාරයන්ට බඳුවෙයි. මෛත්‍රී බ්‍රහමවිහාර
යට රාග තෙමේ ලංවූ සතුරෙක් වැනිවෙයි. ද්වෙෂ තෙමේ දුරවූ
සතුරෙක් වැනිවෙයි. කරුණා බ්‍රහමවිහාරයට ද්වෙෂතෙමේ ලංවූ
සතුරෙක් වැනිවෙයි. අවිශෙෂ ක්ලෙශයෝ දුරවූ සතුරන් වැනි
වෙත්. මුදිතා බ්‍රහමවිහාරයට සොම්නස ලංවූ සතුරන් වැනි
වෙයි. අනභිරති සංඛ්‍යාතවූ ධ්‍යාන විදර්ශනාදියෙහි නොඇලීම

දූරවූ සතුරෙකු වැනිවෙයි. උපෙක්ෂා බ්‍රහ්මවිහාරයට අඤ්ඤාණ උපෙක්ෂාව නොහොත් උපෙක්ෂා සහගත ෂට්ප්‍රකාර අකුශල චිත්තයෙහි යෙදුනාවූ මෝහය ලංවූ සතුරෙකු වැනිවෙයි. රාග ප්‍රතිඝයෝ දෙදෙන දුරුවූ සතුරන් වැනිවෙත්. මෙසේ අප්‍රමාණ්‍ය චෛතසික දෙදෙනාගේ විභාග දතයුතුයි.

පඤ්ඤින්ද්‍රිය චෛතසික තෙමේ සියලු ධර්මයන්ගේ අනිත්‍යාදි ස්වභාව අවබෝධකිරීම හා මාර්ගඵල චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ ධර්මයන් තමාගේ වසඟයෙහි ලක්ෂණකොට ඇති හෙයින් ප්‍රඥෙන්ද්‍රියයයි ව්‍යවහාරකෙරෙත්. මේ ප්‍රඥෙන්ද්‍රිය චතාංගි යහපත් පණ්ඩිත මාර්ගදෙශකයෙකුට බඳු උපමා ඇතිවෙයි. නොහොත් සතවූ පුවරුකඩක් හෝ වෘක්ෂාදියක් හෝ විනිවිද යතලෙස විදීමෙහි දක්ෂවූ ඊතලයකට බඳු උපමා ඇතිවෙයි. යම්සේ දක්ෂවූ දුනුවායෙක් තෙමේ මහත්වූ වෘක්ෂාදිය පවා විනිවිද යතලෙස විදින්නාක්මෙන් මේ ප්‍රඥෙන්ද්‍රිය තෙමේ සියලු ධර්මයන් විනිවිද පවත්නේයි. නොහොත් අන්ධකාරයෙහි විද්‍යමානවූ යම් යම් වස්තුව දල්වනලද්දාවූ ප්‍රදීපාලෝකයකින් දකින්නාක් මෙන් මෝහ නැමති අන්ධකාරයෙන් වැසී පවත්නාවූ අනිත්‍ය දුඃඛ අනාත්මාදී ලක්ෂණයන් අවබෝධකරන්නේයි. දෘෂ්ටියද ප්‍රඥාවද යන මේ ධර්මයෝ දෙදෙන දැකීම ලක්ෂණකොට ඇත්තාහු නම් ඒ ධර්මයන් දෙදෙනාගේ විශෙෂ කවරේද යත්? දෘෂ්ටි තොමෝ ඒ ඒ ධර්මයන්ගේ තත්වාකාරය හැර අසත්‍ය ස්වභාව යන්ද දැක්මකරයි. ප්‍රඥා තොමෝ ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවයන් දැනීමකරයි. සංඥා විඥාන ප්‍රඥා යන මේ ධර්මයෝ තුන්දෙන අරමුණු දැනගැණීම කාරනහෙයින් ඒ ධර්මයන් තුන්දෙනාගේ විශෙෂ කවර යත්? සංඥා තොමෝ නීල පීතාදී වර්ණ මාත්‍රයක් හැඳිනගණියි. කුමක්හෙයින් නිල්වූයේද? කුමක්හෙයින් රත්වන්වූයේද? යනාදී විභාගය නොදනී. එසේම සංඥා තොමෝ අනිත්‍ය ස්වභාව දුඃඛ ස්වභාව අනාත්ම ස්වභාවනොදනී. මාර්ගයාගේලැබීම ඵලයාගේලැබීම මේ මේ හෙතුවෙන්වේයයිද නොදනී. විඤ්ඤාණ තෙමේ නීල පීතාදී රූපාලම්බනය දනී. කුමක් හෙයින් නීල පීතාදී වර්ණවූයේදැයිද දනී. අනිත්‍ය දුඃඛ අනාත්ම ස්වභාවද දනී. එතකුදුවුවත් කවර කමට්ඨානයක් භාවිතාකිරීමෙන් මාර්ගඵලයන්ගේ ලැබීමවන්නේදැයි නොදනී. ප්‍රඥා තොමෝ නීල පීතාදී අරමුණුද හඳුනයි. කුමක්හෙයින් නීල පීතාදිවර්ණය වූයේදැයි යන හෙතුවද දැනගණී. අනිත්‍ය දුඃඛ අනාත්ම ස්වභාවද දැනගණී. අසවල්කමටහන් භාවනාකොට අසවල් මාර්ගඵල

යද ලබන්නේයයි යන විභාගයද දනී. එහෙයින් ප්‍රඥාව හා යෙදුනාවූ සංඥා විඥාන දෙදෙන අප්‍රධානවෙත්. මේ සංඥා විඥාන ප්‍රඥාවන්ට උපමා කවර යත්? ළදරුවෙක, පිටිසර ගම් වැසියෙක, රන්කරුවෙක, යන මෙකී තුන්දෙනා ඉදිරියෙහි රන්කහවණු දමූකල්හී කසාවණී මාත්‍රයක් ළදරු තෙමේ දන ගණී. සංඥාවගේ අරමුණු හැඳිනීමද ඊට උපමාවෙයි. පිටිසර වැසි පුරුෂ තෙමේ රන්කහවණු මනුෂ්‍යයන්ගේ උපභොග පරිභොග වස්තුවක්බවද දුලීභවූ වටිනා වස්තුවක් බවද දනගණී. විඥාණයාගේ අරමුණු හැඳිනීම ඊට උපමාවේ. රන්කරු තෙමේ ඒ රන්කහවණුව අසවල් රට අසවල් ආකරයෙහි උපන්නේය. අසවල්දෙශයෙහි මෙතෙක් අගනේය අසවල් දෙශයෙහි මෙතෙක් අගනේය. යනාදී සියලුවිභාගයන් දනගණී. ශ්‍රද්ධාව ආදීකොට ඇත්තාවූ ප්‍රඥාව අවසන්කොට ඇත්තාවූ මේ පස්විසි චෛතසිකයෝ තුමූ ශොභන චිත්තයෙහිම යෙදියයුතු හෙයින් ශොභන චෛතසිකයෝයයි ව්‍යවහාරකෙරෙත්.

ආයුෂමත්වූ අනුරුද්ධාචාරීන්වහන්ස! තුබවහන්සේගේ මේ “අභිධම්මාඨ” නම් ප්‍රකරණය ව්‍යඤ්ජනවශයෙන් හා අර්ථවශයෙන්ද අතිශයින් සංක්ෂිප්තකොට සංග්‍රහකරම්හයි පළමුවෙන් ප්‍රතිඥාකොට සපර්ශය ආදිකොට ඇත්තාවූ ප්‍රඥාව අවසන්කොට ඇත්තාවූ මේ දෙපණසක් ධර්මයෝ “එසො වෙදනා-පෙ-පඤ්ඤින්ද්‍රියං” යනුවෙන් එකම පරිච්ඡෙදයකින් සංග්‍රහකටහැකිවුවද එසේනොකොට සපර්ශාදීවූ සත්දෙන “සත්තිමෙ චෙතසිකා සබ්බචිත්ත සාධාරණානාම” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, ප්‍රකීර්ණක ධර්මයෝ සදෙන” ඡඉමෙ චෙතසිකා” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, නැවත ඒ පරිච්ඡෙදවය මිශ්‍රකොට “තෙරසචෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, මොහාදී චෛතසිකයෝ සතරදෙනෙක් “සබ්බා කුසල සාධාරණානාම” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, ලොභාදී චෛතසිකයෝ දසදෙනෙක් හා සමග ඒ පළමු චෛතසිකයෝ සතරදෙන “චුද්දසිමෙ චෙතසිකා අකුසලානාම” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, ශ්‍රද්ධාදී චෛතසිකයෝ එකුන් විසිදෙනෙක් “එකූනවීසතිමෙ චෙතසිකා සොභන සාධාරණා නාම” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද,සම්මාවාචාදී චෛතසිකයෝ තුන්දෙනෙක් “තිස්සො විරතියො නාම” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද, කරුණාදී චෛතසිකයෝ දෙදෙනෙක් “අප්පමඤ්ඤායො” යනුවෙන් එක් පරිච්ඡෙදයක්වශයෙන්ද “පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං” යනුවෙන් ප්‍රඥාව එක් පරිච්ඡෙදයක්,

වශයෙන්දැයි මෙසේ නවපරිච්ඡේදයකින් පිරිසිඳ ග්‍රන්ථගෞරවය ඇතිකොට කුමක්හෙයින් ප්‍රකාශකෙළේද යත්? මෙසේනො කොට සපර්ශාදිවූ ප්‍රඥාම අවසන්කොට ඇත්තාවූ මේ දෙපණස් ධර්මයන්ගේ නාමව්‍යවස්ථානය එකම පරිච්ඡේදයකින් සංග්‍රහ නොකෙළේ කුමක්නිසාද යත්? ඊට පරිහාර මෙසේ දතයුතුයි. මේ දෙපණස් චෛතසිකයන් අතුරෙන් සපර්ශාදී චෛතසිකයෝ සත්දෙන සියලුම චිත්තයෙහි ඒකාන්තයෙන් යෙදෙනබව හඟවනු පිණිස "සබ්බචිත්ත සාධාරණානාම" යනුවෙන් එක් පරිච්ඡේදයකින් පිරිසිඳිනාලද්දේයි. විතර්කාදී ධර්මයෝ සදෙන නානාප්‍රකාරයෙන් විසිර පවත්නා අර්ථය ප්‍රකාශකරනු පිණිස නොහොත් එක එකක් විරුද්ධව සයාකාරයකින් යෙදෙන අර්ථය හඟවන පිණිස "පකිණ්ණකා නාම" යනුවෙන් එක් පරිච්ඡේදයකින් පිරිසිඳිනාලද්දේයි. ඒතෙළෙස් චෛතසික ධර්මයෝ තුමූ කුශලාකුශල අව්‍යාකෘත යන සියලු ධර්මයන්ට සමානව පවත්නා අර්ථය හඟවනු පිණිස "අඤ්ඤසමාන ධම්ම"යෝයයි පිරිසිඳිනාලද්දේයි. අකුශල චෛතසිකයන් අතුරෙන් මොහාදීවූ ධර්මයෝ සතරදෙනෙක් සර්වාකුශල සාධාරණවශයෙන් යෙදෙන බව හඟවනු පිණිස "අකුසල සාධාරණා නාම" යනුවෙන් පිරිසිඳිනාලද්දේයි. ලොභාදී අකුශල චෛතසිකයෝ දසදෙන සියලු අකුශල චිත්තයෙහි ඒකාකාරයෙන් නොයෙදී අනෙකාකාරයෙන් අකුශල චිත්තයෙහිම යෙදෙන බැව් හඟවනු පිණිස "අකුසලානාම" යනුවෙන් පිරිසිඳිනාලද්දේයි. ශ්‍රද්ධාදිවූ එකුන්විසි ධර්මයෝ තුමූ එකුන්සැටක් ශොභන චිත්තයෙහි නියතයොගීවශයෙන් ඒකාන්තයෙන් යෙදෙනබව හඟවනු පිණිස "සොභන සාධාරණානාම" යනුවෙන් පිරිසිඳිනාලද්දාහුය. සම්මාවාචාදිවූ විරතීහු තුන්දෙන ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තුවෙහි එක එක ශික්ෂාපදයක් අරමුණුකොටගෙණ පවත්නාබව හා ලොකොත්තර විරතීහු ලොකොත්තර චිත්තයෙහි ඒකාන්තයෙන් සියල්ල ලැබිය යුතුබව හඟවනු පිණිසද කරුණාදිවූ චෛතසිකයෝ දෙදෙන ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන චිත්තයෙහි බ්‍රහ්මවිහාර භාවනාවශයෙන් පවත්නාකල්හි ලැබිය යුතුබව හඟවණු පිණිස "අප්පමඤ්ඤායො නාම" යනුවෙන් පිරිසිඳිනාලද්දාහුය. ප්‍රඥාචෛතසිකය වනාහී සත්සාළිස් ත්‍රිහෙතුක චිත්තයෙහිම අනියත යොගීවශයෙන් ලැබිය යුතුබව හඟවනු පිණිස "පඤ්ඤින්ද්‍රියෙන" යනුවෙන් වෙන්කොටදක්වනලද්දේයි. මෙසේ මේ දෙපණස් චෛතසික ධර්මයන්ගේ නවප්‍රකාර අර්ථය හඟවනු පිණිස නවපරිච්ඡේදයකින් වෙන්කොට දක්වනලද්දාහුයයි දත යුතුයි.

චිත්තාවියුත්තානං, චිත්තයෙහි එකාන්තයෙන් යෙදෙන් නාවූ; එතසං, ඒ චෛතසිකයන්ගේ; චිත්තුප්පාදෙසු, චිත්තයෙහි; පච්චෙකං, වෙන වෙනම; සම්පයොගො, සම්ප්‍රයොගක්‍රමය; ඉතො, මේ සංක්ෂෙප ක්‍රමයෙන්; නොහොත් මේ උද්දෙසයෙන්; පරං, මත්තෙහි; යථායොගං, සුදුසු පරිද්දෙන්; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනුලැබේ.

සත්ත, සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන තුමූ; සබ්බෙසු, සියලු එකුන්අනූවක් චිත්තයෙහි; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්; පකිණ්ණකා, ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන තුමූ, යථායොගං, සුදුසු පරිද්දෙන්; යුජ්ජන්ති, යෙදෙන් නාහුවෙත්; චුද්දස, තුදුස් අකුශල චෛතසිකයෝ තුමූ; අකුසලෙසෙව, දොළොස් අකුශලයෙහිම; යථායොගං, සුදුසු පරිද්දෙන්; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්; සොභනා, පස්විසි ශොභන චෛතසිකයෝ තුමූ; සොභනෙසෙව, එකුන්සැටක් ශොභන චිත්තයෙහිම; යථායොගං, සුදුසු පරිද්දෙන්; යුජ්ජන්ති, යෙදෙන් නාහුවෙත්.

කථං යුජ්ජන්ති? කෙසේ යෙදෙන්නාහුද යත්? "යුජ්ජන්ති' යනු අධ්‍යාහාරයි. සබ්බචිත්ත සාධාරණා, සබ්බචිත්තසාධාරණ චෛතසිකයෝ සත්දෙන: තාව, පළමුකොට; "මයා වුච්චන්තෙ" යනු අධ්‍යාහාරකරණු. ඉමෙසත්තචෙතසිකා, මේචෛතසිකයෝ සත්දෙන; සබ්බෙසුපි, සියලුම; එකූනනවුති චිත්තුප්පාදෙසු; එකුන් අනූවක් චිත්තොත්පාදයෙහි; ලබ්භන්ති, ලැබියයුත්තාහු වෙත්.

පන, සබ්බචිත්ත සාධාරණ චෛතසිකයන්ගේ සම්ප්‍රයොග ක්‍රමයෙන් අන්‍යවූ ප්‍රකීර්ණක චෛතසිකයන්ගේ සම්ප්‍රයොගක්‍රමය කියමි. පකිණ්ණකෙසු, ප්‍රකීර්ණක චෛතසිකයන් සදෙනා අතුරෙන්; තාව, පළමුකොට; "මයාවුච්චන්තෙ" යනු අධ්‍යාහාරයි. විතක්කො, විතර්ක චෛතසික තෙමේ; ද්විපඤ්චවිඤ්ඤාණ වජ්ජිත කාමාවචර චිත්තෙසුචෙව, දෙපස් විඥානයන් තොරකොට ඇත්තාවූ සුසාලිස් කාමාවචර චිත්තයෙහිද; එකාදසසු, එකොළොස් ප්‍රකාරවූ; පඨමජ්ඣාන චිත්තෙසු, ප්‍රථමධ්‍යානය හා යුක්තවූ චිත්තයෙහිද; ඉති, මෙසේ; පචපඤ්ඤාස චිත්තෙසු, පස් පණස් චිත්තයෙහි; උප්පජ්ජති, උපදනේයි.

විචාරොපන, විචාර චෛතසිකය වනාහි; "පන" යනු පක්ෂාන්තරයෙහි නිපාතපදයි. තෙසුචෙව, ඒ සවිතක්කවූ පස්පණස්

චිත්තයෙහිද; එකාදසසු, එකොළොස් ප්‍රකාරවූ; දුතියජ්ඣාන චිත්තෙසුච ඉති, ද්විතීයධ්‍යාන චිත්තයෙහිදැයි යන; ඡසට්ඨි චිත්තෙසු, සසැටක් චිත්තයෙහි උපදනේයි.

අධිමොක්ඛො, අධිමොක්ෂ චෛතසික තෙමේ; ද්විපඤ්චවිඤ්ඤාණවිචිකිච්ඡා සහගත වජ්ජිත චිත්තෙසු, දෙපස් විඥානය විචිකිච්ඡා සහගත චිත්තය යන එකොළොස් චිත්තයන් තොරකොට ඇත්තාවූ අටසැත්තෑවක් චිත්තයෙහි, උපදනේයි.

විරියං, වීර්‍ය්‍ය චෛතසික තෙමේ; පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිත චිත්තෙසු, පඤ්චද්වාරාවර්ජන චිත්තය; දෙපස් විඥානදසය; සම්ප්‍රතීච්ඡන යුගලය සන්තීරණත්‍රය යනමොවුන් තොරකොට ඇත්තාවූ තෙසැත්තෑවක් චිත්තයෙහි; උප්පජ්ජති, උපදනේයි.

පීති, ප්‍රීති චෛතසික තෙමේ; දොමනස්සුපෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣාන වජ්ජිත චිත්තෙසු, ද්වේෂ මූලික දෙසිතය උපෙක්ෂා සහගත පස්පණස් චිත්තය කායවිඥාන යුගලය චතුර්ථධ්‍යාන එකොළොස් චිත්තය යනමොවුන් තොරකොට ඇත්තාවූ එක්පණස් චිත්තයෙහි; උප්පජ්ජති, උපදනේයි.

ඡන්දො, ඡන්ද චෛතසික තෙමේ; අහෙතුකමොමූහවජ්ජිත චිත්තෙසු, අටළොස් අහේතුක චිත්තය මෝහ මූලික දෙසිතය යන විංශති ප්‍රකාර චිත්තය වර්ජිතකොට ඇත්තාවූ එකුන් සැත්තෑවක් චිත්තයෙහි; උප්පජ්ජති, උපදනේයි.

ඉති, මෙසේ; "තෙසං සත්තවිධො සම්පයොගො වෙදිතබ්බො" යනු අධ්‍යාහාරයි. පන, පාරිශෙෂන්‍යායෙන් එක් ප්‍රභේදයක් කියමි:- පකිණ්ණක විවජ්ජිතා, ප්‍රකීර්ණක සදත වර්ජිතකොට ඇත්තාවූ; තෙචිත්තුප්පාදා, ඒ චිත්තොත්පාදයෝ; යථාක්කමං, පිළිවෙළින්; ඡසට්ඨි, සසැටක් ප්‍රභෙද ඇත්තාවූද; පඤ්චපඤ්ඤාසච, පස්පණසක් ප්‍රභෙද ඇත්තාවූද; එකාදසච, එකොළොසක් ප්‍රභෙද ඇත්තාවූද; සොළසච, සොළසක්ප්‍රභෙද ඇත්තාවූද; සත්තතිච, සැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූද; වීසතිචෙව, විස්සක් ප්‍රභෙද ඇත්තාවූදැයි; වෙදිතබ්බා, දතයුත්තාහුය. සපකිණ්ණකා, ප්‍රකීර්ණක චෛතසික සදත හා එක්වගට ගත්තාවූ; තෙචිත්තුප්පාදා, ඒ චිත්තොත්පාදයෝ; යථාක්කමං, පිළිවෙළින්; පඤ්චපඤ්ඤාසච, පස්පණසක් ප්‍රභෙද ඇත්තාවූද; ඡසට්ඨිච, සසැටක් ප්‍රභෙද ඇත්තාවූද; අට්ඨසත්තතිච, අටසැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූද, තිසත්තතිච, තෙසැත්තෑවක් ප්‍රභෙද

ඇත්තාවූද; එකපඤ්ඤාසව, එක්පණසක් ප්‍රභෙද ඇත්තාවූද: එකූන සත්තතිව, එකූන් සැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූදැයි; වෙදිතබ්බා, දතයුත්තාහුය.

දෙපණස් චෛතසිකයන්ගේ ස්වභාව ලක්ෂණයන් දක්වා ඒ ඒ චෛතසිකයෝ තුමූ යෙදෙන්නාවූද නොයෙදෙන්නාවූද ක්‍රමය සංක්ෂෙපයෙන් දක්වනුලැබේ. ඒ දෙපණස් චෛතසිකයන් අතුරෙන් සර්වචිත්තසාධාරණ චෛතසිකයෝ සත්දෙන කවර චිත්තයෙක්හි යෙදෙන්නෝදැයි යමෙක් ප්‍රශ්න කොළේවී නම් ඒ ධර්මයෝ සත්දෙන නොයෙදෙන්නාවූ චිත්තයෙක් නම් නැත්තේය. එකාන්තයෙන් සියලු එකූන් අනූවක් චිත්තයෙහිම යෙදෙන්නෝයයි කියයුතුයි. ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන සියලු එකූන් අනූවක් චිත්තයන් අතුරෙන් යථාහීයෙන් යෙදෙන්නාවූ චිත්තයෝද ඇත්තාහ. නොයෙදෙන්නාවූ චිත්තයෝද ඇත්තාහයි කියයුතුයි. තුදුස් අකුශල චෛතසිකයෝ තුමූ දොළොස් අකුශල චිත්තයෙහිම යෙදෙන්නාහුය. එතකුදුවුවත් ඇතැම් චෛතසික ධර්මයෝ ඇතැම් අකුශල චිත්තයෙක්හි යෙදෙන්නාහුය. ඇතැම් අකුශල චිත්තයෙක්හි නොයෙදෙන්නාහුය. පස්විසි ශොභන චෛතසිකයෝ තුමූ එකුන්සැටක් ශොභන චිත්තයෙහිම යෙදෙන්නාහුය. එතකුදුවුවත් ඇතැම් චෛතසිකයෝ ඇතැම් ශොභන චිත්තයෙක්හිම යෙදෙන්නාහුය. ඇතැම් ශොභන චිත්තයෙක්හි නොයෙදෙන්නාහුය. අටළොස් අහෙතුක චිත්තයෙහි වනාහි තුදුස් අකුශල චෛතසිකයන්ගෙන් හා පස්විසි ශොභන චෛතසිකයන්ගෙන් යම් ධර්මයක් යෙදී ඇත්තෝදෝහෝයි නොසෙවිය යුත්තේයි. අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ ධර්මයන් සොයනු කැමැත්තාහුනම් අඤ්ඤසමාන තෙළෙස් චෛතසිකයන් අතුරෙහි සෙවියයුත්තේයි. දොළොස් අකුශල චිත්තයෙහි යෙදෙන්නාවූ ධර්මයන් සොයනු කැමැත්තාහුනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය. තුදුස් අකුශල චෛතසිකයෝය. යනමේ සත්විසි ධර්මයන් අතුරෙහි සෙවියයුත්තේයි. එකුන්සැටක් ශොභන චිත්තයෙහි යෙදෙන්නාවූ ධර්මයන් සොයනු කැමැත්තාහුනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය පස්විසි ශොභන චෛතසිකයෝය යනමේ අටතිස් ධර්මයන් අතුරෙහි සෙවියයුත්තේයි. මෙසේ සංක්ෂෙපයෙන් චෛතසිකයන්ගේ ස්වභාව දැනගත් කල්හි අසවල් චෛතසිකයෝ අසවල් චිත්තයෙහි යෙදෙන්

නාහුය. අසවල් චිත්තයෙහි නොයෙදෙන්නාහුයයි වහාම අව බොධකටහැකිවන්නේයි. මේ අර්ථය සඳහාම දෙපණස් චෛතසිකයෝ අඤ්ඤසමාන රාශිය, අකුශල රාශිය, කුශල රාශියයි තුන් රාශියකට බෙදනලද්දාහුය. මේ චෛතසික ධර්මයෝ කෙසේ යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේවීනම් සර්වචිත්ත සාධාරණ ධර්මයෝ සත්දෙන සියලු එකුන් අනූවක් චිත්තයෙහි අනූනාධිකවශයෙන් යෙදෙන්නාහුයයි මෙසේ ප්‍රකාශකොට ප්‍රකීර්ණක සදෙනා අතුරෙන් විතර්ක චෛතසික තෙමේ දෙපස් විඤ්ඤාණයන් දසදෙන තොරකොට ඇත්තාවූ සූසාළිස් කාමාවචර චිත්තය ලෞකික ලොකොත්තරවශයෙන් එකොළොස් වැදෑරුම්වූ ප්‍රථමධ්‍යානචිත්තය යන පස්පණස් චිත්තයෙහිද විචාර චෛතසික තෙමේ සවිතර්ක පස්පණස් චිත්තයෙහි ලෞකික ලොකොත්තරවශයෙන් දෙවැදෑරුම්වූ විතීය ධ්‍යාන එකොළොස බහා ලැබෙන්නාවූ සසැටක් චිත්තයෙහිද අධිමොක්ෂ චෛතසික තෙමේ දෙපස් විඤ්ඤාණ දසය විචිකිච්ඡා සහගත චිත්තය යන එකොළොස් චිත්තය හැර අටසැත්තෑවක් චිත්තයෙහිද වීර්ය චෛතසික තෙමේ පඤ්චද්වාරාවර්ජන චිත්තය, දෙපස් විඤ්ඤාණ දසය, කුශලාකුශලවූ සම්පටිච්ඡන යුගලය, සන්තීරණත්‍රය යන සොළොස් චිත්තය හැර තෙසැත්තෑවක් චිත්ත යෙහිද ප්‍රීතිචෛතසික තොමෝ දෞර්මනස් සහගත දෙසිතය, උපෙක්ෂා සහගත පස්පණස් චිත්තය, කුශලාකුශල විපාකවූ කායවිඤ්ඤාණ දෙසිතය, ලෞකික ලොකොත්තරවූ චතුර්ථ ධ්‍යාන එකොළොසය යනමේ සැත්තෑවක් චිත්තයන් හැර අව ශෙෂවූ එක්පණස් චිත්තයෙහිද ඡන්ද චෛතසික තෙමේ අට ළොස් අහෙතුක චිත්තය, මොහ මූලික දෙසිතය යනමේ විසි චිත්තයන් හැර අවශෙෂවූ එකුන්සැත්තෑවක් චිත්තයෙහිද යෙදෙන්නේයයි කියාදතයුතුයි. අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන්ගේ යෙදෙන්නාවූ ක්‍රම සතක් ඇත්තේවෙයි. ඒ සත කවරයත්? සර්වචිත්ත සාධාරණ සත්දෙන සමග ප්‍රකීර්ණක චෛතසිකයන් අතුරෙන් එක එක චෛතසිකය එක එක ආකාරයෙන් යෙදෙනහෙයින් සර්වචිත්ත සාධාරණ සත්දෙනාගේ යෙදීම හා එක්කොටගත්කල්හි සම්ප්‍රයොග ක්‍රම සතක්වන්නේයි. ඒ අන්‍ය සමාන චෛතසිකයන් අතුරෙන් විතර්ක විචාර ප්‍රීතිනු විස්තාර පූර්වව හා යෙදෙන්නාහුයි. එයින් අන්‍යවූ ප්‍රීති ඡන්ද අධිමොක්ෂ යන චෛතසික තුන්දෙන සංක්ෂෙප පූර්වව හා යෙදෙන්නාහුයි. විස්තාර පූර්වය යනු එකසිය විසිඑක් චිත්තයන්ගේ සංඛ්‍යාවයි. මේ චෛතසිකයෝ සදෙන කුමක්හෙයින් එකාකාරව නොයෙදී

දෙආකාරයකින් යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේනම් විතර්ක විචාර ප්‍රීති යන ධර්මයෝ තුන්දෙන ධ්‍යානාඞ්ග කෘත්‍යය සිඬකරන්නාවූ චෛතසිකයන් බැවින් විස්තාර පුඬුව හා යෙදෙත්මැයි. අවශෙෂ චෛතසිකයෝ තුන්දෙන ධ්‍යානාඞ්ගකෘත්‍යය සිඬනොකරන්නාවූ චෛතසික බැවින් සංක්ෂෙප පුඬුව හා යෙදෙත්මැයි. අටළොස් අහෙතුක චිත්තයන් හා යෙදෙන්නාවූ චෛතසිකයෝ කවරහුදැයි දතගණු කැමතිනම් අන්‍ය සමාන තෙලෙස් චෛතසිකයන් අතුරෙන් ඡන්ද චෛතසික මාත්‍රයක් හැර අවශෙෂ දොළොස් චෛතසික ධර්මයෝ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙනබව සැලකියයුත්තාහුය. විතර්ක විචාර අධිමොක්ෂ යන චෛතසිකයෝ තුන්දෙන දෙපස් විඤ්ඤාණයන් හා නොයෙදෙත්මැයි. ඒ දෙපස් විඤ්ඤාණයන් හැර අවශෙෂ චිත්තයන් අතුරෙන් අසවල් චිත්තයෙහි ඒ ධර්මයෝ තුන්දෙන නොයෙදෙන්නාහුයයි නැත්තේයි. “විරිය පීති” යන ධර්මයෝ දෙදෙනවනාහි ඇතැම් චිත්තයෙක්හි නොයෙදෙත්යයි දතයුතුයි. අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් ඡන්ද වර්ජිත දොළොස් චෛතසිකයෝ තුමූ හසිතුප්පාද චිත්තයෙහිම යෙදෙත්මැයි. චෛතසික එකොළොසක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සොම්නස් සහගත සන්තීරණ චිත්තය මනොද්වාරාවර්ජන චිත්තය යන දෙදෙනාමැයි. චෛතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සම්ප්‍රත්‍යෙෂණ යුගලය, අහෙතුක පටිසන්ධි යුගලය, පඤ්චද්වාරාවර්ජන චිත්තය යන සිත් පසයයි දතයුතුයි. චෛතසික නවයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-කුශලාකුශල පක්ෂයෙහි චක්ඛුවිඤ්ඤාණවය, සොතවිඤ්ඤාණවය, ඝාණවිඤ්ඤාණවය, ජිව්හාවිඤ්ඤාණවය, කායවිඤ්ඤාණවය, යන දෙපස් විඤ්ඤාණයෝයි. නොහොත් අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් චෛතසිකයන් සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙක්ද, චෛතසිකයන් දස දසදෙනා යෙදෙන්නාවූ චිත්තයන් පස්දෙනෙක්ද, චෛතසිකයෝ එකොළොස එකොළොස යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙක්ද, දොළොස් චෛතසිකයන් යෙදෙන්නාවූ චිත්තයෙක්දැයි මෙසේ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික සංඛ්‍යාව යථාක්‍රමයෙන් දතයුතුයි.

ඒ අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් දොළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්තය එකමහසිතොත්පාද චිත්තයමැයි. එකොළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්ත

දෙයාකාරයකින් යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේනම් විතර්ක විචාර ප්‍රීති යන ධර්මයෝ තුන්දෙන ධ්‍යානාඞ්ග කෘත්‍යය සිද්ධකරන්නාවූ චෛතසිකයන් බැවින් විස්තාර පුඩුව හා යෙදෙත්මැයි. අවශෙෂ චෛතසිකයෝ තුන්දෙන ධ්‍යානාඞ්ගකෘත්‍යය සිද්ධනොකරන්නාවූ චෛතසික බැවින් සංක්ෂෙප පුඩුව හා යෙදෙත්මැයි. අටළොස් අහෙතුක චිත්තයන් හා යෙදෙන්නාවූ චෛතසිකයෝ කවරහුදැයි දතගණු කැමතිනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන් අතුරෙන් ඡන්ද චෛතසික මාත්‍රයක් හැර අවශෙෂ දොළොස් චෛතසික ධර්මයෝ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙනබව සැලකියයුත්තාහුය. විතර්ක විචාර අධිමොක්ෂ යන චෛතසිකයෝ තුන්දෙන දෙපස් විඥානයන් හා නොයෙදෙත්මැයි. ඒ දෙපස් විඥානයන් හැර අවශෙෂ චිත්තයන් අතුරෙන් අසවල් චිත්තයෙහි ඒ ධර්මයෝ තුන්දෙන නොයෙදෙන්නාහුයයි නැත්තේයි. "විරිය පීති" යන ධර්මයෝ දෙදෙනවනාහි ඇතැම් චිත්තයෙක්හි නොයෙදෙත්යයි දතයුතුයි. අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් ඡන්ද වර්ජිත දොළොස් චෛතසිකයෝ තුමූ හසිතුප්පාද චිත්තයෙහිම යෙදෙත්මැයි. චෛතසික එකොළොසක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:–සොම්නස් සහගත සන්තීරණ චිත්තය මනොද්වාරාවර්ජිත චිත්තය යන දෙදෙනාමැයි. චෛතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:–සම්ප්‍රත්‍යෙෂණ යුගලය, අහෙතුක පටිසන්ධි යුගලය, පඤ්චද්වාරාවර්ජිත චිත්තය යන සිත් පසයයි දතයුතුයි. චෛතසික නවයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:–කුශලාකුශල පක්ෂයෙහි චක්ඛුවිඥානද්වය, ශ්‍රොතවිඥානද්වය, ඝ්‍රාණවිඥානද්වය, ජිව්හාවිඥානද්වය, කායවිඥානද්වය, යන දෙපස් විඥානයෝයි. නොහොත් අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් චෛතසිකයන් සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙක්ද, චෛතසිකයන් දස දසදෙනා යෙදෙන්නාවූ චිත්තයන් පස්දෙනෙක්ද, චෛතසිකයෝ එකොළොස එකොළොස යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙක්ද, දොළොස් චෛතසිකයන් යෙදෙන්නාවූ චිත්තයෙක්දැයි මෙසේ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික සංඛ්‍යාව යථාක්‍රමයෙන් දතයුතුයි.

ඒ අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් දොළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්තය එකම හසිතොත්පාද චිත්තයමැයි. එකොළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්ත

යෝනම්:- සොම්නස් සන්තීරණය, මනොද්වාරාවර්ජනය, යන දෙදෙනායි. චෛතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:- සම්ප්‍රත්‍යෙෂණයුගලය, අහේතුක පටිසන්ධියුගලය, පඤ්චද්වාරාවර්ජනය, යනමේ සිත් පසයි. චෛතසිකයෝ සත්දෙනෙක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:- දෙපස්විඤ්ඤාණ දශදෙනායි. නොහොත් අටළොස් අහේතුක චිත්තයන් අතුරෙන් චෛතසිකයෝ සත්සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙකි. චෛතසිකයෝ දසදසදෙන යෙදෙන්නාවූ චිත්තයෝ පස්දෙනෙකි. එකොළොස් එකොළොස් චෛතසික යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙකි. දොළොස් චෛතසික තෙනෙක් යෙදෙන්නාවූ එක්චිත්තයෙකි. චෛතසිකයෝ සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෙහිවනාහී අන්‍යසමාන තෙළෙස් චෛතසිකයන් අතුරෙන් දෙපස්විඤ්ඤාණ දසයෙහි ප්‍රකීර්ණකයෝ සදෙනම නොයෙදෙන්නාහුවෙති එහෙයින් ප්‍රකීර්ණක සදෙන වර්ජිතකොට ඇත්තාවූ සර්වචිත්ත සාධාරණ සත්දෙන යෙදෙන්නාහුවෙති එනම්:- දෙපස්විඤ්ඤාණ දසදෙනායි. චෛතසික දශය දශය බැගින් යෙදෙන්නාවූ පඤ්ච චිත්තයෝනම්:- සම්ප්‍රත්‍යෙෂණ යුගලය, අහේතුක පටිසන්ධියුගලය, මනොද්වාරාවර්ජන චිත්තය යන පස්දෙනායි. ඒ චෛතසිකයන් දශදෙනාවනාහී ඡන්දවර්ජිතවූ අන්‍යසමාන දොළොස් චෛතසිකයන් අතුරෙන් සම්ප්‍රත්‍යෙෂණ යුගලය, අහේතුක පටිසන්ධි යුගලය, පඤ්චද්වාරාවර්ජනය යනමේ චිත්තයෝ පස්දෙනම උපෙක්ෂා සහගත බැවින් ප්‍රීතියද උද්ධරණය කටයුත්තේයි. එසේම වීර්‍ය්‍ය චෛතසිකයද උද්ධරණය කළකල්හී අවශෙෂවූ චෛතසිකයෝ දසදෙන ලැබෙන්නාහුයි. සොම්නස් සන්තීරණ මනොද්වාරාවර්ජන චිත්තය යන දෙසිතෙහි එකොළොස් චෛතසිකයක් යෙදෙන්නේය යනු සොම්නස් සන්තීරණයවූයේනම් ඡන්දවීර්‍ය්‍ය දෙදෙන උද්ධරණයකළකල්හි අවශෙෂවූ එකොළොස ලැබෙන්නේයි. මනොද්වාරාවර්ජනයවීනම් ඡන්ද ප්‍රීති දෙදෙන උද්ධරණයකොට අවශෙෂවූ එකොළොස ලැබෙන්නේයි. ඒ සොම්නස් සන්තීරණ මනොද්වාරාවර්ජන යන දෙසිත එක්කොටගත් කල්හි කොතෙක් චෛතසික ලැබෙන්නේදැයි යමෙක් ප්‍රශ්නකොළේනම් ප්‍රීති චෛතසිකය මනොද්වාරාවර්ජනය හා නොයෙදෙන්නේ නමුදු සොම්නස් සන්තීරණයෙහි යෙදිය යුතුහෙයින් ඒ සොම්නස් සන්තීරණයෙහි යෙදෙන්නාවූ ප්‍රීතිය ලැබෙනසේද වීර්‍ය්‍ය චෛතසිකය සොම්නස් සන්තීරණයෙහි නොයෙදෙන්නේ නමුදු මනොද්වාරාවර්ජන චිත්තයෙහි යෙදෙනහෙයින් මනොද්වාරාවර්ජනයෙහි යෙදුනාවූ වීර්‍ය්‍ය චෛතසිකය ලැබෙනසේද ඒදෙසිත

එකට සම්බන්ධකොට එකම ඡන්දචෛතසිකය හැර අවශෙෂ දොළ ලැබෙත්යයි කියයුත්තේයි. දොළොස් චෛතසිකයක් ලැබෙන්නාවූ චිත්තය එකමහසිතොත්පාදයමැයි. ඒ දොළස කෙසේ ලැබෙත්ද යත්? අන්‍ය සමාන තෙළෙස් චෛතසික යන් අතුරෙන් එකම ඡන්ද චෛතසිකය හැර අවශෙෂ දොළස ලැබෙත්යයි කියයුත්තේයි. පඤ්චාරාවර්ජන මනොවාරා වර්ජන දෙසිතෙහි යෙදෙන්නාවූ චෛතසිකයෝ කෙතෙක්දැයි ප්‍රශ්නකෙළේවීනම් වීර්‍ය්‍ය චෛතසිකය පඤ්චාරාවර්ජන චිත්ත යෙහි නොයෙදෙන්නේ නමුදු මනොවාරාවර්ජන චිත්තයෙහි යෙදෙනහෙයින් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන් අතු රෙන් ඡන්ද ප්‍රීති දෙදෙන හැර අවශෙෂ එකොළොස් චෛත සිකය ලැබෙත්නේයයි විසඳියයුත්තේයි.

## අටළොස් අහෙතුක චිත්තයෙහි සම්ප්‍රයොග ක්‍රමයයි.

දොළොස් අකුශල චිත්තයෙහි චෛතසිකයන්ගේ යෙදීම කෙසේ යත්? අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය, තුදුස් අකුශල චෛතසිකයයි යනමේ දෙකොටස එක්කලකල්හි ලැබෙ න්නාවූ සත්විසි චෛතසිකය සාමාන්‍යයෙන් දොළොස් අකු ශල චිත්තයෙහි යෙදෙන්නේයයි විසඳියයුත්තේයි. එතකුදුවු වත් ලොභ මූලික චිත්තය, ද්වෙෂ මූලික චිත්තය, මොහ මූලික චිත්තය යනමොවුන් වෙන් වෙන්කොට ප්‍රකාශකෙළේවීනම් ඒ දොළොස් අකුශල චිත්තයන් අතුරෙන් ඇතැම් චිත්තයක යෙදෙනහෙයින් ඒ දොළොස් අකුශල චිත්තයෙහි වෙන්වෙන් වශයෙන් ලැබෙන්නාවූ චෛතසිකයෝ මේ මේයයි විස්තර කටයුත්තාහුය. සියලු දොළොස් අකුශල චිත්තයෙහි සාමාන්‍ය යෙන් ලැබෙන්නාවූ සත්විසි චෛතසිකයන් අතුරෙන් සර්‍ව චිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනාය, ප්‍රීති අධිමොක්ෂ යන තුණ හැර විතර්ක විචාර ප්‍රීති සංඛ්‍යාතවූ ප්‍රකීර්ණක චෛත සිකයන් තුන්දෙනාගේද වශයෙන් අන්‍ය සමාන චෛතසිකයෝ දසදෙනය, තුදුස් අකුශල චෛතසිකයන් අතුරෙන්ද මොහ අහිරික අනොත්තප්ප උද්ධච්ච සංඛ්‍යාතවූ සර්‍වාකුශල සාධාරණ චෛතසිකයෝ සතරදෙනය යනමේ තුදුස් චෛතසිකයන් අතු රෙන් අසවල් චෛතසිකය අසවල් චිත්තයෙහි යෙදෙන්නේද්‍ය හෝයි නොයෙදෙන්නේද්‍යහෝයි සැකනොකටයුත්තේයි.

නොහොත් සියලු අකුශල චිත්තයෙහි යෙදෙන්නාහුයයි දත යුතුයි. අන්‍ය සමාන චෛතසිකයන් අතුරෙන් ඡන්ද ප්‍රීති අධිමොක්ෂ යන තුන්දෙනාය, සර්වාකුශල සාධාරණ චෛතසිකයෝ සතරදෙනාය යන මේ සත්දෙනාගෙන් අන්‍යවූ ලොභදෘෂ්ටිමාන ද්වේෂ ඊර්ෂ්‍යාමාත්සර්ය කුකකුච්ච ථීන මිද්ධ විචිකිච්ඡා යන චෛතසිකයෝ දසදෙනාය යන තෙළෙස් චෛතසිකයෝ අසවල් චිත්තයෙහි යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සෙවියයුත්තේයි. කුමක්හෙයින යත්? ඒ චෛතසිකයෝ අනියත යෝගී බැවිනි. පළමුවෙන් දක්වනලද්දාවූ චෛතසිකයෝ නියත යොගීනම් වෙත්. ලොභ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසිකයෝ කවරහුදැයි විචාලේනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් "ද්වේෂ ඊර්ෂ්‍යාමාත්සර්යකුකකුච්ච විචිකිච්ඡා" යන චෛතසිකයෝ පස්දෙන උගුළුවා අවශෙෂ දෙවිසි චෛතසිකයෝ ලැබෙත්යයි කියයුතුයි. ඒ ලොභ මූලික චිත්තයන් අටදෙනාකෙරෙහි සෞමනස්‍ය උපෙක්ඛාසම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අසඞ්ඛාරික සසඞ්ඛාරික යන්වෙන්කොට විචාලේනම් ලොභ මූලික චිත්තයෙහි ලැබෙන්නාවූ දෙවිසි චෛතසිකය මුල්කොටගෙණ නොලැබියයුතු චෛතසික මේ මේයයි උද්ධරණයකොට විසඳියයුත්තේයි. සොම්නස් සහගත සතරචිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික සඞ්ඛ්‍යාව විචාලේනම් යටකී දෙවිස්ස ලැබෙන්නේයයිකියාද, උපෙක්ෂා සහගත සතර චිත්තය විචාලේනම් යටකී දෙවිසි චෛතසිකයන් අතුරෙන් ප්‍රීතිය පමණක් උද්ධරණයකොට අවශෙෂ එක්විස්ස ලැබෙන්නේයයි කියයුතුයි. සම්ප්‍රයුක්ත සතර විචාලේනම් ඒ දෙවිසි චෛතසිකයන් අතුරෙන් මානචෛතසිකය උද්ධරණයකොට අවශෙෂ එක්විසි චෛතසිකයෝද, විප්‍රයුක්ත සතර විචාලේනම් දෙවිසි චෛතසිකයන් අතුරෙන් දෘෂ්ටිය පමණක් උද්ධරණයකොට අවශෙෂ එක්විස්ස ලැබෙන්නේයයි කියයුතුයි. අසඞ්ඛාරික සතර විචාලේනම් දෙවිසි චෛතසිකයන් අතුරෙන් ථීන මිද්ධ දෙදෙන උද්ධරණයකොට අවශෙෂ විසිචෛතසිකය ලැබෙන්නේයයිද, සසඞ්ඛාරික සතර විචාලේනම් ඒ ථීන මිද්ධ දෙදෙන ප්‍රක්ෂෙප දෙවිස්සම ලැබෙන්නේයයිද කියයුත්තේයි. මේ ලොභ මූලික චිත්තයෙහි සොම්නස හා උපෙක්ෂාවවෙන්කොට ප්‍රශ්නකිරීම ප්‍රීතිය හෙතුකොටගෙණ කරන්නේවෙයි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත භෙදයවෙන්කොට ප්‍රශ්නකිරීම දෘෂ්ටිමාන දෙදෙන හෙතුකොටගෙණවන්නේයි. අසඞ්ඛාරික සසඞ්ඛාරික දෙක වෙන්කොට ප්‍රශ්නකිරීම ථීන මිද්ධ දෙදෙන හෙතුකොට ගෙණවන්නේයි. දෘෂ්ටිසම්ප්‍රයුක්ත චිත්තයෙහි මානය හා මාන

සම්ප්‍රයුක්ත චිත්තයෙහි දෘෂ්ටියද කුමක්හෙයින් නොයෙදෙන් නේද යත්? තරුණවූ කෙසර සිංහ රාජයෝ දෙදෙනෙක් ඔවුනොවුන්ට යටත්නොවනහෙයින්ද එකසමාන බලසම්පන්නහෙයින්ද එකම ගල්ගුහාවෙහි කිසිකලක නොවසත්මැයි. එපරිද්දෙන් මේ දෘෂ්ටිමාන දෙදෙන එකසමාන බලැතිහෙයින් එක චිත්තයෙක්හි නොයෙදෙත්හි දතයුතුයි. ද්වෙෂ මූලික දෙසිතෙහි යෙදෙන්නාවූ චෛතසිකයන් කොතෙක්දැයි ප්‍රශ්නකෙලේවීනම් දෙලොස් අකුශලයන්ට සාධාරණවූ සත්විසි චෛතසිකයන් අතුරෙන් "ප්‍රීති ලොභදිඨිමාන විචිකිච්ඡා" යන චෛතසිකයන් පස්දෙන උඩරණයකොට අවශෙෂ දෙවිසි චෛතසිකයෝ ලැබෙන්නාහුයයි විසඳියයුත්තේයි. ඒ දෙවිසිචෛතසිකයෝද සාමාන්‍යයෙන් ද්වෙෂ මූලික දෙසිතෙහිම යෙදෙන්නාහුයයි දතයුතුයි. ද්වෙෂ මූලික අසඞ්ඛාරික චිත්තයෙහි කොතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙලේවීනම් ථීන මිඩ දෙදෙන උඩරණයකොට අවශෙෂ විසිචෛතසිකයෝ අසඞ්ඛාරික චිත්තයෙහිද, ද්වෙෂ මූලික සසඞ්ඛාරික චිත්තයෙහිම ථීන මිඩදෙදෙන එක්කොට දෙවිස්සමයයි කියයුතුයි. මේ ද්වෙෂ මූලික චිත්තයෙහි අසඞ්ඛාරිකදැයි යන ප්‍රශ්නය ථීන මිඩදෙදෙන හෙතුකොටගෙණමවන්නේයි. මොහ මූලික දෙසිතෙහි යෙදෙන්නාවූ චෛතසිකයෝ කොතෙක්දැයි ප්‍රශ්නකොලේවීනම් යටකී සත්විසි චෛතසිකයන් අතුරෙන් "ඡන්ද පීති ලොභ දිඨිමාන දෙස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච ථීන මිඩ" යන එකොළොස් චෛතසිකයන් උඩරණයකොට අවශෙෂවූ සොළොස් චෛතසිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. ඒ දෙසිත අතුරෙන් විචිකිච්ඡා චිත්තය වෙන්කොට ප්‍රශ්නකෙලේවීනම් සොළොස් චෛතසිකයන් අතුරෙන් අධිමොක්ෂය උඩරණයකොට අවශෙෂ පසළොස් චෛතසිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. උද්ධච්චසහගත චිත්තය ප්‍රශ්නකෙලේවීනම් ඒ සොළොස් චෛතසිකයන් අතුරෙන් විචිකිච්ඡාව උඩරණයකොට අවශෙෂ පසළොස් චෛතසිකයෝ යෙදෙන්නාහුයයි කියයුතුයි. විචිකිච්ඡාව හා උද්ධච්චයද යෙදීමෙන් පසළොස් සඞ්ඛ්‍යාව සමානවේමැයි. සඞ්ඛ්‍යය අසමානවේමැයි. විචිකිච්ඡා චෛතසික තෙමේ විචිකිච්ඡා සහගත චිත්තයෙහිම යෙදෙයි. අධිමොක්ෂය යෙදෙන්නාවූ චිත්තයෙහි විචිකිච්ඡාව නොයෙදෙන්නේමැයි. අධිමොක්ෂ චෛතසික තෙමේ උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදෙන්නේවෙයි. විචිකිච්ඡා සහගත චිත්තයෙහි නොයෙදෙයි. එහෙයින් සංඛ්‍යා සමානනොවන්නේයයි දතයුතුයි. මේ දෙසිත එක්

කොට විචාලේනම් විචිකිච්ඡා චිත්තයෙහි යෙදෙන්නාවූ විචිකිච්ඡාවද උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදෙන්නාවූ අධිමොක්ෂයද ලැබෙන නියාවෙන් සොළොස් චෛතසිකයයි විසඳියයුත්තේයි. ශුද්ධ ලෝභ මූලික චිත්තය, ශුද්ධ දෝස මූලික චිත්තය, ශුද්ධ මෝහ මූලික චිත්තය යන තුන් ප්‍රකාරවූ අකුශල චිත්තය මෙසේ දතයුතුයි. ලෝභ මූලික චිත්තය හා දෝස මූලික චිත්තයද යන මේ දශප්‍රකාරවූ චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් විචිකිච්ඡා චෛතසික මාත්‍රයක් උද්ධරණයකොට අවශෙෂවූ සවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතු. ලෝභ මූලික මෝහමූලික දසචිත්තය එක්කොට කෙතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් "දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච" යන චෛතසිකයෝ සතරදෙන උද්ධරණයකොට අවශෙෂවූ තෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. වෙෂ මූලික මෝහ මූලික සතර චිත්තය එක්කොටගත් කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් "පීති ලෝභ දිට්ඨිමාන" යන සතර චෛතසිකය උද්ධරණයකොට සෙසු තෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. දොළොස් අකුශල චිත්තයම පිඩුකොටගෙණ ඔවුන් අතුරෙහි සොම්නස් සතර චිත්තයෙහි කෙතෙක් චෛතසික යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් "දෝස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා" යන පස උද්ධරණයකොට අවශෙෂ දෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. ඒ දොළොස් චිත්තයන් අතුරෙහි උපෙක්ෂා සහගත සයාකාර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් "පීති දෝස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච" යන පස උද්ධරණයකොට අවශෙෂ දෙවිස්ස ලැබෙන්නේයයි විසඳියයුත්තේයි. දොළොස් චිත්තයන් අතුරෙන් දෘෂ්ටි සම්ප්‍රයුක්ත සතරෙහි කෙතෙක් චෛතසිකයෝලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් එකම මාන චෛතසිකය උද්ධරණයකොට අවශෙෂ සවිස්ස ලැබෙන්නේයයි විසඳියයුතුයි. දොළොස් චිත්තයන් අතුරෙන් අසඞ්ඛාරික පචකයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් ථීන මිද්ධ විචිකිච්ඡා තුන්දෙන උද්ධරණයකොට අවශෙෂ සූවිස්ස ලැබෙන්නේයයි විසඳියයුතුයි. සසඞ්ඛාරික පචකයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් විචිකිච්ඡා චෛතසික මාත්‍රයක් උද්ධරණයකොට සෙසු සවිස්ස

ලැබෙන්නේයයි විසඳියයුතුයි. දොළොස් අකුශල්ය, අටළොස් අහෙතුකය, යන සමතිස් චිත්තය එක්කොටගත්කල්හී ඒසමති සෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේ වීනම් අහෙතුක චිත්තයෙහි ලැබෙන්නාවූ චෛතසිකයෝ අකුශල චිත්තයෙහිද ලැබියයුතුහෙයින් අකුශල චිත්තයට අනුව විසඳියයුතුයි. ලොභ මූලික චිත්තයන් අටදෙන හා අටළොස් අහෙතුක චිත්තය එක්කොටගත්කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් ලොභ මූලික චිත්තයෙහිමෙන් දෙවිසි චෛතසිකයෙකැයි විසඳියයුතුයි. ද්වෙෂ මූලික චිත්තය හා අටළොස් අහෙතුක චිත්තය එක්කොටගත් කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේ වීනම් ද්වෙෂ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ දෙවිස්ස අතුරෙහි සුඛසන්තීරණ හසිතුප්පාද චිත්තයෙහි යෙදියයුතුවූ ප්‍රීතිය උඬරණයකොට දෙවිසි චෛතසිකයෙකැයි විසඳියයුතුයි. මොහ මූලික දෙසිත හා අටළොස් අහෙතුක චිත්තයන් එක්කොටගත්කල්හි කෙතෙක් චෛතසික ධර්මයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේ වීනම් මොහ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ සොළොස් චෛතසිකයන් අතුරෙහි ප්‍රීතිය උඬරණයකොට පසළොසෙකැයි විසඳිය යුත්තේයි.

## මේ අකුශල අහෙතුක චිත්තයෙහි සම්ප්‍රයොග ක්‍රමයයි.

දොළොස් අකුශල චිත්තයන්ගේ උත්පත්තික්‍රමයකෙසේ යත්? “යදූහි නත්ථිකාමෙසු ආදී නවොංත්‍යාදිනා” යනාදීන් ටීකායෙහි ආබැවින් යම්කලෙක්හි පස්කම්සැප විඳීමෙහි දොසක් නැත්තේය යන මිථ්‍යාදිෂ්ඨියෙන් යුක්තව නොහොත් “නත්ථිසුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො” යන නියත මිථ්‍යා දෘෂ්ටියෙන් පෙරළුනාවූ සිත් ඇතිව අනුන් විසින් නොමෙහෙයන ලදුව පූර්වචිත්තය විසින් පසුවහටගන්නාවූ චිත්තයට මෙහෙයුමක් නොලැබ තමාගේ ස්වභාව තීක්ෂණවූ කල්පනාවෙන් යුක්තව කාමසම්පත්තීන්ගේ සම්පූර්ණත්වය හෙතුකොටගෙණ සොම්නසින් යුක්තව රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ සඞ්ඛ්‍යාතවූ පස්කම් සැප අනුභවකිරීමක් හෝ මඞ්ගල සූත්‍රයෙහි වදාලාවූ අටතිස් මඞ්ගල්‍යයන්ගෙන් අන්‍යවූ උදෑසන යහපත් රූපාලම්බනයක් දැකීම යහපත් මඞ්ගල්‍යයෙකැ, අයහපත්වූ

රූපාලම්බනයක් දුකීම අවමඞ්ගල්‍යයෙක, ගමන් බිමන් යාම් ආදියෙහි කිරිදෙනුන් ආදී යහපත් අරමුණු ඉදිරියට සම්භවීම මඞ්ගල්‍යයෙක, මළමිනී ආදී අයහපත් අරමුණු සම්භවීම අවමඞ්ගල්‍යයෙකැයි, යනාදී දිට්ඨමඞ්ගල්‍යයක් හෝ එසේම උදෑසන්හී යහපත් ශබ්ද ඇසීම මඞ්ගල්‍යයෙක, අයහපත් ශබ්ද ඇසීම අවමඞ්ගල්‍යයෙකැයි "යනාදී සුතමඞ්ගල්‍යයක් හෝ, උදෑසන යහපත් සුවඳ මලක් හෝ සුවඳ වර්ගයක් හෝ සිඹීමය, යහපත් අභිනව වස්ත්‍රයක් පැළඳීම කිරි ගිතෙල් ආදිය අනුභව කිරීම, යහපත් මඞ්ගල්‍යයෙකැයි යනාදී මුත මඞ්ගල්‍යයක් හෝ අථර්වණවේදයෙහි ආ නයින් අසවල් වාහනයෙන් යම්සි සිතා යාම් ආදීවූ විස්සුත මඞ්ගලයක් හෝ එපරිද්දෙන් කර්ම විපාකයෙන් තොරව යහපත් නක්ෂත්‍ර මුහුර්තාදිය යහපත් ග්‍රහදසාදිය හෙතුකොටගෙණ මේ මේ සුභ ඵලවෙයි යනාදීන් ගැණීමද, වෙදයෙහි ආ නයින් බලි බිලි ග්‍රහහෝම ග්‍රහශාන්ති ආදියෙන් මෙබඳු මෙබඳු යහපත් විපාක ලැබෙත් යනාදී දෘෂ්ටිගැණීමද, යනමේ ආදී කාලයෙහි සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත පළමුවන අසංස්කාරික චිත්තය උපදනේයි. ඒ චිත්තය උපදනා කල්හිද ජවන් සතකින් යුක්තවූ ජවන් වීථියක්ම උපදනේයි. ඒ ජවන වීථි අතුරෙන්ද අර්ථසාධක නොවන්නාවූ ජවන වීථිහු කර්මවශයෙන්ද, අර්ථ සාධකවූ ජවන වීථිහු කර්මපථවශයෙන්ද, වෙන්වෙන්කොට සැළකියයුතුයි. අර්ථ සාධක නොවන්නාවූ ජවනයන් විසින් පිරිවරාගන්නාලද අර්ථ සාධක ජවන වීථියෙහි ප්‍රථම ජවන චෙතනා සංඛ්‍යාතවූ කර්මය ඉහාත්මයෙහි ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්දෙන්නේයි. සත්වන ජවන සහගතවූ කර්මය අනතුරු අත්බැව්හි පටිසන්ධි ප්‍රවෘර්ති විපාක දෙකම දෙන්නේයි. මධ්‍යයෙහි ජවන පඤ්චකය පිළිබඳවූ කර්මයෝ පස්දෙන සංසාරයෙහි අවකාශ ලැබුනාවූ භවයෙක්හි පටිසන්ධි ප්‍රවෘර්ති විපාකවයම හෝ ප්‍රවෘර්ති විපාක මාත්‍රයක් හෝදෙන්නේයයි දතයුතුයි. මේ පළමුවන අකුශල චිත්තයටකී ක්‍රමය උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තය හැර අවශේෂවූ දශප්‍රකාර අකුශල චිත්තයන්ට හා කාමාවචර කුසල් අටටද යොදාගතයුතුයි. "යදා පන මන්දෙන සමුස්සාහිතෙන චිත්තෙන තදදුතියං" යනු ටීකායෙහි ආ බැවින් පඤ්චකාම සම්පත් අනුභවකිරීමෙහි දෙසක් නැත්තේය යන විපරීත මිථ්‍යාදෘෂ්ටිය කාරණකොටගෙණ අනුන් විසින් හෝ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයුමක් ඇතුවම පඤ්චකාම සම්පත්තීන්ගේ සම්පූර්ණත්වය හෙතුකොටගෙණ සොම්නසින් යුක්තව පස්කම් සැප විඳින්නේහෝවේද, ඉටකී දිඨ

මඛගලාදිය සාරවශයෙන් හෝ ගණිද, එකල්හි දෙවෙනි සසංඛාරිකවූ අකුශල චිත්තය යටකී පරිච්ඡෙදන් උපදනේයි. "යදාපන මිච්ඡා දිට්ඨිං අපුරක්ඛිත්වා" යනාදිය ටීකායෙහි ආ බැවින් යම් කලෙක්හි පඤ්චකාම සම්පත් අනුභවකිරීම් ආදිය සදොස්යයි දැන දැනම් අනුන්ගෙන් හෝ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයුම් රහිතව තමාගේ ස්වභාව තීක්ෂණවූ කල්පනාවෙන්ම කාමසම්පත්ත්‍යාදීන්ගේ සම්පූර්ණත්වය හෙතුකොටගෙණ මෛථුන සෙවනයකෙරේද, අනුන්ගේ සම්පත් ආදියට ලොභ උපදවාද, අනුන්ගේ සම්පත්තිය පැහැරගන්නේවේද, එකල්හී සොම්නස් සහගත දිට්ඨිගත විප්‍රයුක්ත තුන්වෙනි අකුශල චිත්ත වීථිය උපදනේයි. "යදාපන මනෙදන සමුස්සාහිතෙන" යනාදීයකී බැවින් යම්කලෙක්හී පස්කම් සැප අනුභවකිරීම් ආදිය සදොස්යයි දැන දැනම අනුන් විසින් හෝ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයුම් ඇතුව පඤ්චකාම සම්පත්ත්‍යාදීන්ගේ සම්පූර්ණත්වය හෙතුකොටගෙණ සොම්නසින් යුක්තව මෙවුම්දම්සෙවීමද, අන් සැපත් අභිධ්‍යාකෙරේද, අන් සැපත් පැහැරගණිද, එකල්හී සොම්නස් සහගත දිට්ඨිවිප්‍රයුක්ත සතරවන අකුශල චිත්තය උපදනේයි. "යදාපන කාමානං අසම්පත්තිං ආගමම" යනාදිය ආ බැවින් යම්කලෙක්හි පඤ්චකාම සම්පත් අනුභවකිරීම් ආදියෙහි දොසක් නැතැයි යන මිථ්‍යාදෘෂ්ටිය කරණකොටගෙණ අනුන්ගෙන් හෝ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයුම් නොලැබ පඤ්චකාම සම්පත්ත්‍යාදීන්ගේ අපරිපූර්ණත්වය හෙතුකොටගෙණ මධ්‍යස්ථකල්පනාවෙන් යුක්තව පස්කම් සැපවිඳින්නේහෝවේද, මූලචිත්තයෙහිකී දිට්ඨමඞ්ගලාදිය හෝ සාරවශයෙන්ගණිද එකල්හී පස්වෙනි අකුශල චිත්තය උපදනේයි. එසේම මධ්‍යස්ථකල්පනාවෙන් යුක්තව අනුන්ගේ හෝ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයු ලැබ යටකී නයින් මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තව පස්කම් සැප හෝ විඳීද දිට්ඨමඞ්ගලාදිය හෝ සාරවශයෙන්ගණිද, එකල්හි සවෙනි සසංඛාරික අකුශල චිත්තය උපදනේයි. යම්කාලෙක්හි පඤ්චකාම සම්පත් අනුභවකිරීම සාවද්‍යයයි දැන දැනම් අනුන්ගෙන් හෝ තමාගේ පූර්ව චිත්තයකින් හෝ මෙහෙයුම් නොලැබ පඤ්චකාමසම්පත්ති ආදීන්ගේ අසම්පූර්ණත්වය හෙතුකොටගෙණ මධ්‍යස්ථ කල්පනාවෙන් යුක්තව මෛථුනසෙවනය හෝ කෙරේද අනුන්ගේ සම්පත්තියට ලෝභ හෝ කෙරේද, අනුන් සන්තක වස්තුව පැහැර ගැණීම හෝ කෙරේද, එකල්හි සත්වෙනි අකුශල චිත්තය උපදනේයි. යම් කාලෙක්හී එම අකුශල කර්මයෝ අනුන්ගේ මෙහෙයුමෙන් හෝ තමාගේ පූර්වචිත්තයකින් ලැබූ මෙහෙයුම

කින් හෝ කරන්නේවීනම් එකල්හි දිට්ඨිගත විප්‍රයුක්ත අට වෙනි සසඞ්ඛාරිකවූ අකුශල චිත්තය උපදනේය. මේ ලොභ මූලික චිත්තය තෙමේ සොම්නස් සහගත සතරය, උපෙක්‍ෂාසහ ගත සතරයයි අටවැදෑරුම්වන්නේ නමුදු ගුණිත සඞ්ඛ්‍යාවෙන් වැඩිකළකල්හි අනෙක ප්‍රකාරවන්නේයි. ගුණිත සඞ්ඛ්‍යාවෝනම් අදින්නාදානය කාමෙසුමිච්ඡාචාරය, මුසාවාදය පිසුනවචනය සම්ඵ පලාපය, අභිජ්ඣාය මිච්ඡාදිට්ඨිය යනමේ අකුශල කර්මපථ සතින් ලොභ මූලික සිත් අට ගුණිතකළකල්හි සපණස් සිත් කෙනෙක් වෙත්. ඒසපණස් චිත්තය අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙන් ගුණිතකළකල්හි එක්සියඅටසැට අකුශල චිත්තයක් ලැබෙන්නේයි. ඒ එක්සිය අටසැට චිත්තය රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන සාරමුණෙන් ගුණිතකළකල්හි එක්දහස් අටක්වෙයි. ඒ එක්දහස් අටක් චිත්තය අධ්‍යාත්මසන්තානය බහිද්ධාසන්තානය යනදෙකින් ගුණිතකළකල්හි සොළසක් අධිකවූ දෙදහසක් චිත්තයෝවෙති. ඒ දෙදහස් සොළසක් ප්‍රභෙදවූ ලොභ මූලික චිත්තය නගර ජනපදාදියෙහි වාසීන්ගේවශයෙන් ගුණිත කළකල්හි අනන්තාප්‍රමාණවන්නේයි.

## ලොභ මූලික අකුශල චිත්තයන්ගේ විශෙෂ විභාගයයි,

“චිත්තං පනතෙසං චිත්තානං පාණාතිපාතාදිසු තික්ඛමන්දප්පවත්තිකාලෙ උප්පත්ති වෙදිතබ්බා” යනාදිය ටීකාවෙහි ආ බැවින් අතිශට අරමුණක් දක්නාවූකල්හි අනුන්ගේ මෙහෙයීමක් හෝ පූර්වභාග චිත්තයකින් මෙහෙයුමක් හෝ නොලැබ තමාගේ තීක්‍ෂණ චිත්තයෙන්ම පාණාතිපාතාදීවූ දුශ්චරිතයන් කරන්නාවූකල්හි නොහොත් නපුරු වචන කියනකල්හි නපුරු අදහස් උපදවනකල්හි දොම්නස්ස සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික පළමුවන චිත්තය උපදී. එපරිද්දෙන්ම අනුන්ගේ මෙහෙයුමක් ඇතුව හෝ තමාගේ පූර්වභාග චිත්තයකින් රුකුල් ලැබීමෙන් හෝ දොම්නස්ස සහගත පටිඝසම්පයුත්ත අකුශල චිත්තය උපදී. “යංකිඤ්චි අනිට්ඨාලම්බනං නවවිධ ආඝාතවත්ථූනිච දොමනස්සස්සකාරණං පටිඝස්සකාරණමොතිදට්ඨබ්බං” යනු ටීකා වචන බැවින් මේ දොම්නස් වෙදනා පටිඝසඞ්ඛ්‍යාතවූ දෙවැදෑරුම් ධර්මයන්ගේ ඉපදීමට හෙතුව නොකැමති අරමුණක්ලැබීම හා නවවිධ ආඝාත වස්තූවයි. මේ දොම්නස් පටිඝ දෙදෙනාගේ

ඉපදීම එකම හෙතුවකින් වන්නේනම් දෞම්නස හෝ පටිඝය දක්වීමෙන් අභිමතාර්ථය ලැබෙන්නේ නොවේද, කුමක්හෙයින් දෞම්නස ලැබෙන්නේයයි කීසේක්ද යත්? සෙසු චිත්තයන්ගේ වෙදනා භෙදය පළමුකොට දක්වූහෙයින් මේ චිත්තයන් දෙදෙනාගේ වෙදනා භෙදය දක්වීමට එකාන්ත සහචාරිත්වය දක්වීම පිණිසද දෞම්නස්ස පටිඝදෙකින්ම වෙසෙසා දක්වනලද්දේයයි දතයුත්තේයි. ඒ ද්වෙෂ මූලික චිත්තය වනාහි විප්‍රකාරවන්නේ නමුදු ගුණිත සඞ්ඛ්‍යාවෙන්ගත්කල්හි අනෙක ප්‍රකාරවන්නේය. ඒ කෙසේ යත්? ප්‍රාණාතිපාත ඵරුසාවාච ව්‍යාපාද යන කර්‍මපථ තුණ හා අදින්නාදාන මුසාවාද පිසුණාවාච සම්ඵප්පලාප යන සතර කර්‍ම පථයෙහිදැයි යන සප්තාකුශල කර්‍ම පථයෙහි පවත්නාහෙයින් මේ දෙසින තුදුස් ප්‍රකාරවන්නේයි. ඒ තුදුස් ප්‍රකාර ද්වෙෂ මූලික චිත්තය කාලත්‍රයෙන් ගිණූකල්හි දෙසාළිස් චිත්තකෙනෙක්වෙත්. ඒ දෙසාළිස් චිත්තයෝ තුමූ සඅළලම්බණයෙන් ගුණිතකළකල්හි දෙසිය දෙපණසෙක්වෙත්. ඒ දෙසිය දෙපණස් චිත්තයෝ තුමූ අධ්‍යාත්මබහිර්ධා යන සන්තානවශයෙන් ගුණිතකළකල්හි පන්සිය සතරෙක්වෙති. ඒ පන්සිය සතරක් ප්‍රභෙද ද්වෙෂ මූලික චිත්තයෝ නගර ජනපදාදියෙහි වාසීන්ගේ වශයෙන් ගුණිතකළකල්හි අනන්තාපරිමාණවෙයි. මේ ද්වෙෂ මූලික චිත්තය වනාහි ප්‍රාණාතිපාත ඵරුසාවාච ව්‍යාපාදයන කර්‍මපථත්‍රයෙහි අනිෂ්ටාලම්බණ ආඝාත වස්තු හෙතුකොට ගෙණ උපදනාහුවෙත්නම් කුකුළෙකු මරා මස් අනුභවකරණු කැමතිකල්හි ඒ කුකුලා අනිෂ්ටාලම්බණවන්නේ කෙසේද? නවවිධ ආඝාත වස්තූන්ගෙන් කවර ආඝාත වස්තුවක් ඒ කුකුලා කෙරෙහි ලැබෙන්නේදැයි ප්‍රශ්නකටයුතුවෙයි. කුකුට මාංශයෙහි ලොභ සහගත ජවන වීථියක් උපන්කල්හි ඒ මාංශය ලබාගැණීම වලක්වන්නාවූ සතුරානම් ඔහුගේ ජීවිතෙන්ද්‍රියයයි. එහෙයින් ඔහුගේ ජීවිතෙන්ද්‍රියය අනිෂ්ටාලම්බණවෙයි. "අනත්ථං මෙ අචරි" යන ආඝාත වස්තුවෙහිත් දක්නාලැබෙයි. එහෙයින් මස් කන පිණිස සත්ව ඝාතනය කරන්නවුන්ට උපදනා ප්‍රතිඝ සම්ප්‍රයුක්ත චිත්තය ලොභ පච්චය ද්වෙෂ මූලික චිත්තයයි දතයුතුයි. අදින්නාදාන මුසාවාද පිසුනාවාච සම්ඵප්‍රලාප යන අකුශල කර්‍ම පථ සතර ද්වෙෂ මූලික චිත්තයෙන් කෙසේ හටගන්නේද යත්? තමාගේ සතුරාගේ පිටු දක්වම්හයි සිතා ඔහුට අලාභ කරණ අදහසින් ඔහු සන්තක දේ පැහැරගැණීම ද්වෙෂ මූලික චිත්තයෙන්වේ. එසේම සතුරාට විරුඬව අධිකරණ සභාවෙහි බොරු සාක්ෂිකීමද, සතුරා කෙරෙහි මිත්‍රයන් බිඳවන පිණිස

කේලාම්කීමද, සතුරුට අලාභකරණ පිණිස හෝ නින්දාකරණ පිණිස සම්ඵප්‍රලාප කීණිමද ද්වෙෂ මූලික චිත්තයෙන් හටගන්නේය. මොහ මූලික දෙසිතෙහි වනාහි "ඡසු ආරම්මණෙසු වේදනා වසෙන මජ්ඣත්තසසකබ්බා පවත්ති කාලෙ උප්පජ්ජති" යනාදිය අර්ථශාලිනී අර්ථකථාවෙහි ආ බැවින් යම්කලක මධ්‍යස්ථ කල්පනාවෙන් රූපාදී සාරමුණෙහි සැකය පවත්නේවේද එකල්හි උපෙක්ෂා සහගත විචිකිච්ඡා චිත්තය වන්නේයයි දතයුතුයි. "ඉදං චිත්තං ඡසු ආරම්මණෙසු වෙදනාදිවසෙන මජ්ඣත්තං හුත්වා උද්ධතං හොති" යනු අර්ථශාලිනී අටුවා බැවින් යම් කලෙක්හී මධ්‍යස්ථ කල්පනාවෙන් යුක්තව රූපාදි සාරමුණෙහි පිහිටියහැකිවූ චංචලවූ සිත් ඇත්තේවේද එකල්හී උපෙක්ෂා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තය උපදනේයයි දතයුතුයි. ඒ මොහ මූලික චිත්තය වනාහි විප්‍රකාරවූයේ තමුදු ගුණිත සංඛ්‍යාවන්ගේ වශයෙන් අනෙක ප්‍රකාරවන්නේයි. ඒ කෙසේ ගුණිත කරන්නේද යත්? දශඅකුශල කර්ම පථයන්ගේ වශයෙන් මොහ මූලික දෙසිත ගුණිතකල්හි විස්සෙක්වෙයි. ඒ විසිචිත්තය කාලත්‍රයෙන් ගුණිතකළකල්හී සැටෙක්වෙයි. ඒ සැට ෂඩාලම්බණයෙන් ගුණිතකළකල්හි තුන්සිය සැටක්වෙයි. ඒතුන්සියසැටක් චිත්තයෝ සන්තානවශයෙන් ගුණිතකළකල්හි සත්සිය විස්සෙක්වෙයි. ඒසත්සියවිසි චිත්තයෝ නගර ජනපදාදියෙහි වසන්නවුන්ගේවශයෙන් අනන්තාප්‍රමාණවන්නේයි. මේ සත්සියවිසි චිත්තයන් අතුරෙන් තුන්සිය සැටක් චිත්තයෝ සතර අපායෙහි පටිසන්ධි ප්‍රවෘර්ති විපාක හා සුගතියෙහි ප්‍රවෘර්ති විපාක මාත්‍රයක් දෙන්නාහුවෙත්. අවශෙෂ තුන්සියසැට චිත්තයෝ තුමූ පටිසන්ධි විපාකදීමෙහි පොහොසත්වෙති. සුගති දුගති දෙක්හිම අහෙතුක ප්‍රවෘර්ති විපාක මාත්‍රයක් දෙන්නාහුවෙත්. මේදොළොස් අකුශල චිත්තයන් අතුරෙන් ලොභ මූලික සිත් අටවනාහි ලොභ මොහ සංඛ්‍යාතවූ හෙතුවයක් නොහොත් දෙමූලයක් ඇත්තේවෙයි. ද්වෙෂ මූලික දෙසිතවනාහි ද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත හෙතුවයක් නොහොත් දෙමූලයක් ඇත්තේයි. මොහ මූලික දෙසිත වනාහි මොහ සඞ්ඛ්‍යාත එක මූලයක් නොහොත් හෙතුවක් ඇත්තේවේ. ලොභ මූලික සිත් උපදනාකල්හී ඒ පුද්ගලයාගේ මුඛාදී අවයවයෝ විලිකුන් තුග ඵලමෙන් රක්ත වර්ණ ඇත්තේවෙයි. ද්වෙෂ මූලික සිත් උපදනාහුගේ මුඛාදී අවයවයෝ විලිකුන් දඹ ඵලමෙන් අතිශයින් කාළවර්ණ ඇත්තේයි. මොහ මූලික සිත් උපදිනාහුගේ මුඛාදී අවයවයෝ තලතෙලෙහි ඇත්තාවූ වර්ණයට බඳු පැහැයක් ඇත්තේයි. මෙසේ ඒ ඒ සිත් උපදින අවස්ථාව මුඛ වර්ණාදිය බලාදතයුත්තේයි.

# මේ දෙළොස් අකුශලයන්ගේ සංක්ෂේප ලක්ෂණයයි.

අටලොස් අහෙතුක චිත්තයන් අතුරෙන් අකුශල විපාකයෝ සත්දෙන එක එක අකුශලයෙහි විපාකවශයෙන් ලැබෙන්නේයි. ඒ කෙසේ ලැබෙන්නේද යත්? සොම්නස් සහගත දිඨිසම්ප්‍රයුක්ත පළමුවන අකුශල චිත්තයෙන් යම් කර්ම සිඩියක් වූයේනම් ඒ අකුශල චිත්තය සතර අපායෙහි පටිසන්ධි ප්‍රවෘර්ති විපාකවශයෙන්ද, සුගතියෙහි ප්‍රවෘර්ති විපාක වශයෙන්ද පවත්නේයි. ඒ කෙසේ පවත්නේද යත්? සප්තාකුශල විපාකයන් අතුරෙන් උපෙක්ඛා සහගත අකුශල විපාක සන්තීරණ චිත්තය, යථොක්ත අකුශල චිත්තයාගේ නානාක්ෂණික කර්මප්‍රත්‍යය ලැබීමෙන් සතර අපායෙහි පටිසන්ධිවශයෙන් පවත්නේයි. ඉක්බිති ඒ අපායෙහි යමපල්ලන් ගිනිදැල් ආදී අනිෂ්ටවූ රූපාලම්බණ දුටුකල්හි චක්ඛුද්වාරයෙහි චක්ඛු විඥාන විපාක වශයෙන් චක්ඛු විඥාන චිත්තයද ඊට අනතුරුව ඒ අරමුණු පිළිගැණීම්වශයෙන් අකුශල විපාක සම්පටිච්ඡන චිත්තයද, ඊට අනතුරුව ඒ අරමුණු තීරණයකරගැණීම් වශයෙන් පළමු පටිසන්ධිය දුන් සන්තීරණ චිත්තයම සන්තීරණ කෘත්‍යයවශයෙන්ද උපදී. එසේම යමපල්ලන් විසින් කියන්නාවූ "තලව මරව" යනාදී නොයෙක් රළු පරුෂ වචන ඇසූකල්හි අකුශල විපාක සොත විඥානය හා අවශෙෂ චිත්තයෝද එසේම තිරිසතුන්ගේ හිස පැලී යනතරම් නපුරුවූ දුර්ගන්ධය ආඝ්‍රාණයකළකල්හි අකුශල විපාක ඝ්‍රාණ විඥානය හා සෙසු චිත්තයෝද, එසේම යමපල්ලන් විසින් ඒ නරකයෙහි උපන් සත්වයා උඩුකුරුව හොවා අයොමය අඬුවෙන් මුඛය විවෘතකොට ගිනිගෙණ දිලියෙන්නාවූ ලොහොදිය ලොහො ගුලි ආදිය ගිල්වන්නාවූකල්හි අකුශල විපාකවූ ජිහ්වා විඥානය හා සෙසු චිත්තයෝද, එසේම නරකයෙහි උපන් සත්වයා ගිනිගෙණ දලියෙන්නාවූ අයොමය භූමියෙහි හොවා සතරැස්කොට අටැස්කොට සොළසැස්කොට සසින්නාවූකල්හිද, ගිණිගෙණ දිලිහෙන්නාවූ අයොමය රථයෙහි යොදා අඞ්ගාර පර්වතයට කටුසැමිටියෙන් තලතලා නන්වන්නාවූකල්හි අකුශල විපාක දුක්ඛ සහගත කායවිඥාන චිත්තයහා අවශෙෂ චිත්තයෝද චක්ඛුවිඥානයට කීකයින් උපදනාහුය. මේ සප්තාකුශල විපාක විඥානයන් අතුරෙන් චක්ඛුවිඥානය කුමක් නිශ්‍රයකොටගෙණ පවත්නේදයත්? සසුඥාරව චක්ඛු

ප්‍රසාදචක්ඛු යන ද්විප්‍රකාර චක්ෂුන් අතුරෙන් ප්‍රසාදචක්ෂුස නිශ්‍රයකොටගෙණ පවත්නේයි. සසම්භාර චක්ෂුය යනු ලෝකයා විසින් අක්ෂි ගෝලයයි ව්‍යවහාරකරණු ලබන්නාවූ මාංශ පිණ්ඩ යයි. ප්‍රසාදචක්ෂුය යනු යටගිය ජාතියෙහි රූප තෘෂ්ණාව කාරණකොටගෙණ රැස්කළාවූ රූප දක්නා සංඛ්‍යාත කාමාවචර කුශල බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද තෛලය ශ්වෙත මණ්ඩලයෙන් වටකරණලද්දාවූ කෘෂ්ණමණ්ඩලය මධ්‍යයෙහි ඒ ඒ පිට පිහිටියාවූ ඇස් පටල සතෙහි කපුපුළුන් පටල සතක් තබා වත්කළාවූ තලතෙලක්මෙන් අක්ෂිපටල සතෙහි පැතිරපවත්නේයි. මනුෂ්‍යයාගේ චක්ෂුප්‍රසාද රූපය ගුලිකොටගත්කල්හි උකුණු හිසක් ප්‍රමාණවන්නේයි. ඒ චක්ෂු ප්‍රසාදයට අභිමුඛයෙහි යම් රූපාරම්මණක් වැටුනුකල්හි ඒප්‍රසා දය නිශ්‍රයකොටගෙණ හටගන්නාවූ චක්ෂුර්විඥාන චිත්තයෙන් ඒ රූපයදක්නේවෙයි. ඒචක්ෂු ප්‍රසාද රූපයෙහි සාමාන්‍යයෙන් ක්ෂුද්‍රාෂ්ටක රූපය හා චක්ෂුප්‍රසාද ජීවිතෙන්ද්‍රිය සඞ්ඛ්‍යාතවූ රූප දශයකින් යුක්තවූ මිටියක්ව පවත්නේයි. ශෝත්‍රවිඥානය කුමක් නිශ්‍රයකොටගෙණ පවත්නේද යත්? සසම්භාර ශ්‍රොත බිලයාගේ අභ්‍යන්තරයෙහි තුනීවූ තඹවන් රෝමයෙන් ගැවසී ගත්තාවූ ඇඟිලි මුදුවකට බඳු සටහන් ඇත්තාවූ වස්තුවෙහි පූර්ව ජාතියෙහි ශබ්ද තෘෂ්ණාව කාරණකොටගෙණ දුන්නාවූ සද්ද දානමය කුශලකර්මබලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහා භූත යන්ගේ ප්‍රසාද සංඛ්‍යාතවූ තෙල්ගතිය පැතිරපවත්නේයි. ඒ ප්‍රසාදය නිශ්‍රයකොටගෙණ හටගන්නාවූ ශ්‍රොත්‍ර විඥානයෙන් ශබ්දය දැනගණී. ඒ ශ්‍රොත්‍රප්‍රසාදයෙහිද ක්ෂුද්‍රාෂ්ටක රූපය හා ශ්‍රොත්‍රප්‍රසාදය ජීවිතෙන්ද්‍රියය යන රූප දශයකින් යුක්තවූ කලා පයක්ව පවත්නේයි. ඝ්‍රාණ විඥානය කුමක් ආශ්‍රයකොටගෙණ පවත්නේද යත්? සසම්භාර ඝ්‍රාණබිලය ඇතුලෙහි එළුකුරයකට බඳු සටහන් ඇති ස්ථානයෙහි පූර්වජාතියෙහි ගන්ධතෘෂ්ණාව කාර ණකොටගෙණ දුන්නාවූ ගන්ධ දානමය කුශල කර්මබලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද තෙල්ගතිය පැතිර පවත්නේයි. යම් සුගන්ධ දුර්ගන්ධයක් හැපුණුකල්හි ඒ ඝ්‍රාණ ප්‍රසා දය නිශ්‍රයකොටගෙණ උපදනා ඝ්‍රාණවිඥාන චිත්තයෙන් ඒ ආර ම්මණ දැනගනී. ක්ෂුද්‍රාෂ්ටක රූපය හා ඝ්‍රාණ ප්‍රසාදය ජීවිතෙන්ද්‍රිය යන රූප දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේයි. ජිව්හා විඥානයට කුමක් නිශ්‍රයස්ථානවන්නේද යත්? සසම්භාර ජිව්හා මධ්‍යයාගේ මුදුනෙහි උපුල්මල් පෙති අගක් බඳුවූ සටහන් ඇති ස්ථානයෙහි යටගිය ජාතියෙහි රසතෘෂ්ණාව කාරණකොට

ගෙණ දෙනලද්දාවූ රසදනයන්ගේ කුශල කම්බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද සඞ්ඛ්‍යාතවූ තෙල් ගතිය පැතිරපවත්නේයි. යම් රසයක් එහි ගැටුනුකල්හි ඒ නිශ්‍රයකොටගෙණ උපදනා ජිව්හා විඥ්ඥාණයෙන් රසාරමුණු හැඳිනගණී. ක්‍ෂුද්‍රාෂ්ටක රූපය හා ජිහ්වාප්‍රසාදය ජීවිතෙන්ද්‍රියය යන දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේයි. කාය විඥ්ඥාණය කුමක් ආශ්‍රයකොටගෙණ පවත්නේද යත්? ව්‍යාම ප්‍රමාණවූ මේ සසම්භාර කාය සඞ්ඛ්‍යාතවූ ශරීරයෙහි කෙසාග්‍ර ලොමාග්‍ර නඛාග්‍ර ශුෂ්ක චර්ම ජර්රාග්නිය යන පස්තැන හැර අවශෙෂ සකල ශරීරයෙහි ඇතුලතහිද පිටතහිද යන සියලු තන්හි යට ගිය ජාතියෙහි ඓාඨබ්බ තණ්හාව කාරණාකොට ඇත්තාවූ ස්පර්ශදනමය කුශල සාම්බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද සඞ්ඛ්‍යාතවූ තෙල්ගතිය පැතිර පවත්නේයි. යම් ස්පර්ශයක් එහි ගැටුනුකල්හි ඒ ස්පර්ශය දනගන්නා දුක්ඛ සහගත කා යවිඥ්ඥාණ චිත්තය උපදී. ක්‍ෂුද්‍රාෂ්ටක රූපය කාය ප්‍රසාදය ජීවිතෙන්ද්‍රියය යන දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේයි. මේ පඤ්චප්‍රසාදයෙහි පඤ්චාලම්බණයන් ගැටුනුකල්හි පඤ්චවිඥ්ඥාණයන්ගේ ඉපදීමට උපමා කාවර යත්? යම් බෙර යෙක්හි කඩිපුවෙන් පහර දුන්කල්හි එයින් නික්මෙන්නාවූ ශබ්දයමෙනි. ප්‍රසාද රූපය බෙර ඇසමෙන්ද, රූපාදී අරමුණු හැපීම කඩිප්පුවකින් පහරදීමක්මෙන්ද ඒ ප්‍රසාද ආලම්බණයන්ගේ ගැටීමෙන් හටගන්නාවූ පඤ්චවිඥ්ඥාණය බෙරයෙන් නික්මෙන්නාවූ ශබ්දයමෙන්ද දතයුතුයි නොහොත් ගිනිගානා දඬු දෙකක් එකට ගැටීමෙන් හටගන්නාවූ ගින්නක්මෙනි. පඤ්ච ප්‍රසාද පඤ්චාලම්බණයෝ උඩු යටි ගිනිගානා දඬුදෙකක්මෙන්ද ප්‍රසාද ආලම්බණයන්ගේ ගැටීම ගිනිගානා දඬුදෙක එකට ගැටීමක්මෙන්ද, ඒ ගැටීමෙන් හටගන්නාවූ ගින්නක්මෙන් පඤ්ච විඥ්ඥාණයන්ගේ හටගැණීමද දතයුත්තේයි. තවද මේ පඤ්ච ප්‍රසාද රූපයෝ පස්දෙන ශක්තිමත් ශරීරාවයව ඇත්තාවූ අන්ධයන් පස්දෙනෙක්මෙන්ද, ඒ පඤ්චප්‍රසාදයන් නිසා පවත්නාවූ විඥ්ඥාණයෝ පස්දෙන ඇස් ඇත්තාවූ පිළුන් පස්දෙනෙකු මෙන්ද, දතයුත්තාහුය. ඇස් ඇත්තාවූ පිලු තෙමේ ශක්ති සම්පන්නවූ අන්ධයා පිට නැගිකල්හි ඒ පිලිහුගේ මාර්ගදෙශකත්ව යෙන් අභිමත ස්ථානයට දෙදෙනාම පැමිණෙන්නාක්මෙන් අන්ධවූ පඤ්චප්‍රසාද රූපයන් ආශ්‍රයකොටගෙණ පඤ්චවිඥ්ඥාණ යන්ගේ පැවැත්මවනහෙයින් අභිමත ස්ථානයට පැමිණීමක් මෙන් පඤ්චවිඥ්ඥාණයෝ අරමුණු හැඳිනගණිති.

## මේ අන්ධ පංගුලන්‍යායයි.

පඤ්චවිඤ්ඤාණයන් කාරණකොටගෙණ ගන්නාලද්දාවූ රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ යන පඤ්චාලම්බණය පිළිගැණීම්වශයෙන් උපදනා චිත්තය සම්පටිච්ඡන චිත්තනම්වෙයි. සම්පටිච්ඡන චිත්තය විසින් පිළිගන්නාලද අරමුණු තීරණයකරගැණීම් වශයෙන් උපදනා චිත්තය සන්තීරණ චිත්තනම්වෙයි. නොකැමැතිවූ රූපාදී අරමුණු පඤ්ච හමුවූකල්හී අකුශල විපාකවූ චක්ඛුසොත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණයෝද අකුසල විපාකවූ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝද උපදිත්. උද්ධච්ච සම්ප්‍රයුක්ත මොහමූලික චිත්තය හැර අවශෙෂවූ එකොළොස් අකුශල චිත්තය විසින් සතර අපායෙහි පටිසන්ධිදෙන්නාවූකල්හී මේ අකුශල විපාක සන්තීරණ චිත්තය පටිසන්ධිවශයෙන්ද ඒ භවයෙහිවසනතාක්කල් භවාඞ්ගවශයෙන්ද ඒ භවයෙන් චුතවන්නාවූකල්හී චුතිවශයෙන්ද, එම සන්තීරණ චිත්තයම පවත්නේය. ප්‍රවෘත්ති කාලයෙහි දොළොස් අකුශලයන්ගේම විපාකවශයෙන් සප්ත අකුශල විපාකයෝ සුදුසු පරිද්දෙන් උපදිත්. සප්තකාම ස්වර්ගයෙහි ඒ අකුශල විපාකයෝ සත්දෙන අපරාපර්‍ය්‍ය වේද්‍ය අකුශල කර්මබලයෙන් පවත්නේයි. අසංඥතලය හැර අවශෙෂවූ පසළොස් රූප භූමියෙහි අපරාපරිය වේද්‍ය අකුශල කර්මයන්ගේ වශයෙන් මිනිස්ලොව බලන්නාවූකල්හි හෝ මිනිස් ලොවට පැමිණිකල්හි හෝ අකුශල විපාක චක්ඛු විඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ විපාකයෝ සතරදෙන උපදිත්. යහපත්වූ ඉෂ්ටාලම්බණයන් වැටහුනුකල්හී කුශල විපාක චක්ෂුර්විඥානාදී විපාකයෝ අටදෙන උපදිත්. පඤ්චද්වාරාවර්ජන චිත්තය යනු චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ රූපාදී අරමුණු ගැටුණුකල්හි ඒ අරමුණු ආවර්ජනාකිරීම්වශයෙන් උපදනා චිත්තයයි. ක්‍රියා මනොධාතු චිත්තයයි. මනොද්වාරාවර්ජිතය යනු එකුන් විසිභවාඞ්ග සඞ්ඛ්‍යාතවූ මනොද්වාරයෙහි දිට්ඨසුත මුත විඤ්ඤාතවශයෙන් පඤ්චද්වාරයෙන්ගන්නාලද අරමුණු ආවර්ජනාකරන්නාවූ මනොවිඤ්ඤාණ ධාතුචිත්තයයි. හසිතුප්පාදචිත්තය යනු අනොළාරික අරමුණෙහි රහතුන්ට සිනා පහළකිරීම් වශයෙන් උපදනා චිත්තයයි.

## අටළොස් අහෙතුක චිත්තයන්ගේ විභාගයනිමි.

එකුන් සැටක් ශොභන චිත්තයෙහි චෛතසිකයන්ගේ යෙදීම කෙසේ යත්? අන්‍ය සමාන තෙළෙස් චෛතසිකය ශොභන චෛතසිකයෝ පස්විසිදෙනාය යනමේ අටතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. ඒ ශොභන සිත් එක එකක් පාසා කෙතෙක් චෛතසිකයන් ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවී නම් ඒ අටතිස් චෛතසිකය තබා එක එක චිත්තයෙහි නොයෙදෙන්නාවූ ධර්‍ම මේ මේයයි දැන සුදුසු පරිද්දෙන් විසඳියයුතුයි. මේ ශොභන චිත්තයෙහි යෙදියයුතුවූද නොයෙදියයුතුවූද චෛතසිකයන් සොයනු කැමතිකල්හි ප්‍රකීර්‍ණක චෛතසිකයන් අතුරෙන් විතර්‍ක විචාර ප්‍රීති යන තුන්දෙනාය පස්විසි ශොභන චෛතසිකය යන අටවිසි චෛතසිකයන් අතුරෙන් විරති අප්‍රමාණ්‍ය ප්‍රඥෙන්ද්‍රිය යන සදෙනාය යනමේ චෛතසිකයන් අතුරෙන් කවර චෛතසිකයක් යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සෙවියයුත්තේයි. අවශෙෂවූ ශොභන සාධාරණ චෛතසිකයන් විසිදෙනාය අන්‍ය සමාන චෛතසිකවූ ඡන්දවිරිය අධිමොක්ෂය සබ්බචිත්ත සාධාරණ සත්දෙනාය යනමේ එකුන්තිස් චෛතසිකයන් අතුරෙන් අසවල් චෛතසිකය යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සැකයක් නැත්තේයි. කාමාවචර කුශල චිත්තයෙහි කෙතෙක් චෛතසික ධර්‍මයන් යෙදෙන්නේදැයි ප්‍රශ්නයක්වීනම් අටතිසයයි විසඳියයුතුයි. මහාවිපාක අටෙහි කෙතෙක් චෛතසික ධර්‍මයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නයක්වීනම් කුශල චිත්තයෙහි යෙදෙන්නාවූ අටතිස අතුරෙන් විරතිත්‍රය අප්‍රමාණ්‍යවය යනමේ පස උධරණයකොට අවශෙෂ චෛතසිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. මහාක්‍රියා අටෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් ඒ අටතිස් චෛතසිකයන් අතුරෙන් විරතිත්‍රය පමණක් උධරණකොට අවශෙෂ පන්තිසලැබෙන්නේයයි කියයුතුයි. මෙසේ කුශල විපාක ක්‍රියාවන් කෙරෙහි ලැබෙන්නාවූ වෙනස විරති අප්‍රමාණ්‍ය යන ධර්‍මයන් පස්දෙනාගෙන්ම වියයුතුබව සැලකියයුතුයි. සොම්නස් සහගත කාමාවචර කුශල චිත්තයෙහි කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවීනම් අටතිසම නොඅඩුව ලැබෙන්නේයයි කියයුතුයි. උපෙක්ඛා සහගත සතර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝදැයි ප්‍රශ්නයක්වීනම් ඒ අටතිස අතුරෙන් ප්‍රීතිය පමණක් උධරණයකොට අවශෙෂ සත්තිස ලැබෙන්නේයයි කියයුතුයි. ඥාණවිප්‍රයුක්ත සතරෙහි කෙතෙක් ලැබෙන්නේදැයි ප්‍රශ්නයක්වීනම් ප්‍රඥාචෛතසිකය උධරණයකොට අවශෙෂ සත්තිසයයි කියයුතුයි. සොමනස්සය හා උපෙක්ෂාව

ප්‍රශ්නකිරීම ප්‍රීතිය හෙතුකොටගෙණවන්නේසි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්තවශයෙන් ප්‍රශ්නකිරීම ප්‍රඥාව හෙතුකොටගෙණවන්නේසි. මේ කුශලයෙහිද පඨම දුතාදියෙහි ක්‍රමයෙන් උද්ධරණයකොට නොලැබියයුතු චෛතසික තෙමේ මේයයි දැන විස්තරකටයුතුයි. මහාවිපාක අටෙහි තෙතිස් චෛතසිකයන් ගෙන්ද, මහාක්‍රියා අටෙහි පන්තිස් චෛතසිකයන්ගෙන්ද පටන්ගෙණ නොලැබෙන්නාවූ චෛතසික මේ මේයයි කීයයුතුයි.

කාමාවචර ශොභනයන් අතුරෙහි පළමුවන මහාකුශලයෙහි ලක්ෂණ මෙසේයි. "යදා පන යො දෙය්‍ය ධම්ම පටිග්ගාහකාදි සම්පත්තිං" යනාදිය ටීකාවෙහි ආ බැවින් යම් කාලෙක්හි දනවස්තු ප්‍රතිග්‍රාහකාදීන්ගේ සම්පත්තියක් දැක සතුටුවූ සිත් ඇතිව දන්දීම් පෙහෙවස් විසීම් ආදීවූ සුචරිත ක්‍රියාවන් කිරීමෙන් මෙතෙම මෙබඳු විපාක ඇත්තේයයි තමාගේ ප්‍රඥාව පෙරමුණෙහි යොදා පූර්ව චිත්තයකින් හෝ අනුන් විසින් හෝ මෙහෙයීමක් නොවී දන්දීම් සිල්රක්ෂාකිරීම් ආදිය තමාගේ ස්වභාව තීක්ෂණවූ සිතින්ම කරන්නේවේද එකල්හි සොම්නස් සහගත ඥාණසම්ප්‍රයුක්ත පළමුවන අසංස්කාරික චිත්තය උපදනේසි. යම් කලෙක්හි මූලචිත්තයෙහි කියායින් තුටුවූ පහටුව දනාදී පින්කම්කිරීම මෙබඳු අනුසස් ඇතැයි යන සම්‍යක් දෘෂ්ටිය පෙරටුකොටගෙණ වස්තු ත්‍යාගණාදිය කාරණාකොටගෙණ පසුබටවීමක් ඇතිකල්හි යම්කිසි කල්‍යාණ මිත්‍රාදීන් විසින් පාප වැත්තෙකු විසින් දන්නොදීම නොයෙදෙයි, යටගිය ජාතියෙහි දන්දීම හෙතුකොටගෙණ මේ ආත්මයෙහි නොපි ධනසම්පත් ලැබූවහුය. යම්හෙයකින් දන්දෙවයි යනාදීන් අනුන්ගේ මෙහෙයුමකින් හෝ අනුන් විසින් දෙන්නාවූ දන් දැක ඔා විසිනුත් දන්දියයුතුයයි පූර්වභාගයෙහි උපදනා චිත්තයකින් මෙහෙයුම් ලැබ හෝ දනාදී පින්කම්කරන්නාහට දෙවෙනි සසංස්කාරික කුශල චිත්තය උපදනේයි. යම්කාලෙක්හි මාතෘ පිතෘන්ගේ දන්දීම් ආදිය දැක පුරුදුවූ ළදරුවෝ භික්ෂූන් දුටුමාත්‍රයකින් සතුටු සිත් ඇතිව අත තුබූ යම්කිසි වස්තුවක් පුදන්නෝ හෝ වෙත්ද, මව්පියන් විසින් උගන්නා තුබූ පරිද්දෙන් දෙහොත් මුදුන්දී වඳින්නෝ හෝ වෙත්ද, එකල්හි සොම්නස් සහගතඥාණවිප්‍රයුක්ත අසංස්කාරික මහාකුශල චිත්තය උපදනේවෙයි. යම්කාලෙක භික්ෂූන් දුටුකල්හි පුත! මේ දේ පුදව මෙසේ වඳුවයි යනාදී මව්පියන් විසින් මෙහෙයන ලදුව දන්දෙන්නෝ හෝ වඳින්නෝ හෝ වේද, එකල්හි දරුවන්ට සොම්නස් සහගත ඥාණ

විප්‍රයුක්ත සසංස්කාරික චිත්තය උපදනේයි. යම් කලෙක දානාදි වස්තූන්ගේ හෝ ප්‍රතිග්‍රාහකාදීන්ගේ හෝ අසම්පූර්ණත්වය හෙතු කොටගෙණ උපෙක්ෂා වෙදනාවෙන් යුක්තව දානානිශංසදැනීම් සංඛ්‍යාතවූ නුවණින් යුක්තව මෙරමාගෙන් හෝ පූර්වචිත්තය කින් හෝ මෙහෙයුම් නොලැබ බොහෝසෙයින් සංසාර පුරුද්ද හෙතුකොටගෙණ දානාදී පින්කම් කෙරේද එකල්හී උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසල චිත්තය උපදනේයි. යම් කලෙක එම දන්දීම් ආදිය පූර්වචිත්තයකින් හෝ අනුන්ගෙන් හෝ මෙහෙයුම් ලැබකරන්නේවීනම් උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසඞ්ඛාරික කුසල චිත්තය උපදනේයි. යම්කලෙක්හි දාන වස්තු ආදීන්ගේ අසම්පූර්ණත්වය හෙතුකොට ගෙණ මවුපිය ආදීන්ගේ චරිතය දැක පුරුදුවූ ළදරුවෝ භික්ෂු සඞ්ඝයා දැක අත තුබූ යමක් දෙන්නෝ හෝ වෙත්ද බඩාඤ්ජලිව වඳින්නෝ හෝ වෙත්ද එකල්හී සත්වෙනි මහාකුශලචිත්තය උපදනේයි. යම් කලෙක්හි එපරිද්දෙන්ම මවුපිය ආදීන්ගේ මෙහෙයුමකින් ඒදාන වස්තු ආදිය දෙන්නාවූකල්හී අටවෙනි මහා කුශල චිත්තය උපදනේයි. මේ කුශල චිත්තයන් අටදෙනා අතුරෙන් ඥාන විප්‍රයුක්ත සතර චිත්තයට බාලදරක උපමාව කුමක්හෙයින් දක්වනලද්දේද යත්? ඒ සතර චිත්තය බාල දරුවන්ට මුත් තරුණ මහලු අයට නූපදනේදැයි ප්‍රශ්නයක්තිබේ. ඥාන විප්‍රයුක්ත බව පෙන්වීමට උදාහරණ වශයෙන් දැක්වූ පමණ මුත් තරුණ මහලු ආදී කවරෙක්වුවත් "අත්ථි දින්නං අත්ථි යිට්ඨං" යනාදීන් දශ වස්තුක සම්‍යක් දෘෂ්ටිය ඉපදවීමට සුදුසුවූ නුවණ නැත්තෝ නම් එබඳු සියල්ලෝම ළදරුවන්ට බඳු උපමා ඇතිවෙත්. එහෙයින් ළදරුවෝ හෝ තරුණයෝ හෝ මහල්ලෝහෝ දානාදී කුශල ධර්මයන්ගේ අනුසස් නොදැන නොසලකා කුසල්කරන්නෝවීනම් ඔවුන්ට ඥානවිප්‍රයුක්ත මහාකුශල චිත්තය උපදනේයි. මේ අටමහා කුශලයන් අතුරෙන් පළමුවන මහාකුශල චිත්තය ඉපදීමට උපමාවක් නම් යම්කිසි මනුෂ්‍යයෙක් විසින් දානක් දෙමියි සිතා දාන වස්තු සැපයීම් ප්‍රතිග්‍රාහකයන් සෙවීම් ආදී සියලු ක්‍රියාවෙහි ජවන් සතකින් යුක්තවූ අනන්තා පරිමාණවූ ජවන වීථි උපදනාහුවෙත්. ඒ දානය යම් දවසක සිතූ පරිද්දෙන් ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි පිහිටුවාද ඒ දාන වස්තුව ඔසවාදීම් සඞ්ඛ්‍යාතවූ කායවිඤ්ඤත්තිය ඉපදවීමට හෙතුභූතවූ අර්ථ සාධක ජවන වීථියම දානමය කුශල කර්මපථයයි කියත්. ඒදානය දුන්නායින් පසු මා විසින් මෙබඳු දානයක් දෙන ලද්දේයයි සිහිකරන්නේවේද ඒ සිහිකරන්නාවූකල්හි උපදනා

කාමාවචර කුසලකර්ම වීථිහුද අනන්තාපරිමාණයෙත්. පූර්වභාග පශ්චාත්භාගයෙහි උපදනා අනන්තා පරිමාණවූ කාමාවචරකුශල කර්ම වීථිහු අර්ථ සාධක ජවන වීථියට පිරිවරව උපස්ථම්භකවන් නාහුය, ඒ අනන්තාපරිමාණ පූර්වපශ්චාද්භාගයෙහි උපදනා කාමාවචර කුශල කර්මයන්ගෙන් උපස්ථම්භ ලබනලද්දාවූ අර්ථ සාධක ජවන වීථියගේ ප්‍රථම ජවන සහගතවූ චේතනාවක්ෂේත්‍ර අධ්‍යාශ සම්පත්තීන්ගෙන් යුක්තවීනම් ධනඤ්ජය මෙණ්ඩකාදී සිටු වරුන්ටමෙන් ඉහාත්මයෙහි සිටුසේසත් ආදී ප්‍රවෘත්ති විපාක දෙන්නේයි. සත්වන ජවන චේතනා සංඛ්‍යාත අර්ථ සාධක කුශල චේතනා තොමෝ අනතුරු ආත්ම භාවයෙහි අංකුරාදී දිව්‍ය පුත්‍රයන්ටමෙන් කාමසුගතියෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන්නේයි. මධ්‍යයෙහි ජවන් පස පිළිබඳවූ චේතනාවෝ පස් දෙන අපරාපරිය වේද්‍ය කර්ම වශයෙන් කල්පවිනාශාදී අවකාශ ලාභය ඇතිකල්හි අවීචිමහා නරකයෙන් පවා චුතව අවුත්සදිව්‍ය ලොකයෙහි උපදවා එහිදී වායො කසිණයෙන් ධ්‍යාන ලැබ බ්‍රහ්ම ලොකොත්පත්තියට පවා හෙතුවන්නේයි. මේ පළමුවන මහාකුශල චිත්තයන් අතුරෙන් පළමුවන කුශල චිත්තය මේ මනුෂ්‍ය ලොකයෙහි අසංඛ්‍යායුෂ්ක ප්‍රතිසන්ධිය ලැබූ පශ්චිම භවික මහාබොධි සත්ව චක්‍රවර්ති රාජාදීන්ට ලැබෙයි. එතකුදු වුවත් ගෞතම බොධිසත්වයන්වහන්සේ වැනි ලොකයෙහි පහළවූ හායන පක්ෂයෙහි උපදනා බොධිසත්වවරයන්ගේ මරණය සෘතු විපරීතය හෙතුකොටගෙණ සියක්අවුරුද්දකින්වන්නේයි. මේ මහාකුශල චිත්තයට වඩා අතිශයින් මහානුභාව සම්පන්නවූ රූපා රූප ධ්‍යාන චිත්තයන්ට මහාලොකොත්තර චිත්තයන්ටද මහා යන විශෙෂණය නොයොදා මේ කාමාවචර චිත්තයන්ටම මහා යන විශෙෂණය කුමක්හෙයින් යොදනලද්දේද යත්? එහි මහා ශබ්දය පූජාර්ථයෙහි පවත්නා මහා ශබ්දයක් නොව මහා විෂයාර්ථයෙහිපවත්නා මහන්ත ශබ්දයෙකැයි දතයුත්තේයි. ප්‍රථම ධ්‍යාන කුශල චිත්තය එකම ප්‍රථම ධ්‍යාන භූමියෙහි විපාකදෙයි. අවශෙෂවූ මහග්ගත ලොකොත්තර චිත්තයෝද තම තමාගෙන් අන්‍යවූ භූමියෙක්හි විපාක නොදෙන්නාහුය. මේ කාමාවචර කුශල චිත්තයෝ වනාහි සප්තකාම භූමියෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක හා එකොළොස් කාම භූමියෙහි ප්‍රවෘත්ති විපාකද දෙන් නාහුවෙති. එහෙයින් මේ කාමාවචර කුශල චිත්තයන්ට වඩා විෂය මහන්තත්වය ඇත්තාවූ චිත්තයෙක්නම් නැත්තේයි. එහෙ යින් මහාවිෂය ඇතිහෙයින් මහාකුශල චිත්තයෝයි ව්‍යවහාර කෙරෙත්. ඒ අටමහා කුසල චිත්තය වනාහි සොමනස් සහගත

සතරය, උපෙක්‍ෂා සහගත සතරයයි යනමොවුන්ගේවශයෙන් අටවැදෑරුම්වන්නේ නමුදු ලැබියයුතුවූ පඵස්ථානයන්ගේ වශයෙන් පසළොස් දහස්එකසිය විස්සෙක්වන්නේයි. ඒ ගණන කෙසේ ගිණිය යුත්තේද යත්?

"කාමේන පුඤ්ඤවත්ථුහි ගොචරාධිපතීහිච
කම්මහීනාදිතොචෙව ගණෙය්‍ය නය කොවිදො."

යන ගාථාවෙහි ආ ක්‍රමයෙන් ගිණිය යුත්තේයි. ඒ කෙසේද යත්? දාන, ශීල, භාවනා, පත්තිදාන, පත්තානුමෝදනා, ධම්මසවණ, ධම්මදෙශනා, වෙය්‍යාවච්ච, දිට්ඨිජ්ජුකම්ම, යන දශ පුණ්‍යක්‍රියා වස්තූන්ගේවශයෙන් අටමහා කුසල චිත්තය දශයෙන් ගුණිතකළකල්හි අසූවක්වෙයි. ඒ අසූ චිත්තය රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්, යන අභිධම්යෙහි ආවාවූ ධම්යන් සදෙනාගේ වශයෙන් ගිණූකල්හි සාරසිය අසූවක්වෙයි. ඒ සාරසිය අසූ චිත්තයන් අතුරෙන් ඥාන සම්ප්‍රයුක්තවූ දෙසිය සතළිස ගෙණ ඡන්ද, චිත්ත, විරිය, වීමංස, යන අධිපති සතරින් ගිණූකල්හි නවසිය සැටෙක්වෙත්. ඥාණ විප්‍රයුක්තවූ දෙසියසතළිස් චිත්තය ඡන්ද, චිත්ත, වීරිය, යන අධිපතීන් තුන්දෙනාගෙන් ගුණිතකළකල්හි සත්සිය විස්සෙක්වෙත්. ඒ දෙකොටස එක් කරගත්කල්හි එක්දහස් සසිය අසූවක්වෙයි. ඒ එක්දහස් සසිය අසූ චිත්තය කායකම්, වචීකම්, මනොකම්, යන කම්ත්‍රයෙන් ගුණිතකළකල්හි පන්දහස් සතළිසෙක්වෙයි. ඒ පන්දහස් සතළිස හීන, මධ්‍යම, ප්‍රණීත, යන තුණින් ගුණිතකළකල්හි පසළොස් දහස් එක්සිය විස්සෙක්වෙයි. මේ කාමාවචර චිත්තයන් අට දෙනාගේ ප්‍රභෙදය මෙසේ වියයුතුනම් බුඞදත්තාචාරීන් විසින් අභිධම්ාවතාරනම්වූ සංග්‍රහ අටුවාවෙහි:—

සත්තරස සහස්සානි වෙසතානි අසීතිච
කාමාවචර පුඤ්ඤානි භවන්තීති විනිද්දිසෙ.

යන ගාථාවෙන් සතළොස් දහස් දෙසිය අසූවෙකැයි කුමක්හෙයින් වැඩිකොට කියනලද්දේද යත්? ඥානවිප්‍රයුක්ත දෙසිය සතළිස් චිත්තයෙහි නොලැබෙන්නාවූ වීමංසාධිපතිධම්ය නුගුලුවාම ගණන් ශ්‍රොතසයෙහි වැටුනාවූ ක්‍රමයෙන් ගිණූහෙයි නැයි දතයුතුයි. එයින් අන්‍යවූ කාලදෙශාදී භෙදයෙන්වන්නාවූ ගණන අනන්ත පරිමාණවන්නේමැයි. මේ අටමහා කුශල චිත්තය ගිණූක්‍රමයෙන් මේ මහාක්‍රියා අටද ගිණියයුත්තේයි. මහාවිපාක සිත් අටෙහි වනාහි සොම්නස් උපෙක්‍ෂා සහගත විය යුතුබව "ඉමානිපි ඉධ ඉට්ඨමජ්ඣත්තාරම්මණවසෙන යථාක්කමං

සොමනස්ස උපෙක්ඛාසහිතානි" යන ටීකා පාඨයට අනුව දත යුත්තේයි.

එහි භාවය:—යහපත්වූ ඉෂ්ටාලම්බනයෙක්හි කුශල චිත්තය උපදනේවීනම් විපාකයත් සොම්නස් සහගතවෙයි. ඉෂ්ට මධ්‍යස්ථාලම්බනයෙක්හි කුසල චිත්තය උපන්නේවීනම් ඔහුගේ විපාකය උපෙක්ෂා සහගතවේමැයි. මහාවිපාකයෝ අට දෙන ඥාන සම්ප්‍රයුක්ත ඥාන විප්‍රයුක්තවීමට හෙතුකවර යත්? පටිසන්ධි, භවාඞ්ග, චුතීන්ගේ වශයෙන් පවත්නාකල්හී පටිසන්ධිය දෙන්නාවූ කර්ම තෙමේ බලවත්වූකල්හී විපාකවශයෙන් පහළ වන්නාවූ පටිසන්ධි චිත්තයද ඥාන සම්ප්‍රයුක්තවෙයි. දුර්වලවූ කර්මයක් විසින් පටිසන්ධිදෙන්නාවූකල්හී ඒ විපාක චිත්තය ඥාන විප්‍රයුක්තවෙයි. මහාවිපාක චිත්තය තදාරම්මණවශයෙන් පවත්නා කල්හි බොහෝසෙයින් ඥානසම්ප්‍රයුක්තබවද විප්‍රයුක්තබවද ජවනයන්ට අනුවවන්නේයි. හෙවත් ඥානසම්ප්‍රයුක්ත ජවන්දිවූ කල්හී තදාලම්බනවශයෙන් උපදනා විපාකයද ඥානසම්ප්‍රයුක්තවෙයි. ඥාන විප්‍රයුක්තවූ ජවන්දිවූකල්හී තදාලම්බන විපාකයද ඥාන විප්‍රයුක්තවේමැයි. මේ ක්‍රමයද අනියතවෙයි. කුමක් හෙයින යත්? ඥාන සම්ප්‍රයුක්ත පටිසන්ධිගත් තැනැත්තාහට උපදනා භවාඞ්ගයෝද ඥානසම්ප්‍රයුක්තමැයි. එබන්දෙකුට ඥාන විප්‍රයුක්ත ජවන් උපන්නේ නමුදු මූලභවාඞ්ගයන්ගේ ශක්තිය කාරණකොටගෙණ තදාලම්බන විපාක ඥානසම්ප්‍රයුක්තවිය හැක්කේයි. එපරිද්දෙන්ම ඥානවිප්‍රයුක්ත පටිසන්ධිගත් තැනැත්තාහට ඥාන සම්ප්‍රයුක්ත ජවන්දිවූකල්හි ඥානවිප්‍රයුක්ත තදාලම්බනද වියහැක්කේයි. කාමාවචර කුසල කර්ම අටදෙනාගේ ශක්තියෙන් සුදුසු පරිද්දෙන් කාමාවචර සුගති පටිසන්ධි නවයෙන් යම්කිසි පටිසන්ධියක් දියහැක්කේයි. ඒ කුශලයන් අටදෙනා අතුරෙන් උත්කෘෂ්ටවූ කාමාවචර මහාකුශල චිත්තයෙන් සුගති පටිසන්ධියගත් තැනැත්තාහට ප්‍රවෘත්ති කාලයෙහි සහෙතුක මහාවිපාක අටය, අහෙතුක විපාක අටයයි සොළොස් විපාකයක් උපදවන්නේයි. ඥානසම්ප්‍රයුක්ත මහාවිපාක සිතින් පටිසන්ධිගත් තැනැත්තාහට රන් රිදී මුතු මැණික් ගව මහිෂ කෙත් වත් ගම් නියම් ආදී උපභොග පරිභොග සම්පත් නැමති විපාක ආනිශංසයෝද ලැබෙන්නාහුය. ඥාන විප්‍රයුක්ත ද්විහෙතුක පටිසන්ධිගත් තැනැත්තහුට උට්ඨාන වීර්‍ය්‍ය ඵල සංඛ්‍යාතවූ කෘෂිවණික ආදී කෘත්‍යයන් හෙතුකොටගෙණ මධ්‍යම ප්‍රමාණවූ උපභොග පරිභොග සම්පත් නැමැති විපාක ආනිශංසයෝ ලැබෙන්නාහුවෙති. දුර්වලවූ ද්විහෙතුක කාමාවචර කුශල කර්ම බලයෙන් ජාත්‍යන්ධාදී අඞ්ගවිකලවූද, අනුන්ට බැලමෙහෙකරන්නාවූද, වැදි කෙවුල්

ආදී නීච ආත්මභාවයන්හිද, සුගති අහෙතුක පටිසන්ධිවසයෙන් උපදනේසි. ඔවුන්ගේ ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුක විපාක අට පමණක් ලැබෙන්නේසි. අහෙතුක විපාකයන්ට එපාකානිශංස නැති බැවින් එබඳු සත්වයෝ අනුන්ට බැලමෙහෙකොට අතිශ සින් දුක්ඛජීවිකාවෙන් ජීවත්වෙති. අසංඥ සත්වයන් හැර අව ශෙෂ පසළොස් රූප භූමියෙහි කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වශයෙන් අහෙතුක විපාක සතරක් ලැබෙන්නේයයි දතයුතුයි. තිපිටක චූලනාගථෙ රවාදයෙහි: ත්‍රිහෙතුක උත්කෘෂ්ටවූ මහාකුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශලචිත්තයක් තෙමේ ත්‍රිහෙතුක මහා විපා කයන් සතරදෙනා අතුරෙන් එක්තරා විපාක චිත්තයක් පටි සන්ධිවසයෙන් උපදවයි. ප්‍රවෘත්ති කාලයෙහි සහෙතුක මහා විපාක අටය අහෙතුක කුශල විපාක අටය යන සොළොස් විපාක දෙන්නේයයිද, ත්‍රිහෙතුක ලාමක මහාකුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක්ද, ද්‍විහෙතුක උත්කෘෂ්ට මහා කුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක්ද යන දෙදෙන ශක්තිවශයෙන් සමානවෙත්. එහෙයින් ත්‍රිහෙතුක ලාමක කුශලයක් හෝ ද්‍විහෙතුක උත්කෘෂ්ට කුශලයක් හෝ පටිසන්ධිගන්වන්නාවූකල්හි ඥාන විප්‍රයුක්තවූ මහාවිපාකයන් සතරදෙනා අතුරෙන් එක්තරා විපාකයක් තෙමේ පටිසන්ධිවශ යෙන් උපදවයි. ප්‍රවෘත්ති කාලයෙහි ඥාන විප්‍රයුක්ත මහාවිපාක සතරය, අහෙතුක විපාක අටය, යන දොළොස් විපාකය උපද වයි කියාද, ද්‍විහෙතුක ලාමක කාමාවචර කුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ පටිසන්ධිගන්වන් නාවූකල්හි කුසලවිපාක උපෙක්ඛා සන්තීරණ චිත්තය පටිසන්ධි වශයෙන් උපදවා ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුක විපාක අට උපද වන්නේයයි කියත්. මේතිපිටක චූලනාගවාදයයි. ඒමහා විපාක තෙමේ සංක්ෂෙපයෙන් අටවැදෑරුම්වූයේ නමුදු ගුණිත සංඛ්‍යා වශයෙන් බොහෝ ප්‍රභෙද ඇත්තේය. හේ කෙසේ යත්? මහා විපාකයෝ අටදෙන දශපුණ්‍ය ක්‍රියා වස්තු වශයෙන් ගිණූකල්හි අසූවක්වන්නේසි. ඒ අසූවක්වූ විපාක චිත්තය රූපාදී සාරමුණු වශයෙන් ගිණූකල්හි සාරසිය අසූවක්වෙත්. ඒ සාරසිය අසූවක් විපාක චිත්තය කායවාක් මනො යන කර්මත්‍රයෙන් ගිණූකල්හි එක්දහස් සාරසිය සතළිසෙක්වෙත්. ඒ එක්දහස්සාරසිය සතළිස හීන මධ්‍යම ප්‍රණීතවශයෙන් සාරදහස් තුන්සිය විස්සෙක්වෙත්. කාල දෙශාදීන්ගේ වශයෙන් ගිණූකල්හි අනෙක ප්‍රකාර ප්‍රභෙද වන්නාහුය. මෙසේ මහාකුසල චිත්තයන් අටදෙනාගේ මධ්‍යම

පුඬුව පසළොස් දහස් දෙසිය අසූවෙක්ද මහාක්‍රියා අටදෙනාගේ මධ්‍යම පුඬුව පසළොස් දහස්දෙසිය අසූවෙක්ද, මහාවිපාක අටදෙනාගේ මධ්‍යම පුඬුව සාරදහස් තුන්සිය විස්සෙක්ද, වන් නාහුයයි කියාද, මේ චිත්තයන්ගේ විස්තාර පුඬුව අනන්තාපරිමාණවන්නේයයි කියාද දතයුතුයි. කාමාවචර මහාක්‍රියාවන්ගේ හටගැණීම "තං තං කිච්චසාධන වසෙන පවත්තාපනකරණ මත්ත මෙව හොති තස්මා ක්‍රියාවුත්තා" යනු අර්ථශාලිනී අටුවා වචන බැවින් ඒ ඒ කෘත්‍ය සිඬකිරීම්වශයෙන් මුත් විපාක ඉපද වීම්වශයෙන් නොපවත්නාහෙයින් දන්දීම් ආදී ඒ ඒ ක්‍රියා කරණ මාත්‍රයක්හෙයින් ක්‍රියායයි කියනලද්දේයි. "ඉදං චිත්තං අසෙක්ඛසං අසාධාරණං ඛීණා සවසෙසව පාටිපුග්ගලිකං ඡසු චාරෙසු ලබ්භති, යනු අර්ථශාලිනී අටුවා වචන බැවින් මේ ක්‍රියා චිත්තයන්ගේ සමූහය වනාහි පෘථග්ජන ශෛක්‍ෂ්‍යයන්ට සාධාරණනොවෙයි. ක්ෂීණාශ්‍රව මහාරහතුන්ට හා පසේ බුදුවරයන්ටද ආවේණිකවූ ප්‍රාතිපුද්ගලික චිත්තයයි දතයුතුයි. එතකුදු වුවත් කාමාවචර කුශලයමෙන්ම චක්‍ෂුරාදී ෂඩ්වාරයෙහි පැවති කාමාවචර ක්‍රියා චිත්තය රහතුන්ට ආවෙණිකවන්නාක්මෙන්ම කාමාවචර මහාකුශල චිත්තයද පෘථග්ජන ශෛක්‍ෂ්‍යයන්ට ආවෙණිකවන්නේයි. කාමාවචර මහාකුශල චිත්තයද චක්‍ෂුරාදී ෂඩ්වාරයෙහි අර්ථ සාධකවශයෙන් පවත්නාකල්හි නොහොත් දන්දෙමැයි සිල්රක්‍ෂාකරම්හයි යනාදී සිතූ මාත්‍රයක්නම් ප්‍රවෘර්ති විපාක මාත්‍රයක් මුත් ප්‍රතිසන්ධි විපාක නොඉපදවියහැක්කේයි. දන්දෙමැයි සිතා දන වස්තු ආදිය සම්පාදනයකොට භික්ෂූන් වඩාහිඳුවා සියලු පූජා කෘත්‍යකොට ඒ දන වස්තු ප්‍රතිග්‍රාහකයන්ගේ අතෙහි නොපිහිටුවා ලූයේවීනම් ඒ ප්‍රස්තාවෙහි උපදනා කාමාවචර කුශල චිත්තයෝද පටිසන්ධි විපාක නොදියහැක්කාහුවෙති. ඒ සතූ පරිද්දෙන් දන වස්තු ප්‍රතිග්‍රාහකයාගේ අතෙහි පිහිටුවනකල්හී උපදනා අර්ථ සාධක ජවන වීථියම ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දියහැකිවෙති. දන වස්තුව ඔසවා ප්‍රතිග්‍රාහකයාටදම කායවිඥප්ති රූපයක්වෙයි. ඒකායවිඥප්ති රූපය කුමක්හෙයින් මේසා මහත් විපාක දෙන්නේද යත්? දන්දෙමැයි සිතන්නාවූකල්හි සප්තජවනයකින් යුක්තවූ චිත්ත වීථියක් උපදී. ඒ සප්තජවන් හා සමග උපදනා චිත්තජ වායොධාතුහු සත්දෙන අවශෙෂ තිජවායො ධාතූන්ට පැමිණීමෙන් සකල ශරීරයම ඒ චිත්තජ වායො ධාතුහුගේ වසඟයට පැමිණෙයි. ඉක්බිති ඒ චිත්තජ වායො ධාතුහු හස්තපාදාදීන් කරා පැමිණ දන වස්තුව ඔසවා ප්‍රතිග්‍රාහකයාගේ අතෙහි පිහිටුවීම් සඞ්ඛ්‍යාතවූ

කායවිකාරය උපදවයි. ඒ කායවිකාරය ඉපදවීමට මූලභූතකාරණවූ සත්ජවනයන් හා යෙදුනාවූ මේ චෙතනාවෝ සත්දෙන ඒ ක්‍රියාව නිපදවීමට කාරණවූහෙයින් ඒ චෙතනාවන්ට දෘතමය කුශලකර්මයයි කියති ඒජවන වීථිය වහාම නිරුද්ධවීයන්නේ නමුදු ණයගන්නාවූ ණයගැතියාගේ ණයනැඟීම් සඞ්ඛ්‍යාතවූ ක්‍රියාව වහා නිරුද්ධවීයන්නේ නමුදු ඊට බොහෝ කාලයකට පසු ණයහිමියා ණයදෙවයි ඉල්ලූකල්හි එදවසගත් ණයක් මෙන්ම ණයගෙවා නිදහස්වියයුතුවාක්මෙන් ඒ දෘතමය කුශල කර්මය ක්ෂණයකින් නිරුද්ධවීගියේ නමුදු ණයගැණීමේ ශක්තිය නැතිනොවන්නාක්මෙන්ම කර්මයෙන් බඩවූ ශක්තිය කල්පකොටි ශතසහශ්‍රයෙකිනුත් නිරුද්ධනොවී විපාකදීමට සුදුසු අවසරය ලැබුනුකල්හි මරණාසන්න ජවන වීථියට එසමයෙහි දන්දෙන කල්හි උපන්නාවූ දෘතමය කුශල චිත්ත වීථිය හෝ ඒදනොප කරණ ප්‍රතිග්‍රාහකාදීන් හෝ ඒ කර්මයට නියතවූ සුගතියෙහි දිව්‍ය විමාන කප්රුක් ආදීන්ගේ ස්වරූපය හෝ ස්වප්නයක් දක්නෙකුටමෙන් මරණාසන්න ජවන වීථියට අරමුණුවෙයි. ඉක්බිති ඒ අරමුණ ධරමානකල්හිම චුතිචිත්තය ඉපදී සුගති පටිසන්ධි චිත්තය පහළවන්නේයයි දතයුතු. මේ කාමාවචර කුශල්ය කාමාවචර ක්‍රියාය යනමොවුන්ට විලිකුම් අඹ ඇත්තාවූ අඹ ගසක් උපමාකටයුතුයි. ඒ ආම්‍රවෘක්ෂයෙහි රොපණයකිරීමට සුදුසුවූ ආම්‍රබීජයන්ගෙන් යුක්තවූ විලිකුම් අඹ ඵලමෙන් අර්ථ සාධක කාමාවචර කුශල කර්ම පථ විපිහුද, රොපණය නොකටයුතුවූ ආම්‍රබීජයන් නැත්තාවූ අඹ ඵලමෙන් ක්ෂීණාශ්‍රවයන්ට උපදනා ක්‍රියා චිත්තයෝද, යහපත් අඹ ඵලරොපණය කොට උපදවන්නාවූ අඹ වෘක්ෂමෙන් කාමාවචර විපාක චිත්තයෝද උපමා උපමෙය සම්බන්ධකොට දතයුතුයි.

## කාමාවචර කුශල විපාක ක්‍රියාවන්ගේ විභාගය නිමි.

සත්විසි මහද්ගත චිත්තයෙහි පළමුකොට කාමාවචර මහා කුශලයටකී අටතිස් චෛතසිකය තබා විරතිත්‍රය උගුළුවා අවශෙෂවූ පන්තිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. ප්‍රථම ධ්‍යානත්‍රය සඳහා පන්තිස් චෛතසිකය කියනලද්දේයි. විතිය ධ්‍යාන තුණෙහි විතර්ක චෛතසිකය උගුලුවා අවශෙෂ සූතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. තෘතීය ධ්‍යානතුණෙහි විතර්ක විචාර දෙක උගුලුවා අවශෙෂවූ තෙතිස් චෛතසිකය

ලැබෙන්නේයයි කියයුතුයි. චතුර්ථ ධ්‍යාන තුණෙහි විතර්ක විචාර ප්‍රීති තුණ උද්ධරණයකොට අවශෙෂ දෙතිස ලැබෙන්නේයයි කියයුතුයි. පඤ්චමධ්‍යාන පසළොසෙහි විතර්ක විචාර ප්‍රීති කරුණා මුදිතා යන පස උද්ධරණයකොට අවශෙෂවූ සමතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. මේ මහග්ගත චිත්තයෙහි යෙදියයුතු නොයෙදියයුතු චෛතසිකයෝ කවරහුදැයි සොයනු කැමතිකල්හී විරතිත්‍රය හාත්පසින්ම උද්ධරණයකටයුතුයි. මහග්ගත චිත්තයෙහි විරතීහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? විරතිත්‍රයෙහි ඇතුලත් අඨම්වජ්ජවය ශීලවිශුද්ධියෙහි අන්තර්ගත වන බැවින් චිත්ත විසුද්ධි සඞ්ඛ්‍යාතවූ මේ මහග්ගත චිත්තයෙහි ඒ විරතීහු හාත්පසින් නොලැබෙන්නාහුමැයි. විතර්ක විචාර ප්‍රීති කරුණා මුදිතා යන මේ චෛතසිකයෝ පස්දෙන ඇතැම් ධ්‍යානයෙක්හී නොලැබෙති. ඇතැම් ධ්‍යානයෙක්හී ලැබෙති. එහෙයින් මහග්ගත චිත්තයන්ගේ චෛතස සොයනු කැමතිකල්හී ඒචෛතසික ධර්මපසින්ම සෙවියයුත්තේයි. රූපාවචර කුශල චිත්තයෙහි යෙදෙන්නාවූ ධ්‍යාන ධර්මයෝ නම්:—“ඣානන්ති” විතක්කො, විචාරො, පීති, සුඛං, චිත්තෙකග්ගතා”යි විභඞ්ගප්‍රකරණයෙහි ධ්‍යාන විභඞ්ගයෙහි වදාළහෙයින් විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යනමේ ධර්මයෝ පස්දෙන ධ්‍යානාඞ්ග ධර්මයෝනම්වෙති. ඒ ධර්ම එක එකගත්කල්හී ධ්‍යානාඞ්ගමුත් ධ්‍යානයයි නොකියති. යම්සේ නිම් වළලු දැවි ආදීවූ රථාවයවයන් වෙන්වෙන්කොට ගත්කල්හි රථයයි නොකියති. රථාවයවයයි කියාම ව්‍යවහාරකරති. ඒරථාවයවයන් එක්කොට රචනාකළකල්හිම රථයයි ව්‍යවහාරකරන්නාක්මෙන්ම මේ ධ්‍යානාඞ්ගපඤ්චකය එක් සිතෙක්හි යෙදුනුකල්හිම ධ්‍යානයයි ව්‍යවහාරකෙරෙත්. ඉදින් ධ්‍යානාඞ්ග පඤ්චකය යෙදුනුකල්හිම ධ්‍යානවෙත්නම් ධ්‍යානාඞ්ග සතරක් හෝ තුණක් හෝ දෙකක් හෝ යෙදුනාවූ චිත්තය කෙසේ ධ්‍යානනම්වන්නේදයත්? යටත් පිරිසෙයින් උපෙක්ෂා ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ගද්වය යෙදුනාවූ චිත්තයෙහි අවශෙෂ ධ්‍යානාඞ්ගත්‍රයාගේ කෘත්‍යය ධ්‍යානාඞ්ගද්වය විසින්ම සමූඞ්කරණු ලැබෙයි. එහෙයින් ධ්‍යානාඞ්ගද්වය යෙදුනාවූ චිත්තයද ධ්‍යානනම්වෙයි. මේ විතර්කාදී පස්දෙන කුමක්හෙයින් ධ්‍යානාඞ්ගනම්වන්නෝද යත්?

“උපනිජ්ඣාන කිච්චත්තා කාමාදි පටිපක්ඛතො
සන්තත්තා පිච අඞ්ගත්තා පඤ්ච ඣාන සඤ්ඤිතා.

යනු සච්ච සංඛෙප වචන බැවින් පන්තිස් චෛතසිකයකින් සම්පූර්ණවූ රූපාවචර ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි මේ විතර්කාදී අඞ්ග

පඤ්චකය යෙදුනු බැවින් ධ්‍යාන චිත්තයයි ව්‍යවහාරකෙරෙත්. ඉදින් ඒ අඞ්ගපඤ්චකය පමණක් ධ්‍යානවන්නේනම් ස්පර්ශාදී අවශෙෂ සමතිස් ධර්ම හා චිත්තයද යන එක්තිස් ධර්මයන්ගේ සමූදය කාමාවචරයයි කියයුතුද? රූපාවචරාදී අනික් නමක් කියයුතුදැයි ප්‍රශ්නයක්වේ. යම්සේ උණ්ඩුදියෙහි බහා පිසනලද්දවූ නොයෙක් පුෂ්ප ඵලපත්‍රාදිය උණ්ඩුදියෙහි ඇත්තාවූ තෙජොධාතු ශක්තියෙන් එකම සූපස්වභාවට පැමිණෙත්ද, එපරිද්දෙන්ම ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ග පඤ්චකයාගේ ශක්තිය කාරණකොටගෙණ අවශෙෂවූ එක්තිස් ධර්මයෝද ධ්‍යානනම් වෙත්.විතර්කාදී ධර්මපඤ්චකය යටකී ගාථායෙහි ආ න්‍යායෙන් උපනිජ්ඣානකෘත්‍ය සඞ්ඛ්‍යාතවූ නැරඹීම් නොහොත් ලංකොට බැලීම ඇතිහෙයින්ද කාමාදී පඤ්චනීවරණ ධර්මයන්ට ඉඳුරා ප්‍රතිපක්ෂ බැවින්ද ධ්‍යානාඞ්ගයයි ව්‍යවහාරකෙරෙති. මේ "ඣාන" ශබ්දයවනාහි "ඣෙචින්තායං" යන ධාතුවෙන් නිපන්නේයයි කියත්. ලංකොට බැලීමය යනු කුමක් ලංකොට බලන්නේද යත්? කසිණ ප්‍රතිභාග නිමිති ආදීවූ අරමුණ ලංකොට බලන්නේයයි දතයුතු. ඒ ලංකොටබැලීම කෙසේවන්නේද යත්? අන්ධකාරවූ රාත්‍රියෙක්හී පර්වතයක් මුදුනෙහි දල්වනලද්දවූ මහත්වූ ගිනිකඳක් අන්ධයන් එක්තිස් දෙනෙකුට හා ඇස් ඇත්තාවූ පුරුෂයන් පස්දෙනෙකු ලවා බලත්වයි නියොගකළකල්හී ඇස් ඇත්තාවූ පුරුෂයන් පස්දෙනා විසින් සමීපයෙහි දල්වූ ගින්නක් මෙන් ඒ පර්වතය මුදුනෙහි දිලියෙන්නාවූ ගිනිකඳ දක්නාලැබෙයි. එතකුදුවුවත් අන්ධකාරයෙහි දක්නාබැවින් ඒ පර්වතයාගේ මොබ ඇත්තාවූ වෘක්ෂලතාදිය නොදක ගිනිකඳම දක්නාලැබෙයි. එපරිද්දෙන් ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ විතර්කාදී අඞ්ගපඤ්චකය විසින් රූපාදී අනිත් අරමුණක් නොදක කසිණ ප්‍රතිභාග නිමිත්තම දක්නාලැබෙයි. අවශෙෂවූ අන්ධයන් එක්තිස් දෙනා ඒ පර්වතයෙහි දිලියෙන්නාවූ ගිනිකඳ නොදක්නාක් මෙන් ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ ස්පර්ශාදිවූ සමතිස් ධර්ම හා ධ්‍යාන චිත්තයද යන එක්තිස් ධර්මයෝ කසිණ ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාතවූ ආලෝකය නොදක්නාහුවෙති. මේ උපනිජ්ඣා යන කෘත්‍යයාගේ ස්වභාවයයි. විතර්ක චෛතසික තෙමේ ඒ කසිණ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත අරමුණට සම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තය ආරොපණය කරවයි. විචාර තෙමේ සම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තය අරමුණෙහි හසුරුවයි. හෙවත් ගලපවයි. ප්‍රීති තොමෝ කසිණ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාතවූ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධ්‍යාන චිත්තය පිනවයි. සුඛ තොමෙ අරමුණ මහත්කොට

සසම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තයට හඟවයි. ඒ විතර්ක විචාර ප්‍රීති සුඛ
යන සතර ධර්මයන්ගෙන් උපකාර ලැබූනාවූ ඒකාග්‍රතා චෛතසික
තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ ධ්‍යානචිත්තය කසිණ
ප්‍රතිභාග නිමිත්තාලම්බනයෙහි මොනවට පිහිටුවා තමාගේ වශ
යට පමුණුවාගන්නේයි. එහෙයින ඒකාම කසිණ ප්‍රතිභාග නිමිත්
තාලම්බණයෙහි සමකොට ලීනොද්ධච්චයෙහි වැටියනොදී මනා
කොට සථිරවශයෙන් පිහිටුවන්නේවෙයි. මේ ධ්‍යානාඞ්ගයෝ
පස්දෙනවනාහි තම තමන්ට සතුරුවූ පඤ්චනීවරණ ධර්මයන්ටද
සතුරුවන්නාහුවෙති. ඒකෙසේද යත්? විතර්ක නැමති සිංහරාජ
තෙමේ ථීන මිද්ධ නීවරණනැමති හස්තියාට විරුද්ධවන්නේයි. විචාර
නැමති ගරුඩරාජ තෙමේ විචිකිච්ඡා නීවරණ නැමති නාග
රාජයාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. ප්‍රීති නැමති බිළාර තෙමේ
ව්‍යාපාද නැමති මූෂිකයාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. සුඛ නැමති
නාගරාජ තෙමේ උද්ධච්ච කුක්කුච්ච නැමති මැඩියාහට ඉදුරා ප්‍රති
පක්ෂවෙයි. ඒකාග්‍රතා නැමති ව්‍යාඝ්‍ර තෙමේ කාමච්ඡන්දනීවරණ
නැමති මුවාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. මෙසේ මේ ධ්‍යානාඞ්ගයෝ
පස්දෙන පඤ්චනීවරණ ධර්මයන්ට ජාතියෙන් සතුරුවූ ප්‍රහායක
ධර්මනම්වෙත්. සිංහාදීවූ පස්දෙන ඔවුන්ට ගොදුරුවූ නොහොත්
ඔවුන්ට සතුරුවූ හස්ති ආදී පස්දෙන යම්සේ විනාශකෙරෙත්ද
එපරිද්දෙන් මේධ්‍යානාඞ්ගයන් පස්දෙන කරණකොටගෙණ ථීන
මිද්ධනීවරණාදී පඤ්චනීවරණ ධර්මයෝ විෂ්කම්භනප්‍රහාණවශයෙන්
විනාශවන්නාහුයයිදතයුතුයි. මේපච්චනීකඛ්‍යාපන අර්ථයයි. මෙසේ
මේ ධ්‍යානාඞ්ග පඤ්චකයාගේ ආරම්මණූපනිජ්ඣාන කෘත්‍යය, ප්‍රත්‍ය
නීක ඛ්‍යාපන අර්ථය යන අර්ථවය මනාසේ අවබෝධකටයුතුයි.

ඒ රූපාවචරයන්ගේ විපාක දෙන්නාවූ ක්‍රමය කෙසේ
යත්? සමථ කර්මස්ථානවඩන්නාවූ යෝගාවචර පුද්ගල තෙමේ
හීනවූ රූපාවචර කුශල පඨමධ්‍යානය නොහොත් පඤ්චවසිතාවන්
ගෙන් පුරුදු නොකරණලද්දාවූ ප්‍රථම ධ්‍යානය භාවිතාකොට
නොපිරිහුන් ධ්‍යානයෙන් කාලක්‍රියාකෙළේවීනම් බ්‍රහ්මපාරිෂද්‍ය
භූමියෙහි ඒ ඒ ප්‍රථම ධ්‍යාන රූපාවචර කුශල ශක්තියෙන් එම
විපාක චිත්තය පටිසන්ධිවශයෙන් පහළවී එහි ආයු පමණින්
වැස බ්‍රහ්මලොවින් චුතව මතු බ්‍රහ්මලයක නූපදනේවීනම් යළි
කාමධාතුවෙහි පූර්වජාතියෙහි ධ්‍යාන උපදවන්නාවූකල්හි ඒ
ධ්‍යාන වීථියෙහි පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ නමින්
උපන්නාවූ කාමාවචර භාවනාමය කුසල කර්මබලයෙන් ත්‍රිහෙතු
කවූ හෝ ද්විහෙතුකවූ හෝ කාමාවචර මහාවිපාක ප්‍රතිසන්ධියගන්
නේයි. ඒ රූපාවචර ප්‍රථම ධ්‍යානයම "ආවජ්ජන, සමාපජ්ජන

අභිඤ්ඤාන, චුණ්ණාන, පච්චවෙක්ඛන, යන පචවසිතාවන් අතුරෙන් දෙතුන් ආකාරයකින් පුරුදුකොට ඒ ධ්‍යානය නොපිරිහී කාලක්‍රියාකෙළේවීනම් බ්‍රහ්මපුරොහිතනම් බඹලොව ප්‍රතිසන්ධිවශයෙන් එම විපාක චිත්තය උපදී. එහි ආයු පමණින් සිට මතු බඹතලයකට නොයන්නේවීනම් යටකී නයින්ම උපචාර සමාධි කාමාවචර භාවනාමය කුශල කර්මබලයෙන් සප්තකාම ස්වර්ගයෙහි ත්‍රිහෙතුකවූ හෝ ද්විහෙතුකවූ හෝ ප්‍රතිසන්ධියගන්නේයි. ඒ ප්‍රථම ධ්‍යානයම පචවසිතාවන්ගෙන් මනාකොට පුරුදුකළාවූ රූපාවචර ප්‍රථම ධ්‍යාන කුසල තෙමේ මරණින් මතු මහාබ්‍රහ්ම භූමියෙහි ප්‍රතිසන්ධි විපාකය උපදවයි. ඒ බ්‍රහ්මතෙමේ එයින් චුතව මතු බ්‍රහ්මතලයෙහි නූපදනේවීනම් යටකී නයින් සප්ත කාම ස්වර්ගයෙහි ප්‍රතිසන්ධිය උපදවයි. මේ බ්‍රහ්ම භූමි තුණ සමාන තල නොහොත් එකම භූමියක්වශයෙන් පිහිටාතිබෙයි. මහාබ්‍රහ්මනැමති රජුන්ගේ පිරිවරවූ බ්‍රහ්මයෝ බ්‍රහ්මපාරිෂද්‍යයෙහිද, අමාත්‍යවූ බ්‍රහ්මයෝ බ්‍රහ්මපුරොහිතයෙහිද උපදනාහුවෙත්. "පුථුජ්ජනා පන අරියා වා අනරියා වා අඪසමාපත්තිලාභිනියො බ්‍රහ්මපාරිසජ්ජෙසුයෙව නිබ්බත්තනති" යනු අට්ඨශාලිනී අටුවා බැවින් සෝවාන් සකෘදාගාමි අනාගාමි යන මාර්ගඵලලාභීවූ සත්‍රීහු ධ්‍යාන නූපදවා ගිහි භූමියෙහි සිටියාහුනම් මරණාසන්න කාලයෙහි ප්‍රථමධ්‍යාන උපදවාද පෘථග්ජන ධ්‍යානලාභීවූ සත්‍රීහුද මරණින් මතු බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි උපදිත්. එහි සිට මතුමත්තෙහි ධ්‍යාන වඩා අකනිටා බඹලොව දක්වා ක්‍රමයෙන් ගොස් නිවන් දක්නාහුවෙති. රූපාවචර කුසල විතීය ධ්‍යානය තෘතීයධ්‍යානය යන ධ්‍යානයෝ දෙදෙන හීන මධ්‍යම ප්‍රණීත යන ත්‍රිවිධාකාරයෙන් වඩා පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර, යන බ්‍රහ්මභූමි ත්‍රයෙහි උපදනාහුවෙත්. එතකුදුවුවත් විතීය ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මයෝ ස්වල්පානුභාව ඇතුවද, තෘතීය ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මයෝ මහානුභාව සම්පන්නවද ශරීර ප්‍රභාවිමානාදියෙන් වෙනස්වම උපදනාහුවෙත්. ඒ සමැදෑරුම් බ්‍රහ්මරාජයෝ ඒ බඹලොවින් චුතව මතු බඹතලයෙක්හි නූපදනාහුවෙත්නම් උපචාර සමාධි කාමාවචර භාවනාබලයෙන් සප්තකාම ස්වර්ගයෙහි ත්‍රිහෙතුකව හෝ ද්විහෙතුකව හෝ උපදනාහුවෙත්. රූපාවචර කුසල චතුර්ථධ්‍යානය හීන මධ්‍යම ප්‍රණීතවශයෙන් වඩා ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකළාහුනම් පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හක, යන බ්‍රහ්මභූමිත්‍රයෙහි උපදනාහුවෙත්. එහි ආයු පමණින් සිට කාලක්‍රියාකොට මතු බඹතලයට නොයන්නාහුවීනම් සප්තකාම ස්වර්ගයෙහි යටකී නයින් ප්‍රතිසන්

සී ගණිත්. රූපාවචර කුශල පඨම ධ්‍යානයද හීන, මධ්‍යම, ප්‍රණීත, වශයෙන් වඩා වෙහප්ඵල බඹතලයෙහි උපදනාහුවෙත්. ඒ ත්‍රිවිධාකාර බ්‍රහ්මයෝම සමානායුෂ්කවන්නාහු නමුත් ශරීර ප්‍රභාදියෙන් ධ්‍යානයෙහි කී වෙනස දක්නාලැබෙත්. ඒ පඨමධ්‍යානයම ශාසනයෙන් පිටත්හි අන්‍ය තීර්ථකයන් විසින් "සඤ්ඤා රොගො සඤ්ඤා ගණ්ඩො" යනාදීන් සතර නාමස්කන්ධයෙහි දොස් දුත වාෙයා කසිණභාවනාවෙන් ධ්‍යාන වඩා මරණින් මතු අසංඥතලයෙහි මනුෂ්‍ය ලොකයෙහි යම් ඉරියව්වකින් කාලක්‍රියා කළාහු නම් එම ඉරියව්වෙම්ම පිළිමරූ බැඳි ප්‍රතිමාලයක්මෙන් රූපස්කන්ධ මාත්‍රයක් පහලව ඒ ධ්‍යානවෙගය නොසිඳී පවත්නා පන්සියයක් මහාකල්ප මුළුල්ලෙහි ඒ බ්‍රහ්මලොකයෙහි වැස එයින් චුතව කාමධාතුවට එන්නාවූකල්හී පලමු ධ්‍යාන ලැබූ භවයෙහි කරණලද්දවූ යම්කිසි කාමියක් අවකාශ ලැබ එයින් පටිසන්ධියගන්නේසි. උපචාර සමාධි කාමාවචර භාවනාබලයෙන් ඔවුන්ගේ පටිසන්ධිය නොගන්නාබව දතයුතුයි. අනාගාමි පුද්ගලයෝ තුමූ මරණින් මත්තෙහි පඤ්චසුද්ධාවාස භූමියෙහි හෝ ඔවුන්ගේ භවනිකාන්තිවශයෙන් අනිකුදු බ්‍රහ්ම ලොකයෙක්හි හෝ උපදනාහුමෙත්. පඤ්චසුද්ධාවාසයෙහි උපදනා අනාගාමීහු තුමූ ඔවුන් ලබන්නාවූ පඨම ධ්‍යානයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය අධිකවීනම් අවිහතලයෙහිද, සතීන්ද්‍රිය අධිකවීනම් අතප්පතලයෙහිද, වීර්‍ය්‍යෙන්ද්‍රිය අධිකවීනම් සුදස්සතලයෙහිද, සමාධින්ද්‍රිය අධිකවීනම් සුදස්සීතලයෙහිද, ප්‍රඥෙන්ද්‍රිය අධිකවීනම් අකනිට්ඨතලයෙහිද ක්‍රමයෙන් උපදනාහුමෙත්. වෙහප්ඵලය, අකනිට්ඨභූමිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනභූමිය යනමේ තුන්තලයෙහි උපන්නාවූ ආර්‍ය්‍යයෝ තුමූ ඒ භූමීන්ගේ උතුම් බැවින් එයින් චුතව අනිත් භූමියෙක්හී නොඋපද මතුමාර්ගයන්ට පැමිණ නිවන් දක්නාහුවෙති එහෙයින්:—

"වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙ ච පතිට්ඨිතා
න පුනඤ්ඤත්‍ථ ජායන්ති සබ්බෙ අරියපුග්ගලා
බ්‍රහ්මලොකගතා හෙට්ඨා අරියා නොපපජ්ජරෙ."

යනු නාම රූප පරිච්ඡෙදයෙහි අනුරුද්ධාචාර්‍ය්‍යන් විසින් කියනලදී. මේ රූපාවචර කුශල චිත්ත තෙමේ පඤ්චප්‍රකාරයයි කීයේ නමුදු ගුණිත සංඛ්‍යා විසින් ගත්කල්හී අනෙක ප්‍රකාර වන්නේහි. ඒ ගුණිත සංඛ්‍යා ක්‍රමය මෙසේයි. රූපාවචර කුශල චිත්තයවනාහී ප්‍රථම ධ්‍යාන චිත්තය ද්විතීය ධ්‍යාන චිත්තය තෘතීය ධ්‍යාන චිත්තය චතුර්ථධ්‍යාන චිත්තයයි යනාදි ප්‍රඥපුද්ගල

යන් සඳහා සියලු රූපධ්‍යානයෝ මේ ධ්‍යාන චතුෂ්කයෙහි සංග්‍රහකොට චතුෂ්කනය වදාරණලද්දේයි. ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ පඤ්චම ධ්‍යානයයි සියලු රූපාරූප ධ්‍යානයෝ ධ්‍යාන පඤ්චකයෙහි සංග්‍රහකොට මන්දප්‍රාඥ පුද්ගලයන් සඳහා පඤ්චකනය වදාරණලද්දේයි. මේ චතුෂ්ක පඤ්චක දෙකට හේතුහූ කවර යත්? රූපාවචර චතුර්ථ ධ්‍යානය පඤ්චම ධ්‍යානය අරූපධ්‍යාන චතුෂ්කය යන ධ්‍යාන සයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයන්ගේ ගණන්වශයෙන් සමාන බැවින් හෙවත් මේ ධ්‍යාන සයම ධ්‍යානාඞ්ගද්වයකින් යුක්ත හෙයින් ධ්‍යානාඞ්ගද්වයකින් යුක්තවූ ධ්‍යානයෝ සදෙන චතුර්ථ ධ්‍යානයෙහිම සංග්‍රහකොට චතුෂ්කනය වදාරණලද්දේයි. ඒ ෂඩ් ධ්‍යානයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයන් ගණන්වශයෙන් සමාන නමුදු සුඛෛකාග්‍රතා යන ධ්‍යානාඞ්ගද්වය සමග යෙදුනාවූ ධ්‍යානය චතුර්ථ ධ්‍යානයයි කියාද, උපෙක්ෂා ඒකාග්‍රතා යන අඞ්ගද්වයකින් යුක්තවූ රූපාවචර පඤ්චමධ්‍යානය හා එම අඞ්ගද්වයකින්ම යුක්තවූ අරූපධ්‍යානයෝ සතරදෙනද අඞ්ග සමානත්වය සලකා උපෙක්ෂා ඒකාග්‍රතා යන අඞ්ගද්වයෙන් යුක්තවූ ධ්‍යාන පඤ්චකයම පඤ්චමධ්‍යානයයි වෙන්කොට වදාරණලද්දේයි. මෙසේ දේශනා කිරීමට හේතු කවර යත්? සංක්ෂෙප රුචිකවූ තීක්ෂ්ණප්‍රාඥ පුද්ගලයන්ගේ සත්‍යාවබෝධය පිණිස චතුෂ්කනයද විස්තාර රුචිකවූ මන්දප්‍රාඥ පුද්ගලයන්ගේ සත්‍යාවබෝධය පිණිස පඤ්චකනයද ඒ ඒ සූත්‍රාන්තයෙහි ධර්මප්‍රතිග්‍රාහක පුද්ගලයන්ගේ අදහස්බලා වදාරණලද්දේයයි දතයුතුයි. මේ චතුෂ්කපඤ්චකනය එක්කොටගත් කල්හී ඊට සුද්ධික නවකයයි කියත්. ඒ සුද්ධික නවකය "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤාය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤාය, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤාය 'යන සතරප්‍රතිපදාවන් හා මිශ්‍රකොට වදාළහෙයින් එක එක ප්‍රතිපදාවෙහි නවකයක් නවකයක් බැවින් ප්‍රභේදවන්නේය. "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤං පඨමජ්ඣානං කුසල චිත්තය" යනාදිවශයෙන් සුද්ධික නවකයට සතර ප්‍රතිපදාව මිශ්‍රකිරීමෙන් ප්‍රතිපදා නවක නවකයක්වෙයි. ඒ නවයම පරිත්ත පරිත්තාරම්මණය පරිත්ත අප්පමාණාරම්මණය අප්පමාණ පරිත්තාරම්මණය, අප්පමාණ අප්පමාණාරම්මණයයි, මෙසේ අප්‍රමාණචතුෂ්කය හා මිශ්‍රකොට වදාළහෙයින්ද, එක එක අරමුණෙක්හි නවක සතරක් බැගින්වෙයි. ඊට අනතුරුව ආරම්මණ නවක සතර හා ප්‍රතිපදා නවක සතරද මිශ්‍රකොට දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා පරිත්ත පරිත්තාරම්මණය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා පරිත්ත අප්පමාණාරම්මණය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා අප්පමාණ පරිත්තාරම්මණය, සුඛාපටිපදා ඛිප්පා

භිඤ්ඤද අප්පමාණ අප්පමාණාරම්මණයයි, මෙසේ ප්‍රතිපදාරම්මණයන් මිශ්‍රකොට වදාළහෙයින්ද, ප්‍රතිපදාරම්මණ මිශ්‍රකයෙහි නවක අවශ්‍යවෙයි. ඒ අට හා යටකී සුද්ධික නවකය ප්‍රතිපදානවකය ආරම්මණ නවකය යන ත්‍රිවිධාකාරය එක්කොටගත්කල්හි රූපාවචර කුශල චිත්තයෙහි නවකයෝ පස්විස්සෙක්වෙත්. "දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං," යනාදීන් ගත්තාවූ ක්‍රමයද, අෂ්ටප්‍රකාර අභිභායතනයෝය, අෂ්ටප්‍රකාර විමොක්ෂයෝය, සතර බ්‍රහ්මවිහාරය, දශඅශුභය යන මොවුන් භාවනාකොට ලබනලද්දවූ රූපාවචර කුශල ධ්‍යානයෝ ඒ ඒ ධර්මයන්ගේවශයෙන් ගුණිතකොටගත්කල්හි ලැබෙන්නාවූ ප්‍රභෙදයෝද ඒ ධර්මයන්ට අනුව දතයුතුයි. විපාක ක්‍රියාවන් ගුණිත සංඛ්‍යාවශයෙන් ගණින්නාවූකල්හි කුශලයෙහිකී ක්‍රමය විපාක ක්‍රියායෙහිද අනූනාධිකව ලැබෙත්යයි දතයුතුයි

## රූපාවචර කුශල විභාගය නිමියේයි,

අරූපාවචර දොළොස් චිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන කුශල චිත්තය, ආකාශානඤ්චායතන විපාක චිත්තය, ආකාශානඤ්චායතන ක්‍රියාචිත්තය, යනමේ තුන්දෙන ආකාශකසිණ වර්ජිතකොට ඇත්තාවූ නවකසිණයන් අතුරෙන් එක්තරා කසිණයකින් උපදවාගන්නාලද රූපාවචර පංචමධ්‍යානයට අරමුණු කසිණාලොක සංඛ්‍යාතවූ ප්‍රතිභාගනිමිත්ත කැමති පමණ ආකාශ ප්‍රදෙශයක පතුරුවා නැවත ඒ කසිණ ප්‍රතිභාග නිමිත්ත මෙනෙහිනොකොට අත්හැරීමෙන් කසිණාලොකය අන්තර්ධානවීයෙයි. ඒ කසිණයෙන් වැසී තිබූනාවූ ආකාශ ප්‍රදෙශය කසිණුග්ඝාටිමාකාසයයි කියත්. ඒ කසිණු ඉගුළු අනන්ත අරමුණුකොටගෙණ "ආකාසො අනන්තො ආකාසො අනන්තො" යනුවෙන් භාවනාවඩනකල්හි උපෙක්ෂා එකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානවය ආදිකොට ඇත්තාවූ සමතිස් චෛතසිකයන්ගෙන් සම්පූර්ණවූ ආකාශානඤ්චායතන කුසල චිත්තය පෘථග්ජන සෝවාන් සකෘදාගාමි අනාගාමි යන සතරාකාර පුද්ගලයන්ට උපදනේයි. ඒ ධ්‍යානලාභී පුද්ගල තෙමේ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකෙළේවිනම් ආකාශානඤ්චායතන භූමියෙහි ප්‍රතිසන්ධිවශයෙන් විපාක චිත්තය පහලවෙයි. එම ධ්‍යානය රහතුන්ට හෝ බුදු පසේබුදුවරයන්ට හෝ උපදනා කල්හි ආකාශානඤ්චායතන ක්‍රියා ධ්‍යානයයි කියත්. ඒ ආකාශානඤ්චායතන ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ විඤ්ඤාණඤ්චායතන

ධ්‍යානය උපදවනු කැමතිකල්හි පළමු උපන් ආකාශානඤ්චායතන කුශල චිත්තය "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් භාවනාවඩනකල්හි ආකාශානඤ්චායතන කුශලචිත්තය අරමුණුකොටගෙණ ධ්‍යානාඞ්ගවය ආදිකොට ඇත්තාවූ සමතිස් චෛතසිකයකින් සම්පූර්ණවූ විඤ්ඤාණඤ්චායතන කුශල චිත්තය පෘථග්ජනාදි සතරුකාර පුද්ගලයන්ට උපදනේයි. ඒධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකෙළේවීනම් විඤ්ඤාණඤ්චායතන භූමියෙහි විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය පටිසන්ධිවශයෙන් පහලවේ. එම ධ්‍යානය බුද්ධ පසේබුදු මහරහතුන් විසින් උපදවන්නාවූ කල්හි ක්‍රියා ධ්‍යානයයි කියත්. ඒ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලැබූවාවූ යොගාවචරයාගේ ඒ ධ්‍යානය ලබනවා හා සමග පෙර තුබූ ආකාශානඤ්චායතන කුශල චිත්තය හාත්පසින් නිරුද්ධ යෙයි. ඒ නිරුද්ධවීම නත්ථිභාව ප්‍රඥප්තියයි කියත්. ඒ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ විඥතවායතන ධ්‍යානලාභී යොගාවචර තෙමේ "නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි" යනුවෙන් භාවනා වඩනකල්හි නොයෙක් තමා විසින් පළමුවෙන් උපදවාගන්නා ලද්දාවූ ආකාශානඤ්චායතන කුශල චිත්තයාගේ උත්පාද, ස්ථිති, භඞ්ග, සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රය අතුරෙන් යටත් පිරිසෙයින් භඞ්ග මාත්‍රය තුදු අවශිෂ්ටවනැතැයි, භාවනා වඩනකල්හි යටකී ක්‍රම යෙන් ධ්‍යානාඞ්ගවය ආදිකොට ඇත්තාවූ සමතිස් ධර්මයකින් සම්පූර්ණවූ ආකිඤ්චඤ්ඤායතන කුශල චිත්තය උපදනේයි. ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකෙළේවීනම් ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය ප්‍රතිසන්ධිවශයෙන් පහලවේ. ඒ ධ්‍යානය බුදු පසේබුදු මහරහතුන් විසින් උපදවනකල්හි ක්‍රියා ධ්‍යානයයි ව්‍යවහාරකෙරෙත්. ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ තමා විසින් උපදවනලද්දාවූ ආකිඤ්චඤ්ඤායතන කුශල චිත්තය ශාන්තවශයෙන් මෙනෙහිකොට "සන්තමෙතං පණීතමෙතං" යනුවෙන් භාවනාවඩනකල්හි පෘථග්ජනාදි සතරුකාර පුද්ගලයන්ට ධ්‍යානාඞ්ගවය ආදිකොට ඇත්තාවූ සමතිස් චෛතසිකයකින් සම්පූර්ණවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශල චිත්තය උපදනේයි. ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේවීනම් පෘථග්ජනාදි සතරුකාර පුද්ගලයන්ට නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය ප්‍රතිසන්ධිවශයෙන් පහලවන්නේයි. බුදු පසේබුදු මහරහතුන් විසින් නිරෝධ සමාපත්තියට සමවදනා කල්හි චිත්ත චෛතසිකයන්ගේ නිරෝධයට පූර්වභාගයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය උපදනේයි. මේ

නෙවසඤ්ඤානාසඤ්ඤායතනචිත්තය සංඥාශීර්ෂවශයෙන් හෙවත් සංඥාව ප්‍රධානකොට නෙවසඤ්ඤානාසඤ්ඤායයි කියේ නමුදු ඒ චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ එකුන්තිස් ධර්ම හා චිත්තයද "නෙවඵස්සො නාඵස්සො නෙවවේදනා නාවේදනා නෙවචිත්තං නාචිත්තං" යනාදීන් සියලු ධර්මයන්ගේ පදාර්ථ දතයුතුයි. මේ සතර අරූපාවචර විපාක ධර්මයෝ සතර අරූතලයෙහි මුත් අන්කිසි භූමියෙක්හි නුපදිත්. රූපාවචර ධ්‍යානයන්ගේ විතර්කාදී අඩගයන් ඉක්මවා මතු මතු ධ්‍යාන උපදවන්නාක්මෙන් මේ අරූපධ්‍යානයෝ සතරදෙන නූපදනාහුය. මේ අරූප ධ්‍යානයන්ටවනාහි කිසුණු ඉගුළු අහසය, එහි පැවති විඥානය, එහි විඥානයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය ඒ නත්ථිභාව ප්‍රඥප්තියෙහි උපදවන්නාවූ ආකිඤ්චඤ්ඤායතන කුශල චිත්තය යන සතරදෙන යථාක්‍රමයෙන් අරමුණුවෙති.

එහෙයින්:—

"ආරම්මණාතික්කමතො චතස්සොපි භවන්ති වා,
අඞ්ගාතික්කමමෙතාසං න ඉච්ඡන්ති විභාවිනො."

යනු පුරාතන අර්ථකථාචාරීන්ගේ මතය බැවින් එක එක අරමුණ ඉක්මවා යාම මේ අරූප ධ්‍යානයන්ගේ ලක්ෂණයි.

එහෙයින් ජපපටාචාරීන් විසින්:—

"අසුචිම්හි මණ්ඩපෙ ලග්ගො
එකො තන්නිස්සිතො පරො;
ඕතඤ්ඤො බහිනිස්සාය,
තන්නිස්සායවා පරො."

යන්නෙන් ඒ සතර අරූපාවචරයන්ගේ ආලම්බන විභාගය දක්වනලදී. විඤ්ඤාණඤ්චායතන කුශල චිත්තය උපදවන්නාවූ යොගාවචරයා විසින් උප්පාදස්ථිති භඞ්ගසඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුක්තවූ ආකාශානඤ්චායතන කුශලචිත්තය "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් උප්පාදභඞ්ග සඞ්ඛ්‍යාතවූ කෙලවරක් නැත්තාවූ විඤ්ඤාණයයි කුමක්හෙයින් භාවනා වඩන්නේදයත්? විඤ්ඤාණය උප්පාදස්ථිති භඞ්ගසඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුක්තවුවද ඨානගත නාමය ඨානීහු කෙරෙහි ආරොපණය කොට ඨානූ පචාරවශයෙන් විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං යි කියනලදී." මචා උක්කුට්ඨිං කාරෙන්ති" යන උදාහරණයෙහිමේ මැසිහු ඉල්විරඥ ශසක්. එහෙයින් "මච" ශබ්ද

යෙන් මචයෙහි හොත්තාවූ පුරුෂයෝ ශබ්දකරන්නාහයි අසීගන්නාක්මෙනි. ඒ අරූපාවචර දොළොස් චිත්තය සොළසකඛත්තුකනය, සුඛිත එකකනය, පටිපදා එකකනය, චතුආරම්මණ එකකනය, යන මොවුන්ගේවශයෙන් ගුණිත කළකල්හි අනෙක ප්‍රකාරවෙත්. සොළසකඛත්තුකනයාය යනු දුක්ඛාපටිපදා දන්ධාභිඥාවෙහි ආරම්මණ එකෙක, සතරෙක, දුක්ඛාපටිපදා ඛිප්පාභිඥාවෙහිද ආරම්මණ එකෙක සතරෙක, සුඛාපටිපදා දන්ධාභිඥාවෙහිද ආරම්මණ එකෙක සතරෙක, සුඛාපටිපදා ඛිප්පාභිඥාවෙහිද ආරම්මණඑකෙක සතරෙකැයි, මෙසේ සොළසකඛත්තුකනය ආදිකොට ඇත්තාවූ අභිභායතන විමොක්ෂයන්ගේවශයෙන් ලැබෙන පරිද්දෙන් දතයුත්තේයි. රූපාවචරයෙහි කීනයින් මේ අරූපාවචර චිත්තයෙහිද කුශලයන් කෙරෙහි ලැබෙන්නාවූ ප්‍රභෙදය අනූනාධිකවශයෙන් විපාක ක්‍රියායෙහිද ලැබෙන්නේයයි දතයුතුයි.

## අරූපාවචර විභාගය නිමියේයි.

ලොකොත්තර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයන් ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවීනම් කාමාවචර මහාකුශලචිත්තයට කී අටතිස් ධර්මයගෙණ ඔවුන් අතුරෙන් අප්‍රමාණ්‍යදෙදෙන උධරණයකොට අවශෙෂ සතිස ලැබෙන්නේයයි කියයුතුයි. ප්‍රථම ධ්‍යානය ද්විතීය ධ්‍යානය තෘතීය ධ්‍යානය චතුර්ථධ්‍යානය පචමධ්‍යානය යන ධ්‍යාන පසින් යෙදුනාවූ ලොකොත්තර චිත්තයෝ අටදෙනද, සෞමිනස් උපෙක්ෂාවන්හි පළමුකී මහගගත චිත්තය ආශ්‍රයකොටගෙණ නොලැබෙන්නාවූ චෛතසිකයන් උධරණය කටයුත්තේයි. සත්විසි මහගගත චිත්තයන් හා ලොකොත්තර චිත්තයෝද මිශ්‍රකොට ප්‍රශ්නකෙළේවීනම් එකොළොස් ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි අටතිස් චෛතසික කෙතෙක්ද, ද්විතීය ධ්‍යාන එකොළොසෙහි ඒ අටතිස් චෛතසිකයන් අතුරෙන් විතර්කය උධරණයකොට අවශෙෂ සත්තිසද, තෘතීය ධ්‍යාන එකොළොසෙහි විතර්ක විචාර දෙදෙන උධරණයකොට අවශෙෂ සතිස් චෛතසිකයෝද, චතුර්ථ ධ්‍යාන එකොළොසෙහි විතර්ක, විචාර, ප්‍රීති, තුණ උධරණයකොට අවශෙෂ පන්තිසද, තෙවිසි පචම ධ්‍යාන චිත්තයෙහි විතර්ක විචාර ප්‍රීති අප්‍රමාණ්‍ය දෙදෙනය යන පස උධරණයකොට අවශෙෂ තෙතිස් චෛතසිකයද ලැබෙන්නේයයි විසඳිය යුත්තේයි. ලොකොත්තර චිත්තයෙහි ත්‍රිවිධ විරතීහු එකාන්ත

යෙන් ලැබෙන්නේසි. සියලු ශොභන චිත්තයන් එක්කොට නොලැබෙන්නාවූ චෛතසික මේයයි දන සුදුසු පරිද්දෙන් උඬරණයකොට කියයුත්තේසි. ශොභන සිත් හා අශොභන සිත් එක්කොට කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්න කෙළේවීනම් දෙපණස් චෛතසිකයම්ම බහා නොලැබෙන් නාවූ ධර්ම මේ මේයයි විසඳියයුත්තේසි. නොලැබෙන්නාවූ ධර්ම උඬරණය කරණ ක්‍රමය මෙසේසි. දෙසැටක් සොම්නස් සහ ගත චිත්තයෙහි දෙපණස් චෛතසිකයන් අතුරෙන් දෙස, ඉස්සා, මච්ඡරිය, කුකකුච්ච, විචිකිච්ඡා, යන පස උඬරණයකොට අව ශෙෂවූ සත්සාළිස් ධර්මය ලැබෙන්නේයයි විසඳියයුතුයි. උපෙක්ෂාසහගත පස්පණස් චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවීනම් ප්‍රීති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුකකුච්ච, යන පස උඬරණයකොට අවශෙෂවූ සත්සාළිස ලැබෙන්නේයයි විසඳියයුතුයි. උපෙක්ෂා සහගත පස් පණස් චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්න කෙළේවීනම් පීති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුකකුච්ච, යන පස උඬරණයකොට අවශෙෂවූ සත්සාළිස ලැබෙන්නේයයි විසඳිය යුතුයි. මොහ මූලික දෙසිතය, අභිසඥ දෙසිතය, යන සතර චිත්තය එකතුකොට කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවීනම් විතර්ක, විචාර, විචිකිච්ඡා, අකුශල සාධාරණ සතරදෙනය, යන මෙතෙක් ධර්මයෝ නොලැබෙන්නේයයි විස ඳියයුතුයි. මේ එකුන් අනූවක් චිත්තයන් අතුරෙන් දෙපණස් චෛතසිකයම ලැබෙන්නාවූ සිත් පස කවරහුදැයි ප්‍රශ්නයක් කෙළේවීනම් පළමුවෙනි මහාකුශල් දෙසිතය, පළමුවෙනි අකු ශල චිත්තය, පළමුවෙනි දෙස මූලික චිත්තය, විචිකිච්ඡා සහ ගත චිත්තය, යනමේ පචසයෙහි දෙපණස් චෛතසිකය ලැබෙ න්නේයයි කියයුතුයි. නියත අනියතවශයෙන් චෛතසිකය න්ගේලැබීම කෙසේදැයි ප්‍රශ්නයක්කෙළේවීනම් “ඉස්සාමච්ඡර කුකකුච්ච” යනාදී ගාථාව මෙතෙහිකොට සියලුකල්හි නොයෙ දෙන්නාවූ අනියත චෛතසිකමේයයි කියයුතුයි. ඊර්ෂ්‍යාවය, මාත්සර්‍ය්‍යය, කෞක්‍රත්‍යය, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව කරුණා, මුදිතා, මාන, ථීන, මිඬ, යන එකොළොස් දෙන අතුරෙන් ඉස්සා, මච්ඡරිය, කුකකුච්ච, යන තුන්දෙන වෙෂ මූලික චිත්තය උපදින සියලුකල්හි නූපදින්නාහුමය. අනුන්ගේ සම්පත්තියට රචා බලන්නාවූකල්හි වෙෂය හා ඊර්ෂ්‍යාවද, තමාගේ සම්පත්තිය සඟවනු කැමතිකල්හි වෙෂය හා මාත්සර්‍ය්‍යයද, කළාවූ දුශ්චරිත හා නොකළාවූ සුචරිතයන් අතු

රෙන් යම්කිසිවක් මෙනෙහිකොට පසුතැවෙනකල්හි වෙෂය හා කෞක්‍රත්‍යයද වෙන් වෙන්ව උපදනාහෙයින් මේ ධර්මයෝ අනියතනම්වෙත්. විරති චෛතසිකයෝ තුන්දෙනාද සියලු කාමාවචර කුශල චිත්තයෙහි ඒකාන්තයෙන් නොලැබෙන්නේමැයි. ආජීවට්ඨමක සීලසමාදානයෙහි හෝ පඤ්ච, අෂ්ට, දස, සීල සමාදානයක හෝ එක එක විරතිය එක එක ශික්ෂාපදය පිළිබඳව උපදනා කාමාවචර කුශලචිත්තයෙහි උපදනේයි. ලොකොත්තර චිත්තයෙහි පමණක් ඒ ඒ මාර්ගයෙන් වධ්‍යවූ කෙලශයන්ට ඇතුලත්වූ විරතිහු ඒ ඒ මාර්ග චිත්තක්ෂණයෙහි ලැබෙත්මැයි. එහෙයින් විරතිහු අනියතයයි කියත්. කරුණා මුදිතා යන අප්‍රමාණ්‍යයෝ දෙදෙනද සප්‍රීතික ධ්‍යානචිත්තයක හෝ කාමාවචර කුශලචිත්තයක හෝ කාමාවචර ක්‍රියා චිත්තයක හෝ දුක්ඛිත සුඛිත සත්වයන් අරමුණුකිරීම්වශයෙන් පවත්නාකල්හිම ලැබෙත්. සෙසු කාමාවචරාදී චිත්තයෙහි නොලැබෙත්මැයි. එහෙයින් අප්‍රමාණ්‍යයෝද අනියතනම්වෙත්. මානචෛතසිකයද ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තයක්පාසා සියලුකල්හි නොලැබේමැයි. ඒ ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තය හීනමානය සදිසමානය ප්‍රණීතමානය යන යම්කිසි මානයක්හුගේ වශයෙන් පවත්නාකල්හී ඒ චිත්තයෙහි සමහර කලෙක්හිම මානය ලැබෙන්නේමැයි. ඉස්සා, මච්ඡර, කුක්කුච්ච, විරති, කරුණා, යන ශබ්ද හා සමග "නා නා" ශබ්දය මුත් කදාචි ශබ්දය නොයෙදෙයි. මාන ශබ්දය හා කදාචි ශබ්දය මුත් නා නා ශබ්දය නොයෙදෙයි. ථීන චෛතසිකය හා මිද්ධ චෛතසිකයද සියලුම් සසංස්කාරික චිත්තයක් පාසා නොලැබෙන්නේමැයි. යම්කලෙක්හි චිත්ත චෛතසිකයන්ගේ හැකිලීමක් ඇතිකල්හිම ථීන මිද්ධය ලැබෙන්නේමැයි. එහෙයින් සහ ශබ්දය සමග කදාචි ශබ්දයද ථීන මිද්ධ දෙදෙනා සමග මුත් මානය හා නොයෙදෙයි. නොහොත් ඉස්සා, මච්ඡර, කුක්කුච්ච, විරති, කරුණා යන ධර්මයන් හා කදාචි ශබ්දය හා නා නා ශබ්දයද සුදුසු පරිද්දෙන් යෙදෙන්නාහුමැයි. මානචෛතසිකය හා කදාචි ශබ්දයම යෙදෙයි. ථීන මිද්ධ ශබ්දදෙදෙනා හා සමග සහ ශබ්දය හා කදාචි ශබ්දයත් යෙදෙන්නේමැයි. ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විරති, කරුණා චෛතසිකයෝ තුමූ වෙන වෙනම කදාචි ශබ්දය සමගද නා නා ශබ්දය සමගද යෙදෙන්නාහුවෙත්. මාන චෛතසික තෙමේ කදාචි ශබ්දය හා සමගම යෙදෙන්නෝයි. ථීන මිද්ධ ශබ්දයෝ තුමූ කදාචි ශබ්දය හා සමගද සහ ශබ්දය හා සමගද යෙදෙන්නාහු වෙත්. නා නා ශබ්දය සමග නොයෙදෙන්නාහුවෙත්, නොහොත්

ථීන මිද්ධ දෙදෙනා සසඞ්ඛාරික පඤ්චකයෙහි යෙදෙන්නේයයි කියේ නමුදු ද්වේෂ මූලික සසංඛාරික චිත්තය උපදනාකල්හි චිත්ත චෛතසික ධර්මයන්ගේ හැකිලීම හා අනුන්ගේ සම්පත්තියට ඊර්ෂ්‍යාකිරීමද යනමේ කාරණා තුණ එක්වූකල්හි පටිසම්ප්‍රයුක්තවීමට හෙතුවක්ද චිත්ත චෛතසික ධර්මයන්ගේ හැකිලීමක්ද අනුන්ගේ සම්පත් ආදියට ඊර්ෂ්‍යාකිරීමක්ද එකවිට ඇති කල්හි ද්වේෂ මූල සසඞ්ඛාරික චිත්තයෙහි ථීන මිද්ධ දෙදෙනා හා ඊර්ෂ්‍යාවද යෙදෙන්නේයි. මෙසේ යෙදෙනකල්හි ථීන මිද්ධ ශබ්දය සමගද ඉස්සා ශබ්දය සමගද සහ ශබ්දය සමගද යෙදෙන්නේයි. "ඉස්සා, ථීන, මිද්ධ" යන චෛතසිකයෝ තුන්දෙන ද්වේෂ මූලික සසඞ්ඛාරික චිත්තයෙහි සමහර කලෙක යෙදෙන්නාහුවෙත්. සමහර කලෙක තුන්දෙනම නොයෙදෙන්නාහුවෙත්. සමහර කලෙක ථීන මිද්ධ දෙදෙන පමණක් යෙදෙන්නාහුවෙත්. සමහර කලෙක ඊර්ෂ්‍යාව පමණක් යෙදෙන්නේය. සමහර කලෙක මේ ධර්මයෝ තුන්දෙනම යෙදෙන්නාහුවෙති. සමහර කලෙක තුන් දෙනම නොයෙදෙන්නාහුවෙති. එහෙයින් මේගාථාවෙහි ආවාවූ "කදාචි, නා නා, සහ" යන නිපාත ශබ්දයෝ තුන්දෙන සුදුසු පරිද්දෙන් යොදාගතයුත්තාහුය. "ඉස්සා, ථීන, මිද්ධ" තුන්දෙන හට යම් ක්‍රමයක් දක්වනලද්දේනම් "ථීන, මිද්ධ, මච්ඡරිය" තුන් දෙනහටද "ථීන, මිද්ධ, කුක්කුච්ච, යන තුන්දෙනහටද යෙදිය යුත්තේයි. ලොභ මූලික දිට්ඨි විප්‍රයුක්ත සසඞ්ඛාරික චිත්තවයෙහි "ථීන මිද්ධය" හා "මානය"ද සමග "සහ" ශබ්දය හා "නා නා" ශබ්දය "කදාචි" ශබ්දයද තුන් ආකාරයකින් ලැබෙන ක්‍රමය ද්වේෂ මූලික සසඞ්ඛාරික චිත්තයටකී නයින් යොදාගතයුතුයි. "ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච," මාන" යනමේ චෛතසික සතර දෙන හා සමග ථීන මිද්ධය යෙදෙන්නාවූකල්හි ඒ සතර චෛතසිකයන් හා සමග නානා ශබ්දයද ඒ ඒ චිත්තය හා සමග කදාචි ශබ්දයද යෙදෙන්නාවූ ක්‍රමය සුදුසු පරිද්දෙන් යොදාගතයුතුයි. ලොකොත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ දෙදෙන කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? ලොකොත්තර චිත්තයෝ අටදෙන වනාහි නිර්වාණය අරමුණුකෙරෙත්. අප්‍රමාණ්‍ය ධර්මයෝවනාහි සත්වප්‍රඥප්තිය අරමුණුකෙරෙත්. මෙසේ ආලම්බණනානත්වය හෙතුකොටගෙණ ලොකුත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ නොයෙදෙන්නාහුයයි දතයුතුයි. සත්විසි මහග්ගත චිත්තයන් අතුරෙහි විරතීහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුදයත්? මහග්ගත චිත්තයෝවනාහි කසිණාදී ප්‍රඥප්තිය අරමුණුකෙරෙති. ලොකුත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු නිර්වාණය අරමුණු

කෙරෙති. ලෞකික චිත්තයන් අතුරෙන් විරති චෛතසිකයන් ලැබෙන්නාවූ ලෞකික චිත්තයෝ ඒ ඒ ව්‍යතික්‍රම වස්තූන් අරමුණුකොට පවත්නාහුවෙති. එහෙයින් ඇතැම් කාමාවචර චිත්තයෙක්හිම ලෞකික විරතීහු ලැබෙන්නාහුයයි දතයුතුයි. නොහොත් මහග්ගත කුසල චිත්තයෝ තුමූ කාමාවචර කුශලයන්මෙන් කායකර්‍ම වචීකර්‍මයෝ තදඞ්ගප්‍රහාණවශයෙන් නොනැසියහැකිවෙති. ලොකොත්තර චිත්තයන්මෙන් දුශ්චරිත දුරාජීවයන් සමුච්ඡේද ප්‍රහාණවශයෙන් නොනැසිය හැකිවෙයි. එහෙයින් මහග්ගත චිත්තයෙහි විරතීහු නොලැබෙන්නාහුමැයි. අප්‍රමාණ්‍යයෝ දෙදෙන වනාහි ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යානයන් අතුරෙන් එකී එකී ධ්‍යාන චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ දෙදෙන එකවිට නොලැබ එක එක චිත්තයෙහි එක එක අප්‍රමාණ්‍ය ධර්‍මය කුමක්හෙයින් ලැබෙන්නේද යත්? සතළිස් කර්‍මස්ථානයන් අතුරෙන් මෙත්තාකරුණා භාවනාදෙක හැර අවශෙෂවූ අටතිස් කර්‍මස්ථානයන්ගෙන් උපදවන්නාවූ ප්‍රථම ධ්‍යානාදියෙහි කිසිකලෙකත් අප්‍රමාණ්‍යයෝ නොලැබෙත්මැයි. දුක්ඛිත සත්වයන් කෙරෙහි අප්‍රමාණ්‍යවශයෙන් වඩන්නාවූ කරුණා භාවනාව හෙතුකොටගෙණ උපදනා ධ්‍යාන චිත්තයෙහි කරුණා චෛතසිකය මුත් මුදිතා චෛතසිකය නූපදනේයි. අප්‍රමාණවූ සුඛිත සත්වයන් කෙරෙහි මුදිතාභාවනා වඩන්නාවූ යොගාවචරයාහට උපදනා ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි මුදිතා චෛතසිකය මුත් කරුණා චෛතසිකය නූපදනේයි. මේ අප්‍රමාණ්‍යයෝ දෙදෙන වනාහි ලෞකික උපෙක්ෂා සහගත චිත්තයෙහි ලැබෙන්නාක්මෙන් පඤ්චම ධ්‍යාන මහග්ගත චිත්තයෙහි කුමක්හෙයින් නොලැබෙන්නේද යත්? අර්පණාබවට පැමිණියාවූ අප්‍රමාණ්‍ය තෙමේ සොම්නසින් වෙන්ව කිසිකලෙක නොලැබෙනහෙයින් පඤ්චම ධ්‍යාන චිත්තයෙහි අප්‍රමාණ්‍යනොලැබෙත්මැයි. ද්විතීය ධ්‍යාන චිත්තයෙහි කුමක්හෙයින් විතර්කය නූපදනේදයත්? "භාවනාබලෙන නූප්පජ්ජති" යනු අටුවා බැවින් භාවනාවෙහි පුරුදුකිරීම්වශයෙන් විතර්කය නූපදනේයයි දතයුතුයි. භාවනාවෙහි පුරුදුකිරීම කෙසේවන්නේදයත්? රූපාවචර ප්‍රථම ධ්‍යානලාභීවූ කාමාවචර රූපාවචර ත්‍රිහෙතුක පුද්ගලයෙක් තෙමේ මාවිසින් අතීශයින් නොලබනලද්දාවූ උතුම් ගුණධර්‍මයක් ලබන ලද්දේයයි ඒ ධ්‍යානයට නැවත නැවත සමවැදී ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ සංස්කාර ධර්‍මයන් සම්මර්ශනය කොට එහි යෙදුනාවූ විතර්කාදී ධ්‍යානාඞ්ග පඤ්චකය අතුරෙන් පළමුකොට විතර්කය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ විපීයකු, විචාරය ප්‍රත්‍ය

වෙක්ෂාකරන්නාවූ වීථියක, ප්‍රීතිය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ වීථියක, සුඛය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ වීථියක, ඒකාග්‍රතාව ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ වීථියක, නැවත ඒ ධ්‍යානාඞ්ග පඤ්චකය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ වීථියකැයි මෙසේ චිත්ත වීථි උපදවමින් ප්‍රත්‍යවෙක්ෂාකොට තදනන්තරව ද්විතීය ධ්‍යානය උපදවනු කැමති කල්හි ප්‍රථම ධ්‍යානයෙහි ආදීනව දැක නොහොත් කාමච්ඡන්ද නීවරණ නැමති සතුරෙක් ආසන්නයෙහි ඇත්තේය, විතර්ක නැමති ඖදාරික අඞ්ගයකින් යුක්තවන්නේය. එහෙයින් මේ ඖදාරිකවූ ධ්‍යානාඞ්ගය හැර ධ්‍යානාඞ්ග චතුෂ්කයකින් සම්පූර්ණවූ ද්විතීය ධ්‍යානය ලැබුයේනම් යෙහෙකැයි සිතා ද්විතීය ධ්‍යානයට කාරණවූ පෘථිවි තුදුස් කර්මස්ථානයන් අතුරෙන් තමහට අභිමතවූ යම්කිසි කමටහනක් භාවනා වඩා අඞ්ගචතුෂ්කයකින් යුක්තවූ ද්විතීය ධ්‍යානය ලබන්නේයි. එහෙයින් "භාවනාබලෙන නුප්පජ්ජති" යනු කීහ. ලෝකෝත්තර චිත්තයෙහි වනාහි "සොතාපත්ති මග්ගෙන හි දිට්ඨිගත සම්පයුත්ත විචිකිච්ඡා සහගතානි පඤ්චඅකුසල චිත්තානි අනවසෙසෙන පහීයන්ති" යනු සංඛෙපවණ්ණනාටීකා බැවින් සෝතාපත්තිමාර්ගය කාරණකොටගෙණ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්සතරය, විචිකිච්ඡා සහගත චිත්තයයන චිත්තයන් පස්දෙන නිරවශෙෂවසයෙන් නසත්. අවශෙෂ අකුශල චිත්තයන් සත්දෙනාගේ අපායගමනීය ශක්තියෙන්යුක්තවූ අනාදිමත් සංසාරයෙහි රැස්කරණලද්දාවූ ගණන පථාතික්‍රාන්තවූ අපරාපරිය අකුශල කර්මරාශිය නසන්නේයි. "සකදාගාමිමග්ගෙන දිට්ඨිගත විප්පයුත්තානි වෙදෙමනස්ස සහගත චිත්තානිවෙති" යනු සංඛෙපටීකා වචන බැවින් දිට්ඨිගත විප්‍රයුක්ත සිත්සතරය, ද්වෙෂ මූලික දෙසිතය යන මේ අකුශලයන් සදෙනාගේ කාම ධාතුවෙහි උපදවා යාවක භාවාදී ඖදාරික විපාක දියහැකිවූ කර්මශක්තිය තුනීකරන්නේයි. "අනාගාමිමග්ගෙන කාමරාග ව්‍යාපාදනි අනවසෙස වසෙන පහීයන්ති" යනු එම ටීකා බැවින් දිට්ඨිවිප්‍රයුක්ත සතරය, දෞර්මනස් සහගත දෙසිතය යනසදෙන අනවශෙෂ ප්‍රහාණයෙන්ද දිට්ඨිගත විප්‍රයුක්ත සතරදෙනාගේ කාම රාගයෙන් යුක්තවූ කොටස්ද නිරවශෙෂයෙන් ප්‍රහාණයකෙරේ. "අරහත්ත මග්ගෙන චත්තාරි දිට්ඨිගත විප්පයුත්තානි උද්ධච්ච සහගත චිත්තඤ්චාති අනවසෙසවසෙන පහීයන්ති" යනු ටීකා බැවින් රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, යන උද්ධම්භාගිය සංයෝජන පක්ෂයෙහිවූ යටමාර්ගත්‍රයෙන් තුනීකරණලද්දාවූ දෘෂ්ටිගත විප්‍රයුක්ත සතරය, උද්ධච්ච සහගත චිත්තය යන මේ චිත්තයන් පස්දෙන නිරවශෙෂවසයෙන් නසන්නේයි. මේ සතර

මාර්ග චිත්තයන්ට අනතුරුව ඒ ඒ මාර්ග චිත්ත වීථියෙහි උපදනා ඵලචිත්තයෝ සතරදෙනවනාහි ඒ ඒ මාර්ගයෙන් නසනලද්දාවූ අකුශලයන් නිරවශෙෂවසයෙන් ප්‍රහාණයකොට ඒමාර්ගයන්ගේ හා ඵලයන්ගේද අතරතුර ඇසිපිය හෙලන කාලයක් පමණ කුඩා අතරක් නොදී තීක්ෂණ ප්‍රාඥයන්ට ඵල සිත් තුනක්ද මන්ද ප්‍රාඥයන්ට ඵල සිත් දෙකක්ද උපදනාහුය. ඒ උපදනා ඵල චිත්තයන්ට ආනන්තරික සමාධියයි ව්‍යවහාර කෙරෙත්. මේ මනුෂ්‍ය ශරීරයෙහිම නිවන් සැප විඳිනාහෙයින් ඒ ඵල චිත්තයට වඩා උතුම්වූ සැපයක් භවත්‍රයෙහිම නැත්තේයයි දතයුතුයි. මේ ලොකොත්තරයෙහි ක්‍රියා සිත් නැත්තේ කුමක්හෙයිනයත්? "මග්ගස්ස එකචිත්තක්ඛණිකත්තා" යනු අටුවා බැවින් නැසියයුතු යම්කිසි වෘක්ෂයකට එකම අසනිප්‍රහාරයක් වැදීමෙන් ඒ වෘක්ෂයාගේ යට මූලාශ්‍රය දක්වා එකක්ෂණිකවම විනාශවනහෙයින් නැවත ඒ වෘක්ෂයට අසනි ප්‍රහාරයවැදීමෙන් නැසියයුත්තක්නැත්තේයි. එපරිද්දෙන්ම මාර්ගචිත්තයෙන් නැසූවාවූ කෙලශයන්ගේ නැවත නැවතත් නැසියයුත්තක් ඇත්තාහුවෙත්නම් නැවත නැවත උපදනා ලොකොත්තර මාර්ග චිත්තයෝ ක්‍රියා සිත්බවට පැමිණිය යුත්තාහුය. එබඳු නැසීමක් නොවනහෙයින් යම්කිසි උතුම් වස්තුවක් ලැබුවාවූ පුරුෂයෙකු විසින් ඒවස්තුව බලමින් ප්‍රීති සැප විඳින්නාක්මෙන් මාර්ග ඵලලාභීවූ ආර්‍ය්‍යයන්වහන්සේ දිට්ඨධම්ම සුඛවිහාරය පිණිස ඵල සමාපත්තියට සමවැදීමමුත් ක්‍රියාචිත්තයන්ගේ ඉපදීමෙක් නැතැයිදතයුතුයි. ලොකොත්තර මාර්ග චිත්තයවනාහි සතරමාර්ගය හා සම්ප්‍රයුක්තවීම්වශයෙන් සතරාකාරවන්නේ නමුදු සුඤ්ඤත අප්පණිහිත ප්‍රතිපදාදීන්ගේවශයෙන් ගුණිතකළකල්හි අනෙක ප්‍රකාරවන්නේයි. ඒ කෙසේ යත්? සුඤ්ඤත සොතාපත්තිමාර්ගය අප්පණිහිත සොතාපත්ති මාර්ගය යන දෙකින් ගුණිතකරණලද්දාවූ සොතාපත්ති මාර්ගවය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, යන සතර ප්‍රතිපදාවන්ගෙන් සුඤ්ඤත අප්පණිහිත සොතාපත්ති මාර්ගවය, වෙන වෙනම ගුණිතකළකල්හි සොතාපත්ති මාර්ගචිත්තයෝ අටදෙනෙක්වෙත්. ඒ මාර්ග චිත්තයෝ අට දෙන පළමු කී සුඤ්ඤත අප්පණිහිත සොතාපත්ති මාර්ගචිත්තවය එක්කරගත්කල්හි සොතාපත්ති මාර්ග චිත්තයෝ දසදෙනෙක් වෙත්. ඒ දසදෙන සතිපට්ඨානය, සම්‍යක් ප්‍රධානය, ඍද්ධි පාදය, ඉන්ද්‍රිය, බලය, බොජ්ඣඞ්ගය, සච්චය, සමථය, විදර්ශනාය, ලොකුත්තර ධර්මය, ස්කන්ධය, ආයතනය, ධාතුය, ආහාරය,

ඵස්සය, වෙදනාය, සඤ්ඤාය, චෙතනාය, චිත්තය යනමේ එකුන්
විසි අභිනිවෙසයන් කරණකොටගෙණ ගුණිතකළකල්හි එක්
සිය අනූවක් සොතාපත්ති මාර්ග චිත්තයෝවෙති. ඒ එක්සිය අනූ
වෙහි පළමුකී සොතාපත්ති මාර්ගදසය යෙදූකල්හි දෙසියයෙක්
වෙත්. ඒ සොතාපත්ති මාර්ග දෙසියය ඡන්ද, චිත්ත, විරිය,
විමංස, යන අධිපති ධර්ම සතරින් ගුණිතකළකල්හි අටසියයෙක්
වෙත්. ඒ අටසියයක් ශ්‍රොතාපත්ති මාර්ග චිත්තයන්ට අධිපතීන්
හා මිශ්‍රනොවූ පළමුකී දෙසියය එක්කළකල්හි සොතාපත්ති
මාර්ගචිත්තයෝ දහසෙක්වෙති. මේ මාර්ග දහස්දෙන නානාධි
මුක්තිකවූ දහසක් ආර්‍ය්‍යයන්ටමුත් එක් ආර්‍ය්‍යයෙක්හට දෙසි
නෙක් නොලැබිය හැකිවෙයි. එතකුදුවූවත් සොතාපත්ති මාර්ග
චිත්තයෙහි ප්‍රභෙද බැවින් දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සොතා
පත්තිමාර්ගයයි කියත්. සකෘදාගාමි අනාගාමි අර්හත් යන මාර්ගත්‍ර
යෙහිද මෙසේම නය දහස බැගින් ලැබිය යුතුහෙයින් සතර
මාර්ගයෙහි නය සාරදහසක් ලැබෙන්නාහුය. ඒ සාරදහසක් නය
ක්‍රමය සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මා
ආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික
මාර්ගයන්ගේ ලොභයෙන් අවශිෂ්ටවූ කෙලශයන්ගෙන් නික්ම
යාමය. ලොභයෙන් අවශිෂ්ටවූ අකුශල චිත්තයන්ගෙන් නික්ම
යාමය. අකුශල මූලත්‍රයෙන් නික්මයාමය. සම්ප්‍රයුක්ත ධර්ම සහි
තවූ කාමාදී චතුරාශ්‍රවයන්ගෙන් නික්මයාමය යනමේ පඤ්ච
ප්‍රකාරවූ නීය්‍යාණිකාර්ථයෙන් ගුණිතකළකල්හි ඒ සතරමාර්ග
යෙහි විසිදහසක් නය ලැබෙන්නාහුය. නැවත ඒ සාරදහසක්
මාර්ග චිත්තය ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ විතර්ක, විචාර, ප්‍රීති
සුඛ ඒකාග්‍රතා උපෙක්ෂා යන ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් ගුණිතකළ
කල්හි නය විසිදහසෙක්වෙත්. නැවත ඒ මාර්ගචිත්තයන් සාර
දහසම සර්වසංග්‍රාහිකවූ ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් ගුණිතකළකල්හි
විසිදහසක් නය ක්‍රමයෝ ලැබෙන්නාහුවෙත්. මේ ත්‍රිවිධ ක්‍රම
යන් අතුරෙන් ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ග පඤ්චක
යාගේ වශයෙන් යෙදීම ශුෂ්ක විදර්ශකයන්ගේවශයෙන්ද, සර්ව
සංග්‍රාහික ධ්‍යානාඞ්ග පඤ්චකයාගේවශයෙන් යෙදීම සමථයානික
යන්ගේ වශයෙන්ද ගතයුත්තේයි. මෙසේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික
මාර්ගයන්ගේ පඤ්චප්‍රකාර නීය්‍යාණිකාර්ථයන්ගේවශයෙන් විසිදහ
සෙක, ශුෂ්කවිදර්ශකයන්ගේ ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ අඞ්ග
පඤ්චකයන්ගේවශයෙන් විසිදහසෙක, සමථයානිකයන්ට ලැබිය
යුතුවූ සර්වසංග්‍රාහික ධ්‍යානාඞ්ගයන්ගේවශයෙන් විසිදහසෙකැයි
යනමේ තෙවිසි දහස එක්කොටගත්කල්හි සතර මාර්ගයෙහි

ලැබියයුතුවූ නව සැටදහස සච්ච විභඞ්ගයෙහි ආ ක්‍රමයෙන් ලැබෙන්නාහුයයි දතයුතුයි. කැඩපතින් මුඛ නිමිත්ත බලන්නාවූකල්හි මුඛයෙහි ඇත්තාවූ සියලු අවයව පෙණෙන්නාක් මෙන් සතරමාර්ග චිත්තයන්ගේ ප්‍රතිබිම්බවූ සතරඵල චිත්තයෙහිද සැටදහසක් නය ලැබියයුතුහෙයින් මාර්ගඵල චිත්තයන් අට දෙනාගේ එක්ලක්‍ෂ විසිදහසක් නයක්‍රමයෝ සුදුසු පරිද්දෙන් යොදාගතයුත්තාහුය. ඒ එක්ලක්‍ෂ විසිදහසක් නය ක්‍රමයෝ තුමූ සත්විසි මහග්ගත චිත්තයෙහි ලැබියයුතු සතිස්නවකයන්ගේවශයෙන් හා කාලදේශ සන්තානාදීන්ගේවශයෙන්ද, ගුණිතකළකල්හි මාර්ගඵල චිත්තයන්ගේ සංඛ්‍යාව අනන්තාපරිමාණවෙයි. පඤ්චද මේ මාර්ගඵල චිත්තයෝ අටදෙන විතර්කාදි ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් ගුණිතකළකල්හි මාර්ග චිත්තයෝ විසිදෙනෙක්ද, ඵලචිත්තයෝ විසිදෙනෙක්දැයි සමසාළිස් මාර්ගඵල සිත් කෙනෙක්වෙත්. පළමුවෙන් දක්වනලද්දවූ සංක්‍ෂෙප පුඩුවෙහි එකූන් අනූවක් චිත්ත මධ්‍යම පුඩුවයයි කියනලද්දවූ එකසිය විසිඑකක්වීමට හෙතුව මේ මාර්ගඵල චිත්තයන්ගේ වැඩීමයි. ඒකෙසේවන්නේද යත්? පාදකධ්‍යානය සම්මසිත ධ්‍යානය පුද්ගලාධ්‍යාශයධ්‍යානය යනමේ තුන්දෙනා අතුරෙන් එකතර ධ්‍යානයක් හා සදෘශවන බැවින් ලොකොත්තර චිත්තයන් අට දෙනා අතුරෙන් එකී එකී චිත්තයෙහි ධ්‍යානාඞ්ග පස පස බැගින් යෙදෙනහෙයින් ලොකොත්තර චිත්තයෝ සමසාළිස් දෙනෙක්වෙත්. පාදකධ්‍යානය යනු කවර යත්? "පඨමජ්ඣානාදීසු යං යං ඣානං සමාපජ්ජිත්වා තතො තතො වුට්ඨාය සංඛාරෙ සම්මසන්තස්ස වුට්ඨාන ගාමිනී විපස්සනා පවත්තා තං පාදකජ්ඣානං නාම" යනු ටීකා බැවින් කර්මස්ථාන භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගල තෙමේ ප්‍රථම ධ්‍යානාදි පඤ්ච ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයකට සම්වැද ඒ ධ්‍යානයෙන් නැගිට ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අරමුණුකොටගෙණ "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ සඞ්ඛාරා අනත්තා" යනුවෙන් නැවත නැවත භාවනාවඩන්නාවූ ඒ යොගාවචරයාහට සෝවාන් ආදී මාර්ගයක් ලබනු කැමතිකල්හි ඒ සංස්කාර ධර්මයන් අරමුණුකොටගෙණ මනොද්වාරා වර්ජන චිත්තයක් ඉපිද මන්ද ප්‍රාඥයාහට පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් පූර්වභාග විදර්ශනා චිත්තයෝ සතරදෙනෙක් හෝ තීක්‍ෂ්ණ ප්‍රාඥයාහට උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් පූර්වභාග විදර්ශනා චිත්තයෝ තුන්දෙනෙක් හෝ ඉපිද පස්වෙනි හෝ සතරවෙනි හෝ චිත්තය සොතාපත්ති මාර්ග චිත්තයවූ සවෙනි සත්වෙනි

චිත්තවය හෝ පස්වෙනි සවෙනි සත්වෙනි සිත් තුණ හෝ සොතාපත්තිඵල සිත්වෙත්. මේ සොතාපත්ති මාර්ග වීථියෙහි සතර වරක් හෝ තුන් වරක් හෝ උපදනා පූර්වභාග විදර්ශනා චිත්තයන් අතුරෙන් අනුලොම චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය වුඨානගාමිනී විදර්ශනාය, සංඛාරොපෙක්ෂාඥානය, සච්චානු ලොමිකඥානය, සානුලොම ඥානය, යන නම් සතර කින් ව්‍යවහාරවෙයි. වුඨානගාමිනී විදර්ශනා සඞ්ඛ්‍යාත පූර්වභාග විදර්ශනා චිත්තයට පළමු සමවන් ධ්‍යානය පාදකවෙයි. ඒ ලබන්නාවූ මාර්ගඵල චිත්තයෝද ඒ සමවන් ධ්‍යානයට බඳු අඞ්ගයන්ගෙන් යුක්තවම උපදනාහුය. එහෙයින් පාදක ධ්‍යානයයි ව්‍යවහාර කෙරෙත්. මාර්ගඵල ලබන්නාවූ සියලු ආර්යයෝ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයට ආරොපණයකොට භාවනාවඩනකල්හි එක් ආර්යයෙක්හට එක් ලක්ෂණයක්ම වැටහී මාර්ගඵලයන්ගේ ලැබීම ස්වභාව ධර්මයක්වෙයි. බුදුවරයන්ට වනාහි ඤාණුත්තරිය පුද්ගල බැවින් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණත්‍රයම එකවිට වැටහී සෝවාන් ආදී මාර්ගයන්ගේ පිළිවෙළින් අභීත් මාර්ගඵලාවබොධය කෙරෙත්. ඒ අභීත්මාර්ග ඵලයෙහි දශබල චතුවෛශාරද්‍යඥානාදී සියලු ඥානයෝ අන්තර්ගතවෙත්. අන්‍යවූ යම්කිසි ශ්‍රාවකයෙක් තෙමේ "අනිච්චං, දුක්ඛං, අනත්තං" යන ත්‍රිලක්ෂණ භාවනාව වඩා අනාත්මවශයෙන් දැක ආත්ම ග්‍රහණය මුදන්නීවේද, ඔහුට උපදනා මාර්ග වීථියෙහි අනුලොමසිත හා යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය සුඤ්ඤතානුපස්සනා නම් විමොක්ෂමුඛය වෙයි. තදනන්තරව උපදනා මාර්ගයද සුඤ්ඤත මාර්ගනම්වෙයි. ඊට අනතුරුව උපදනා ඵලයද සුඤ්ඤත ඵලය නම්වෙයි. ඒ මාර්ග ඵලයන්ට අරමුණුවන්නාවූ නිර්වාණ ධර්මයද, සුඤ්ඤත නිර්වාණයයි කියත්. තවත් ශ්‍රාවකයෙක් තෙමේ තිලකුණු භාවනා වඩා සියලු ධර්මයන් අනිත්‍යවශයෙන් දැක විපල්ලාස නිමිත්ත මුදන්නීවේද, ඔහුට උපදනා මාර්ග වීථියෙහි අනුලොම සිත හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ අනිමිත්තානුපස්සනා විමොක්ෂ මුඛය නම්වෙයි. ඊට අනතුරුව උපදනා මාර්ගඵල නිර්වාණ ධර්මයෝ තුමූ අනිමිත්ත මාර්ගය අනිමිත්ත ඵලය අනිමිත්ත නිර්වාණයයි ව්‍යවහාරයට යෙත්. තවත් ශ්‍රාවකයෙක්තෙමේ තිලකුණු භාවනා වඩා සියලු සංස්කාර ධර්මයන් දුක්වශයෙන් දැක තෘෂ්ණාපණිධිය මුදන්නීවේද ඔහුට උපදනා මාර්ග වීථියෙහි අනුලොම සිත හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ අප්පණිහිතානු පස්සනා විමොක්ෂ මුඛයනම්වෙයි. ඊට

අනතුරුව උපදනා මාර්ගඵල නිර්වාණ ධර්මයෝද අප්පණිහිත මාර්ග අප්පණිහිත ඵල අප්පණිහිත නිර්වාණයයි ව්‍යවහාරයටයෙත්. මෙසේ මාර්ග චිත්ත වීථියෙහි යෙදෙන්නාවූ අනුලෝම සිත හා යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ වුට්ඨානගාමිනී විදර්ශනාය, සංඛාරෝපෙක්ඛා ඥානය, සච්චානුලෝමිකඥානය, අනුලෝමඥානය, යන නම් ලබන්නාක්මෙන්ම සුඤ්ඤතානුපස්සනා විමොක්ඛ මුඛය, අනිමිත්තානුපස්සනා විමොක්ඛමුඛය, අප්පණිහිතානුපස්සනා විමොක්ඛමුඛය, යන නම් ලබා ඒ හෙතුවෙන් මාර්ගඵල නිර්වාණ ධර්මයෝද ඒ ඒ නම් ලබන්නාහුයයි දතයුතුයි. යම් නගරයකට ඇතුල්වන්නාවූ වාරයක් විවෘතවූකල්හි ඒ වාරය කාරණකොටගෙණ නිර්භයවූ ක්ෂෙමවූ නගරාභ්‍යන්තරයට ඇතුල් වන්නාවූ පුරුෂයෙකුමෙන් මේ විදර්ශනා ඥානයෝ තුන්දෙන දොරටු තුණක් බඳුහෙයින් විමොක්ෂ මුඛයෝයයි කියත්. සම්මසිත ධ්‍යානය යනු "යං යං ඣානං සම්මසන්තස්ස සා පවත්තා තං සම්මසිතජ්ඣානං" යනු ටීකා වචන බැවින් ධ්‍යානලාභිවූ යොගාවචර පුද්ගලයෙක් තෙමේ ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් අනිත්‍ය දුඃඛ අනාත්මවශයෙන් භාවනා වඩනකල්හි ඒ වුට්ඨාන ගාමිනී විදර්ශනාව පවත්නීද නොහොත් අනිත්‍යාදීවශයෙන් භාවනා වැඩීම හෙතුකොටගෙණ ඒධ්‍යානය අනිත්‍යවශයෙන් හෝ දුක්වශයෙන් හෝ අනාත්මවශයෙන් හෝ වැටහී පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ සංඛ්‍යාතවූ පූර්වභාග විදර්ශනා චිත්තයන් පවත්නාකල්හි අනුලෝම සිත හා සමඟ යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ වුට්ඨානගාමිනී විදර්ශනා නම්වෙයි. ඒ විදර්ශනාවගේ ඉපදීමට අනිත්‍යාදීවශයෙන් සම්මර්ශනයකල ධ්‍යානය ඒ මාර්ගඵලයන්ට උපකාරවන බැවින් සම්මසිත ධ්‍යාන ආයයී පුද්ගලනම්වෙයි. "පුද්ගලධ්‍යාශය ධ්‍යානය" යනු "අහො! වත මෙ පඨමජ්ඣානසදිසො මග්ගො පඤ්චඞ්ගිකො දුතියජ්ඣානාදීසු වා අඤ්ඤතර සදිසො චතුරඞ්ගිකාදි භෙදො මග්ගො භවෙය්‍යාති" එවං යොගාවචරස්ස උප්පන්නජ්ඣාසයො පුග්ගලජ්ඣාසයො නාම" යනු ටීකා බැවින් අෂ්ටසමාපත්තිලාභීවූ යම් යොගාවචරයෙක් තෙමේ ප්‍රකීර්ණක ධර්මයන් අනිත්‍යාදීවශයෙන් සම්මර්ශනයකරනකල්හි අහො! මට ප්‍රථම ධ්‍යානයට බඳු පඤ්චාඞ්ගයකින් යුක්තවූ මාර්ගයක් ලැබූයේනම් යෙහෙක, ද්විතීය ධ්‍යානය තෘතීය ධ්‍යානය චතුර්ථ ධ්‍යානය පඤ්චම ධ්‍යානයන්ට බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගයක් ලැබූයේනම් යෙහෙකැයි මෙසේ යොගාවචරයාට උපන් අදහස් පරිද්දෙන් ඒ ඒ ධ්‍යානයන්ට බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගය උපදී. මේ පුග්ගල

ලජ්ඣාසය නම්වෙයි. කම්ස්ථානවඩන්නාවූ ධ්‍යානලාභීවූ යොගාවචර පුද්ගලයෙක් තෙමේ ප්‍රථම ධ්‍යානාදීවූ ධ්‍යානයන් පස්දෙනා අතුරෙන් යම් යම් ධ්‍යානයකට සමවදනේවේද ඒ ධ්‍යානයෙන් නැගිට ත්‍රෛභූමික මිශ්‍ර සංස්කාරයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනාකොට ශ්‍රොතාපත්ති මාර්ගාදිය ලබන්නේවේද ඒ ලබනලද්දාවූ මාර්ග තෙමේ සමවන් ධ්‍යානයට බඳු අඞ්ගයන්ගෙන් යුක්තවන්නේයි. ඒ යොගී පුද්ගලයාහට විදර්ශනාවට පාදකවූ යම්කිසි ධ්‍යානයක් නැතිවම ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් අනිත්‍යාදීවශයෙන් විදර්ශනාකොට ශ්‍රොතාපත්ති මාර්ගාදිය ලබන්නේවේද ඒ ලබන්නාවූ මාර්ගය වනාහි අනිච්චාදිවශයෙන් විදර්ශනාකළාවූ ධ්‍යානයට බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගයලබන්නේයි. ඒ යොගාවචර පුද්ගල තෙමේ ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම් ධ්‍යානයකට සමවැද ඒ සමවන් ධ්‍යානයෙන් නැගිට අභිමතවූ ධ්‍යානයක් අනිත්‍යාදී වශයෙන් විදර්ශනාකොට ලබන්නාවූ මාර්ග තෙමේ යොගී පුද්ගලයාගේ අදහස් පරිද්දෙන් ඒ පාදක ධ්‍යානයට හෝ සම්මර්ශනය කළ ධ්‍යානයට හෝ සමානවූ ධ්‍යානාඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගයලබන්නේයි. එබඳු අදහසක් නැත්තාවූ යොගාවචර පුද්ගලයාහටවනාහි යට යට ධ්‍යානයට සමවැද ඒ ඒ ධ්‍යානයෙන් නැගිට මතු මතු ධ්‍යානයන් විදර්ශනාකෙරේද ඒ යොගාවචරයාහට ලැබෙන්නාවූ මාර්ගයවනාහි පාදක ධ්‍යානය අපෙක්ෂා නොකොට සම්මර්ශනයකළ ධ්‍යානයට බඳුවූ මාර්ගය ලැබෙන්නේයි. මතු මතු ධ්‍යානයන්ට සමවැද ඒ ඒ ධ්‍යානයෙන් නැගිට යට යට ධ්‍යාන ධර්මයන් විදර්ශනාකෙරේද ඒ යොගාවචර පුද්ගලයාහට සම්මර්ශනයකළ ධ්‍යානය අපෙක්ෂා නොකොට සමවන් ධ්‍යානයට බඳු අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගය ලැබෙන්නේයි. ධ්‍යානලාභීවූ යොගාවචරයෙක් හෝ ධ්‍යාන නොලැබූ යොගාවචරයෙක් හෝ මාර්ගඵල ලබනු කැමතිකල්හි ඒධ්‍යානය නොසලකා ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් අනිත්‍යාදීවශයෙන් මෙනෙහිකරන්නාවූකල්හි ඔහුට ලැබෙන්නාවූ මාර්ගය ප්‍රථම ධ්‍යානයට බඳු අඞ්ග පසකින් යුක්තවම ලැබෙන්නේයි. තවද එකම යොගාවචර පුද්ගලයෙක්හට පාදකධ්‍යානවශයෙන් සෝවාන් මාර්ගයද, සම්මසිත ධ්‍යානවශයෙන් සකෘදාගාමි මාර්ගයද, පුද්ගලජ්ඣාසය ධ්‍යානවශයෙන් අනාගාමි මාර්ගයද, ශුෂ්කවිදර්ශකවශයෙන් රහත් මාර්ගයද, ඔහුගේ කැමති පරිද්දෙන් ලැබියහැකිවේ. සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිතවශයෙන් විමොක්ඛමුඛත්‍රයද, එසේම එකම ආර්යයෙක්හට මාර්ගත්‍රයෙක්හි ලැබියහැකිවේයි.

එසේ ඒ සියලු මාර්ගඵලලාභීවූ ආර්යයෝ ඵලසමාපත්ති උපද වන්නාවූකල්හිද ඒ විමොක්ෂ මුඛත්‍රය ලබන්නාහුයි. එක්ආර්ය යෙක්හට එක් දවසක් ලැබෙන්නාවූ ඵලසමාපත්තිය සුඤ්ඤත විමොක්ෂ මුඛවශයෙන් ලැබ දෙවෙනි දවස්හි අනිමිත්ත විමොක්ෂ මුඛවශයෙන්ද, තුන්වෙනි දවස්හි අප්පණිහිත විමොක්ෂ මුඛ වශයෙන්ද නොහොත් එකම දවස්හි තුන්වරක් ඵලසමාපත්ති න්ට සමවදින්නාවූ ආර්යයන්වහන්සේ ඉදින් කැමතිවීනම් තුන්වරක් විමොක්ෂ මුඛත්‍රය ලැබියහැකිවෙයි.

## මේ ලොකොත්තර චිත්තයන්ගේ විභාගයයි.

## පදගතාර්ථ.

පන, අකුශල චෛතසිකයන්ගේ සම්ප්‍රයොගනයින් අන්‍යවූ ශොභන චෛතසිකයන්ගේ සම්ප්‍රයොග ක්‍රමය දක්වමි:– සොභනෙසු, පස්විසි සොභන චෛතසිකයන් අතුරෙන්; සොභ න සාධාරණා, සොභන සාධාරණවූ චෛතසිකයෝ; තාව, පළමු කොට; මයාවුච්චමනා, යනු අධ්‍යාහාරයි. එකූනවීසති ඉමෙ චෙතසිකා, ශ්‍රද්ධාව ආදීකොට ඇත්තාවූ චිත්තුජ්ජුකතාව අව සන්කොට ඇත්තාවූ මේ එකුන්විසි චෛතසිකයෝ තුමූ; සබ්බ සුපි, සියලුම්; එකූනසට්ඨිසොභන චිත්තෙසු, එකුන්සැටක් ශොභ න චිත්තයෙහි; සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්; පන, ශොභන සාධාරණයන්ගෙන් අන්‍යවූ විරතීන් කියමි:—තිස්සොපි විර තියො, තුන්විරති චෛතසිකයෝ නොහොත් විරති චෛතසික යෝ තුමූ; ලොකුත්තර චිත්තෙසු, ලොකොත්තර සිත් අටෙහි; සබ්බථාපි, ඒ ඒ දුශ්චරිත දුරාජීවයන් ප්‍රහාණයකිරීම්වශයෙන් පැවැත්තාවූ සියලු ආකාරවශයෙන්ද; නියතා, එකාන්තයෙන් හෙවත් සැමකල්හි; එකතොව, එකක්ෂණවශයෙන්ම; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙති. පන, නියතයෙන් අන්‍යවූ අනියතය කියමි:—ලොකියෙසු, ලෞකිකවූ ශොභන සිත් සතලොස්දෙනා අතුරෙන්; කාමාවචර කුසලෙසෙව්ව, කාමාවචර කුශල් සිත් අටෙහිම; කදාචි, කලින්කල; සන්දිස්සන්ති, ප්‍රකටව දක්නාලැ බෙත්. විසුං විසුං, වෙන වෙනම; “ජායන්ති,” යනු අධ්‍යාහාරයි. පන, විරති චෛතසිකයන්ගෙන් අන්‍යවූ අප්‍රමාණ්‍ය චෛතසික යන් කියමි. අප්පමඤ්ඤායො, අප්‍රමාණ්‍ය චෛතසිකයෝ තුමූ; වාදසසු, දොළොස් වැදෑරුම්වූ; පඤ්චමජ්ඣානවජ්ජිත මහග්ගත චිත්තෙසුචෙව, පඤ්චමධ්‍යාන යන නම් ඇත්තාවූ චිත්තයන් තොර

නොව ඇත්තාවූ මහද්ගත චිත්තයෙහිද, කාමාවචර කුසලෙසුච, කාමාවචර කුශල් අටෙහිද; සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තෙසුච, සහෙතුකවූ කාමාවචර ක්‍රියා චිත්තයෙහිද, ඉති, මෙසේ; අඩවීසති චිත්තෙසෙවව, අටවිසි චිත්තයෙහිම; කදාචි, කලින්කල; නානාහුත්වා, වෙන් වෙන්ව; ජායන්ති, උපදීත්; (අහෙතුක කාමාවචර ක්‍රියා සිත් තුණක් ඇති බැවින් ඔවුන් නොගන්නා පිණිස සහෙතුක ශබ්දය යොදනලදී.) පන, විභජ්ජ වාදයෙන් අන්‍යවූ කෙච්වාදය දක්වමි:—එකෙ, මේ සොළොස් කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන්; උපෙක්ඛා සහගතෙසු, උපෙක්ෂා සහගත සිත් අටෙහි; කරුණාමුදිතා, කරුණාමුදිතා චෛතසිකයෝ තුමූ; නසන්තීති, නැත්තාහයි; කෙච්වදන්ති; ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ කියත්. (අනුරුධාචාරීන් විසින් පිළි නොගත් බැවින් කෙච්වාදයක්කෙළේසි. ඒවාදය මූලටීකාචාරීන්ගේ වාදයකි.) පන, අප්‍රමාණ්‍යයන්ගෙන් අන්‍යවූ පඤ්ඤින්ද්‍රිය චෛතසිකය දක්වමි:-පඤ්ඤා, ප්‍රඥෙන්ද්‍රිය චෛතසිකය තෙමේ; ද්වාදසසු ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසුචෙව, ඥාන සම්ප්‍රයුක්තකුශල් සතරය, විපාක සතරය, ක්‍රියාසතරය යන දොළොස් කාමාවචර ශොභන චිත්තයෙහිද; සබ්බසුපි, සියලුම; පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙසුචෙව, පන්තිස් මහගත ලොකුත්තර චිත්තයෙහිද; ඉති, මෙසේ; සත්තචත්තාළීස චිත්තෙසු, සත්සාළිස් චිත්තයෙහි; සම්පයොගං ගච්ඡන්ති, සම්ප්‍රයොගයටයෙත්. ඉති, මෙසේ; තෙසං, ඒ ශොභන පස්විසි චෛතසිකයන්ගේ; චතුබ්බිධො, සතරවැදෑරුවූ; සම්පයොගො, සම්ප්‍රයොග ක්‍රමය, වෙදිතබ්බො, දතයුත්තේසි.

එකූනවීසති ධම්මා, එකුන්විසි චෛතසිකයෝ තුමූ; එකූනසට්ඨිසු, එකුන්සැටක් චිත්තයෙහි; ජායන්ති, උපදීත්; තයො ධම්මා, විරති චෛතසිකයෝ තුන්දෙන තුමූ; සොළස චිත්තෙසු, සොළොස් චිත්තයෙහි; ජායන්ති, උපදීත්; ද්වයං, අප්‍රමාණ්‍ය චෛතසික දෙක; අඩවීසතියං, අටවිසි චිත්තයෙහි; ජායති, උපදී; පඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය චෛතසිකය; සත්තචත්තාළීස චිත්තෙසුපි, සත්සාළිස් චිත්තයෙහිද; පකාසිතා, ප්‍රකාශකරණලද්දීය; එවං, (යථාවුත්තනයෙන,) මේකියනලද ක්‍රමයෙන්; සොභනා, පස්විසි ශොභන චෛතසිකයෝ තුමූ; සොභනෙසෙවව, ශොභන සිත් එකුන්සැටෙක්හිම; චතුධා, සතරකාරයකින්; සම්පයුත්තාහොන්ති, සතරසම්ප්‍රයොග ලක්ෂණයෙන් යෙදුනාහු වෙත්. ඉස්සාමච්ඡෙර කුක්කුච්චවිරතී කරුණාදයො, ඊර්ෂ්‍යාවය

මාත්සය්‍යය, කෞකෘත්‍යය, විරතීහු තුන්දෙනය, කරුණා මුදිතා දෙදෙනය යන මේ චෛතසිකයෝ තුමූ; කදාචි, කලින්කල; නානාජායන්ති, වෙන් වෙන්ව උපදිත්; මානොච, මාන චෛතසික තෙමේද; කදාචි ජායති, කලින්කල උපදී. තථා, එපරිද්දෙන්; ථින මිද්ධං, ථින මිද්ධ චෛතසිකවය තෙමේ; සහ, එක්ව; කදාචි ජායති, කලින්කල උපදී. නොහොත් තථා, එපරිද්දෙන්; ථින මිද්ධං, ථින මිද්ධවය තෙමේ; ඉස්සා මච්ඡෙර කුක්කුච්චෙහිච; ඊර්ෂ්‍යාවය, මාත්සය්‍යය, කෞකෘත්‍යය, යන චෛතසිකයන් සමගද; මානෙනච, මාන චෛතසිකය හා සමගද; සහ, එක්ව; කදාචි ජායති; කලින්කල උපදී; යථාවුත්තානුසාරෙන, යම් යම් කියනලද ක්‍රමය අනුව යාමෙන්; එකාදස, එකොළොස් චෛතසිකයෝ තුමූ; අනියත යොගිනො, අනියතයෝගී චෛතසිකයෝ නම්වෙත්; හෙවත් එකාන්තයෙන් නොයෙදෙන්නාවූ චෛතසිකයෝ නම්වෙත්; සෙසා, අනියතයෝගී එකොළොස් චෛතසිකයන්ගෙන් අන්‍යවූ එක්සාළිස් චෛතසිකයෝ තුමූ; නියත යොගිනො, නියතයෝගී චෛතසිකයෝනම්වෙත්. හෙවත් එකාන්තයෙන් යෙදෙන්නාවූ චෛතසිකයෝ නම්වෙත්. තෙසං, ඒ නියත යෝගී අනියත යෝගී චෛතසිකයන්ගේ; යථාරහං, සුදුසු පරිද්දෙන්; සඞ්ගහච, එක්කොට හකුළුවා ගැණීමද නොහොත් ගණන්කිරීමද, ඉදානි, දැන්වනාහි; අහං, මම; පවක්ඛාමි; ප්‍රභෙදවශයෙන් කියම්; අනුත්තරෙ, ලොකෝත්තර චිත්තයෙහි; ඡත්තිංසාපි, සතිසක්වූද; ධම්මා, චෛතසික ධර්මයෝ; ලබ්භන්ති; ලැබිය යුත්තාහුවෙත්; මහග්ගතෙ, මහද්ගත චිත්තයෙහි; පඤ්චතිංසාපිධම්මා, පන්තිස්ක්වූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබිය යුත්තාහුවෙත්. කාමාවචර සොභනෙ, කාමාවචර ශොභන චිත්තයෙහි; අට්ඨතිංසාපිධම්මා, අටතිස් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්; අපුඤ්ඤම්හි, අකුශල චිත්තයෙහි; සත්තවීසතිපි ධම්මා, සත්විස්සක් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්; අහෙතුකෙ, අහෙතුක චිත්තයෙහි; ද්වාදසපිධම්මා, දොළොස් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්; ඉතිච, මෙසේම; යථාසම්භව යොගෙන, සම්භවවූ පරිද්දෙන් යෙදීමෙන්; තෙසං, ඒ ගණනා: සමොධාන, සංග්‍රහක්‍රමයෙහි; පඤ්චධා, පස්ප්‍රකාරයකින්; සඞ්ගහො, සංග්‍රහකිරීම නොහොත් හකුළුවා පිඩුකිරීම; හොති, වෙයි.

සඞ්ගහො කථං? හොති, සංග්‍රහක්‍රමය කෙසේ වන්නේද යත්? ලොකුත්තරෙසු, ලොකෝත්තර චිත්තයෙහි; තාව, පළමු

කොට; "සඞ්ගහො මයාවුච්චතෙ," යනු අධ්‍යාහාරයි. අඬ්සු පඨමජ්ඣානික චිත්තෙසු, අෂ්ට ප්‍රකාරවූ ප්‍රථම ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ ලොකොත්තර චිත්තයෙහි; අඤ්ඤසමානා, අඤ්ඤසමාන නම් ඇත්තාවූ; තෙරස චෙතසිකා, තෙළෙස් චෛතසිකයෝද; අප්පමඤ්ඤාවජ්ජිතා, අප්‍රමාණ්‍ය දෙදෙනවර්ජිතකොට ඇත්තාවූ; තෙවීසති සොභන චෙතසිකා, තෙවිස්සක් ශොභන චෛතසිකයෝද; ඉති, මෙසේ; ඡත්තිංස ධම්මා, සතිස් චෛතසික ධර්‍මකෙනෙක් තුමූ; සඞ්ගහං, සංග්‍රහයට; ගච්ඡන්ති, යෙත්; තථා, එපරිද්දෙන්; දුතියජ්ඣානික චිත්තෙසු, ද්විතීය ධ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; විතක්කවජ්ජා, විතර්‍කය තොරකරණලද්දාවූ; පඤ්චතිංස ධම්මා, පන්තිස් චෛතසික ධර්‍මකෙනෙක් තුමූ; සඞ්ගහං, සංග්‍රහකටයුතුබවට, හෙවත් සංග්‍රහයට; ගච්ඡන්ති, යෙති. තතියජ්ඣානික චිත්තෙසු, තෘතීය ධ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; විතක්ක විචාරවජ්ජා, විතර්‍ක විචාරයන් විසින් තොරකරණලද්දාවූ; චතුත්තිංසධම්මා, සූතිස් චෛතසික ධර්‍මකෙනෙක් තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවටයෙත්. චතුත්ථජ්ඣානික චිත්තෙසු, චතුර්ථධ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; විතක්ක විචාර පීතිවජ්ජා, විතර්‍ක විචාර ප්‍රීතීන් විසින් තොරකරණලද්දාවූ; තෙත්තිංස ධම්මා, තෙතිස් චෛතසික ධර්‍ම කෙනෙක් තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවට යෙත්. පඤ්චමජ්ඣානික චිත්තෙසු, පඤ්චමධ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහිද; උපෙක්ඛා සහගතා, උපෙක්ෂාවෙදනාව හා එක්ව හටගත්තාවූ; තෙයෙව ධම්මා, ඒ චතුර්ථ ධ්‍යානයෙහි යෙදෙන්නාවූ තෙතිස් ප්‍රභෙදවූ අන්‍ය සමාන ශොභන චෛතසිකයෝම; සඞ්ගය්හන්ති, සංග්‍රහවනුලැබෙත්. ඉති, මෙසේ; සබ්බථාපි, සර්‍වප්‍රකාරයෙනුදු, අඬ්සු ලොකුත්තර චිත්තෙසු, ලොකුත්තර සිත් අටෙහි; පඤ්චකජ්ඣානවසෙන, පඤ්ච ධ්‍යානයන්ගේවශයෙන්; පඤ්චධාව, පස්ප්‍රකාරයකින්ම; සඞ්ගහො හොති, සංග්‍රහයවෙයි. ඉති, මෙසේ; තෙසු, ඒලොකුත්තර සිත් අටෙහි; පඤ්චවිධො සඞ්ගහො, පඤ්චප්‍රකාරවූ සංග්‍රහක්‍රමය; වෙදිතබ්බො, දතයුත්තේයි; "සඞ්ගහත" යන සියලු තන්හි "සඞ ඒකතො ගතා පවත්තා උප්පන්නා" යනු අර්ථයි.

අනුත්තරෙ, ලොකොත්තර චිත්තයෙහි; සඞ්ගහො, සංග්‍රහක්‍රමය තෙමේ; යථාක්කමං, පිළිවෙළින්; ඡත්තිංසච, සතිසක් චෛතසිකයෝද, පඤ්චතිංසච, පන්තිසක් චෛතසිකයෝද, චතුත්තිංසච, සූතිසක් චෛතසිකයෝද; තෙත්තිංසචවයං, තෙතිස් චෛතසික යුගලයෙක්ද; ඉච්චෙවං, (ඉති එවං) මෙසේම; පඤ්චධාඨිතා, පස්ප්‍රකාරයක්න් සිටියාහුය.

පන, ලොකොත්තර චිත්තයෙන් අන්‍යවූ මහද්ගත චිත්තයෙහි සංග්‍රහනය දක්වමි:—මහග්ගතෙසු, සත්විසි මහද්ගත චිත්තයන් අතුරෙන්; තීසුපඨමජ්ඣානිකචිත්තෙසු, තුන්ප්‍රකාරයෙන් ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ මහද්ගත චිත්තයෙහි; තාව, පලමුකොට "සඞ්ගහොමයාවුච්චතෙ" යනු අධ්‍යාහාරයි. අඤ්ඤසමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ; තෙරසචෙතසිකා, තෙළෙස්චෙතසිකයෝද; විරතිත්තයවජ්ජිතා, විරති චෛතසිකත්‍රය විසින් නොරකරණලද්දාවූ; චාවීසති සොභන චෙතසිකාච, දෙවිසි ශොභන චෛතසිකයෝද; ඉති, මෙසේ; පචත්තිංසධම්මා, පන්තිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවට යෙත්. පන, ඒ ප්‍රථම ධ්‍යානයෙහිම විශෙෂාඞ්ගයක් දක්වමි:—එහ්, ඒම ප්‍රථම ධ්‍යාන මහද්ගත සිත් තුණෙහි නොහොත් මේ පන්තිස් චෛතසික ධර්මයන් අතුරෙන්; කරුණා මුදිතා, කරුණා මුදිතාවෝ දෙදෙන; පච්චෙකමෙව, වෙන වෙනම; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය, තථා, එපරිද්දෙන්; දුතියජ්ඣානිකචිත්තෙසු, ද්විතීය ධ්‍යානයෙන් යුක්තවූ මහද්ගත සිත් තුණෙහි; විතක්කවජ්ජා, විතර්ක චෛතසිකය විසින් වර්ජිත කරණලද්දාවූ; චතුත්තිංස ධම්මා, සූතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවටයෙත්. තතියජ්ඣානිකචිත්තෙසු, තෘතීය ධ්‍යානයෙන් යුක්තවූ මහද්ගත සිත් තුණෙහි, විතක්ක විචාර වජ්ජා, විතර්ක විචාරයන් විසින් වර්ජිතකරණලද්දාවූ; තෙත්තිංස ධම්මා, තෙතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. චතුත්ථජ්ඣානික චිත්තෙසු, චතුර්ථධ්‍යානයෙන් යුක්තවූ මහග්ගත සිත් තුණෙහි; විතක්ක විචාර පීති වජ්ජා, විතර්ක විචාර ප්‍රීතීන් විසින් නොරකරණලද්දාවූ; ද්වත්තිංස ධම්මා, දෙතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. පන, විශෙෂාර්ථයක් දක්වමි:—නොහොත් සුඛික්‍රමයෙන් අන්‍යවූ මිශ්‍රිත ක්‍රමයක් දක්වමි:—පණ්ණරසසු, පසළොස් ප්‍රභෙදවූ; පචමජ්ඣානික චිත්තෙසු, පඨමධ්‍යානයෙන් යුක්තවූ චිත්තයෙහි; අප්පමඤ්ඤායො, අප්‍රමාණ්‍ය ධර්මයෝ දෙදෙන, නලබ්භන්ති, නොලැබිය යුත්තාහුවෙත්. ඉති, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙන්ද, සත්තවීසති මහග්ගත චිත්තෙසු, සත්විසි මහග්ගත චිත්තයෙහි; පචකජ්ඣානවසෙන, ධ්‍යානාඞ්ගයන් පස්දෙනාගේවශයෙන්, පචධාච, පස්පරිද්දකින්ම; සඞ්ගහො හොති, සංග්‍රහයවෙයි. ඉති, මේ උක්තප්‍රකාරයෙන්: තෙසු, ඒ සත්විසි මහග්ගත චිත්තයෙහි; පචවිධො, පස්වැදෑරුම්වූ; සඞ්ගහො, සංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි.

මහග්ගතෙ, මහද්ගත චිත්තයෙහි, සඞ්ගහො, සංග්‍රහක්‍රමය තෙමේ; පඤ්චකකමං, පිළිවෙළින්; පඤ්චතිංසච, පන්තිස් චෛතසිකකෙනෙක්ද, චතුත්තිංසච, සූතිස් චෛතසිකකෙනෙක්ද, තෙත්තිංසච, තෙතිස් චෛතසිකකෙනෙක්ද, ද්වත්තිංසචෙව, දෙතිස් චෛතසිකකෙනෙක්ද, තිංසච, සමතිස් චෛතසිකකෙනෙක්ද, ඉති, මෙසේ; පඤ්චධාව, පස් පරිද්දකින්ම; සියුං, සිටියාහුය.

පන, මහග්ගත චිත්තයෙහි සංග්‍රහක්‍රමයෙන් අන්‍යවූ කාමාවචර ශොභන චිත්තයෙහි සංග්‍රහ ක්‍රමය දක්වමි: කාමාවචර සොභනෙසු, සූවිසි කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන්; කුසලෙසු, අටමහා කුශල චිත්තයෙහි; තාව; පළමුකොට "සඞ්ගහො වුච්චතෙ" යනු අධ්‍යාහාරයි. පඨමෙ, පළමුවන මහා කුසල චිත්තවයෙහි; අඤ්ඤසමානා තෙරස චෙතසිකාච, අන්‍ය සමානනම්වූ තෙළෙස් චෛතසිකකෙනෙක්ද, පඤ්චවීසති සොභන චෙතසිකාච, පස්විසි ශොභන චෛතසිකකෙනෙක්ද, ඉති, මෙසේ; අට්ඨතිංස ධම්මා, අටතිස් චෛතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවට යෙත්. පන, ඒ කුශල චිත්තවයෙහිම විශෙෂාර්ථයක් දක්වමි. එත්ථ, මේ පළමුවෙනි මහාකුශලචයෙහි; නොහොත් අටතිස් චෛතසික ධර්මයන් අතුරෙන්; පඤ්චපි, පඤ්චප්‍රකාරවූද; අප්පමඤ්ඤාවිරතියො, අප්‍රමාණ්‍ය විරතීහු; පච්චෙකමෙව, එක එකක්ම; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය; තථා, එපරිද්දෙන්; දුතියෙ, දෙවෙනි මහාකුශලචයෙහි; ඤාණවජ්ජිතා, ඥාණය විසින් තොරකරණලද්දාවූ; සත්තතිංස ධම්මා, සත්තිස් චෛතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවටයෙත්. තතියෙ, තුන්වන මහාකුශලචයෙහි; ඤාණසම්පයුත්තා, ඥානය හා සම්ප්‍රයුක්තවූ; පීතිවජ්ජිතා, ප්‍රීතිය විසින් තොරකරණලද්දාවූ; සත්තතිංස ධම්මා, සත්තිස් චෛතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහබවටයෙත්. චතුත්ථෙ, සතරවනමහා කුශලචයෙහි; ඤාණපීති වජ්ජිතා, ඥාන ප්‍රීති දෙදෙන විසින් තොරකරණලද්දාවූ; තෙච්චෙව, ඒ සතිසක් ප්‍රභෙදවූ චෛතසිකයෝම; සඞ්ගය්හන්ති, සංග්‍රහවනුලැබෙත්; ක්‍රියාචිත්තෙසුපි, මහාක්‍රියා සිත්අටෙහිද, විරතිවජ්ජිතා, විරති චෛතසිකයන් විසින් තොරකරණ ලද්දාවූ; තෙයෙව, ඒ පන්තිස් ප්‍රභෙදවූ චෛතසිකයෝම; තථෙව, ඒමහා කුශලචිත්තයට සදෘශවම; චතුසුපිදුකෙසු, සතර දුකයෙහිම; චතුධාව, සතර පරිද්දකින්ම; සඞ්ගය්හන්ති, සංග්‍රහවනුලැබෙත්; තථා, ඒක්‍රියාචිත්තයෙහි කීතයින්;

විපාකෙසුච, අටමහා විපාක චිත්තයෙහිද; අප්පමඤ්ඤා විරති වජ්ජිතා, දෙවැදෑරුම් අප්‍රමාණ්‍යය තුන් වැදෑරුම් විරතීන් විසින් තොරකරණලද්දාවූ; තෙයෙව, ඒ තෙතිසක් ප්‍රභෙදවූ අන්‍ය සමාන ශොභන චෛතසිකයෝම; චතූසුපිද්‍රුකෙසු, සතර ද්‍රුක යෙහිම; චතුධාච, සතරපරිද්දකින්ම; සඞ්ගය්හනති, සංග්‍රහවනු ලබෙත්; ඉති, මෙසේ; සබ්බථාපි, සර්ව්‍රප්‍රකාරයෙනුදු; චතුවීසති කාමාවචර සොභන චිත්තෙසු, සුවිසි කාමාවචර ශොභන චිත්ත යෙහි; ද්‍රුකවසෙන, ද්‍රුකයන්ගේවශයෙන්; චාදසධාච, දොළොස් පරිදිදකින්ම; සඞ්ගහො හොති, සංග්‍රහයවේයි. ඉති, මෙසේ තෙසු, ඒකාමාවචර ශොභන චිත්තයෙහි; චාදසවිධො, දොළොස් වැදෑරුම්වූ; සඞ්ගහො වෙදිතබ්බො, සංග්‍රහය දතයුත්තේයි.

සහෙතු කාමාවචර පුඤ්ඤපාක ක්‍රියාමනෙ, කාමාවචර කුශල්ය, සහෙතුක කාමාවචර විපාකය, සහෙතුක කාමාවචර ක්‍රියාය යනමේ චිත්තයෙහි නොහොත් චිත්තයන් අතුරෙන්; පුඤ්ඤෙ, අටමහාකුශල චිත්තයෙහි; අඪතිංසච, අටතිස් චෛතසික කෙනෙක්ද, සත්තතිංසචයය, සත්තිස් චෛතසික යුගලයෙක්ද, ඡත්තිංසකං, සතිස් චෛතසිකකෙනෙක්ද; හවෙ, වන්නේයි. ක්‍රියෙ, අටමහා ක්‍රියාචිත්තයෙහි; පඤ්චතිංස, පන්තිස් චෛතසිකකෙනෙක්ද; චතුත්තිංසචයං, සූතිස් චෛතසික යුගලයෙක්ද; තෙත්තිංසකං, තෙතිස් චෛතසිකකෙනෙක්ද; බත්තිංසචයං, දෙතිස්චෛතසික යුගලයෙක්ද, එකත්තිංසකං, එක්තිස් චෛතසිකකෙනෙක්ද; හවෙ, වන්නේයි. පාකෙ, අටමහා විපාක චිත්තයෙහි; තෙත්තිංස, තෙතිස් චෛතසිකකෙනෙක්ද; බත්තිංසචයං දෙතිස්චෛතසික යුගලයෙක්ද; එකත්තිංසකං, එක්තිස් චෛතසිකකෙනෙක්ද; හවෙ, වන්නේයි. එත්ථ, මේ ශොභනචිත්තයන් අතුරෙන්; ක්‍රියාසුච, අටමහා ක්‍රියාචිත්තයෙහිද; මහග්ගතෙසුච, සත්විසි මහද්ගත චිත්තයෙහිද; විරති, විරතීහු තුන්දෙන තුමූ; නවිජ්ජනති, විද්‍යමානනොවෙත්. අනුත්තරෙ, ලොකොත්තර සිත් අටෙහි; අප්පමඤ්ඤා, අප්‍රමාණ්‍යයෝ දෙදෙන තුමූ; නවිජ්ජනති, විද්‍යමාන නොවෙත්. තථා, එපරිද්දෙන්; කාමපාකෙ, අටමහා විපාක චිත්තයෙහි; චයං, අප්‍රමාණ්‍ය විරති දෙදෙනාගේ සමූහ තෙමේ; නවිජ්ජති, විද්‍යමානනොවේ. අනුත්තරෙ, ලොකොත්තර චිත්තයෙහි, ඣාන ධම්මා, විතර්කාදී ධ්‍යානාඞ්ග ධර්මයෝ තුමූ; විසෙසකා, ප්‍රභෙදකරන්නාහුය මජ්ඣිමෙ, මහද්ගත සත්විස්සෙහි; ඣාන ධම්මාච, විතර්කාදී ධ්‍යානාඞ්ග ධර්මයෝද, අප්පමඤ්ඤාච, අප්‍රමාණ්‍ය ධර්මයෝද, විසෙසකා, ප්‍රභෙදකරන්නාහුවෙති. "අප්පමඤ්ඤාච" යන්නෙහි "ච" ශබ්ද

යෙන් ධ්‍යාන ධර්මයෝද මෙතනට ඇදගන්නාහුවෙත්. පරිතෙතසු, සූවිසිකාමාවචර ශොභන චිත්තයෙහි; අප්පමඤ්ඤාච, අප්‍රමාණ්‍ය චෛතසිකයෝද; විරතී ඤාණ පීතීච, ත්‍රිවිධ විරතීහුය, ප්‍රඥෙන්ද්‍රියය, ප්‍රීතිය, යන මොහුද: විසෙසකා, ප්‍රභෙදකරන්නාහුවෙත්.

පන, කාමාවචර ශොභන චිත්තයෙහි සංග්‍රහ නයින් අන්‍යවූ අකුශල චිත්තයෙහි සංග්‍රහනය කියමි. අකුසලෙසු, අකුශල චිත්තයන් දොළොස්දෙනා අතුරෙන්; ලොභමූලෙසු, ලොභ මූලික සිත් අටෙහි; තාව, පළමුකොට, සඞ්ගය්හා මයාවුච්චතෙ" යනු අධ්‍යාහාරයි. පඨමෙ අසඞ්ඛාරිකෙ, පළමුවන ලොභ මූලික අසඞ්ඛාරික චිත්තයෙහි; අඤ්ඤසමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ; තෙරස චෙතසිකාච, තෙළෙස් චෛතසිකයෝද; චත්තාරො අකුසල සාධාරණාච, අකුසල සාධාරණවූ චෛතසිකයෝ සතරදෙනද; ඉති. මෙසේ; සත්තරස, සතළොස; ලොභ දිට්ඨීහි සද්ධිං, ලොභ දෘෂ්ටීන් හා සමග; එකූනවීසති ධම්මා, එකූන් විසිචෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. තථෙව, ඒ පළමුවන අසඞ්ඛාරික චිත්තයමෙන්ම; දුතියෙ අසඞ්ඛාරිකෙ, දෙවෙනි ලොභ මූලික අසඞ්ඛාරික චිත්තයෙහි; ලොභ මානෙන සද්ධිං, ලොභ මානයන් හා සමග; එකූනවීසති ධම්මා, එකූන්විසි චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. තථෙව, ඒ දෙවන අසඞ්ඛාරික චිත්තයමෙන්ම; තතියෙ, තුන්වන අසඞ්ඛාරික ලොභ මූලික චිත්තයෙහි; පීතිවජ්ජිතා, ප්‍රීතිය විසින් තොරකරණලද්දවූ; ලොභ දිට්ඨි සහ, ලොභදෘෂ්ටීන් හා සමග: අට්ඨාරස ධම්මා, අටළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. තථෙව, ඒ තුන්වන අසඞ්ඛාරික චිත්තයමෙන්ම; චතුත්ථෙ, සතරවැනිවූ; අසඞ්ඛාරිකෙ, අසඞ්ඛාරික ලොභ මූලික චිත්තයෙහි; ලොභමානෙන සහ, ලොභ මාන දෙදෙන සමග; අට්ඨාරස ධම්මා, අටළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. පන, ලොභ මූලික අසඞ්ඛාරික චිත්තයන්ගෙන් අන්‍යවූ ද්වෙෂ මූලික අසඞ්ඛාරික චිත්තය කියමි:—පටිඝසම්පයුත්තෙ, ප්‍රතිඝය හා සම්ප්‍රයුක්තවූ; පඨමෙ අසඞ්ඛාරිකෙ, පස්වන අසඞ්ඛාරික චිත්තයෙහි; දොසාච, ද්වෙෂ චෛතසිකයද, ඉස්සාච, ඊර්ෂ්‍යා චෛතසිකයද, මච්ඡරියඤ්ච, මච්ජරිය චෛතසිකයද; ඉති, මෙසේ; චතූහි සද්ධිං, සතර චෛතසිකයන් හා සමග; පීතිවජ්ජිතා, ප්‍රීතිය විසින් තොරකරණලද්දවූ: තෙවීසති ධම්මා, අන්‍ය සමාන අකුශල චෛතසික සංඛ්‍යාතවූ ඒ විසිධර්මයෝම; සඞ්ගය්හන්ති,

සංග්‍රහවනු ලැබෙත්. පන, එහිම විශෙෂාර්ථයක්කියම්:—එත්ථ, මේ පස්වෙනි අසඞ්ඛාරික චිත්තයෙහි නොහොත් තත් සම්ප්‍රයුක්තවූ විසිධර්මයන් අතුරෙන්; ඉස්සාමච්ඡෙර කුක්කුච්චානි, ඉස්සාමච්ඡෙර කුක්කුච්ච චෛතසිකයෝ; පච්චෙකමෙව, එක එකක්ම; යොජෙතබ්බානි, යෙදියයුත්තාහුය; තථෙව, ඒ පස්වෙනි අසඞ්ඛාරික චිත්තයමෙන්ම; සසඞ්ඛාරික පඤ්චකෙපි, සසඞ්ඛාරික සිත් පසෙහිද; ථීන මිද්ධෙන විසෙසෙත්වා, ථීන මිද්ධයෙන් වෙනස්කොට නොහොත් අසඞ්ඛාරික චිත්තයන්ට කී ධර්මයෙහි ථීන මිද්ධය බහා; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය: පන, ලොභ මූලික ද්වෙෂ මූලික චිත්තයෙන් අන්‍යවූ මොහ මූලික චිත්තය දක්වම්; ඡන්ද පීති වජ්ජිතා, ඡන්ද ප්‍රීතීන් විසින් තොරකරණලද්දවූ; එකාදස අඤ්ඤසමානාච, එකොළොස් ප්‍රකාරවූ අන්‍ය සමාන නම් චෛතසිකයෝද, චත්තාරො අකුසල සාධාරණාච, අකුශල සාධාරණනම්වූ අකුශල චෛතසිකයෝ සතරදෙනද, ඉති පණ්ණරස ධම්මා, මෙසේ පසළොස් චෛතසික ධර්මයෝ තුමූ; උද්ධච්ච සහගතෙ, උද්ධච්ච සහගත චිත්තයෙහි; සම්පයුජ්ජන්ති, සම්ප්‍රයොගවනු ලැබෙත්. විචිකිච්ඡා සහගත චිත්තෙච, විචිකිච්ඡා සහගත චිත්තයෙහිද, තථෙව, ඒ උද්ධච්ච සහගත චිත්තයමෙන්ම; අධිමොක්ඛ විරහිතා, අධිමොක්ෂ චෛතසිකය විසින් තොර කරණලද්දවූ; විචිකිච්ඡා සහගතා, විචිකිච්ඡාව හා එක්වගියාවූ: පණ්ණරස ධම්මා, පසළොස් චෛතසික ධර්මයෝ තුමූ, සමුපලබ්භන්ති, මොනවට ලැබෙත්. ඉති, මෙසේ; සබ්බථාපි, වෙදනා භෙද සඞ්ඛාර භෙදාදී සම්ප්‍රකාරවූද; ද්වාදසා කුසල චිත්තුප්පාදෙසු, දොළොස් අකුශල චිත්තයෙහි; පච්චේකං, වෙන වෙනම; යොජියමානාපි, යෙදනලද්දාහුද; ගණන වසෙන, ගණන් වශයෙන්; සත්තධාව, සත්පරිද්දකින්ම, සඞ්ගහිතා භවන්ති, සංග්‍රහවන ලද්දාහුවෙත්. ඉති, මෙසේ; තෙසු, ඒ දොළොස් අකුශල චිත්තයෙහි; සත්තවිධො, සත්වැදෑරුම්වූ; සඞ්ගහො වෙදිතබ්බො, සංග්‍රහයදතයුතුයි. අකුසලෙසු, දොළොස් අකුශල චිත්තයෙහි; සඞ්ගහා, සංග්‍රහ ක්‍රමයෝ තුමූ;

එකූනවීස, එකුන්විසි චෛතසික කොතෙක්ද; අට්ඨාරස, අටළොස් චෛතසිකකොතෙක්ද, වීස, විසිචෛතසිකකොතෙක්ද, එකවීස, එක්විසිචෛතසිකකොතෙක්ද, වීසති, නැවතත් විසිචෛතසිකකොතෙක්ද, ද්වාවීස, දෙවිසිචෛතසිකකොතෙක්ද, පණ්ණරස, පසළොස් චෛතසිකකොතෙක්ද, ඉති, මෙසේ; සත්තධා, සත්ප්‍රකාරයකින්; ඨිතා, සිටියාහුය; නොහොත් යෙදුනාහුය,

චත්තාරො සාධාරණාච, අකුශල සාධාරණ චෛතසිකයෝ සතරදෙනෙක්ද, අපරෙ, ඡන්ද පීති අධිමොක්ෂ චෛතසිකයන්ගෙන් අන්‍යවූ; දසසමානාච, අන්‍ය සමාන චෛතසිකයෝ දසදෙනෙක්ද, ඉති, මෙසේ; චුද්දස එතෙචෙතසිකා, ඒතුදුස් චෛතසිකයෝ; සබ්බාකුසලයොගිනො, සියලු අකුශල චිත්තයන් හා යෙදීම් ඇත්තාහුයයි; පවුච්චන්ති, ප්‍රභෙදවශයෙන් කියනුලැබෙත්.

පන, අකුශල චිත්තයෙහි සංග්‍රහක්‍රමයෙන් අන්‍යවූ අහෙතුක චිත්තයෙහි සංග්‍රහ ක්‍රමය දක්වමි:—අහෙතුකෙසු, අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන්; හසනචිත්තෙ, හසිතොත්පාද චිත්තයෙහි; තාව, පළමුකොට "සඞ්ගහො මයා වුච්චතෙ" යනු අධ්‍යාහාරයි. හසන චිත්තෙ, හසිතොත්පාද චිත්තයෙහි; ඡන්දවජ්ජිතා, ඡන්දය විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤසමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ, ද්වාදසධම්මා, දොළොස් ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. තථා, ඒ හසනචිත්තය මෙන්ම; වොත්ථපනෙ, ව්‍යවස්ථාපන චිත්තයෙහි; ඡන්ද පීති වජ්ජිතා, ඡන්ද ප්‍රීතීන් විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤ සමානා එකාදස ධම්මා; අන්‍ය සමාන නම් ඇත්තාවූ එකොළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. සුඛසන්තීරණෙ, සොම්නස් සහගත සන්තීරණ චිත්තයෙහි; ඡන්දවිරියවජ්ජිතා, ඡන්දවීර්‍යයන් විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤසමානාඑකාදස ධම්මා, අන්‍ය සමාන නම් ඇත්තාවූ එකොළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත් මනොධාතුත්තිකා හෙතුක පටිසන්ධියුගලෙ, පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන යුගල සංඛ්‍යාත මනොධාතු ත්‍රිකය හා උපෙක්ඛාසන්තීරණවය සංඛ්‍යාතවූ අහෙතුක ප්‍රතිසන්ධි යුගලයෙහිද, ඡන්ද පීති විරිය වජ්ජිතා, ඡන්ද පීති වීර්‍යයන් විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤසමානා, අන්‍ය සමානවූ; දසධම්මා, දශචෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. ද්විපඤ්චවිඤ්ඤාණෙ. දෙපස්විඥාන සංඛ්‍යාතවූ කුශලාකුශල චක්ෂුර්විඥානාදිවූ දසදෙනාකෙරෙහි; පකිණ්ණක වජ්ජිතා, ප්‍රකීර්ණක සදෙන වර්ජිතකොට ඇත්තාවූ; තෙයෙව, ඒ සත්වැදෑරුම්වූ සර්වචිත්ත සාධාරණ චෛතසිකයෝම; සඞ්ගය්හන්ති, සංග්‍රහවනුලැබෙත් ඉති, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; අට්ඨාරසසු අහෙතුකෙසු, අටළොස් අහෙතුක චිත්තයෙහි; ගණනවසෙන, ගණන්වශයෙන්; චතුධාච, සතරපරිද්දෙකින්ම; සඞ්ගහො හොන්ති, සංග්‍රහයවෙයි.

ඉති, මෙසේ; තෙසු, ඒ අහෙතුක චිත්තයෙහි; චතුබ්බිධො, සතරාකාරවූ; සඞ්ගහො, සංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි.

අට්ඨාරස අහෙතුකෙසු චිත්තුප්පාදෙසු, අටළොස් අහෙතුක චිත්තයෙහි; ද්වාදසච, දොළොස් චෛතසිකකෙනෙක්ද; එකාදසච, එකොළොස් චෛතසිකකෙනක්ද; දසච දසචෛතසිකකෙනෙක්ද; සත්තච, සත්චෛතසිකකෙනෙක්ද; ඉති, මෙසේ; චතුබ්බිධො, සතරවැදෑරුම්වූ; සඞ්ගහො, සංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි. සබ්බෙසු අහෙතුකෙසු, සියලුම අටළොස් අහෙතුක චිත්තයෙහි; සත්ත, සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන තුමූ; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්. සෙසා, ඡන්දයෙන් අවශිෂ්ටවූ ප්‍රකීර්ණක චෛතසිකයෝ පස්දෙන තුමූ; යථාරහංයුජ්ජන්ති, යථාහීයෙන් යෙදෙන්නාහුවෙත්. ඉති, මෙසේ; විත්ථාරතො, විස්තරවශයෙන්; තෙත්තිංසවිධ සඞ්ගහො, තෙතිස් ප්‍රභෙදවූ; සංග්‍රහක්‍රමය; මයා වුත්තො, මා විසින් කියනලද්දේයි. ඉත්थං, (යථාවුත්ත භෙදෙන) යම් යම් කියනලද ප්‍රභෙදයකින්; චිත්තාවියුත්තානං, චිත්තයෙහි නිරන්තරයෙන් යෙදෙන්නාවූ චෛතසිකයන්ගේ; චිත්ත පරිච්ඡෙදවසෙන, සිත පිරිසිඳීම්වශයෙන් හෙවත් වෙන්කිරීම්වශයෙන්; වුත්තං, කියනලද්දාවූ; සොළසවිධං, සොළොස් වැදෑරුම්වූ; සම්පයොගංච, සම්ප්‍රයොගතයද, චෙතසික රාසි පරිච්ඡෙදවසෙන, චෛතසිකයන්ගේ රාශීන් පිරිසිඳීම්වශයෙන්, වුත්තං, කියනලද්දාවූ; තෙත්තිංසවිධං, තෙතිස් වැදෑරුම්වූ; සඞ්ගහංච, සංග්‍රහනයද; ඤත්වා, දැන; යථායොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; චිත්තෙනසමං, සිත හා සමවූ; භෙදං, ප්‍රභෙදය; උද්දිසෙ, ප්‍රකාශකරන්නේයි.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්ම සප්තප්‍රකරණයෙහි වදාළාවූ අර්ථයෝ සංක්ෂෙපයෙන් හකුළුවාගත්හෙයින් අභිධර්මාර්ථ සංග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; චෙතසික සඞ්ගහ විභාගොනාම, චෛතසික සංග්‍රහ විභාගනම්වූ; දුතියො පරිච්ඡෙදො, දෙවන පිරිසිඳීම; ඉති සමත්තො, මෙසේ සම්පූර්ණකරණලද්දේයි.

## භාවය.

"විරතියොපන තිස්සොපි ලොකුත්තර චිත්තෙසු" යනාදී පාඨයෙහි අභිප්‍රායමෙසේයි:-සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව යනත්‍රිවිධ විරතීහු සතරලොකොත්තර මාර්ග චිත්තයෙහි එකාන්තයෙන්සර්වප්‍රකාරයෙන් ලැබෙන්නාහුයයි කීකල්හි ඉදින් සෝවාන්

මාර්ගයෙන් සියලු දුශ්චරිත දුරාජීවයන් එකවිට නසන්නාහුනම් ඒ විරතීහු තුන්දෙන සෝවාන් මාර්ගයෙහි ලැබියයුත්තාහුය; නැවත ශකෘදාගාමි ආදී මාර්ගත්‍රයෙහි කෙසේ ලැබිය යුත්තාහුදැයි සංසයකටයුතුවෙයි. එහි සවභාවාර්ථය මෙසේයි:—සතර අපායෙහි ඉපදියයුතුවූ අතිශයින් ඖදාරිකවූ පණිවා ආදී සපත දුශ්චරිතයන් සෝවාන් මාර්ගයෙන් නැසියයුතුහෙයින් ඒ සොතාපත්ති මාර්ගචිත්තයෙහි යෙදෙන්නාවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් අතුරෙන් සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, යන මාර්ගාඞ්ගත්‍රය විසින් නිරවශෙෂවශයෙන් අපායගමනීයවූ දුශ්චරිත දුරාජීවයන් එකක්ෂණයෙහි නසන බැවින් සර්වප්‍රකාරයෙන් සියලු විරතීහුම සෝවාන් මාර්ගයෙහි ලැබියයුත්තාහුය. තදනන්තරව ශකෘදාගාමි මාර්ගක්ෂණයෙහිද කාමධාතුවෙහි උපදවා අඞ්ගවිකලවීම් දුක්පත් භාවයට පැමිණීම් මනුෂ්‍යයුෂකවීම් ආදීවූ කටුකවිපාක දියයුතුවූ අනෞළාරිකවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරාජීවයන් ශකෘදාගාමි මාර්ගයෙහි යෙදුනාවූ සම්මාවාචාදී මාර්ගාඞ්ගත්‍රයකාරණකොටගෙණ සියලු දුශ්චරිත දුරාජීවයන් තුනීකිරීම්වශයෙන් ප්‍රහාණයකරත්. එහෙයින් ශකෘදාගාමී මාර්ගයෙහිද සියලු විරතිහු එකක්ෂණයෙහි එකාන්තයෙන් ලැබියයුත්තාහුය. තදනන්තරව අනාගාමි මාර්ග චිත්තක්ෂණයෙහි උද්ධම්භාගිය සංයොජනයන්ට අයත්වූ දිට්ඨිවිප්‍රයුක්ත සිත් සතර තුනීකිරීම්වශයෙන්ද, දෞර්මනස්‍ය සහගත දෙසිත නිරවශෙෂ ප්‍රහාණයකිරීම්වශයෙන්ද, අධොභාගිය සංයොජනයන්ට අයත්වූ අනෞළාරිකවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරාජීවයන් අනාගාමි මාර්ගයෙහි යෙදුනාවූ සම්මාවාචා ආදී මාර්ගාඞ්ගත්‍රය කාරණකොටගෙණ ප්‍රහාණයකාරණහෙයින් අනාගාමි මාර්ගයෙහිද සියලු විරතීහු ලැබෙත්මැයි. අර්හත්මාර්ග චිත්තක්ෂණයෙහි උද්ධම්භාගිය සංයොජනයන්ට අයත්වූ දිට්ඨිවිප්‍රයුක්ත සිත් සතරය, උද්ධච්චසහගත චිත්තය යනමේ සිත් පසට අයත්වූ අතිශයින් දුර්වලවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරාජීවයන් අර්හත්මාර්ගයෙහි යෙදුනාවූ සම්මාවාචා ආදී මාර්ගාඞ්ගත්‍රය කාරණකොටගෙණ අර්හත්මාර්ගක්ෂණයෙහිද සියලු විරතීහු ලැබෙත්මැයි. "මෙසේ ලොකුත්තර චිත්තෙසු සබ්බථාපි නියතා එකතොව ලබ්භන්ති," යන පාඨයෙහි සම්පූර්ණ භාවාර්ථය දතයුතුයි. ලෞකික චිත්තයන් අතුරෙන් මහාශී කාමාවචර කුශලයෙහිම ඇතැම් කාලයක්හි වෙන් වෙන්ව දක්නාලැබෙත්යයි යන පාඨයෙහි භාවය කෙසේ යත්? කාමාවචර කුශලය වනාහි දානාදී දශපුණ්‍ය ක්‍රියා වස්තුවශයෙන් පවත්නාහු නමුදු දාන භාවනා ආදීවූ නවවිධ පුණ්‍ය ක්‍රියා වස්තුවෙහි උපදනා

කාමාවචර කුශල චිත්තයෙහි එකද විරති ධර්මයක් නොලැබේමැයි. ශීලමය පුණ්‍ය ක්‍රියාවස්තුවෙහිවනාහි “ප්‍රාණාතිපාතාවෙරමණී” යන ශික්ෂාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර මහාකුශල චිත්තවීථියෙහි සම්මාකම්මන්ත විරතීන් අතුරෙන් ප්‍රාණාතිපාතා විරතිය ලැබේමැයි. “අදින්නාදානාවෙරමණී” යන ශික්ෂාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර කුශල චිත්තවීථියෙහි එකම අදින්නාදානාවිරතිය ලැබේමැයි. කාමෙසුමිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර කුශල චිත්ත වීථියෙහි කාමෙසු මිච්ඡාචාර විරතිය ලැබේමැයි. එසේම මුසාවාදාවෙරමණී, පිසුනාවාචාවෙරමණී, ඵරුසාවාචාවෙරමණී, සම්ඵප්පලාපාවෙරමණී, යන ශික්ෂාපද පස සමාදන්වන්නාවූකල්හි එක එක ශික්ෂාපදය අරභයා උපදනා කාමාවචර කුශල චිත්ත වීථි පඤ්චකයෙහි සතරාකාරවූ සම්මාවාචා විරතිය හා සම්මාආජීව විරතියද, යථා ක්‍රමයෙන් ලැබෙත්. එහෙයින් “කාමාවචර කුසලෙසෙවච කදාචි සන්දිස්සන්ති විසුං විසුං” යනු කිහ. මේ විරති ධර්මයෝ වනාහි මහාවිපාක මහාක්‍රියා මහග්ගත කුසල විපාක ක්‍රියා යන පඤ්චප්‍රකාර චිත්තයෙහි කුමක්හෙයින් නූපදනාහුද යත්? කාමාවචර විපාකයවනාහි විඤ්ඤත්ති සමුට්ඨාපක නොවන බැවින් හෙවත් කායික වාචසික ක්‍රියා නූපදවන බැවින් මහාවිපාක චිත්තයෙහි නොලැබෙත්මැයි. මහාක්‍රියා චිත්තයවනාහි අර්හත්මාර්ගයෙන් සියලු දුශ්චරිත දුරාජීවයන් සමුච්ඡෙද ප්‍රහාණයෙන් නැසුවාවූ බුදු පසේබුදු මහරහතුන්ට පමණක් ආවේණිකවූ සිත් බැවින් මහාක්‍රියා චිත්තයෙහි නොලැබෙත්මැයි. මේ විරතීහු වනාහි ශීලවිශුද්ධියෙහි ඇතුලත්වූ ධර්මයන් බැවින්ද, ශීලවිශුද්ධිය සම්පූර්ණකොට ඉක්බිති චිත්තවිශුද්ධි සඞ්ඛ්‍යාතවූ මහග්ගත චිත්තයන් උපදනා බැවින් සියලු මහග්ගත චිත්තයෝ තුමූ විරතීන්ගේ ඉපදීමට ස්ථාන නොවෙත්මැයි. තවද කාමාවචර කුශල චිත්තයෙහි ලැබෙන්නාවූ විරතීහු මතු සපත කාම සුගතියෙහි ඉපදවීමට හෙතුවන බැවින් කාමාවචර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නාවූ සංස්කාරයන්ට ඇතුලත්ව ද්වාදසාඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ දෙවෙනි අඞ්ගයෙහි ඇතුලත්වෙති. සෝවාන් ආදී සතරමාර්ගයෙහි යෙදෙන්නාවූ සම්මාවාචාදි මාර්ගාඞ්ගයෝ තුන්දෙන නෛර්‍යාණිකාර්‍ය්‍ය සඞ්ඛ්‍යාතවූ සසර කාන්තර එතර කිරීමෙහි උපකාරවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග සත්‍යයෙහි ඇතුලත්වෙයි. එතකුදුවුවත් ලෞකික චිත්තයෙහි යෙදෙන්නාවූ ඒ විරතීහු අවශෙෂදානාදී කුශල ධර්මයෝ ඒ මාර්ගසත්‍යයට හෙතුවන්නාක්මෙන් මේ විරති

හුද ඒ මාර්ගසත්‍යයට දුරහෙතුවෙත්. විදර්ශනා භාවනාකිරීම අවිදූර හෙතුවෙත්. මේ වනාහි ලෞකික ලොකොත්තර විරතීන්ගේ වෙනසයි. "අප්පමඤ්ඤායො" යනාදී පාඨයාගේ භාවය මෙසේයි:- කරුණා මුදිතා සඞ්ඛ්‍යාත අප්‍රමාණ්‍ය ධර්මයෝදෙදෙන ශත්‍රු මිත්‍ර උදාසීන සකල සත්ත්වයන් කෙරෙහි ප්‍රමාණයක්නොගෙණ භාවනාවඩනහෙයින් අප්‍රමාණ්‍යයෝයයි කියත්. ඒ අප්‍රමාණ්‍යයෝ දෙදෙන ප්‍රීති චෛතසිකය හා එක්ව ඉපදිය යුතුහෙයින් උපෙක්ෂා ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ පසළොස් පඤ්චමධ්‍යාන චිත්තයෙහි කිසිකලෙකත් නොලැබෙන්නාහුමැයි. සමසතළිස් කමටහන් අතුරෙන් කරුණා සඞ්ඛ්‍යාතවූ අප්‍රමාණ්‍ය ධර්මය භාවනා වඩා ප්‍රථමධ්‍යානය උපදවන්නාවූ යොගාවචරයාහට උපදනා ප්‍රථම ධ්‍යානාදී චිත්තයෙහි කරුණා චෛතසිකය මුත් මුදිතා චෛතසිකය නූපදනේයි. එපරිද්දෙන්ම අප්‍රමාණවූ සුවපත් සත්ත්වයන් අරමුණුකොටගෙණ මුදිතා බ්‍රහ්මවිහාරභාවනා වඩා ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන චතුෂ්කය අතුරෙන් යම්කිසි ධ්‍යානයක් උපදවන්නාවූ යොගාවචරයාහට මුදිතා චෛතසිකය මුත් කරුණා චෛතසිකය නූපදනේයි. එපරිද්දෙන්ම පෘථුවිකසිණාදීවූ අවශෙෂ අටතිස් කර්මස්ථාන භාවනාවඩන්නාවූ යොගාවචරයන්ට උපදනා ධ්‍යාන චිත්තයෙහිද මේ කරුණා මුදිතාවෝ නොලැබෙත්මැයි. කාමාවචර කුශල චිත්තයෙහි මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? කරුණා මුදිතා භාවනාවන් වඩා ධ්‍යාන උපදවන්නාවූ යොගාවචරයාහට උපදනා අර්පණා වීථියෙහි පරිකර්ම උපචාර අනුලොමගොත්‍රභූ නමින් උපදනා පූර්වභාග චිත්තයෝ කාමාවචර කුශල් බැවින් ඒ ඒ ධ්‍යාන වීථියෙහි පූර්වභාග කාමාවචර කුශල චිත්තයෙහිත් ඒ ඒ අප්‍රමාණ්‍ය ධර්මලැබෙමැයි. සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධර්මයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? බුදු පසේ බුදු මහරහතුන්වහන්සේලා විසින් යථොක්ත බ්‍රහ්මවිහාර භාවනා වඩනකල්හි ඒ ඒ ක්‍රියා ධ්‍යාන වීථියෙහි පූර්වභාගයෙහි උපදනා කාමාවචර ක්‍රියා චිත්තයෙහිද සාමාන්‍යයෙන් දුඃඛිත සුඛිත සත්ත්වයන් අරමුණුකොටගෙණ උපදනා කාමාවචර මහා ක්‍රියාචිත්තයෙහිද මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ ලැබෙත්මැයි. ප්‍රථමාදී ධ්‍යාන චතුෂ්කයෙහි හෝ කාමාවචර කුශලයෙහි හෝ මහා ක්‍රියා චිත්තයෙහි හෝ උපදනා අප්‍රමාණ්‍ය ධර්මයෝ වනාහි දුඃඛිත සත්ත්වයන් අරමුණුකොට හෝ සුඛිත සත්ත්වයන් අරමුණුකොට හෝ භාවනාවඩන්නාවූකල්හි එකී එකී ධර්මයක්ම ලැබියයුතු හෙයින් "කදාචි නා නා හුත්වා ජායන්ති" යනු කීහ. උපෙක්ඛා සත

ගතෙසු පනෙඤ්ච කරුණා මුදිතා නසන්තීති කෙචිවදන්ති" යන්නෙහි භාවය කෙසේ යත්? යම්කිසි යොගාවචරයෙකු විසින් දුඃඛිත සුඛිත සත්ත්වයන් අරමුණුකොටගෙණ බ්‍රහ්මවිහාර භාවනාවඩනකල්හි ප්‍රගුණ ග්‍රන්ථයක් සජ්ඣායනාකරන්නෙක්හට අන්‍ය විහිතවත් ඒ ග්‍රන්ථය සජ්ඣායනාකළ හැකිවාක්මෙන්ම අප්‍රමාණ්‍ය භාවනාවඩන්නාවූ යොගාවචරයාහට අර්පණාවට පූර්වභාගයෙහි උපදනා කාමාවචර කුශල ක්‍රියා චිත්තයන් පුරුද්ද කරණකොටගෙණ උපෙක්ෂා සහගතවද ලැබියහැකි බැවින් උපෙක්ෂා සහගත චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධර්‍මයන්ගේ නොයෙදීම මූලටීකාචාරීන් විසින් දක්වනලද්දේ නමුදු අනුරුද්ධාචාරීන්වහන්සේ විසින් ඒ මතය පිළිනොගන්නාලද බව අගාරවාජීයෙහි වැටෙන්නාවූ "කෙචිවදන්ති" යන ශබ්දයන්නෙන් දක්වනුලැබෙයි. ප්‍රඥාවචනාගී ඥාන සම්ප්‍රයුක්ත ත්‍රිහෙතුක කාමාවචර කුශල විපාක ක්‍රියාවෝ දොළොස්දෙනද, පන්තිස් මහද්ගතලොකොත්තර චිත්තයෝය යන සත්සාළිස් චිත්තයෙහි සම්ප්‍රයොගයට යෙත්යසිදතයුතු. එහෙයින් ශොභන සාධාරණවූ එකුන්විසි ධර්‍මයෝ එකුන්සැටක් ශොභන චිත්තයෙහිද, ත්‍රිවිධ විරතීහු සොළොස් චිත්තයෙහිද, අප්‍රමාණ්‍ය දෙදෙන විසිචිත්තයෙක්හිද, ප්‍රඥා තොමෝ සත්සාළිස් චිත්තයෙක්හිදැයි මෙසේ ශොභන පස්විසි චෛතසිකයෝ තුමූ ශොභන චිත්තයෙහිම සතරාකාරයකින් යෙදෙන්නාහුයයි දතයුතු. "ඉස්සාමච්ඡෙර කුක්කුච්ච" යනාදී ගාථාවෙහි ආවාවූ එකොළොස් චෛතසිකයෝ තුමූ ආරම්මණ ප්‍රතිලාභයෙහිම යම්කිසි කලෙක වෙන් වෙන්ව හට ගන්නාහුයයි දතයුතු. ස්පර්ශාදීවූ චෛතසිකයන් නූපදනාසිතක් නැත්තේය. ශ්‍රද්ධාදී ශොභන චෛතසිකයන් නූපදනා ශොභන චිත්තයක්ද නැත්තේය. මොහාදී චෛතසිකයන් නූපදනා අකුශල චිත්තයක්ද නැත්තේය. ඒ ගාථාවෙහි කී චෛතසික එකොළොස්දෙන නොලැබ සර්වප්‍රකාරයෙන්ම ඒ ඒ සිත් උපදනාහු වෙති. අනුන්ගේ සම්පත්තියක් දැක ඊර්ෂ්‍යාකරන්නාවූකල්හි උපදනා ප්‍රතිඝචිත්තයෙහිම ඉස්සාචෛතසිකය ලැබෙයි. එතකුදු වුවත් සත්වඝාතනයකරන්නාවූකල්හි උපදනා ප්‍රතිඝචෛතසිකයෙහි ඉස්සාචෛතසිකය නොලැබෙයි. මේ ඊර්ෂ්‍යාවට සීනසින්ම අවශෙෂ චෛතසිකයන් දසදෙනාටද සුදුසු අරමුණු ලැබුනාහු නම් එකාන්තයෙන් උපදනාහුමැයි. එහෙයින් ස්පර්ශාදීවූද, ශ්‍රද්ධාදීවූද, මොහාදීවූද, නියතයොගී චෛතසික ධර්‍ම හා ඊර්ෂ්‍යාදී අනියත යොගී චෛතසික ධර්‍මයෝද යෙදෙන්නාවූ ක්‍රමය මනායේ අවබොධකටයුතුයි. "ජිතනිං කානුත්තරෙ ධම්මා" යනාදියෙහි

භාවිය මෙසේයි. ලෝකුත්තර චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේද යෙන් සතිස් චෛතසිකකෙනෙක්ද, මහග්ගත චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදවශයෙන් චෛතසිකයෝ පන්තිස්දෙනෙක්ද, කාමාවචර ශොභන චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් අට තිස් චෛතසිකකෙනෙක්ද අකුශල චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සත්විසි චෛතසිකකෙනෙක්ද, අහෙතුක චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදවශයෙන් දොළොස් චෛතසික කෙනෙක්දැයි මෙසේ මේ ලෝකොත්තර, මහද්ගත, කාමාවචර, ශොභන, අකුශලය, යන පස්වැදෑරුම් සහෙතුක අහෙතුක චිත්ත කොඨාසයෙහි පස්ප්‍රකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම දත යුතුයි. හේ කෙසේ යත්? ලෝකොත්තර ප්‍රථම ධ්‍යාන සිත්අටය, ද්විතීය ධ්‍යාන සිත් අටය, තෘතීය ධ්‍යාන සිත් අටය, චතුර්ථ ධ්‍යාන සිත් අටය, පඤ්චම ධ්‍යාන සිත් අටය, යන සමසාළිස් මාර්ගඵල චිත්තයෙහි චෛතසිකයෝ සතිසෙක, පන්තිසෙක, සූතිසෙක, තෙතිසෙක, නැවතත් තෙතිසෙකැයි මෙසේ පඤ්චප්‍රකාරයකින් යෙදෙන්නාහුයයි දතයුතුයි. මෙසේ එකී එකී චෛතසිකය උගතව යෙදීමට හෙතු කවර යත්? ප්‍රථම ධ්‍යානය ලැබූ යොගාවචර තෙමේ ප්‍රථම ධ්‍යානයෙහි ආදීනව දැක ද්විතීය ධ්‍යානනිකාන්තිය උපදවා භාවනා වඩනකල්හි ඔළාරිකවූ විතර්කාඞ්ගය හැර ද්විතීය ධ්‍යානය උපදනේයි. මෙසේ සියලු ධ්‍යානයන්ගේ ඉපදීම භාවනා බලයෙන් වන සැටි දතයුතුයි. මහද්ගත චිත්තයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන සිත් තුණෙහි පන්තිසෙක්ද, ද්විතීය ධ්‍යාන සිත් තුණෙහි සූතිසෙක්ද, තෘතීය ධ්‍යාන සිත් තුණෙහි තෙතිසෙක්ද, චතුර්ථ ධ්‍යාන සිත් තුණෙහි දෙතිසෙක්ද, පඤ්චම ධ්‍යාන පසළොස් චිත්තයෙහි තිසෙක්දැයි මෙසේ සත්විසි මහද්ගත චිත්තයෙහි පස් ආකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම දතයුතුයි.

කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන් චනාහි පළමු කොට පළමුවන කුසල චිත්තවයෙහි අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය, පස්විසි ශොභන චෛතසිකයෝදැයි යන අට තිස් ධර්මකෙනෙක් සම්ප්‍රයොගිකවශයෙන් සඞ්ග්‍රහයට යෙත්. විශෙෂවශයෙන්වනාහි අප්‍රමාණ්‍ය විරතීහු පස්දෙන නානාලම්බණික ධර්ම බැවින් එක් චිත්තක්ෂණයෙක්හි නොයෙදෙත්නුයි එක එක චිත්තයෙහි එක එක ධර්මයක් යෙදේමැයි. ඊට උදාහරණ කවර යත්? දානාදී දශපුණ්‍ය ක්‍රියාවස්තූන් අතුරෙන් දානමය කුශල ක්‍රියාවෙහි මේවිරති අප්‍රමාණ්‍ය ධර්මයෝ නොලැබෙත්මැයි.

ශීලමය පුණ්‍ය ක්‍රියාවෙහි "පාණාතිපාතාවෙරමණී" යනාදී ශික්ෂා පද සමාදන්වන්නාවූකල්හි එක එක විරතිය ලැබෙයි. එහෙයින් ඒ ඒ කුශල චිත්තයන්ගේ අරමුණු පරිද්දෙන් චෛතසික ධර්මයන්ගේ යෙදීම දතයුතුයි. දෙවෙනි කාමාවචර කුශලචයෙහි ඥානවර්ජිතවූ සත්තිස් ධර්මකෙනෙක්ද, තුන්වෙනි මහාකුශලචයෙහි ඥානසම්ප්‍රයුක්තවූ ප්‍රීතිවර්ජිතවූ සත්තිස් ධර්මකෙනෙක්ද, සතරවන ද්‍රකයෙහි ඥාන ප්‍රීති දෙදෙන වර්ජිතකොට ඇත්තාවූ සතිස්චෛතසික ධර්මකෙනෙක්ද, සඞ්ග්‍රහයටයෙත්යයි දතයුතු. කාමාවචර ක්‍රියාසිත් අටදෙනා අතුරෙන් පළමුවන ද්‍රකයෙහි විරතිත්‍රයවර්ජිතකොට ඇත්තාවූ පන්තිස් චෛතසිකකෙනෙක්ද, දෙවෙනි ද්‍රකයෙහි සූතිස් චෛතසිකකෙනෙක්ද, තුන්වන ද්‍රකයෙහිත් එසේම සූතිස් චෛතසිකකෙනෙක්ද, සතරවන ද්‍රකයෙහි තෙතිස් චෛතසිකකෙනෙක්ද ක්‍රමයෙන් යෙදෙන්නාහුයයි දතයුතුයි. කාමාවචර විපාකයන් අටදෙනා අතුරෙන් පළමුවන ද්‍රකයෙහි තෙතිස් චෛතසිකකෙනෙක්ද, දෙවන ද්‍රකයෙහි දෙතිස් චෛතසිකකෙනෙක්ද, තුන්වන ද්‍රකයෙහිත් එසේම දෙතිස් චෛතසිකකෙනෙක්ද, සතරවන ද්‍රකයෙහි එක්තිස් චෛතසිකකෙනෙක්ද, මෙසේ සූවිසි කාමාවචර කුශල විපාක ක්‍රියාචිත්තයෙහි දොළොස් ආකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම දතයුතුයි, "සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියාමනෙ" යන වාක්‍යයෙහිද, "සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා" යන වාක්‍යයෙහිද, යථාලාභ න්‍යායවශයෙන් සහෙතුක ශබ්දය, පුඤ්ඤ ශබ්දය,අපෙක්ෂා නොකොට විපාක ක්‍රියා ශබ්දවය අපෙක්ෂාකරන්නේයයි දතයුතුයි. කුමක්හෙයින යත්? කාමාවචර කුශල්වනාහි එකාන්ත සහෙතුක මුත් අහෙතුක කාමාවචර කුශලයෙක් නම් නැත්තේයි. එහෙයින් කාමාවචර කුශලය සහෙතුකදෝ අහෙතුකදෝහෝයි ව්‍යභිචාරයෙක් නැත්තේයි. කාමාවචර විපාක ක්‍රියාවෝවනාහි සහෙතුක විපාකය, අහෙතුක විපාකය, සහෙතුක ක්‍රියාය, අහෙතුක ක්‍රියායයි යන ව්‍යභිචාරය ඇත්තාහුවෙත්. "සතිහි සම්භවෙ ව්‍යභිචාරෙච විසෙසනං සාත්ථකංසියා" යනු න්‍යාය බැවින් ව්‍යභිචාරය ඇත්තාවූ විපාක ක්‍රියා ශබ්ද හා සමග මුත් ව්‍යභිචාරය නැත්තාවූ කාමාවචර කුශල ශබ්දය හා නොයෙදෙන්නේයයි දතයුතු. සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි හා අඞ්ගුත්තර එකක නිපාතයෙහි "සක්ඛරකථලිකම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිඨන්තම්පි" යන වාක්‍යයෙහි සක්ඛරකථලික ශබ්දය හා චරණ ක්‍රියාවද, මච්ඡගුම්බ ශබ්දය හා ඨානක්‍රියාවද යෙදියයුතුවාක් මෙන් පෙනෙන නමුත් එබඳු අර්ථයක් ලොකයෙහි නොලැබෙන හෙයින් දුරින් පිහිටි චරණ ක්‍රියාව මච්ඡගුම්බ ශබ්දය හා සමගද,

ථාන ක්‍රියාව සඞ්ඛාරකාලික ශබ්දය හා සමඟද අර්ථ ලැබෙන ක්‍රමයෙන් යෙදිය යුතුවාක්මෙන්ම "සහෙතු කාමාවචර පුඤ්ඤ පාක ක්‍රියා" යන වාක්‍යයෙහිද ලඟ පිහිටි සහෙතු ශබ්දය පුඤ්ඤ ශබ්දය හා සමග නොයොදා පාක ශබ්ද ක්‍රියා ශබ්දයන් සමගම යෙදියයුතුයි. මේ යථා ලාභ න්‍යාය අතිකුද්‍ර මෙබඳු තන්හි යෙදිය යුතුයි. ක්‍රියා සිත්හිද, මහද්ගත සිත්හිද, විරතීහු නොලැබෙත් මැයි. කුමක්හෙයින යත්? ක්‍රියා චිත්තයෝ තුමූ ආවෙණිකවශයෙන් රහතුන්ගේ සන්තානයෙහිම උපදනාහෙයින්ද, මහද්ගත සඞ්ඛ්‍යාතවූ රූපාරූප සමාපත්තීන් උපදවන්නාවූ යොගාවචර තෙමේ පළමුකොටම ශීල නැමති පෘථුවියෙහි පිහිටා ශීලවිශුද්ධිය මස්තකප්‍රාප්තකොටගෙණ ධ්‍යාන උපදවනහෙයිනි. ලොකොත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධර්මයෝ නොයෙදෙත්මැයි. කුමක් හෙයින යත්? ලොකොත්තර චිත්තයන්ගේ කෘත්‍යය කෙලශයන්ගේ නිරවශෙෂ ප්‍රහාණයයි. අප්‍රමාණ්‍ය ධර්මයෝ තුමූ දුඃඛිත සුඛිත සත්වප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. එහෙයින් මේ ධර්මයන්ගේ අන්‍යොන්‍ය විසදෘශ භාවයෙන් ලොකොත්තර චිත්තයෙහි නූපදනාහුවෙත්. කාමාවචර විපාක චිත්තයෙහිද ඒ අප්‍රමාණ්‍ය ධර්මයෝ විද්‍යමානනොවෙත්. විතර්කාදී ධ්‍යානාඞ්ග ධර්මයෝ තුමූ ලොකොත්තර චිත්තයන්ගේ සමසතළිස් ප්‍රභෙදයට කාරණාවනහෙයින් ධ්‍යාන ධර්මයෝ ලොකොත්තර ධර්මයන් වෙනස්කරන්නාවූ ධර්මයෝනම්වෙත්. කරුණා මුදිතා බ්‍රහමවිහාර දෙදෙන ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානයන් නිපදවීමටද උපෙක්ෂා බ්‍රහමවිහාරය පඤ්චමධ්‍යානය ඉපදවීමටද හෙතුවන බැවින් අප්‍රමාණ්‍ය ධර්මයෝ තුමූ මහද්ගත ධර්මයන් වෙනස්කරන්නාවූ ධර්මයෝ නම්වෙත්. විරතීහු තුන්දෙනය ඥාන ප්‍රීතිය යන මේ ධර්මයෝ පස්දෙන කාමාවචර සිත්වෙනස්කරන්නාවූ ධර්මයෝනම්වෙත්.

~~~~~~

දොළොස් අකුශලයන් අතුරෙන් ලොභ මූලිකවූ පළමුවන අසඞ්ඛාරික චිත්තයෙහි අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය. අකුශල සාධාරණ සතරදෙනාදයි යන සතළොස්දෙන ලොභ දෘෂ්ටින් හා සමග එකුන්විසි ධර්මකෙනෙක්ව සඞ්ග්‍රහයටයෙති. එසේම දෙවෙනි අසඞ්ඛාරික චිත්තයෙහි දෘෂ්ටිස්ථානයෙහි ප්‍රවිෂ්ටවූ මානය හා සමග එකුන්විසි ධර්මකෙනෙක් සඞ්ග්‍රහයටයෙත්. තුන්වෙනි අසඞ්ඛාරික චිත්තයෙහි ප්‍රීති වර්ජිතවූ ලොභ දෘෂ්ටීන් හා සමග අටළොස් ධර්මකෙනෙක් සඞ්ග්‍රහයටයෙත්. සතරවෙනි අසඞ්ඛාරික චිත්තයෙහි දෘෂ්ටිස්ථානයෙහි ප්‍රවිෂ්ටවූ මානය හා සමග එසේම අටළොස් ධර්මකෙනෙක් සඞ්ග්‍රහයටයෙත්. පටිඝ සම්ප්‍රයුක්තවූ පස්වෙනි අසඞ්ඛාරික චිත්තයෙහිවනාහි දොස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන සතර චෛතසිකයන් හා
~~~~~~

සමග ප්‍රීති වර්ජිතවූ ඒ විසිධර්මයෝ සඞ්ග්‍රහයට යෙත්. මේ චිත්ත යෙහි යෙදියයුතුවූ ද්වේෂ, ඊර්ෂ්‍යා, මච්ඡරිය, කුක්කුච්ච, යන සතර ධර්මයන් අතුරෙන් ද්වේෂය නියතයෝගීවශයෙන්ද, ඊර්ෂ්‍යා, මාත්සර්‍ය, කුක්කුච්ච, යන තුන්දෙන අනියත යෝගී ධර්මවන හෙයින් ද්වේෂය හා ඊර්ෂ්‍යාව හෝ ද්වේෂය හා මච්ඡරිය හෝ ද්වේෂය හා කුක්කුච්චය හෝ මෙසේ වෙන වෙනම යථා ලබ්ධ වශයෙන් උපදනාහුයයි දතයුතු. ඊර්ෂ්‍යාවට මෙර මාගේ සම්පත්ති යද, මච්ඡරියට තමාගේ සම්පත්තියද, කුක්කුච්චයට කළාවූ දුශ්චරිතය හා නොකළාවූ සුචරිතයන්ද අරමුණුවියයුතුහෙයින් කිසි කාලෙක මේ ධර්මයෝ තුන්දෙන එක් සිතක්හි නොලැබෙන්නාහුයයි දතයුතු. යථෝක්ත සසඞ්ඛාරික පඤ්චකයෙහිද ඒ ඒ චිත්ත යට නියමවූ ධර්මයන් හා සමග ථීනමිද්ධයද එක්කොට යෙදිය යුතුයි. ඡන්ද ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන එකොළොස් චෛතසිකයෝය, අකුසල සාධාරණ සතරදෙනදැයි යන පසළොස් චෛතසික ධර්මයෝ උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදෙන්නාහුවෙත්. විචිකිච්ඡා සහගත චිත්තයෙහිද අධිමොක්ෂස්ථාන යට ප්‍රවිෂ්ටවූ විචිකිච්ඡාව හා සමග පසළොස් ධර්මකෙනෙක් සඞ්ග්‍රහයටයෙති. එහෙයින් මේ දොළොස් අකුශල චිත්තයෙහි චෛතසිකයෝ එකුන්විසිදෙනෙක, අටළොස්දෙනෙක, විසිදෙනෙක, එක්විසිදෙනෙක, නැවතත් විසිදෙනෙක, දෙවිසිදෙනෙක, පසළොස්දෙනෙකැයි මෙසේ සත්ප්‍රකාරයකින් සිටියාහුය. අකුශල සාධාරණයෝ සතරදෙනාය, ඡන්ද, ප්‍රීති, වීර්‍ය, වර්ජිතවූ අන්‍ය සමාන දසදෙනාය යනමේ තුදුස් චෛතසික ධර්මයෝ සියලු දොළොස් අකුශල චිත්තයෙහිම නියතයෝගී ධර්මයෝ නම්වෙත්.

අටළොස් අහේතුක චිත්තයන් අතුරෙන් හසිතොත්පාද චිත්තයෙහි ඡන්ද වර්ජිතවූ අන්‍ය සමාන දොළොස් ධර්මයෝ සඞ්ග්‍රහයටයෙත්. ව්‍යවස්ථාපනය පරනාමධෙයකින් යුක්තවූ මනොද්වාරාවර්ජන චිත්තයෙහි ඡන්ද ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ එකොළොස් ධර්මයෝද සොම්නස් සන්තීරණ චිත්තයෙහි ඡන්ද වීර්‍ය වර්ජිතවූ එකොළොස් චෛතසික ධර්මයෝද, පඤ්චද්වාරාවර්ජන සම්ප්‍රතිච්ඡන්න යුගල සඞ්ඛ්‍යාතවූ මනොධාතු ත්‍රිකයෙහි හා උපෙක්ෂා සන්තීරණද්වය සඞ්ඛ්‍යාතවූ අහෙතුක පටිසන්ධි යුගලය යන පඤ්චකයෙහි ඡන්ද ප්‍රීති වීර්‍ය වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන දශධර්මයෝද, කුශලාකුශල විපාකවූ දෙපස් විඥාන දසයෙහි ප්‍රකීර්ණක සදෙන වර්ජිතකොට ඇත්තාවූ සබ්බ

චිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනද යනමේ ක්‍රමයෙන් අටළොස් අහේතුක චිත්තයෙහි චෛතසිකයෝ දොළොස්දෙනෙක, එකොළොස්දෙනෙක, දසදෙනෙක, සත්දෙනෙකැයි යනමේ සතරාකාරයෙන් චෛතසිකයන්ගේ යෙදීම දතයුත්තාහුය. ඉස්සා මච්ඡෙර කුක්කුච්ච යනාදී ගාථාවෙහි භාවය කෙසේ යත්? මේ ගාථාවෙන් දක්වන්නාවූ අනියතයෝගී එකොළොස් චෛතසිකයන් අතුරෙන් ඉස්සාමච්ඡරිය කුක්කුච්ච යන ධර්මයෝ තුන්දෙන ද්වෙෂ මූලික චිත්තය උපදින උපදින සියලුකල්හිම නොලැබෙන්නාහුමැයි. අනුන්ගේ සම්පත්තියක් හුරුස්නාකල්හිද තමාගේ සම්පත් සඟවන්නාවූකල්හිද කතාකත දුශ්චරිත සුචරිතයන් සඳහා පසුතැවෙන්නාවූකල්හිද එක එක චිත්තයෙහි එක එක ධර්මයක් උපදනාහෙයින් කදාචි ශබ්දය යොදන ලද්දේයි. ඒ ඇතැම්කලෙක්හි ඉපදීමද, අනුන්ගේ සම්පතක් හුරුස්නාකල්හි උපදනා ද්වෙෂ මූලික චිත්තයෙහි ඊර්ෂ්‍යාවම මුත් මච්ඡරිය කුක්කුච්ච දෙදෙන නූපදනාහුවෙත්. තම සැපත් සඟවන්නාවූකල්හි උපදනා ද්වෙෂ මූලික චිත්තයෙහි මච්ඡරිය චෛතසිකය මුත් ඉස්සා කුක්කුච්ච දෙදෙන නූපදනාහුවෙත්. කතාකත දුශ්චරිත සුචරිතයන් ගැන පසුතැවීම්වශයෙන් ද්වෙෂ මූලික චිත්තය උපදනාකල්හි කුක්කුච්චයමුත් ඉස්සාමච්ඡරිය දෙදෙන නූපදනාහුවෙත්. එහෙයින් ද්වෙෂ මූලික චිත්තය හා සමග කදාචි ශබ්දයද, ඉස්සා, මච්ඡෙර, කුක්කුච්ච, ශබ්දයන් හා නා නා ශබ්දයද යෙදෙන්නේයි. ඒ ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන චෛතසිකයෝ තුන්දෙන තුමූ එකක්ෂණයෙහි නූපදනාබව නා නා ශබ්දයෙන් දක්වයි. විරති චෛතසිකයෝ තුන්දෙන තුමූ ලොකොත්තර චිත්තයෙහි ඒ ඒ දුශ්චරිත දුරාජීවයන් එකවිට නැසීම්වශයෙන් විරතීහු ලොකොත්තර චිත්තයෙහි නියතයොගී නම්වෙත්. එතකුදුවූවත් මහාකුශල චිත්තයෙහි සියලුකල්හි නූපදනා බැවින්ද දුශ්චරිත දුරාජීවයන්ගෙන් වැළකීම්වශයෙන් සම්පත්ත සමාදානවශයෙන් කලාතුරකින් ලැබෙන්නාහුවෙති. එහෙයින් මහාකුශල චිත්තයන් හා සමග කදාචි ශබ්දයද විරතීන් හා නා නා ශබ්දයද යෙදෙන්නාහුයයි දතයුතු. සම්මාවාචා විරතිය යෙදෙන්නාවූ කල්හි සම්මාකම්මන්ත විරතිය හෝ සම්මා ආජීව විරතිය හෝ නොයෙදෙන්නාහුවෙති. සම්මාකම්මන්ත විරතිය යෙදෙන්නාවූකල්හි සම්මාවාචාවිරතිය හෝ සම්මාආජීව විරතිය හෝ නොයෙදෙන්නාහුවෙති. සම්මාආජීව විරතිය යෙදෙන්නාවූකල්හි සම්මාවාචා සම්මාකම්මන්තවිරතීහු නොයෙදෙන්නාහුවෙති. එහෙයින් නා නා ශබ්දය විරතීන් හා වෙන

වෙනම යෙදියයුතුයි. අප්‍රමාණ්‍යයෝ දෙදෙන තුමූ යෙදෙන්නාවූ චිත්තයෙහි කදාචි ශබ්දයද, අප්‍රමාණ්‍ය ධර්‍ම හා නානා ශබ්දයද වෙන් වෙන්ව යෙදෙන්නේයයිදතයුතු. මානචෛතසික තෙමේද ලෝභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත සතර චිත්තය උපදිනා සියලු කල්හිම නොලැබෙයි. හීනමානය, සදිසමානය, පණීතමානයයි කියනලද තුන් වැදෑරුම් මානයන් අතුරෙන් එක එක මානයක් යෙදෙන්නාවූකල්හී මානචෛතසිකය ලැබියයුතු බැවින් කදාචි ශබ්දය හා යෙදියයුත්තෝයි. මානය වනාහි එනම ධර්‍මයක් බැවින් නානා ශබ්දය හා නොයෙදෙන්නේයි. ථීන චෛතසිකය හා මිද්ධ චෛතසිකයද යන දෙදෙන සසංඛාරික සිත් පචකය උපදනා සියලුකල්හිම නොලැබෙන්නාහුමැයි. චිත්තචෛතසිකයන්ගේ හැකිලීමක් ඇතිකල්හිම කලාතුරකින් ලැබියයුතුහෙයින් කදාචි ශබ්දය හා යෙදෙන්නේයි. ඒ ථීන මිද්ධචෛතසිකයෝ දෙදෙන වනාහි කලාතුරකින් ලැබෙන්නාහු නමුදු ඒකාන්තයෙන් වෙන් වෙන්ව නොලැබෙනහෙයින් සහ ශබ්දයද ථීන මිද්ධ ශබ්දය හා යෙදෙන්නේයි. එතකුදුවුවත් ථීන මිද්ධ ශබ්දය හා සමග නානා ශබ්දය කිසි කලෙකත් නොයෙදෙන්නේයයි දතයුතු. එහෙයින් ඉස්සාමච්ඡරිය කුක්කුච්ච විරතී කරුණා මුදිතා චෛතසිකයෝ තුමූ එක එක ධර්‍මයක් පාසා "කදාචි ඉස්සා නානා කදාචි මච්ඡරියං නානා" යනාදීන් සියලු ධර්‍මයන් හා මේ නිපාත ශබ්දයෝ දෙදෙන වෙන වෙනම යෙදෙන්නාහුයයි දතයුතු. මාන ශබ්දය හා කදාචි ශබ්දය පමණක් යෙදෙන්නේයි. ථීන මිද්ධ ශබ්දයන් හා කදාචි ශබ්දය හා සහ ශබ්දයද යෙදෙන්නාහුයයි දතයුතු. එතකුදුවුවත් නානා ශබ්දය හා කිසිකලෙකත් නොයෙදෙන්නේයයි දතයුතු. නොහොත් ථීන මිද්ධ දෙදෙන වනාහි සසංඛාරික අකුසල පචකයෙහි යෙදෙන්නාහු නමුදු ද්වේෂ මූල සසංඛාර චිත්තය උපදනාකල්හී චිත්තචෛතසිකයන්ගේ හැකිලීම හා අනුන්ගේ සම්පත්තියට ඊර්ෂ්‍යා කිරීමද යන අඞ්ගවශයෙන් සම්පූර්ණවූයේනම් ඒ ද්වේෂ මූලය සංඛාර චිත්තයෙහි ථීන මිද්ධ දෙදෙන හා සමග ඊර්ෂ්‍යාවද යෙදෙන්නේයි. එසේ යෙදෙන්නාවූකල්හි ඊර්ෂ්‍යාව හා සමග ථීන මිද්ධ දෙදෙනද එක්ව උපදනාහුවෙත්. මෙසේ උපදනාකල්හි සහ ශබ්දය හා සමග ඊර්ෂ්‍යාවද, ථීන මිද්ධ දෙදෙනද යෙදෙන්නේයයි දතයුතු. ඉස්සා ථීන මිද්ධ යන චෛතසිකයෝ තුන්දෙන ද්වේෂ මූල සසංඛාර චිත්තය උපදනාකල්හී ඇතැම්විටක යෙදෙන්නාහුවෙත්. ඇතැම්විටක තුන්දෙනම නොයෙදෙන්නාහුවෙත්. එහෙයින් කදාචි ශබ්දයද ථීන මිද්ධ ශබ්දය හා සමගද ඉස්සා ශබ්

දෘශ හා සමගද යෙදෙන්නාහුයයිදතයුතු. ඇතැම් කලෙක්හි ද්වේෂ මූල සසඞ්ඛාර චිත්තයෙහි ථීන මිද්ධ දෙදෙන පමණක් යෙදෙන්නේවෙයි. එකල්හි ඊර්ෂ්‍යාව නොයෙදෙන්නේදවෙයි. ඇතැම් කලෙක්හි ඊර්ෂ්‍යා මාත්‍රයක් යෙදෙන්නේවෙයි. ථීන මිද්ධ දෙදෙන නොයෙදෙන්නේවෙයි. මෙසේ ථීන මිද්ධ දෙදෙන හා සමග ඊර්ෂ්‍යාව යෙදෙන සැටිද, ඊර්ෂ්‍යාවෙන් තොරව ථීන මිද්ධ දෙදෙන යෙදෙන සැටිද වෙන් වෙන්වශයෙන් දතයුතු. ථීන මිද්ධ දෙදෙන හා සමග මච්ඡරිය චෛතසිකයාගේ යෙදීම හා කුක්කුච්ච චෛතසිකයාගේ යෙදීමද ඊර්ෂ්‍යාවට සිතාසිත්ම යොදාගතයුතුයි. ලෝභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත සසඞ්ඛාරික චිත්තවයෙහි ථීන මිද්ධ දෙදෙනා හා සමග මාන චෛතසිකයාගේ යෙදීමද සහ ශබ්දය හා නානා ශබ්දයද සදෘශ ශබ්දයද ලැබෙන්නාවූ ක්‍රමයෙන් තුන්වරක් අභ්‍යසියයුතුයි. ඊර්ෂ්‍යා, මච්ඡරිය, කුක්කුච්ච, මාන යනමේ සතරචෛතසිකයන් හා සමග ථීන මිද්ධය යෙදෙනකල්හි චෛතසිකයන් හා සහ ශබ්දයද නානා ශබ්දයද, චිත්තය හා සදෘශ ශබ්දයද තුන්වරක්ම ලැබෙන්නේ යයි දතයුතු. ලෝකුත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ දෙදෙන කුමක් හෙයින් නොයෙදෙන්නාහුද යත්? ලෝකෝත්තර චිත්තයෝවනාහි නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. අප්‍රමාණ්‍යයෝවනාහි සත්වප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. මෙසේ නානාලම්බණික භාවය හේතුකොටගෙණ ලෝකෝත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ නොලැබෙත්මැයි. සත්විසි මහද්ගත චිත්තයෙහි කුමක්හෙයින් විරතීහු නොලැබෙන්නාහුද යත්? මහද්ගත චිත්තයෝ වනාහි ප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. ලෝකෝත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. කාමාවචර කුශල චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු ඒ ඒ දුශ්චරිත දුරාජීවයන් අරමුණුකරන්නාහුවෙති. නොහොත් මහද්ගත කුශල චිත්තයෙහි වනාහි කාමාවචර කුශල චිත්තයෙහිමෙන් කුමක්හෙයින් විරතීහු නොලැබෙන්නාහුද යත්? මහද්ගත කුශලය වනාහි කාමාවචර කුශලයමෙන් කාය කම් වචීකම්යන් තදඞ්ග ප්‍රහාණවශයෙන් නසන්නාහුද නොවෙත්. ලෝකෝත්තර කුශලයන්මෙන් සමුච්ඡේද ප්‍රහාණවශයෙන් නසන්නාහුද නොවෙත්. විෂ්කම්භන ප්‍රහාණවශයෙන්ම ක්ලේශ මුවහසාරණ බැවින් මහද්ගත චිත්තයෙහි විරතීහු නොලැබෙත්. අප්‍රමාණ්‍ය දෙදෙන වනාහි එක චිත්තයක එකක්ෂණිකව නොලැබ වෙන් වෙන්ව ලැබෙන්නේ කුමක් නිසාද යත්? භින්නාලම්බණික බැවිනැයි දතයුතුයි. දුක්ඛිත සත්ව ප්‍රඥප්තිය අරමුණුකරන්

නාවූකල්හි සුඛිත සත්ත්වප්‍රඥප්තිය හෝ සුඛිත සත්ත්ව ප්‍රඥප්තිය
අරමුණුකරන්නාවූකල්හි දුක්ඛිත සත්ත්ව ප්‍රඥප්තිය හෝ අර
මුණුනොකොට හැකිවෙති. එහෙයින් ඒකක්ෂණිකව එකම
චිත්තයෙහි මේ ධර්මයෝ දෙදෙන නොලැබෙන්නාහුයයි දත
යුතුයි මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ දෙදෙන වනාහි ලෞකික උපෙ
ක්ෂා සහගත චිත්තයෙහි යෙදෙන්නාහුද උපෙක්ෂා සහගත
පඤ්චමධ්‍යාන චිත්තයෙහි කුමක්හෙයින් නොයෙදෙන්නාහුදයත්?
අර්පණාවට පැමිණියාවූ අප්‍රමාණ්‍යයෝ දෙදෙනවනාහි කිසි
කලෙකත් සොම්නස් වෙදනාවෙන් තොරව නූපදනාහුමය.
පඤ්චමධ්‍යානයද කිසිකලෙකත් උපෙක්ෂාවෙන් තොරව නූපද
නේයි. එහෙයින් මේ අප්‍රමාණ්‍ය දෙදෙනාගේ හා පඤ්චමධ්‍යානයා
ගේද වෙදනා විසභාගත්වය හෙතුකොටගෙණ අප්‍රමාණ්‍ය ධර්ම
යන්ගෙන් යුක්තවූ පඤ්චමධ්‍යානයෙක්නම් නැත්තේයි. ප්‍රථම
ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානයෙහි සොම්නස් වෙදනා යුක්ත
බැවින් එක එක අප්‍රමාණ්‍ය ධර්මය අනියතවශයෙන් යෙදෙන්නේ
යයි දතයුතු. ද්විතීය ධ්‍යානයෙහි විතර්ක ධ්‍යානාංගය කුමක්
හෙයින් නොයෙදෙන්නේද යත්? "භාවනා බලෙන නූප්පජ්ජති"
යනුකීහෙයින් භාවනාශක්තියෙන් විතර්කය නූපදනේය දත
යුතු. එහි විස්තර මෙසේයි. ප්‍රථම ධ්‍යානලාභීවූ ත්‍රිහෙතුක කාමා
වචර රූපාවචර පුද්ගල තෙමේ මා විසින් ලබනලද්දාවූ මේ ප්‍රථම
ධ්‍යානය අතිශයින් දුර්ලභවූ උතුම් ධර්මයකැයි නැවත නැවත
සොම්නසින් යුක්තව ප්‍රථමධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි
ඇත්තාවූ සංස්කාර ධර්මයන් ප්‍රත්‍යවෙක්ෂාකොට හෙවත් පළමු
කොට එක එක ධ්‍යානාංගය ප්‍රත්‍යවෙක්ෂාකොට නැවත ධ්‍යානා
ඞ්ගපඤ්චකයම එක්කොට ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් පුරුදු පුහුණු
කොට ද්විතීය ධ්‍යාන නිකාන්තිය උපදවන්නේයි. කෙසේ උපද
වන්නේද යත්? යම්කිසි පුරුෂයෙක් තෙමේ භාර්‍යාවක් සරණ
පාවාගෙණ බොහෝකල් එකට විසීමෙන් ඈ කෙරෙහි ඇත්තාවූ
දුර්ගුණයන් ප්‍රත්‍යක්ෂවීමෙන් ඈ කෙරෙහි ඇත්තාවූ ප්‍රෙමය සිඳ
අනික් භාර්‍යාවක් කෙරෙහි ප්‍රෙමය උපදවාගත් පුරුෂයෙකුමෙන්
ප්‍රථම ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ මා විසින් ලබනලද්දාවූ
ප්‍රථම ධ්‍යාන තෙමේ මේ කාමච්ඡන්දනීවරණ සඞ්ඛ්‍යාතවූ ලඟවූ
සතුරෙකුගෙන් යුක්තය. ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ග
පඤ්චකය අතුරෙන විතර්ක ධ්‍යානාඞ්ගය ඖදාරිකවන්නේය. එහෙ
යින් ඒ ධ්‍යානාඞ්ගය හැර විචාරාදී චතුරඞ්ගයකින්යුක්තවූ ද්විතී
යධ්‍යානය ලැබුයේනම් මැනවැයි සිතා ද්විතීයධ්‍යානයට ගොචර
වන්නාවූ තුදුස කර්මස්ථානයන් අතුරෙන් තමාගේ චරිතයට
අනුකූලවූ කර්මස්ථානයක් "පඨවි පඨවි" යනාදීන් මෙනෙහිකරණ

කල්හි විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ග සතරකින් යුක්තවූ ද්විතීය ධ්‍යානය ලබන්නේයි. විතර්ක සඞ්ඛ්‍යාතවූ ධ්‍යානාඞ්ගය වනාහි භාවනාශක්තියෙන් දුරුකරන්නේයි. මේ ද්විතීය ධ්‍යානයටත් ක්‍රමය පඨම ධ්‍යානය දක්වා යොදා අභිගතයුත්තේයි.

## මහද්ගත චිත්තයන්ගේ සංග්‍රහනය නිමියේයි.

මහද්ගත සඞ්ග්‍රහනයට අනතුරුව කාමාවචර චිත්තයන්ගේ සඞ්ග්‍රහනය දක්වනු කැමතිවූ අනුරුද්ධාචාරීන්වහන්සේ "කාමාවචර සොභනෙසු පන" යනාදිය කීහ. සුවිසි කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන් මහාවිපාක මහාක්‍රියාවන්ට පූර්වභාගයෙහි මහාකුශල චිත්තය දක්වනලදී. ඔවුන් අතුරෙන් පළමුවන මහාකුශලවයෙහි යටකීතයින් විරතිත්‍රය හා අප්‍රමාණ්‍ය දෙදෙනද සඞ්ග්‍රහකළහෙයින් අටතිස් ධර්මකෙනෙක් ලැබෙන්නාහුවෙත්. එතකුදුවුවත් විරතිත්‍රය අප්‍රමාණ්‍යද්වය යන පස්දෙනා අතුරෙන් එක එක චෛතසිකයම ලැබෙන්නේයි. එතකුදුවුවත් විරතිත්‍රය අතුරෙන් එකක් හා අප්‍රමාණ්‍ය දෙදෙනා අතුරෙන් එකක්ද ඒකාන්තයෙන් ඒකක්ෂණයෙහි නොලැබෙන්නේයි. විරතියක් ලැබෙන්නාවූ චිත්තයෙහි අප්‍රමාණ්‍යයක් හෝ අප්‍රමාණ්‍යයක් යෙදෙන චිත්තයෙහි විරතියක් හෝ නොලැබෙන්නේයි. කුමක් හෙයින යත්? අප්‍රමාණ්‍යයෝවනාහි ප්‍රමාණ රහිතවූ සත්ත්වප්‍රඥප්තියක්ම අරමුණුකෙරෙත්. ලෞකික චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු විරමිතව්‍ය වස්තුවූ දුශ්චරිත දුරාජීවයන්ම අරමුණුකෙරෙති. මෙසේ අප්‍රමාණ්‍ය විරතීන්ගේ ආලම්බණනානත්වය හෙතුකොටගෙණ අප්‍රමාණ්‍ය විරතීහු එක චිත්තයෙහි එකවිට නොලැබෙත්මැයි. මේ විරතීහුවනාහි කාමාවචර කුශල චිත්තයෙහි අනියත යොගීවශයෙන් ඇතැම් කලෙක්හි එක එක විරතිය ලැබෙන්නේ නමුදු ලොකොත්තර චිත්තයෙහි සියලු විරතීහුම ඒකක්ෂණයෙහි නියතයොගීවශයෙන් යෙදෙන්නාහුමැයි. මේ විරතීහු වනාහි කාමාවචර කුශල චිත්තයෙහි අනියත යොගීවශයෙන් එක එක ධර්මයක් ලොකොත්තර චිත්තයෙහි නියත යොගීවශයෙන් සියලු විරතීහුත් කෙසේ ලැබෙන්නාහුද යත්? කාමාවචර කුශලයෙහි ලැබෙන්නාවූ විරතීහු විරමිතව්‍ය දුශ්චරිතයන්ම අරමුණුකෙරෙති. ලොකොත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු ඒකාන්තයෙන් නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. එහෙයින් ලොකොත්තර චිත්තයෙහි සියලු විරතීහු ඒකක්ෂණිකව ලැබෙන්

නාහුමැයි. කාමාවචර කුශලය වනාහි දුශ්චරිතාද අරමුණුකරයි. සුදුසු පරිද්දෙන් නිර්වාණයද අරමුණුකරයි, ප්‍රඥප්තියද අරමුණු කරයි. මෙසේ නිර්වාණ ප්‍රඥප්ති ආදිය අරමුණුකරන්නාවූකල්හි සුදුසු පරිද්දෙන් විරතීන්ගේ යෙදීම දතයුතුයි.

## මහාකුශල සංග්‍රහනය නිමියේයි.

සහේතුක කාමාවචර ක්‍රියා චිත්තයෙහි විරතීහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? ලොකිය කුසලානං එකන්ත කුසල සභාවත්තා තස්ස අබ්‍යාකතෙසු සම්භවොති වුත්තං විරති වජ්ජිතා" යි. ටීකා වචන බැවින් ලෞකික විරතීහු එකාන්ත කුශල සවභාව ඇති බැවින් අව්‍යාකෘතවූ ක්‍රියා චිත්තයෙහි නොලැබිය යුතුහෙයින් විරතීහු ක්‍රියා චිත්තයෙහි නොලැබෙන්නාහුයයි කියයුතුයි. "පඤ්චසික්ඛාපදානි කුසලානි" යනු ප්‍රතිසම්භිදා මාර්ගයෙහි වදාළ බැවින් කාමාවචර කුශලයෙහි මුත් අව්‍යාකෘතවූ විපාක ක්‍රියා චිත්තයෙහි නොලැබෙන්නේයයි දතයුතුයි. මේ මහාක්‍රියා චිත්තයෙහි අටතිස් චෛතසිකයන් අතුරෙන් විරතිත්‍රය උද්ධරණයකොට අවශෙෂවූ පන්තිස් චෛතසිකයෝ ප්‍රථම දුකාදියෙහි සුදුසු පරිද්දෙන් යෙදියයුත්තාහුයි.

## කාමාවචර ක්‍රියා සංග්‍රහනය නිමියේයි.

සහේතුක කාමාවචර විපාක චිත්තයෙහි අප්‍රමාණ විරතී දෙදෙන කුමක්හෙයින් නොලැබෙන්නාහුද යත්? "කාමාවචර විපාකානම්පි එකන්ත පරිත්තාරම්මණත්තා අප්පමඤ්ඤානඤ්ච සත්තාරම්මණත්තා විරතීනම්පි එකන්ත කුසලත්තාවුත්තං අප්පමඤ්ඤාවිරති වජ්ජිතානි" යනු ටීකා බැවින් අරමුණු විශෙෂ බැවින්ද, ජාති විශෙෂ බැවින්ද, අප්‍රමාණ විරතීහු විපාකචිත්ත යෙහි නොලැබෙන්නාහුයයි දතයුතුයි. මේ මහාවිපාක චිත්ත යෙහි අටතිස් චෛතසිකයන් අතුරෙන් අප්‍රමාණ්‍ය විරතීහු පස් දෙන උද්ධරණයකොට අවශෙෂවූ තෙතිස් චෛතසික ධර්මයෝ ප්‍රථම දුකාදියෙහි සුදුසු පරිද්දෙන් යොදාගතයුත්තාහුයි.

## කාමාවචර මහාවිපාක සංග්‍රහනය නිමියේයි.

සුවිසි කාමාවචර සොභන චිත්තයන්ගේ සඞ්ග්‍රහනය දක්වා දොළොස් අකුශල චිත්තයන්ගේ සඞ්ග්‍රහනය දක්වනුලැබේ. පළමු

වන අසංඛාරික චිත්තය හා දෙවෙනි අසංඛාරික චිත්තයෙහිද, දිට්ඨි, මාන, දෙදෙන සමග විසිචෛතසිකයෙක් බැගින් ලැබෙන්නේයයි කියාද, තුන්වෙනි අසංඛාරික චිත්තය හා සතරවෙනි අසංඛාරික චිත්තයෙහිද, ප්‍රීතිය උද්ධරණයකොට දිට්ඨිමාන දෙදෙන වෙන වෙනම බහා අටළොස් චෛතසික කෙනෙක්ද, පස්වෙනි අසංඛාරික චිත්තයෙහි දෙවිසි චෛතසිකයන් අතුරෙන් ථීන මිද්ධ දෙදෙන උද්ධරණයකොට විසි විසි චෛතසිකය ලැබෙන්නේයයි දතයුතුයි. පළමුවන සසංඛාරික චිත්තය, දෙවෙනි සසංඛාරික චිත්තය යන දෙසිතෙහි අසංඛාරික චිත්තයෙහි කී එකුන් විසිචෛතසිකයන් කෙරෙහි ථීන මිද්ධ දෙදෙන බහා එක් විසිචෛතසිකකෙනෙක්ද, තුන්වන සසංඛාරික චිත්තයෙහි හා සතරවන සසංඛාරික චිත්තයෙහිද අසංඛාරික චිත්තවලට කී අටළොස් චෛතසිකයන් කෙරෙහි ථීන මිද්ධ දෙක බහා විසි චෛතසිකයක් ලැබෙන්නේයයි දතයුතුයි, දෙස මූල සසංඛාර චිත්තයෙහි ථීන මිද්ධ දෙදෙන බහා විසිචෛතසිකකෙනෙක්ද, උද්ධච්ච සහගත චිත්තයෙහි ඡන්ද ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන එකොළොස් චෛතසිකයන් කෙරෙහි අකුශල සාධාරණ සතරචෛතසිකය බහා පසළොස් චෛතසිකයක් ලැබෙන්නේයයිද, විචිකිච්ඡා සහගත චිත්තයෙහි එම පසළොස් චෛතසිකයන් කෙරෙහි ඇතුළත්වූ අධිමොක්ෂය උදුරා විචිකිච්ඡාව බහා පසළොස් චෛතසිකයෙක්යයි දතයුතුයි. ඒ දොළොස් අකුශලයෙහි සත්වැදෑරුම් සංග්‍රහනය ගාථාවෙහි කීනයින් දතයුතුයි.

## අකුශල සංග්‍රහනය නිමියේයි.

අහේතුක සංග්‍රහයෙහි දොළොස් අකුශල චිත්තයෙහිමෙන් කියයුත්තේයි. සම්ප්‍රයොග ක්‍රමයෙහිවනාහී අකුශල සංග්‍රහය පළමුකොට දක්වූවාක්මෙන් මේ අහේතුක සංග්‍රහවෙහිද, අකුශල විපාකය දක්විය යුතුනොවේද යත්? ලොකොත්තරචිත්තය කුමක්හෙයින් දක්වූයේදැයි චොදනාකටයුතුවෙයි. චෛතසික ධර්මයන් අතිශයින් වනිවූ චිත්තය පළමුකොට දක්වා ඊට අනතුරුව ක්‍රමයෙන් චෛතසිකයන් වැඩිචිත්තයන් දක්වනු පිණිස ලොකොත්තර චිත්තය පළමුකොට දක්වූයේයයි දතයුතුයි. චෛතසිකයන්ගේ යෙදීමෙහි මහාකුශලචිත්තයෙහි සියල්ලන්ට අධිකවූ චෛතසිකයන් යෙදෙනහෙයින් කාමාවචර මහාකුශල චිත්තාදිය පළමුකොට දක්වියයුතු නොවේදැයි ප්‍රශ්නයක්තිබේ. ඊට පරිහාර වචනනම්:-අධිකාර්ථ සවලපාර්ථ දෙකින් යුක්තවූ

කුශල චිත්තයන් අතුරෙන් යම් චිත්තයක් උතුම්වීනම් ඒචිත්තය පළමුකොට දක්වීම් යුක්ති බැවින් ලෝකෝත්තර චිත්තයෙහි චෛතසික ධර්මයන්ගේ උත්තමබව ඇති නුමුත් ශ්‍රේෂ්ඨාර්ථය සලකා පළමුකොට තබනලද්දේයයි දතයුතු. මහාක්‍රියා චිත්තය හා සමග මහාවිපාක චිත්තයද උත්තමාර්ථයෙන් ක්‍රියාචිත්තයම පළමුකොට දක්වනලද්දේයි.

## මේ ක්‍රියා විපාක චිත්තයෙහි සංග්‍රහනයයි.

"ඉත්ථං චිත්තාවියුත්තානං" යනාදී නිගමන ගාථාවෙහි අභිප්‍රායාර්ථය "මෙසේයි:-චිතෙතකත සමමුද්දිසෙ" යන ගාථාපදයෙහි අභිප්‍රායාර්ථය චිත්ත පරිච්ඡෙදයට අනුව යෙදියයුත්තේයි. ඒ මෙසේයි:-ස්පර්ශාදීවූ චෛතසිකයෝ සත්දෙන සර්වචිත්තසාධාරණ භාවයෙන් සියලු චිත්තයෙහිම යෙදෙනහෙයින් එකුන් අනූවක් ස්පර්ශය, එකුන් අනූවක් වේදනාය, එකුන් අනූවක් සංඥාය එකුන් අනූවක් චේතනාය, එකුන් අනූවක් ඒකාග්‍රතාවෝය, එකුන් අනූවක් ජීවිතෙන්ද්‍රියයෝයයි මෙසේ චෛතසික සංඛ්‍යාව මොනවට අවබොධකටයුත්තේයි. ප්‍රකීර්ණක චෛතසිකයන් සදෙන අතුරෙන් වනාහි විතර්කය සැටෙක්ද; විචාරය පස් පණසෙක්ද, අධිමොක්ෂය එකොළොසෙක්ද, වීර්‍ය්‍යය සොළසෙක්ද, ප්‍රීතිය සැත්තෑවෙක්ද, ඡන්දය විස්සෙක්දැයි, මෙසේ ප්‍රකීර්ණකයන්ගේ ගණන දතයුතුයි. ශ්‍රද්ධාව ආදිකොට ඇත්තාවූ කායුජ්ජුකතාව අවසන්කොට ඇත්තාවූ එකුන්විසි චෛතසිකයන් අතුරෙන් එක් චෛතසිකයක් එකුන් සැටක් ප්‍රභෙදවනහෙයින් ඒ එකුන්විසි ශෝභන සාධාරණයන්ගේ එකුන් සැටක් ප්‍රභෙදය වෙන වෙනම දතයුතුයි. අප්‍රමාණ්‍යයන් අතුරෙන් එක්තරා ධර්මයක් සොළසක් සොළසක් වනහෙයින් තුන්දෙනාගේ සොළසාකාර භෙදය එක එකක්හුගේ සොළසාකාරවූ භෙදයයි දතයුතුයි. අප්‍රමාණ්‍ය දෙදෙන අටවිසි චිත්තයෙහි යෙදෙනහෙයින් එක එක ධර්මයක් අටවිසි අටවිසි ප්‍රභෙදවේ. ප්‍රඥාතොමෝ වනාහි පන්සාළිසක් ප්‍රභෙදවෙයි. මොහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, යන ධර්මයෝ සතරදෙනම්වනාහි එකක් එකක් දොළොස් ආකාරවෙත්. මිථ්‍යාදෘෂ්ටියවනාහි සතරාකාරවෙයි. මානයද එසේම සතරාකාරවෙයි. විචිකිච්ඡාවවනාහි විචිකිච්ඡාසහගත චිත්තයෙහි යෙදෙනහෙයින් ඒකාකාරවන්නේයි. "ඉස්සා, මච්ඡර, කුක්කුච්ච" ධර්මයෝ තුන්දෙනම්වනාහි සම්ඛිසි

කාලෙක යෙදෙනහෙයින් අනියතයෝයයි කියනලද්දහුය. වෙෂය එතාහි දෙයාකාරවන්නේයි. මෙසේ මේ චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයන් එතාහි තම තමා හා යෙදෙන් නාවූ චිත්තයන්ගෙන් ගණන් බලා චෛතසිකයන්ගේ සංඛ්‍යාව පිඩුකොට කියයුතුයි.

මෙසේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි චෛතසික සඞ්ග්‍රහ විභාගනම්වූ ද්විතීය පරිච්ඡේදය නිමියේයි.

## තුන්වෙනි පරිච්ඡේදයෙහි පදගතාර්ථයි.

යථායෝගං, සුදුසු පරිද්දෙන්; සම්පයුත්තා, සතරසම්ප්‍රයොගලක්ෂණයෙන් යුක්තවූ; චිත්තචෛතසිකා, චිත්ත චෛතසික නම්වූ; ධම්මා, පරමාර්ථ ධර්මයෝ තුමූ; සභාවතො, ආරම්මණ විජානන ඵුසනාදි තම තමාගේ ස්වභාව ලක්ෂණ ප්‍රභෙදවශයෙන්; තෙපඤ්ඤාස, තෙපණසක් ප්‍රභෙදවූවාහු; හොන්ති, වෙත්; දානි (ඉදානි) දැන් එතාහි; තෙසං, ඒ තෙපණසක් ප්‍රභෙදවූ ස්වභාව ධර්මයන්ගේ; යථාරහං, සුදුසු පරිද්දෙන්; චිත්තුප්පාදවසෙනෙව චිත්තචෛතසිකයන්ගේ වශයෙන්ම; වෙදනාහෙතුතො, වෙදනා, භෙදය හෙතු භෙදය වශයෙන්ද; කිච්චද්වාරාලම්බණවත්ථුතො, කෘත්‍යය භෙදය, ද්වාර භෙදය, ආලම්බණ භෙදය, වස්තු භෙදය, යනමොවුන්ගේවශයෙන්ද, සඞ්ගහොනාම, වෙදනාදී සංග්‍රහ නම් ඇත්තාවූ ප්‍රකීර්ණක සංග්‍රහයක්; මයා, මා විසින්; නීයතෙ, එලවනුලැබේ.

තත්ථ, (තෙසුඤ්ඤ පකිණ්ණක සඞ්ගහෙසු) ඒ සවැදෑරුම්වූ ප්‍රකීර්ණක සංග්‍රහයන් අතුරෙන්; වෙදනා සඞ්ගහෙ, වෙදනා සංග්‍රහයෙහි, තාව, පළමුකොට; (විභාගො, විභාගය; මයාවුච්චති, මා විසින කියනුලැබේ;) වෙදනා, වෙදනා තොමෝ; සුඛාච, සුඛ වෙදනාවෙක්ද; දුක්ඛාච, දුඃඛවෙදනාවෙක්ද; අදුක්ඛමසුඛාච, දුකුත් නොවූ සැපත් නොවූ උපෙක්ෂාවෙදනාවෙක්ද; ඉති, (ඉමිනාපභෙදෙන) මෙසේ අනුභවන ලක්ෂණ ප්‍රභෙදවශයෙන්; තිවිධා, (හොති) තුන් ප්‍රකාරවන්නේයි. පන, අනුභවන ලක්ෂණ යෙන් අන්‍යවූ ඉන්ද්‍රිය භෙදය දක්වම්:-වෙදනා, වෙදනාතොමෝ; සුඛංච, සුඛවෙදනාවෙක්ද; දුක්ඛංච, දුක්වෙදනාවෙක්ද; සොමනස්සංච, සොම්නස්වෙදනාවෙක්ද; දොමනස්සංච, දොම්නස් වෙදනාවෙක්ද; උපෙක්ඛාච, උපෙක්ෂාවෙදනාවෙක්ද; ඉති, (ඉමිනාප

දෙන) මෙසේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ප්‍රභේදවශයෙන්; පඤ්චධා හොන්ති, පස්ප්‍රකාර වන්නේයි. තත්‍ර, ඒ වෙදනා සංග්‍රහයෙහි නොහොත් පඤ්චප්‍රකාර වෙදනාවන් අතුරෙන් නොහොත් ඒ පඤ්චප්‍රකාර වෙදනාවන් හා සමග හටගත්තාවූ චිත්තයන් අතුරෙන්; සුඛසහගතං, සුඛවෙදනාව හා එක්ව හටගත්තාවූ සිත් තෙමේ; කුසලවිපාකං, කුසලයාගේ විපාකවූ; කායවිඤ්ඤාණමෙකමෙව හොති, කායවිඥාන එකම සිතක් වෙයි; තථා එපරිද්දෙන්; දුක්ඛසහගතං, දුක් වෙදනාව හා එක්ව හටගත්තාවූ සිත් තෙම; අකුසලවිපාකං, අකුසලයාගේ විපාකවූ; කායවිඤ්ඤාණමෙකමෙව හොති, එක් කායවිඥානයක්ම වෙයි. පන, දුක්ඛවෙදනාවෙන් අන්‍යවූ සොම්නස් වෙදනාව කියමි; සොමනස්සසහගත චිත්තානි, සොම්නස් වෙදනාව හා එක්ව හටගත්තාවූ චිත්තයෝ තුමූ; චත්තාරි ලොභමූලානිච, ලොභමූලික චිත්තයෝ සතර දෙනෙක්ද; ද්වාදස කාමාවචර සොභනානිච, කාමාවචර සොභන චිත්තයෝ දොළොස්දෙනෙක්ද; සුඛසන්තීරණහසනානිච, සොම්නස් සහගත සන්තීරණ චිත්තය, සොම්නස් සහගත හසිතොත්පාද චිත්තය යන දෙදෙනාද; ඉති, මෙසේ; අට්ඨාරස කාමාවචර සොමනස්ස සහගත චිත්තානිචෙව, අටළොස් කාමාවචර සොම්නස් සහගත චිත්තයෝද; පඨම, දුතිය, තතිය, චතුත්ථජ්ඣාන, සංඛාතානි, ප්‍රථමධ්‍යානචිත්තයෝ එකොළොස්දෙනය; ද්විතීය ධ්‍යාන චිත්තයෝ එකොළොස්දෙනය; තෘතීයධ්‍යාන චිත්තයෝ එකොළොස් දෙනය චතුර්ථධ්‍යාන චිත්තයෝ එකොළොස්දෙනය යන; චතුචත්තාළීස, සූසාළිසක් ප්‍රභේදවූ; මහග්ගතලොකුත්තර චිත්තානි, මහද්ගත ලොකොත්තර චිත්තයෝය; ඉති, (ඉමිනාපභෙදෙන) මෙසේ මේ ප්‍රභේදයෙන්; ද්වාසට්ඨිවිධා භවන්ති, දෙසැටවැදෑරුම් වෙත්. පන, සොමනස්සසහගත චිත්තයන්ගෙන් අන්‍යවූ දොම්නස හා එක්ව හටගත්තාවූ චිත්තයෝ තුමූ; වෙපටිඝ සම්පයුත්ත චිත්තානෙවහොන්ති, ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයෝ දෙදෙනාම වෙති. සෙසානි, සුඛ දුක්ඛ සොමනස්ස දොමනස්ස වෙදනා සහගත චිත්තයන්ගෙන් අවශිෂ්ටවූ; සබ්බානි, සියලුම; පචපඤ්ඤාස, පස්පණස් චිත්තයෝ තුමූ; උපෙක්ඛා සහගත චිත්තානි භවන්ති, උපෙක්ෂාසහගිය චිත්තයෝ නම් වෙති. ඉති, මෙසේ මේ උක්තප්‍රකාරයෙන්; (වෙදිතබ්බං) දතයුත්තේයි.

තත්‍ර, ඒ වෙදනා සංග්‍රහයෙහි; වෙදනා, වෙදනා තොමෝ; සුඛංච, සුඛවෙදනාවද; දුක්ඛංච, දුක්ඛවෙදනාවද; උපෙක්ඛාච, උපෙක්ෂා වෙදනාවද; ඉති, (ඉමිනාපභෙදෙන) මෙසේ මේ අනු

භවන ලක්ෂණ ප්‍රභෙදයෙන්; තිවිධාහොති, තුන් වැදෑරුම් වෙයි. වේදනා, වේදනාතොමෝ; සුඛච, සුඛවේදනාවද; දුක්ඛච, දුක් වේදනාවද; සොමනස්සච, සොම්නස් වේදනාවද; දොමනස්සච, දොම්නස් වේදනාවද; උපෙක්ඛාච, උපෙක්ෂාවේදනාවද; (ඉති ඉන්ද්‍රියභෙදෙන) මෙසේ මේ ඉන්ද්‍රිය භෙදයෙන් පඤ්චධාහොති, පස්වැදෑරුම්වෙයි. සුඛච, සුඛවේදනා තොමෝද; දුක්ඛච, දුක් වේදනා තොමෝද; එකත්ථඨිතං, එකම චිත්තයෙක්හි පිහිටියේයි. දොමනස්සං, දොම්නස් වේදනා තොමෝ; ද්වයෙඨිතං, දෙතැනෙක්හි පිහිටියේයි; සොමනස්සං, සොම්නස් වේදනා තොමෝ; ද්වාසට්ඨිසු ඨිතං, දෙසැටචිත්තයෙක්හි පිහිටියේයි. ඉතරා, මොවුන් ගෙන් අන්‍යවූ; උපෙක්ෂාවේදනා තොමෝ; පඤ්චපඤ්ඤාසකෙ, පස් පණස් චිත්තයෙක්හි; ඨිතා, සිටියාවෙයි; මෙහි වේදයිත ශබ්දය අපෙක්ෂාකොට "සුඛං දුක්ඛං" යන නපුංසක ලිඞ්ග නිර්දේශයද, වේදනා ශබ්දය අපෙක්ෂාකොට "උපෙක්ඛා යන ස්ත්‍රී ලිඞ්ග නිර්දේශයද, සුදුසු පරිද්දෙන් යොදගත යුතුයි.

## භාවාර්ථ.

චෛතසික පරිච්ඡෙදය දක්වා තදනන්තරව ප්‍රකීර්ණක පරිච්ඡෙදය දක්වනුලැබේ:—හේ කෙසේයත්? එකුප්පාද, එක නිරොධ, එකාලම්බණ, එකවත්ථුක, සංඛ්‍යාතවූ සතරසම්ප්‍රයොග ලක්ෂණයෙන් යුක්තවූ චිත්ත චෛතසික ධර්මයෝ තුමූ ආරම්මණ විජානනලක්ෂණය, ඵුසන ලක්ෂණය, යනාදිවූ අන්‍යොන්‍ය විරුද්ධ ලක්ෂණ වශයෙන් තෙපණස් වැදෑරුම් වෙයි. ඒ සියලු චිත්ත චෛතසිකයෝ වනාහි කවරකාරයකින් තෙපණසක්වන්නාහුද යත්? එකුන් අනූවක් චිත්තයෝ තුමූ අරමුණු දැනගැනීම් සංඛ්‍යාතවූ එකම අර්ථයෙන් ඒ එකුන් අනූවක් චිත්තයම සාධාරණ වූ එකම ලක්ෂණයෙන් යුක්ත හෙයින් එකක්කොට ගන්නේයි. දෙපණස් චෛතසිකයෝ වනාහි ඵුසනවේදයිතාදිවූ තම තමාගේ ලක්ෂණවශයෙන් දෙපණස් වැදෑරුම් වන හෙයින් දෙපණසක්ම වන්නේයි. ඒ දෙපණසට යටකී එක් වැදෑරුම් චිත්තය එක්කොට ගත්කල්හි ඒ තෙපණස තෙපණස් නාම ධර්මයයි ගත යුතුයි. ඒ තෙපණස් නාම ධර්මයෝ තුමූ සුදුසු පරිද්දෙන් චිත්ත චෛතසිකයන්ගේ මිශ්‍රකිරීම් වශයෙන්ම වේදනා භෙදය, හෙතු භෙදය, කෘත්‍යය භෙදය, ද්වාර භෙදය, ආලම්බණ භෙදය, වත්ථු භෙදය, යන මොවුන්ගේ වශයෙන් වේදනා සංග්‍රහාදී නම් ඇත්තාවූ ප්‍රකීර්ණක සංග්‍රහයක් එලවනු ලැබෙයි. ඒ තෙපණස් නාම

ධම්මයෝ තුමූ සුදුසු පරිද්දෙන් එලවීමය යනු වෙදනා භෙදය, හෙතුභෙදය, කෘත්‍ය භෙදය, ද්වාරභෙදය, ආලම්බණ භෙදය, වත්‍ථු භෙදය, යන මොවුන්ගේ වශයෙන් බෙදීමම සුදුසු පරිද්දෙන් බෙදීම නම් වෙයි දතයුතුයි. ඒ සයාකාර භෙදයන් අතුරෙන් වෙදනා සංග්‍රහයෙන් බෙදූකල්හි වෙදනාවිරහිත චිත්තයක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. හෙතුසංග්‍රහයෙන් බෙදූකල්හි අටළොස් අහෙතුක චිත්තයන් හැර එක් සැත්තෑවක් සහෙතුක චිත්තයෝ ලැබෙත්. කෘත්‍ය සංග්‍රහයෙන් බෙදූකල්හි කෘත්‍යාදිය රහිතවූ චිත්තයක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. ද්වාරසංග්‍රහයෙන් බෙදූකල්හි ද්වාර විමුක්තවූ හෙවත් ෂට්ද්වාරයෙන් පිටත්හී පවත්නාවූ එකුන්විසි චිත්තයන් හැර අවශෙෂ චිත්තයෝම ලැබෙත් ආලම්බණ සංග්‍රහයෙන් බෙදූකල්හි නිරාලම්බණිකවූ සිතක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. වත්‍ථුසංග්‍රහයෙන් බෙදූකල්හි සතර අරූප විපාක හා සමග අරූපභූමියෙහි හටගන්නාවූ දෙසාළිසක් චිත්තයෝ විකල්ප වශයෙන් ලැබෙත්. අනුභවනය යනු අරමුණු රසවිඳගැණීම කියනලදී. ඒ වෙදනාවම ඊශ්වරභාවිය කරණ හෙයින් ඉන්ද්‍රිය ධම්මයෝයයි කියනු ලැබෙත්. අනුභවන ලක්‍ෂණවශයෙන් ත්‍රිවිධාකාරවූ වෙදනාවන් අතුරෙන් සුඛවෙදනා තොමෝ වනාහි සුඛසහගතවූ තෙසැට චිත්තයෙහි පවත්නාවූ වෙදනාවයයි කියනුලැබෙයි. සුඛවෙදනා සමූහයද තෙසැටෙක්වෙයි. ඒ සුඛවෙදනා හා පවත්නාවූ චෛතසිකයෝ වනාහි අගහිත ග්‍රහණන්‍යායෙන් සසාළිසෙක් වෙත්. දුක්ඛ වෙදනා තොමෝ දුක් සහගත තුන්සිතෙහි පවත්නේයි. ඒ තුන් සිතෙහි පවත්නාවූ වෙදනාව දුක්ඛවෙදනායයි කියනු ලැබේ. දුක්ඛවෙදනාවන්ගේ සමූදය තුන්දෙනෙකි. ඒ දුක්ඛ වෙදනාව හා සමග පවත්නාවූ චෛතසිකයෝ තුමූ අගහිත ග්‍රහණන්‍යායෙන් එක්විස්සෙකි. උපෙක්‍ෂාවෙදනාය යනු උපෙක්‍ෂා සහගත පස්පණස් චිත්තයෙහි පවත්නා වෙදනාවයි. ඒ උපෙක්‍ෂාවෙදනාවන්ගේ සමූදය පස්පණසෙකි. උපෙක්‍ෂාවෙදනාව හා සමග පවත්නාවූ චෛතසිකයන්ගේ සංඛ්‍යාව අගහිත ග්‍රහණන්‍යායෙන් සසාළිසෙක්ම වෙයි. ඉන්ද්‍රිය භෙදයද මේ ක්‍රමයෙන්ම විස්තර කටයුත්තේයි. ඉන්ද්‍රිය භෙදයෙන් බෙදූකල්හි දුක්ඛෙන්ද්‍රිය සමග පවත්නාවූ එක් සිතෙක්ද, සුඛෙන්ද්‍රිය සමග පවත්නාවූ එක් සිතෙක්ද, සොමනස්සෙන්ද්‍රිය සමග පවත්නාවූ දෙසැට චිත්තයෙක්ද, දොමනස්සෙන්ද්‍රිය සමග පවත්නා දෙසිතෙක්ද, උපෙක්ඛින්ද්‍රිය සමග පවත්නා පස්පණස් චිත්තයෙක්ද වන්නාහුයයි දතයුතුයි.

දුක්ඛවේදනාවෙන් හා සැප වේදනාවෙන්ද අන්‍යවූ වේදනා තොමෝ අදුක්ඛමසුඛා නම් වන්නීය. අදුක්ඛම සුඛා යන්හි යෙවමදනාදී සූත්‍රයෙන් මකාරාගමවූ නැති. අකාරය තෙමේ ප්‍රතිෂේධාර්ථය, විරුද්ධාර්ථය, අභාවාර්ථය, මුඛ්‍යාර්ථය, තබ්භාවාර්ථය, යන මෙතෙක් අර්ථයෙහි පවත්නේයි. ඒ අර්ථයන් අතුරෙන් මෙතැන්හි අන්‍යාර්ථයෙහි පවත්නේය යනු බව හඟවන පිණිස අදුක්ඛ අසුඛ ශබ්දයෙහි අකාරය අසදෘශ ශබ්දයෙන් විනාවෙහි වර්ණනා කරණ ලද්දේයි. එහෙයින් "දුක්ඛතො අසදිසා අදුක්ඛා සුඛතො අසදිසා අසුඛා,"යි පඤ්චමීතත්පුරුෂ සමාසකටයුතුයි. "ද්වෙමා භික්ඛවෙ වේදනා සුඛදුක්ඛා" යනුවෙන් සූත්‍රාන්තයෙහි වදාළහෙයින් වේදනාවෝ දෙදෙනෙක් නොවේදැයි යම්කිසි චෝදකයෙකු විසින් චෝදනාකෙළේවීනම් ඊට මෙසේ ප්‍රත්‍යුත්තර දියයුතුයි. ඒ 'ද්වේමා භික්ඛවේ" යනාදී වචනය වනාහි නිරවද්‍ය පක්ෂයෙහිවූ අදුක්ඛමසුඛ උපෙක්ෂා වේදනාව සුඛවේදනාවෙහිද, සාවද්‍ය පක්ෂයෙහිවූ අදුක්ඛමසුඛ වේදනාව දුක්ඛ වේදනාවෙහිද සංග්‍රහකොට වේදනාවෝ දෙදෙනෙකැයි වදාරණලද්දහුය. අනවද්‍ය පක්ෂයෙහිවූ වේදනාව නම් කුශලාව්‍යාකෘතයෙහි පවත්නාවූ උපෙක්ෂා වේදනාවයි. සාවද්‍යපක්ෂයෙහි පවත්නාවූ වේදනාව නම් අකුශල චිත්තයෙහිවූ වේදනාවයි. තවද ඇතැම් සූත්‍රාන්තයෙක්හි "යං කිඤ්චි වේදයිතමිද තං දුක්ඛස්ස, යනුවෙන් විඳීම අර්ථකොට ඇත්තාවූ සියලු වේදනාවෝම දුක්ඛ වේදනාවම වන්නේයයි යන මේ වචනයද භාග්‍යවතුන් විසින් වදාරණ ලද්දේයි. අභිධර්මයෙහි තුන් ප්‍රකාරයක් හා පස් ප්‍රකාරයක් ඇතැයි වදාරණලද්දාවූ මේ වේදනාව ඇතැම් සූත්‍රයෙක්හි දෙයාකාරයයි වදාරා නැවතත් එකම වේදනාවයයි තවත් සූත්‍රයෙක්හි දේශනාකිරීම කෙසේ ගැලපෙන්නේදැයි යම්කිසි චෝදකයෙකු විසින් චෝදනාකෙළේවීනම් ඊට ප්‍රත්‍යුත්තර මෙසේයි. ත්‍රෛභූමිකවූ සියලු වේදනාවෝ ප්‍රත්‍යයෙන් හටගන්නා බැවින් සියලු වේදනාව දුක් වේදනාවයයි වදාරණලද්දේයයි දතයුතුයි. තවද සංඛාර දුක්ඛ විපරිනාමදුක්ඛ දුක්ඛ දුක්ඛයයි දුක් වේදනාවම ත්‍රිවිධාකාරවෙයි. ඔවුන් අතුරෙන් ජාති ජරා මරණාදී සංසාර දුක් හා සතර අපා දුකද දුක්මවූ දුක් බැවින් දුක්ඛ දුක්ඛයයි කීයාද, අවශෙෂ භවත්‍රයෙහි ඇතුලත්වූ සුඛවේදනා සම්මතවූ සියලු වේදනාවෝ ප්‍රත්‍යයෙන් හටගන්නා බැවින් සංඛාර දුක්ඛයයි කීයාද, සුවාසූදහසක් මහා කල්පයන්ට ආයුෂ ඇත්තාවූ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙන් චුතවී එන්නාවූ දවස්හි සුවාසූදහසක් කල්පය මුලුල්ලෙහි විඳවූ විරාගී සැපය විපරි

නාම දුක්ඛයෙහි ඇතුළත්වෙයි. එහෙයින් බ්‍රහ්මලෝක දිව්‍යලෝක මනුෂ්‍ය ලෝකයෙහි ඇත්තාවූ සුඛ සම්මතවූ වේදනාවෝ විපරිනාම දුකින් හා සංඛාර දුකින්ද පහනුවූ බැවින් ත්‍රෛභූමික වෘත්තයම දුඃඛ සත්‍යයයි වදාරණලද්දේයි. එහෙයින් "යං කිඤ්චි වෙදයිත මිදමෙත්ථ දුක්ඛස්ස" යන දේශනාවම නිෂ්පර්‍යායවූ (ප්‍රධාන) දේශනාවමවෙයි. සූත්‍රාන්තයෙහි හා අභිධර්මපිටකයෙහි වේදනාවෝ ද්විප්‍රකාරය, ත්‍රිප්‍රකාරය, පඤ්චප්‍රකාරයයි වදාළාවූ දේශනාවෝ පර්‍යාය (අප්‍රධාන) දේශනාවෝ නම්වෙත්. සර්වඥවරයන්ගේ දේශනාවිලාසයෙන් හා විනෙයජනයන්ගේ අදහස් පරිද්දෙන්ද එකම ධර්මය අනෙක ප්‍රකාරයෙන් බෙදා වදාළේයයි දතයුතුයි.

## පදගතාර්ථ.

හෙතු සඞ්ගහෙ, හෙතු සඞ්ග්‍රහයෙහි; (එවං, මෙසේ; විභාගොවයාවුච්චතෙ,) යනු අධ්‍යාහාරයි. හෙතු නාම, හෙතුහු නම් වනාහි; ලොභොච, ලොභ හෙතුවෙක්ද; දොසොච, ද්වෙෂහෙතුවෙක්ද; මොහොච, මෝහහෙතුවෙක්ද; අලොභොච, අලොභහෙතුවෙක්ද, අදොසොච, අද්වෙෂ හෙතුවෙක්ද, අමොහොච ඉති, අමෝහ හෙතුවෙක්දැයි (ඉමිනා.පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්,) ඡබ්බිධා භවන්ති, සවැදෑරුම්වෙත්. තත්‍ථ. ඒ හෙතු සඞ්ග්‍රහයෙහි නොහොත් ඒ සවැදෑරුම් හෙතුන් අතුරෙන් නොහොත් සවැදෑරුම් හෙතුන් ඇත්තාවූද නැත්තාවූද හෙතුන් අතුරෙන්; පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණවොත්ථපන හසනවසෙන,පඤ්චද්වාරාවජ්ජන චිත්තය දෙපස්විඤ්ඤාණයෝය සම්ප්‍රතීච්ඡනයුගලය සන්තීරණත්‍රය ව්‍යවස්ථාපන චිත්තය හසිතොත්පාදචිත්තය යනමොවුන්ගේවශයෙන්; අට්ඨාරස, අටළොස් චිත්තයෝ තුමූ; අහෙතුක චිත්තානිනාම, සම්ප්‍රයුක්තහෙතු විරහිත බැවින් අහෙතුක චිත්තනම්වූවාහු; හොන්ති, වෙත්; සෙසානි අටළොස් අහෙතුක චිත්තයන්ගෙන් අවශිෂ්ටවූ; සබ්බානිපි එකසත්තති චිත්තානි, සියලුම එක් සැත්තෑවක් චිත්තයෝ තුමූ; සහෙතුක චිත්තානි, (නාමහොන්ති) සම්ප්‍රයුක්තහෙතු සහිත බැවින් සහෙතුක චිත්තයෝනම්වෙත්. තත්‍ථ අපි, ඒ සහෙතුක චිත්තයන්අතුරෙනුදු;ද්වෙමොමූහ චිත්තානි,මෝහ මූලික චිත්තයෝ දෙදෙන තුමූ; එකහෙතුකානි, එකම හෙතුවක් ඇති බැවින් එකහෙතුක චිත්තයෝනම්වූවාහු; හොන්ති, වෙත්. සෙසානි, මොහ මූලික දෙසිතෙන් අන්‍යවූ; දසඅකුසල චිත්තානි චෙව, දසඅකුසල

චිත්තයෝද; ඤාණවිප්පයුත්තානි, ඤාණවිරහිතවූ; චාදසකාමාවචරසොභනානිච: දෙළොස් වැදෑරුම්වූ කාමාවචර ශොභන චිත්තයෝද; ඉති, මෙසේ; චාවීසති, දෙවිසි චිත්තයෝ තුමූ; ද්වි‍හෙතුක චිත්තානි හොන්ති, හෙතුන්දෙදෙනෙකුගෙන් යුක්ත හෙයින් ද්විහෙතුක චිත්තනම්වූවාහුවෙත්. චාදසඤාණසම්පයුත්ත කාමාවචර සොභනානිචෙව, දොළොස් වැදෑරුම් ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර ශොභන චිත්තයෝද. පංචතිංසමහග්ගත ලොකුත්තර චිත්තානිචෙති, පන්තිස් මහද්ගත ලොකොත්තර චිත්තයෝදැයි යන; සත්තචත්තාළීස, සත්සාළිස් චිත්තයෝ තුමූ; තිහෙතුක චිත්තානි (හොන්ති) සම්ප්‍රයුක්තවූහෙතුන් තුන්දෙනෙකුන්ගෙන් යුක්තහෙයින් ත්‍රිහෙතුක චිත්තනම්වූවාහුවෙත්. ඉති, මෙසේ; වෙදිතබ්බං, දතයුත්තේයි.

අකුසලාහෙතු, අකුශලවූ හෙතුහු තුමූ; ලොභොච, ලොභ හෙතුවද; දොසොච, ද්වෙෂ හෙතුවද; මොහොච, මොහහෙතුව දැයි, තයොහොන්ති, ප්‍රභෙදයෝ තුන්දෙනෙක්වෙත්. කුසලාබ්‍යාකතා, කුශලවූද අව්‍යාකෘතවූද; හෙතු හෙතුහු තුමූ; අලොභොච, අලොභහෙතුවද; අදොසොච, අද්වෙෂ හෙතුවද, අමොහොච ඉති, අමොහ හෙතුවදැයි; තථා, ඒ අකුශලයෙහිකී පරිද්දෙන්; තයොහොන්ති, ප්‍රභෙදයෝ තුන්දෙනෙක්වෙත්. අහෙතුකා, අහෙතුක චිත්තයෝ; අඨාරස, අටළොස් ප්‍රභෙදය කැයි; මතා, දන්නාලද්දාහුය; එකහෙතුකා, එකහෙතුක චිත්තයෝ; ‍ෙව, ප්‍රභෙද දෙකෙකැයි; මතා, දන්නාලද්දාහුය; ද්විහෙතුකා, ද්විහෙතුක චිත්තයෝ; චාවීස, දෙවිසි ප්‍රභෙදයක් ඇත්තාහුයයි; මතා, දන්නාලද්දාහුය, තිහෙතුකා, ත්‍රිහෙතුක චිත්තයෝ; සත්තචත්තාළීස, සත්සාළිසක් ප්‍රභෙද ඇත්තාහුයයි; මතා, දන්නාලද්දාහුය.

## භා ව ාර්ථ.

හෙතු තෙමේ ලක්‍ෂණවශයෙන් සයාකාරයෙක්ද, කුශලාකුශල අව්‍යාකෘත ජාතිවශයෙන් නවාකාරයෙක්ද, වෙත්. නොහොත් කුශලාකුශල විපාක ක්‍රියාවශයෙන් දොළොස් ආකාරයෙක්ද, කාමරූප අරූපභූමිවශයෙන් සතිස් ආකාරයෙක්ද වෙත්. නොහොත් ලක්‍ෂණවශයෙන් සයාකාරයෙක්ද, මාතෘකාවශයෙන් නවාකාරයෙක්ද, නිර්දේශවශයෙන් දොළොස් ආකාරයෙක්ද, කාමභූමියෙහි සයාකාරයෙක්ද,රූපාරූප ලොකොත්තර භූමියෙහි තුන් තුන් ආකාරය ලැබෙනහෙයින් නවආකාරයෙ

ක්ද, සියලු හෙතූන්ගේ පිඩුකිරීම්වශයෙන් දෙසාළිස් හෙතුකෙනෙක්ද, වෙත්. මේ හෙතූන්ගේ ප්‍රභෙද ක්‍රමයයි. මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහ තෙමේ අහෙතුක චෛතසිකනම්වෙයි. මොහ මූලික දෙසිත චිත්තාහි එක හෙතුකචිත්තනම්වෙයි. ඒ දෙසිතෙහි යෙදුනාවූ අවශෙෂවූ චෛතසිකයෝද එක හෙතුක චෛතසිකනම්වෙත්. ද්විහෙතුක චිත්තයෙහි යෙදුනාවූ චෛතසික සමූහ තෙමේ ද්විහෙතුක චෛතසිකනම්වෙත්, ඒ ද්විහෙතුක චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ චෛතසිකයන් හා චිත්තයෝද ද්විහෙතුක චිත්ත චෛතසිකයෝනම්වෙත්. ත්‍රිහෙතුක චිත්තයෙහි යෙදුනාවූ චෛතසික සමූහ තෙමේ ත්‍රිහෙතුක චෛතසිකනම්වෙත්. (අවශෙෂ චෛතසිකයන් හා චිත්තයෝද ත්‍රිහෙතුක චිත්ත ත්‍රිහෙතුක චෛතසිකනම්වෙත්) ලොභ හෙතුව හා දෙස හෙතුවද සියලුකල්හිම සහෙතුකමවෙත්, මොහ හෙතු තෙමේ අහෙතුක සහ එකහෙතුකවෙයි. අලොභ හෙතුව හා අදෙස හෙතුවද එක හෙතුක සහ ද්විහෙතුකදවෙයි. අමොහ හෙතු තෙමේ චිත්තාහි ත්‍රිහෙතුකමවෙයි. ත්‍රිහෙතුකවූ හෙතුධර්මයක්නම් ඇත්තේමැයි. තදනන්තරව අහෙතුක ද්විහෙතුක ත්‍රිහෙතුක චිත්ත විභාගය අභිධර්මාර්ථ සංග්‍රහ පාඨයෙහි ආනයින් අවබොධකටයුතුයි. එහෙයින් හෙතුවර්ථ ධර්ම මාත්‍රයක් විස්තරකොට දක්වනුලැබෙයි. ඒ සංක්‍ෂෙපයෙන් සත්‍යාකාරවූ හෙතූන්ගේ හෙතු භාවයවනාහි ඒ හෙතු සම්ප්‍රයුක්තවූ චිත්තයන් මොනවට පිහිටා සිටිනබවයයි කියනලද්දවූ මූල භාවයනම්වෙයි. හෙවත් මූලයන්ට සදෘශවූ අර්ථයයි. කුමක්හෙයින් මොනවට පිහිටාසිටිනබව මූල සවභාවයයි හෙවත් හෙතුබවයයි කියනලද්දේද යන චොදනාවට පරිහාර මෙසේ දතයුතුයි. ලබනලද හෙතුප්‍රත්‍යය ඇත්තාවූ ධර්මයෝ තුමූ හටගත් මුල් ඇත්තාවූ වෘක්‍ෂයෝ ඒ වෘක්‍ෂයන්ගේ මුල් හෙතුකොටගෙණ ප්‍රකෘති පෘථුවියෙහි යම්සේ පිහිටා සිටිද්ද එපරිද්දෙන් සහෙතුකවූ චිත්ත සංඛ්‍යාතවූ වෘක්‍ෂයෝද වැටිය නොදී දරන්නාහුවෙති. තවද හටගත් මුල් ඇත්තාවූ වෘක්‍ෂයන්ගේ ඒ මුල් තැමති හස්තයන් විසින් පෘථුවී ඕජාව උඩට නගා ශාඛාග්‍රයෙහි පුෂ්ප ඵලයන් උපදවද්ද එපරිද්දෙන්ම සහෙතුක කුශලා කුශල චිත්තයන්ගේ ඵලදානය හෙවත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකදීම මේ හෙතු ධර්මයන්ගේ ශක්තියෙන්ම සිඩකෙරෙය්. අහෙතුක චිත්තයෝ තුමූ හෙතූන්ගේ විරහය හෙතුකොටගෙණ දියපිට හටගත් ශෛවාලයන්ට සමානවෙත්. එහෙයින් සුපිහිටි බැව් සිඩකිරීම සංඛ්‍යාතවූ මූලභාවයම හෙතු බවනම්වෙයි. එහෙ

සින්ම සූත්‍රාන්තයෙහි "ලොභො අකුසල මූලං අලොභො කුසල මූලං" යනාදීන් අභිධර්මයෙහි වදළාවූ හෙතු ධර්මයෝම මූල ධර්මයෝයයි වදාරණලද්දාහුය. එසේකුදුවූවත් මේ අර්ථය නොදන්නා වූ අභයගිරිවාසීනු කුශලයන්ගේ කුශල භාවයද අකුශලයන්ගේ අකුශල භාවයද අව්‍යාකෘත ධර්මයන්ගේ අව්‍යාකෘත භාවයද සිඬකරන්නාවූ මූල ධර්ම තෙමේ හෙතු භාවයයි කියත්. අභය ගිරිවාසීන්ගේ වාදනිරාකරණය පිණිස මහාවිහාරවාසීන්ගේ විභජ්ජවාදයෙන් දුන්නාවූ ප්‍රත්‍යුත්තරය මෙසේයි. ඉදින් අභය ගිරිවාසීන්ගේ මතය පරිද්දෙන් කුසලාදීන්ගේ කුශලාදිභාවය සිඬකරන්නාවූ මූල ධර්ම තෙමේ හෙතුවේනම් ඒ හෙතූන්ගේ කුශලාදි භාවය සිඬකරන්නාවූ අනික් හෙතුවක් සෙවියයුත්තේය. එම්බා ආචාරීනි! හෙතූන්ගේ කුශලාදී භාවය සිඬකරන් නාවූ අනික් හෙතුවක් සෙවිය යුත්තේයයි කියන්නේවීනම් ද්විහෙතුකවූ කුසලාකුසලයන්ගේ හා ත්‍රිහෙතුකවූ කුසලාකුසලයන්ගේද එක් හෙතුවක් තෙමේ අනික් හෙතුයාගේ කුසලාකුසල භාවය සිඬකරන්නේයයි කියයුතුහෙයින් ද්විහෙතුක ත්‍රිහෙතුක කුසලාකුසලයන්ගේ කුශලාකුශලයෙහි යෙදුනාවූ හෙතූන්ගේ කුශලාකුශලාදී භාවය සම්ප්‍රයුක්තවූ සෙසු හෙතූන් ප්‍රතිබඬයයි. කිවහැකිවෙයි. එසේ කීකල්හිද මොහ මූලික චිත්තවලෙහි යෙදුනාවූ මොහ හෙතූන්ගේ අකුශල භාවය සිඬකරන් නාවූ අනික් හෙතුවෙක් නැතිහෙයින් ඒ මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහයාගේ අකුශල භාවය හෙතුප්‍රතිබඬ නොවෙයි. ඒ මොහය ස්වභාවවිශෙෂයෙන්ම අකුශල්වන්නේයයි කියයුතු වෙයි. ඉදින් මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ හෙතූන්ගේ පමණක් අකුශලභාවය හෙතුප්‍රතිබඬ නොවෙයි. අවශෙෂ කුශලාකුශලයන්ගේ කුශලාකුශලාදී භාවය හෙතු ප්‍රතිබඬයයි කියන්නේවීනම් ඒ දෙආකාර අර්ථය ඒකාන්තයෙන් නොසෙමෙන් නේමැයි. එහෙයින් මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහයෝ දෙදෙන තමාගේ ස්වභාවයෙන්ම අකුශල්වෙති. සෙසු ද්විහෙතුක දශ අකුශල චිත්තයෙහි යෙදුනාවූ ලොභ මොහ දෙස මොහයන්ගේ අකුශලභාවය සම්ප්‍රයුක්තවූ අන්‍ය හෙතු ප්‍රතිබඬවෙයි. නොහොත් ලොභයාගේ අකුශලභාවය තත්සම්ප්‍රයුක්තවූ මොහය ප්‍රතිබඬවෙයි ඒ මොහයාගේ අකුශල භාවයද ලොභ ප්‍රතිබඬවේයයි. ප්‍රකාශකරන්නේවීනම් ඒකාන්තයෙන් තොපගේ ඒ වාදය පිහිටුවීමට යුක්තියක් හෝ ආගමක් හෝ නැතැයි මෙසේ මහාවිහාරවාසීන් විසින් පිළිතුරු දුන් කල්හි අභයගිරිවාසීනු තුෂ්ණීම්භූතවූවාහුය. එහෙයින් මොහ මූලික දෙසිතෙහි

යෙදුනාවූ මොහයෝ දෙදෙන තමන්ගේ සවභාවයෙන්ම අකුශල්වූවාහුනම් සෙසු සියලු සහෙතුක චිත්තයෙහි යෙදුනාවූ එකුන්සැත්තෑ ප්‍රභෙදවූ (සමසාලිස් ප්‍රභෙදවූ) සහෙතුන්ගේද කුශල අකුශල අව්‍යාකෘත භාවය සවයං සිඩවේයයි දතයුතුයි. තවද අටලොස් අහෙතුක චිත්තයන්ගේ අව්‍යාකෘත භාවය සිඩකරන්නාවූ එකම හෙතුව කුදු නැතිව අව්‍යාකෘත භාවය සවයං සිඩවීනම් සෙසු කුශලා කුශල අව්‍යාකෘතයන්ගේද කුශලා කුශල අව්‍යාකෘත භාවය සවයං සිඩනොවීමට හෙතුවක් අභයගිරිවාසීන්ට නොදක්විය හැක්කේයි. එහෙයින් කුශලභාවය යොනිසොමනසකාර හෙතුවෙන්ද අකුශල භාවය අයොනිසොමනසකාර හෙතුවෙන්ද ක්‍රියාවන්ගේ අව්‍යාකෘතභාවය රහතුන්ගේ සන්තානයෙහි පැවතීමෙන්ද විපාකයන්ගේ අව්‍යාකෘතභාවය කම්ප්‍රතිබඩ භාවයෙන් හා අවිපාක භාව ප්‍රතිබඩ භාවයෙන්දවන්නාහුයයි දතයුතුයි. මේ හෙතුන්ගේ භූමිවශයෙන් විභාගය කෙසේ යත්? ලොභ වෙෂ මොහ යන ත්‍රිවිධාකාර අකුශල හෙතුහු තුමූ එකොළොස් කාමභූමියෙහි හටගන්නාහෙයින් තුන්දෙනෙක්මවෙති. අලොභ අවෙෂ අමොහ සඞ්ඛ්‍යාත කුශල හෙතුහු තුන්දෙන තුමූ එකොළොස් කාමභූමිය, පසළොස් රූපභූමිය, සතරාකාර අරූපභූමිය, ලොකොත්තර භූමිය යනමේ සතර භූමියෙහි හෙතුහු තුන් තුන්දෙන ලැබෙන හෙයින් දොළොස් හෙතු කෙනෙක්වෙත්. ඒදොළොස් දෙනයට කී අකුශල හෙතු තුන්දෙන හා මිශ්‍රවූකල්හි සියලු හෙතුහු භූමිවශයෙන් පසළොස් වැදෑරුම්වෙත්. ජාතිවශයෙන්වනාහි ලොභ වෙෂ මොහ යන හෙතුහු තුන්දෙන අකුශල ජාතියෙහිවූහෙයින් ත්‍රිවිධ අකුශල් හෙතුහුනම්වෙත්. අලොභ අවෙෂ අමොහ සංඛ්‍යාත හෙතුහු තුන්දෙනවනාහි මාතෘකාක්‍රමයවූ කුශල අව්‍යාකෘත ජාතිවතහෙයින් සදෙනෙක්වෙත්. ඒ සදෙනහට යටකී හෙතුහු තුන්දෙන එක්කොටගත්කල්හි හෙතුහු නවදෙනෙක්වෙත්. එහෙයින් ජාතිවශයෙන් හෙතුහු නවදෙනෙකැයි දතයුතුයි. නිර්දෙශ ක්‍රමයෙන් වනාහි කුශලය, අකුශලය, විපාකය, ක්‍රියාය, යන සතර තන්හි කුශල හෙතුහු නවදෙනෙක, අකුශල හෙතු තුන්දෙනෙක, යනමේ දෙපක්ෂය එක්කොටගත්කල්හි හෙතුහු දොළොස් දෙනෙක්වෙත්. මෙසේ සවභාවවශයෙන් සදෙනෙක, භූමිවශයෙන් පසළොස්සෙක, ජාතිවශයෙන් නවදෙනෙක, නිර්දෙශකයවශයෙන් දොළොස් දෙනෙකැයි යන මේ සතරවාරය එක්කොටගත්කල්හි හෙතුහු දෙසාලිස් දෙනෙකැයි දතයුතුයි. එකුන් අනූවක් චිත්තයන් අතුරෙන් අටළොස්

අහෙතුක චිත්තය තබා අවශෙෂවූ එක් සැත්තෑවක් චිත්තයෝ තුමූ ෂට් වැදෑරුම් හෙතූන් හා සම්ප්‍රයුක්තවනහෙයින් සහෙතුක චිත්තයෝනම්වෙත්. ඒ සහෙතුකවූ එක්සැත්තෑවක් චිත්තයන් අතුරෙ තුදු මොහ මූලික දෙසිත එකම මොහ හෙතුවකින් යුක්ත බැවින් එක හෙතුක චිත්තයෝනම්වෙත්. ලොභ මූලික සිත් අටෙහි ලොභ මොහ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක්ද ද්වෙෂ මූලික දෙසිතෙහි ද්වෙෂ මොහ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක්ද ඤාණවිප්‍රයුක්ත දොළොස් කාමාවචර ශොභන චිත්තයෙහි අලොභ අද්වෙෂ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක් බැගින්ද සම්ප්‍රයුක්තවනහෙයින් මේ දෙවිසි චිත්තයෝ තුමූ ද්විහෙතුක චිත්තයෝනම්වෙත්. ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර ශොභන සිත් දොළසය, පන්තිස් මහද්ගත ලොකොත්තර චිත්තයෝය යන මේ සත්සාළිස් චිත්තයෝ තුමූ අලොභ අද්වෙෂ අමොහ සංඛ්‍යාතහෙතූන් තුන්දෙනෙකු හා සම්ප්‍රයුක්තවනහෙයින් ත්‍රිහෙතුක චිත්තයෝ නම්වෙත්යයි දතයුතුයි.

## කිච්චසඞ්ගහ පදාර්ථ.

කිච්ච සඞ්ගහෙ, කෘත්‍ය සඞ්ග්‍රහයෙහි; (එවං විභාගොමයා වුච්චතෙ) යනු අධ්‍යාහාරයි. කිච්චානිනාම, කෘත්‍යයෝවනාහි; පටිසන්ධි භවඞ්ගාවජ්ජනදස්සන සවනඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන තදාරම්මණ චුතිවසෙන, පටිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය, ආවර්ජන කෘත්‍යය, දර්ශනකෘත්‍යය, සවන කෘත්‍යය, ඝායන කෘත්‍යය, සායන කෘත්‍යය, ඵුසන කෘත්‍යය, සම්පටිච්ඡන කෘත්‍යය, සන්තීරණ කෘත්‍යය, ව්‍යවස්ථාපන කෘත්‍යය, ජවන කෘත්‍යය, තදාලම්බණ කෘත්‍යය, චුති කෘත්‍යය, යන මොවුන්ගේවශයෙන්; චුද්දස විධානි භවන්ති, තුදුස් වැදෑරුම්වෙත්. පන, කෘත්‍යයන්ගෙන් අන්‍ය ස්ථානයකියම්:—තෙසං, ඒකෘත්‍යවත්වූ ධර්මයන්ගේ; ඨාන භෙදො, ස්ථාන භෙදය; පටිසන්ධි භවඞ්ගාවජ්ජන, පඤ්චවිඤ්ඤාණ ඨානාදිවසෙන, ප්‍රතිසන්ධිස්ථානය, භවාඞ්ගස්ථානය, ආවර්ජනස්ථානය, පඤ්චවිඤ්ඤාණස්ථානාදීන්ගේවශයෙන් තොහොත් ප්‍රතිසන්ධිස්ථානය, භවාඞ්ගස්ථානය, ආවර්ජනස්ථානය, පඤ්චවිඥානස්ථානය, සම්පටිච්ඡනස්ථානය සන්තීරණස්ථානය, ව්‍යවස්ථාපනස්ථානය, ජවනස්ථානය, තදාලම්බණස්ථානය, චුතිස්ථානය යන මොවුන්ගේවශයෙන් දසධා, දශප්‍රකාර ඇත්තෝයයි; වෙදි

තම්බං, දනයුත්තේසි. ඒ කෘත්‍ය සඞ්ග්‍රහයෙහි නොහොත්
ඒ කෘත්‍යස්ථාන දසදෙනා අතුරෙන් නොහොත් ඒ කෘත්‍ය
ස්ථානවත්වූ චිත්තයන් අතුරෙන්; වෙ උපෙක්ඛා සහගත සන්තී
රණානි චෙව, උපෙක්ෂා සහගිය සන්තීරණ චිත්තයෝ දෙදෙ
නාද; අට්ඨමහා විපාකානිච, මහාවිපාක චිත්තයෝ අටදෙනද;
නවරූපාරූප විපාකානිච, නවවැදෑරුම්වූ රූපාරූප විපාක
චිත්තයෝ නවදෙනද; ඉති (ඉමිනාපභෙදෙන,) මෙසේ මේ
ප්‍රභෙදයෙන්; එකූනවීසති චිත්තානි, එකුන්විසි චිත්තයෝ තුමූ;
පටිසන්ධි භවඞ්ගචුති කිච්චානි නාම, ප්‍රතිසන්ධි කෘත්‍යය, භවාඞ්ග
කෘත්‍යය චුති කෘත්‍යයවත්වූ චිත්තයෝනම්වෙත්. පන, ඒ ත්‍රිවිධ
කෘත්‍යයෙන් අන්‍යවූ එක කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ දක්වම්;-
ආවජ්ජන කිච්චානි, ආවර්ජණ කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ
තුමූ; වෙ, දෙදෙනෙකි; දස්සන සවන ඝායන සායන ඵුසන
සම්පටිච්ඡන කිච්චානිච, රූපයන් දක්නා කෘත්‍යය ශබ්දයන්
අසන කෘත්‍යය ගන්ධයන් ආඝ්‍රාණයකරණ කෘත්‍යය රසයන් විඳ
ගන්නා කෘත්‍යය ස්පර්ශයන් වැදගන්නා කෘත්‍යය ඒ පඤ්චාලම්බ
ණයන් පිළිගන්නා කෘත්‍යය යන මොහුද යන මෙකී කෘත්‍ය
වත්වූ චිත්තයෝද; වෙ, දෙදෙනෙක් දෙදෙනෙක්වෙති. සන්තී
රණ කිච්චානි, සන්තීරණ කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ තුමූ;
තීණි, තුන්දෙනෙක්වෙති. මනොද්වාරාවජ්ජනමෙව, මනොද්වාරා
වර්ජණ චිත්තයම; පඤ්චද්වාරෙ, පඤ්චද්වාරයෙහි; වොත්ථපනකිච්චං
සාධෙති, අරමුණුනියමකරණ කෘත්‍යය සිඬකෙරෙයි. ආවජ්ජන
වය වජ්ජිතානි, පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන දෙසිත
තොරකොට ඇත්තාවූ; පඤ්චපණ්ණාස, පස්පණසක් පමණවූ
කුසලාකුසල ඵලක්‍රියා චිත්තානි, කුශලාකුශල ඵල ක්‍රියා චිත්ත
යෝ තුමූ; ජවනකිච්චානි නාම, දිවන කෘත්‍යය සිඬකරන්නාවූ
චිත්තයෝනම්වෙත්; අට්ඨමහා විපාකානිචෙව, මහාවිපාක
චිත්තයෝ අටදෙනද; සන්තීරණත්තයංච, සන්තීරණ සිත්
තුනද; ඉති, (ඉමිනාප භෙදෙන) මේ ප්‍රභෙදයෙන්; එකාදස,
එකොළොස් චිත්තයෝ තුමූ; තදාලම්බණ කිච්චානිනාම, ජවන
යන්ගේ අරමුණුමගන්නාහෙයින් තදාලම්බණ කෘත්‍ය සාධකවූ
චිත්තයෝනම්වෙත්. පන, සප්‍රදෙශයෙන් අන්‍යවූ නිෂ්ප්‍රදෙශය
දක්වම්:- තෙසු, ඒ කෘත්‍ය ස්ථානවත්වූ චිත්තයන් අතුරෙන්; වෙ
උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තානි, උපෙක්ෂා සහගියාවූ
සන්තීරණ චිත්තයෝ දෙදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුති තදා
රම්මණ සන්තීරණවසෙන, පටිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය

චුති කෘත්‍යය තදාරම්මණ කෘත්‍යය සන්තීරණ කෘත්‍යය යන මොවුන්ගේවශයෙන්; පඤ්චකිච්චානි නාම, කෘත්‍ය පසක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. අට්ඨමහාවිපාකානිච, මහාවිපාක චිත්තයෝ අටදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුතිතදාරම්මණවසෙන, පටිසන්ධි කෘත්‍යය භවාඞ්ග කෘත්‍යය චුති කෘත්‍යය තදාරම්මණකෘත්‍යය යන මොවුන්ගේවශයෙන් චතුකිච්චානි නාම, සතර කෘත්‍ය ඇත්තාවූ චිත්තයෝනම්වෙත්; නවමහග්ගත විපාකානි, රූපාරූප විපාක චිත්තයෝ නවදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුතිවසෙන, පටිසන්ධි කෘත්‍යය භවාඞ්ග කෘත්‍යය චුති කෘත්‍යය යනමොවුන්ගේ වශයෙන්; තිකිච්චානි නාම, කෘත්‍යත්‍රයක් ඇත්තාවූ චිත්තයෝ නම්වෙත්. සොමනස්ස සන්තීරණං, සොම්නස් සහගිය සන්තීරණ සිත් තෙමේ; සන්තීරණ තදාරම්මණවසෙන, සන්තීරණ කෘත්‍යය තදාරම්මණ කෘත්‍යයවශයෙන්; ද්විකිච්චං, කෘත්‍යවයක් ඇත්තාවූ චිත්තයනම්වේ. වොට්ඨපනං, ව්‍යවස්ථාපන චිත්තය තෙමේ; වොට්ඨපනාවජ්ජනවසෙන, පඤ්චද්වාරයෙහි අරමුණුනිශ්චය කිරීමය මනොද්වාරයෙහි අරමුණු ආවර්ජනාකිරීමය යනමොවුන්ගේවශයෙන්; තථා, එපරිද්දෙන්; ද්විකිච්චං, කෘත්‍යවයක් ඇත්තාවූ චිත්තයනම්වේ. පන, අනෙක කෘත්‍යයෙන් අන්‍යවූ එක කෘත්‍යය දක්වමි:-සෙසානි, කියනලද්දවුන්ගෙන් අවශිෂ්ටවූ; සබ්බානිපි, ජවන මනොධාතුත්තික විඤ්ඤාණානි, සියලු පස්පණස් ජවන් හා මනොධාතුත්‍රිකය දෙපස් විඥානයෝ දස දෙනය යන චිත්තයෝ තුමූ; යථාසම්භවං සම්භව වන පරිද්දෙන් එකකිච්චානීති, එක කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝයයි; වෙදිතබ්බා, දතයුත්තාහුය.

## ගාථා.

පටිසන්ධාදයො, ප්‍රතිසන්ධ්‍යාදීවූ නම් ඇත්තාවූ;චිත්තුප්පාද, චිත්තචෛතසිකයෝ; කිච්චභෙදෙන, කෘත්‍යයන්ගේ ප්‍රභෙදයෙන්; චුද්දස, තුදුස් ප්‍රකාර ඇත්තාහයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය. ඨානභෙදෙන, ස්ථානයන්ගේ ප්‍රභෙදයෙන්; දසධා, දසප්‍රකාර ඇත්තාහයි. පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය. එක ද්විතිචතුපඤ්චට්ඨානානි, එක කෘත්‍යය එකස්ථාන ද්විකෘත්‍යය ද්විස්ථාන ත්‍රිකෘත්‍යය ත්‍රිස්ථාන චතුකෘත්‍යය චතුස්ථාන පඤ්චකෘත්‍යය පඤ්චස්ථාන ඇත්තාවූ චිත්තයෝ; යථාක්කමං, පිළිවෙලින්; අට්ඨසට්ඨිච, අටසැටක් ප්‍රභෙද ඇත්තාහුයයිද; තථා, එපරිද්දෙන්; ද්වෙච, ද්විප්‍රකාරයයි කියාද; නවච, නවප්‍රකාරයයි කියාද; අට්ඨ

අණුප්‍රකාරයයි කියාද, චේව, ඵපකාරයයි කියාද; නිද්දිසෙ විස්තරකරන්නේයි. නොහොත් විස්තරකරව.

~~~~~~

කෘත්‍ය සංග්‍රහයෙහි සංක්‍ෂෙප විභාගය මෙසේයි:–පටිසන්ධිය යනු කුමක්හෙයින් පටිසන්ධිනම්වන්නේද යත්? අතීත භවය හා වර්තමාන භවය හෝ වර්තමාන භවය හා අනාගත භවය හෝ ගළපනහෙයින් පටිසන්ධිනම්වෙයි. කෙසේ ගළපන්නේද යත්? චුතියවූයේනම් තදනන්තරව පටිසන්ධියවන්නේමය. එහෙයින් චුතිය හා පටිසන්ධියගේද අතරතුර නොදක්වා ගැළපීම පටිසන්ධිනම්වෙයි. යම්සේ ජීවත්ව ඉන්නාවූ සත්වයෙකුගේ ප්‍රවෘත්ති කාලයෙහි නිරුද්ධවන්නාවූ චිත්තයක් තෙම හටගන්නාවූ චිත්තයකට අනන්තරාදී ප්‍රත්‍යයෙන් උපකාරවේද, එපරිද්දෙන් චුති චිත්තයතෙම අනතුරු භවයෙහි පටිසන්ධි චිත්තයට අනන්තරාදි ප්‍රත්‍යයෙන් උපකාරවෙයි. භවාඞ්ගය යනු කුමක්ද යත්? සැඩ පහර ඇත්තාවූ ගඞ්ගාවෙක්හි බස්නා ජලශ්‍රොත්‍රයමෙන්ද, දල් වන්නාවූ පහණක පහන් සිළුමෙන්ද නොහොත් ගඞ්ගාශ්‍රොත්‍රය පළමු ජලයට පසුව බස්නාවූ ජලයද, පළමු හටගත්තාවූ පහන් සිළුවට පසුවහටගත්තාවූ පහන්සිළුද අතරතුර නොදක්වා බස්නාක්මෙන්ද, දල්වෙන්නාක්මෙන්ද, උපප්‍රාප්ති භවයට කාරණ වශයෙන් හටගන්නාවූ චිත්ත පරම්පරා තොමෝ භවාඞ්ගයයි කියත්. සත්වයාගේ සයන කාලයෙහි පඤ්චද්වාරයන් විසින්ම රූපාදි අරමුණු නොගත හැකි බැවින් චිත්ත පරම්පරාව පැවතීමට හෙතුවක් නැතිවෙයි. එහෙයින් සවල්ප කාලයෙහි හෝ උපප්‍රාප්ති භවයෙහි අරමුණු නොගන්නා කාලයෙහි හෝ යටගිය ජාතියෙහි මේ භවයෙහි ඉපදීමට හෙතුවූ යම්කිසි කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් හෝ වැටහි ප්‍රතිසන්ධියවූයේනම් වර්තමාන භවයෙහි අරමුණු නොගන්නාකල්හිද ස්වපන කාලයෙහිද එම අරමුණ එල්බගෙණ භූමි ජාති සම්ප්‍රයුක්ත ධර්ම සංස්කාර ආරම්මණයන්ගේවශයෙන් සර්වප්‍රකාරයෙන් ප්‍රතිසන්ධි චිත්තයට සමානවූ සිතක් නිරතුරුව පවත්නේය. ඒ සිත උපප්‍රාප්ති භවය නොසිඳීමට කාරණාවන හෙයින් "භවස්ස අඞ්ගං කාරණං භවඞ්ගං" යන නිර්වචන බැවින් භවාංගයමවෙයි. විපාක චිත්තයන්ගේ පැවැත්ම තමහට නොවැටහෙනහෙයින් ස්වප්නයෙහි සිඳුවූ දෙය මුළාවට පැමිණෙයි. පඤ්චද්වාරයෙහි හටගන්නාහෙයින් පඤ්චද්වාරාවර්ජනනම් වූද, මනොද්වාරයෙහි හටගන්නාහෙයින් මනොද්වාරාවර්ජනනම් වූද චිත්තයෝ දෙදෙනා ආවර්ජන කෘත්‍යයනම්වෙත්. දර්ශන
~~~~~~

කෘත්‍යය සිඩකරන්නාවූ චක්ෂුර්විඥානයෝ දෙදෙන දර්ශන කෘත්‍යනම්වෙත්. එසේ එපරිද්දෙන්ම ඉෂ්ටානිෂ්ටවූ ශබ්දයන් ශ්‍රවණයකරන්නාවූ දෙසිත ශ්‍රවණ කෘත්‍යනම්වෙයි. ඉෂ්ටානිෂ්ටවූ ගන්ධයන් ආඝ්‍රාණයකරන්නාවූ දෙසිත ඝ්‍රාණකෘත්‍යනම්වෙයි. ඉෂ්ටානිෂ්ටවූ රස විඳගන්නාවූ දෙසිත සායන කෘත්‍යයනම්වෙයි. ඉෂ්ටානිෂ්ටවූ පහස් විඳගන්නාවූ දෙසිත ඵුසන කෘත්‍යනම්වෙයි. චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි ගැටෙනලද පඤ්චාලම්බණයන් පිළිගන්නා හෙයින් සම්පටිච්ඡන කෘත්‍යනම්වෙයි. සම්ප්‍රත්‍යෙෂණ චිත්තයන් විසින් පිළිගන්නාලද අරමුණු මොනවට ලකුණුකරණහෙයින් හෙවත් සලකන අර්ථයෙන් සන්තීරණ කෘත්‍යනම්වෙයි. පඤ්චද්වාරයෙහි රූපාදී අරමුණු පස නියමකරණහෙයින් ව්‍යවස්ථාපනනම්වෙයි. අරමුණු රස හාත්පසින් විඳගැණීම්වශයෙන් යුහු සුළුව නොහොත් නැවත නැවත හටගැණීම ජවන කෘත්‍යනම්වෙයි. ඒ ජවනයන්ගේ අරමුණම එල්බගෙණ අරමුණු රසවිඳගැණීම තදාලම්බණ කෘත්‍යනම්වෙයි. වර්තමාන භවයෙන් ගිලිහීම චුති කෘත්‍යනම්වෙයි. මේ චුති කෘත්‍යය මාත්‍රකාවශයෙන් අවසානයෙහි යොදා පදභාජනය කරන්නාවූ කාලයෙහි කුමක් හෙයින් ආදියෙහි තබනලද්දේද යත්? පටිසන්ධි භවාඞ්ග චුති යන චිත්තයෝ තුන්දෙනම සම්ප්‍රකාරයෙන් සම්ප්‍රයුක්ත ස්පර්ශාදි වශයෙන් සමානවෙයි. එහෙයින් මේ චිත්තයෝ තුන්දෙන එක් රැස්කොට දක්වනලදහ. ස්ථානවශයෙන් ප්‍රතිසන්ධිස්ථානඑකෙක, භවාඞ්ගස්ථානයෝ සදෙනෙක, ආවර්ජනස්ථානයෝ දෙදෙනෙක, පඤ්චවිඥානස්ථාන, එකෙක, සම්ප්‍රත්‍යෙෂණ ස්ථාන එකෙක,සන්තීරණ ස්ථාන එකෙක,ව්‍යවස්ථාපන ස්ථාන දෙකෙක, ජවනස්ථාන සදෙනෙක, තදාලම්බන ස්ථාන දෙකෙක, චුතිස්ථාන තුනෙක, යනමේ සියල්ල පිඩුකළකල්හි ස්ථානයෝ පස්විසිදෙනෙක්වෙති. ප්‍රතිසන්ධි ස්ථානය වනාහි මරණාසන්න වීථියෙන් දතයුත්තේය. භවාඞ්ග ස්ථානයෝ සදෙන වනාහි මරණාසන්න වීථිදෙකෙක, ප්‍රතිසන්ධිස්ථාන එකෙක, ප්‍රවෘත්ති කාලයෙහි අතිමහන්තාලම්බණ වීථි එකෙක, පරිත්තාලම්බණ වීථි එකෙක, අතිපරිත්තාලම්බණ වීථි එකෙක යනමේ චිත්ත වීථින් එක්කොට භවාඞ්ගස්ථාන සදෙන දතයුත්තාහුය. ආවර්ජනස්ථානයෝ දෙදෙනානම්:–පඤ්චද්වාර වීථියෙහි එක් තැනෙක, මනොද්වාර වීථියෙහි එක් තැනෙකැයි දතයුතුයි. පඤ්චවිඥාන සම්පටිච්ඡන සන්තීරණ ස්ථානයෝ වනාහි පඤ්චද්වාර වීථියෙහි ගතයුත්තේයි. ව්‍යවස්ථාපන ස්ථානයෝ දෙදෙනා වනාහි අතිමහන්තාලම්බණවීථිය මහන්තාලම්බණ වීථිය යන වි[illegible] වීථි දෙක්හි එක්

තැනෙක, පරිත්තාලම්බණ වීථියෙහි එක් තැනෙකැයි ගතයුත්තේයි. ජවන ස්ථානයෝ සදෙනා නම්,-අතිමහන්තාලම්බණ වීථිය, මහන්තාලම්බණවීථිය, විභූතාලම්බණවීථිය, අවිභූතාලම්බණවීථිය, ජවනයන්ට අනතුරුව චුතිය හටගන්නාවූ මරණාසන්න මනොද්වාර වීථිය, ජවනයන්ට අනතුරුව චුතිය හටගන්නාවූ චක්ඛුද්වාර මරණාසන්න වීථියද යනමේ සදෙන දතයුත්තාහුය. තදාලම්බණ තුනනම්:-ප්‍රවෘත්තිකාලයෙහි දෙතැනෙක, මරණාසන්න කාලයෙහි එක් තැනෙකැයි, තුන්දෙනයි. චුති ස්ථානයෝ තුන්දෙනනම්:-මරණාසන්න චිත්ත වීථි තුනෙහිම දතයුත්තාහුයි, මෙසේ පස්විසි ස්ථානය වෙන්වෙන්කොට බෙදා දතයුත්තේයි. ඒ පස්විසි ස්ථානයන් අතුරෙන් චුති භවඞ්ග චිත්තයන්ගේ අතර එකම පටිසන්ධි ස්ථානනම්වෙයි. පටිසන්ධි ආවර්ජනයන්ගේද, ජවන ආවර්ජනයන්ගේද, තදාලම්බණ ආවර්ජනයන්ගේද, ව්‍යවස්ථාපන ආවර්ජනයන්ගේද, ජවනචුතීන්ගේද, තදාලම්බණචුතීන්ගේද, අතරතුර ෂට්භවාඞ්ග ස්ථානයෝනම්වෙත්. භවාඞ්ග පඤ්චවිඥානයන්ගේද, භවාඞ්ගජවනයන්ගේද, අතරතුර ආවර්ජන ස්ථානවය නම්වෙයි පඤ්චද්වාරාවර්ජන සම්ප්‍රත්‍යෙෂණයන්ගේ අතරතුර එකම පඤ්චවිඥානස්ථානනම්වෙයි. පඤ්චවිඥාන සන්තීරණයන්ගේ අතරතුර එකම සම්පටිච්ඡන ස්ථානනම්වෙයි. සම්පටිච්ඡන ව්‍යවස්ථාපනයන්ගේ අතරතුර එකම සන්තීරණ ස්ථානනමවෙයි. සන්තීරණ ජවනයන්ගේද, සන්තීරණ භවාඞ්ගයන්ගේද, අතරතුර ව්‍යවස්ථාපනවයනම්වෙයි. ව්‍යවස්ථාපන තදාලම්බණයන්ගේද ව්‍යවස්ථාපන භවාඞ්ගයන්ගේද, ව්‍යවස්ථාපන චුතීන්ගේද, මනොද්වාරාවර්ජන තදාලම්බණයන්ගේද, මනොද්වාරාවර්ජන භවාඞ්ගයන්ගේද, මනොද්වාරාවර්ජන චුතීන්ගේද, අතරතුර ජවන ස්ථානයෝ සදෙනනම්වෙත්. ජවනභවාඞ්ගයන්ගේද, ජවනචුතීන්ගේද, අතරතුර තදාලම්බණ ස්ථානවයනම්වෙයි. ජවනපටිසන්ධීන්ගේද, තදාලම්බණ පටිසන්ධි චිත්තයන්ගේද, භවාඞ්ග පටිසන්ධි චිත්තයන්ගේද, අතරතුර චුති ස්ථානත්‍රයනම්වෙයි. මෙසේ පූර්ව චිත්ත පශ්චිම චිත්තයන්ගෙන් හටගන්නාවූ පස්විසි ස්ථානය දතයුත්තේයි. මේ ස්ථානයන්ගේ ආකාරය දතගණු කැමැත්තහු විසින් චිත්ත වීථි වින්‍යාසය කොට අවබෝධ කටයුතුයි. ඒ ඒ කෘත්‍ය සිද්ධකරන්නාවූ චිත්තයෝ මෙසේ දතයුත්තාහුය. උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තයෝ දෙදෙනාය, මහාවිපාකයෝ අටදෙනාය, රූපාරූප විපාකයෝ නවදෙනාය, යනමේ එකුන්විසි චිත්තයෝ තුමූ පටිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය, චුති කෘත්‍යය සිද්ධකරන්නාවූ

චිත්තයෝ නම්වෙත්. පටිසන්ධි චිත්තය, භවාඞ්ග චිත්තය චුති චිත්තයයි කියාද ව්‍යවහාරකෙරෙත්. පඤ්චාරාවර්ජන මනොද්වාරාවර්ජන චිත්තයෝ දෙදෙන ආවර්ජනා කෘත්‍ය සිඬකරන්නාවූ චිත්තයෝනම්වෙත්. චක්‍ෂුර්විඥාන දෙසිත දර්ශන කෘත්‍යය සිඬකරයි. ශ්‍රොත විඥාන දෙසිත සවන කෘත්‍යය සිඬකරයි. ඝ්‍රාණ විඥාණ දෙසිත ඝායන කෘත්‍යය සිඬකරයි. ජිහ්වා විඥානදෙසිත සායන කෘත්‍යය සිඬකරයි. කාය විඥාන දෙසිත ඵුසන කෘත්‍යය සිඬකරයි. සම්ප්‍රතිච්ඡණ යුගලය අරමුණු පිළිගන්නා කෘත්‍යය සිඬකරයි. සන්තීරණත්‍රය අරමුණු සලකන කෘත්‍යය සිඬකරයි. මනොද්වාරාවර්ජනය ව්‍යවස්ථාපනකෘත්‍යය සිඬකරයි. දොළොස් අකුශල් සහ හසිතොත්පාද චිත්තය, මහාකුශල් අටය, මහාක්‍රියා අටය, මහද්ගත කුශල් නවය, මහද්ගත ක්‍රියානවය, ලොකොත්තර අටය, යනමේ පස්පණස් චිත්තයෝ තුමූ ජවන කෘත්‍ය සිඬකෙරෙති. සන්තීරණත්‍රය, මහාවිපාක අටය, යන එකොළොස් චිත්තයෝ තුමූ තදාලම්බණ කෘත්‍යය සිඬකෙරෙත්. ඒ ඒ කෘත්‍යය සිඬකරන්නාවූ චිත්තයෝ වෙන වෙන පිඬුකොට දක්වත්හොත් උපෙක්ඛා සන්තීරණ යුගලය, පටිසන්ධි, භවාඞ්ග, චුති, තදාලම්බණ සන්තීරණ යන පඤ්චකෘත්‍යයක් හා පස් තැනක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. මහාවිපාකයෝ අටදෙන වනාහි පටිසන්ධි භවාඞ්ග චුති තදාලම්බණ යන සතර කෘත්‍යයක් හා සතර ස්ථානයක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. මහද්ගත විපාකයෝ නවදෙන වනාහි පටිසන්ධි භවාඞ්ග චුති යන කෘත්‍යත්‍රයක් හා ස්ථානත්‍රයක් ඇත්තාවූ චිත්තයෝ නම්වෙත්. සොම්නස් සන්තීරණය වනාහි තදාලම්බණ සන්තීරණ කෘත්‍යද්වයක් හා ස්ථානද්වයක් ඇත්තාවූ චිත්තය නම්වේ. මනොද්වාරාවර්ජන චිත්තයවනාහි එසේම කෘත්‍යද්වයක් හා ස්ථානද්වයක් ඇත්තාවූ චිත්තයනම්වේ. පස්පණස් ජවන්හුය, මනොධාතුත්‍රිකය, දෙපස් විඥානයෝ දසදෙනය, යන මෙමනස් චිත්තයෝ වනාහි එකම කෘත්‍යයක් හා එකම ස්ථානයක් ඇත්තාවූ චිත්තයෝ නම්වෙත්.

---

## ද්වාරාවීථි,

ද්වාරසඞ්ගහෙ, ද්වාරසඞ්ග්‍රහයෙහි; (එවං, මෙසේ; විභාගො; විභාගය; වෙදිතබ්බො, දතයුත්තේයි) ද්වාරානිනාම, ද්වාරයෝ වනාහි; චක්ඛුද්වාරඤ්ච, චක්ඛුද්වාරයද; සොතද්වාරඤ්ච, ශ්‍රොත්‍රද්වාරයද; ඝානද්වාරඤ්ච, ඝ්‍රාණද්වාරයද; ජිව්හාද්වාරඤ්ච, ජිහ්වාද්වාරයද;

කායවාරච, කායවාරයද; මනොවාරච, මනොවාරයද; ඉති, (ඉමිනාපභෙදෙන) මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි භවන්ති, සවැදෑරුම්වූවාහුවෙත්. තත්‍ථ, ඒ සවැදෑරුම් වාරයන් අතුරෙන්; චක්ඛුමෙව, ප්‍රශාදචක්‍ෂුසම; චක්ඛුවාරං, චක්‍ෂුවාරනම්වේ. තථා, ඒ චක්‍ෂුවාරයමෙන්ම; සොතාදයො, ප්‍රශාද ශ්‍රොත්‍රය, ප්‍රශාද ඝ්‍රාණය, ප්‍රශාද ජිහ්වාවය, ප්‍රශාදකායය යන මොව්හු; සොතවාරාදීනි, ශ්‍රොත්‍රවාර ඝ්‍රාණවාර ජිහ්වාවාර කායවාරයෝනම් වෙති. පන, පචවාරයෙන් අන්‍යවූ මනොවාරය කියම්:-නොහොත් රූපවාරයෙන් අන්‍යවූ නාම වාරය කියම්:-නොහොත් සුඛයෙන් අන්‍යවූ මිශ්‍රකනය කියම්. භවඞ්ගං, එකුන්විසි වැදෑරුම්වූ භවඟුපවෙඡ්දය; මනොවාරනති,මනොවාරයයි නොහොත් ආවර්ජනාදිවූ වීථි චිත්තයන්ගේ ඉපදීමට කාරණයයි. නොහොත් එකුන්විසි භවාංගු පච්ඡෙදයම මනොවාරාවර්ජනාදී වීථි චිත්තයන්ගේ ඉපදීමට කාරණයයි; පවුච්චති, කියනුලැබේ. නෙවත් අනෙක ප්‍රකාරයෙන් කියනුලැබේ. තත්‍ථ, ඒ වාරසංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම්වූ වාරයන් අතුරෙන් නොහොත් සවැදෑරුම් වාරයෙහි හටගන්නාවූ චිත්තයන් අතුරෙන්; චක්ඛුවාරෙ, චක්‍ෂුවාරයෙහි; පචවාරාවජ්ජන චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්‍ථපන කාමාවචර ජවන තදාලම්බණවසෙන, පචවාරාවර්ජනය චක්‍ෂුර්විඥාන දෙසිතය, සම්ප්‍රතීච්ඡණ යුගලය සන්තීරණත්‍රය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කාමාවචර ජවන්හුය, එකොළොස් තදාලම්බණයෝය, යනමොවුන්ගේවශයෙන්; ඡචත්තාළීස චිත්තානි, සසාළිස් චිත්තයෝ තුමූ; යථාරහං, සුදුසු පරිද්දෙන්; උප්පජ්ජන්ති, උපදනාහුවෙත්. තථා, ඒ චක්‍ෂුවාරයට කීනයින්; සොතවාරාදිසුපි, ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වාකාය යන වාරයෙහි; පචවාරාවජ්ජන සොතවිඤ්ඤාණාදි වසෙන, පචවාරාවර්ජන ශ්‍රොත්‍රවිඥානාදීන්ගේවශයෙන් නොහොත් පචවාරාවර්ජන, ශ්‍රොත්‍රවිඥානය, පචවාරාවර්ජන ඝ්‍රාණ විඥානය, පචවාරාවර්ජන ජිහ්වාවිඥානය, පචවාරාවර්ජන කාය විඥානය, සම්පටිච්ඡන සන්තීරණ ව්‍යවස්ථාපන කාමාවචර ජවන තදාලම්බණ යන මොවුන්ගේවශයෙන්; ඡචත්තාළීසෙව චිත්තානි, සසාළිස් චිත්තයෝම; භවන්ති, හටගණිත්, ඉති, මෙසේ; සබ්බථාපි, සර්ව්‍රකාරයෙ නුදු; පචවාරෙ, පචවාරයෙහි; චතුපඤ්ඤාසචිත්තානි, අඟනිත ග්‍රහණන්‍යායෙන් සූපණස් සිත් කෙනෙක් තුමූ; කාමාවචරානෙව, කාමාවචරවූවාහුම; භවන්ති, හටගණිත්. පන, පචවාරයෙන් අන්‍යවූ මනොවාරය කීයම්. මනොවාරෙ, මනොවාරයෙහි; මනොවාරාවජ්ජන පචපඤ්ඤාස

**ජවන තදාලම්බණවසේන**, මනොද්වාරාවජ්ජනය, පස්පණස් ජවන් හුය, එකොළොස් තදාලම්බණය, යන මොවුන්ගේවශයෙන්; **සත්තසට්ඨි චිත්තානි**, සත්සැට සිත් කෙනෙක් තුමූ; **භවන්ති**, උපදනාහුවෙත්. **එකූනවීසති**, එකුන්විසි සිත් කෙනෙක් තුමූ; **පටිසන්ධි භවඞ්ග චුතිවසේන**, ප්‍රතිසන්ධි භවාඞ්ග චුතීන්ගේවශයෙන්; **ද්වාරවිමුත්තානි**, ෂට්ද්වාරයෙන් මිදුනාවූ චිත්තයෝනම්වෙත්;පන, ප්‍රදෙශයෙන් අන්‍යවූ සමුදය දක්වමි. **තෙසු**, ඒ ෂට්ද්වාරික චිත්තයන් අතුරෙන්; **පඤ්චවිඤ්ඤාණානිචෙව**, දෙපස් විඥානයෝ දසදෙනද, **මහග්ගත ලොකුත්තර ජවනානිච**, මහද්ගත ලොකොත්තර ජවනයෝ සවිසිදෙනද; **ඉති** (ඉමිනාපභෙදෙන) මෙසේ මේ ප්‍රභෙදයෙන්; **ඡත්තිංස**, සතිසක් ප්‍රභෙදවූ චිත්තයෝ තුමූ; **යථාරහං**, සුදුසු පරිද්දෙන්; **එකද්වාරික චිත්තානි නාම**, එකද්වාරික චිත්තයෝ නම්වෙත්. පන, එකද්වාරික චිත්තයන්ගෙන් අන්‍යවූ පඤ්චද්වාරික චිත්තයන් දක්වමි. **මනොධාතුත්තිකං**, පඤ්චද්වාරාවජ්ජන සම්ප්‍රතීච්ඡන යුගල සංඛ්‍යාතවූ මනොධාතු ත්‍රික තෙමේ; **පඤ්චද්වාරිකං**, පඤ්චද්වාරයෙහි උපදනේයි. **සුඛසන්තීරණ වොට්ඨපන කාමාවචර ජවනානි**, සොම්නස් සහගිය සන්තීරණ චිත්තය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කම්වැදැරි ජවන්හුය, යනමේ චිත්තයෝ තුමූ; **ඡද්වාරික චිත්තානිනාම**, ෂට්ද්වාරයෙහි උපදනා චිත්තයෝ නම්වෙත්. **උපෙක්ඛා සහගත සන්තීරණ මහාවිපාකානි**, උපෙක්ෂා සහගිය සන්තීරණයෝ දෙදෙනය, මහාවිපාකයෝ අටදෙනය, යනමේ චිත්තයෝ තුමූ; **ඡද්වාරිකානිචෙව**, ෂට්ද්වාරයෙහිද උපදනාහුවෙති. **ද්වාරවිමුත්තානිච**, ඇතැම් කලෙක්හි ෂට්ද්වාරයෙන් මිදුනාහුවෙති. **මහග්ගත විපාකානිනව**, මහද්ගත විපාකයෝ නවදෙන තුමූ; **ද්වාරවිමුත්තානෙව**, සියලුකල්හිම ෂට්ද්වාරයෙන් මිදුනාහුමවෙත්. **ඉති**, මෙසේ **වෙදිතබ්බං**, දතයුතුයි.

**එකද්වාරික චිත්තානිච**, එක්ද්වාරයෙක්හි උපදනා චිත්තයෝද; **පඤ්චද්වාරිකානිච**, පඤ්චද්වාරයෙහි උපදනා චිත්තයෝද, **ඡද්වාරිකානිච**, ෂට්ද්වාරයෙහි උපදනා චිත්තයෝද, **ඡද්වාරිකවිමුත්තානිච චිත්තානි**, ෂට්ද්වාරයෙහි ඉපිද ඇතැම් කලෙක්හි ෂට්ද්වාරයෙන් මිදුනාවූ චිත්තයෝද, **සබ්බථා**, සර්වප්‍රකාරයෙන්; **විමුත්තානිච**, ෂට්ද්වාරයෙන් මිදුනාවූ චිත්තයෝද; **යථාක්කමං**, පිළිවෙළින්; **ඡත්තිංසතිච**, සතිසක් ප්‍රකාර ඇත්තාහුයයිද; **තථා**, එපරිද්දෙන්; **තීණිච**, තුන්ප්‍රකාර ඇත්තාහුයයිද; **එකතිංසච**, එක්තිසෙක්ද, **දසධාච**, දසප්‍රකාර ඇත්තාවූද,* **නවච**, නව

ප්‍රකාර ඇත්තාහුද; ඉති, මෙසේ: පඤ්චධා, පස්ප්‍රකාරයකින්; පරිදීපයෙ, හාත්පසින් ප්‍රකාශකරන්නේයි.

“ද්වාරය” යනු මනුෂ්‍යයන්ගේ ඇතුල්වීමට හා නික්මීමට කාරණාවූ ද්වාරයයි කියත්. මේ ස්ථානයෙහි වනාහි චක්ෂුද්වාරයෙහි රූපාලම්බණය එල්බගෙණ සසාළිස් සිත් නොනෙක් තුමූ ඇතුල්වීම හා නික්මීමද කෙරෙත්. චිත්තයාගේ ඉපදීම ඇතුල්වීමට බඳුවෙයි. චිත්තයාගේ නිරුද්ධවීම නික්මීමට බඳුවෙයි. එහෙයින් චක්ෂුද්වාරයයි කියතුලැබේ. සොතඝාණ ජිව්හාකාය යන ද්වාරසතරෙහිද, ශබ්දාලම්බණ ගන්ධාලම්බණ රසාලම්බණ ස්ප්‍රෂ්ටාලම්බණයන් එල්බගෙණ සසාළිස් සසාළිස් සිත් නොනෙක්ම ඇතුල්වීම් සංඛ්‍යාතවූ ඉපදීමට හා නික්මීම් සංඛ්‍යාතවූ නිරුද්ධයටද පැමිණෙනහෙයින් සොතද්වාරය, ඝාණද්වාරය, ජිව්හාද්වාරය, කායද්වාරයයි කියත්. “චක්ඛුමෙව” යන්නෙහි එව ශබ්ද තෙමේ විභාවිනී ටීකායෙහි ආක්‍රමයට මාංශ චක්ෂුවම කියන්නේයයිද “මණිසාරමඤ්ජුසා” ටීකායෙහි ආක්‍රමයෙන් චක්ෂුර්දශක කලාපයෙහි චක්ෂුප්‍රාසාදයෙන් අවශිෂ්ටවූ නවරූපය කියන්නේයයිද කියත්. මනොද්වාරය යනු කුමක්ද යත්? භවඞ්ග පච්ඡෙද චිත්තය මනොද්වාරයයි කියත්. එසේවීනම් පටිසන්ධි චිත්තයට අනතුරු තන්හි හටගන්නාවූ ප්‍රථම භවාඞ්ගාදිය පටන් සියලු භවාඞ්ගයෝම සිදි සිදී යන්නාහුවෙති. ඒ සිඳි සිඳී යන්නාවූ සියලු භවාඞ්ගයෝම මනොද්වාරයයි ගතයුතුද යනු ප්‍රශ්නයක්වෙයි. ප්‍රථම භවාඞ්ගාදී සියලු භවාඞ්ගයෝම අනතුරුව උපදනා භවාඞ්ග චිත්තයාගේ ඉපදීමට හෙතුභාවයෙන් සිඳීයන්නාහුවෙති. ඒ භවාඞ්ගයෝ මනොද්වාරයයි නොගතයුතුයි. යම් භවාඞ්ගයක් වනාහි විථි චිත්තයන්ගේ ඉපදීමට කාරණා බැවින් සිඳියන්නේවීනම් ඒ භවඞ්ග පච්ඡෙදයම මනොද්වාරයයිගතයුතුයි. ඉදින් එසේවීනම් චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි අරමුණුගැටුනුකල්හි පඤ්චද්වාරාවර්ජන චිත්තයට මුලින් උපදනා භවඞ්ග පච්ඡෙද චිත්තයද. විථි චිත්තයන්ගේ ඉපදීමට උපකාරවෙමින් භවාඞ්ග ශ්‍රොතසය සිඳිනේවෙයි. ඒ භවඞ්ග පච්ඡෙදයත් මනොද්වාරයයිගතයුතුද යත්? එසේ නොගතයුත්තේයි. පඤ්චද්වාරාවර්ජන චිත්තයට පළමුව උපදනා භවඞ්ග පච්ඡෙද චිත්තයද චක්ෂුරාදී පඤ්චද්වාරයටම සාධාරණහෙයින් සාමාන්‍යද්වාරයයි කියතුලැබේ. මනොද්වාරාවර්ජන චිත්තයටම පූර්වභාගයෙහි උපදනා භවඞ්ග පච්ඡෙද චිත්තයම ඒ නියම මනොද්වාරයයි ගතයුත්තේයි. මේ පඤ්චද්වාර

යට හා මනොද්වාරයටද පළමුව හටගන්නා භවඞ්ග උපච්ඡේද චිත්තයන්ට උපමා කවරහත්? වැසි පටලයෙන් සූර්‍ය්‍යාලොකය මුවහවූ දවසෙක යම් වෘක්ෂශාඛාග්‍රයෙක්හි සංගවෙන්නාවූහෙවත් හිඳගන්නාවූ පක්ෂියෙකුගේ ඡායාව භූමියෙහි නොපැතිරෙයි. පඤ්චද්වාරයෙහි පඤ්චද්වාරාවර්ජන චිත්තයට පූර්වභාගයෙහි උපදනා භවඞ්ග උපච්ඡේද චිත්තයද ඒ භූමියෙහි නොපැතිරෙන්නාවූ ඡායාව ඇති පක්ෂියාට බඳු උපමා ඇතිවෙති. පඤ්චොපක්ලෙශයන්ගෙන් විනිර්මුක්තවූ සූර්‍ය්‍යාලොකය ඇති දවසෙක යම්වෘක්ෂශාඛාග්‍රයෙක්හි පක්ෂියාගේ වැහීම හා ඒ වෘක්ෂ ඡායාවෙහි පක්ෂි ඡායාව ස්පර්ශවීමද ඉදිරිපසුනොවී එකක්ෂණයෙහි සිඬවන්නේයි. එපරිද්දෙන් මනොද්වාරාවර්ජන චිත්තයට අරමුණුහමුවීමද, ඊට පළමුව උපදනා භවඞ්ග උපච්ඡේද චිත්තයද, උපමා උපමෙය සම්බන්ධකොට අවබොධකටයුත්තේයි. ඒ ෂට්ද්වාරයෙහි හටගන්නාවූ චිත්තයෝවනාහි පඤ්චද්වාරාවර්ජනය, චක්ෂුර්විඥාන යුගලය, සම්ප්‍රතිච්ඡණයුගලය, සන්තීරණත්‍රය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කාමාවචර ජවන්හුය, තදාලම්බණ මහාවිපාකයෝ අටදෙනය යනමේ සසාළිස් චිත්තයෝ තුමූ චක්ෂුර්ද්වාරයෙහි උපදිත්. සොතද්වාරයෙහිද එම සසාළිස් චිත්තයන් අතුරෙන් චක්ෂුර්විඥානයුගලය උඬරණයකොට සොතවිඥාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාළිස් චිත්තයෝ උපදනාහුවෙත්. ඝාණද්වාරයෙහි එම සසාළිස් චිත්තයන් අතුරෙන් සොතවිඥාණ යුගලය උදුරා ඝාණවිඥාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාළිස් චිත්තයෝ උපදනාහුවෙත්. ජිව්හාද්වාරයෙහි වනාහි එම සසාළිස් චිත්තයන් අතුරෙන් ඝාණවිඥාණ යුගලය උදුරා ජිව්හාවිඥාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාළිස් චිත්තයෝ උපදනාහුවෙත්. කායද්වාරයෙහි එම සසාළිස් චිත්තයන් අතුරෙන් ජිව්හාවිඥාණයුගලය උදුරා කාය විඥාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාළිස් චිත්තයෝ උපදනාහුවෙත්. මනොද්වාරයෙහි මනොද්වාරාවර්ජනය, පස්පණස් ජවන්හුය, එකොළොස් තදාලම්බණය යන සැටසතක් චිත්තයෝ උපදනාහුවෙත්. පටිසන්ධි භවාඞ්ග චුතිකෘත්‍යය සිඬකරන්නාවූ එකුන්විසි චිත්තයෝවනාහි ෂට්ද්වාරයෙහිම නොපවත්නාහෙයින් ද්වාරවිමුක්ත නම්වෙත්. ෂට්ද්වාරයෙහිහට ගන්නාවූ චිත්තයෝ වෙන් වෙන්කොට දක්වන්නාවූ කල්හි දෙපස් විඥානදසය, මහද්ගත ලොකොත්තර ජවනයෝ සවිසිදෙනය, යනමේ සතිස් චිත්තයෝ තුමූ සුදුසු පරිද්දෙන් එක එක ද්වාරයෙහි පවත්නාවූ චිත්තයෝනම්වෙත්. පඤ්චද්වාරාවර්ජනය, සම්ප්‍රතිච්ඡණයුගලය, යන මනොධාතුත්‍රිකයවනාහි

පචද්වාරයෙහිම උපදනේවෙයි. සෝමනස් සහගත සන්තීරණ චිත්තය ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කාමාවචර ජවන්හුය, යන මොහු ෂට්ද්වාරයෙහිම උපදනාහුවෙත්. උපෙක්ෂා සහගත සන්තීරණයෝ දෙදෙනය, මහාවිපාකයෝ අටදෙනය යන කාමාවචර විපාක චිත්තයෝ දසදෙනවනාහි ෂට්ද්වාරයෙහිද උපදනාහුවෙත්. ෂට්ද්වාරයෙන් විනිර්මුක්තවද උපදනාහුවෙත්. මහද්ගත විපාකයෝ නවදෙනවනාහි සර්වප්‍රකාරයෙන්ම ද්වාරවිමුක්තමවෙත්.

## ද්වාරසංග්‍රහ විභාගයයි.

ආලම්බණ සඞ්ගහෙ, ආලම්බණ සංග්‍රහයෙහි; (එවං විභාගො වෙදිතබ්බො,) යනු අධ්‍යාහාරයි. නොහොත් ආලම්බණ සඞ්ගහෙ, අලම්බණ වස්තුවෙහි; (එවං ඉමිනාවුච්චමානනයෙන විභාගො මයාවුච්චතෙ,) යනු අධ්‍යාහාරයි. ආලම්බණානිනාම, ආලම්බණයෝ වනාහි; රූපාරම්මණච, රූපාලම්බණයද; සද්දාරම්මණච, ශබ්දාලම්බණයද; ගන්ධාරම්මණච, ගන්ධාලම්බණයද; රසාරම්මණච, රසාලම්බණයද; ඵොට්ඨබ්බාරම්මණච, ස්පර්ශාලම්බණයද; ධම්මාරම්මණච, ධර්මාලම්බණයද; ඉති ඉමිනාප්‍රභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි භවන්ති, සවැදෑරුම්වෙත්. තත්‍ර, ඒ සවැදෑරුම් ආලම්බණයන් අතුරෙන්; රූපමෙව, වර්ණායතන තෙමේම; රූපාරම්මණං, රූපාලම්බණනම්වෙයි; තථා, ඒ රූපාලම්බණයමෙන්; සද්දාදයො, ශබ්දායතනාදීහු තුමූ; නොහොත් ශබ්දායතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතනයෝ තුමූ; සද්දාරම්මණාදීනි, ශබ්දාලම්බණාදීහුනම්වෙත්. නොහොත් ශබ්දාලම්බණය; ගන්ධාලම්බණය, රසාලම්බණය; ස්පර්ශාලම්බණයයි නම් ඇත්තාහුවෙති. පන, කෙවල නයින් අන්‍යවූ මිශ්‍රකනය දක්වම්. ධම්මාරම්මණං, ධර්මාලම්බණය; පසාද සුඛුමරූප චිත්තචෙතසික නිබ්බාන පඤ්ඤත්තිවසෙන, පඤ්චප්‍රසාද රූපය, සොළොස් සූක්ෂමරූපය, එකුන් අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය, නිර්වාණය, ප්‍රඥප්තිය, යනමොවුන්ගේවශයෙන්; ඡධා, සයාකාරයකින්; සඞ්ගය්හන්ති, හකුළුවාගන්නාලද්දාහුවෙත්. තත්‍ර, ඒආලම්බණ සංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම්වූ ආලම්බණයන් අතුරෙන්; නොහොත් සවැදෑරුම්වූ ආලම්බණයෙහි හටගන්නාවූ චිත්තයන් අතුරෙන් සබ්බෙසම්පි චක්ඛුද්වාරික චිත්තානං, සියලුම චක්ෂුද්වාරයෙහි හටගන්නාවූ චිත්තයන්ගේ; ආරම්මණං, ආලම්බණ තෙමේ; රූපමෙව, රූපාලම්බණයමැයි. තථා, ඒ

රූපාලම්බණයද, පච්චුප්පන්නං, ප්‍රත්‍යුත්පන්නවේයි. තථා, එපරිද්දෙන්; සොතද්වාරික චිත්තාදීනං, ශ්‍රොතද්වාරයෙහි හටගන්නාවු චිත්තාදීන්ගේ නොහොත් සොතද්වාරයෙහි හටගන්නාවූ චිත්තය, ඝ්‍රාණද්වාරයෙහි හටගන්නාවු චිත්තය, ජිව්හාද්වාරයෙහි හටගන්නාවු චිත්තය, කායද්වාරයෙහි හටගන්නාවු චිත්තය, යන මොවුන්ගේ; ආරම්මණානිපි, ආලම්බණයෝ තුමූද; සද්දාදීහු වෙත්. නොහොත් ශබ්දාලම්බණ ගන්ධාලම්බණ රසාරම්මණ ස්පර්ශාලම්බණය යනමොහුයි. තානිච, ඒශබ්දාලම්බණාදීහුතුමූද, නොහොත් ඒ ශබ්දාලම්බණය, ගන්ධාලම්බණය, රසාලම්බණය; ස්පර්ශාලම්බණය යන මොව්හුද, පච්චුප්පන්නානි එව, ප්‍රත්‍යුත්පන්නමවෙත්. පන, කෙවලයාගින් අන්‍යවූ විශෙෂයක් දක්වමි. නොහොත් ප්‍රත්‍යුත්පන්නාලම්බණයෙන් අන්‍යවූ ප්‍රත්‍යුත්පන්න අතීත අනාගතකාල විමුක්ත ආලම්බණයන් දක්වමි:- මනොද්වාරික චිත්තානං, මනොද්වාරික චිත්තයන්ගේ; ආලම්බණං, අරමුණ තෙමේ; යථාරහං, සුදුසු පරිද්දෙන්; පච්චුප්පන්නංච, ප්‍රත්‍යුත්පන්නකාලිකවූද; අතීතංච, අතීතකාලිකවූද; අනාගතංච, අනාගතකාලිකවූද; කාලවිමුත්තංච, කාලවිමුක්තවූද; ඡබ්බිධම්පි, සවැදෑරුම්වූ ආලම්බණ තෙමේද; හොති, වෙයි. පටිසන්ධි භවඞ්ග චුති සඞ්ඛාතානං, ප්‍රතිසන්ධි භවාඞ්ගචුතියයි කියනලද්දාවූ; ද්වාරවිමුත්තානං, ද්වාරයෙන් විමුක්තවූ එකුන්විසි චිත්තයන්ගේ; ආලම්බණංච, අරමුණම; යෙභුය්‍යෙන, බොහෝසෙයින්; භවන්තරෙ, අතීතානන්තර භවයෙහි: ඡද්වාරගහිතං, සදොරින්ගන්නාලදුව: නොහොත් ෂට්ද්වාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නාලදුව; පච්චුප්පන්නංවා, ප්‍රත්‍යුත්පන්නකාලිකව හෝ, අතීතංවා, අතීතකාලිකව හෝ පඤ්ඤත්තිභූතංවා, ප්‍රඥප්තිව හෝ; කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්ත සම්මතං, කර්මය කර්මනිමිත්තයගතිනිමිත්තයයි සම්මතකරණ ලදුව; ඡබ්බිධම්පි,සවැදෑරුම්වූ අරමුණම ;යථාසම්භවං,ලැබෙන ලැබෙන පරිද්දෙන්;හොති, අරමුණුවෙයි. තෙසු,ඒ ආරම්මණික චිත්තසමූහයා අතුරෙන්;චක්ඛුවිඤ්ඤාණාදීනි, චක්ෂුර්විඥාන, ශ්‍රොත්‍ර විඥාන, ඝ්‍රාණවිඥාන, ජිහ්වාවිඥාන, කායවිඥාන චිත්තයෝ තුමූ; යථාක්කමං පිළිවෙළින්; රූපාදි එකෙකාරම්මණානෙව, රූපාදී ආලම්බණයන් අතුරෙන් එකෙකී අරමුණෙක් ඇත්තාහුමවෙත්. මනොධාතුත්තිකං පන; මනොධාතුත්‍රිකයවනාහි; රූපාදී පඤ්චාලම්බණං, රූපාදී අරමුණු පසක් ඇත්තේවෙයි. සෙසානි, දෙපස් විඥානදසය, සම්ප්‍රත්‍යෙෂණයුගලය, යනමොවුන්ගෙන් අවශිෂ්ටවූ; කාමාවචර විපාකානිච, කාමාවචර විපාකයෝ වනාහි: රූපාදී පඤ්චාලම්බණං,

රූපාදී අරමුණු පසක් ඇත්තේවෙයි. සෙසානි, දෙපස්විඥාන දසය, සම්ප්‍රතීච්ඡන යුගලය යනමොවුන්ගෙන් අවශිෂ්ටවූ; කාමාවචර විපාකානිච, එකොළොස් කාමාවචර විපාක චිත්තයෝද, හසනචිත්තඤ්ච, හසිතොත්පාද චිත්තයද, ඉති ඉමානිචා දස චිත්තානි, මේ දොළොස් චිත්තයෝ තුමූ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; කාමාවචරාලම්බණානෙව, කාමාවචර ධර්මයෝම අරමුණුකොට ඇත්තාහුවෙත්. අකුසලානිචෙව, දොළොස් අකුශල චිත්තයෝද; ඤාණවිප්පයුත්ත කාමාවචර ජවනානිච, ඥානවිප්‍රයුක්තවූ කාමාවචර කුශල ක්‍රියා ජවනයෝ අටදෙනද, ඉතිඉමානි වීසති චිත්තානි, මේ විසිචිත්තයෝ තුමූ; ලොකුත්තරවජ්ජිත සබ්බාලම්බණානි, නවලොකොත්තර ධර්මවර්ජිතකොට ඇති සියලු අරමුණු ඇත්තාහුවෙත්. ඤාණසම්පයුත්ත කාමාවචර කුසලානිචෙව, ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුශල චිත්තයෝද; පඤ්චමජ්ඣාන සඞ්ඛාත මභිඤ්ඤාකුසලංච, පඤ්චමධ්‍යානයයි කියනලද අභිඥා කුශල චිත්තයද, ඉති ඉමානි පඤ්චචිත්තානි,මේ පඤ්චප්‍රකාරවූ චිත්තයෝ තුමූ; අරහත්තමග්ගඵලවජ්ජිත සබ්බාලම්බනානි, අර්හත්මාර්ග ඵලයන් වර්ජිතකොට ඇති සියලු අරමුණු ඇත්තාහුවෙත්. ඤාණසම්පයුත්ත කාමාවචර ක්‍රියානිචෙව, ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා චිත්තයෝ සතරදෙනද; ක්‍රියාභිඤ්ඤාච, අභිඥාක්‍රියාචිත්තයද; වොට්ඨපනඤ්ච, ව්‍යවස්ථාපන චිත්තයද, ඉතිඉමානි ඡචිත්තානි, මේ සවැදෑරුම් චිත්තයෝ තුමූ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; සබ්බාලම්බණානි, සියලු අරමුණුඇත්තාහුවෙත්. ආරුප්පෙසු, දොළොස් අරූපාවචර චිත්තයන් අතුරෙන්: දුතියචතුත්ථානි, විඤ්ඤාණඤ්චායතන සිත් තුණය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත් තුණය, යනමේ සවැදෑරුම් චිත්තයෝතුමූ; මහග්ගතාලම්බණානි, ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය, තෘතීයාරූප්‍ය විඥානය යන මහද්ගත ධර්මයෝම අරමුණුකොට ඇත්තාහුවෙත්. සෙසානි, විඤ්ඤාණඤ්චායතන සිත් තුණය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත් තුණය, අභිඥා දෙසිතය යනමොවුන් වර්ජිතකොට ඇත්තාවූ; සබ්බානිපි, සියලුම; මහග්ගත චිත්තානි, එක්විසි මහග්ගත චිත්තයෝ තුමූ; පඤ්ඤත්තාලම්බණානි, ප්‍රඥප්ති ධර්මයන්ම අරමුණුකොට ඇත්තාහුවෙත්. ලොකුත්තර චිත්තානි, ලොකොත්තර චිත්තයෝ තුමූ; නිබ්බානාලම්බනානි, නිවන් අරමුණුකොට ඇත්තාහුවෙත්.නොහොත් නිර්වාණ ධර්මය අරමුණු කරන්නාහුය. ඉති, මෙසේ;වෙදිතබ්බං,දතයුතුයි. පඤ්චවීස, පස්විසි සිත් කෙනෙක් තුමූ; පරිත්තමෙව එං, කාමාවචර අරමුණකිම;

හොනති, හටගන්නාහුවෙත්. ඡබ්බීසති, සයාකාර සිත්කෙනෙක් තුමූ; මහග්ගතෙ එව, මහද්ගතාලම්බණයෙහිම; හොනති, වෙත්. එකවීසති, එක්විසි සිත් කෙනෙක් තුමූ; වොහාරෙ එව, ප්‍රඥප්තාලම්බනයෙහිම; හොනති, වෙත්. අට්ඨ, චිත්තයෝ අට දෙනෙක් තුමූ; නිබ්බානගොචරෙ එව, නිවන් අරමුනෙහිම; හොනති, වෙත්. වීස, විසිසිත් කෙනෙක් තුමූ; අනුත්තරමුත්තම්හි නවලෝකොත්තර ධර්මයන්ගෙන් මිදුනාවූ අරමුණෙහිම: හොනති වෙත්. පඤ්ච, පඤ්චප්‍රකාරවූ සිත්කෙනෙක් තුමූ; අග්ගමග්ග ඵලුජ්ඣිතෙ, අර්හත්මාර්ගඵලයන් වර්ජිතකොට ඇත්තාවූ අරමුණෙහි; හොනති, වෙත් ඡඅ, චිත්තයෝ සදෙනෙක්වනාහි: සබ්බත්ථ, සියලු අරමුණෙහි, හොනති, වෙත්. ඉති, මෙසේ; තත්ථ, ඒ ආලම්බණ සංග්‍රහයෙහි; සත්තධා, සත්පරිද්දෙකින්; සඞ්ගහො හොති, සංග්‍රහයවෙයි. අරමුණුවශයෙන් කෙසේ දතයුත්තාහුදැයි යත්: අරමුණු තෙමේ රූපාලම්බණය, ශබ්දාලම්බණය, ගන්ධාලම්බණය, රසාලම්බණය; ස්පර්ශාලම්බණය, ධර්මාලම්බණයයි සවැදෑරුම්වේ. ඒ සදෙනා අතුරෙන් නීල පීතාදීවූද, දීර්ඝහ්‍රස්වසතරැස් අටැස් ආදීවූ සටහණද, ඇසින් දක්කයුතුහෙයින් රූපාලම්බණනම් වෙයි. මනුෂ්‍යයන්ගේ කථිත හසිතාදීවූද, භෙරිමෘදඞ්ගාදීවූද සියලු ශබ්දතෙමේ ශබ්දාලම්බණනම්වෙයි. කපුරු කස්තූරි ආදීවූ සියලු ගන්ධතෙමේ ගන්ධාලම්බණනම්වෙයි. මධුරාම්ලකටුකතික්ත ආදිවූ සියලු රසතෙමේ රසාලම්බණනම්වෙයි. උපාදිණ්ණ අනුපාදිණ්ණ සියලු ස්පර්ශයෝ ස්පර්ශාලම්බණනම්වෙත්. පඤ්චප්‍රසාදරූපය; සූක්ෂමරූපසොළසය, එකූන් අනූවක් චිත්තය, දෙපණස් චෛතසිකය, නිර්වාණය, ප්‍රඥප්තිය යන සවැදෑරුම් ධර්මතෙමේ ධර්මාලම්බණනම්වෙයි. චක්ෂුර්වාරයෙහි උපදනා සසාළිස් චිත්තයෝ තුමූ ප්‍රත්‍යුත්පන්නවූ රූපාලම්බණයම අරමුණුකෙරෙති. මෙහි ප්‍රත්‍යුත්පන්නය යනු ඛණපච්චුප්පන්නය, සන්තතිපච්චුප්පන්නය අද්ධාපච්චුප්පන්නයයි ප්‍රත්‍යුත්පන්නය ත්‍රිවිධාකාරවෙයි. ඔවුන් අතුරෙන් ඛණපච්චුප්පන්නයයනු රූපාලම්බණයාගේ ආයුෂවූසත ළොස් චිත්තක්ෂණකාලය රූපයාගේ ඛණපච්චුප්පන්නනම්වෙයි. සන්තතිපච්චුප්පන්නය යනු යම්රූපයක් ඇසින් දුටුකල්හි චක්ෂුර්වාරිකඑක් චිත්ත වීථියෙක්ද, තදනුවර්තීක මනොද්වාර වීථිහු තුන්දෙනෙක්ද, ඉපදීමෙන්ම, ඒ රූපය හඳුනයි. මේචිත්තවීථි සතරදෙන පවත්නා කාලයයි සන්තති පච්චුප්පන්නය අද්ධාපච්චුප්පන්නය යනු යම්සත්වයෙකුගේ පටිසන්ධිචිත්තය පටන් චුතිචිත්තයදක්වා සියක් අවුරුද්දක් හෝ ඉන් අඩුවැඩිකාලයක් හෝ ඔහුගේ ජීවත්වීම පිළිබඳවූකාලය අද්ධාපච්චුප්පන්නයයි. මේත්‍රිවිධාකාරප්‍රත්‍යුත්පන්නයන්

අතුරෙන් මෙහි කී ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණය යනු ඒරූපා ලම්බණයාගේ උත්පත්තිය පටන් නිරුඬවීම දක්වා මේ අතර තුර පැවති සතලොස් චිත්තක්ෂණයයි කියනලද්දවූ රූපයාගේ ආයුෂ බණ පච්චුප්පන්නයයි දතයුතුයි. ශබ්ද ගන්ධ රස ස්පර්ශා ලම්බණයන්ගේ ප්‍රත්‍යුත්පන්නයද මෙසේම ඛණපච්චුප්පන්න යයි සැලකියයුතුයි. සොතද්වාරයෙහි හටගන්නාවූ සසාළිස් චිත්තයෝ තුමූ ඛණ ප්‍රත්‍යුත්පන්නවූ ශබ්දාලම්බණය අරමුණු කෙරෙත්. ඝාණද්වාරයෙහි උපදනා සසාළිස් චිත්තයෝ තුමූ ඛණ ප්‍රත්‍යුත්පන්නවූ ගන්ධාලම්බණය අරමුණුකෙරෙත්. ජිව්හාද්වාර යෙහි උපදනා සසාළිස් චිත්ත යෝ තුමූ ඛණපච්චුප්පන්නවූ රසා ලම්බණය අරමුණුකෙරෙත්. කායද්වාරයෙහි උපදනා සසාළිස් චිත්තයෝ තුමූ ඛණපච්චුප්පන්නවූ ස්පර්ශාලම්බණය අරමුණු කෙරෙත්. මනොද්වාරයෙහි උපදනා සත්සැට චිත්තයෝ තුමූ ප්‍රත්‍යුත්පන්න අරමුණය අතීතවූ අරමුණය, අනාගතවූ අරමු ණය, නිර්වාණාලම්බණය, ප්‍රඥප්තාලම්බණය යන මොහු කාමා වචර ජවන අභිඥාමහද්ගත ජවනයන්ට සුදුසු පරිද්දෙන් අර මුණුකරන්නාහුවෙත්. ද්වාරවිමුක්තවූ චිත්තයෝ එකුන්විසිදෙන වනාහි අනතුරු භවයෙහි මරණාසන්න කාලයෙහි ෂට්ද්වාර යෙන් ගන්නාලද්දවූ ප්‍රත්‍යුත්පන්න අරමුණුය, අතීත අරමු ණුය, ප්‍රඥප්තිඅරමුණුය, කර්මඅරමුණුය, කර්මනිමිති අරමුණුය, ගතිනිමිති අරමුණුය, යන මෙතෙක් ආලම්බණයෝ බොහෝ සෙයින් සුදුසු සුදුසු පරිද්දෙන් අරමුණුකෙරෙත්. ඒ අරමුණුකර න්නාවූ චිත්තයෝවෙන් වෙන්කොට මෙසේ දක්විය යුත්තාහුය. චක්ෂුර්විඥානයෝ දෙදෙන රූපාලම්බණයද, ශ්‍රොත්‍රවිඥා නයෝ දෙදෙන ශබ්දාලම්බණයද, ඝ්‍රාණවිඥාන දෙදෙන ගන්ධා ලම්බණයද, ජිව්හාවිඥානයෝ දෙදෙන රසාලම්බණයද,කාය විඥානයෝ දෙදෙන ස්පර්ශාලම්බණයද, කායවිඥානයෝදෙදෙන ස්පර්ශාලම්බණයද, වෙන් වෙන්වශයෙන් අරමුණුකරන්නාහු වෙත්. මනොධාතු ත්‍රිකයතෙමේ රූපාලම්බණාදී පඤ්චාලම්බණ යම අරමුණුකරයි. ඔවුන් කෙරෙන් අවශිෂ්ටවූ කාමාවචර විපාක චිත්තයෝය, හසිතොත්පාද සඞ්ඛ්‍යාතවූ අහෙතු ක්‍රියා චිත්තයද, යන මෙතෙක් චිත්තයෝ තුමූ කාමාවචර ධර්මයන්ම අරමුණුකෙරෙත්. දොළොස් අකුශල චිත්තයෝය, ඥානවිප්‍ර යුක්ත කාමාවචර ජවන් අටදෙනය යන මෙතෙක් චිත්තයෝ තුමූ ලොකොත්තර ධර්මයන්ගෙන් අවශිෂ්ටවූ සියලු ධර්මයන්ම අරමුණුකරන්නාහුවෙත්. ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල ක්‍රියා චිත්තයෝ සතරදෙනය, රූපාවචර පඤ්චමධ්‍යාන සඞ්ඛ්‍යාත

අභිඥාකුශලය යනමේ චිත්තයෝ පස්දෙන තුමූ අර්හත්මාර්ග ඵලවර්ජිතකොට ඇත්තාවූ සත්අසූවක් ප්‍රභෙදවූ චිත්තයන් අරමුණුකරන්නාහුවෙත්. කාමාවචර ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සතරදෙනය, ක්‍රියාභිඥාචිත්තය, ව්‍යවස්ථාපන චිත්තය, යන මෙතෙක් චිත්තයෝ තුමූ සියලු කාමාවචර ධර්මයෝය, සියලු මහද්ගත ධර්මයෝය, සියලු ලෝකෝත්තර ධර්මයෝය, සියලු ප්‍රඥප්ති ධර්මයෝය, යනමෙතෙක් ධර්මයන් අරමුණුකරන්නාහු වෙත්. සර්වඥ බුදුවරයන් විසින් ලෝකධාතුව බලාවදාරන්නාවූ කල්හිද ධර්මදෙශනාකාරණකල්හිද, යනාදී සියලු ප්‍රස්තාවෙහි බුදුවරයන්ට උපදනා චිත්තය මේ ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා චිත්තයවේ. එපරිද්දෙන්ම අතීතානාගත කාලයන් බලාවදාරන් නාවූකල්හි උපදනා අභිඥාක්‍රියා චිත්තය මෙහිකී අභිඥා ක්‍රියා චිත්තයයිදතයුතුයි. අරූපාවචර දොළොස් චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතනචිත්තයෝ තුන්දෙනය, නෙවසඤ්ඤා නා සඤ්ඤායතනචිත්තයෝ තුන්දෙනය, යනමේ චිත්තයෝ ස දෙන තුමූ ආකාශානඤ්චායතනචිත්තය ආකිඤ්චඤ්ඤායතන චිත්තය, යනදෙසිත අරමුණුකොට පවත්නාහෙයින් මහග්ගතා ලම්බණිකවෙත්. ආකාශානඤ්චායතන චිත්තයෝ තුන්දෙනය, ආකිඤ්චඤ්ඤායතන චිත්තයෝ තුන්දෙනය, රූපාවචරචිත්තයෝ පසළොස්දෙනය, යනමේ එක්විසි චිත්තයෝ තුමූ කසිණොද්ඝාට ආකාශප්‍රඥප්ති නිමිත්තය, නත්ථිභාවප්‍රඥප්ති නිමිත්තය, සෙසු කසිණප්‍රතිභාග නිමිතිහුය, යන ප්‍රඥප්තිහුම අරමුණුකරන්නාහු වෙත්. ලෝකෝත්තර චිත්තයෝ අටදෙනවනාහි නිර්වාණ ධර්ම යම අරමුණුකරන්නාහුවෙත්. මේආලම්බණයන් අතුරෙන්වනාහි රූපාදි අරමුණු සතර අමිශ්‍රවූ අරමුණුවෙති. ස්පර්ශාලම්බණය මිශ්‍රවූ අරමුණවෙයි. ධර්මාලම්බණයද නාමරූප ප්‍රඥප්ති නිර්වාණ ධර්මයන්ගෙන් මිශ්‍රවූ අරමුණක්වෙයි. චක්ෂුර්ද්වාරයෙහි උපදනා සසාළිස් චිත්තයෝ තුමූ ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණයම අර මුණුකෙරෙති. ශ්‍රොත්‍රද්වාරාදියෙහිද එවත් වෙන් වශයෙන් උප දනා සසාළිස් චිත්තයෝ තුමූ ප්‍රත්‍යුත්පන්නවූ ශබ්දාලම්බණා දීන් අරමුණුකෙරෙති. මනොද්වාරයෙහි හටගන්නාවූ සැටසත් චිත්තයෝ තුමූ ආලම්බණයෝ සදෙනය කාලවිමුක්ත ආලම්බ ණය, යනමොවුන් අරමුණුකොරෙති. ප්‍රත්‍යුත්පන්න අතීතා නාගතවූ සියලු කාලිකවූ අරමුණුම අරමුණුකෙරෙති. සියලු අර මුණු දිඪ සුත මුත වශයෙන් තුන් වැදෑරුම්වෙති. "දිඪ" යනු ඇසින් දක්නාලද රූපාරමුණයි. "සුත" යනු කණින් අසන ලද්දාවූ ශබ්දාලම්බණයයි. "මුත" යනු ඝාණජිව්හාකාය යන

ද්වාරත්‍රයෙන් වැදගන්නාලද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ආලම්බණයෝයි, රූපාලම්බණයන් ඇසින් දක්නාලදකල්හි සතළොස් චිත්තක්ෂණය ඉක්ම ගියාට පසු දිට්ඨයයි ව්‍යවහාරකෙරෙති. ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යාලම්බණයෝද ඒ ඒ ද්වාරයෙන් ගන්නාලද කල්හි සතළොස් චිත්තක්ෂණය ඉක්ම ගියාට පසු සුතමුතයයි ව්‍යවහාරකෙරෙත්. ඒ දිට්ඨ, සුත, මුත, යන ත්‍රිවිධාකාර ආලම්බණයෝම මනොද්වාරයට අතීතකාලිකවශයෙන් හමුවෙත්. ශ්‍රැත යන්නට අනුශ්‍රැතයද ඇතුලත්වෙයි. මනොද්වාරයෙහි හටගන්නාවූ චිත්තයෝ තුමූ කාලත්‍රයම අරමුණුකරන්නාවූ තන්හි රූපාලම්බණයාගේ ප්‍රත්‍යුත්පන්නවූ සතළොස් චිත්තක්ෂණය පවත්නාවූකල්හි මනොද්වාරයට හමුනොවෙත්. යම්කිින් මූවහකරණලද්දාවූ අරමුණුම ප්‍රත්‍යුත්පන්නවශයෙන් මනොද්වාරයට හමුවෙති. ඒකෙසේ අරමුණුකරන්නාහුද යත්? ඊයේ දවස්හි යම්කිසි බුද්ධාදිවූ රූපාලම්බණයක් දැක අද දවස්හි එම අරමුණ නැවත අරමුණුකරණු කැමතිවීනම් තමාගේද උත්පාදක්ෂණය බුද්ධසඞ්ඛ්‍යාතවූ ආලම්බණයාගේ උත්පාදක්ෂණයද එකක්ෂණිකවූකල්හිප්‍රත්‍යුත්පන්නවූ ඒරූපාලම්බණය අරමුණුකෙරෙති. ඊයේ දවස ශ්‍රවණයකරණලද්දාවූ ශබ්දාදියෙහිද මේක්‍රමය යොදා ගතයුතුයි. තමාගේ උත්පාදක්ෂණය යනු මනොද්වාරයයිදතයුතුයි. "යථා සම්භවං" යන්නෙහි අභිප්‍රාය කෙසේයත්? කාමාවචර ප්‍රතිසන්ධිහු දසදෙනවනාහී අරමුණුවශයෙන් රූපාදී සාරමුණුම ගන්නාහුවෙති. ද්වාරවශයෙන්ද ෂඩ්ද්වාරයෙහිම පවත්නාහුය,කාලවශයෙන් ප්‍රත්‍යුත්පන්න අතීත යනකාලවයම ලැබෙන්නේවෙයි. නිමිත්තවශයෙන් කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්ත සඞ්ඛ්‍යාතවූ නිමිති තුන්දෙනම ලැබෙන්නාහුවෙති. රූපාවචර ප්‍රතිසන්ධිහු පස්දෙනය, ආකාශානන්ච්‍යායතන ආකිඤ්චඤ්ඤායතන සඞ්ඛ්‍යාතවූ අරූපීප්‍රතිසන්ධිහු දෙදෙනදැයි යන මහද්ගත ප්‍රතිසන්ධිහු සත්දෙන තුමූ අරමුණුවශයෙන් ධර්මාලම්බණයෙහි ඇතුලත්වූ ප්‍රඥප්ති ධර්මාලම්බණයද, ද්වාරවශයෙන් එකම මනොද්වාරයද, කාලවශයෙන් කාලවිමුක්ත අරමුණුද. නිමිත්තවශයෙන් කර්මනිමිත්ත සඞ්ඛ්‍යාත නිමිත්තද, ඒ කර්මනිමිත්ත සදෙන අතුරෙන් ධර්මාලම්බණ කර්මනිමිත්තද ඇත්තාහුවෙත්. ධර්මාලම්බණ කර්මනිමිත්ත අතුරෙහුදු ප්‍රඥප්ති ධර්මාලම්බණ කර්මනිමිත්ත ලබන්නාහුවෙත්. විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිහු දෙදෙන තුමූ අරමුණුවශයෙන් ධර්මාලම්බණය අරමුණුකරන්නාහුවෙති. ධර්මාලම්බණ සදෙන අතුරෙහුදු චිත්ත සඞ්ඛ්‍යාත නාමධර්මය අරමුණුකරන්නාහුවෙති. ඒ එකුන් අනූවක් චිත්ත

යන් අතුරෙනුදු ආකාශානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සඞ්ඛ්‍යාත කුශලක්‍රියා දෙදෙන අරමුණුකරන්නාහුවෙති. ද්වාරවශයෙන් මනොද්වාරයෙහිම පවත්නාහුය. කාලත්‍රය අතුරෙන් අතීතකාලයම අරමුණුකරන්නාහුවෙති. ත්‍රිවිධාකාර නිමිත්තයන් අතුරෙන් කර්මනිමිත්තම අරමුණුකරන්නාහුවෙති. ෂඩාකාර කර්මනිමිති අතුරෙනුදු ධර්මාලම්බන කර්මනිමිත්ත අරමුණුකෙරෙති. ධර්මාලම්බන කර්මනිමිති සදෙන අතුරෙනුදු චිත්ත සඞ්ඛ්‍යාත ධර්මාලම්බන කර්මනිමිත්ත අරමුණුකරන්නාහුවෙති. එකුන් අනූවක් චිත්තයන් අතුරෙනුදු ආකාශානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන කුශලක්‍රියා චිත්තයෝ දෙදෙන අරමුණුකරන්නාහුවෙති. කර්මනිමිති තෙමේ අරමුණුවශයෙන් ධර්මාලම්බනවෙයි. ධර්මාලම්බනයන් සදෙනා අතුරෙන් චෛතසික ධර්මාලම්බනයවෙයි. දෙපණස් චෛතසිකයන් අතුරෙනුදු එකම චෙතනා සඞ්ඛ්‍යාත ධර්මාලම්බනයවෙයි. ද්වාරවශයෙන් මනොද්වාරයද, කාලවශයෙන් අතීතකාලයද, නිමිතිවශයෙන් කර්මනිමිත්තද, අරමුණුවශයෙන් ෂඩාලම්බනයද, ද්වාරවශයෙන් ෂඩ්ද්වාරයද, කාලවශයෙන් ප්‍රත්‍යුත්පන්න අතීතකාලවයදවෙයි. ගතිනිමිතිතෙමේ අරමුණුවශයෙන් රූපාලම්බනයද, ද්වාරවශයෙන් මනොද්වාරයද කාලවශයෙන් ප්‍රත්‍යුත්පන්නකාලයදවන්නේයි. ෂඩ්ද්වාරයෙන් ගන්නාලද්දාවූ කර්මනිමිති ගතිනිමිතිහු අතීතභවයෙහි මරණාසන්න ජවනයන් විසින්ද කර්මය අරමුණුකරන්නේවීනම් ප්‍රත්‍යුත්පන්නභවයෙහි ප්‍රතිසන්ධි චිත්ත තෙමේ ඒ කර්මය අරමුණුකරයි. කර්මනිමිත්ත අරමුණුකරන්නේවීනම් එම ප්‍රතිසන්ධි සිත්තෙමේද කර්ම නිමිත්ත අරමුණුකෙරෙයි. "යෙභුය්‍යෙන" යන්නෙහි අභිප්‍රාය මෙසේයි:-මරණාසන්න ජවනයන් හා පටිසන්ධි ආලම්බනයන්ගේ සදෘශභාවය යෙභුය්‍යත්‍යායෙන්ම වන්නේයයිකී නියායි. යෙභුය්‍යත්‍යායෙන් වනකල්හි අප්පකත්‍යායවශයෙනුදු එසේ නොවන්නාවූ තැන් ඇතිවියයුතුයි. ශේ කවරේද යත්? මේ මනුෂ්‍ය ලොකයෙහි වායොකසිණයෙන් චතුර්ත්ථධ්‍යාන උපදවා අසංඥතලයෙහි උපදනා කර්මවාදී ක්‍රියාවාදී තීර්ත්ථකයන්ගේ ප්‍රතිසන්ධිය හා අසංඥතලයෙහි පන්සියයක් මහාකල්පගතකොට නැවත සප්තකාම භූමියට එන්නාවූ අසංඥ බ්‍රහ්මයන්ගේද කාමසුගතියෙහි පටිසන්ධියද රහතුන්ගේ මරණාසන්නවීථියෙහි උපදනා චුති චිත්තයද මෙහි අප්පකත්‍යායෙන් කොලැබෙන්නාවූ ස්ථානයෝයයි දතයුතුයි. දෙපස් විඤ්ඤාණයෝ දසදෙන තුමූ ඒකාන්ත කාමාවචරද ඒකාන්ත රූපාලම්බනාදිය ඇත්තාහූද ඒකාන්ත ඛණපච්චුප්පන්න ඇය

තාහුද චිත්තයෝයයි දතයුතුයි. අවශෙෂවූ චිත්තයෝවනාහි
අනෙකාන්ත චිත්තයෝයයිදතයුතු. මහග්ගත චිත්තයෝවනාහි
අරමුණුකරණකල්හි එකාන්ත මහග්ගතමවෙති. එකාන්ත ධර්මා
ලම්බණඇත්තාහුදවෙති. හේ කෙසේයත්? එක්මහග්ගත චිත්ත
යක් තෙමේ එකාන්තයෙන් සිතක්ම අරමුණුකරයි. ඒ චිත්ත
යද එකාන්තයෙන් අතීතකාලිකවෙයි. එකාන්තයෙන් නාමධර්ම
යක්මවෙයි. අවශෙෂවූ මහද්ගත චිත්තයෝ වනාහි එකාන්ත
යෙන් ප්‍රඥප්තාලම්බණිකවෙති. එකාන්තයෙන් කාලවිමුක්ත
වෙති. එකාන්තයෙන් ධර්මාලම්බණ ඇත්තාහුවෙති. ලොකො
ත්තර චිත්තයෝ අටදෙනවනාහි එකාන්තයෙන් නිර්වාණයම
අරමුණුකෙරෙති. එකාන්තයෙන් නාමධර්මයක්ම අරමුණුකෙ
රෙති. එකාන්තයෙන් ධර්මාලම්බණයක්ම අරමුණුකෙරෙති.
එකාන්තයෙන් කාලවිමුක්ත අරමුණුඇත්තාහුමවෙති. චිත්තයෝ
තුන්දෙනෙක්වනාහි එකාන්තයෙන් රූපයම අරමුණුකෙරෙති.
එකාන්තයෙන් ප්‍රත්‍යුත්පන්නවූම අරමුණුගණිති. එකාන්ත
යෙන් කාමාවචර අරමුණුමගණිති. ඒ චිත්තයෝ තුන්දෙනනම්
මනොධාතු ත්‍රිකයයි. අටමහා කුශලයෝවනාහි අර්හත්මාර්ගඵල
වර්ජිතවූ සියලු අරමුණුගන්නාහුනම් ඒ කුශලයන්ගේ විපා
කයෝ අටදෙනවනාහී කුශලයන්ගේ සියලු අරමුණු කුමක්
හෙයින් නොගන්නාහුද යත්? කාමාවචර කුශලයෝ තුමූ
තෘෂ්ණාව පෙරටුකොට ඇති බැවින් අර්හත්මාගී ඵලයන් අරමුණු
කළනොහැකිවෙති. අකුශල චිත්තයෝවනාහි ලොකොත්තර
ධර්මයන් කුමක්හෙයින් අරමුණු නොකරන්නාහුදයත්? තමාගේ
ලාමකභාවය ඇතිහෙයින් ලොකොත්තර ධර්මයන් අරමුණුනො
කොට හැකිවෙති. යම්සේ අතිශයින් රත්වූ අයසකඛයෙහි
මැසි මදුරු ආදීහු නොවසත්ද එහෙයින් මැසි මදුරු ආදීන්ට
බඳුවූ දොළොස් අකුශල චිත්තයෝවනාහි රත්වූ අයසකඛය
කට බඳුවූ ලොකොත්තර චිත්තය අරමුණුනොකරන්නාහුවෙති.
ඥානවිප්‍රයුක්ත කාමාවචර කුශල ක්‍රියාවෝ තුමූ ඥානයෙන් විප්‍ර
යුක්තහෙයින් ලොකොත්තර ධර්මයන් අරමුණුකිරීමෙහි පොහො
සත් නොවෙති. ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශලයෝ සතර
දෙනය, අභිඥා කුශලය යන පස්දෙන අර්හත්මාගී අර්හත්ඵලයන්
වර්ජිතකොට ඇති සියලු ධර්මයන් අරමුණුකෙරෙති. ඒචිත්තයෝ
පස්දෙන වනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තානයෙහිම හට
ගණිති. රහතුන්ගේ සන්තානයෙහි හටනොගණිති. මනො
වාරාවර්ජන සිත්තෙමේ ඥානයෙන් විරහිතවූයේද සර්වඥතාඥාන
ගතිඇත්තේයයි කුමක්හෙයින් කීයේද යත්? ඥානසම්ප්‍රයුක්ත

මහාක්‍රියාචිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥාව සර්ඥතාඥානනම්වෙයි. ඒ මහාක්‍රියා චිත්තයන්ට පූර්භාගයෙහි උපදනා මනොද්වාරවර්ජන චිත්තාදද සර්ඥතාඥනගති ඇත්තේයයි ව්‍යවහාරකරත්. කාමාවචර කුශලතෙමේ පෘථග්ජන සන්තානයෙහිද උපදනේයි. එසේ හටගන්නේ නමුදු ඥානසම්ප්‍රයුක්ත මහාකුශලයෝ සතර දෙන තුමූ නිර්වාණය අරමුණුකොට හැකිවෙති. එපාකුදුවුවන් සෝවාන් ශකෘදාගාමි අනාගාමි යන ආර්ය්‍ය පුද්ගලයන් තුන් දෙනාකෙරෙහි පවත්නාවූ ඥානසම්ප්‍රයුක්ත මහාකුශලයෝ තුමූ නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. පෘථග්ජන සන්තානයෙහි පවත්නා ඥානසම්ප්‍රයුක්ත කුශලයවනාහි සෝවාන් මාර්ගඥානයට පළමු උපදනා චිත්තමාත්‍රයක්ම තීවන් අරමුණුකරයි. ගොත්‍රභූ චිත්තය උපදනා ක්ෂණයෙහි එතෙමේ පෘථග්ජනම්වෙයි. ඊට අනතුරුව උපදනා සෝවාන් මාර්ග චිත්තයෙන් පසු සෝවාන් ඵලක්ෂණයෙහි සොතාපන්න පුද්ගලනම්වෙයි. මනොද්වාරවර්ජන අභිඥාවෝද එපරිද්දෙන් විස්තරකටයුත්තාහුයි.

---

වත්ථු සඞ්ගහෙ, වස්තු සංග්‍රහයෙහි (එවං විභාගො වෙදිතබ්බො) යනු අධ්‍යාහාරයි. නොහොත් වත්ථු සඞ්ගහෙ, වස්තු සංග්‍රහයෙහි (එවං ඉමිනා වුච්චමානනයෙන මයාවුච්චතෙ) යනු අධ්‍යාහාරකොට අර්ථකියයුතුයි. වත්ථූනි නාම, වස්තුහුනම්වනාහි; චක්ඛුවත්ථුච, චක්ෂුර්වස්තුවද, සොතවත්ථුච, ශ්‍රොත්‍රවස්තුවද, ඝාණවත්ථුච, ඝ්‍රාණවස්තුවද; ජිව්හාවත්ථුච, ජිව්හාවස්තුවද; කායවත්ථුච, කායවස්තුවද; හදයවත්ථුච, හෘදයවස්තුවද; ඉති (ඉමිනාපභෙදෙන,) මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි භවන්ති, සවැදෑරුම්වූවාහුදවෙත්. කාමලොකෙ, කාමභූමියෙහි; සබ්බානිපි තානි, ඒ සියලු ෂට් වස්තුරූපයෝම;ලබ්භන්ති, ලැබියයුත්තාහු වෙත්. පන, සියල්ලෙන් අන්‍යවූ ඒකදෙශය දක්වම්:-රූපලොකෙ, රූපභූමියෙහි;ඝාණාදිත්තයං, ඝ්‍රාණාදීවූවස්තුහු තුන්දෙන; නත්ථි,නැත්තේයි. පන,ඒකදෙශයෙන් අන්‍යවූ සකලාර්ථය දක්වම්:-අරූපලොකෙ, අරූපභූමියෙහි;සබ්බානිපි, සියලු වස්තු රූපයෝද; න සංවිජ්ජන්ති, විද්‍යමානනොවෙත්. තත්ථ, ඒවස්තුරූප සංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම් වස්තු රූපයන් අතුරෙන් නොහොත් සවැදෑරුම් වස්තු රූපයන් නිශ්‍රයකොටගෙණ හට ගන්නාවූ විඥානධාතූන් අතුරෙන්; පඤ්චවිඤ්ඤාණධාතුයො, පඤ්චවිඥානධාතුහු තුමූ; යථාක්කමං, පිළිවෙළින්; එකන්තෙන, ඒකාන්තයෙන්; පඤ්චපසාදවත්ථූනි, පඤ්චප්‍රකාරවූ ප්‍රසාද වස්තු

රූපයන්; නිස්සායෙව, නිශ්‍රයකොටගෙණම; පවත්තන්ති, හට ගන්නාහුමවෙත්. පන, පඤ්චවිඥාන ධාතූන්ගෙන් අන්‍යවූ මනො ධාතුව කියම්:-පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සඞ්ඛාතා, පඤ්චද්වාරා වර්ජන චිත්තය, සම්ප්‍රත්‍යෙෂණ යුගලයයි කියනලද්දාවූ; මනො ධාතුව, මනොධාතු තොමෝද; හදයං නිස්සිතායෙව, හෘදය වස්තුව නිශ්‍රිතවූවාම; පවත්තන්ති, පවතී; පන, පඤ්චවිඥාන ධාතු මනොධාතූන්ගෙන් අන්‍යවූ මනොවිඤ්ඤාණ ධාතු වකියම්:-අවසෙසා, පඤ්චවිඥාන ධාතු මනොධාතූන්ගෙන් අව ශිෂ්ටවූ සන්තීරණ මහාවිපාක පටිඝද්වය; පඨමමග්ගහසන රූපා වචරවසෙන, සන්තීරණත්‍රය, මහාවිපාක අටය. ද්වෙෂ මූලික දෙසිතය, සොවාන් මාර්ගචිත්තය, හසිතොත්පාද චිත්තය, රූපා වචර පසළොස් චිත්තය, යන මෙකී චිත්තයන්ගේවශයෙන්; තිංස, තිස්ප්‍රකාරවූ; මනොවිඤ්ඤාණ ධාතු සඞ්ඛාතා, මනො විඤ්ඤාණධාතුයයි කියනලද්දාවූ, විඤ්ඤාණධාතුයොච, විඥාන ධාතුහුද, හදයං නිස්සායෙව; හෘදය වස්තු රූපය නිසාම; පවත්තන්ති, හටගන්නාහුවෙත්. පන, එකාන්තනිශ්‍රයවූ චිත්ත යන්ගෙන් අන්‍යවූ අනෙකාන්තනිශ්‍රය චිත්තයන් දක්වම්:-සෙසා, සන්තීරණාදී සමතිස් චිත්තයන්ගෙන් අවශිෂ්ටවූ; කුසලාකුසල ක්‍රියානුත්තරවසෙන, ලෞකික කුශල් දෙළසය, අකුශල් දස දෙනය, ක්‍රියාසිත් තෙළෙස්දෙනය, ලොකොත්තර සිත් සත් දෙනය යනමොවුන්ගේවශයෙන් වෙචත්තාළීස මනොවිඤ්ඤාණ ධාතුයො, දෙසාළිස් වැදෑරුම්වූ මනොවිඤ්ඤාණධාතුහු තුමූ; හදයං නිස්සායවා, හෘදය වස්තු රූපය නිසාහෝ; අනිස්සායවා, හෘදයවස්තුරූපය නොනිසා හෝ; පවත්තන්ති, හටගන්නාහු වෙත්. ආරුප්පවිපාකවසෙන, අරූපාවචර විපාකයන්ගේවශ යෙන්; චතසෙසාමනොවිඤ්ඤාණධාතුයො, මනොවිඤ්ඤාණධාතු හු සතරදෙන තුමූ; හදයං අනිස්සායෙව, හෘදය වස්තුව නොනි සාම; පවත්තන්ති, හටගණිත්යයි; වෙදිතබ්බං, දතයුතුයි.

කාමෙ, එකොළොස් කාමභූමියෙහි; ඡවත්ථුං, ෂට්ප්‍රකාර වස්තුරූපය; නිස්සිතා, නිශ්‍රයකොටගෙණ හටගත්තාවූ; විඤ්ඤා ණධාතුයො, විඥානධාතුහු; සත්ත, සත්දෙනෙකැයි, මතා, දන්නා ලද්දාහුය; රූපෙ, අසංඥ සත්ව වර්ජිතවූ පසළොස් රූපභූමියෙහි; තිවත්ථුං, චක්ෂුර්වස්තු ශ්‍රොත්‍රවස්තු හෘදයවස්තුත්‍රය, නිස්සිතා, නිශ්‍රය කොටගෙණහටගත්තාවූ; විඤ්ඤාණ ධාතුයො, විඥාන ධාතුහු;චතු බ්බිධා,සතරවැදෑරුම්යයි; මතා, දන්නාලද්දාහුය; අරූපෙ, අරූප භූමියෙහි; වත්ථු, වස්තුරූපය, අනිස්සිතායෙව, නිශ්‍රයකොට

නොගෙණම හටගත්තාවූ; එකාධාතු, එකම මනොවිඥාණ ධාතුව; මනා, දන්නාලදී. තෙචත්තාළීස, තෙසාළිස් චිත්තයෝ තුමූ, වත්‍ථු, වස්තුරූපය; නිස්සාය එව, නිශ්‍රයකොටගෙණම; ජායන්ති, උපදින්නාහුවෙත් ද්විචත්තාළීස, දෙසාළිස් චිත්තයෝ තුමූ; වත්‍ථුං, වස්තුරූපය; නිස්සායව, නිශ්‍රයකොටගෙණද, අනිස්සායව, නිශ්‍රයකොට නොගෙණද, ජායරෙ, උපදනාහුවෙත්. පාකා රූප්පා, අරූපාවචර විපාකයෝ සතරදෙන තුමූ; වත්‍ථුං, වස්තු රූපය; අනිස්සිතායෙව, නිශ්‍රයකොට නොගෙණම; ජායරෙ, උපදනාහුවෙත්.

අභිධම්මත්‍ථ සඞ්ගහෙ, අභිධර්මාර්ථ සප්තප්‍රකරණයෙහි වදාරණලද්දාවූ අර්ථයන්ගේ සංක්‍ෂෙප සඞ්ග්‍රහයවූහෙයින් අභිධර්මාර්ථ සඞ්ග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; පකිණ්ණක සඞ්ගහ විභාගොනාම, ප්‍රකීර්ණක සඞ්ග්‍රහය බෙදීමට කාරණාවූහෙයින් පකිණ්ණක සඞ්ග්‍රහනම්වූ; තතියො පරිච්ඡෙදො, තුන්වන පරිච්ඡෙදය; ඉති, මෙසේ සමාප්තකරණලද්දේයි.

~~~

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, යන ප්‍රසාද රූපයෝ පස්දෙනම චක්‍ෂුර්විඥාන යුගලාදිවූ දෙපස් විඥානයන්ගේ ඉපදීමට කාරණාවනහෙයින් වස්තු රූපනම්වෙත්. ඒ වස්තු රූපයන්ගේ ස්වරූප විභාගය මතු රූප නිර්දෙශයෙහි පහළවන්නේයි. මනොධාතු මනොවිඥාණධාතූන්ගේ නිශ්‍රය ස්ථානවූ හෘදය රූපය හෘදය වස්තුනම්වන්නේයි. ඒ හෘදය වස්තු රූපය වනාහි දෙතන මැද යටිකුරුව එල්වනලද්දාවූ පියුම් කැකුලක් මෙන් පිහිටා ඇත්තේයි. ඒ වස්තුහුගේ අභ්‍යන්තරය වැටකොළු වහල්ලක්මෙන් නොසමව ඇත්තේයි. ඊතුළ අඹකුලුදුලක් පමණ ලෙහෙයක්ඇත්තේයි. ඒ ලෙහෙය ආශ්‍රයකොටගෙණ හෘදය වස්තුරූපය පවත්නේ නුවණැත්තහුගේ ඒ හෘදයවස්තු රූපය කුඩාවෙයි. නුවනනැත්තවුන්ගේ හෘදය වස්තුරූපය මහත්වෙයි. එතකුදුවුවත් නුවන ඇත්තවුන්ගේ හෘදය වස්තුවෙහි සිදුර මහත්වෙයි. අඥානයන්ගේ සිදුර කුඩාවෙයි. නුවනැත්තවුන්ගේ හෘදය වස්තු රූපයෙහි අඹපත්‍ර දෙකක් වැනිවූ කුඩා අවයව දෙකක් ඇත්තේවෙයි අඥානයන්ගේ හෘදය වස්තුවෙහි අඹපත්‍රයක් වැනිවූ මහත්වූ එකම අවයවයක් ඇත්තේවෙයි. ඒ හෘදය වස්තු ලොහිතයවනාහි ද්වෙෂාධිකකල්හි ඉදීගිය දංඇට මෙන් කාළවර්ණඇත්තේවෙයි. ලොභාධිකකල්හි මස් සේදූ ජලයට බඳු වර්ණඇතිවෙයි. මොහාධිකකල්හි සහල් දෙව් දියට බඳු වර්ණඇතිවෙයි. විතර්ක චරිතයාගේ ඒ ලොහිතය
~~~

කොල්ලුතැම්බූ ජලයට බඳු පැහැ ඇතිවෙයි, ශ්‍රද්ධාචරිතයාගේ හෘදය වස්තු ලොහිතය ප්‍රසන්න මුතු ඵල බඳු වර්ණ ඇතිවෙයි, එසේ නොවීනම් කිණිහිරියමල් පෙත්තට බඳු වර්ණ ඇතිවෙයි, ප්‍රඥා චරිතයාගේ හෘදයවස්තු ලොහිතය ලොහිතඛක මාණික්‍යයට බඳු පැහැය ඇතිවෙයි. මේ ෂට්වස්තුහුම පරිපූර්ණායතන ඇත්තාවූ සත්වයන් කාමලොකයෙහිම ලැබියයුතු හෙයින් ෂට්වස්තුහුම කාමලොකයෙහි ලැබෙන්නාහුවෙත්. රූපලොකයෙහි වනාහි අසංඥතලයහැර අවශෙෂ පසලොස් රූපභූමියෙහි ඝ්‍රාණජිව්හාකායයන වස්තුහු තුන්දෙන අවිද්‍යමානුවෙත්. චක්ෂුශ්‍රොත්‍ර දෙදෙනාවන්නාහු නම් ඝ්‍රාණාදිත්‍රය කුමක්හෙයින් නොවන්නාහුදයත්? චක්ෂුශ්‍රොත්‍ර වස්තුදෙදෙන හෙතුකොටගෙණ බුද්ධදර්ශනධර්මශ්‍රවණාදී කුශල ධර්මයෝද රැස්කොට හැකිවෙති. ඝ්‍රාණජිව්හාකාය වස්තුත්‍රය හෙතුකොටගෙණ ගන්ධ රස ස්පර්ශ සඞ්ඛ්‍යාත ත්‍රිවිධකාම ගුණ විඳගැණීමමුත් අන්කිසි කුසල් ධර්මයක් නොලැබියහැකිවේ. එහෙයින් ඝ්‍රාණජිව්හාකායයුම බ්‍රහ්මලොකයෙහි නැත්තේයි. එසේම කාමවිරාග භාවනාබලයෙන් පචකාම ගුණික තෘෂ්ණාව ප්‍රහීණකල හෙයින් පචකාමගුණයන්ම විඳගැණීම අර්ථකොට ඇත්තාවූ ඝ්‍රාණජිව්හාකායයන වස්තුත්‍රයෙහිද විරක්ත භාවය ඇතිහෙයින් බ්‍රහ්මලොකයෙහි ඝ්‍රාණාදිත්‍රය නැත්තේයි. අසංඥතලයෙහි භාත්පසින්ම වස්තුරූපනැත්තේයි. අරූපභූමියෙහි වස්තුරූපාදීවූ සියලුම රූපස්කන්ධය නොපවත්නේයි. ලොකයෙහි වනාහි සිතකැලත්වන්නේයයි යන ව්‍යවහාරයෙහි හෙතුහුගේ නාමය ඵලයෙහි ආරොපණයකොට හෘදයවස්තු ලොහිතයාගේකැලැත් බව චිත්තයාගේ කැලැත් බවයයි ව්‍යවහාර කෙරෙති. හෘදය වස්තුව කැලැත්යයි ව්‍යවහාර කරණ කල්හී ඨානිහුගේ නාමය ඨානයෙහි ආරොපණයකොට ඨානූපචාර වශයෙන් ව්‍යවහාර කරණලදී. හෘදය වස්තුව ආශ්‍රයකොට පවත්නාවූ මනොවිඥාණ ධාතුතොමෝ තුන්ප්‍රකාරයක් වන්නීය. ඒ කවරයත්? හෘදය වස්තුව ඒකාන්තයෙන් ආශ්‍රයකොට පවත්නා එක්කොඨාසයක, හෘදය වස්තුව අනෛකාන්ත වශයෙන් ආශ්‍රයකොට පවත්නා එකකොඨාසයක, සර්වප්‍රකාරයෙන්ම හෘදය වස්තුව ආශ්‍රය නොකොට පවත්නා එක් කොඨාසයකැයි මෙසේ ත්‍රිවිධාකාර වන්නේයි. ඔවුන් අතුරෙන් තෙතිස් සිත්කෙනෙක් ඒකාන්තයෙන් හෘදය වස්තුව ආශ්‍රය කෙරෙති. දෙසාළිස් සිත්කෙනෙක් අනෛකාන්ත වශයෙන් හෘදය වස්තුව ආශ්‍රය කෙරෙති. සතර සිත්කෙණෙක් සර්වප්‍රකාරයෙන්ම හෘදය වස්තුව ආශ්‍රය නොකෙරෙති.

## අභිධර්මාර්ථ සංග්‍රහ භාවසන්නයෙහි ප්‍රකීර්ණක සංග්‍රහ විභාගනම්වූ තෘතීය පරිච්ඡේදය නිමි.

---

අහං, මම; ඉච්චෙවං (ඉතිඑවං යථා වුත්තනයෙන) යම් පරිද්දෙකින් කියනලද ක්‍රමයෙන්; චිත්තුප්පාදානං, චිත්ත චෛතසික සඞ්ඛ්‍යාතවූ සතරනාමස්කන්ධයන්ගේ; උත්තරං, වේදනා සංග්‍රහාදිය බෙදීම් වශයෙන් උතුම්වූ; සඞ්ගහං කත්වා, සඞ්ග්‍රහය කොට; පුන, නැවත; භූමිපුග්ගලභෙදෙන, භූමිපුද්ගලයන්ගේ ප්‍රභෙදයෙන්; ලක්ඛිතං, ලක්ෂිතවූ; හෙවත් සලකුණු කරණලද්දාවූ නොහොත් දතයුතුවූ; පුබ්බාපරනියාමිතං, පූර්වචිත්ත අපරචිත්තයන්ගෙන් නියම කරණලද්දාවූ; පටිසන්ධිප්පවත්තියං, ප්‍රතිසන්ධිකාලයෙහි හා ප්‍රවෘත්ති කාලයෙහිද; වා, නොහොත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන් අතුරෙන්; පවත්ති සඞ්ගහං නාම, ප්‍රවෘත්ති සඞ්ග්‍රහ නම්වූ වීථිසඞ්ග්‍රහයක්; සමාසෙන, සංක්ෂෙපයෙන් යථාසම්භවතො, සම්භවවන පරිද්දෙන් හෙවත් ලැබෙන පරිද්දෙන්; පවක්ඛාමි, ප්‍රභෙද වශයෙන් කියම්; කථං, (පවක්ඛාමි) කෙසේ ප්‍රකාශ කරන්නෙම්දයත් ? ඡවත්ථූනිච, ෂට්ප්‍රකාරවූ වස්තු කෙනෙක්ද; ඡද්වාරානිච, ෂට්ප්‍රකාරවූ ද්වාරකෙනෙක්ද; ඡආලම්බණානිච, ෂට්ප්‍රකාරවූ ආලම්බණ කෙනෙක්ද; ඡවිඤ්ඤාණානිච, ෂට්ප්‍රකාරවූ විඤ්ඤාණ කෙනෙක්ද; ඡවීථියො, ෂට්වීථිකෙනෙක්ද; ඡධාවිසයප්පවත්තිච, ආලම්බණයන්ගේ ද්වාරයන්ගේ හටගැණීමද; වා, නොහොත් ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීමද; ඉති, මෙසේ; වීථිසඞ්ගහෙ, වීථිසංග්‍රහයෙහි; ඡඡක්කානි, ෂට්කසදෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය; පන, විශේෂාර්ථයක් කියම්:—වීථිමුත්තානං, වීථිමුක්තවූ එකුන්විසි චිත්තයන්ගේ; විසයප්පවත්ති, ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීම තොමෝ; කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්තවසෙන, කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තය යන මොවුන්ගේ වශයෙන්; තිවිධා හොති, තුන්වැදෑරුම් වන්නීය. තත්ථ, ඒ ෂට් ෂට්කයන් අතුරෙන්; වත්ථුද්වාරාලම්බණානි, වස්තුෂට්ක ද්වාරෂට්ක ආලම්බණෂට්කයෝතුමූ; පුබ්බෙ, පූර්වවූ ප්‍රකීර්ණක සංග්‍රහයෙහි වුත්තනයානෙව, කියනලද ක්‍රමඇත්තාහුමැයි; චක්ඛුවිඤ්ඤාණච, චක්ෂුර්විඥානයද; සොත විඤ්ඤාණච, ශ්‍රොත්‍ර විඥානයද, ඝාණවිඤ්ඤාණච, ඝ්‍රාණවිඥානයද, ජිව්හාවිඤ්ඤාණච, ජිහ්වාවිඥානයද; කායවිඤ්ඤාණච, කායවිඥානයද; මනොවිඤ්ඤාණච ඉති, මනොවිඥානය දැයි සත; ඡවිඤ්ඤාණානි හොන්ති, ෂට්විඥාන කෙනෙක් වෙත්. පන, විශේෂාර්ථයක් දක්වම්:—නොහොත් හුදුක්‍රමයෙන්

අන්‍යවූ මිශ්‍රක ක්‍රමය දක්වමි:—නොහොත් අභෙදයෙන් අන්‍යවූ භෙදයක් දක්වමි:—ද්වාරප්පවත්තා, ද්වාරයෙහි හටගන්නාවූ; චිත්තප්පවත්තියො, චිත්තයන්ගේ හටගැණීම් සඞ්ඛ්‍යාතවූ; වීථියො. වීථිහු; චක්ඛුද්වාර වීථිච, චක්‍ෂුර්ද්වාර වීථියද; සොතද්වාර වීථිච, සොතද්වාර වීථියද; ඝානද්වාරවීථිච, ඝ්‍රාණද්වාරවීථියද; ජිව්හාද්වාර වීථිච, ජිව්හාද්වාර වීථියද; කායද්වාරවීථිච, කායද්වාරවීථියද; මනොද්වාර වීථිච, මනොද්වාර වීථියදැයි කියා; ද්වාරවසෙනවා ද්වාරවශයෙන් හෝ; චක්ඛුවිඤ්ඤාණවීථිච, චක්‍ෂුර්විඥාන වීථියද; සොතවිඤ්ඤාණ වීථිච, ශ්‍රොත්‍ර විඥාන වීථියද; ඝාණවිඤ්ඤාණ වීථිච, ඝ්‍රාණ විඥාන වීථියද; ජිව්හා විඤ්ඤාණවීථිච, ජිව්හාවිඥානවීථියද; කාය විඤ්ඤාණ වීථිච, කායවිඥානවීථියද; මනොවිඤ්ඤාණ වීථිච, ඉති, මනොවිඥාන වීථියදැයි කියා; විඤ්ඤාණවසෙනවා, විඥානයන්ගේ වශයෙන් හෝ; ඡ, සයාකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. නොහොත් ද්වාරප්පවත්තා, ද්වාරයෙහි හටගන්නාවූ; වීථියො, වීථිහු; චක්ඛුද්වාර වීථිච, චක්‍ෂුර්ද්වාර වීථියද;-පෙ-මනොද්වාර වීථිච ඉති, මනොද්වාර වීථියදැයි කියා; ද්වාරවසෙනවා, ද්වාරයන්ගේ වශයෙන් හෝ; ඡ, සදෙනෙක් වන්නාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. චිත්තප්පවත්තියො, චිත්තයන්ගේ හටගැණීම් සඞ්ඛ්‍යාතවූ; වීථියො, වීථිහු; චක්ඛුවිඤ්ඤාණ වීථිච, චක්‍ෂුර්විඥාන වීථියද;-පෙ-මනොවිඤ්ඤාණ වීථිච ඉති, මනොවිඥාන වීථියදැයි කියා; විඤ්ඤාණවසෙනවා, විඥානයන්ගේ වශයෙන් හෝ; ඡ, සදෙනෙක් වන්නාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය; නොහොත් ද්වාරවසෙනවා, ද්වාරයන්ගේ වශයෙන්ද, ද්වාරප්පවත්තා, ද්වාරයෙහි හටගන්නාවූ; වීථියො, වීථිහු; චක්ඛුද්වාර වීථිච, චක්‍ෂුර්ද්වාර වීථියද,-පෙ-මනොද්වාර වීථිච ඉති, මනොද්වාර වීථියදැයි කියා; ඡ, සදෙනෙක් වන්නාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය; විඤ්ඤාණවසෙනවා, විඥානයන්ගේ වශයෙන්ද චිත්තප්පවත්තියො, චිත්තයන්ගේ හටගැණීම් සඞ්ඛ්‍යාතවූ වීථියො, වීථිහු; චක්ඛුවිඤ්ඤාණ වීථිච, චක්‍ෂුර්විඥාන වීථියද;-පෙ-මනොවිඤ්ඤාණ වීථිච ඉති, මනොවිඥාන වීථිය දැයි කියා; ඡ, වීථිහු සදෙනෙක්; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. නොහොත් ඡ වීථියො, ෂට්වීථිහු; චක්ඛුද්වාර වීථිච, චක්‍ෂුර්ද්වාර වීථියද; සොතද්වාර වීථිච, ශ්‍රොත්‍රද්වාර වීථියද; ඝාණද්වාර වීථිච, ඝ්‍රාණද්වාර වීථියද; ජිව්හාද්වාර වීථිච; ජිව්හාද්වාර වීථියද; කායද්වාර වීථිච, කායද්වාර වීථියද; මනොද්වාර වීථිච, මනොද්වාර වීථියද; ඉති, මෙසේ ද්වාරවසෙනවා, ද්වාරයන්ගේ වශයෙන්ද; ද්වාරප්පවත්තා, ද්වාරයෙහි හටගන්නාහුයයි; යොජෙතබ්බා,

යෙදිය යුත්තාහුය; ඡ වීථියො, ඡව්වීථීහු; චක්ඛුවිඤ්ඤාණ වීථිච චක්ෂුර්විඥාන වීථියද; සොතවිඤ්ඤාණ වීථිච, ශ්‍රොත්‍ර විඥාන වීථියද; ඝාණවිඤ්ඤාණ වීථිච, ඝ්‍රාණවිඥාන වීථියද; ජිව්හාවිඤ්ඤාණ වීථිච, ජිහ්වාවිඥාන වීථියද; කායවිඤ්ඤාණ වීථිච, කායවිඥාන වීථියද; මනොවිඤ්ඤාණ වීථිච, මනොවිඥාන වීථියද; ඉති මෙසේ; විඤ්ඤාණභෙදෙන, විඥානයන්ගේ වශයෙන්ද; චිත්තප්පවත්තියො, චිත්තයන්ගේ හටගැණීම වන්නාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය; අතිමහන්තං, ඉතා මහත්වූ වීථිචිත්තොත්පාදය ඇත්තාවූ අරමුණෙක්ද; මහන්තං මහත්වූ වීථිචිත්තොත්පාදය ඇත්තාවූ අරමුණෙක්ද; පරිත්තංච, සවල්පවූ වීථිචිත්තොත්පාදය ඇත්තාවූ අරමුණෙක්ද; අතිපරිත්තංච, ඉතා සවල්පවූ වීථිචිත්තොත්පාදය ඇත්තාවූ අරමුණෙක්ද; ඉති, මෙසේ; පඤ්චද්වාරෙ, පඤ්චද්වාරයෙහි; විසයප්පවත්ති, ආලම්බනයන්ගේ ද්වාරයෙහි හටගැණීම නොහොත් ආලම්බනයෙහි ද්වාරයන්ගේ හටගැණීම; චතුධා, සතරාකාර ඇත්තීවෙයි. මනොද්වාරෙ, මනොද්වාරයෙහි; විභූතම, වැටහෙන්නාවූ අරමුණෙක්ද; අවිභූතම, නොවැටහෙන්නාවූ අරමුණෙක්ද; ඉති මෙසේ; විසයප්පවත්ති, ආලම්බනයන්ගේ හටගැණීම නොහොත් ආලම්බනයෙහි චිත්තයන්ගේ හටගැණීම; ද්විධා, දෙවැදෑරුම්වෙයි. ඉති (ඉමිනාපභෙදෙන) මේ ප්‍රභෙදයෙන්; ඡධා සයාකාරයක් ඇත්තාවූ; විසයප්පවත්ති, ආලම්බනයන්ගේ ද්වාරයෙහි හටගැනීම නොහොත් ආලම්බනයෙහි චිත්තයන්ගේ හටගැණීම; වෙදිතබ්බා, දතයුත්තීය. නොහොත් විසයප්පවත්ති, ආලම්බනයන්ගේ ද්වාරයෙහි හටගැණීම; ඡධා සයාකාරයක් ඇත්තීයයි; වෙදිතබ්බා, දතයුත්තීය. කථං (වෙදිතබ්බා,) කෙසේ දතයුත්තීදයත්? උප්පාදට්ඨිති භඞ්ගවසෙන, උත්පාදක්ෂණය, ස්ථිතික්ෂණය, භඞ්ගක්ෂණය යන මොවුන්ගේ වශයෙන්; ඛණත්තයං, ක්ෂුද්‍රක්ෂණයන් තුන්දෙනෙකුගේ සමූදය යෙමේ; ඒකචිත්තක්ඛණං නාම, එක් චිත්තක්ෂණයක් නම්වෙයි. පන, චිත්තයාගේ ආයුෂයෙන් අන්‍යවූ රූපයාගේ ආයුෂය දක්වම්:—තානි, තාදිසානි, එබඳු සවභාව ඇත්තාවූ හෙවත් තුන් තුන් ක්ෂණයකින් පරිපූර්ණවූ; සත්තරස චිත්තක්ඛණානි, සත්ලොස් චිත්තක්ෂණයකට බඳු ක්ෂණයෝ තුමූ; රූපධම්මානං, විඤ්ඤත්ති රූපද්වය ලක්ෂණ රූපසතරය යන මොවුන් හැර සෙසු දෙවිසිරූපයන්ගේ; ආයු, ආයුෂවෙයි. ඒකචිත්තක්ඛණාතීතානිවා, එක් චිත්තයක්හුගේ ක්ෂණයන්ට බඳු ක්ෂණයන් ඉක්මගියාවූ හෝ; බහුචිත්තක්ඛණාතීතානිවා, බොහෝ චිත්තයන්ගේ ක්ෂණයන්ට බඳු ක්ෂණයන් ඉක්මගියාවූ

හෝ නොහොත් විචිත්තක්ෂණයක් හෝ තුන්චිත්තක්ෂණයක් හෝ සතර චිත්තක්ෂණයක් හෝ පඤ්චිත්තක්ෂණයක් හෝ සචිත්තක්ෂණයක් හෝ සත්චිත්තක්ෂණයක් හෝ අටචිත්තක්ෂණයක් හෝ -පෙ- පසළොස් චිත්තක්ෂණයක් හෝ ඉක්මගියාවූ; ඨිතිප්පත්තානි එව, ඨිතිකාලයට පැමිණියාවූම; පචාලම්බණානි; පචාලම්බන යෝතුමූ; පචචාරෙ, පචචාරයෙහි; ආපාථං, හමුබවට නෙවත් වැටහීමට; යස්මා ආගච්ඡන්ති, යම් හෙයකින් එත්ද, තස්මා එසේ හෙයින්; එකචිත්තක්ඛණාතීතානං, එක්චිත්තක්ෂණයක් හුගේ ක්ෂණයන්ට බඳු ක්ෂණයන් ඉක්මගියාවූ; රූපාරම්මණං, රූපාලම්බණ තෙමේ; චක්ඛුස්ස, චක්ෂුඃප්‍රසාදයට; ආපාථං, හමුබවට; නෙවත් වැටහීමට; යදි ආගච්ඡති, ඉදින් පැමිණෙන්නේවී නම්; එවංසති, මෙසේ පැමිණීමක් ඇතිකල්හි; තතො, එසේ වැටහීමට; පැමිණිහෙයින් නොහොත් එසේ වැටහීමට පැමිණීමෙන්; පරං, මත්තෙහි; විකඛත්තුං, දෙවිටක්; භවාඞගචලිතෙ, භවාඞගය සැලුනුකල්හි; භවඞගසොතං, භවාඞගප්‍රවාහය; වොච්ඡිඥිත්වා, විශෙෂයෙන් සිඳ ගෙණ; තමෙව රූපාරම්මණං, ඒ රූපාලම්බණයම; ආවජ්ජන්තං, අවජිතා කරන්නාවූ; පචචාරාවජ්ජන චිත්තං, පචචාරාවජ්ජන සිත්තෙම; උපපජ්ජිත්වා, ඉපිද, නිරුජ්ඣති, නිරුඬවෙයි, තතොපරං, ඒ පඤ්චාරාවජ්ජන චිත්තය නිරුඬ වීමෙන් මත්තෙහි; තස්ස, ඒ පචචාරාවජ්ජන චිත්තයට අනතුරුතත්හි; තමෙවරූපං, ඒ රූපයම; පස්සන්තං, දක්නාවූ; චක්ඛු විඤ්ඤාණං, චක්ෂුර්විඥාන චිත්තයද, සම්පටිච්ඡන්තං, පිළිගන්නාක්වැනිවූ; සම්පටිච්ඡන චිත්තං, සම්පටිච්ඡන චිත්තයද; සන්තීරයමානං, මොනවට සලකුණු ලබන්නාවූ; සන්තීරණ චිත්තං, සන්තීරණ චිත්තයද; වවත්ථපෙන්තං, මොනවට නියමකරන්නාක් වැනිවූ; වොත්ථපන චිත්තය, ව්‍යවස්ථාපන චිත්තයද, ඉති ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; යථාක්කමං, පිළිවෙළින්; උපපජ්ජිත්වා, ඉපිද; නිරුජ්ඣන්ති, නිරුඬවෙත්; තතො, ඒ ව්‍යවස්ථාපන චිත්තය, නිරුඬවීමෙන් මත්තෙහි, එකූනතිංස කාමාවචර ජවනෙසු, එකුන්තිස් නම්වූ දරි ජවන් අතුරෙන්; යංකිඤ්චි, යම්කිසි ජවනයක් තෙමේ; ලද්ධප්පච්චයං, යොනිසොමනසිකාරාදී වශයෙන් ලබනලද උපකාර ඇතිව; යෙභුය්‍යෙන, බොහෝ හෙයින්; සත්තක්ඛත්තුං, සත්විටක්; ජවති, දිවේ; ජවනානුබන්ධානි, ජවන් ලුහුබැන්දවූ නොහොත් ජවනයන්ට අනුව ගියාවූ; ෙවතදාලම්බණපාකානි ච, තදාලම්බණ විපාක චිත්තයෝ දෙදෙනෙක්ද; යථාරහං, සුදුසු පරිද්දෙන්; පවත්තන්ති, උපදිත්; තතොපරං, ඒ තදාලම්බණයාගේ නිරුඬවීමෙන් මත්තෙහි; භවඞ

පාතො, භවාඞ්ගයෙහි වැටීමවෙයි. එත්තාවතා, මෙපමණකින්; චුද්දසචිත්තුප්පාද, තුදුස්වීථි චිත්තොත්පාද කෙනෙක්ද, වෙ භවඞ්ගචලනානි, භවාඞ්ගචලන චිත්තයෝ දෙදෙනෙක්ද, පුබ්බෙව, පූර්වයෙහිම; අතීතකං, ඉක්මගියාවූ; එකචිත්තක්ඛණං, එක් භවාඞ්ග චිත්තක්ෂණයෙක්ද; ඉතිකත්වා, මෙසේ මේ ප්‍රභෙදයෙන්; සත්තරස චිත්තක්ඛණානි, සත්ලොස් චිත්තක්ෂණ කෙනෙක්හුම්; පරිපූරෙන්ති, සම්පූර්ණවෙත්. තතොපරං, ඒ දෙවන තදාලම්බණයාගේ ඊතික්ෂණයෙන් මතු භවාඞ්ගකාලයෙහි; රූපාලම්බණං, රූපාලම්බණ තෙමේ; නිරුජ්ඣති, නිරුද්ධවෙයි. එතං ආරම්මණං, ඒ අරමුණුතෙම; අතිමහන්තං නාම, අතිමහන්තාලම්බණ නම් ඇත්තාවූ; ගොචරං, අරමුණයි. පන, අතිමහන්තාලම්බණ වීථියෙන් අන්‍යවූ මහන්තාලම්බණ වීථිය දක්වමි:—
නොහොත් තදාලම්බණ වාරයෙන් අන්‍යවූ ජවනවාරය දක්වමි:—
යාවතදාලම්බණුප්පාද, තදාලම්බණොත්පත්තිය දක්වා; අප්පහොන්තාතීතකං, නොපොහොනා බැවින් ඉක්මීම් ඇත්තාවූ; නොහොත් ශක්තිනැති බැවින් ඉක්මීම් ඇත්තාවූ; ආපාථං ආගතං, වැටගීමට පැමිණියාවූ; ආලම්බණං, අරමුණු තෙමේ; මහන්තං නාම, මහන්තාලම්බණ නම් වෙයි. තත්‍ථ, ඒ මහන්තාලම්බණයෙහි; ජවනාවසානෙ, ජවන්හුගේ කෙළවර; භවඞ්ගපාතොව හොති, භවාඞ්ගයෙහි හීමමවෙයි. තදාලම්බණුප්පාදො, තදාලම්බණයන්ගේ හටගැණීමෙක්; නත්‍ථි, නැත්තේයි. යාවජවනුප්පාදම්පි, ජවනයන්ගේ හටගැණීම දක්වාද; අප්පහොන්තාතීතකං, නොපොනා බැවින් තික්මීම් ඇත්තාවූ; ආපාථං ආගතං, හමුබවට ගියාවූ; ආලම්බණං, අරමුණු තෙමේ; පරිත්තං නාම, පරිත්තාලම්බණ නම් වෙයි. තත්‍ථ, ඒ පරිත්තාලම්බණයෙහි; ජවනම්පි, ජවනස්ස අපි, ජවනයාගේද, අනුප්පජ්ජිත්වා, අනුප්පජ්ජනතො, හටගැණීම නොවන හෙයින්; වත්තික්ඛත්තුං, දෙතුන් විටක්; වොත්ථපන මෙව, ව්‍යවස්ථාපන චිත්තයම; පවත්තති, හටගන්නේයි. තතොපරං, ඒ දෙතුන් ව්‍යවස්ථාපන චිත්තයකින් මත්තෙහි, භවඞ්ගපාතොව හොති, භවාඞ්ගයෙහි හීමම වෙයි. පන, ව්‍යවස්ථාපන වාරයෙන් අන්‍යවූ මොඝවාරය දක්වමි:—
යාව වොත්ථපනුප්පාදාච, ව්‍යවස්ථාපනොත්පත්තිය දක්වාද; අප්පහොන්තාතීතකං, නොපොහොනා බැවින් ඉක්මීම ඇත්තාවූ; ආපාථං ආගතං, හමුබවට ගියාවූ නිරොධාසන්නං, නිරුද්ධවීමට ලංවූ; ආලම්බණං, අරමුණු තෙමේ; අතිපරිත්තං නාම, අතිපරිත්තාලම්බණ නම් වෙයි. තත්‍ථ, ඒ අතිපරිත්තාලම්බණයෙහි; භවඞ්ගචලනමෙව හොයි, භවාඞ්ගයාගේ සැලීම් මාත්‍රයක්මවෙයි.

විථිචිත්තුප්පාදා, විථිචිත්තයන්ගේ හටගැණීමෙක්; නත්ථි, නැත්තේයි. ඉති එවං යථා වුත්තනයෙන, මෙසේ මේ කියනලද ක්‍රමයෙන්; චක්ඛුද්වාරෙ, චක්ඛුද්වාරයෙහි; විසයප්පවත්ති, ආලම්බණයන්ගේ ද්වාරයෙහි හටගැණීම නොහොත් ආලම්බණයෙහි හටගැණීම; චතුධා හොති, සතරාකාර වෙයි. තථා; එපරිද්දෙන්; සොතද්වාරාදීසු ච, ශ්‍රොත්‍රද්වාරාදියෙහිද, නොහොත් සොතඝාණජිව්හාකාය යන සතරද්වාරයෙහිද; විසයප්පවත්ති, ආලම්බයන්ගේ ද්වාරයෙහි හටගැණීම; චතුධා හොති, සතරාකාර වෙයි. ඉති මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; පඤ්චද්වාරෙ, පඤ්චද්වාරයෙහි; තදාලම්බන ජවන වොත්ථපන මොඝවාර සඞ්ඛාතානං, තදාලම්බනවාරය, ජවනවාරය, වොත්ථපනවාරය, මොඝවාරයයි කියනලද්දාවූ; චතුන්නං වාරානං, සතරවාරයන්ගේ; යථාක්කමං, පිළිවෙළින්; ආලම්බනභූතා, අරමුණුවූ නෙවත් කාරණාවූ; විසයප්පවත්ති, ආලම්බණයන්ගේ ද්වාරයෙහි හටගැණීම නොහොත් ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීම; චතුධා, සතරපරිද්දෙන්; වෙදිතබ්බා, දතයුත්තීය. පඤ්චද්වාරෙ, පඤ්චද්වාරයෙහි; යථාරහං, සුදුසු පරිද්දෙන්; උප්පජ්ජමානානි, උපදිනු ලබන්නාවූ; වීථිචිත්තානි, වීථිචිත්තයෝතුමූ; අවසෙසතො, සාමාන්‍ය වශයෙන්; සත්තෙව, සත්දෙනෙක්ම; සියුං, වන්නාහුය; විසෙසතො, විශෙෂ වශයෙන් චිත්තුප්පාද, චිත්තුප්පාදවසෙන, චිත්තයන්ගේ වෙන වෙනම හටගැණීම් වශයෙන්; චතුද්දස සියුං, තුදුස් ප්‍රභෙදයක් වෙති. විත්ථාරා, විස්තර වශයෙන්; චතුපණ්ණාස සියුං, සූපණසක්ම වෙත්. එත්ථ, මේ වීථිසංග්‍රහයෙහි; අයං, මේ කියනලද්දේ වනාහි, පඤ්චද්වාරෙ, පඤ්චද්වාරයෙහි; වීථිචිත්තප්පවත්තිනයො, වීථිචිත්තයන්ගේ හටගන්නා ක්‍රමයයි.

---

ආලම්බණයන්ගේ ද්වාරයෙහි හටගැණීමය යන අභියොජනාව වනාහි රූපාලම්බණාදීහු චක්ඛුද්වාරාදියෙහි හටගැණීම සඳහා කියනලදී. ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීමය යන අභියොජනාව වනාහි චක්ඛුද්වාරාදීයෙහි හටගන්නාවූ චිත්තයෝතුමූ රූපාලම්බණාදිය අරමුණු කොටගෙණ හටගැණීම සඳහා කියනලදී. මනොද්වාරයෙහි හටගන්නා චිත්තයෝතුමූ කර්මය කර්මනිමිත්තය යන දෙදෙන අරමුණු කිරීම ගතයුත්තේයි. පඤ්චද්වාරවීථියෙහි අතිමහන්තාලම්බණය, මහන්තාලම්බණය, පරිත්තාලම්බණය, අතිපරිත්තාලම්බණයයි ගොචර ප්‍රවෘත්ති සතරාකාර වෙයි. මනොද්වාරයෙහි වනාහි විභූතාලම්බණය, අවිභූතාලම්බණ

යයි විෂය ප්‍රවෘත්තිය දෙයාකාරවෙයි. මෙසේ පඤ්චද්වාරමනොද්වාරයෙහි විෂයප්‍රවෘත්තිය දෙයාකාරයක් වෙයි. චිත්තයාගේ ඉපදීම උත්පාදක්ෂණ නම්වෙයි. චිත්තයාගේ ස්ථිතිය ජරතා නම්වෙයි. චිත්තයාගේ බිඳීම මරණ හෙවත් භඞ්ග නම් වෙයි. මෙසේ එකම චිත්තයක්හුගේ උත්පාදස්ථිති භඞ්ගසඞ්ඛ්‍යාතවූ ක්ෂණත්‍රය එක්වූ කල්හි එක් චිත්ක්ෂණයක් නම්වේ. හෙවත් චිත්තයාගේ ආයුෂ නම් වෙයි. එබඳු චිත්තක්ෂණ සතළොසෙක් හෝ උත්පාදක්ෂණාදී කුඩාක්ෂණයෝ එක් පණසෙක් හෝ එකම රූපධර්මයක්හුගේ ආයුෂ නම් වෙයි. රූපයාගේ ඉපදීම හා රූපයාගේ බිඳීමද ඒ කුඩා එක් පණසින් එක එකක්ම වන හෙයින් රූපයාගේ උත්පාදභඞ්ගද්වය හා චිත්තයාගේ උත්පාදභඞ්ගද්වයද සමානායුෂ්ක වන්නේයි. එබඳු කුඩාක්ෂණයෝ එකුන් පණසක් රූපයාගේ ස්ථිතිකාලය හෙවත් ජරතා රූපය නම් වෙයි. චිත්තයාගේ ස්ථිතිය වනාහි එකම කුඩාක්ෂණයක් වන හෙයින් රූපයාගේ උත්පාදය හා සමානවන්නේයි. රූපයාගේ උත්පාදය, රූපයාගේ උපචය, රූපයාගේ සන්තතිය, යනමේ නාමයෝ තුන්දෙනාම සමානාර්ථයි. රූපයාගේ ස්ථිති කාලය, ජරතාරූපය යන මේ නාම ද්වයද, සමානාර්ථයි. රූපයාගේ භඞ්ගය, රූපයාගේ මරණය, අනිච්චතා රූපය, යන මේ නාමත්‍රය සමානාර්ථයි. කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය හෙවත් කයින් අභිප්‍රාය ඇඟවීමය, වචනයෙන් අභිප්‍රාය ඇඟවීමය යන මේ රූපද්වයද එක එක චිත්තයකට බඳු ආයුෂ ඇතිවෙයි. හෙවත් උත්පාදස්ථිති භඞ්ගසඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් එක් චිත්තක්ෂණයක් කෙළවරවන්නාක් මෙන්ම කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති සඞ්ඛ්‍යාතවූ චිත්තජරූපද්වයද, ඒ ඒ සිත හා සමගම නිරුද්ධවන්නේයි. එහෙයින් අභිධර්ම මාතෘකාවෙහි "චිත්තානුපරිවත්තිනො ධම්මා චිත්තසහභුනො ධම්මා," යන පදයන්ගෙන් මේ කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපද්වය වදාළ බැවින් ඒ රූපද්වය සත්තරසායුෂ්ක නොවිය යුත්තේයි. එහෙයින් අටවිසිරූපධර්මයන් අතුරෙන් උපචය රූපය අනිත්‍යතා රූපය, යන රූපද්වය කුඩාක්ෂණ එක් පණසින් එක එක ක්ෂණයකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, විඤ්ඤත්ති රූපද්වය ඒ කුඩාක්ෂණ තුණතුණට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, ජරතා රූපය ඒ කුඩාක්ෂණ එකුන්පණසකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, අවශේෂවූ සියලු රූපයෝ සත්තරසායුෂ්ක නොහොත් කුඩාක්ෂණ එක් පණසකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, සන්තතිරූපය උපචය රූපයට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, අර්ථගතයුත්තේයි. පටිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළවන්නාවූ කායභාව වස්තුකලාපත්‍රයාගේ

හටගැණීම උපචය රූපයයිද, ඒ පටිසන්ධි චිත්තයාගේ ඨිතික්ෂණය පටන් චුතිචිත්තයට ආපසු ගිණූ කල්හි සතළොස් වන චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා නිරන්තරයෙන් ඒ රූපයන්ගේ හටගැණීම සන්තතිරූපනම් වෙයි. ඒ ඒ භවයෙහි යම් රූපකලාපයක්හුගේ පළමුවන හටගැණීම උපචය රූපයයිද, නැවත නැවත හටගැණීම් සන්තතිරූපයයිද වන බැවින් උපචය සන්තති දෙදෙනාගේ වෙනසක් නැතැයි දතයුතුයි. අවශෙෂවූ දෙවිසි රූපයම සත්තරසායුක වියයුත්තේයි. ඒ සත්තරසායුක වන්නාවූ දෙවිසි රූපයන් අතුරෙන් වර්ණායතනාදී යම්කිසි රූපයක් තෙමේ ඉපිද යටත් පිරිසෙයින් එක් චිත්තක්ෂණයක් ඉක්මවා හෝ උඩත් පිරිසෙයින් සොළොස් චිත්තක්ෂණයක් ඉක්මවා හෝ චක්ෂුරාදී ද්වාරයට හමුවන්නේයයි දතයුතුයි. ඒ හමුවීමද අභිමුඛීභූත ස්ථානය හමුවීමයයි කියනලදී. ඒ හමුවීමද භවාඞ්ගචලනයාගේ උත්පාදක්ෂණයකට පැමිණීමෙන් හමුවන්නේයයි කියාද ඇතැම් ආචාර්ය්‍යවරයන්ගේ මතපරිද්දෙන් පළමුවන අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි ඇත්තාවූ චක්ෂුප්‍රසාදය හා බාහිර රූපාලම්බණ තෙමේ අතීත භවාඞ්ගය හා සමානව උපන්නාවූ චක්ෂුප්‍රසාදයට ගැටෙන්නේයයි ඇතැම් ආචාර්ය්‍යවරයෝ කියත්. භවාඞ්ගචලනය යනු වාතානුසාරයෙන් සැලෙන්නාවූ වෘක්ෂ ශාඛාවක්මෙන් සැලෙන්නේ නොවෙයි. පූර්‍වභවාඞ්ගයට විසදෘශව උපදනා භවාඞ්ගයම භවාඞ්ගචලනයයි ව්‍යවහාර කෙරෙති. ඒ භවාඞ්ගශ්‍රොතස සිඳගෙණ උපදනා භවාඞ්ග චිත්තයම භවඞ්ගුපච්ඡෙදයයි ව්‍යවහාර කෙරෙත්. චක්ෂුප්‍රසාදය චතුර්හි සසම්භාර චක්ෂුව ආශ්‍රය කොටගෙණ පවත්නේයි. ඒ උපාදාරූපවූ චක්ෂුප්‍රසාදය හා සමග ශරීරයෙන් පිටත්හි පවත්නාවූ රූපාලම්බණය ගැටුනු කල්හි කුමක්හෙයින් හෘදයවස්තුව නිසා පවත්නාවූ මනොවිඥ්ඥාණධාතු සංඛ්‍යාතවූ භවාඞ්ග චිත්තය සැලෙන්නේද, ඝට්ටණයවූ ස්ථානය අනිකෙක, සැලෙන්නාවූ ධර්‍මය අනිකෙක, මේ සිඳවීම කෙසේ වන්නේදැයි ප්‍රශ්නයක් නැඟේ. ඊට පරිහාර මෙසේයි. සුණඛ කුණපයක් අනුභව කරමින් ඉන්නාවූ ගිජුලිහිණියෙකුට යන්ත්‍ර මුඛාන්ත ආයුධ සංඛ්‍යාතවූ තුවක්කුවකින් වෙඩිතැබූකල්හි ඒ ලඟහුන් කවුඩුතෙම අතිශයින් භයට පැමිණ ඉගිලීයන්නාක්මෙන් සුණඛ කුණපයට බඳුවූ රූපාලම්බණය අනුභව කරන්නාවූ ගිජුලිහිණියෙකුට බඳුවූ චක්ෂුප්‍රසාදය ගැටුනු කල්හි ඊලඟහුන් කවුඩුවෙකුට බඳුවූ භවාඞ්ග චිත්තය සැලෙන්නේයයි දතයුතුයි. අතීත භවාඞ්ග චිත්තයාගේ

උත්පාදක්ෂණයෙහි "ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති" යනු කීහෙයින් උත්පාදක්ෂණයෙහි චක්ෂුර්දශක වස්තු දශකයෝද, ස්ථිතික්ෂණයෙහි චක්ෂුර්දශක වස්තු දශකයෝද, භඞ්ගක්ෂණයෙහි චක්ෂුර්දශක වස්තු දශකයෝද, නිරන්තරයෙන් උපදනාහුවෙත්. සියලු චිත්තයන්ගේ පූන් තුන් ක්ෂණයෙහි ස්ත්‍රීන්ට ස්ත්‍රී භාවරූපය සමගද පුරුෂයන්ට පුරුෂභාව රූපය සමගද, මෙසේම රූපකලාපයෝ අට අටදෙනෙක් උපදනාහුවෙත්. එහෙයින් නිරන්තරයෙන් එක් සත්වයෙක්හට චක්ෂුර්දශක කලාපයෝ එක් පණසෙක්දා ශ්‍රොත්‍රාදී අවශෙෂ සප්තකලාපයන්ගේ එක් පණස බැගින් ඇත්තාහුවෙත්. ඔවුන් අතුරෙන් චක්ෂුර්දශකයෙහි ඇතුලත්වූ සතර මහාභූතයන්ගෙන් අවශිෂ්ටවූ වර්ණ ගන්ධ රස ඔජජීවිතෙන්ද්‍රිය චක්ෂුප්‍රසාද සඞ්ඛ්‍යාතවූ සංස්කාර උපාදය රූපයෝතුමූ චක්ෂුර්දශක කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කය නිශ්‍රයකොට පවත්නාහුවෙත්. ඒ සතර මහා භූතයෝ වනාහි එක් භූතයෙක් අවශෙෂ භූතත්‍රයටද ඒ භූතත්‍රය එක් භූතයෙක්හටද භූතමයෙක් අනික් භූතවයද නිශ්‍රයවීමෙන් තමාගේ සතළොස් චිත්තක්ෂණයතුල පවත්නාහුය. වස්තුදශක කලාපයෙහිද චක්ෂුදශක කලාපයට කීනයින්ම සතර මහා භූතයන්ගෙන් අවශිෂ්ටවූ උපාදා රූපයෝ සදෙන භූතචතුෂ්කය නිශ්‍රයකොට පවත්නාහුවෙත්. ඒ සතර මහා භූතයෝ වනාහි චක්ෂුකලාපයෙහි කීනයින් ඔවුනොවුන්ට ඔවුනොවුන් උපකාරවෙත්. මනොවිඥානධාතු තෙමේ හෘදය වස්තුව නිශ්‍රයකොට පවත්නේයි. එසේ පවත්නා හෙයින් බාහිරවූ රූපාලම්බනය හා අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි අධ්‍යාත්ම සන්තානයෙහි ඇත්තාවූ චක්ෂුප්‍රසාදය හා ගැටීමෙක් වීනම් ඒ චක්ෂුප්‍රසාදය චචලවන්නේයි ඒ චක්ෂුප්‍රසාදය චචලවූ කල්හී චක්ෂුප්‍රසාද කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කය චචලවන්නේයි. ඒ භූතචතුෂ්කය චචලවූ හෙයින් වස්තුදශක කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කයද අන්‍යොන්‍ය සම්බන්ධය ඇති හෙයින් චචලවන්නෙයි. ඒ වස්තුදශක කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කය චචලවූ හෙයින් තන්නිශ්‍රිතවූ හෘදයවස්තුව චචලවන්නේයි. ඒ හෘදය වස්තු චචලවීම හෙතුකොට ගෙණ මනොවිඥානධාතු සඞ්ඛ්‍යාතවූ භවාඞ්ගය චචලවන්නේයි. ඊට උපමාකවරයත්? දෙදුහුණු බෙරයක එක් මුහුනතෙක්හී ඇලීගියාවූ සකුරු කැටයෙහි මැස්සෙක් අවුත් හුන් කල්හි අනික්බෙර මුහුනතට ගැසීමෙන් ඒ බෙර මුහුණත චචලවෙයි. ඊටපසු වරපට චචලවෙයි. ඉක්බිති ඒ වරපට හා සම්බන්ධ බැවින් අනික් බෙර මුහුණත චචලවෙයි. ඉක්බිති ඒ බෙරමුහුණෙහි ඇලීතුබූ සකුරු කැටය චචලවෙයි. ඒ චචලවීම හෙතුකොට ගෙණ සකුරු කැටයෙහි හුන් මැස්සා ඉගිලයෙයි. මේ උපමාවෙහි අනික් බෙර මුහුනතට ගසන්නාවූ කඩිප්පුව

මෙන් බාහිරවූ රූපාලම්බනයද, ඒ බෙර මූහුනතමෙන් චක්ෂු ප්‍රසාද රූපයද, වරපටමෙන් චක්ෂුර්දශක කලාපයෙහි භූතචතුෂ්ක යද, සකුරු කැටය ඇලීතිබෙන්නාවූ බෙර මූහුනතමෙන් හෘදය වස්තු කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කයද, සකුරු කැටයමෙන් හෘදය වස්තු රූපයද, ඒ සකුරු කැටයෙහි හුන්මැස්සාමෙන් මනොවිඥනධාතු සඞ්ඛ්‍යාත භවාඞ්ගචලන චිත්තයද උපමා උප මෙය සම්බන්ධකොට අර්ථ දතයුතුයි. ආලම්බන සට්ටණයවූ කල් හිම විථිසිත් කොතුපද කුමක්හෙයින් අතීත භවාඞ්ග සිත් එකක් හෝ ඉන්වැඩි ගණනක් හෝ උපදනාහුදයත්? මහත් ජව වෙග යෙන් දුවන්නාවූ අසෙකු අතිමහත ස්ථානයෙහි සිටුවනු කැමැත්තේ වීනම් ඒ ස්ථානයෙන් එක් බඹයක් හෝ දෙතුන් බඹයක් හෝ පොලාපැන ගොස් නැවැත්විය යුතුවෙයි. එපරිද් දෙන්ම මහත්වූ සැඩවතුරෙක් මෙන් බස්නාවූ භවාඞ්ග ප්‍රවාහය සිඳගෙණ චිත්ත වීථියක් උපදවනු කැමති වීනම් යටත් පිරි සෙයින් එක් අතීත භවාඞ්ගයක් හෝ උඩත් පිරිසෙයින් අතීත භවාඞ්ග (සොළසක්) හෝ ඉපිද ඊට අනතුරුව වීථිසිත් ඉපදිය යුතුවෙත්. චක්ෂුප්‍රසාදය හා බාහිර රූපාලම්බණයාගේ ගැටීම ගිනිගලක් හා ගිනිකටුවක්ද එකට ගැටීමක් වැනිවෙයි. ගිනිගල හා ගිනිකටුව ගටන්නාවූ කල්හි ගිනිමල් වැටෙන්නාක්මෙන් විථිචිත්තයන්ගේ හටගැණීම දතයුතුයි. ගිනිගලමෙන් චක්ෂු ප්‍රසාද රූපයද, ගිනිකටුවමෙන් රූපාලම්බණයද, උපමා උපමෙය සම්බන්ධ කොට අර්ථ ගතයුතුයි. විථිචිත්තයන්ගේ තදාලම්බණ වාරාදිය විථියෙහි අන්තිම චිත්තය සඳහා ව්‍යවහාර කරණු ලැබෙයි. තදාලම්බණයන්ගෙන් අවසාන වන විථිය තදාලම්බණ වාරයයි කියාද, ජවනයන්ගෙන් අවසාන වන විථිය ජවන වාරයයි කියාද, ව්‍යවස්ථාපන චිත්තයෙන් අවසන් වන්නාවූ විථිය වොත්ථපනවාරයයි කියාද, භවාඞ්ගචලන මාත්‍රයකින් කෙළවරවන්නාවූ විථිය විථිචිත්තයන්ගෙන් සිස්වූ බැවින් මොඝ වාරයයි කියාද ව්‍යවහාර කෙරෙත්. අතිමහන්තාලම්බණ විථි යෙහි විථිචිත්තයෝ තුදුස්දෙනෙක් වෙත්. ඔවුන්ගේ අරමුණ වනාහි එක් අතීත භවාඞ්ගයක් ඉක්මගියාවූ නොහොත් අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණය හා සමග එක්කොතපාදවූ ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණයයි. ඒ "ප්‍රත්‍යුත්පන්නය" යනු පච්චුප්පන්න සඞ්ඛ්‍යාතවූ ඒ රූපාලම්බණයාගේ ධරමාණ කාල යයි. හෙවත් සතළොස් චිත්තක්ෂණයක් ඇතුලත්හිවූ කාලයයි. තදාලම්බණ නියමයෙහි "ජවනානුබන්ධානි" යන වචනයෙහි අභිප්‍රාය මෙසේයි. සොම්නස් සහගත ඥනසම්ප්‍රයුක්ත අසංස්කා රික චිත්තයෙන් පටිසන්ධි ගත්තාවූ පුද්ගලයාහට තදාලම්බණ වන්නාවූ කල්හි ඒ සොම්නස් සහගත ඥනසම්ප්‍රයුක්ත අසංස්කා රික මහා විපාක චිත්තයක්ම තදාලම්බණ වශයෙන් පැවතුනේ

කම් තදනන්තරව පවත්නාවූ භවාඞ්ගයද, සෝමනස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික භවාඞ්ගයක්ම වෙයි. ඥානවිප්‍රයුක්ත සිතින් පටිසන්ධි ගත්තාවූ පුද්ගලයාහට භවාඞ්ගසිත් හා සමග තදාලම්බණයද, ඊට සමානවම වන්නේයි. භවාඞ්ගය විසින් අරමුණු කරණලද්දාවූ කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තය යන තුණින් එකක් අරමුණු කරන්නේයයි කීහෙයින් භවාඞ්ගයාගේ අරමුණ නොගෙණ ජවනයාගේ අරමුණට අනුවයන්නේයයි දක්වනු පිණිස "ජවනානුබන්ධානි"යනු කියනලදී. රූපාලම්බණ තෙමේ අතිශයින් අධිකවූ ආයුෂ ඇත්තාවූ චිත්තවීථි තෙමේ අතිමහන්තාලම්බණ වීථිනම් වෙයි. මහන්තාලම්බණ වීථිය යනාදියෙහිද මේ ක්‍රමයෙන් දතයුතුයි. මහන්තාලම්බණ වීථියෙහි වනාහි කුමක්හෙයින් තදාලම්බණ නොවන්නේදයත් ? තදාලම්බණ දෙසිතක් ඉපදීම පිණිස රූපාලම්බණයාගේ ආයුෂ නොපොහොනා බැවින් තදාලම්බණ නොවන්නේයයි දතයුතුයි. එසේ වීනම් එක් තදාලම්බණයක් ඉපදීමට රූපාලම්බණයාගේ ආයුෂ ඇති බැවින් එක් තදාලම්බණයක් නුපදින්නේ කුමක් නිසාදයත් ? තදාලම්බණය වනාහි යුගල යුගල වශයෙන්ම ඉපදීම චිත්තනියාමය බැවින් එක් තදාලම්බණයෙක් නූපදනේයි. ඉදින් ඒ රූපාලම්බණයාගේ ආයුෂ නොපොහොනේ වීනම් ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණයෙහි එක් තදාලම්බණයක් හා අතීතවූ රූපාලම්බණයෙහි එක් තදාලම්බණයෙක්ද ඉපදියයුතු නොවේදැයි යමෙක් ප්‍රශ්නකෙළේ වීනම් එකම චිත්තවීථියෙහි ඇතැම් චිත්තයන් ප්‍රත්‍යුත්පන්නාලම්බණයන් හා ඇතැම් චිත්තයන්ට අතීතාලම්බණයද අරමුණු නොවියයුතු බැවින් හා පචවාරයෙහි හටගන්නාවූ චිත්තයන්ට අතීතාලම්බණයන් අරමුණු නොවිය යුතුහෙයිනැයි දතයුතුයි. එහෙයින් එක් තදාලම්බණයකට ආයුෂ ඇත්තේ නමුදු අනිත් තදාලම්බණයට ආයුෂ නොපොහොනා බැවින් ජවනයන්ගේ කෙළවර භවාඞ්ග වන්නේයයි දතයුතුයි. පරිත්තාලම්බණ වීථියෙහි ජවන්නූපදින්නේ කුමක්හෙයින්දයත්? ජවනයන්ගේ සවභාව වනාහි ප්‍රකෘති ප්‍රවෘත්ති කාලයෙහි කාමාවචර ජවන්හු සත්දෙනෙක්ම දිවීමද, සිහිමූර්ඡාවූ කල්හි ජවන් සදෙනෙක් දිවීමද, මරණාසන්න කාලයෙහි ජවන් පසක් දිවීමද, සෘද්ධිප්‍රාතිහාර්‍යාදිය පානාකල්හි කාමාවචර ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ දිවීමද, කාමාවචර ජවනයන්ගේ ප්‍රකෘති සවභාව මේ මේ ප්‍රස්තාව වනාහි සයවරක් හෝ සතරවරක් හෝ පස්වරක් හෝ දිවන්නාවූ කාලය නොවෙයි සත්වරක්ම දිවීම්

ස්වභාව වෙයි. මේ වීථියෙහි රූපාලම්බණයාගේ ආයුෂ චිත්තක්ෂණ සතකට අඩුවූ හෙයින් චිත්තනියාමය පරිදි සත්ජවන් කෙනෙක් ඉපදීමට ආයුෂ නොපොහොනා බැවින් එක් ජවනයෙකු නොඉපද භවාඞ්ගවන්නේයයි දතයුතුයි. අතිපරිත්තාලම්බණ වීථියෙහි පඤ්චාරවර්ජනය, සම්පටිච්ඡනය, සන්තීරණය, ව්‍යවස්ථාපන චිත්තය යන චිත්තක්ෂණ සතරක් ඉපදීමට ආයුෂ ඇතිවුවද එසේ නොඉපිද භවාඞ්ගචලන මාත්‍රයක්ම භවාඞ්ග ශ්‍රොතසයට බස්නේ කුමක්හෙයිනයත්? ව්‍යවස්ථාපන චිත්තය වනාහි අතිමහන්තාලම්බණ මහන්තාලම්බණ යන දෙවීථියෙහිම එක්වරක්ම උපදනේයි. මේ චිත්ත වීථිවයෙන් අන්‍යවූ වීථියෙක්හි ව්‍යවස්ථාපන චිත්තය එක්වරක්ම උපදනේය යන නියමය නැති බව "වත්තික්ඛත්තුං වොත්ථපනමෙව පවත්තති" යන්නෙන් ප්‍රකට වේ. ව්‍යවස්ථාපන චිත්තය වනාහි අතිමහන්තාලම්බණ මහන්තාලම්බණ වීථිවයෙන් අන්‍යවූ යම් වීථියක උපදනේ වීනම් දෙතුන්විටක්ම උපදනේයි. දෙතුන්විටක් ඉපදීමට ආයුෂ නොපොහොනේ වීනම් සර්වප්‍රකාරයෙන් ව්‍යවස්ථාපන චිත්තය නූපදනේයි. ව්‍යවස්ථාපන චිත්තය නූපදනා හෙයින් සන්තීරණ චිත්තයත් නූපදනේයි. සන්තීරණ චිත්තය නූපදනා හෙයින් සම්පටිච්ඡන චිත්තයත් නූපදනේයි. සම්පටිච්ඡන චිත්තය නූපදනා හෙයින් පඤ්චවිඤ්ඤාණය නූපදනේයි. පඤ්චවිඤ්ඤාණය නූපදනා හෙයින් පඤ්චාරාවර්ජනය නූපදනේයි එහෙයින් භවාඞ්ගචලන මාත්‍රයක්ම වන්නේයයි දතයුතුයි. ඊට උපමා කවරයත්? තුඹසෙහි වසන්නාවූ සර්පයාගේ හිස තුඹස් කටින් එක්තරා පුරුෂයෙක් දැක එහි සර්පයෙක් වසන්නේයයි තමාගේ යහළුවා හා සමග සාකච්ඡාකරණ කල්හි සර්පයාගේ හිස නැවත ඇතුලට ගෙණ නොපෙණියාමත් මෙන්ද, බලවත්සේ නිදිමතින් සයනය කරන්නාවූ යම් පුරුෂයෙකු පුබුදුවා එකල්හි මදක් ඇසහැර නැවත නිද්‍රොපගතවන්නාක් මෙන්ද, මේ අතිපරිත්තාලම්බණ වීථිහුගේ භවාඞ්ගචලන මාත්‍රයක් වන්නේයයි දතයුතුයි. මේ චිත්ත වීථියෙහි පඤ්චාරාවර්ජනයට අනතුරුව පඤ්චවිඤ්ඤාණයද, ඊට අනතුරුව සම්පටිච්ඡනයද, ඊට අනතුරුව සන්තීරණයද, ඊට අනතුරුව ව්‍යවස්ථාපනයද, ඊට අනතුරුව ජවන් සතෙක්ද, ඊට අනතුරුව තදාලම්බණ යුගලයෙක්ද යන මේ පිළිවෙළින් හටගැණීම ඊශ්වරාදී ආත්මාදිකාරයෙක් හුගේ නියමයෙක් නොව චිත්ත නියාමයයි දතයුතුයි. ඒ එසේමැයි—මේ ලෝකයෙහි ලෝකස්වභා ධර්මස්වභා වශයෙන් නියමයෝ පස්දෙනෙක් වෙති. ඒ කවරහුයත්? ඍතුනියාමය, බීජනියාමය, ධර්මනියාමය,

කර්මනියාමය, චිත්තනියාමය යන මේ නියාමයෝ පස්දෙනායි. එහි ඍතුනියාමය නම්:– මේ සමයෙහි තොපි සීත කරව්, තොපි උෂ්ණ කරව්, වර්ෂා කරව් යනාදීන් නියමකරන්නාවූ ඊශ්වරාදී කාරකයෙක් නැත්තේයි. මේ ලෝකයෙහි හටගන්නා සියලු ස්වභාවයෝ ඍතුනියම නම්වෙත්. "බීජනියමය"යනු සියලු ලතා ජාතිහු ආසන්නයෙහි ඇති වෘක්ෂයක (දක්ෂිණාවෘතවම) පැටලී යන්නාහුවෙති. නාලිකෙරඵලයෙහි සිදුරුතුණක් ඇතිවෙයි. වේණු ආදී වෘක්ෂයන් ඇතුලත්හි සිදුරු ඇතිවෙති. මේ සියල්ල බීජනියාමය නම්වෙයි. "ධර්මනියාමය"යනු මහාබෝධිසත්වාදීන්ගේ පහළවීමාදියෙහි පෘථුවිකම්පාවීමය, දෙතිස් පූර්වනිමිති පහළවීමය, යනාදී සියලු සිඬවීම් ධර්මනියාමයනම් වෙයි. "කර්මනියාමය"යනු කුශල කර්මයට කුශල කර්මවිපාකය හා අකුශල කර්මයට අකුශල විපාකදීමාදිය කර්මනියම නම්වෙයි. "චිත්තනියමය"යනු මේ චිත්තවීථීන්ගේ චිත්තයන් හටගන්නා පිළිවෙළ නම්වෙයි. තෝ පඤ්චද්වාරාවර්ජන නම්වෙව, තෝපඤ්චවිඥාණ නම් වෙවයි කියා හෝ තෝපඤ්චද්වාරාවර්ජනයට අනතුරුව උපදුවයි කියා හෝ නියමකරන්නාවූ කාරකයෙක් නැතිහෙයින් චිත්ත නියාම නම්වෙයි.

පඤ්චද්වාරාවර්ජන චිත්තවීථියෙහි උපමාව මෙසේයි. විලිකුම් අඹ ඇත්තාවූ අඹගසක්යට හිසවසා පොරවාගෙණ සැතපෙන්නාවූ පුරුෂයෙක් තෙමේ ඒ අඹගසින් විලිකුන් අඹ ඵලයක් හුණු ශබ්දයට පිබිද ඇස ඇර බලා ඒ අඹඵලය දැක අතින්ගෙණ විලිකුන් නොවිලිකුන් බව දැනගන්නා පිණිස අතින්මැඩ පරීක්ෂාකොට නැවතත් නියම වශයෙන් විලිකුන් බව දැනගන්නා පිණිස නාසයට අල්වා සිඹ විලිකුන් බව දැන සතුටින් යුක්තව අඹඵලය අනුභවකොට තලුආදියෙහි වැකී තිබුනාවූ අඹ රසය මුඛගත ශ්ලේෂ්මය හා සමග ගිල නැවතත් එහිම සයනයකරන්නේය. මේ උපමාවෙහි විලිකුම් අඹ ඇති ගසමෙන් කාමලෝකයද, එහි හිසවසා පෙරවාගෙණ සැතපීහුන් පුරුෂයාමෙන් භවාඞ්ගවීමද අඹගසින් අඹගෙඩියක් වැටීමක් මෙන් රූපාදී පඤ්චාලම්බණයන් අතුරෙන් යම්කිසි අරමුණක් වැටහීමද, ඒ අඹඵලය හුණු ශබ්දයෙන් නින්දෙන් පිබිද ඇස දැල්වීමක්මෙන් පඤ්චද්වාරාවර්ජන චිත්තයද, අඹඵලය දැකීමක්මෙන් චක්ෂුර්විඥාන චිත්තයද, අඹඵලය අල්ලා ගැණීමක්මෙන් සම්ප්‍රත්‍යෂණ චිත්තයද, අඹඵලය අතින්මැඩ පරීක්ෂා කිරීමක්මෙන් සන්තීරණ චිත්තයද, ඉදුනු බව නියමකරගැණීම පිණිස නාසයට ඇල්වීමක්මෙන් ව්‍යවස්ථාපන චිත්තයද, ඉදුනු බව නිශ්චය කොටගෙණ සතුටට පැමිණ අනුභව කිරීමක්මෙන් සෞම්නස්

සහගත දිට්ඨිගතසම්ප්‍රයුක්ත ලෝභමූලික චිත්තය බොහෝසෙයින් ජවන් වශයෙන් සත්වරක් දිවීමද, නැවත තලුආදියෙහි වැකුණාවූ අඹ රසය මුඛගතශ්ලේෂ්මය හා සමග ගිලීමක්මෙන් තදාලම්බණ විපාක චිත්තයන් දෙදෙනාගේ ඉපදීමද, නැවතත් හිස වසා පෙරවාගෙණ එහිම සැතපීමක්මෙන් මේ අතිමහන්තාලම්බණ චිත්තවීථියට අරමුණුවූ සප්තරසායුකවූ රූපාලම්බණය නිරුද්ධවීමෙන් පසු නැවත භවාඞ්ගයනීමද උපමා උපමෙය සම්බන්ධකොට අඞ්දතයුතුයි. මේ අම්බොපමා මාත්‍රයකි.

දෞවාරිකොපමාව කෙසේයත්? එක්තරා රජෙක් තෙමේ සවස්භාගයෙහිම ශ්‍රීයහන් ගබඩාවට පැමිණ සැතපෙන්නට පටන් ගන්නේයි. ඉක්බිති ඒ රජහුගේ පරිචාරක පුරුෂ තෙමේ රජහුගේ පාදයන් මඩිමින් ශ්‍රීයහනලඟ හිඳින්නේවෙයි. රජගෙයි දොරටුවෙහි බිහිරිවූ දොරටුපාලයෙක් මුරකරයි. ඒ දොරටුව හා ශ්‍රීයහනට අතරතුර පාටිහාරික රාජපුරුෂයෝ තුන්දෙනෙක් පිළිවෙළින් සිටියාහුය. ඉක්බිති පසල්දනව්වැසි එක්තරා මනුෂ්‍යයෙක් තෙමේ පඬුරු රැගෙණ අවුත් රජගෙයි වාසල් දොරට ආකොටණය කෙරෙයි. එතකුදුවුවත් බිහිරි දොරටුපාල තෙමේ ඒ ශබ්දය නොඅසයි. රජහුගේ පය පිරිමඩිමින් හුන්නාවූ රාජපුරුෂ තෙමේ ඒ ආරාකොටණ ශබ්දය අසා බිහිරි දොරටුපාලයාහට දොර විවෘතකරවයි සංඥාවක්දෙයි. ඒ සංඥාවෙන් බිහිරි දොරටුපාලයා දොරහැර දුන්කල්හී පාටිහාරිකයන් තුන්දෙනා අතුරෙන් පළමුවන පාටිහාරික පුරුෂ තෙමේ පසල් දනව්වැසි මනුෂ්‍යයා විසින් ගෙණඑනලද්දාවූ පඬුරුපාක්කුඩම අතටගෙණ දෙවෙනි පාටිහාරික පුරුෂයා අතටදෙයි. දෙවෙනි පාටිහාරික පුරුෂ තෙමේ තුන්වෙනි පාටිහාරිකයා අතටදෙයි. තුන්වෙනි පාටිහාරික පුරුෂ තෙමේ රජහු අතට පිළිගන්වයි. රජතෙමේ මහත් සොම්නසින් යුක්තව අනුභවකරයි. මේ උපමායෙහි රජහුමෙන් සත්ජවනයන්ගේ පැවැත්ම දතයුතුයි. රජහුගේ පාදසම්බාහනය කළ පුරුෂයාමෙන් පඤ්චද්වාරාවර්ජන චිත්තය දතයුතුයි. බිහිරි දොරටුපාලයාමෙන් චක්ෂුර්විඥාන චිත්තය දතයුතුයි. පාටිහාරික පුරුෂයන් තුන්දෙනාමෙන් ක්‍රමයෙන් සම්පටිච්ඡන සන්තීරණ ව්‍යවස්ථාපන චිත්තයන් තුන්දෙන දතයුත්තාහුය. පසල්දනව්වැසි මනුෂ්‍යයෙක් පඬුරක් ගෙණවුත් රජවාසල් දොරට ආකොටණය කිරීමක්මෙන් රූපාදී පඤ්චාලම්බණය පඤ්චප්‍රසාදයෙහි ගැටීම දතයුතුයි. පාදපිරිමදිමින්හුන් රාජපුරුෂයා විසින් සලකුණක් දුන්කාලයමෙන් ක්‍රියා මනොධාතු සංඛ්‍යාතවූ පඤ්චද්වාරාවර්ජන චිත්තය කාරණකොටගෙණ භවාඞ්ග

යාගේ ආවෘත්තිතකාලය දතයුතුයි. ඔහු විසින් දෙනලද සංඥාවෙන් බිහිරි දොරටුපාලයාගේ දොර විවෘත කළ කාලයමෙන් චක්ෂුර්විඥානයාගේ ආරම්මණ දර්ශනකෘත්‍යය සිද්ධකළාවූ කාලය දතයුතුයි. පළමුවන පාටිහාරික පුරුෂයා විසින් පසල්දනව්වැසි මනුෂ්‍යයා අතින් පඬුර පිළිගත් කාලයමෙන් විපාක මනොධාතු සඞ්ඛ්‍යාතවූ සමපටිච්ඡන චිත්තයාගේ අරමුණු පිළිගන්නාකාලය දතයුතුයි. පළමුවන පාටිහාරික පුරුෂයා විසින් දෙවෙනි පාටිහාරික පුරුෂයා අතට දුන්කාලයමෙන් විපාක මනොවිඥානධාතු සඞ්ඛ්‍යාතවූ සනතීරණ චිත්තයාගේ අරමුණු තීරණය කර ගන්නාකාලය දතයුතුයි. දෙවෙනි පාටිහාරිකයා විසින් තුන්වෙනි පාටිහාරික පුරුෂයා අතට දුන්කාලයමෙන් ක්‍රියා මනොවිඥානධාතු සඞ්ඛ්‍යාතවූ ව්‍යවස්ථාපන චිත්තයාගේ අරමුණු නියමකරගන්නාකාලය දතයුතුයි. තුන්වෙනි පාටිහාරික පුරුෂයා විසින් රජහු අතට දුන්කාලයමෙන් ව්‍යවස්ථාපන චිත්තයෙන් ජවනයට නියමිතකාලය දතයුතුයි. රජහුගේ පරිභොග කාලයමෙන් ජවනයාගේ ආලම්බණ රසානුභවනකාලය දතයුතුයි.– මේ දෞවාරික උපමාවෙන් මහන්තාලම්බණ වීථිය සැල කියයුතුයි.

ගාමදූර කොපමාව කෙසේයත්? බොහෝවූ ගම්දරුවෝ එක්රැස්ව ඇතුල්වීථියෙහි වැලිකෙළිමින් සිටියාහුය, ඔවුන් අතුරෙන් එක්තරා ගම්දරුවෙකුගේ හස්තයෙහි වැලි පෙරලන්නාවූ කල්හි රිදීමය කහවණුවක් ගැටෙයි. ඉක්බිති ඒ ළදරුතෙමේ මාගේ අතෙහි කුමක් වැටුණේදැයි විචාරයි. අනිත් ගම්දරුවෙක් ශ්වෙතවර්ණවූ එක්තරා වස්තුවෙකැයි කීයේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් තෙමේ ඒ ශ්වෙතවර්ණවූ වස්තුව වැලි හා සමග මිටමොළවාගත්තේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් පලල්වූ සතරැස් වස්තුවෙකැයි කීයේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් ඒ වස්තුව එක් කහවණුවක්යයි කීයේයි. ඉක්බිති ඒ කහවනුව මිටමොලවාගත් ගම්දරු තෙමේ වහාම ගෙටදුව අවුත් මව අතට දුන්නේයි. ඉක්බිති මව් තොමෝ ඒ කහවණුව අභිමත කටයුත්තෙක්හි යෙදූයේයි. බොහෝවූ ගම්දරුවෝ ඇතුල් වීථියෙහි වැලිකෙළිමින් හුන්කාවූ කාලයමෙන් චිත්ත වීථිහුගේ පැවැත්ම දතයුත්තීය. එක් ගම්දරුවෙකුගේ අතෙහි කහවණුව හැපුනුකලක් මෙන් ආලම්බණය ප්‍රසාදයෙහි හැටුනු කාලය දතයුතුයි මේ කිමෙක්දැයි කියනලද කාලයමෙන් ඒ අරමුණ එල්බගෙණ මනොවාරාවර්ජන චිත්තයාගේ භවාඞ්ගාවත්තිතකාලය දතයුතුයි. ඒ සුදෙකැයි කියනලදකාලයමෙන් චක්ෂුර්විඥානය විසින් දර්ශනකෘත්‍යය සිද්ධකරණකාලය දතයුතුයි. වැලි හා සමග දූකිකොට මිටමොලවාගත් කාලයමෙන් සම්ප්‍රත්‍ය

ෂණ චිත්තයාගේ අරමුණු පිළිගන්නාකාලය දතයුතුයි. ඒ පලල්වූ සතරැස් වස්තුවෙකැයි කියනලද කාලයමෙන් සන්තීරණ චිත්තයාගේ අරමුණු තීරණය කරගන්නාකාලය දතයුතුයි. ඒ සිදීකහවණුවකැයි නියමකොට කියනලද කාලයමෙන් ව්‍යවස්ථාපන චිත්තයාගේ අරමුණ නියමකරන්නාකාලය දතයුතුයි. ඉක්බිති මව විසින් අභිමතකර්මයෙහි යොදනා කාලය මෙන් ජවන් සත්දෙනාගේ ආලම්බණරසානුභවනකාලය දතයුතුයි. මේ ගාමදූරකොපමාවෙන් අතිමහන්තාලම්බණ මහන්තාලම්බණ වීථිදෙදෙනාගේ පැවැත්ම අවබොධ කටයුතුයි. මේ උපමා ත්‍රය අතුරෙන් අම්බොපමාව අභිධර්ම අනුටීකාවෙන්ද දොවාරිකොපමාව හා ගාමදූරකොපමාවද අභිධම්මත්ථවිභාවිනී නම්වූ අභිධර්මාවතාරටීකාවෙන්ද විස්තර කැමැත්තහු විසින් බලා අවබොධකටයුතුයි.

මනොද්වාරයහටගැණීමෙහි හෙතුව යට ප්‍රකීර්ණක නිර්දේශයෙහි කීනයින් දතයුතුයි. මනොද්වාරයෙහි අතීතභවාඞ්ගයන්ගේ ඉක්මීමවනාහි විසුදත්තිරූපමය, ලක්ෂණරූපසතරය, එකුන් අනුවස්චිත්තය යන මෙතෙක් ධර්මයෝ වනාහී අතීතානාගත වර්තමාන යන කාලයන් අතුරෙන් කොබඳු කාලයක අරමුණු කරන්නාහුනමුදු අතීතභවාඞ්ගනොවෙයි, විසුදත්තිරූපමය, ලක්ෂණරූපසතරය යනමේ සඳෙන වර්ජිතකොට ඇත්තාවූ දෙවිසිරූපයද, අතීත අනාගතකාලිකවූම අරමුණක් අරමුණු කරන්නේවීනම් අතීතභවාඞ්ග නොවියයුත්තේයි. ඒ දෙවිසි රූපය ප්‍රත්‍යුත්පන්නකාලික වශයෙන්ම අරමුණුකරන්නේ වීනම් අතීතභවාඞ්ගවියයුත්තේයි. මනොද්වාර වීථියෙහි විෂය ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාතවූ විප්‍රකාරවූ අරමුණු අතුරෙන් විභූතාලම්බණය යනු අතිශයින් ප්‍රකටවූ අරමුණ සඳහාම කීයයි. අවිභූතාලම්බණය යනු විභූතාලම්බණය ඇති බැවින්ම අවිභූතාලම්බණ යයි ව්‍යවහාර කෙරෙයි. ඉදින් අරමුණ හාත්පසින්ම නොමැට හෙන්නේවීනම් වීථිචිත්තයන්ගේ ඉපදීමෙක් නැත්තේය. යම් වර්ණායතනසඞ්ඛ්‍යාතවූ රූපාලම්බණයක් තෙමේ සම්ප්‍රකාරයෙන් හාත්පසින්ම චක්ෂුර්ද්වාරයෙහි වැටහුනේවීනම් එම අරමුණ මනොද්වාරයෙහි විභූතාලම්බණ නම්වෙයි හෙවත් ප්‍රකට අරමුණ නම්වෙයි. යම් රූපාලම්බණයක් තෙමේ එක දෙශයකින් චක්ෂුර්ද්වාරයට අරමුණුවූයේවීනම් එම අරමුණ මනොද්වාරයෙහි අවිභූතාලම්බණ නම්වෙයි. මනොද්වාරික විභූතාලම්බණ වීථියෙහි මනොද්වාරාවර්ජනචිත්තයක් ඉපිද තදනන්තරව ජවන් සතක්ද, තදනන්තරව තදාලම්බණ යුගලයක්ද ඉපිද විච්ඡේද අවසන්වෙයි.

අවිභූතාලම්බණ වීථියෙහි මනොද්වාරාවර්ජන චිත්තයක්ඉපිද තදනන්තරව ජවන්සතක් ඉපිද ඊට අනතුරුව භවාඞ්ගපාතය වන්නේයි. මේ විභූතා විභූත අරමුණුදෙක ප්‍රකට වශයෙන් දත හැකිම පිණිස උපමාවක් දක්වනුලැබේ. ඉල්මස පුරපසළොස්වක් දවස්හි රාත්‍රි භාගයෙහි අහසදෙස බලන්නාහට චන්ද්‍රමණ්ඩලය හා අවශෙෂ තාරකා රූපයන්ද පළමුකොට චක්ෂුද්වාරයෙහි ප්‍රත්‍යොත්පන්නකාලික වශයෙන් අතිමහන්තාලම්බණ හෝ මහන්තාලම්බණ හෝ යම් චිත්තවීථියක් ඉපිද මනොද්වාරයට වැටහෙන්නාවූ කල්හි චන්ද්‍රබිම්බය විභූතාලම්බණනම්වෙයි. තාරකාරූපයෝ අවිභූතාලම්බණනම්වෙත්. රහතුන් විසින් පිරිවරණලද්දාවූ තථාගතයන්වහන්සේ වීථියෙහි පිඬුසිඟාවඩිනා කල්හි සම්බුද්ධරූපය විභූතාලම්බණනම්වෙයි, අවශෙෂ රහතුන්ගේ රූපයෝ අවිභූතාලම්බණනම්වෙයි, මේ ක්‍රමයෙන් සියලු විභූත අවිභූත ආලම්බණයන්ගේ ක්‍රමය සැලකියයුතුයි.

## පදගතාර්ථ.

පන, පඤ්චද්වාරයෙන් අන්‍යවූ මනොද්වාරයෙහි කියම්:—මනොද්වාරෙ, අනන්තරාදි ප්‍රත්‍යයෙන් උපකාරලබන්නාවූ එකුන්විසිභවඞ්ග ප්‍රභෙද සඞ්ඛ්‍යාතවූ මනොද්වාරයෙහි; විභූතං, ප්‍රකටව වැටහෙන්නාවූ; ආලම්බණං, අරමුණුතෙමේ; ආපාථං, හමුබවට; යදි ආගච්ඡති, ඉදින් පැමිණේද; එවංසති, මෙසේ ඇතිකල්හි, තතො, ඒ වැටහීම හෙතුකොටගෙණ; තොහොත් තතොපරං, ඒ වැටහීමෙන් මත්තෙහි; භවඞ්ගචලන මනොද්වාරාවජ්ජන ජවනාවසානෙ, භවාඞ්ගචලනය මනොද්වාරාවර්ජනය, ජවන්ය යන මොවුන්ගේ කෙළවර; තදාලම්බණපාකානි තදාලම්බණවිපාක චිත්තයෝතුමූ; පවත්තන්ති, පවත්නේත්; තතොපරං, ඒ දෙවෙනි තදාලම්බණයාගේ නිරුද්ධයෙන් මත්තෙහි; භවඞ්ගපාතො හොති, භවාඞ්ගපාතයවෙයි; පන, විභූතාලම්බණවීථියෙන් අන්‍යවූ අවිභූතාලම්බණවීථිය කියම්:—අවිභූතෙ ආලම්බණෙ, අප්‍රකට අරමුණෙහි; ජවනාවසානෙ, ජවන් කෙළවර; භවඞ්ගපාතොව හොති, භවාඞ්ගයෙහි හීමමවේ. තදාලම්බණුප්පාදෙ, තදාලම්බණොත්පත්තියෙහි; නත්ථි, නැත්තේයයි; (වෙදිතබ්බං) දතයුත්තේයි.

එත්ථ, මේ මනොද්වාරයෙහි; (උපපන්නානි, හටගත්තාවූ) වීථිචිත්තානි, වීථිචිත්තයෝ; (අවිසෙසෙන, සාධාරණ වශයෙන්;) තීණෙව, තුන්දෙනෙක්මවෙත්යයි ඊරිතා, (ඊරිතානි) කියනලද්දාහුය; විසෙසතො, විශෙෂ වශයෙන්; චිත්තුප්පාද, (චිත්තුප්පාදවසෙන, චිත්තොත්පාදයන්ගේ වශයෙන් හෙවත් වෙන

වෙන්වූ චිත්තයන්ගේ වශයෙන්;) දසජ්ජිතා, (ජ්ජිතානි) එසෙ දෙනෙකැයි කියනලද්දහුය. පන, විශෙෂාර්ථයක් දක්වමි:- තොහොත් වුක්තකම්යෙන් අන්‍යවූ අනුක්තකර්මය දක්වමි:- තොහොත් අනුක්ත කතීංවෙන් අන්‍යවූ උක්තකතීංව දක්වමි:- පඬිතෝ එකචත්තාළීස විභාවයෙ යන තන්හි එකචත්තාළීස යනු අනුක්ත කර්මයි. පඬිතෝ යනු වුක්ත කර්තෘයි. විත්ථාරෙන යනුඅනුක්ත කතෘයි. විත්ථාරෙන, විස්තර වශයෙන්; එකචත්තාළීස, එක්සාළිසෙක්යයි; විභාවයෙ, ප්‍රකට කොට දක්වයි. එත්ථ, මේ විපිසඞ්ග්‍රහයෙහි; අයං, මේ කියලනද්දේ ම්‍ථනාහි; පරිත්ත ජවනවාරෙ, කාමාවචර ජවනයන්ගේ වාරයයි.

## භාවනාව.

පණු පලගැටි ආදී සතුන් හැසිරෙන්නාවූ මාර්ගයෙහි පස් දිසාවන්ට දූල්පසක් ඇද ඊමැදහුන් මකුළුතෙමේ වැදහෝනේය. මේ පස්දිසාවන් අතුරෙන් පළමුවන දිසාවෙහි අදිනාලද නූලෙහි පණුවෙක් හෝ මැස්සෙකු හෝ ගැටුනු කල්හි එහි හුන් මකුළු තෙමේ හුන්තැනින් මදක් සෙලවී සූත්‍රානුසාරයෙන් ගොස් ඒ පණුවාගේ හිසවිද ලේඋරා බොයි. නැවත අවුත් පළමුවැදහොත් දූලමැදම සහසු පරිද්දෙන් වැදහෝනේය. දෙවෙනි තුන්වෙනි සතරවෙනි පස්වෙනි දිසාවන්හිත් මෙසේම ඒ සූත්‍රයෙහි පණුවන් ආදී සතුන් ගැටුනුකල්හි පිළමු පරිද්දෙන් ගොස් ලේ උරා බොයි. මේ උපමාවෙහි පස්දිගව අදිනාලද නූල්මෙන් චක්ඛු සොත, ඝාණ, ජිව්හා, කාය යන පචප්‍රසාදයෝ දතයුත්තාහුය. මැදහොත් හුණ මකුළුවාමෙන් හෘදයවස්තුව නිසා පවත්නා භවාඞ්ගචිත්තය දතයුතුයි. පණුවන් ආදී සතුන් ඒ ඒ නූලෙහි හැපීමක් මෙන් චක්ඛුරූදී පචප්‍රශාදයෙහි රූපාදී පචාලම්බණයන් ගේ ගැටීම දතයුතුයි. ඒ මැදහුන් හුණ මකුළුවාගේ සැළීමක් මෙන් ප්‍රශාදඝට්ට්ටනයෙන්ද, එහි අරමුණුගෙන කි්‍රයා මනොධාතු සඞ්ඛ්‍යාතවූ පචවාරාවජ්ජන චිත්තය හා භවාඞ්ගයන්ගේ සෙරළීමද ඒ සූත්‍රානුසාරයෙන් හුණ මකුළුවාගේ ගමන මෙන් සමපටිච්ඡනාදී විථිචිත්තයන්ගේ ඉපදීමද දතයුතුයි, ඒ පණුවන් ආදීන්ගේ හිස්පලා ලේඋරාපීමක්මෙන් ආලම්බණරසානුභවන වශයෙන් ජවනයන්ගේ ඉපදීම දතයුතුයි. නැවත නූලදිගේ ආපසු අවුත් දූලමැද හෙවීමක් මෙන් හෘදය වස්තුව නිසාම භවාඞ්ගයාගේ හාත්පසින් පැවැත්ම ද දතයුතුයි. මේ උපමාව එනාහි චිත්ත විථීන්ගේ පවත්නා ආකාරය පහළ කරයි. පළමු කොට අරමුණෙන් ප්‍රශාද ඝට්ටනය වූකල්හි චක්ඛුරූදී ප්‍රශාදයන්ගෙන් හා හෘදය වස්තුවෙන්ද චිත්තයන්ගේ ඉපදීම දතයුතුයි. ඒ චිත්තයන් අතුරෙනුදු හෘදයවස්තුව නිසා පවත්නාවූ සමවාරාවජ්ජනචිත්තය පළමුකොට උපදනේයි, එක එක අරමුණ එනාහි වාර දෙකක

සියලු චක්ෂුරාදී ද්වාරයෙහි අරමුණුබවට පැමිණෙන්නේය යනමේ අර්ථයද මෙසේම පහදාකරයි. ඒ හමුබවට පැමිණීම මෙසේයි. රූපාලම්බනය චක්ෂුප්‍රසාදයෙහි ගැටීම හා සමගම මනොද්වාරයෙහිත් ගැටීම වන්නේයි. ඊට උපමා කවරයත්? සූර්යාලොකය පවත්නා කල්හි වෘක්ෂ ශාඛාවෙක්හි සැඟවෙන්නාවූ පක්ෂි තෙමේ ශාඛාග්‍රයෙහි වහනවා සමගම ඒ පක්ෂියාගේ ඡායාව බිම පැතිර තිබෙන්නාවූ වෘක්ෂ ශාඛා ඡායාවෙහිත් ඉදිරිපසු නොවී එකවිට ස්පර්ශවීම නොහොත් ගැටීම වන්නේයි. ඒ ශාඛාවේ ගැටීම හා ඡායාවේ පැතිරයාමත් ඉදිරිපසු නොවී එකවිට සිඬවෙයි. එසේම රූපයහා ප්‍රසාදසට්ටනයෙන් හෘදයවස්තුව නිසා පවත්නා භවාඞ්ග චිත්තයාගේ සැළීමත් අර්ථයෙන් හා ප්‍රත්‍යයෙනුත් සමානමැයි. එසේම මනොද්වාරයෙහි හමුවීමද ඉදිරිපසු නොවී එකක්ෂණයෙහි සිඬවන්නේයි. ඊටපසු භවාඞ්ගවෙගය සිඳී; චක්ෂුද්වාරයෙහි ක්‍රමයෙන් පඤ්චද්වාරාවර්ජනචිත්තය උපන්කල්හි චක්ෂුර්විඥානචිත්තය හා සම්පටිච්ඡනචිත්තයද සන්තීරණචිත්තය හා ව්‍යවස්ථාපන චිත්තයද ක්‍රමයෙන් ඉපිද චතුශ්චක්‍ර සම්පත්තීන්ගේ හේතුවෙන් යොනිසොමනසිකාරය ලැබ කුසල් ජවනයන්ද චතුශ්චක්‍ර සම්පත්තීන්ගේ විපත්තියෙන් අයොනිසොමනසිකාර හේතුවෙන් අකුශල් ජවන්ද ත්‍රිකුශල සන්තාන හේතුවෙන් හෙයිත් රහතුන්ගේ සන්තානයෙහි ඉපදීමෙන් ක්‍රියා ජවන්ද උපදනාහුවෙති. මෙසේ චක්ෂුද්වාරික චිත්ත වීථියට අනතුරුව එම අරමුණ අතීත කාලික වශයෙන් ගෙණ මනොද්වාරයෙහි මනොද්වාරාවර්ජනය, ජවන්සතය තදාලම්බන දෙසිතය යන තුදුස් චිත්තයකින් යුක්තවූ මනොද්වාරික චිත්ත වීථියක් උපදනේයි. පඤ්චද්වාරිකචිත්තවීථි හෝ අධිසාධක නොවන්නාවූ මනොද්වාරික වීථියෙහි හෝ උපදනා ජවනයන්ගේ ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්මුත් ප්‍රතිසන්ධි විපාක නොදියහැක්කේයි. කෙවත් දන්දෙමියි සිතුපමණකින් හෝ සතෙක් මරමියි සිතු පමණකින් හෝ උපදනා ජවන පිළිබඳවූ කර්මයන්ට ප්‍රතිසන්ධි විපාක නොදියහැක්කේයි. ඒ සිතු නියාවෙන් දන්දෙන්නාවූ ප්‍රස්තාවෙහි හෝ සත්ඝාතනය කරන්නාවූ ප්‍රස්තාවෙහි හෝ උපදනා අධිසාධක ජවන වීථියෙහි පළමුවන ජවන චිත්ත සම්ප්‍රයුක්තවූ කර්මය ආසෙවන ප්‍රත්‍යයෙන් ශක්තිමත් නොවූ හෙයින් ප්‍රතිසන්ධිවිපාක නොදියහැකිබැවින් ඒ කර්මය සිඬකළාවූ පඤ්චස්කන්ධයටම අහෙතුකප්‍රවෘත්තිවිපාක මාත්‍රයක් දෙයි. ඒ කර්මය දිට්ඨධම්මවෙදනීය කර්මනම්වේ. සත්වන ජවන් තෙමේ මුල ජවන් සයකින් ආසෙවන ප්‍රත්‍යය ලැබූ බැවින් අතිශයින් ශක්තිමත්ව

මිට අනතුරු අත්බැවෙහි පටිසන්ධිවිපාක හා ප්‍රවෘත්ති විපාකත් දෙන්නේවෙයි. ඒ උපපද්‍ය වේද්‍යකර්මයි. මැද ජවන්පස සම්බන්ධවූ කර්ම පස කටත්තා කර්මනම් වෙයි. හෙවත් කල්ප පමණකින් කර්ම සඞ්ඛ්‍යාවට පැමිණි බැවින් තුන්වෙනි අත්බැව පටන් ස්කන්ධපරිනිර්වාණය දක්වා කල්ප කෝටි ලක්ෂ ගණන් ඇවෑමෙනුදු අවකාශලැබූ කල්හිම පටිසන්ධි ප්‍රවෘත්ති උභය විපාකයම දෙන්නාහු වෙති. මේ චක්ෂුද්වාරයට කීනයින් ශ්‍රොත්‍රද්වාර මනොද්වාර දෙක්හිද ඝ්‍රාණද්වාර මනොද්වාර දෙක්හිද, ජිව්හාද්වාර මනොද්වාර දෙක්හිද, කායද්වාර මනොද්වාර දෙක්හිද, කර්මවීථි කර්මපථ වීථීන්ගේ පැවැත්ම යථා ක්‍රමයෙන් දතයුත්තාහුය. අභිසාධකනොවී නම් කර්ම වීථි වශයෙන්ද, අභිසාධක වීනම් කර්මපථවීථි වශයෙන්ද, අභිදතයුතුයි. පඤ්චද්වාරයෙහි කිසිකලෙකත් අභිසාධක වීථි නූපදනා බව මනොද්වාරයෙහි අභි සාධක අසාධක වශයෙන් දෙයාකාර වීථිහුම පවත්නා බවද දතයුතුයි.

## මේ පරිත්ත ජවනවාරයයි.

## පදගතාභී.

පන, කාමාවචර ජවන වාරයෙන් අන්‍යවූ අර්පණා ජවන වාරය කියමි:- අප්පණා ජවණවාරෙ, අර්පණා ජවනයාගේ වාරයෙහි; විභූතා විභූතභෙදො නත්ථි, ප්‍රකට අරමුණය, අප්‍රකට අරමුණය යන විශෙෂයක් නැත්තේයි. තථා, එපරිද්දෙන්; තදාලම්බණුප්පාදොච, තදාලම්බණයාගේ හටගැණීමෙක්ද; නත්ථි, නැත්තේයි. හි, ඒ අර්ථය විස්තර කෙරෙමි:- අප්පණා ජවන වාරෙ, අර්පණා ජවනයාගේ වාරයෙහි අට්ඨඤාණ සම්පයුත්තකාමාවචර ජවනානං, ඥානසම්ප්‍රයුක්තවූ කාමාවචර ජවනයන් අට දෙනා අතුරෙන්; අඤ්ඤතරස්මිං, එක්තරා ජවනයක්තෙමේ; පරිකම්මොපචාර අනුලොම ගොත්‍රභූනාමෙන, පරිකර්මය උපචාරය අනුලොමය ගොත්‍රභූය යන නමින්; චතුක්ඛත්තුංවා, සතරවරක් හෝ; තික්ඛත්තුමෙවවා, තුන්වරක්ම හෝ; යථාක්කමං, පිළිවෙළින්; උප්පජ්ජිත්වා නිරුද්ධෙ, ඉපිද නිරුද්ධවූකල්හී; නිරුද්ධානන්තරමෙව, ඒ නිරුද්ධවීමට අනතුරුවම හෙවත් ඒ නිරුද්ධවූ චිත්තයාගේ අනන්තර ප්‍රත්‍යය ඇතිවම; යථාරහං, ක්ෂිප්‍රාභිඥ දන්ධාභිඥ පුද්ගලයන් කෙරෙහි සුදුසු පරිද්දෙන්; චතුත්ථංවා, සතරවැනිව හෝ; පඤ්චමංවා, පස් වැනිව හෝ; ඡබ්බිසති මහග්ගත ලොකුත්තර ජවනෙසු, ෂඩ්විංශති මහද්ගත ලොකොත්තර ජවනයන් අතුරෙන්; යථාභිනීහාරවසෙන, ප්‍රාර්ථනාකල පරිද්දෙන් රූපාරූප ලොකොත්තර මාර්ගඵලයන්ට සුදුසුවූ සමථ විදර්ශනා භාවනාවන්ගේ වශයෙන්; යංකිඤ්චිජවනං, යම් කිසි

ජවනයක් නොවේ; අප්පණාවීථිං, අර්පණාවීථියට; ඔතරති, බස්නේයි. තතොපරං, ඒ අර්පණාවීථියට බැසීමෙන් මත්තෙහි; අප්පණාවසානෙ, අර්පණාජවන් කෙළවර, භවඞ්ගපාතොව හොති; භවාඞ්ගයෙහි හීමම වෙයි. තත්‍ර, ඒ අර්පණාජවන් වාරයෙහි නොහොත් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ජවනුන් අටදෙනා අතුරෙන්, සොමනස්ස සහගත ජවනානන්තරං, සොමනස් සහගිය ඥාන සම්ප්‍රයුක්ත සතරකාමාවචර ජවනුන්ට අනතුරුව; අප්පණාපි, අර්පණාවද, සොමනස්ස සහගතාව, සොමනස් සහගිය අර්පණාවෙක්ම; පාටිකංඛිතබ්බා, පැසැස්සයුත්තීය. උපෙක්ඛා සහගත ජවනානන්තරං, උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සතරකාමාවචර ජවනුන්ට අනතුරුව; අප්පණාපි, අර්පණාවද; උපෙක්ඛා සහගතාව, උපෙක්ෂා සහගිය අර්පණාවෙක්ම; පාටිකංඛිතබ්බා, පැසැස්සයුත්තීය. තථාපි, යනු "තස්මිං එකවෙදනා ජවනවාරෙ අපි" යනාදියයි. ඒ සඳහා වෙදනා ඇත්තාවූ ජවනයාගේ වාරයෙහිද; කුසල ජවනානන්තරං, ඥානසම්ප්‍රයුක්ත මහා කුශලයන් සතරදෙනාට අනතුරුව; කුසල ජවනමෙව, මහද්ගතවූ හෝ ලොකොත්තරවූ කුශල ජවනයෙක්ද; හෙට්ඨිමං, යටභාගයෙහිවූ; ඵලත්තයම, ඵලජවනයන් තුන්දෙනාගේ සමූහයෙක්ද; අප්පෙති, "අප්පණාවසෙන උප්පජ්ජති," යනාදියයි. අර්පණාවශයෙන් උපදී. ක්‍රියා ජවනානන්තරං, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන් සතරදෙනාට අනතුරුව; ක්‍රියාජවනම, මහද්ගත ක්‍රියා ජවනයෙක් හෝ අරහත්තඵලම, අර්හත්ඵල ජවනයෙක් හෝ; අප්පෙති, අර්පණා වශයෙන් උපදී. ඉති (වෙදනාභෙදො) මෙසේ දතයුත්තේයි.

සුඛපුඤ්ඤම්හාපරං, සොමනස් සහගත ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුශල ජවනයන් දෙදෙනාගෙන් මත්තෙහි; චතුත්තිංස අප්පණා, දෙතිස් අර්පණා ජවනකෙනෙක් තුමූ; සම්භවන්ති, පහළවෙත්. උපෙක්ඛකාපරං, උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුශලයන් දෙදෙනාගෙන් මත්තෙහි; ද්වාදස අප්පණා, දොළොස් අර්පණාජවන් කෙනෙක්තුමූ; සම්භවන්ති, හටගනිත්. සුඛිතක්‍රියතොපරං, සොමනස් සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන් දෙදෙනාගෙන් මත්තෙහි; අට්ඨ අප්පණා, අර්පණා ජවනයෝ අටදෙනෙක්තුමූ; සම්භවන්ති, හටගණිත්. උපෙක්ඛකාපරං, උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා දෙදෙනාගෙන් මත්තෙහි; ඡ අප්පණා, අර්පණා ජවනයෝ සදෙනෙක් තුමූ; සම්භවන්ති, හට ගණිත්. පුථුජ්ජනානංච, ත්‍රිහෙතුක

පෘථග්ජන පුද්ගලයන්ටද; සෙක්ඛානං, යටඵලස්ථ ආර්‍ය්‍යපුද්ගලයන් තුන්දෙනාහටද, කාමපුඤ්ඤතිහෙතුතොපරං, ත්‍රිහෙතුක කාමාවචර කුශලයන් සතරදෙනාගෙන් මත්තෙහි; චතුචත්තාළීසඅප්පණා, සුසාලිස් අර්පණාජවන් කෙනෙක්තුමූ; සම්භවන්ති, හටගණිත්. වීතරාගානං, රහතුන්ගේ; තිහෙතුකාමක්‍රියතො, ත්‍රිහෙතුක කාමාවචරක්‍රියා සතරින් මත්තෙහි; චුද්දස අප්පණා, තුදුස් අර්පණා ජවන්කෙනෙක්තුමූ; සම්භවන්ති, හටගණිත්. එත්ථ, මේ වීථි සංග්‍රහයෙහි; අයං, මේ කියනලද්දේ වනාහි; මනොද්වාරෙ, මනොද්වාරයෙහි; වීථි චිත්තප්පවත්තිනයො, වීථි චිත්තයන්ගේ හටගන්නා ක්‍රමයයි.

## භාවාර්ථ.

අර්පණා ජවනවාරයෙහි විභූත අවිභූත භේදයක් කුමක් හෙයින් නැත්තේද යත්? අර්පණාජවනය වනාහි හාත්පසින් ප්‍රකටවූ අරමුණෙහි ඉපදිය යුතුහෙයින් අප්‍රකට අරමුණ කිසිසේත් අර්පණාවාරයෙහිම නොයෙදෙයි. “අප්පණාය” යනු “ආරම්මණං අප්පෙති පාපෙතීති අප්පණා” යනු නිර්වචන බැවින් සසම්ප්‍රයුක්තවූ චිත්තය අරමුණට පමුණුවන හෙයින් අර්පණායයි ව්‍යවහාරකෙරෙත්. අර්පණාය යනු විතර්කයාගේ පර්‍ය්‍යාය විශෙෂයකි. සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ගේ පූර්වභාගයෙහි පළමුකොට ප්‍රථමධ්‍යානය ඉපදවිය යුතුවෙයි, ඒ ප්‍රථම ධ්‍යානය පචවසිතාවන්ගෙන් පුරුදුකොටගෙණ ඒ ප්‍රථම ධ්‍යානයාගේම උපකාරයෙන් අෂ්ටසමාපත්තීහුම ඉපදවිය යුත්තාහුවෙත්. එපරිද්දෙන්ම ප්‍රථම ධ්‍යානය පටන් චතුර්ථ ධ්‍යානය දක්වා රූපාවචර සියලු ධ්‍යානයන් උපදවා පචවශිතාවන්ගෙන් පුරුදුකොටගෙණ නැවත චතුර්ථ ධ්‍යානයෙන්ම පචාභිඥාවෝද ඉපදවියයුත්තාහුය. ඒ ප්‍රථම ධ්‍යානාදී ධ්‍යානයට සමවැද එයින් නැගී ධ්‍යාන පාදකකොට හෝ සම්මර්ශනයකොට හෝ පුද්ගල ධ්‍යාශයවශයෙන් හෝ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් සම්මර්ශනයකොට සෝවාන් ආදී මාර්ගඵල තෙමේ ඉපදවියයුත්තේවේ. නැවත ඒ ප්‍රථම ධ්‍යානය පටන් අෂ්ටසමාපත්තීන්ට ක්‍රමයෙන් සමවැද නෛවසංඥානාසංඥායතන ධ්‍යානයට දෙවරක් සමවැද චිත්ත ප්‍රවෘත්තිය නිරුද්ධකිරීමෙන් සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවදී. මෙසේ ප්‍රථම ධ්‍යානය ආදිකොට නිරොධ සමාපත්තිය අවසන්කොට ඇත්තාවූ සියලු උත්තරි මනුෂ්‍ය ධර්මයන්ට විතර්ක සංඛ්‍යාතවූ අර්පණාව ප්‍රධාන ධර්මයවෙයි. එහෙයින් සියලු උත්තරි මනුෂ්‍ය ධර්මයන්ට ප්‍රධානත්‍වයවශයෙන් අර්පණායයි ව්‍යවහාරකෙරෙත්.

ඒ අර්පණා ජවන තෙමේ ඥානසම්ප්‍රයුක්ත විප්‍රයුක්ත දෙදෙනා අතුරෙන් ඥාන සම්ප්‍රයුක්ත ජවනයක්ම වියයුතුයි අසංඛාරික සසංඛාරික දෙදෙනා අතුරෙන් අවිශෙෂවශයෙන් අසංඛාරිකත්වෙයි. සසංඛාරිකත්වෙයි. ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර ජවන් අටදෙනාය යනු ඥානසම්ප්‍රයුක්ත මහාකුසල් සතරය, ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා සතරය යන අටදෙනා අතුරෙන් යම්කිසි ජවනයක් අර්පණා වීථියෙහි උපදනේයි. ඔවුන් අතුරෙ නුදු ත්‍රිහෙතුක පෘථග්ජනයන්හා සොවාන් සකෘදාගාමි අනාගාමි යන ශෛක්ෂ්‍යයන්ටද අර්පණාවනකල්හි ත්‍රිහෙතුක කුශල යන් සතරදෙනා අතුරෙන් එකක් හෝ රහතුන්ට අර්පණා උපදනාකල්හි ත්‍රිහෙතුක ක්‍රියා ජවන් සතරදෙනා අතුරෙන් එකක් හෝ සුදුසු පරිද්දෙන් උපදනේයි. පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යන සතර නාමයෙන් ව්‍යවහාරකරන්නේ නමුදු ස්වභාවයෙන් කාමාවචර කුශල් හෝ ක්‍රියා හෝ වෙත්. පළමුවන සිත පරිකර්මයයි කුමක්හෙයින් ව්‍යවහාරකරන්නේද යත්? ධ්‍යාන මාර්ගඵල සංඛ්‍යාතවූ අර්පණාව සකස්කරණහෙයින් පළමුවන සිත පරිකර්මයයි ව්‍යවහාරකරත්. උපචාරය යනු අර්පණාවට සමීපයෙහි හැසිරෙන හෙයින් උපචාරයයි ව්‍යවහාර කෙරෙත්. අර්පණාවට සමීපවූ චිත්තය ගොත්‍රභූචිත්තය නොවේද, ඒ සිතට උපචාරයයි ව්‍යවහාර නොකොට අනුලොම ගොත්‍රභූ යන දෙසිතකට පූර්වයෙහිවූ චිත්තයට උපචාරයයි කුමක්හෙයින් ව්‍යවහාර කරන්නේදයත්? ඉතා නුදුරුවූද ඉතා නොලංවූද චිත්තයත් උපචාරයයි ව්‍යවහාර කටයුතු හෙයින් උපචාර චිත්ත යයි, මෙහි ව්‍යවහාර කරත්. අනුලොම චිත්තය යනු අනුරූපවූ හෙවත් යොග්‍යවූ චිත්තය යන අර්ථයි. කෙසේ අනුරූපවන්නේදයත්? ඉදින් අනුලොම චිත්තය සොම්නස් සහගතවීනම් පෙර පසුව උපදනා පරිකර්ම අර්පණාවෝද සොම්නස් සහගතම වෙති. ඉදින් අනුලොම චිත්තය උපෙක්ෂා සහගතවීනම් පෙර පසු උපදනා පරිකර්ම අර්පණා චිත්තයෝද උපෙක්ෂා සහගතම වෙති. මෙසේහීම සුදුසුවූ අනුරූපභාවය නම් වෙයි. "ගොත්‍රභූ චිත්තය" යනු ගොත්‍රය මැඩපවත්වන හෙයින් නොහොත් දිවුණු කාරණ හෙයින් ගොත්‍රභූ නම් වෙයි. ධ්‍යානයට පූර්වභාගයෙහි උපදනා ගොත්‍රභූ චිත්තය කාමාවචර ගොත්‍රය මැඩපවත්වන හෙයින්ද මහග්ගත ගොත්‍රය දියුණුකරණ හෙයින්ද ගොත්‍රභූ නම් වෙයි. මාර්ගයට පූර්වභාගයෙහි උපදනා ගොත්‍රභූචිත්තය පෘථජ්ජන ගොත්‍රය මැඩපවත්වන හෙයින්ද ආර්ය ගොත්‍රය දිවුණුකරණ හෙයින්ද සෝවාන් මාර්ගයට පෙර වූව උපදනා චිත්තය ගොත්‍රභූයයි ව්‍යවහාර කෙරෙත්. ඒ සොතාපත්තිමාර්ග ක්ෂණයෙහි දර්ශනගත සම්ප්‍රයුක්තාදිවූ සතර

අපායෙහි උපදවන්නාවූ අකුශල චිත්තයන් නිරවශෙෂප්‍රහාණ යෙන් නසා පවිත්‍රවූ හෙයින් ශකෘදගාමි අනාගාමි අර්හත් යන මාර්ගත්‍රයට පූර්වභාගයෙහි උපදින චිත්තයන් තුන්දෙන වොදාන චිත්තයන්යයි ව්‍යවහාර කෙරෙත්. සතරමාර්ග වීථියෙහි උපදනා අනුලොම චිත්ත සම්ප්‍රයුක්තවූ ප්‍රඥා චෛතසිකය අනුලොම ඥානය සච්චානුලොමික ඥානය මස්තක ප්‍රාප්ත විදර්ශනා ඥනය වුඨාන ගාමිනී විදර්ශනා ඥනය සඞ්ඛාරෝපෙක්ෂා ඥනය යනාදී නොයෙක් නමින් ව්‍යවහාර කෙරෙත්. ධ්‍යාන වීථියෙහි උපදනා එම අනුලොම චිත්ත සහගතප්‍රඥා චෛතසිකය දිබ්බාභිඤ්ඤය බිප්පාභිඤ්ඤය යනාදී නමින් ව්‍යවහාර කෙරෙත්. මේධ්‍යාන මාර්ග වීථියෙහි උපදනා අනුලොම ගොත්‍රභූ චිත්තයන්ගේ විශෙෂයි.

———(⌓)———

## පදගතාර්ථ.

පන, ජවනවාරයෙන් අන්‍යවූ තදලම්බණ වාරය දක්වම්:- එත්ථ, මේ පඤ්චද්වාර මනොද්වාරයෙහි; සබ්බථාපි, අති මහන්තාදී සියලු විෂය ප්‍රවෘත්ති ආකාරයෙන්ද නොහොත්; එත්ථ, මේ වීථි සංග්‍රහයෙහි; සබ්බථාපි, සියලු පඤ්චද්වාර මනොද්වාර යෙහිද; අනිට්ඨෙ ආලම්බණෙ, නොකැමතිවනලද අමෙධ්‍යපූතබ කුණපාදී අරමුණෙහි; අකුසල විපාකානෙව; අකුශල විපාකවූම; පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදලම්බණානි, පඤ්චවිඥනය සම්පටිච්ඡනය සන්තීරණය තදලම්බණය යන මොහු; භවන්ති, වෙත්. ඉට්ඨෙ, කැමතිවනලද්දවූ; ආලම්බණෙ, ආහාර පාන සයනාසන වස්ත්‍රාභරණාදීවූ අරමුණෙහි; කුසල විපාකානි, කුශල විපාකවූ; පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදලම්බණානි, පඤ්චවිඥානය සම්පටිච්ඡනය සන්තීරණය තදලම්බණය යන මොහු; භවන්ති, වෙත්. පන, අත්‍යාන්තර පක්ෂයක් දක්වම්- අති ඉට්ඨෙ, අතිශයින් කැමතිවනලද්දවූ; ආලම්බණෙ, බුද්ධප්‍රතිමා චෛත්‍ය භික්ෂු ආදී අරමුණෙහි; සොමනස්ස සහගතානෙව, සොම්නස් සහගියාවූම; සන්තීරණ තදලම්බණානි, සන්තීරණ තදලම්බණයෝ තුමූ; භවන්ති, වෙත්. තත්ථාපි, ඒ එකොළොස් තදලම්බණයන් අතුරෙ තුඩු සොමනස්ස සහගත ක්‍රියා ජවනාවසානෙ, සොම්නස් සහගතවූ ක්‍රියා ජවනුන්ගේ කෙළවර; සොමනස්ස සහගතානෙව, සොම්නස් සහගියාවූම; තදලම්බණානි භවන්ති, තදලම්බණයෝවෙත්. උපෙක්ඛා සහගත ක්‍රියාජවනාවසානෙව, උපෙක්ෂා සහගිය ක්‍රියා ජවනුන්ගේ කෙළවරද; උපෙක්ඛා සහගතානි හොන්ති, උපෙක්ෂා සහගතවූ තදලම්බණයෝ වෙත්. පන, ජවනයෙන් තදලම්බණයම නියමකිරීමෙන්

අන්‍යවූ ජවනයෙන් තදාලම්බණ භවාඞ්ගදෙක නියමකරන්නාවූ පක්ෂය දක්වමි:-දෞමනස්‍ය සහගත ජවනාවසානෙච, දොම්නස් සහගිය ජවනුන්ගේ කෙළවරද; උපෙක්ඛා සහගතානෙව, උපෙක්ෂා සහගියාවූම; තදාලම්බණානිචෙව, තදාලම්බණයෝද; භවඞ්ගානිච, භවාඞ්ගයෝද; යස්මා භවන්ති, යම්හෙයකින් වෙත්ද, තස්මා, එසේහෙයින්; සොමනස්‍ස පටිසන්ධිකස්‍ස, සොම්නස් සහගිය විපාක සිතින් පිළිසිඳගත් පුද්ගලයාහට; දෞමනස්‍ස ජවනාවසානෙ, දොම්නස් සහගිය ජවනුන්ගේ කෙළවර; තදාලම්බණ සම්භවො, තදාලම්බණයන්ගේ හටගැනීමෙක්; යදි නත්ථි, ඉදින් නැත්තේවේද; එවංසති, මෙසේ ඇතිකල්හි, තදා, එකල්හී; පරිචිත පුබ්බං, පුරුදුකරණලද වීරූ; යංකිඤ්චි පරිත්තාලම්බණං, යම්කිසි කාමාවචර අරමුණක්; ආරබ්භ, අරබයා; උපෙක්ඛා සහගත සන්තීරණං, උපෙක්ෂා සහගිය සන්තීරණ සිත් තෙමේ; උප්පජ්ජති; උපදනේයි. තං, ඒ උපෙක්ෂා සහගත ආගන්තුක භවාඞ්ග චිත්තය; අනන්තරිත්වා, අනතුරු කොට, භවඞ්ගපාතොවහොති, සොම්නස් භවාඞ්ගපාතයම වෙයි. ඉති, මෙසේ; ආචරියා, අර්ථකථාචාර්‍යවරයෝ තුමූ; වදන්ති, කියත්. තථා, එපරිද්දෙන්; කාමාවචර ජවනාවසානෙ, කම්වැදරි ජවන් කෙළවර; කාමාවචර සත්තානං, කම්වැදරි සත්වයන්ට; ආලම්බණභූතෙසු, අරමුණුවූ; කාමාවචර ධම්මෙසුච, කම්වැදරි ධර්මයෙහිම; තදාලම්බණං ඉච්ඡන්ති, තදාලම්බණය පසසිත්. ඉති වෙදිතබ්බං, මෙසේ දතයුත්තේයි.

කාමෙ, එකොළොස් කාමභූමියෙහි; (පවත්තානං) හට ගත්තාවූ; ජවන සත්තාලම්බණානං, ජවනය සත්වය ආලම්බණය යනමොවුන්ගේ; තීසු අඞ්ගෙසු, තුන් අඞ්ගයන් කරණකොට ගෙණ; නියමෙ සති, නියමය ඇතිකල්හි; විභූතෙච, විභූතාලම්බණයෙහිද; අතිමහන්තෙච, අතිමහන්තාලම්බණයෙහිද; තදාලම්බණං, තදාරම්මණය, ඊරිතං, කියනලද්දේයි. එත්ථ, මේ චිත්ත සඞ්ග්‍රහයෙහි; අයං, මේ කියනලද්දේවනාහි; තදාලම්බණනියමො, තදාලම්බණයන්ගේ නියම ක්‍රමයයි.

## භාවාර්ථ.

තදාලම්බණ නියමයෙහි දක්වනලද්දාවූ ඉෂ්ටාලම්බණ අතිඉෂ්ටාලම්බණ විශේෂය යට ප්‍රථම පරිච්ඡෙදයෙහි අහෙතුකාධිකාරයෙන්ද දතයුතුයි. අනිෂ්ටවූ හෙවත් නොකැමතිවූ අරමුණක් වූයේනම් චක්ෂුරාදී ද්වාරයෙහි උපදනා චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝ තුමූ අකුශල විපාකම වෙති.

හෙවත් සංසාරයෙහි රැස්කරණලද්දාවූ අකුශල කර්මයන්ගේ විපාකවශයෙන් ඒ චිත්තයෝ පහළවෙති. ඉදින් චක්‍ෂුරාදී පඤ්චද්වාරයෙහි ගැටෙන්නාවූ රූපාදී අරමුණු ඉෂ්ටාලම්බනවූවාහු නම් චක්‍ෂුරාදී පඤ්චවිඥානද හා සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝද කුශල විපාකමවෙති. හෙවත් සංසාරයෙහි රැස්කරණ ලද්දාවූ කාමාවචර කුශල කර්මයන්ගේ විපාකමවෙති. ඒ චිත්ත වීථි අවසානයෙහි උපදනා තදාලම්බන චිත්තයෝද අනිෂ්ටාලම්බන වීථියක්වීනම් අකුශල විපාකවූ උපෙක්ඛාසන්තීරණ චිත්තය තදාලම්බනවශයෙන් උපදී. ඉදින් ඒ අරමුණ ඉෂ්ට මධ්‍යස්ථාලම්බනයක්වීනම් ඒ චිත්ත වීථි අවසානයෙහි උපදනා තදාලම්බන චිත්තයෝ කුශල විපාක උපෙක්ඛාසන්තීරණ චිත්තය හෝ උපෙක්ඛා සහගත මහා විපාක සතර හෝ යනමේ විපාක පසින් යම් විපාකයෙක් තදාලම්බනවශයෙන් උපදී. ඉදින් බුද්ධාදී අති ඉෂ්ටාලම්බනයක් ගැටුනේවීනම් චිත්ත වීථියෙහි මූල උපදනා සන්තීරණ චිත්තයද සොම්නස් සහගත සන්තීරණයමවෙයි. ඒ වීථි අවසානයෙහි තදාලම්බනවියයුතු නම් එම සොම්නස් සහගත සන්තීරණ චිත්තය හෝ සොම්නස් සහගත මහාවිපාක සතර හෝ යනමේ පසින් එක්තරා චිත්තයක් තදාලම්බනවශයෙන් උපදී. එතකුදුවුවත් ලෝභ මූලික ජවන් අටය, මෝහ මූලික ජවන් දෙදෙනාය මහාකුශල් ජවන් අටය යන අටළොස් ජවනයන් අතුරෙන් යම්කිසි ජවනයක් ජවන්වශයෙන් දිවූකල්හි අසවල් විපාක චිත්තයම තදාලම්බනවශයෙන් උපදනේය යන නියමයක් නැත්තේයි. කුමක්හෙයින යත්? ඒ ජවනයෝ තුමූ පෘථග්ජන ශෛක්‍ෂ්‍ය සන්තානයෙහිම උපදනාහෙයිනැයි දතයුතුයි. පෘථග්ජනවූ තීර්ථකයන්ට බුද්ධාදී අති ඉෂ්ටාලම්බනයෙහි පවා දොම්නස් සහගත ජවන් උපදී. සුනඛාදීන්ට වනාහි ගෙරිකුණු අශුචි ආදිවූ අනිෂ්ටාලම්බනයෙහි පවා සොම්නස් සහගත ජවන් උපදී. කුමක්හෙයින යත්? සඤ්ඤාවිපල්ලාස චිත්ත විපල්ලාස දිට්ඨිවිපල්ලාස යනාදී විපල්ලාසයන් ඇතිහෙයින් පෘථග්ජනයන්ටද සංඥාදී විපර්‍ය්‍යාස නැතිහෙයින් ශෛක්‍ෂ්‍ය පුද්ගලයන්ටද ජවනයෙන්ම තදාලම්බන නියමය නොකටහැක්කේයි. එහෙයින් සොම්නස්සහගත හසිතොත්පාද චිත්තය හෝ සොම්නස්සහගත මහාක්‍රියා ජවන් හෝ දිවූ කල්හි සොම්නස් සහගත තදාලම්බනයක්ම එකාන්තයෙන් උපදනේයයි නියම කළහැක්කේයි. එසේම උපෙක්ෂාසහගත ක්‍රියා ජවනයන් දිවූ කල්හි උපෙක්ෂාසහගත තදාලම්බන සඳෙනා අතුරෙන් එක්තරා තදාලම්බනයක්ම නියම වශයෙන් උපදනේයි. ඥානසම්ප්‍රයුක්ත

මහාක්‍රියා ජවනයන්ට අනතුරුව, ඥානසම්ප්‍රයුක්ත මහා විපාකයක්ම තදාලම්බණ වශයෙන් උපදී. ඥානවිප්‍රයුක්ත මහාක්‍රියා ජවනයන්ට අනතුරුව ඥානවිප්‍රයුක්තවූ තදාලම්බණයක්ම උපදී. එසේම සසංස්කාරික අසංස්කාරික ක්‍රියා ජවනයන්ට අනතුරුව සසංස්කාරික අසංස්කාරික තදාලම්බණයෝම උපදනාහුය. මේ හසිතුප්පාද මහාක්‍රියාවන්ට අනතුරුවම ඒ ජවනයන්ට සුදුසුවූ තදාලම්බණයන්ම ඉපදීම කුමක්හෙයින් වන්නේදයත්? හසිතුප්පාද මහාක්‍රියා ජවනයෝ වනාහි බුදුන් රහතුන්ටම උපදනා හෙයිනි. ඒ බුදුන් රහතුන්ට වනාහි සංඥා විපල්ලාසාදී පඤ්චවිපල්ලාසයන් නැතිහෙයින් කිසිකලෙකත් ඉෂ්ටාලම්බණය අනිෂ්ට වශයෙන් හෝ අනිෂ්ටාලම්බණය ඉෂ්ටයකියා හෝ ඉෂ්ටාලම්බණ අනිෂ්ටාලම්බණ දෙක්හිම සංඥාවිපල්ලාසාදිය නොවනහෙයින් කිසිකලෙකත් ජවනයට විරුද්ධවූ තදාලම්බණොත්පත්තියක් බුදුන් රහතුන්ට නැත්තේයයි දතයුතුයි. උපෙක්ෂාසහගත ප්‍රතිසන්ධි චිත්තයෙන් පිළිසිඳගත්තාවූ පුද්ගලයෙක්හට ඉෂ්ටමධ්‍යස්ථවූ අරමුණක් එල්බගෙණ ලෝභමූලික ජවනයෙක්වීනම් තදාලම්බණයන්ගේ හටගැණීමට සුදුසුවූ ආයුෂ ඇත්තේවීනම් උපෙක්ෂාසහගත තදාලම්බණයක්වෙයි. තදාලම්බණයන්ගේ හටගැණීමට ආයුෂ නොපොහොනේවීනම්. උපෙක්ෂාසහගත භවාඞ්ගමවෙයි. මෙසේ ඇතිකල්හී අරමුණහා පටිසන්ධිචිත්තයද ජවනයද ඔවුනොවුන්ට ගැලපෙන්නේයි. ඒ උපෙක්ෂාසහගත පටිසන්ධි ඇත්තාවූ පුද්ගලයෙක්හටම අති ඉෂ්ටාලම්බණයක් හමුවී ලෝභමූලික ජවන්වූවාහුනම් තදාලම්බණවීමට අවකාශ ඇත්තේනමුදු තදාලම්බණනොවී කාමාවචර උපෙක්ෂාසහගත භවාඞ්ගයක්මවෙයි. ඉදින් තදාලම්බණය වියයුතුකල්හී අරමුණටඅනුව සොම්නස් සහගත තදාලම්බණයක්ම වියයුත්තේයි. එසේවනකල්හිද ජවනයන් හා නොගැලපෙන හෙයින් තදාලම්බණ නොවී භවාඞ්ගම වන්නේයි. වේදනාවන්ගේ විරුද්ධයක් ඇතිකල්හී අනන්තර ප්‍රත්‍යය නොවියයුත්තේයි. සොම්නස් පටිසන්ධික පුද්ගලයාහට ඉෂ්ටමධ්‍යස්ථාලම්බණයක් අරමුණුකොටගෙණලෝභ මූලික ජවන් දිවූ කල්හි තදාලම්බණ නොවියයුත්තේයි. ඉදින් තදාලම්බණ වන්නේනම් උපෙක්ෂාසහගත තදාලම්බණයක්ම වියයුත්තේයි. එසේ නොවනහෙයින් සොම්නස්සහගත ජවනයාට අනතුරුව උපෙක්ෂාසහගත භවාඞ්ගයක්මවෙයි. ඒ සොම්නස්සහගත පටිසන්ධිගත් පුද්ගලයාහට අති ඉෂ්ටාලම්බණයක් අරමුණුකොටගෙණ ලෝභමූලික ජවන් දිවූ කල්හී තදාලම්බණවියයුතු වීථියක් වීනම අරමුණට අනුරූප පරිද්දෙන් සොම්නස්සහගත තදාලම්

බණයක් වියයුත්තේයි. එසේ ඇති කල්හි ජවනයන් හා නොගැලපෙන හෙයින් ඒ ජවනයන්ට සුදුසු පරිද්දෙන් උපෙක්ෂා තදාලම්බණයක් වියයුත්තේයි. එසේ ඇතිකල්හි ඉෂ්ටාලම්බණය හා නොගැලපෙන හෙයින් උපෙක්ෂා සන්තීරණ චිත්තය උපදනේයි. උපෙක්ෂා සන්තීරණචිත්තය වනාහි පඤ්චකෘත්‍යයක් හා පඤ්චස්ථානයක් ඇති හෙයින් මේ දෙසමූලික ජවන් කෙලවර උපන්නාවූ සන්තීරණය පටිසන්ධිකෘත්‍යය සිඬකරන්නේවේදැයි යමෙක් ප්‍රශ්නකොළේවීනම් එසේ නොවේයයි පිළිවදන් දියයුත්තේයි. කුමක්හෙයින්දයත්? වර්තමාන භවය හා අනාගත භවයද ගලපන්නාවූ තන්හිම පටිසන්ධිකෘත්‍යය සිඬකෙරෙයි. මේ වෙෂ මූලික ජවනයන්ට හා භවාඞ්ගයන්ටද අතරතුර භවයන්ගේ ගැලපීමක් නැති හෙයින් මේ සන්තීරණ චිත්තය ප්‍රතිසන්ධි කෘත්‍යය සිඬකරන්නේ නොවෙයි පිළිවදන් දියයුතුයි. ඉදින් ප්‍රතිසන්ධි කෘත්‍යය සිඬනොකරන්නේවී නම් ච්‍යුති කෘත්‍යය සිඬකරන්නේදැයි නැවතත් ඒ චොදක තෙමේ විචාරයි. ච්‍යුති කෘත්‍යයද සිඬකරන්නාවූ ස්ථානයෙක්ද නොවෙයි. කුමක්හෙයිනයත්? ප්‍රත්‍යුත්පන්නභවයෙන් ගිලිහෙන්නාවූ අවසාන චිත්තය ච්‍යුති කෘත්‍යය නම්වෙයි.

මේ වෙෂ මූලික ජවනයන්ගේ හා භවාඞ්ගයන්ගේද අතර කවර ච්‍යුති කෘත්‍යයෙක් දැයි පිළිවදන්දිය යුත්තේයි. නැවතත් ඒ චොදක තෙමේ ඉදින් ච්‍යුති කෘත්‍යය නොවේනම් සන්තීරණ කෘත්‍යය දැයි ප්‍රශ්න කටයුතු වෙයි. සන්තීරණ කෘත්‍යයද නොවන්නේයයි පිළිතුරු දියයුතුයි. කුමක් හෙයිනයත්? සන්තීරණ කෘත්‍යය වනාහි පඤ්චද්වාරයෙහි සම්පටිච්ඡන කෘත්‍යය ව්‍යවස්ථාපන කෘත්‍යය දෙදෙනාගේ අතරතුරෙහි අරමුණු තීරණය කිරීමම සන්තීරණ කෘත්‍යය නම් වෙයි. මේ වෙෂ මූලික ජවනයන්ට හා භවාඞ්ගයන්ට ද අතරතුර කවර සන්තීරණ කෘත්‍යයෙක් දැයි පිළිතුරු දියයුතුයි. නැවතත් ඒ චොදක තෙමේ ඉදින් සන්තීරණ කෘත්‍යය සිද්ධ නොකරන්නේවී නම් තදාලම්බණ කෘත්‍යය සිද්ධ කරන්නේදැයි ප්‍රශ්න කටයුතු වෙයි. එසේ කල්හි තදාලම්බණ කෘත්‍යයද නොවන්නේය යි පිළිවදන් දියයුතුයි. කුමක් හෙයිනයත්? තදාලම්බණය යනු ජවනයට අනුව ජවනයාගේ අරමුණම ගෙණ උපදනා විපාක චිත්තය තදාලම්බණය යි ව්‍යවහාර කෙරෙති. මෙතන්හි ජවනයන්ට හා භවාඞ්ගයන්ට අනතුරුව උපදනා සන්තීරණ චිත්තය වන හෙයින් තදාලම්බණ කෘත්‍යය නැති හෙයිනැ යි කියයුතුයි.

ඉක්බිති චෝදක තෙමේ එසේ වීනම් විථිචිත්තභාවයෙන් උපදනේද? ප්‍රශ්න කටයුතුයි. එසේද නොවන්නේය යි පිළිතුරු දියයුතුයි. කුමක් හෙයිනයත්? විථිචිත්තය යනු ආවර්ජන චිත්තය විසින් ගන්නා ලද අරමුණ ම අරමුණුකොට ඉපදියයුතු වෙයි. මෙහි වනාහි ආවර්ජනය විසින් ගන්නා ලද අරමුණ නොගෙණ ඒ භවයෙහි යෙභුය්‍ය වශයෙන් ගන්නාලද විරූ කාමාවචර අරමුණක් එල්බගෙණ මේ ජවනයන්ට හා භවාඞ්ගයන්ටද අතරතුර උපදනා සන්තීරණ චිත්තය විථිචිත්ත වශයෙන්ද නො ගතයුත්තේය යි පිළිතුරු දියයුතුයි. මෙසේ සන්තීරණ චිත්ත යට අයත්වූ චුති කෘත්‍යය ප්‍රතිසන්ධි කෘත්‍යය සන්තීරණ කෘත්‍යය තදාලම්බණ කෘත්‍යය විථිචිත්තභාවය යන පසටම අයිති නොවන්නාවූ මේ සන්තීරණ චිත්තය වනාහී පාරිශෙෂ න්‍යාය ක්‍රමයෙන් අවශිෂ්ටව ඇතනාවූ ආගන්තුක භවාඞ්ගකෘත්‍ය වශයෙන් පවත්නේයයි පිළිතුරු දියයුතුයි. මෙසේ ප්‍රත්‍යුත්තර දුන් කල්හි චෝදකවාදී තෙමේ නිශ්ශබ්දවෙයි. ඉක්බිති ඒ සන්තීරණ චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ තමාගේ පටිසන්ධි චිත්තය හා භූමි ජාත්‍යාදී වසයෙන් සදෘශවූ සොම්නස් සහගත භවාඞ්ග තෙමේ භවාඞ්ග කෘත්‍යය වශයෙන් පවත්නේය යි දතයුතුයි.

තදාලම්බණ ඉපදීමට ආයුෂ නොපොහොනාවූ සොම්නස් සහගත පටිසන්ධිචිත්තයෙන් පිළිසිඳ ගත් තැනැත්තාහට උප දනා දොම්නස් ජවනයාගෙන් සොම්නස් භවාඞ්ගචිත්තයට අනන්තරප්‍රත්‍යය ලැබෙනා ක්‍රමය මෙසේ දතයුතුයි තථාගත යන්වහන්සේ විසින් වනාහි "අහෙතුකං භවඞ්ගං සහෙතුකස්ස භවඞ්ගස්ස අනන්තරපච්චයෙන පච්චයො" යනුවෙන් පට්ඨාන ප්‍රකරණයෙහි සාමාන්‍යයෙන් වදාළ වචනය සලකා අර්ථකථා චාරීන්වහන්සේ විසින් මේ චිත්තවීථි ක්‍රමය නියමකරණලද් දේයි. මේ වීථි තොමෝ වනාහි පඤ්චද්වාරයෙහි මුත් මනො ද්වාරයෙහි නොඋපදනේයි. මනොද්වාරයෙහි වනාහි අෂ්ටසමා පත්තිලාභීවූ පුද්ගලයෙකුගේ ධ්‍යානය යම්කිසි නුසුදුසු කාරණා වක් හෙතුකොටගෙණ ඒ ධ්‍යානයෙන් පිරිහුනුකල්හි උපදනා ද්වේෂ මූලික ජවනයද අනිෂ්ටාලම්බණයෙහි මේ ක්‍රමයෙන් යෙදියයුතු වන්නේයි. කාමාවචරජවනය කාමාවචර සත්වය කාමා වචර අරමුණය යන අඞ්ගයන්ගේ යෙදීමක් ඇතිකල්හිම තදා ලම්බණවන්නේයයි දතයුතුයි. එතකුදුවුවත් මනොද්වාරයෙහි විභූතාලම්බණවීථිය පඤ්චද්වාරයෙහි අතිමහන්තාලම්බණවීථිය

යන දෙතැන්හිම තදාලම්බණයයි දතයුතුයි. රූපී අරූපී බ්‍රහ්ම යන්ට වනාහි කුමක්හෙයින් තදාලම්බණ නොවන්නේද යත්? කාමාවචරකර්‍ම නමැති බිජුවටින් ප්‍රතිසන්ධි නොගත්හෙයිනැයි දතයුතුයි. මහද්ගතලෞකොත්තර ජවනයන්ට අනතුරුව කුමක්හෙයින් තදාලම්බණ නොවන්නේද යත්? මහද්ගත ලෞකොත්තර නිර්‍වාණ ප්‍රඥප්තීන් අරමුණුකරන්නාවූ තන්හි තදාලම්බණ නොවන්නේයි. කුමක්හෙයින යත්? තදාලම්බණ යන්ගේ හෙතුභූතවූ කාමතෘෂ්ණාවට ප්‍රතිපක්ෂ හෙයිනැයි දත යුතුයි.

අවිභූතාලම්බණය පරිත්තාලම්බණය අතිපරිත්තාලම්බණය මහන්තාලම්බණය යන මේ සතර වීථියෙහි තදාලම්බණ යන්ගේ නොවීම තදාලම්බණවීමට සුදුසු පමණ ආයුෂ නැති හෙයිනැයි දතයුතුයි. එහෙයින් තදාලම්බණ තෙමේ මනොද්වාරයෙහි විභූතාලම්බණ වීථියෙහිත් පඤ්චද්වාරයෙහි අතිමහන්තාලම්බණවීථියෙහිත් තදාලම්බණ වියයුතුනම් තදාලම්බණවන්නේයි. ඒ විභූතාලම්බණ අතිමහන්තාලම්බණ තෙමේ තදාලම්බණයෙහි වන්නේයි. විභූතාලම්බණ අතිමහන්තාලම්බණ සියලු වීථියෙහිම තදාලම්බණ වියයුතුය යන නියමයෙක්ද ඇත්තේයි. එහෙයින් යෙභුය්‍යනයාය වශයෙන් අති මහන්තාලම්බණ විභූතාලම්බණවීථියෙහි තදාලම්බණවන්නේයයි දතයුතුයි.

තදාලම්ලණ තෙමේ ළදරුවෙකුට බඳු උපමා ඇතිවෙයි. ළදරු තෙමේ මව්පියන්ගේ පසුපස්සෙහි යන්නේවෙයි. මව්පියන්ට බඳුවූ නැදිමයිලන් සුළුපියන් පස්සෙහිද යන්නේවෙයි. එතකුදුවුවත් රාජපුරුෂාදීන්ගේ පසුපස්සෙහි නො යන්නේ වෙයි. මව්පියාදීන්ගේ පසුපස්සෙහි යන්නේ තමූදු ළදරුවන්ට පුරුදු ගේ මිදුල් ආදියෙහිම යන්නේ වෙයි. මව් පියාදීන් ගෙයින් පිටත්ව දුරබැහැර යන්නාවූ කල්හි පුරුදුවූ ගේ මිදුල් ආදියෙහිම පසුපස්සෙහි ගොස් නොපුරුදුවූ [illegible] කල්හි ආපසු ස්වකීය ගෙදරටම පෙරළා [illegible]න්නේ වෙයි. දොළොස් අකුසල් හා කාමාවචර [illegible]කුශලයෝද මව්පියන්ට බඳුවෙත්. කාමාවචර මහාක්‍රියාවන් හා හසිතොත්පාද ක්‍රියාචිත්තයද සුළුපිය නැදිමයිලන්ට බඳුවෙත්. මහද්ගත ලෞකොත්තර ජවනයෝ වනාහි රාජපුරුෂාදීන්ට බඳුවෙත්. තදාලම්බණ තෙමේ ළදරුවෙකුට බඳු උපමා ඇති වෙයි. එහෙයින් රාජපුරුෂාදීන්ට බඳු මහද්ගත ලෞකොත්තර ජවන යන්ගේ පසුපස්සෙහි තදාලම්බණයෝ නුදුවත්.

මේ තදාලම්බණ නියමයයි.

ප්‍රවෘත්ති කාලයෙහි අධිකවශයෙන කාමාවචර ජවන්දිවන්නාවූ කල්හි සත්වරක්ද මූර්ඡාකාලයෙහි සයවරක්ද මරණාසන්න කාලයෙහි පස්වරක්ද කුමක්හෙයින් දිවන්නාහුද යත්? සිතට නිශ්‍රයස්ථානවූ හෘදයවස්තුව මරණාසන්න කාලයෙහි අතිශයින් දුර්වල හෙයිනැයි දතයුතුයි. එහෙයින් "චුතිචිත්තපවත්ත සමකාලමෙව නිරුජ්ඣන්ති" යනු කීහ. මරණාසන්නජවන් එතමේ මහද්ගත හෝ ලොකොත්තර හෝ නොවන්නේයි. එහෙයින් කාමභූමියෙහි හෝ රූපාවචර අරූපාවචර භූමියෙහි හෝ මැරෙන්නාවූ සත්ත්වයන්ට කාමාවචර ජවන් දිවීම ම ස්වභාව ධර්මයක්වෙයි. ඒ සියලු සත්වයන්ට හටගන්නාවූ කාමාවචර ජවනයෝ තුමූ කාමභූමියෙහි අන්තර්ගතවූ ලොභජවනය දොසජවනය මොහජවනය කාමාවචරමහාකුසල ජවනය යන මොවුන් අතුරෙන් යම්කිසි ජවනයක් ම දිවන්නේයි. ඒ් කෙසේද යත්? සප්තකාමභූමියෙහි ලොභමූලික අකුසල් රැස්කොට අනතුරු ආතම භාවයෙහි අපායප්‍රතිසන්ධිය ගන්නේවීනම් ලොභමූලික ජවන් ම දිවන්නේ යි. යම් සත්ත්වයෙක් දෙස මූලික අකුසල් රැස්කොට අනතුරු ආත්මභාවයෙහි අපායොත්පත්තිය ගන්නේවීනම් මරණාසන්න ජවන්වශයෙන් ද්වෙෂ මූලික ජවන්දිවෙත්. මොහ මූලික අකුශල් රැස්කොට අනතුරු ආත්මභාවයෙහි අපායප්‍රතිසන්ධිය ගන්නේවීනම් මොහ මූලික ජවනයෝම මරණාසන්න කාලයෙහි වෙත්. සප්ත කාමභූමියෙහි දානාදී පින්කම්කොට හෝ රූපාරූපධ්‍යාන උපදවා හෝ අනතුරු ආත්මභාවයෙහි සුගතියෙහි හෝ රූපාරූප භවයෙහි හෝ ප්‍රතිසන්ධිගන්නේවී නම් කාමාවචර මහාකුශල් ජවන්වශයෙන් දිවෙත්: රූපාරූපභවයෙහි උපන්නාවූ සත්ත්වයන් ඒ භවයෙන් චුතවන්නාවූකල්හි මහාකුශල් ජවනයෝම එකාන්තයෙන් දිවන්නාහුවෙත්, රූපාරූපභවයෙන් චුතවන්නවුන්ට යටකී පරිද්දෙන් අකුශල් ජවන් කුමක්හෙයින් නූපදනාහුද යත්? ශ්‍රෙෂ්ඨ භවයෙන් චුතව අනතුරු ආත්මභාවයෙහි දුර්ගතියෙහි නූපදනා හෙයිනි; එසේද වුවත් සතර අරූපතලයෙන් චුතව කාමස්වර්ගයෙහි උපදින්නාවූ සත්ත්වයෝ ත්‍රිහෙතුකව මුත් දුහෙතුකව නූපදනාහු මැයි. අහෙතුක පටිසන්ධිය කියනුම කිම? සොළොස් රූපභවයෙන් චුතව කාමසුගතියෙහි උපදින්නවුන්ට ත්‍රිහෙතුකව හෝ විහෙතුකව හෝ ප්‍රතිසන්ධිය මුත් අහෙතුක ප්‍රතිසන්ධිය කිසිකලෙකත් නොලැබෙන්නේයි. පුද්ගල වශයෙන් වනාහි සප්තකාමභූමියෙන් චුතවන්නාවූ පෘථග්ජනයන්ට ලොභජවනය හෝ ද්වෙෂ ජවනය

හෝ මෝහජවනය හෝ මහා කුශල ජවනය හෝ ස්ත්‍රීාදි රූප පරිද්දෙන් දිවෙන්නාහු වෙත්. රූපාරූපභූමියෙහි උපන්නාවූ ත්‍රිහෙතුක පෘථග්ජනයන්ට හා සෝවාන් සකෘදාගාමි අනාගාමි යන ඵලසථ තුන්දෙනාහට ද මරණාසන්න කාලයෙහි මහාකුශල් ජවන්ම දිවෙත්.

මරණාසන්න කාලයෙහි බොහෝසෙයින් ලෝභජවන් දිවූ සත්වතෙමේ අනතුරු ආත්මභාවයෙහි ප්‍රේත ලෝකයෙහිම උපදනාහු වෙත්. ඒ ප්‍රේතයන් අතුරෙහුදු නිජ්ඣාමතණ්හි කාදිවූ ප්‍රේතවිෂයෙහි උපදනාවුන්ගේ පටිසන්ධිචිත්තය උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණයෙන් අපායට ඇතුලත්ව හටගන්නේයි. ඇති ප්‍රේතව උපදනා ප්‍රේතයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය කුසලවිපාක උපෙක්ඛාසහගත සන්තීරණ චිත්තයෙන් සිව්මහරජයට ඇතුලත්ව හටගන්නේයි. මරණාසන්න කාලයෙහි ද්වෙෂ මූලිකජවන් දිවූ සත්වතෙමේ බොහෝ සෙයින් අනතුරු ආත්මභාවයෙහි අපාය ප්‍රතිසන්ධිය ගන්නේයි. මරණාසන්න කාලයෙහි මෝහමූලිකජවන් දිවූ සත්ව තෙමේ බොහෝසෙයින් අනතුරු ආත්මභාවයෙහි තිරිසන් අපායෙහි ප්‍රතිසන්ධි ගන්නේ යි. සප්තකාම භූමියෙන් චුතව නැවත එම භූමියෙහිම හෝ රූපාරූප භූමියෙහි හෝ පටිසන්ධි ගන්නාවූ සත්වයන්ටද රූපභූමියෙන් චුතව එම රූප භූමියෙහිම හෝ කාමසුගතියෙහි හෝ අරූපභූමියෙහි හෝ උපදනා සත්වයන්ටද, අරූපභූමියෙන්චුතව එමභූමියෙහිමහෝ කාමසුගති භූමියෙහි හෝ උපදනා සත්වයන්ට මරණාසන්න කාලයෙහි කාමාවචර මහා කුශල්ජවන්ම දිවෙත්. “මරණාසන්නකාලාදිසු” යන්නෙහි ආදි ශබ්දයෙන් විභාවනීටීකායෙහි මූර්ඡාකාලාදියෙහි හටගන්නාවූ ජවන් සදෙන ගන්නේයි. සංඛෙපවණ්ණනා ටීකායෙහි එම ආදි ශබ්දයාගේ අර්ථ වශයෙන් බුද්ධාදීන්ට ලඝුක ප්‍රවෘත්තියෙහි උපදනාවූ ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතර හෝ පස හෝ ගන්නේයි. ඒ එසේමැයි. යමක ප්‍රාතිහාර්‍ය්‍යාදී කාලයෙහි බුදුවරයනට උපදනා ප්‍රත්‍යවෙක්ෂා ජවන සතරද ප්‍රත්‍යෙක බුද්ධ මහාශ්‍රාවකාදීන්ට එබඳු ප්‍රාතිහාර්‍ය්‍යාදිය දැක්වීමෙහි උපදනා ප්‍රත්‍යවෙක්ෂා ජවන් පසයයි ගන්නේයි. එසේදවුවත් ආචාර්‍ය්‍ය ධම්මපාල ස්ථවිරයන් විසින් තික්ඛින්ද්‍රිය පුද්ගලයන්ට ජවන් සතරක්ද මුදින්ද්‍රිය පුද්ගලයන්ට ජවන් පසක්ද ගතයුතුහෙයින් භාග්‍යවත්හු තික්ඛින්ද්‍රිය බැවින් ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතරක්ද ප්‍රත්‍යෙක බුද්ධමහාශ්‍රාවකාදීන් මුදින්ද්‍රිය බැවින් ප්‍රත්‍යවෙක්ෂා ජවන්

පසෙකැයි විස්තර කොට දක්වන ලද්දේයි. මහග්ගතජවනයන් ගේ ආදිකර්මික වීථියෙහි එක් වරක්ද, ඒ ඒ ධ්‍යානයට සමවදනා සමාපත්ති වීථියෙහි අහොරාත්‍රයක් හෝ කැමති කාලයක් හෝ මුළුල්ලෙහි අර්පණා ජවනයන්ගේ සඞ්ඛ්‍යා පථාතික්‍රාන්තව හටගන්නා බවද අධිෂ්ඨාන කල පරිද්දෙන් සමාපත්තියට සමවැදීම අධිෂ්ඨාන වශිතා නම් වන බවද, අධිෂ්ඨාන කල පරිද්දෙන් ධ්‍යානයෙන් නැගිට අන්‍යවූ අභිමත චිත්ත වීථියක් ඉපදවීමයයි කියන ලද්දාවූ ධ්‍යානයෙන් නැගිටීම වුට්ඨාන වසීනම් වන බවද, සියලු මාර්ගජවනය එක් වරක්ම වන බවද, මාර්ගජවනයන්ගේ සමාපත්ති වශයෙන් නැවැත්ම නැති බවද, අභිඥා ජවනය වනාහි පළමුවෙන් ලබන්නාවූ කල්හිද එක් වරක්ම උපදනා බවද. අභිඥාජවනයට සමවදනා කල්හිද එක් වරක්ම සමවදනා බවද, දතයුත්තේයි. අභිඥා ජවනය වනාහි සෙසු සමාපත්ති වීථියෙහි මෙන් බොහෝවර කුමක් හෙයින් නූපදනේදයත්? අභිඥාජවනයෙහි සමාපත්තියක් නැති හෙයිනැයි දතයුතු. "අභිඥාවය" යනු පඤ්චමධ්‍යානයාගේම එක්තරා ශක්ති විශේෂයෙක් වෙයි. අභිඥාජවනය වනාහි එක් වරක් ඉපිද නිරුද්ධවූ කල්හි" සතං හොමි සහස්සං හොමි" යනාදීන් සියදහස් කෞමාර රූපාදිය උපද වන්නාවූ කල්හි ඒ අභිඥාජවනය නැත්තේ මැයි. අභිඥාජවනය නැත්තේවීනමුදු පළමු උපන් ඒ අභිඥාජවනචිත්තක්ෂණයාගේ ධර්ම ශක්තිය හේතුකොටගෙණ ශතසහශ්‍රාදී රූපයන්ගේ හට ගැණීම වෙයි. මේ ඍද්ධිවිධියට කී නයින්ම දිව්‍යශ්‍රොත්‍ර පරචිත්ත විජානන ඥානාදී සෙසු අභිඥාවන් උපදවන කල්හිද පඤ්චමධ්‍යාන සඞ්ඛ්‍යාතවූ අභිඥාජවන චිත්තය එක් වරක්ම ඉපිද නිරුද්ධවූ කල්හි පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ට කාමාවචර කුශල චිත්තයෙන්ද, බුදුපසේබුදු මහරහතුන්ට කාමාවචර ක්‍රියා චිත්තයෙන්ද ඒ දිව්‍ය ශ්‍රොත්‍රාදිය හටගන්නේයයි දතයුතුයි. කුමක් මෙන්දයත්? මෘගමදය බහාතුබූ භාජනයෙහි ඒ මෘගමදය ඉවත් කළේ නමුදු මනොඥවූ සුගන්ධය ඒ භාජනයෙහි පවත්නාක් මෙන් අභිඥා චිත්තය නිරුද්ධවී ගියේ නමුදු ඒ අභිඥානුභාවය කාරණකොටගෙණ කාමාවචර කුශල ක්‍රියා චිත්තයන්ගෙන් ඍද්ධිවිධිය දිව්‍යශ්‍රොත්‍රය පරසිත් දැනීමය, පෙර විසූ කඳපිළිවෙළ දැනීමය, දිව්‍යංචක්ෂුරභිඥාවය යන පඤ්චාභිඥාව හා දිව්‍යංචක්ෂුරභිඥානයාගේ විශේෂවූ ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාණය, අතීතංසඥානය, අනාගතංසඥානය යන අභිඥාවෝද පවත්නාහු වෙති. ඵලජවනතෙමේ මාර්ග වීථියෙහි මන්දප්‍රාඥයාහට දෙවරක්ද, තික්ඛ ප්‍රාඥයාහට තුන්

වරක්ද උපදනේය යන මේ වාදය සමාන වාදය නම් වෙයි. සමහර ආචාර්‍ය්‍යවරයෝ වනාහි ඵලජවනයන්ගේ දෙතුන් වරක් ඉපදීමට තීක්ෂප්‍රාඥබව හෝ මන්‍දප්‍රාඥබව හෝ කාරණා නොවෙති. ඒ මාර්ග වීථි පූර්වභාගයෙහි පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූයන කාමාවචර සමාධීහු සතර වරක් උපන්නෝ වීනම් පස්වන සිත මාර්ගසිත්ව සවන සත්වන දෙසිත ඵලසිත් වෙයි. එම වීථියෙහිම පරිකර්ම සිත නොඉපද උපචාර අනුලෝම ගොත්‍රභූ යන නමින් කාමාවචර ජවනයෝ තුන් දෙනෙක් වූහුනම් සතරවන සිත මාර්ගසිත්වැ පස්වෙනි සවෙනි සත්වෙනි තුන්දෙන ඵලසිත් වන්නේයයි කියති. අනාගාමීන්ට හා රහතුන්ට පමණක් නිරෝධයට සමවැදිය හැකි වෙති. සකෘදාගාමි සෝවාන් පෘථග්ජන යන සත්වයන්ට ඖදාරිකවූ කාමරාගය ඇතිහෙයින් නිරෝධ සමාපත්තියට සමවදිනු නොහැකි වෙත්. අනාගාමී රහත්හුද ශුෂ්ක විදර්ශකයෝ වූවාහුනම් හෝ මෑත භාගයෙහිවත් අෂ්ටසමාපත්තිය නොලැබූවාහු නම් හෝ අනාගාමි රහත්වූ පමණින්ම නිරෝධයට සමවැදිය නොහැකි වෙති. නිරෝධයට සමවැදීමෙහි අඞ්ගවශක් ඇතිවිය යුතුයි. එනම්:—අෂ්ටසමාපත්තියෙහි අග තැන්පත් වීමය. කාමරාගය නිරවශෙෂ ප්‍රහාණයෙන් නැසීමය, යන මේ අඞ්ගවය ඇතිකල්හිම නිරෝධයට සමවැදිය හැකි වෙති. එතකුදුවුවත් කාමාවචර භූමියෙහි වසන්නාවූ අනාගාමීන්ට හා රහතුන්ට මුත් රූපභූමියෙහි වත් අරූපභූමියෙහි වත් වසන්නාවූ ඒ ආර්‍ය්‍යයන්ට නිරෝධසමාපත්තිය නොලැබෙත්යයි සමහරු කියති. කුමක් හෙයිනයත්? නිරෝධයට සමවදින්නාවූ ආර්‍ය්‍යයන් වහන්සේ විසින් රූපාවචර ප්‍රථම ධ්‍යානය පටන් චතුර්‍ථ නයින් අෂ්ට සමාපත්තියට සමවැද වැද ක්‍රමයෙන් ගොස් නාමධර්මයන්ගේ නිරෝධය කට යුතු වෙයි. එතකුදුවුවත් රූපභූමියෙහි උපන්නාවූ ආර්‍ය්‍යයන්ට අරූපධ්‍යානය හෝ අරූපභූමියෙහි උපන්නාවූ ආර්‍ය්‍යයන්ට රූපධ්‍යානය හෝ නොලැබිය හැකි බැවින් රූපාරූප භූමිවයෙහිම උපන්නාවූ අනාගාමී රහතුන්ට නිරෝධ සමාපත්තිය නොලැබෙයි. එතකුදුවුවත් නිර්වාණ සැපයට උදාහරණ දක්වන්නාහු විශුද්ධි මාර්ග ටීකායෙහි නිරෝධයට සමවන් අරූපීබ්‍රහ්මයෝ ඒ බඹලොවින් චුතවූවාහු නොවෙති. එහෙයින් අරූපී බ්‍රහ්මයන්ට නිරෝධ සමාපත්ති කාලයෙහි ලැබෙන්නාවූ සැපත නිර්වාණ සැපතට සමානයයි විස්තර කර තිබේ. ඉදින් අෂ්ටසමාපත්තීන්ට සමවැදීම නොහොත් රූපධ්‍යානයන්ට සමවැදීම නිරෝධයාගේ පූර්ව කෘත්‍යයක් නොවන්

නේ වීනම් අරූප ලෝකයෙහි නිරෝධ සමාපත්තිය ඒකාන්ත යෙන් ලැබිය හැක්කේයි, එහෙයින් රූපාවචර බ්‍රහ්මලෝකය හැර සතර අරූප භවයෙහිද කාමසුගතියෙහිද වසන්නාවූ ආර්යයන්ට නිරෝධසමාපත්තිය ලැබෙන්නේය යන වාදය සමාන වාදයයි සැලකිය යුතුයි, සමහර ආචාර්යවරයෝ වනාහි අරූපී භවයෙහි රූපය නැතිහෙයින් නිරෝධ සමා පත්තියට සමනොවදින්නේයයිකියති. එහෙයින් අෂ්ට සමාපත්ති ලාභිවූ අනාගාමි අර්හත් පුද්ගලයෝ තුමූ පළමුකොට ප්‍රථම ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ විතර්කවිචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ග පංචකය අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ලක්ෂණත්‍රයට ආරෝපණය කොට ප්‍රත්‍යවේක්ෂා කරත්. තදනන්තරව ද්විතීය ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත් තාවූ ධ්‍යානාඞ්ග චතුෂ්කයද විදර්ශනා කොට තදනන්තරව තෘතීය ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ගත්‍රිකය විදර්ශනා කොට තදනන්තරව සුඛෛකාග්‍රතා උපේක්ෂා ඒකාග්‍රතා යන චතුර්ථධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ග යුග්මය විදර්ශනා කොට තදනන්තරව ආකාශා නඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන යන අරූප ධ්‍යානත්‍රයටද පිළිවෙළින් සමවැද ඒ ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ උපේක්ෂා ඒකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ ධ්‍යානාඞ්ගයෝ දෙදෙන අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කොට තදනන්තරව තමාගේ චීවරාදී පරිෂ්කාරයන් සොරුන් විසින් පැහැර නොගණිවයි කියාද, තමාගේ විහාරය ගින්නෙන් විනාශ නොවේවයි කියාද, යන මේ නා නා භාණ්ඩ අවිකෝපණය කොට තදනන්තරව සඞ්ඝයන් වහන්සේ විසින් අඬගා වදාළේ වී නම් දැනගැණිම්වා යන සත්ථුපකොසකයද, සඞ්ඝයාට යම් කෘත්‍යයක් ඇතිවිට ගෙඩිය ගැසුයේ නම් ඒ දැනගැණිම්වා යන සඞ්ඝ පටිමානනයද, අධිෂ්ඨාන කොට තදනන්තරව සත්දවස ගිය තත්හි නැගිටිම්වා යන අද්ධ පරිච්ඡේදය අධිෂ්ඨාන කිරීමය. යන මේ පූර්ව කෘත්‍ය සතර අධිෂ්ඨාන කොට ගෙණ තදනන්තරව නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවදිනාහුය. ඒ ධ්‍යාන යට දෙවරක් සමවැදුනාවූ කල්හි චිත්ත චෛතසික, චිත්තජ රූපයන්ගේ නිරෝධය වෙයි. කර්මජ උතුජ ආහාරජ යන ත්‍රිජරූපයන්ගේ හටගැණිම නිරෝධ සමාපත්තියට සම වැදීමයයි කියනු ලැබේ. ඒ නිරෝධයෙන් නැගිටිනා කල්හි අනාගාමීන්ට අනාගාමිඵල චිත්තයද රහතුන්ට අර්හත්ඵල චිත්තයද, එක් වරක් ඉපිද ඒ ඵල චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ භවාඞ්ග

ඒමට පවත් ගන්නේය. අරූපභූමියෙහි නිරොධයට සම වදනාවූ ආර්යයන්ට නා නා ස්කන්ධ අවිකොපණාදී සතර අධිෂ්ඨාන මාත්‍රයක් නැත්තේය. කුමක් හෙයින් නැත්තේද යත්? රූපස්කන්ධය නැතිහෙයිනැයි දතයුතුයි. අනාගාමීන් නිරොධයට සමවදිනා කල්හි ප්‍රථමධ්‍යාන කුශල චිත්තාදීන්ද රහතුන් සමවදිනා කල්හි ප්‍රථම ධ්‍යාන ක්‍රියා චිත්තාදීන්ද උපදනාබැව් මාත්‍රයක් මෙහි විශෙෂයි. "අභිඥා ජවනය" යනු පචම ධ්‍යාන කුශල ක්‍රියා චිත්තයෝ මැයි. එහෙයින් අභිඥා චිත්තයයි අනික් සිතක් නැත්තේයයි දතයුතුයි. ද්විහෙතුක පුද්ගලයන්ට ක්‍රියා ජවන් කුමක් හෙයින් නූපදනාහුදයත් ක්‍රියාජවන් වනාහී ත්‍රිහෙතුක පුද්ගලයන්ට අර්හත්ඵලය ලැබී මෙන්ම උපදනා ජවනයෝය. එහෙයින් බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්ය ශ්‍රාවකයන්ගේ සන්තානයෙහිම මහග්ගත ක්‍රියා නවයද කාමාවචර ක්‍රියා අටද යන සතළොස් දෙනා හා හසිතුප්පාද ක්‍රියා චිත්තයද යන අටළොස් ක්‍රියා චිත්තය උපදනේයයි දත යුතුයි. ද්විහෙතුක සත්වයන්ට අර්පණා ජවන් කුමක් හෙයින් නූපදනාහුද යත්? විපාකානන්තරාය ඇති හෙයිනැයි දතයුතු. ඥාන විප්‍රයුක්ත මහා විපාකයෝ සතරදෙන ද්විහෙතුක පුද්ගල යන්ගේ පටිසන්ධි චිත්තයෝ වෙති. ඒ පටිසන්ධි විපාකයෙන් අර්පණාව මුවහ කරණහෙයින් සුගතියෙහි ද්විහෙතුක සත්වයන්ට කිසිකලෙකත් අර්පණාව නොලැබෙන්නේයි. එහෙයින් වෙප චිත්ති අසුරභවනයෙහි වාසයකරන්නාවූ අසුරයන්ටද, ගන්ධර්ව ලොකයෙහි වාසයකරන්නාවූ ද්විහෙතුක දෙවියන්ටද, මනුෂ්‍ය ලොකයෙහි ද්විහෙතුක මනුෂ්‍යයන්ටද එම ආත්ම භාවයෙහි ධ්‍යානාභිඥා මාර්ගඵල සඞ්ඛ්‍යාතවූ අර්පණාව එකාන්තයෙන් නොලැබෙන්නේය, එතකුදුවුවත ඒ ද්විහෙතුක සත්වයන්ටද දුගති අහෙතුක පටිසන්ධි ඇත්තාවූ කම්බලාස්සතර නාග භවනාදියෙහි වසන්නාවූ දිව්‍ය නාගයන්ට හා ගුරුළු භවන යෙහි වසන්නාවූ දිව්‍යගුරුළන්ටද, ප්‍රවෘත්තිකාලයෙහි තදා ලම්බණ වශයෙන් ත්‍රිහෙතුක මහාවිපාකද; ඒ ත්‍රිහෙතුක මහා විපාකයන්ගේ අනුසස්වූ සප්තරුවන්මය විමාන උද්‍යානාදිය හා සිතූ පැතූ දේ ලබන්නාවූ කප්රුක්ද, දිව්‍ය වස්ත්‍ර දිව්‍ය සුගන්ධ දිව්‍යාප්සරාවන් ආදිවූ දිව්‍යමානවූ පචකාම සම්පත්තියද ලැබෙන්නේයි.

---

## පදගතාර්ථය.

පන, ජවන නියමයෙන් අන්‍යවූ පුද්ගල භෙදයකියම්:- එනම, මේ පුද්ගල භෙදයෙහි කොතෙක් මේ දෙළොස් පුද්

ගලයන් අතුරෙන්; දුහෙතුකානම, දුහෙතුකපුද්ගලයන්ටද; අහෙතුකානම, සුගති අහෙතුකදුගති අහෙතුක පුද්ගලන්යටද; ක්‍රියාජවනානිචෙව, ක්‍රියාජවනයෝද; අප්පණාජවනානිච, අර්පණාජවනයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන්; සුගතියං, සුගති භූමියෙහි; දුහෙතුක අහෙතුකානං, දුහෙතුක පුද්ගලයන්ට හා සුගති අහෙතුක පුද්ගලයන්ටද; ඤාණ සම්පයුත්ත විපාකානිච, ඥාන සම්ප්‍රයුක්ත මහා විපාකයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. දුග්ගතියං, දුගතිභූමියෙහි; අහෙතුකානං පන, දුගති අහෙතුක පුද්ගලයන්ට වනාහි; ඤාණවිප්පයුත්තානි, ඥානවිප්‍රයුක්තවූ; මහාවිපාකානිච, මහා විපාකයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. තිහෙතුකෙසුච, ත්‍රිහෙතුක පුද්ගලයන් අතරෙහිදු; ඛීණාසවානං, රහතුන්ට; කුසලාකුසල ජවනානිච, කුශලාකුශල ජවනයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන්; සෙක්ඛපුථුජ්ජනානං, යට ඵලස්ථයන් තුන්දෙනාය, ත්‍රිහෙතුක පෘථග්ජනයාය, යන මොවුන්ට; ක්‍රියා ජවනානි නලබ්භන්ති, ක්‍රියා ජවනයෝ නොලැබිය යුත්තාහුය. සෙක්ඛානං, යටඵලස්ථයන් තුන්දෙනාහට; දිට්ඨිගතසම්පයුත්ත විචිකිච්ඡා ජවනානිච, දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත ජවන් හා විචිකිච්ඡා ජවනයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. පන, එහිම විශේෂාර්ථයක් දක්වම්:- අනාගාමි පුග්ගලානං, අනාගාමී පුද්ගලයන්ට; පටිඝ ජවනානිච, ද්වේෂමූලික ජවනයෝද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. ලොකුත්තර ජවනානිච, ලොකොත්තර ජවනයෝ අටදෙන වනාහි; යථාරහං, සුදුසු පරිද්දෙන් අරියානං එව, අෂ්ටාර්ය්‍ය පුද්ගලයන්ටම; සමුප්පජ්ජන්ති, මොනවට වෙන වෙනම උපදනාහු වෙත්. ඉති වෙදිතබ්බා මෙසේ දතයුත්තේයි. මේ පාඨයෙහි "දුහෙතුකානම" යන ෂෂ්ඨිය පටන් "අනාගාමි පුග්ගලානං" යන ෂෂ්ඨී විභක්තිය දක්වා විභක්ති විපරිනාමවශයෙන් සලකා දුහෙතුක පුද්ගලයන් විසින් යනාදීන් අනුක්ත කර්තෘ අර්ථය කියා සියලු පදයන් වුත්ත කර්ම වශයෙන් දෙවෙනි වාරයෙහි අර්ථ කිය යුතුයි. අසෙක්ඛානං රහතුන්ට; චතුචත්තාළීස, සුසාළිස් වීථි සිත් කෙනෙක්; සම්භවා, (යථාසම්භවං) සම්භවවන පරිද්දෙන්; උද්දිසෙ, ප්‍රකාශකරන්නේයි. සෙක්ඛානං, ශෛක්ෂ්‍ය පුද්ගලයන් සත්දෙනාහට; ඡපඤ්ඤාස, සපණස් වීථිසිත් කෙනෙක්; යථාසම්භවං උද්දිසෙ, ලැබෙන පරිද්දෙන් ප්‍රකාශ කරන්නේයි. අවසෙසානං, සෙක්ඛ අසෙක්ඛ පුද්ගලයන් කෙරෙන් අවශිෂ්ටවූ පෘථග්ජනයන් සතරදෙනාහට; චතුපඤ්ඤාස, සූපණස් වීථිසිත් කෙනෙක්; යථාසම්භවං, සුදුසු

පරිද්දෙන්; උද්දිසෙ, ප්‍රකාශ කරන්නේයි, අයං, මේ කියන ලද්දේ වනාහි; එව, මේ වීථිසංග්‍රහයෙහි; පුග්ගලභෙදෙ, පුද්ගල ප්‍රභෙදයයි. නොහොත් පුද්ගලයන්ගේ වශයෙන් හටගන්නාවූ චිත්ත වීථික්‍රමයයි.

---

## පදගතාර්ථය.

කාමාවචර භූමියං පන, කාමාවචර භූමියෙහිම; "පන" ශබ්දය අවධාරණාර්ථයි. සබ්බානිපි එතානි වීථිචිත්තානි, ඒ සියලුම වීථි චිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; උපලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. රූපාවචර භූමියං, රූපාවචර භූමියෙහි; පටිඝජවන තදාලම්බණ වජ්ජිතානි, වෙෂමූලික දෙසිතය, තදාලම්බණ එකොළොසය යන තෙළෙස් චිත්තයන් විසින් තොරකරණ ලද්දාවූ; එතානි වීථිචිත්තානි, ඒ වීථි චිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; උපලබ්භන්ති ලැබිය යුත්තාහු වෙත්. ච, විශෙෂාර්ථයක් කියමි:- අරූපාවචර භූමියං, අරූපාවචරභූමියෙහි; පඨමමග්ග රූපාවචරහසන හෙට්ඨිමාරූප්ප වජ්ජිතානි, සෝවාන් මාර්ගචිත්තය; පසළොස් රූපාවචර චිත්තය, හසිතොත්පාද චිත්තය, යට යට අරූපචිත්තය යන මොවුන් විසින් වර්ජිත කරණ ලද්දාවූ; එතානි වීථිචිත්තානි, ඒ වීථිචිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. සබ්බථාපිච, සියලු ආකාරයෙනුදු; තංතං පසාදරහිතානං, ඒ ඒ ප්‍රශාද රූපයෙන් වෙන්වූ භූමින්ගේද, තං තං ද්වාරික වීථිචිත්තානි, ඒ ඒ ද්වාරයෙහි, උපදනා වීථිචිත්තයෝ; නලබ්භන්ති නොලැබිය යුත්තාහු වෙත්. නොහොත් තං තං පසාදරහිතානං, ඒ ඒ ප්‍රශාද රහිත සත්වයන් විසින්; තංතංද්වාරික වීථිචිත්තානි, ඒ ඒ ද්වාරයෙහි ඉපදිය යුතු වීථිචිත්තයෝ; නලබ්භනෙතව, නොලැබිය යුත්තාහුමැයි. අසඤ්ඤසත්තානං පන, අසංඥසත්වයන්ට වනාහි; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; චිත්තප්පවත්ති, චිත්තයන්ගේ හටගැණීමෙක්; නත්ථෙව, නැත්තේ මැයි. ඉති වෙදිතබ්බං, මෙසේ අර්ථ දතයුතුයි.

කාමෙ, එකොළොස් කාමභූමියෙහි; අසීති වීථිචිත්තානි, අසූවක් වීථිචිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; ලබ්භරෙ, ලැබිය යුත්තාහු වෙත්. රූපෙ, අසංඥ සත්ව වර්ජිතවූ පස

ලොස් රූපභූමියෙහි ; චතුසට්ඨි වීථිචිත්තානි, සුසැට වීථිසිත් කෙනෙක් ; යථාරහං ලබ්භරෙ, සුදුසු පරිද්දෙන් ලැබිය යුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන් ; අරූපෙ, සතර අරූප භූමියෙහි ; ද්වෙචත්තාළීස වීථිචිත්තානි, දෙසාළීස් වීථිසිත් කෙනෙක් ; යථාරහං ලබ්භරෙ, යනු සම්බන්ධ කටයුතුයි. අයං, මේ කියන ලද්දේ වනාහී ; එත්ථ, මේ වීථිසංග්‍රහයෙහි; භූමිවිභාගො, භූමි විභාගයයි. නොයෙක් භූමින්ගේ වශයෙන් ප්‍රවෘත්තිතවීථි චිත්තයන්ගේ විභාගයයි. ඉච්චෙවං, (යථා වුත්තන යෙන) යථොක්ත ක්‍රමයෙන් හෙවත් කියනලද ක්‍රමයෙන් ; ඡද්වාරික චිත්තප්පවත්ති, ෂට්ද්වාරයෙහි හටගන්නා චිත්තයන්ගේ පැවැත්ම; යථාසම්භවං, ලැබෙන ලැබෙන පරිද්දෙන් විභාගයන් අතුරුකොට ඇතිව ; යාවතායුකං, දිවි ඇතිතාක් මුළුල්ලෙහි ; අබ්බොච්ඡින්නා නොසිඳෙන ලද්දී ; පවත්තති, පවත්නේයි. අභිධම්මත්ථසඞ්ගහෙ, අභිධර්මාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයෙහි ; වීථිසඞ්ගහවිභාගො නාම, වීථිසංග්‍රහ විභාග නම්වූ ; චතුත්ථො පරිච්ඡෙදො, සතරවන පරිච්ඡේදය, ඉති, මෙසේ සම්පූර්ණ කරණ ලද්දේයි.

---

## භාවාර්ථය.

කාමාවචර භූමියෙහි වනාහි ඒ සියලු වීථිචිත්තයෝම යථාභියෙන් කුමක්හෙයින් ලැබෙන්නාහුද යත් ? කාමාවචර භූමියෙහි වනාහි එකොළොස් භූමිකෙනෙක්ද, ප්‍රතිසන්ධීහු දසදෙනෙක්ද, අටවිසිරූපකෙනෙක්ද, ෂට්ද්වාරකෙනෙක්ද, සම්පූර්ණයෙන් ලැබෙන්නාහු වෙති. මේ කාමාවචර භූමියෙහි ලැබෙන්නාවූ දශප්‍රකාර ප්‍රතිසන්ධීහු නම් සතර අපායවාසීන්ගේ අපායප්‍රතිසන්ධි චිත්තසඞ්ඛ්‍යාතවූ අකුශලවිපාක උපෙක්ඛා සන්තීරණ චිත්තයද, මනුෂ්‍යලොකයෙහි ජාත්‍යන්ධාදි ලාමක සත්වයන්ගේ හා භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන්ගේද ප්‍රතිසන්ධිය ගෙණදෙන්නාවූ කුශලවිපාක උපෙක්ඛා සන්තීරණ චිත්තයද සප්තකාම ස්වර්ගයෙහිම ප්‍රතිසන්ධි දෙන්නාවූ මහා විපාකයෝ අටදෙනද යන මේ දශප්‍රකාරවූ ප්‍රතිසන්ධියකින් යුක්තවූ නිකාය වශයෙන් ගණන පථාතික්‍රාන්තවූ අනෙක සත්වවර්ගයාගෙන් සම්පූර්ණවූ භූමිය කාමභූමියයි. භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන් හෝ වෘක්ෂ නිශ්‍රිත කොට වාසය කරන්නාවූ රුක්දෙවියෝද පර්වත ගඞ්ගා සමුද්‍රාදිය ආශ්‍රය කොට වසන්නාවූ දෙවියෝද චාතුර්මහාරාජිකයෙහිම ඇතුලත්

වෙති. ඒ භූමි නිශ්‍රිත විනිපාතික අසුරයෝ වනාහි ක්‍ෂුත්ති ප්‍රේත සංඛ්‍යාවෙන් නෑයන් බලාපොරොත්තු වන නමුත් මනුෂ්‍ය භූමියට හෝ අපාය භූමියට හෝ ඇතුලත් නොවනහෙයින් චාතුර්මහාරාජිකායෙහිම ඇතුලත් වන්නාහුයයි දතයුතුයි, මෙසේ කාම භූමිය සියල්ලෙන්ම සම්පූර්ණ වන බැවින් පරිපූර්ණායතන ඇත්තාවූ සත්‍වයන්ට සුදුසු පරිද්දෙන් සියලු වීථි චිත්තයෝම උපදනාහු වෙත්. රූපාවචර භූමියෙහි වනාහි ප්‍රතිඝ ජවන තදාලම්බණයෝ නූපදනාහු වෙත්. තදාලම්බණයන්ගේ නොඉපදීමේ හෙතුව යට තදාලම්බණ නියමයෙහි දක්වනලදී. එසේම රූපාවචර භූමියෙහි ඝ්‍රාණජිව්හා කාය යන ද්වාරත්‍රය නොලැබෙන හෙයින් ඒ ද්වාරත්‍රයෙහි ආවෙණික වශයෙන් උපදනාවූ ඝ්‍රාණ විඥානද්වය ජිව්හාවිඥානද්වය කායවිඥානද්වය යන චිත්තයෝසදෙන නූපදනාහු වෙත්. රූපාවචර බ්‍රහ්මයන්ට වනාහි ඝ්‍රාණාදිප්‍රසාදත්‍රය නැත්තේ නමුදු සසම්භාරඝ්‍රාණ සසම්භාරජිව්හා සසම්භාරකාය යන මහාභූතරූපයෝ ඇත්තාහු මැයි. ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය කුමක් හෙයින් නැත්තේද යත්? කාමයෙහි විරක්ත භාවනා බලයෙන් බ්‍රහ්මලොකොත්පත්තිය වන හෙයින් ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය නැත්තේයි. එසේවී නම් චක්‍ෂු සොත ප්‍රසාදද්වය කුමක් හෙයින් ලැබෙන්නේද යත්? බුද්ධ දර්ශන ධර්මශ්‍රවණාදිය සඳහා මුත් රූප ශබ්ද කාම කොට්ඨාසයන් අරමුණු වශයෙන් ගන්නා පිණිස නොවෙත්යයි දතයුතුයි. "ඝ්‍රාණජිව්හා" කායප්‍රසාදත්‍රය ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කාමගුණයන් අනුභව කිරීම මුත් අනිත් කෘත්‍යයක් නැති හෙයින් රූපී බ්‍රහ්මයන්ට ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය නැත්තේයයි දතයුතුයි. එහෙයින් අරූපාවචර භූමියෙහි සෝවාන් මාර්ගය පසලොස් රූපාවචර චිත්තය හසිතොත්පාද චිත්තය යට යට අරූපාවචර චිත්තය යන මොවුන් තොර කොට ඇත්තාවූ අවශෙෂ සියලු චිත්තයෝ සුදුසු පරිද්දෙන් උපදනාහුයයි දතයුතුයි. අසංඥතල සත්‍වයන්ට වනාහි චිත්තයන්ගේ ඉපදීමට හෙතුභූතවූ ෂට්ද්වාරයම නැති හෙයින් චිත්ත ප්‍රවෘත්තිය හාත්පසින්ම නැත්තේයි. ඉදින් අසංඥතල වාසී සත්‍වයන්ට චිත්ත ප්‍රවෘත්තිය හාත්පසින්ම නැත්තේ වී නම් අසංඥ භවයෙන් චුතව කාමාවචර භූමියෙහි උපදනා කල්හී කවර ද්වාරයකින් ගන්නාලද අරමුණෙක පටිසන්ධිය වන්නේද යත්? අසංඥතලයෙහි ඉපදීමට හෙතුභූතවූ වායොකසිණ චතුර්ථධ්‍යානය ඉපදෙවී භවයෙහි රැස්කරණ ලද්දාවූ යම්කිසි කාමාවචර කුශල කර්මයක් අවසරලැබ අපරාපරිය වෙද්‍ය වශයෙන් එළඹුනාවූ කර්මානුභාවයකින් ගෙණ හැර දක්වන්නාවූ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්

තක් හෝ එල්බ ගෙණ කාමාවචර භූමියෙහි පටිසන්ධිගන්නේයයි දතයුතුයි, එහෙයින් කීහ :- සච්චසංඛෙපයෙහි-

“ භවන්තර කතං කම්මං යමොකාසං ලභෙ තතො
හොති සා සන්ධි තෙනෙව උපඨාපිත ගොචරෙ” යනාදියයි.

අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි වීථි සංග්‍රහ විභාග නම්වූ සිව්වෙනි
පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.

චතුත්ථො පරිච්ඡෙදො නිට්ඨිතො.

---

## පදගතාර්ථ.

වීථි චිත්ත වසෙනෙවං පවත්තිය මුදීරිතො
පවත්ති සඞ්ගහො නාම සන්ධියං දානි වුච්චති.

එවං ( යථාවුත්තනයෙන ) යථොක්ත ක්‍රමයෙන් ; වීථිචිත්ත වසෙන, වීථි චිත්තයන්ගේ වශයෙන් ; පවත්තියං, ප්‍රවෘත්ති කාලයෙහි හෙවත් ප්‍රතිසන්ධි චිත්තයට අනතුරු ප්‍රථම භවාඞ්ගය පටන් චුති චිත්තයට අනන්තර ප්‍රත්‍යය වන්නාවූ ජවනයෝ තදාලම්බණ හෝ භවාඞ්ගය දක්වා මේ අතර කාලයෙහි ; පවත්ති සඞ්ගහො නාම, ප්‍රවෘත්ති සංග්‍රහ නම්වූ වීථි සංග්‍රහය ; මයා, මාවිසින් උදීරිතො, කියන ලද්දේයි. දානි, ( ඉදානි ) දැන් වනාහි ; සන්ධියං, ප්‍රතිසන්ධි කාලයෙහි හා චුතිකාලයෙහි; පවත්ති සඞ්ගහො නාම, ප්‍රවෘත්ති සඞ්ග්‍රහ නම්වූ වීථිමුක්ත සඞ්ග්‍රහයක්; මයා, මාවිසින් ; පවුච්චති, කියනු ලැබේ. චතස්සො භූමියොච, සතර භූමි කෙනෙක්ද ; චතුබ්බිධා පටිසන්ධිච, සතරාකාරවූ ප්‍රතිසන්ධියෙක්ද ; චත්තාරිකම්මානිච, සතර කර්මයෝනෙක්ද, චතුධාමරණුප්පත්තිච, සතරාකාරවූ මරණෝත්පත්ති සංඛ්‍යාතවූ චුතියෝද; ඉති, මෙසේ; වීථිමුත්ත සඞ්ගහෙ, වීථිමුක්ත සංග්‍රහයෙහි; චත්තාරිචතුක්කානි සතර චතුෂ්ක කෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය. තත්ථ, ඒ සතර චතුෂ්කයන් අතුරෙන් ; අපායභූමිච, අපායභූමියද ; කාමසුගති භූමිච, කාමසුගති භූමියද ; රූපාවචර භූමිච, රූපාවචර භූමියද ; අරූපාවචර භූමිච, අරූපාවචර භූමියද ; ඉති, මෙසේ ; චතස්සොභූමියොනාම, සතරභූමීහු නම් ; වෙදිතබ්බා, දතයුත්තාහුය. තාසු, ඒ සතරාකාර භූමීන් අතුරෙන් ; නිරයොච, නරක භූමියද ; තිරච්ඡානයොනිච, තිරිසන් භූමියද ; පෙත්තිවිසයොච, ප්‍රේත භූමියද ; අසුරකායොච, අසුරකාය භූමියද ; ඉති, මෙසේ ; අපායභූමි, අපාය භූමිතොමෝ ; චතුබ්බිධා හොති, සතරාකාර වන්නීය. මනුස්සාච, මනුෂ්‍ය භූමියද ; චතුමහා

රාජිකාච, චාතුර්මහාරාජික භූමියද ; තාවතිංසාච, තාවතිංස භූමියද, යාමාච, යාමභූමියද ; තුසිතාච, තුසිත භූමියද ; නිම්මාණරතීච, නිර්මාණරති භූමියද ; පරනිම්මිතවසවත්තීච, පරනිර්මිත වශවර්ති භූමියද ; ඉති, මෙසේ ; කාමසුගතිභූමි, කාමසුගති භූමි තොමෝ ; සත්තවිධා හොති, සත් වැදෑරුම් වන්නීය. පන, අවයවයෙන් අන්‍යවූ සමුදය කියම්හ:– එකා දසවිධා අපි, එකොළොස් වැදෑරුම්වූද ; "සා අයංභූමි, ඒ භූමිතොමෝ ; කාමාවචර භූමිච්චෙව, කාමාවචර භූමියයි කියාම ; සඞ්ඛංගච්ඡති, ගණනට යෙයි. නොහොත් කාමාවචර භූමියෙහි සංග්‍රහයට යෙයි. හෙවත් කාමාවචර භූමිය යන ව්‍යවහාරයට යෙයි. බ්‍රහ්මපාරිසජ්ජාච, බ්‍රහ්මපාරිෂද්‍ය භූමියද ; බ්‍රහ්මපුරොහිතාච, බ්‍රහ්මපුරොහිත භූමියද ; මහාබ්‍රහ්මාච ඉති, මහාබ්‍රහ්ම භූමියදැයි ; පඨමජ්ඣාන භූමි, ප්‍රථමධ්‍යාන භූමිතොමෝ ; තිවිධා හොති, තුන්වැදෑරුම් වන්නීය ; පරිත්තාභාච, පරිත්තාභා නම් භූමියද ; අප්පමාණාභාච, අප්පමාණාභා නම් භූමියද ; ආභස්සරාච ඉති, ආභස්සර භූමියදැයි යන ; දුතියජ්ඣාන භූමි, ද්විතීයධ්‍යානභූමි තොමෝ ; තිවිධා හොති, තුන්වැදෑරුම් වන්නීය. පරිත්තසුභාච, පරිත්තසුභ නම් භූමියද ; අප්පමාණසුභාච, අප්පමාණසුභ නම් භූමියද ; සුභකිණ්හාච ඉති, සුභකිණ්හ නම් භූමියදැයි ; තතියජ්ඣාන භූමි, තෘතීය ධ්‍යාන භූමිතොමෝ ; තිවිධාහොති, තුන්වැදෑරුම් වන්නීය. වෙහප්ඵලාච, වෙහප්ඵල නම් භූමියද ; අසඤ්ඤසත්තාච, අසංඥසත්ව නම් භූමියද ; සුද්ධාවාසාච ඉති, පඤ්චසුද්ධාවාස භූමිහුදැයි ; චතුත්ථජ්ඣානභූමි, චතුර්ථධ්‍යාන භූමිතොමෝ ; සත්තවිධා හොති, සත්වැදෑරුම් වන්නීය. ඉති, මෙසේ ; රූපාවචරභූමි, රූපාවචර භූමිතොමෝ ; සොළසවිධා හොති, සොළොස් වැදෑරුම් වන්නීය. අවිහාච, අවිහනම් භූමියද ; අතප්පාච, අතප්ප නම් භූමියද, සුදස්සාච, සුදස්ස නම් භූමියද ; සුදස්සීච, සුදස්සී නම් භූමියද ; අකනිට්ඨාච ඉති, අකනිට්ඨ නම් භූමිය දැයි, සුද්ධාවාස භූමිතොමෝ ; පඤ්චවිධා හොති, පස්වැදෑරුම් වන්නීය. ආකාසානඤ්චායතන භූමිච, ආකාශානන්තායතන භූමියද ; විඤ්ඤාණඤ්චායතන භූමිච, විඥානන්තායතන භූමියද ; ආකිඤ්චඤ්ඤායතන භූමිච, ආකිඤ්චඤ්ඤායතන භූමියද ; නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමිච ඉති, නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමිය දැයි ; අරූපභූමි, අරූප භූමිතොමෝ ; චතුබ්බිධා හොති, සතර වැදෑරුම් වන්නීය.

සුද්ධාවාසෙසු, සුද්ධාවාසභූමියෙහි නොහොත් සුද්ධාවාස භූමිහු තුමූ ; සබ්බථා, සර්වප්‍රකාරයෙන් ; පුථුජ්ජනාපුග්ගලාඅපි, පෘථග්ජන පුද්ගලයෝද ; සොතාපන්නාපුග්ගලාචාති, සෝවාන් පුද්ගලයෝද ; සකදාගාමිනො පුග්ගලාචාපි, සකෘදාගාමි පුද්ගලයෝද ;

නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. අසඤ්ඤාපායභූමිසු, අසංඥසත්ත්ව භූමිය අපායභූමිය යන මෙහි නොහොත් භූමීන් විසින් අරියා, අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයෝ ; නුපලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. සෙසඨානෙසු, පඤ්චසුද්ධාවාස සතර අපාය අසංඥසත්ත්ව භූමිය යන දස භූමීන්ගෙන් අන්‍යවූ එක්විසි භූමියෙහි නොහොත් භූමින් විසින් ; අරියාච, අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයෝද ; අනරියාපිච, පෘථග්ජන පුද්ගලයෝ තුන්දෙනද ; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. ඉදං, මේ කියන ලද්දේ වනාහි, එත්ථ, මේ වීථිමුක්ත සංග්‍රහයෙහි ; භූමිචතුක්කං, භූමි චතුෂ්කයයි

---

## භාවාර්ථ.

මෙසේ දක්වන ලද්දාවූ නාමරූප සඞ්ඛ්‍යාත පරමාර්ථ ධර්මයාගේ හටගැණීමට ස්ථානවූ භූමිතොමෝ වනාහි එකොළොස් කාමභූමිය සොළොස් රූපාවචර භූමිය සතර අරූපාවචර භූමියයි සඞ්ඛ්‍යා වශයෙන් ත්‍රිවිධාකාර වන්නේයි. සඞ්ඛ්‍යා වශයෙන් එක්තිස් ආකාර වන්නේයි. එකොළොස් කාමභූමිය’ යනු නරක භූමිය තිරශ්චාන භූමිය, ප්‍රේතභූමිය, අසුරකාය භූමියයි අපායභූමි සතරෙක. මනුෂ්‍යභූමිය, චාතුර්මහාරාජිකභූමිය, තාවතිංසභූමිය, යාමභූමිය, තුසිතභූමිය, නිර්මාණරතීභූමිය, පරනිර්මිත වශවර්ත්තිභූමිය’යි යන කාමභූමි සතෙක. මේ දුර්ගති සුගති දෙක එක්කොට ගත් කල්හි එකොළොස් කාමභූමියයි කියත්. මේ එකොළොස් කාමභූමීන්ගේ ස්වභාව ලක්ෂණය වෙන් වෙන් කොට දක්වන්නාවූ තන්හි “අයතො සුඛතො නිග්ගතොති නිරයො ” යනුවෙන් අය සඞ්ඛ්‍යාතවූ සැපයෙන් පහව ගියාවූ ස්ථානය නිරය නමැයි කියන ලදී. එක් ඇසිපියක් හෙළන කාලයක් පමණකුදු සැපයක් නැතිව අත්‍යශය දුඃඛයට පැමිණෙන හෙයින් නිරය භූමියයි කී නියායි. ඒ නිරයභූමිය වනාහි කුශලාකුශල කර්මයන්ගේ දුනීමක් නැත්තාවූ ලොභයෙන් මුළාව සත්ත්වඝාතනාදී අකුශල්රැස් කළාවූ සත්ත්වයන්ගේ ඉපදීමට ස්ථානවූ නරකයෙහි ආයු පමණින් පන්සියයක් අවුරුදු ආයුෂ ඇත්තාවූ සංජීව නම් නරකයෙක්ද, ඒ සංජීව නරකයෙහි එක් දවසක් මනුෂ්‍යයන්ගේ ආයුපමණින් හව්රුදු නවලක්ෂයකැයි කියනලදී. සෙසු නරකයෙහිද සතර සතරින් ගුණ කොට ආයු ගතයුතුයි. මාතෘ පිතෘ ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් කෙරෙහි වරදවා පිළිපදිනා සත්ත්වයෝය. මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ සත්ත්වයෝය, යන මොවුන්ගේ ඉපදීමට භූමිවූ නරක ආයු පමණින් දහසක් අවුරුද්දට ආයු

ඇත්තාවූ කාල සූත්‍ර නම් එක් නරකයෙක, ගවයන් එළුවන් තිරෙළුවන් ආදීවූ සත්ව ඝාතනය කරන්නාවූ වැදි කෙවුල් ආදීවූ සත්වයන්ගේ ඉපදීමට භූමිවූ නරකායුගණනින් දෙදහසක් අවුරුද්දට ආයුෂ ඇත්තාවූ සංඝාත නම් එක් නරකයෙක, සත්වයන්ට හිංසා පීඩා කරන්නාවූ සත්වයෝය, ඉන්ද්‍රජාල මායාකාර සත්වයෝය යන මොවුන්ගේ ඉපදීමට භූමිවූ නරකායු පමණින් සාරදහසක් අවුරුද්දට ආයුෂ ඇත්තාවූ රෞරව නම් නරකයෙක, තුණුරුවන්ට අයත්වූ වස්තුය අම්බලම් මඩම් ආදිය මේ ආදීවූ වස්තුව විනාශ කරන්නාවූ පැහැරගන්නාවූ මනුෂ්‍යයන්ගේ ඉපදීමට භූමිවූ නරක ආයුපමණින් අටදහසක් අවුරුද්දට ආයු ඇත්තාවූ මහාරෞරව නම් නරකයෙක, ප්‍රාණඝාතාදීවූ දුශ්චරිතයන්ට අනිෂ්ට විපාකයෙක් නැත්තේය සුගතිය හා දුගතියත් මේ මනුෂ්‍ය භූමියෙහිමය යනාදීවූ මිථ්‍යාදෘෂ්ටි ගත්තාවුන්ට භූමිවූ නරකායුපමණින් සොළොස් දහසක් අවුරුද්දට ආයු ඇත්තාවූ තාප නම් මහා නරකයෙක, බුදුන් දහම් සඞ්ඝයා නැතැයි යන මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ සත්වයන්ගේ ඉපදීමට භූමිවූ අන්තරකල්පාර්ධයකට ආයුෂ ඇත්තාවූ මහා තාප නම් එක් නරකයෙක, මව්පියන් රහතුන් මැරීමක් හෝ දේවදත්තාදීන් මෙන් බුදුන්ගේ ශරීරයෙන් ලේ සොල්වන්නාවූ තැනැත්තන්ද, සඞ්ඝයාට අයිතිවූ සඞ්ඝාරාම දාගැබ් මහබෝ ප්‍රතිමාරූපාදිය විනාශ කරන්නාවූ තැනැත්තන්ගේද උත්පත්තියට සුදුසුවූ අන්තරකල්පයකට ආයුෂ ඇත්තාවූ දුකෙන් අතුරක් නැතිහෙයින් අවීචි නම්වූ මහානරකයෙක, මේ මහා නරක අට හා එක් මහා නරකයෙක්හි එකී එකී පාර්ශ්වයෙහි උස්සද නරක සතර සතර බැගින් ඇතිහෙයින් සියලු පිරිවර ක්ෂුද්‍ර නරක හා මහා නරකයෝද එක්සියසතිසක්වෙත්. තවද චක්‍රවාටයන් තුන්දෙනෙක් රැස්වූ තන්හි පටගන්නාවූ ලෝකාන්තරික නම් නරකයෙක්ද, ලෝහකුම්භී නම් ක්ෂුද්‍ර නරකයෙක්ද, වෛතරණී නම් ගඞ්ගා නරකයෙක්ද, කෝටිසිම්බලී නම් වෘක්ෂාකාර නරකයෙක්ද, යන මේ සියලු නරකයෝ නිරය නම් වෙත්. ඒ අටමහා නරකයෝ තුමූ ජම්බුද්වීපයෙහි පාංශුපෘථුවියෙහි පිහිටා ඇත්තාහුයයි දතයුතුයි. අවීචිමහානරකය, ජම්බුද්වීපය, තව්තිසා භවනය, අසුරභවනය, ගුරුළුභවනය යන මේ සියලු භූමිහුම දසදහසක් යොදුන් ප්‍රමාණ ඇත්තාහුයයි දතයුතුයි. "නිරෝඅස්සාදිතාති නිරයාඃ" යනු විග්‍රහ බැවින් සරසට යන්නාවූ සත්වයෝ තුමූ තෝහොත් මාගීඵලයන්ගෙන් මිදුනාවූ යට භාගයට යන්නාවූ අර්ථයෙන් තිරච්ඡාන නම් වෙත්. "පතමේත සුඛතො ඉතාගතාති පෙතා" යනු විග්‍රහ බැවින්

ප්‍රකෘතියෙන් හෙවත් සර්වප්‍රකාරයෙන් සැපයෙන් පහවගියාවූ අර්ථයෙන් ප්‍රේත නම් වෙත්. තසුරන්ති ඉස්සරිය කීලාදීහි නදිබ්බන්තීති අසුරා" යනු නිර්වචන බැවින් ඓශ්වර්ය ක්‍රීඩාදියෙන් ක්‍රීඩා නොකරණ අර්ථයෙන් හෙවත් නොබබලන අර්ථයෙන් අසුර නම් වෙත්. මේ විග්‍රහයෙන් වනාහි ප්‍රේතාසුරයෝ මුත් වෙපචිත්ති අසුරයෝ නොගැණෙත්. කුමක් හෙයිනයත්? වෙපචිත්ති නම් අසුරරාජයා විසින් තමං වශයෙහි පවත්වන්නාවූ දිව්‍ය අසුරයෝ වනාහි ද්විහෙතුක කාමාවචර විපාක සිතින් පටිසන්ධි ගෙණ ප්‍රවෘත්ති කාලයෙහි ත්‍රිහෙතුක මහා විපාකයන්ගේ වශයෙන් දෙවියන්ට බඳුවූ පඤ්චකාමසැප අනුභව කරණ හෙයින් තව්තිසාවැසි දෙවියන් කෙරෙහි ඇතුලත් වෙත් මැයි. ඔවුන්ට වනාහි ත්‍රිහෙතුක දෙවියන්ට මෙන් ධ්‍යාන මාර්ගඵල නොලැබෙත් මැයි. එහෙයින් කීහ:- පරමාර්ථ විනිශ්චයෙහි :-

"තාවතිංසෙසු දෙවෙසු වෙපචිත්තාසුරාගතා" යනාදියයි. ඒ තිරශ්චාන ප්‍රේත අසුර යන ත්‍රිවිධාකාර නරකවාසී සත්වයන්ට අයත්වූ ආවේණික භූමියෙක් නම් නැත්තේයි. "තිරච්ඡාන පෙතත්තිවිසය අසුරකායානං පන විසුං භූමිනත්ථි තෙසං ඛන්ධපවත්ති විසයො යෙව භූමිනාම" යනු කීහ. එසේම "යථාවං අරඤ්ඤපබ්බත පාදාදිකෙ නිබද්ධවාසං වසන්ති සොයෙව ඔකාසො භූමි ඉති ගහෙතබ්බො" යනුද සංඛෙපවණ්ණනා ටීකායෙහි කී බැවින් තිරශ්චාන ප්‍රේත අසුර නිකායයන්ට අන්‍ය භූමියෙක්නම් නැත්තේමැයි. ඔවුන්ගේ සකන්ධයෝම භූමිනම්වෙයි. ඒ එසේමැයි. රජමාලිගාදියෙහි වර්ණයකරන්නාවූ ගිරා සැළලිහිණි මොනර ආදීවූ පක්ෂීන් හා රාජාලිවූ ඇත් අශ්ව මඞ්ගල්‍ය වෘෂභාදී සත්වයෝද වාසයකරන්නාවූ ඒ රාජ මන්දිරය කාමසුගති භූමියෙහි ඇතුලත්වෙයි. එසේකුදුවුවත් ඔවුන්ගේ පඤ්චසකන්ධයෝම තිරශ්චාන භූමිනම්වෙත්යයි අර්ථගතයුතුයි. තවද ගිජ්ඣකූට පර්වතපාදයෙහි අනෙක ප්‍රකාර නිජ්ඣාමතණ්හිකාදී ප්‍රේතයෝද, සියලු ජලයෙහි මත්ස්‍යාදීවූ අනෙක ප්‍රකාර සත්වයෝද, සියලු ආරණ්‍යාදියෙහි සිංහ ව්‍යාඝ්‍රාදී අනෙක ප්‍රකාර සත්වයෝද නිබද්ධ වාසයකරණහෙයින් ඒ ඒ ස්ථාන ඒ ඒ සත්වයන්ගේ අපාය භූමියයි එකාකාරයකින් ගතහැකිවෙති. නරකය තිරශ්චානයොනිය ප්‍රේත විෂය අසුරකාය යන භූමීහු සතරදෙන වනාහි "පුඤ්ඤසම්මතා අයා යෙභුය්‍යෙන අපගතොති අපායො" යනු විග්‍රහ බැවින් පුණ්‍ය සම්මතවූ අයයෙන් බොහෝසෙයින් පහව ගිය ස්ථානය අපායනම්වෙයි. එහි "අප"

ශබ්දය අපෙතාර්ථවාචකවෙයි. "අය" ශබ්දය අභිවෘද්ධිකුශල කර්මවිපාක වාචකවෙයි. ඒ එසේමැයි. සතරඅපායෙහිම සැප විඳීමට හෝ කුශල් රැස්කිරීමට හෝ සුදුසුවූ යොග්‍යවූ ඇසි පියහෙලන කාලය කුදු නැත්තේයි. එහෙයින් අපායයි ව්‍යව හාරයි.

පුද්ගලයෝ වනාහි දුගති අහේතුක පුද්ගලය, සුගතිඅහේතුක පුද්ගලය, ද්විහේතුක පුද්ගලය ත්‍රිහේතුක පුද්ගලයයි,යන පෘථග් ජනයෝ සතරදෙනෙක්ද; සෝතාපත්තිමාර්ගස්ථය, ඵලස්ථය,සකෘදාගාමි මාර්ගස්ථය, ඵලස්ථය, අනාගාමි මාර්ගස්ථය. ඵලස්ථය, අර්හත් මාර්ගස්ථය, ඵලස්ථයයි, ආර්‍ය්‍යපුද්ගලයෝ අටදෙනෙක යන මේ දෙවැදෑරුම් පුද්ගලයන්ගේ සංඛ්‍යාව දොළොසක්වෙයි. ඒ දොළොස් පුද්ගලයන් අතුරෙන් සතර අපායභූමියෙහි වාසය කරන්නාවූ සත්ව ජාතීන්ගේ සංඛ්‍යාව යම් උපමාවකින් හෝ ගණන් ක්‍රමයකින් හෝ නොදතහැක්කේය. නොකියහැක්කේය. එව උදාහරණයක් නම්:—අප ඉදිරියෙහි වසන්නාවූ දිය ගොඩ සත්වයන්ගේ හෙවත් තිරිසන් අපායගත සත්වයන්ගේ ජාති සංඛ්‍යාව ගණන් නොතැබිය හැක්කේය. එසේම අපගේ ඇසට විෂය නොවන්නාවූ ත්‍රිවිධාපායවාසී සත්වයන්ගේ ජාති සංඛ්‍යාවට උපමාවක් නැත්තේයි. එක එක ජාතියෙහි උපදනාවූ එක එක සත්වයාවගෙයෙන් ගණන් ගතහොත් අනන්තාප්‍රමෙය්‍ය වෙයි. එහෙයින්"සත්තවිසයොඅචින්තියො"යනු වදාළේයි. ඒසතර අපායවාසී සත්වයන්ගේ පටිසන්ධිය උද්ධච්ච සහගත අකුශලය හැර අවශෙෂවූ එකොළොස් අකුශල කර්මයන්ගේ ශක්තියෙන් අකු ශල විපාක උපෙක්ෂා සන්තීරණ චිත්තයෙන්මගන්නේයි. එහෙ යින් සතර අපායවාසී සත්වයන්ට එකත්ත සඤ්ඤීයයිකියති. නානත්තකායායයි ව්‍යවහාරකෙරෙති. එකත්තසඤ්ඤී යනු එකම උපෙක්ඛා සහගත සන්තීරණය යන අර්ථයි. නානත්තකාය යනු අනෙක ප්‍රකාර ශරීර සටහන් ඇත්තාවූ සත්ව සමූහයෝය යන අර්ථයි. මේ අකුශල විපාක උපෙක්ඛා සන්තීරණ චිත්ත යෙන් සත්සියයක් යොදුන් දිග ඇත්තාවූ ආනන්ද මත්ස්‍යාදී මහත් ආත්මභාව ඇත්තාවූ සත්වයෝද, මෙතන සූත්‍රාදියෙහි "අණුක චූලා" යනාදී තන්හි මසැසට නොපෙණෙන්නාවූ කුඩා සත්වයෝද කෙසේ උපදින්නාහුදැයි විමතිය ඉපදිය යුතුවෙයි. සියලුම සත්වයන්ගේ උත්පත්තිය සියලු භව යෝනි ගති ඨිති සත්වාවාසයන්ට සුදුසු පරිද්දෙන් උපදනාහුයයි දතයුතුයි. එහෙ යින් එකම උපෙක්ඛා සන්තීරණ චිත්තයෙන් යොදුන් සිය

ගණන් ආත්මභාව ඇත්තාවූ සත්ත්වයෝද. ඇසට නොපෙණෙන්නාවූ සියුම් සත්ත්වයෝද, අපාද ද්විපාද චතුප්පාද බහුප්පාද සත්ත්වයෝද, ඒ ඒ යෝනියට සුදුසු පරිද්දෙන් උපදනාහුයයි දතයුතුයි. ඒ සත්ත්වයන්ගේ නාමකාය උපේක්ෂා සන්තීරණ චිත්තයෙන්ද, රූපකාය යෝනියෙන්ද, හටගන්නා බැවින් ඒ ඒ යෝනියෙහි ඇත්තාවූ ස්වභාවයෙන් ඒ සත්ත්වයන්ගේ ශරීර සටහන් ආදිය හටගන්නාබව දතයුතුයි. උපේක්ෂා සන්තීරණ චිත්තයෙන් පටිසන්ධියගන්නාවූ සියලු ආපායික සත්ත්වයන්ගේ භවාඞ්ග චුතීහුද එම චිත්තයෙන්ම වන්නේයයි දතයුතුයි. ඒ දුගති අහේතුක පුද්ගලයන් කෙරෙහි ප්‍රවෘත්ති කාලයෙහි උපදනා චිත්තයෝ නම්:—දොළොස් අකුශල චිත්තයෝය, හසිතෝත්පාද චිත්තය හැර අවශේෂ අහේතුක සිත් සතළොසය, මහාකුශල අටය, යනමේ දෙතිස් චිත්තයෝ තුමූ සුදුසු පරිද්දෙන් උපදනාහුමෙත්. ඒ සතර අපායවාසී සත්ත්වයන්ගේ ආයුෂවනාහි නියමයෙක් නැත්තේයි "ආපායිකානං සත්තානං ආයු පරිච්ඡෙදො නත්ථි. යාව අකුසලකම්මං නඛීයති තාවචවනාභාවතො"යි සුචිත්තාලඞ්කාරයෙහි ආහෙයින්ද,

"ආපායික මනුස්සායු—පරිච්ඡෙදො නවිජ්ජති ;
තථාභිකාලො මන්ධාතා—යක්ඛාකෙචි චිරායුනො."

යන සච්චසංඛෙපප ගාථාවෙන් තිරිසන් අපායෙහි උපන්නාවූ මහාකාලනාගරාජ තෙමේ කල්පායුෂ්ක බව පෙණෙන හෙයින්ද, වැසිකිළි ආදියෙහි කුණුමස් ආදියෙහි උපදනාවූ සියලු පණුවර්ගයෝ ඉපද සත් දවසකින් වයෝවෘද්ධව මරණයට යනබව පෙණෙනහෙයින්ද, යම්තාක් අකුශලකර්මය නොගෙවේ නම් ඒතාක් අපායෙන් චුත නොවේයයි දතයුතුයි.

## අපාය පරිච්ඡේදය නිමි.

"සතිසූර බ්‍රහ්මචරිය යොග්‍යතාහි ගුණෙහිඋක්කට්ඨමනතාය මනොඋස්සන්නං එතෙසන්ති මනුස්සා" යනු නිර්වචන බැවින් මනුෂ්‍යයන්ට ඇත්තාවූ පඤ්චකාම සම්පත්තියට වඩා විශිෂ්ටවූ ප්‍රණීතවූ පඤ්චකාම සම්පත්තියක් දෙවියන්ට ඇත්තේ නමුදු මනුෂ්‍යයෝ තුමූ උපසම්පදාදී ශ්‍රේෂ්ඨ ශීලයන් රක්ෂාකිරීම පිණිසද නොයෙක් ගුණයෙන් උතුම්වූ සිත් ඇතිහෙයින් අතිශයින් උතුම්වූ ස්මෘති ප්‍රඥාගුණයට පැමිණියාවූ සම්‍යක් සම්බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ අග්‍රශ්‍රාවක මහාශ්‍රාවකා තුමූදීහු මනුෂ්‍ය යෝනියෙහිම උපදනා

හෙයින් උත්කෘෂ්ටවූ සිතක් ඇත්තේය යන අර්ථයෙන් "මනුස්ස" නම්වෙයි. නොහොත් ලෝක ශබ්දයාගේ අර්ථය දන්නාවූ පුරාතන ආචාර්‍ය්‍යවරයෝ තුමූ මේ ලෝකයෙහි පළමුවෙන් පහළවූ මනු නම් ඇත්තාවූ රජහුගේ පුත්‍රවූ බැවින්ද, මනුෂ්‍යයයි කීවාහුය. ඒ මනුෂ්‍යයන්ගේ වාසස්ථානවූ පන්සියයක් ක්‍ෂුද්‍ර දිවයින් පිරිවරකොට ඇත්තාවූ සතරමහා වීපය මනුෂ්‍ය භූමිනම්වෙයි. "චාතුම්මහාරාජික භූමි" යනු "මනුස්ස භූමිතො චත්තාළීස සහස්ස යොජනෙ යුගන්ධරපබ්බතමත්ථකෙ තිට්ඨති" යනු සුවිනතාලඞ්කාරයෙහි ආ බැවින් මනුෂ්‍ය භූමියෙන් දෙසාළිස් දහසක් යොදුන් උස්වූ යුගන්ධර පර්‍වතය හා සමානවූ මහාමේරු පර්‍වතයාගේ පස්වෙනි ආලින්දයෙහි චාතුර්මහාරාජික භූමිය පිහිටියේයි. ඒ චාතුර්මහාරාජික භූමිය වනාහි නොයෙක් ආකාරයෙන් නොයෙක් තන්හි පිහිටියාවූ නොයෙක් විමානයෝද චාතුර්මහාරාජික යයි ව්‍යවහාරකෙරෙති. නොයෙක් පර්‍වත ගඞ්ගා සමුද්‍රවෘක්‍ෂාදිය ආශ්‍රයකොටගෙණ වසන්නාවූ සියලුභූම්‍යස්ථ දෙවියෝද, චාතුර්මහාරාජික භූමියෙහි ඇතුලත්වෙති. ද්විහෙතුක ලාමක කාමාවචර කුශල කර්මබලයෙන් අහෙතුක කුශල විපාක උපෙක්‍ෂාසන්තීරණ සිතින් පටිසන්ධිගන්නාවූ භූමිනිශ්‍රිත විනිපාතික අසුරයයි කියන ලද්දවූ ඥාති ප්‍රෙත සමූහයාද කුශල කර්මානුභාවයකින්ම උපන් හෙයින් අපායෙහිද ඇතුලත් නොකොටහැකි වෙති. මනුෂ්‍ය යොනියෙහි නූපන් හෙයින් මනුෂ්‍ය භූමියෙහිද ඇතුලත්නොකට හැකිවෙති. එහෙයින් ඔවුන් චාතුර්මහාරාජිකයෙහිම ඇතුලත්කටයුත්තාහුය. එබැවින් පෘථිවීතලයෙන් පටන් යුගන්ධර පර්‍වතය දක්වා සියලු භූම්‍යස්ථ ආකාශස්ථ දෙවියන්ගේ වාසස්ථානයෝ තුමූ චාතුර්මහාරාජික භූමියෙහි ඇතුලත්වෙති. එතැන් පටන් දෙසාළිස් දහසක් යොදුන් ගිය තන්හි තව්තිසා භවනයද එතැන් පටන් මතු දිව්‍ය ලෝකයන්ගේද අතරතුර දෙසාළිස් දහසක් යොදුන්ම ඇති වන්නාහුය. "චතු මහාරාජෙසු භත්ති යෙසං චතුන්නං මහාරාජානං නිවාසඨානභූතෙ චතුමහාරාජෙ භවන්ති-චාතුමහාරාජිකා" යනු නිර්වචන බැවින් සිව්වරම් රජදරුවන්ට ගෞරවකට යුතු බැවින්ද, සිව්වරම් රජුන්ගේ නිවාසස්ථානවූහෙයින්ද, චාතුමම හාරාජිකනම්වේ. තාවතිංසය යනු "මඝෙන මානවෙන සද්ධිං තෙත්තිංස සහපුඤ්ඤකාරිනො එත්ථ නිබ්බත්තාති තං සහචරිත ඨානං තෙත්තිංසා"යි නිර්වචන බැවින් මඝමානවකයා ප්‍රධාන කොට ඇත්තාවූ එක්ව පින්කම්කළාවූ තෙතිස්දෙනාගේ උත්පත්තිස්ථානවූහෙයින් "තෙත්තිංස"යයි කියයුතුතන්හි මහා

ප්‍රදේශ සූත්‍රයෙන් තාවතිංසා යනු ආදේශකොට උපචාරවශයෙන් "තාවතිංසාභූමි" යයි කියනලදී "දුක්ඛතො යාතා අපයාතාති යාමා යනු නිර්වචන බැවින් දුකින් පහවූ හෙයින් ඒ දෙවියෝ යාමනම් වෙත් "අත්තනො සිරි සම්පත්තියා තුසං පීතිං ඉතා ගතාති තුසිතා" යනු නිර්වචන බැවින් තමන්ගේ ශ්‍රී සම්පත්තිය කාරණකොටගෙණ ප්‍රීතියට පැමිණියාවූ හෙයින් තුසිතනම් වෙයි. "නිම්මාණෙ රති එතෙසන්ති නිම්මාණරතිනො" යනු නිර්වචන බැවින් තමන් විසින් නිර්මිත කරගන්නා ලද්දාවූ ශ්‍රී සම්පත්තියෙහි ඇලෙන හෙයින් ඒ දෙවියෝ නිම්මාණරති නම් වෙත් ඒ දෙවියන්ට වාසස්ථානවූ භූමිතොමෝ නිම්මාණරති භූමිනම්වේ. 'පරනිම්මිතෙසු භොගෙසු අත්තනො වසං වත්තෙන්තීති පරනිම්මිත වසවත්තිනො" යනු නිර්වචන බැවින් අනුන් විසින් නිර්මිත කරණ ලද්දාවූ ශ්‍රී සම්පත්තිය තමාගේ වසගයට පමුණුවන හෙයින් ඒ දෙවියෝ පරනිම්මිත වසවත්ති නම් වෙත්. ඒ දෙවියන්ට වාසස්ථානවූ භූමිතොමෝ "පරනිම්මිත වසවත්ති" නම් වේ. මෙසේ දක්වන ලද්දාවූ මනුෂ්‍ය භූමිය ෂට්විධ කාම ස්වර්ගය යන භූමිහු සත්දෙන "අනෙකවිධ සම්පත්ති අධිඨානතාය සොභනා ගන්තබ්බතො උපගන්තබ්බතො ගතීති සුගතී" යනු නිර්වචන බැවින් අනෙකප්‍රකාරවූ සම්පත්තීන්ට ආධාරස්ථානවූ හෙයින්ද ශොභන සඞ්ඛ්‍යාතවූ කාමාවචර මහා කුශල කර්ම හෙතුවෙන් පැමිණිය යුතුහෙයින් පටිසන්ධි ලැබියයුතු හෙයින් කාම සුගති යයි ව්‍යවහාර කරණු ලැබේ. ඒ සප්තප්‍රකාරවූ කාමසුගති භූමින් අතුරෙන් මනුෂ්‍යභූමිය චාතුර්මහාරාජිකභූමිය යන භූමිද්වයෙහි යට කියන ලද්දාවූ දෙළොස් වැදෑරුම්වූ පුද්ගලයන් අතුරෙන් දුගති අහෙතුක එකම පුද්ගලයෙකු හැර අවශෙෂ එකොළොස් පුද්ගලයෝම ලැබිය යුත්තාහුය. තාවතිංස භවනය පටන් වශවර්ත්ති දිව්‍යලොකය දක්වා මේ පඤ්චභූමියෙහි දුගති අහෙතුක සුගති අහෙතුක දෙදෙන හැර අවශෙෂවූ දසවැදෑරුම් පුද්ගලයෝම ලැබිය යුත්තාහුය ඒ කාමසුගති පුද්ගලයන් අතුරෙන් පටිසන්ධි චිත්ත බිජුවටෙහි හටගන්නාවූ අණ්ඩජ සත්වය, කලල සඞ්ඛ්‍යාතවූ මඩෙහි දලබුව නිශ්‍රයකොට හටගන්නාවූ ජලාබුජසත්වය, යන මේ සත්වයන් දෙදෙනාහට චක්ෂුරෙන්ද්‍රියාදිවූ ඉන්ද්‍රිය රූපයන්ගේ හටගැණීමට සුදුසුකාලයෙහි ඒ චක්ඛාදි ඉන්ද්‍රියයන් වලක්වන්නාවූ අකුශලකර්මය විසින් තමාගේ විපාකය පටිසන්ධිකාලයෙහි දෙන හෙයින්ද ඒ කර්මයෙන් අන්‍යවූ ප්‍රවෘත්ති කාලයෙහි අනිෂ්ට විපාක දිය හැකිවූ අකුශලකර්ම හෙතුවෙන්ද චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ ජාත්‍යන්ධාදී සත්වයන්ටද, පටිසන්ධි වශයෙන් බිහිරිවන්නාවූද, පටිසන්ධි

වශයෙන් පණ්ඩකවන්නාවූද, උභතොබ්‍යඤ්ජනකවන්නාවූද, කළාකිරීමෙහි අදක්ෂවූ සත්වයන්ටද, භූමිනිශ්‍රිතවූ දෙවියන්ටද, විනිපාතික අසුරයන්ටද කුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෙන් අහේතුක ලෞකික කාමාවචර කුශල කර්මහේතුවෙන් පටිසන්ධියෙන ඒ භවයෙහි වසනතාක්කල් මුලුල්ලෙහි එම චිත්තයම භවාඞ්ගවශයෙන් ඉපිද මරණ කාලයෙහි එම චිත්තයම චුතිවශයෙන් උපදී. කාමාවචර මහාවිපාකයෝ අටදෙනවනාගී සප්තකාම භූමියෙහිම උපදනා සත්වයන්ට පටිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් උපදනාහුවෙත්. මේ මහාවිපාකයෝ අටදෙන හා යවකී ජාත්‍යන්ධාදී මනුෂ්‍යයන්ගේ හා විනිපාතික අසුරයන්ගේද පටිසන්ධි ගන්නාවූ උපෙක්ඛා සන්තීරණ චිත්තයද, යනමේ නව චිත්තයම කාමසුගති පටිසන්ධි නවයයි ව්‍යවහාරකෙරෙත්. කාමසුගති එකොළොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහේතුක පුද්ගලයා කෙරෙහි උපදනා චිත්තයෝ නම් :- දොළොස් අකුශල චිත්තය, හසිතොත්පාද වර්ජිත අහේතුක සතළොස් චිත්තය, මහා කුශල් අටය, ඥාන සම්ප්‍රයුක්ත මහා විපාක වර්ජිත කොට ඥානවිප්‍රයුක්ත සතර මහා විපාක චිත්තයෝද, යන මේ එක් සාළිස් චිත්තයෝම හටගන්නාහු වෙති· ද්විහේතුක පුද්ගලයා කෙරෙහිද යථොක්ත එක්සාළිස් චිත්තයම ලැබෙත්. ධ්‍යානලාභී නොවූ ත්‍රිහේතුක පුද්ගලයාහට යථොක්ත එක්සාළිස් චිත්තයෙහි ඥානසම්ප්‍රයුක්ත මහා විපාක සතර බහා පන්සාළිස් චිත්තයෙක්ම උපදනාහුයයි දතයුතුයි. ධ්‍යානලාභීවූ ත්‍රිහේතුක පුද්ගලයාහට යථොක්ත පන්සාළිස් චිත්තයෙහි මහග්ගත කුශල් නවය බහා සූපණස් සිත්කෙනෙක් උපදනාහුයයි දතයුතුයි. ශ්‍රොතාපත්ති මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි ශ්‍රොතාපත්ති මාර්ග චිත්තයක්ම අධික වශයෙන් යෙදිය යුතුයි. ධ්‍යානලාභී නොවූ ශ්‍රොතාපත්ති ඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරය, ද්වේෂ මූලික දෙසිතය, උද්ධච්චසම්ප්‍රයුක්ත චිත්තය හසිතොත්පාද වර්ජිතවූ සතළොස් අහේතුක චිත්තය, මහාකුශල් අටය, මහාවිපාක අටය සෝතාපත්තිඵල චිත්තයයන මේඑක්සාළිස් චිත්තයෝ උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ සෝතාපත්තිඵලස්ථ පුද්ගලයා කෙරෙහි යථොක්ත එක්සාළිස් චිත්තයෙහි මහග්ගතකුසල් නවයබහා සමපණස් සිත්කෙනෙක්උපදනාහුයයිදතයුතුයි. සකෘදාගාමි මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි සකෘදාගාමී මාර්ග චිත්තයම ලැබෙයි. ධ්‍යානලාභී නොවූ සකෘදාගාමි ඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරය, ද්වේෂ මූලික දෙසිතය, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතය; හසිතොත්පාද වර්ජිත සත

ළොස් අහෙතුක චිත්තය, මහාකුශල් අටය, මහා විපාක අටය සකෘදාගාමී ඵල චිත්තය යන එක්සාලිස් සිත්කෙනෙක් උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ සකෘදාගාමි පුද්ගලයා කෙරෙහි එක්සාලිස් චිත්තයෙහි මහග්ගත කුශල් නවය බහා සමපණස් සිත්කෙනෙක් උපදනාහුයයි දතයුතුයි. අනාගාමී මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි අනාගාමී ඵලචිත්තය උපදනේ වෙයි. ධ්‍යානලාභී නොවූ අනාගාමී ඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිට්ඨිගත විප්‍රයුක්ත සතරය උද්ධච්චසහගත චිත්තය, හසිතොත්පාද වර්ජිත අහෙතුක සතළොසය මහාකුශල් අටය, මහාවිපාක අටය, අනාගාමී ඵල චිත්තය යන එකුන්සාලිස් සිත්කෙනෙක් උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ අනාගාමී පුද්ගලයා කෙරෙහි ඒ එකුන්සාලිස් චිත්තයෝ උපදනාහුයයි දතයුතුයි. අර්හත්මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි අර්හත් මාර්ග චිත්තය උපදනේයි. ධ්‍යානලාභී නොවූ අර්හත්ඵලස්ථ පුද්ගලයා කෙරෙහි අටළොස් අහෙතුක චිත්තය, මහා විපාකඅටය, මහා ක්‍රියා අටය, අර්හත්ඵල චිත්තය, යන පන්තිස් චිත්තයෝ උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ අර්හත්ඵල පුද්ගලයා කෙරෙහි යථොක්ත පන්තිස් චිත්තයෙහි මහද්ගත ක්‍රියා නවය බහා හුසාළිස් සිත්කෙනෙක් උපදනාහුයයි දතයුතුයි. දොළොස් පුද්ගලයන් අතුරෙන් මාර්ගස්ථ ඵලස්ථ අටදෙනා කෙරෙහි මාර්ගස්ථ පුද්ගලයන් සතරදෙන වනාහී තම තමන්ගේ එකම මාර්ග චිත්තක්ෂණයෙහිම මාර්ගස්ථයයි ව්‍යවහාර කෙරෙති. මාර්ගය හා ඵල චිත්තයාගේද අතර කාලය ඇසිපිය හෙළීමය, අකුර ගැසීමය, විදුලිය යන කිසිවෙකින් උපමා නොකට හැකි වේ. උත්පාදස්ථිති භඞ්ග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුක්තවූ මාර්ග චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ ඵල චිත්තය උපදනා හෙයින් ඵලස්ථයන් මුත් මාර්ගස්ථ පුද්ගලයෙක් නොලැබේමැයි. යම්කිසිවෙක් විසින් ආර්යමාර්ගස්ථ පුද්ගලයෙකු මරම්යි සිතා ආයුධයක් ගෙණ ග්‍රීවයෙහි තබා මාර්ගක්ෂණයෙහි ජීවිතක්ෂයට පමුණුවම්හයි උත්සාහ කෙළේ නමුදු ඒ මාර්ගක්ෂණයෙහි මරණය සිද්ධ නොකට හැකිවෙයි. එසේමමාර්ගස්ථ පුද්ගලයෙක්හට දන්දෙම්යි සිතා උත්සාහ කෙළේ නමුදු මාර්ගචිත්තක්ෂණයෙහි දන් දිය නොහැකි වෙයි. යමෙක් මාර්ගක්ෂණයෙහි දන් දෙනු කැමැත්තේවී නම් මස්තකප්‍රාප්ත විදර්ශනා ඇති යොගාවචරයෙක්හට නිරන්තරයෙන් දන්දෙන්නේවී නම් ඔහුගේ දනය මළඳ භාවනා කරන්නාවූ කල්හී මාර්ග ප්‍රත්‍යක්ෂ කෙළේවී නම් ඒ මාර්ගස්ථයාහට දන් දුන්නේ නම් වෙයි. ඒ ඵලස්ථ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් සෝතාපත්ති ඵලස්ථ පුද්ගල තෙමේ ධ්‍යානලාභී සෝතාපන්නයාය, ධ්‍යානලාභී නොවූ සෝතාපන්නයායයි

මිප්‍රකාර වනහෙයින් ධ්‍යානලාභි සෝවාන් පුද්ගල තෙමේ මේ මනුෂ්‍ය භූමියයි කියනලද කාම භූමියෙහි එක්වරකුදු පටිසන්ධි නොගෙණ මේ භවයෙහිම මතු මාර්ගත්‍රය ප්‍රත්‍යක්ෂ කොට අග්‍රීත් ඵල නිර්වාණ ධර්මයට පැමිණෙණයි. රූපභූමි අරූපභූමියෙහි හෝ ඉපිද එහිදී රහත්ව නිවණට හෝ පැමිණෙණයි. එහෙයින් ධ්‍යාන ලාභී සෝවාන් පුද්ගලයාගේ ප්‍රභේදයක් නැත්තේයි. ධ්‍යාන ලාභී නොවූ ශුෂ්ක විදර්ශක සෝවාන් පුද්ගලයා වනාහි එකබීජ සොතාපන්නය, කොලංකොල සොතාපන්නය, සත්තක්ඛත්තු පරමයයි ත්‍රිවිධාකාර සෝවාන් පුද්ගල කොටෙතක් වෙත්, ඔවුන් අතුරෙන් සෝවාන් වීමට අනතුරුව මේ මනුෂ්‍ය ලොකයෙහි හෝ දිව්‍යලොකයෙහි හෝ එක්වරක්ම පටිසන්ධි ගෙණ ඒ ආත්ම යෙහි රහත්ව නිවන් දක්නා සෝවාන් පුද්ගල තෙමේ එකම ප්‍රතිසන්ධි බීජයක් ඇතිහෙයින් එකබීජ සොතාපන්න නම් වෙයි. සෝවාන්වීමට අනතුරුව මේ මනුෂ්‍ය භූමියෙහි හෝ දිව්‍යලොක යෙහි හෝ ඒ දිව්‍ය මනුෂ්‍ය යන දෙතැන්හිම හෝ දෙවරක් හෝ තුන්වරක් හෝ සතර වරක් හෝ පස්වරක් හෝ සයවරක් හෝ පටිසන්ධිගෙණ ඒ සවෙනි ආත්මභාවයෙහි අර්හත් ඵලය සාක්ෂාත් කරන්නාවූ සොතාපන්න තෙමේ කොලංකොල නම් වෙයි. සෝවාන් ඵලයට පැමිණීමට අනතුරුව මනුෂ්‍ය භූමි හෝ දිව්‍යභූමිහෝ ඒ දෙක්හිම හෝ මිශ්‍රව සත්වරක් පටිසන්ධි ගෙණ සත්වෙනි අත්බැව්හි රහත්ව නිවන් දක්නා සොතාපන්න තෙමේ සත්තක්ඛත්තු පරමසොතාපන්න නම් වෙයි. මේ සොතාපන්න ආර්ය්‍ය පුද්ගලයා සඳහා "නතෙ භවං අට්ඨමං ආදියන්ති" යන දෙශනා ක්‍රමයෙන් අටවෙනි භවයෙහි නූපදනේය යන නියමය කාම භවය සඳහාම ගතයුත්තේයි. මනුෂ්‍ය ලොකයෙහි සෝවාන් ඵලයට පැමිණ ප්‍රථම ධ්‍යානය උපදවා ගෙණ බ්‍රහ්ම පාරිෂද්‍ය භූමි යෙහි උපන්නාවූ සෝවාන් පුද්ගල තෙමේ ඉදින් කැමති වී නම් පසළොස් රූපාවචර භූමියෙහි පසළොස් වරක්ද, පඤ්චශුද්ධාවාස යෙහි අනාගාමිව පස්වරක්ද මෙසේ විසි අත්බැව්හී ඉපිද අකනිටා බඹලෙව්හිදී රහත්ව පිරිනිවන් පෑමට හැකිවෙයි.

ශකෘදාගාමී ඵලසථ පුද්ගලතෙමේද ධ්‍යානලාභී ශකෘදාගාමියාය, ශුෂ්කවිදර්ශක ශකෘදාගාමියායයි දෙවැදෑරුම් වෙයි. ඔවුන් අතුරෙන් ධ්‍යානලාභී ශකෘදාගාමී තෙමේ මනුෂ්‍යලොක යෙහි හෝ දිව්‍යලොකයෙහි හෝ එක්වරකුදු පටිසන්ධි නොගෙණ ඉදින් කැමති වී නම් මේ භවයෙහිම රහත්ව නිවන් දක්නට පොහොසත් වෙයි. රූපභූමි අරූපභූමියෙහි හෝ ඉපිද එහිදී රහත්ව නිවන් දක්නටද පොහොසත් වෙයි. එහෙයින් ධ්‍යාන

ලාභී ශකෘදාගාමිහුගේ ප්‍රභෙදයක් නැත්තේයි. *ධ්‍යානලාභී නොවූ ශකෘදාගාමී පුද්ගලයන් අතුරෙහි මේ මනුෂ්‍යභූමියෙහිම ශකෘදාගාමි ඵලයට පැමිණ මෙහිදී අර්හත්ඵලය සාක්ෂාත්කරන්නාවූ ශකෘදාගාමි පුද්ගලයෙක්ද ඇත්තේය, දිව්‍යලොකයෙහිදී ශකෘදාගාමි ඵලයට පැමිණ දිව්‍යලොකයෙහි රහත්වන්නාවූ ශකෘදාගාමි පුද්ගලයෙක්ද ඇත්තේය. මනුෂ්‍යලොකයෙහි ශකෘදාගාමිවූ පුද්ගලතෙම එක්වරක් දිව්‍යලොකයෙහි පටිසන්ධිගෙණ එහිදී රහත්වන ශකෘදාගාමී පුද්ගලයෙක්ද ඇත්තේය, දිව්‍යලොකයෙහිදී ශකෘදාගාමීව මනුෂ්‍ය ලොකයෙහි ඉපිද රහත්වන ශකෘදාගාමී පුද්ගලයෙක්ද ඇත්තේය. නැවත මනුෂ්‍යලොකයෙහි ශකෘදාගාමීව දිව්‍යලොකයෙහි එක්වරක් පටිසන්ධිගෙණ එයින් චුතව මනුෂ්‍යලොකයෙහි ඉපිද මෙහිදී රහත්වන ශකෘදාගාමි පුද්ගලයෙක්ද ඇත්තේය. මෙසේ ධ්‍යානලාභීනොවූ ශකෘදාගාමි පුද්ගලයාගේ ප්‍රභෙදපසෙක් ඇත්තේ වෙයි.

## ශකෘදාගාමි විභාගයයි.

අනාගාමි ඵලසථ පුද්ගල තෙමේ ධ්‍යානලාභී සමථයානික අනාගාමි පුද්ගලයාය, ධ්‍යානලාභීනොවූ ශුෂ්ක විදර්ශක අනාගාමි පුද්ගලයායයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් ධ්‍යානලාභී නොවූ අනාගාමි තෙමේ මනුෂ්‍යලොකයෙහි හෝ දිව්‍යලොකයෙහි හෝ එක්වරකුදු පටිසන්ධි නොගෙණ ඉදින් කැමති වී නම් මේ භවයෙහිදීම රහත්ව නිවන් දක්නේයි. රූපාරූප භූමියට හෝ පැමිණ එහිදී රහත්ව නිවන් දක්නා අනාගාමි පුද්ගලයෙක් ඇත්තේයි. එහෙයින් ධ්‍යානලාභී අනාගාමි පුද්ගලයාගේ ප්‍රභෙදයෙක් නැත්තේයි. ධ්‍යානලාභී නොවූ ශුෂ්ක විදර්ශක අනාගාමි පුද්ගලතෙමේ වනාහි අන්තරාපරිනිබ්බායී අනාගාමීය, උපහච්චපරිනිබ්බායී අනාගාමීය, අසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමීය, සසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමීය, උද්ධංසොත අකනිට්ඨගාමී අනාගාමීයයි පංචප්‍රකාර වන්නේය. ඔවුන් අතුරෙන් යම් අනාගාමි පුද්ගලයෙක් තෙමේ පඤ්ච ශුද්ධාවාසයන් අතුරෙන් යම්කිසි භූමියක පටිසන්ධිගෙණ එහි නියමිත ආයුෂයාගේ මධ්‍යයට නොපැමිණ පූර්වභාගයෙහි රහත්ව නිවන් දක්නේවීනම් ඒ අනාගාමි තෙමේ අන්තරාපරිනිබ්බායී

* සකිං එකවාරං පටිසන්ධිවසෙන ඉමං මනුස්ස ලොකං ආගච්ඡතීති සකදාගාමී, ඉධපත්වා ඉධ පරිනිබ්බායී, තත්‍ථ පත්වා තත්‍ථ පරිනිබ්බායී, ඉධ පත්වා තත්‍ථ පරිනිබ්බායී, තත්‍ථ පත්වා ඉධ පරිනිබ්බායී, ඉධපත්වා තත්‍ථ නිබ්බත්තිත්වා ඉධ පරිනිබ්බායීති පංචසු සකෘදාගාමීසු.

නම් වේ. යම් අනාගාමියෙක් තෙමේ සුද්ධාවාසභූමීන් අතුරෙන් යම් භූමියක ඉපිද එහි නියම ආයුෂයාගේ කෙළවරට පැමිණ රහත්ව නිවන් දක්නේ වී නම් ඒ අනාගාමී තෙමේ උපහච්ච පරිනිබ්බායී නම් වේ. යම් අනාගාමි පුද්ගලයෙක් තෙමේ මේ පඤ්චසුද්ධාවාසයන් අතුරෙන් යම්කිසි භූමියක ඉපිද විදර්ශනා භාවනා කිරීම් සඞ්ඛ්‍යාත උත්සාහය නොකොට රහත්ව නිවන් දක්නේවී නම් ඒ අනාගාමී තෙමේ අසඞ්ඛාර පරිනිබ්බායී නම් වේ. යම් අනාගාමී පුද්ගලයෙක් තෙමේ සුද්ධාවාස භූමියක ඉපිද විදර්ශනා භාවනා කිරීම් සඞ්ඛ්‍යාත උත්සාහ කොට රහත්ව නිවන් දක්නේ වී නම් ඒ අනාගාමි තෙමේ සසඞ්ඛාර පරිනිබ්බායී නම් වේ. යම් අනාගාමි පුද්ගලයෙක් තෙමේ කාමධාතුවෙන් එතරව අවිහ බඹලොව ඉපිද එහි කැමතිතාක් වැස අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිට්ඨ යන සතර සුද්ධාවාස භූමියෙහි ඉපිද ආයු ඇතිතාක් එහි වැස රහත්ව නිවන් දක්නේ වී නම් ඒ අනාගාමි තෙමේ උද්ධංසොත අකනිට්ඨගාමි නම් වේ.

## මේ අනාගාමි පුද්ගල විභාගයයි.

---

අර්හත්ඵලස්ථ පුද්ගල තෙමේද ධ්‍යානලාභී රහත්හුය, ධ්‍යානලාභී නොවූ රහත්හුයයි දෙවැදෑරුම් වේ. ඒ ධ්‍යානලාභී රහත් තෙමේ සමථයානිකය හෙවත් ධ්‍යානිකයයි කියති. ධ්‍යානලාභී නොවූ රහත්තෙමේ ශුෂ්ක විදර්ශකයයි කියති. එතකුදු වුවත් රහතන්වහන්සේ සියලු කෙලෙස් නැසූ හෙයින් පිරිනිවීමෙන් මතු සෙසු ආර්‍ය්‍යයන්ගේ මෙන් විශෙෂයෙක් නැතැයි දතයුතුයි. මේ සතර ආර්‍ය්‍ය පුද්ගලයන් විසින් ඒ ඒ මාර්ගයෙන් නසන්නාවූ කෙලශයන්ගේ විභාගය යට චිත්තපරිච්ඡෙදයෙහි උපමා උපමෙය සමග දක්වන ලද්දේය.

ඒ සප්තකාම භූමියෙහි උපන්නාවූ සත්ත්වයන්ගේ ආයුපරිච්ඡෙදය මෙසේයි. "මනුස්සානම්පි ආයුපරිච්ඡෙදො නත්ථි. කදාචි උක්කට්ඨවසෙන අසඞ්ඛ්‍යෙය්‍යායුකතාපිච කදාචි ඔමකවසෙන දසවස්සායුකතාච" යනු සුචිත්තාලඞ්කාරයෙහි ආ බැවින් මනුෂ්‍යයන්ට ඇතැම් කාලෙක්හි උත්කෘෂ්ට වශයෙන් අසඞ්ඛ්‍යායුෂද යටත්පිරිසෙයින් දසවස්සායුකද වන හෙයින් මනුෂ්‍යයන්ට නියමවූ ආයුපරිච්ඡෙදයෙක් නැත්තේයි. "භුම්මදෙවානම්පි ආයුපරිච්ඡෙදො නත්ථි" යනු කී හෙයින් භූමාටුදෙවියන්ටද කුශල කර්මය නොගෙවෙනතාක් ඒ දිව්‍යාත්මයෙන් චුතවීමක් නැත්තේයි. එහෙයින් ඇතැම් භූමාටුදෙවියෝ සත්දවසක් පමණද,

ඇතැම් භූමාටු දෙවියෝ කල්පයක් පමණද ජීවත්වන හෙයින් භූමාටු දෙවියන්ටද ආයුපරිච්ඡේදයක් නැත්තේයි. චාතුර්මහා රාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිත වශවර්තිය යන ෂට්කාම ස්වර්ගයෙහි දෙවියන්ට වෙන වෙනම් ආයුෂ ඇත්තේයි. මිනිස් ගණනින් පණස් අවුරුද්දක් චාතුර්මහා රාජික දිව්‍යලොකයෙහි එක් දවාලක් හා එක් රැයක්ද වෙයි. ඒ ගණනින් තිස්දවසෙක් මාසයෙක්ද, දොළොස් මාසයෙක් හවුරුද්දෙක්ද ඒ ප්‍රමාණයෙන් පන්සියයක් හවුරුදු චාතුර්මාරාජික දිව්‍යලොකයෙහි ආයුෂ ප්‍රමාණ වෙයි. ඒ පන්සියය මිනිස්ගණනින් අනූලක්ෂයක් හවුරුදු වේත්. මිනිස් ගණනින් හවුරුදු සියයක් තව්තිසා භවනයෙහි එක් දවාලක් හා එක් රැයක් වෙයි. ඒ ගණනින් දහසක් හවුරුදු තව්තිසා භවනයෙහි ආයුෂ වෙයි. මිනිස් ගණනින් තුන්කෙළ සැටලක්ෂයක් හවුරුදු වෙයි. මනුෂ්‍ය ලොකයෙහි හවුරුදු දෙසියයෙක් යාම දෙව්ලොවට එක් දිවාරැයෙක්වෙයි. ඒගණනින් දෙදහසක්හවුරුදු යාමදෙව්ලොව ආයුෂ ප්‍රමාණ වෙයි. මිනිස් ගණනින් තුදුස් කොටි සතලිස් ලක්ෂයක් හවුරුදු වෙයි. මනුෂ්‍යයන්ගේ සාරසියයක් හවුරුදු තුසිතපුරයෙහි එක් දිවාරැයෙක් වෙයි. ඒ ගණනින සාරදහසක් හවුරුදු තුසිපුරයෙහි ආයුෂ ප්‍රමාණ වෙයි. මිනිස් ගණනින් සත්පණස් කොටි සැටලක්ෂයක් හවුරුදු වෙයි. මනුෂ්‍යලොකයෙහි අටසියයක්හවුරුදු නිර්මාණරතී දිව්‍යලොකයෙහි එක් දිවාරැයෙක් වෙයි. ඒ ගණනින් අටදහසක් හවුරුදු නිර්මාණරතී දිව්‍යලොකයෙහි ආයුෂ ප්‍රමාණ වෙයි. මිනිස් ගණනින් දෙසිය තිස්කොටි සතළිස් ලක්ෂයක් හවුරුදු වෙයි. මනුෂ්‍යලොකයෙහි හවුරුදු එක් දහස් සසියයෙක් පරනිර්මිත වශවර්ති දිව්‍යලොකයෙහි එක දිවාරැයෙක් වෙයි. ඒ ගණනින් සොළොස් දහසක් හවුරුදු පරනිර්මිත වශවර්ති දිව්‍යලොකයෙහි ආයුෂ ප්‍රමාණ වෙයි. මිනිස් ගණනින් නවසිය එක්විසිකෙළ සැට ලක්ෂයක් හවුරුදු වෙයි. මෙසේ ෂට්කාමභූමියෙහි ආයුෂ ප්‍රමාණය දත යුතුයි.

සොළොස් රූපාවචරභූමිය යනු බ්‍රහ්මපාරිෂද්‍යය බ්‍රහ්ම පුරෝහිතය මහා බ්‍රහ්මය යන භූමිත්‍රය ප්‍රථම ධ්‍යාන භූමි නම් වේ. පරිත්තාභා අප්පමාණාභා ආභස්සරා යන භූමිත්‍රය ද්විතීය ධ්‍යාන භූමි නම් වේ. පරිත්තසුභා අප්පමාණසුභා සුභකිණ්හා යන භූමිත්‍රය තෘතීය ධ්‍යාන භූමි නම් වේ. වෙහප්ඵල අසංඥ සත්ව යනභූමිද්වය හා සමග අවිහඅතප්පසුදස්ස සුදස්සී අකනිට්ඨ යන පංචසුධාවාසභූමි හා සමග යන භූමි සතවතුර්ථධ්‍යාන භූමි නම් වෙයි. මෙසේ

රූපාවචර භූමිය සොළොස් ප්‍රකාර වේසි. "පඨමජ්ඣානභූමිච පරනිම්මිත වසවත්ති භූමිතො උපරි පඤ්චපඤ්ඤාස සතසහස්සාධික සහස්ස යොජනෙ සමතලෙ ආකාසෙ තිඨති" යනු සුවිත්‍තාලඞ්කාරයෙහි ආ බැවින් ප්‍රථමධ්‍යානභූමියද පරනිර්මිත වශවර්ති දිව්‍යලොකයෙන් මත්තෙහි පණස්පස් ලක්‍ෂ අටදහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටා සිටිනේ වෙයි. ද්විතීය ධ්‍යාන භූමිත්‍රයද ප්‍රථම ධ්‍යාන භූමිය මත්තෙහි පණස්පස් ලක්‍ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතලවූ ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. තෘතීයධ්‍යාන භූමිත්‍රයද ද්විතීයධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස්පස් ලක්‍ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතලවූ ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. තෘතීය ධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස්පස්ලක්‍ෂඅටදහසක් යොදුන් ගියතන්හි වෙහප්ඵල අසඤ්ඤසත්ත යන භූමිවය සමතල ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. වෙහප්ඵලය මත්තෙහි පණස්පස්ලක්‍ෂ අටදහසක් යොදුන් ගිය තන්හි අවිහභූමියද, අවිහභූමියෙන් එපමණ මත්තෙහි අතප්පභූමියද, අතප්ප භූමියෙන් එපමණමත්තෙහි සුදස්ස භූමියද, සුදස්ස භූමියෙන් එපමණ මත්තෙහි සුදස්සිභූමියද, සුදස්සී භූමියෙන් එපමණ මත්තෙහි අකනිට්ඨ භූමියද, පිහිටා සිටිනේ වෙයි. මේ සොළොස් රූපාවචර භූමියෙහි වාසය කරන්නාවූ සත්වයන්ගේ ලක්‍ෂණ මෙසේයි. "මහාබ්‍රහ්මානං පරිවාරිකත්තා තෙසං පරිසතිං භවාති බ්‍රහ්මපාරිසජ්ජා" යනු විග්‍රහ බැවින් මහා බ්‍රහ්මයන්ගේ උපස්ථායක පිරිසෙහි හටගත් බැවින් බ්‍රහ්මපාරිසජ්ජ නම් වේ. ඒ බ්‍රහ්මයන්ගේ වාසස්ථාන භූමියද උපචාර වශයෙන් බ්‍රහ්මපාරිෂද්‍ය නම් වේ. "තෙසං පුරොහිතට්ඨානෙ ඨිතත්තා බ්‍රහ්ම පුරොහිතා" යනු නිර්වචන බැවින් ඒ මහා බ්‍රහ්මයන්ගේ අමාත්‍ය ස්ථානයෙහි සිටි හෙයින් බ්‍රහ්මපුරොහිත නම් වේ. "තෙහි තෙහි ඣානාදීහි ගුණ විසෙසෙහි බ්‍රැහිතා පරිවුඩ්ඪාති බ්‍රහ්මානො. වණ්ණ වන්තතායචෙව දීඝායුකතාදීහිච බ්‍රහ්මපාරිසජ්ජාදීහි මහන්තා බ්‍රහ්මානොති මහාබ්‍රහ්මානො" යනු නිර්වචන බැවින් ඒ ඒ ධ්‍යානාදී ගුණ විශෙෂයන් කරණකොටගෙණ හාත්පසින් අභිවෘද්ධියට පැමිණි හෙයින්ද, වර්ණවත් බැවින් හා දීර්ඝායුෂ්ක බැව් ආදියෙන් බ්‍රහ්මපාරිෂද්‍යාදීන් කෙරෙන් මහත්වූ බැවින්ද මහා බ්‍රහ්ම නම් වෙත්. ඒ ප්‍රථම ධ්‍යාන භූමිත්‍රය වනාහි විශෙෂ වශයෙන් උතුම්වූ ආලොකයෙන් බබලන්නාවූ සමානතල වාසීහු වෙත්. ඔවුන් අතුරෙන් බ්‍රහ්මපාරිෂද්‍යයෙහි උපදනා බ්‍රහ්මයෝ තුමූ මේ මනුෂ්‍ය ලෝකයෙහි ප්‍රථම ධ්‍යාන ලැබූ මාත්‍රයකින් නො

පිරිහුන් ධ්‍යානයෙන් තොර බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි උපදනාහු වෙත්. ඒ ප්‍රථම ධ්‍යානයම ආවර්ජනා ආදී සිපාකාරයකින් වශී භූතකොටගත් ධ්‍යානලාභීහු බ්‍රහ්මපුරෝහිත තලයෙහි උපදිත්. ඒ ප්‍රථම ධ්‍යානය පඤ්චප්‍රකාරයකින් වශීභූත කරගත්තාවූ ධ්‍යාන ලාභීහු මහාබ්‍රහ්මතලයෙහි උපදනාහු වෙත්. මේ තුන්තල යෙහිම උපදනා බ්‍රහ්මරාජයන්ගේ පටිසන්ධි විපාක චිත්තය එකම ප්‍රථම ධ්‍යානයාගේ විපාක චිත්තය මැයි. ඒ භවයෙහි වසනතාක් කල් මුළුල්ලෙහි එම විපාක චිත්තයම භවාඞ්ග වශයෙන් ඉපිද චුතිකාලයෙහිද එම විපාක චිත්තයම චුති වශයෙන් පවත්නේයි. "පරිත්තාභා" යනු "උපරිමෙහි පරිත්තා ආභා එතෙසන්ති පරිත්තාභා" යනු නිර්වචන බැවින් මතුබ්‍රහ්ම ලෝකයෙහි බ්‍රහ්මරාජයන්ට වඩා ස්වල්පවූ ආලෝක ඇති හෙයින් පරිත්තාභා නම් වෙත්. "අප්පමාණා ආභා එතෙසන්ති අප්පමාණාභා" යනු නිර්වචන බැවින් ප්‍රමාණ රහිතවූ ආලෝක ඇති හෙයින් අප්පමාණාභා නම්වෙත්. "වලාහකතො විජ්ජුවිය ඉතො චිතොච ආභා සරති නිස්සරති එතෙසං සප්පීතිකජ්ඣාන නිබ්බත්තක්ඛන්ධ සන්තානතොති ආභස්සරා" යනු නිර්වචන බැවින් වලාපටලයකින් නික්මෙන්නාවූ විදුලියක් මෙන් සප්‍රීතික ධ්‍යානයෙන් හටගත්තාවූ ස්කන්ධයක් ඇති හෙයින් මේ බ්‍රහ්මයන්ගේ ශරීරප්‍රභාවද ඔබ මොබ නික්මෙන හෙයින් ආභාශ්වර නම් වෙත්. ඒ ද්විතීය ධ්‍යාන තුන්තල වාසීවූ බ්‍රහ්මයන්ගේද වාසය කරන්නාවූ සමාන තල ත්‍රය අතිශයින් උතුම්වූ ආලෝකයෙන් බබලන්නේයි. ද්විතීය ධ්‍යානය හා තෘතීය ධ්‍යානයද පරිත්ත වශයෙන් හා මධ්‍යම වශයෙන්ද උත්කෘෂ්ට වශයෙන්ද උපදවා ගත්තාවූ ධ්‍යාන ලාභීහු ඒ බ්‍රහ්මලෝකත්‍රයෙහි සයාකාරයකින් ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන විපාක චිත්තය කාරණකොටගෙණ පටිසන්ධි භවාඞ්ග චුති චිත්තයන්ගේ හටගැණීම වේ. "පරිත්ත සුභ" යනු "සුභාති එකග්ගා අචලා සරීරා ආභා වුච්චති සා උපරිබ්‍රහ්මෙහි පරිත්තාසුභා එතෙසන්ති පරිත්තසුභා" යනු විග්‍රහ බැවින් සුභ සංඛ්‍යාතවූ ඒකඝණවූ ශරීරප්‍රභාව මතු බ්‍රහ්මලෝකයන් කෙරෙන් මතු බ්‍රහ්මයන් කෙරෙන් පරිත්ත හෙයින් පරිත්තසුභ නම් වේ. "අප්පමාණසුභ" යනු අප්පමාණා සුභා එතෙසන්ති අප්පමාණසුභා" යනු නිර්වචන බැවින් ඒ සුභසංඛ්‍යාත නිශ්චල ශරීර ස්වභාව අප්‍රමාණ වශයෙන් ඇතිහෙයින් අප්පමාණසුභ නම්වේ. "සුභකිණ්හා" යනු "පභාසමුදය සංඛාතෙහි සුභෙහි කිණ්ණා ආකිණ්ණාති" යනු නිර්වචන බැවින් ප්‍රභාසමූහ සංඛ්‍යාතවූ ශෝභාවෙන් ගැවසී ගත්හෙයින් සුභකිණ්ණ නම් වේ. සුභා

කීණ්ණායයි කියයුත තන්හි හකාරයට හ්‍රස්ව කොට අනතිම ණකාරයට සකාරාදේශවීමෙන් සුභකිණ්හා යන ව්‍යවහාර කරණු ලැබේ. ඒ තෘතීය ධ්‍යාන භූමිත්‍රයෙහි වාසයකරන්නාවූ බ්‍රහ්මයෝ වනාහි විශෙෂ වශයෙන් උතුම්වූ එකඝණ ශරීර ප්‍රභාවෙන් බබලන හෙයින් ඒ බ්‍රහ්මයන්ගේ වාසස්ථාන භූමිත්‍රය සමානතල වශයෙන් පිහිටියේයි. ඒ තෘතීය ධ්‍යාන තුන්තලයෙහි එකම චතුර්ථ ධ්‍යානය හීන වශයෙන්ද මධ්‍යම වශයෙන්ද ප්‍රණීත වශයෙන්ද වැඩූවාවූ බ්‍රහ්මයන්ම ඒ බඹතලයෙහි උපදනා හෙයින් එකම චතුර්ථධ්‍යාන විපාක චිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී. "වෙහප්ඵලභූමි' යනු "ඣානප්පභාය නිබ්බත්තං විපුලං ඵල මෙතෙසන්ති වෙහප්ඵලා" යන නිර්වචන බැවින් ධ්‍යානානුභාවයෙන් හටගන්නාවූ අනෙක ප්‍රකාරවූ විපාක ඵල ඇති හෙයින් වෙහප්ඵල නම් වේ. අසංඥ සත්ව භූමිය යනු "සඤ්ඤාවිරාගභාවනා නිබ්බත්ත රූපසන්තති මත්තත්තා නත්ථි සඤ්ඤාමුඛෙන වුත්තා අවසෙසා රූපක්ඛන්ධාව එතෙසන්ති අසඤ්ඤා" යනු නිර්වචන බැවින් "සඤ්ඤා රොගො සඤ්ඤා ගණ්ඩො" යනාදීන් සංඥවගේ නොඇලුනාවූ භාවනා වශයෙන් හටගන්නාවූ රූපකලාප මාත්‍රයක් ඇති බැවින්ද සංඥ ශීර්ෂයෙන් කියන ලද්දවූ සතර අරූපස්කන්ධයන් මොවුන්ට නැතිහෙයින් අසංඥ නම් වෙත්. ඒ වෙහප්ඵල අසංඥ සත්ව භූමිවයෙහි වාසයකරන්නාවූ බ්‍රහ්මයන්ගේ විශෙෂය නම්:- ධ්‍යානලාභීවූද ධ්‍යානලාභී නොවූද පඨමධ්‍යානලාභීවූ ආර්‍යයී අනාර්‍යයී දෙකොට්ඨාසය උපදනා භූමිය වෙහප්ඵලයයි කියාද කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයන් විසින් සංඥවෙහි නො ඇළුනාවූ වායොකසිණයාගේ වශයෙන් උපදවන ලද පඨම ධ්‍යානයාගේ විපාකයෙන් රූප මාත්‍රයක් හටගන්නා භූමිය අසංඥ සත්ව භූමි නම් වේ. මේ වෙහප්ඵල අසංඥ සත්ව භූමිවයද සමානතල වශයෙන් පිහිටා තිබේ. ඔවුන් අතුරෙන් වෙහප්ඵල භූමියෙහි පඨමධ්‍යාන විපාක චිත්තය පටිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී. අසංඥ තලයෙහි එම පඨම ධ්‍යාන විපාක ශක්තියෙන් උපදවන ලද්දවූ ජීවිත නවක රූපකලාප සමූහය මහා කල්ප පන්සියයක් මුලුල්ලෙහි සන්තති විච්ඡෙදය නොවී පැවත නිරුද්ධවන්නේයි. අවිහභූමි යනු "අප්පකෙන කාලෙන අත්තනො ඨානං න විජහන්තීති අවිහා" යනු නිර්වචන බැවින් තමාගේ ඒ අවිහ භූමි සඞ්ඛ්‍යාත ස්ථානය මඳකලකින් අත්නොහරින හෙයින් අවිහ නම් වෙත්. දුතීය තලය වනාහි න කෙනචි තප්පන්තීති අතප්පා" යනු නිර්වචන බැවින් යම් කිසිවකින් නොතැවෙන හෙයින් අතප්ප නම්වෙත්. තුන්වනතල වාසීහු වනාහි "පරමසුන්දර රූප

තතා සුඛෙන දිස්සන්තීති සුදස්සා” යනු නිර්වචන බැවින් අතිශයින් සිත්කළු රූප ඇති බැවින් සුවසේ දක්කයුතු බැවින් සුදස්ස නම්වෙත්, සතරවෙනිතල වාසීහු වනාහි “සුපරිසුද්ධ දස්සනත්තා සුඛෙන පස්සන්තීති සුදස්සිනො” යනු නිර්වචන බැවින් සතරවෙනි තල වාසීහු වනාහි අතිශයින් පවිත්‍ර චක්ෂුර්විඥානය ඇතිහෙයින් රූපාලම්බනය සුවසේ දක්නා සුළුහෙයින් සුදස්සී නම් වෙත්. පස්වෙනිතලවාසීහු වනාහි “උක්කට්ඨසම්පත්තිකත්තා නත්ථි එතෙසං කනිට්ඨභාවොති අකනිට්ඨා” යනු නිර්වචන බැවින් අතිශයින් උත්කෘෂ්ට සම්පත්ති ඇතිහෙයින් කිසි බ්‍රහ්මයෙකුට බාලබවෙක් නැති හෙයින් අකනිට්ඨ නම් වේ. මේ භූමිහු පස්දෙන වනාහි “සුද්ධානං අනාගාමි අරහන්තානමෙව ආවාසොති සුද්ධාවාසො” යනු නිර්වචන බැවින් කෙලෙසුන්ගෙන් පවිත්‍ර අනාගාමී රහතුන්ගේ වාසස්ථාන හෙයින් සුද්ධාවාස නම් වේ. නොහොත් “අනුනය පටිඝාභාවතො වා සුද්ධා ආවාසා එතෙසන්ති සුද්ධාවාසො” යනු නිර්වචන බැවින් දිට්ඨිගතසම්ප්‍රයුක්ත චිත්තය උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තය වෛෂමූලික දෙසිතය යන මොවුන්ගෙන් වෙන්වූ අනාගාමි රහතුන්ගේ වාසස්ථානවූ හෙයින්ද සුද්ධාවාස නම්වේ. මේ සුද්ධාවාස පංචකයෙහි වනාහි අනාගාමී ආර්යයෝම පඤ්චමධ්‍යාන විපාකචිත්තයෙන් පටිසන්ධිගෙන එම චිත්තයම භවාඞ්ග චුතිවශයෙන පැවති එම භූමියෙහිම රහත්වී පිරිනිවන් පානාහු වෙති. සොළොස් රූපාවචර භූමින් අතුරෙන් අසංඥසත්ව සුද්ධාවාස භූමිවය හැර අවශේෂවූ දසභූමියෙහි සටගන්නාවූ පුද්ගලයෝ නම්:— සටකී දොළොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහෙතුකය, දුගති අහෙතුකය, ද්විහෙතුකය යන තුන්දෙනා හැර අවශේෂ ත්‍රිහෙතුක පුද්ගලය, සතර මාර්ගස්ථයෝය, සතර ඵලස්ථයෝය යන නවවැදෑරුම් පුද්ගලයෝයි. ඒ නවවැදෑරුම් පුද්ගලයන් අතුරෙන් බඹලොව උපන් ත්‍රිහෙතුක පුද්ගලයා කෙරෙහි වෛෂමූලික දෙසිතද හැර දස අකුශල චිත්තය ඝ්‍රාණවිඥානද්වය, ජිහ්වා විඥානද්වය, කාය විඥානද්වය, හසිතොත්පාද චිත්තය යන සත්ලොසද හැර එකොළොස් අහෙතුක චිත්තය මහාකුසල් අටය, මහද්ගත කුසල් නවය, රූපාවචරවිපාක පසය යන මේ තෙතිස් චිත්තයෝ සුදුසු පරිද්දෙන් උපදනාහු වෙත්, ශ්‍රොතාපත්තිමාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි ඒ තෙතිස හා සමග ශ්‍රොතාපත්ති මාර්ගචිත්තය උපදී. ශ්‍රොතාපත්තිඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරය, උද්ධච්ච සහගත චිත්තය, චක්ෂු විඥානද්වය, ශ්‍රොත්‍ර විඥානද්වය, සම්පටිච්ඡනද්වය, සන්තීරණත්‍රය, ආවර්ජනද්වය යන මොවුන්ගේ වශයෙන් එකොළොස් අහෙතුක චිත්තය, මහා

කුසල් අටය, මහද්ගත කුශල් නවය, රූපාවචර විපාක පසය, සෝතාපත්තිඵල චිත්තය යන මොවුන්ගේ වශයෙන් එකුන් සාළිස් සිත් කෙනෙක් සුදුසු පරිද්දෙන් උපදිත්. ශකෘදාගාමී මාර්ගස්ථයා කෙරෙහි ශකෘදාගාමී මාර්ග චිත්තය සමග ඒ එකුන් සාළිසම ලැබේ. ශකෘදාගාමී ඵලස්ථයා කෙරෙහි යථොක්ත එකුන්සාළිස් චිත්තයන් අතුරෙන් සෝතාපත්තිඵලචිත්තය උඬරණයකොට ශකෘදාගාමී ඵලචිත්තය බහා එකුන්සාළිස් සිත් කෙනෙක් සුදුසු පරිද්දෙන් උපදිත්. අනාගාමී මාර්ගස්ථයා කෙරෙහි අනාගාමී මාර්ග චිත්තය සමග යථොක්ත එකුන්සාළිසම ලැබේ. අනාගාමී ඵලස්ථයා කෙරෙහි යථොක්ත එකුන්සාළිස් චිත්තයන් කෙරෙන් ශකෘදාගාමී ඵලචිත්තය උදුරා අනාගාමී ඵලචිත්තය බහා එකුනසාළිසක්ම සුදුසු පරිද්දෙන් ලැබෙත්. අර්හත්මාර්ගස්ථයා කෙරෙහි අර්හත්මාර්ග චිත්තය සමග යථොක්ත එකුන්සාළිස් චිත්තයම ලැබේ. අර්හත්ඵලස්ථයා කෙරෙහි චක්ෂුර් විඥානවය, ශ්‍රොත්‍රවිඥානවය, සම්පටිච්ඡනවය, සන්තීරණත්‍රය, ආවර්ජනවය, හසිතොත්පාදචිත්තය යන මොවුන්ගේ වශයෙන් දොළොස් අහෙතුක චිත්තය, මහාක්‍රියා අටය, රූපාවචරවිපාක පසය, මහද්ගත ක්‍රියානවය, අර්හත්ඵලචිත්තය යන මොවුන්ගේ වශයෙන් පන්තිස් සිත්කෙනෙක් සුදුසු පරිද්දෙන් ලැබෙත්. අසංඥතලයෙහි වනාහි "අසඤ්ඤසත්තා බ්‍රහ්මලොකෙ එකො සුගති අහෙතුක පුග්ගලො තස්මිං තයො කලාපා හොන්ති" යනු සුචිත්තාලඞ්කාර වචනබැවින් අසංඥතලභූමියෙහි එකම සුගති අහෙතුක පුද්ගලයෙක් වේ. ඔහු කෙරෙහි ජීවිතනවකකලාපය, ශුද්ධාෂ්ටක කලාපය, ලඝුතාදී එකාදශක කලාපය යන රූපකලාපයෝ තුන්දෙනෙක්ම වෙති, මනුෂ්‍යලොකයෙහි වායොකසිණයෙන් සංඥා විරාගභාවනාව වඩා පඤ්චමධ්‍යානලාභීව යම් ඉරියව්වකින් කාලක්‍රියාකළේ නම් ඒ ඉරියව්වෙන්ම ඒ බ්‍රහ්මලොකයෙහි ප්‍රතිමාරූපයක්මෙන් පහළව ඒ ඉරියව්වෙන්ම මහා කල්ප පන්සියයක්හුගේ අවශානයෙහි ධ්‍යානවෙගය සිඳී අපරාපරිය වෙදනීය කුශලකර්ම බලයෙන් කාමධාතුවෙහිම උපදනේයි. ශුද්ධාවාස පඤ්චභූමියෙහි වනාහි අනාගාමී ඵලස්ථයාය, අර්හත් මාර්ගස්ථයාය, අර්හත්ඵලස්ථයායයි පුද්ගලයෝ තිදෙනෙක්ම ලැබෙත්. ඒ තිදෙනා අතුරෙන් අනාගාමී ඵලස්ථයා කෙරෙහි දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරය, උද්ධච්චසහගත චිත්තය, චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන ෂට්කය, සන්තීරණත්‍රය, ආවර්ජනවය යන සොළොස් සහෙතුක අහෙතුක චිත්තය, මහා කුශල් අටය, මහද්ගත කුසල් නවය, පඤ්චමධ්‍යාන විපාකචිත්තය අනාගාමී ඵලචිත්තය යන පන්තිස් චිත්තයෝ සුදුසුපරිද්දෙන් උප

දිත්. අර්හත්මාර්ගීසත්වයා කෙරෙහි අර්හත්මාර්ගී චිත්තය සමග යථොක්ත පන්තිස් චිත්තයෝම ලැබෙත්. අර්හත්ඵලසත්වයා කෙරෙහි චක්ඛුවිඥාණ සොතවිඥාණ සම්පටිච්ඡන පඤ්චකය, සන්තීරණත්‍රය, ආවර්ජනාවය, හසිතොත්පාදය යන දෙළොස් අහෙතුක චිත්තය, මහාක්‍රියා අටය, මහද්ගත ක්‍රියා නවය, පඨම ධ්‍යාන විපාක චිත්තය, අර්හත්ඵලචිත්තය යන එක්තිස් චිත්තයෝ සුදුසු පරිද්දෙන් උපදිත්. මෙසේ කියනලද්දාවූ රූපාවචර සොළොස් භූමියෙහි ආයුපරිච්ඡෙදය මෙසේයි. "අසඞ්ඛෙය්‍ය කප්පස්ස තතියොභාගො බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං ආයු හොති" යනු සුචිත්තාලඞ්කාරපාඨයෙහි ආනයින් අසඞ්ඛෙය්‍ය කල්පයක්හුගේ තුන්වෙනි භාගය බ්‍රහ්මපාරිෂද්‍යයාගේ ආයුෂ වෙයි. "උපඩ්ඪාසඞ්ඛෙය්‍යකප්පො බ්‍රහ්මපුරොහිතානං ආයු" යනු බැවින් අසඞ්ඛෙය්‍යකල්පයක්හුගේ අර්ධය බ්‍රහ්මපුරොහිතයට ආයුෂ වෙයි. 'අසඞ්ඛෙය්‍යානං කප්පො මහාබ්‍රහ්මායු" යනු බැවින් මහාබ්‍රහ්ම තල වාසීන්ට අසඞ්ඛෙය්‍ය කල්පයක් ආයුෂවෙයි. මෙසේ ප්‍රථම ධ්‍යාන තුන්තලවාසීන්ගේ ආයු ප්‍රමාණය අසඞ්ඛෙය්‍ය කල්පයෙන්ම නියම කටයුත්තේයි. ද්විතීයධ්‍යාන තලය පටන් මතු බ්‍රහ්මතලයන්ගේ ආයුෂවනාහි මහාකල්පයෙන්ම නියම කටයුත්තේය. ඒ අසඞ්ඛ්‍යකල්ප මහා කල්පයන්ගේ වෙනස මෙසේයි. දිගින් යොදුනක්ද පුළුලින් යොදුනක්ද ඝනයෙන් යොදුනක්ද ඇත්තාවූ සුදු අබ අටුවකින් අවුරුදු සියයක් ඇවෑමෙන් එක එක් අබ බිජුව නිකුත්කිරීමෙන් අබ අටුව ගෙවීයන්නේ නමුදු අවුරුදුගණන නොගෙවෙන්නාවූ කල්පය එකම අසඞ්ඛ්‍ය කල්පයක් නම් වෙයි. ඒ අසංඛ්‍ය කල්ප සතරෙක් එක් මහාකල්පයකි. මිනිස්ලොව ආයුගණනින් දක්වන මේ නම් සත්ථන්තර කල්පය, දුබ්භික්ඛන්තර කල්පය, රොගාන්තර කල්පය යන ත්‍රිවිධ අන්තරකල්ප විනාශයන් අතුරෙන් යම්කිසි විනාශයකින් බොහෝ සත්වයන් විනාශවී ගොස් ගල්ගුහාදියෙහි සැඟවී සිටියාවූ බොහෝ දෙනෙකුගෙන් හටගන්නා සත්වයෝ තුමූ අපගේ අකුශල කර්මානුභාවයෙන් දශවර්ෂායුෂකව නැවත විනාශවී ගියේයයි පවට භයව පාපයෙන් වැලකීම් හේතුවෙන් ක්‍රමයෙන් වැඩී අසංඛ්‍යායුෂ්ක බවට පැමිණ නැවත නැවතත් සත්වයන්ට ජරා මරණ නැතැයි සලකා අධර්ම සමාදානයෙහි හැසිරීම හෙතුකොට [illegible] ක්‍රමයෙන් ආයුෂ පිරිහී ගොස් දශවර්ෂායුෂ්කාවූ කල්හී පළමු කී නයින්ම එක්තරා අන්තරකල්ප විනාශයකින් සත්ව විනාශය වෙයි. මේ දශවර්ෂායුෂ්ක සත්වයන්ගේ විනාශදෙකකින් පිරිසිඳින ලද කාලය එක් අන්තරකල්පයක් නම් වෙයි. එබඳු අන්තර කල්ප සූසැටෙක් හෝ සමහරුන්ගේ මතවශයෙන් විස්සෙක්

හෝ එකම අසංඛ්‍ය කල්පයකි. ඒ අසංඛ්‍ය කල්පය වනාහි සංවට්ටකල්පය, සංවට්ටට්ඨායී කල්පය, විවට්ටකල්පය, විවට්ටට්ඨායී කල්පයයි සතරකට බෙදෙයි. ඔවුන් අතුරෙන් කල්පවිනාශක මහා මේඝය පටන් කල්පවිනාශක මහාවහ්නියගේ නිවීම දක්වා සංවට්ට අසංඛ්‍ය කල්ප නම්වේ. ඒ ගිණි නිවීමපටන් කෙලලක්ෂයක් සක්වල සම්පත්තිකර මහාමේඝය දක්වා මේ අතර කල්පය සංවට්ටට්ඨායී කල්ප නම්වේ. සම්පත්තිකර මහා මේඝය පටන් චන්ද්‍ර සූර්‍ය්‍යාදීන්ගේ උදාවීම දක්වා විවට්ට අසංඛ්‍ය කල්පනම්. චන්ද්‍ර සූර්‍ය්‍යාදීන්ගේ පහළවීම පටන් නැවතත් කල්ප විනාශක මහා මේඝය දක්වා මේ අතර කාලය විවට්ටට්ඨායී අසංඛ්‍ය කල්ප නම් වේ. මේ අසංඛ්‍යකල්ප සතරෙක් එක් මහාකල්පයක් නම් වේ. ප්‍රථමධ්‍යාන තලවාසී බ්‍රහ්මයන්ගේ ආයුෂ වනාහි මේ මහා කල්පයක් සම්පූර්ණවීමට මත්තෙන් ඒ බඹලොවින් චුතවන හෙයින් අසංඛෙය්‍ය කල්පයෙන්ම ආයුෂ නියමකරණ ලද්දේයි.

මහාකල්පය විනාශවන සැටි මෙසේයි:—

ඔහාසලෝක සංඛ්‍යාත කෙළලක්ෂයක් සක්වළ විනාශවන්නාවූ කල්හි පිළිවෙළින් සත්වරක් ගින්නෙන් විනාශව අටවෙනි වාරයෙහි දියෙන් විනාශවේ. ඒ ජලය යනු ප්‍රකෘති ජලය නොව නරකයෙහි හටගන්නා ක්ෂාරෝදකයයි. මෙසේ අටවාර අටක් විනාශවූ කල්හි නැවත් සැටසතර වාරය සම්පූර්ණවූකල්හි සැටපස්වෙනි වාරය සුළඟින් විනාශ වේ. මෙසේ ලෝක විනාශයවන කල්හි ප්‍රථමධ්‍යාන තුන්තලයපටන් ගින්නෙන්ද ද්විතීයධ්‍යානතලය පටන් ජලයෙන්ද චතුර්ථධ්‍යාන තලය පටන් සුළඟින්ද මෙසේ වෙහප්ඵලාව හැර අවශෙෂවූ සියලු බ්‍රහ්මභූමීහු විනාශවන්නාහුය. එහෙයින් ප්‍රථමධ්‍යාන තුන්තලවාසීන්ගේ ආයුෂ මහාකල්පයෙන් නොව අසංඛ්‍ය කල්පයෙන්ම නියම කට යුත්තේය. පරිත්තාභ බ්‍රහ්මලොකවාසීන්ගේ ආයුෂ මහාකල්ප දෙකක් ප්‍රමාණ වෙයි. අප්පමාණාභ බ්‍රහ්මයන්ගේ ආයුෂ මහා කල්ප සතරක් ප්‍රමාණවෙයි. ආභස්සර බ්‍රහ්මයන්ගේ ආයුෂ එක් අසංඛ්‍ය කල්පයක් හා මහාකල්ප සතරක් ප්‍රමාණ වේ. පරිත්තසුභ බ්‍රහ්මයන්ගේ ආයුෂ වනාහි මහාකල්ප සොළසක් පමණ වේ. අප්පමාණසුභ බ්‍රහ්මයන්ගේ ආයුෂ දෙතිස් මහා කල්පයක් ප්‍රමාණවේ. සුභකිණ්හබ්‍රහ්මයන්ගේ ආයුෂ වනාහි එක් අසඞ්ඛ්‍යකල්පයක් හා මහාකල්ප සැටසතරක් පමණ වේ. වෙහප්ඵල අසංඥ සත්ව බ්‍රහ්මයනගේ ආයුෂ වනාහි මහා කල්ප පන්සියයක් ප්‍රමාණවේ. අවිහයන්ගේ ආයුෂ වනාහි මහාකල්ප දහසක් ප්‍රමාණ වේ. අතප්ප බ්‍රහ්මයන්ගේ ආයුෂ මහාකල්ප

දෙදහසක් ප්‍රමාණවේ. සුදස්ස බ්‍රහ්මයන් ගේ ආයුෂ මහාකල්ප සාරදහසක් ප්‍රමාණ වේ. සුදස්සී බ්‍රහ්මයන්ගේ ආයුෂ මහා කල්ප අටදහසක් ප්‍රමාණ වේ. අකනිට්ඨ බ්‍රහ්මයන්ගේ ආයුෂ මහාකල්ප සොළොස් දහසක් ප්‍රමාණ වේ.

## රූපාවචර පරිච්ඡේදය නිමි.

---

අරූපාවචර සතර භූමිය යනු ආකාසානඤ්චායතනභූමිය, විඤ්ඤාණඤ්චායතනභූමිය, ආකිඤ්චඤ්ඤායතනභූමිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනභූමිය යන මොවුන්ගේ වශයෙන් අරූප භූමිය සතරාකාර වේ. ඒ සතරභූමිහුද අකනිට්ඨභූමියෙන් මත්තෙහි යොදුන් පණස්පස්ලක්‍ෂ අසූදහසකින් මත්තෙහි ආකාශානඤ්චායතන භූමිය පිහිටා තිබේ, සෙසු භූමිනු තිදෙනද එපමණ දුරින් පිහිටා තිබෙන්නාහුයයි සමහරු කියත්. සමහර ආචාර්‍ය්‍යවරයෝ වනාහි සතර භූමිය සමානව පිහිටා තිබේයයි කියත්. ආකාශානඤ්චායතන භූමිය යනු ආකාශ කසිණය හැර නව කසිණයන්ගෙන් යම් කිසි කසිණයකින් උපදවාගන්නාලද ප්‍රතිභාග නිමිත්ත නොහොත් කසිණාලොකය පතුරුවා උගුළුවා ගන්නාලද කසිණුග්ඝාටිමාකාශයෙහි උපදවන ලද්දාවූ ප්‍රථමාරූප්‍ය කුශල චිත්තයාගේ විපාකවශයෙන් අකනිට්ඨ බ්‍රහ්මලොකයෙන් මත්තෙහි යට කියනලද්දාවූ දුර ප්‍රමාණ ආකාශයෙහි පහළවී පවත්නා සතරනාමස්කන්ධයයි, නොහොත් ප්‍රථමාරූප්‍ය සඞ්ඛ්‍යාත සතර නාමස්කන්ධයන් විසින් පිරිසිඳගන්නා ලද්දාවූ ආකාශය ආකාශානඤ්චායතන භූමිනමු සෙසු භූමිත්‍රය එපරිද්දෙන්ම ඒ ධ්‍යාන විපාක චිත්තයන්ගේ වශයෙන් පිරිසිඳ ගන්නා ලද්දාවූ ආකාශ ප්‍රදෙශයෝ මැයි. ඔවුන් අතුරෙන් ආකාශානඤ්චායතන බ්‍රහ්මයෝ තුමූ ආකාශානඤ්චායතන විපාක චිත්තයෙන් පිළිසිඳගෙණ ආයු පමණින් භවාඞ්ග වශයෙන් පැවත එම චිත්තයම චුතිවශයෙන් නිරුද්ධ වන්නේය, සෙසු භූමිත්‍රය, එසේම දතයුතුයි. මේ සතර අරූප බ්‍රහ්මයෝ වනාහි යට කියනලද දොළොස් ප්‍රකාර පුද්ගලයන් අතුරෙන් දුගති අහෙතුක සුගති අහෙතුක ද්විහෙතුක සොතාපත්තිමාර්ගස්ථ යන සතර දෙන හැර ත්‍රිහෙතුක පුද්ගලය සොතාපත්ති ඵලස්ථයා ආදි කොට ඇත්තාවූ සප්ත ආර්‍ය්‍ය පුද්ගලයෝය යන අටදෙනෙක්ම වෙති. ඒ අටදෙනා අතුරෙන් ආකාශානඤ්චායතනයෙහි උපදනා ත්‍රිහෙතුකයා කෙරෙහි ලැබෙන්නාවූ චිත්තයෝ නම්:- ද්වේෂ මූලික දෙසිත හැර අවශෙෂ දස අකුශල චිත්තය, මනොද්වාරාවර්ජනය. මහා කුශල් අටය, අරූපාවචර කුශල් සතරය, ආකාශා

නඤ්චායතන විපාක චිත්තය යන මේ සූවිසිචිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතනයෙහි හටගන්නා ත්‍රිහෙතුක පෘථග්ජනයාහට යටකී සූවිසි චිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන විපාක චිත්තය, කුශලචිත්තය, යන දෙසිත උද්ධරණය කොට විඤ්ඤාණඤ්චායතන විපාකචිත්තය බහා තෙවිසිසිත් කෙනෙක්ම ලැබෙත්, ආකිඤ්චඤ්ඤායතනයෙහි උපදනා ත්‍රිහෙතුකයාහට වනාහි යටකී තෙවිසිචිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුශල විපාක දෙසිත උද්ධරණය කොට ආකිඤ්චඤ්ඤායතන විපාකය බහා දෙවිසි සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපන් ත්‍රිහෙතුක පෘථග්ජනයාහට යටකී දෙවිසි චිත්තයන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන කුශලවිපාකවය උද්ධරණය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා එක්විසිසිත්කෙනෙක් ලැබෙත්. ආකාසානඤ්චායතනයෙහි උපන් සෝතාපත්ති ඵලස්ථයාහටදිට්ඨිගත විප්‍රයුක්ත සතරය, උපෙක්ෂාසහගත චිත්තය, මනොද්වාරාවජ්ජනය, මහාකුශල් අටය, අරූපකුශල් සතරය, ආකාසානඤ්චායතන විපාකය, සෝතාපත්ති ඵලචිත්තය යන විසි චිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතනයෙහි උපන් සෝතාපත්තිඵලස්ථයාහට යටකී විසිචිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන කුශලවිපාකවය උද්ධරණයකොට විඤ්ඤාණඤ්චායතන විපාකය බහා එකුන්විසි සිත්කෙනෙක් ලැබෙත්. ආකිඤ්චඤ්ඤායතනයෙහි උපන් සෝතාපත්තිඵලස්ථයාහට යටකී එකුන්විසි චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුශල විපාකවය උද්ධරණයකොට ආකිඤ්චඤ්ඤායතන විපාකය බහා අටළොස් සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපන් සෝතාපත්තිඵලස්ථයාහට යටකී අටළොස් චිත්තයන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන කුශලවිපාකවය උද්ධරණයකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා සතළොස් සිත් කෙනෙක් ලැබෙත්. සකෘදාගාමී මාර්ගස්ථයාහට වනාහී සකෘදාගාමී මාර්ගචිත්තය අධික කොට ලැබේ. ආකිඤ්චඤ්ඤායතනයෙහි උපන් සකෘදාගාමී ඵලස්ථයාහට යටකී සෝතාපත්ති ඵලස්ථයා කෙරෙහි ලැබෙන විසි චිත්තයන් අතුරෙන් සෝතාපත්තිඵලචිත්තය උද්ධරණයකොට සකෘදාගාමී ඵලචිත්තය බහා විසි සිත්කෙනෙක් ලැබෙත්. ආකිඤ්චඤ්ඤායතනයෙහි සකෘදාගාමී ඵලස්ථයාහට අටළොස් සිත්කෙනෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සකෘදාගාමියාහට සතළොස් සිත් කෙනෙක්ද, ඒ ක්‍රමය පිළිවෙළින් සෝතාපත්තිඵලචිත්තය උද්ධරණයකොට සකෘදාගාමී ඵලචිත්තය බහා යොදගත්කල සංඛ්‍යාක්‍රමය සම්පූර්ණ

යෙන් ලැබේ. අනාගාමි මාර්ගස්ථ පුද්ගලයාහට අනාගාමි මාර්ග චිත්තයම අධික වශයෙන් ලැබේ. ආකාසානඤ්චායතන අනාගාමි පුද්ගලයාහට වනාහි යටකී විසිචිත්තයම ලැබේ. විඤ්ඤාණඤ්චායතන අනාගාමි ඵලස්ථ පුද්ගලයාහට එකූන්විසි චිත්තයෙක්ද, ආකිඤ්චඤ්ඤායතන අනාගාමි ඵලස්ථයාහට අටළොස් සිත් කෙනෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ඵලස්ථයාහට සතළොස් සිත් කෙනෙක්ද ලැබෙත්. ඒ ක්‍රමයෙන්ම ශකෘදාගාමි ඵලචිත්තය උද්ධරණයකොට අනාගාමි ඵලචිත්තය බහාලීමෙන් යට කියනලද සංඛ්‍යාවෝ වෙති. අර්හත්මාර්ගස්ථ පුද්ගලයාහට අර්හත් මාර්ග චිත්තය පමණක් අධිකවශයෙන් ලැබේ. ආකාසානඤ්චායතන අර්හත්ඵලස්ථයාහට මනොද්වාරවර්ජන චිත්තය, මහාක්‍රියා අටය, අරූපාවචර ක්‍රියා සිත් සතරය, ආකාසානඤ්චායතන විපාක චිත්තය, අර්හත්ඵල චිත්තය යන පසළොස් චිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතන අර්හත්ඵලස්ථයාහට යටකියනලද පසළොස් චිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන විපාක ක්‍රියා දෙක උද්ධරණය කොට විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය බහා තුදුස් සිත් කෙනෙක්ම ලැබෙත්. ආකිඤ්චඤ්ඤායතන අර්හත්ඵලස්ථයාහට යටකී තුදුස් චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන විපාක ක්‍රියා දෙක උද්ධරණයකොට ආකිඤ්චඤ්ඤායතන විපාකචිත්තය බහා තෙළෙස් සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතන අර්හත්ඵලස්ථයාහට යටකී තෙළෙස් චිත්තයන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන විපාක ක්‍රියා දෙක උද්ධරණයකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා දොළොස් සිත්කෙනෙක්ම ලැබෙත්. ආකාසානඤ්චායතන බ්‍රහ්මයන්ගේ ආයුෂ වනාහි විසි දහසක් මහාකල්ප ප්‍රමාණවෙයි. විඤ්ඤාණඤ්චායතන බ්‍රහ්මයන්ට වනාහි මහාකල්ප සතළිස්දහසක්ද, ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්මයන්ට මහාකල්ප සැටදහසක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්මයන්ට මහාකල්ප අසූසාර දහසක්ද ආයුෂ ප්‍රමාණ වන්නේයි.

මෙසේ දක්වනලද්දවූ එකොළොස් කාමභූමිය, සොළොස් රූපාවචර භූමිය, සතර අරූපාවචරභූමිය යන එක්තිස් භූමියෙහි හටගන්නාවූ පුද්ගලයෝ සංක්ෂෙපවශයෙන් දොළොස්දෙනෙක්ද විස්තරවශයෙන් දෙසිය තුදුස් දෙනෙක්ද වෙත්. ඒ දෙසිය තුදුස් දෙන නම්:— සතරඅපායභූමියෙහි ලැබෙන්නාවූ එකම දුගති අහෙතුක පුද්ගලයා නරක තිර්යක් ප්‍රෙත අසුරසංඛ්‍යාතවූ සතර භූමියෙහි හටගන්නාවූ සතරදෙනාගේ වශයෙන් දුගති

අහෙතුකයෝ සතරදෙනෙක් වෙත්. මනුෂ්‍යභූමිය චාතුම්මහා රාජික භූමිය යන භූමිවයෙහි ලැබෙන්නාවූ දෙලොස්දෙනා අතුරෙන් දුගති අහෙතුක පුද්ගලයා දුරුකළහෙයින් අවශෙෂවූ එකොළොස් පුද්ගලයන්ගේ වශයෙන් මනුෂ්‍යභූමියෙහි එකොළොස් දෙනෙක, චාතුම්මහාරාජික භූමියෙහි එකොළොස් දෙනෙකැයි දෙවිසි දෙනෙක් වෙත්. අවශෙෂ පඤ්චසුගති භූමියෙහි වනාහි සුගති අහෙතුකයාද නොලැබෙන හෙයින් දසදෙනෙක්ම ලැබෙත්. ඒ දසදෙන පවසුගතිභූමියෙන් ගණන්වැඩිකළකල්හි තව්තිසාභූමියෙහි දසදෙනෙක, යාමයෙහි දසදෙනෙක, තුසිතයෙහි දසදෙනෙක, නිම්මාණරතියෙහි දසදෙනෙක, පරනිර්මිත වශවර්ති භූමියෙහි දසදෙනෙකැයි මෙසේ පණස් පුද්ගල කෙනෙක් වෙත්. ප්‍රථමධ්‍යානභූමිත්‍රය, ද්විතීයධ්‍යානභූමිත්‍රය, තෘතීය ධ්‍යාන භූමිත්‍රය, වෙහප්ඵලය යන දසභූමියෙහි දොළොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහෙතුක දුගති අහෙතුක ද්විහෙතුක යන තුන්දෙනෙක් නොලැබෙන හෙයින් ද බ්‍රහමලොකයෙහි පුද්ගලයන් නවදෙන බැගින් අනූදෙනෙක් ලැබෙත්. අසංඥසත්ව භූමියෙහි එකම සුගති අහෙතුක පුද්ගලයෙක් ලැබේ. පඤ්චසුද්ධාවාසභූමියෙහි අනාගාමි ඵලස්ථයාය, අර්හත්මාර්ගස්ථයාය, අර්හත්ඵලස්ථයාය යන තුන්දෙන ලැබෙන හෙයින් පවසුද්ධාවාසයෙහි පසළොස් දෙනෙක් ලැබෙත්. සතර අරූපභූමියෙහි වනාහි දුගති අහෙතුක සුගති අහෙතුක ද්විහෙතුක සොතාපත්තිමාර්ගස්ථය යන සතරදෙන හැර අටදෙන බැගින් ලැබෙන හෙයින් සතර අරූප භූමියෙහි දෙතිස් පුද්ගලකෙනෙක් ලැබෙත්. මේ සියලු පුද්ගලයන්ගේ සංඛ්‍යාව පිඩුකළකල්හි දෙසිය තුදුස් පුද්ගල කෙනෙක් එක්තිස් තලයෙහිම ලැබෙත්.

ඒ එක්තිස් තලයෙහි උපදනා සත්වයන්ට තමතමාගේ භූමියට සුදුසු පරිද්දෙන් ලැබියයුතු නොලැබිය යුතු යොනිප්‍රතිසන්ධිහු වනාහි "නිරයෙ එතා ඔපපාතිකයොනි හොති" යනු සූචිතනාලඞ්කාර බැවින් අටමහා නරකය ආදිවූ නරකයෙහි වාසී සත්වයන්ට ඔපපාතික ප්‍රතිසන්ධියම වන්නේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව, වස්තු දශක සංඛ්‍යාතවූ සප්ත දශකකෙනෙක් පහළ වෙති. චක්ඛු සොත භාව දශකයන් ඇතැම් කලෙක්හි ඇතැම් සත්වයන්ට පහළ නොවෙති. "අඝාණකො ඔපපාතිකො නත්ථි" යනු යමක අටුවා බැවින් ඝ්‍රාණප්‍රසාද නැත්නාවූ නරකවාසී සත්වයෙක් නැත්තේයි. "නිරවජ්ජාතෙ අණ්ඩජයොනි ජලාබුජයොනි

සංසෙදජයොනි ඕපපාතිකයොනි ඉති චතස්සො යොනියො භොන්ති" යනු එම සුචිත්තාලඞ්කාරයෙහි පාඨබැවින් තිරශ්චාන යොනියෙහි උපදනා සත්ත්වයන් කෙරෙහි මේ සතරයොනියෙහි සත්ත්වයෝම ඇත්තාහු වෙති. "නිජ්ඣාමතණ්හික පෙතවජ්ජිත පෙතලොකෙ අණ්ඩජයොනි ජලාබුජයොනි සංසෙදජයොනි ඔපපාතිකයොනි ඉති චතස්සො යොනියො භවන්ති" යනුබැවින් නිජ්ඣාමතණ්හික ප්‍රේතයන් හැර අවශෙෂ ප්‍රේතයන් කෙරෙහිද සතරයොනිහුම ලැබෙත්. නිජ්ඣාමතණ්හික ප්‍රේතයන්ට වනාහි එකම ඕපපාතික යොනි ප්‍රතිසන්ධියම ලැබෙන්නේයි. මනුෂ්‍යයන්ට හා භූමාටු දෙවියන්ටද ඒ සතර ප්‍රතිසන්ධිහුම ලැබෙත් මැයි. ෂට්කාමාවචර දිව්‍යලොකයෙහි වනාහි එකම ඕපපාතික ප්‍රතිසන්ධියම ලැබෙන්නේයි. රූපා රූප බ්‍රහ්මලොකයෙහිද එකම ඕපපාතික ප්‍රතිසන්ධියම ලැබෙන්නේමැයි. මේ ප්‍රතිසන්ධීන් අතුරෙන් ඔසුපත් නරක හා අටමහා නරකයෙහිද, නිජ්ඣාමතණ්හික ප්‍රේතයන් කෙරෙහිද, දෙවියන්ට මෙන් ඕපපාතික ප්‍රතිසන්ධියලැබෙන්නේයයි කුමක් හෙයින් කීයේදයත්? ඒනරකයෙහි උපදනා සත්ත්වයන්ගේ කර්මජ තෙජොධාතුව අධික හෙයින් කල්පාන්තවහ්නියෙහි අණ්ඩජ ජලාබුජ සංසෙදජ සත්ත්වයන් නූපදනාක්මෙන් නිජ්ඣාමතණ්හික ප්‍රේතයන් සහිතවූ අටමහානරකවාසී සත්ත්වයන්ට ගබ්භසෙය්‍යකාදී යොනිත්‍රය නොලැබෙන්නේ මැයි.

## භූමි විභාග චතුෂ්කය නිමි.

---

අපාය පටිසන්ධිච, අපාය ප්‍රතිසන්ධියද ; කාමසුගති පටිසන්ධිච, කාමසුගති ප්‍රතිසන්ධියද ; රූපාවචරපටිසන්ධිච, රූපාවචර ප්‍රතිසන්ධියද ; අරූපාවචරපටිසන්ධිච, අරූපාවචර ප්‍රතිසන්ධියද ; ඉති, මෙසේ ; චතුබ්බිධා, සතරාකාර ඇත්තාවූ ; පටිසන්ධිනාම, ප්‍රතිසන්ධිය වනාහි ; වෙදිතබ්බා, දතයුත්තීය ; තත්ථ, (තෙසු පටිසන්ධිසු.) ඒ සතරාකාර ප්‍රතිසන්ධීන් අතුරෙන් ; අකුසල විපාකොපෙක්ඛා සහගත සන්තීරණං, අකුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත් තෙමේ ; අපායභූමියං, අපාය භූමියෙහි ; ඔක්කන්තික්ඛණෙ, බැසගන්නාක්ෂණයෙහි ; පටිසන්ධිහුත්වා, ප්‍රතිසන්ධිව ; තතොපරං, ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි ; භවඞ්ගංහුත්වා, භවාඞ්ගව ; පරියොසානෙ, භවයාගේ කෙළවර ; චවනංහුත්වා, චුතිසිත්ව ; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිඳේ. එකා, හුදකලාවූ ; අයංපටිසන්ධි, මේ ප්‍රතිසන්ධි තොමෙ

අපායපටිසන්ධිනාම, අපායපටිසන්ධි නම් වේ. පන, දුගති ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ සුගති අහෙතුක ප්‍රතිසන්ධිය දක්වම් :- කුසල විපාකොපෙක්ඛාසහගත සන්තීරණං, කුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ සිත්තෙමේ ; කාමසුගතියංනාම, කාමසුගති භූමියෙහි ; ජච්චන්ධාදීනං, ප්‍රතිසන්ධි වශයෙන් අන්ධවීම් ආදී විකාර ඇත්තාවූ ; මනුස්සානංචෙව, මිනිසුන්ගේද ; නොහොත් මිනිසුන්ටද ; භුම්මනිස්සිතානං, භූමාට්ටු දෙවියන්ගේ ස්වභාව ඇති හෙයින් භූමිනිශ්‍රිතයයි කියන ලද්දාවූ ; විනිපාතිකාසුරානම, විනිපාතික අසුරයන්ගේද ; පටිසන්ධි භවඞ්ගචුතිවසෙන, ප්‍රතිසන්ධිභවාඞ්ගචුති වශයෙන් ; පවත්තති, හටගන්නේයි. පන, අහෙතුක ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ සහෙතුක ප්‍රතිසන්ධිය දක්වම් :- අට්ඨමහාවිපාකානි, මහාවිපාකයෝ අටදෙන තුමූ ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු ; කාමසුගතියං එව, සප්තකාම සුගතියෙහිම ; පටිසන්ධිභවඞ්ගචුතිවසෙන පවත්තන්ති, ප්‍රතිසන්ධි භවාඞ්ගචුතීන්ගේ වශයෙන් හටගන්නාහු වෙත්. නවඉමා, නව ප්‍රකාරවූ මේ ප්‍රතිසන්ධීහු තුමූ ; කාමසුගතිපටිසන්ධියොනාම, කාම සුගති ප්‍රතිසන්ධීහු නම් වෙත්. පන, අවයවයෙන් අන්‍යවූ සමුදායාර්ථය දක්වම් :- දසවිධාපි, දශප්‍රකාරවූද ; සා අයංපටිසන්ධි, ඒ ප්‍රතිසන්ධිතොමෝ ; කාමාවචර පටිසන්ධිචෙව, කාමාවචර ප්‍රතිසන්ධියයි කියාම ; සඞ්ඛ්‍යංගච්ඡති, සඞ්ඛ්‍යාවට හෙවත් ගණනට යෙයි. තෙසු, දශප්‍රකාරවූ ඒ ප්‍රතිසන්ධීන් යුක්තවූ ඒ පුද්ගලයන් අතුරෙන් ; චතුන්නං අපායානංච, සතර ආපායික පුද්ගලයන්ටද ; මනුස්සානච, මිනිසුන්ටද ; විනිපාතිකාසුරානච, විනිපාතික අසුරයන්ටද ; ආයුප්පමාණගණනාය, ආයුප්‍රමාණ ගිණීමෙහි ; නියමොනත්ථි, ඒකාන්තබවෙක් නැත්තේයි. පන, අනියතයෙන් අන්‍යවූ නියතය දක්වම් :- චාතුම්මහාරාජිකානං දෙවානං ; සිව්මහරජයෙහි දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය ; දිබ්බානි, දෙවියන් කෙරෙහිවූ ; පඤ්චවස්සසතානි හොන්ති, පන්සියයක් හවුරුදු වෙත් මනුස්සගණනාය, මිනිස් ගණිතින් ; නවුතිවස්ස සතසහස්සප්පමාණං හොති, අනූලක්ෂයක් හවුරුදු වෙයි. තතො, ඒ සිව්මහ රජයෙහි දෙවියන්ගේ ආයුගණිතින් ; චතුග්ගුණං, සතරගුණයක් තෙමේ ; තාවතිංසානං දෙවානං, තව්තිසාවැසි දෙවියන්ගේ ; ආයුප්පමාණංහොති, ආයුෂ ප්‍රමාණය වෙයි ; තතො, ඒ තව්තිසාවැසි දෙවියන්ගේ ආයුගණිතින් ; චතුග්ගුණං. සතර ගුණයක් තෙමේ ; යාමානං දෙවානං, යාමදෙවියන්ගේ ; ආයුප්පමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතො, ඒ යාමදෙවියන්ගේ ආයුගණිතින් ;

චතුගගුණං, සතර ගුණයක් තෙමේ; තුසිතානං දේවානං, තුසිත දෙවියන්ගේ; ආයුප්පමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතො, තුසිත දෙවියන්ගේ ආයුගණනින්; චතුගගුණං, සතර ගුණයක් තෙමේ; නිම්මානරතීනං දේවානං. නිර්මාණරතී දෙවියන්ගේ; ආයුප්පමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතො, ඒ නිම්මානරති දෙවියන්ගෙ ආයුගණනින්; චතුගගුණං, සතර ගුණයක් තෙමේ; පරනිම්මිත වසවත්තීනං දේවානං, පරනිර්මිත වශවර්ති දෙවියන්ගේ; ආයුප්පමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. වසවත්තිසු, වශවර්ති භූමියෙහි භව ගත්තාවූ; දේවානං, දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; මනුස්සගණනාය, මිනිස්ගණනින්; වස්සානං, වර්ෂයන් සම්බන්ධවූ; නවසතඤ්චකොටියො, කොටිනවසියයෙක්ද; එකවීස කොටියොච, එක්විසිකොටියෙක්ද; තථා, එපරිද්දෙන්; සට්ඨිච වස්සසතසහස්සානි, හැට්ලක්ෂයෙක්ද; හොති, වෙයි.

පඨමජ්ඣාන විපාකං, ප්‍රථමධ්‍යාන විපාකය; පඨමජ්ඣාන භූමියං, ප්‍රථමධ්‍යාන භූමියෙහි; පටිසන්ධි භවඞ්ගචුතිවසෙන, ප්‍රතිසන්ධිය භවාඞ්ගය චුතිය යන මොවුන්ගේ වශයෙන්; පවත්තති, හටගන්නේයි. තථා, එපරිද්දෙන්; දුතියජ්ඣාන විපාකඤ්ච, ද්විතීයධ්‍යානය හා යුක්තවූ විපාකචිත්තයද; තතිය ජ්ඣාන විපාකඤ්ච, තෘතීයධ්‍යානය හා යුක්තවූ විපාක චිත්තයද; දුතියජ්ඣාන භූමියං, ද්විතීයධ්‍යාන භූමියෙහි; පටිසන්ධි භවාඞ්ග චුතිවසෙන, පටිසන්ධි භවඞ්ග චුතීන්ගේ වශයෙන්; පවත්තති, හටගන්නේයි. චතුත්ථජ්ඣාන විපාකං, චතුර්ථධ්‍යානය හා යුක්තවූ විපාක චිත්තය; තතියජ්ඣාන භූමියං, තතියජ්ඣාන භූමියෙහි; පටිසන්ධිභවඞ්ග චුතිවසෙන ප්‍රතිසන්ධිභවාඞ්ගචුති වශයෙන්; පවත්තති, හටගන්නේයි. පඤ්චමජ්ඣාන විපාකං, පඤ්චම ධ්‍යානය හා යුක්තවූ විපාකචිත්තය; චතුත්ථජ්ඣාන භූමියං, චතුර්ථ ධ්‍යාන භූමියෙහි; පටිසන්ධිභවඞ්ග චුති වසෙන, ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන්; පවත්තති, හටගන්නේයි. පන, විශෙෂාර්ථයක් දක්වමි :- අසඤ්ඤසත්තානං, අසංඥ භූමියෙහි සත්වය න්ට: රූපමෙව, ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම; පටිසන්ධි හොති, ප්‍රතිසන්ධිය වෙයි; තථා එපරිද්දෙන්; තතොපරං, ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි; පවත්තියඤ්ච, ප්‍රවෘත්තිකාලයෙහිද; චවනකාලෙච, චුතවන්නාවූ කාලයෙහිද; රූපමෙව ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම; භවඞ්ග චුතිවසෙන, භවාඞ්ගචුති වශයෙන්; පවත්තිත්වා, පැවත;

නිරුජ්ඣති, නිරුද්ධවන්නේයි. ඉච්චා, මේ ප්‍රතිසන්ධිහු සදෙන තුමූ; රූපාවචර පටිසන්ධියොනාම, රූපාවචර ප්‍රතිසන්ධිහු නම් වෙත්.

තෙසු, ඒ ෂට්ප්‍රකාර ප්‍රතිසන්ධීන් හා යුක්තවූ පුද්ගලයන් අතුරෙන්; බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං, බ්‍රහ්මපාරිෂද්‍යයෙහි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කප්පස්ස, අසඞ්ඛ්‍ය කල්පයාගේ; තතියො භාගොහොති, තුන්වන භාගය වෙයි. හෙවත් තුනින් බෙදූ කොටසක් වෙයි. බ්‍රහ්ම පුරොහිතානං දෙවානං, බ්‍රහ්ම පුරොහිත භූමියෙහිවූ දෙවියන්ගේ: ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; උපඩ්ඪකප්පො හොති, අසඞ්ඛ්‍ය කල්පයාගේ අඩියක් වෙයි. මහාබ්‍රහ්මානං, දෙවානං, මහාබ්‍රහ්ම භූමියෙහිදෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; එකො කප්පොහොති, එක් අසඞ්ඛ්‍ය කල්පයෙක් වෙයි. පරිත්තාභානං දෙවානං, පරිත්තාභා නම් දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වෙකප්පානිහොනති, මහාකල්පයෝ දෙදෙනෙක්වෙත්; අප්පමාණාභානං, දෙවානං, අප්පමාණාභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චත්තාරිකප්පානි හොනති, මහාකල්පයෝ සතරදෙනෙක් වෙත්. ආභස්සරානං දෙවානං, ආභස්සර දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂප්‍රමාණය; අට්ඨකප්පානි හොනති, මහාකල්පයෝ අටදෙනෙක් වෙත්. පරිත්තසුභානං දෙවානං, පරිත්තසුභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; සොළසකප්පානි හොනති, සොළොස් මහාකපෙක් වෙත්. අප්පමාණසුභානං දෙවානං, අප්පමාණ සුභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; ද්වත්තිංසකප්පානි හොනති, දෙතිස් මහාකල්පයෙක් වෙත්; සුභකිණ්හකානං දෙවානං, සුභකිණ්හක දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චතුසට්ඨිකප්පානි, හොනති, සුසැට මහාකල්පයෙක් වෙත්. වෙහප්ඵලානං දෙවානම, වෙහප්ඵල දෙවියන්ගේද; අසඤ්ඤසත්තානං දෙවානම, අසංඥතලවාසී දෙවියන්ගේද; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; පඤ්චකප්පසතානි හොනති, මහාකල්ප පන්සියයෙක් වෙත්. අවිහානං දෙවානං, අවිහතලවාසී දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කප්පසහස්සානි හොනති, මහාකල්ප දහසෙක් වෙත. අතප්පානං දෙවානං, අතප්පතලවාසී දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වෙකප්ප සහස්සානි හොනති, මහාකල්ප දෙදහසෙක් වෙත්. සුදස්සානං දෙවානං, සුදස්සතලවාසී දෙවියන්ගේ ආයුප්ප

මාණං, ආයුෂ ප්‍රමාණය චත්තාරිකප්පසහස්සානි හොන්ති, මහා කල්ප සාරදහසෙක් වෙත්. සුදස්සීනං දේවානං, සුදස්සීතලවාසී දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය ; අට්ඨකප්පසහස්සානි හොන්ති, මහා කල්ප අටදහසක් වෙත්. අකනිට්ඨානං දේවානං, අකනිටාතලවාසී දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂප්‍රමාණය, සොළසකප්පසහස්සානි හොන්ති, මහා කල්ප සොළොස් දහසෙක් වෙති.

පඨමාරූප්පාදිවිපාකානි, ප්‍රථමාරූප්‍යයන් හා යුක්තවූ විපාකයෝ තුමූ; පඨමාරූප්පාදිභූමිසු, ප්‍රථමාරූප්‍යාදිභූමියෙහි; යථාක්කමං, පිළිවෙළින්; පටිසන්ධිභවඞ්ගචුතිවසෙන, ප්‍රතිසන්ධිභවාඞ්ගචුතීන්ගේ වශයෙන්; පවත්තන්ති, හටගණිත්; චත්තාරො ඉමා, මේ සතර ප්‍රතිසන්ධිහුතුමූ; ආරුප්පපටිසන්ධියො නාම, ආරූප්‍ය ප්‍රතිසන්ධිහු නම් වෙත්. පන, ප්‍රතිසන්ධියෙන් අත්‍යවූ ආයුෂ ප්‍රමාණය දක්වම්:—තෙසු චතුසු, ඒ සතර ප්‍රතිසන්ධියෙන් යුක්ත පුද්ගලයන් අතුරෙන්; ආකාසානඤ්චායතනූපගානං දේවානං, ප්‍රථමාරූප්‍ය භූමියට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වීසතිකප්පසහස්සානි හොන්ති, මහා කල්ප විසිදහසක්වෙත්. විඤ්ඤාණඤ්චායතනූපගානං දේවානං, විතීයාරූප්‍යතලයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චත්තාළීසකප්පසහස්සානි, සතළිස් දහසක් මහා කල්පයෝ වෙත්. ආකිඤ්චඤ්ඤායතනූපගානං දේවානං, තුන්වෙනි ආරූප්පතලයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂප්‍රමාණය; සට්ඨිකප්පසහස්සානි හොන්ති, මහාකල්ප සැටදහසක් වෙත්; නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දේවානං, සතරවන ආරූප්‍යයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂප්‍රමාණය; චතුරාසීති කප්පසහස්සානි හොන්ති, සුවාසූදහසක් මහාකල්පයට ආයුෂ වෙත්.

පටිසන්ධි භවඞ්ගඤ්ච තථා චවන මානසං,
එකමෙව තථෙවේක විසයංචෙක ජාතියං.

එක ජාතියං, එක් භවයෙක්හි; පටිසන්ධිච, ප්‍රතිසන්ධිචිත්තයද; භවඞ්ගංච, භවාඞ්ග චිත්තයද; තථා, එසේම; චවනමානසංච, චුතිචිත්තයද; එකමෙව හොති, භූමිජාති සම්ප්‍රයුක්ත ධර්මසංස්කාරවශයෙන්; සදෘශමවෙයි. තථෙව, එපරිද්දෙන්ම; එකවිසයංච, සදෘශවූ අරමුණුද ඇත්තේ වෙයි. ඉදං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මේ විපිමුක්තසඞ්ග්‍රහයෙහි; පටිසන්ධිවත්ථුකං, ප්‍රතිසන්ධි චතුෂ්කයයි.

ප්‍රතිසන්ධි චතුෂ්කයෙහි විභාග කෙසේයත්? අපාය ප්‍රතිසන්ධිය කාමසුගති ප්‍රතිසන්ධිය, රූපාවචරප්‍රතිසන්ධිය, අරූපාවචර ප්‍රතිසන්ධි යයි ප්‍රතිසන්ධිතොමෝ සතරප්‍රකාරවන්නීයි. "භවතො භවස්ස පටිසන්ධානං පටිසන්ධි" යනු නිර්වචන බැවින් අතීතභවයෙහි චුති චිත්තය හා වර්තමාන භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද වර්තමාන භවයෙහි චුති චිත්තය හා අනාගත භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද යන භවයෙන් භවය අතුරක් නැතිසේ ගලපන්නාවූ චිත්තය ප්‍රතිසන්ධි නම් වේ. ඔවුන් අතුරෙන් දොළොස් අකුශලයන්ගේ විපාකවූ උපෙක්ඛාසහගත සන්තීරණ සිත් තෙමේ සතර අපාය භූමියෙහි බැසගන්නාවූ ක්ෂණයෙහි පළමුකොට ප්‍රතිසන්ධි වශයෙන් ඉපිද ඒ අපාය භූමියෙහි වසන්නාක්කල් මුලුල්ලෙහි භවාඞ්ගවද, ඒ අපාය භූමියෙන් චුතවන්නාවූ කාලයෙහි චුති චිත්තවශයෙන්ද ඉපිද නිරුද්ධවන්නේයි. මේ සතර අපායට අයත්වූ සත්ත්වවර්ගයාගේ සඞ්ඛ්‍යාවට උපමා කළහැකි වස්තුවක් ලෝකයෙහි නැත්තේයි. එහෙයින් නානත්තකායා එකත්තසඤ්ඤියයි ව්‍යවහාර කෙරෙති. කම්බලාස්සතර නාග භවනයෙහි හා ගුරුළු භවනයෙහිද උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය මෙම උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තයම වන නුමුත් ඔවුන්ගේ ප්‍රවෘත්තිකාලයෙහි දෙවියන්ට බඳුවූ සුධාභොජනය අනුභවකොට දිව්‍ය විමාන දිව්‍ය කල්ප වෘක්ෂාදියෙන් අභිමත වස්තු ලැබ දෙවියන්මෙන් සැපවිඳිනාහු වෙති. ඔවුන් අභිමතවූ රූපාදිය මවා පෑමෙහිද පොහොසත් වෙති. ඔවුන්ගේ ප්‍රතිසන්ධිවිඥානය අකුශලකර්ම හෙතුවෙන් හට ගත්තේ නමුදු සියලු ප්‍රවෘත්ති විපාක පරම්පරාව කාමාවචර උපෙක්ෂාසහගත කුශල බලයෙන්ම ලැබෙත්. අකුශල විපාක සන්තීරණ බලයෙන් හටගත්තාවූ විපාකවිඥානය බැවින් ඒ ආත්මයෙහි ධ්‍යාන මාර්ගඵලාදිය එකාන්තයෙන් නො ලැබෙත්තේමැයි. කුශලවිපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය වනාහි කාමසුගතියෙහි ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිනපුංසකාදිවූ අඞ්ගවිකල සත්ත්වයන්ගේ හා බොහෝසෙයින් අනුන්ට බැලමෙහෙ කරන්නාවූ විචාරණ බුද්ධිමත්වූ අඞ්ග සම්පූර්ණවූද සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය හා භූමිනිශ්‍රිතවූ විනිපාතික අසුර සඞ්ඛ්‍යාතවූ ඥාති ප්‍රේතාදීන්ගේද, ප්‍රතිසන්ධියගත්තේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධිය වනාහි ඥානවිප්‍රයුක්තවූ ද්විහෙතුක කාමාවචර කර්මබලයෙන් හට ගත්තේයයි දතයුතුයි. ඔවුන් අතුරෙන් ලාමක මනුෂ්‍යයෝ මනුෂ්‍ය භූමියෙහිද, විනිපාතික අසුරයෝ චාතුර්මහාරාජික භූමියෙහිද, ඇතුලත්වන බැවින් චාතුර්මහාරාජිකයෙහිද අහෙතුක ප්‍රතිසන්ධිකයෝ ඇතැයි කියති. මහාවිපාකයෝ අට

දෙන වනාහි සාමාන්‍යයෙන් සප්තකාමසුගතියෙහි ප්‍රතිසන්ධි වශයෙන් පවත්නාහුයයි කියනලද මනුෂ්‍යභූමියෙහි ඛත්තිය මහාසාර බ්‍රාහ්මණ මහාසාර ගෘහපති මහාසාර යන සාමි කුලත්‍රයෙහි ඥානසම්ප්‍රයුක්ත සතරවිපාකයද, ඒ සාමි කුලත්‍රයෙහි මහාසාර නොවන්නාවුන්ගේ හා ශුද්‍රයන්ගේද ප්‍රතිසන්ධිය ද්විහෙතුක විපාක සතරෙන්ම ගන්නේයි. ෂට්කාම ස්වර්ගයෙහි මහේශාක්‍ය මහානුභාවසම්පන්න දෙවියන්ගේ ප්‍රතිසන්ධිය ත්‍රිහෙතුක විපාක සතරෙන් හා ගන්ධර්වලොක අසුරභවන යන දෙතන්හිද අල්පෙශාක්‍ය දෙවියන්ගේද ප්‍රතිසන්ධිය ද්විහෙතුක විපාක සතරෙන් ගන්නේයි. එහෙයින් අසුර ගන්ධර්වාදීන්ට එම ආත්මයෙහි ධ්‍යාන මාර්ගඵලාදිය නොලැබිය හැකි වේ. මේ සදිව්‍ය ලොකවාසීන්ගේ ආයු ප්‍රමාණය යට භූමිචතුෂ්කයෙහි කීනයින් දතයුතුයි.

ප්‍රථමධ්‍යාන විපාකය ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් පවත්නේයයි සාමාන්‍යයෙන් කීයේ නමුදු විතර්කාදී පඤ්චාඞ්ගයෙන් යුක්තවූ ප්‍රථම ධ්‍යානය උපදවාගත් පමණින් කාලක්‍රියා කෙළේවී නම් බ්‍රහ්ම පාරිෂද්‍යභූමියෙහි උපදනේ වෙයි. එසේම සත්‍රී ආත්මභාවයෙහි උපන්නාවූ අෂ්ටසමාපත්ති ලාභීවූ අනාගාමීහුද බ්‍රහ්ම පාරිෂද්‍යභූමියෙහි ඉපිද මතු මතු බඹතලයට අනුක්‍රමයෙන් ගොස් ශුද්ධාවාස භූමියෙහි පිරිනිවන් පානාහුයයි දතයුතුයි. ඒ ප්‍රථමධ්‍යානය මධ්‍යම වශයෙන් වැඩූ පමවසිතාවෙන් පුරුදු නොකළාවූ ධ්‍යානලාභී තෙම බ්‍රහ්ම පුරෝහිතතලයෙහි උපදී. ඒ ප්‍රථමධ්‍යානය පස් ආකාරයකින් වශීභූතකර ගත්තාවූ ධ්‍යානලාභීහට මහා බ්‍රහ්මභූමියෙහි ප්‍රථමධ්‍යානවිපාක චිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් පවත්නේයි. සෙසු ධ්‍යානයන්ගේද යටකී නයින් විස්තර දතයුත්තේයි.

## ප්‍රතිසන්ධි චතුෂ්කය නිමි.

---

## (පදගතාර්ථ.)

ජනකම, විපාකනාමස්කන්ධකටත්තාරූපයන් උපදවන්නාවූ ජනකකර්මයද; උපත්ථම්භකම, ඒ ජනක කර්මයට ලංව රුකුල් දෙන්නාවූ උපස්ථම්භක කර්මයද; උපපීලකම, ඒ ජනක කර්මයට ලංව පීඩාකරන්නාවූ උපපීඩක කර්මයද; උපඝාතකම, ජනක කර්මයට ලංව විපාකශක්තිය සිඳිනාවූ උපඝාතක කර්මයද; ඉති, මෙසේ; කිච්චවසෙන, කෘත්‍යයන්ගේ වශයෙන්; චත්තාරිකම්මානි කාම, සතරකර්මකොතෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

ගරුකම, කුශලපක්ෂයෙහි නොහොත් අකුශලයෙහි සියල් ලට වඩා බරවූ කර්මයද; ආසන්නංච, මරණාසන්නකාලයෙහි සිහි කරණ ලද්දාවූ හෝ රැස්කරණ ලද්දාවූ කර්මයද; ආචිණ්ණංච, බොහෝකලක් නිරන්තරයෙන් පුරුදුකරණ ලද්දාවූ කර්මයද; කටත්තාකම්මංච, ගරුකාදී භාවයට නොපැමිණියාවූ විපාකදීම් මාත්‍රයක් ඇත්තාවූකර්මයද; ඉති, මෙසේ; විපාකදානපරියායෙන, විපාක දෙන්නාවූ ක්‍රමයෙන්; චත්තාරිකම්මානි නාම, සතර කර්ම කෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

දිට්ඨධම්මවෙදනීයංච, ප්‍රත්‍යක්ෂවූ ශරීර භාවයෙහි වින්දයුතු විපාක ඇත්තාවූ කර්මයද; නොහොත් කර්මය රැස්කළාවූ ස්කන්ධ පංචකයටම විපාකදීම ලක්ෂණකොට ඇත්තාවූ කර්මයද; උපපජ්ජවෙදනීයංච, දෙවෙනි ආත්මභාවයෙහි වින්දයුතුවූ කර්මයද; අපරාපරියවෙදනීයංච, ප්‍රත්‍යක්ෂ ආත්ම භාවයෙන්ද දෙවෙනි ආත්මභාවයෙන්ද අන්‍යවූ යම්කිසි ආත්මභාවයක විඳයුතු විපාකදීම් ඇත්තාවූ කර්මයෙක්ද නොහොත් තුන්වෙනි භවය පටන් ස්කන්ධපරිනිර්වාණය දක්වා මේ අතරෙහි යම්කිසි තැනකදී විපාකදීම ලක්ෂණකොට ඇත්තාවූ කර්මයෙක්ද; අහොසිකම්මංච, (විපාකදී කෙළවරවූද) අනාගතයෙහි විපාක නොදිය යුතුවූද කලමාත්‍රයකින් කර්මනමුදු අහොසිනම් කර්මයෙක්ද; ඉති, මෙසේ; පාකකාලවසෙන, විපාක දෙන්නාවූ කාලයන්ගේ වශයෙන්; කම්මානිනාම, කර්මයෝ වනාහි; චත්තාරිඉති, සතරදෙනෙකැයි; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

තථා, එපරිද්දෙන්; අකුසලංච, දොළොස් අකුශල කර්මයද; කාමාවචරකුසලංච, කාමාවචර කුසලකර්ම අටද; රූපාවචරකුසලංච, රූපාවචර කුසලකර්ම පසද, අරූපාවචරකුසලංච, අරූපාවචර කුශලකර්ම සතරෙක්ද; ඉති, මෙසේ; පාකට්ඨානවසෙන, විපාක දෙන්නාවූ ස්ථානයන්ගේ වශයෙන්; චත්තාරිකම්මානි නාම, සතර කර්මකෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

තත්ථ, ඒ සතරාකාර කර්මයන් අතුරෙන්; අකුසලං, අකුශල කර්ම තෙමේ; කායකම්මංච, කායකර්මයද; වචීකම්මංච, වාක් කර්මයද; මනොකම්මංච. මනඃ කර්මයද; ඉති, මෙසේ; කම්මද්වාරවසෙන, කර්මනිෂ්පත්තිද්වාරවශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වෙයි. කථං හොති? කෙසේ වන්නේද යත්? පාණාතිපාතොච, අනුන්ගේ ජීවිතෙන්ද්‍රියය සුනුසුණුව හෙළීමද; අදින්නාදානංච, හිමියාවිසින් කායවාක්දෙකින් නොදෙන ලද්දාවූ අන්සතු වස්තුව හොරකම් කිරීමද; කාමෙසුමිච්ඡාචාරොච, සත්පුරුෂනොවූ අධමයන්ගේ

හැසිරීම සෙවනය කිරීම් වශයෙන්ද; කායවාරයෙහි හටගන්නාවූ නොයායුතු මාතුරක්ඛිතාදී ස්ථානයන් ඉක්මවන්නාවූ චෙතනා සඞ්ඛ්‍යාතවූ කාමගුණයෙහි වරදවා හැසිරීමද; ඉති, මෙසේ; තිවිධං කම්මං, තුන්වැදෑරුම්වූ කර්මතෙමේ; කායවිඤ්ඤත්තිසඞ්ඛාතෙ, කායවිඥප්තියයි කියනලද්දවූ නොහොත් ශරීරයෙන් හැඟවීම් සංඛ්‍යාතවූ නොහොත් ශරීරය හෙතුකොටගෙණ දන්වීමයයි කියනලද්දවූ; කායවාරෙ, කායවාරයෙහි; බාහුල්ලවුත්තිතො, බොහෝ සෙයින් හටගන්නා බැවින්; කායකම්මං නාම, කායකර්ම නම් වේ.

මුසාවාදො, අසත්‍යය සත්‍යය වශයෙන් කීමට හෙතුවූ වචනයද; පිසුණාවාචා, දෙදෙනෙකුගේ ප්‍රෙමය සුණුවිසුණුකරන්නාවූ වචනයද; ඵරුෂාවාචා, කියනක්මෙන් රෞද්‍ර ස්පර්ශ ඇත්තාවූ වචනයද; සම්ඵප්පලාපො ච, හිතාභිවෘද්ධිය විනාශකරන්නාවූ ගීතාභරණාදි නිෂ්ප්‍රයොජන කථාවන්ද; ඉති, මෙසේ; චතුබ්බිධං කම්මං, සතර වැදෑරුම් කර්මතෙමේ; වචීවිඤ්ඤත්ති සඞ්ඛාතෙ, වචීවිඥප්තියයි කියනලද්දවූ නොහොත් වචනයෙන් හැඟවීමයයි කියනලද්දවූ නොහොත් වචනය හෙතුකොටගෙණ; දන්විය යුත්තේයයි කියනලද්දවූ; වචිවාරෙ, වාග්වාරයෙහි; බාහුල්ලවුත්තිතො, බහුලවශයෙන හටගත් සෙයින්; වචීකම්මං නාම, වාක් කර්ම නම් වෙයි,

අභිජ්ඣාච, මෙරමාගේ සම්පත්තිය අභිමුඛකොට කල්පණාකිරීම් වශයෙන් පවත්නාවූ දැඩි තෘෂ්ණාවද; ව්‍යාපාදො ච, මෙරමාගේ සම්පත් විනාශකිරීමට හෙතුවූ වෙෂචෙතසිකයද; මිච්ඡාදිට්ඨිච, විපරීතවූ දැකීමද; ඉති, මෙසේ; තිවිධං කම්මං, තුන්වැදෑරුම් කර්මතෙමේ; විඤ්ඤත්තියා අඤ්ඤත්‍රාපි, කයින් හැඟවීමෙන් හෝ වචනයෙන් හැඟවීමෙන් තොරවද; මනස්මිංයෙව, චිත්තයෙහිම; බාහුල්ලවුත්තිතො, බහුල වශයෙන් හටගන්නා හෙයින් නොහොත්; මනස්මිං, මනොවාරයෙහි; බාහුල්ලවුත්තිතොයෙව, බහුල වශයෙන් හටගන්නාහෙයින්ම; මනොකම්මං නාම, මනඃකර්ම නම් වෙයි.

තෙසු, ඒ දශාකුශලකර්මපථයන් අතුරෙන්; පාණාතිපාතොච, ප්‍රාණාතිපාතයද; ඵරුෂාවාචාච, පරුෂ වචනයද; ව්‍යාපාදොච, ව්‍යාපාදයද; දොෂමූලෙන, වෙෂසංඛ්‍යාතවූ මූලය හෙතුකොටගෙණ; ජායන්ති, උපදනාහු වෙත්. කාමෙසුමිච්ඡාචාරොච, කාම මිථ්‍යාචාරයද; අභිජ්ඣාච, අභිධ්‍යාවද; මිච්ඡාදිට්ඨිච, මිථ්‍යාදෘෂ්ටි

සද; ලොභමූලෙන, ලොභසංඛ්‍යාත මූලය හෙතුකොටගෙණ; ජනයන්ති, උපදනාහු වෙත්. සෙසානි කියනලද කර්‍මපථයන්ගෙන් අවශිෂ්ටවූ; චත්තාරිහි, සතරාකාරවූ; අදින්නාදාන මුසාවාද පිසුනාවාච සම්ඵප්පලාපයෝ චත්තාහි; ද්වීහිමූලෙහි, ලොභ ද්වෙෂ සංඛ්‍යාතවූ මූලද්වය හෙතුකොටගෙණ; සම්භවන්ති, හටගන්නාහු වෙත්. පන, අවයවයෙන් අන්‍යවූ; සමුදායාර්‍ථයද දක්වම්:- චිත්තුප්පාදවසෙන, චිත්තොත්පාදයන්ගේ වශයෙන්; එතං අකුසලං, ඒ අකුශල කර්‍මතෙමේ; සබ්බථාපි, සර්‍වප්‍රකාරයෙනුදු; ද්වාදසවිධං හොති දොළොස්වැදෑරුම් වෙයි.

කාමාවචර කුසලම්පි, කාමාවචර කුශලයද; කායද්වාරෙ පවත්තං, කායද්වාරයෙහි හටගත්තාවූ කර්‍මතෙමේ; කායකම්මව, කායකර්‍මයයි කියාද; වචීද්වාරෙ පවත්තං, වචීද්වාරයෙහි හටගත්තාවූ කර්‍මතෙමේ; වචීකම්මව, වචීකර්‍මයයි කියාද; මනොද්වාරෙ පවත්තං, මනොද්වාරයෙහි හටගත්තාවූ කර්‍මතෙමේ; මනොකම්මව, මනොකර්‍මයයි කියාද; ඉති, මෙසේ; කම්මද්වාරවසෙන, කර්‍මනිෂ්පත්තියට හෙතුවූ ද්වාරයන්ගේ වශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වේ. තථා, එපරිද්දෙන්; දානසීලභාවනාවසෙන, දාන ශීල භාවනාවන්ගේ වශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වෙයි. පන, එකදෙශයෙන් අන්‍යවූ සමුදායාර්‍ථය දක්වම්:- චිත්තුප්පාදවසෙන, චිත්තොත්පාදයන්ගේ වශයෙන්; එතං කුසලං, ඒකාමාවචර කුශලකර්‍ම තෙමේ; අට්ඨවිධං හොති, අටවැදෑරුම් වෙයි. දාන ශීල භාවනා වෙය්‍යාවච්ච පත්තිදාන පත්තානුමොදනා ධම්මසවන ධම්මදෙසනා දිට්ඨිජ්ජුකම්මවසෙන, දන්දීමය, සිල්රැකීමය, කමටහන්භාවනා වැඩීමය, තුණුරුවන් මව්පියන් ආදීන්ට ගරුබුහුමන් කිරීමය, ඔවුන්ටම කුදුමහත් කටයුතු වතාවත් කිරීමය. තමා විසින් රැස්කළාවූ කුශලභාගය අනුන්ට දීමය, අනුන් විසින් කරණලද්දාවූ කුශලකර්‍මයට සතුටුවීමය, බණ ඇසීමය, බණ දෙසීමය, දෘෂ්ටිය ඍජුකිරීමය, යන මොවුන්ගේ වශයෙන්; දසවිධං හොති, දසවැදෑරුම් වේ. පන, අවයවයන්ගෙන් අන්‍යවූ; සමුදායාර්‍ථය දක්වම්:—වීසතිවිධම්පි, විසිවැදෑරුම්වූද; තං එතං කම්මං, ඒ කුශලාකුශලකර්‍මතෙමේ; කාමාවචරකම්මම්චෙවව, කාමාවචර කර්‍මයයි කියාම; හෙවත් කාමාවචරයන්ගේ ගණනටම; ගච්ඡති, යෙයි.

පන, කාමාවචරකර්‍මයෙන් අන්‍යවූ රූපාවචර කර්‍මය දක්වම්:—රූපාවචරකුසලං, රූපාවචර කුශලකර්‍ම තෙමේ; මනොකම්මමෙව, මනඃකර්‍මයමැයි. තංච, ඒරූපාවචරකුශල සංඛ්‍යාතවූ

මනඃකර්මතෙමේද; භාවනාමයං, භාවනාවෙන් නිපන්නේයි. අප්පණාප්පත්තං, අර්පණාවට පැමිණියේයි. ඣානඞ්ගභෙදෙන, ධ්‍යානාඞ්ගයන් හා යුක්තවූ ප්‍රභෙදය කාරණකොටගෙණ; පංචවිධං හොති, පස්වැදෑරුම් වෙයි. තථා, එපරිද්දෙන්; අරූපාවචර කුසලංච, අරූපාවචර කුශලකර්ම තෙමේද; මනොකම්මං. මනඃ කර්මයයි නම්පි, ඒ අරූපාවචර කුශල සංඛ්‍යාත මනොකර්ම තෙමේද; භාවනාමයං, භාවනාවෙන් නිපන්නේයි. අප්පණාප්පත්තං, අර්පණාවට පැමිණියේයි. ආලම්බණභෙදෙන, කසිණු උගුළු අහසය ආකාශානඤ්චායතන කුශලචිත්තය එම චිත්තයාගේ නැතිභාව ප්‍රඥප්තිය ආකිඤ්චඤ්ඤායතන කුශල චිත්තය යන සතරාලම්බණයන්ගේ ප්‍රභෙදයෙන්; චතුබ්බිධං හොති, සතරවැදෑරුම් වේ. එතෙ, මේ සතරකර්මයන් අතුරෙන්; උද්ධච්චරහිතං, උද්ධච්චසම්ප්‍රයුක්ත චිත්තයෙහි යෙදුනාවූ චෙතනාව විසින් තොරකරණලද්දවූ; අකුසලකම්මං, එකොළොස් අකුශලකර්මතෙමේ; අපායභූමියං, සතර අපාය භූමියෙහි; පටිසන්ධිං ජනෙති, පිළිසිඳගන්වයි. පවත්තියං පන, ප්‍රථමභවාඞ්ගය පටන් චුතිය දක්වා මේ අතර ප්‍රවෘත්තිකාලයෙහි වනාහි; ද්වාදසවිධා, දොළොස් වැදෑරුම්වූ; සබ්බම්පි, සියලු අකුශලකර්ම තෙමේද; සත්තාකුසලවිපාකානි, සත්වැදෑරුම් අකුශල විපාකයෝ; සබ්බත්ථාපි, සර්වප්‍රකාරයෙනුදු; කාමලොකෙච, කාමභූමියෙහිද; රූපලොකෙච, රූපභූමියෙහිද; යථාරහං විපච්චති, සුදුසු පරිද්දෙන්; විපාක උපදවයි.

කාමාවචර කුසලම්පි, කාමාවචර කුශලකර්ම තෙමේද; කාමසුගතියමෙව, සප්තකාම සුගතිභූමියෙහිම; පටිසන්ධිං ජනෙති, පිළිසිඳගන්වයි. තථා, එපරිද්දෙන්; පවත්තියංච, ප්‍රවෘත්තිකාලයෙහිද; මහාවිපාකානි, මහාවිපාකයෝ අටදෙන; ජනෙති, දන්වයි. අට්ඨපි අහෙතුක විපාකානි පන, අෂ්ටප්‍රකාරවූද අහෙතුක විපාකයෝ වනාහි; සබ්බත්ථාපි, සර්වප්‍රකාරයෙනුදු; කාමලොකෙච, කාමභූමියෙහිද; රූපලොකෙච, රූපභූමියෙහිද; යථාරහං විපච්චති, සුදුසු පරිද්දෙන් විපාක උපදවයි.

තත්ථ, ඒ කාමාවචර කුශලකර්මයන් අතුරෙනුදු; තිහෙතුකමුක්කට්ඨං, ත්‍රිහෙතුක උත්කෘෂ්ටවූ; චතුබ්බිධං කුසලං, සතර වැදෑරුම්වූ කුශලකර්මතෙමේ; තිහෙතුකං ත්‍රිහෙතුකවූ; චතුබ්බිධං පටිසන්ධිං දත්වා, සතර වැදෑරුම් ප්‍රතිසන්ධීන්දී; පවත්තෙ, ප්‍රවෘත්තිකාලයෙහි; සොළස විපාකානි, සහෙතුක අටය, අහෙතුක අටය යන සොළොස් විපාකචිත්තයන්; විපච්චති, උපදවයි. තිහෙතුක ඕමකං, ත්‍රිහෙතුක ලාමකවූ; චතුබ්බිධං කුසලංච,

සතරවැදෑරුම්වූ කුශලකර්මයද; දුහෙතුක මුක්කඨං, දුහෙතුක උත්කෘෂ්ටවූ; චතුබ්බිධං, සතර වැදෑරුම්වූ; කුසලච, කුශල කර්ම තෙමේද; දුහෙතුකං, දුහෙතුකවූ; චතුබ්බිධං පටිසන්ධිං දත්වා, සතරවැදෑරුම් පිළිසිඳදී; පවත්තෙ, ප්‍රවෘත්තිකාලයෙහි; තිහෙතුක රහිතානි, ත්‍රිහෙතුක විපාක සතර තොරකොට ඇත්තාවූ; ද්වාදසවිපාකානි, දොළොස් වැදෑරුම් විපාක චිත්තයන්; විපච්චති, උපදවයි. විහෙතුකමොමකං, විහෙතුකලාමකවූ; (චතුබ්බිධං) කුසලං පන, සතරවැදෑරුම් කුසලකර්මය වනාහි; අහෙතුකමෙව පටිසන්ධි, අහෙතුකවූ ප්‍රතිසන්ධියක්ම; දෙති, දෙයි. පවත්තෙච, ප්‍රවෘත්තිකාලයෙහිද; අහෙතුකවිපාකානෙව, අහෙතුක කුශලවිපාකයන් අටදෙනම; විපච්චති, උපදවයි.

අසංඛාරං, අසංසකාරික කුශලකර්ම තෙමේ; සසංඛාරවිපාකානි, සසංසකාරිකවිපාකයන්; න විපච්චති, නූපදවයි. සසංඛාරං, සසංසකාරික කුශලකර්ම තෙමේ; අසංඛාරවිපාකානි, අසංසකාරික විපාක චිත්තයන්; න විපච්චතීයි, නූපදවන්නේයයි. කෙචිපන, ඇතැම් ආචාර්යවරයෝ තුමූ නොහොත් මහාවිහාරවාසී මහා ධම්මරක්ඛිත ස්ථවිරාදීවූ ස්වකීය පරම්පරායෙහි ආචාර්යවරයෝ තුමූ; "වදන්ති" යනු අධ්‍යාහාරයි. තෙසං තෙසං, ඒ ඒ ආචාරීන්ගේ වාදයෙහි; යථාවුත්තානුසාරෙන, යථොක්ත ක්‍රමානුසාරයෙන්; යථාක්කමං, පිළිවෙළින්; ද්වාදසපාකානි, දොළොස් විපාක සිත් කෙනෙකුන්ද; දසපාකානිච, දසවිපාක සිත් කෙනෙකුන්ද; අට්ඨපාකානිච, අටවිපාකසිත් කෙනෙකුන්ද; යථාසම්භවං, සම්භව වන පරිද්දෙන්; උද්දිසෙ, ප්‍රකාශකරන්නේයි.

පන, කාමාවචර කුශලයෙන් අන්‍යවූ රූපාවචර කුශලය කියම්:— නොහොත් ධර්මාධිෂ්ඨානයෙන් අන්‍යවූ පුද්ගලාධිෂ්ඨානය කියම්:— "යොගාවචරො" යන කර්තෘකාරකය අධ්‍යාහාරයි. රූපාවචරකුසලං, රූපාවචර කුශල කර්මයවූ; පරිත්තං, ස්වල්පානුභාව ඇත්තාවූ; පඨමජ්ඣානං භාවෙත්වා, ප්‍රථමධ්‍යානය වඩා; නොහොත් පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; පරිත්තං, ස්වල්පානුභාව ඇතිකොට; භාවෙත්වා, වඩා; බ්‍රහ්මපාරිසජ්ජෙසු, බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි; උපපජ්ජති, උපදනේයි මජ්ඣිමං, මධ්‍යමානුභාව ඇත්තාවූ; තථෙව, ඒ ප්‍රථමධ්‍යානයම; භාවෙත්වා, වඩා; විකල්පාර්ථය යටකී නයයි. බ්‍රහ්මපුරොහිතෙසු, බ්‍රහ්මපුරොහිත භූමියෙහි; උපපජ්ජති, උපදනේයි, පණීතං, උතුම් ආනුභාව ඇත්තාවූ; තථෙව, ඒ ප්‍රථමධ්‍යානයම; භාවෙත්වා, වඩා; මහාබ්‍රහ්මෙසු, මහාබ්‍රහ්ම භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

තථා, එපරිද්දෙන්; පරිත්තං, ස්වල්පානුභාව ඇත්තාවූ; දුතියජ්ඣානම, විතියධ්‍යානයද; තතියජ්ඣානම, තෘතීයධ්‍යානයද; භාවෙත්වා, වඩා; විකල්පාර්ථය සියලු තන්හි යටකී නයින් දතයුතුයි. පරිත්තාභෙසු, පරිත්තාභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. මජ්ඣිමං, මධ්‍යමානුභාව ඇත්තාවූ; විතීයධ්‍යානය හා තෘතීයධ්‍යානයද; භාවෙත්වා, වඩා; අප්පමාණාභෙසු, අප්පමාණාභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. පණීතං, උත්තමානුභාව ඇත්තාවූ විතීයධ්‍යානය හා තෘතීයධ්‍යානයද; භාවෙත්වා, වඩා; ආභස්සරෙසු, ආභාස්වරභූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

පරිත්තං, ස්වල්පානුභාව ඇත්තාවූ; චතුත්ථජ්ඣානං, චතුර්ථධ්‍යානය; භාවෙත්වා, වඩා; පරිත්තසුභෙසු, පරිත්තසුභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. මජ්ඣිමං, මධ්‍යමානුභාව ඇත්තාවූ; චතුර්ථධ්‍යානය; භාවෙත්වා, වඩා; අප්පමාණසුභෙසු, අප්පමාණසුභ භූමියෙහි; උපපජ්ජති, උපදනෙයි. පණීතං, උත්තමානුභාව ඇත්තාවූ චතුර්ථධ්‍යානය; භාවෙත්වා, වඩා; සුභකිණ්ණෙසු, සුභකිණ්ණ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

පඤ්චමජ්ඣානං, පඤ්චමධ්‍යානය; භාවෙත්වා, ත්‍රිවිධාකාරයෙන් වඩා; වෙහප්ඵලෙසු, වෙහප්ඵල භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. සඤ්ඤාවිරාගං, පහවූ සංඥා ඇත්තාවූ; තමෙව, ඒ පඤ්චමධ්‍යානයම; භාවෙත්වා, වඩා; නොහොත් තමෙව, ඒ පඤ්චමධ්‍යානයම; සඤ්ඤාවිරාගං, සංඥාවෙහි නො ඇලීම් වශයෙන්; භාවෙත්වා, වඩා; අසඤ්ඤසත්තෙසු, අසංඥසත්වභූමියෙහි; උපපජ්ජති, උපදනේයි. අනාගාමිනො පන, අනාගාමී පුද්ගලයෝම; මෙහි "පන" ශබ්දය එවකාරාර්ථයි. සුද්ධාවාසෙසු, පඤ්චසුද්ධාවාස භූමියෙහි; උපපජ්ජන්ති, උපදනාහු වෙත් අරූපාවචර කුසලම, අරූපාවචර කුශලකර්මයද; යථාක්කමං භාවෙත්වා, පිළිවෙළින් වඩා; අරූපෙසු, අරූප භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

ඉත්ථං මහග්ගතං පුඤ්ඤං, යථාභූමිවවත්ථිතං,
ජනෙති සදිසං පාකං, පටිසන්ධිප්පවත්තියං.

ඉත්ථං, (යථාවුත්තභෙදන) මේ යථොක්ත ප්‍රභෙදයෙන්; මහග්ගතං පුඤ්ඤං, මහද්ගත කුශලකර්ම තෙමේ; පටිසන්ධිපවත්තියං, ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයෙහි; යථාභූමිවවත්ථිතං, භූමි පරිද්දෙන් නියමකරණලද්දාවූ; සදිසංපාකං, කුශලයට සදෘශ විපාකචිත්තය; ජනෙති, උපදවයි. ඉදං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මෙහි; කම්මචතුක්කං, කර්මචතුෂ්කයයි.

## (භාවය.)

කර්ම චතුෂ්කයෙහි විභාග කෙසේයත් ? ප්‍රතිසන්ධි සංඛ්‍යාතවූ විපාක නාමස්කන්ධයෝය, ප්‍රතිසන්ධිය හා එකට පහළවන්නාවූ කර්මජරූප සංඛ්‍යාතවූ කටත්තාරූපයද යන මේ නාමරූපවය උපදවන්නාවූ කර්මතෙමේ ජනක කර්ම නම් වේ. ඒ ජනක කර්මය වනාහි ස්වල්ප විපාක දෙන්නාවූ කල්හි ඒ ජනකකර්මයාගේ විපාක මහත් බව පිණිස රුකුල් දෙන්නාවූ කර්මතෙමේ උපස්තම්භක කර්ම නම් වේ. ඒ ජනකකර්මයාගේ පරම්පරාවත් නොසිඳ ජනකකර්මයත් නොසිඳ ජනකකර්මයට හිංසා කරන්නාවූ කර්මතෙමේ උපපීඩක කර්ම නම් වේ. ඒ ජනක කර්ම විපාකය සිඳීම් වශයෙන් තමාගේ විපාකදීමට අවකාශ ගන්නාවූ කර්මතෙමේ උපඝාතක කර්ම නම් වේ.

මේ කර්මචතුෂ්කයට උපමා නම්:–යම් ගොවියකු විසින් ක්ෂේත්‍රයෙහි ධාන්‍යබීජරෝපණය කිරීමක්මෙන් ජනකකර්මයද, ඒ ශස්‍යයට උපකාර පිණිස දිය බැඳීම් පොහොර දැමීම් රැකවල්ලීම් නෙළීම් ආදියමෙන් උපස්තම්භක කර්මයද මෙසේ ශස්‍ය වර්ධනය වන කල්හි කුළුසායක් හටගෙණ ශස්‍යයන්ගේ ම්ලානිකවීමක් මෙන් උපපීඩක කර්මයද, ඊට අනතුරුව ලැව්ගින්නක් හටගෙණ ඒ ශස්‍යයන්ගේ විනාශය මෙන් උපච්ඡේදක කර්මයද; සැලකිය යුත්තේයි.

සවිඥාණක වස්තු උපමාවක් නම්:- දෙව්දත් තෙරණුවන්ගේ රජකුලයෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ගැණීම ජනක කුශලකර්ම නම් වේ. මෑතභාගයෙහි සස්නෙහි පැවිදිව අෂ්ටසමාපත්ති උපදවාගැන්ම කුශල උපස්තම්භක නම් වේ. ඊට පසුභාගයෙහි බුද්ධ රාජ්‍යය ගණිමැයි සිතා දුනුවායම් යැවීම් ගල්පෙරළීම් ආදි අකුශල ක්‍රියාවන්ගේ රැස්කිරීම උපපීඩක කර්ම නම් වේ. අන්තිම කාලයෙහි සංඝ භෙදකොට ඒ කර්මයෙන් ජනක කුශලකර්මය සිඳ එම් ආත්මයෙන්ම අවීචිමහානරකයට යාම උපච්ඡේදක නම් වේ. මෙසේ අවිඥාණක සවිඥාණක උපමාවන්ගේ වශයෙන් කර්මචතුෂ්කය අවබොධකටයුතුයි.

ජනක කර්මතෙමේ කුශල ජනකකර්මය අකුශල ජනක කර්මය යන දෙදෙනාගේ වශයෙන් විප්‍රකාර වේ. ඔවුන් අතුරෙන් කුශලජනක කර්මතෙමේ කුශල විපාකනාමස්කන්ධයන් හා කටත්තාරූප උපදවයි. අකුශලජනක කර්මතෙමේ අකුශල විපාකනාමස්කන්ධයන් හා කෘතත්තාරූප උපදවයි.

ඒ විප්‍රකාරවූ ජනක කර්මතෙමේ පටිසන්ධිවිපාක ප්‍රවෘත්ති විපාක යන උභය විපාකයන්ම දෙන්නේයි. ඔවුන් අතුරෙන් ප්‍රතිසන්ධි විපාක දීමට අනතුරුව යට කී පරිද්දෙන්ම ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ කල්හි යහපත් පස්කම්සැප අනුභව කිරීම් ආදිය නොහොත් සිතූ පැතූ සියලු භවභොග සම්පත් ලැබීම කුශල ජනක කර්මයාගේ විපාකදීමයයි දතයුතුයි. දුක්සහිතවූ ස්ථානයෙහි ප්‍රතිසන්ධියෙන් ප්‍රවෘත්තිකාලයෙහි සා පිපාසාදී නොයෙක් දුකින් පීඩිතවීම අකුශලජනක කර්මයාගේ සවභාවයයි දතයුතුයි.

උපස්තම්භක කර්මයද කුශල උපස්තම්භකය අකුශල උපස්තම්භකය යන දෙදෙනාගේ වශයෙන් විප්‍රකාර වෙයි. ඒ උපස්ථම්භක කර්මතෙමේ ප්‍රතිසන්ධියට අනතුරුවූ පළමුවෙනි භවාඞ්ගය පටන් චුති චිත්තය දක්වා මේ අතර කාලයෙහිමුත් ප්‍රතිසන්ධි කාලයෙහි විපාක නොදෙන්නේයි. එසේවූවත් කුසල උපස්තම්භක කර්මතෙමේ කුශලජනක කර්මයකටම රුකුල් දෙන්නේයි. ඒ කෙසේ දෙන්නේදයත්? කුශල ජනක කර්මයක්හු විසින් නාමස්කන්ධ විපාක කටත්තා රූපයන් උපදවන ලදුව ඒ ජනක කර්මයාගේ ශක්තියෙන් උපදවන ලද්දාවූ නාමස්කන්ධ කටත්තා රූපයන් වඞ්ගය කිරීමට නුපුළුවන් කල්හි අනිත් උපස්තම්භක කුශල කර්මයක් සරිලා ඒ විපාක නාමස්කන්ධයන් වඞ්ගයකිරීම පිණිසද මහත්වූ භවභොග සම්පත් දීම පිණිසද උපස්තම්භක කර්මය රුකුල් දෙන්නේයි. මෙසේ ජනක කුශල කර්මයට ජනක උපස්තම්භක කර්මය රුකුල්දෙන සැටි දතයුතුයි. ජනක අකුශල කර්මයට ජනක උපස්තම්භක අකුශලකර්මය රුකුල් දෙන සැටි කෙසේද යත්? අකුශල කර්මහේතුවෙන් ගවයෙක්ව ඉපිද ඒ ගවයා වැඩිවිය පැමිණි කල්හි බරගැල් ආදියෙහි යොදා කටුඇමිටි ආදියෙන් තලමින් විෂම මාර්ගයෙහි මහත්වූ සූර්‍ය්‍යතාපයෙහි ගමන් කරවීමට සුදුසුවූ උපස්තම්භක අකුශල කර්මයක් ලඟට පැමිණ විපාක දෙන්නේයි. එසේම අකුශල කර්මයෙන් පිරිව ගන්නාලද්දාවූ දුර්වල දුහෙතුක කාමාවචර කුශලකර්ම බලයෙන් මිනිසත්බව ලැබ නැවත සා පිපාසා දෙකින් නොමිඳීමට හෙතුවූ අකුශල කර්මයන් ලඟට පැමිණ විපාක දෙන්නේ වෙයි

උපපීලක කර්මයද කුසල උපපීලක කර්මය අකුශල උපපීලක කර්මයයි දෙවැදෑරුම් වේ. ඒ කර්මයෝ වනාහි ප්‍රවෘත්ති කාලයෙහිමුත් ප්‍රතිසන්ධිකාලයෙහි විපාක නොදෙති. එසේ නොදෙන්නේ

නමුදු උපපීඩක කුශල කර්‍මතෙමේ ජනක අකුශලකර්‍මයට හිංසා කෙරෙයි. උපපීඩක අකුශල කර්‍මතෙමේද ජනක කුශල කර්‍මයට හිංසා කෙරෙයි. අකුශල කර්‍මතෙමේ කුශල කර්‍මයට හිංසා කිරීම මෙසේයි. කුශලජනක කර්‍මය විපාක දෙන්නාවූ කල්හි නොහොත් මහත්වූ සම්පත්තීන් ආඪ්‍යවූ කුලයෙහි ඉපිද ඒ සම්පත් අනුභව නොකළ හැකිවන පිණිස රොගාතුරයෙක් හෝ උමතු මනුෂ්‍යයෙක් හෝ වෙයි. එසේවූ කල්හි ඒ සම්පත් අනුභව කිරීමට අවකාශ නොලැබෙන්නේයි. කුශල උපපීඩක කර්‍මතෙමේ අකුශලයට හිංසා කිරීම කෙසේයත්:— අකුශල ජනකකර්‍මයක් කාරණකොට ගෙණ හස්තියොනියෙහි අශ්වයොනියෙහි ගවයොනියෙහි උපන් කල්හි ඒ හස්ති අශ්ව ගවයන් රාජවාහනයට යෙදූ කල්හි අවශෙෂ මනුෂ්‍යයන්ට අධිකවූ මහත්වූ සැප ඔවුන්ට ලැබෙන්නේයි. එසේම දුඃඛිතවූ කුලයෙක ඉපිද සා පිපාසා දෙකින් පෙළෙන්නාවූ කල්හි එකවිටම ඔවුන්ගේ දුක් නසන්නාවූ කුශලකර්‍මයන් ලඟට පැමිණ අකුශල කර්‍මයන්ට හිංසාකිරීම මෙසේ දතයුතුයි. එක් කලෙක ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ ලොකවිවරණ නම් ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වා අවීචිමහානරකයෙහි වස් නිස නිවා මොහොතක් කල් ධර්‍මදෙශනා කෙළේයි. එකල්හි ඒ නරකයෙහි උපන්නාවූ සත්වයන්ගේ අකුශලකර්‍මයට හිංසා කොට කුශල කර්‍මය විපාක දීම් වශයෙන් යහපත්වූ ආයසී රූපය දැකීමද ධර්‍ම ශබ්දය ඇසීමද කුශල විපාක වශයෙන් සිඩවූ බව දතයුතුයි. උපඝාතක කර්‍මතෙමේද කුශල උපඝාතක කර්‍මය අකුශල උපඝාතක කර්‍මයයි දෙවැදෑරුම්වේ. ඒ දෙවැදෑරුම් උපඝාතක කර්‍මතෙමේ පටිසන්ධි විපාකය හා ප්‍රවෘත්ති විපාකයත් දෙන්නේයි. එතකුදුවුවත් කුශල උපඝාතක කර්‍මතෙමේ අකුශල ජනක කර්‍මයද කුශල ජනක කර්‍මයද යන විප්‍රකාරවූ කර්‍මයම නසා තමාගේ විපාකය දෙවන්නේයි. අකුශල උපඝාතක කර්‍මතෙමේද කුශලජනක කර්‍මය අකුශලජනක කර්‍මය යන මිප්‍රකාරවූ කර්‍මයම නසා තමාගේ විපාකය දෙවන්නේයි. කුශල කර්‍මය කුශලකර්‍මයෙන් නැසීම වනාහි මෙසේයි. දන් දුන්නාවූ කුශලකර්‍මයකින් ප්‍රතිසන්ධිය දෙමැයි ඉදිරියට පැමිණි කල්හි වස්ත්‍රදානමයවූ කුශලකර්‍මතෙමේ උපඝාතක කර්‍මව ආහාරදානමය සඞ්ඛ්‍යාතවූ ජනක කුශල කර්‍මය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාක දෙවන්නේයි. කුශල කර්‍මයෙන් අකුශල කර්‍මය නැසීම නම්—: ප්‍රාණඝාත අකුශල ජනක කර්‍මය ප්‍රතිසන්ධි දෙමැයි ඉදිරියට පැමිණි කල්හි

විහාරදත්ත සඞ්ඛ්‍යාතවූ කුශල උපඝාතක කර්මයක් ඉදිරියට පැමිණ ප්‍රාණඝාත අකුශලජනක කර්මය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේයි. අකුශලයෙන් අකුශලය නැසීම නම්:— ගොඝාතක අකුශල ජනක කර්මයක් ප්‍රතිසන්ධිය දෙමැයි ඉදිරියට පැමිණි කල්හි සුණඛඝාතන අකුශල උපඝාතක කර්මයක් අනිත් කර්මය සිඳ තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේයි. අකුශල කර්මයෙන් කුශලකර්මය නසන්නාවූ තන්හි උදක පූජා සඞ්ඛ්‍යාතවූ කුශල ජනක කර්මයක් ප්‍රසන්ධි විපාක දෙමැයි ඉදිරියට පැමිණි කල්හි කුක්කුටඝාතන අකුශල උපඝාතක කර්මයක් ඉදිරියට පැමිණ පූර්ව ජනක කර්මය සිඳ තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේයි. ප්‍රවෘත්තිකාලයෙහිද මේ ක්‍රමයෙන්ම දතයුතුයි. උපඝාතක කර්මයෙන් ජනක කර්මය නසන්නේයයි කියේ නමුදු දුර්වලවූ ජනක කර්මයක්ම බලවත්වූ උපඝාතක කර්මයක් විසින් නැසියයුතුවේ. බලවත්වූ ජනක කර්මයක් දුර්වලවූ උපඝාතක කර්මයක් විසින් නොනැසිය හැක්කේයි. ඒ සතර කර්මයන් අතුරෙන් ජනක කර්මය හා උපඝාතක කර්මතෙමේද කුශල විපාක ඇතිබව හා ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දීමද, සදෘශ හෙයින් ජනක කර්මය කියේවීනම් උපඝාතක කර්මය නොකිය යුත්තේයි. උපඝාතක කර්මය කියේවීනම් ජනක කර්මය නොකිය යුත්තේයි.

මෙසේ දක්විමට හෙතුව නම්:= කාරණයන්ගේ විරුඬ බවයයි දතයුතුයි. උපඝාතක කර්මතෙමේ ජනක කර්මශක්තිය සිඳ තමාගේ විපාකය දීමට පොහොසත් වෙයි. ඊට උපමාවක්නම්:= සෙනෙවිරත් තෙමේ සෙනෙවිරත් ධුරය දරන්නාවූ කල්හි කිසි මනුෂ්‍යයෙක් ඝාතනය නොකරයි. එතකුදු වුවත් ඝාතනය කිරීමට ආඥාව දෙයි. අනිත් මනුෂ්‍යයෙක් රාජ්‍යයට පැමිණි කල්හි ඒ සෙනෙවියා ඝාතනය කෙරෙයි. එසේ ඝාතනය කොට රාජ්‍යය ලබාගැණීමෙහිදී සෙනාපතියා මෙන් ජනක කර්මයද, ඒ සෙනෙවිරජහු ඝාතනය කරන්නාවූ පුරුෂයා මෙන් උපඝාතක කර්මයද, රජහු මරා රාජ්‍යය ගැණීමක් මෙන් පටිසන්ධි කටත්තාරූපයන් ඉපදවීමද, මෙසේ උපමා උපමෙය්‍ය සංසන්දනය කොට අර්ථ දතයුත්තේයි. මේ වනාහි අටුවාවෙහි ආ සමාන වාදයයි. ඇතැම් ආචාර්ය්‍යයෝ වනාහි උපඝාතක කර්මතෙමේ විපාක නොදිය හැක්කේය. ප්‍රතිසන්ධි කර්මය සිඳීම් මාත්‍රයක් කරන්නේය යන මේ අර්ථය යට කී උපමාවෙන් ස්ඵුට කරති. උපරිපණ්ණාස අටුවාවෙහි

එනාහි ජනක කර්මතෙමේ කුසල විපාක ඇත්තේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හිම විපාක දෙන්නේයි. උපස්තම්භක කර්මතෙමේ කුසල්ම වෙයි. අකුශල උපස්තම්භක කර්මයෙක් නම් නැත්තේය. ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්ම දෙන්නේය, උපපීඩක උපඝාතක කර්මතෙමේ කුසල් නම් නොවන්නේය. අකුශල්ම වන්නේය. උපපීඩක කර්මය එනාහි ප්‍රවෘත්ති වශයෙන්ම විපාක දෙයි. උපඝාතක කර්මය එනාහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති යන විපාක වය දෙන්නේයි. ඒ කර්මයෝ තුන්දෙන එනාහි කෘත්‍යය වශයෙන් හටගන්නාවූ විශෙෂ ඇත්තාහුයයි කියති. බරවූ කර්මතෙමේ ගරුකර්ම නම් වෙයි. මරණාසන්න කාලයෙහි කරණ ලද්දාවූ හෝ රැස්කරණ ලද්දාවූ කර්මතෙමේ ආසන්න කර්මය නම් වෙයි. විපාක දීම් මාත්‍රයක් ඇත්තාවූ ගරුක ආසන්න ආචිණ්ණ යන ත්‍රිවිධාකාරයට නොපැමිණියාවූ කර්මතෙමේ කටත්තා කර්ම නම් වෙයි. ඒ සතරාකාර කර්මයන් අතුරෙන් ගරුකර්ම තෙමේ කුශල ගරුකර්මය අකුශල ගරුකර්මයයි දෙආකාරවෙයි. ඔවුන් අතුරෙන් අකුශල ගරුකර්මය එනාහි මාතෘඝාතක පිතෘඝාතක අරහන්ත ඝාතක ලොහිතුප්පාදක සංඝභේද කර්මවශයෙන් පස් වැදෑරුම්වෙයි. මේ කර්ම පවකය මිනුෂ්‍යයෙකුටමුත් අමනුෂ්‍යයෙකුට නොකට හැක්කේයි. ඒ කර්ම පවසායම යම් මනුෂ්‍යයෙක් විසින් රැස් කෙළේ නම් කවර කර්මයක් විපාක දෙන්නේ දැයි ප්‍රශ්න කෙළේවීනම් සඞ්ඝභෙද කර්මයම විපාකදෙන්නේයි. අවශෙෂ කර්ම චතුෂ්කය අහොසිකර්ම වේයයි පිළිතුරු දියයුතුයි. සඞ්ඝභෙදකර්මය හැර අවශෙෂ කර්මචතුෂ්කය කෙළේවීනම් ලොහිතුප්පාදක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මත්‍රය අහොසිකර්ම වෙයි, ලොහිතුප්පාදක කර්මය හැර අවශෙෂ කර්මත්‍රය රැස් කෙළේවී නම් අරහන්තඝාතක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මවය අහොසි කර්ම නම් වෙයි. අරහන්ත ඝාතකය හැර අවශෙෂ කර්මවය රැස්කෙළේවීනම් පියා සුසීලවන්තයෙක්වීනම් මව දුශ්ශීලවීනම් පිතෘඝාතක කර්මය විපාක දෙයි, මාතෘඝාතක කර්මය අහොසි කර්මවෙයි. මව්පිය දෙදෙනම දුශ්ශීල වෙත් නම් මාතෘඝාතක කර්මය විපාකදෙයි. පිතෘඝාතක කර්මය අහොසි කර්ම වෙයි මාතෘ පිතෘ දෙදෙනම සිල්වත් වී නම් එකල්හිද මාතෘඝාතක කර්මය විපාක දෙයි. පිතෘඝාතකකර්මය අහොසි කර්මවෙයි. මව ශීලවන්තියෙක්ව පියාදුශ්ශීලයෙක්වී නම් මාතෘඝාතක කර්මයම විපාකදෙන්නේ කුමක් හෙයින්ද යත්? මාතෘ පිතෘ දෙදෙනා අතුරෙන් මව ගුණ මහත්තාබැවය

ඇතිහෙයිනැයි දතයුතුයි. අහෝසිකර්මය යනු විතීයාදී ආත්ම භාවයන්හි විපාක නොදෙන කර්මයවේ. ඒ පඤ්චානන්තරිය කර්මයම රැස්කළාවූ පුද්ගල තෙමේ ඒ කර්මය කළාවූ ආත්මභාවයට අනතුරු අත්බැව්හි එකාන්තයෙන් අපායොත්පත්තිය ලබයි. එහෙයින් ආනන්තරිය කර්මයයි ව්‍යවහාර කෙරෙති. ඒ ආනන්තරිය කර්මය කළාවූ සත්වතෙමේ ඔසුපත් සහිතවූ අටමහානරකයන් අතුරෙන් යම්කිසි නරකයක ඉපදීම නියතනුමුත් අවීචි මහා නරකයෙහිම උපදින්නේයයි කියා හෝ එක්කල්පයක් දුක්විඳින්නේයයි කියා හෝ නියත බවෙක් නොවදාළේයි. කල්පයක්හුගේ මධ්‍යයෙහි ආනන්තරිය කර්මයක් කෙළේවීනම් අර්ධකල්පයක්ම දුක්විඳ කර්මය ගෙවීයන්නේයි. කල්පවිනාශයට දසදවසක් මත්තෙහි ආනන්තරිය කර්මයක් කෙළේවීනම් දස දවසක්ම අපාය දුක්විඳ කර්මය ගෙවීයන්නේයි. කල්පවිනාශයට දෙතුන්දිනක් තබා ආනන්තරිය කර්මයක් කෙළේවීනම් ඒ පුද්ගලතෙමේ නොමළහොත් අපාය දුකින් මිදෙන්නේ නැයි. කුමක්හෙයින්දයත්? අපායෙහි දවසක් හෝ දෙකක් හෝ දුක් විඳිමෙක් නැත්තේයි. එසේම ඒ ආත්මයෙන් චුතවූ දෙවෙනි ආත්මයෙහි ආනන්තරිය කර්ම සඞ්ඛ්‍යාතවූ සත්වෙනි ජවන චේතනා කර්මය අහෝසි කර්මය වන බැවින්ද නැවත අපාය දුක්විඳීමෙක් නැත්තේයි. ආනන්තරිය කර්මයන් රැස්කරන්නාවූ සමයෙහි උපදනා සත්වෙනි ජවන චේතනා කර්මය මෙසේ අහෝසි කර්ම වන නමුත් ඒ අභිසාධක ජවන වීථියෙහි දෙවන තුන්වන සතරවන පස්වන සවන ජවන චේතනාවන් අපරාපරිය වේද්‍ය වශයෙන් විපාක දියහැකි බැවින් මුගලන් මහ තෙරුන් වහන්සේ සංසාරයෙහි කළාවූ මාතෘඝාතක පිතෘඝාතක කර්මයන්ගේ දෙවෙනි චේතනාව ආදීවූ අපරාපරිය වේද්‍ය අකුශල කර්මයක් හෙතුකොට ගණ රහත්වූ අත්බැව්හි පල්හොරු පන්සියයක් විසින් තලා මරු දැමීමෙන් පිරිනිවන් පෑයේයි. ඒ පඤ්චානන්තරිය කළාවූ යම්කිසි පුද්ගලයෙක් තෙමේ ඒ කර්මය වලක්වන අදහසින් මහාමේරු පර්වතය ප්‍රමාණවූ චෛත්‍යයක් කොට මේ චක්‍රවාළ ගර්භය ප්‍රමාණවූ මණ්ඩපයක් තනා ඒ චෛත්‍යය නවරත්නයෙන් සරසා චක්‍රවාළ ප්‍රමාණවූ මහා මණ්ඩපයෙහි බුද්ධප්‍රමුඛවූ මහරහතුන් වහන්සේලා උරයෙන් උරය ගැටෙනසේ වඩා හිඳුවා අෂ්ටපරිෂ්කාරකල්ප වෘක්ෂ සහිතවූ අනෙකප්‍රකාර පුද පූජා සහිතවූ කොසොල් මහ රජ්ජුරුවන් විසින් දෙන ලද්දාවූ අසදෘශ මහා දන් වැනිවූ දන් දුන්නේ නමුදු අනතුරු අත්බැව්හි අපායොත්පත්තිය

එකාන්තයෙන් නොවැළැක්විය හැකිවේමැයි. ඒට උදාහරණ නම් :- අජාසත් මහ රජතෙමේ පිතෘඝාතක කර්මය කොට ලොහිතුප්පාදක සඞ්ඝභෙදක කර්මයන්ට දායකව ඒට මෑත භාගයෙහි සාමඤ්ඤඵල සූත්‍රාන්ත ධර්මදේශනාව අසා තමා කළාවූ පව්ගැණ පශ්චාත්තාපවී බුදුන් සමාකරවාගෙණ මේ ශාසනයෙහි අචලශ්‍රද්ධාවන්ත උපාසකයන් කෙරෙන් අග්‍රයයි එතදග්‍රස්ථානයෙහි තබනු ලැබ මෑතභාගයෙහි බුදුන්ගේ පිරිනිවීමෙන් පසු ප්‍රථම මහා සඞ්ගායනාව පිණිස සප්තපර්ණි ගුහාවාරයෙහි කෙලෙසගණන් වසතු විසදූ සඞ්ගායනා ධර්මමණ්ඩපය කරවා තුන්මසක් මුළුල්ලෙහි මහා කාශ්‍යපාදී පන්සියයක් මහරහතුන්ට මහදන් දී පන්දහසක් හව්රුදු මේ ශාසනය නිර්මලසේ පවත්නා පිණිස උපස්ථම්භකවූයේ නමුදු සැටදහසක් අව්රුද්දට ආයු ඇත්තාවූ ලෝහකුම්භී නරකයෙහි ඉපිද අද දක්වා දුක් විඳින්නේයයි දතයුතුයි. එහෙයින් ආනන්තරිය කර්මය කළාවූ සත්වතෙමේ කෙතෙක් පින් රැස්කෙළේ නමුදු අපායොත්පත්තියෙන් නොවැළැක්වියහැක්කේයයි දතයුතුයි. එසේම නාස්තික දෘෂ්ටිය අහේතුක අක්‍රිය දෘෂ්ටිය යන නියත මිථ්‍යාදෘෂ්ටීන් තුන්දෙන ගත්තාවූ පුද්ගලතෙමේ මරණයට අනතුරු අත්බැව්හි එකාන්තයෙන් අවීචි මහා නරකයෙහි උපදනේයි. කල්පවිනාශ කාලයෙහි ආකාශයෙහි ගින්නක් මැවී ඒ මිථ්‍යාදෘෂ්ටික සත්වයා ඒ ගින්නෙහි පැසෙන්නේයයි සමහර ආචාර්‍ය්‍යවරයෝ කියති. ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ වනාහි එකවිට නස්නා කෙළලක්ෂයක් ලොකධාතූන්ගෙන් පිටත්හි අනික් අවීචිනිරයෙක්හි පැසෙන්නේයයි කියති. පඤ්චානන්තරිය කර්මයන් හා ත්‍රිවිධ නියත මිථ්‍යාදෘෂ්ටීන්ගේද වෙනස නම්—: පඤ්චානන්තරිය කර්ම කළාවූ පුද්ගලතෙමේ අනතුරු අත්බැව්හි අනියතවූ යම්කිසි නරකයෙක්හි ඉපිද කල්ප විනාශ සීමාවෙන් මිදෙන්නේයි. ත්‍රිවිධ නියත මිථ්‍යාදෘෂ්ටිගත් පුද්ගලතෙමේ මරණින් මතු එකාන්තයෙන් අවීචි මහා නරකයෙහිම ඉපිද කල්පවිනාශ කාලයෙහි නොනස්නා අපායකට පැමිණ මෙසේ ගණන පථාතික්‍රාන්ත කාලයක් මුළුල්ලෙහි දුක් විඳින්නේයයි දතයුතුයි. එහෙයින් සියලු අකුශල කර්මයන් අතුරෙන් ගරුකර්මය නියත මිථ්‍යාදෘෂ්ටි කර්මය බවද, දෙවෙනි ගරුක කර්මය පඤ්චානන්තරි කර්මය බවද දතයුත්තේයි. මොවුන් අතුරෙන් නියත මිථ්‍යාදෘෂ්ටි කර්මය යනු සෞමනස්සසහගතවූ හෝ උපෙක්ෂාසහගතවූ හෝ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත වීථියක් ඉපිද කුශලාකුශල කර්මයෙහි විපාක

නැත යනාදිවූ දශවස්තුව හෝ දුඃඛවශයෙන් ගණීද මේලොකය හා සත්ත්වයෝ අහෙතුකව හටගන්නේයයි දුඃඛවශයෙන් ගණීද කුශල කර්මයෙහි ඉෂ්ටවිපාකය හෝ අකුශල කර්මයෙහි අනිෂ්ට විපාකය හෝ නැතැයි දුඃඛවශයෙන් ගණීද එකල්හි උපදනා අකුශල චිත්ත විථියෙහි සත්වන ජවනචෙතනා තොමෝ තික මාතෘකායෙහි මිච්ඡත්තත්‍රිකයෙහි වදළාවූ මිථ්‍යාදෘෂ්ටි කර්මයයි දතයුතුයි. පඤ්චානන්තරිය කර්මය යනු දෞර්මනස්සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අකුශල චිත්තවීථියක් ඉපිද මව් මැරීම්ආදී අර්ථ සිද්ධිය කෙළේවීනම් ඒ චිත්තවීථියෙහි සත්වන ජවනචෙතනාව ආනන්තරිය කර්මයයි දතයුතුයි. මේ පිප්‍රකාරවූ ගරුකර්මයම රැස්කළාවූ සත්ත්වතෙමේ අනතුරු අත්බැව්හි ඒකාන්තයෙන් අපායොත්පත්තිය ලබයි. කුශලපක්ෂයෙහි ගරුකර්මය නම්:—නව මහග්ගත කුශලයෝයි. අකුශලපක්ෂයෙහි ගරුකර්මයෝ නම්:—නියත මිථ්‍යාදෘෂ්ටිතුණ හා පඤ්චානන්තරිය කර්මයද යන අඨමිච්ඡත්තනයයිදතයුතුයි ලොකොත්තර කුශලතෙමේ කුමක්හෙයින්ගරුකර්ම වශයෙන් නොගත්තේදයත්? මෙහිකී කුශලාකුශල කර්මයෝතුමූ ඒකාන්තයෙන් ප්‍රතිසන්ධි විපාකදෙන්නාවූ කුශලාකුශලයෝම වෙති. ලොකොත්තර කුශලය වනාහි ප්‍රතිසන්ධි විපාක නොදියහැකි බැවින් ගරුකර්මස්ථානයෙහි නොගන්නා ලද්දේයි. ප්‍රථමධ්‍යානලාභීවූ යොගාවචරතෙමේ ඒ දහැතින් නොපිරිහී කාලක්‍රියා කෙළේවීනම් ඒකාන්තයෙන් ප්‍රථමධ්‍යාන භූමියෙහි උපදනේයි. එහෙයින් ගරුකර්මයයි කියති. ප්‍රථම ධ්‍යානය පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය දක්වා ධ්‍යාන උපදවාගත් යොගාවචරයෙක්තෙමේ මරණින් මතු අසවල් නැත උපදිම්වායි භූමි නියමයක් නොකොට කළුරිය කෙළේවීනම් • නෙවසඤ්ඤානාසඤ්ඤායතනතලයෙහි උපදනේයි. අනිත් ධ්‍යානලාභියෙක්තෙමේ නවවිධවූ මහද්ගත ධ්‍යානයම උපදවා මරණාසන්නකාලයෙහි යම් භූමියක නිකාන්තිය පිහිටුවා කාලක්‍රියා කෙළේවීනම් ඒ භූමියෙහිම උපදනේයි. අනිත් ධ්‍යානලාභී යොගාවචරයෙක් තෙමේ නවමහද්ගත ධ්‍යානයම උපදවා ඉදින් බ්‍රහමලොකයෙහි ඉපදීමෙන් කම්නැත කාමස්වර්ගයෙහි උපදීම්වායි නිකාන්තීය පිහිටුවා කාලක්‍රියා කෙළේවීනම් ඒ ධ්‍යානවීථින්ගේ පරිකර්මාදි කාමාවචර කුශල කර්ම බලයෙන් සපතකාමස්වර්ගයෙහි මහෙශාක්‍ය දිව්‍යරාජයෙක්ව උපදනේයි.

### මේ ගරුකර්ම විභාගයයි.

ආසන්න කර්මයාගේ විභාගය මෙතැන් පටන් දක්වනු ලැබේ:— ආසන්නකර්මය වනාහි කුශලාසන්නකර්මය අකුශලාසන්නකර්මයයි දෙවැදෑරුම් වේ. කුශලාසන්නකර්මය වනාහි පසු පසුව කළාවූ කුශලකර්මයද, මරණාසන්න කාලයෙහි කළාවූ කුශල කර්මයද, පූර්වයෙහි කරණලදුව මරණාසන්නකාලයෙහි සිහිපත්කළාවූ කර්මයද, ආසන්න කුශලකර්මනම්වේ. ඒ කුශල කර්මය ප්‍රතිසන්ධි විපාකයදෙන්නේයි. ඊට සාධකනම්:—දුටුගැමුණුමහරජ තෙමේ චූලංගණිය යුද්ධයෙන් පැරද චුල්ලුපඨාකනම් තිස්සඇමතියා සමග වලටවැද අතිශය බඩසයින් පෙළෙනකල්හි එම්බා චුල්ලුපඨාකය! කෑ යුත්තක් ඇත්තේදැයි විචාළේය. ස්වාමීනි! මට ආහාර පිණිස ගෙණ එනලද්දාවූ එකම බත්තලියක් ඇත එය අනුභවකරනසේක්වායි කියා ඉදිරියෙහි තැබුයේයි. එකල්හි රජතෙමේ එසේවීනම් ඒ බත්තලිය සතරකොටසකට බෙද වයි නියොගකෙළේයි. චුල්ලුපඨාක තෙමේ ස්වාමීනි! නුඹවහන්සේ හා මමද අස්වෙළඹද යන තුන්දෙනෙක් පමණක් ඇත්තේය. සතරවෙනි කොටස කවරක්හු පිණිසදැයි විචාළේයි. එම්බල චුල්ලුපඨාකය! මාගේ ආත්මය සිකිකරන්නට දැනගත් තැන් පටන් අද දවස දක්වා කිසිකලෙකත් දන්නොදී නොකෑවිරූම්හ. එහෙයින් ආර්‍ය්‍යයන් උදෙසා සතරවැනි කොටසයයි කීයේය. ඉක්බිති චුල්ලුපඨාක තෙමේ ස්වාමීනි! ඉතාකල් ආසන්නවිය. මේ වනමධ්‍යයෙහි කොයින් ආර්‍ය්‍යයන් ලබමුදැයි විචාළේයි. එම්බල! මට ශ්‍රද්ධාව තිබේනම් ආර්‍ය්‍යයන් දුර්ලභ නොවෙයි. වහා බෙදවයි නියොගකෙළේයි. චුල්ලුපඨාක තෙමේද එසේම කෙළේයි. * රජතෙමේ හුනස්නෙන් නැගිට අහසදෙස බලා ස්වාමීනි ආර්‍ය්‍යයෝ ඇත්නම් දන් මේ අනතුරුයට පැමිණියාවූ ගැත්තහුගේ දානය පිළිගැණීමට වඩනාසේක්වයි කාලඝොෂාකෙළේයි. එකල්හි පුවඟු දිවයින දෙළොස් දහසක් භික්ෂූන් හා සමග දන් වැළඳීමට වැඩහුන්නාවූ පිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන්වහන්සේ කාලඝොෂා ශබ්දය අසා අනාගතයෙහි බුදුසසුන් වඩන්නාවූ රජහුගේ ශ්‍රද්ධාව පිරිහී ගියේවීනම් නපුරැයි සිතා ඒ භික්ෂූන්ට එසේම වැඩහිඳුවයි කියා පාසිවුරුගෙණ ඇසිල්ලකින්

* රාජා කාලං ඝොසෙහීති ආහ. ජඩ්ඪිතාරඤ්ඤෙ කුතො අය්‍යෙ ලභිස්සාම දෙවාති, නායං තව භාරො, සචෙ මම සද්ධා අත්ථි අය්‍යෙ ලභිස්සාම, විස්සත්ථො කාලං ඝොසෙහීති ආහ. සො කාලො හන්තෙති තික්ඛත්තුං ඝොසෙසි. අථස්ස බොධිමාතු මගාතිස්සත්ථෙරො තං සද්දං දිබ්බාය සොත ධාතුයා සුත්වා-පෙ-අජ්ජ මයා රඤ්ඤො සංගහං කාතුං වට්ටතීති මනොගතියා ආගන්ත්වා රඤ්ඤො පුරතො අඨාසි, අංගුත්තරනිකායට්ඨකථා.

අහසින් අවුත් රජහුගේ ඉදිරියේ වැඩසිටිකල්හි එම්බා චුල්ලපණ්ඩාකය! මාගේ ශ්‍රද්ධාමහිමය බලවයි කියා ශ්‍රද්ධාව දිගුණව රජහුගේ කොටසත් සමග පිණ්ඩපාතයට තිබූ කොටස පිදූයේයි. චුල්ලපණ්ඩාකයාද තමාගේ කොටසත් පිදූයේයි. අස්වෙළඹගේ කොටසද පුදුනු කැමැත්ත හැඟවූයේයි. ඉක්බිති ඒ කොටසත් පිදූයේයි. තෙරුන්වහන්සේ වහාම අහසින් ගොස් රජහුගේ කුශලය මහත්වේවයි සිතා දොළොස් දහසක් භික්ෂූන්ට බත් සරලූ ගණතින් දන්දී වළඳා අනන්තරයෙහි දුටුගැමුණු මහරජ තෙමේ ක්ෂුධාවෙන් පීඩිත බැව් දැනගෙණ තෙරුන්වහන්සේගේ පාත්‍රය සොධා ප්‍රණීතාහාරයෙන් පුරවා අහසට දමූයේයි. පාත්‍රය අවුත් රජහුගේ අතැ පිහිටියේයි. ඉක්බිති රජහුද චුල්ලපණ්ඩාකයාද අස්වෙළඹද යන තුන්දෙන බඩපුරා බත් කා තෙරුන්වහන්සේගේ පාත්‍රය දෙවා හිස් පාත්‍රය යැවීම් නුසුදුසුයයි සිතා රජහුගේ ශරීරයෙහි තුබූ ලක්ෂයක් අගනා කසීසළුව පාත්‍රයෙහි බහා අහසට දමූකල්හි තෙරුන්වහන්සේගේ අතැ පිහිටියේයි. ඉක්බිති රජතෙමේ යුද්ධයෙන් ජයගෙණ අනුරාධපුරයට පැමිණ ථූපාරාමපරිසංඛරණය ලොහප්‍රාසාදය රුවන්වැලිසෑය යනාදීවූ මහපින්කම්කොට මරණමංචකයට පැමිණිකල්හි තමාගේ පුණ්‍යකර්මයන් සටහන්කරණලද්දාවූ පින් පොත කියවන්නට පටන් ගෙණ රුවන්වැලිසෑය ආදීවූ මහාපුණ්‍යකර්මයන් කියවන්නාවූ කල්හිද විශෙෂ ප්‍රීතියක් නූපන්නේය. චූලංගණිය යුද්ධයෙන් පැරද වනයෙහි සැඟවීසිටගෙණ දුන් බත් පාත්‍රය ගැන කියවන කල්හි අහෝ! මා විසින් මෙබඳු සම්බාධ ස්ථානයෙහි සිටගෙණ දෙනලද්දාවූ පිණ්ඩපාතදානය අතිශයින් ආශ්චර්යයයි මහත් ප්‍රීති සොම්නස් උපන්කල්හිම එදවස් දන්පිළිගන්නාලද පිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන්වහන්සේ පාත්‍රය අතින්ගෙණ වැඩසිටියාක්මෙන් සවප්නයක් දකින්නාක්මෙන් කර්මනිමිති වැටහින. ඉක්බිති ඒ කර්මනිමිත්ත අරභයා මරණාසන්න ජවන වීථිය ඉපිද ඒ චිත්ත වීථි අවසානයෙහි නිදා පිබිදි එකෙකුමෙන් කළුරිය කොට තුසිපුරයෙන් ඉගණා දිව්‍ය රථයෙහි සොළොස් හැවිරිදි වයස් ප්‍රමාණවූ රාජකුමාර වෙශයකින් ඖපපාතිකව ඉපිද ගැල් සැටක් පුරලන්නාවූ දිව්‍යාභරණයෙන් සැරසී දිව්‍යප්සරාවන් පිරිවරාගෙණ දිව්‍ය රථයෙන් බැස රුවන්වැලිසෑය පැදකුණු කොට නැවතත් රථයට නැගී තුසිපුරය බලාගියේයි. මෙසේ පූර්වයෙහි කරණලද්දාවූ කුශල කර්මයද මරණයට ආසන්නවූ කල්හී සෙසු බලවත් කුශල කර්මවතුරු තමාගේ විපාකයට අවකාශගන්නේයි. මනොරථපූරණීයෙහි සබ්බහුලකර්මයයි කියන

ලදී. තවද රජගහනුවරවැසි තම්බදාඨිකනම් චෞරඝාතක තෙමේ දිවිහිමියෙන් මනුෂ්‍ය ඝාතනයකොට මරණයට ආසන්න කාලයෙහි ආයුෂ්මත් සැරියුත් මහතෙරුන්වහන්සේ මඟදී සරිලා ගෙට වැඩම්වාගෙණවුත් වඩා හිඳුවා තමා පිණිස පිසූ කිරිබත දන්දී උන්වහන්සේගෙන් ධර්මකථාව අසා නොබෝ කලකින්ම කාලක්‍රියාකොට ඒ මනුෂ්‍ය ඝාතක අකුශල කර්මය මුවහකොට දන්දී බණ ඇසූ කුශල කර්මය ආසන්නයට පැමිණ සුගති පටිසන්ධිය දුන්නේයි. ආසන්න අකුසල කර්මයට උදාහරණ නම්:- චාචකාල උපාසක වස්තුව දතයුතුයි.

## ආසන්න කර්ම විභාගයයි.

---

"ආචීර්ණ කර්මය" යනු නිරන්තරයෙන් කරණලද්දාවූ වැදි කෙවුල් ආදී කර්මාන්තය හෝ එක් වරක්මකරණලද්දාවූ යම්කිසි කුශල කර්මයක් හෝ අකුශල කර්මයක් හෝ නිරන්තරයෙන් සිහිපත්කරන්නේපිනම් ඒ කර්මයද ආචීර්ණ කර්මනම්වේ. ඊට උදාහරණවශයෙන් දෙව්රම්වෙහෙර පිටිපස සිටියාවූ චුන්ද සූකරයාගේ කථාවස්තුව දතයුතුයි.

## මේ ආචීර්ණ කර්ම විභාගයයි.

---

"කටත්තා කර්මය" යනු එක්වරක්කොට සිහියෙන් තුරන්වූ කර්මයයි. එබඳු කර්මයද ගරුකාදී කර්ම නැත්තේවිනම් ආසෙවන ප්‍රත්‍යය ලැබ පටිසන්ධි විපාකදෙන්නේයි. එක් වරක් කොට සිහියෙන් තුරන්වූ යම්කිසි කර්මයක් ආසෙවන ප්‍රත්‍යය නොලැබුයේනම් ප්‍රතිසන්ධි විපාක නොදෙන්නේයි. සවල්පවූ කුශලකර්මයකුදුකොට නැවත නැවත සිහිපත්කරන්නේවිනම් ඒ සිහිපත්කිරීම ආසෙවන ප්‍රත්‍යය නම්වේ. එසේ බලලැබීමෙන් පටිසන්ධි විපාකදීමෙහි පොහොසත්වෙයි. විපාකදෙන කල්හී පළමුකොට ගරුකර්මයක් නැතිකල්හී ආසන්න කර්මය පටිසන්ධි විපාකදෙයි. ගරුකර්මය ආසන්නකර්මය යන දෙක නැති කල්හී ආචීර්ණක කර්මයද ප්‍රතිසන්ධි විපාකදෙයි. ගරුකර්ම ආසන්න කර්ම ආචීර්ණකර්ම තුණ නැතිකල්හී කටත්තාකර්මය ආසෙවන ප්‍රත්‍යය ලාභයෙන් පටිසන්ධි විපාකදෙයි. මේ වනාහි අනුරුද්ධාචාරීන්ගේ අභිප්‍රායයි. අභිධර්මාවතාර ටීකායෙහි වනාහි ආචීර්ණ කර්මය බලවත්වෙයි. ආසන්න කර්මය දුර්වලවෙයි. ඊට උපමා නම්:—

ගව ගාලෙක්හි සයනයකරන්නාවූ ගවයන් අතුරෙන් ජරපත්වූ ගවයෙක් තමුදු ගාල් දොරටුවෙහි සයනයකෙළේවීනම් පසු භාගයෙහි සයනයකරන්නාවූ බලවත් ගවයන්ට පළමුකොට ගාල් දොර සයනයකළාවූ දුර්වල ගව තෙමේ නික්මෙන්නාක් මෙන් බලවත්වූ ආචීර්ණ කර්මයක් ඇත්තේ තමුදු දුර්වලවූ ආසන්න කර්මය මරණයට ලංවීනම් පළමුකොට විපාකදෙන්නේ යයි දක්වයි. මේ උපමාවෙහි බලවත්වූ ගවයන්ට ආචීර්ණකර්ම යද ජරපත්වූ ගවයන්ට ආසන්න කර්මයද උපමා උපමේය වශයෙන් සම්බන්ධකටයුතුයි. ඉහාත්මයෙහි කර්මයකළාවූ ස්කන්ධ යන්ටම විපාකදෙන කර්ම තෙමේ දිට්ඨධම්මවේදනීය කර්මනම්වේ. අනතුරු අත් බැව්හි ප්‍රතිසන්ධිවිපාකදෙන කර්මතෙමේ උපපජ්ජ වේදනීය කර්මනම්වේ. තුන්වන අත් බැව පටන් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන්පිරිනිවන් පෑම දක්වා මේ අතරෙහි අවකාශ ලත්විටක විපාකදෙන කර්ම තෙමේ අපරාපරිය වේදනීය කර්ම නම් වේ. විපාක නොදෙනලද්දවූද මතුවිපාක නොදෙන්නාවූද කර්මතෙමේ අහෝසි කර්මනම්වේ. ඒ සතරාකාරකර්මයන් අතුරෙන් ප්‍රවෘර්තිකාලයෙහි සත්වරක් ජවන්වශයෙන් පවතිනනාවූ කුශලා කුශල ජවන චිත්තයන්ගේ හෙවත් කුශලාකුශල ජවනචිත්ත යෙහි යෙදුනාවූ චෛතසිකයන් අතුරෙන් චේතනා චෛත සිකය කර්මයයි ව්‍යවහාරකෙරෙයි. ප්‍රථම ජවනයෙහි යෙදුනාවූ චේතනා කර්ම තෙමේ ඉහාත්මභාවයෙහි නිධිකුම්හි රත්පවීනා දිය පහළවීම් වශයෙන් විපාක දිය හැකිව කර්ම තෙමේ දිට්ඨධම්ම වේදනීය කර්මනම්වෙයි. ඒ කර්මය කුශලාකුශල කර්මවශයෙන් දෙ වැදෑරුම්වෙයි. ඒ විප්‍රකාරවූ කර්මයන් අතුරෙන් දිට්ඨධම්ම වේද නීය කුශලකර්මය අතිශයින් මහත්වූ විපාකදීමෙහි ශක්ති ඇත් තාවූ කර්මයක්වීමට සතර කාරණයකින් සම්පූර්ණවියයුතුයි. ඒ සතර කාරණයෝ නම්:—

ධ්‍යානාභිඥාබලයෙන් සම්පූර්ණවූ බුදු පසේබුදු මහරහත් කෙනෙකුන්ගේ ලැබීමය, ධාර්මිකවූ දනවස්තුවක් ලැබීමය, ප්‍රතිග්‍රාහක තෙමේ එදවස්හී නිරෝධයෙන් නැගිටිනබවය, දායක තෙමේද පූර්වචේතනා මුඤ්චනචේතනා අපරචේතනාවන් ගෙන් සම්පූර්ණවූ ශ්‍රද්ධාවීර්‍ය්‍ය ප්‍රඥාවන්ගෙන් යුක්තවනබවය යනමේ සතරාඞ්ගයෙන් යුක්තවනකල්හි දෘෂ්ට ධර්ම වේදනීය කර්මය එදවස්හිම සිටු සේසත්ලැබීම් ආදියට උපකාරවන්නේයි. දිට්ඨධම්මවේදනීය කර්මය ආසේවන ප්‍රත්‍යය නොලැබීමෙන් දුර්වලවූහෙයින් ප්‍රතිසන්ධි විපාක නොදිය හැක්කේය එසේ හෙයින් එම කර්මයකළාවූ ස්කන්ධපචකයටම සහේතුක කුශලා

කුශලවිපාක මාත්‍රයක් දියහැකිවෙයි. ඉහාත්මයෙහි සිටු සේසත් ආදිය ලැබීම වනාහි ත්‍රිහෙතුක කුශලයන්ගේ සහෙතුක මහා විපාකයමවෙයි. සිටු සේසත් ආදිය ලැබීමෙහි අපරාපරිය වෙද නීය කර්මය මහත් යශෛශ්වර්ය්‍ය සංඛ්‍යාතවූ විපාක ආනිශංස කෙසේදෙන්නේද යත්? එබඳු දිඪධම්මවේදනීය කර්මය විසින් බලවත්වූ අපරාපරිය වෙදනීය කර්මයකට රුකුල්දීමෙන් සසර තුන්වැනි අත්බැව් ආදියෙහි මහත්වූ ඓශ්වර්‍ය්‍යය ලැබෙන්නේයි. එතකුදුවුවත් දිඪධම්මවේදනීය කර්මයෙන් තො රව ඒ මහානුභාව සම්පන්නවූ අපරාපරිය වෙදනීය කර්මයන්ට විපාක නොදියහැක්කේයි. ඊට උපමා නම්:— දර, තෘණ, පරඬලා ආදී වස්තුවය, ගිනිපුපුරුය, යන මේ ද්‍රව්‍යයන් සොයා බහාලන් නාවූ පුරුෂයාය, ගිනි පිඹින්නාවූ පුරුෂයාය, යන මේ දෙදෙනා හට සමානවෙත්. ගිනි පුපුරු දර ආදිය සොයා පරීක්ෂාකොට බහාලන්නාවූ පුරුෂයාමෙන් දිඪධම්මවේදනීයකර්මයද, ගිනි පිඹින්නාවූ පුරුෂයාමෙන් වාක් ආදිය භේදකොට විපාකාදිය කැමතිව ප්‍රාර්ථනාකරන්නාවූ පුරුෂයාද ගිනිපුපුරක්මෙන් අපරා පරිය වෙදනීයකර්මයද, උපමාඋපමෙය සම්බන්ධකොට අවිදත යුතුයි. එහෙයින් දිඪධම්ම වෙදනීය කර්මයන්ගෙන් මුක්තවූ අපරාපරියවෙදනීය කර්මයන් විසින් තුන්වෙනි අත්බැව් ආදියෙහි සිටු සේසත් ආදී මහත් විපාක දියහැක්කේයි. අපරාපරිය වේදනීය කර්මය බලවත්කල්හිද දිඪධම්මවේදනීය කර්මය දුර්වලවූ යේ නමුදු මහත්වූ ප්‍රකටවූ විපාකදෙන්නේයි. ඊට උපමා නම්:— දැඩිවූ ගිනි අඟුරු රැසක් මත්තෙහි අමු දර රාශියක් දැමූයේ නමුදු ඒ දර දවන්නේයයි දතයුතුයි, අපරාපරිය වෙදනීය කර්මය දුර්වලවූකල්හි දිඪධම්මවෙදනීය කර්මය බලවත්වූයේ නමුදු මහත්වූ විපාකදෙන්නේයි. ඊට උපමා නම්:—දුර්වලවූ ගින්නට යසපත්වූ දර දැමූකල්හිඅතිශයින් දැඩිවූ ගින්න හටගන්නාක්මෙනි; අපරා පරිය කුශලකර්මය දුර්වලවූකල්හි බලවත්වූ අපරාපරිය අකුශල කර්මය විසින් පෙළෙන ලදුව විපාක නොදෙන්නේයි. ඊට උපමා නම්:—දුර්වලවූ ගින්නට වර්ෂා ජලය ලැබුනුකල්හි ඒගින්න නිවී යන්නාක් මෙනි

අපරාපරිය වෙදනීය කර්මයන්ගේ ස්වභාව නම්:—ඒ කර්ම න්ගේ ශක්තියෙන්ම විපාකනොදිය හැකිබවයි. බිය සුළු පුරුෂයෙක්හට රාත්‍රි කාලයෙහි හුදකලාව සොහොන් භූමියකට නොයාහැකිවෙයි. එහෙයින් දෙවෙනි පුරුෂයෙක් හා සමගම සොහොන් භූමියට යාහැකිවන්නාක්මෙන් අපරාපරිය වෙදනීය කර්ම තෙමේ දිඪධම්මවෙදනීය කර්ම නැමති යහළුවාගේ උපකාර

ලැබ විපාකදෙන්නේයයි දතයුතුයි, දිට්ඨධම්මවේදනීය කර්මයන්ගේ විපාකදීමය යනු:—යම්සේ ආහාර පානාදියෙන් දුක් විඳින්නාවූ පුරුෂයෙක්හට උපභෝග පරිභෝග සම්පත්තියෙන් ආඪ්‍ය වූවන් විසින්දෙනලදුව යහපත් වස්ත්‍රාභරණ හැඳ පැලඳ යහපත් ආහාරපාන අනුභව කරන්නාවූ කල්හි අපගේ ස්වාමියා විසින් දෙනලදුව මේබඳු වස්ත්‍රාභරණාදිය හැඳ පැලඳ යහපත් ආහාර අනුභවකරමියි කියයි නමුදු ඒ දුඃඛිතවූ සත්ත්වයන් කෙරෙහි ලැබියයුතුවූ කුශල කර්මයන්ගේ විපාකවශයෙන් ඒ වස්ත්‍රාභරණ ආහාරපානාදිය ලබන්නේයයි දතයුතුයි.

## මේ වනාහී කුශල කර්මයන්ගේ විපාකදීමයි.

---

අකුශල කර්මයන්ගේ විපාකදීම වනාහි පුද්ගල වශයෙන් නන්දනම් මානවක තෙමේ උත්පලවර්ණ රහත් මෙහෙණින්න කෙරෙහි වරදවා පිළිපැදීමද, නන්ද නම් ගොඝාතක තෙමේ පස ළොස්වක් පොහෝ දවස්හී තමාගේ මඞ්ගලවෘෂභයාගේ දිවකපා බැද ගෙණවයි නියොගකොට ඒ මාංසය තමාගේ දිවෙහි තුබූ කෙණෙහිම දිවමුලින් ඉගිලී බත්වස්තෙහි හුණුබවද, සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේට කොකාලික තෙමේ "පාපිච්ඡා හනෙත සාරිපුත්තමොග්ගල්ලානා" යනාදීන් ආය්‍යෝපවාදකොට බුදුන්ගේ අභිමුඛයෙන් මදක්නැත් යනකල්හි බෙලිඵල පමණ මහත්වූ පිළිකා හටගෙණ එයින් කාලක්‍රියාකොට පදුම නරකයෙහි උපන් වස්තුවද, අකුශල පක්ෂයෙහි උදාහරණ වශයෙන් දක්විය යුතුයි. මේ දිට්ඨධම්මවේදනීය කර්මය වනාහි සමාන ජාතික ජවනයන්ගෙන් ආසෙවන ප්‍රත්‍යය නොලැබූ හෙයින් ප්‍රතිසන්ධි විපාක නොදෙන්නේයි. ඉදින් ඉහාත්මයෙහි අහෙතුක විපාක මාත්‍රයක් නුදුන්නේවීනම් අහෝසිකර්ම වෙයි. සත්වෙනි ජවනයෙහි යෙදුනාවූ චේතනාව උපපජ්ජවේදනීය කර්මයයි කියත්. ඒ කර්මය වනාහි දෙවෙනි අත්බැව්හි පටිසන්ධිවිපාක හා ප්‍රවෘත්ති විපාකත් දෙන්නේයි. එය ජනක කර්මය සමානයි. ඒ කර්මය දෙවෙනි අත්බැව්හි පටිසන්ධි විපාකදෙන්නේ කුමක් හෙයින්ද යත්? ආසෙවන ප්‍රත්‍යයාගේ බලවත් බැවිනැයි දතයුතුයි.

ඊට උපමා නම්:—

ගොන්යුගසතක් යෙදූ ගැල පසු පසුව යෙදුවාවූ ගොන්යුගසය විසින් රුකුල්දෙන ලදුව සත්වන ගව යුගය විසින් සම්පූර්ණයෙන් ගැලඅදිනු ලැබෙයි. එපරිද්දෙන්ම ප්‍රථම ජවනාදී ජවන් සය විසින් රුකුල් දෙන ලදුව සත්වන ජවනය විසින් ප්‍රතිසන්ධි

ප්‍රවෘත්ති විපාකය උපදවනු ලැබෙයි. ඒ කර්මයද කුශලාකුශල වශයෙන් දෙවැදෑරුම් වෙයි. ඔවුන් අතුරෙන් කුශල උපපජ්ජවේදනීය කර්මයෝ තුමූ එක් සත්වයෙක් කෙරෙහි අනන්තාප්‍රමාණ වෙත්. ඒ අප්‍රමාණ උපපජ්ජවේදනීය කර්මයන් අතුරෙන් අතිශයින් බලවත්වූ උපපජ්ජවේදනීය කර්මයකින් හෙවත් පිණ්ඩපාත දානමය ආදී කුශල කර්මයකින් ප්‍රතිසන්ධිය දුන්කල්හි අවශෙෂවූ සත්වන ජවනචෙතනා කුශලකර්මයෝ තුමූ අහොසිකර්ම නම්වෙත්. නොහොත් නියම කාලය ඉක්මීම හෙතුකොට ගෙණ පැලනොවෙන්නාවූ ධාන්‍යබීජමෙන් අහොසිකර්ම බවට යෙත්. එපරිද්දෙන්ම බොහෝ අකුශල් රැස්කළාවූ පුද්ගලයෙක් තෙමේ එක්තරු ගොඝාතක අකුශලකර්ම සත්වන ජවනයකින් අපායප්‍රතිසන්ධිය ගත්කල්හි අවශෙෂවූ අනන්තාප්‍රමාණවූ සත්වන ජවන චෙතනා අකුශලකර්මයෝ තුමූ අහොසිකර්ම නම් වෙත්.

“අපරාපරියවෙදනීයකර්මය” යනු මධ්‍යයෙහි ජවන චෙතනා පසසම්බන්ධවූ කර්මයෝයි. එක් සත්වයෙක්හට ඇත්තාවූ අපරාපරිය වෙදනීය කර්මයන්ගේ සංඛ්‍යාව ගන්නා පිණිස මේ මහාපෘථිවියෙහි සියලු පස අබ බිජු පමණ ගුලිකෙළේ නමුදු සතර මහාසාගරයෙහි ජලය අබ පියල්ලකින් මනින්නාහු නමුදු එකම සත්වයෙකුගේ අපරාපරිය වෙදනීය කර්මයන්ට නොපොහොනේ යයි දතයුතුයි. ඒ අපරාපරිය වෙදනීයකර්මය වනාහි විපාකදීමට අවකාශයක් ලැබුනු කල්හිම විපාක දෙන්නේයි. ඊට උදාහරණයක් නම්:—මිනිසුන් දහසක් නැගී ගියාවූ නැවක් සමුද්‍රමධ්‍යයෙහි විනාශවීනම් ඒ දහසක් මිනිසුන්ට අපරාපරිය කර්ම දහසක් අභිමුඛයට අවුත් විපාකදෙයි.ඒදහසක් මිනිසුන්ගේම මරණය වන්නේයි. අපරාපරිය වෙදනීයකර්ම සංඛ්‍යාතවූ මධ්‍යයෙහි ජවනයෝ පස්දෙන නිර්වාණය දක්වාම ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාක දිය හැකිවෙත්. එක් කර්මයක්හු එක් භවයෙක ප්‍රතිසන්ධිය දී ජාති සතසහශ්‍රයකත් ප්‍රවෘත්ති විපාක දියහැක්කේයි. ප්‍රතිසන්ධිවිපාක නොදී ප්‍රවෘත්තිවිපාක දෙන්නාවූ අපරාපරියවෙදනීයකර්මයෙක් නම් නැත්තේයි. අහොසිකර්මයද කුශලාකුශල වශයෙන් දෙවැදෑරුම් වෙයි. දෙව්දත් තෙරණුවෝ මේ ශාසනයෙහි පැවිදිව සතර සංවර ශීලය රක්‍ෂාකොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා මෑතභාගයෙහි සංඝභෙදකර්මයකොට අවීචිමහා නරකයෙහි උපන්නේය. ඔහු විසින් රැස්කළාවූ කාමාවචර රූපාවචර කුශලයන්ගේ දිට්ඨධම්මවෙදනීය උපපජ්ජවෙදනීය කර්මයෝ අහොසිකර්ම බවට පැමිණවූහ. කොටිගණන් මනුෂ්‍යඝාතනය කොට මෑතභාගයෙහි මහණව රහත්වූ අඟුල්මල් තෙරණුවෝ ඒ අප්‍ර

මාණවූ අකුශල කර්මයන්ගේ උපපජ්ජවේදනීය අපරාපරියවේදනීය අකුශලකර්මයන් අහෝසිකර්ම බවට පැමිණවූහ. එතකුදුවුවත් ඒ අඞ්ගුලිමාල තෙරුන්වහන්සේ වැඩවසන බවට පැමිණ ග්‍රාම නගරාදියෙහි බලු කපුටු ආදීන්ට දමාගසන්නාවූ කැටමුගුරු ආදිය තෙරුන්වහන්සේගේ හිසේ පැහැර හිසෙන් ගලන්නාවූ ලෙහෙයෙන් සිරුරු තෙමී වෙහෙරට පෙරළා එන්නේ වෙයි. මේ වනාහි මනුෂ්‍යඝාතන අකුශල කර්මයන්ගේ දිට්ඨධම්මවේදනීය විපාකයයි දතයුතුයි.

මෙහිදී බුදුන් රහතුන්ගේ කර්මක්ෂයකරඥාන සඞ්ඛ්‍යාතවූ අර්හන් මාර්ගඥානයෙන් කර්මක්ෂය කරන්නාහු නොවෙත්ද? එසෙයින් මේ අඞ්ගුලිමාල වස්තුවෙහි දිට්ඨධම්මවේදනීය කර්මය කෙසේ විපාක දුන්නේදැයි ප්‍රශ්නයක් උපදින්නේය. ඊට පරිහාර නම්:— සියලු රහතුන් වහන්සේලාගේ අර්හත්මාර්ගඥාන සඞ්ඛ්‍යාතවූ කර්මක්ෂයකරඥානයෙන් ආයතිභවයෙහි පටිසන්ධිගෙණ දෙන්නාවූ උපපජ්ජවේදනීය කර්මයෝය් බුදුවරයන්ගේ කර්මක්ෂයකරඥානයෙන් උපපජ්ජවේදනීය කර්මය, දිට්ඨධම්මවේදනීය කර්මය, (අපරාපරියවේදනීය කර්මය) යන මේ සියලු කර්මයනුත් නසන්නාහුයයි දතයුතුයි. මුගලන් මහතෙරුන් වහන්සේට අපරාපරියවේදනීය කර්මයද, අගුල්මල් තෙරුන්ට දිට්ඨධම්මවේදනීය කර්මයද විපාක දුන් සැටි දතයුතුයි. දිට්ඨධම්මවේදනීයකර්මය ඉහාත්මයෙහිත් උපපජ්ජවේදනීයකර්මය දෙවෙනි ආත්මයෙහිත් අපරාපරියවේදනීයකර්මය සකන්ධපරිනිර්වාණයෙහිත් අහෝසිකර්ම වන බැවින් දිට්ඨධම්මවේදනීයාදිවූ කර්මයන්ගේත් ඒ නියමකාලය ඉක්මීමෙන්ම අහෝසිකර්මයයි ව්‍යවහාර කෙරෙත්. ඊටනානාරිත කර්මවිපාකයයි කියත්.

මේ කර්මයෝ සතරදෙන විපාකදෙන්නාවූ කාලයාගේ වශයෙන් ගටහන්නාවූ කර්මයෙත්. ඒ කර්මතෙමේ අකුශලකර්මය කාමාවචර කුශලකර්මය රූපාවචරකුශලකර්මය අරූපාවචරකුශලකර්මයයි සතරවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් අකුශලකර්මය වනාහි සතරඅපායෙන් අන්‍යවූ කාමාවචර රූපාවචර අරූපාවචර යන තුන්වැදෑරුම්වූ භූමියෙහි විපාකදෙන්නාහු නමුදු රූපාවචර අකුශල අරූපාවචර අකුශලයයි ව්‍යවහාර නොකෙරෙත්. යම්සේ මනුෂ්‍ය සත්‍රීන්ගේ කුස උපදනා තිරශ්චීනයන් මනුෂ්‍ය යොනියෙහි සඞ්ග්‍රහ නොකොට තිරශ්චීනයොනියෙහිම සඞ්ග්‍රහ කෙරෙත්ද, එපරිද්දෙන්ම රූපාරූපභූමියෙහි විපාක දෙන්නාවූ අකුශලකර්මයන් අපායභූමියෙහිම සඞ්ග්‍රහ කෙරෙත්. ඒ කර්මය වනාහි විපාක දෙන ස්ථාන වශයෙන් සතර වැදෑරුම වේ.

ඔවුන් අතුරෙන් අකුශල කර්මතෙමේ කායකර්මය, වචීකර්මය, මනෝකර්මයයි ද්වාර වශයෙන් තුන්වැදෑරුම් වේ.

මෙතැන්හි ද්වාරය යන ව්‍යවහාරය මතු රූපපරිච්ඡේදයෙහි ප්‍රසාදරූපයන්ට ද්වාරරූපයයි කරන්නාවූ ව්‍යවහාරයමෙන් නොවේ. කායවිඥප්ති වචීවිඥප්ති වශයෙන් කායද්වාර වචීද්වාරයයි කියති. ඒ ත්‍රිවිධාකාරකර්මයන් අතුරෙන් ප්‍රාණාතිපාත, අදින්නාදාන, කාමමිථ්‍යාචාර යන කර්ම තුන්දෙන වනාහි කායකර්ම නම් වෙත්. ඒ කර්ම තුන්දෙන කායකර්මය යන නාමය කිසි කලෙකත් අත් නොහරිති. කායවිඥප්තිය වනාහි කායද්වාරයයි කුමක් හෙයින් ව්‍යවහාර කරන්නේදයත්? කායකර්මයන්ගේ නික්මීමට දොරටුවක් වැනි හෙයින් කායද්වාර නම් වේ. ඒ කායකර්මයන්ගේ හටගැණීමට ස්ථානවූ කායවිඥප්ති සඞ්ඛ්‍යාත ද්වාරයෙහි වචීකර්මය හටනොගන්නේදැයි ප්‍රශ්න කෙළේවීනම් කායද්වාරයෙහි වචීකර්මයද ස්වල්පවශයෙන් හටගන්නේයයි විස්තර කටයුතුයි. එහෙයින් කායද්වාරයෙහි කායකර්මය බොහෝසෙයින්ද වචීකර්ම ස්වල්පවශයෙන්ද හටගන්නේයයි කියයුතුයි. එතකුදුවුවත් ඒ කායද්වාරයෙහි හටගන්නාවූ ස්වල්පවූ වචීකර්මයන්ට කායකර්මයයි ව්‍යවහාර නොකෙරෙත්. කුමක්මෙන්දයත්? "බ්‍රාහ්මණගාමො" යනාදී උදාහරණයෙහිමෙන් බොහෝසෙයින් වසන්නාවූ බ්‍රාහ්මණයන්ගේ වශයෙන් බ්‍රාහ්මණග්‍රාමයයි කියන නමුත් ස්වල්පවශයෙන් වසන්නාවූ චණ්ඩාලාදීන් හේතුකොටගෙණ චණ්ඩාලග්‍රාමයයි යනාදීන් ව්‍යවහාර නොකෙරෙති. මේ උපමායෙහි බ්‍රාහ්මණයන්මෙන් කායකර්මයද ස්වල්පවූ චණ්ඩාලාදීන්මෙන් වචීකර්මයද, ග්‍රාමයමෙන් කායවිඥප්තියද, උපමා උපමෙය්‍ය සම්බන්ධ කටයුතුයි. කායද්වාරයෙහි ස්වල්පවශයෙන් වචීකර්මහටගන්නේ කෙසේදයත්? වචනයෙන් කියයුතුවූ මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්‍රලාප යන යම්කිසි අකුශල කර්මයක් පත්‍රාදියෙහි ලියා දෙන්නේවීනම් හස්තමුද්‍රායෙන් හඟවන්නේවීනම් කායද්වාරයෙහි පැවති වචීකර්මයයි දතයුතුයි. මෙ වනාහි කායකර්මයෙන් ද්වාරය නියමකිරීමයි. කායද්වාරය එකාන්තයෙන් ගතයුත්තේයි. ඒ කර්මය කායද්වාරයෙහි උපදනා හෙයින් කායකර්මයයි ව්‍යවහාර කෙරෙත්. අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන කර්මයෝතුමූ මනෝද්වාරයෙහි පවත්නා හෙයින් මනෝකර්ම නම් වෙත්. කායකර්ම වචීකර්මයෝ තුමූ කායවිඥප්ති වචීවිඥප්තීන්ගෙන් තොරව හටනොගන්නාක්මෙන් මනෝකර්මයද මනෝද්වාරයෙන් තොරව හටගන්නේදැයි යන චෝද්‍යය සඳහා "අඤ්ඤත්‍රාපි විඤ්ඤත්තියා" යන්නෙහි "පි" ශබ්දය දක්වන

ලද්දේයි. ඒ "ප්‍ර" ශබ්දයාගේ ප්‍රයෝජනය නම්:— මනෝකර්ම සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධකර්මයෝ තුමූ කායවිඥප්තිය හා සමගද ඇතැම් කලෙක්හි හටගනිත්ය යන අර්ථය "ප්‍ර" ශබ්දයාගේ ප්‍රයෝජනයයි. එසේ හටගන්නේ නමුදු කායවිඥප්ති වචීවිඥප්තීන් හා සමග ස්වල්පවශයෙනුත් මනෝද්වාරයෙහි බහුලවශයෙනුත් පවත්නා බව හඟවනු පිණිස "මනස්මිං යෙව බාහුල්ල වුත්තිතො" යනු කීහ. එහි අභිප්‍රාය නම්:—

කායවිඥප්ති වචීවිඥප්තියෙහි බහුලවශයෙන් නූපදනාහුය. මනෝද්වාරයෙහිම උපදනාහුය යන අර්ථය හඟවනු පිණිස එවකාරය දක්වනලදී. එතකුදු වුවත් කායද්වාර වචීද්වාරයෙහි හටගන්නාවූ ලෝභද්වේෂයෝ දුර්වලවෙති. මනෝද්වාරයෙහි හටගන්නා ලෝභද්වේෂයෝම බලවත්වෙති. යම් කර්මයක් කරන්නාවූ කල්හි චේතනාව පෙරමුණෙහි ගමන්කිරීමය අභිසිඛියම්මාන යන මේ ලක්ෂණවශයෙන් සම්පූර්ණවූ කර්මයම ප්‍රතිසන්ධි විපාකයදෙයි. නිසුණුචේතනාව නැතිවිනම් ප්‍රවෘත්ති විපාකමාත්‍රයක් දෙන්නේයි. එහෙයින් මව්පිය ගුරුවරාදීන් විසින් දූදරු ශිෂ්‍යාදීන්ගේ යම්කිසි දුශ්චරිතාදියක් දුටුකල්හි රළුපරුෂ වචනාදිය ව්‍යවහාර කරත් නමුදු චිත්තයාගේ සණ්හමෘදුභාවය හේතුකොට ගෙණ ඵරුස වචන කර්මපථය නොවන්නේයි. මනෝකර්මයෙහි දෘෂ්ටිය යනු මේ ලෝකය හා සත්වයෝත් අහේතුකව හටගණීත්ය යන අහේතුකදෘෂ්ටියද කුශලකර්මයෙහි කුශල විපාකයකුත්නැත. අකුශල කර්මයෙහි අකුශල විපාකයකුත් නැතැයි යනාදී දශවස්තුවක් නැතැයි ගන්නාවූ නාස්තික දෘෂ්ටියද, බුද්ධාදී උතුමන් කෙරෙහි පැවැත්විය යුතුවූ සිරිත් විරිත් ආදීවූ ක්‍රියාවක් (සත්වයාගේ මරණින් මත්තෙහි ඉපදීමෙක්)නැතැයි ගන්නාවූ අකිරිය දෘෂ්ටියද, යන මේ ත්‍රිවිධ මිථ්‍යාදෘෂ්ටිහුම දශ අකුශල කර්මපථයෙහි ඇතුලත්වූ කර්මපථයෝ නම් වෙති, අවශේෂවූ සියලු අනියත මිථ්‍යාදෘෂ්ටිහු අකුශල කර්මයෙහි ඇතුලත්වෙති. එතකුදු එකාන්තයෙන් අපායෙහි උපදන්නේයයිනිශ්චමකොට හැක්කේයි. මේ දශාකුශලකර්මපථයන් අතුරෙන් ප්‍රාණාතිපාත ඵරුස වචන ව්‍යාපාද යන මේ ත්‍රිවිධ කර්මපථයෝතුමූ ද්වේෂමූලික සිතින් උපදනාහුය. විකල්පයෙන් වනාහි මෝහසමුට්ඨානවූ ද්වේෂමූලික සිතින්ද උපදනාහුය. ඒ කෙසේයත්? මොහු මට අනර්ථයක් කෙළේයයි යනාදීන් නවවිධ අඝාත වස්තූන් හේතුකොට ගෙණ ප්‍රාණඝාත ඵරුස වචන ව්‍යාපාද යන අකුශල කර්මයක් කරන්නේවීනම් ඒ අකුශලකර්මය ද්වේෂ මූලික සිතින් හටගත්

නේයි. මෝහය හේතුකොටගෙණ ආදීනව නොදන්නා ප්‍රාණඝාතාදි අකුශලකර්මයක් කරන්නේ වීනම් ඒ කර්මය මෝහසමුට්ඨාන මෝහ මූලිකයයි දතයුතුයි. කාමමිථ්‍යාචාර අභිධ්‍යා මිථ්‍යාදෘෂ්ටි යන මේ අකුශලකර්මයෝ තුන්දෙන ලෝභමූලික සිතින් හෝ මෝහපච්චය ලෝභ මූලික සිතින් හෝ හටගන්නා ක්‍රමය යටකී නයින් දතයුතුයි.

මාතුරක්ඛිතාදී දෙලොස් ප්‍රකාර ස්ත්‍රීන්කරා වරදවා යන්නාවූ පුරුෂයාහට කාමමිථ්‍යාචාර කර්මය වෙයි. ස්ත්‍රීන්ට වනාහි තමාගේ ස්පර්ශ කාමගුණය අයිතිවූ පුරුෂයෙකු නැත්තේවීනම් කාමමිථ්‍යාචාරය නොවෙයි. කුමක් හෙයින යත්? ඈගේ මව්පියාදීන්ට කාමගුණය අයිති නොවන හෙයිනි. පුරුෂයන්ට වනාහි කෙබඳු ස්ත්‍රියක් වුවත් ඉක්මවා ගියේ නම් කර්ම පථය වන්නේයි. සුරාමේරකර්මය වනාහි කායකර්මාදී ත්‍රිවිධ කර්මයන් අතුරෙන් කායකර්මයෙහිද ස්පර්ශ කාමගුණයෙහිද වරදවා පිළිපදනා හෙයින් කාමමිථ්‍යාචාරයෙහිද ඇතුලත් වන්නේයි. අවශෙෂවූ අදින්නාදාන මුසාවාද පිසුණාවාච සම්ඵප්ප්‍රලාප යන සතර වැදෑරුම් කර්මයෝ තුමූ ලෝභමූලික දෙසමූලික සිතින් උපදනාහුය. විකල්පයෙන් වනාහී යටකී නයින් මෝහපච්චය ලෝභමූලික සිතින්ද මෝහපච්චය ද්වෙෂමූලික සිතින්දැයි මෙසේ සතරාකාරයකින් හටගන්නා ක්‍රමය යටකී නයින් යොදගත යුත්තේයි. ඒ දශප්‍රකාරවූ අකුශලකර්මයෝ චිත්තොත්පාද වශයෙන් දෙලොස් වැදෑරුම් වෙයි. කාමාවචර කුශලයද කායකර්ම වචීකර්ම මනොකර්ම වශයෙන් ත්‍රිවිධාකාර වන්නේයි. චාරවනක්‍රමය අකුශල කර්මයට කී නයින් යොදගත යුතුයි. හෙවත් ස්වහස්තයෙන් දන්දෙන කල්හී දානමය කුශලය කායචාරයෙහිද මෙසේ දන්දෙවයි විධානකළ කල්හි දානමය කුශල කර්මය වචීචාරයෙහිද පවත්නා සැටි දතයුතුයි. චාර වශයෙන් ත්‍රිවිධාකාරවන්නාක් මෙන්ම දාන සීල භාවනා වශයෙනුදු ත්‍රිවිධාකාර වෙයි. චිත්තොත්පාද වශයෙන් අෂ්ටප්‍රකාර වෙයි. යමෙකු විසින් මම දන්දෙම්යයි සිතිවිලි මාත්‍රයක් උපදවන ලද්දේවීනම් ඒ උපදවන ලද්දාවූ කාමාවචර කුශලචිත්තවීථිය දානමයකුශලකර්ම නම්වෙයි ඒ සිතු පරිද්දෙන් දානයදෙන්නාවූ කල්හී හටගන්නා අභිසංඛත ජවන වීථිය කුශලකර්මපථ නම් වෙයි. සියලු තන්හිම අභිසංඛත ජවනවීථීහු ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකමයද අභිසංඛත නොවූ ජවනවීථීහු අහෙතුක ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්ම දෙන්නාහුයයි දතයුතුයි. මේ දානාදීවූ දශ කුශල කර්මපථයන් අතුරෙන් අපචායන වෙය්‍යාවච්ච යන

පුණ්‍ය ක්‍රියා දෙදෙන ශීලමය පුණ්‍යක්‍රියාව හා සදෘශ බැවින් ශීලයෙහි ද පත්තිදාන පත්තානුමෝදනා දෙදෙන දානයට සදෘශ බැවින් දානමය පුණ්‍යක්‍රියාවෙහි ද ධර්මශ්‍රවණ ධර්මදේශනා දිට්ඨිජ්ජු කර්ම තුන්දෙන භාවනාව හා සදෘශ බැවින් භාවනාවෙහි ඇතුලත් වන්නේයයි සමහර ආචාර්ය්‍යවරයෝ කියති. එතකුදුවුවත් දිට්ඨිජ්ජුකර්මය වනාහි සියලු පුණ්‍යක්‍රියාවන් නියම කිරීම ලක්‍ෂණ කොට ඇත්තේයයි දීඝනිකා අටුවාවෙහි කියන ලද්දේයි. කුමක් හෙයිනයත්? දෘෂ්ටිය ඈද නැති කල්හිම දාන ශීලාදී සියලු කුශල කර්මයන් රැස්කළ හැක්කේ වෙයි එහෙයින් දානාදී නව පුණ්‍ය ක්‍රියාවෙහිම දිට්ඨිජ්ජු කර්ම පුණ්‍යක්‍රියාව පූර්වාඞ්ගම කොට ඇත්තේයයි දතයුතුයි. රූපාවචර කුශල කර්මයද මනොද්වාරයෙහිම හටගන්නේයි. භාවනාවෙන් නිපන්නේ වෙයි. අර්පණාවට පැමිණියේ වෙයි. ධ්‍යානාඞ්ග වශයෙන් පච ප්‍රකාර වන්නේයි. එසේම අරූපාවචර කුශල කර්මයද මනො ද්වාරයෙහිම හටගන්නේ වෙයි. භාවනාවෙන් නිපන්නේ වෙයි. අර්පණාබවට පැමිණියේ වෙයි. රූපාවචර කුශලකර්මය ධ්‍යානාඞ්ග වශයෙන් පසක් වන්නාක්මෙන් අරූපාවචර කුශලකර්මය ආලම්බණ වශයෙන් සතරක් වෙයි පරිකර්ම නිමිත්ත වැටහුණු තැන් පටන් උග්ගහ නිමිත්ත උපදින තැන් දක්වා "පඨවි පඨවි" යනාදීන් කරන්නාවූ භාවනා තොමෝ පරිකර්ම භාවනා නම් වෙයි. පරිකර්ම නිමිත්ත වැටහීමය. උග්ගහනිමිත්ත වැට හීමය යනු අරුණුවන් මැටියෙන් ඉදිකරනන්නාවූ කසිණ මණ්ඩලය අභිමුඛයෙහි තබා භාවනා කරණ කල්හී දියෙහි ගිලුනු පුරුෂයෙකුට හාත්පසින් ජලයයි වැටහෙන්නාක්මෙන් තමන්ගේ හාත්පස පෘථුවියයි වැටහුනේවීනම් පෘථුවීකසිණ පරිකර්ම නිමිත්ත වැවහුනේ වෙයි. ඒ නිමිත්ත බලා භාවනා කරණ කල්හි ඒ නිමිත්ත හා සර්වප්‍රකාරයෙන් සමානවූ ප්‍රතිබිම්බ යක් වැනිවූ නිමිත්ත උපන් කල්හී යම් යම් දිගකට හොස් බලන්නාවූ කල්හිත් සවපනයෙන් දකින්නාක් මෙන් ඒපෘථුවි කසිණ නිමිත්ත දකින්නාහු වී නම් උග්ගහනිමිත්ත උපන්නේ නම් වෙයි. ඒ පරිකර්ම නිමිත්ත උපන් තැන් පටන් උග්ගහ නිමිත්ත උපදිනතැන් දක්වා කරන්නාවූ භාවනා පරිකර්ම භාවනාව නම් වෙයි. උග්ගහනිමිත්ත උපන් තැන් පටන් ගොත්‍රභූ චිත්තය දක්වා "පඨවිකසිණං" යනාදීන් කරන් නාවූ භාවනාව උපචාර භාවනා නම් වෙයි. ඊට අනතුරුව උපදනා ධ්‍යාන ජවනතෙමේ අර්පණා භාවනානම් වෙයි. පරිකර්ම භාවනා උපචාර භාවනාවෝ තුමූ කාමාවචර මහා කුශල් නම් වෙත්. අර්පණාජවනය රූපාවචර කුශල් නම් වෙයි.

විපාකදානස්ථාන වශයෙන් වනාහි අකුශලය කාමාවචර කුශලය රූපාවචර කුශලය අරූපාවචර කුශලය යන සතර කර්මයන් අතුරෙන් උද්ධච්චචේතනා සහිත චිත්තය වර්ජිත කොට ඇත්තාවූ එකොළොස් වැදෑරුම් අකුශල කර්මයෙහි ඇත්තාවූ චේතනා සංඛ්‍යාතවූ කර්මතෙමේ අපායභූමියෙහි පටිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි කාමරූප භූමියෙහි දොළොස් වැදෑරුම් අකුශල කර්මතෙමේ සත් වැදෑරුම් අහෙතුක අකුශල විපාකය දෙන්නේයි. එසේ දෙන්නේනමුදු චක්ෂු ශ්‍රොත ඝ්‍රාණප්‍රසාදයෝ නොලැබුවාහු නම් කාමභූමියෙහි ඒ ඒ විපාක චිත්තය නො ලැබෙන්නේයි. ප්‍රතිසන්ධි කාලයෙහි වනාහි උද්ධච්චසහගත කර්ම වර්ජිතකොට ඇත්තාවූ එකොළොස්කර්මය අපායභූමියෙහි ප්‍රතිසන්ධිය දෙන්නේයයි කුමක්හෙයින් කියේදයත්? උද්ධච්ච සහගත කර්මය වනාහි ප්‍රතිසන්ධි දානශක්තිය නැති හෙයින් ප්‍රතිසන්ධිය නොදෙන්නේයි. ඒ බව කවර කාරණයකින් දතයුත්තේද යත්? මාතෘකාවෙහි දර්ශන ත්‍රිකය බලන කල්හි උද්ධච්ච සහගත කර්මය ප්‍රතිසන්ධි නොදෙනබව හැඟෙයි. ඉදින් ඒ උද්ධච්ච සහගත කර්මය ප්‍රතිසන්ධිය දෙන්නේවීනම් දර්ශනත්‍රිකයෙහි "දස්සනෙන පහාතබ්බා ධම්මා" යන මාතෘකාපදයාගේ පදභාජනයෙහි වදාළ යුතුමැයි. එසේ නොවදාළ හෙයින් ඒචිත්තය පටිසන්ධිය නොදෙන බව දතයුත්තේයි. "යථාරහං" යන පදයාගේ අභිප්‍රාය නම්:—කාමභූමියෙහි ඉන්ද්‍රිය විකලනූවූයේ සප්තාකුශල විපාකයම ලැබෙන්නේයි. චක්ඛු සොත ඝාණ කලාපයන්ගේ අඩුබවක් වීනම් ඒ ඒ විඥානය නොලැබිය යුත්තේයි. රූපභූමියෙහි වනාහි ඉන්ද්‍රිය විකලයක් නැත්තේමැයි. එසේවූයේනමුදු චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ යන විපාක සතරම ලැබෙන්නේයි. අවශෙෂ විපාකයෝ තුන්දෙන නොලැබෙත්. චතුර්මහාරාජයෙන් මත්තෙහි අනිෂ්ටවූ රූපාලම්බණයක් නැත්තේයි. ඉෂ්ටවූම රූපාලම්බණාදිය ඇත්තේයි. එසේවීනම් කුමක්හෙයින් අකුශල විපාකවූ චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? ඒ ඒ බ්‍රහමභූමියෙහි සිට හෝ චාතුර්මහාරාජිකයෙන් මත්තෙහි පස් දිව්‍යලොකයෙහි සිට හෝ කාමධාතුව බලන්නාවූ කල්හි හෝ බුද්ධදර්ශන ධර්මශ්‍රවණාදිය සඳහා කාමධාතුවට පැමිණිකල හෝ අනිෂ්ටවූ රූපශබ්දාලම්බණයන් දැකීමෙන් හෝ ඇසීමෙන් ඒ ඒ දිව්‍යබ්‍රහමයන්ට අකුශල විපාක චක්ඛුවිඤ්ඤාණාදිය උපදනාහුයයි දතයුතුයි. කාමාවචර මහා

කුශලයෝ අටදෙන වනාහි සප්තකාමභූමියෙහිම ප්‍රතිසන්ධිවිපාක උපදවත්. ප්‍රවෘත්තිකාලයෙහිවනාහි කාම භූමිරූප භූමි යන දෙකන්හිම ඒ කාමාවචර කුශලයෝ තුමූඅහේතුක කුශලවිපාක අටය සහේතුක විපාක අටය යන සොළොස් විපාකයන්ම උපදවත්. "යථාරහං" යන පදයාගේ අභිප්‍රාය නම්:—කාමභූමියෙහි ඉන්ද්‍රිය විකලයක් නොවූයේනම් සොළොස් විපාකයම උපදවති. ඉන්ද්‍රිය විකලයක්වීනම් ඒ ඒ විපාක උගුළුවා දැමිය යුතුයි. රූපභූමියෙහි වනාහි කුශල විපාකවූ චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ විපාකයෝ සතරදෙන පමණක් උපදවති අවශෙෂවූ පසළොස් කාමාවචර විපාකයෝ බඹලෙව්හි නැතැයි දතයුතුයි. ඒ මහාකුශලයන් අටදෙනා අතුරෙන් ඥාන සම්ප්‍රයුක්ත කුශලය තෙමේ උත්කෘෂ්ටවූ ඥානසම්ප්‍රයුක්ත කුශලය ලාමකවූ ඥාන සම්ප්‍රයුක්ත කුශලයයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ඥානසම්ප්‍රයුක්ත කුශලචිත්තයන් සතරදෙනා හා සමග යෙදුනාවූ චෙතනාවෝ සතරදෙන ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල චෙතනාකර්ම නම් වෙත්. ලාමකවූ ඥාන සම්ප්‍රයුක්ත කුශලචිත්තයන් සතරදෙනා හා සමග යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ ත්‍රිහෙතුක ඔමක කුශලකර්ම නම් වෙත්. ඔවුන් අතුරෙන් ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලචෙතනාකර්මතෙමේ සප්තකාම සුගතියෙහි මහෙශාක්‍ය මහානුභාව සම්පන්නවූ ත්‍රිහෙතුක උත්කෘෂ්ට ප්‍රතිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි මහාවිපාක අටය අහෙතුකවිපාක අටයයි සොළොස් විපාක කෙනෙකුන් උපදවයි. ඥානවිප්‍රයුක්ත කාමාවචර කුශලතෙමේද උත්කෘෂ්ටවූ ඥානවිප්‍රයුක්ත කුශලය ලාමකවූ ඥාන විප්‍රයුක්ත කුශලයයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ඥානවිප්‍රයුක්ත ද්විහෙතුක කුශල් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්ම නම්වේ. ලාමකවූ ඥාන විප්‍රයුක්ත කුශල් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ ද්විහෙතුක ඔමකකුශලකර්ම නම් වේ. ඒ දෙවැදෑරුම් කර්මයන් අතුරෙන් ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්මය හා ත්‍රිහෙතුක ඔමක කුශලකර්මයද විපාකදීම් වශයෙන් සමාන ශක්ති ඇත්තාහුවෙත්. ඒ දෙවැදෑරුම් කුශලකර්මයම සප්තකාම භූමියෙහි ද්විහෙතුක ප්‍රතිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි ඥානවිප්‍රයුක්ත මහවිපාක සතරය, අහෙතුක කුශලවිපාක අටයයි දොළොස් විපාක කෙනෙකුන් උපදවයි. ද්විහෙතුක ඔමක කුශලකර්ම තෙමේ මනුෂ්‍යභූමියෙහි ජාත්‍යන්ධාදී හීනසත්වයන්ගේද චාතුර්මහාරාජික භූමියෙහිද ඥාතිප්‍රෙත සඞ්ඛ්‍යාතවූ විනිපාතික අසුරයන්ගේද අහෙ

තුන සුගති ප්‍රතිසන්ධිය උපදවයි. ඥාතිප්‍රෙත සඞ්ඛ්‍යාතවූ විනිපාතික අසුරයෝ වනාහි මනුෂ්‍යයන් සම්බන්ධවූ භූමියෙහිම උපදනාහු නමුදු මනුෂ්‍යභූමියෙහි නොව චාතුර්මහාරාජිකභූමියෙහිම ඇතුළත් වෙති. එහෙයින් චාතුර්මහාරාජිකයෙහි අහෙතුක ප්‍රතිසන්ධිකයෝ ඇතැයි කියති. අන්තරීක්ෂ චාතුර්මහාරාජිකභූමියෙහි වනාහි කිසිසේත් අහෙතුක ප්‍රතිසන්ධි නැත්තේයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලකර්මය යනු යම් කුශලකර්මයක් කිරීමට මත්තෙන් හෝ කුශලකර්මය කරන්නාවූ කල්හි හෝ අකුශලකර්මයකින් පිරිවරා නොගෙණ කුශලකර්මයන් විසින්ම පිරිවරා ගන්නේ වේද කුශලකර්මය කළාවූ ඉක්බිතිද අහෝ! මාගේ වස්තුහානිය වූයේයයි පශ්චාත්තාපයක් නොවී සිහිවූවූවිට සතුට උපදවන්නේ වේද මේ සියලුතන්හිම දානානිශංස සැලකීමෙහි පොහොසත්වේද ඒකර්මය ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල නම් වෙයි. ත්‍රිහෙතුක ලාමක කුශලකර්මය යනු දානානිශංස සැලකීමෙහි පොහොසත්වූවද අධර්මයෙන් ලබනලද ධනයෙන් දුශ්ශීලාදීන් විෂයෙහි දන්දේද මෙසේ අකුශලකර්මයන්ගෙන් පිරිවරාගන්නා ලද්දාවූ කුශලකර්මය ත්‍රිහෙතුක ඔමක කුශලකර්ම නම් වෙයි. ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්මය යනු දැහැමෙන් ලබනලද වස්තුවෙන් ශීලවන්තයන් විෂයෙහිම දානානිසංශ නොදැන දෙන්නාවූ දානය ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්ම නම් වේ. ද්විහෙතුක ලාමක කුශලකර්මය යනු දානානිශංසත් නොදැන අධර්ම වෙළඳාම් පසින් හෝ වැදි කෙවුල් ආදී නීචකර්මාන්තයෙන් හෝ නොසකස්ව දෙන්නාවූ දානය ද්විහෙතුක ලාමක කුශලකර්ම නම් වෙයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල කර්මය යනු පූර්ව අපරභාග දෙක්හි කුශලකර්මයන්ගෙන් පිරිවරනු ලැබ දානවස්තුව දෙන්නාවූ කල්හිද මේ දානය මෙබඳු මෙබඳු ආනිශංස ඇත්තේයයි යන කර්මස්වකතාඥානයෙන් යුක්තව ආදි මධ්‍ය පර්‍යවසානය යන තුන් තන්හිම ඥානසම්ප්‍රයුක්තව දානාදී පින්කම් කරන්නේවීනම් ඒ කාමාවචර ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලකර්ම නම් වෙයි. ඒ කර්මයෙන් ගන්නාවූ ප්‍රතිසන්ධිය හෙතු අටකින් යුක්ත වෙයි. එනම්:—ආයුහන ක්ෂණයෙහි හෙතුන් තුන්දෙනෙක, ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතුන් තුන්දෙනෙක, නිකාන්තික්ෂණයෙහි හෙතුන් (තුන්දෙනක) දෙදෙනෙකැයි මෙසේ හෙතු අටකින් යුක්ත වන්නේයයි ප්‍රතිසම්භිදාමාර්ගයෙහි දක්වයි. ආයූහණ ක්ෂණය යනු දානාදී පින්කම්කරන්නාවූ කාලයයි. නිකාන්තික්ෂණය යනු මරණාසන්න කාලයෙහි මරණාසන්න ජවන් වශයෙන් උපදනා කාමාවචර ඥානවිප්‍රයුක්ත (ඥානසම්ප්‍රයුක්ත) කුශලචිත්ත වීථියයි. හෙතුහු අටදෙනාය යනු ආයූ

ගණක්ෂණයෙහි උපදනා කාමාවචර කුශලචිත්ත වීථියෙහි යෙදෙන්නාවූ අලෝභ අද්වේෂ අමෝහ යන තුන්දෙනය, නිකාන්ති ක්ෂණයෙහි උපදනා ඥානවිප්‍රයුක්ත කුශලචිත්තවීථියෙහි යෙදුනාවූ අලෝභ අද්වේෂ යන දෙදෙනාය, ප්‍රතිසන්ධි චිත්තක්ෂණයෙහි ලැබෙන්නාවූ අලෝභ, අද්වේෂ, අමෝහ යන හෙතුහු තුන්දෙනාය යන මේ හෙතුහු අටදෙනායයි දතයුතුයි. ආයූහන ක්ෂණයෙහි හා නිකාන්තික්ෂණයෙහි ලැබෙන්නාවූ හෙතුහු පස්දෙන කුශල්ම වෙති. ප්‍රතිසන්ධික්ෂණයෙහි ලැබෙන්නාවූ හෙතුහු තුන්දෙන අව්‍යාකෘත නම් වෙති. ත්‍රිහෙතුක ඔමකකර්මය යනු චෙතනා පූර්ව අපර චෙතනාවන් අකුශලකර්මයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන චෙතනා මාත්‍රයක් ඥානසම්ප්‍රයුක්තවූ කර්මයයි. ද්විහෙතුක උත්කෘෂ්ට කර්මය යනු පුබ්බචෙතනා අපරචෙතනා දෙදෙන කුශලකර්මයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන චෙතනාවද ඥානයෙන් වියුක්තවූ කර්මය ද්විහෙතුක උත්කෘෂ්ට කර්මයයි. ද්විහෙතුක ලාමක කර්මය යනු පූර්වචෙතනා අපර චෙතනාවන් අකුශලකර්මයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන චෙතනාවද ඥානයෙන් වියුක්තවූ කර්මයයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කර්මය හා ත්‍රිහෙතුක ලාමක කර්මයද මධ්‍යයෙහි ඥානසම්ප්‍රයුක්තවීම සමානයි. පූර්වචෙතනා අපරචෙතනාවෝ අසමාන වෙත්. ද්විහෙතුක උත්කෘෂ්ට කර්මය හා ද්විහෙතුක ලාමක කර්මයද මධ්‍යයෙහි සමානව පෙරපසු අසමාන වෙත්. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කර්මය හා ද්විහෙතුක උත්කෘෂ්ට කර්මයද පෙරපසු සමානවම මධ්‍යයෙහි අසමානවෙයි. ත්‍රිහෙතුක ලාමක කර්මය හා ද්විහෙතුක ලාමක කර්මයද පෙරපසු සමානව මධ්‍යය අසමාන වෙයි. කාමාවචර කුශලකර්ම බලයෙන් ගන්නාවූ ප්‍රතිසන්ධියට "තිණ්ණං භික්ඛවෙ! සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති" යන දෙශනා ක්‍රමයෙන් මවගේ ඍතුකාලය පැමිණීමය, මාතෘ පිතෘන්ගේ සඞ්ගමය, ගර්භයට පැමිණියයුත්තෙක් එළඹසිටීමය, යන කාරණයන් තුන්දෙනාගේ රැස්වීම හෙතුකොටගෙණ මව් කුස ප්‍රතිසන්ධියලැබෙන්නේයි රූපාවචර කුශලකර්ම තෙමේ ප්‍රථමධ්‍යානාදී වශයෙන් දෙයාකාර වන්නේයි. ඔවුන් අතුරෙන් ප්‍රථමධ්‍යාන මාත්‍රයක්ලැබූ පුද්ගලතෙමේ ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේවීනම් බ්‍රහ්ම පාරිෂද්‍යනම්වූ බ්‍රහ්ම භූමියෙහි ප්‍රතිසන්ධිය ගන්නේයි. ඒ බ්‍රහ්මයෝ වනාහි අසඞ්ඛ්‍යකල්පයක්හුගේ තුනෙන් භාගයක් ආයුෂ ඇත්තාහු වෙති ඒ ප්‍රථමධ්‍යානය වනාහි සවා භාවිත වශයෙන් වැඩූ යොගාවචරයෝ තුමූ මරණින් මත්තෙහි බ්‍රහ්මපුරොහිත භූමියෙහි ඉපිද අසඞ්ඛ්‍ය කල්පයක්හුගේ අඩයක්ම එහි සැප විඳිනාහුය. ප්‍රථමධ්‍යානයම පඤ්චප්‍රකාරයෙන් භාවිත

කළාවූ යෝගාවචරයෝ තුමූ මරණින් මත්තෙහි මහා බ්‍රහ්මභූමියෙහි උපදනාහුය. ඒ බ්‍රහ්මයෝ වනාහි එහි අසංඛ්‍යකල්පයක්ම සැපවිඳිනාහුය. මෙසේ ප්‍රථමධ්‍යානයම ත්‍රිවිධාකාරයකින් වඩා බ්‍රහ්මභූමිත්‍රයෙහි උපදනාබව දතයුතුයි. ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යානයෝද මෙසේම ත්‍රිවිධාකාරයකින් වඩා ඒ ඒ ධ්‍යානයට අයිතිවූ තලයෙහි උපදනාබව දතයුතුයි. පඤ්චමධ්‍යානය ලැබුවාවූ යෝගාවචරයෝ තුමූ මරණින් මත්තෙහි වෙහප්ඵලය අසඤ්ඤසත්තය ශුද්ධාවාසභූමිය යන සත්තැනක උපදනාහුයයි දතයුතුයි. ඒ කෙසේ උපදනාහුදයත්? කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයෝ වනාහි නාම ධර්මයෙහි ආදීනව දැක "සඤ්ඤා රෝගෝ සඤ්ඤා ගණ්ඩෝ" යනාදීන් භාවනා වඩා වායෝ කසිණයෙන් පඤ්චමධ්‍යානය උපදවා ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේ වීනම් අසංඥතලයෙහි උපදනාහුය. ඒ උත්පත්ති ක්‍රමයද මනුෂ්‍යලෝකයෙහි ඉඳීම් සිටීම් ආදී යම් ඉරියව්වකින් කාලක්‍රියා කෙළේවීනම් එම ඉරියව්වෙන්ම අසංඥ තලයෙහි හඹාපු ප්‍රතිමාරූප පරිද්දෙන් රූපස්කන්ධ මාත්‍රයක් පහළව මහාකල්ප පන්සියයක් මුලුල්ලෙහි ඒ අසංඥතලයෙහි රූපමාත්‍රයකින් පවත්නාහුය. එම පඤ්චමධ්‍යානයම රූපධර්මයෙහි ආදීනව දැක හෙවත් රූපය ඇතිකල්හි දණ්ඩාදාන ශස්ත්‍රාදානාදිය පවත්නේයයි යනාදීන් රූපයෙහි දෝෂ දැක පඤ්චමධ්‍යානය උපදවා ගත්තාවූ යෝගාවචරයෝ තුමූ කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයෝ හෝ සම්‍යක්දෘෂ්ටිකයෝ හෝ මරණින් මත්තෙහි සතර අරූපතලයෙහි ඉපිද සුවාසූ දහසක් මහාකල්පයන් මුලුල්ලෙහිත් ඒ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනභූමියෙහි පවත්නාහුය. එම පඤ්චමධ්‍යානය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් විසින් උපදවනලද්දේවීනම් මරණින් මත්තෙහි වෙහප්ඵලභූමියෙහි උපදනාහුය. එපරිද්දෙන්ම සෝවාන් සකෘදාගාමි යන ආර්යයෝද පඤ්චමධ්‍යානය උපදවා රූපධර්මයෙහි ආදීනව නොදක්නාහුනම් මරණින් මත්තෙහි වෙහප්ඵලභූමියෙහි උපදනාහුය. එම සෝවාන් සකෘදාගාමි යන ආර්යයෝ වනාහි පඤ්චමධ්‍යානය ලැබ රූප ධර්මයෙහි ආදීනව දුටුවාහුවීනම් මරණින් මත්තෙහි සතර අරූතලයෙහි උපදනාහුය. අනාගාමී පුද්ගලයෝ තුමූ එම පඤ්චමධ්‍යානය ලැබ ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියයන්ගේ සමානත්වය ඇතිකල්හි වෙහප්ඵල බඹලෙව්හිම උපදනාහුය. ඒ අනාගාමී පුද්ගලයෝ තුමූ පඤ්චමධ්‍යානය ලැබ ශ්‍රද්ධේන්ද්‍රිය අධිකවීනම් අවිහතලයෙහිද වීර්යේන්ද්‍රිය අධිකවීනම් අතප්පතලයෙහිද සතීන්ද්‍රිය අධිකවීනම් සුදස්ස තලයෙහිද සමාධීන්ද්‍රිය අධිකවීනම්

සුද්දස්සී තලයෙහිද ප්‍රඥෙන්ද්‍රිය අධිකවීනම් අකනිට්ඨ තලයෙහිද ක්‍රමයෙන් උපදනාහුයයි දතයුතුයි. මෙසේ චතුර්ථක නයින් චතුර්ථධ්‍යානවූද පඤ්චකනයින් පඤ්චමධ්‍යානවූද උපෙක්ෂා ඒකාග්‍රතා යන අංගයන් යුක්තවූ එකම ධ්‍යානය උපදවා නාමයෙහි කලකිරුණාවූ යෝගාවචරයෝ අසංඥ තලයෙහිද රූපයෙහි කලකිරුණාවූ යෝගාවචරයෝ සතර අරූප තලයෙහිද නාම රූප දෙක්හිම කලනොකිරුණාවූ සෝවාන් සකෘදාගාමී යන ආර්‍යයෝ දෙදෙනාද ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාද ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන්ගේ සමානත්වය ඇත්තාවූ අනාගාමීහුද යන මේ සතරාකාරවූ පුද්ගලයෝ වෙහප්ඵලභූමියෙහිද ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන්ගේ වෙමත්තතාව ඇත්තාවූ අනාගාමීහු පස්දෙන ක්‍රමයෙන් පඤ්චශුද්ධාවාස භූමියෙහිද උපදනාබව දතයුතුයි. අනාගාමීහු වනාහි කාමභූමියෙහි ප්‍රතිසන්ධිවශයෙන් නූපදනාහුයයි දතයුතුයි. කුමක් හෙයිනයත්? කාමරාගය ප්‍රහාණයකළ හෙයිනැයි දතයුතුයි. එපරිද්දෙන්ම ධ්‍යානය නොලැබ කාලක්‍රියා කරන්නාවූ අනාගාමී පුද්ගලයෙක්ද නැත්තේයි. යටත් පිරිසෙයින් මරණාසන්න චිත්තවීථියට සමීපකාලයෙහිද පඤ්චමධ්‍යානයලැබ ඉන්ද්‍රිය වෙමත්තතාව නැත්තේවීනම් වෙහප්ඵලභූමියෙහිද ඉන්ද්‍රිය වෙමත්තතාව ඇත්තේ වී නම් ඒ ශුද්ධාවාස භූමියෙහිද උපදනාහුයයි දතයුතුයි. "අනාගාමිනොපන" යන්නෙහි පන ශබ්දයතෙමේ එවකාරාර්ථයෙහි වැටෙයි. ඒ අවධාරණාර්ථය හෙතුකොටගෙණ අනාගාමීන්ගෙන් අන්‍යවූ පුද්ගලයෙක් ශුද්ධාවාස භූමියෙහි නූපදනාබව දතයුතුයි.

## කර්මචතුෂ්කය නිමියේයි.

---

## (පා)

යථාරහං, සුදුසු පරිද්දෙන්; අභිමුඛීභූතං, ඉදිරියට පැමිණියාවූ; භවන්තරෙ, අනතුරු භවයෙහි; පටිසන්ධිජනකං, ප්‍රතිසන්ධිය උපද වන්නාවූ; කම්මංවා, කුශලාකුශල කර්මය හෝ; තං කම්මකරණකාලෙ, ඒ කර්මය කරන්නාවූ කාලයෙහි; උපලද්ධපුබ්බං, ලබන ලද විරූද; උපකරණභූතංච, උපකරණවූද; රූපාදිකං, රූපාලම්බනාදිවූ නොයෙක් රූප (සපර්ශධර්ම සඞ්ඛ්‍යාත) දශීන ධර්ම ශ්‍රවණාදිවූ; කම්මනිමිත්තංවා, සංඝ දුනු අඩයටි තොමරාදීවූද බුද්ධප්‍රතිමා චෛත්‍ය භොජන චීවර ධජ

පතාක සුවඳ මල් ආදීවූ කර්මනිමිත්තක් හෝ; අනන්තරවුප්පජ්ජමානභවෙ, අනතුරුව උපදිනු ලබන්නාවූ භවයෙහි; උපලභිතබ්බං, ලැබිය යුතුවූද; උපභොගභූතං, විඳයුතුවූද, ගතිනිමිත්තංවා, මාතෘකුක්ෂි නරකාග්නි යමපල්ලන් ආදීවූද දිව්‍යාප්සරා දිව්‍යවිමාන කල්පවෘක්ෂ ආදීවූද ගතිනිමිත්තක් හෝ; කම්මබලෙන, කර්මානුභාව ශක්තියෙන්; ඡන්නං ද්වාරානං, ෂඩ්වාරයන් අතුරෙන්; අඤ්ඤතරස්මිං, එක්තරා ද්වාරයෙක්හි; පච්චුපට්ඨාති, නැවත නැවත එළඹ සිටිනේ වෙයි. තතොපරං, ඒ කර්ම කර්මනිමිති ගතිනිමිතීන්ගේ එළඹ සිටීමෙන් මත්තෙහි; තථොපට්ඨිතං, ඒ ආකාරයෙන් නැවත නැවත එළඹ සිටියාවූ; තමෙව ආලම්බණං, ඒ කර්ම කර්මනිමිති ගතිනිමිති සඞ්ඛ්‍යාත අරමුණක්ම; ආරබ්භ, අරමුණුකොටගෙණ විපච්චමානක කම්මානුරූපං, ප්‍රතිසන්ධිය ඉපදවිය හැකිවූ කර්මයට සුදුසුවූ; පරිසුද්ධංවා, කුශලකර්ම වශයෙන් පවිත්‍රවූ හෝ උපක්කිලිට්ඨංවා, අකුශලකර්ම වශයෙන් කිළුටුවූ හෝ; උපලභිතබ්බභවානුරූපං, ලැබියයුතුවූ අනුභවකටයුතු භවයට සුදුසු පරිද්දෙන්; තත්ථ, ඒ ලැබිය යුතුවූ අනුභවකටයුතුවූ භවයෙහි; ඔනතං ඉව, නැමුනාක්මෙන්; ඔනද්ධං, නැමුනේම; චිත්තසන්තති, චිත්ත පරම්පරාතොමෝ; අභිණ්හං, නිරන්තරයෙන්; බාහුල්ලෙන; බොහෝසෙයින්; පවත්තති, පවතින්නේය; පන, අඤ්ඤතරයක්‍ෂංදක්වම් :— පටිසන්ධිජනකභූතං, ප්‍රතිසන්ධිය උපදවන්නාවූ; තමෙව කම්මංවා, ඒ කර්මයම හෝ; අභිනවකරණවසෙන, නැවත අළුතින් කිරීම් වශයෙන්; ද්වාරප්පත්තං හොති, ද්වාරයට පැමිණියේ වෙයි. පච්චාසන්නමරණස්ස, ඉතා ලංවූ මරණඇත්තාවූ; තස්ස, ඒ සත්වහට; වීථිචිත්තාවසානෙවා, තදාලම්බණය අවසන්කොට ඇත්තාවූ හෝ වීථිචිත්තයන්ගේ අවසානයෙහි හෝ; භවඞ්ගක්ඛයෙවා, ඒ ජවන තදාලම්බණයන්ට අනතුරුවූ භවාඞ්ගයාගේ කෙළවර හෝ නොහොත් භවාඞ්ගචිත්තයාගේ භඞ්ගක්ෂණාවසානයෙහි හෝ; චවනවසෙන, පුරාණ භවයෙන් ගිලිහීම් වශයෙන්; පච්චුප්පන්නභවපරියොසානභූතං, ඒ ප්‍රත්‍යුත්පන්නභවයාගේ අවසානයවූ; චුතිචිත්තං, චුතිසිත්තෙමේ; උප්පජ්ජිත්වානිරුජ්ඣති, ඉපිද නිරුද්ධවන්නේය. තස්මිං, ඒ චුතිචිත්තය; නිරුද්ධෙ, නිරුද්ධවූ කල්හී; නිරුද්ධාවසානෙ, නිරුද්ධයාගේ කෙළවර; තස්ස, ඒ චුතිචිත්තයාගේ; අනන්තරමෙව, අනතුරුතන්හිම; තථාගහිතං, ඒ ආකාරයෙන් නොහොත් ෂඩ්ද්වාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නාලද්දාවූ; ආලම්බණං; කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තයයි

කියන ලද්දාවූ අරමුණ ; ආරබ්භ, එල්බගෙණ ; සවත්ථුකංවා, පඤ්චවොකාරභවයෙහි හෘදයවස්තුව සහිතව හෝ ; අවත්ථුකමෙව වා, චතුවොකාරභව වශයෙන් හෘදයවස්තුව නැතිව හෝ ; යථාරහං, සුදුසු පරිද්දෙන් ; අවිජ්ජානුසය පරික්ඛිත්තෙන, අවිජ්ජානුසය විසින් පිරිවරණ ලද්දාවූ ; තණ්හානුසය මූලකෙන, තෘෂ්ණානුශයම මූලකාරණාකොට ඇත්තාවූ ; සඞ්ඛාරෙන, මරණාසන්න ජවන සහගතවූ කුශලාකුශල සංස්කාරය විසින් ; ජනීයමානං, උපදවනු ලබන්නාවූ ; සම්පයුත්තෙහි, ස්පර්ශ වෙදනාදිවූ සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් ; පරිග්ගය්හමානං, අපගේ ඵලයයි මනාකොට පිළිගන්නා ලද්දාවූ ; සහජාතානං, එක්ව උපන්නාවූ ස්පර්ශවෙදනාදිවූ ධර්මයන්ගේ ; අධිට්ඨානභාවෙන, ආධාරස්ථානභාවයෙන ; පුබ්බඞ්ගමභූතං, පෙරටුව යන්නාවූ ; භවන්තරපටිසන්ධානවසෙන, පූර්වපශ්චිම භවයන් එක්කොට ගැලපීම් වශයෙන් ; පටිසන්ධිසඞ්ඛාතං, ප්‍රතිසන්ධියයි කියන ලද්දාවූ : මානසං, සිත්තෙමේ ; උප්පජ්ජමානමෙව, උපදිනු ලබමින්ම ; භවන්තරෙ, අන්‍ය භවයෙහි ; පතිට්ඨාති, පිහිටයි. පන, අර්ථාන්තරයක් දක්වමි :- එතං, මේ මරණාසන්න වීථියෙහි ; මන්දප්පවත්තානි, ලස්ව හටගත්තාවූ ; පඤ්චජවනානි, මරණාසන්නජවනයෝ පස්දෙනෙක් ; යස්මා, යම්හෙයකින් ; පාටිකංඛිතබ්බානි, පැසැස්ස යුත්තාහුද ; තස්මා, එසේහෙයින් ; ආපාථගතෙසු, හමුබවට පැමිණියාවූ ; පච්චුප්පන්නාලම්බණෙසු, යටකී කඩු දුනු චෛත්‍ය විහාරාදී කර්මනිමිත්තක් හෝ මාතෘකුක්ෂි දිව්‍යාප්සරාදීවූ ගතිනිමිත්තක් හෝ; ධරන්තෙසෙව, උපන්නාකල්හිම ; මරණංහොති, මරණයවේද ; තදා, එකල්හි ; පටිසන්ධිභවඞ්ගානමපි, ප්‍රතිසන්ධිභවාඞ්ග චිත්තයන්ගේද ; පච්චුප්පන්නාලම්බණතා, ප්‍රත්‍යුත්පන්න අරමුණු බව ; ලබ්භති, ලැබිය යුත්තේයි. ඉති, (යස්මා) මෙසේ වන හෙයින් ; කාමාවචරපටිසන්ධියා, කාමාවචර ප්‍රතිසන්ධියගේ ; ආලම්බණං, අරමුණ ; ඡද්වාරගහිතං, ෂඩ්ද්වාරයෙන් ගන්නා ලද්දාවූ නොහොත් ෂඩ්ද්වාරික මරණාසන්නජවනයන් විසින් ; ගන්නාලද්දාවූ ; පච්චුප්පන්නං, ප්‍රත්‍යුත්පන්නවූද ; අතීතං, අතීතවූද ; කම්මනිමිත්තංච, කර්මනිමිත්තක්ද ; මනොද්වාරගහිතං මනොද්වාරයෙන් ගන්නාලද්දාවූ ; පච්චුප්පන්නමෙව, ප්‍රත්‍යුත්පන්නමවූ ; ගතිනිමිත්තංච, ගතිනිමිත්තක්ද ; උපලබ්භති, ලැබිය යුත්තේය. කම්මංපන, කුශලාකුශල කර්මය වනාහී; අතීතමෙව, අතීතකාලිකමැයි ; තඤ්ච, ඒ කුශලාකුශල කර්මයද ;

මනොවාරගහිතං, මනොවාරයෙන් ගන්නා ලද්දේවෙයි. පන, අවයවාර්ථයෙන් අන්‍යවූ සමුදායාර්ථ දක්වමි :— සබ්බානිපි තානි, ඒ සියලු කර්ම කර්මනිමිත්ති ගතිනිමිත්තීහු තුමූ ; පරිත්තධම්මභූතානෙව, කාමාවචරස්වභාව ඇත්තාවූ ආලම්බණානි, හොන්ති, ආලම්බණයෝ වෙත්. පන, කාමාවචර ප්‍රතිසන්ධිහුගේ අරමුණෙන් අන්‍යවූ මහද්ගත ප්‍රතිසන්ධිහුගේ අරමුණක් දක්වමි :— රූපාවචර පටිසන්ධියා, රූපාවචර ප්‍රතිසන්ධිහුගේ ; ආලම්බණං, අරමුණ තෙමේ ; පඤ්ඤත්තිභූතං, ප්‍රඥප්තිවූ ; කම්මනිමිත්තමෙව හොති, පාඨවිකසිණාදී කර්මනිමිත්තක්ම වෙයි. තථා, එපරිද්දෙන් ; ආරුප්පපටිසන්ධියා අරූපාවචර ප්‍රතිසන්ධිහුගේ ; ආලම්බණව, අරමුණක්ද ; යථාරහං, සුදුසුපරිද්දෙන් ; මහග්ගතභූතංච, මහද්ගතවූද ; පඤ්ඤත්තිභූතංච, කසිණ උගුළු අහසය ; නත්ථිභාවය යන ප්‍රඥප්තීහුද ; කම්මනිමිත්තමෙව හොති, කර්ම නිමිත්තම වෙයි. පන, නාම ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ රූපප්‍රතිසන්ධිය කියමි :- අසඤ්ඤසත්තානං, අසංඥසත්වයන්ට ; ජීවිතනවකමෙව, ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම ; පටිසන්ධිභාවේන, ප්‍රතිසන්ධිභාවයෙන් ; යස්මා පතිඨාති, යම්හෙයකින් පිහිටාද ; තස්මා, එහේහෙයින් ; තෙ, ඒ අසංඥසත්ව පුද්ගලයෝ තුමූ ; රූපපටිසන්ධිකානාම, රූප ප්‍රතිසන්ධික පුද්ගලයෝ නම් වෙත්. අරූපා, අරූපාවචර පුද්ගලයෝ තුමූ ; අරූපපටිසන්ධිකානාම, අරූපප්‍රතිසන්ධිකයෝ නම් වෙත්. සෙසා, අවශෙෂවූ පචවොකාරභව ප්‍රතිසන්ධික පුද්ගලයෝතුමූ; රූපාරූපපටිසන්ධිකානාම, නාමරූප ප්‍රතිසන්ධික පුද්ගලයෝ නම් වෙත්.

ආරුප්පචුතියා පරං, අරූපාවචර චුතියෙන් මත්තෙහි ; හෙට්ඨිමාරුප්පවජ්ජිතා, යට යට අරූපාවචර ප්‍රතිසන්ධිය වර්ජිත කොට ඇත්තාවූ ; ආරුප්පසන්ධිව, අරූපාවචර ප්‍රතිසන්ධියද ; තථා, එපරිද්දෙන්ම ; කාමතිහෙතුකා, කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිහු සතරදෙනද ; හොන්ති, වෙත්. රූපාවචර චුතියා පරං, රූපාවචර චුතියෙන් මත්තෙහි ; අහෙතුක ප්‍රතිසන්ධිය වර්ජිතකොට ඇත්තාවූ දොළොස් සහෙතුක ප්‍රතිසන්ධිහු තුමූ ; සියුං, වන්නාහුය ; කාම තිහෙතුම්හාපරං, කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි චතුෂ්කයෙන් මත්තෙහි ; සබ්බා, සියලු එකුන්විස්සක් ප්‍රතිසන්ධිහුතුමූ නොහොත් සියලු විසි ප්‍රතිසන්ධිහු තුමූ; සියුං, වන්නාහුය. පන, අර්ථාන්තරයක් දක්වමි :—ඉතො පරං, කාමාවචර ත්‍රිහෙතුක ද්විහෙතුක චුතියෙන් මත්තෙහි; කාමෙසෙවච, එකොළොස් කාමභූමියෙහිම ; (පටිසන්ධියො, දස

ප්‍රකාරවූ ප්‍රතිසන්ධිහු තුමූ;) සියුං, වන්නාහුය, නොහොත්, කාමෙසුඑව, කාමාවචර ප්‍රතිසන්ධි දශදෙනම, සියුං, වන්නාහුය.

අයං, මේ වනාහි ; එත්ථ, මේ පරිච්ඡෙදයෙහි ; චුතිපටිසන්ධික්කමො, ච්‍යුතිප්‍රතිසන්ධීන්ගේ : ක්‍රමයයි.

පන, ච්‍යුතිප්‍රතිසන්ධි පරම්පරාවෙන් අන්‍යවූ භවාඞ්ගපරම්පරාව දක්වම් ;— පුබ්බෙ ව යථාවුත්තනයෙන. යම් යම් පරිද්දෙකින් කියනලද්දවූ ක්‍රමයෙන්; ගහිතපටිසන්ධිකානං, ගන්නාලද ප්‍රතිසන්ධි ඇති පුද්ගලයන්ට ; පටිසන්ධි නිරොධානන්තරතො, ප්‍රතිසන්ධිචිත්තයාගේ නිරොධයවූ තැන්පටන්; තමෙව ආලම්බණං, ඒ ප්‍රතිසන්ධි චිත්තයාගේ අරමුණම ; ආරබ්භ, අරමුණුකොට ගෙණ ; තදෙව චිත්තං, ඒ පටිසන්ධි චිත්තයම ; යාවචුතිචිත්තුප්පාද, චුතිචිත්තොත්පත්තිය දක්වා ; වීථිචිත්තුප්පාදෙ අසති, වීථිචිත්තයාගේ ඉපදීමෙක් නැති කල්හී හෙවත් පඤ්චද්වාරාවජ්ජනය. චක්ෂුර් විඥනය පඤ්චද්වාරාවජ්ජනය, ශ්‍රොත්‍රවිඥනය පඤ්චද්වාරාවජ්ජනය—ඝ්‍රාණ විඥනය—පඤ්චද්වාරාවජ්ජනය—ජිව්හා විඥානය—පඤ්චද්වාරාවජ්ජනය—කායවිඥානය—මනොද්වාරාවර්ජනය—ජවන්හුය, යනාදී වීථිචිත්තයන්ගේ ඉපදීමෙක් නැති කල්හී; භවස්ස, ප්‍රත්‍යොත්පන්න උපප්‍රාප්තිභවයාගේ; අඞ්ගභාවෙන, නොසිඳීමට අඞ්ගබැවින් ; භවඞ්ගසන්තතිසඞ්ඛාතං, භවාඞ්ග ප්‍රවාහයයි කියනලද්දවූ ; මානසං, සිත්තෙමේ ; අබ්බොච්ඡින්නං, නොසිඳෙන ලද්දේ ; නදීසොතොවිය, ගඞ්ගා ප්‍රවාහයක් මෙන් ; පවත්තති, හටගණිමින් පවත්නේයි. පරියොසානෙච, ආයුෂයාගේ කෙළවරද ; චවනවසෙන, ප්‍රත්‍යොත්පන්න භවයෙන් ගිලීම් වශයෙන් ; චුතිචිත්තංහුත්වා, චුතිසිතක්ව ; නිරුජ්ඣති, නිරුද්ධවන්නේයි, තතොපරංච, ඒ චුති චිත්තයාගේ නිරොධයෙන් මත්තෙහිද ; පටිසන්ධාදයො, ප්‍රතිසන්ධිආදීවූ චිත්තයෝතුමූ ; යථාක්කමං, දැන් මෙහි කියනලද ක්‍රමයෙන්ම ; රථචක්කං ඉව, රථචක්‍රයක් මෙන් ; පරිවත්තන්ති එව, පෙරළෙන්නාහුම හෙවත් පෙරළෙමින්ම ; වත්තන්ති, හට ගණිත්.

---

## ගාථාර්ථ.

ඉහ, මේ ප්‍රත්‍යොත්පන්න භවයෙහි; පටිසන්ධිභවඞ්ග වීථියො, ප්‍රතිසන්ධිභවාඞ්ග වීථිචිත්තයෝද ; චුතිච, චුතිචිත්තයද ; පරිවත්තන්තියථා, යම්සේ පෙරළෙන්නාහුද ; තථා, එපරිද්දෙන්; පුන, නැවත ; භවන්තරෙ, අනතුරු භවයෙහි ; පටිසන්ධි භවඞ්ග

ඉති, ප්‍රතිසන්ධිභවාඞ්ගය ආදිකොට ඇත්තාවූ ; අයං චිත්ත සන්තති, මේ චිත්තපරම්පරතොමෝ ; පරිවත්තති, පෙරළෙත් නේයි. පන, සංසාර චක්‍රයාගේ භ්‍රමණයෙන් අන්‍යවූ සංසාර චක්‍රයාගේ විනාශය දක්වමි :- බුද්ධා, ප්‍රාඥයෝතුමූ ; අධුවං ; අනන්තානන්තස්වභාව ඇත්තාවූ නොහොත් සදාකාලික නොවන්නාවූ ; එතං, මේ වෘත්ත ධර්මය ; පටිසඞ්ඛාය, විදර්ශනානුවකින් පරීක්ෂාකොට දැන ; චිරාය, බොහෝකලක් මුලුල්ලෙහි හෙවත් උත්කෘෂ්ට පරිච්ඡෙදයෙන් සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක් හා නිකෘෂ්ටපරිච්ඡෙදයෙන් කප්ලක්ෂයක් මුලුල්ලෙහිද ; සුබ්බතා, දාන ශීල භාවනා සංඛ්‍යාතවූ යහපත් වෘත්ත ඇත්තාහුයයි ; සුසමුච්ඡින්නසිනෙහබන්ධනෙන, මොනවට මාර්ගයකරණ කොටගෙණ අනුත්පාදනිරොධයෙන් සිඳිනාලද තෘෂ්ණා බන්ධන ඇත්තාහුයයි ; අච්චුතං, ගිලිහීමක් නැත්තාවූ හෙවත් පහවීමක් නැත්තාවූ ; පදං ; නිර්වාණපදය ; අධිගන්ත්වා, මාර්ගඥාන ඵලඥානයන්ගෙන් දැක ; සම්මං, සියලු වෘත්ත දුඃඛය සංසිඳුවන්නාවූ නිරුපධිශෙෂ නිර්වාණධාතු සංඛ්‍යාත සන්සිඳීමට ; එස්සන්ති, පැමිණෙත්.

(අභිධම්මත්ථ සඞ්ගහෙ) අභිධර්මාර්ථ සංග්‍රහ නම්වූ ප්‍රකරණයෙහි ; වීථිමුත්තසඞ්ගහවිභාගොනාම, වීථිමුක්තසංග්‍රහ විභාග නම්වූ ; පඤ්චමො පරිච්ඡෙදො, පස්වන පරිච්ඡෙදය ; ඉති, මෙසේ ; සමාප්ත කරණ ලද්දේයි.

---

## භාවය.

භවයෙහි උපන්නාවූ සත්වයෝතුමූ ආයුෂගෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති. කර්මයගෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති. ආයු කර්ම දෙදෙනාගේ ගෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති යුහුසුළුව උන් තැන් පහකරන්නාවූ උපච්ඡෙදක කර්මයෙන්ද කාලක්‍රියා කෙරෙති. මෙසේ සතරාකාර මරණයන් අතුරෙන් දහසක් හවුරුද්දට ආයුෂ ඇති සමයකින් උපන් සත්වතෙමේ දහසක් හවුරුද්ද ගෙවීමෙන් වන්නාවූ මරණය ආයුක්ඛය මරණ නම් වේ. දහසක් හවුරුද්දව ආයුෂ ඇති කාලයෙක්හි පන්සියයක් හවුරුදු විපාකදිය යුතුවූ කර්මයකින් ඉපිද ඒ කර්මවෙගය සිඳීයාමෙන් පන්සියයක් හවුරුද්දෙන් වන්නාවූ මරණය කර්මක්ෂය මරණය නම් වේ. අසූහවුරුද්දකට ආයුෂ ඇති කාලයෙහි අසූහවුරුද්දම විපාක දියහැකි කර්මයකින්

ඉපිද අසූහවිරුද්දෙන් මියයාම ආයුකර්ම දෙදෙනාගෙන් වන්නාවූ මරණයයි. අසූහවිරුද්දක් ආයුෂ ඇති කාලයෙක්හි අසූහවිරුද්දක් විපාක දියහැකි කර්මයකින් උපන් සත්වතෙමේ සතළිස් හවිරුදු කාලයෙහි යුද්ධයකට හසුවීමෙන් හෝ වෘක්ෂයකින් වැටීමෙන් හෝ දියෙහි වැටීමෙන් හෝ විෂ භක්ෂණයෙකින් හෝ වන්නාවූ මරණය උපච්ඡේදක මරණය නම්වේ. මේ සතරාකාර මරණයන් අතුරෙන් උපච්ඡේදක මරණය ප්‍රේත ලෝකය අසුරනිකාය තිරිසන් අපාය මනුෂ්‍යලෝකය විනිපාතික අසුරාදී භූමාටුදෙවියෝය යන මොවුන් කෙරෙහිම ලැබෙන්නේයි. ඥාතිප්‍රේතාදී විනිපාතික අසුරයෝ තුමූ චාතුර්මහාරාජික භූමියෙහි ඇතුලත්වන හෙයින් චාතුර්මහාරාජිකභූමියෙහිද උපච්ඡේදක මරණය ඇත්තේයයි කියයුතුයි. මනුෂ්‍ය භූමියක හා චාතුර්මහාරාජික භූමියකද අතරතුර අනික්භූමියක් නැතිහෙයින් භූමිනිශ්‍රිතව උපදනා විනිපාතික අසුර සංඛ්‍යාතවූ මලයක්‍ෂාදී සියලු භූමාටු දෙවියෝද චාතුර්මහාරාජිකායෙහිම ඇතුලත් වෙති. තාවතිංස භවනය පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය දක්වා ඇත්තාවූ සියලු සුගතිභූමිය අටමහානරකය උතුරුකුරුදිවයිනය යන මෙකී තන්හි උපච්ඡේදක මරණය නොලැබෙන්නේයි, උපච්ඡේදක මරණය නොලැබෙන්නාවූ සියලු තන්හිම අවශේෂවූ ත්‍රිවිධාකාර මරණයම ලැබෙන්නේයි. මේ සතරාකාර මරණයම එකම තෙලප්‍රදීප උපමාවෙන් දැක්විය යුතුයි. තෙලප්‍රදීපය වනාහි තෙල් ගෙවීමෙන්ද, පහන්වැටිය ගෙවීමෙන්ද, තෙල් පහන්වැටි දෙදෙනාගේම ගෙවීමෙන්ද, තෙල් පහන්වැටි විද්‍යමානව තිබියදීත් බලවත් පවන් වැදු නිවීමද, මේ සතරාකාර මරණයට උපමාවෙයි. තෙල් ගෙවීමෙන් වෙන්නාවූ මරණය කර්මක්‍ෂය මරණයටද, තෙල් තිබියදී පහන්වැටිය ගෙවීමෙන් වන්නාවූ මරණය ආයුක්‍ෂය මරණයටද, තෙල් පහන්වැටි දෙකම ගෙවීමෙන් වන්නාවූ මරණය උභයක්‍ෂය මරණයටද, තෙල් පහන්වැටි තිබියදී බලවත් පවනින් වන්නාවූ නිවීම උපච්ඡේදක මරණයටද, උපමා කටයුතුයි. මරණාසන්න කාලයෙහි කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තය යන තුන්දෙනා අතුරෙන් යම්කිසි අරමුණක් සවස් කාලයෙහි පර්වතච්ඡායාව පූර්වදිසාවට වැටෙන්නාක් මෙන් මරණාසන්නකාලයට එළඹෙන්නේයි. ඒ එළඹෙන්නාවූ කර්ම කර්මනිමිති ගතිනිමිති යන තුන මාතා පිතෘ ඥාති මිත්‍රාදීන් විසින් එළවන්නේද ආචාර්‍ය උපාධ්‍යායාදීන් විසින් එළවන්නේද මහේශාක්‍ය මහානුභාව සම්පන්නවූ දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් එළවනු ලබන්නේද යනාදී මහත් සැකයක් උපදනේයි. ඒ කර්මාදිය

වනාහි කර්මානුභාවයෙන්ම වැටහෙන්නේයි. එක් සත්ත්වයෙකුට ඇත්තාවූ කර්මයන්ගේ සඞ්ඛ්‍යාව ගණනපථාතික්‍රාන්ත බැවින් ඒ මහත්වූ කර්මසමූහයන් අතුරෙන් කවර කර්මයක්හු විසින් එළවනු ලබන්නේද යත්? අනතුරු භවයෙහි ප්‍රතිසන්ධිය ඉපදවීමට නියතවූ ප්‍රතිසන්ධි ජනක කර්මය විසින් එළවනු ලබන හෙයින් සත්ත්වයා උපදවන්නාවූ ඊශ්වරයා නම් කර්මයයි. විශුද්ධිමාර්ග ඉන්ද්‍රියනිර්දේශයෙහි ආයේයි. "උපලද්ධපුබ්බකට" යන පදයෙහි අර්ථයනම්:— දඬුමුගුරු ආයුධ ආදියයි. "උපකරණභූතව" යන්නෙහි අභිප්‍රායනම්:- මල්පහන් ආදිවූ පූජාවස්තුයි. දඬුමුගුරු අවිආයුධාදිය වනාහි අකුශලකර්ම නිමිත්තයි. විහාරය ප්‍රතිමාලය චෛත්‍යය චීවරාදිය යන මේ පූජාවස්තු වනාහි කුශල කර්මනිමිත්තයි. නරකාග්නි නිරයපාල කාළසුනඛාදීහු වනාහි අකුශල ගතිනිමිත්තයි. දිව්‍යප්සරා කල්පවෘක්ෂ උද්‍යානාදීහු වනාහි කුශල ගතිනිමිත්තයි. කර්මනිමිත්ත වැටහීම වනාහි යම් කිසි ආයුධයකින් ඇන ගවයෙක් මරා අනතුරු අත්බැව්හි ඒ කර්මය-විපාක දියයුතු නම් මරණාසන්න ජවනයන්ට ස්වප්නයකින් පෙනෙන්නාක් මෙන් ඒ ගවයා වැටහෙයි. කුශල කර්මයෙහි මේ ක්‍රමය අනුව අර්ථ දතයුතුයි. මෙම ලක්දිව්හි සෝණ නම් පර්වතය සමීපයෙහි වැඩවිසූ සෝණ ස්ථවිරයන්ගේ පිතෘ වන මහාසාමණේරයන්ගේ මරණාසන්නයෙහි පළමුවෙන් අකුශල කර්ම ගතිනිමිති වැටහී ඊට අනතුරුව දිව්‍යාප්සරාවන් වැටහුනු බැවින් කුශලාකුශල කර්මවයටම සෝණ ස්ථවිර වස්තුව උදාහරණ කටයුතුයි. මරණින් මතු ප්‍රේතලෝකයෙහි උපදින සත්ත්වහට මහත්වූ ආරණ්‍ය පර්වතපාදාදිය ගතිනිමිති වශයෙන් වැටහෙයි. මේ කර්ම කර්මනිමිති ගතිනිමිති වැටහීම කවරෙකු විසින් එළවනු ලැබේදැයි යතහොත්? කුශලාකුශල කර්මානුභාවයෙන්ම වැටහෙයි. කවරවාරයෙක්හි වැටහෙන්නාහුදයත්? කර්මය වනාහි මනොද්වාරයෙහිම වැටහෙයි. ඒ වනාහි එකාන්ත නාමධර්මයකි. කර්මනිමිත්ත වනාහි ෂඩ්වාරයෙහිම රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම වශයෙන් වැටහෙයි. ගතිනිමිත්ත වනාහි එකාන්ත රූපාලම්බණයම බැවින් ස්වප්නයක් දකින්නාවූ කලක් මෙන් මනොවාරයටම වැටහෙයි. "පරිසුද්ධං උපක්කිලිට්ඨංවා" යන්නෙහි "පරිසුද්ධං" යනු කුශල කර්මනිමිති ගතිනිමිති වෙත්. "උපක්කිලිට්ඨං" යනු අකුශල කර්මනිමිති ගතිනිමිතිවෙත්. අනතුරු භවයෙහි ලැබියයුතුවූ භවයට නැමුනාක් මෙන් චිත්තපරම්පරා තොමෝ නිරන්තරයෙන් පවත්නේවෙයි. අතීත ජාතියෙහි සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත

සිතින් යුක්තව දන වස්තු ආදිය බෙදීමක් හෝ ශීලභාවනාදී පුණ්‍යක්‍රියාවක් හෝ රැස්කෙළේ වී නම් අනතුරු අත්බැව්හි විපාකදිය යුතුවූ ඒ කුශලකර්මය මරණාසන්නයෙහි වැටහී ඒ කර්මය රැස්කළාවූ සමයෙහි මෙන් මහත්වූ සොම්නස් උපදු නේයි. "අභිනව කරණ වශයෙන" යන්නෙහි අභිප්‍රාය නම්:— යම් කුශලකර්මයක් හෝ අකුශලකර්මයක් හෝ අනතුරු භව යට යායුතු නම් ඒ කර්මය රැස්කරන්නාවූ කාලයෙහි කළාක් මෙන් මරණාසන්නයෙහිද අළුතින් කරණ ලද්දේවෙයි. "සවත්ථුකං අවත්ථුක මෙව වා" යන්නෙහි අභිප්‍රාය නම්:—එකොළොස් කාමභූමිය පසළොස් රූපභූමිය; යන පඤ්චවොකාර භව යෙහි හෙවත් පඤ්චස්කන්ධයකින් යුක්තවූ භවයෙහි හෘදය වස්තුව ආශ්‍රයකොටගෙණ හෙවත් හෘදය වස්තුව උපද වමින්ම පටිසන්ධි විඥානය පිහිටයි. චතුවොකාර භව සඞ්ඛ්‍යාතවූ සතරඅරූපභූමියෙහි රූපයනැති බැවින් ප්‍රතිසන්ධි විඥානය අවස්තුකව පිහිටයි. "අවිජ්ජානුසය පරික්ඛිත්තෙන" යන්නෙහි අභිප්‍රාය නම්:— සතර අපායෙහි උපදනා සත්වයන්ට උපදනා ලොභසහගත මරණාසන්න ජවන වීථියෙහි අවිද්‍යාව සම්ප්‍රයුක්තවම ලැබෙයි. සුගතියෙහි උපදනා සත්වයන්ට මරණාසන්නයෙහි කාමාවචර කුශලචිත්තවීථිය උපදනේ නමුදු මාර්ගයෙන් අවිද්‍යාව ප්‍රහාණය නොකළ බැවින් අනුසයවශයෙන් පැවති අවිද්‍යාව විසින් වටකරණු ලැබෙයි. තෘෂ්ණාසඞ්ඛ්‍යාතවූ මූලය හෙතුකොටගෙණ ප්‍රතිසන්ධිය උපදවන බැවින් රහතුන් ගේ චුතියෙන් අනතුරුව ප්‍රතිසන්ධියක් නැත්තේයි. "සම්පයුත්තෙහි පරිග්ගය්හමානං යන්නෙහි අභිප්‍රාය නම්:— ප්‍රතිසන්ධි චිත්තය හා එක්ව හටගන්නාවූ ස්පර්ශාදිවූ චෛතසික ධර්මයන් විසින් පිරිවරණු ලබන බැවින් "මනොපුබ්බඞ්ගමාධම්මා" යනාදී ගාථාවෙහි ආනයින් ප්‍රතිසන්ධිචිත්තය පෙරටුකොට ගමන් ගත් කල්හී අවශෙෂස්පර්ශාදිවූ චෛතසික ධර්මයෝද මේ අපගේ ළලයයි වැළඳගන්නාක් මෙන් ප්‍රතිසන්ධිචිත්තය ආශ්‍රය කොට ගෙණ පවත්නාහු වෙති. වර්තමාන භවය හා අනාගත භවය ගලපන අර්ථයෙන් ප්‍රතිසන්ධියයි ව්‍යවහාර කෙරෙති. ඛණ පච්චුප්පන්නය, සන්තති පච්චුප්පන්නය, අද්ධාපච්චුප්පන්නයයි පච්චුප්පන්නය ත්‍රිවිධාකාර වෙයි. ඔවුන් අතුරෙන් එක්ම රූප ධර්මයක්හුගේ ආයුෂවූ සතළොස් චිත්තක්ෂණ කාලය ඛණ පච්චුප්පන්නනම්වෙයි. එක අරමුණක් පිළිබඳව උපදනා යම් තාක් චිත්ත වීථිවන්නාහුනම් ඒ සියලු චිත්ත වීථින්ගේ කාලය සන්තතිපච්චුප්පන්නනම්වෙයි. ප්‍රතිසන්ධි චිත්තය පටන් චුති

චිත්තය දක්වා මේ අතර කාලය අබ්‍යාපච්චුප්පන්නනම්වෙයි. එක් භවයෙකින් චුතව අනික් භවයට යන්නාවූ සත්ත්වයා සම්බන්ධවූ පඤ්චස්කන්ධයෙන් යම් ස්කන්ධයක් අනික් භවයට යන්නේයයි කියා හෝ හාත්පසින් කිසිවක් නොයන්නේයයි කියා හෝ නොගතයුත්තේයි. පහනකින් පහනක් දල්වන්නාවූ කලක්මෙන්ද, කස්ත මුද්‍රාවක් ඔබාගන්නා කලක් මෙන්ද, පරිඝොෂකයාගේ වචනය විතිශ්චයකාරයාගේ සිතෙහි හටගන්නාක්මෙන්ද සජී. විෂ දූතයාහට මන්ත්‍රාදකය පෙවීමෙන් විෂ ආතුරයාගේ විෂ ව්‍යපසමනයවීමක්මෙන්ද චුතවන්නාහුගේ පඤ්චස්කන්ධය මෙහිම නිරුද්ධවන්නේ නමුදු කර්මවේගය කාරණකොටගෙණ මරණාසන්න ජවන වීථියෙහි උපදනා මරණාසන්නජවනයන් පස්දෙනා හා සම්ප්‍රයුක්තවූ චේතනා සඞ්ඛ්‍යාත බිජුවටින් නානාක්ෂණික කර්මශක්තිය ප්‍රධානකොටගෙණ අනතුරු භවයෙහි ප්‍රතිසන්ධිය උපදනේයි. මරණාසන්න කාලයෙහි ජවන් පසෙක්ම කුමක්හෙයින් උපදනාහුද යත්? අව්වෙහි දමනලද තාලපත්‍රයාගේ නීලවර්ණය ක්‍රමයෙන් නැතිවී අවුත් එක් තැනෙක රැස්වන්නාක්මෙන් චක්ෂු ශ්‍රොත්‍රාදී කර්මජ රූප සියල්ල නිරුද්ධවීගොස් අවශිෂ්ටව ඇත්තාවූ හෘදයවස්තුව නිසා පවත්නාවූ චිත්තය අතිශයින් දුර්වලවෙයි. එහෙයින් පස් වරෙක්ම උපදනාහුයයි දතයුතුයි. චුති චිත්තයද තදාලම්බණයට අනතුරු චුත්‍ය. තදාලම්බණයට අනතුරු භවාඞ්ගයද, ඒ භවාඞ්ගයට අනතුරු චුතියද, ජවනයන්ට අනතුරු චුතියද, ජවනයන්ට අනතුරුව භවාඞ්ගවී ඒ භවාඞ්ගයට අනතුරුව වන්නාවූ චුතියදයි සතරාකාරවන්නේයි. ඒ තදාලම්බණයට අනතුරු චුතියවන්නාවූ වීථියෙහි මනොද්වාර වර්ජනය පටන් මරණාසන්න ජවනයන් අවසන්කොට ඇත්තාවූ චිත්තයෝතුමූ රූපාලම්බණ කර්ම නිමිත්තක්ම අරමුණුකොට ගන්නාවූකල්හි රූපාලම්බණ තෙමේ ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව උපදනා සතරවෙනි භවාඞ්ග චිත්තයාගේ භඞ්ගය හා එකක්ෂණිකව නිරුද්ධවේ.එකල්හී ප්‍රත්‍යුත්පන්නවූ රූපාලම්බණ කර්මනිමිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ගයන්ට අරමුණුවන්නේහි. මේ ක්‍රමය එල්බගෙණ මතු මතු වීථිහුද දතයුත්තාහුය කර්ම නිමිත්ත වනාහි ප්‍රත්‍යුත්පන්නයයි කියේ නමුදු ඒකාන්ත ප්‍රත්‍යුත්පන්නය නොවෙයි. යමෙක් සිවුරක් පුද ඒ කුශලයෙන් සුගතියෙහි උපදනාකල්හි ඒ චීවර සඞ්ඛ්‍යාතවූ කර්ම නිමිත්ත ඒකාන්ත ප්‍රත්‍යුත්පන්නවශයෙන් නොවැටහෙන්නේමැයි. තත්සාදෘශ්‍යවූ කර්මනිමිත්තක් මරණාසන්න කාලයෙහි හටගන්නා බැවින් ප්‍රත්‍යුත්පන්නයයි ව්‍යවහාරකෙරෙත්. කර්ම කර්මනිමිති ගතිනිමි

තිහු කාල ආරම්මණ මාරයන්ගේවශයෙන් නියමකිරීම යට ආලම්බණ සංග්‍රහයෙහි ආනයින් දතයුත්තාහුය. අසංඥ සත්ව භූමියෙහි වනාහි රූපයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙති. සතර අරූප භූමියෙහි නාමයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙති. ඔවුන් කෙරෙන් අවශිෂ්ට පචවොකාර භූමියෙහි නාම රූපවයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙති. අරූපාවචර චුතියෙන් මත්තෙහි අරූපාවචර ප්‍රතිසන්ධි සතරය ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධිසතරය, යන මොවුන්ගේ වශයෙන් ප්‍රතිසන්ධි අටෙක් යථායෝගයෙන් වෙත්. වෙන් වෙන්ව භූමිවශයෙන් වනාහි ආකාශානඤ්චායතන චුතියට අනතුරුව එම ප්‍රතිසන්ධි අටම වෙත්. විඤ්ඤාණඤ්චායතන චුතියට අනතුරුව ආකාශානඤ්චායතන ප්‍රතිසන්ධි වර්ජිතකොට ඇත්තාවූ අරූපාවචර ප්‍රතිසන්ධිත්‍රය, ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි චතුෂ්කය, යන ප්‍රතිසන්ධි සතෙක්වෙත්. (ආකිඤ්චඤ්ඤායතන චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිචතුෂ්කය, ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිද්වය යන මොවුන්ගේ වශයෙන් සදෙනෙක් වෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතන චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක සතරය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිය යන පසෙක්වෙත්.) ඉම්පාඨයවිමසනු පුද්ගලවශයෙන්වනාහි ආකාශානඤ්චායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව සතර අරූප ප්‍රතිසන්ධිහුය. ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි සතරය, යනමොවුන්ගේවශයෙන් අටදෙනෙක් වෙත් එම භූමියෙහි සෝවාන් සකෘදාගාමී අනාගාමීහුවෙත්නම් සතර අරූපාවචර ප්‍රතිසන්ධිහුමවෙත්. රහත් පුද්ගලයෙක්වීනම් එක්ප්‍රතිසන්ධියකුත් නොවේ. විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි චතුෂ්කය, ආකාශානඤ්චායතන වර්ජිතකොට ඇත්තාවූ අරූපාවචර ප්‍රතිසන්ධිත්‍රය, යනමොවුන්ගේවශයෙන් සත්දෙනෙක් වෙත් සෝවාන් සකෘදාගාමි අනාගාමීහුවෙත්නම් අරූපාවචරප්‍රතිසන්ධිත්‍රයම ලැබෙයි. රහත්පුද්ගලයෙක්වීනම් එකකුදු නොලැබේ. ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි චතුෂ්කය, ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි යුගලය යනමොවුන්ගේ වශයෙන් සදෙනෙක්වෙත් සෝවාන් සකෘදාගාමි අනාගාමීහුවෙත්නම් ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියුගල මාත්‍රයක්වෙයි. රහත්පුද්ගලයෙක්වීනම් එකකුදු නොලැබෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි සතරය, නෙවසඤ්ඤා

නාසඤ්ඤායතන ප්‍රතිසන්ධිය, සත පසෙක්ම ලැබෙයි. සොතාපන්න සකෘදාගාමි අනාගාමිහුවෙත්නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි මාත්‍රයක්වෙයි. රහත්පුද්ගලයෙක්වීනම් එද නොලැබෙයි. අරූපභූමියෙන් චුතව කාමභූමියට එන්නාවූකල්හි අහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි කුමක්හෙයින් නොගන්නාහුද යත්? අරූපාවචර ධ්‍යාන චිත්තයට පූර්වභාගයෙහි උපදනා පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යන උපචාර ධ්‍යානයන්ගේ බලවත් බැවින් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය මුත් ද්විහෙතුක අහෙතුක ප්‍රතිසන්ධිහු නොගන්නාහුයයි දතයුතුයි. මතු මතු අරූපාවචර භූමියෙන් චුතවන්නාවූ බ්‍රහ්මයෝ තුමූ යට යට භූමියෙහි කුමක්හෙයින් නූපදනාහුද යත්? මතු මතු අරූපධ්‍යානයන්ට භාවනා වඩන්නාවූ යොගාවචරයෝ තුමූ යට යට අරූපධ්‍යානයන්ට පිළිකුල්ව මතු මතු ධ්‍යානයන් උපදවන්නාක්මෙන්ම මතු භූමියෙන් චුතව යට භූමියෙහි නූපදනාහුයයි දතයුතුයි. නොහොත් යට යට කුශලධ්‍යාන තෙමේ මතු මතු භූමියෙහි උපන්නාවූ බ්‍රහ්මයන්ට නොලැබෙනහෙයින් යට භූමියෙහි ඉපදීමට ධ්‍යානයක් නැත්තේයයි දතයුතුයි. "බ්‍රහ්මලොකගතා හෙට්ඨා" යනාදී ගාථාවෙහි ආක්‍රමයෙන් බ්‍රහ්මලොකයෙහි උපන්නාවූ ආර්‍ය්‍යයී තෙමේ ඌර්ධ්වංසොත බැවින් මතු බ්‍රහ්මලොකයෙක්හී රහත්ව පිරිනිවන් පානා පමණමුත් යට බ්‍රහ්මලොකයකට හෝ කාමධාතුවට හෝ එකාන්තයෙන් නොඑත්තේයයි දතයුතුයි. රූපාවචර චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි අටය, මහද්ගත ප්‍රතිසන්ධි නවය යනමොවුන්ගේ වශයෙන් සතළොස් ප්‍රතිසන්ධි කෙනෙක්වෙත්. භූමිවශයෙන් විභාගකරන්නාවූකල්හි ප්‍රථම ධ්‍යාන භූමියෙහි සතළොසෙක, ද්විතීයධ්‍යාන භූමියෙහි සතළොසෙක, තෘතීය ධ්‍යාන භූමියෙහි සතළොසෙක චතුර්ථධ්‍යාන භූමි සඞ්ඛ්‍යාත වෙහප්ඵල තලයෙහි සතළොසෙකැයි මෙසේ ප්‍රතිසන්ධිගණිත්. අසංඥසත්ව භූමියෙහි ප්‍රතිසන්ධි අටක්වෙත්. යට සුද්ධාවාස සතරෙහිවනාහී පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත එකම ප්‍රතිසන්ධියෙක්වෙයි. අකනිට්ඨ භූමියෙහිවනාහී එකම ප්‍රතිසන්ධිය කුදු නොවෙයි. පුද්ගලවශයෙන් වනාහී ප්‍රථම ධ්‍යාන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව අහෙතුක ප්‍රතිසන්ධි වර්ජිතකොටඇති සතළොස් ප්‍රතිසන්ධිකෙනෙක්වෙත්. සෝවාන් ශකෘදාගාමි අනාගාමිහුද වෙත්. රහත්පුද්ගලයෙක්වීනම් එකකුදු නොවෙයි. ද්විතීය ධ්‍යාන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව සතළොස් ප්‍රතිසන්ධි කෙනෙක්වෙත්. සොතාපන්න සකෘදාගාමීඅනාගාමීහුවෙත්නම් මහද්ගත ප්‍රතිසන්ධි නවයවෙයි. අර්හත්පුද්ගලයෙක්

වීනම් එකකුදු නොවෙයි තෘතීය ධ්‍යාන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව සතළොස් ප්‍රතිසන්ධිකෙනෙකක්වෙත්. සෝවාන් ආදී ආර්‍යයෝ තුන්දෙනවීනම් මහද්ගත ප්‍රතිසන්ධි නවය වෙත්. රහත් පුද්ගලයෙක්වීනම් එකකුදු නොවෙයි. වෙහප්ඵල භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව අහෙතුක ප්‍රතිසන්ධිවර්ජිතකොට ඇත්තාවූ සතළොස් ප්‍රතිසන්ධිහුවෙත්. සොතාපන්නාදී ආර්‍යකෙනෙක්වීනම්:—“වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙව පතිට්ඨිතා” යනාදී ක්‍රමයෙන් ඉදින් ඒ ආර්‍යයන්වහන්සේගේ අභිප්‍රායානුකූල පරිද්දෙන් එම භූමියෙහිම පඨමධ්‍යාන ප්‍රතිසන්ධි එකෙක් වෙයි. රහත්පුද්ගලයෙක්වීනම් එකකුත්නොවෙයි. යට සතර ශුද්ධාවාස භූමියෙහි අනාගාමීහු ඉදින් කැමැත්තාහුවීනම් පඨම ධ්‍යාන ප්‍රතිසන්ධි මාත්‍රයක් ගතහැකිවෙයි. රහත් පුද්ගලයෙක්වීනම් ඒද නොගන්නේයි. යටශුද්ධාවාසයෙහි රහත්වූ ආර්‍යයතෙමේ අකනිට්ඨභූමියෙහිද නැවත නූපදනේයි. අනාගාමි ආර්‍ය තෙමේ ශුද්ධාවාස භූමියෙහි නොරහත්ව පිරිනිවන් නොපානේමැයි. හෙවත් ඒකාන්තයෙන් රහත්ව පිරිනිවන් පානේයයි දතයුතුයි. අසංඥසත්ව භූමියෙහි එකම්සුගති පුද්ගලයෙක්ම ලැබෙයි. අසංඥසත්වභූමියෙන් චුතව ඒ පුද්ගල තෙමේ ඒකාන්තයෙන් කාම භූමියෙහි ත්‍රිහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි අටින් එකක්ම ගන්නේයි. කාමාවචර චුතියට අනතුරුව එකුන්විසි ප්‍රතිසන්ධි කෙනෙක් හෝ අසංඥ සත්ව ප්‍රතිසන්ධිය සමග විස්සෙක් හෝ ලැබෙන්නේයි. භූමිවශයෙන් කල්පණාකරණකල්හි සප්තකාම ස්වර්ගීයෙන් චුතවූයේනම් එකුන්විසි ප්‍රතිසන්ධිය හෝ විස්සම හෝ ලැබෙන්නේයි. සතර අපාය භූමියෙන් චුතවූ සත්ව තෙමේ දශප්‍රකාර කාමාවචර ප්‍රතිසන්ධීන්ගෙන් එක්තරා ප්‍රතිසන්ධියක්ම ගන්නේයි. පුද්ගලවශයෙන් කල්පණාකරන්නාවූ කල්හි සප්ත කාම භූමියෙහි සුගති අහෙතුක දුගති අහෙතුක පුද්ගලයෙක් චුතවීනම් කාමාවචර ප්‍රතිසන්ධි දශදෙනා අතුරෙන් එක්තරා ප්‍රතිසන්ධියෙක්මගන්නේයි. කාමාවචර ත්‍රිහෙතුක චුතියට අනතුරුව එකුන්විසි ප්‍රතිසන්ධිය හෝ අසංඥසත්ව ප්‍රතිසන්ධිය හා සමග විස්සම හෝ ලැබෙන්නේයි. කාමභූමියෙන් චුතවන්නාවූ සෝවාන් සකෘදාගාමි පුද්ගලයෝ තුමූ කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි සතරය මහද්ගත ප්‍රතිසන්ධි නවය යනමේ දහතුණෙන් එකක් ගන්නාහුමැයි, කාමභූමියෙහි අනාගාමී පුද්ගල තෙමේ මහද්ගත ප්‍රතිසන්ධි නවයෙන් එකක් ගණියි. අර්හත් පුද්ගලයෙක්වීනම් එකකුදු නැත්තේයි. සතර අපායෙහි එකම දුගතිඅහෙතුක පුද්ගලයෙක්වෙයි, එයින් චුතව එකල්හි අහෙතුක

ප්‍රතිසන්ධි යුගලය, සහෙතුක ප්‍රතිසන්ධි අටය යන දශයෙන් එකක් ගන්නේයි. අසංඥ සත්ව භූමියෙහි නාමයෙන් තොරව මහාකල්ප පන්සියයක් වැස කාමභූමියට එන්නාවූකල්හි නාම රූපවයෙන් යුක්තවූ ප්‍රතිසන්ධිය කුමක්හෙයින් ගන්නේදයත්? අසංඥසත්වය ලැබීමට හෙතුවූ සතරවෙනි ධ්‍යානය උපදවන කල්හී ඒ ධ්‍යාන සිතට පූර්වභාගයෙහිවූ උපචාර ජවනබලයෙන් යයි දතයුතුයි. බ්‍රහ්මලොකයෙන් චුතව කාම ධාතුයෙහි කුමක් හෙයින් අහෙතුක ප්‍රතිසන්ධියෙන් නූපදනේද යත්? ඒ ඒධ්‍යාන වීථියෙහි උපචාර ජවන චෙතනා බලයෙනැයි දතයුතුයි. යම් භවයෙක්හි ප්‍රතිසන්ධි වන පුද්ගලයෙක් තෙමේ ප්‍රතිසන්ධියට අනතුරුව යම්තාක් වීථි සිත් නූපදනාහුද ඒතාක්කල් මූලුල්ලෙහි ජලප්‍රවාහයක්මෙන් භවාඞ්ග ප්‍රවාහය නොකඩව බස්නේයයි දතයුතුයි. මිනිස් ලොව මව්කුශ උපදනාවුන්ට ප්‍රතිසන්ධියට අනතුරුව භවාඞ්ග දශයක් ඉපිද දෙවනුව මනොද්වාරාවර්ජනයක් හා භවනිකාන්ති ලොභ ජවන පසකින් යුක්ත ජවන වීථියක් ඉපිද තදනන්තරව භවාඞ්ග සිත් උපදින්නට පටන්ගණිත්. එතැන් පටන් නවමසක් හෝමූලුල්ලෙහි ගඞ්ගාශ්‍රොතසයක්මෙන් භවාඞ්ග සිත්ම පැවත මව් කුසින් නික්මෙනවා හා සමග පළමුකොට සූය්‍යාලොකාදිය දකිමෙන් චක්ෂුර්විඥානාදී වීථිසිත් ඉපදීමට පටන්ගණිත්. එතැන් පටන් ක්‍රමයෙන් සත්වයාගේ වැඩීමහෙතුකොටගෙණ භවාඞ්ග පරම්පරාව අඩුවී රූපාදී අරමුණු එල්බගෙණ වීථි සිත් උපදින්නාහුවෙත්. ඒ ඉපදීමද රූපයක් දක නැවත ශබ්දයක් අසන්නාවූකාලයෙහි අතර භවාඞ්ග බොහෝසෙයින් උපදිත්. නින්දට ගියකල්හී භාත්පසින්ම භවාඞ්ග පරම්පරාව පවතිත්. මෙසේ අසූ අනූ වයස්ගතවන කල්හී නැවතත් භවාඞ්ග පරම්පරාව වැඩෙයි. ඊට අනතුරුව ඇතිවන චුති සිතද භවාඞ්ගයාගේ අරමුණම එල්බගෙණ පවතියි. එක් භවයෙක්හී එක් සත්වයෙකුගේ භවාඞ්ගය චුතිය ප්‍රතිසන්ධිය යනමේ සිත් තුණ කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තය යන තුණෙන් එකක්ම අරමුණුකොට පවත්නේයි. මීට අනතුරු භවයෙහිද ඒ චිත්තයන්ගේ පැවතීම මේ භවයට කීසෙයින් දතයුතුයි. මෙසේ භ්‍රමනයවන්නාවූ සංසාර චක්‍රයාගේ දූව සඞ්ඛ්‍යාත කුශලාකුශලකර්ම සමූහය ශීල භූමියෙහි පිහිටා, සිටගෙණ ශ්‍රද්ධානැමති හස්තයෙන් අර්හත්මාර්ගඥාන නමැති කඩුව ගෙණ සිඳ බිඳ විනාශකොළේවීනම් සංසාර චක්‍රය විනාශවූයේයයි දතයුතුයි.

## භූමි විභාගය නිමි.

---

## චුති ප්‍රතිසන්ධි ක්‍රමයයි

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වීථි මුක්ත සංග්‍රහ විභාග
නම්වූ පස්වෙනි පරිච්ඡේදය නිමි.

# සවෙනි පරිච්ඡෙදය

## ( ප )

එත්තාවතා, (එත්තා වතාහි පමණි පරිච්ඡෙදයෙහි) මෙපමණවූ පඤ්චපරිච්ඡෙදයකින්; සප්පභෙදප්පවත්තිකා, ත්‍රිවිධ පරිච්ඡෙදයකින් කියනලද්දවූ හටගැණීම්ද ඇත්තාවූ; නොහොත් උද්දෙස නිද්දෙස පටිනිද්දෙසයන්ගේවශයෙන් කියනලද්දවූ ප්‍රභෙද හා ප්‍රවෘත්ති ප්‍රතිසන්ධීන්ගේවශයෙන් කියනලද්දවූ හටගැණීම්ද ඇත්තාවූ; චිත්තචෙතසිකා ධම්මා, චිත්තචෛතසික සංඛ්‍යාතවූ ස්වභාව ධර්මකෙනෙක්; හි, (යස්මා) යම්හෙයකින්; මයා, මා විසින්; විභත්තා, බෙදනලද්දහුවෙත්ද; තස්මා, එසේ බෙදනලදහෙයින්; ඉදානි, (ඉදානි) දැන් වනාහි; රූපං, රූපය; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනුලැබේ.

සමුද්දෙසාච, සංක්ෂෙපයෙන් රූපය ප්‍රකාශකිරීම් වශයෙන්ද; විභාගාච, රූපයබෙදීම්වශයෙන්ද; සමුට්ඨානාච, චක්ෂුර්දශකාදි රූපයන්ගේ හටගැණීම්වශයෙන්ද; කලාපතොච, චක්ෂුර්දශකාදී රූපයන්ගේ කලාපවශයෙන්ද; පවත්තික්කමතොච, භවකාල සත්ව ප්‍රභෙදයෙන් රූපයන්ගේ හටගැණීම් වශයෙන්ද; ඉති, මෙසේ; තත්‍ථ, ඒ රූප සංග්‍රහයෙහි; පඤ්චධා, පස්ප්‍රකාරයකින්; සඞ්ගහො ඉති, සංග්‍රහයවෙයි.

චත්තාරි මහාභූතානිච, සතරමහා භූතරූපකෙනෙක්ද චතුන්නංච මහාභූතානං, සතරමහාභූතයන්; උපාදායරූපංච, කාශ්‍රයකොට ගෙණ හටගත්තා රූපයද; ඉති, මෙසේ; දුවිධම්පි, ද්විප්‍රකාරවූද; එතං රූපං, ඒ රූප තෙමේ; එකාදසවිධෙන, එකොළොස් ප්‍රකාරයකින්; සඞ්ගහං ගච්ඡති, සංග්‍රහයට හෙවත් ව්‍යවහාරයට පැමිණේ. කථං? කෙසේ සංග්‍රහයට යන්නේද යත්? පඨවි ධාතු, පෘථිවි ධාතුවය; ආපොධාතු, ආපොධාතුවය, තෙජොධාතු, තෙජොධාතුවය, වායොධාතු, වායොධාතුවය; භූතරූපංනාම, භූතරූපනම්වේ. චක්ඛුං, චක්ෂුප්‍රසාදයද; සොතං, ශ්‍රොත්‍රප්‍රසාදයද; ඝාණං, ඝ්‍රාණප්‍රසාදයද; ජිව්හා, ජිව්හාප්‍රසාදයද; කායො කායප්‍රසාදයද; පසාදරූපංනාම, ප්‍රසාදරූපනම්වේ. රූපං, රූපාලම්බණයද; සද්දො, ශබ්දාලම්බණයද; ගන්ධො, ගන්ධාලම්බණයද; රසො, රසාලම්බනයද; ආපොධාතු විවජ්ජිතං, ආපොධාතුවර්ජිතකොට ඇත්තාවූ; භූතත්තය සංඛාතං, භූත රූප තුන්දෙනාගේ සමුදායයි කියනලද්දවූ;

ඵොට්ඨබ්බං, ස්පර්ශාලම්බණයද; ගොචරරූපං නාම, ගොචර රූප නම්වේ; ඉත්ථත්තං, ස්ත්‍රීභාවරූපයද; පුරිසත්තං, පුරුෂභාවයද, භාවරූපං නාම, භාවරූප නම්වේ. හදයවත්ථු, හෘදයවස්තු තෙමේ; හදයරූපං නාම, හෘදය රූප නම්වේ. ජීවිතින්ද්‍රියං, ජීවිතෙන්ද්‍රියය තෙමේ; ජීවිත රූපං නාම, ජීවිත රූප නම්වේ. කබලීකාරො, කබලුකොට අනුභවකරන්නාවූ; ආහාරො ආහාර තෙමේ; ආහාර රූපං නාම, ආහාර රූප නම්වේ. ඉති (ඉමිනාපභෙදෙන) මේ ප්‍රභෙදයෙන්; අට්ඨාරසවිධංපි, අටළොස් වැදෑරුම්වූද; එතං රූපං, මේ රූප තෙමේ; සභාවරූපනතිච, කැකුළු බැව් ආදී තම තමාගේ ස්වභාවවශයෙන් ලැබියයුතු බැවින් සභාව රූපයයි කියාද; සලක්ඛණ රූපනතිච, අනිත්‍යාදී ලක්ෂණයන් හා සමග හටගන්නාහෙයින් සලක්ඛණ රූපයයි කියාද; නිප්ඵන්න රූපනතිච, පරිච්ඡෙදාදී ස්වභාව හැර තම තමාගේ ස්වභාවවශයෙන්ම; කර්මාදී සතර ප්‍රත්‍යයන් විසින් නිපදවනහෙයින් නිෂ්පන්න රූපයයි කියාද; රූපරූපංච, ශීතොෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයක් ඇතිකල්හි විකාර ස්වභාවය ඒ ශීතොෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයන් විසින් විකාරකරවිය යුතු ස්වභාව ඇතිහෙයින් රූපරූපයයි කියාද; සම්මසන රූපනතිච, පරිච්ඡෙදාදී ස්වභාවය ඉක්මවා ස්වභාවවශයෙන්ම ලැබියයුතු හෙයින් අනිත්‍ය දුඃඛ අනාත්ම යයි කියනලද්දාවූ ලක්ෂණත්‍රයාරොපණයකිරීමෙන් සම්මර්ශනය කිරීමට සුදුසු බැවින් සම්මසන රූපයයිකියාද; සඞ්ගහං ගච්ඡති, සංග්‍රහයට හෙවත් ව්‍යවහාරයට පැමිණේ. ආකාසධාතු, ආකාශ ධාතු තෙමේ; පරිච්ඡෙද රූපං නාම, පරිච්ඡෙද රූප නම් වේ. කායවිඤ්ඤත්ති, කායවිඥප්තියද; වචීවිඤ්ඤත්ති, වාග්විඥප්ති යද, විඤ්ඤත්ති රූපං නාම, විඥප්ති රූප නම්වේ. රූපස්ස, අට ළොස් නිෂ්පන්න රූපයාගේ; ලහුතා, සැහැල්ලුබවද, මුදුතා, මෘදුබවද, කම්මඤ්ඤතා, කර්මයෙහි යහපත්බවද; විඤ්ඤත්ති වයං, විඥප්තිරූපවයද; විකාර රූපං නාම, විකාර රූප නම්වේ. රූපස්ස, චක්ෂුරාදී රූපයන්ගේ, උපචයො, ප්‍රථමොත්පත්තියද; සන්තති, නැවත නැවත හටගැනීමද; ජරතා, දිරීමද; අනිච්ච තා, භාත්පසින් රූපයාගේ බිඳුමද; ලක්ඛණරූපං නාම, ලක්ෂණරූප නම්වේ. පන, අනිකක් කාරයක් දක්වමි:—එත්ථ, මේ ලක්ෂණ රූපයන් සතරදෙනා අතුරෙන්; ජාතිරූපමෙව, එකම ජාති රූපයම; උපචය සන්තතිනාමෙන, උපචය නමින් හා සන්තති නමින්ද; පවුච්චති, ප්‍රභෙදකොට කියනුලැබේ; ඉති, මෙසේ; එකාදසවිධම්පි, එකොළොස් වැදෑරුම්වූද; එතං රූපං, මේ රූප තෙමේ; සරූපවසෙන, තම තමාගේ ස්වකීය ස්වරූපවශයෙන්

නොහොත් තම තමාගේ සවභාවවශයෙන්; අෂ්ඨවීසති විධං හොති, අටවිසිවැදෑරුම් වෙයි. කථං?, කෙසේද යත්?

භූතප්පසාදවිසයා, භූතරූප සතරය; ප්‍රසාද රූපපසය, ගොචරරූප සතරය, යනමොවුන්දෑ; භාවො, භාවරූපවයද; හදයම්චාපි, හෘදයරූපයද, ජීවිතාහාර රූපෙහි, ජීවිත රූපආහාර රූපයන් හා සමග; අෂ්ඨාරසවිධං, අටළොස් වැදෑරුම්වූ; (නිප්ඵන්නංච) නිෂ්පන්න රූපයද; තථා, එසින් අන්‍යවූ; පරිච්ඡෙදෝච, පරිච්ඡෙද රූපයද; විඤ්ඤත්තිච, විඥප්ති රූපමයද; විකාරොච, විකාරරූපත්‍රයද; ලක්ඛණන්තිච, ලක්ෂණ රූපසතරද; ඉති, මෙසේ; දසඅනිප්ඵන්නාච, අනිෂ්පන්න රූපයෝ දසදෙනද; ඉති, (ඉමිනා භෙදෙන) මේ ප්‍රභෙදයෙන්; අෂ්ඨවීසවිධංභවෙ, අටවිසි වැදෑරුම් වේ.

අයං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මේ රූප සංග්‍රහයෙහි නොහොත් රූපසමුද්දෙසාදී පංචසමුද්දෙසයන් අතුරෙන්. රූපසමුද්දෙසා, රූපසංක්ෂෙපයෙන් ප්‍රකාශකරන්නාවූක්‍රමයයි.

## රූප සමුද්දෙසය නිමි.

———o———

පන, රූප සමුද්දෙසයෙන් අන්‍යවූ රූප විභාගය කියමි:- සබ්බංච, සියලුම; මෙහි "ච" ශබ්දය එවකාරාර්ථයි; එතං රූපං, ඒ රූප තෙමේ; අහෙතුකං, අලොභාදී සම්ප්‍රයුක්ත හෙතු නැති හෙයින් අහෙතුකනම්වෙයි. සප්පච්චයං, කර්මචිත්ත සෘතු ආහාර සංඛ්‍යාත සතර ප්‍රත්‍යය ධර්මයන් හා යටගත්හෙයින් සප්පච්චය නමුදුවෙයි. සාසවං, චතුරාශ්‍රව ධර්මයන්ට අරමුණුවනහෙයින් සාසවනමුදුවෙයි. සංඛතං, කර්මචිත්ත සෘතු ආහාර යන සතර ප්‍රත්‍යයන් විසින් සකස්කළහෙයින් සංඛත නමුදුවෙයි. ලොකියං, සතර උපාදානයන්ට අරමුණුවූ සංස්කාර ලොකයෙහි ඇතුලත්වනහෙයින් ලොකිය නමුදුවෙයි. කාමාවචරං, කාමතෘෂ්ණාවගේ හැසිරීමට ගොචර ස්ථානවනහෙයින් කාමාවචර නමුදුවෙයි. අනාරම්මණං, චිත්ත චෛතසිකයන්මෙන් අරමුණුනොගන්නාහෙයින් අනාරම්මණ නමුදුවෙයි. අප්පහාතබ්බං, තදඞ්ගප්‍රහාණවිෂ්කම්භනප්‍රහාණ සමුච්ඡෙද ප්‍රහාණයන්ගේ වශයෙන් නොපෑහිය යුතුහෙයින් අප්පහාතබ්බ නමුදුවෙයි. ඉති, මෙසේ; එකවිධම්පි, එක්වැදෑරුම්වූද; රූපං, රූප තෙමේ; අජ්ඣත්තික බාහිරාදිවසෙන, අධ්‍යාත්මික බාහිරාදීන්ගේවශයෙන්; බහුධා, අනෙකප්‍රකාරයෙන්; භෙදං ගච්ඡති, ප්‍රභෙදයට යේ. කථං?, කෙසේ ප්‍රභෙදයට යන්නේද යත්? පසාද සංඛාතං, පංචප්‍රසාද යයි කියනලද්දාවූ; පංචවිධම්පි රූපං, පස් වැදෑරුම්වූද රූපය;

අජ්ඣත්තික රූපං නාම, අධ්‍යාත්මික රූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ තෙවිසිවැදෑරුම් රූප තෙමේ; බාහිර රූපං, බාහිර රූපනම්වේ. පසාදහදය සංඛාතං, ප්‍රසාද රූප පසය, හෘදය රූපයයි කියනලද්දාවූ; ඡබ්බිධම්පි රූපං, සවැදෑරුම්වූද රූපතෙමේ; වත්ථුරූපං නාම, චිත්ත චෛතසිකයන්ගේ ඉපදීමට කාරණාවනහෙයින් වත්ථුරූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ දෙවිසි රූපය; අවත්ථුරූපං නාම, අවත්ථුරූපනම්වේ පසාද විඤ්ඤත්ති සංඛාතං; පචප්‍රසාදය විඤ්ඤත්තිද්වයයි කියනලද්දාවූ; සත්තවිධම්පිරූපං, සත්වැදෑරුම්වූද රූපය; ද්වාරරූපං නාම; චිත්තචෛතසික කායවාක් කර්මයන්ගේ නික්මීමට ද්වාරවන හෙයින් ද්වාරරූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ එක්විසි රූපය; අද්වාරරූපං නාම, අද්වාරරූපනම්වේ. පසාදභාව ජීවිත සංඛාතං, පචප්‍රසාදය භාවරූපද්වය ජීවිතෙන්ද්‍රියයයි කියනලද් දාවූ; අෂ්ටවිධම්පි රූපං, අටවැදෑරුම්වූද රූපය; ඉන්ද්‍රියරූපං නාම, ඊශ්වරාධිකරණහෙයින් ඉන්ද්‍රිය රූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ විසිවැදෑරුම්රූපය; අනින්ද්‍රිය රූපං නාම, අනින්ද්‍රි යරූපනම්වේ. පසාදවිසය සංඛාතං, පචප්‍රසාදය විෂයරූප සතරයයි කියනලද්දාවූ; ද්වාදසවිධම්පිරූපං, දොළොස් වැදෑරුම් වූද රූපය; ඔළාරිකරූපං නාම, ඖදාරික රූපනමුදුවේ. නො හොත් රළු පරුෂ රූපනම්වේ. සන්තිකෙරූපංච, සන්තිකෙ රූපනමුදුවේ; හෙවත් ලංවූ රූප නමුදුවේ. සප්පටිඝ රූපංච; සප්පටිඝ රූපනමුදුවේ. හෙවත් හැපීම් ඇත්තාවූ රූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ සොළොස් රූප තෙමේ; සුඛුමරූපංච; සියුම් රූප නමුදුවේ. දූරෙරූපංච, දූරෙරූප නමුදුවේ. හෙවත් දුර පිහිටි රූපනමුදුවේ. අප්පටිඝරූපංච, අප්පටිඝ රූපනමුදුවේ. හෙවත් හැපීම් නැත්තාවූ රූපනමුදුවේ. කම්මජං, අටළොස් කර්මජරූප තෙමේ; උපාදිණ්ණරූපං නාම, උපාදිණ්ණ රූපනම් වේ. නොහොත් අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණාදෘෂ්ටීන් විසින් ලංකොටගන්නාලද්දාවූ කර්මය විසින් තමාගේ ඵලවශයෙන් ගන්නාලදහෙයින් උපාදිණ්ණ රූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ තිජ රූප තෙමේ; අනුපාදිණ්ණ රූපං නාම, අනුපා දිණ්ණ රූපනම්වේ. හෙවත් යටකී අර්ථයෙන් නොගන්නාලද හෙයින් අනුපාදිණ්ණ රූපනම්වේ. රූපායතනං, රූපායතන තෙමේ; සනිදස්සන රූපං නාම, සනිදස්සන රූපනම්වේ. හෙවත් දැකීම් සහිතව හටගන්නාවූ රූපනම්වේ. ඉතරං, මෙසින් අන්‍යවූ සත්විසි රූපතෙමේ; අනිදස්සන රූපං නාම, අනිදස්සන රූපනම්වේ. චක්ඛාදිද්වයං, චක්ඛුශ්‍රොත දෙදෙන; අසම්පත්තව

සෙන, නොපැමිණීම්වශයෙන්ද; ඝාණාදිත්තයං, ඝ්‍රාණජිහ්වා කාය තුන්දෙන; සම්පත්තවසෙන, පැමිණීම්වශයෙන්ද; නොහොත් අසම්පත්තවසෙන, නොපැමිණීම්වශයෙන්; (පවත්තා) චක්ඛාදිද්වයං ගටගත්තාවූ චක්ඛුසොත දෙදෙනද; සම්පත්තවසෙන, පැමිණීම්වශයෙන්, (පවත්තං) ඝාණාදිත්තයං, ගටගත්තාවූ ඝාණජිව්හාකාය යන තුන්දෙනද, ඉති, මෙසේ; පඤ්චවිධම්පි, පස්වැදෑරුම්වූද රූපතෙමේ; ගොචරග්ගාහික රූපං නාම, ගොචරග්‍රාහික රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ තෙවිසි රූපය; අගොචරග්ගාහික රූපංනාම, අගොචරග්‍රාහික රූපනම්වේ. වණ්ණොච, රූපාලම්බණයද; ගන්ධොච, ගන්ධාලම්බණයද; රසොච, රසාලම්බණයද; ඔජාච, ආහාරරූපයද; භූතචතුක්කඤ්ච, භූතචතුෂ්කයද, ඉති, මෙසේ; අට්ඨවිධම්පි, අටවැදෑරුම්වූද රූපතෙමේ; අවිනිබ්භොගරූපං, වෙන් වෙන්කොට නොගතහැකි රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ විසිරූපතෙමේ; විනිබ්භොගරූපං, වෙන් වෙන්කොට ගතහැකි රූපනම්වේ.

ඉච්චෙවං, ඉති එවං (යථාවුත්තනයෙන) මේ යථොක්ත ක්‍රමයෙන්; අට්ඨවීසතිවිධම්පි, අටවිසිවැදෑරුම්වූද; රූපං, රූපය; මෙහි "ච" ශබ්දය එවකාරාර්ථයි. යථාරහං, සුදුසු පරිද්දෙන්; අජ්ඣත්තිකාදි භෙදෙන, අජ්ඣත්තික රූපාදීන්ගේ ප්‍රභෙදයෙන්; විචක්ඛණා, අභිධර්මාසවාදනයෙහි දක්ෂ පණ්ඩිතයෝ තුමූ; විභජන්ති, විභාගකෙරෙත්.

අයං, මේ කියනලද්දේවනාහි; එත්ථ, මේ රූපසංග්‍රහයෙහි, හෙවත් රූපසමුද්දෙසාදී පඤ්චසමුද්දෙසයන් අතුරෙන්; රූපවිභාගො, රූපයන්ගේ බෙදීමය.

———o———

කම්මඤ්ච, කාමාවචර කුශලය; අකුශලය යන විසිවැදෑරුම්වූ කර්මයද; චිත්තඤ්ච, සතර අරූපාවචර විපාකය දෙපස්විස්සද්ණය රහතුන්ගේ චුති චිත්තය යනමොවුන් විසින් තොරකාරණ ලද්දවූ පන්සැත්තෑවක් චිත්තයද; උතුච, ශීතොෂ්ණ සංඛ්‍යාත ඍතුවද; ආහාරොච ඉති, ආහාරයද යන, චත්තාරි, සතරකාරණයෝ තුමූ; රූපසමුට්ඨානානි නාම, රූපයන් උපදවන්නාවූ හෙතුහූනම්වෙත්. තත්ථ, ඒ සතරුකාර හෙතූන් අතුරෙන්; කාමාවචරඤ්ච, කාමාවචර කුශලාකුශල විසිදෙනද; රූපාවචරඤ්ච; රූපාවචර කුශල කර්මයෝ පස්දෙනද; ඉති, මෙසේ; පඤ්චවීසතිවිධම්පි, පස්විසි වැදෑරුම්වූද; කුසලාකුසලං කම්මං, කුශලාකුශල කර්මතෙමේ; අජ්ඣත්තික සන්තානෙ, අධ්‍යාත්මික සන්තානකයෙහි; අභිසංඛතං, සංස්කාරකලද්දවූ; කම්මසමුට්ඨාන රූපං, කර්මය උත්පත්තිකාරණකොට ඇත්තාවූ රූපය නොහොත්

කම්මයෙන් හටගන්නා රූපය; පටිසන්ධිමුපාදාය, ප්‍රතිසන්ධි චිත්තය
පටන්; ඛණෙ ඛණෙ, ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා; නොහොත්
එකෙකී චිත්තයාගේ තුන් තුන් ක්‍ෂණයෙහි; සමුට්ඨාපෙති, උපද
වයි; අරූප විපාක ද්විපඤ්චවිඤ්ඤාණවජ්ජිතං, අරූප විපාක සතරය
දෙපස් විඤ්ඤාණය රහතුන්ගේ චුති චිත්තය යන මොවුන්
විසින් තොරකරණලද්දාවූ; පඤ්චසත්තතිවිධම්පි, පන්සැත්තෑ
වක් ප්‍රභෙදවූද; චිත්තං, සිත්තෙමේ; චිත්ත සමුට්ඨානරූපං, සිතම
කාරණකොට ඇති රූපය නොහොත් සිතින් හටගන්නාවූ
රූපය; පඨමභවඞ්ගමුපාදාය, ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව හට
ගන්නාවූ පළමුවෙනි භවාඞ්ගයාගේ උත්පාදක්‍ෂණයෙහි පටන්;
ජායන්තං එව, උපදිනු ලබමින්ම; හෙවත් උත්පාදක්‍ෂණයෙ
හිම්; අජ්ඣත්තික සන්තානෙ, අධ්‍යාත්ම සන්තානයෙහි; සමුට්ඨා
පෙති, චිත්තජ රූපය උපදවයි. තත්‍ථ, එක් සැත්තෑවක් ප්‍රභෙ
දවූ චිත්තයන් අතුරෙන්; අප්පනාජවනං, සවිසි අර්පණා ජවන්
තෙමේ; ඉරියාපථම්පි, ඊර්‍ය්‍යාපථයද; නොහොත් යාම් ඉදීම්
සිටීම් සයනයකිරීම් සංඛ්‍යාත ඊර්‍ය්‍යාපථයද, සන්නාමෙති, මොන
වටනමයි, හෙවත් විධානකරවයි. වොත්ථපන කාමාවචර ජව
නාභිඤ්ඤාපන, ව්‍යවස්ථාපන චිත්තය කාමාවචර ජවන් එකුන්
තිසය, අභිඥාකුශල ක්‍රියාවෝ දෙදෙනාය යනමොහුවනාහි;
විඤ්ඤත්තිම්පි, කායවාක් විඤ්ඤත්ති සංඛ්‍යාත විකාරයද; සමුට්ඨා
පෙන්ති, උපදවත්. පන, විශෙෂාර්ථයක් දක්වමි:—එත්‍ථ, මේ
විඤ්ඤත්තිය උපදවන්නාවූ ව්‍යවස්ථාපන චිත්තය කාමාවචර
ජවන් එකුන්තිසය අභිඥාදෙසිතය යනමොවුන් අතුරෙන්;
තෙරසසොමනස්ස ජවනානි, තෙළෙස් ප්‍රකාරවූ සොම්නස් සහ
ගත ජවනයෝ තුමූ; හසනම්පි ජනෙන්ති, සිනාවද උපදවත්.
සීතුණ්හොතු සමඤ්ඤාතා, සීත උතු උෂ්ණ උතුයයි කියනලද්දාවූ;
තෙජොධාතු, තෙජෝධාතු තොමෝ; ඨිතිප්පත්තාව, තමාගේ
ඨිතිකාලයයි කියනලද්දාවූ එකුන්පණස් කුඩා ක්‍ෂණයන්ට පැමි
ණියේම; උතුසමුට්ඨාන රූපං, සෘතුව කාරණකොට ඇත්තාවූ
රූපය; නොහොත් සෘතුවෙන් හටගන්නාවූ රූපය; අජ්ඣත්තඤ්ච,
අධ්‍යාත්ම සන්තානයෙහිද; බහිද්ධා ච, බහිද්ධා සන්තානයෙහිද;
යථාරහං සමුට්ඨාපෙති, සුදුසු පරිද්දෙන් උපදවයි. ඕජාසංඛාතො,
ඕජායයි කියනලද්දාවූ; ආහාරො, ආහාරයතෙමේ; ආහාරසමුට්ඨාන
රූපං, ආහාරයම කාරණකොට ඇත්තාවූ රූපය නොහොත්
ආහාරයෙන් හටගන්නාවූ රූපය; අජ්ඣොහරණකාලෙ, ගිලින්
නාවූකාලයෙහි; ඨානපත්තොව, තමාගේ ඨිතිකාල සංඛ්‍යාතවූ
එකුන්පණස් කුඩා ක්‍ෂණයන්ට පැමිණියේම නොහොත් ආමාශ

සංඛ්‍යාතවූ ස්ථානයෙහි හැත්පත්වූයේම; අජ්ඣත්තසන්තානෙ, අධ්‍යාත්ම සන්තානයෙහි; සමුට්ඨාපෙති, ආහාරජරූප උපදවයි. තත්‍ථ, ඒ රූප සමූහයා අතුරෙන්; හදය ඉන්ද්‍රිය රූපානි, හෘදය රූපය ඉන්ද්‍රියරූපය යනමොහු; කම්මජානෙව, කර්මයෙන් හටගත් තාහුම වෙත්. විඤ්ඤත්තිද්වයං, විඥප්තිරූපද්වය; චිත්තජමෙව, සිතින්ම හටගන්නේයි සද්දො, ශබ්දය තෙමේ; චිත්තොතුජො, සිතින් හා සෘතුවෙන් හටගන්නේයි, ලහුතාදිත්තයං,රූපස්ස ලහු තා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා යන රූපත්‍රය;උතුචිත්තා හාරෙහි, සෘතු චිත්ත ආහාර යන තුන්දෙන හෙතුකොටගෙණ හෙවත් සෘතුවෙන් හෝ චිත්තයෙන් හෝ ආහාරයෙන් හෝ; සම්භොන්ති, හටගණී. අවිනිබ්භාග රූපානිචෙව, සුද්ධට්ඨකරූප සංඛ්‍යාතවූ ඔජට්ඨකරූපයෝද; ආකාසධාතුච, පරිච්ඡෙදාකාශ ධාතුවද; චතූහි, සතර රූපසමුට්ඨානයන් හෙතුකොටගෙණ වෙත වෙතම; සම්භූතානි, හටගත්තාහුවෙත්. ලක්ඛණ රූපානි,ලක්ෂණරූපයෝ සතරදෙන තුමූ; කුතොචි, කිසි රූප ජනක ප්‍රත්‍යයකින්; නජායන්ති, නූපදනාහුවෙත්.

කම්ම-පෙ-ජාති, කර්මජ චිත්තජ උතුජ ආහාරජ රූපයෝ තුමූ; යථාක්කමං, පිළිවෙළින්; අට්ඨාරසාතිච, අටළොස් ප්‍රභෙද ඇත්තාහුද; හොන්ති, වෙත්; පණ්ණරසාතිච, පසළොස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්; තෙරසාතිච, තෙළෙස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්; ද්වාදසාතිච, දොළොස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්.

කෙවලං, හුදෙක්; ජායමානාදිරූපානං, උපදිනුලැබීම් ආදීවූ නිෂ්පන්නරූපයන්ගේ; සභාවත්තාහි, (සභාවතො යෙව) ස්වභාවක් වන හෙයින්ම; ලක්ඛණානි, ලක්ෂණරූපයෝ සතරදෙනතුමූ; කෙහිචි, යම්කිසි රූපජනක ප්‍රත්‍යයකින්; නජායන්තීති, නොහටගණිත්යයි; පකාසිතං, ප්‍රකාශකරණ ලද්දේයි.

අයං, මේ කියනලද්දේ වනාහි; එත්‍ථ, මේ රූප සඞ්ග්‍රහයෙහි නොහොත් රූපසමුද්දෙසාදී පඤ්ච පරිච්ඡෙදයන් අතුරෙන්; රූපසමුට්ඨානනයො, රූපසමුට්ඨාන ක්‍රමයයි,

එකුප්පාදා, එක්ව හටගැණිම් ඇත්තාවූ; නොහොත් සමාන හටගැණිම් ඇත්තාවූ; එකනිරොධා, එක්ව නිරුද්ධවීම් ඇත්තාවූ; නොහොත් සමානනිරුද්ධවීම් ඇත්තාවූ; සහවුත්තිනො,එක්ව හටගැණිම් ඇත්තාවූ; නොහොත් වෙන් වෙන්වූ කලාපයෙහි පිහිටියාවූ රූපයන්ගේ විශයෙන් එක්ව හටගැණිම් ඇත්තාවූ; එකවීසති, එක්විසි රූපසමූහයෝතුමූ; රූපකලාපානාම, රූපකලාපයෝ නම්වෙත්. තත්‍ථ, ඒ එක්විසි රූපකලාපයන් අතුරෙන්; ජීවි

කලාපව, ජීවිතරූපයද; අවිනිබ්භොගරූපකලාපව, අවිනිර්භොග ශුද්ධාෂ්ටක රූපයද; චක්ඛුනා සහ, චක්ෂුප්‍රසාදය හා සමග; චක්ඛුදසකනති, චක්ෂුර්දශකයයි; පවුච්චති, කියනුලැබේ හෙවත් චක්ෂුප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයයි; පවුච්චති, ප්‍රභේදවශයෙන් කියනු ලැබේ. තථා, එපරිද්දෙන්; සොතාදීහි සද්ධිං, ශ්‍රොත්‍රදශකාදීන් හා සමග; නොහොත් ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිහ්වාප්‍රසාද කායප්‍රසාද ඉත්ථිභාවදසකය පුම්භාවදසකය හෘදයවස්තු දශකය යන මොවුන් හා සමග; සොතදසකනතිච, ශ්‍රොත්‍රදසකයයි කියාද නොහොත් ශ්‍රොත්‍රප්‍රසාදයෙන් නියම කටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; ඝාණදසකකලාපව, ඝ්‍රාණදශකයයි කියාද නොහොත් ඝ්‍රාණප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දශදෙනාගේ සමූහයද; ජිව්හාදසකකලාපව, ජිව්හාදසකයයි කියාද නොහොත් ජිව්හාප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; කායදසකකලාපව, කායදසකයයි කියාද; නොහොත් කායප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දශදෙනාගේ සමූහයද; ඉත්ථිභාවදශකකලාපව, ස්ත්‍රීභාව දශකයයි කියාද නොහොත් ස්ත්‍රීභාවයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; පුම්භාවදසකකලාපව, පුම්භාවදශකයයි කියාද; නොහොත් පුම්භාවයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; වත්ථුදසකකලාපව, වස්තුදශකයයි කියාද නොහොත් හෘදය වස්තුවෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයයි කියාද; පවුච්චති, ප්‍රභේදවශයෙන් කියනු ලැබේ. ඉති, මෙසේ; යථාක්කමං, පිළිවෙළින්; යොජෙතබ්බං, යෙදිය යුතුයි. අවිනිබ්භොගරූපමෙව, අවිනිර්භොගශුද්ධාෂ්ටක රූපයම; ජීවිතෙන සහ, ජීවිතෙන්ද්‍රිය හා සමග; ජීවිතනවකනති, ජීවිත නවකකලාපයයි කියාද නොහොත් ජීවිතෙන්ද්‍රියයෙන් සලකුණු කටයුතුවූ නවක කලාපයයි කියාද; පවුච්චති, ප්‍රභේදවශයෙන් කියනු ලැබේ ඉති, මෙසේ; ඉමෙනව, මේ රූපකලාපයෝ නවදෙන; කම්මසමුට්ඨානකලාපානාම, කර්මයෙන් හටගන්නා රූපකලාපයෝ නම් වෙත්.

පන, කර්මජකලාපයෙන් අන්‍යවූ චිත්තජකලාපයන් දක්වමි:- අවිනිබ්භොගරූපං, අවිනිබ්භොගරූපයන් අටදෙන; සුද්ධට්ඨකං හොති, අමිශ්‍රවූ අෂ්ටකය නම් වෙයි. තදෙව, ඒ ශුද්ධාෂ්ටක කලාපයම; කායවිඤ්ඤත්තියා සහ, කායවිඥප්තිය හා සමග; කායවිඤ්ඤත්තිනවකඤ්ච හොති, කායවිඥප්ති නවක කලාපයක්ද වෙයි; වචීවිඤ්ඤත්තිසද්දෙහිච සහ, වාක්විඥප්ති ශබ්දයන් හා සමග; වචීවිඤ්ඤත්තිදසකඤ්ච හොති, වචීවිඤ්ඤත්ති දසකකලාප

යෙක්ද වෙයි. ලහුතාදීහි සඞ්ං, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය සමග; ලහුතාදෙකාදසකං, ලහුතාදී එකාදශක කලාප යෙක්ද වෙයි; කායවිඤ්ඤත්ති ලහුතාදීවාදසකං, කාය විඤ්ඤත්ති ලහුතාදී ද්වාදශක කලාපයෙක්ද වෙයි; වචිවිඤ්ඤත්තිසද්දලහුතාදි තෙරසකඤ්චාති; වාග්විඤ්ඤත්ති ශබ්ද ලහුතාදී තෙරසක කලාප යෙක්ද වෙයි; ඉති, මෙසේ; ඡ, (ඉමෙරූපකලාපා) මේ සවැදෑරුම් රූපකලාපයෝ තුමූ; චිත්තසමුට්ඨානකලාපා (නාම) සිතින් හට ගන්නා රූපකලාපයෝ නම් වෙත් නොහොත් චිත්තයම උත් පත්තිකාරණකොට ඇති රූපකලාපයෝ නම් වෙත්.

සුද්ධට්ඨකං, ශුද්ධාෂ්ටක කලාපයෙක්ද; සද්දනවකඤ්ච, ශබ්ද නවක කලාපයෙක්ද; ලහුතාදෙකාදසකඤ්ච, ලහුතාදී එකාදසක කලාපයෙක්ද; සද්දලහුතාදිවාදසකඤ්ච, ශබ්ද ලහුතාදී ද්වාදශක කලාපයෙක්ද, ඉති, මෙසේ; චත්තාරො (ඉමෙ රූපකලාපා) මේ රූපකලාපයෝ සතරදෙන තුමූ; උතුසමුට්ඨාන කලාපා (නාම) සෘතුවෙන් හටගන්නා රූපකලාපයෝ නම්වෙත්; හෙවත් සෘතු වම උත්පත්ති කාරණකොට ඇති රූපකලාපයෝ නම් වෙත්.

සුද්ධට්ඨකඤ්ච, ශුද්ධාෂ්ටක කලාපයෙක්ද; ලහුතාදෙකාදස කඤ්ච, ලහුතාදී එකාදශක කලාපයෙක්ද; ඉති, මෙසේ; වෙ(ඉමෙ රූපකලාපා) මේ රූපකලාපයෝ දෙදෙන තුමූ; ආහාරසමුට්ඨාන කලාපා (නාම) ආහාරයෙන් හටගන්නා රූපකලාපයෝ නම් වෙත්.

තත්ථ, ඒ එක්විසි රූපකලාපයන් අතුරෙන්; සුද්ධට්ඨකඤ්ච, ශුද්ධාෂ්ටක කලාපයද; සද්දනවකඤ්ච, ශබ්දනවක කලාපයද; ඉති, මෙසේ; වෙ උතුසමුට්ඨානකලාපා, සෘතුවෙන් හටගන්නා රූප කලාපයෝ දෙදෙන; බහිද්ධාපි, (සන්තානයෙන්) පිටත්හිද; හෙ වත් පෘථිවි ජලීත ගඞ්ගා සමුද්‍ර මෙඝ ගජිතාදීයෙහිද; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්; පන, සාධාරණයෙන් අන්‍යවූ අසාධාර ණය කියම්:—අවසෙසා උතුසමුට්ඨානරූපකලාපයන් දෙදෙනා කෙරෙන් අවශිෂ්ටවූ,සබ්බපි, සියලුම; (එකූනවීසතිරූපකලාපා) එකූන්විසි රූපකලාපයෝ; අජ්ඣත්තිකාමෙව, අධ්‍යාත්ම සන්තාන යෙහිම; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්.

කම්මචිත්තොතුකාහාරසමුට්ඨානා, කර්මය චිත්තය සෘතුය ආහාරය යන මේ සතර ප්‍රත්‍යයෙන් හටගන්නාවූ රූපකලාපයෝ තුමූ; යථාක්කමං, පිළිවෙළින් හෙවත් අනතුරුව දක්වන සඞ්ඛ්‍යා ක්‍රමයෙන්; නවච (හොනන්ති), කර්මජකලාපයෝ නවදෙනෙක්ද වෙත්; ඡච (හොන්ති,) චිත්තයෙන් හටගන්නාවූ රූපකලාපයෝ

සදෙනෙක්ද වෙත්; චතුරෙව (හොන්ති,) සෘතුවෙන් හටගන්නා රූපකලාපයෝ සතරදෙනෙක්ද වෙත්; වෙව (හොන්ති,) ආහාරයෙන් හටගන්නා රූපකලාපයෝ දෙදෙනෙක්ද වෙත්; ඉති, මෙසේ; කලාපා, රූපකලාපයෝ තුමූ; එකවීසති (සියුං,) එක්විසි දෙනෙක් වෙත්.

ආකාසංච, පරිච්ඡෙදකාශධාතුවද; ලක්ඛණානිච; ලක්ෂණ රූපයෝ සතරදෙනද; ආකාසලක්ඛණානං, ආකාශධාතු ලක්ෂණ රූප සතරදෙනාගේ; කලාපානං, කලාපයෝ හෙවත් කලාපයන්ගේ; පරිච්ඡෙදලක්ඛණත්තා, වෙන්කිරීම් සලකුණු බැවින්; කලාපඞ්ගං ඉති, රූපකලාපයන්ගේ අඞ්ගයයි; විචක්ඛණා, අණී චක්ෂණයෙහි දක්ෂවූ පණ්ඩිතයෝ තුමූ; නආහු, නොකීවාහුය.

අයං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මේ රූපසඞ්ග්‍රහයෙහි; කලාපයොජනා, රූපකලාපයන්ගේ යෙදීමයි.

— — o — —

පන, රූපකලාපක්‍රමයෙන් අන්‍යවූ රූපප්‍රවෘත්තිය දක්වමි:— සබ්බානිපිතානිරූපානි, ඒ සියලුරූපයෝම; කාමලොකෙ, කාම ධාතුයෙහි; යථාරහං, සුදුසුපරිද්දෙන්; පවත්තියං, ප්‍රවෘත්ති සංඛ්‍යාතවූ; ප්‍රතිසන්ධිච්‍යුතිදෙදෙනා අතර කාලයෙහි; අනූනානි, නො අඩුවූවාහු; උපලබ්භන්ති, ලබන්නාහුය.

පන, ප්‍රවෘත්තිකාලයෙන් අන්‍යවූ ප්‍රතිසන්ධි කාලය දක්වමි:— පටිසන්ධියං, ප්‍රතිසන්ධිකාලයෙහි; සංසෙදජාතකෙඩුච, පණුවන් ආදී සංසේදජසත්ත්වයන්ටද; ඔපපාතිකානඤ්ච, විශිෂ්ටවූ උපපාතනය ඇති සත්ත්වයන්ටද; නොහොත් සිව්මහරජය පටන් සියලු සුගති සත්ත්වයන්ටද; උක්කට්ඨවසෙන, උත්කෘෂ්ටවශයෙන්; චක්ඛු-පෙ-වත්ථුදසකසඞ්ඛාතානි, චක්ෂුර්දශකය ශ්‍රොත්‍රදශකය ඝ්‍රාණදශකය ජිහ්වාදශකය කායදශකය භාවදශකය වස්තුදශකයයි කියනලද්දවූ; සත්තදසකානි, දශකයෝ සත්දෙනෙක් තුමූ; පාතුභවන්ති, ප්‍රතිසන්ධිකාලයෙහි එකක්ෂණිකව පහළවෙත්; ඔමකවසෙනපන, අඩුවූකලාපයන්ගේ වශයෙන් වනාහි; චක්ඛු-පෙ-භාවදසකානි, චක්ෂුර්දශක ශ්‍රොත්‍රදශක ඝ්‍රාණදශක භාවදශක යන මොහු; කදාචි, ප්‍රථමකල්පාදී ඇතැම් කලෙක්හී; නලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්; තස්මා, එසේහෙයින්; තෙසංවසෙන, ඒ නොලැබෙන්නාවූ කලාපයන්ගේ වශයෙන්; කලාපහානි වෙදිතබ්බා, කලාපයන්ගේ අඩුවීම තොමෝ දතයුත්තීය.

පන, සංසෙදජඔපපාතික සත්වයන්ගේ අනන්‍යවූ ගබ්භසෙය්‍යක ප්‍රතිසන්ධිය දක්වමි:— ගබ්භසෙය්‍යක සත්තානං, මව්කුස භව ගන්නා සත්වයන්ට; කාය-පෙ-සඞ්ඛාතානි, කායදශකය පුරුෂයන්ට පුරුෂභාව දශකය ස්ත්‍රීන්ට ස්ත්‍රීභාවදශකය, වස්තුදශකයයි කියනලද්දාවූ; තීනි, දශකයෝ තුන්දෙනෙක් තුමූ; පාතුභවන්ති, පහළවෙත්. තත්‍ථාපි, ඒ තුන්කලාපයන් අතුරෙනුදු භාවදසකං, භාවදශකය; කදාචි, ඇතැම් කලෙක්හි; නලබ්භති, නොලැබිය යුත්තේයි. තතො පරං, ඒ ප්‍රතිසන්ධිකාලයෙන් මත්තෙහි; පවත්තිකාලෙ, චුතිය දක්වා ඇත්තාවූ ප්‍රවෘත්තිකාලයෙහි; චක්ඛුදසකාදීනිච, චක්ෂුර්දශකාදීහුද; නොහොත් චක්ඛු සොත ඝාණ ජිව්හාදසකයෝද; කමෙන, පිළිවෙළින්; පාතුභවන්ති, පහළවෙත්.

ඉච්චෙවං, යථොක්ත ක්‍රමයෙන්; පටිසන්ධිමුපාදාය, ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයපටන්; කම්මසමුට්ඨානා, කර්මයෙන් හටගන්නා රූපකලාපයෝ තුමූ; පවත්තනති, පහලවෙත්. දුතිය චිත්තමුපාදාය, ප්‍රතිසන්ධිචිත්තයට දෙවෙනිව පහළවන්නාවූ පළමුවෙනි භවාඞ්ගයාගේ උත්පාදක්ෂණය පටන්; චිත්තසමුට්ඨානා, සිතින් හටගන්නාවූ රූපකලාපයෝ තුමූ; පවත්තනති, හටගණිත්. ඨිතිකාලමුපාදාය, ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතිකාලය පටන්; උතුසමුට්ඨානා, ඍතුවෙන් හටගත්තාවූ රූපකලාපයෝ තුමූ, පවත්තනති, හටගණිත්. ඔජාඵරණමුපාදාය, ගර්භයෙහි උපන් තැනැත්තහුගේ ගර්භාශය පිහිටා ජීවිතනවක කලාපයාගේ තෙජොධාතුව දීප්තිමත්වූ තැන් පටන් මවගේ ආහාර ඔජාව පැතිරීම හෙතුකොටගෙණ; ආහාරසමුට්ඨානා, ආහාරයෙන් හටගන්නා රූපකලාපයෝ තුමූ; පවත්තනති, හටගණිත්. ඉති, මෙසේ; චතුසමුට්ඨානරූපකලාප සන්තති, සතර සමුට්ඨානයන්ගෙන් හටගන්නා රූපකලාපයන්ගේ පරම්පරාතොමෝ; කාමලොකෙ, එකොළොස් කාමභූමියෙහි; දීපජාලාවියච, පහන් සිළුවෙන් හටගන්නා පහන් දැල්ලක්මෙන්ද; නදීසොතොවියච, ගඞ්ගා ප්‍රවාහයක්මෙන්ද; යාවතායුකං, දිවිඇතිතාක් කල් මුළුල්ලෙහි; අබ්බොච්ඡින්නා, නොසිඳෙනලද්දී; පවත්තනති, හටගණිමින් බිඳෙමින් පවත්නේයි.

පන, රූපයන්ගේ හටගැණීමෙන් අනන්‍යවූ භඞ්ගය දක්වමි:— මරණකාලෙ, මරණයට ආසන්නවූ කාලයෙහි; චුතිචිත්තොපරි, චුතිචිත්තයෙන් මත්තෙහි, සත්තරසමචිත්තස්ස, ප්‍රතිලෝමයෙන් ගිණූ කල්හි සතළොස්වන චිත්තයාගේ; ඨිතිකාලමුපාදාය, සපිත්

කාලය පටන්; කම්මජරූපානි, කර්මයෙන් හටගත්තාවූ රූපකලා
පයෝ අටදෙන වනාහි; න උප්පජ්ජන්ති, නූපදිත්; පුරෙතරං,
චුතිචිත්තයට මත්තෙහි සතළොස්වන චිත්තයාගේ උත්පාද
ක්‍ෂණයෙහි නොහොත චුතිචිත්තය පටන් ප්‍රතිලෝමයෙන් ගිණූ
කල්හි සතළොස්වන චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි; උප්පන්නා
නි, උපන්නාවූ; කම්මජරූපානිච, කර්මජරූපයෝද; චුතිචිත්තසම
කාලමෙව, චුතිචිත්තයට සමානවූ කාලය මුළුල්ලෙහිම; පවත්ති
ත්වා, පැවත; නිරුජ්ඣන්ති, නිරුද්ධවෙත්. තතොපරං, ඒකර්මජ
රූපයන්ගේ නිරුද්ධවීමෙන් මත්තෙහි; චිත්තජාහාරජ රූපඤ්ච,
චිත්තජ ආහාරජ රූපයද; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිඳෙන්
නේයි. තතොපරං, ඒ චිත්තජ ආහාරජ රූපයන්ගේ නිරුද්ධවී
මෙන් මත්තෙහි; උතුසමුට්ඨානරූපපරම්පරා, ඍතුවම කාරණා
කොට ඇත්තාවූ රූපකලාපයන්ගේ පරම්පරාතොමෝ; යාව
මතකලෙබරසඞ්ඛාතා, මැරීමෙන් මතෙහි මෘතශරීරයයි කියන
ලද්දවූ ධර්මපුඤ්ජය දක්වා; පවත්තන්ති, හටගණිමින් පවත්නා
හුය.

ඉච්චෙවං, ඉතිඑවං, (යථාවුත්තනයෙන) මෙසේ කියනලද
ක්‍රමයෙන්; "ඉහභවෙ" යනු පාඨශෙෂයි. මේ ප්‍රත්‍යුත්පන්න
භවයෙහි; පටිසන්ධිමුපාදාය ප්‍රතිසන්ධිචිත්තයාගේ; උත්පාදක්‍ෂණය
පටන්; රූපං, චතුසමුට්ඨානික රූපතෙමේ; යථාපවත්තන්ති, යම්
සේ හටගණිද; තථා, එපරිද්දෙන්; මතසත්තානං, මළාවූ සත්ව
යන්ට; පුනදෙව, නැවතද; භවන්තරෙ, අනතුරුභවයෙහි; පටි
සන්ධිමුපාදාය. ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්‍ෂණය පටන්; රූපං
චතුසමුට්ඨානික රූපතෙමේ; පවත්තන්ති, හටගණිමින් පවත්
නේයි.

———o——

පන, කාම්භූමියෙහි හටගන්නා රූපයෙන් අන්‍යවූ රූප
භූමියෙහි හටගන්නා රූපයන් දක්වමි:—රූපලොකෙ, රූපභූමි
යෙහි ඝාණ-පෙ-භාවදසකානිච, ඝ්‍රාණදශකය ජිහ්වාදශකය
කායදශකය භාවදශකය යන මේ කර්මජ රූප කලාපයෝද;
ආහාරජ කලාපානිච, ආහාරජ කලාපයෝද; නලබ්භන්ති, නො
ලැබියයුත්තාහුවෙත්; තස්මා, එසේ නොලැබෙනහෙයින්;
තෙසං, ඒ රූපී බ්‍රහ්මයන්ට; පටිසන්ධිකාලෙ, ප්‍රතිසන්ධිකාලයෙහි;
චක්ඛුසොතවත්ථුවසෙන, චක්‍ෂුර්දශකය ශ්‍රොත්‍රදශකය වස්තු
දශකය යනමොවුන්ගේවශයෙන්; තීනිදසකානිච, තුන් දසක
යෝද; ජීවිතනවකච, ජීවිතනවක කලාපයද; ඉති, මෙසේ;

චත්තාරෝ කම්මසමුට්ඨානකලාපා, කර්මයෙන් හටගන්නා රූප කලාපයෝ සතරදෙන; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්. පවත්තියං, ප්‍රවෘත්තිකාලයෙහි; චිත්තොතුසමුට්ඨානාච, චිත්තයෙන් හා ඍතුවෙන් හටගන්නා රූපකලාපයෝද; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්.

---

පන, විශෙෂාර්ථයක් කියාම්:--අසඤ්ඤසත්තානං, අසංඥ සත්වයන්ට; චක්ඛුසොතවත්ථුසද්දාපි, චක්ෂුශ්‍රොත්‍ර වස්තු ශබ්දයෝද, නලබ්භන්ති, නොලැබියයුත්තාහුවෙත්. තථා, එපරිද්දෙන්; සබ්බානිපි චිත්තජ රූපානි, සියලු චිත්තජ රූපයෝද; නලබ්භන්ති, නොලැබියයුත්තාහුය. තස්මා, එසේ නොලැබියයුතුහෙයින්; තෙසං, ඒ අසංඥතලවාසීන්ට; පටිසන්ධිකාලෙ, ප්‍රතිසන්ධි කාලයෙහි; ජීවිතනවකමෙව, ජීවිතනවක රූපකලාප මාත්‍රයක්ම; (හොති) වන්නේයි. පවත්තියංච, ප්‍රවෘත්තිකාලයෙහිද; සද්දවජ්ජිතං, ශබ්දය තොරකොට ඇත්තාවූ; උතුසමුට්ඨාන රූපං, ඍතුවමකාරණකොට ඇත්තාවූ රූපතෙමේ; අතිරිච්චති, අවශිෂ්ටවන්නේයි. ඉච්චෙවං, ඉතිඑවං යථාවුත්තක්කමෙන, මේ යථොක්තක්‍රමයෙන්; කාමරූපාසඤ්ඤීසඞ්ඛාතෙසු, කාමභූමිය රූපභූමිය අසංඥ සත්ව භූමියයි කියනලද්දාවූ, තීසුඨානෙසු, තුන්ස්ථානයෙහි; පටිසන්ධි පවත්තිවසෙන, ප්‍රතිසන්ධි ප්‍රවෘත්තීන්ගේවශයෙන්; ද්විධා, විප්‍රකාරවූ; රූපප්පවත්ති, රූපයන්ගේ හටගැන්ම; වෙදිතබ්බා, දතයුත්තීය.

කාමෙසු, එකොළොස් කාමභූමියෙහි; අට්ඨවීසති, අටවිසි රූපයෙකෙනෙක්වෙත්. රූපීසු, අසංඥ සත්වවර්ජිත පසළොස් රූප භූමියෙහි; තෙවීස හොන්ති, තෙවිසි රූපයෙකනෙක්වෙත්; අසඤ්ඤීනං, අසංඥ සත්වයන්ට; සත්තරසෙව, සතළොස් රූපයෙකනෙක්ම වෙත්; අරූපෙ, සතර අරූප භූමියෙහි; කිඤ්චිපි, කිසි රූපයෙක් තෙමේ; නත්ථි, නැත්තේයි

උප්පත්තියං, ප්‍රතිසන්ධි කාලයෙහි; සද්දොච, ශබ්දයද; විකාරොච, විකාර රූපයද; ජරතාච, ජරතා රූපයද; මරණංච; අනිච්චතා රූපයද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහුවෙත්. තු, නොලැබෙන්නාවූ රූපයන්ගෙන් අන්‍යවූ ලැබියයුතුවූ රූප යන් දක්වම්:—පවත්තෙ, ප්‍රවෘත්ති කාලයෙහි; කිඤ්චිපි, කිසිද රූප යක්; නලබ්භති, නොලැබිය යුත්තේය යනු; න, නොවේ. (ලබ්භති එව) ලැබියයුත්තේමැයි.

අයං, මේ කියනලද්දේවනාහි; එත්ථ, මේ රූපසංග්‍රහයෙහි, රූප පවත්තික්කමො, රූපයන්ගේ ප්‍රවෘත්තික්‍රමයයි.

—— —— ∘ —— ——

පන, රූපයෙන් අන්‍යවූ නිර්වාණය කියමි:-නොහොත් චිත්ත චෛතසික රූපයන්ගෙන් අන්‍යවූ නිර්වාණය කියමි:—මග්ගඵලානං, සතරමාර්ගඵලයන්ට; ආලම්බණභූතං, අරමුණුවූ; චතුමග්ගඤාණෙන, සතරමාර්ගඥානයෙන්; සච්ඡිකාතබ්බං, ප්‍රත්‍යක්ෂ කටයුතුවූ හෙවත් ප්‍රඥානැමති ඇසට හමුකටයුතුවූ; ලොකුත්තරසඞ්ඛාතං, ලොකොත්තරයයි කියනලද්දාවූ; නිබ්බානං, නිර්වාණය; වාන සඞ්ඛාතාය, සත්ත්වයන් සංසාරවෘත්තයෙහි මසනාවූයෙන් සංසාර වෘත්තයයි කියනලද්දාවූ හෙවත් කුඩාභවයෙන් මහත් භවයද මහත්භවයෙන් කුඩාභවයද එකටමසන්නාවූ බානක් වැනිවූ; තණ්හාය, තෘෂ්ණාවෙන්; නික්ඛන්තත්තා, නික්මගිය හෙයින්; නිබ්බානන්ති, නිර්වාණයයි; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. සභාවතො, තමාගේ සන්සුන් සවභාව වශයෙන් නොහොත් තමාගේ කෘත්‍යලක්ෂණවශයෙන්; එකවිධම්පි, එක් වැදෑරුම් වූයේ නමුදු; තං එතං, (නිබ්බානං), ඒ නිර්වාණධාතු තොමෝ; සඋපාදිසෙසනිබ්බාන ධාතුච, කෙලෙසුන්ගෙන් අවශිෂ්ටවූ සකන්ධපඤ්චක මාත්‍රයක් සමග හටගත්තාවූ; සඋපාදිශෙෂ නිර්වාණධාතුවෙක්ද; අනුපාදිසෙසනිබ්බානධාතුච, කෙලෙසුන් ගෙන් අවශිෂ්ටවූද සකන්ධමාත්‍රයක් නැත්තාවූ අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙක්ද; ඉති, මෙසේ; කාරණපරියායෙන, භගවුන් නාවූ හෙතූන්ගේ ලෙසමාත්‍රයක් කාරණකොටගෙණ; දුවිධං හොති, ද්විප්‍රකාර වෙයි. තථා, එසින් අන්‍යවූ; සුඤ්ඤතඤ්ච, රාග ද්වෙෂ මොහයන්ගෙන් සිස්වූ හෙයින් සුඤ්ඤත නම්වූ නිර්වාණයෙක්ද; අනිමිත්තඤ්ච, රාග ද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත කාරණයෙන් පහවූ හෙයින් අනිමිත්ත නම් ඇත්තාවූ නිර්වාණයෙක්ද; අප්පණිහිතඤ්ච, රාග ද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත ප්‍රාර්ථනාවන් පහවූ හෙයින් අප්පණිහිත නම් ඇත්තාවූ නිර්වාණයෙක් ද, ඉති; මෙසේ; ආකාරභෙදෙන, විදර්ශනාවගේ ආකාරභෙදයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වෙයි.

අච්චුතං, චුතවීම් සංඛ්‍යාත ගිලිහීමක් නැත්තාවූ; අච්චන්තං, චුති සංඛ්‍යාත අන්තය ඉක්ම සිටියාවූ නොහොත් ලොක ධාතුවගේ අතිශයින් අනන්තයවූ; අසඞ්ඛතං, කර්මචිත්ත සෘතු ආහාර සංඛ්‍යාතවූ හෙතු ධර්මයන් විසින් නොසකස්කරණලද්දාවූ;

නොහොත් සංස්කාරයන් විසින් උපදවනලද්දවූ සෙසු සත්වයන් මෙන් නොසකස්කරණලද්දවූ; අනුත්තරං, තමහට අධික ධර්මයක් නැත්තාවූ; පදං, මාර්ගඵලයන්ට ආලම්බණ ප්‍රත්‍යක්‍ෂවූ ධර්මය; නිබ්බානං ඉති, නිර්වාණයයි වාතමුත්තා, වාණයයි කියන ලද තෘෂ්ණාවෙන් මිදුනාවූ; මහෙසයො, මහාසෘෂිවරයෝ තුමූ; භාසන්ති, දේශනාකෙරෙත්.

ඉති, (එවං යථාවුත්තනයෙන) යථොක්ත ක්‍රමයෙන්; චිත්තං, චිත්තය; චෙතසිකං, චෛතසිකය; රූපං, රූපය; නිබ්බානං ඉති අපි, නිර්වාණයයි කියාද; චතුධා, සතරාකාරයකින් හෙවත් සතර ප්‍රභෙදයකින්ම; පරමත්ථං, පරමාර්ථ ධර්මය; තථාගතා, තථාගතවූ බුදුවරයෝ තුමූ; පකාසෙන්ති, ප්‍රකාශ කෙරෙත්.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්මාර්ථ සංග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; රූප සඞ්ගහ විභාගොනාම, රූපසංග්‍රහ විභාගනම්වූ; ඡට්ඨො පරිච්ඡෙදො, සවෙනි පරිච්ඡේදය; ඉති, මෙසේ සම්පූර්ණ කරණලද්දේයි.

——o——

## (හා.)

උද්දේශ නිර්දේශ ප්‍රතිනිර්දේශ වශයෙන් පඤ්චපරිච්ඡේදයකින් චිත්ත චෛතසිකයන්ගේ විභාගයකොට දැන් වනාහි රූපයාගේ ප්‍රභේදය දක්වනුලැබේ "පඤ්චපරිච්ඡේදය" යනු චිත්ත පරිච්ඡේදය, චෛතසික පරිච්ඡේදය, පකිණ්ණක පරිච්ඡේදය, වීථි පරිච්ඡේදය, භූමි පරිච්ඡේදය, යන පසයි. උද්දේශ නිද්දේශ පටිනිද්දේසයෝ නම්:--චිත්ත පරිච්ඡේදය උද්දේශනම්. චෛතසික පරිච්ඡේදය නිර්දේශ නම්. පකිණ්ණක පරිච්ඡේදය ප්‍රතිනිර්දේශ නම්. වීථි පරිච්ඡේදය ප්‍රවෘත්ති නම්. භූමි පරිච්ඡේදය ප්‍රතිසන්ධිය දක්වීමනම්වෙයි. මෙසේ පඤ්ච පරිච්ඡේදයකින් චිත්ත චෛතසිකයම විභාගකොට, දැන් වනාහි රූපය විභාග කරණුලැබේ. ඒ කෙසේද යත්? රූපයාගේ නාම මාත්‍රයක් ප්‍රකාශකිරීමනම්වූ උද්දේශය, සිතින් හටගන්නාවූ රූපය, කර්මයෙන් හටගන්නාවූ රූපය, ශීතොෂ්ණ සංඛ්‍යාතවූ ඍතුවෙන් හටගන්නාවූ රූපය, ආහාරයෙන් හටගන්නාවූ රූපයයි මෙසේ සමුට්ඨානවශයෙන්ද, මේ මේ රූපයෝ එක්ව හටගන්නාහුයයි කලාපවශයෙන්ද, මේ රූපය මෙතැන් පටන් හටගන්නේය. මෙතැන් පටන් නිරුද්ධවන්නේයයි හටගන්නා ක්‍රමය ප්‍රකාශ

කිරීම්වශයෙන්ද, යනමේ පස් ආකාරයෙන් රූපසංග්‍රහය දක්වනලැබේ. ඒ පස් ආකාරයන් අතුරෙන් රූපනිදේශයාගේ අභිප්‍රාය මෙසේයි. ඒ කෙසේද? සියලුම රූප තෙමේ භූතරූපය උපාදා රූපයයි විප්‍රකාරවෙයි. ඔවුන් අතුරෙන් මහාභූත රූපයෝ වනාහි එක් භූතයෙක් තෙමේ භූතත්‍රයක්ද, භූතයෝ තුන්දෙනෙක් තුමූ එක් භූතයක්ද, භූතයෝ දෙදෙනෙක් තුමූ භූතයෝ දෙදෙනෙක්ද නිශ්‍රයකොට ගන්නාහුවෙත්. උපාදාය රූපයෝ වනාහී සතර මහාභූතයෝම නිශ්‍රයකොටගෙණ හට ගන්නාහුවෙති. ඉදින් භූත රූපයෝද එක් භූතයෙක් හෝ භූතයන් දෙදෙනෙක් හෝ භූතයන් තුන්දෙනෙක් හෝ නිශ්‍රය කොටගෙණ හටගන්නාහුනම් ඔවුන්ටද උපාදාය රූපයයි නොකියන්නේද යත්? නොකියත්මැයි. සතර මහාභූතයන්ම නිශ්‍රයකොටගෙණ හටගන්නා රූපයන්ට උපාදාය රූපය යන නාමය ප්‍රකාශකරණ පමණ මුත් එක් භූතයක් හෝ දෙකක් හෝ තුණක් හෝ නිසා පවත්නා රූපයන්ට භූතයයි කියා මිස උපාදාරූපයයි ව්‍යවහාර නොකෙරෙත්මැයි. ඊට නිදශීන නම්:--පඨවී ආපො තෙජෝ වායො වර්‍ණ ගන්‍ධ රස ඔජා ජීවිතෙන්‍ද්‍රිය චක්‍ෂුප්‍රසාදය යන චක්‍ෂුර්දශක කලාපයෙහි අන්තර්ගතවූ චක්‍ෂුප්‍රසාදදී සදෙන සතර මහාභූතයන් නිසාම පවත්නේයි. චක්‍ෂු ප්‍රසාදදී යම් උපාදාය රූපයකට අනික් රූපයක් පැවැත්වීමට ශක්තියක් නොමැත්තේයි. එහෙයින් එක්විසි රූපකලාපයෙහිම විද්‍යමානවන්නාවූ සතරමහා භූතයන් නිසා චක්‍ෂුරාදි උපාදාය රූපයෝ පවත්නාහුවෙති. තවද අනුන් නිසාම පවත්නා රූපයෙක්ම උපාදාය රූපනම්වෙයි. සතරමහා භූතයෝ කිසිකලෙකත් උපාදාය රූපනම් නොවන්නාහුය. මේ උපාදාය රූපයෝ වනාහි එකොළොස් දෙනෙක්වෙත්. ඔවුන්ගේ විභාග මතු පහලවන්නේයි. පෘථුවී ධාතුව කර්කශ සවභාව ලක්‍ෂණ කොට ඇත්තේයි. මේ ප්‍රකෘති පොළොව මනුෂ්‍ය තිරශ්චීන වෘක්‍ෂ ලතාදී සියල්ලගේ පිහිටා සිටීමට ආධාරවන්නාක්මෙන් එක එක රූප කලාපයක්හි අන්තර්ගතවූ සියලු රූපයන්ගේ පිහිටීමටද උපකාරවන්නේයි. ආපොධාතු තොමෝ වැගිරීම හා බැඳීමද මහත්කිරීමද ලක්‍ෂණකොට ඇත්තේයි. මේ මහා පොළොව වනාහි අනන්ත ප්‍රමාණ රූප කලාපයන් ආපොධාතුවෙන් බැඳීම කාරණකොටගෙණ නොවිසිර පවත්නේයි. රූපකලාපයන්ගේ එකට බැඳී පැවතීම ආපොධාතුහුගේ ලක්‍ෂණනම්වෙයි. වායොධාතු තෙමේ පිරවීමය, සිටීමය, සැලීමය, යන මොවුන් ලක්‍ෂණකොට ඇත්තේයි. ඊට නිදශීනනම්:—

මේ පොළොවෙහි පිහිටා සිටින සියලු වෘක්ෂලතාදීන්ගේසිටීම වායො ධාතු ශක්තියෙන්යයි දතයුතුයි. තෙජො ධාතුය යනු මිහිකිරීමය පැසවීමය උණුසුම්කිරීමය යන මොවුන් ලක්ෂණ කොට ඇත්තේයි. යම්සේ ලුණු මිශ්‍රකළ මාංශය කුනුනොවී පවත්නේද එසේම තෙජො ධාතුව කාරණකොටගෙණ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියලු වස්තූන්ගේ බොහෝකලක් පැවැත්වීම කෙරෙයි. මේ සතර කුමක්හෙයින් මහාභූතයයි ව්‍යවහාරකරන්නේද යත්? යොදුන් ගණන් දිග පුළුල ඇති ආනන්දාදී මත්ස්‍යයෝද, රාහු අසුරාදී අසුරයෝද, මහාකාල නන්දෝපනන්දාදී නාගයෝදයනාදී සවිඥානකවූද මහමෙරුමහාසමුද්‍ර මහාපෘථුවි ආදීඅවිඥානකවූද භූතයන් පහලකරවනහෙයින් මහාභූතයයි ව්‍යවහාරකෙරෙත්. තවද ඉන්ද්‍රජාලිකයන්ටද මහාභූතයයි කියති. ඉන්ද්‍රජාලිකයෝ වනාහි රන් රිදී නොවන්නාවූ වස්තු රන් රිදී ආදිය මෙන් කොට පෙන්වති. එසේම මේ මහාභූතයෝ එක එක ආකාරයට මිශ්‍රවූවාහු රත්ය රිදීය මුතුය මාණික්‍යය යනාදී නොයෙක් වර්ණයට පැමිණ මනුෂ්‍යාදීන්ගේ ඉන්ද්‍රියයන් මුළාකරති. එහෙයින් මහාභූතයයි කියත්. තවත් හිමාලය වනාදියෙහි වාසයකරන්නාවූ වඩක යක්ෂණීන්ටද භූතයයි කියති. ඒ යක්ෂණීහුවනාහි පුරුෂයන් දුටුකළ යාව නාව විලාශය සම්පූර්ණ සොළ සැවිරිදි වයස්වූ ස්ත්‍රී රූප මවා ඒ පුරුෂයන් පොළඹවා අභිමත ස්ථානයට ගෙණගොස් මස් ලේ අනුභවකරති. එසේම මේ සතරමහා භූතයෝ තුමූ ස්ත්‍රීන්ගේ සිතගන්නා පුරුෂරූපය පුරුෂයන්ගේ සිත්ගන්නා ස්ත්‍රී රූපය යනාදී රූප මවා මහත්වූ අනර්ථ ව්‍යසනයට පමුණුවන්නාහුවෙති. එහෙයින්ද මහා භූතයයි ව්‍යවහාර කෙරෙති. ඒ සතරමහා භූතයන් අතුරෙන් ස්පර්ශකරන්නාවූ ස්වභාව පඨවි නම්. විසිරයානොදී එකාබද්ධකොට පවත්වන්නාවූ ස්වභාව ආපො නම්. හිසකේ පැසීම් දත්වැටීම් ආදි මිහිකිරීම තෙජො ධාතු ලක්ෂණයයි. මේ භූතත්‍රය සෙලවීම් ආදී ක්‍රියා පැවැත්වීම වායො ධාතු ලක්ෂණයයි. තෙජො ධාතු තෙමේ ශීතලවූයේනම් ශීත තෙජො ධාතුයයි කීයාද, උණුසුම්වූයේනම් උණුසුම් තෙජො ධාතුයයි කීයාද ව්‍යවහාරකරයි. එහෙයින් ශීතොෂ්ණ යන ගුණදෙක තෙජො ධාතුහුගේ ලක්ෂණයයි හෙවත් විශෙෂයකැයි දතයුතුයි. ඉදින් ආපොධාතුහුගේ ගුණය ශීතයයි කියාද තෙජො ධාතුහුගේ ගුණය උෂ්ණයයිකියාහෝ ගතයුතුවීනම් ශීතොෂ්ණ යන ගුණවය එකම්රූපකලාපයෙක්හි ලැබියයුතුවෙයි. මේ ශීතොෂ්ණ යන ගුණවය කිසි කාලෙකත් එකම රූප කලාපයෙක්හි නොලැබෙන බැවින්

තේජෝධාතූහුගේ එතර මෙතර දෙක ශීතෝෂ්ණ ගුණ දෙක යයි දතයුතුයි. ඔවුන් අතුරෙන් පෘථුවී ධාතු තෙමේ කර්මජ පෘථුවී ධාතුය, චිත්තජ පෘථුවී ධාතුයයි යනාදී නොයෙක් ප්‍රකාර වෙයි. එපරිද්දෙන්ම සෙසු භූතත්‍රයද කර්මජ චිත්තජාදිවශයෙන් අනේක ප්‍රකාරයි. මේ සතර මහාභූතයන් අවිද්‍යමාන වස්තුවක්නම් නැත්තේයි. එතකුදුවුවත් එක එක වස්තුවෙහි එකෙකී භූතය අධිකව බලවත්වූකල්හී සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි. සමුද්‍රගඞ්ගාවාපි තඩාගාදියෙහි ජලය. පස්තෙල්, කිරි, ආදි ද්‍රව ද්‍රව්‍යාදියෙහි ආපොධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි, සරජාවාතය, අරජාවාතය, යනාදී වායනා සුළු ද්‍රව්‍යයෙහි වායෝධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටයි. කල්පාන්තවහ්නිය, සූර්‍ය්‍යතාපය, කරකාග්නිය, ප්‍රකෘති ගින්නය, යනාදියෙහි තෙජොධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි. එහෙයින් බුදුරජාණන්වහන්සේ විසින් ධාතු විභඞ්ග හස්තිපදෙපම සූත්‍රාදියෙහි ඒ ඒ භූතය අධික වස්තුව ඒ ඒ ධාතු හඳුන්වනු පිණිස වදාරණලද්දේයි. ඉදින් පෘථුවී ආදී ධාතූන්ගේ සවභාව මාත්‍රයක් වදාළේවීනම් ඒ අවබොධ කිරීම අතිශයින් දුෂ්කරවෙයි. අඞ්ගසක හටගත් එළ තෙජො ධාතු අධිකවීම හෙතුකොටගෙණ විලිකුම්බවට පැමිණෙයි. අනතුරුව නටුවෙන් වැගිරෙයි. එසේම මනුෂ්‍ය තිරශ්චීන දීන්ගේද වෘක්ෂලතාදීන්ගේද ජරාව තෙජො ධාතුව කාරණ කොටගෙණවෙයි. මරණයද ඒ කාරණකොටගෙණමවෙයි. යනු අවබොධකටයුතුයි. චක්ෂුරාදී පසට කුමක්හෙයින් ප්‍රසාද රූප යයි ව්‍යවහාරකරන්නේද යත්? තමා හා එක්ව යෙදුනාවූ කලාපයම ප්‍රසන්නකරවනහෙයින් ප්‍රසාද රූපයයි කියත්. ඇසින් දක්කයුතුවූ යහපත්වූ හෝ නපුරුවූ හෝ සියලු අරමුණම රූපාලම්බණනම්. එසේම කණින් ඇසියයුතුවූද, නාසයෙන් විඳයුතුවූද, දිවෙන් දතයුතුවූද, කයින් දතයුතුවූද, සියලු ශබ්ද ගන්ධ රස පහස ආදී අරමුණු ආලම්බණනම්වෙයි. සපර්ශාලම්බණය ආපොධාතුව හැර අවශෙෂ භූතත්‍රය පමණකි. මේ සත්දැරුම් රූප තෙමේ දෙපස් විඥානයන්ට ගොචර වනහෙයින් දෙපස් විඥාන නැමති මහල්ලන්ගේ නැගිටීමට සැරයටි වැනි බැවින් ගොචර රූපයයි කියත්. චක්ෂුර්විඥානයාගේ ගොචරස්ථානය රූපාලම්බණයයි. සොත ඝාණ ජිහ්වා කායවිඥානයන්ගේද එසේමැයි. ස්ත්‍රී ලිඞ්ග ස්ත්‍රී නිමිත්ත ස්ත්‍රී ආකල්පයයි කියනලද ස්ත්‍රී භාව රූපයද, පුරුෂ ලිඞ්ග පුරුෂ නිමිත්ත පුරුෂ කුත්තක පුරුෂ ආකල්පයයි කියනලද, පුරුෂ භාව රූපයද, යනමේ

ලිඞ්ගාදිය මෝ ස්ත්‍රිය මේ පුරුෂයයි දැනගැනීමට කාරණාවන හෙයින් භාව රූපකම්වෙයි. ස්ත්‍රීන්ගේ අඞ්ගජාතය ස්ත්‍රී ලිඞ්ග නමි. ස්ත්‍රීන්ගේ අදහස් ආදිය ස්ත්‍රී නිමිත්ත නමි. ස්ත්‍රීන්ගේ ග්‍රීවාභරණ කර්ණාභරණ වස්ත්‍රාභරණාදිය ස්ත්‍රීකුත්තනමි. ස්ත්‍රීන්ගේ අධඃ ශරීරයෙහි විශදභාවය ඌර්ධ්ව ශරීරයාගේ අවිශද භාවය ස්ත්‍රීආකල්පනමි. අටුවාවෙහි ආක්‍රමය මෙසේයි. ස්ත්‍රීන්ගේ සිහින්වූ හස්තපාදාදිය කුඩාවූ මුහුනද පයොධරාදියද ස්ත්‍රී ලිඞ්ගනමි. ස්ත්‍රීන්ගේ හිසකේ ගැවසීම හෘදයෙහි ලොම් නැතිබව රැවුල් නැතිබව ස්ත්‍රීනිමිත්තනමි. ස්ත්‍රීන්ට අයත්වූ මැහුම් පිසුම් ගෙතුම් ආදී ක්‍රියාවෝ ස්ත්‍රී කුත්තනමි. ස්ත්‍රීන්ගේ ලැසිගමන් ඇතිබවය. සිහින්වූ කටහඬ ඇතිබවය, යනාදී ක්‍රියාවෝ ස්ත්‍රීආකල්පනමි. පුරුෂයන්ගේ අභිප්‍රාය පුරුෂ නිමිත්ත නමි. පුරුෂයන්ට අයත්වූ වස්ත්‍රාභරණාදිය පුරුෂකුත්තනම පුරුෂයන්ගේ අධඃ ශරීරය අවිශද භාවයද ඌර්ධ්ව ශරීරය විශද භාවයද පුරුෂාකල්ප නම නොහොත් අටුවාවෙහි ආ ක්‍රමයෙන් පුරුෂයන් කෙරෙහි ස්ත්‍රීන්ට වෙනස්ව පිහිටන්නාවූ ම[illegible] ආදියද හෘදයෙහි හටගන්නා රොමාදියද පුරුෂ ලිඞ්ග නමි. පුරුෂයන්ගේ වස්ත්‍රාභරණාදිය පළඳිනා ආකාරය පුරුෂ නිමිත්ත නමි. පුරුෂයනට අයත්වූ කර්මාන්තාදිය පුරුෂ ආකල්ප නමි. ස්ත්‍රීභාව පුරුෂභාවවලය වෙන් වෙන්ව ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි ඇතිබව කෙසේ දතයුත්තේද යත්? ස්ත්‍රීහු තුමූ ළදරු අවස්ථායෙහිම ක්‍රීඩා පිණිස දරුවන් නැළවීම් පිසීම් ආදී ක්‍රියාවෝ ස්ත්‍රීභාව රූපයන්ගේ හෙතුනුවෙත්. පුරුෂභාව රූපය ඇති ළදරුවෝ කුඩා කාලයෙහි සී සෑම් වැපිරීම් ආදියෙහි පුරුදුවෙති. එය පුරිස භාවනම්වෙයි. මෙසේ ස්ත්‍රී පුරුෂයන්ගේ උපපන්න කාලයෙහිම ඔවුනොවුන්ට වෙනස්වූ ක්‍රියා ඇතිවීම ස්ත්‍රීභාව පුම්භාව රූපයන්ගෙන් ඇතිවන්නේයයි දතයුතුයි. "හෘදය රූපය" යනු හෘදය මාංශාභ්‍යන්තරයෙහි යටිකොට එල්වනලද්දවූ පිසුම් කැකුලක් බඳුවූ ස්ථානයෙහි ඇතුළත විසමවූ මස් ගඩුවක්වෙයි. එහි අඩපතක් පමණවූ නොහොත් දෙඹ ගෙඩියක් තුළ වක්කළහැකි පමණවූ ප්‍රසන්න ලෙහෙය ආශ්‍රයකොටගෙණ හෘදය වස්තු රූපය පවත්නේයි. ඒ රූපය ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි දෙසනාභෙදයවනහෙයින් නොවදුලේ නමුදු පට්ඨානයෙහි නිශ්‍රය ප්‍රත්‍යය නිර්දේශයෙහි:- යං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච" යන පාඨයෙන් වදාරණ ලද්දේයි. "ජීවිත රූපය" යනු තමා හා එක්ව හටගන්නාවූ කර්මජ රූපයන් ආරක්ෂාකරමින් ඒ ඒ කලාපයෙහි රූපයන්ට

ඊශ්වර භාවයෙන් පවත්නාහෙයින් ජීවිතෙන්ද්‍රිය රූපයයි ව්‍යවහාර කෙරෙත්. චක්ෂුර්දශක කලාපයෙහි විද්‍යමානවූ ජීවිතෙන්ද්‍රිය තෙමේ තමාගෙන් අන්‍යවූ රූපයන් නවය ආරක්ෂාකරමින් ඊශ්වරභාවය පවත්වයි. සෝත ඝාණ ජිහ්වා කාය හදයවත්ථු භාව යන දශක කලාපයෙහිද එපරිද්දෙන්ම ඊශ්වර භාවය කෙරෙත්. ජීවිත නවකකලාපයෙහි විද්‍යමානවූජීවිතනවකකලාප තෙමේ තමාගෙන් අන්‍යවූ රූප අටදෙන ඊශ්වර භාවයෙන් ආරක්ෂාකෙරෙයි. ඊට උපමානම්:--පියුම් දණ්ඩෙහි ඇත්තාවූ ජලය ඒ පියුම් මලාතික නොව ආරක්ෂාකරගන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිය තෙමේ තමා හා එක්ව හටගත්තාවූ කර්මජ රූපයන් ආරක්ෂාකෙරෙති. යම්සේ නැවේ යන්නාවූ නාවිකයාගේසිටීම නැවතිසාද නැව් ආරක්ෂාවී පැවතීම තමා නිසාද වන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිය නැමති නාවුක තෙමේ කර්මජ රූප කලාප නැමයි නැව නිසාද, ඒ නැවියා නිසා නැව පවත්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිය හෙතුකොටගෙණ කර්මජ රූප කලාප පවත්නාහුවෙති. කර්මජ චිත්තජ ඍතුජ ආහාරජ යන රූප කලාප සමුඨාන සතරින් හට ගත්තාවූ එක්විසි රූප කලාපයන් අතුරෙන් කර්මජ රූප කලාප නවදෙන පමණක් තම තමාට ඊශ්වරවූ ජීවිතෙන්ද්‍රියය නිසා පවත්නාක්මෙන් චිත්ත ඍතු ආහාර යන ත්‍රිසමුඨානික රූප කලාපයන් පවත්වන්නාවූ ජීවිතෙන්ද්‍රියයෝ තුමූ කුමක්හෙයින් නැත්තාහුද යත්? කර්මජ රූප කලාපයෝ වනාහි පූර්වජාති කර්ම ප්‍රත්‍යයෙන් කර්මජ රූප කලාපයන් උපදවා නිරුද්ධවීයන්නේය. මව්මලවිට දරුවන් පොෂ්‍යයකිරීම පිණිස කිරිමව්වරු ඇතිවිය යුතුවාක්මෙන් කර්මජ රූපයන්ගේ ජනක ප්‍රත්‍යය නැතිවූහෙයින් ජීවිතෙන්ද්‍රිය ශක්තියෙන් පවත්නාහුවෙති. චිත්ත ඍතු ආහාර යන තිසමුඨානක රූප කලාපයන්ගේ ජනක ප්‍රත්‍යයවූ චිත්ත ඍතු ආහාරයන් විද්‍යමාන බැවින් ජීවිතෙන්ද්‍රියයාගෙන් ප්‍රයෝජන නැත්තේයි.

“ඔජා රූපය” යනු කටුකතිකතලවනාදීවූ ෂට් රසයන්ගේ හා ඛාද්‍ය-භොජ්‍ය-ලෙය්‍ය-පෙය්‍ය යන රසයන්ගේ සත්සියයක් නහර අනුව යන්නාවූ තෛල සඞ්ඛ්‍යාතවූ ආහාරය ඔජා රූපනම්වෙයි. කර්මජ රූප කලාප නවයෙහි ඇත්තාවූ ඔජාරූපයන් නවදෙනාහට යථොක්ත බාහිර ආහාරයෙන් රුකුල් ලැබීමෙන්ම බාහිර ආහාරයෝ ආහාරජ රූපයන් උපදවණ්නාහුවෙති. ඉදින් බාහිර ආහාර ඔජාව නොලැබුනේනම් අධ්‍යාත්මිකවූ ඔජාරූපයන් සම්ප්‍රකාරයෙන්ම ඉපදවියනොහැක්කේයි. මේ අභ්‍යන්තර ඔජාව හා බාහිර ඔජාව යන දෙදෙන

දිට්ඨධම්මවේදනීය අපරාපරියවේදනීය යන කර්මයට සමාන වේ. (ඉදින් දිට්ඨධම්මවේදනීය කර්මයක්වීනම් අපරාපරිය වේදනීය කර්මයකින් රුකුල්ලැබීමෙන්ම විපාකදෙයි. අපරාපරිය වේදනීය කර්මයකින් රුකුල් නොලැබුණේනම් දිට්ඨධම්මවේදනීය කර්ම අහෝසි කර්ම නම් වෙයි.) එපරිද්දෙන්ම කර්මජ අභ්‍යන්තරවූ ඕජාරූපයට ඛාද්‍ය-භෝජ්‍ය-ලේහ්‍ය-පෙය්‍යාදී ආහාරයෙන් රුකුල් නොලැබුනේ වීනම් සත්ත්වයා මව් කුසතුළ විනාශවෙයි. මෙසේ මේ දක්වනලද්දාවූ රූපයෝ අටළොස්දෙන වනාහි කර්කශ බැව් ආදිවූ තමාගේ ස්වභාව සමග හටගත්තාවූ රූපයන්බැවින් ස්වලක්ෂණ රූප නමුදුවෙයි. කර්මාදීන් විසින් උපදවනලදහෙයින් නිෂ්පන්න රූප නමුදුවෙයි. විකාරවනහෙයින් රූප රූප නමුදු වෙයි. ත්‍රිලක්ෂණයට නඟා භාවනාකටයුතුහෙයින් සම්මසන රූප නමුදුවෙයි. අවශේෂවූ දශරූපයෝ තුමූ කර්කශ බැව් ආදී ස්වභාවෙන් පහවූහෙයින් අභාවරූපය, අලක්ෂණරූපය, අනිෂ්පන්නරූපය, අරූපරූපය, අසම්මසනරූපයයි කියාද ව්‍යවහාර කෙරෙත්.

"ආකාශ ධාතුය" යනු ගර්භසෙය්‍යක සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි පහළවන්නාවූ කායභාව වස්තු දශක සංඛ්‍යාතවූ රූපකලාපයන් තුන්දෙන මිශ්‍රනොවීම පිණිසද ඖපපාතික ප්‍රතිසන්ධිගන්නාවූ සත්ත්වයන්ගේ වනාහි චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය-භාව-වස්තු සංඛ්‍යාතවූ ප්‍රතිසන්ධියසමග පහළවන්නාවූ රූපකලාපයන් පස්දෙනාගේ ඔවුනොවුන් මිශ්‍රනොවීම පිණිසද එපරිද්දෙන් සියලු රූප කලාපයන්ගේ මිශ්‍රනොවීම පිණිස පවත්නාවූ පරිච්ඡේදය හෙවත් වෙන්කිරීම පරිච්ඡේද රූප නම්. නිෂ්පන්න රූපයන්ගේ නිරුද්ධවීම හටගැණීමම ආකාශ ධාතුහුගේ හටගැණීම නිරුද්ධවීමයයි දතයුතුයි. ඉදිරියට යාමයපසුව ඒමය යනාදී සියලු ක්‍රියාවෝ උපදවන්නාවූ සිතින් හටගන්නාවූ ධාතුහුගේ විකාරවීම සංඛ්‍යාතවූ ආකාරයයි කියනලද්දාවූ හස්තපාදාදීන්ගේ සෙලවීම කායවිඥප්ති රූප නම්වෙයි. ඊට කුමක් හෙයින් කායවිඥප්තියයි කියන්නේද යත්? දුර සිටින්නාවූ කෙනෙකුට යම් අභිප්‍රායක් අඟවනු කැමතිකල්හි හස්තචලනාදීයෙන් තමාගේ අභිප්‍රාය හඟවනු ලැබෙයි. ඒ අභිප්‍රාය දැනගන්නාපුරුෂ තෙමේද චලවූ ශරීරාංගයන් කාරණකොටගෙණ මෙනම් දෙයක්කරනට නියෝගකරන්නේයයි දැනගණියි. එහෙයින් කායවිඥප්ති රූපයයි කියති. වාක් ප්‍රයෝගය උපදවන්නාවූ සිත කාරණකොටගෙණ හටගන්නාවූ පෘථුවි ධාතු තොමෝ අක්ෂරොත්පත්තිස්ථානයෙහි පිහිටියාවූ කර්මජ පෘථුවි

ධාතූන් හා ගැටුනුකල්හි තමාගේ අභිප්‍රායවූ වචනය මුඛයෙන් නික්මෙන්නේවෙයි. එහෙයින් ඒවචී ප්‍රයොග සංඛ්‍යාතවූ පෘථුවී ධාතූන්ගේ විකාර වචී විඤ්ඤත්ති රූප නම්වෙයි. ඊට උපමා නම්:—යම්සේ බෙර ගසන්නාවූ පුරුෂ තෙමේ තමා විසින් අද හස්කරණලද්දවූ තාලවෘතාදියද, වායන දණ්ඩෙන් බෙර මුහුනෙහි ගසන්නේවේද, එකල්හි අභිප්‍රායකරණලද තාලවෘතාදිය නික්මෙයි. එපරිද්දෙන්ම යම් වචනයක් කියනු පිණිස චිත්ත වීථියක් උපන්කල්හි එහි සත් ජවනයන් හා එක්ව උපදනා චිත්තජ පෘථුවී ධාතූහු අවශෙෂ තිජභූතයන් හා සමග පරම්පරාවශයෙන් ගැටෙමින් අවුත් මුඛයෙහි අක්ෂරොත්පත්ති ස්ථානයෙහි පිහිටියාවූ කර්මජරූපකලාපයන් සම්බන්ධවූ පෘථුවී ධාතූන් හා ගැටුනුකල්හි අභිමතවූ ශබ්දය මුඛයෙන් නික්මෙයි. එහෙයින් චිත්තජ පෘථුවී ධාතුව කඩිප්පුවක්මෙන්ද, කර්මජ පෘථුවී ධාතුව බෙර ඇසක්මෙන්ද, නොහොත් චිත්තජ පෘථුවී ධාතුව ඝණ්ඨාවෙහි දිවනක්මෙන්ද, කර්මජ පෘථුවී ධාතුව ඝණ්ඨාවක්මෙන්ද, උපමා උපමෙය්‍ය සම්බන්ධකොට අර්ථ දතයුත්තේයි. මෙ කාය විඥප්ති වචීවිඥප්ති රූපවය වනාහි වාතය හැපීමෙන් වචලවන්නාවූ වෘක්ෂ ශාඛාදියෙහි හෝ වාතය ගැටීමෙන් වෘක්ෂාදියෙහි ඇතිවන ශබ්දයෙහි හෝ ඒ විඥප්ති රූපවය නැත්තේයි. කුමක්හෙයින්ද යත්? චිත්තජ නොවන හෙයිනි.

බෙරවැයීම්-වීනාගැම් ආදී ශබ්ද චිත්තසමුට්ඨාන උතුජ නම් වෙයි. ධූම්රථ-නැව් ආදීන්ගේ ගමනාදිය එසේම චිත්තසමුට්ඨාන වායොධාතුවෙන් හටගන්නේයි. නිෂ්පන්නරූපයන්ගේ සැහැල්ලු බව ලඝුතාරූප නම් වෙයි. නිෂ්පන්නරූපයන්ගේ මොලොක්බව මුදුතාරූප නම් වෙයි. ඒ ඒ ක්‍රියාවන්ගේ ඉවසීම කම්මඤ්ඤතා රූප නම් වෙයි. ලඝුතා රූපය වනාහි නිරොගී පුරුෂයෙකුට සමානවෙයි. නොහොත් දවස මුලුල්ලෙහි රත්කරණලද අය සකණ්ඩයකට බඳුවෙයි. මුදුතා රූපය වනාහි දවසක් මුලුල්ලෙහි මැඩගන්නාලද සම්කඩක් බඳුවෙයි. කම්මඤ්ඤතාරූපය මොනවට පිඹගන්නාලද සුවණ්ණයකට බඳුවෙයි. ඒ රූපයන් තුන්දෙනා හා විඤ්ඤත්තිරූපවයද උපචයරූපය අනිච්චතාරූපය යන ඒ රූපයෝ සත්දෙන නිෂ්පන්නරූපයන්ගේ විකාරවන හෙයින් විකාරරූප නම් වෙයි. "උපචය රූපය" යනු ප්‍රතිසන්ධිකාලයෙහි කාය-භාව-වස්තු යන කලාපයන් තුන්දෙනාගේ ප්‍රථමොත්පත්තිය උපචයරූප නම් වෙයි. ඒ රූපකලාපත්‍රයම ප්‍රතිසන්ධිචිත්තයාගේ ඨිතික්ෂණය. පටන් දිවිමුලුල්ලෙහි සියලුම ක්ෂණයක් පාසාහට

ගැළීම සන්තතිරූප නම් වෙයි. නිෂ්පන්නරූපයන්ගේ ආයුෂ කුඩා ක්ෂණ එක්පණසෙක් වෙයි. ඒ එක්පණස අතුරෙන් පළමුවන උත්පාදක්ෂණය උපචය රූපයට සමාන වෙයි. අන්තිම භඞ්ගක්ෂණ රූපය අනිච්චතා රූපයට සමාන වෙයි. මධ්‍යයෙහිවූ එකුන්පණස් ක්ෂණයෝ ජරතා රූපයට සමාන වෙයි. උප්පාද-ඨිති-භඞ්ගසඞ්ඛ්‍යාතවූ ක්ෂණත්‍රයක් කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්තිරූපයන් දෙදෙනාගේ ආයුෂ වෙයි. මෙසේ උපචය සන්තති ජරතා කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපයන් පස්දෙන වර්ජිත කොට ඇත්තාවූ අවශෙෂ තෙවිසිරූපයෝම සතළොස් මහාක්ෂණයකට හෝ එක්පණස් කුඩා ක්ෂණයකට හෝ ආයුෂ ඇත්තාහුයයි දතයුතුයි. එහෙයින් සච්චසංඛෙපයෙහි "තං සත්තරසචිත්තායුවිනාවිඤ්ඤත්ති ලක්ඛණං" යනු කීහ. මේ සියලු රූපයන් එකතුකළ කල්හි අටවිස්සෙක් වෙති. අටවිසි රූපයෙහි එකොළොස් ප්‍රභෙදය නම්:—භූත රූපය, පසාදරූපය, විසයරූපය, භාවරූපය, හදය රූපය, ජීවිතරූපය, ආහාරරූපය, පරිච්ඡෙදරූපය, විඤ්ඤත්ති රූපය, විකාරරූපය, ලක්ෂණරූපය යන මොවුන්ගේ වශයෙන් එකොළොස් වැදෑරුම් වෙයි. සියලුරූපතෙමේ සහෙතුක අහෙතුක යන විප්‍රකාරයන් අතුරෙන් ලොභාදී හෙතු වශයෙන් නූපදනා හෙයින් අහෙතුකම වෙයි. සප්පච්චය අප්පච්චය යන විප්‍රකාරයන් අතුරෙන් කර්ම-චිත්ත-ඍතු-ආහාර යන සතර ප්‍රත්‍යයෙන් හටගන්නා හෙයින් සප්පච්චයම වෙයි. එසේවුවත් මේ සතර ප්‍රත්‍යයෙන් එකවිට හටගන්නේ නොවෙයි. කර්මයෙන් හටගන්නා රූපය, චිත්තයෙන් හටගන්නා රූපය, ඍතුවෙන් හටගන්නා රූපය, ආහාරයෙන් හටගන්නා රූපයයි වෙන්වශයෙන් යොදාගතයුතුයි. සාසව අනාසව යන විප්‍රකාරයෙන් චතුරාශ්‍රවයන්ට අරමුණුවන හෙයින් සාසව වෙයි. සඞ්ඛත අසඞ්ඛත යන විප්‍රකාරයෙන් යටකී කර්මාදී සතර ප්‍රත්‍යයෙන් සකස්කළ හෙයින් සඞ්ඛත නම් වෙයි. අනාශ්‍රවවූ අසඞ්ඛතවූ රූපයක් නම් නැත්තේයි. ලෞකිය අලෞකිය යන විප්‍රකාරයෙන් සංස්කාරලොකයට ඇතුළත්වන හෙයින් ලෞකිය නම් වෙයි. අලෞකිය නම් රූපයෙක් නැත්තේයි. කාමාවචර අකාමාවචර යන විප්‍රකාරයෙන් කාමතෘෂ්ණාවට ගොචරවන හෙයින් සියලුම රූපය කාමාවචර නම් වෙයි. අකාමාවචර නම්වූ රූපයෙක් නම් නැත්තේයි. කාමාවචර චිත්තය රූපාවචර චිත්තයයි ව්‍යවහාර කරන්නාක් මෙන් කාමභූමියෙහි බොහෝ සෙයින් හැසිරෙන හෙයින් කාමාවචර නම් වෙයි. අනාරම්මණ සාරම්මණ යන විප්‍රකාර චිත්තයන් මෙන් අරමුණු නොගන්නා හෙයින් සියලු රූපයම අනාරම්මණ

නම් වෙයි. සාරම්මණරූපයෙක් නම් නැත්තේයි. අප්පහාතබ්බ පහාතබ්බ යන විප්‍රකාරයන් අතුරෙන් තදඞ්ගාදී ත්‍රිවිධාකාරයෙන් නොපැහිය යුතු බැවින් සියලුරූපය අප්පහාතබ්බ නම් වෙයි. ප්‍රහාතව්‍යරූපයෙක් නම් නැත්තේයි. මෙසේ එකවිධ ක්‍රමයෙන් සියලුම රූපය අවබොධ කටයුතුයි.

තදනන්තරව විප්‍රකාරය දක්වනු ලැබේ:—පචප්‍රශාද රූපය වනාහී ඉදින් නොපකෙරෙහි අපනුවූයෙහි නම් නොපකටවූ කලිඞ්ගරයකට බඳුවෙයි. යනුවෙන් කියන්නාක් මෙන් අධ්‍යාත්මයට උපකාරවන හෙයින් අජ්ඣත්තික නම් වෙයි. අවශෙෂ සියලු රූපය අධ්‍යාත්මයට එසේ උපකාර නොවන හෙයින් බාහිර රූප නම් වෙයි. ප්‍රශාදරූප පසය, හදයරූපය යන මේ සදෙන සප්තවිඥාන ධාතූන්ට නිශ්‍රයවන හෙයින් වත්ථු රූප නම් වෙයි. අවශෙෂ සියලු රූප අවත්ථුරූප නම් වෙයි. පසාදවිඤ්ඤත්ති රූපයෝ අටදෙන වනාහි කුශලාකුශලකර්මය, චිත්තචෛතසිකය, කායවචීකර්මය යන මොවුන්ගේ පැවැත්මට ද්වාරයන් බැවින් ද්වාර රූප නම් වෙයි. අවශෙෂවූ සියලු රූපය අද්වාරරූප නම් වෙයි. හෙවත් චක්ෂුද්වාරතෙමේ චක්ෂුද්වාරයෙහි හටගන්නා හෙයින් සසාලිස්චිත්තයන්ගේ නික්මීමට ද්වාරයක් වන බැවින් ද්වාර රූප නම් වෙයි. සොත-ඝාණ-ජිව්හා-කාය රූපයෝද එසේමැයි. කායවිඤ්ඤත්ති රූපතෙමේ ත්‍රිවිධාකාර කායකර්මයන්ගේ පැවැත්මට ද්වාරයක් වැනි හෙයින් ද්වාර රූප නම් වෙයි. පසාද භාව-ජීවිතරූපයෝතුමූ ඉන්ද්‍රාර්ථයෙන් යුක්තහෙයින් ඉන්ද්‍රියරූප නම් වෙයි. හෙවත් චක්ෂුර්දශක කලාපයෙහි චක්ෂුප්‍රශාද රූපතෙමේ අවශෙෂ රූපයන් නවදෙන තමාගේ වසඟයෙහි පවත්වයි. සෙසු සියලු ඉන්ද්‍රිය රූපයන්ගේ ඉන්ද්‍රාර්ථය එපරිද්දෙන්ම දතයුතුයි. අවශෙෂ සියලු රූපයන් අනින්ද්‍රිය නමි. පසාද-විසය සඞ්ඛ්‍යාතවූ දොළොස් රූපයෝ තුමූ ස්ථූලභාවයෙන් යුක්ත හෙ හෙයින් ඖදාරික රූප නම් වෙයි. සමීපයෙහි පවත්නාක් මෙන් වන හෙයින් සන්තිකෙරූප නම් වෙයි. හැපීම් සහිතව පවත්නා හෙයින් සප්පටිඝරූප නම් වෙයි. අවශෙෂ සොළොස් රූපය, සූක්ෂ්මරූපය, දූරෙරූපය, අප්පටිඝරූපයයි කියත්. අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ලන්කොට ගන්නාලද්දවූ කුශලාකුශල කර්මයන්ගේ විපාකවූ රූපය උපාදිණ්ණ රූප නම් වෙයි. සෙසු සියලු රූපය අනුපාදිණ්ණ නම් වෙයි. අටවිසි රූපයන් අතුරෙන් එකම රූපාලම්බනය දක්නයුතු හෙයින් සනිදස්සන රූප නමි. සෙසු සත්විසිරූපය අනිදස්සන රූපනමි.

චක්ෂු--ශ්‍රොත්‍ර දෙදෙන අරමුණුකරා නොපැමිණ හෝ අරමුණු තම තමන් කරා නොපැමිණ හෝ ආපාථ ගතවන හෙයින් අසම්පත්තවිෂයග්‍රාහී නම් වෙයි. අවශෙෂ ඝ්‍රාණ-ජිව්හා- කාය යන තුන්දෙනා කරා ගොචරයන් පැමිණිකල්හි ආපාථගතවන හෙයින් ගොචරග්‍රාහී රූපනම්වෙත්. අවශෙෂ සියලු රූපය අගොචරග්‍රාහී නම් වෙයි. වර්ණ-ගන්ධ-රස-ඕජා-භූත සතරය යන මේ රූපයෝ අටදෙන එකාන්ත වෙන් කොට නොගතහැකි හෙයින් අවිනිර්භොග රූපනම් වෙයි. සුද්ධාෂ්ටක රූපය, ඕජට්ඨමකරූපය යන පරියාය නම්ද වෙත්. අවශෙෂ රූප වෙන් වෙන්ව ලැබියහැකි බැවින් විනිර්භොග රූප නම් වෙත්. සියලු පෘථුවී පර්වත ගඞ්ගා සමුද්‍රාදියෙහි ඇති අතීන්ද්‍රිය බද්ධරූපය මේ සුද්ධාෂ්ටක අවිනිර්භොග රූපයයි දතයුතුයි. කාමාවචර කුශලාකුශල විස්සය, රූපාවචර කුශල්පසය යන මේ පස්විසි චිත්තයෝ තුමූ අධ්‍යාත්මසන්තානයෙහි පටිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය පටන් සියලුම චිත්තයන්ගේ උත්පාදස්ථිති භඞ්ග යන තුන් ක්ෂණයක්පාසා හෙවත් නිරන්තරයෙන්ම කර්මජ රූපයන් උපදවති. මේ එකාන්ත සමානවාදයයි. අභයගිරි ජෙතවන වාසීහු වනාහි:- චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි චුති-ඨිති-භඞ්ග යන ක්ෂණයන්හි කර්මජරූපයෝ නූපදනාහුයයි කියත්. එසේ කියන්නේ මක්නිසාදයත්? යමක ප්‍රකරණයෙහි නයදන විශයෙන් එදළ දෙශනාවෙක්හි ස්වභාව මාත්‍රය නොහැඟීමෙන් එසේ කියන්නාහු වෙති. ඒ කර්මජරූපකලාපනවයෙහිම ජීවිතෙන්ද්‍රිය නවදෙනෙක් විද්‍යමාන වෙති: අවශෙෂවූ චිත්තජ-ඍතුජ-ආහාරජ රූපකලාපයෙහි ජීවිතෙන්ද්‍රියය කුමක් හෙයින් නැත්තේදයත්? පූර්වජාතියෙහි කළාවූ යටකී පස්විසි වැදෑරුම් කුශලාකුශලකර්ම නැමති මව විසින් ප්‍රතිසන්ධිකාලයෙහි කර්මජ රූපයන් උපදවා වැදූහෙයි මව් නසින්නාක්මෙන් ප්‍රතිසන්ධිකර්මය නිරුද්ධ වෙයි. වැදූහෙයි මව් නැසුනු ළදරුවෙකු පොෂ්‍යය පිණිස කිරි මවක් අභිමතවිය යුතුවාක්මෙන්ම කර්මතෙමේ කර්මජරූප උපදවා නිරුද්ධවීගිය බැවින් කිරිමවෙකුට සමානවූ ජීවිතෙන්ද්‍රියය ඇත්තේ වෙයි. අවශෙෂ තිජ කලාපයන්ගේ උත්පත්තියට කාරණවූ මව්වරුන්ට උපමා ඇත්තාවූ චිත්ත-ඍතු-ආහාරසඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝ තුන්දෙන විද්‍යමානවන බැවින් අවශෙෂ තිජකලාපයන්ගේ ජීවත්වීමට ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයොජනයක් නොමැත්තේය. ඉදින් ප්‍රතිසන්ධිකාලයෙහි කර්මජරූපයන් උපදවන්නාවූ කුශලාකුශල කර්මබීජය ජීවත්ව තුබුයේ නම් ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයොජනයක් නැත්තේ වේද, එහෙයින් කුශලාකුශල කර්මය ප්‍රති

සන්ධිය උපදවා කුමක් හෙයින් නිරුද්ධවන්නේද යත්? ලෝකයෙහි අංකුරය උපදවන්නාවූ සියලු බීජ ජාතීහු අංකුරය උපදවා විනාශවීයාම ලෝකස්වභාව ධර්මයක් බැවින් කුශලාකුශල කර්ම සංඛ්‍යාත බීජයද, ප්‍රතිසන්ධි නාමස්කන්ධ කටත්තා රූපයන් උපදවා නිරුද්ධවීයාම යුක්ති යුක්තවන්නේයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ජලාබුජ සත්වයන්ගේ කාය භාව වස්තු සංඛ්‍යාත කලාපත්‍රයක්ද, ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි එම රූපකලාපත්‍රයක්ද, ප්‍රතිසන්ධි චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි රූපකලාපත්‍රයක්දැයි මෙසේ කර්මජරූපකලාපයෝ නවදෙනෙක් වෙති. ප්‍රතිසන්ධි චිත්තයෙහි පටන් අනුලෝමවශයෙන් ගිණූ කල්හි සතළොස්වන චිත්තයාගේ නිරුද්ධයෙහි කායකලාප එක්පණසෙක්ද, භාවකලාප එක්පණසෙක්ද, වස්තු කලාප එක්පණසෙක්දැයි මෙතෙක් රූප කලාපයෝ සම්පූර්ණවෙති, ප්‍රතිසන්ධි චිත්තය හටගත් තැන් පටන් සත්තෑසත් රැයක් සම්පූර්ණවූ කල්හි චක්ෂුර්දශක කලාපයද, ඊලඟ සතියෙහි ශ්‍රොත්‍රදශක කලාපයද, ඊලඟ සතියෙහි ඝ්‍රාණදශක කලාපයද, ඊලඟ සතියෙහි ජිව්හාදසක කලාපයදැයි මෙසේ කර්මජ රූපකලාපයෝ සත්දෙනෙක් සම්පූර්ණවෙති. ඊට පසු මව්කුස උපන් සත්වයාගේ ආමාශය යම් දවසක හටගණීද, කර්මජ තෙජෝධාතු සංඛ්‍යාතවූ ඉතා උතුම් තෙජෝ ධාතු සහිතවූ කර්මජනවක කලාපය පහළ වෙයි. මේ සියලු කර්මජ රූපයන්ගේ හටගැණීමවූ චිත්තක්ෂණය පටන් සතළොස් වන චිත්තක්ෂණය සම්පූර්ණවූකල්හි එක එක කර්මජ රූපකලාපයෙන් එකුන් පණස් කලාප නොතෙක් ධරමානව පවතිත්; හටගණිමින් පවත්නා කලාපය හා නිරුද්ධ වෙමින් පවත්නා කලාපයද එක්කොට එක්පණස් කලාපය කැයි කියයුතුයි. මෙසේ එකකර්මජ කලාපයෙන් එක් පණස බැගින් පැවතීම් චුති චිත්තයට ආපසු ගිනූකල්හි සතළොස්වන චිත්තක්ෂණය පටන් කර්මජ රූපයන්ගේ පිරිහීම පටන්ගෙණ චුති චිත්තයාගේ භඞ්ගක්ෂණය හා සියලු කර්මජ රූපයන්ගේ නිරුද්ධය එකක්ෂණිකවම වන්නේයි.

## මේ කර්මජ රූපයන්ගේ විභාගයයි.

---

චිත්තජ රූපය වනාහි චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙහිම හටගන්නේයි. කර්මජ රූපයන්මෙන් ස්ථිතික්ෂණ භඞ්ගක්ෂණ දෙක්හි චිත්තජ රූපයෝ නූපදනාහුමැයි. එතකුදුවූවත් අරූපා

වචර විපාක සතරය, දෙපස් විඥාන දසය, රහතුන්ගේ චුති චිත්තය යන පසළොසහැර අවශෙෂවූ පන්සැත්තෑවක් චිත්තයෝ තුමූ ප්‍රතිසන්ධි සිතට අනතුරුව උපදනා පළමුවන භවාඞ්ග චිත්තයාගේ උත්පාදක්ෂණය පටන් පඤ්චවෝකාර භවයෙහි හට ගන්නාවූ ඒ පන්සැත්තෑවක් චිත්තයන්ගේ සියලු උත්පාදක්ෂණයෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි චිත්තජ රූපය උපදවන්නාහු වෙති. රහතුන්ගේ චුති චිත්තය වනාහි නැවත ප්‍රතිසන්ධි නොගන්නාහෙයින් රූප ජනක නොවන්නේය යනු අටුවාචාර්‍ය්‍යමතයයි. එතකුදුවුවත් මූලටීකාචාර්‍ය්‍ය ආනන්දස්වාමින් විසින් සියලුම සත්ත්වයන්ගේ චුති චිත්තයට අනතුරුව රූප ජනකවන්නේ සි යනු කියනලදී. දෙදෙන පරිද්දෙන් පරීක්ෂාකොට අර්ථ ගතයුතුයි. අරූප විපාක සතරවනාහි රූප විරාග භාවනාබලයෙන් රූපයෙහි කලකිරම සතර අරූප භූමියෙහි ඇතිහෙයින් කිසිකලෙක්හි රූප ජනක ප්‍රත්‍යය නොවෙති. දෙපස් විඤ්ඤාණ දසයවනාහි කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? රූපයන්ගේ උත්පත්තියට වනාහි විතර්කාදී ධ්‍යානාඞ්ගයෝ තුමූ සාතිශය හෙතුවෙත්. දෙපස්විඥානයෙහි ධ්‍යානාඞ්ග නැති බැවින් රූප ජනක නොවෙයි. දෙපස් විඥානදසයෙහි කුමක් හෙයින් ධ්‍යානාඞ්ගනැත්තේද යත්? සුඛ සහගත කායවිඥානයෙහි සුඛ ධ්‍යානාඞ්ගයද, දුඃඛ සහගත කායවිඥානයෙහි දුඃඛ සඞ්ඛ්‍යාත අකුශල ධ්‍යානාඞ්ගයද, හසිතොත්පාද සොමනස්ස සන්තීරණවයෙහි ප්‍රීති ධ්‍යානාඞ්ගයද දෙපස්විඥානයෙහිම එකාග්‍රතාධ්‍යානාඞ්ගයද මෙසේ යෙදීව ඇතිබැවින් කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? “විතක්ක පච්ඡිමකන්නති ඣානඞ්ගනති පවුච්චති” යනු පරිහාරයි. ඒ සුඛ දුඃඛ ප්‍රීති එකාග්‍රතාවෝ තුමූ විතර්කය පසුකොට ඇතිකල්හිම ධ්‍යානාඞ්ග නම් වෙත්. මේ පස් විඥානයෙහි ඇත්තාවූ සුඛාදී ධර්මයෝවනාහි විතර්ක සම්ප්‍රයුක්ත නොවනහෙයින් ධ්‍යානාඞ්ගයයි නොකියත්. එහෙයින් දෙපස් විඥානයෝ තුමූ රූප ජනක නොවෙත්යයි දතයුතුයි. සතරඅරූපාවචර විපාකයෝවනාහි කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? හෙතෙම රූප නැත්තාවූ භූමියෙහිම පවත්නාහෙයින් රූප ජනක නොවන්නේයි. නොහොත් අරූපධ්‍යානය ලබනු පිණිස කර්මස්ථාන භාවනාකරන්නාවූ යොගාවචර තෙමේ රූපය ඇතිකල්හි දණ්ඩාදාන ශස්ත්‍රාදාන වන්නේය. සාමාන්‍යයෙන් කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්තිදෙකින් හටගන්නාවූ සියලු කායකර්ම වචීකර්මයෝ රූපයෙන්ම හට ගන්නාහුයයි රූපයෙන් වෙන්වූ භූමියක් ලබනු පිණිස අරූප

ධ්‍යාන උපදවන්නේසි. එහෙයින් අරූපාවචර විපාක සතර ඒකාන්තයෙන් රූපජනක නොවන්නේයයි දතයුතුයි. මූලටීකායෙහි ප්‍රතිසන්ධි චිත්තයද රූප ජනක නොවන්නේයයි කියන ලදී. කුමක්හෙයින යත්? කර්මජ රූපයන් විසින් චිත්තජ රූපයන්ගේ ස්ථානය ගන්නාලද බැවින්ද, ඒ භවයට ආගන්තුක බැවින්ද ප්‍රතිසන්ධි සංඛ්‍යාතවූ ව්‍යාපාරාන්තරයක් අපේක්ෂාකරණහෙයින්ද ප්‍රතිසන්ධි චිත්තය රූපජනක නොවන්නේසි. එය කුදුවුවත් ඒ ප්‍රතිසන්ධි සිතම ඒ භවයෙහි මරණතාක්කල් මුලුල්ලෙහි භවාඞ්ගවශයෙන් පවත්නාකල්හි චිත්තජ රූප උපදවන්නේසි. එහෙයින් ප්‍රතිසන්ධි චිත්තයද තමාගේ සභාගිකවූ භවාඞ්ගයන් විසින් රූප උපදවනහෙයින් ප්‍රතිසන්ධි සිතද රූප ජනක ප්‍රත්‍යය භාවයෙන් නොමිදෙන්නේසි, මාර්ගයෙහි යන්නාවූ පුරුෂ තෙමේ මාර්ගක්ලාන්තය නිසා පා විසින් කටයුතු කෘත්‍යය නොකටහැකිවාක්මෙන් ප්‍රතිසන්ධි චිත්තය රූප ජනක නොවියයුතුයි. කර්මජ රූපය වනාහි එක එක චිත්තයාගේ උත්පාදස්ථිති භඞ්ග යන ක්ෂණත්‍රයෙහිම කර්මජ රූපයන් උපදවන්නාක්මෙන් චිත්තජ රූප උපදවන්නාවූ චිත්තය තමාගේ ස්ථිති භඞ්ග කාලයෙහි චිත්තජ රූප නූපදවා උත්පාදක්ෂණයෙහිම කුමක්හෙයින් රූප උපදවන්නේද යත්? චිත්තජ රූප ඉපදවීමට වනාහි පූර්වචිත්තයෙන් ආසේවන ප්‍රත්‍යය බලවත් උපකාරයවෙයි, පූර්වචිත්තයෙන් ආසේවන ප්‍රත්‍යය ලැබීම වනාහි උත්පාදක්ෂණයට මුත් ස්ථිති භඞ්ගක්ෂණවයට නොලැබෙන්නේසි. මෙසේ පූර්වචිත්තයෙන් ලැබෙන්නාවූ ආසේවන ප්‍රත්‍යය ස්ථිති භඞ්ගයන්ට නොලැබෙනහෙයින් ස්ථිති භඞ්ගදෙකෙහි චිත්තජ රූප නොලැබෙන්නේයයි දතයුතුයි. රූප උපදවන්නාවූ පන්සැත්තෑවක් චිත්තයන් අතුරෙන් සවිසි අර්පණා ජවනයෝ තුමූ රූප ඊර්යාපථ සංඛ්‍යාතවූ අහසින්යාම පොළව කිමිද යාම නොයෙක්දේ මවා පෑම යනාදිය උපදවන්නේසි. ව්‍යවස්ථාපන චිත්තය හා එකුන්තිස් කාමාවචර ජවන්හුය, අභිඥා කුශල අභිඥා ක්‍රියා යන දෙසිතය යන මෙතෙක් චිත්තයෝ තුමූ රූප ඊර්යා පථ සංඛ්‍යාතවූ කායවිඥප්ති වචීවිඥප්තිහුද උපදවන්නාහුවෙත්. සෞමනස්ස සහගත තෙළෙස් ජවනයෝ තුමූ රූප ඊර්යාපථය හා කායවිඥප්ති වචීවිඥප්ති දෙදෙනය සිනාවය යන මෙතෙක්දේ උපදවන්නාහුවෙත්. අසූතවයක් චිත්තයන් වෙන් වෙන් වශයෙන් බෙදා රූපය ඉපදවීම දක්වන්නාවූ තන්හි ලොභ මූලිකවූ සෞමනස්ස සහගත චිත්තයෝ සතරදෙන කර්මජරූපය, චිත්තජරූපය, ඊර්යාපථය, විඥප්ති

රූපය, සිනාසීමය, යන පසක් උපදවත්. ලොභ මූලිකවූ උපෙක්ෂාසහගත චිත්තයෝ සතරදෙන වනාහි යටකී පඤ්චධර්මයන් අතුරෙන් සිනාව හැර අවශෙෂ සතර උපදවන්නාහුය. ද්වෙෂ මූලික මොහමූලික චිත්තයෝ සතරදෙන වනාහි කර්මජ රූපය, චිත්තජ රූපය, ඊර්යාපථය, විඥප්තිරූපමය, යන මේ සතර ධර්මය උපදවන්නාහුවෙති. දෙපස් විඥානයන් හා අරූපාවචර සතර විපාකය යනමේ තුදුස් චිත්තයෝ තුමූ ඒ එකද රූපය කුත් නූපදවන්නාහුවෙති. මනොධාතුත්‍රිකය සන්තීරණත්‍රිකය යන චිත්තයෝ සදෙන යටකී පඤ්චධර්මයන් අතුරෙන් එකම චිත්තජ රූපමාත්‍රයක් උපදවන්නාහුය. ව්‍යවස්ථාපන චිත්තය වනාහි චිත්තජ රූපය ඊර්යාපථය, විඥප්තිය යන තුන උපදවන්නේවෙයි. හසිතුප්පාද චිත්ත තෙමේ චිත්තජ රූපය, ඊර්යාපථය, විඥප්තිරූපය, සිනාවය, යන ධර්ම සතරදෙන උපදවන්නාහුය. රූපාවචර කුශල කර්මතෙමේ කර්මජරූපය, චිත්තජ රූපය, ඊර්යාපථය, විඥප්තිය, යන සතර ධර්මය උපදවත්. රූපාවචර විපාක තෙමේ චිත්තජරූපය, ඊර්යාපථය, යන ධර්මද්වය උපදවන්නාහුය. රූපාවචර ක්‍රියා තොමෝ චිත්තජ රූපය, ඊර්යාපථය, යන ධර්මයුගලය උපදවත්. අරූපාවචර කුශල ක්‍රියා යන අටදෙන වනාහි චිත්තජ රූපය, ඊර්යාපථය යන ධර්ම යුගලය උපදවන්නාහුවෙත්. ලොකොත්තර කුශල විපාක යන අටදෙන වනාහි චිත්තජ රූපය, ඊර්යාපථය, යන ධර්මද්වය උපදවන්නාහුවෙති. අටමහා කුශලයෝවනාහි ලොභ මූලික අකුශල් අට බෙදූ ක්‍රමයෙන් අවිශෙෂයෙන් බෙදියයුතුයි. මහාවිපාක අටවනාහි රූපාවචර විපාක පඤ්චකයට සර්වප්‍රකාරයෙන් සමානයි. මහාක්‍රියා අටදෙන අතුරෙන් සොම්නස් සහගත මහාක්‍රියාවෝ සතරදෙන චිත්තජ රූපය, ඊර්යා පථය, විඥප්තිය, සිනාවය, යන සතර උපදවන්නාහුවෙති. උපෙක්ෂා සහගත මහාක්‍රියා සතරදෙනවනාහි සිනාව හැර අවශෙෂ ධර්මයන් උපදවන්නාහුවෙති. සියලු තැන්හිම විඥප්ති රූපවය ලැබෙන්නේවී නම් ඊර්යා පථයද ලැබෙන්නේයි. කුමක් හෙයින යත්? අවිනිර්භොග ශුද්ධාෂ්ටක රූපකලාපයෙහි පෘථුවි ධාතුව වෙන්කොටගන්නාකල්හි අවශෙෂ ධර්ම සප්තකයද ලැබෙන්නාක්මෙන් විඥප්ති රූප හා ඊර්යාපථයද වෙන්නොකොට හැක්කේමැයි. සිනාවගේ හෙතු ධර්මයෝ වනාහි යටකී නයින් අවබොධකටයුතුයි.

හසිතොත්පාදය වනාහි බුදු පසේබුදු මහරහත් යන ආර්යයන්ටම ලැබෙයි. බුදුන්ගේ සියලු කාය වචී මනොකර්මයෝ ඥාන

පූර්වාඞ්ගම බැවින් මේ හසිතොත්පාදය බුදුන්ට නූපදීයයි ඇතැම් ආචාර්ය්‍ය මතයකි. ඒ යුක්ති යුක්ත නොවන්නේයි. කුමක්හෙයින යත්? චාවොදගතකාරණලද ග්‍රන්ථයක් සතිවිප්‍රවාසයෙනුදු සජ්ඣායනා කලහැකිවාක්මෙන් සර්වඥතාඥානයට අනුව මේහසිතොත්පාදය උපදියි. එහෙයින් මේ හසිතොත්පාදය බුදුවරයන්ට උපදනාකල්හි ඥානය පසු පස්සෙහි ගමන් කාරණබවද, අවශෙෂ රහතුන්ට ඥානවිප්‍රයුක්තවද උපදනා බව දතයුතුයි. කර්මජ රූප කලාපයන්ගේ ස්ථිතිකාලයෙහි එම කර්මජ රූපයන් තුන්දෙනා කෙරෙහි විද්‍යමානවූ තෙජො ධාතු තොමෝ පටිසන්ධිහුගේ ස්ථිති කාලයට පැමිණිකල්හි බහිද්ධා තෙජො ධාතු සඞ්ඛ්‍යාතවූ ශීතොෂ්ණය ලැබුණුකල්හි අභ්‍යන්තර තෙජො ධාතුහුද උතුජ රූප උපදවත්මැයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි වනාහි කුමක්හෙයින් උතුජ රූප උපදවන්නාහුද යත්? පච්ඡාජාත ප්‍රත්‍යයෙන් උපකාර නොලැබූ හෙයින් ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි උතුජ රූප නූපදවත්. නොහොත් කර්මජ තෙජො ධාතුව විසින් උතුජ රූපයන්ගේ ස්ථානය ගන්නාලද හෙයින් උතුජ රූප නූපදවත් ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතිකාලයට පැමිණියේ නමුදු ප්‍රථම භවාඞ්ග චිත්තය නූපන්හෙයින් පච්ඡාජාත ප්‍රත්‍යය වන්නාවූ සිතක් නූපන් 1 ස්ථිතිකාලයෙහි ද උතුජරූප නූපදවත්. අධ්‍යාත්මික උතුජරූප තෙමේ බාහිරඋතුජරූපයෙන් උපස්තම්භ ලැබීමෙන් ම රූපයාගේ ස්ථිතිකාලයට පැමිණීමෙන් ම උතුජරූප උපදවත් මැයි. මහාභූතයන්ගේ පරම්පරාගතව රූපයන්ගේ හටගැණීම් වනාහි මවගෙන් දියනියන් ද, දියනියන්ගෙන් මිනිබිරිය ද, පරම්පරා වශයෙන් හටගන්නාක් මෙන් පෘථුවීධාතුවෙන් තවත් පෘථුවිධාතුවක් ද, එයින් තවත් පෘථුවිධාතුවක් දැයි මෙසේ පරම්පරා වශයෙන් රූපකලාපයන්ගේ හටගැණීම වන්නේ යි. ආහාරජ රූප තෙමේ බාහිර වූ ෂඩ්රසය ලැබීමෙන් හෙවත් බාහිර වූ ආහාරරූපයෙන් රුකුල් ලැබීමෙන් ම අධ්‍යාත්මික ආහාරජ රූපය උපදවන්නේ මැ යි. අධ්‍යාත්මික සන්තානයෙහි විද්‍යමාන වූ කර්මජකලාපයෙහි ඕජාව ය, චිත්තජකලාපයෙහි ඕජාව ය, උතුජ කලාපයෙහි ඕජාව ය, යන මේ ත්‍රිවිධාකාර වූ ඕජා කලාපයෝ තුමූ තමතමාගේ ස්ථිතිකාලයට පැමිණිකල්හි ම අධ්‍යාත්මික සන්තානයෙහි ආහාරජරූපයන් උපදවන්නේ යි. ඒ ආහාරජරූපය ද බහිද්ධාඕජාව ලැබීමෙන්ම ඒ ඕජාව ශරීර

1 හසිතොත්පාද චිත්තය සම්බන්ධව ආචාර්ය්‍යවාද මත භෙද ඇත්තේ නමුදු සර්වඥ බුදුවරයෝ ඥානසම්ප්‍රයුක්ත සිතින්ම සිනහ පහළකෙරෙත්,

යෙහි පැතිර ගිය කල්හි ම අබ්‍යන්තරඕජාවෝ රූප උපදවත්. අබ්‍යන්තරඕජාරූපයන්ගේ ඨිතිකාලය යනු ක්‍ෂුද්‍රක්‍ෂණ එකුන්පණසක් ඨිති කාලය යි කියැත්. අධ්‍යාත්මික සන්තානයෙහි ඇත්තා වූ ඕජා තොමෝ ඨිති කාලයට පැමිණියේ නමුදු බහිද්ධාහාරයෙන් උපස්තම්භ නො ලැබුයේ නම් එකාන්තයෙන් රූප නුපදවත් මැ යි. එට උපමා නම්:—දෘෂ්ටධර්මවේදනීය කර්මයෙන් උපස්තම්භිතවූ අපරාපර්‍යායවේදනීය කර්මය වෙති. බහිද්ධාඕජාව හා දෘෂ්ටධර්මවේදනීයය ද අධ්‍යාත්මික ඕජාව හා අපරාපරියවේදනීයකර්මය ද උපමාඋපමේය වශයෙන් සම්බන්ධ කට යුතු යි.

හෘදය ඉන්ද්‍රිය රූපයෝ තුමූ කර්මයෙන් ම හටගන්නා හෙයින් එකාන්ත කර්මජරූපයෝ නවදෙනෙකි. අවිනිර්භාග ශුද්ධාෂ්ටකලාපය, ආකාශධාතුය, යන මේ රූපයෝ තුමූ රූප ජනක සතර ප්‍රත්‍යයෙන් ම හටගන්නාහු වෙති. එහෙයින් අනෛකාන්තික කර්මජරූපයෝ නවදෙනෙකැ යි කියා ද, අට ළොස් කර්මජරූපකෙනෙක් වෙත්. විඥප්තිරූපවය එකාන්ත සිතින් ම හටගන්නා හෙයින් එකාන්ත චිත්තජරූපවයක් ම වෙයි. ශබ්දය හා ලඝුතාදිත්‍රයද, අවිනිර්භාග ශුද්ධාෂ්ටක රූපයද, ආකාශධාතුවද, යන මේකී රූපයෝ තුමූ සතර ප්‍රත්‍යයෙන් ම හටගන්නා හෙයින් අනෛකාන්තික චිත්තජරූපයෝ තෙළෙස්දෙනෙක් වෙත්. මෙසේ එකාන්ත චිත්තජරූපයෝ දෙදෙනාය. අනෛකාන්තික චිත්තජරූපයෝ තෙළෙස්දෙනාය, යන ගණින් දෙක පිඬු කළ කල්හි පසළොස් චිත්තජරූප කෙනෙක් වෙත්. ශබ්ද තෙමේ චිත්තජ ශබ්දය උතුජ ශබ්දය යි ද්විප්‍රකාරවෙයි. එයින් අකාරාදී අක්‍ෂරයන්ගෙන් උපදින ශබ්ද තෙමේ චිත්තජ ශබ්ද නමි. බඹුරගෑමය, මෙඝශබ්දය, වාත ශබ්දය ආදිය උතුජ ශබ්ද නමි. භෙරිවීණාඝණ්ටා ආදි ශබ්දයන් චිත්තය කාරණකොටගෙණ ම හටගන්නා හෙයින් චිත්තපච්චය උතුජශබ්ද නම් වෙයි ශබ්දලඝුතාදිත්‍රය, අවිනිර්භාගශුද්ධාෂ්ටකරූපය, ආකාශ ධාතුය, යන මේ තෙළෙස් රූපයෝ තුමූ උතුජරූපයෝ නම්වෙත්. ලඝුතාදිත්‍රය, අවිනිර්භාගරූපය, ආකාසධාතුය, යන මේ දොළොස් රූපයෝ තුමූ ආහාරජ රූප නම් වෙත්.

සියලු ම චිත්තජ උතුජරූපයෝ වනාහි සෙසු ප්‍රත්‍යවයෙන් ද උපදනා හෙයින් අනෛකාන්තික ම වෙත්. ලක්‍ෂණ රූප සතරදෙන වනාහි අටළොස් නිෂ්පන්නරූපයන්ගේ උප්පාදවයි

නිභඩ්ගයන් ම වන හෙයින්ද වස්තු දශකාදී රූපයන්ගේ සව භාව ලක්ෂණයක් හෙයින්ද අසවල් ප්‍රත්‍යයෙන් හටගන්නාහුය යි නො කියයුත්තාහුය. කුමක්හෙයින යත්? උත්පාදක්ෂණයෙන් වෙන් වූ රූපයෙක් නැත්තේයි. එහෙයින් කර්මජරූප චිත්තජ රූප ඍතුජරූප ආහාරජරූපයෝ තුමූ උප්පාදට්ඨිති භඞ්ගයන් ගෙන් ම යුක්ත වන හෙයින් ඒ සියලු ම රූපකලාපයන් හා සමග ලක්ෂණ රූපයෝ ද බෙදියයුත්තාහුය. එහෙයින් පිළිවෙ ළින් දෙවිස්සය, එකුන් විස්සය සතළොසය සොළසයයි කියා ගණන් කටයුත්තාහුය. යම් චිත්තයක යෙදෙන්නා වූ චෛත සික ධර්මයන් හා චිත්තය ත් එකොත්පාදය, එකනිරෝධය, එකාලම්බණය, එකවස්තුකය යි සතර සම්ප්‍රයොග ලක්ෂණය කින් යුක්තවන්නාක්මෙන් එකිඑකී රූපකලාප යෙදෙන්නා වූ රූපධර්මයන්ගේ එකට ඉපදීමය, එකට නිරුද්ධවීමය, පෘථිවි ධාත්වාදී එක් වස්තුවක් නිශ්‍රය කර ගැණිමය චක්ෂුරාදී එක් වස්තු වක් හා පැවතීම් ඇති බව්ය යන ලක්ෂණ සතරයින් උප ලක්ෂිතවූ රූපකලාපයෝ එක්විස්සක් වෙති. ඊට උදාහරණ නම්:— චක්ෂුර්දශකකලාපයෙහි භූතචතුෂ්කය, වර්ණාදිචතුෂ්කය, චක්ෂුප්‍රසාදය, ජීවිතෙන්ද්‍රියය යන රූපයෝ දසදෙන ඉදිරිපසු නොව එකක්ෂණිකව හටගෙණ නිරුද්ධ වන්නා වූ කල්හි ද, ඉදිරිපසු නො වී එකක්ෂණිකව නිරුද්ධ වෙත්. මේ දශකයෙහි පෘථිවි ධාතුව අවශෙෂරූපනවයට ආධාර හෙවත් නිශ්‍රය වෙයි. මේ දශකය එකී භූතව පවතියි. මේ ලක්ෂණ සතරින් සියලු එක්විසි කලාපයෝ ම සමාන වෙත් මැ යි.

චක්ෂුර්දශකකලාපයෙහි ඇති එක් මහාභූතයෙක් තෙමේ අවශෙෂ භූතත්‍රයට නිශ්‍රය වෙයි. ඒ මහාභූතයෝ තුන්දෙන අව ශෙෂ භූතයට නිශ්‍රයස්ථාන වෙයි. මේ සතර මහාභූතයන්ගෙන් අවශිෂ්ට වූ රූපයෝ සදෙන තුමූ උපාදායරූප නම් වෙත්. ඒ උපා දාය රූපයෝ සදෙන සතර මහාභූතයන් නිශ්‍රය කොට ගෙණ පවත්නාහු වෙත්. චක්ෂුර්දශකකලාපයෙන් අන්‍ය වූ මහාභූත නම් වූ ශ්‍රොත්‍රදශකකලාපයෙහි ඇති මහාභූතයන් අනික් කලා පයෙක්හි ඇති මහාභූතයෙක් නිශ්‍රය කොට නො ගණී යි. “සහ වුත්තිනො” යන පදයෙන් මේ රූපකලාපයෝ විසිඑකදෙන එක්ව පවත්නාහුය යි අර්ථ නො ගතයුතු යි. එසේ ම එකට උපදනේය. එකට නිරුද්ධවන්නේය යි කියා ද අර්ථ නො ගත යුත්තාහුය. එතකුදුවුවත් පාලියෙහි “එකුප්පාදා එකනිරොධා එකනිස්සයා සහවුත්තිනො එකවීසති රූපකලාපා” යන පාඨ

යෙන් මේ එක්විසි රූපකලාපයෝ එකවිට උපදනාහුය. එක විට නිරුද්ධවන්නාහුය එකනිශ්‍රයහ එක්ව පවත්නාහුය යි යන අර්ථයක් හැඟේ. එතකුදුවුවත් ඒ ලක්ෂණ සතර එක ම රූප කලාපයෙක් හී හටගන්නා වූ රූපයන්ට මුත් අන්‍යකලාපයක් හා ඒ අර්ථචතුෂ්කය නො යෙදත්ය යි දතයුතුයි. අවිනිර්බ්භොගකලාපය, ජීවිතෙන්ද්‍රියය, චක්ෂුප්‍රසාදය. යන දශයට චක්ෂුර්දශකකලාපය යි කියත්.

ඒ චක්ෂුර්දශකකලාපය ද මහා නිද්දේශපාලියෙහි:- උකුණු හිසකට බඳු වූ උපමා ඇත්තේය යි ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේ විසින් වදාරණ ලද්දේ යි. මෙහි වනාහි උකුණු හිසය යි කී කල්හි ඒ උකුණාගේ චක්ෂුශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය සංඛ්‍යාත වූ කලාපපංචකයක් ඇති වියයුතු හෙයින් උකුණු හිස් ප්‍රමාණය සියලු සත්වයන්ගේ චක්ෂුප්‍රසාදය සඳහා නො වදාළ බව ද, උකුණු හිසෙහි ඇත්තාවූ චක්ෂුප්‍රසාදකලාපය ඒ උකුණු හිසේ ප්‍රමාණයට කුඩාව ඇති බව ද, ආනන්දාදී යොදුන් සිය ගණන් දිගැති සත්වයන්ගේ චක්ෂුප්‍රසාදය උකුණු හිසක් නො වියයුතු යි. එහෙයින් මහා නිර්දෙශපාලියෙහි:- වර්තමානකාලික මනුෂ්‍යයන්ගේ චක්ෂුප්‍රසාදකලාපය උකා ගත්තේ වී නම් එය උකුණුහිසක් ප්‍රමාණ වෙයි. ඒ උකුණුහිසක් ප්‍රමාණ චක්ෂුප්‍රසාද යෙහි බොහෝකලාපයන් එකතුව උකුණුහිසක් ප්‍රමාණ බව ද දතයුතු යි.

ඒ චක්ෂුප්‍රසාද කලාපයෙහි චක්ෂුප්‍රසාදය උදුරා ශ්‍රොත්‍රය යෙදූ කල්හි ශ්‍රොත්‍රකලාපය ද, එය උදුරා ඝ්‍රාණය යෙදූ කල්හි ඝ්‍රාණ ප්‍රසාදකලාපයන් ද, එය උදුරා ජිහ්වාප්‍රසාදය යෙදූ කල්හි ජිහ්වා, ප්‍රසාදකලාපය ද, එය උදුරා කායකලාපය යෙදූ කල්හි කාය ප්‍රසාද කලාපය ද, භාවවස්තූන් යෙදූ කල්හි භාවකලාපවය, වස්තුකලාපය, යන කලාපයෝ හටගනිත් අවිනිර්බ්භොග ශුද්ධාෂ්ට කකලාපය සහා ජීවිතෙන්ද්‍රියය යෙදූ කල්හි ජීවිතනවකකලාපය වෙයි. ජම්බුවෘක්ෂය ආශ්‍රය කොට ගෙණ ජම්බුද්වීපය යි කියත් නාක් මෙන් චක්ෂුප්‍රසාදය නිසා චක්ෂුර්දශකකලාපය යි කියාද, සෙසු කලාපාදීහු දු එසේ ම ඒ ඒ ප්‍රධාන රූපය නිසා කලාප නියමය ව්‍යවහාර කරන්නේ යි. ඒකාන්තක කර්මජ රූපයෝ නව දෙනය, අනෛකාන්තික කර්මජ රූපනවදෙනය යි කර්මජ රූප යෝ අටළොස්දෙනෙක් වෙත්.

අවිනිර්භොග ශුඬාෂ්ටකකලාපය එක් කලාපයෙක්වෙයි. ඒ ශුඬාෂ්ටකයට කායවිඥප්තිය යොදා කායවිඥප්ති නවකකලාපය යි කියත්. ඒ ශුඬාෂ්ටකයට වචීවිඥප්තිය හා ශබ්දය බහා වචීවිඥප්තිදශකය යි කියා ද, ඒ ශුඬාෂ්ටකයට ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන තුණ යොදා ලහුතාදී එකාදශකකලාපය යි කියා ද, එම ශුඬාෂ්ටකයට කායප්‍රඥප්තිය හා ලහුතාදී තුණ යොදා ලහුතාදී ද්වාදශකය යි කියා ද, එම ශුඬාෂ්ටකයට ම වචීවිඥප්තිය හා ලහුතාදී තුණ යොදා වචීවිඤ්ඤත්තිද්වාදශකය යි කියා ද, එම ශුඬාෂ්ටකයට වචීවිඤ්ඤත්තිය හා ශබ්දය ලහුතාදී තුණය යන මෙකී රූපයන් පස්දෙන බහා වචීවිඤ්ඤත්තිතෙරසකය යි කියා ද, මෙසේ චිත්තජ රූපකලාපයෝ සදෙනෙක්වෙත්. ශුඬාෂ්ටකය එක්කලාපයක් වෙයි. ශබ්ද නවකය එක්කලාපයක්වෙයි. ඊට ලහුතාදී තුන්දෙන එක් කොට ලහුතාදී එකාදසක කලාපය යි කියා ද, ඒ ශුඬාෂ්ටකයටම සද්ද ලහුතාදී චතුෂ්කය බහා සද්දලහුතාදී ද්වාදසකකලාපය යි කියා ද, මෙසේ උතුජ කලාපයෝ සතරදෙනෙක් වෙත්. ශුඬාෂ්ටකය එක් කලාපයෙක් වෙයි. ඊට ලහුතාදී තුණ එක් කොට ලහුතාදී එකාදසකකලාපය යි කියත්. මේ ආහාරජ කලාපයෝ දෙදෙනවෙත්. මෙ එක්විසි රූපකලාපයන් අතුරෙන් උතුජ සුඬාෂ්ටකකලාපය, උතුජ සද්ද නවකකලාපය, යන කලාපදෙදෙන බහිඬසන්තානයෙහිද ලැබෙත්. හෙවත් පෘථුවි පර්වත සමුද්‍ර ගඞ්ගා ආදීවූ සියල්ලෙහි උතුජ සුඬාෂ්ටකකලාපය ද, සමුද්‍රඝොෂා මෙඝගර්ජිතා ආදී අවිඤ්ඤාණකසන්තානයෙහි පවත්නා වූ සියලු ශබ්දයෝ උතුජ ශබ්ද නවකකලාප නම් වෙයි.

මේ එක්විසිරූපකලාපයෝම කාමධාතුවෙහි සුදුසු පරිද්දෙන් ලැබෙත්. මේ එක්විසි රූපකලාපයන් අතුරෙන් අනුපාදිණ්ණකසන්තානයෙහි නොහොත් පෘථුවිපර්වත ගඞ්ගා සමුද්‍රාදී සියලු අවකාශලොකයෙහි උතුජ සුඬාෂ්ටකකලාපය හා උතුජ සද්දනවකකලාපයද ලැබේ. උපාදිණ්ණක සන්තානයෙහි මේ සියල්ලමලැබේ. අවශෙෂ වූ ශබ්දයන් පිළිබඳව හටගන්නා වූ හෙරිවීණා දී ශබ්දය චිත්තප්‍රච්චය උතුසමුට්ඨානික ශබ්දය යි. චිත්තජ ශබ්දය වනාහි මුඛයෙන් පිටත නො වන්නේය. එහෙයින් මුඛයෙන් පිටතට යන්නාවූ ශබ්දය චිත්තපච්චය උතුසමුට්ඨාන ශබ්ද නමි. මේ එක්විසි රූපකලාපය ම කාමධාතුවෙහි පරිපූර්ණආයතනඇති සත්ත්වයන්ටම නො අඩුව ලැබෙත්. සත්ත්වයන් අතුරෙහුදු කාමධාතුවෙහි උපදනා ස්ත්‍රියෙක් වී නම් පුරුෂභාවකලාපය හැර විසිකලාපයෙක් ද, කාමධාතුවෙහි උප

දනා පුරුෂයෙක් වී නම් ප්‍රථමකල්පික සත්ත්වයන් හැර අවශෙෂ විසිකලාපයක් ලැබේ. ප්‍රථමකල්පිකයන්ට වනාහි කාමරාගය ඉපදීම දක්වා භාවකලාපද්වය හැර එකුන්විසිකලාපයෙක්ම ලැබේ. ජාතිනපුංසක ජාතිපණ්ඩක උභතොබ්‍යඤ්ජනක සත්ත්වයන්ට ද භාවකලාපද්වය ම නොලැබෙන හෙයින් එකුන්විසිකලාපයෙක් ම ලැබෙත්ය යි දතයුතු යි.

පරිච්ඡෙද ආකාසධාතුව රූපකලාපයන් වෙන්කරන ලක්ෂණ ඇතිහෙයින් වෙන්වෙන්ව ලැබෙ යි. ලක්ෂණරූපයන් සතරදෙන කෙරෙහි ද උපචයසන්තතිරූපද්වය වනාහි එක්ව හටගන්නේය. එක්ව නිරුද්ධවන්නේය. අනිච්චතා රූපය ද නිරුද්ධවන්නේ යි ජරතා රූපයෙහි වනාහි ඒ චතුර්විධලක්ෂණය නොලැබෙන්නේ යි. මෙසේ ආකාසධාතු උපචය සන්තති ජරතා අනිච්චතා යන රූපයන්ගේ කලාපබන්ධනය නො ලැබෙ යි. කුමක් හෙයිනයත්? රූපයන්ට සාධාරණ වූ ලක්ෂණය නැති හෙයි නැයි දතයුතු යි, නොහොත් අනිෂ්පන්නරූපයෝ කුමූ සෙසු චක්ෂුරාදී රූපයන් මෙන් වෙන්වෙන්ව නැති හෙයින් ආකාසධාතු ලක්ෂණරූපයන්ගේ කලාපබන්ධනය නො වන්නේ යි. ඉදින් එසේ වී නම් ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය හා විඤ්ඤත්තිරූපද්වය ද කුමක්හෙයින් කලාපාඞ්ගවශයෙන් නියමකළේද යත්? ඒ රූපයෝ පස්දෙන වනාහි නිෂ්පන්නරූපයන් මෙන් වෙන්වෙන්ව නො ලැබෙන්නේ නමුදු නිෂ්පන්නරූපයන් හා එක්ව හටගැණීමය, එක්ව නිරුද්ධවීමය, සමානනිශ්‍රයස්ථාන ඇතිබවය සහ වෘත්තිය යන මේ සියලු රූපයන්ට ම සාධාරණ වූ ලක්ෂණචතුෂ්කයෙන් යුක්ත හෙයින් කලාපාඞ්ගවශයෙන් නියම කරන්නේ යි.

ඒ රූපයන් පස්දෙන වනාහි ජාතිමත් වෘෂභයාය, පශ්චිමභවික වූ බොධිසත්ත්වයෝය, යන දෙදෙන හැර අන් කිසි සත්ත්වයෙක්හට මව්කුසින් බහිනික්ක්‍රමණය හා සමග නො ලැබෙන්නේ යි ඒ එසේ මැ යි. මහාබොධිසත්ත්වයන් වහන්සේ මව්කුසින් බිහිව පෘථුවියෙහි පිහිටීම හා සමග ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය හා කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්තිද්වය ද එකවිට ම පහළව උත්තරදිශාභිමුඛව සප්තපද වීතිහාරයක් ගොස් "අග්ගොහමස්මි ලොකස්ස" යනාදීන් අභීතසිංහනාදකළෝ. ඊට උපමා දක්වන්නා වූ මහතෙරුන් වහන්සේලා වනාහි:–"මුහුත්තජාතො ව ගවම්පතී යථා" යනාදීන් ගවයන් දහසකට නායකව උපදනා ගවශ්‍රෙෂ්ඨයා ම උපමා කරණ ලද්දේ යි. අවශෙෂ සියලු සත්ව

යන්ට බෝධිසත්වයන්වහන්සේට මෙන් ලහුතාදී රූපපඤ්චකය සම්පූර්ණව නොලැබේ.

අවිනිර්භාගරූපඅටය ශබ්දපාචකකලාපයෙහි රූපනවය යන මේ සතළොස්රූපය උපචය සන්තති ජරතා අනිච්චතා යන ලක්ෂණරූප සතරින් ගුණිත කළ කල්හි අටසැටක් රූපයෝ වෙත්. ඒ අටසැටරූපයන්ගේ එක එක රූපයක් පාසා ආකාශධාතු පසළොස්දෙනෙක් එක් කිරීමෙන් අසූතුන්රූප කෙනෙක් වෙත්. ඒ අසූතුන්රූපයට පළමු කී සතළොස් රූපග බඟා එක්සියයක්රූපයෝ වෙත්ය යි දතයුතු යි. මෙසේ ගණන් කිරීම අට්ඨකථාචාර්යයන්ට විරුද්ධ බැවින් සියලු කල්හි ම එකාන්තයෙන් නො ලැබෙන්නේය යි දතයුතු යි. කාමභූමියෙහි අටවිසිරූපය ම ලැබෙන්නේ නමුදු ප්‍රතිසන්ධිකාලයෙහි ජරතා රූපය, අනිච්චතාරූපය, ලහුතාදී රූපපඤ්චකය, ශබ්දය යන මෙතෙක් රූපයෝ නො ලැබෙත්. එතකුදු වුවත් මව්කුස ප්‍රවෘත්ති කාලයෙහි ලහුතාදී රූපපඤ්චකය හා ශබ්දය ත් හැර අවශේෂ සියලු රූපයෝ ලැබෙත්. මව්කුසින් බිහි වූ වහාම ශබ්ද කලාපය හා යට කී නයින් ලහුතාදී රූපපඤ්චකය ද පිළිවෙළින් ලැබෙත්.

ගර්භාශයගතසත්වයන්ට වනාහි කලලසප්තාහය, අර්බුද සප්තාහය, පෙසිසප්තාහය, ඝනසප්තාහය, ප්‍රශාඛසප්තාහය යි පඤ්චසප්තාහයක් ඉක්ම ගිය කල්හි කෙසලොමසත්තාහය, චක්ඛු සෝතඝාණජිව්හාසත්තාහය යි මෙසේ සත්සත්තාහයෙක් වන්නේය යි අට්ඨකථාචාරීහු කියත්. මූලටීකායෙහි වනාහි:-කලල දසසත්තාහයෙක, අබ්බුදදසසත්තාහයක, පෙසිදසසත්තාහයක, ඝනදසසත්තාහයක, පසාඛදසසත්තාහයකැයි මෙසේ දශසත්තාහයක් ඉක්ම ගිය කල්හි එකොළොස් වන සත්තාහයෙහි චක්ෂුර්දශකය ද, දොළොස් වන සත්තාහයෙහි සෝතදසකය ද, තෙළෙස්වන සත්තාහයෙහි ඝාණදසකය ද, තුදුස්වන සත්තාහයෙහි ජිව්හාදසකයද, මෙසේ ක්‍රමයෙන් පහළවන්නේය යි කීයේය. ගර්භාශයකප්‍රතිසන්ධි ගන්නා සත්වයන්ට ප්‍රතිසන්ධිය හා සමග ස්ත්‍රියක් වී නම් ස්ත්‍රීභාවදශකය හෝ පුරුෂයෙක් වී නම් පුම්භාවදශකය ද, හෘදයවස්තුදශකය, කායදශකය, යන රූපකලාපයෝ තුන්දෙනෙක් ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග එකක්ෂණිකව පහළවන්නාහුය. මෙසේ කර්මජ රූපයන්ගේ පහළවීම සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ ස්ථිති ක්ෂණ භඞ්ගක්ෂණ යන සියලු ම ක්ෂණයෙහි ලැබෙත්. ප්‍රතිසන්ධි

සිතට අනතුරුව හටගන්නා වූ පළමු වන භවාඞ්ගචිත්තයාගේ උත්පාදක්ෂණය පටන් චිත්තජ රූපය පහළවීමට පටන්ගණී යි.

ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග පහළ වූ රූපකලාපයන්හි ඇත්තාවූ තෙජෝධාතු සඞ්ඛ්‍යාත ඍතු තොමෝ ඨිතිකාලයට පැමිණි කල්හි පච්ඡාජාතප්‍රත්‍යය ලැබී මෙන් උතුජ රූපයන්ගේ ද හටගැණීම පටන්ගණී යි, ආහාරජ රූපය වනාහි මව විසින් අනුභව කරණ ලද්දා වූ ආහාරඕජව ළදරුවාගේ ආංගශයට පැමිණීමෙන් බාහිරආහාරය වූ එයින් රුකුල් ලැබීමෙන් ම ආහාරරූපය උපදවන්නට පටන්ගණී යි. එසේ ම සංස්වේදජ ඕපපාතික සත්ත්වයන්ගේ මුඛයෙහි ශෙලෂ්මය හටගත් තැන් පටන් ආහාරජ රූප උපදින්නට පටන්ගණී යි. මෙසේ කර්මචිත්ත ඍතු ආහාර යන සතර ප්‍රත්‍යයන්ගෙන් ප්‍රදීප ජ්වාලාවක් මෙන් ජීවිතාන්තය මුළුල්ලෙහි රූපකලාපයන්ගේ හටගැණීම අවිච්ඡින්නව පවති යි. ප්‍රදීපොපමාවෙහි අභිප්‍රාය නම්:—ප්‍රදීපකපාලයෙක්හි තෙල් වැටිකොට පහන දැල්වූ කල්හි තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ඒ ප්‍රදීපය නො නිමී පවත්නේ නම් පෙරයම දැල් වූ ප්‍රදීපජ්වාලාව ම රාත්‍රිය මුළුල්ලෙහි නො නිමී පැවතුනේය යි සිතක්. එතකුදුවුවත් ඒ ප්‍රදීපජ්වාලාවන්ගේ පැවැත්ම චිත්තක්ෂණ සතළොසකට ආයුෂ ඇත්තා වූ පහන් සිළුසමූහයක්හුගේ එක්වීමෙන් බලන් නවුන්ට එකි මෙතෙක් පහන්සිළු ඉක්ම ගියෝය. මෙතෙක් පහන්සිළු උපන්නාහුය යි නො වැටහෙත් මැ යි. එතකුදුවුවත් එක ද පහන්සිළුවක් චිත්ත ක්ෂණ සතළොසකින් ඔබ්බට නොගොස් නිරුද්ධවන්නේ යි. අසියමිතආයුෂ ඇත්තා වූ පහන්සිළු බොහෝ ගණනක් හට ගණිමින් බොහෝ ගණනක් නිරුද්ධවෙමින් එක ම සන්තාන යෙහි පවත්නා හෙයින් ප්‍රදීපජ්වාලාව තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි එකාකාරව පැවති නිමී ගිය කල්හි ම දැන් ඉතින් පහණ නිවී ගියේය යි ව්‍යවහාර කරන්නාක්මෙන් ම ප්‍රතිසන්ධි සිත හා සමග ඒකොත්පාද වූ රූපකලාපයෝ තුමූ සතළොස් චිත්තක්ෂණය කින් බිඳී ගොස් අතීත් අතීත් රූපකලාපකෙනෙක් එක ම සන්තානයෙහි උපදිමින් සියක්අවුරුද්දක් මුළුල්ලෙහි චිත්ත ක්ෂණ සතළොසින් සතළොසට ඇති වන්නාවූ ඛණිකමරණය නො දැන ඒ රූපයන්ගේ සන්තානවිච්ඡේද සඞ්ඛ්‍යාත වූ සම්මුති මරණය ම මරණය යි සලකන්නාහුය.

මෙසේ සම්මුතිමරණය වන්නා වූ සත්ත්වයාගේ චුතිචිත්තය පටන් ආපසු ගිණූ කල්හි සතළොස් වන චිත්තක්ෂණයාගේ

උත්පාදක්ෂණය හා සමග කර්මජ රූපයන්ගේ පහළවීම වලක්නේ යි. පළමු උපන් කර්මජ රූපයෝ ද චුතිචිත්තයට සමකාලිකව ම නිරුද්ධ වෙති. චිත්තජ රූප ආහාරජ රූපයෝ වනාහි චුති චිත්තය පටන් සතළොස් චිත්තක්ෂණයක් පමණ කල් පැවති නිරුද්ධ වෙති. ඉන් මතු මෘතශරීරය යි ව්‍යවහාර කරන්නාවූ උතුජ රූපයෝ ශේෂ වෙත්. එම රූපයෝ වනාහි යම්තාක් කල් සත්ත්වයාගේ අස්ථීහු පවත්නාහු ද ඒතාක් කල් මුලුල්ලෙහි උතුජ රූපයෝ පවත්නාහු වෙත්. මේ වනාහි ගබ්භසෙය්‍යකසංසෙදජ සත්ත්වයන්ගේ පැවැත්මයි.

සෝවාන් ආදී මාර්ගඥානයෙන් හමු කටයුතු හෙයින් කුඩා මහත් භවයන් හෙවත් මනුෂ්‍යගතියෙන් දිව්‍යගතියද, දිව්‍යගතියෙන් බ්‍රහ්මගතිය ද, බ්‍රහ්මගතියෙන් නැඟිත දිව්‍යගතිය ද, එයින් මනුෂ්‍යගතිය ද, මනුෂ්‍යගතියෙන් අපායගතිය ද, යනාදී ක්‍රමයෙන් කුඩා භවයෙන් මහත් භවය ද, මහත් භවයෙන් කුඩා භවය ද, උඩුයටි කොට මසනාඪියෙන් වානය යි කියනු ලද්දා වූ තෘෂ්ණාවෙන් නික්ම ගිය හෙයින් නිර්වාණ සංඛ්‍යාත වූ ලෝකෝත්තර ධර්මයන්ට අරමුණු වන්නා වූ යම් ධර්මයක් වේ ද ඒ ධර්මය නිර්වාණ නම් වෙයි. ඒ නිර්වාණධර්මය වනාහි අවශිෂ්ට වූ ස්කන්ධ ඇති හෙයින් සඋපාදිශේෂනිර්වාණය, අවශිෂ්ට වූ ස්කන්ධයක් නැති හෙයින් අනුපාදිශේෂනිර්වාණධාතුය යි දෙවැදෑරුම් වෙ යි. "තණ්හාදිවසී උපගන්තත කම්මුනා අත්තනො ඵලභාවෙන ආදීයතීති උපාදි-උපාදි එව සෙසො නත්ථි කිලෙසාති උපාදිසෙසො. නත්ථි උපාදිසෙසො එතස්සාති අනුපාදිසෙසො". යනු නිර්වචන යි. එහි අභිප්‍රාය නම්:—කෙලෙසුන්ගෙන් වෙන් වූ පංචස්කන්ධය ප්‍රතිබද්ධ වූ නිර්වාණධාතුව සඋපාදිසෙසය යි යනු ද, ඒ පංචස්කන්ධයෙන් වෙන් වූ නිර්වාණධාතුව අනුපාදිසෙසය යි යනු අභිප්‍රාව යි. එයින් සඋපාදිසෙස නිර්වාණධාතුව වනාහි ගිනි ගානා දඬු දෙකක් එකට හැපීමෙන් හටගන්නා වූ ගින්නක් මෙන් ද, අනුපාදිසෙස නිර්වාණධාතුව චක්‍රවර්තිරජහුගේ චක්‍රරත්නය මෙන් දැ යි ආයුෂ්මත් නාගසේනස්ථවිරයන් වහන්සේ විසින් වදාරණ ලදී.

ඒ ගින්න වනාහි විනාශ වී නො යන්නාක් මෙන් ද, දස දිසාවන් අතුරෙන් අසවල් දිසාවෙහි පවත්නේය යි නො කිය හැකිවාක් මෙන් ද, ඒ නිර්වාණධර්මය ද විනාශ වන්නේය යි කියා හෝ අසවල් දිසායෙහි පවත්නේය යි කියා හෝ නො කියයුත්තේය යනු අභිප්‍රාය යි. විශුද්ධිමාර්ගටීකායෙහි:—"අරහතො ඛන්ධපටිබද්ධමෙව" යනු කියන ලදී. එහෙයින් බුදුපසේබුදුමහරහත්

යන උත්තමයන්ගේ දැවීමෙන් ඇතිවන්නා වූ අබඇටයක් පමණ වූ ධාතුවකට පවා වැඳීම් ආදිය කරණකොටගෙණ සවර්ගමොක්ෂ ප්‍රතිලාභය වින්නේ යි. ඒ නිර්වාණය වනාහි සියලු කෙලෙසුන්ගෙන් සිස් වූ හෙයින් ශූන්‍යතය යි කියා ද රාගාදී නිමිති රහිත හෙයින් අනිමිත්තය යි කියාද, කෙලශප්‍රාර්ථනාවෙන් පහ වූ හෙයින් අප්පණිහිතය යි කියා ද ව්‍යවහාර කෙරෙත්. හෙවත් මාර්ගවීථියෙහි පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ සඞ්ඛ්‍යාත වූ පූර්වභාගප්‍රතිපදාවන් අතුරෙන් අනුලෝම චිත්තය වනාහි ශූන්‍යත වශයෙන් වැටහී ඒ අනුලෝමචිත්තය උපන්නේ වී නම් ඒ සිත හා එක්ව යෙදුනා වූ ප්‍රඥාචෛතසිකය ශූන්‍යතානුපස්සනාවය යි කියා ද, එම වීථියෙහි උපදනා මාර්ගචිත්තය ශූන්‍යතවිමොක්ෂමුඛය යි කියා ද, ඒ මාර්ගයට අරමුණුවන්නාවූ නිර්වාණධාතුව ශූන්‍යතනිර්වාණය යි කියා ද ව්‍යවහාරකෙරෙත්. එපරිද්දෙන් ම කෙලශ සඞ්ඛ්‍යාත වූ නිමිත්තෙන් තොරව අනුලෝම සිත උපදනේ වේ ද, එකල්හි පෙර සේ ම අනිමිත්තානුපස්සනා අනිමිත්තවිමොක්ෂ අනිමිත්තනිර්වාණය යි ව්‍යවහාර කෙරෙත්. අප්පණිහිතානුපස්සනා අප්පණිහිතවිමොක්ෂ මුඛ අප්පණිහිතනිර්වාණය ද මේ ක්‍රමයෙන් ම දතයුතු යි.

මෙසේ මේ පරිච්ඡේද සයකින් යථාප්‍රතිඥාත සතරාකාර වූ පරමාර්ථධර්මය ප්‍රතිඥාත පරිද්දෙන් ම සම්පූර්ණ කරණ ලද්දේය යි දතයුතු යි.

**මෙසේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි රූපසංග්‍රහ නම් වූ සයවෙනි පරිච්ඡේදයනිමියේ යි.**

———o———

## (ප)

**සලක්ඛණා,** ආරම්මණවිජානනය ඵුෂණය කර්කශබවය සාන්තබවය යනාදී වූ තමතමාගේ කෘත්‍යය ලක්ෂණය හා සමග කටගන්නා වූ; චාසත්තති විධා, දෙසැත්තෑවක් ප්‍රභෙද ඇත්තා වූ; වත්ථුධම්මා, සවභාවධර්මයෝ; මයා, මා විසින්; වුත්තා, කියන ලද්දාහුය. ඉති, (ඉදානි) දැන් වනාහි; තෙසං, ඒ දෙසැත්තෑවක් ප්‍රභෙද වූ සවභාවධර්මයන්ගේ; සමුච්චයං, රැස්කිරීම; යථායොගං, යෙදීමට සුදුසු පරිද්දෙන්; අහං, මම; පවක්ඛාමි, ප්‍රභෙද වශයෙන් කියමි. අකුසලසඞ්ගහොච, අකුශල සංග්‍රහය ද; මිස්සකසඞ්ගහොච, කුශලාකුශල අව්‍යාකෘතනාමරූපධර්මයන්ගේ මිශ්‍රක සංග්‍රහයෙක් ද; බොධිපක්ඛිය සඞ්ගහො ච, සතතිස් බොධිපාක්ෂික

ධර්මයන්ගේ සංග්‍රහයෙක් ද; සබ්බසඞ්ගහො ච, ඛන්ධායතන සත්‍ය සංඛ්‍යාත වූ සර්වධර්මයන්ගේ සංග්‍රහයෙක් ද; ඉති, මෙසේ; චතුබ්බිධො, සතරවැදෑරුම් වූ; සමුච්චය සඞ්ගහො, සමුච්චයසංග්‍රහය තෙම; වෙදිතබ්බො, දතයුත්තේ යි.

කථං, කෙසේ දතයුත්තේදයත්? අකුසලසඞ්ගහෙ, අකුශලසංග්‍රහයෙහි; (තාව විභාගො මීසො වුච්චතෙ) යනු අධ්‍යාහාර යි. ආසවා, ආශ්‍රවයෝ තුමූ; කාමාසවො කාමාශ්‍රවයෙක් ද; භවාසවො, භවාශ්‍රවයෙක් ද; දිට්ඨාසවො, දෘෂ්ටාශ්‍රවයෙක් ද; අවිජ්ජාසවො, අවිද්‍යාශ්‍රවයෙක් ද; ඉති, මෙසේ; චත්තාරො හොන්ති, ආශ්‍රවධර්මයෝ සතරදෙනෙක් වෙත්.

ඔඝා, ඔඝයෝ තුමූ; කාමොඝො, කාමොඝයෙක් ද; භවොඝො, භවොඝයෙක් ද; දිට්ඨොඝො, දෘෂ්ටිඕඝයෙක් ද; අවිජ්ජොඝො, අවිද්‍යොඝයෙක් ද; ඉති, මෙසේ; චත්තාරො (හොන්ති) සතරදෙනෙක් වෙත්.

යොගා, යොගධර්මයෝ තුමූ; කාමයොගො, කාමයොගයෙක් ද; භවයොගො, භවයොගයෙක් ද; දිට්ඨියොගො, දෘෂ්ටියොගයෙක් ද; අවිජ්ජායොගො, අවිද්‍යායොගයෙක් ද; ඉති, මෙසේ චත්තාරො (හොන්ති) සතරක් වෙත්.

ගන්ථා, ග්‍රන්ථ ධර්මයෝ තුමූ; අභිජ්ඣාකායගන්ථො, අභිධ්‍යාකායග්‍රන්ථයෙක් ද; ව්‍යාපාදෙකායගන්ථො, ව්‍යාපාදකායග්‍රන්ථයෙක් ද; සීලබ්බතපරාමාසො කායගන්ථො සීලබ්බතපරාමාස කායග්‍රන්ථයෙක් ද; ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො, ඉදං සච්චාභිනිවෙසකායග්‍රන්ථයෙක් ද; ඉති, මෙසේ; චත්තාරො (හොන්ති) සතරදෙනෙක් වෙත්.

උපාදානා, උපාදාන ධර්මයෝ තුමූ; කාමුපාදානං, කාමුපාදානයෙක් ද; දිට්ඨුපාදානං, දෘෂ්ටිඋපාදානයෙක් ද; සීලබ්බතුපාදානං, සීලබ්බතුපාදානයෙක් ද; අත්තවාදුපාදානං, අත්තවාදුපාදානයෙක් ද; ඉති, මෙසේ; චත්තාරො (හොන්ති) සතරක් වෙත්.

නීවරණානි, නීවරණධර්මයෝ තුමූ; කාමච්ඡන්දනීවරණං, කාමච්ඡන්දනීවරණයෙක් ද; ව්‍යාපාදනීවරණං, ව්‍යාපාදනීවරණයෙක් ද; ථිනමිද්ධනීවරණං, ථිනමිද්ධනීවරණයෙක් ද; උද්ධච්චකුක්කුච්චනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණයෙක් ද; විචිකිච්ඡානීවරණං, විචිකිච්ඡානීවරණයෙක් ද; අවිජ්ජානීවරණං, අවිද්‍යානීවරණයෙක් ද; (ඉති, මෙසේ;) ඡ, (හොන්ති) සයක් වෙත්,

අනුසයා, අනුසයධර්මයෝ තුමූ; කාමරාගානුසයො, කාම රාගානුසයෙක් ද; භවරාගානුසයො, භවරාගානුසයෙක් ද; පටිඝානුසයො, පටිඝානුසයෙක් ද; මානානුසයො, මානානුසයෙක් ද; දිට්ඨානුසයො, දිට්ඨිඅනුසයෙක් ද, විචිකිච්ඡානුසයො, විචිකිච්ඡා නුසයෙක් ද; අවිජ්ජානුසයො, අවිද්‍යානුසයෙක් ද;(ඉති,මෙසේ;) සත්ත (හොන්ති) සත්දෙනෙක් වෙත්.

(සුත්තන්තෙ, සූත්‍රාන්තයෙහි; වුත්තානි,) යනු පාඨශෙෂ යි. සංයොජනානි, සංයොජනධර්මයෝ තුමූ; කාමරාගසංයොජ නං, කාමරාගසංයොජනයෙක් ද; රූපරාගසංයොජනං, රූපරාග සංයොජනයෙක් ද; අරූපරාගසංයොජනං, අරූපරාගසංයොජ නයෙක් ද; පටිඝසංයොජනං, පටිඝසංයොජනයෙක් ද; මාන සංයොජනං, මානසංයොජනයෙක් ද; දිට්ඨිසංයොජනං, දිට්ඨිසං යොජනයෙක් ද; සීලබ්බතපරාමාසසංයොජනං, ශීලව්‍රතපරා මාශසංයොජනයෙක් ද; විචිකිච්ඡාසංයොජනං, විචිකිච්ඡාසංයො ජනයෙක් ද; උද්ධච්චසංයොජනං, උද්ධච්චසංයොජනයෙක් ද; අවි ජ්ජාසංයොජනං, අවිද්‍යාසංයොජනයෙක් ද; (ඉති, මෙසේ;) දස (හොන්ති) දසදෙනෙක් වෙත්.

අභිධම්මෙ, අභිධර්මපිටකයෙහි වූ; වුත්තානි, වදාරණ ලද්දා වූ; අපරානි, අනිකුදු වූ; සංයොජනානි, සංයොජනධර්මයෝ තුමූ; කාමරාගසංයොජනං, කාමරාගසංයොජනයෙක් ද—පෙ— අවිජ්ජාසංයොජනං, අවිද්‍යාසංයොජනයෙක් ද; (ඉති, මෙසේ;) දස (හොන්ති) දසප්‍රකාර වෙත්.

කිලෙසා, ක්ලෙශධර්මයෝ තුමූ; ලොභො, ලොභය ද; දොසො, ද්වෙෂය ද; මොහො, මොහය ද; මානො, මානය ද, දිට්ඨි, දෘෂ්ටිය ද; විචිකිච්ඡා, විචිකිච්ඡාව ද; ථීනං, ථීනය ද; උද්ධච්චං, උද්ධච්ච ය ද; අහිරිකං, අහිරිකය ද; අනොත්තප්පං, අනොත්තප්පය ද; (ඉති, මෙසේ;) දස (හොන්ති) දසදෙනෙක් වෙත්.

පත, අර්ථානතරයක් දක්වමි:—එහි, මේ අකුශල සංග්‍රහ යෙහි; ආසවාදිසු, ආශ්‍රවාදීන් අතුරෙන්; කාමභවනාමෙන, කාමය යන නාමින් හා භවය යන නාමින් ද; තබ්බත්ථුකා, ඒ කාමය යන නාමයාගේ තිශ්‍රයස්ථාන වූ හෙවත් රූපභවඅරූ පභවයන් ම නිශ්‍රයස්ථාන කොට ඇත්තා වූ; තණ්හා, තෘෂ්ණාව නොහොත් ලොභචෛතසිකය; අධිප්පෙතා, කැමතිවන ලද් දිය. තථා පවත්තනං, ඒ ඒ ආකාරයෙන් හටගත්තා වූ; දිට්ඨිගත මෙව, එක ම දෘෂ්ටිචෛතසිකය; සීලබ්බත පරාමාසො ච, සීලබ්බ

තපරාමාසය යි කියා ද; ඉදං සච්චාභිනිවෙසො ච, ඉදංසච්චාභිනිවේසය යි කියා ද, අත්තවාදුපාදානං ච, අත්තවාදූපාදානය යි කියා ද, පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ.

වත්ථුතො, ස්වභාව වශයෙන් නොහොත් ධර්ම වශයෙන්; ආසවොඝා ච, ආශ්‍රව-ඕඝධර්මයෝ ද; යොගා ච, යොගධර්මයෝ ද; ගන්ථා ච, ග්‍රන්ථධර්මයෝ ද; තයො, තුන්දෙනෙක්; වුත්තා, කියන ලදහ. උපාදානා, උපාදානයෝ තුමූ; ද්වෙවුත්තා, දෙදෙනෙකැ යි කියනලද්දාහුය. නීවරණා, නීවරණධර්මයෝ තුමූ; අඨ සියුං, අට දෙනෙක්වෙත්.

අනුසයා, අනුසයධර්මයෝ තුමූ; ඡළෙව හොන්ති, සදෙනෙක් ම වෙත්. සංයොජනා, සංයොජනයෝ තුමූ; නවමතා, නවදෙනෙකැ යි දන්නා ලද්දාහුය. කිලෙසා, කෙලෙශයෝ, දසමතා, දසදෙනෙකැ යි දන්නා ලද්දාහුය. ඉති, මෙසේ; නවධා, නවප්‍රකාරයකින්; අයං පාපසඞ්ගහො, මේ අකුශලසංග්‍රහය; මයා වුත්තො, මා විසින් කියන ලද්දේ යි.

———o———

(ගා)

“චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා” යන උද්දෙස ගාථාවෙහි දර්ශිතවූ සංක්ෂෙප සතර පරමාර්ථය ෂට් පරිච්ඡෙදයකින් විස්තර වශයෙන් දක්වා දැන් වනාහි ඒ සතර පරමාර්ථධර්මය මිශ්‍ර කොට දක්වනු කැමතිව “වාසත්තති විධා වුත්තා” යනාදී ගාථාව කීහ. තමතමාගේ ස්වභාවයෙන් ලැබෙන පරමාර්ථධර්මයෝ දෙසැත්තෑවක් වෙත්. ඒ කවරහුදයත්? අසූනවයක් හෝ එකසියවිසිඑකක් හෝ අනන්තප්‍රමාණවූ ප්‍රභෙද හෝ වන්නාවූ සියලු චිත්තයෝ වනාහි ආරම්මණවිජානනලක්ෂණයෙන් එක් වැදෑරුම් වූ හෙයින් එකකැ යි කියා ද, අනන්තප්‍රමාණප්‍රභෙද වන්නා වූ දෙපණස් චෛතසිකයෝ තුමූ අන්‍යොන්‍යවිරුද්ධලක්ෂණ ඇති හෙයින් දෙපණසෙකැ යි ගත් කල්හි නාමධර්මයෝ තෙපණස්දෙනෙක් වෙති. නිෂ්පන්නරූපයෝ අටළොස්දෙන ඔවුනොවුන්ගේ විරුද්ධ හෙයින් අටළොසෙකැ යි ගණන් ගත් කල්හි පලමු කී තෙපණස හා එක් කොට එක් සැත්තෑවක් වෙත්. ශාන්තලක්ෂණයෙන් එක් වැදෑරුම්වූ නිර්වාණ ධර්මය ඒ එක්සැත්තෑවට එක් කොට ගත් කල්හි සියලු ස්වභාව ධර්මයෝ දෙසැත්තෑවක් වෙත්. අසඞ්ගීතග්‍රහණ න්‍යායෙන් පිටකත්‍රයෙහි වදාළා වූ සියලු ධර්මයෝ මේ දෙසැත්තෑවෙහි ම ඇතු

ලත් වෙත්. ඒ දෙසැත්තෑවක් ධර්මයෝ සමුච්චයසංග්‍රහයෙහි විස්තර වෙත්. ඒ සමුච්චය සංග්‍රහයෙහි සතර සංග්‍රහයන් අතුරෙන් පළමු වන අකුශල සංග්‍රහය දක්වමි:—

එහි ආශ්‍රවයෝය, ඕඝධර්මයෝය, යොගධර්මයෝය, ග්‍රන්‍ථයෝය, උපාදානයෝය, නීවරණයෝය, අනුසයධර්මයෝය, සංයෝජනධර්මයෝය, ක්ලේශධර්මයෝය යි නවප්‍රකාර වෙත්. ඔවුන් අතුරෙන් ආශ්‍රවධර්ම තෙමේ නොයෙක් වර පෙරා ගන්නා ලද්දාවූ සුරාවක්හට බඳු වෙ යි. කුමක්හෙයිනයත්? සුරාපානය කළාවූ සත්‍ත්වයෝ තුමූ ප්‍රකෘතිස්වභාව හැර උමතු වූවන් මෙන් සියලු අකට යුතු දුශ්චරිතයන්හි හැසිරෙත් ද, එපරිද්දෙන් ම කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන මේ ධර්මයෝ සතරදෙන ද මද උපදවන අර්ථයෙන් ද ආශ්‍රවය යි කියත්. ඒ ආශ්‍රවධර්මයෝ තුමූ භූමි වශයෙන් නෛවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා ද, ධර්ම වශයෙන් සෝවාන් මාර්ගයට පෙරටුව උපදනා වූ ගොත්‍රභූ චිත්තය දක්වා ද, පැතිර පවත්නාහු ය. තවද ව්‍රණයකින් වහනය වන්නා වූ පූයාවක් මෙන් චක්ෂුරාදී ව්‍රණමුඛ සයකින් රූපාදී ෂට්ස්ථානයෙක්හි වහනය වන වඟුරුවන අර්ථයෙන් ද, ආශ්‍රව නම් වෙත්. භූමිවශයෙන් භවාග්‍රයදක්වා ද ධර්ම වශයෙන් ගොත්‍රභූචිත්තය දක්වා ද, වහනය වන්නා වූ අකුශල ධර්මයෝ තුමූ මේ සතරදෙන පමණක් නො වෙති. මානාදී වූ අවශේෂ ක්ලේශයෝද භවාග්‍රය හා ගොත්‍රභූචිත්තය දක්වා ද වහනය වෙමින් පවත්නාහු නො වෙත් ද? එසේ වී නම් මේ ධර්මසතරදෙන පමණක් කුමක් හෙයින් ආශ්‍රව නම් වෙත් ද යත්? ඒ මානාදී ධර්මයෝ භවාග්‍රය හා ගොත්‍රභූචිත්තය දක්වා ද පවත්නාහු නමුදු මේ කාමාදී ධර්මසතර ම රූසී වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් ආශ්‍රවය යි ව්‍යවහාර කෙරෙත්.

"ඕඝය" යනු මහත් වූ ගඞ්ගාජලයෙහි හටගන්නා වූ සැඩ පහර සමග පවත්නා වූ දියසුළිය යි. යම්සේ ගඞ්ගාජලයෙක්හි වැටුනා වූ යම්කිසි ද්‍රව්‍යයක් සැඩපහරට අසුවූයේ නම් ගඞ්ගාවෙන් සමුද්‍රයට වැද ඒ සමුද්‍රමධ්‍යයෙහි දියසුළියෙන් යට කොට ගෙණ ගොස් සමුද්‍ර පතුලෙහි ගසන්නේ වේ ද, එපරිද්දෙන් ම මේ කාමාදී සතර ඕඝයෙන් පහරණලද්දාවූ සත්‍ත්වයා සංසාර සාගරයෙහි පත්ලට බඳු වූ අවීචිමහානරකයෙහි ගෙණ ගොස් හිංසා කරන්නේ ඊ. එහෙයින් මේ කාමාදී ධර්මයන් සතරදෙන ම ඕඝය යි කියත්.

"යෝගය" යනු ගවආදී සිව්පාවුන් රථයෙහි යොදා ඔබින්

නා වූ රැහැන් වැනිය යනාර්ථයෙන් යෝගය යි කියත්. මේ සංසාර ගත සත්ත්වයා භව නැමති රථයෙහි යොදන අර්ථයෙන් මේ ආශ්‍රවධර්මයන් ම යෝගය යි ව්‍යවහාර කෙරෙත්.

"ග්‍රන්ථධර්මය" යනු මේ ප්‍රත්‍යුත්පන්න කාය, අනාගත කාය සඞ්ඛ්‍යාත වූ මතු භවය හා ද, නාමය හා රූප ධර්මය ද, එකට ගැටගසනාර්ථයෙන් ග්‍රන්ථයයි ව්‍යවහාර කෙරෙත්.

"උපාදානය" යනු දැඩි තෘෂ්ණාවට කියන නමකි. යම්කිසි සොරෙක් අනුන්ගේ ගෙට වැද අන්ධකාරයෙහි අතපය ගානා කල්හි පවත්නා වූ ලොභය තෘෂ්ණා නම් වෙයි. යම් වස්තුවක් ඒ සොරුගේ අතට පත් කල්හි හටගන්නා වූ ලොභය උපාදාන නම් වෙයි. මැඩියෙකු පසුපස්සෙහි ලුහුබඳින්නා වූ සර්පයෙක් හට උපදනා ලොභය තෘෂ්ණා නම් වෙ යි. ඒ මැඩියා අල්වාගත් කල්හි උපදනා ලොභය උපාදාන නම් වෙයි. සංක්‍ෂෙපයෙන් තමා විසින් සපයා ගන්නා ලද රන්රුවන් මුතු මැණික් ආදී වස්තුවෙහි පවත්නා ලොභය උපාදාන නම් වෙ යි. මතු වෙලඳාම් ආදී කෘත්‍යය කොට මෙතෙක් වස්තුව ලබමිය යි පැවති ලොභය තෘෂ්ණා නම් වෙ යි. එසේ හෙයින් පටිච්චසමුප්පාදයෙහි "තණ්හාපච්චයා උපාදානං" යනු වදාළේ යි.

"නීවරණධර්මය" යනු ධ්‍යානාදී වූ කුශල ධර්මය හා ප්‍රඥා චක්‍ෂුසය වලක් වන හෙවත් ආවරණය කරන කෙලශධර්මයෝ අවදෙනෙක් තුමූ නීවරණධර්මයෝය යි ව්‍යවහාරකෙරෙත්. නොහොත් නිවන්මග අවුරන්නා වූ අකුල්අටක් වැනි ධර්මයෝ නීවරණධර්මයෝය යි කියත්.

"අනුසය" යනු "අනු සන්තානෙ සෙන්තීති අනුසයා" යනු නිර්වචන බැවින් මාර්ගයෙන් ප්‍රහීණ නො කළා වූ කෙලශයන් ආලම්බන ප්‍රතිලාභයෙහි උපදනා හෙයින් අනුසය ධර්මයයි කියත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය උපදවා ගත් යොගාවචර තෙමේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනතලයෙහි ඉපිද මහා කල්පසුවාසූදහසක් ගෙවෙන තුරු කෙලශ පරිවුඨානයෙන් වෙන්ව සිට ඒ බඹතලයෙන් චුතව කාමධාතුවට ආ කල්හි සෙසු කාමාවචරසත්ත්වයන්ට මෙන් ම ඒ පුද්ගලයාහට ලොභාදී සියලු කෙලෙසුන්ගේ උත්සන්නතාවය ඇති වෙ යි. මේ වනාහි අනුසය කෙලශයන්ගේ ශක්තිය යි.

"සංයොජනය" යනු දික්වූ රැහැණින් ගවයන් දිගවෙලි කර තැබීමක් මෙන් රූප රාග අරූප රාගාදී වූ කෙලශයන්ගේ

හටගැණීම යි. රූපභූමි අරූපභූමියෙහි වසන්නා වූ සත්ත්වයන්ගේ සංයෝජනධර්මයෝ තුමූ ගාල්කණුවෙන් මුදා රැහැන් සමග හැරිය ගවයන්ට බඳු වෙත්. ඒ ගවයෝ වනාහි ගාල්කණුවෙන් ඈතට ගොස් තණ කන්නාක් මෙන් කාමභූමියෙන් ඈත්ව රූපාරූපභූමියෙහි උපදනා සත්ත්වයන්ගේ සංයෝජන ධර්මයෝ භව ත්‍රය නැමැති ගාලෙහි බඳිනාවූ රැහැන්වලට බඳු වෙත්.

“ක්ලේශයෝග” යනු සත්ත්වයන් කිලුටුකරන තැවීමකරන ධර්මයෝ යි. ඒ ක්ලේශයන්ට වනාහි ගිණි ගෙණ දිලියෙන ගිනි අඟුරු උපමා කටයුතු යි. ගිනිඅඟුරු වනාහි තමා පිළිබඳ වූ දර සහ පිසන්නා වූ සහල්භාජනාදිය තවන්නාක් මෙන් හෙවත් හිංසා කරන්නාක් මෙන් මේ ක්ලේශධර්මයෝ ද තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් හා තත්සමඞ්ගිසත්ත්වයන් ද පෙළත්. එහෙයින් ක්ලේශයන් ගිනි අඟුරු මෙන් ද, තත්සම්ප්‍රයුක්ත ස්පර්ශාදි ධර්මයන් දර මෙන් ද, ඒ සිතින් යුක්ත වූ පුද්ගලතෙමේ බඳුනක් මෙන් ද උපමා උපමෙය්‍යකටයුතු යි. යම් සිතෙක දශක්ලේශයන් අතුරෙන් යම් ක්ලේශයෙක් ඇත්තේද, ඒ ක්ලේශ නැමැති ගිනිඅඟුරු හේතුකොටගෙණ අවශේෂ සම්ප්‍රයුක්තධර්ම නැමැති දර දවන්නාහු වෙති. ඒ වහ්නිතේජසින් පැසෙන්නා වූ බත් සැළියක් මෙන් ඒ සිතින් යුක්ත පුද්ගලයා තවන්නේ හෝ හිංසා කරන්නේ හෝ වේ.

නීවරණයන් අතුරෙහි ථීනය හා මිද්ධය ද, උද්ධච්චය හා කුක්කුච්චය ද, කුමක්හෙයින් එක ම නීවරණභාවයෙන් වදාලේදයත්? කෘත්‍යය ආහාර ප්‍රතිපක්ෂධර්මයන්ගේ සමානත්වය ඇති හෙයින් එක්එක් නීවරණ භාවයෙන් වදාලේය යි දත යුතු යි. ඒ කෙසේදයත්? කුක්කුටපත්‍රයක් ගින්නට පෑ කල්හි හැකිලීමක් මෙන් ථීනය ද, එසේ ම මිද්ධය ද හැකිලීම ස්වභාව කොට ඇත්තේයි. මෙසේ ථීනමිද්ධ දෙදෙනාගේ කෘත්‍යය වශයෙන් එකාකාර බව ලැබෙන්නේ යි. ථීනචෛතසිකය හේතු කොටගෙණ සිත හැකිලෙන කල්හි ශරීරය ද හැකිළේ. හෙයින් ශරීරයාගේ අලසභාවය ද, ඈනුම් ඇරීම ද, ඇඟමැලි කැඩීම ද වන්නේ යි. එසේ ම මිද්ධය කාරණකොටගෙණ අවශේෂනාමස්කන්ධයන් හැකිලෙන කල්හි ඒ සිතින් හටගන්නා වූ චිත්තජ රූපයන් ශරීරයෙහි පැතිර යාම හේතුකොටගෙණ ශරීරය ද හැකිළෙයි. ඈනුම් හැරීම් ඇඟමැලි කැඩීම් ආදිය වෙ යි. මෙසේ ථීනමිද්ධදෙදෙනාගේ ආකාරය ද සමාන වෙ යි. ථීනචෛතසිකය වීර්‍ය්‍යචෛතසිකයාගේ සතුරුධර්මය වෙ යි. මිද්ධය ද එසේ ම වීර්‍ය්‍යයාගේ සතුරු ධර්මයයි. ථීනමිද්ධදෙකින් යුක්ත වූ සසංස්කා

ථීන අකුශලපච්චකය නැවත නැවත උපදනා සල්හි ඒ ඒ සිතින් හටගන්නා වූ චිත්තජ රූපයන් ශරීරයෙහි පැතිර යාම හේතු කොටගෙණ නාමකායසම්බන්ධ වූ මිද්ධචෛතසිකය තිරුඬ වී මෙන් රූපකාය ද වහා ම නිද්‍රාවට පැමිණෙ සි. එසේහෙයින් අත්ථසාලිනී අටුවාවෙහි:—"පචලායිකා නිද්දා පච්චුපට්ඨානා" යනාදිය කියනලද්දේ සි. මෙසේ ථිනමිද්ධ දෙදෙනාගේ කෘත්‍යය සඞ්ඛ්‍යාතවූ ලක්ෂණය හා ථිනමිද්ධ දෙක විසින් එළවන ධර්මය ද, ථිනමිද්ධ දෙදෙනාගේ සතුරුධර්මය ද, සමාන බැවින් එක නීවරණ භාවයෙන් වදාළේ සි.

උද්ධච්චචෛතසික තෙමේ නො සන්හුන් ආකාරයෙන් යුක්ත වූ හෙයින් නොයෙක් අරමුණෙහි සිත දමා ගැසීම ලක්ෂණ කොට ඇත්තේ සි. කුක්කුච්චචෛතසිකය ද නො සන්හුන් පසුතැවිලි ස්වභාව ඇති හෙයින් නොයෙක් අරමුණෙහි සිත දමා ගැසීම ලක්ෂණ කොට ඇත්තේ සි. මේ වනාහි උද්ධච්ච කුක්කුච්චදෙදෙනාගේ කෘත්‍ය වශයෙන් සමානත්වය සි. උද්ධච්ච චෛතසික තෙමේ නො සන්හුන් ස්වභාව ඇති හෙයින් ඉතා ලුහුඬු වූ කල්පනා කිරීම් එළවයි. කුක්කුච්චචෛතසිකය ද නො සන්හුන් ස්වභාව ඇති හෙයින් ඉතා ලුහුඬු වූ කල්පනාව ඇති වෙ සි. මේ වනාහි ඒ දෙදෙනාගේ ආකාර වශයෙන් සමානත්වය සි. උද්ධච්චචෛතසික තෙමේ එකාග්‍රතාවට ප්‍රතිපක්ෂ වෙ සි. නොහොත් ධ්‍යාන සමාපත්තියට ප්‍රතිපක්ෂවෙ සි. කුක්කුච්චචෛතසිකය ද එසේමැ සි. මෙසේ උද්ධච්ච කුක්කුච්ච දෙදෙනාගේ කෘත්‍යආකාරප්‍රතිපක්ෂධර්මයන්ගේ සමානත්වය ඇති හෙයින් එක ම නීවරණභාවයෙන් වදාරණ ලද්දේ සි. "එකධම්මා -පෙ- ටීකාතය බලනු.

කාමය යන නාමය හා භවය යන නාමය ද අරමුණු වන්නා වූ භූමිය සඳහා ම කාමභව යන නාමයෙන් වදාරණ ලද්දේ සි. ලෝභය, කාමභවය, රූපභවය, යන ව්‍යවහාරය වනාහි උපචාර වශයෙනැ සි දතයුතු සි. කාම-භව යන නාමවයෙන් කියන ලද්දේ එක ම ලෝභය සි දතයුතු සි. සීලබ්බතපරාමාසය, ඉදං සච්චාභිනිවේසය, අත්තවාදූපාදානය, යන නාමත්‍රයකින් ම දක්වන ලද්දේ දිට්ඨිචෛතසිකය සි.

ධර්මවශයෙන් වනාහි "කාමාසවො භවාසවො" යන දෙකින් ම එක ම ලෝභය කියන ලදී. "දිට්ඨාසවය" යනු දෘෂ්ටිය සි "අවිජ්ජාසවො" යනු මෝහය සි එහෙයින් මේ ආශ්‍රවයෝ සතරදෙන ධර්මයන් තුන්දෙනෙක් ම වෙති. කාමය භවඔඝය

යනු එක ම ලෝභය යි. දිට්ඨෝඝය යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. අවිජ්ජෝඝය යනු එක ම මෝහය යි. මෙසේ සතර ඕඝය ද ධර්මයෝ තුන්දෙනෙක් වෙති. "කාමයෝගය භවයෝගය" යනු එක ම ලෝභය යි. දිට්ඨියෝගය යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. අවිජ්ජායෝගය යනු එක ම මෝහය යි. මෙසේ සතර යෝගධර්මයෝ ද හකුළුවා ගත් කල්හි ධර්මයෝ තුන්දෙනෙක් වෙති. "අභිජ්ඣා කායගන්ථො" යනු එකම ලෝභය යි. "ව්‍යාපාදෝ කායගන්ථෝ" යනු එක ම ද්වේෂය යි. "සීලබ්බතපරාමාසො කායගන්ථො" යනු ද, "ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො" යනු ද, එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. මෙසේ ග්‍රන්ථධර්මයෝ සතරදෙන ද, හකුළුවා ගත් කල්හි ධර්මයෝ තුන්දෙනෙක් වෙති. කාමූපාදානය යනු ලෝභය යි. දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදුපාදානය යන තුන්දෙන ද එක ම මිථ්‍යාදෘෂ්ටිය යි නොහොත් මිථ්‍යාදෘෂ්ටියගේ ස්වභාව විශේෂයෝ යි. මෙසේ සතර උපාදානයෝ ද හකුළුවා ගත් කල්හි ධර්මයෝ දෙදෙනෙක් ම වෙති. කාමච්ඡන්දනීවරණය යනු ලෝභය යි ව්‍යාපාදය යනු ද්වේෂය යි. ථිනමිද්ධය යනු අකුශල චෛතසික දෙකකි උද්ධච්චකුක්කුච්ච නීවරණය යනු අකුශල චෛතසික දෙකකි. අවිජ්ජානීවරණය යනු මෝහය යි. මෙසේ නීවරණධර්මයෝ විස්තාර වශයෙන් අටදෙනෙක් වෙති. කාමරාගානුසය, භවරාගානුසය, යනු ලෝභය යි. පටිඝානුසය යනු ද්වේෂය යි. දිට්ඨානුසය යනු මිථ්‍යාදෘෂ්ටිය යි. විචිකිච්ඡානුසය යනු විචිකිච්ඡාචෛතසිකය යි. අවිජ්ජානුසය යනු මෝහය යි. මෙසේ හකුළුවා ගත් කල්හි අනුසයධර්මයෝ සදෙනෙක් වෙති.

සූත්‍රාන්තයෙහි කාමරාගසංයෝජනය, රූපරාග සංයෝජනය, අරූපරාගසංයෝජනය, යන නාමත්‍රයෙන් එක ම ලෝභය දක්වයි. පටිඝසංයෝජනය යනු ද්වේෂය යි. මානසංයෝජනය යනු අකුශලමාන චෛතසිකය යි. දිට්ඨිසංයෝජනය, සීලබ්බතපරාමාසසංයෝජනය, යන සංයෝජනද්වයෙන් එක ම දෘෂ්ටි චෛතසිකය දක්වයි. "විචිකිච්ඡාසංයෝජනය" යනු විචිකිච්ඡාව යි. "උද්ධච්චසංයෝජනය" යනු උද්ධච්චය යි. මෙසේ සූත්‍රාන්තයෙහි ආවා වූ දශසංයෝජනයෝ * හකුළුවා ගත් කල්හි සත්දෙනෙක් ම වෙයි. අභිධර්මක්‍රමයෙහි ආවා වූ සංයෝජනයෝ තුමූ "කාමරාග-භවරාගසංයෝජනය" යනු එක ම ලෝභය යි, "පටිඝ" යනු ද්වේෂය යි. "මාන" යනු මානය යි. "දිට්ඨි-සීලබ්බතපරාමාස" යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි, "විචිකිච්ඡා" යනු විචිකිච්ඡාව යි. "ඉස්සා" යනු අන් සැපත් නු රුස්නා ඊර්ෂ්‍යා චෛත

* මෙහි අගණිත ග්‍රහණ න්‍යායය සිද්ධ කියා තිබේ.

සිතය යි. "මච්ඡරිය" යනු මාත්සර්‍යචෛතසිකය යි. "අවිජ්ජා සංයෝජනං" යනු එක ම මෝහය යි. මෙසේ අටක් ම වේති. ලෝභය, ද්වේෂය, මෝහය, මානය, දිට්ඨිය, විචිකිච්ඡාය, ථීනය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්පය, යන මේ ධර්මයෝ දසදෙන දසක්ලේශයෝ නම් වෙති. ඒ ක්ලේශධර්මයන්ගේ නවය සියා අඩු වීමෙක් හෝ දසය සියා වැඩි වීමෙක් හෝ නැත්තේය. මේ සියලු අකුශල ධර්මයන් නවප්‍රකාරයකින් සංග්‍රහ කොට ගත් හෙයින් අකුශල සංග්‍රහය යි කියත්.

## අකුශල සංග්‍රහය නිමි

---

## (ප)

මිස්සක සඞ්ගහෙ, මිශ්‍රකසංග්‍රහයෙහි (එවං විභාගො මයා වුච්චතෙ) යනු අධ්‍යාහාර යි. එවං, මේ වක්ෂ්‍යමානක්‍රමයෙන්, විභාගො, බෙදීම; මයා, මා විසින්; වුච්චතෙ, කියනු ලැබේ. හෙතු, හෙතුධර්මයෝ තුමූ; ලොභො, ලොභහෙතුවය; දොසො, ද්වේෂ හෙතුවය, මොහො, මොහහෙතුවය; අලොභො, අලොභ හෙතුවය; අදොසො, අදොසහෙතුවය; අමොහො, අමොහ හෙතුවය; ඉති, මෙසේ; ඡ හොන්ති, සදෙනෙක් වෙත්. ඣානඞ්ගානි, ධ්‍යානාඞ්ගයෝ තුමූ; විතක්කො, විතර්කධ්‍යානාඞ්ගය; විචාරෙ; විචාරධ්‍යානාඞ්ගය, පීති, ප්‍රීතිධ්‍යානාඞ්ගය; එකග්ගතා, එකාග්‍රතාධ්‍යානාඞ්ගය; සොමනස්සං, සෞමනස්‍ය ධ්‍යානාඞ්ගය; දොමනස්සං, දෞර්මනස්‍ය ධ්‍යානාඞ්ගය; උපෙක්ඛා, උපෙක්ෂාධ්‍යානාඞ්ගය; (ඉති, මෙසේ) සත්ත (හොන්ති) සත්දෙනෙක් වෙත්. මග්ගඞ්ගානි, මාර්ගාඞ්ගයෝ තුමූ; සම්මාදිට්ඨි, සම්මාදිට්ඨි මාර්ගාඞ්ගය;-පෙ-මිච්ඡාසමාධි, මිථ්‍යාසමාධි මාර්ගාඞ්ගය; (ඉති, මෙසේ;) වාදස (හොන්ති) දොළොස්දෙනෙක් වෙත්. ඉන්ද්‍රියානි, ඉන්ද්‍රියධර්මයෝ තුමූ; චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රිය;-පෙ-අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, සෝවාන් මාර්ගඥානසංඛ්‍යාත වූ අනඥාතඥාස්‍යාමීතීන්ද්‍රියං; අඤ්ඤින්ද්‍රියං, සෝවාන් ඵලඥානය ආදි කොට ඇති අර්හත්මාර්ගඥානය අවසන් කොට ඇති සවැදෑරුම් මාර්ගඵලසංඛ්‍යාත වූ අඥෙන්ද්‍රියය; අඤ්ඤාතාවින්ද්‍රියං, අර්හත්ඵලඥානසංඛ්‍යාත වූ අඥාතාවීන්ද්‍රියය; (ඉති, මෙසේ;) බාවීසති (හොන්ති) දෙවිසිඉන්ද්‍රිය ධර්මයෙනෙක් වෙත් බලානි, බලධර්මයෝ තුමූ; සද්ධාබලං, ශ්‍රද්ධාබලය;-පෙ-අනොත්තප්පබලං, අනොත්තප්පබලය; (ඉති, මෙසේ;) නව, (හොන්ති) නවදෙනෙක් වෙත්. අධිපතී, අධිපතිධර්මයෝ තුමූ; ඡන්දාධිපති, ඡන්දාධිපතිය;-පෙ-වීමංසාධිපති, වීමංසාධිපතිය යි;

(ඉති, මෙසේ; චත්තාරො) (හොන්ති) සතර දෙනෙක් වෙත්. ආහාරා, ආහාරයෝ තුමූ; නොහොත නාමරූපයන් පවත්වන ධර්මයෝ තුමූ; කබලීකාරො ආහාරො, කබළු කොට අනුභව කරන ආහාරය; දුතියො, දෙවැනි වූ; ඵස්සො, ස්පර්ශාහාරය; තතියො, තුන්වැනි වූ; මනොසඤ්චෙතනා, මනොසංචෙතනාහාරය; චතුත්ථං, සතරවැනි වූ; විඤ්ඤාණං, විඤ්ඤාණාහාරය; (ඉති, මෙසේ;) චත්තාරො, (හොන්ති) සතරදෙනෙක් වෙත්.

පන, විශෙෂාර්ථයක් කියම්:—එත්ථ, මේ මිශ්‍රකසංග්‍රහයෙහි ඉන්ද්‍රියෙසු, දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන්; සොතාපත්තිමග්ගඤාණං, සෝවාන් මාර්ගචිත්තක්ෂණයෙහි යෙදුනා වූ ඥානය; අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අනාදිමත් සංසාරයෙහි නො දන්නා ලද විරූ නිර්වාණධර්මය; අඤ්ඤස්සාමිති, දැන ගන්නෙමි යි පැවති; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියධර්මය යි. නොහොත් මාර්ගචිත්තසම්ප්‍රයුක්ත වූ සියලු ධර්මයන් වශග යෙහි පවත්වන අර්ථයෙන් ඉන්ද්‍රියධර්මය යි; (පවුච්චති,) ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. අරහත්තඵලඤාණං, අර්හත්ඵල චිත්ත යෙහි යෙදුනා වූ ඥානය; අඤ්ඤාතාවින්ද්‍රියං; අඤ්ඤවිය යි කියන ලද්දා වූ රහතුන් වහන්සේගේ සියලු ධර්මයන් වශගයෙහි පවත් වන අර්ථයෙන් අඤ්ඤාතාවින්ද්‍රිය යි; (පවුච්චති,) ප්‍රභෙද වශ යෙන් කියනු ලැබේ. මජ්ඣෙ, මේ සෝවාන් මාර්ග අර්හත්ඵල දෙදෙනාගේ මධ්‍යයෙහි වූ; ඡඤාණානි, ෂට්ශෛක්ෂ්‍යඥානයෝ; අඤ්ඤින්ද්‍රියානීති, අඤ්ඤින්ද්‍රියයෝය යි. පවුච්චන්ති, ප්‍රභෙද වශ යෙන් කියනු ලැබෙත්. ජීවිතින්ද්‍රියඤ්ච, ජීවිතින්ද්‍රියය වනාහි; රූපා රූප වසෙන, රූපජීවිතෙන්ද්‍රිය නාමජීවිතෙන්ද්‍රියයන්ගේ වශ යෙන් නොහොත් නවවැදෑරුම් වූ කර්මජ රූපකලාපයන්ගේ ජීවිතය එකුන් අනූවක් චිත්තයන් ජීවත්කරවන ජීවිතෙන්ද්‍රිය චෛතසිකයදැයි; දුවිධා හොති, දෙවැදෑරුම් වෙයි. පඤ්චවිඤ්ඤාණෙසු, දෙපස් විඤ්ඤාණද්වයෙහි; ඣානඞ්ගානි, විතර්ක පශ්චිම කොට ඇත්තා වූ ධ්‍යානාඞ්ගයෝ; න ලබ්භන්ති, අවිතර්ක දෙපස් විඥානද්වයෙහි නො ලැබියයුත්තාහුය. අවිරියෙසු වීර්‍ය රහිත වූ සොළොස් චිත්තයෙහි; බලානි, වීර්‍යපශ්චිම කොට ඇත්තා වූ බලධර්මයෝ; න ලබ්භන්ති, වීර්‍ය රහිත බැවින් නො ලැබියයුත්තාහු වෙත්. අහෙතුකෙසු: අටළොස් අහෙතුක චිත්තයෙහි; මග්ගඞ්ගානි, හෙතුපශ්චිමකොට ඇත්තා වූ මාර්ගා ඞ්ගයෝ, න ලබ්භන්ති, හෙතු රහිත බැවින් නො ලැබියයුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන්; විචිකිච්ඡාචිත්තෙ, විචිකිච්ඡාසහගත චිත්තයෙහි; එකග්ගතා, එකාග්‍රතා චෛතසික තෙමේ; මග්ගින්ද්‍රිය බලභාවං, මාර්ගාඞ්ගඉන්ද්‍රිය බලභාවයට; ගච්ඡති, නො පැමිණේ.

ද්විහේතුකතිහේතුක ජවනෙසුව, ද්විහේතුක ජවන් අටළොසය, ත්‍රිහේතුක ජවන් සූතිසය, යන මේතෙක් චිත්තයෙහි ම; යථා සම්භවං, සම්භවවූ පරිද්දෙන්, එකතොව, එක ම; අධිපති, අධිපතිධර්මයෙක්; ලබ්භති, ලැබිය යුත්තේ යි.

චතුද්ධා, සවභාවධර්ම වශයෙන්; හේතු, හේතුහු; ඡඊරිතා, සදෙනෙකැ යි කියන ලද්දාහුය; ඣානඞ්ගා, සප්තධ්‍යානාඞ්ගයෝ; පඤ්චඊරිතා, හකුළුවා ගැණීමෙන් පස්දෙනෙකැ යි කියන ලදහ. මග්ගඞ්ගා, දොළොස් මාර්ගාඞ්ගයෝ; නව ඊරිතා, හකුළුවා ගැණීමෙන් නවදෙනෙකැ යි කියනලදහ. ඉන්ද්‍රියධම්මා ච, දෙවිසි ඉන්ද්‍රිය ධර්මයෝ වනාහි; සොළස ඊරිතා, හකුළුවාගැණීමෙන් සොළොස්දෙනෙකැ යි කියනලදහ. බලධම්මා, බලධර්මයෝ; නව ඊරිතා, අඩුවැඩි නොවන හෙයින් නවදෙනෙකැ යි කියන ලදහ.

අධිපති, අධිපතිධර්මයෝ; චත්තාරො වුත්තා, සතරෙකැ යි කියන ලදහ. තථා, එපරිද්දෙන්, ආහාරා, ආහාරධර්මයෝ; චත්තාරො වුත්තා, සතරකැ යි කියනලදහ. ඉති, මෙසේ; සත්තධා, සප්තප්‍රකාරයකින්; කුසලාදිසමාකිණ්ණා, කුශලාකුශල අව්‍යාකෘත ධර්මයන්ගෙන් හෝ නාමරූපධර්මයන්ගෙන් සමාකීර්ණ වූ හෙවත් මිශ්‍ර වූ; මිස්සකසඞ්ගහො, මිශ්‍රකසංග්‍රහය; (මයා) වුත්තො, මා විසින් කියනලද්දේ යි.

— — ○ — —

(ගා)

මිශ්‍රකසංග්‍රහයෙහි හේතු ධ්‍යානාඞ්ග මාර්ගාඞ්ග ඉන්ද්‍රිය බල අධිපති ආහාර වශයෙන් සත්ප්‍රකාරයක් ඇති වේ. මේ සංග්‍රහය වනාහි කුමක් හෙයින් මිශ්‍රකසංග්‍රහ නම් වන්නේදයත්? කුශලාකුශල අව්‍යාකෘතනාමරූප යන සතර පරමාර්ථධර්මයන්ගේ ආකීර්ණ වූ සංග්‍රහයක් හෙයින් මිශ්‍රකසංග්‍රහ නම් වෙයි. ඔවුන් අතුරෙන් හේතුසංග්‍රහය යනු ලෝභ-දෝස-මෝහ-අලෝභ අදෝස-අමෝහ යන සවැදෑරුම් ධර්මයන්ගේ සංග්‍රහය හේතු සංග්‍රහය සංඛ්‍යාත මිශ්‍රකසංග්‍රහය නම් වේ යි. ඔවුන් අතුරෙන් ලෝභ-දෝස-මෝහ යන හේතුහු තුන්දෙන දොළොස් අකුශලයන් ගේ මූලසඞ්ඛ්‍යාත හේතුහු නම් වෙත්. අලෝභ-අදෝස-අමෝහ සඞ්ඛ්‍යාත හේතුහු තුන්දෙනා අතුරෙන් එක්විසිකුසල් හා සම්ප්‍රයුක්ත වූ හේතුහු තුමූ කුසලහේතුහු නම් වෙත්. විපාක-ක්‍රියා සිත් සමග යෙදුනාවූ හේතුහු තුමූ අව්‍යාකෘතහේතුහු නම් වෙත්. තමා හා සමග ඒ එක්ව හටගත්තා වූ හේතුහු තුමූ සම්ප්‍රයුක්ත

ධර්මයන්ගේ පිහිටීමට ආධාර වන හෙයින් මූලාර්ථයෙන් හෙතු හු නම් වෙත්. ඊට උදාහරණයක් මෙසේ යි.

ත්‍රිහෙතුක ඥානසම්ප්‍රයුක්ත කුශලවිපාක සිතින් ප්‍රතිසන්ධි ගන්නා වූ තැනැත්තාහට යහපත් මුල් බැස්සාවූ වෘක්‍ෂයක් හුනේ මූලයන්ගේ අනුසාරයෙන් පෘථුවිඔජාරසය ඇද ගණිමින් ශාඛාග්‍රයෙහි මල්ඵල උපදවන්නාක් මෙන් ත්‍රිහෙතුක ඥානසම් ප්‍රයුක්තමහාවිපාක නැමති වෘක්‍ෂයාගේ අලොභ-අද්වෙෂ-අමොහ නැමති මූලානුසාරයෙන් නොයෙක් නොයෙක් උපභොග පරි භොග සම්පත් ඥානගුණ නැමති පුෂ්පඵලපල්ලවයන්ගෙන් සම න්විත වෙයි. එපරිද්දෙන් ම ද්විහෙතුකලාමකකුශලානුභාව යෙන් උපෙක්‍ෂාසහගත සන්තීරණ නැමති අහෙතුකවිපාක යෙන් ප්‍රතිසන්ධි ගත්තා වූ දුසකරපොරිසාදී හීනමනුෂ්‍යයන්ගේ ඒ ප්‍රතිසන්ධි නැමති වෘක්‍ෂයෙහි හෙතු නැති හෙයින් තමතම න්ගේ සාපිපාසා විනොදනයට පමා සුදුසු ප්‍රත්‍යයක් නැති හෙ යින් අනුන්ගේ දාස බවට පැමිණ දුක සේ ජීවිකාව කෙරෙ යි. මේ උදාහරණයෙන් කුශලඅව්‍යාකෘත හෙතුන්ගේ ශක්තිය කල්පනා කටයුතු යි.

සහෙතුක චිත්තය, සහෙතුක චිත්තජ රූපය, සහෙතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය යනාදි වූ ධර්මයෝ තුමූ ඒ වෘක්‍ෂයාගේ ශාඛාපල්ලාසපුෂ්පඵලාදියට බඳු වෙත්. යට ගිය ජාතියෙහි කළා වූ ත්‍රිහෙතුක ඥානසම්ප්‍රයුක්තකුශලකර්මය වනාහි යහපත් සෘතු වෙහි හටගත්තා වූ බිජුවටකට බඳු වෙයි. ඒ බිජුවටින් හට ගන්නා වූ අංකුරය මෙන් කාමස්වර්ගයෙහි හටගන්නා වූ ත්‍රිහෙ තුක ප්‍රතිසන්ධිවිපාකය දතයුතු ය. මේ ප්‍රතිසන්ධිවිපාකය වනාහි කුමක්හෙයින් මෙබඳු විශෙෂආනිශංස එලවන්නේද යත්? ‘ජවනක්ඛණෙ තිණ්ණං චුතික්ඛණෙ විනානං පටිසන්ධික්ඛණෙ තිණ්ණන්නි අඨන්නං හෙතූනං සච්චසා ගතිසම්පත්තියා උප පත්තිහොති’’ යනුපටිසම්භිදාමාර්ග බැවින් බුදු-පසේබුදු-මහරහත් සක්විතිරජ ආදී වූ මහෙශාක්‍ය මනුෂ්‍යයන්ගේ හා දෙවියන්ගේ ප්‍රතිසන්ධි නැමති වෘක්‍ෂයෙහි රසතලය දක්වා බැසගත්තාවූ මහත් වූ මූලයන් අටදෙනෙකුට බඳු වූ හෙතුධර්මඅටකින් යුක්ත වූ හෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධිවිපාකයෙන් ආශ්චර්‍ය්‍ය අද්භූත විපා කානිශංස එලවන්නේ මැ යි. සිද්ධාර්ථකුමාරයන් වහන්සේගේ ප්‍රතිසන්ධිචිත්ත නැමති වෘක්‍ෂයාගේ රසතලය දක්වා බැස ගත් තා වූ මූලයන් අටදෙනාගේ අනුසාරයෙන් දෙසැත්තෑවක් ප්‍රභෙද වූ ඥානයන් පිරිවර කොට ඇති සර්වඥතාඥානය සා

ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණ අශීත්‍යානුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිත ධර්මකාය රූපකාය සඞ්ඛ්‍යාත වූ විපාකානිශංස හා පන්දහසක් අව්රුදු මුලුල්ලෙහි දිව්‍යබ්‍රහ්මයන්ගෙන් ලබන අනන්තප්‍රමාණ වූ පූජාසත්කාර නැමති විපාකානිශංසයෝ ද ලැබෙත්ය යි දතයුතු යි.

අටළොස් අහේතුකචිත්තයෝ වනාහි "ජලතලෙ සෙවාලසදිසා" යනු කී බැවින් වාතානුසාරයෙන් ඔබමොබ යා හැකි වූ දියසෙවෙල් බඳු උපමා ඇති වෙත්. එහෙයින් අහේතුක ප්‍රතිසන්ධි ගත් සතර අපායෙහි වසන්නා වූ සත්ත්වයන්ට හා භූමිනිශ්‍රිත විනිපාතිකඅසුරාදී ඥාතිප්‍රේතකාලකඤ්ජිකමනුෂ්‍යාදීන්ගේ ද ප්‍රතිසන්ධිය වනාහී අහේතුක බැවින් දියසෙවෙලට බඳු උපමා ඇති වෙ යි. ඥාතිප්‍රේතවිනිපාතිකඅසුරයෝ වනාහි මනුෂ්‍ය ජාතික නොවන බැවින් චාතුර්මහාරාජික භූමියෙහි ඇතුලත් වෙති. කම්බලාශ්වතරනාගභවනයෙහි දිව්‍යනාගයන්ගේ හා දිව්‍යගරුඩයන්ගේ ප්‍රතිසන්ධිය තිරිසන්අපායෙහි ම ඇතුලත් වන්නේයි. "ඡළෙව හෙතු පඤ්චඣානඞ්ගා" යනුවෙන් හෙතුහු සයෙකැ යි කීයේ නමුදු අලොභ-අද්වෙෂ-අමොහසඞ්ඛ්‍යාත වූ හෙතුහු තුන්දෙන කුශලාව්‍යාකෘත වශයෙන් දෙවැදෑරුම් වන්නේ නමුදු නම් වශයෙන් සමාන හෙයින් අගහිතග්ගහණන්‍යායෙන් ගැනුළුවා ගෙණ හෙතුහු සදෙනකැ යි කියන ලදී.

## මේ හේතු විභාගය යි.

———o———

ධ්‍යානාඞ්ගවිභාගය කෙසේයත්? "ධ්‍යානාඞ්ගය" යනු විතර්කය, විචාරය, ප්‍රීතිය, ඒකාග්‍රතාය, සෞමනස්සය, දෞමනස්සය, උපෙක්ෂාය, යන ධර්මයෝ සත්දෙනා යි. මේ විතර්කාදී ධර්මයෝ සත්දෙන කුශලාකුශල චිත්තයෙහි ද; අව්‍යාකෘතචිත්තයෙහි ද යෙදෙත්. එතකුදුවුවත් 'විතක්කපච්ඡිමකං ඣානඞ්ගන්ති පවුච්චති" යනුකී බැවින් ද්විපඤ්චවිඥානාදී චිත්තයෙහි විතර්ක රහිත බැවින් ඒ අවිතර්කචිත්තයෙහි යෙදුනාවූ ඒකාග්‍රතා උපෙක්ෂාදී ධර්මයෝ වනාහි ධ්‍යානාඞ්ගයෝ ය යි නො කියත්. මේ ධර්මයෝ සත්දෙන වනාහි විතර්කපශ්චිම කොට ඇති කල්හි ම ධ්‍යානාඞ්ගය යි ව්‍යවහාර කෙරෙත්.' ඣාන" ශබ්දයාගේ "පච්චනීක ධම්මෙ ඣාපෙති"ති= ඣානං. ආරම්මණං උපනිජ්ඣායතීති=ඣානං" යනුවෙන් විග්‍රහඅර්ථදෙකක් ඇත්තේ යි. ඒ දෙදෙනා අතුරෙන් මහග්ගතලොකොත්තරාදී චිත්තයෙහි යෙදුනා වූ ධ්‍යානාඞ්ගයෝ තුමූ විග්‍රහාර්ථදෙකින් ම ධ්‍යානාඞ්ගයෝ නම් වෙත්. ඒ

කෙසේ යත්? රූපාවචරප්‍රථමධ්‍යාන කුශල චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගපස්දෙන පංචනීවරණ ධර්මයන් ක්‍රමයෙන් නසනාර්ථයෙන් ද, නොහොත් විෂ්කම්භනප්‍රහාණ වශයෙන් උපකාරකාර්ථයෙන් ද, ධ්‍යානාලම්බන සංඛ්‍යාත වූ කසිණප්‍රතිභාග නිමිත්තාලම්බනය ලං කොට බලනාර්ථයෙන් හෝ ගන්නාර්ථයෙන් ධ්‍යානාඞ්ග නම් වෙයි. ප්‍රථම ධ්‍යානචිත්තයෙහි යෙදුනා වූ පන්තිස් ධර්මයන් අතුරෙන් විතර්කාදි ධ්‍යානාඞ්ගපංචකය කසිණනිමිත්ත බලනාර්ථයෙන් ධ්‍යානාඞ්ගය යි කියා ද, අවශේෂ වූ ස්පර්ශාදි සමතිස්ධර්ම ධ්‍යානාඞ්ගය යි කියා ද ව්‍යවහාර කෙරෙත්. යම්සේ උණුජලයෙහි දමන ලද්දා වූ පුෂ්පඵලාදිය තෙජොධාතුශක්තියෙන් පිසන්නාක් මෙන් ධ්‍යානාඞ්ගචිත්ත නැමති උණුදියෙහි විතර්කාදි ධ්‍යානාඞ්ගපංචක නැමති තෙජොධාතුශක්තියෙන් ස්පර්ශාදි වූ සමතිස් ධර්මයන්ට ද ධ්‍යානාඞ්ගශක්තිය ගන්වයි. මෙසේ රූපධ්‍යානාදි මහග්ගත චිත්තයෙහි යෙදුනා වූ විතර්කාදි ධ්‍යානාඞ්ගපංචකය අරමුණු නැගීම හා පංචනීවරණ ධර්මයන් දැවීම ද, එකක්ෂණයෙහි සිදු කරණ බැවින් ධ්‍යානාඞ්ගය යි යට කී විග්‍රහ දෙකින්ම ව්‍යවහාර කෙරෙත්. අකුශල චිත්තාදියෙහි යෙදුනා වූ නොහොත් සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත පළමු වන අසංස්කාරික අකුශල චිත්තයෙහි යෙදුනාවූ සොම්නස්සය, විචාරය ප්‍රීතිය, යන ධර්මයෝ තුන්දෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් ධ්‍යානාඞ්ගය යි කියත්. පටිඝසම්ප්‍රයුක්තචිත්තයෙහි යෙදුනාවූ දොම්නස් විචාර දෙදෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් අකුශලධ්‍යානාඞ්ගය යි කියත්. අවශේෂ වූ උපෙක්ෂාසහගත ෂට්අකුශල චිත්තයෙහි යෙදුනාවූ උපෙක්ෂාවිචාර දෙදෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් අකුශලධ්‍යානාඞ්ගය යි කියත්. මේ අකුශලධ්‍යානාඞ්ගයන්ට වනාහි "ආරම්මණං උපනිජ්ඣායති" යන එක ම විග්‍රහාර්ථය මුත් "පච්චනීකධම්මෙ ඣාපෙති" යන විග්‍රහය නො ලැබේ. දොළොස් අකුශල චිත්තයෙහි යෙදුනා වූ සොම්නස්සය, දොම්නස්සය, ප්‍රීතිය, විතර්කය, විචාරය උපෙක්ෂාය, යන ධ්‍යානාඞ්ගයෝ සදෙන ඒ ඒ අකුශල චිත්තයාගේ අරමුණ ලං කොට බලනාර්ථයෙන් හෝ ගන්නා අර්ථයෙන් හෝ ධ්‍යානාඞ්ගය යි කියත්. එසේ ම කාමාවචර කුශල චිත්තයෙහි යෙදුනා වූ විතර්කවිචාර ප්‍රීති සොම්නස්ස උපෙක්ෂා යන ධ්‍යානාඞ්ගපංචකය කුශලධ්‍යානාඞ්ගය යි කියා ද, විපාක ක්‍රියා සම්ප්‍රයුක්ත වූ එම ධ්‍යානාඞ්ගපංචකය අව්‍යාකෘත ධ්‍යානාඞ්ගපංචකය යි කියා ද ව්‍යවහාර කෙරෙත්. එකසියඑක්විසි ප්‍රභේද විතර්කවිචාර ප්‍රීතීන් අතුරෙන් කුශලචිත්තයෙහි යෙදුනා වූ ඒ ධර්මයෝ

තුන්දෙන කුශලධ්‍යානාඞ්ගය යි කියා ද, අකුශලචිත්තයෙහි යෙදුනා වූ එම ධර්මයෝ තුන්දෙන අකුශලධ්‍යානාඞ්ගය යි කියා ද, විපාක ක්‍රියා සම්ප්‍රයුක්ත වූ එම ධර්මයෝ තුන්දෙන අව්‍යාකෘත ධ්‍යානාඞ්ගය යි කියා ද ව්‍යවහාර කෙරෙත්. සෝමනස් උපෙක්ෂා දෙදෙනාගේ විභාගය ද එසේ මැ යි. දෞර්මනස්සධ්‍යානාඞ්ගවය විනාහි අකුශලධ්‍යානාඞ්ග මැ යි. මෙසේ මේ සප්තධ්‍යානාඞ්ගයන් ගේ විභාගය යොගක්ෂම වූ චිත්තයන්ගේ වශයෙන් විස්තර කට යුතු යි.

## ධ්‍යානාඞ්ග විභාගය යි.

"මාර්ගාඞ්ගය" යනු "සම්මාදිට්ඨි–පෙ–සම්මාසමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්ප, මිච්ඡාවායාම, මිච්ඡාසමාධි," යන මේ දොළොස් දෙන මාර්ගාඞ්ගයෝ නම් වෙත්. දොළොස්දෙනා අතුරෙන් සෝම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශලචිත්තයෙහි යෙදුනා වූ මිථ්‍යාදෘෂ්ටිය, මිච්ඡාසඞ්කප්පය, මිච්ඡාවායාමය, මිච්ඡාසමාධිය යන අකුශලමාර්ගාඞ්ගයෝ සතරදෙනා සතර අපායට යන්නා වූ මාර්ගයාගේ අඞ්ග වන බැවින් හෝ සතර අපායට ගෙණ යන්නා වූ නැවකට බඳු වූ හෙයින් හෝ මාර්ගාඞ්ග නම් වෙත්. මිථ්‍යාදෘෂ්ටිය ප්‍රකටය. මිච්ඡාසඞ්කප්පය යනු අකුශල චිත්තයෙහි යෙදුනා වූ විතර්කචෛතසිකය යි. "මිථ්‍යාව්‍යායාමය" යනු එම චිත්තයෙහි යෙදුනා වූ වීය්‍ය්‍යචෛතසිකය යි "මිථ්‍යාසමාධිය" යනු එම චිත්තයෙහි යෙදුනා වූ ඒකාග්‍රතා චෛතසිකය යි. මෙසේ දොළොස් අකුශල චිත්තයන් අතුරෙන් දිට්ඨිගතසම්ප්‍රයුක්ත සතර චිත්තයෙහි අපායමාර්ගාඞ්ගයෝ සතරසතරදෙනා බැගින් ද, අවශෙෂ වූ අකුශල්අටෙහි මිච්ඡාවායාම, මිච්ඡාසඞ්කප්ප,මිච්ඡාසමාධි යන අපායමාර්ගාඞ්ගයෝ තුන්දෙන ද, යථාලාභයෙන් යෙදෙත්. එපරිද්දෙන් ම කාමාවචර මහාකුශල්අටෙහි යෙදුනා වූ සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි, යන මාර්ගාඞ්ගයෝ පස්දෙන සුගතිමාර්ගයාගේ අඞ්ගවන බැවින් සුගති මාර්ගාඞ්ගයෝ ය යි කියත්. ශීලපුණ්‍යක්‍රියා වශයෙන් පවත්නා වූ හෙවත් ආජීවාෂ්ටමකශීලයෙහි එකඑක ශික්ෂාපදයක් පාසා ලැබෙන්නා වූ ප්‍රාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාරය යන ත්‍රිවිධවිරති සඞ්ඛ්‍යාත වූ සම්මාකම්මන්ත මාර්ගාඞ්ගය ද, මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්පලාප යන චතුර්විධවිරති සඞ්ඛ්‍යාත වූ සම්මාවාචා මාර්ගාඞ්ගය ද, "මිච්ඡාජීව විරතියෙහි ලැබෙන්නා වූ සම්මාආජීවමාර්ගාඞ්ගය ද, යන මේ ආජීවාෂ්ටමක

ශීලයෙහි එකෙකී ශික්ෂාපදයක් පාසා වෙන්වෙන්ව ලැබියයුතු වූ "සම්මාකම්මන්ත, සම්මාවාචා සම්මාආජීව" යන මාර්ගාඞ්ගයෝ තුන්දෙන සප්තකාමසුගතිමාර්ගයාගේ අඞ්ග වන හෙයින් සුගති මාර්ගාඞ්ග නම් වෙත්.

රූපාවචර ප්‍රථමධ්‍යානචිත්තයෙහි ලැබියයුතු වූ "සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවායාම සම්මාසති සම්මාසමාධි" යන පඤ්චමාර්ගාඞ්ගයන් හා ද්විතීයධ්‍යානකුශලචිත්තය-පෙ-පඤ්චමධ්‍යාන කුශලචිත්තය, ආකාසානඤ්චායතන-පෙ-නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඛ්‍යාත වූ සතර අරූපාවචර චිත්තයෝ ද රූපධ්‍යාන අරූපධ්‍යානකුශලචිත්තයන් අටදෙනා සමග යෙදුනා වූ සම්මාදිට්ඨි සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන සතර මාර්ගාඞ්ගයන් හා ප්‍රථමධ්‍යානකුශලචිත්තයෙහි යෙදුනා වූ මාර්ගාඞ්ගපඤ්චකය ද යන සුගතිමාර්ගාඞ්ගයෝ තුමූ සොළොස් රූපාවචරබ්‍රහ්ම ලෝකය, සතර අරූපබ්‍රහ්මලෝකය යන සුගතිමාර්ගයාගේ අඞ්ග වන හෙයින් සුගතිමාර්ගාඞ්ග නම් වෙත්. මේ නවමහග්ගත චිත්තයෙහි "සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව" යන විරති සංඛ්‍යාත මාර්ගාඞ්ගයෝ නො ලැබෙත් මැයි. කුමක්හෙයින්යත්? චිත්තවිශුද්ධිසංඛ්‍යාත වූ ධ්‍යානයට පූර්වභාගයෙහි පැවති ශීලවිශුද්ධියෙහි ත්‍රිවිධවිරතීන් ලැබියයුතු හෙයිනි. සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් සංඛ්‍යාත වූ සතරමාර්ගයෙහි ශුෂ්කවිදර්ශක යෝගාවචරයාහට හෝ ප්‍රථමධ්‍යානපාදකාදී වශයෙන් මාර්ගය ලබන්නා වූ සමථයානික යෝගාවචරයාට හෝ සම්මාදිට්ඨි-පෙ-සම්මාසමාධි යන නිර්වාණ මාර්ගාඞ්ගයෝ අටදෙන අනූනව ම ලැබෙත්. ද්විතීයධ්‍යානය පටන් අවශෙෂධ්‍යානයන් පාදක කිරීම් ආදී වශයෙන් මාර්ගය ලබන සමථයානික යෝගාවචරයාහට සම්මාසඞ්කප්පමාර්ගාඞ්ගය නො ලැබෙන හෙයින් මාර්ගාඞ්ගයෝ සත්දෙනොක් ම ලැබෙති. මෙසේ මාර්ගාඞ්ගය ලබන යෝගාවචරයන්ගේ මාර්ගාඞ්ග අටදෙන හෝ සත්දෙන නිර්වාණය සඞ්ඛ්‍යාත එතරට ගමන් කරන්නා වූ නැවකට බඳු හෙයින් මාර්ගාඞ්ගයෝ යයි කියත්. මෙසේ දුර්ගතිමාර්ගාඞ්ගය, සුගතිමාර්ගාඞ්ගය, නිර්වාණමාර්ගාඞ්ගය යන ත්‍රිවිධමාර්ගාඞ්ගයන්ගේ විභාගය දතයුතුයි.

## මාර්ගාඞ්ග විභාගය යි.

---

ඉන්ද්‍රියධර්මයෝ වනාහි චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය,

සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යනමොවුන්ගේ වශයෙන් දෙවිසි වැදෑරුම් වේ. "චක්ඛුවාරෙ ඉන්දට්ඨං කාරෙතීති චක්ඛුවාරභාවෙන-තංවාරිකෙහි අත්තනො ඉන්දභාවං පරමිස්සරියභාවං කාරයතීති=චක්ඛුන්ද්‍රියං. තං හි තෙන රූපග්ගහණෙ අත්තානං අනුවත්තෙති, තෙ ච තං අනුවත්තන්ති, සෙසෙසුපි එසෙව නයො" යන විශුද්ධිමාර්ගටීකාවචනයෙන් චක්ඛුන්ද්‍රියාදීන්ගේ ඉන්ද්‍රියාර්ථය දතයුතු යි. එහි අර්ථ මෙසේයි. යං ධම්මජාතං, යම් ධර්මස්වභාවක් තෙමේ; චක්ඛුවාරෙ, චක්ෂුවාරයෙහි; ඉන්දට්ඨං, අධිපති බව; කාරෙති, කරවයිද. චක්ඛුවාරභාවෙන, චක්ෂුවාර ස්වභාවයෙන්, තංවාරිකෙහි, ඒ චක්ෂුවාරයෙහි හටගන්නා වූ චිත්තචෛතසිකයන් විසින්; අත්තනො, තමාගේ; ඉන්දභාවං, පරමිස්සරියභාවං, අතිශයින් ඊශ්වරභාවය; කාරයති, කරවනු ලබයි. ඉති, (තස්මා) එසේ හෙයින්; තං ධම්මජාතං, ඒ ධර්මස්වභාව තෙමේ; චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රිය නම් වේ. හි, ඒ එසේ මැයි. තං, ඒ චක්ඛුන්ද්‍රිය තෙමේ; තංවාරිකෙ, ඒ වාරයෙහි හටගන්නා වූ චිත්තචෛතසිකයන්; රූපග්ගහණෙ, රූපයන්ගැණීමෙහි; අත්තානං, තමාකෙරෙහි; අනුවත්තෙති, අනුව පවත්වයි. තෙ ච තංවාරිකා, ඒ වාරයෙහි හටගන්නා චිත්තචෛතසිකයෝ තුමූ; තං, ඒ චක්ඛුන්ද්‍රියට; අනුවත්තන්ති, අනුව පවතිත්. සෙසෙසුපි, අවශෙෂ වූ ශ්‍රොත්‍රෙන්ද්‍රියාදියෙහි ද; එසෙව නයො, මේ ක්‍රමයම; වෙදිතබ්බො, දතයුත්තේය යනු ටීකාපාඨයෙහි අර්ථයි. ඒ දෙවිසිඉන්ද්‍රියයන් කෙරෙහි සාධාරණඅසාධාරණ වශයෙන් සහ අර්ථවශයෙන් ද, ලක්ෂණාදීන්ගේ වශයෙන් ද, ක්‍රම වශයෙන් ද, භෙදාභෙද වශයෙන් ද, තමතමාගේ කෘත්‍ය වශයෙන් ද, හටගන්නා භූමි වශයෙන් ද යි මෙසේ සත්ආකාරයකින් නිශ්චය දතයුත්තේ යි. ඒ ලක්ෂණාදීන් අතුරෙන් "චක්ඛතීති චක්ඛු" යනාදී වශයෙන් ඛන්ධවිභාගයෙහි කී ක්‍රමයෙන් අර්ථ දතයුත්තේ යි.

මේ දෙවිසි ඉන්ද්‍රියයන් අවසානයෙහි කී ඉන්ද්‍රියයන් තුන් දෙන අතුරෙන් අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වතාහි ආර්‍යමාර්ගය ලැබීමට පෙර නොලැබූ විරූ නො දන්නා විරූ අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණය නොහොත් චතුස්සත්‍යය දැන ගන්නෙමි යි මෙසේ පිළිපන්නා වූ යොගාවචර පුද්ගලයාහට උපදනා හෙයින් ද, ඉන්ද්‍රියාර්ථ සම්භව වන හෙයින් ද, නොහොත් ඉන්ද්‍රියශබ්දයාගේ

අර්ථය ලැබියයුතු හෙයින් ද, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යි කියත්. අඤ්ඤින්ද්‍රිය වනාහි:- සෝවාන් මාර්ගයෙන් දක්නාලද්දවූ පරිච්ඡේද නොයික්මවා ඒ සෝවාන් මඟින් දක්නාලද චතුස්සත්‍යය නැවත දක්නා හෙයින් ද, ඉන්ද්‍රියාර්ථය ලැබෙන හෙයින් ද, අඤ්ඤින්ද්‍රිය යි කියත්. තුන්වන අඤ්ඤාතාවීන්ද්‍රිය වනාහි චතුස්සත්‍යධර්මය දක්නා ලද්දාවූ අඤ්ඤාතාවීනම් රහතුන් වහන්සේගේ කෙවත් නිෂ්ඨා කරණ ලද ඥානකෘත්‍යය ඇත්තාවූ ආර්‍ය්‍යයන් වහන්සේට උපදනා හෙයින් ද, ඉන්ද්‍රියාර්ථය සම්පූර්ණ වන හෙයින් ද, අඤ්ඤාතාවීන්ද්‍රිය යි කියන ලද්දේ යි. හාත්පසින් නිෂ්ඨා කරණ ලද ඥානකෘත්‍යය ඇත්තාවූ අර්හත්ඵලඥාන ප්‍රමාණ නිමිත්ත කොට ගෙණ අඤ්ඤාතාවීශබ්ද තෙමේ ඒ අර්හත්ඵල සමංගිපුද්ගලයා හෝ අර්හත්ඵලසම්ප්‍රයුක්ත ධර්මය හෝ වාච්‍ය වේ. ඒ අර්හත්ඵලඥාන තෙමේ අඤ්ඤාතාවී භාවය වේ යි. ඒ පරිනිෂ්ඨිත කෘත්‍යය ඇත්තාවූ ඥානය තෙමේ ක්ෂීණාශ්‍රවභාවය වන හෙයින් ක්ෂීණාශ්‍රවයන්ට උපදනා හෙයින් අඤ්ඤාතාවීන්ද්‍රිය යි කියත්.

මේ ඉන්ද්‍රිය ශබ්දාර්ථය කාවරේදයත්? ඉන්ද නම් වූ කුශලාකුශලකර්මය ප්‍රකාශිතවූ ධර්මයාගේ සවභාව හෝ ඉන්ද නම් වූ කුශලාකුශලකර්මය ප්‍රකාශ කිරිම් සංඛ්‍යාත වූ ඉන්ද්‍රිය ශබ්දාර්ථයද, ඉන්දලිඞ්ගාර්ථ නම් වූ ඉන්ද්‍රියාර්ථ නම් වේ, ඉන්දදෙශිතාර්ථය යනු ඉන්ද නම් සර්වඥයන් විසින් දෙශිතවූ ධර්මයාගේ සවභාව හෝ නොහොත් දෙශනා කරණ ලද්දේය යන අර්ථය හෝ ඉන්දදෙශිතාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. “ඉන්දදිඨාර්ථය” යනු ඉන්ද නම් වූ බුදුන් විසින් දක්නා ලද ධර්මයාගේ සවභාව හෝ දක්නා ලද්දේය යන අර්ථය හෝ ඉන්දදිඨාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. “ඉන්දඉඨාර්ථ ඉන්ද්‍රියාර්ථය” යනු ඉන්ද්‍රිය නම් වූ කර්මය විසින් සකස් කරණ ලද උපදවන ලද ධර්මයාගේ සවභාව හෝ සකස්කරණ ලද්දේය. උපදවන ලද්දේය යනාර්ථය හෝ ඉන්දඉඨාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. “ඉන්දජුඨාර්ථ ඉන්ද්‍රියාර්ථය” යනු ඉන්ද නම් වූ සර්වඥයන් වහන්සේ විසින් ආසෙවිතනිසෙවිතධර්මයාගේ සවභාව හෝ ආසෙවිතනිසෙවිතාර්ථය හෝ ඉන්ද්‍රජුඨාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. මෙසේ දක්වන ලද ඉන්දලිඞ්ගාර්ථ ඉන්ද්‍රියාර්ථ, ඉන්දදෙශිතාර්ථ ඉන්ද්‍රියාර්ථ, ඉන්දදිඨාර්ථ ඉන්ද්‍රියාර්ථ, ඉන්දඉඨාර්ථ ඉන්ද්‍රියාර්ථ, ඉන්දජුඨාර්ථ ඉන්ද්‍රියාර්ථ, යන මේ පඤ්චප්‍රකාර සියලු අර්ථසවභාව තෙමේ දෙවිසි ඉන්ද්‍රිය ධර්මයෙහි සුදුසු පරිද්දෙන් යෙදෙන්නේ යි.

මේ අත්‍ථය වනාහි "ලිඞ්ගති ගමෙති ඤාපෙතීති ලිඞ්ගං, ලිංගීයති වා එතෙනාති ලිඞ්ගං, කිං ලිඞ්ගති? කිච වා ලිංගීයතීති=ඉන්‍දං, ඉන්‍දො වා, ඉන්‍දස්ස ලිඞ්ගං-ඉන්‍දලිඞ්ගං, ඉන්‍දලිඞ්ගස්ස අත්‍ථො, තං සභාවො-ඉන්‍දලිඞ්ගට්ඨො. සජ්ජිතං උප්පාදිතන්ති—සිට්ඨං, ඉන්‍දෙන සිට්ඨං-ඉන්‍දසිට්ඨං. ජුට්ඨං සෙවිතං, කම්මසංඛාතස්ස ඉන්‍දස්ස ලිඞ්ගානි තෙන ච සිට්ඨානීති? කම්මජානෙව යොජෙතබ්බානි, න අඤ්ඤානි, තෙ ච මෙ අත්‍ථා කමෙම එව යොජෙතබ්බා, ඉතරෙ ච භවන්ති යෙවාති, යථායොගන්ති ආහ, යනු විශුද්ධිමාර්ගටීකායෙහි ආවා වූ ලිඞ්ගාත්‍ථපචනය යි.

ලිඞ්ගති- ගමෙති- ඤාපෙති- දන්වා ද; ඉති, (තස්මා), එසේ හෙයින්; ලිඞ්ගං, ලිඞ්ග නම් වේ. වා, නොහොත් එතෙන, මේ සවභාවධර්මය කාරණකොට ගෙණ; ලිංගීයති, දැන ගන්නා ලද්දේ ද; ඉති (තස්මා) එසේ දැන ගන්නා ශක්තිහෙයින්; ලිඞ්ගං, ලිඞ්ග නම් වේ. කිං ලිඞ්ගති? කුමක් දැන ගන්නේ ද යත්? වා, නොහොත්; කිච ලිංගීයති? කෙසේ දැන ගන්නා ලැබේ ද යත්? ඉති වේ, ඉදින් මෙබඳු චොදනාවක් වී නම්; ඉන්‍දං, ඊශ්වර වූ මේ කර්මය; ලිඞ්ගති, දැන ගණීවා; නොහොත් ඉන්‍දො, ඊශ්වර වූ කර්මය; ලිංගීයති, දැන ගන්නා ලැබේ ද; ඉන්‍දස්ස, ඊශ්වරවූ කර්මය; ලිඞ්ගං, දන්වන්නේයි යේ යි; නොහොත් ඊශ්වර වූ කර්මය දැන ගැණීමට ඇත්තා වූ හෙතුව; ඉන්‍දලිඞ්ගං, ඉන්‍දලිඞ්ග නම් වේ. නොහොත් ඉන්‍දලිඞ්ගස්ස, ඊශ්වර වූ කර්මයදන්වන්නා වූ ධර්මයාගේ; අත්‍ථො, තං සභාවො, ඒ දැන්වීම සංඛ්‍යාත සවභාව; ඉන්‍දලිඞ්ගට්ඨො, ඉන්‍ද්‍රලිඞ්ගාත්‍ථ නම් වේ. වා, නොහොත්; ඉන්‍දලිඞ්ගමෙව, අධිපති වූ කර්මය භගවන්තා වූ ම; ඉන්ද්‍රියසද්දස්ස, ඉන්ද්‍රිය ශබ්දයාගේ; අත්‍ථො, අත්‍ථ යි ඉන්‍දලිඞ්ගට්ඨො, ඊශ්වර වූ කර්මය දැන ගැණීමට කාරණා වූ ඉන්ද්‍රිය ශබ්දයාගේ අත්‍ථය, සජ්ජිතං, සදන ලද්දේද; උප්පාදිතං, උපදවන ලද්දේද; ඉති (තස්මා) එසේ හෙයින්; සිට්ඨං, සිට්ඨ නම් වේ, ඉන්‍දෙන, ඊශ්වර වූ කර්මය විසින්; සිට්ඨං, රචනා කරණ ලද්දේය. උපදවන ලද්දේ නුයි; ඉන්‍දසිට්ඨං, ඉන්‍දසිට්ඨ නම් වේ. ජුට්ඨං, ජුට්ඨ යනු; සෙවිතං, සේවනය කරණ ලද්දේ යි. කම්මසංඛාතස්ස, කර්මය යි කියන ලද්දා වූ; ඉන්‍දස්ස, ඊශ්වර ධර්මයාගේ, ලිඞ්ගානි, දැන ගැණීමට කාරණයෝ නුයි; තෙන ච, ඒ ඊශ්වර වූ කර්මයවිසිනුදු; සිට්ඨානි, උපදවන ලද්දාහුය; ඉති ඉමිනා අත්‍ථෙන, යන මේ අත්‍ථය කාරණ කොට ගෙණ; කම්මජානෙව, කර්මයෙන් හටගන්නා වූ ඉන්ද්‍රියයෝ ම; යොජෙතබ්බානි, යෙදියයුත්තාහුය; අඤ්ඤානි, සෙසු ඉන්ද්‍රිය ධර්මයෝ; න යොජෙතබ්බානි, නො යෙදියයුත්තාහුය. තෙ ච මෙ

අත්‍ථා, ඒ ඉන්‍ද්‍රලිඞ්ග-සිට්ඨ සංඛ්‍යාත වූ අර්‍ථයෝ දෙදෙන; කම්මෙ එව, කර්‍මයෙහි ම; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය; ඉතරෙ ච, මෙයින් අන්‍ය වූ ඉන්‍ද්‍රදෙසිතාදී වූ අර්‍ථයෝ තුන්දෙන ච නාහි; භගවති එව, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ම; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය; ඉති (තස්මා) එසේ හෙයින්; යථායොගං, යථායොගං යනුවෙන්; ආචරියො, ධර්‍මපාලාචාර්‍ය්‍ය තෙමේ; ආහ, කියේ යි. "ඉන්‍ද්‍රලිඞ්ගට්ඨො" යනාදියෙහි ඨකාරයට ඪකාරාදෙශ කරණ ලද්දේ යි.

ඉන්‍දතො ලිඞ්ගසිට්ඨදෙසිතසිට්ඨජුට්ඨිස්සරියත්ථෙව වත්තබ්බා ඉන්‍දසද්දතො ණ්‍යපච්චයො හොති. ඉන්‍ද්‍රියන්ති එත්ථාති ඉන්‍දො ඉන්‍දො වුච්චති සම්මාසම්බුද්ධො. පරමිස්සරියභාවතො කුසලාකුසලඤ්ච කම්මං, කම්මෙසු කස්සචි ඉස්සරියාභාවතො තස්මා කම්මසඤ්ජනිතානි චක්ඛාදීනි ඉන්‍දං කුසලාකුසලකම්මං උල්ලිඞ්ගෙන්ති තෙන ච සිට්ඨානීති ඉන්‍ද්‍රියානීති සබ්බානෙව පන තානි සති ඉන්‍ද්‍රියානි, ඉන්‍දෙන භගවතා යථාභූතතො දෙසිතානීති ඉන්‍ද්‍රියානි, තථා ඉන්‍දෙන භගවතා දිට්ඨානීපි ඉන්‍ද්‍රියානි, තෙනෙව ච ඉන්‍දෙන භගවතා කානිචි ගොචරාසෙවනාය කානිචි භාවනාසෙවනාය ජුට්ඨානීති ඉන්‍ද්‍රියානි, ආධිපච්ච සඞ්ඛාතෙන ඉන්‍ද්‍රියට්ඨෙනාපි ඉන්‍ද්‍රියානි, අපි ච ඉන්‍දනාති ඉන්‍ද්‍රියානි, අත්‍ර පතිදම්පි උපලක්ඛණීයං, ඉන්‍දස්සභාවො ඉන්‍දති විග්ගහෙ ඉන්‍ද්‍රියන්ති පදං සක්කත්ථෙ සද්දං වදන්ති, තදෙව පදං දකාරස්ස ජකාරෙ කතෙ ච ඛාදිතො ච වදන්ති. සඞ්කතාතිරූළ්හෙහි සද්දෙ අත්‍ථතූති" යනු සද්දනීති ගන්ථය යි.

හි, විස්තර කෙරෙමි:—සම්මාසම්බුද්ධො, චතුරාර්‍ය්‍යසත්‍යය අවිපරීතාකාරයෙන් අවබොධ කළාවූ; භගවා, භාග්‍යවත් තෙමේ; පරමිස්සරියභාවතො, පරමෙශ්වර බවට පැමිණි හෙයින්; ඉන්‍දො, ඉන්‍ද නම් වේ. කුසලාකුසලඤ්ච කම්මං, කුශලාකුශලකර්‍මය ද; කම්මෙසු, කර්‍මයන් කෙරෙහි; කස්සචි, කිසිවෙක්හුගේ; ඉස්සරියාභාවතො, ඓශ්වර්‍ය්‍ය බවෙක් නැති හෙයින්; ඉන්‍දො, ඉන්‍ද නම් වේ. තෙන භගවතා කම්මස්ස ච ඉන්‍දත්තා, ඒ භාග්‍යවත් හුගේ ද කර්‍මයාගේ ද ඉන්‍දභාවය ඇති හෙයින්; එත්‍ථ, මේ ඉන්ද්‍රියයන් අතුරෙන්; තාව, පළමු කොට; කම්මසඤ්ජනිතානි, කර්‍මය විසින් උපදවන ලද්දා වූ; ඉන්ද්‍රියානි, චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ තුමූ; කුසලාකුසලකම්මං, කුශලාකුශලකර්‍මය; උල්ලිඞ්ගෙන්ති, හී සේ සී; ඤාපෙන්ති, හඟවත් ද; පකාසෙන්ති, ප්‍රකාශ කෙරෙත් ද; තෙන ච, ඒ කර්‍මය විසිනු දු; සිට්ඨානීති; උපදවන ලද්දානු

නුයි; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. ඉති, මෙසේ; ඉන්දලිඞ්ග
ත්ථෙන ච, ඉන්ද නම් වූ කර්මය ප්‍රකාශ කරණ ස්වභාව ඇති හෙයින්
ද, නොහොත් ප්‍රකාශ කිරීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් ද,—ඉන්ද
සිට්ඨෙන ච, ඉන්ද නම් වූ කර්මය විසින් රචනා කරණ ස්වභාව
ඇති හෙයින් ද; නොහොත් ඉන්ද නම් වූ කර්මය විසින් රචනා
කිරීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් ද; (මේ වනාහි ඉන්දලිඞ්ගස්ස
අත්ථො තං සභාවො. ඉන්දලිඞ්ගට්ඨො=ඉන්දලිඞ්ග මෙව ට්ඨො ඉන්ද්‍රිය
සද්දස්ස අත්ථොති= ඉන්දලිඞ්ගට්ඨො, යන විශුද්ධිමාර්ගටීකාපාඨයට
අනුව කියන ලදී. නොහොත් ඉන්දලිඞ්ගත්ථෙන ච, ඉන්ද නම් කර්මය
ප්‍රකාශ කරණ ස්වභාව ඇති හෙයින් ද; නොහොත් භගවත ස්ව
භාව සංඛ්‍යාත ස්වභාවාර්ථයෙන් ද; (මේ වනාහි ලිඞ්ගශබ්දය
භාවප්‍රධාන වශයෙන් කල්පනා කොට අර්ථශබ්දයාගේ ස්වභාවා
ර්ථය, ප්‍රකාශාර්ථය යන අර්ථයන් දෙදෙනා ගෙණ කරන්නා වූ
අර්ථයොජනාව යි.) ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. පන, එසින්
අන්‍ය වූ; සබ්බානෙව එතානි, මේ සියලු දෙවිසි ඉන්ද්‍රියයෝ;
ඉන්දෙන භගවතා, පරමෛශ්වර භාග්‍යවත්හු විසින්, යථාභූතතො,
තත් වූ ස්වභාව වශයෙන්; පකාසිතානි, ප්‍රකාශ කරණ ලද්ද
හුය; අභිසම්බුද්ධානි ච, විශිෂ්ටසර්වඥතාඥානයෙන් තමන්වහන්සේ
විසින් අවබොධ කරණ ලද්දහුය. ඉති, මෙසේ; ඉන්දදෙසිතට්ඨ
තා ච, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින් දෙසියයුතුබැවින් ද,
ඉන්දදිට්ඨත්ථෙන ච, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින් දක්නා ලද
අර්ථයෙන් ද, ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. මුනින්දෙන, ෂට්විධ
මුනීන්ට ඉන්ද්‍ර වූ; තෙන භගවතා, ඒ භාග්‍යවත්හු විසින්; කා
නිචි, ඇතැම් ඉන්ද්‍රියයෝ; ගොචරාසෙවනාය, අරමුණු ආසෙවන
යෙන් ද; කානිචි, ඇතැම් ඉන්ද්‍රියයෝ; භාවනාසෙවනාය, වැඩීම්
ආසෙවනයෙන් ද; දිට්ඨානීති, සෙවනය කරණ ලද්දහුද, ඉති,
මෙසේ; ඉන්දජුට්ඨෙනාපි, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින්
ගොචරාසෙවන-භාවනාසෙවන වශයෙන් සෙවනය කරණ ලද
බැව් සංඛ්‍යාත ස්වභාවාර්ථයෙන් ද; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම්
වෙත්. "තෙසං කිඤ්චි ං ආසෙවති" යනාදියෙහි අරමුණු කිරීම
ආසෙවන නම් වන හෙයින් "කානිචි ගොචරාසෙවනාය' යනු
කීහ. "තස්ස තං මග්ගං ආසෙවතො" යනාදියෙහි භාවනා
සෙවන නම් වන හෙයින් භාවිතව්‍ය වූ ශ්‍රද්ධාදීන් සඳහා "කානිචි
භාවනාසෙවනාය" යනු කීහ. අපි ච, වැලිත්; ආධිපච්චසඞ්ඛා
තෙන, අධිපති බැව් සඞ්ඛ්‍යාත වූ නොහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යය
භාවය යි කියනු ලද්දා වූ ඉස්සරියට්ඨෙන, ඓශ්වර්‍ය්‍යභාව සඞ්ඛ්‍යා
ත වූ අර්ථයෙන්ද; එතානි, මේ චක්ඛුරාදී දෙවිසි ඉන්ද්‍රියධර්මයෝ

පුමු; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. මේ "ඉස්සරියට්ඨෙන" යන පාඨය බලා ම; (නො ව හි) ඉත්ථිලිඞ්ගාදියෙහි; භාවප්‍රධාන බව කල්පනා කෙළේ යි ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රියයන්ගේ තමතමාහට ප්‍රධාන වන බව යෙවත් ස්ත්‍රීනාමාදියට උපකාර වන හෙයිනි එසේ කුදුවුවත් ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් උපකාර නොවන්නේ යි යි, ඒ එසේමැ යි. චක්ඛුවිඤ්ඤාණාදි පවත්තියං, චක්ෂුර්විඥානාදීන්ගේ පටිගැණීමෙහි චක්ෂුරාදී ඉන්ද්‍රිය නොවම්; තික්ඛෙ, තියුණු බව ඇතිකල්හි; තෙසං, ඒ චක්ෂුර්විඥානාදීන්ගේ; තික්ඛතාය, තියුණු බව වන හෙයින් ද, මන්දෙ ච, මඳ වූ කල්හි, මන්දතාය, මඳ වන හෙයින්; චක්ඛාදීනං, චක්ෂුරාදීන්ගේ; ආධිපච්චං, අධිපති බව; සිද්ධං, සිද්ධ යි. ඉති (තස්මා) එසේ හෙයින්; ඉන්ද්‍රියානි ඉන්ද්‍රිය නම් වෙත්.

ඒ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් චක්ෂුප්‍රසාදරූපකලාපයෙහි ඇතුළත් වූ පඨවි ආපො තෙජො වායො වණ්ණ ගන්ධ රස ඔජා ජීවිත යන රූපයෝ නවදෙන චක්ෂුප්‍රසාද සංඛ්‍යාත වූ රූපයට අනුව පවත්නා හෙයින් හෙවත් ඒ රූපයන් නවදෙනා කෙරෙහි චක්ෂුප්‍රසාදය අධිපති බව කාරණ හෙයින් චක්ෂුරින්ද්‍රිය නම් වේ. ශ්‍රොත්‍රකලාපය ඝ්‍රාණජිහ්වාකාය ජිහ්වාකලාපය යන මෙතෙක් රූපකලාපයෙහි ද ශ්‍රොත්‍රප්‍රසාදාදීහු අධිපති බව කාරණ හෙයින් ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිහ්වෙන්ද්‍රිය ය කායෙන්ද්‍රිය ය යි කියත්. ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය කලාපවලයෙහි ඒ ස්ත්‍රීභාව පුරුෂභාවයෝ දෙදෙන ස්ත්‍රීලිඞ්ග ස්ත්‍රීනිමිත්ත ස්ත්‍රීකුත්ත ස්ත්‍රීආකල්පයන්ට හා පුරුෂලිඞ්ග පුරුෂනිමිත්ත පුරුෂාකල්ප පුරුෂකුත්ත යන මොවුන්ට ද අධිපති බව කාරණ හෙයින් ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ය යි කියත්. "ස්ත්‍රීලිඞ්ගය" යනු ස්ත්‍රීන්ගේ ආකාරය යි. "ස්ත්‍රී නිමිත්තය" යනු ස්ත්‍රීන්ගේ පයොධරාදී අවයවයෝ යි. ස්ත්‍රී කුත්තය යනු බාල අවස්ථාවෙහි කුඩා කුළුආදියෙන් ක්‍රීඩා කිරීමාදිය යි. ස්ත්‍රීආකල්පය යනු ස්ත්‍රීන්ගේ හාවභාවලීලාදිය යි. පුරුෂලිඞ්ගාදියෙහි ද මේ ක්‍රමය යොදා ගතයුතු යි. ජීවිතෙන්ද්‍රිය යනු නාමරූපධර්මයන් පරිපාලනයෙහි සමර්ථවූ නාමජීවිතෙන්ද්‍රිය හා රූපජීවිතෙන්ද්‍රිය යි. මේ චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රින්ද්‍රිය ඝ්‍රාණින්ද්‍රිය ජිහ්වින්ද්‍රිය කායින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය යන ඉන්ද්‍රියයෝ අටදෙන රූපෙන්ද්‍රියයෝ නම්වෙත්. එතැන් පටන් දක්වන්නා වූ මනින්ද්‍රියාදීහු නාමෙන්ද්‍රියයෝ නම් වෙත්. හෙවත් සියලු ම නාමා යා සම්ප්‍රයුක්තධර්මයන්ට ඊශ්වරභාවය කාරණ හෙයින් මනින්ද්‍රිය නම් වෙයි. සුඛසහගත කායවිඥාන චිත්තයෙහි යෙදුනා වූ වේදනාචෛතසිකය නමා ඒ්ව යෙදුනා වූ

චෛතසික ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් සුඛෙන්ද්‍රිය නම් වේ. දුක් සහගත කායවිඥානචිත්තයෙහි යෙදුනා වූ වේදනාචෛතසිකය තමා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් දුක්ඛින්ද්‍රිය නම් වේ. දෙසැටක් සොම්නස් සහගත චිත්තයෙහි යෙදුනා වූ වේදනාචෛතසිකය ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් සොමනස්සින්ද්‍රිය නම් වේ. දොම්නස් සහගත දෙසිතෙහි යෙදුනා වූ දොම්නස්වේදනා තොමෝ තමා හා සම්ප්‍රයුක්ත වූ අවශෙෂ ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් දොම්නස්සින්ද්‍රිය නම්වේ. උපෙක්ෂාසහගත පස්පණස් චිත්තයෙහි යෙදුනා වූ වේදනාතොමෝ ඒ ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂ චෛතසික ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් උපෙක්ඛින්ද්‍රිය නම් වේ ධ්‍යානමාගීඵලචිත්තයෙහි ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-සමෘති-සමාධි-ප්‍රඥා යන ධර්මයෝ පස්දෙන තමතමාගේ කෘත්‍යය පැමිණි කල්හි ඒ ඒ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් ඉන්ද්‍රිය ධර්මයෝ යි ව්‍යවහාර කෙරෙත් ඊට උපමා කවරයත්?

සිටුපුත්‍රයන් සතරදෙනෙක් සමග නගර සංචාරණයට යන්නා වූ රජ තෙමේ පළමුවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි රජු හා අවශෙෂ සිටුපුත්‍රයන් තුන්දෙන ද නිශ්ශබ්දව සිටි කල්හි ඒ ගෙට අධිපති සිටුපුත්‍ර තෙමේ තමන්ගේ දාසිදාසයන් ලවා ආගන්තුකව පැමිණි රජු හා සිටුපුත්‍රයන් තුන්දෙනා හට බත්බුලත් ආදියෙන් සංග්‍රහ කරව යි කියයි. එපරිද්දෙන්ම ශ්‍රද්ධාචෛතසිකය ධ්‍යානමාගීඵල චිත්තයෙහි ආරම්මණයෙහි ප්‍රසන්න කරවීම් වශයෙන් තමාගේ කෘත්‍යය කරණ හෙයින් සද්ධින්ද්‍රිය නම් වේ. එතැනින් නැගිට දෙවෙනි සිටුපුත්‍රයාගේ ගෙට ගිය කල්හි රජු හා අවශෙෂ සිටුපුත්‍රයෝ තුන්දෙන ද නිශ්ශබ්ද වෙත්. ඒ ගේ හිමි සිටුපුත්‍රතෙමේ ද තමාගේ දාසිදාසයන් ලවා බත් බුලත් සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවන්නාක්මෙන් ධ්‍යානමාගීඵල චිත්තයෙහි යෙදුනා වූ විරියචෛතසිකය සම්‍යක් ප්‍රධානයන්ගේ වශයෙන් තමතමන්ගේ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් විරියින්ද්‍රිය නම් වේ. එතැනින් නැගිට තුන්වෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි දු එසේම තුන්වෙනි සිටුපුත්‍ර තෙමේ ද සංග්‍රහ කරවන්නාක් මෙන් ධ්‍යානමාගීඵල චිත්තයෙහි යෙදුනාවූ සතිචෛතසික තෙමේ සතර සතිපට්ඨානයන්ගේ වශයෙන් ඊශ්වරභාවයෙන් තමාගේ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් සතින්ද්‍රිය නම් වේ. එතැනින් නැගිට සතරවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි දු රජු හා අවශෙෂ තුන්දෙන

තූෂ්ණීම්භූත වෙත්. ඒ යෝ හිමි සිටුපුත්‍ර තෙමේද පෙර මෙන් සංග්‍රහ කරවන්නාක් මෙන් ධ්‍යානමාර්ගඵලචිත්තයෙහි යෙදුනාවූ ඒකාග්‍රතාචෛතසිකය තමාගේ කෘත්‍යය සංඛ්‍යාත වූ සමාතවට අරමුණෙහි පිහිටුවීම සිද්ධ කරණ හෙයින් සමාධීන්ද්‍රිය නම්වේයි. එතැයින් නැගිට රජගෙට පැමිණි කල්හි සිටුපුත්‍රයෝ සතර දෙන නිශ්ශබ්ද වෙත්. සිටුපුත්‍රයන්ගේ සංග්‍රහයට විගුණත්‍රිගුණ වූ සංග්‍රහයක් රජ තෙමේ උත්සාහව වශයෙන් කරවන්නාක් මෙන් ධ්‍යානමාර්ගඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාචෛතසිකය ධර්මයන්ගේ යථාස්වභාවාවබෝධ කිරීම් වශයෙන් තමාගේ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් ප්‍රඥෙන්ද්‍රිය නම් වේ.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යනු සෝවාන් මාර්ගචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාචෛතසිකය යි. ඒ ප්‍රඥාව වනාහි අනාදිමත් සංසාරයෙහි කිසි කලෙක නුදුටු විරූ අසංඛතධාතු සංඛ්‍යාත නිර්වාණධර්මය පළමුකොට දක්නා හෙයින් ද මාර්ගචිත්තයෙහි යෙදුනා වූ සත්තිස්බෝධිපාක්ෂිකධර්මයන්ට ඊශ්වරභාවය කාරණ හෙයින් ද අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය නම් වේ. සෝවාන් ඵල චිත්තය-පෙ-අර්හත්මාර්ගචිත්තය යන මේ මාර්ගඵල සිත්සයෙහි යෙදුනා වූ ප්‍රඥාචෛතසිකයෝ සදෙන සාත්පසින් නිර්වාණධර්මය දක්නා හෙයින් ද, ඒ ඒ චිත්තයෙහි යෙදුනා වූ සත්තිස්බෝධිපාක්ෂික ධර්මයන්ට ඊශ්වරභාවය කාරණ හෙයින් ද, අඤ්ඤින්ද්‍රිය යයි කියත්. මෙහි "අඤ්ඤ" ශබ්දය සෝවාන් ඵලචිත්තය පටන් අර්හත්මාර්ගචිත්තය දක්වා සවැදෑරුම්වූ මාර්ගඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාව වාච්‍යවන හෙයින් ප්‍රතිෂේධාර්ථ අකාරය යි නො ගෙණ සමන්තාර්ථවාචක වූ අකාරය යි දතයුතු යි. මෙහි ආකාරයට හ්‍රස්ව කොට සදිසභාවය කිරීමෙන් අඤ්ඤශබ්දය සිද්ධ යි, "අඤ්ඤ ඉති" යනාදියෙහි සර්වනාම පදයකැ යි නොදතයුතු යි. "අඤ්ඤාතාවින්ද්‍රිය" යනු අර්හත්ඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාචෛතසිකය යි. ඒ ප්‍රඥාචෛතසිකය වනාහි අඤ්ඤාතාවී නම් වූ රහතුන් වහන්සේගේ ඉන්ද්‍රියයක් වන හෙයින් අඤ්ඤාතාවින්ද්‍රිය නම් වේ. මේ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් රූපෙන්ද්‍රියයන් අටදෙනාගේ හා නාමෙන්ද්‍රියයන් තුදුස්දෙනාගේ ද විශේෂ නම්:—රූපෙන්ද්‍රියයෝ අටදෙන යට කී රූපකලාපාදියෙහි ඇතුලත් වූ රූපාදීන්ට මුත් අවශේෂධර්මයන්ට ඊශ්වරභාවය නො කෙරෙත්. තුදුස් නාමෙන්ද්‍රියයෝ වනාහි අනන්තනය සමන්ත පට්ඨාන මහාප්‍රකරණයෙහි දේශනා කර වදාළා වූ ඉන්ද්‍රියප්‍රත්‍යය ධර්මයන් කෙරෙහි ඇතුලත් වෙති.

## ඉන්ද්‍රිය විභාගය යි.

—— o ——

"බලධර්ම" යනු අනුන්ගේ අධිපතිභාවය නො වලක්වා විරුද්ධ වූ ධර්මයන්ට හිංසා කරන්නා වූ ධර්මයෝ තුමූ බලධර්මයෝ නම් වෙත්. ඒ බලධර්මයෝ වනාහි යුද්ධසේනාවකට අධිපතිවන්නා වූ බලනායකයන් නවදෙනෙකුට බඳු උපමා ඇති වෙත්. ඒ බලනායකයෝ වනාහි තමාගේ පක්ෂයෙහි සෙසු බලනායකයන්ගේ ශක්තිය මැඩ නො පවත්වා සතුරන්ගේ ශක්තිය ම මැඩපැවැත්වීමෙහි උත්සාහ කරති. එපරිද්දෙන් ම මේ බලධර්මයෝ නවදෙන වනාහි තමාගේ පක්ෂයෙහි සෙසු බලධර්මයන්ගේ ශක්තිය මැඩ නො පවත්වා අකුශලධර්මයන්ගේ ශක්තියම මැඩ පවත්වන්නාහු වෙති. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා, හිරි, ඔත්තප්ප, යන බලධර්මයෝ සත්දෙන සූවිසි කාමාවචර ශෝභන චිත්තය, සත්විසි මහද්ගත චිත්තය, ලෝකෝත්තර සිත් අටය, යන ධර්මයන් හා සම්ප්‍රයුක්තව තමතමාගේ සතුරුධර්මයන් නැසීමෙහි හෙවත් ශ්‍රද්ධාබලය අශ්‍රද්ධාබලය නැසීමට ද, වීර්යබලය කුසීතභාවය නැසීමට ද, ස්මෘතිබලය මුඨස්සතිය නැසීමට ද, සමාධිබලය විචිකිච්ඡාව නැසීමට ද, ප්‍රඥාබලය අවිද්‍යාව නැසීමට ද, හිරිබලය අහිරිකය නැසීමට ද, ඔත්තප්පබලය අනොත්තප්පබලය නැසීමට ද, තමතමාගේ චිත්තයෙහි යෙදුනා වූ ස්පර්ශ වේදනාදී චෛතසික නැමති යෝධභටයන් මෙහෙයමින් උත්සාහ කරන්නාහු වෙති. අහිරික අනොත්තප්ප යන මේ අකුශල පාක්ෂික බලධර්මයෝ දෙදෙන සියලු දොළොස් චිත්තයෙහි යෙදී කුශලපක්ෂයෙහි වූ ධර්මයන් නැසීමට උත්සාහ කරන්නාහු වෙති.

මේ බලධර්මයන්ගේ විනිශ්චය යි.

"අධිපති ධර්ම" යනු ඊශ්වරභාවයෙන් අධිපති නම් වෙත්. ඉන්ද්‍රියයන්ගේ හා අධිපති ධර්මයන්ගේ ද විශේෂ කවරයත්? යම් රජෙකුගේ රට්ඨවාසී අමාත්‍යයෝ සෙසු අමාත්‍යයන්ගේ ශක්තිය මැඩ නොපවත්වා තමතමාගේ කටයුතු කෘත්‍යය සිද්ධ කරන්නාක් මෙන් ඉන්ද්‍රිය ධර්මයෝ තුමූ අන්‍යයන්ගේ ශක්තිය මැඩ නොපවත්වා තමාගේ අධිපතිභාවය උසුලන්නෝ වෙති. ඊට උදාහරණයක් නම්:—චක්ෂුප්‍රසාදකලාපයෙහි ඇත්තා වූ චක්ෂුරින්ද්‍රිය ධර්මය ශ්‍රොත්‍රකලාපයෙහි ඇත්තා වූ ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ශක්තිය මැඩ නො පවත්වා තමාගේ කලාපයෙහි ඊශ්වරභාවය සිද්ධකෙරේ යි. අවශේෂ වූ එක්විසි ඉන්ද්‍රියධර්මයෝ ද මෙසේ තම තමන්ට අයත් වූ ධර්මසමූහයෙහි ඊශ්වරභාවය සිද්ධකරමින් පවත්නාහුය. අධිපති ධර්ම වනාහි එසේ නොවෙයි. චක්‍රවර්ති රජ

හුගේ ශක්තිය මෙන් අනිත් සියලු ධර්මයන්ගේ අධිපතිභාවය මැඩපවත්වා තමාගේ අධිපතිභාවය ම සිඩ කෙරේ යි. ලෝක යෙහි සක්විතිරජ පහල වූ කල්හි සතරමහාද්වීපයින් වාසී වූ රජ දරුවෝ ම ඒ සක්විතිරජහුගේ ආඥාවක්‍රමයට යටත් වෙති. එපරිද්දෙන් ම ඥානසම්ප්‍රයුක්තමහාකුශලචිත්තයෙහි යෙදුනා වූ ඡන්ද, චිත්ත, විරිය, වීමංස යන අධිපතිධර්මයන් සතරදෙනා අතුරෙන් වීමංසා සඞ්ඛ්‍යාත ප්‍රඥාව අධිපතිප්‍රත්‍යය වන්නේ නම් එම චිත්තයෙහි යෙදුනා වූ අවශේෂ අධිපතිධර්මයන් තුන්දෙනා ගේ අධිපතිශක්තිය මැඩ පවත්වා ප්‍රඥාවගේ අධිපතිභාවය ම සිඩ කෙරෙයි. එහෙයින් චක්‍රවර්තිරජහුගේ බලයද, අධිපති ධර්මයාගේ බලය ද, සමානය යි දතයුතු යි.

තවද ඒ ධර්මයන්ගේ අධිපතිභාවය ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඊශ්වරභාවය මෙන් නො වෙයි. ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඊශ්වරභාවය වනාහි එක ම රජෙකුගේ යටත් වැසි ඒ ඒ රාජකෘත්‍යය කරන් නාවූ අමාත්‍යයන් මෙනි. යම් කිසි ගම් මුදලියෙක් හෙම අනිත් ගම්මුදලියෙකුගේ රාජබලය මැඩ නොපවත්වා ම තමා අයත් රාජකෘත්‍යය කරන්නේ යි. එපරිද්දෙන් ම ඉන්ද්‍රිය ධර්මයෝ ද එක ම මාගීචිත්තයෙහි යෙදුනා වූ ඉන්ද්‍රියධර්මයෝ පස්දෙන අන්‍ය යන්ගේ ඉන්ද්‍රියශක්තිය මැඩ නො පවත්වා තමතමාගේ කෘත්‍යය සිඩ කෙරෙති. අධිපති ධර්මයෝ වනාහි එසේ නො වෙත්. චක්‍රවර්තිරජහුගේ බලයට සමාන වෙත්. යම් කලෙක සක්විති රජෙක් පහල වී නම් අවශේෂ වූ සියලු රජුන්ගේ අණ මැඩ පවත්වා සක්විති රජහුගේ අණසක පවත්වයි. එපරිද්දෙන් ම මෙ අධිපති ධර්මයන් එකම චිත්තයෙක්හි යෙදුනු කල්හි එක් ධර්ම යක් අධිපති ප්‍රත්‍යය වේ නම් අවශේෂ ධර්මයෝ තුන්දෙන ඒ ධර්ම යට යටත්ම ප්‍රත්‍යයොත්පන්නභාවයෙන් සිටිත්. එහෙයින් පට්ඨාන මහාප්‍රකරණයෙහි "ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානංච රූපානං අධිපතිපච්චයෙන පච්චයො" යනාදීන් සතර අධිපතිධර්මයන්ගේ ම අධිපතිභාවය වදාරණලදී. ඊට උදාහරණයක් නම්:—ත්‍රිහෙතුක මහාකුශල චිත්තයෙහි යෙදෙන් නා වූ අටතිස් චෛතසික ධර්මයන් අතුරෙන් යම් කලෙක ඡන්දය අධිපතිප්‍රත්‍යය වන්නේ නම් අවශේෂ අධිපති තුන්දෙනා හා සෙසු ධර්මයෝ ද ප්‍රත්‍යයොත්පන්න නාම වෙත්. චිත්ත, විරිය, වීමංසා තුන ද මෙසේ ම යෙදිය යුතුයි.

මේ අධිපතිධර්ම විභාගය යි.

———○———

"ආහාරය" යනු කබලීකාරාහාරය, ඵස්සාහාරය, මනොසඤ්චෙතනාහාරය, විඤ්ඤාණාහාරය, යන සතරදෙනා යි. ආහාරය යනු පවත්වන්නාය යන අර්ථ යි. කබලීකාරාහාරය තෙමේ කුමක් පවත්වන්නේ ද යත්? කරජකාය සඞ්ඛ්‍යාත වූ රූප ධර්ම සමූහ තෙම කබලීකාරාහාරය විසින් පවත්වනු ලැබෙ යි. අභ්‍යන්තරයෙහි ඇත්තා වූ ආහාරරූපය වනාහි බාහිර වූ කබලීකාරාහාරයෙන් උපස්තම්භ ලැබූ කල්හි ම අභ්‍යන්තර වූ ආහාරය පවත්වන්නේ වෙ යි. එහෙයින් මනුෂ්‍ය ලොකයෙහි උපන්නාවූ සියලු සත්ත්වයෝ තුමූ සතියක් කල් මුලුල්ලෙහි ආහාරොපච්ඡෙදය වී නම් වහා ම මියයත් දිව්‍යලොකයෙහි හෙවත් තව්තිසාභවනය චාතුම්හාරාජිකය යන ඛිඩ්ඩාපදූසික මනොපදූසික දෙවියන් ඇත්තා වූ දෙදෙව්ලොව ඛිඩ්ඩාපදූසික දෙවියන්ගේ සමෘතිවිප්‍රවාසය හෙතුකොටගෙණ ආහාරොපච්ඡෙදය වී නම් වහා ම මරණය වන්නේ යි. "ස්පර්ශාහාරය" යනු සුඛවෙදනා දුක්ඛවෙදනා උපෙක්ෂාවෙදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධවෙදනාව පවත්නා හෙයින් ඵස්සාහාරය යි කියති. "මනොසඤ්චෙතනාහාරය" යනු ලොකොත්තර කුශල් වර්ජිතවූ එකුන්තිස් කුශලාකුශලචෙතනාවෝ යි. ඒ කුශලාකුශලචෙතනාවෝ තුමූ කාමරූප අරූප සඞ්ඛ්‍යාතවූ භවත්‍රයෙහි ප්‍රතිසන්ධිය ඵලවත හෙයින් මනොසඤ්චෙතනාහාරය යි කියත්. "විඤ්ඤාණාහාරය" යනු ප්‍රතිසන්ධි විඤ්ඤාණ යයි. ඒප්‍රතිසන්ධිවිඥානය හා එක්ව යෙදුනා වූ වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර සංඛ්‍යාත වූ නාමත්‍රය හා කාය, භාව, වත්‍ථු, සංඛ්‍යාත වූ කර්මජරූපකලාපත්‍රය ද ඵලවත හෙයින් පවත්වන හෙයින්විඥානාහාරය යි කියත්. තව ද කබලීකාරාහාර සංඛ්‍යාත වූ කනබොන ආහාරපානයන්ගෙන් හටගන්නා වූ ඕජා සංඛ්‍යාතවූ ආහාරසෙනහය නොහොත් සත්සියයක් රසනහර අනුව යන්නා වූ බත්ආදී ආහාරයන්ගේ තෙලගතිය ආහාරය යි කියත්. ඒ ආහාරය වනාහි ඕජඨමකරූප සංඛ්‍යාත වූ සුද්ධට්ඨක අවිනිබ්භොගරූපය පවත්ව යි. ඒ ආහාරරූපය වනාහි ප්‍රතිසන්ධි චිත්තය හා එකක්ෂණිකව පහල වන්නා වූ කාය-භාව-වත්‍ථු සංඛ්‍යාත රූපකලාපත්‍රයෙහි අන්තර්ගත වූ ඕජාව අභ්‍යන්තර ආහාරජ රූපය උපදවන්නේ නො වේ ද යත්? ඒ එසේ මැයි. අභ්‍යන්තර වූ ඕජාවට බාහිර වූ ආහාරයෙන් ලැබෙන්නා වූ ඕජාවෙන් රැකුල් ලැබීම හෙතුකොටගෙණ ම අභ්‍යන්තර වූ ඕජාව ද ආහාරජරූපය උපදවයි. එහෙයින් මනුෂ්‍යයෙක් තෙමේ යටත් පිරිසෙයින් දවසක් පමා බාහිර වූ ආහාරය අනුභව නො කෙළේ වී නම් අභ්‍යන්තර වූ ආහාරය දුර්වලවී මෙන්

සියලු ශරීරය ම අකර්මණ්‍යභාවයට පැමිණේ යි. එහෙයින් බාහිර වූ කබලීකාරාහාරය ඕජාව අටවැනි කොට ඇත්තා වූ රූපකලාපය පවත්වන උපදවන අර්ථයෙන් ආහාරය යි කියත්.

"ඵස්සාහාරය" යනු චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා, කාය-මනෝ යන ෂට්ද්වාරයන්ට රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ ධර්ම-යන අරමුණු හමුවූ කල්හි ඒ ඒ ආලම්බනය කරා ගොස් වැද ගන්නා ආකාරයෙන් පැවතීම ඵස්සාහාරය යි. ඒ කෙසේ වැද ගන්නේ ද යත්? ඇඹුල්කන පුරුෂයෙකුගේ මුඛයදෙස බලා සිටිනා පුරුෂයාගේ මුඛයෙහි ද, කෙල ඉනීම සිද්ධ වෙයි. උස ඇති වෘක්ෂයක්හුගේ කුඩා ශාඛාවක් කරා යම් පුරුෂයෙක් නගින කල්හි ඒ නැගීම බලමින් බිම සිටිනා පුරුෂයාගේ පාදයෝ චංචල වෙත්ද, එපරිද්දෙන් චක්ෂුර්විඥානචිත්තය ද ඉතා සියුම් වශයෙන් රූපාලම්බනයෙහි වැද ගණී. මෙසේ ආලම්බණයත් කරා යාම් අයුරෙන් සුඛවේදනා දුඃඛවේදනා උපෙක්ෂාවෙදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධවේදනා ඒ ස්පර්ශය විසින් පවත්වනු ලබයි. මේ චක්ඛුසම්ඵස්සාදී ස්පර්ශයෝ සඳදන කබලීකාරාහාරය මෙන් ම සත්වයාගේ ජීවත්වීමට අසහාය වෙත්. ඊට කාරණා කවරේද යත්? යම් මනුෂ්‍යයෙක් තෙමේ චක්ෂුරාදී සදෙරින් රූපාදී සාරමුණු නො ගන්නේ වී නම් ඒ මනුෂ්‍ය තෙමේ වහා ම මියන්නේ යි. එහෙයින් ඵස්සාහාරය ද, මනුෂ්‍යයාගේ ජීවිතයට ප්‍රධාන උපකාරය වේ යි. "මනෝසඤ්චෙතනාහාරය" යනු දොළොස් අකුශල චිත්තය සම්ප්‍රයුක්ත වූ චේතනාදොළසය, අට මහාකුශලචිත්තයෙහි යෙදුනා වූ චේතනාවෝ අටදෙනය, රූපාරූපකුශලචිත්තයන් නවදෙනා හා සම්ප්‍රයුක්ත වූ චෙතනාවෝ නවදෙනද යි යන මේ එකුන්තිස් චේතනාවෝ තුමූ මනෝසඤ්චෙතනාහාරය නම් වේ. ඒ එසේමැ යි. දොළොස් අකුශලචෙතනාවෝ තුමූ සතර අපායෙහි ප්‍රතිසන්ධිවිඥානය උපදවත්. අට මහාකුශලචෙතනාවෝ තුමූ සප්තකාමභූමියෙහි ප්‍රතිසන්ධි විඥානය උපදවත්. නවමහග්ගතචෙතනාවෝ තුමූ විසි බ්‍රහ්මතලයෙහි පටිසන්ධිවිඥානය උපදවත්. මෙසේ පටිසන්ධිවිඥානය උපදවන පවත්වන අර්ථයෙන් මනෝසඤ්චෙතනාහාරය යි කියත්. "විඤ්ඤාණාහාරය" යනු කාමාවචරප්‍රතිසන්ධිවිඥාණයෝ දසදෙනාය, රූපාරූපප්‍රතිසන්ධිවිඥාණයෝ නවදෙනාය, යන මේ එකුන්විසි ප්‍රතිසන්ධිවිඥාණයෝ තුමූ එකවොකාර භවයෙහි රූපමාත්‍රයක්ද, චතුවොකාර භවයෙහි නාමමාත්‍රයක්ද, පඤ්චවොකාරභවයෙහි නාමරූප මාත්‍රයක්ද, උපදවන පවත්

වන අර්ථයෙන් විඤ්ඤාණාහාරය යි කියත්. මෙසේ සතරාකාර ආහාරය දතයුතු යි.

## ආහාර විභාගය යි.

—o—

## මිශ්‍රක සංග්‍රහය නිමි.

—o—

## (ප)

බොධිපක්ඛියසඞ්ගහෙ, බොධිපාක්ෂිකසංග්‍රහයෙහි; "එවං විභාගො මයා වුච්චතෙ" යනු පාඨශෙෂ යි. සතිපට්ඨානා, සිව්වන්හු තුමූ; කායානුපස්සනා සතිපට්ඨානං, කායානුපස්සනා සිව්වන්න; -පෙ- ධම්මානුපස්සනා සතිපට්ඨානං, ධම්මානුපස්සනා සිව්වන්ය; ඉති, මෙසේ; චත්තාරො හොන්ති, සතරදෙනෙක් වෙත්. සම්මප්පධානා, සම්‍යක්ප්‍රධානයෝ තුමූ; උප්පන්නානං, හටගත්තා වූ, පාපකානං, ලාමක වූ; අකුසලානං ධම්මානං, අකුශලධර්මයන්ගේ; පහානාය; ප්‍රහාණය පිණිස; වායාමො, උත්සාහයද;—අනුප්පන්නානං, නූපන්නා වූ;-පෙ-භීය්‍යොභාවාය, බොහෝ බැව් පිණිස; වායාමො, ව්‍යායාමයද; ඉති, මෙසේ; චත්තාරො හොන්ති, සතර දෙනෙක් වෙත්. ඉද්ධිපාදා, ඍද්ධිපාදයෝ තුමූ; ඡන්දිද්ධිපාදො, ඡන්දිද්ධිපාදය-පෙ-වීමංසිද්ධිපාදො, වීමංසිද්ධිපාදය හෙවත් ප්‍රඥාචෛතසිකයද ඉති, මෙසේ; චත්තාරො හොන්ති, සතර දෙනෙක්වෙත්. ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය ධර්මයෝ තුමූ; සද්ධින්ද්‍රියං, ශ්‍රද්ධේන්ද්‍රියය-පෙ-ඉති, මෙසේ; පඤ්ච හොන්ති, පස් දෙනෙක් වෙත්; බලානි, බලධර්මයෝ තුමූ, සද්ධාබලං, ශ්‍රද්ධාබලය,=පෙ=පඤ්ඤාබලං, ප්‍රඥාබලය; ඉති, මෙසේ; පඤ්ච හොන්ති, පස් දෙනෙක් වෙත්.=බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ගයෝ තුමූ; හෙවත් මාර්ගඥානබොධිහුගේ අඞ්ගයෝ තුමූ; සතිසම්බොජ්ඣඞ්ගො, ස්මෘති සම්බොධ්‍යඞ්ගය-පෙ-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය; ඉති, මෙසේ; සත්ත හොන්ති, සත් දෙනෙක් වෙත්. මග්ගඞ්ගානි, මාර්ගාඞ්ගයෝ තුමූ; සම්මාදිට්ඨි, සම්‍යක්දෘෂ්ටි මාර්ගාඞ්ගය;-පෙ-සම්මාසමාධි, සම්‍යක් සමාධිමාර්ගාඞ්ගය; ඉති, මෙසේ; අට්ඨ හොන්ති, අටදෙනෙක් වෙත්. පන, අර්ථාන්තරයක් කියමි:-එත්ථ, මේ බොධිපාක්ෂිකසංග්‍රහයෙහි; එකොව සම්මාසති, එකම සම්‍යක්ස්මෘතිය; චත්තාරො සතිපට්ඨානාති, සතරසිව්වන් හුය යි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ තථා, එපරිද්දෙන්; එකොව සම්මාවායාමො, එකම සම්‍යක්ව්‍යායාමය,

**චත්තාරො සම්මප්පධානානි ච**, සම්‍යක්ප්‍රධානයෝ සතරදෙනද යි; **පවුච්චන්ති**. ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ.

**එත්ථ**, ඒ බොධිපාක්ෂිකධර්මයෝ තුමූ; **සභාවතො**, තම තමාගේ ස්වභාව වශයෙන්; **ඡන්දො ච**, ඡන්දචෛතසිකයෙක් ද; **චිත්තඤ්ච**, සිත ද; **උපෙක්ඛා ච**, තත්‍රමධ්‍යස්ථතාචෛතසිකයෙක් ද; **සද්ධා ච**, ශ්‍රද්ධාවය; **පස්සද්ධි**, ප්‍රශ්‍රබ්ධිය; **පීතියො**, ප්‍රීතිය, යන චෛතසිකයෝ ද; **සම්මාදිට්ඨි ච**, ප්‍රඥාචෛතසිකයෙක් ද; **සඞ්කප්පො ච**, විතර්කචෛතසිකයෙක් ද; **වායාමො ච**, වීර්‍ය්‍ය චෛතසිකයෙක් ද; **විරතිත්තයඤ්ච**, විරතිචෛතසිකයන් තුන්දෙනාගේ සමුදායෙක් ද; **සම්මාසති ච**, සතිචෛතසිකයෙක් ද; **සම්මාසමාධි ච**, එකාග්‍රතාචෛතසිකයෙක් ද; **ඉති**, මෙසේ; **චුද්දස සභාවා**, තුදුස්දෙනෙක් වෙත්. **පභෙදෙන**, ප්‍රභෙදයෙන්; **සත්තතිංස හොන්ති**, සත්තිස්දෙනෙක් වෙත්. **ඉති**, මෙසේ; **තත්‍ර** ඒ බොධිපාක්ෂික සංග්‍රහයෙහි, **සත්තධා**, සත්පරිච්ඡෙදයකින්; **සඞ්ගහො හොති**, සංග්‍රහය වෙයි.

**සඞ්කප්ප-පස්සද්ධි ච**, විතර්ක චෛතසිකය හා ප්‍රශ්‍රබ්ධිචෛතසිකය ද; **පීතුපෙක්ඛා ච**, ප්‍රීතිචෛතසිකය හා තත්‍රමධ්‍යස්ථතා චෛතසිකයෙක් ද; **ඡන්දො ච**, ඡන්දචෛතසිකයෙක් ද; **චිත්තඤ්ච**, ලොකොත්තරචිත්තයෙක් ද; **විරතිත්තයඤ්ච**, විරතිචෛතසිකයන් තුන්දෙනාගේ සමුදායෙක් ද; **ඉති**, මෙසේ; **නව**, ධර්මයන් නවදෙනෙක් තුමූ; **එකට්ඨානා**, එකස්ථානිකධර්මයෝ නම් වෙත්. හෙවත් එකෙකි ස්ථානයක් ඇත්තා වූ ධර්මයෝ නම් වෙත්. **විරියං**, වීර්‍ය්‍යචෛතසික තෙමේ; **නවට්ඨානා**, ස්ථානනවයක් ඇත්තේ වෙයි. **සති**, ස්මෘතිචෛතසික තෙමේ; **අට්ඨට්ඨානා**, අෂ්ටස්ථානයක් ඇත්තේ වෙයි. **සමාධි**, එකාග්‍රතාචෛතසික තෙමේ; **චතුට්ඨානා**, සතරස්ථානයක් ඇත්තේ වෙයි. **පඤ්ඤා**, ප්‍රඥා තොමෝ; **පඤ්චට්ඨානා**, පඤ්චස්ථානයක් ඇත්තී වෙයි. **සද්ධා**, ශ්‍රද්ධා තොමෝ; **දුට්ඨානා**, ස්ථානද්වයක් ඇත්තී වෙයි. **ඉති**, මෙසේ; **උත්තම සත්තතිංසධම්මානං**, උතුම්වූ සත්තිස් බොධිපාක්ෂිකධර්මයන්ගේ; **පවරො**, උතුම් වූ; **එසො විභාගො**, මේ විභාගය තෙමේ; **මයා වුත්තො**, මා විසින් කියන ලදී.

**ලොකුත්තරෙ**, ලොකොත්තරචිත්තයෙහි; **සබ්බෙ**, සියලු බොධිපාක්ෂික ධර්මයෝ තුමූ; **හොන්ති**, වෙත්. **සඞ්කප්පපීතියො**, විතර්කප්‍රීතිචෛතසිකයෝ තුමූ; **වා**, සමහර ලොකොත්තර චිත්තයෙක්හි; යොවත් විකල්පයෙන්; **න හොන්ති**, නො වෙත්. **ලොකියෙපි**, ලෞකිකශොභන චිත්තයෙහි ද; **ඡබ්බිසුද්ධිපවත්තියං**, ෂට්

විශුද්ධීන්ගේ හටගැණීමක් ඇති කල්හි; යථායෝගං, සුදුසු පරිද්දෙන්; හොනති, වෙත්.

—o—

## භාවනාවී.

බොධිපාක්ෂිකසංග්‍රහයෙහි සතිපඨානය-සම්‍යක්ප්‍රධානය-ඍද්ධිපාදය—ඉන්ද්‍රිය—බලය—බොධ්‍යඞ්ගය—මාර්ගාඞ්ගය යන මොවුන්ගේ වශයෙන් සත්වැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් සතිපඨානය සතරවැදෑරුම්වේ. කුමක්හෙයින් සතරවැදෑරුම්වන්නේද යත්? අටවිසිරූපයන් අතුරෙන් එකෙකී රූපය අනිත්‍යාදී වශයෙන් නැවත නැවත දැකීම හෙවත් සිහි එලවීම කායානුපස්සනා සතිපඨාන නම් වේ. වේදනානුපස්සනා සතිපට්ඨානය යනු එකාසූවක් ලෞකිකචිත්තයෙහි යෙදුනා වූ එකාසූවක් වේදනාවන් අනිත්‍යදුඃඛඅනාත්ම වශයෙන් සිහි එලවීම වේදනානුපස්සනා සතිපඨාන නම් වේ. චිත්තානුපස්සනා සතිපඨානය යනු එකාසූවක් ලෞකික චිත්තය අනිත්‍යාදී වශයෙන් නැවත නැවත බැලීම හෙවත් සිහි එලවීම චිත්තානුපස්සනා සතිපඨාන නම් වේ. ධම්මානුපස්සනා සතිපඨානය යනු එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනා වූ එකාසූවක් ලෞකිකසංඥාවෝය-එම එකාසූවක් ලෞකිකචිත්තයෙහි යෙදුන ස්පර්ශාදී එක්පණසක් චෛතසිකයෝ ද, යන දෙපණස් ධර්මයන් අනිත්‍යාදී වශයෙන් නැවත නැවත බැලීම හෙවත් සිහි එලවීම ධම්මානුපස්සනා සතිපඨාන නම් වේ. එහෙයින් සංක්ෂෙපයෙන් සතර සතිපඨානය යනු ලොකොත්තරමාර්ග සිත්සතරය—ඵල සිත්සතරය—නිර්වාණය, යන නවලොකොත්තරධර්මයන් හැර අවශෙෂ වූ ත්‍රෛභූමික ධර්මයන් අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කොට සිහි එලවීමයි. එහෙයින් ත්‍රෛභූමිකධර්මය ආලම්බණ නම් වෙයි. සම්‍යක්චෛතසිකය ආලම්බණික නම් වෙයි. මෙසේ මේ සතර සතිපඨාන ධර්ම වැඩීම හෙතුකොටගෙණ ධ්‍රුවසංඥාවය-සුභසංඥාවය-සුඛසංඥාවය-ආත්මසංඥාවය යන සතර සංඥාවෝ මේ සතර සතිපඨාන ධර්ම හෙතුකොටගෙණ ප්‍රහීණවෙත්. එහෙයින් සංක්ෂෙපයෙන් නවලොකොත්තරධර්මය හැර අභිධර්මසප්තප්‍රකරණයෙයි වදාලාවූ සියලු ධර්ම මේ සතර සතිපඨානයෙහි ඇතුලත්වෙයි මාර්ගඵල ලබන යොගාවචරයා විසින් මේ සබ්බත්තිකවූ සතිපඨානධර්ම සත්හවුරුද්දක පටන් සතියක් දක්වා භාවනාවඩා පුරුදු කටයුතු යි.

මේ සතිපට්ඨානයෙහි සංක්ෂෙප විභාගය යි.

—o§o—

"සතර සම්‍යක් ප්‍රධානය" යනු එකම වීය්‍ය්‍යචෛතසිකය අරමුණු වශයෙන් සතරාකාරයකින් පවතී. ඒ කෙසේ පවත්නේ ද යත්? තමාගේ සතන්හි පවත්නා අකුශලධර්මයන් ප්‍රහාණය කිරීම පිණිස උත්සාහ කිරීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සන්තානයෙහි නූපන් අකුශලධර්මයන් නූපදනා පිණිස උත්සාහ කිරීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සන්තානයෙහි නූපන් කුශලධර්මයන් උපදවනු පිණිස උත්සාහ වැඩීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සතනහි උපන් කුශලධර්මයන් අභිවෘද්ධියට පමුණුවනු පිණිස උත්සාහ වැඩීම එක් සම්‍යක් ප්‍රධානයෙකි. එකම වීය්‍ය්‍යචෛතසිකය වනාහි ආලම්බණ ප්‍රභෙදයෙන් සතරාකාර වන හෙයින් සතරසම්‍යක් ප්‍රධානය යි ව්‍යවහාර කෙරෙති. මෙහි වීය්‍ය්‍යචෛතසිකයා ආලම්බණිකා නම් වෙයි උපන් අකුසල්ය-නූපන් අකුසල්ය-නූපන් කුසල් ඉපදවීමය-උපන් කුශල් වැඩිකිරීමය යන සතරාකාරධර්මයන් ඇති බැවින් ඒ ඒ ධර්මය අරමුණු කිරීම් වශයෙන් පවත්නා හෙයින් සතර සම්‍යක්ප්‍රධානයෝ ආලම්බණ නම් වෙත්. මේ විය්‍ය චෛතසිකය ලෞකික චිත්තයෙහි යෙදෙන කල්හි එකම විය්‍යචෛතසිකය යි ගිණීමට යේ. ලෝකොත්තරචිත්තයෙහි යෙදෙන කල්හිම උපන් අකුශල් නැසීමය-නූපන් අකුශල් නූපදවීමය—නූපන් කුශල් ඉපදවීමය—උපන් කුශල් දියුණු කිරීමය, යන සතරාකාර කෘත්‍යයක් කරණ හෙයින් රාජ කෘත්‍යසතරක නියුක්ත වූ එකම රාජාමාත්‍යයෙක් මෙන් සතර කෘත්‍යයක් සිද්ධ කරයි. යට කී සතිපට්ඨාන ධර්ම ද ලෞකික චිත්තයෙහි යෙදෙන කල්හි එකම සති චෛතසික යයි කියත්. ලෝකෝත්තර චිත්තයෙහි යෙදෙන කල්හි සතර කෘත්‍යයක් සිද්ධකරණ හෙයින් හෝ වත් සතර ධර්මයක් අරමුණු කරණ හෙයින් සතර සතිපට්ඨානයෝ යයි කියත්. රාජාමාත්‍ය උපමාව සතිපට්ඨානයෙහි ද යෙදේ.

## සතර සම්‍යක් ප්‍රධානය යි.

---

"සතර ඍද්ධිපාදයන්" අතුරෙන් ලෝකොත්තරචිත්තයෙහි යෙදුනාවූ ඡන්දචෛතසිකය අදහස සමෘද්ධිකරණාර්ථයෙන් ඡන්දිද්ධිපාදයයි කියති, විරියිද්ධිපාදය යනු යටකී සම්‍යක්ප්‍රධාන වීය්‍ය්‍යම අදහස සමෘද්ධිකරණ අර්ථයෙන් විරියිද්ධිපාදයයි ද කියත්. චිත්තිද්ධිපාදය යනු ලෝකොත්තර චිත්තය යි. ඒ ලෝකොත්තර චිත්තය වනාහි අදහස සමෘද්ධිකරණ අර්ථයෙන් චිත්තිද්ධිපාදයයි කියත්. විමංසිද්ධිපාදය යනු ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසික යයි. ඒ ප්‍රඥා චෛතසිකය වනාහි අදහස සමෘද්ධි

කරණ අර්ථයෙන් වීමංසිද්ධිපාද යයි කියත්. මේ සතරදෙන ලොකොත්තර චිත්තයෙහිම යෙදුන කල්හි ඍද්ධිපාදයෝ යයි කියත්.

## සතර ඍද්ධිපාදය යි.

---

"පඤ්චෙන්ද්‍රිය" යනු ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ශ්‍රද්ධා චෛතසිකය—වීර්‍ය්‍යචෛතසිකය—සතිචෛතසිකය— ඒකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ සමාධිචෛතසිකය—ප්‍රඥාචෛතසිකය, යන මේ ධර්‍මයෝ පස්දෙන ලොකොත්තර චිත්තයෙහි තම තමාගේ කෘත්‍යයෙහි ඉන්ද්‍රියභාවයෙන් හෙවත් අධිපතිභාවයෙන් පවත්නා හෙයින් ඉන්ද්‍රිය ධර්‍මයෝ යයි කියත්. ඊට උපමාවක් මෙසේයි:-සිටුපුත්‍රයන් සතරදෙනකු සමග රාජ්‍යය ආරක්ෂාකරන රජෙක් තෙම රාත්‍රි දවස්හි නගරයෙහි තොරතුරු දැනගන්නා පිණිස නගර සංචාරණයෙහි යෙදෙන්නේයි. එසේ නගර සංචාරණය කරණ සමයෙහි පළමුවන වර පළමුවන සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. ඉක්බිති ඒ ගෙට ස්වාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සිටුපුත්‍රයන් තුන්දෙන ඈතුළු මහරජහටද සුවඳ විලවුන් බත්බුලත් ආදියෙන් සංග්‍රහකරවයි. අවශෙෂ සතර දෙන තුෂ්ණිම්භූතව සිටිති. ඉක්බිති දෙවෙනි වර දෙවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. එසේ පැමිණි කල්හි ඒ ගෙට ස්වාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් බත් බුලත් ආදියෙන් සංග්‍රහකරවයි. අවශෙෂ සතරදෙන තුෂ්ණිම්භූතව සිටිති. ඉක්බිති තුන්වෙනි වර තුන්වෙනි සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙයි. එසේ පැමිණි කල්හිද ඒ ගෙට ස්වාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති එයින් නැගිට සතරවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙත්, එකල්හි පෙරමෙන්ම ඒ ගෙට ස්වාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති පස්වන වාරයෙහි සිටුපුත්‍රයන් සතරදෙන සමග රජගෙට ආ කල රජ තෙමේ සිටුපුත්‍රයන්ට වඩා සියක්ගුණයකින් අධිකවූ සත්කාර සම්මානයන් සිටුපුත්‍රයන් සතරදෙනාට කරවන්නේ වෙයි. එපරිද්දෙන්ම ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ශ්‍රද්ධා වීර්‍ය්‍ය සතිසමාධි යන චෛතසිකයෝ සතරදෙන තමතමන්ට අයත්වූ ඒ ඒ කෘත්‍යයන් මනාකොට සිද්ධකරවති. ප්‍රඥා චෛතසිකය වනාහි මහරජෙකු මෙන් සියලු කටයුතු මාර්‍ගචිත්තයෙහි මනාසේ සිද්ධකරවයි. මේ උපමාව වනාහි අර්ථශාලිනී අටුවාවේ හා පටිසම්භිදාමාර්‍ගී අටුවායෙහි ද ආයේය යි දතයුතුයි.

## පඤ්චෙන්ද්‍රිය විභාගය යි.

---

ඉන්ද්‍රියයන්ට අනතුරුව සද්ධාබල-විරියබල-සතිබල-සමාධිබල-පඤ්ඤාබල වශයෙන් ඉන්ද්‍රියයන්ට කී ධර්මයෝම බලධර්ම නම් වෙත්. ඒ බලධර්මයන්ගේ ස්වභාව නම්:-අන්‍යයන්ගේ අධිපතිභාවය නො වලක්වා පඤ්චනීවරණාදී සතුරු පාපධර්මයන්ට හිංසාකරණ අර්ථයෙන් බලධර්ම නම් වෙයි. යම් දේශසතගක් යුද්ධකරන්නාවූ භූමියෙහි බලනායකයෝ තුමූ තමතමන්ගේ අධිපතිභාවයෙහි පවත්වන යොධභටයන් මෙහෙයා සතුරුපක්ෂය විනාශ කරන්නාක් මෙන් සෝවාන් ආදී සතරමාර්ගචිත්තයෙහි යෙදුනු බලධර්මයෝ ඔවුනොවුන්ගේ බලය මැඩ නො පවත්වාම සතුරු පාපධර්මයන් නසත්. ශ්‍රද්ධා බලය වනාහි සෙසු සතර බලයන්ගේ ශක්තිය මැඩ නොපවත්වාම රාග ද්වේෂ මෝහාදී පාපධර්මයන්ට හිංසාකරයි. අවශේෂවූ සතරබල ධර්මයෝද එපරිද්දෙන් තම තමාහට සතුරුවූ පාපධර්මයන්ගේ ශක්තිය විනාශ කෙරෙත්. එක්දහස් පන්සියයක් කෙලෙසුන්ගෙන් පිරිවරණ ලද්දවූ පඤ්චනීවරණ ධර්ම නැමති සතුරන් පස්දෙනාගේ බලය මේ ලෝකොත්තර චිත්ත නැමති යුද්ධභූමියෙහි සිට ශ්‍රද්ධාදී බලනායකයෝ පස්දෙනා, ඒ පඤ්චනීවරණ ප්‍රධානවූ එක්දහස් පන්සියයක් කෙලෙස් නැමැති සතුරන් ඝාත්පසින් විනාශ කෙරෙති.

## පඤ්ච බලය යි.

---

සප්ත බොධ්‍යඞ්ගයන් අතුරෙන් "සතිසම්බොජ්ඣඞ්ගය" යනු සතිචෛතසිකයයි. "විරියසම්බොජ්ඣඞ්ගය" යනු වීර්‍ය්‍යචෛතසිකයයි. "ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය" යනු ප්‍රඥාවයි. පීතිසම්බොජ්ඣඞ්ගය" යනු ප්‍රීතිචෛතසිකයයි. "පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය" යනු චෛතසික විභාගයෙහි කියන ලද්දවූ කායපස්සද්ධි චිත්තපස්සද්ධි යන ධර්මයෝ දෙදෙන එක්ව කෙලෙසදරථය විනොදනය කරණ හෙයින් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයයි කියත්. "සමාධිසම්බොජ්ඣඞ්ගය" යනු ලෝකොත්තර චිත්තයෙහි යෙදුනාවූ එකාග්‍රතා චෛතසික යයි. "උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය" යනු තත්‍රමජ්ඣත්තතා චෛතසිකයයි. මේ ධර්මයෝ සත්දෙන කුමක් හෙයින් සම්බොධ්‍යඞ්ග නම් වෙත් ද යත්? බොධි වුච්චති මග්ගක්ඛණං යනු කී බැවින් බොධිය යනු මාර්ගඥාන යයි. ඒ බොධිසංඛ්‍යාතවූ මාර්ගඥානයාගේ අවයව වූ ධර්මයෝ සත්දෙන බොධ්‍යඞ්ග නම් වෙත්. "බොධියා බොධිස්ස වා අඞ්ගාති බොජ්ඣඞ්ගා" යි" නිර්වචන බැවින් බොධි සංඛ්‍යාතවූ මාර්ගඥානයාගේ හෝ අඞ්ගයෝ තුමූ බොධ්‍යඞ්ග නම් වෙත්.

## බොධ්‍යඞ්ග විභාගය යි.

---

"සම්මාදිට්ඨි" යනු ධර්මයන් අවිපරීතාකාරයෙන් දැකීම සිද්ධ කරණ හෙයින් මාර්ගඥානයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය සම්මාදිට්ඨි මාර්ගාඞ්ගය යි කියත්. "සම්මාසඞ්කප්පය" යනු මාර්ග චිත්තයෙහි යෙදුනාවූ විතර්කචෛතසිකය යි. ඒ විතර්කචෛතසිකය ලෝකොත්තරචිත්තයෙහි යෙදුනු කල්හි සම්මාසඞ්කප්ප මාර්ගාඞ්ගය යි කියත්. සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මාආජීව යන විරතිහු තුන්දෙන මාර්ගචිත්තයෙහි යෙදී සියලු දුශ්චරිත දුරාජීවයන්ගෙන් අනුත්පාදනිරෝධයෙන් වැලැක්ම සිද්ධ කරණ හෙයින් සම්මාවාචා මාර්ගාඞ්ගය සම්මාකම්මන්තමාර්ගාඞ්ගය, සම්මාආජීව මාර්ගාඞ්ගය යි කියත්. සම්මාවායාම-සම්මාසති-සම්මාසමාධි යන මාර්ගාඞ්ගයෝ තුන්දෙන ද ලෝකොත්තරචිත්තයෙහි යෙදුනාවූ වීර්‍යචෛතසිකය, සතිචෛතසිකය, ඒකාග්‍රතාචෛතසිකය යන මේධර්මයෝ තුන්දෙන සම්මාවායාම මාර්ගාඞ්ගය, සම්මාසති මාර්ගාඞ්ගය, සම්මාසමාධි මාර්ගාඞ්ගය යි කියත්. මේ ධර්මයෝ අටදෙන කුමක් හෙයින් මාර්ගාඞ්ග නම් වෙත් ද යත්? මහත්වූ දුවදඬුඅටක් එක් කොට බැඳ ගන්නා ලද පහුර සාගරයෙන් එතර වීමට උපකාර වන්නාක් මෙන් මේ මාර්ගාඞ්ගයෝ අටදෙන සංසාරසාගරයෙන් එතර වීමට කාරණා වන හෙයින් නිර්වාණ මාර්ගයෙහි අඞ්ගයෝ ය, කාරණයෝ ය, යන අර්ථයෙන් මාර්ගාඞ්ගයෝ ය යි කියත්.

මේ සත්තිස් බෝධිපාක්ෂිකධර්මයෝ වනාහි ඒකාන්තයෙන් ලෝකොත්තර චිත්තයෙහි ම ලැබෙත්. එවිත් වෙන් වශයෙන් සත්තිසක් වන්නාහු නමුදු අගෘහීතග්‍රහණන්‍යාය වශයෙන් නොයෙක් ප්‍රභෙද වන්නා වූ ධර්මයෝ එකඑකකින් සංග්‍රහ කොට ගත්කල්හි තුදුස් ධර්මකෙනෙක් ද වෙනස් වෙනස් ජාති වශයෙන් ජාති සතෙක් ද වෙත්. ඒ කවර ජාති සතෙක්ද යත්? සතිපට්ඨාන, සම්‍යක්ප්‍රධාන, ඍද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මාර්ගාඞ්ග යන මොවුන්ගේ වශයෙන් ජාති සතෙක් වෙත්.

ඒ ඒ ධර්මයන් කෙරෙහි සම්මාසඞ්කප්පය, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය, ඡන්දිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, සම්මාවාචාවිරතිය, සම්මාකම්මන්තවිරතිය, සම්මාආජීවවිරතිය, යන මේධර්මයෝ නවදෙන ඒකකාර්‍ය්‍යය හා ඒකස්ථානික ධර්මයෝ නම් වෙත්. වීර්‍යචෛතසිකය සතර සම්‍යක්ප්‍රධාන වශයෙන් සතර කෘත්‍යයක් හා විරියිද්ධිපාදය, විරියින්ද්‍රිය, විරියබලය. විරියසම්බොජ්ඣඞ්ග, සම්මාවායාම මාර්ගාඞ්ග යන කෘත්‍යනවයක්සිද්ධ කරණහෙයින් නවකෘත්‍ය-නවස්ථානිකධර්ම

යක් නම් වෙසි. ස්මෘතිචෛතසික තෙමේ සතර සතිපට්ඨානය, සතින්ද්‍රිය, සතිබලය, සතිසම්බොජ්ඣඞ්ගය, සම්මාසති මාර්ගාඞ්ගය, යන අටතැනෙක්හි වන හෙයින් අෂ්ටසථානික-අෂ්ටකෘත්‍යයක් ඇති ධර්ම නම් වෙයි. ඒකාග්‍රතා චෛතසික තෙමේ සමාධින්ද්‍රිය, සමාධිබලය, සමාධිසම්බොජ්ඣඞ්ගය, සම්මාසමාධි මාර්ගාඞ්ගය, යන සතරතැනෙක්හි පවත්නා හෙයින් චතුසථානික-චතුෂ්කෘත්‍ය ඇති ධර්ම නම් වේ යි, ප්‍රඥාචෛතසික තෙමේ වීමංසිද්ධිපාදය, ප්‍රඥාබලය, ප්‍රඥෙන්ද්‍රියය, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය, සම්මාදිට්ඨි මාර්ගාඞ්ගය යන පස් තැනක පවත්නා හෙයින් පඤ්චසථානික-පඤ්චකෘත්‍ය ඇති ධර්ම නම් වේ යි. ශ්‍රද්ධාචෛතසිකය තෙමේ සද්ධින්ද්‍රිය සද්ධාබලය, යන දෙතැනෙක්හි පවත්නා හෙයින් ද්විසථානික-ද්විකෘත්‍ය ඇති ධර්ම නම් වෙසි.

ඒකසථානිකධර්මයන් නවදෙනාගේ කෘත්‍ය නවය ද, නව සථානිකධර්මයාගේ නවකෘත්‍යය ද, අෂ්ටසථානික ධර්මයාගේ කෘත්‍ය අට ද පඤ්චසථානිකධර්මයාගේ කෘත්‍ය පස ද, චතුසථානිකධර්මයාගේ කෘත්‍ය සතර ද, ද්විසථානිකධර්මයාගේ කෘත්‍යවය ද, යන මෙතෙක් ධර්මයන් පිඬු කළ කල්හි සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ ය යි කියත්.

ඒ සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ තුමූ ඒකාන්තයෙන් ලොකොත්තරචිත්තයෙහි ලැබෙත්. ඒකෙසේ ලැබෙත් ද යත්? ශුෂ්කවිදර්ශක ආර්යයන් වහන්සේට හා ප්‍රථමධ්‍යානය පාදකාදි වශයෙන් විදර්ශනා වඩා මාර්ගඵල ලබන්නා වූ සම්ප්‍රයුක්ත ආර්යයා හට ද සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ ම අනූනාධිකව ලැබෙත්. එතකුදුවුවත් ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන යන අවිතර්කධ්‍යානයන් පාදකාදී වශයෙන් භාවනා වඩා මාර්ගඵල ලබන්නා වූ ආර්යයාහට සම්මාසඞ්කප්ප මාර්ගාඞ්ග විරහිත වූ බොධිපාක්ෂික ධර්ම සතිස්දෙනෙක් ම ලැබෙත්. එපරිද්දෙන් ම නිස්ප්‍රීතික වූ රූපාවචරපඤ්චමධ්‍යානය හෝ අරූපධ්‍යාන සතරින් මූල අරූපධ්‍යානත්‍රය හෝ විදර්ශනා වඩා මාර්ගඵල ලබන්නා වූ ආර්යයන්ට සම්මාසඞ්කප්ප ප්‍රීතිසම්බොජ්ඣඞ්ග සංඛ්‍යාත වූ බොධිපාක්ෂිකධර්ම දෙකින් විරහිතවූ පන්තිස් ධර්මකෙනෙක්ම ලැබෙත්.

මේ සත්තිස් බොධිපාක්ෂිකධර්මයන් අතුරෙන් සතිපට්ඨානාදි වූ නම් කිසි ධර්මයක් සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි සඞ්ඛ්‍යාත වූ ලෞකික ෂඩ්විශුද්ධීන් පුරුදු කරන්නා වූ

යොගාවචරයාහට ඒ ෂට්විශුද්ධි වශයෙන් උපදනා කාමාවචර කුශලචිත්තයෙහි එක එකක් ම ලැබිය හැක්කේ යි. එහෙයින්:—

"සබ්බ ලොකුත්තරෙ හොන්ති නවාසඞ්කප්පපීතියො
ලොකියෙපි යථායොගං ඡබ්බිසුද්ධිප්පවත්තියං"

යනු අටුවාචාරීන් විසින් කියන ලදී.

## සත්තිස් බොධිපාක්ෂික ධර්ම විභාගය යි.

— —∘— —

(ප)

සබ්බසඞ්ගහෙ, සර්වසංග්‍රහයෙහි; එවං විභාගො මයා වුච්චතෙ, යනු අධ්‍යාහාර යි. ඛන්ධා, ස්කන්ධයෝ තුමූ; රූපක්ඛන්ධො, රූපස්කන්ධය; වෙදනාක්ඛන්ධො, වෙදනාස්කන්ධය; සඤ්ඤාක්ඛන්ධො, සංඥාස්කන්ධය; සංඛාරක්ඛන්ධො, සංස්කාරස්කන්ධය; විඤ්ඤාණක්ඛන්ධො, විඥානස්කන්ධය: ඉති, මෙසේ; පඤ්ච හොන්ති, ස්කන්ධයෝ පස්දෙනෙක් වෙත්. උපාදානක්ඛන්ධා, කාමූපාදානාදී සතර උපාදානයන්ට අරමුණු වූ ස්කන්ධයෝ තුමූ; රූපූපාදානක්ඛන්ධො, රූපූපාදානස්කන්ධය ද; වෙදනූපාදානක්ඛන්ධො, වෙදනූපාදානස්කන්ධය ද; සඤ්ඤූපාදානක්ඛන්ධො, සංඥූපාදානස්කන්ධය ද; සංඛාරූපාදානක්ඛන්ධො, සංස්කාරූපාදානස්කන්ධය ද; විඤ්ඤාණූපාදානක්ඛන්ධො, විඥානූපාදානස්කන්ධය ද; ඉති, මෙසේ, පඤ්ච හොන්ති උපාදානස්කන්ධයෝ පස්දෙනෙක් වෙත්. ආයතනානි, ආයතනයෝ තුමූ; චක්ඛායතනං, චක්ඛායතනය ද;-පෙ-ධම්මායතනං, ධර්මායතනය ද, ඉති, මෙසේ; ද්වාදස හොන්ති, දොළොස්දෙනෙක් වෙත්. ධාතුයො, ධාතූහු තුමූ; චක්ඛුධාතු; චක්ෂුඃප්‍රසාද සංඛ්‍යාත වූ ධාතුව ද; සොතධාතු, ශ්‍රොත්‍රප්‍රසාද සංඛ්‍යාත වූ ධාතුව ද; ඝාණධාතු, ඝ්‍රාණප්‍රසාද සංඛ්‍යාත වූ ධාතුව ද; ජිව්හාධාතු, ජිහ්වාප්‍රසාද සංඛ්‍යාත වූ ධාතුව ද; කායධාතු, කායප්‍රසාද සංඛ්‍යාත වූ ධාතුව ද; රූපධාතු, වර්ණායතන සංඛ්‍යාත වූ රූපධාතුව ද; සද්දධාතු, ශබ්දධාතුව ද; ගන්ධධාතු, ගන්ධාලම්බන සංඛ්‍යාත වූ ගන්ධධාතුව ද; රසධාතු රසාලම්බන සංඛ්‍යාත වූ රසධාතුව ද; ඵොට්ඨබ්බධාතු, ආපොධාතුවර්ජිත භූතත්‍රය සංඛ්‍යාත වූ ස්පර්ශධාතුව ද; චක්ඛුවිඤ්ඤාණධාතු, කුශලාකුශලවිපාක සංඛ්‍යාත චක්ෂුර්විඥානධාතුව ද; සොතවිඤ්ඤාණධාතු, එසේ ම ශ්‍රොත්‍රවිඥානයුගල සංඛ්‍යාත වූ ශ්‍රොත්‍රවිඥානධාතුව ද; ඝාණවිඤ්ඤාණධාතු, එසේම ඝ්‍රාණවිඥානධාතුවය සංඛ්‍යාත වූ ඝ්‍රාණවිඥානධාතුව ද; ජිව්හාවිඤ්ඤාණධාතු, එසේ ම ජිව්හාවිඤ්ඤාණයුගලය ද; කායවිඤ්ඤා

ණධාතු, එසේම කායවිඥානධාතු යුගලය ද; මනොධාතු, පඤ්චද්වාරාවර්ජනය, සම්ප්‍රත්‍යෙෂණයුගලය, යන මනොධාතුව ද; ධම්මධාතු, ධර්මධාතුව ද; මනොවිඤ්ඤාණධාතු, ඒ තෙළෙස් චිත්තයන් හැර අවශෙෂ සියලු චිත්ත සංඛ්‍යාත වූ මනොවිඥානධාතුව ද; ඉති, මෙසේ; අට්ඨාරස හොන්ති, ක්‍රමයෙන් අටළොස්දෙනෙක් වෙත්. අරියසච්චානි, ආර්‍ය්‍යසත්‍යයෝ තුමූ; දුක්ඛං අරියසච්චං, දුක් සංඛ්‍යාත වූ ආර්‍ය්‍යසත්‍යය ද; දුක්ඛසමුදයං, දුඃඛයාගේ ඉපදීමට හෙතු වූ; අරියසච්චං, ආර්‍ය්‍යසත්‍යය ද; දුක්ඛනිරොධං, දුඃඛයාගේ වැළැකීමට කාරණ වූ; අරියසච්චං, ආර්‍ය්‍යසත්‍යය ද, දුක්ඛනිරොධගාමිනීපටිපදා, දුඃඛයාගේ වැළැකීමෙන් ලැබියයුතු වූ නිර්වාණයට පැමිණීමට හෙතු වූ ප්‍රතිපදා සංඛ්‍යාත වූ; අරිය සච්චං, ආර්‍ය්‍යසත්‍යය ද; ඉති, මෙසේ; චත්තාරි හොන්ති, සතර දෙනෙක් වෙත්. පන, විශෙෂාර්ථයක් කියම්:—එත්ථ, මේ සර්ව සංග්‍රහයෙහි; චෙතසික-සුඛුමරූප-නිබ්බානවසෙන, දෙපනස් චෛතසිකය, සූක්ෂමරූපසොළසය, නිර්වාණය යන මොවුන්ගේ වශයෙන්; එකූනසත්තතිධම්මා, එකුන්සැත්තෑවක් ධර්මයෝ තුමූ; ධම්මායතන-ධම්මධාතු ඉතිච, ධර්මායතනයයි ද-ධර්මධාතුයයි ද; සඞ්ඛං ගච්ඡන්ති, ගණනට නොහොත් ධර්මායතන-ධර්මධාතු සංඛ්‍යාත ව්‍යවහාරයට යෙත්. මනායතනං එව, මනායතනයම; සත්තවිඤ්ඤාණධාතුවසෙන, සප්තවිඥානධාතූන්ගේ වශයෙන්; භිජ්ජති, ප්‍රභෙද වේ.

රූපඤ්ච, අටවිසිරූපය ද; වෙදනා ච, වෙදනාචෛතසිකය ද; සඤ්ඤා ච, සංඥාචෛතසිකය ද; සෙසචෙතසිකා ච, වෙදනාසංඥාවන්ගෙන් අවශිෂ්ට වූ සම්පනස් චෛතසිකයෝ ද; තථා, එපරිද්දෙන; විඤ්ඤාණං ච, එකුන්අනූවක් චිත්තය ද; ඉති; මෙසේ, එතෙ පඤ්ච, මේ ධර්මයෝ පස්දෙන; පඤ්චක්ඛන්ධාති, පඤ්ච ස්කන්ධයෝ ය යි; භාසිතා, තථාගත වරයන් විසින් වදාරණ ලද්දාහු ය.

තථා, එපරිද්දෙන්; තෙභූමකා, කාමරූපාරූප සංඛ්‍යාත භූමිත්‍රයෙහි හටගත්තා වූ; එතෙ පඤ්ච, මේ ධර්මයෝ පස්දෙන; පඤ්චුපාදානක්ඛන්ධාති, පඤ්චඋපාදානස්කන්ධයෝ ය යි; මතා, දත්තාලද්දාහුය; නිබ්බානං, නිර්වාණධාතු තෙමේ; භෙදාභාවතො, රූපාදීන් මෙන් ප්‍රත්‍යුත්පන්න-අතීත-අනාගත-අධ්‍යාත්ම-බාහිර-දූර-සන්තික-හීන-ප්‍රණීත--සුඛුම--ඔළාරික-සංඛ්‍යාත වූ--එකොළොස් ප්‍රභෙදයෙන් වෙනස් නො වන හෙයින; ඛන්ධසඞ්ගහනිස්සටං, ස්කන්ධ සංඛ්‍යාත වූ ගණනින් නිර්ගත කරණ ලද්දේ යි-හෙවත් පඤ්චස්කන්ධයෙන් වෙන්ව පවත්නේ යි.

ආයතනානි, ආයතනයෝ තුමූ; ද්වාරාලම්බණභෙදෙන, සද්වාරය-සාරම්මණය යන ප්‍රභේදයෙන්; (ද්වාදස භවන්ති) දොළොස් දෙනෙක් වෙත්. ධාතුයො ච, ධාතූහු තුමූ ද; ද්වාරාලම්බණතදුප්පන්නපරියායෙන, සද්වාරය-සාරම්මණය-ඒ ද්වාරාලම්බණයන් නිසා හටගන්නා වූ විඥානය යන මොවුන්ගේ ක්‍රමයෙන්; (අට්ඨාරස භවන්ති) අටළොස් දෙනෙක් වෙත්.

තෙභූමකං, භූමිත්‍රයෙහි හටගන්නා වූ; වට්ටං, කම්මවට්ට- විපාකවට්ට-කෙලෙස්වට්ට සංඛ්‍යාත වූ වෘතධර්ම තෙමේ; දුක්ඛං, දුඃඛසත්‍ය නම් වේ. තණ්හා, ලෝභචෛතසික තෙමේ; සමුදයො භවෙ, සමුදය නම් වේ. නිබ්බානං, අසංඛතධාතු තෙමේ; නිරොධො නාම භවෙ, නිරොධසත්‍ය නම් වේ. ලොකුත්තරෙ, ලොකොත්තරයෙහි වූ; (මග්ගා, මාර්ගාඞ්ගයන් අටදෙන;) මග්ගාමතො, මාර්ග සත්‍යය යි දන්නා ලදී. "මග්ගො ලොකුත්තරෙ මතො" යන්නෙහි-ලොකුත්තරො මග්ගො මතො, යනුවෙන් මධ්‍යපදලොපය යි දතයුතු යි.

මග්ගයුත්තා ච, මාර්ගාඞ්ගයන් අටදෙන හැර තත්සම්ප්‍රයුක්තවූ මාර්ගචිත්තොත්පාදයෝ ද; ඵලා චෙව, ඵලචිත්තයෙහි යෙදුනා වූ ඒ මාර්ගාඞ්ගය නුත් සමග ඵලචිත්තොත්පාදයෝ ද; චතුසච්චවිනිස්සටා, චතුස්සත්‍යයෙන් නිර්ගත වූවාහු ය; හෙවත් චතුස්සත්‍යයෙහි ඇතුලත් නොවූවාහු ය; ඉති, මෙසේ; පඤ්චප්පභෙදෙන, පඤ්චප්‍රභෙදයකින්; සබ්බසඞ්ගහො, සර්වසංග්‍රහය; පවුත්තො, ප්‍රභෙද වශයෙන් කියන ලදී.

අභිධම්මත්ථසඞ්ගහෙ, අභිධර්මාර්ථසංග්‍රහ නම් ප්‍රකරණයෙහි; සමුච්චයසඞ්ගහවිභාගො නාම, සමුච්චයසංග්‍රහවිභාග නම් වූ; සත්තමො පරිච්ඡෙදො, සත්වන පිරිසිඳීම; ඉති, මෙසේ සමාප්ත වූයේ යි.

---

## (භා)

සර්වසංග්‍රහයෙහි ඛන්ධ, ධාතු, ආයතන, සත්‍ය, යන සතරු කාරයකින් සර්වඥයන් වහන්සේ විසින් සතර පරමාර්ථය කුමක් පිණිස සතරුකාරයකින් බෙදා වදාළේ ද යත්? යම්කිසි වෘක්ෂාදියක් රොපණය කිරීම පිණිස වෘදුකාරණ ලද්දා වූ පසින් යුක්ත වූ ආලවාලය සතරක් කරන්නාක් මෙන් විදර්ශනාප්‍රඥා සඞ්ඛ්‍යාත වූ වෘක්ෂය රොපණය කරණු පිණිස ඛන්ධආලවාලභූමිය, ආයතන ආලවාලභූමිය, ධාතුආලවාලභූමිය, සත්‍යආලවාලභූමිය යි මෙසේ

ආලවාලය සතරක් නියම කර වදාරණ ලද්දේ යි. මහාකාරුණිකා වූ සර්වඥයන් වහන්සේ වනාහි ලෝකවාසී සත්ත්වයන්ගේ සුඛාවතරණය පිණිස එක ම ආලවාලය භූමියක් නොවදාරා කුමක් හෙයින් සතරක් ම වදාළේ ද යත්? ලෝකයෙහි වනාහි දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යාදි සියලු සත්ත්වයෝ ත්‍රිවිධාකාර වෙත්. ඒ කවර ත්‍රිවිධාකාරයෙක් ද යත්? නාමසම්මූළ්හය, රූපසම්මූළ්හය, නාමරූපසම්මූළ්හය යි. කියා හෝ සංක්ෂෙපරුචික මධ්‍යමරුචික විස්තාරරුචික වශයෙන් හෝ ත්‍රිවිධාකාර වෙත්. නාමසම්මූළ්හය යනු ප්‍රකෘතියෙන් නාමයෙහි මුළා වූ සත්ත්වයෝ යි. ඛන්ධදේශනාව වනාහි රූපය එකකින් හා නාමය සතරකින් ද බෙදා වදාළ හෙයින් නාමසම්මූළ්හ සත්ත්වයන්ට ස්කන්ධ සංඛ්‍යාත වූ ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා සංඛ්‍යාත වෘක්ෂය රෝපණය කිරීමෙන් නො බෝ කලකින්ම සතරමග-සතරඵල-නිර්වාණ සංඛ්‍යාත අමාඵලයන් ලැබිය හැකි බැවින් නාමසම්මූළ්හ සත්ත්වයන් කෙරෙහි මහාකරුණායෙන් යෙදී ඛන්ධදේශනාව කෙළේය යි දතයුතු යි. රූපසම්මූළ්හ සත්ත්වයන් කෙරෙහි මහාකරුණාව උපදවා ආයතනදේශනාව කෙළේයි. ආයතනදේශනාවෙහි වනාහි රූපය අර්ධෛකාදශප්‍රකාරයකින් හා නාමය එකාර්ධයකින් හෙවත් එක්හමාරකින් බෙදා වදාළ හෙයින් රූපයෙහි මුළා වූ සත්ත්වයන් සඳහා ආයතනදේශනාව කෙළේ යි. ආයතනදේශනාවෙහි වනාහි අර්ධෛකාදශයකින් හෙවත් අර්ධයක් අධික කොට ඇති දශයකින් රූපය හා අර්ධයක් අධික කොට ඇති එකකින් නාමය ද බෙදා වදාළේ යි. ඒ කෙසේ යත්? ධර්මායතනයෙහි දෙපණස් චෛතසිකය, සූක්ෂ්මරූපසොළසය, නිර්වාණය, යන මෙතෙක් ධර්මයන් සංගෘහිත බැවින් සූක්ෂ්මරූපසොළසය යි කියන ලද්දාවූ අර්ධය රූපයෙහි ඇතුලත් වන බැවින් අර්ධක් සහිත වූ දසයකින් රූපය බෙදා වදාළේ යි. ඒ ධර්මායතනයෙහි ම දෙපණස් චෛතසිකය, නිර්වාණය, යන නාමාර්ධය මනායතනය හා සමග ගත් කල්හි අර්ධක් සහිත වූ එකකින් නාමය බෙදා වදාළේ යි.

මෙසේ රූපසම්මූළ්හ සත්ත්වයන් කෙරෙහි මහාකරුණායෙන් යෙදී ආයතනදේශනාව කළ හෙයින් ආයතන සංඛ්‍යාත වූ ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා නැමති වෘක්ෂය රෝපණය කළාවූ යෝගාවචරයන්ට නො බෝ කලකින් ම නවලෝකෝත්තරධර්ම නැමති අමාඵලය ලැබිය හැක්කේ යි. නාම-රූප සංඛ්‍යාත උභයසම්මූළ්හ සත්ත්වයන් කෙරෙහි උපන්නා වූ මහාකරුණාසමාපත්තිය හේතුකොටගෙණ ධාතුදේශනාව වදාළේ යි. ධාතුදෙශනාවෙහි වනාහි රූපය එකොළොසකින් හා නාමය සත

කින් ද බෙදූ වදාළ හෙයින් හෙවත් එකූන් අනූවක් චිත්තය
චක්ඛුවිඤ්ඤාණධාතු, සෝතවිඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු,
ජිව්හාවිඤ්ඤාණධාතු, කායවිඤ්ඤාණධාතු, මනෝධාතු, මනො
විඤ්ඤාණධාතු, යන සත්තවිඤ්ඤාණධාතුවකින් හා ධම්මධාතුවෙහි
අඩියකින් ද, නාමය හා අවශෙෂ අෂ්ඨකාදශයකින් ද, රූපය
බෙදූ වදාළ හෙයින් උභයසම්මූළ්හ සත්ත්වයන්ට අෂ්ටාරසධාතු
නැමති ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා නැමති වෘක්ෂය රෝපණය
කිරීමෙන් නො බෝ කලකින් ම නවලොව්තුරු දහම් ඵලලැබිය
හැක්කේය. එසේ ම සංක්‍ෂෙපරුචිකයන් සඳහා ඛන්ධදෙශනාව ද
මධ්‍යමරුචිකයන් සඳහා ආයතනදෙශනාව ද, විස්තාරරුචික
යන් සඳහා ධාතුදෙශනාව ද, මෙසේ විනෙයජනයන්ගේ අද
හස් පරිද්දෙන් හා දෙශනාවිලාශ සංඛ්‍යාත වූ බුද්ධවචනය සැර
සීම පිණිස මෙසේ මේ ත්‍රිවිධාකාරදෙශනාව වදාළේ යි.

අවසානයෙහි සත්‍යදෙශනාව වනාහි ඛන්ධභූමියෙහි හෝ
ආයතන භූමියෙහි හෝ ධාතුභූමියෙහි හෝ විදර්ශනාප්‍රඥාව මුහු
කුරුවන්නා වූ යොගාවචරයාහට ඒ විදර්ශනාභාවනාව මස්තක
ප්‍රාප්තවූ කල්හි ත්‍රෛභූමකවර්තිවූ සියලු වෘත්ත දුඃඛය දුක්වශයෙන්
දැන ගණිමින්, සමුදයසත්‍ය සංඛ්‍යාත වූ තෘෂ්ණාව ප්‍රහාණයකර
මින්, නිරොධසත්‍ය සංඛ්‍යාත වූ නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කරමින්,
මාර්ගසත්‍ය සංඛ්‍යාත වූ ආර්‍ය්‍යඅෂ්ටාංගිකමාර්ගය වඩමින් අභිමතාර්ථ
සිද්ධිය සම්පාදනය කරන්නේය යි කියාද; මින් මත්තෙහි කටයුතු
කෘත්‍යයක් නැතැ යි කියා ද අවබොධ කරන්නේ යි.

මේ අර්ථය වනාහී ප්‍රදීපන්‍යායෙන් අවබොධ කටයුතු යි.
යම්සේ තෙල් පහනක් දැල් වූ කල්හි අන්ධකාර නැසීම ය, ආ
ලොකය පැතිර වීම ය, තෙල් ක්‍ෂය වීම ය, පහන්වැටිය දැවීම ය යි
යන මේ සතර කෘත්‍යය එකක්‍ෂණයෙහි සිද්ධ කරන්නාක් මෙන්
මාර්ගඥාන නැමති පහන දැල්වූ කල්හි දුක හාත්පසින් දැනීම ය,
ලොභය නැසීම ය, නිර්වාණධර්මය ප්‍රත්‍යක්‍ෂයෙන් දැකීම ය, මාර්ග
සත්‍යය වැඩීම ය, යන මේ සතර කෘත්‍යය එකක්‍ෂණයෙහි සිද්ධ
කරන්නේ යි. මේ සතර මාර්ගයෙහි ම සතර සතර කෘත්‍යය සිද්ධ
කිරීම සමාන වන්නේ නමුදු සෝවාන් මාර්ගක්‍ෂණය, ශකෘදාගාමි
මාර්ගක්‍ෂණය, අනාගාමි මාර්ගක්‍ෂණය යන ත්‍රිවිධමාර්ගක්‍ෂණය අන්ධ
කාරරාත්‍රියෙක්හි විජ්ජුලතාක්‍ෂණයකට බඳු උපමා ඇතිවේ. යම්සේ
විදුලිය ගසන්නා වූ ක්‍ෂණයෙහි සියලු ද්‍රව්‍යවස්තුපදාර්ථයන් දක්
නාක්මෙන් ම සෝවාන්-ශකෘදාගාමි-අනාගාමි යන ත්‍රිවිධමාර්ගක්‍ෂ
ණයෙහි චතුස්සත්‍ය ධර්මයන්ගේ කෘත්‍යය සිද්ධකොට නැවත විදුලිය
ක්‍ෂයවූකල්හි අන්ධකාරයෙන් වැසීයන්නාක් මෙන් නැවතත් චතු

සත්‍යයන්ගේ මුවහවීම සිඬ වෙයි. අර්හත්මාර්ගක්ෂණයෙහි වන්නාවූ චතුස්සත්‍යාවබෝධය සූර්යයා උදා වූ කල්හි ඝනාන්ධගත වත්තාක් සියලු පදාර්ථයන් දක්නාක් මෙන් ම ඒ මහරහතුන් වහන්සේට ඒ චතුස්සත්‍යය පිරිනිවන් පෑම දක්වා මුවහ නො වී පවත්නේය. එහෙයින් ම සූත්‍රාන්තමාතෘකාවෙහි:-"විජ්ජූපමා ධම්මා" යන පදයෙන් සෝවාන්-සකෘදාගාමි-අනාගාමි යන මාර්ගචිත්තක්ෂණයෝ තුන්දෙන ද, "වජිරූපමා ධම්මා" යන පදයෙන් අර්හත්මාර්ගචිත්තක්ෂණය ද ලැබෙන්නේය යි දතයුතු යි.

පළමුවන විදර්ශනාභූමිය ස්කන්ධභූමිය යි. ඒ ස්කන්ධභූමියෙහි පඤ්චස්කන්ධය, පඤ්චුපාදානස්කන්ධය යි කුමක් හෙයින් දෙයාකාරයක් කොට වදාළේද යත්? "ඛන්ධසංග්‍රහය" යනු වට්ට-විවට්ටය යන උභයපක්ෂයෙහි සියලු ධර්මයන් ම සාමාන්‍යයෙන් සංග්‍රහ කොට පඤ්චස්කන්ධය යි කියා ද, තෘෂ්ණාවට ගොචර වූ ඒ පඤ්චස්කන්ධය හෙවත් කාමලෝක-රූපලෝක-අරූපලෝක යන භවත්‍රයෙහි ඇතුළත් වූ ධර්මසමූහය උපාදානස්කන්ධය යි කියා ද ව්‍යවහාර කරෙත්. "උපාදානක්ඛන්ධය" යනු ලඟට ඇද ගන්නා ලද ස්කන්ධය යන අර්ථ යි. කුමකින් ලඟට ඇද ගන්නේ ද යත්? තෘෂ්ණා නැමති රැහැණින් බැඳ ඇද ගන්නේ ය යි දතයුතු යි. ඔවුන් අතුරෙන් රූපස්කන්ධය යනු භූතරූප සතර ය, උපාදාය රූප සූවිස්ස ය, යන අටවිසිරූපය යි. ඒ අටවිසිරූපයට කුමක් හෙයින් රූපස්කන්ධය යි ව්‍යවහාර කරන්නේ ද යත්? මෙහි "ඛන්ධ" ශබ්දය මහාසාගරයට උදකස්කන්ධය යි ව්‍යවහාර කරන්නාක් මෙන් රූපයන්ගේ රාශියට රූපස්කන්ධය යි කියත්. මේ ව්‍යාමප්‍රමාණ වූ ශරීරයෙහි එතෙක් මහත් වූ රූපස්කන්ධයක් කොයින් ලැබේ දැ යි නො සිතිය යුතු යි.

මේ සත්ත්වයා වනාහි අසවල් බුදුන්ගේ කාලයෙහි අසවල් රජුගේ කාලයෙහි පළමුවෙන් හටගත්තේයයි නියමයෙක් නැත්තේය. එහෙයින්:—**අනමතග්ගොයං භික්ඛවෙ! සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති**" යනු වදාළේ යි. "**අනමතග්ගය**" යනු "න මතඅග්ගය" යනාර්ථ යි. හෙවත් අගක් නො දතහැක්කේ ය යනාර්ථ යි. නොපැණෙන පූර්වාපරකොටිය ඇති එක ම සත්ත්වයෙකුගේ එක ම කල්පයක් තුළ මනුෂ්‍යතිරශ්චීනාදිආත්මභාවයන්හි එක ම සත්ත්වයෙකුව අසිනි වූ ඇටරාශිය ගොඩක් කලේ වී නම් වෙපුල්ලපර්වතයට වඩා උස්වූ ඇටගොඩක් වියයුත්තේය. එහෙයින් එක ම සත්ත්වයෙකුගේ අනාදිමත් සංසාරයෙහි හටගත්තා වූ රූපසමූහය එක් තැනෙක්හි රැස්කෙළේ නම් සතර මහාසාගරයෙහි ජලයට අධික වෙ යි. එහෙයින් රූප

ස්කන්ධය යන නාමය අතීතානාගත ප්‍රත්‍යුත්පන්නවූ සියලු රූප යන්ම එක්කොටගෙණ රූපස්කන්ධය යි කියති. වේදනාස්කන්ධයද එක එක චිත්තයෙක්හි එක එක වේදනාවක්ම ලැබෙන්නේ නමුදු එක් ජීවිතයක් තුල ලැබෙන්නාවූ වේදනාවන්ට උපමා කළ හැකි ධර්මයක් නැත්තේයි. එහෙයින් අතීතානාගත වර්තමාන කාලත්‍රයෙහිම හටගත් වේදනාවන් නුවණින් එක්කොට ගෙණ වේදනාස්කන්ධය යි කියත්. සංඥාස්කන්ධයද එසේමැයි. "සංස්කාරස්කන්ධය" යනු චේතනා ප්‍රධානවූ සම්පණස් ධර්ම කෙනෙකි. ඒ ධර්මයෝද එක එකක් පාසා එක් ජීවිතයක්තුළ හටගන්නාවූ ධර්මයන්ගේ සංඛ්‍යාව ගණන් ශාස්ත්‍රයකින් නොදත හැක්කේය. අතීත අනාගත වර්තමානවූ ඒ සියලුම සංස්කාරයන් නුවණින් එක් කොටගෙණ සංස්කාරස්කන්ධයයි කියත්. "විඥාණස්කන්ධය" යනු එකුන් අනූවක් විඥාණයෝ යි. එක් සත්වයෙක් හට එක් භවයෙක්හි හටගන්නාවූ විඥානයන්ටද උපමා කළ හැකි සංඛ්‍යාවක් නැති හෙයින් ඒ සියල්ල එක්කොට ගෙණ විඥානස්කන්ධයයි කියත්.

"පංචුපාදානස්කන්ධය" යනු සතිපට්ඨාන සූත්‍රයෙහි වදාළාවූ විදර්ශනා කරන යෝගාවචරයන් විසින් අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කළ යුතුවූ ත්‍රෛභූමික ධර්මසමූහයයි. ඒ පංචුපාදානස්කන්ධයෙහි හා සාමාන්‍ය පඤ්චස්කන්ධයෙහිද ඇති විශේෂය නම්:— එකුන් අනූවක් වේදනාවෝ වේදනාස්කන්ධයයි කියාද, එකුන් අනූවක් සංඥාවෝ සංඥාස්කන්ධයයි කියාද, සම්පණස් චෛතසික සංස්කාරස්කන්ධයයි කියාද, එකුන් අනූවක් චිත්තයෝ විඥාණස්කන්ධයයි කියාද, සාමාන්‍ය පඤ්චස්කන්ධයෙහි ව්‍යවහාර කෙරෙත්. උපාදානස්කන්ධ විභාගයෙහි:— එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනාවූ වේදනාවෝ එකාසූව වේදනුපාදානස්කන්ධයයි කියාද, එසේම එකාසූවක් ලෞකික සංඥාවෝ සඤ්ඤුපාදානස්කන්ධයයි කියාද, ඒ එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනාවූ සම්පණස් චෛතසිකය සංස්කාරූපාදානස්කන්ධයයි කියාද, එකාසූවක් ලෞකික චිත්තය විඥාණූපාදානස්කන්ධයයි කියාද ව්‍යවහාර කෙරෙත්.

මේ ස්කන්ධ උපාදානස්කන්ධ දෙදෙනාගේ විශේෂ නම්:— අතීතානාගතාදී භේදයන් නැති හෙයින් නිර්වාණ ධර්මමාත්‍රයක් හැර අවශේෂ සියලු පරමාර්ථ ධර්මයෝ පඤ්චස්කන්ධයෙහි ඇතුළත් වෙත්. පංචුපාදානස්කන්ධයෙහි විශේෂ නම්:— විවට්ටධර්ම සංඛ්‍යාතවූ සතරමාර්ගය, සතරඵලය, නිර්වාණය යන නවලෝකෝත්තර

ධර්මය හැර අවශේෂ සියලු පරමාර්ථ ධර්මයෝ පංචුපාදානස්කන්ධයෙහි ඇතුළත් වෙත්. මේ ස්කන්ධ උපාදානස්කන්ධ දෙදෙනාගේ විශේෂයයි.

ද්වාදසායතනය යනු ද්වාරවූ ආයතනයෝ සදෙනය, ඒ ද්වාරයන්ට අරමුණුවන්නාවූ ආයතනයෝ සයදෙනයයි, මෙසේ ද්වාදසායතනයෙක් වෙත්. මේ ද්වාදසායතනයන්ට වනාහි චිත්ත චෛතසික රූප නිර්වාණ සංඛ්‍යාත සියලු පරමාර්ථ ධර්මයෝම ඇතුළත් වෙත්.

"අෂ්ටාදසධාතුය" යනු ද්වාරධාතු සදෙනය, ආලම්බණධාතු සදෙනය, ඒ ඒ ද්වාරාලම්බණධාතූන් දෙලොස්දෙන ගැටීමෙන් හටගන්නාවූ විඥාන ධාතු සදෙනයයි දතයුතුයි. ඊට උපමාව නම්:—ගිනි ගානා දණ්ඩෙහි උත්තරාරණිය හා අධරාරණිය ද, එකට ගැටීමෙන් ගින්න හටගන්නාක්මෙන් චක්ඛුරූප දෙදෙනාගේ එකට ගැටීමෙන් චක්ඛුවිඤ්ඤාණධාතුව උපදී. අවශේෂ සත ලොස් ධාතූහුද මේ ක්‍රමයෙන් යොදාගත යුතුයි. ආයතන ධාතු සංග්‍රහයෙහි වනාහි:-සොළොස් සූක්ෂ්මරූපය, දෙපණස් චෛතසිකය, නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ධර්මායතනයයි කියාද, ධර්මධාතුයයි කියාද, ව්‍යවහාර කෙරෙත්. මෙසේ සාමාන්‍ය ස්කන්ධ සංග්‍රහයෙන් එකම නිර්වාණධාතුවද, උපාදානස්කන්ධ සංග්‍රහයෙන් නවලෝකෝත්තර ධර්මයද, සංග්‍රහ නොවන්නේ නමුදු ආයතන ධාතු සංග්‍රහයන්ට ඇතුළත් නොවන්නාවූ ධර්මයෙක් නම් නැත්තේ මැයි. මෙසේ ස්කන්ධභූමියෙහි හෝ ආයතනභූමියෙහි හෝ ධාතුභූමියෙහි හෝ විදර්ශනාප්‍රඥාව පුරුදු කරන්නාවූ යෝගාවචරයාහට මස්තකප්‍රාප්තවූ විදර්ශනා ප්‍රඥාවගේ සතර සත්‍යයන් ඉදිරිපසු නොවී එකක්ෂණයෙහි සිද්ධවනබව නොහොත් විදර්ශනා ප්‍රඥාවගේ අන්තිම ඵලය දක්වනු පිණිස අවසානයෙහි සත්‍ය සංග්‍රහය දක්වනලදී.

"සත්‍යසංග්‍රහය" යනු යටකී පඤ්චස්කන්ධයෙහි ඇතුළත්වූ සියලු ධර්මයන් අතුරෙන් නිර්වාණය හා එකම තෘෂ්ණාවද සම්මාදිට්ඨි. ආදී මාර්ගාංග අටදෙනද හැර අවශේෂ සියලු ධර්මසමූහය දුඃඛ සත්‍යයයි කියාද, එකම ලෝභය සමුදය සත්‍යයයි කියාද, නිර්වාණය නිරෝධසත්‍යයයි කියාද, සතරමාර්ගයෙහි යෙදුනාවූ සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අටදෙන හෝ සත්දෙන මාර්ගසත්‍යයයි කියාද, ව්‍යවහාර කෙරෙති. "මග්ගයුත්තා ඵලා චෙව චතුසච්චවිනිස්සටා" යනු කීහෙයින් සතරමාර්ග චිත්තයෙහි යෙදුනාවූ අෂ්ටාංගික මාර්ගය හැර අවශේෂවූ එකුන්තිස් මාර්ගචිත්තොත්පාදයන් හා ඵල

චිත්තයෙහි යෙදුනාවූ සත්තිස් ධර්මයෝද යන මෙකී ධර්මයෝ තුමූ සංස්කාර දුකින් යුක්තවූවාහු නමුදු චතුස්සත්‍යයෙන් විනිර්මුක්තයහ. දුක් ඉපදීමට කාරණා නොවන බැවින් සමුදය සත්‍ය යයි කියාද, නිර්වාණධාතුවට අසම්බන්ධ බැවින් නිරොධසත්‍ය යයි කියාද, සංසාරයෙන් එතරවීමට ප්‍රධාන උපකාර නොවන හෙයින් නිර්‍යාණිකාර්ථයෙන් මිදුන හෙයින් මාර්ගසත්‍යයයි කියාද, ව්‍යවහාර නොකට හැකි බැවින් චතුරාර්‍ය්‍යසත්‍යයන් බැහැරකළාවූ ධර්මයෝ නම් වෙත්. මෙසේ ස්කන්ධසංග්‍රහය, උපාදාන ස්කන්ධ සංග්‍රහය, ආයතනසංග්‍රහය, ධාතුසංග්‍රහය, සත්‍යසංග්‍රහයයි පස්වූ ප්‍රකාරයකින් සර්වසංග්‍රහය සමාප්ත කෙළේයි.

## සමුච්චය සංග්‍රහ විභාග නම් වූ සත්වෙනි පරිච්ඡේදය නිමි.

---

(ප)

යෙසං, යම් සවභාවක් ඇති; සඞ්ඛතධම්මානං, එක් සැත්තෑවක් සහෙතුක චිත්තය; මොහමූලිකදෙසිතෙහි, මොහ වර්ජිත කොට ඇති දෙපණස් චෛතසිකය, සහෙතුක චිත්තජරූපය සහෙතුකප්‍රතිසන්ධිකර්මජරූපය යන මේ ආදිවූ ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ට; යෙධම්මා, යම් සයාකාරවූ හෙතුප්‍රත්‍යාදිවූ ප්‍රත්‍යය ධර්මයෝ තුමූ; යථා, යම් හෙතුසත්‍යාදි වූ ප්‍රකාරයකින්; පච්චයා හොන්ති, උපකාරවෙත්ද; තං විභාගං, ඒ ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ට ප්‍රත්‍යය ධර්මයන්ගේ උපකාරශක්තිභෙදය; ඉධ, මේ අටවෙනි පරිච්ඡේදයෙහි; ඉදානි, දැන්; යථාරහං, සුදුසු පරිද්දෙන් අහං, මම; පවක්ඛාමි, ප්‍රභෙද වශයෙන් කියමි. අහං" යන කර්තෘව අධ්‍යාහාරයි. පටිච්චසමුප්පාදනයො ච, ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රමයද; පට්ඨානනයො ච, ප්‍රස්ථානක්‍රමය ද; ඉති, මෙසේ; පච්චය සඞ්ගහො, ප්‍රත්‍යසංග්‍රහය; ද්විධා, ද්විප්‍රකාරයකින්; වෙදිතබ්බො, දතයුත්තේයි. තත්ථ, ඒ ද්විප්‍රකාරක්‍රමයන් අතුරෙන්; තබ්භාවභාවීභාවාකාරමත්තොපලක්ඛිතො, ඒ අවිද්‍යාදී වූ හෙතුධර්මයන්ගේ හටගැණිම කාරණකොට ගෙණ හටගන්නා සවභාවඇති සංස්කාරාදි ඵලධර්මයන්ගේ හටගන්නා ආකාරමාත්‍රයකින් සළකුණු කරණ ලද ක්‍රම තෙමේ; පටිච්චසමුප්පාදනයො, ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රමය නම්වේ. පට්ඨානනයො පන, ප්‍රස්ථානක්‍රමය වනාහි; ආහච්චපච්චයට්ඨිතිං, වෙසෙසා පැවති ප්‍රත්‍යය සංඛ්‍යාත ස්ථිතිය, ආරබ්භ, ඇරබ; පවුච්චති, කියනුලැබේ. උභයං පන,

මේ විප්‍රකාරක්‍රමය වනාහි; වොමිස්සත්වා, මිශ්‍රකොට; ආචරියා, අට්ඨකථාචාර්‍ය්‍යවරයෝ තුමූ; ("ආචරියා" යනු විශුද්ධිමාර්ගකර්තෘ වූ බුද්ධඝෝෂාචාරීන්වහන්සේ සඳහා කීහු.) පපඤ්චෙන්ති, විස්තර කෙරෙත්. "මයං පන විසුං විසුං දස්සයිස්සාම" යනු අධ්‍යාහාරයි. අනුරුද්ධාචාර්‍ය්‍යාදිවූ පශ්චිමාචාර්‍ය්‍යවූ අපි වෙන වෙන ම දක්වම්හ යනාර්ථයි.

තහි, ඒ විප්‍රකාරක්‍රමයන් අතුරෙන්; "අවිජ්ජා-පෙ-සමුදයො හොතීති" "අවිජ්ජා-පෙ-සමුදයො හොති" යන; අයං නයො මේ ක්‍රම තෙමේ; එහි, මේ ප්‍රත්‍යසංග්‍රහයෙහි; පටිච්චසමුප්පාදනයො, ප්‍රතීත්‍යසමුත්පාදක්‍රම නම්වේ. අවිජ්ජාපච්චයා, චතුසත්‍ය ප්‍රතිච්ඡාදකලක්ෂණවූ මොහ සඞ්ඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; සඞ්ඛාරා, පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනෙඤ්ජාභිසංස්කාරයෝ තුමූ; සම්භවන්ති, හටගනිත්. සඞ්ඛාරපච්චයා, සංස්කාර සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; විඤ්ඤාණං,එකුන්විසි ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත විඥාන තෙමේ; වා, නොහොත් ලෞකික විපාක දෙතිසය යි කියනලද විඥාන තෙමේ; සම්භවති, පහළ වේ යි. පළමු වන විකල්පය ප්‍රතිසන්ධිකාලය සඳහාද, දෙවන විකල්පය ප්‍රවෘත්තිකාලය සඳහා ද යොදයන යුතුයි. විඤ්ඤාණපච්චයා, විඥාන සඞ්ඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; නාමරූපං, නාමය ද, රූපය ද, නාමරූපය ද; සම්භවති, පහළවේයි.

මේ "නාමරූපං" යන පදය නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං, යනුවෙන් සරූපෙකසෙස සමාස කරණු "නාමඤ්ච" යන්නෙන් අරූපභවයෙහි පහළ වන්නා වූ සතර නාමස්කන්ධය ද; "රූපඤ්ච" යනුවෙන් අසංඥසත්ව භූමියෙහි පහළ වන්නා වූ එක ම රූපස්කන්ධය ද; "නාමරූපඤ්ච" යනුවෙන් පසළොස් රූපාවචරභූමිය, සොළොස් කාමාවචරභූමිය යි කියන ලද්දා වූ පඤ්චවොකාරභවය ගැණේ. මේ නාමරූපශබ්දය සරූපෙකසෙස සමාස නො කොළේ වී නම් අරූපාල අසංඥතලයන් නො ගැණේ. එතකුදුවුවත් මීට අනතුරු වූ "නාමරූපපච්චයා" යන පදයෙහි "නාමඤ්ච රූපඤ්ච නාමරූපං" යනුවෙන් ද්වන්ද්වසමාසමාත්‍රයක් මුත් "යටකී පදයට කී සරූපෙකසෙෂය නො ලැබෙන්නේ යි.

නාමරූපපච්චයා, වෙදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රය සංඛ්‍යාත නාමයාගේ හා රූපයාගේ උපකාරයෙන්; සළායතනං චක්ඛායතනාදී ආයතනයෝ සදෙන ද; නොහොත් ෂඩායතන ෂඩායතනයෝ ද; සම්භවන්ති, පහළ වෙත්. මේ "සළායතනං" යන පදය ද සළායතනඤ්ච ඡඩායතනඤ්ච-සළායතනං, යනුවෙන්

සරූපෙසාසෙයසමාස කාරණු. සළායතනපච්චයා, සළායතන සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; ඵස්සො, චක්ඛුසම්ඵස්සාදී සවැදෑරුම් ස්පර්ශ තෙමේ; සම්භවති, පහළ වෙයි. ඵස්සපච්චයා, ස්පර්ශ සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; වෙදනා, චක්ඛුසම්ඵස්සජවෙදනාදී සවැදෑරුම් වෙදනා හෝ නොහොත් සුඛදුඃඛොපෙක්ෂාවෙදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධාකාර වෙදනාව හෝ; සම්භවති, පහළ වෙයි. වෙදනාපච්චයා, වෙදනා සංඛ්‍යාත වූ හෙතුහුගේ උපකාරයෙන්; තණ්හා, කාමතණ්හාදී ත්‍රිවිධාකාරතෘෂ්ණාව හෝ රූපතණ්හාදී සවැදෑරුම් තෘෂ්ණාව හෝ; සම්භවති, පහළ වෙයි. තණ්හාපච්චයා, තෘෂ්ණා සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; උපාදානං, කාමූපාදානාදී වූ සතරවැදෑරුම් උපාදානතෙමේ; සම්භවති, පහළ වෙයි. උපාදානපච්චයා, උපාදාන සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; භවො, කර්මභවය; උපපත්තිභවයයි කියන ලද්ද වූ ද්විප්‍රකාරභව තෙමේ; සම්භවති, පහළ වෙයි. භවපච්චයා භව සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; ජාති, ප්‍රතිසන්ධිගැණීම; සම්භවති පහළ වෙයි. ජාතිපච්චයා, ජාති සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; ජරාමරණං, ජරාව හා මරණයද, සම්භවති පහළ වෙයි. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, සොක කිරීම ය, හැඬීම ය, දුකට පැමිණීම ය, මානසික දුකට පැමිණීම ය, බලවත් ආයාසයට පැමිණීම ය, යන මොව්හු; සම්භවන්ති, පහළ වෙත්.

"ජරාමරණං" යන පදය විභක්ත්‍යන්තව ද, "සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා" යන පදය සමාසාන්තව ද, අතීගැණීමෙහි ප්‍රයොජනය නම්:- ජාතිහුගේ නො වැළැක්විය හැකි මුඛ්‍යඵලය ජරාමරණය යි කියා ද, ජාතිහුගේ වැළැක්විය හැකි වූ අමුඛ්‍යඵලය "සොක-පෙ-උපායාසා" යන්නෙන් ද පහළ වෙත්. ජරාමරණ සංඛ්‍යාත වූ මුඛ්‍යඵලය බුදුපසේබුදුමහරහතුන් විසිනු දු නො වැළැක්විය හැක්කේය. සොකාදී අමුඛ්‍යඵලය බුඩාදීන් විසින් වැළැක්විය හැකිවෙයි. මේ අර්ථය සඳහා "ජරාමරණසොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා"යි එක සම්බන්ධසමාස නො කොට මධ්‍යයෙහි විභක්තිය දැක්වූයේ ය යි දතයුතු යි.

එවං, මෙසේ කියන ලද ක්‍රමයෙන්; කෙවලස්ස, සුඛයෙන් අමිශ්‍රකවූ; නොහොත් සියලු; එතස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ දුක් රාශීහුගේ: සමුදයො, හටගැණීම; හොති, පහළවෙයි. තවද, ඒ ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙහි; තයො අද්ධා ච, අද්ධසංඛ්‍යාත කාලයෝ තුන්දෙනෙක් ද; ද්වාදසඞ්ගානි ච, දොළොස් අඞ්ග සංඛ්‍යාත

කාරණයෙකෙනෙක් ද; වීසතාකාරංච, විංශති ප්‍රභෙද වූ ආකාර කොටෙනක්ද; තිසන්ධිංච, ගැළපීම් තුණක්ද; චතුසංඛෙපා ච, සතර සංක්‍ෂෙප කොටෙනක්ද; නොහොත් එකසම්බන්ධ කොටස් සතරක් ද; තීනිවට්ටානි ච, පෙරළෙන්නාවූ වෘත්තයෝ තුන්දෙනෙක්ද; වෙ මූලානිච, මූලයෝ දෙදෙනෙක් ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

කථං, කෙසේ දතයුත්තාහුද යත්? අවිජ්ජාසංඛාරා, අවිද්‍යා සංස්කාරයෝ තුමූ; අතීතො අද්ධා, අතීතකාල නම් වෙති. ජාති ජරාමරණං, ජාතිජරාමරණ තෙමේ; අනාගතො අද්ධා, අනාගත කාල නම් වෙයි. මජ්ඣෙ අට්ඨ, මධ්‍යයෙහිවූ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භවසංඛ්‍යාත ධර්මයෝ අටදෙන තුමූ; පච්චුප්පන්නො අද්ධා, ප්‍රත්‍යුත්පන්නකාල නම්වෙයි. ඉති, මෙසේ; තයො අද්ධා, අද්ධ සංඛ්‍යාත කාලයෝ තුන්දෙන; වෙදිතබ්බා, දතයුත්තාහුය. අවිජ්ජා, අවිද්‍යාව ද; සංඛාරා, සංස්කාරයෝද; විඤ්ඤාණං, විඤ්ඤාණයද; නාමරූපං, නාමරූපයද; සළායතනං, ෂඩායතනයද, ඵස්සො, ස්පර්ශයද, වෙදනා, වේදනාවද; තණ්හා, තෘෂ්ණාවද; උපාදානං, උපාදානයද; භවො, භවයද; ජාති, ජාතියද; ජරාමරණං, ජරාමරණයද; ඉති, මෙසේ; ද්වාදසඞ්ගානි, දොළොස් අඞ්ගයෝ; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

පන, අර්ථාන්තරයක් කියමි:—නොහොත් නීතාර්ථයෙන් අන්‍යවූ නෙයාර්ථය කියමි:—එත්ථ, මේ ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙහි; සොකාදිවචනං, ශොකාදීන් කීරීම; නිස්සන්දඵල නිදස්සනං, ජාතිහුගේ අනුබන්ධවූ විපාකපරම්පරා මාත්‍රයක් දක්වීමම: හොති, වෙයි. (විසුං, වෙනම; අඞ්ගදස්සනං න හොති, අඞ්ගයක් දක්වීමෙක් නොවෙයි.) පන, විශෙෂාර්ථයක් කියමි:-එත්ථ,මේ දොළොස් වැදූරුම් අඞ්ගයන් අතුරෙන්; අවිජ්ජාසංඛාරග්ගහණෙන, අවිද්‍යා සංස්කාරයන්ගේ ගැණීමෙන්; තණ්හූපාදානභවාපි, තෘෂ්ණා උපාදාන කර්මභවයෝද; ගහිතා භවන්ති, ගන්නා ලද්දාහු වෙත්. තථා, එපරිද්දෙන්ම; තණ්හූපාදානභවග්ගහණෙනච, තෘෂ්ණාඋපාදාන කර්මභවයන් ගැණීමෙන්ද; අවිජ්ජාසංඛාරා, අවිද්‍යාසංස්කාරයෝ; ගහිතා භවන්ති, ගන්නාලද්දාහු වෙත්. ජාතිජරාමරණග්ගහණෙන ච, ජාතිජරාමරණයන්ගේ ගැණීමෙන්ද, විඤ්ඤාණාදි ඵලපඤ්චකං එව; විඤ්ඤාණාදී ඵලපස්ම; ගහිතං, ගන්නා ලද්දේ වෙයි. ඉති කත්වා, මෙසේ ගන්නාලද හෙයින්:—

අතීතෙ, අතීතභවයෙහි; පඤ්චහෙතවො, හෙතූහු පස්දෙනෙක්ද; ඉදානි, දැන් ප්‍රත්‍යුත්පන්නභවයෙහි; ඵලපඤ්චකං, ඵල

පසක් ද; ඉදානි, දැන්; ප්‍රත්‍යුත්පන්නභවයෙහි; පච්චහෙතවො, හෙතූහු පස්දෙනෙක්ද; ආයතිං, අනාගතභවයෙහි; ඵලපඤ්චකං, ඵලපසක්ද; ඉති, මෙසේ; වීසතාකාරා, විසි ආකාරයෙක්ද; තිසන්ධිං, සන්ධිත්‍රයෙක්ද; හෙවත් හෙතුඵලසන්ධිය ඵලහෙතු සන්ධිය හෙතුඵලසන්ධියයි යන සන්ධිත්‍රයෙක් ද: චතුසංඛෙපාච, සතර සංක්ෂෙප කෙනෙක්ද, හෙවත් අතීතහෙතුසංක්ෂෙපයෙක, ප්‍රත්‍යුත්පන්නඵලසංක්ෂෙපයෙක, ප්‍රත්‍යුත්පන්නහෙතුසංක්ෂෙපයෙක, ආයතිඵලසංක්ෂෙපයෙක් ද යි යන සතර සංක්ෂෙප කෙනෙක්ද; භවන්ති, වෙත්. අවිජ්ජාච, අවිද්‍යා තොමෝද; තණ්හුපාදානා ච, තෘෂ්ණාව හා උපාදානයෝ ද; කිලෙසවට්ටං, කෙලෙස්වට නම් වෙ යි. කම්මභව සංඛාතො, කර්මභවය යි කියන ලද්දාවූ; භවෙකදෙසො ච, භවයාගේ එකදෙශයෙක්ද; සංඛාරා ච සංස්කාරයෝ ද, කම්මවට්ටං, කම්වට නම් වෙයි. උපපත්තිභව සංඛාතො, උත්පත්තිභවය යි කියන ලද්දාවූ; භවෙකදෙසො ච, භවයාගේ එකදෙශයෙක් ද; අවසෙසා ච, මෙහි නොකියන ලද්දාවූ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, ජාති ජරා මරණයෝද; විපාකවට්ටං, විපාවට නම් වෙ යි. ඉති, මෙසේ; තිවට්ටානි, තුන්වටකෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය. අවිජ්ජා තණ්හාවසෙන ච, අවිද්‍යා තෘෂ්ණාවන්ගේ වශයෙන්: වෙ මූලානිච, මූලයෝ දෙදෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

ච, සංසාරචක්‍රයෙන් අන්‍ය වූ සංසාරචක්‍රයාගේ බිඳීම දක්වම්:- තෙසමෙව මූලානං, ඒ අවිද්‍යා තෘෂ්ණා සංඛ්‍යාත මූලයන්ගේ ම; නිරොධෙන, අර්හත්මාර්ගයෙන් නිරවශෙෂයෙන් නිරුද්ධකිරීම හෙතුකොටගෙණ; වට්ටං, ත්‍රිවිධවෘත්තය; නිරුජ්ඣති, නිරුද්ධවේ.

ජරාමරණමුච්ඡාය, ජරාමරණදෙකින් මූසපත්වීම හෙතුකොටගෙණ, අභිණ්හසො, නිරන්තරයෙන්; පීළිතානං, පීඩිත සත්වයන්ට; ආසවානං, කාමාදී චතුරාශ්‍රවයන්ගේ; සමුප්පාදා, හටගැණිමෙන්; අවිජ්ජා ච, නැවතත් අවිද්‍යාතොමෝ ද; පවඩ්ඪති, ප්‍රකර්ෂයෙන් වැඩේ.

ඉච්චෙවං, (ඉති එවං යථාවුත්තනයෙන) මේ යථොක්ත ක්‍රමයෙන් හෙවත් දොළොස් වෙනි ජරාමරණ ඵලය හෙතුකොටගෙණ අවිද්‍යාව හටගන්නා හෙයින්; ආබද්ධං, හැත්පසින් බැඳුනාවූ; අනාදිකං, මූලක්නැති; තෙභූමකං වට්ටං, ත්‍රෛභූමික වෘත්තය; පටිච්චසමුප්පාදොති, හෙතුධර්මයාගේ ශක්තිය හෙතුකොටගෙණ ඵලධර්මයාගේ හටගැණීමය යි, මනාවූ, මුනීන්ද්‍රවූ

සර්වඥයන්වහන්සේ; පළපෙසි, පඤ්චමා වදාළේයි. හෙවත් දෙශනා කොට වදාළේයි

———○———

(හ)

"යෙසං සංඛතධම්මානං" යනාදී ගාථාවෙහි අභිප්‍රාය මෙසේයි. "සංඛත ධර්ම" යනු එක්සැත්තෑවක් සහෙතුක චිත්තය මොහමූලිකද්වයෙහි යෙදුනාවූ මොහය හැර අවශෙෂවූ දෙපනස් චෛතසිකය, සහෙතුක චිත්තජරූපය, සහෙතුක ප්‍රතිසන්ධි කර්මජරූපය, යන මෙතෙක් ධර්මයෝ තුමූ; ඒ ඒ ප්‍රත්‍යයෙන් සකස් කළහෙයින් සංඛතයයි කියාද, ව්‍යවහාර කෙරෙත්, "ප්‍රත්‍යධර්මයෝය" යනු (ලොභාදී) මොහාදී සවැදෑරුම් හෙතුධර්මාදී අනෙක ප්‍රකාරප්‍රත්‍යධර්මයෝයි. ඒ ප්‍රත්‍යධර්මයෝ තුමූ සංඛතධර්ම සංඛ්‍යාත ප්‍රත්‍යොත්පන්නධර්මයන්ට හෙතුප්‍රත්‍යාදී යම්යම් ආකාරයකින් උපකාරවෙත්ද, ඒ ප්‍රත්‍යධර්මයන්ගේ හා ප්‍රත්‍යොත්පන්නධර්මයන්ගේද විභාගය මේ සමුච්චයසංග්‍රහයට අනතුරු තන්හි ඒ ඒ ධර්මයන්ට සුදුසු පරිද්දෙන් මෙතැන් පටන් කියම්හයි යනු ප්‍රතිඥාගාථාවෙහි භාවය යි. ඒ ප්‍රත්‍යසංග්‍රහය වනාහි ප්‍රතීත්‍යසමුත්පාදක්‍රමය, ප්‍රස්ථානක්‍රමයයි දෙවැදෑරුම් වන්නේයි. ඔවුන් අතුරෙන් තද්භාවභාවීභාවාකාර මාත්‍රයකින් හෙවත් ඒ ඇති කල්හි ඒ ඇතිවීමයයි කියන ලද හෙවත් අවිද්‍යාව ඇති කල්හි සංස්කාරය හටගන්නේය යි යන තද්භාවභාවීභාවාකාර මාත්‍රයකින් හදුන්වනු ලබන ක්‍රමය හෙවත් සලකුණු ලබන ක්‍රමය හා අතද්භාවභාවීභාවාකාර මාත්‍ර සංඛ්‍යාත ඒ නැති කල්හි ඒ නැති වීම ය යි කියන ලද අතද්භාවභාවීභාවාකාරමාත්‍රයකින් සලකුණුකරණ ලද ක්‍රමය ද පටිච්චසමුප්පාද ක්‍රමය නම් වෙයි.

මේ පටිච්චසමුප්පාදක්‍රමයෙහි අවිද්‍යාව ප්‍රත්‍යය හා සංස්කාරය ප්‍රත්‍යොත්පන්නද වන්නාක් මෙන් සංස්කාරය ප්‍රත්‍යය හා විඥානය ප්‍රත්‍යොත්පන්නද වන හෙයින් මේ ද්වාදශපදිකප්‍රත්‍යයාකාරයෙහි දෙළොස්පදය ප්‍රත්‍යය හා නැවත ඒ දෙළොස්පදයම ප්‍රත්‍යොත්පන්නද වෙත්. එසේ ඒ අභි ගත් කල්හි අවිද්‍යා සංඛ්‍යාත මොහයට උපකාරධර්මයක් නැත්තේ වී නම් ඒ අවිද්‍යාව අහෙතුඅප්‍රත්‍යධර්මයක් වියයුතුය. එකල්හි (අහෙතු) අප්‍රත්‍යය මිථ්‍යාදෘෂ්ටියෙහි වැටෙයි. එසේ අභි නොගතයුතුයි.

"ජරාමරණ මුච්ඡාය පීළිතානමභිණ්හසො,
ආසවානං සමුප්පාදා අවිජ්ජා ච පවත්තති"

යන ගාථාවෙහි කී පරිදි ජාතිප්‍රත්‍යයෙන් හටගන්නාවූ ජරාමරණයෙන් හෙවත් ජරාමරණප්‍රත්‍යයෙන අවිද්‍යා නැමති

ඵලයසටගන්නා හෙයින් අනන්තර වූ ඵලය ප්‍රත්‍යය ව පළමු වන හෙතුව ප්‍රත්‍යාසන්න වන හෙයින් මේ සංස්කාරචක්‍රය වනාහි භාත්පසින් බැඳී පවත්නේයි. පට්ඨානනය වනායි ආහච්චපච්චයට්ඨිතිය යි කියත්. මේ ආහච්චපච්චයට්ඨිතිය වනාහි සමහර අගය සිරිවාසිහු කාණ්ඩතාලු ආදියෙන් පැහැර දෙශනා කළ හෙයින් ආහච්චපච්චයට්ඨිතිය යි කියත් ඔවුන්ගේ අර්ථදීම වනාහි ශ්‍රවණ මාත්‍රයකින් ම පරිහාස කටයුතු අර්ථ කීමක් වෙයි. පට්ඨානක්‍රමය හෝ අනිත් ක්‍රමයක් හෝ කාණ්ඩතාලු ආදියෙහි නො පැහැර දෙශනා නො කොට හැක්කේයි. එසේ අර්ථ ගන්නේ වි නම් සියලු ත්‍රිපිටකධර්මය ම කාණ්ඩතාලු ආදියෙහි පැහැර දෙශනා කළ හෙයින් පිටකත්‍රධර්මය ම ආහච්චපච්චයට්ඨිති විය යුතුයි. එහෙයින් නොවියත් හගිරිතබයන්ගේ අර්ථ කීම පණ්ඩිතයන්ට හාස්‍යොත්පාදනයට කාරණා වෙයි. එසේ හෙයින් පටිච්චසමුප්පාද ප්‍රත්‍යයන්ගේ ම විවිධාකාර ප්‍රත්‍යය ධර්මයෝ ආහච්චපච්චයට්ඨිති යයි දතයුතුයි

"අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙහි අවිද්‍යා සංඛ්‍යාත මෝහය ප්‍රධාන හේතුව වෙයි. සංස්කාරය ප්‍රධාන ඵලය වෙයි. මේ අවිද්‍යා සංඛ්‍යාත මෝහය හේතුප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, නිස්සයප්‍රත්‍යය, උපනිස්සයප්‍රත්‍යය, යනාදිවූ විවිධාකාරයෙන් අවිද්‍යාව සංස්කාරයට උපකාර වන හෙයින් පටිච්චසමුප්පාදය ප්‍රධාන උපකාරවශයෙන්ද, පට්ඨානක්‍රමය අප්‍රධාන උපකාර ධර්මයන්ගේ වශයෙන්ද, අර්ථගත් කල්හි කිසි අර්ථවිරොධයෙක් නොවන්නේ මැයි. මේ පටිච්චසමුප්පාද පට්ඨාන යන ක්‍රමවය වනාහී විශුද්ධිමාර්ගී අටුවාදියෙහි මෙන් මිශ්‍රකොට අර්ථවර්ණනා කරත් නමුදු මේ ප්‍රකරණයෙහි ඒ ඒ ප්‍රත්‍යයුග්මය වෙන් වෙන් කොට අර්ථ කීයේම හයි යනු භාවයි. "අවිද්‍යා" යනු වින්දියං න වින්දති. න වින්දියං වින්දති. යනාදී නොයෙක් ක්‍රමයෙන් අර්ථවර්ණනා කරත් නමුදු "අන්තවිරහිතෙ සංසාරෙ සත්තෙ ජවාපෙති" යන වාක්‍යයෙන් වර්ණාගම වර්ණලොපාදී පචවිධනිරුක්ති නයින්* "අන්ත" ශබ්දයාගේ අකාරය හා "විරහිත" ශබ්දයාගේ විකාරය හා "ජවාපෙත" යන ශබ්දයාගේ ජකාරයද ගෙණ සැදිසවූ භාවය කොට අවිජ්ජාය යි කියත්.

ඒ අවිද්‍යාව වනායි සූත්‍රාන්තක්‍රමයෙන් දුඃඛාදී චතුරාර්‍යසත්‍යය හා පූර්වාන්තාදී සතරතැනද නො දක්ම අවිද්‍යායයි

* වර්ණාගමො වර්ණවිපර්‍යයශ්ච ද්වෞචාපරෞ වර්ණවිකාර නාශෞ ධාතොස්තදර්ථාතිශයෙන යොගස්තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්.

කියත් අභිධර්මක්‍රමයෙන් දොළොස් අකුශල චිත්තයෙහි පවත්නා හෙයින් දොළොස් වැදෑරුම්යයි කියත්. ඒ අවිද්‍යාප්‍රත්‍යය හෙතු කොටගෙණ හෙවත් අවිද්‍යාවගේ උපකාරයෙන් කාමාවචර රූපාවචර තෙළෙස් කුශලකර්ම සංඛ්‍යාතවූ පුණ්‍යාභිසංස්කාර යද, දොළොස් අකුශලචේතනා සංඛ්‍යාතවූ අපුණ්‍යාභිසංස්කාර යද; සතර අරූපාවචර කුශලචේතනා සංඛ්‍යාතවූ ආනෙඤ්ජාභිසංස්කාරය ද, පහළ වෙත්. මේ සතරකාර කුශලචේතනාවන් අතුරෙන් මහාකුශල චේතනා අටය, රූපාවචර කුශලචේතනා පසය, අරූපාවචර කුශලචේතනා සතරය, යන මෙතෙක් සංස්කාරයෝ වනාහි මහාකුශල් සිත් අටය, රූපාවචර කුශල්සිත් පසය, අරූපාවචර කුශල් සිත් සතරය යන සතළොස් ලෞකික කුශලචිත්තයන් හා යෙදුනාවූ චේතනා චෛතසිකයෝයි "අපුණ්‍යාභිසංස්කාරය" යනු දොළොස් අකුශල චිත්තයෙහි යෙදුනාවූ චේතනාචෝ දොළොස්දෙනායි. මොවුන් අතුරෙන් සතළොස් ලෞකික කුශලචිත්තයෙහි ඒකාන්තයෙන් අවිද්‍යාව නොයෙදෙන්නේයි. දොළොස් අකුශල චිත්තයෙහි වනාහි ඒ චේතනා චෛතසිකයන් සමග ඒකාන්තයෙන් අවිද්‍යාව යෙදෙන්නේමය.

අවිද්‍යාව අන්‍යොන්‍යසම්බන්ධයෙන් යෙදෙන්නා වූ දොළොස් අකුශලචිත්තයෙහි දොළොස් චේතනාවන්ට අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, හෙතුප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, යනාදී පඨානාගත බොහෝ ප්‍රත්‍යාඞ්ගයන් උපකාර වන හෙයින් අකුශල සංස්කාරයන්ට අවිද්‍යාව උපකාර වේ වා. සතළොස් ලෞකික කුශල චිත්තයෙහි ඒකාන්තයෙන් අවිද්‍යාව නැත්තේ ම ය. එසේ නැත්නාවූ අවිද්‍යාව කෙසේ උපකාර වන්නේද යත්? මාර්ගයෙන් අප්‍රහීණවූ අනුසය වශයෙන් පවත්නා අවිද්‍යාවගේ උපකාරයෙන් කාමාවචර කුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් අවිද්‍යාව උපකාර වන්නේය. ඊට උපමා කවර යත්? පර්වතයක් මුදුනෙහි සිට ගෙණ ප්‍රපාතයදෙශ බලන්නාවූ පුරුෂයාහට ඒ පර්වතප්‍රපාතයෙහි දිව්‍යාඞ්ගනාවන් සිටිනා බව දැක ඒ දිව්‍යාඞ්ගනාවන් ලබා ගන්නා පිණිස පර්වතයෙන් පනින්නේය. ඒ පර්වතයෙන් පැණීම හෙතුකොටගෙණ මතු විය යුතු ආදීනව අවිද්‍යාව හෙතුකොටගෙණ නො පෙණී යාමෙන් පර්වතප්‍රපාතයට පැමිණ විනාශ වන්නාවූ අඥාන පුරුෂයා මෙන් සදිව්‍ය ලොකයෙහි වසන්නාවූ දිව්‍යප්සරාවන් ලබා ගන්නා අදහසින් අවිද්‍යාව හෙතුකොටගෙණ කාමාවචර කුශල් රැස් කරන්නේය. ඒ පුරුෂ තෙමේ පර්වතයෙන් පනින්නාක් මෙන් කාමලොකයෙහි ඉපදීමට හෙතුවූ කාමාවචර කුශල් රැස්කොට සුගතියෙහි

ඉපිද පස්කම්සැප විඳිනු පිණිස සත්වඝාතන සුරාපාන පරස්ත්‍රී සෙවනාදී මහාසාවද්‍ය පව් කොට ඒ පාපයන්ගේ විපාක විඳින පිණිස නැවත සතර අපායෙහි උපදනෝයි. එහෙයින් දිව්‍යසිරි ලබා ගන්නා පිණිස කාමාවචර කුශල් රැස් කිරීම පජීතප්‍රපාතයෙහි සිටිනා දෙවඟනන් ලබනු පිණිස අඥානකම හේතුකොට ගෙණ පජීතයෙන් පනින්නාවූ පුරුෂයෙකුට බඳුවෙයි. එහෙයින් කාමාවචර කුශලයන්ට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වෙයි.

අතික් පුරුෂයෙක් තෙමේ මීපැණියෙන් වැකුනු කඩුමුවහත ලෙවින්නාක් මෙන් හෙවත් කඩුමුවහත ලෙවීමෙන් දිවසිඳිනා බව අවිද්‍යාව කාරණකොටගෙණ නොදැකීමෙන් මීපැණියෙහි ආසාව මුල් කොට ගෙණ කඩුමුවහත ලෙවින්නාක්මෙන් පඤ්චප්‍රකාර වූ රූපාවචරධ්‍යාන උපදවා මඳකලක් බ්‍රහ්මලෝකයෙහි විඳිනාවූ සැපයෙහි ඇලුම්කොට ඒ බඹලොව ආයු පිරිහීමෙන් නැවතත් කාමධාතුවට පැමිණ සතර අපාදුකට භාජන වන බව අවිද්‍යාවෙන් නොපෙණී රූපාවචර කුශල් රැස් කෙරෙයි. මෙසේ දුර සිට අවිද්‍යාව රූපාවචර කුශලයන්ට උපකාර වන හෙයින් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන්නේමැයි.

අතිකුදු මං මුළාවූ පුරුෂයෙක් තෙමේ පිශාචනගරයට යන්නාවූ මාර්ගයක් දැක මේ අභයපුරයට යන මාර්ගයකැයි සිතා අවිද්‍යාවෙන් මුළා වී පිශාචනගරයට වැද යකුන්ට බත් වේ යි. එපරිද්දෙන් සතර අරූපාවචර කුශල චේතනාවන් රැස් කොට සදාකාලික සැප විඳිමහයි සිතා සතර අරූපාවචර භවයෙහි ඉපිද බොහෝ කාලයක් මුළුල්ලෙහි කිසි අඞ්ගයක් නැත්තාවූ සතර අරූතලයෙහි ප්‍රමාද වන්නෝයි. මෙසේ අවිද්‍යාව ආනෙඤ්ජාභි සංස්කාර සංඛ්‍යාතවූ සතර අරූපාවචර චේතනාවන්ට දුර සිට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන්නේ යි.

අපුණ්‍යාභි සංස්කාරයන්ට කෙසේ උපකාරවන්නේ දයත්? විෂ මිශ්‍රවූ රසභොජනයක් බොහෝ කල් ජීවත්වනු කැමති පුරුෂයෙක් අනුභව කරන්නාක් මෙන් ද, අශුචිමූත්‍රසුණඛකුණපාදියෙන් පිඬා කරණු ලබන පුරුෂයෙකු මෙන් ද, බොහෝ කලක් ජීවත් වනු පිණිස සත්වඝාතන සුරාපානාදිය කොට රස මසවුලෙන් යුක්තවූ භොජනය අනුභව කරයි. එසේ ම පරස්ත්‍රී පරපුරුෂ සෙවනාදියෙන් සිත පිනවීමෙහි උත්සාහ කරයි. මෙසේ දෙළොස් අකුශල චේතනාවන් හා අවිද්‍යාව අන්‍යොන්‍යසම්බන්ධ

යෙන් යෙදෙන හෙයින් අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, හෙතුප්‍රත්‍යය යනාදී නව ආකාරයකින් උපකාර වේ යි.

මෙසේ අවිද්‍යා සංඛ්‍යාතවූ ප්‍රධාන හෙතුවෙන් චෙතනා සංඛ්‍යාතවූ ප්‍රධානඵලය හටගැණීම තද්භාවභාවීභාවාකාර ලක්ෂණයෙහි හෙතුප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය යනාදී නවාකාරයකින් උපකාර වීම ආහච්චපච්චයට්ඨිති ලක්ෂණය වේ. හෙවත් විශෙෂ උපකාරයෝ ය යි දතයුතු යි. ඒ සංස්කාර ප්‍රත්‍යයෙහි ප්‍රතිසන්ධි සංඛ්‍යාත එකුන්විසි ප්‍රතිසන්ධිචිත්තය ප්‍රවෘත්ති විපාක වශයෙන් දෙතිස් ලෞකික විපාක විඤ්ඤාණය, හටගන්නේ යි. හෙවත් ද්වාදස අකුශල සංඛ්‍යාත අපුණ්‍යාභි සංස්කාරප්‍රත්‍යයෙන් නරකතිර්යක් ප්‍රේත අසුර සංඛ්‍යාත වූ සතර අපාය භූමියෙහි උපෙක්ෂා සහගත අකුශල විපාක සන්තීරණ සංඛ්‍යාතවූ එකම ප්‍රතිසන්ධි විපාක විඥානය පහල වන්නේ යි. ප්‍රවෘත්ති කාලයෙහි වනාහි අවීචිමහානරකය ආදී කොට ඇති මහානරකයෙහි කුශල විපාකය අප්‍රකට නමුදු බුද්ධකොලාහලාදියෙහි ධර්මස්වභාව වශයෙන් උපදනා ආලොකාදිය සම්බන්ධව කුශල විපාක චක්ෂුර්විඥානය උපදින්නේ යි.

ආයුෂ්මත් මහාමුගලන් තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ සෘද්ධි බලයෙන අවීචි මහානරකයෙහි ගිනිනිවා මොහොතක් කල් වැඩ සිට තමන් වහන්සේගේ ශරීරය සියලු තිරිසතුන්ට පෙණේව යි අධිෂ්ඨාන කොට තමන් වහන්සේගේ ධර්මකථාව ද සියලු තිරිසතුන්ට ඇසේව යි අධිෂ්ඨානයෙන් ධර්මදෙශනා කල කල්හි අවීචිමහානරකවාසී සියලු සතුන්ට කුසල විපාක චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝ උපන්නාහුය. ප්‍රේතලොකයෙහි ද එසේ ම බුද්ධාදී උතුමන්ගේ සෘද්ධ්‍යානුභාවයෙන් ධර්මදෙශනාදිය කරණ කල්හි ඔවුනට ද කුශල විපාක චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණාදිය උපදී. චක්‍රවර්තිරජහුගේ ඇතපාහනය අස්වාහනය ආදී කොට ඇති සියලු උත්තම පරිභොග තිරශ්චීන සත්වයන්ට ද, අපරපරියවේදනීය කර්මයන්ගේ කුශල විපාකයෝ ලැබෙත් මැ යි. දිව්‍යනාගභවනය, දිව්‍යගරුඬභවනය, යන දෙතන්හි උපදනා සියලු සත්වයන්ගේ පටිසන්ධිය ද අපායපටිසන්ධිය වන්නේ නමුදු සියලු ප්‍රවෘත්තිවිපාකයෝ අටමහාකුශලයෙන් හටගත් අපරාපරියවේදනීය කර්මයන්ගේ විපාකයෝ යි. එහෙයින් ඔවුන්ටද දෙවියනට මෙන්ම දිව්‍යවිමාන කල්පවෘක්ෂ සුධාභොජනාදීහු ලැබෙත් මැ යි. අටමහාකුශලයන්ගේ ශූතා දුර්වල වූ කාමාවචර කුශල

චේතනා සංඛ්‍යාත ද්විහේතුකලාමක කුශල සංස්කාරයන්ගේ හෙතුවෙන් මනුෂ්‍යලොකයෙහි බොහෝ සෙයින් ශුද්‍රමනුෂ්‍ය යන්ගේද ප්‍රතිසන්ධිය හා උසස්මාදිය කරන්නාවූ හීනමනුෂ්‍ය යන්ගේද ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිමූග ජාතිපණ්ඩක ජාතිඋභතොබ්‍යඤ්ජනකාදී අඞ්ගවිකල සත්වයන්ගේද, භූමිනිශ්‍රිත විනිපාතික අසුර සංඛ්‍යාත ඥාතිප්‍රේතමලයක්ෂාදීන්ගේ ප්‍රතිසන්ධිය ද, කුශලවිපාක උපෙක්ෂාසන්තීරණ චිත්තයෙන් ප්‍රතිසන්ධිගෙණ ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුකකුශල විපාක අට හා අහෙතුක අකුශල විපාක සත ද යන මේ පසළොස් විපාකවිඥානය ලැබෙන්නේයි. අටමහාකුශලයන් අතුරෙන් ත්‍රිහෙතුක ලාමකකුශලකර්මයෝ සතරය, ද්විහෙතුක උත්කෘෂ්ට කුශල කර්මයෝ සතරය යි යන මේ සංස්කාරයන් අටදෙනාගේ උපකාරයෙන් ඥානවිප්‍රයුක්ත සතරප්‍රතිසන්ධි විපාකවිඥානයෝ ප්‍රතිසන්ධි වශයෙන් පහල වෙත්. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි ඥානවිප්‍රයුක්ත මහාවිපාකයෝ සතරය, අහෙතුක කුශල විපාකයෝ අටය යි යන මේ දොළොස් විපාක විඥානකෙනෙක් පහළ වෙත්.

මේ සතරවිපාකප්‍රතිසන්ධිය වනාහි සදිව්‍යලොකයෙහි අල්පෙශාක්‍යදෙවියන්ගේ හා සියලු අසුරයන්ගේ ද මනුෂ්‍යලොකයෙහි අල්පෙශාක්‍ය මිනිසුන්ගේ ප්‍රතිසන්ධිය වන්නේ යි. එහෙයින් ඔවුන්ට එම ආත්මභාවයෙහි ධ්‍යානමාර්ගඵලාදිය නො ලැබෙන්නේ මැයි. එහෙයින් ඔවුන්ට ඇත්තාවූ සෘද්ධිය අභිඥාබලයෙන් නොව පක්ෂීන්ට ඇත්තාවූ සෘද්ධිය මෙන් කර්මයෙන් හටගන්නේ යි. ත්‍රිහෙතුකමහාකුශලයන් සම්බන්ධ උත්කෘෂ්ටවූ සංස්කාර සතරදෙන හෙතුකොටගෙණ සදිව්‍යලොකයෙහි මහෙශාක්‍ය දෙවියන්ගේ හා මනුෂ්‍යලොකයෙහි බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්‍ය්‍යශ්‍රාවක චක්‍රවර්තිරාජාදී වූ සියලු උත්තමසත්වයන්ගේ ප්‍රතිසන්ධිවිපාක විඥානය පහලවන්නේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඥානය වනාහි "අණනකං හෙතූනං පච්චයා ගතිසම්පත්තියා උපපත්ති හොති" යනු පටිසම්භිදාමාර්ගයෙහි වදාල බැවින් ඒ කාමාවචරකුශලකර්මය රැස් කරන්නා වූ කල්හි උපදනා ජවන වීථියෙහි යෙදුනා වූ අලොභ අද්වෙෂ අමොහ යන හෙතුහු තුන් දෙනාය, ඒ කර්මයෙන් සුගතිප්‍රතිසන්ධිය ගැණීමට සුදුසු වූ මරණාසන්නකාලයෙහි උපදනා ත්‍රිහෙතුක මහාකුශල චිත්තවීථියෙහි යෙදුනා වූ අලොභඅද්වෙෂ අමොහ යන හෙතුහු තුන්දෙනාය, ඒ කර්මයෙන් සුගතිප්‍රතිසන්ධි ගන්නා වූ කල්හි උපදනා මහාවිපාක පටිසන්ධිවිඥානයෙහි යෙදුනා වූ අලොභ අද්වෙෂ අමොහ යන හෙතුහු තුන්දෙනාය යන මේ හෙතුහු නවදෙනාගේ * උප

---

* නිකෘෂ්ටක්ෂණයෙහි ලොභ මොහ වශයෙන් අටදෙනෙක් වෙත්.

කාරණයෙන් ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඥානසම්ප්‍රයුක්ත වන බැවින් පාරිහාරිකප්‍රඥා සංඛ්‍යාතවූ සමථවිදර්ශනා භාවනාබලයෙන් උපන්නාවූ ප්‍රඥාවෙන් ධ්‍යානමාර්ගඵල සංඛ්‍යාත උත්තරි මනුෂ්‍ය ධර්මය ම ලැබිය හැක්කේ ම ය, එහෙයින් පටිසම්භිදාමාර්ගයෙහි "ආයූහනක්ඛණෙ තිණ්ණන්නං නිකන්තික්ඛණෙ ද්වින්නං පටිසන්ධික්ඛණෙ තිණ්ණන්නන්ති" අට්ඨන්නං හෙතූනං පච්චයා ඤාණසම්පයුත්තා උපපත්ති හොති යනු වදාළේයි.

මේ "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන පදයෙහි විභාගයයි.

———o———

"විඤ්ඤාණපච්චයා නාමරූපං" යන තෘතීය පදයෙහි භාවය මෙසේයි. නාමචන්දසමාසපදයෙහි "නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං" යනුවෙන් සරූපෛකශේෂසමාසය දතයුතු යි. මෙසේ සරූපෛකශේෂසමාස කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද යත්? ඒ සමාසය නො කෙළේවී නම් පඤ්චවොකාරභවප්‍රතිසන්ධිය මුත් චතුවොකාරභවප්‍රතිසන්ධිය නො ලැබෙන්නේ මැයි. එහෙයින් "නාමඤ්ච රූපඤ්ච" යන පළමුවන පදය පඤ්චවොකාරභව වශයෙන්ද, 'නාමඤ්ච" යන පදය චතුවොකාරභව වශයෙන්ද රූපඤ්ච, යන පදය ඒක වොකාර භව වශයෙන්ද, යොදාගත යුතුයි. මෙහි විඤ්ඤාණපච්චයා නාමරූපං" යන වචනයෙන් විඥාන ප්‍රත්‍යයෙන් නාමරූපය හටගන්නේය යි කී කල්හි "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන පදයෙහි මෙන් හේතුඵල දෙදෙන භවදෙකෙක්හි ලැබෙන්නාක් මෙන් "විඤ්ඤාණපච්චයා නාම රූපං" යන පදයෙහි නො සිතිය යුතු යි. "සංඛාරපච්චයා" යනු මේ ජාතියෙහි රැස් කරණ ලද්දාවූ කුශලාකුශලකර්ම චේතනාවෝ ය. "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන පදයෙහි අනතුරුභවයෙහි ලැබෙන්නා වූ හෙවත් මේ ජාතියෙහි රැස් කළාවූ කුශලාකුශලකර්මහේතුවෙන් අනතුරු ජාතියෙහි හට ගන්නා වූ පටිසන්ධිප්‍රවෘත්ති විපාක විඥානය යි- අර්ථ ගන්නා හෙයින් හේතුඵලදෙදෙනාගේ ලැබීම භවදෙකෙක්හි වන්නාක් මෙන් "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන්නෙහි නො ලැබෙන්නේ මැ යි. එසේ වී නම් කෙසේ ලැබෙන්නේ ද යත්? අහසින් බිමට දමන්නාවූ උණ ලී මිටි තුණක් එකවිට අහසින් අවුත් භූමියෙහි පිහිටන්නා වූ කල්හි ඒ මිටිතුණ ඔවුනොවුන්ට උපකාර වී මෙන් භූමියෙහි යම්සේ කෙළින් පිහිටන්නාහු වෙත් ද එකල්හී ප්‍රත්‍යය වූ උණ ලී මිටිය හා ඵලයවූ මිටිදෙකද ඉදිරිපසු නො වී එකවිට භූමියෙහි පිහිටන්නාක් මෙන් පටිසන්ධිවිඤ්ඤා

ණය හා තත්සම්ප්‍රයුක්ත වූ වේදනාදී නාමස්කන්ධත්‍රයද, මනුෂ්‍ය ලෝකයෙහි ගර්භසෙය්‍යකසත්ත්වයන්ට පටිසන්ධිවිඤ්ඤාණය හා සමග පහළ වන්නා වූ කාය, භාව, වස්තු සංඛ්‍යාත රූපකලාපත්‍රය ද, මාතෘකුක්ෂි නැමති භූමියෙහි අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, සම්ප්‍රයුක්තප්‍රත්‍යය, අවිගතප්‍රත්‍යය, යන පඨානාගත සතර ප්‍රත්‍යයකින් ඔවුනොවුන්ගෙන් ඔවුනොවුන්ට උපකාරව එකවට පිහිටන්නේය සි දතයුතු යි. එසේ අර්ථ ගතයුතු බැවින් "විඤ්ඤාණපච්චයා" යන්නෙන් ප්‍රතිසන්ධිවිඥානයද "නාමරූපං" යන්නෙන් ඒ ප්‍රතිසන්ධිවිඥානය හා එක්ව යෙදුනාවූ වේදනා සංඥා සංස්කාර යන නාමස්කන්ධත්‍රයද, කාය භාව වස්තු සංඛ්‍යාතවූ රූපකලාපත්‍රය ද, යන මේ විඤ්ඤාණ, නාම, රූප, තුන්දෙන අඟසින් බිමට දැමූ වේණුකලාපත්‍රය ඔවුනොවුන් ඉදිරිපසු නොව එකවිට භූමියෙහි පිහිටන්නාක් මෙන් ම ප්‍රත්‍යය වූ විඥානය හා ප්‍රත්‍යයෝත්පන්න වූ නාමරූපවය ද, කෙසාග්‍රයක් පමණකුදු ඉදිරිපසු නො වී එකවිට පිහිටන්නේ ය යි දත යුතු යි.

"කායකලාපය" යනු මේ ශරීරය හටගන්නා වූ මුල් ධාතුවයි. ඒ කලාපය ද පඨවී ආපො තෙජෝ වායො වණ්ණ ගන්ධ රස ඔජා" යන ශුද්ධාෂ්ටකකලාපය හා ජීවිතෙන්ද්‍රියය, කායප්‍රසාදය, යන රූපදශයකින් යුක්ත කලාපයක් වෙ යි. "භාවකලාපය" යනු ස්ත්‍රියක් වී නම් ස්ත්‍රීභාවරූපය හා සමගද, පුරුෂයෙක් වී නම් පුම්භාවරූපය හා සමග ද, කායදශකයට කීවාක් මෙන් රූපදශකකලාපයක් වෙ යි. "වස්තුකලාපය" යනු හෘදය වස්තුව හා සමග කායකලාපයට කීවාක් මෙන් දශකකලාපයක් වෙ යි.

මේ රූපකලාපත්‍රයකින් යුක්ත වූ මව්කුස හටගන්නා වූ මේ සත්ත්ව තෙමේ පළමුවෙනි දවස්හී හිමාලයවනයෙහි වසන්නාවූ එදවස් උපන් ජාතිමත් එළුවෙකුගේ බඩ මයිලක් ගෙණ ප්‍රසන්නවූ තලතෙලෙහි ගලා ඔසවා ගත් කල්හි ඒ ලොමාග්‍රයට රැස් වෙන්නා වූ තෙල්බිඳක් සමානවන්නෝය යි– "පඨමං කලලං හොති" යනාදී යක්ඛසංයුත්තකයෙහි වදාළ ගාථා අටුවායෙහි විස්තර කරණ ලද්දේ යි. එතකුදුවූවත් ඔපපාතික සත්ත්වයන්ගේ පහලවීම දහසයහැවිරිදි වයස් පමණ වූ තරුණවෙශයක් බැවින් සියලු රූපකලාපයන්ගේ පහළවීම ප්‍රතිසන්ධිවිඥානය හා සමග ඉදිරිපසු නො වී එකක්ෂණිකව සිඩවන්නේ යි. (මන්ධාතුරජජුගය,) මහාපදුමාදී පන්සියයක් පසේබුදුවරුය,

පොක්ඛරසාති බ්‍රාහ්මණයා ය, යනාදි සංසේදජසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි ද, සියලු රූපකලාපයන් හා සමග ප්‍රතිසන්ධි විඥානය ඉදිරිපසු නො වී පහළවූහ. ගබ්භසෙය්‍යකසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි රූපකලාපත්‍රයක් පහළවීම යෙභුය්‍යනයාය වශයෙන් දතයුතු යි. කුමක්හෙයින යත්? නපුංසකපණ්ඩකඋභතොබ්‍යඤ්ජනකාදි සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි භාවකලාපය හැර අවශේෂ රූපකලාපමය පහළවන හෙයිනි.

මෙ "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන පදයෙහි විභාගයයි.

—o—

"නාමරූපපච්චයා සළායතනං" යන පදයෙහි විභාග කෙසේ යත? නාමරූප සඞ්ඛ්‍යාත වූ ප්‍රතිසන්ධිවිඥානය හා සම්ප්‍රයුක්ත නාමස්කන්ධත්‍රය ඒ ප්‍රතිසන්ධිවිඥානයා හා සමග ඉදිරිපසු නො වී පහළ වන්නා වූ කාය-භාව-වස්තු සඞ්ඛ්‍යාත වූ රූපය ද යන නාමරූපමය හෙතුකොටගෙණ චක්ඛු, සොත, ඝාණ, ජිව්හා කාය, මනො" යන ආයතනයෝ සදෙන හෝ ෂඩායතන සංඛ්‍යාත වූ මනායතනය හෝ පහළවෙයි. ඒ කෙසේ පහළ වන්නාහුද යත්? ප්‍රතිසන්ධිවිඥානය හටගත් දවස පටන් සැත්තෑ සත් රැයක් ගිය කල්හි ගබ්භසෙය්‍යකසත්ත්වයන්ගේ චක්ෂුප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූපදශයකින් යුක්තවූ චක්ෂුකලාපය ද, ඊ ලඟ සතියෙහි එසේ ම ශ්‍රොත්‍රප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූප දශයකින් යුක්ත වූ ශ්‍රොත්‍රකලාපය ද, ඊ ලඟ සතියෙහි ඝ්‍රාණ ප්‍රසාදය ප්‍රධානකොට ඇති රූපදශයකින් යුක්ත වූ ඝ්‍රාණ කලාපය ද, ඊ ලඟ සතියෙහි ජිව්හාප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූප දශයකින් යුක්තවූ ජිව්හාකලාපය ද, ක්‍රමයෙන් පහළවෙත්.

ගබ්භසෙය්‍යකසත්ත්වයන්ට වනාහි ප්‍රතිසන්ධිය එක් කාමිය කින්ද හෙවත් කාය-භාව-වත්ථු යන රූපකලාපත්‍රයකින් යුක්තවූ ප්‍රතිසන්ධිවිඥානය එක් කාමියකින් පහළවූවාට පසු ප්‍රතිසන්ධියෙන් සැත්තෑසත්රැයක් නික්ම ගිය කල්හි සංසාරයෙහි දෙන ලද රූපදානමය කාමාවචර කුශලකර්මබලයෙන් හටගන්නා වූ මහාභූතයන්ගේ ප්‍රසාදය හෙවත් ඒ මහාභූතයන්ගෙන් පෙරී එන්නාවූ තෙලය සසම්භාරචක්ෂු සංඛ්‍යාත වූ මාංශගණ්ඩයෙහි ශ්වෙතමණ්ඩලයෙන් පරික්ෂිප්ත වූ කාලමණ්ඩලයාගේ මධ්‍යයෙහි අභිමුඛයෙහි සිටියවුන්ගේ රූපයන් පිලිබිඹු වන්නා වූ ප්‍රදෙශයෙහි හෙවත් මුංපියල්ලක් පමණ විශාල වූ ප්‍රදෙශයෙහි ඇස් පටලසත ගලා ගොස් පවත්නේය. ඒ ප්‍රසාදය එක් කොට ගත් කල්හි මනුෂ්‍යයන්ගේ ඇසෙහි උකුණුහිසක් පමණ වන්නේය යි

කියත්. ඒ ප්‍රසාදය ආශ්‍රය කොට නෙණ පවත්නාවූ විඥානය චක්ඛුවිඤ්ඤාණයයි කියත්. ඒ චක්ඛායතන සංඛ්‍යාතවූ චක්‍ෂු ප්‍රසාදය රූපදෘනමය කාමාවචර කුශලකර්මයෙන් පහලවූහෙයින් ඒ චක්ඛායතනය නිසා පවත්නාවූ විඥානයෙන් රූප දක්නේ වෙයි.

"ශ්‍රොත්‍රායතනය" යනු චක්ඛායතනය පහලවූ සත්ත්‍වයා අනතුරුසංසාරයෙහි සංසාරයෙහි ශබ්දදානය දීමෙන් රැස් කර ගත් කාමාවචර කුශලකර්මබලයෙන් මේ ආත්මයෙහි පහල වූ මහාභූතයන්ගේ ප්‍රසාද සංඛ්‍යාත වූ තෛලය ශ්‍රොත්‍රබිලයතුල සිහින් තඹවන් රෝමයෙන් ගැවසී ගත් ඇඟිලි මුද්දුවකට බඳු සට හන් ඇති තහරයක් වැනි වූ වස්තුවෙහි පැතිර පවත්නේය. සංසාරයෙහි ශබ්දදානමය කුශලකර්මබලයෙන් පහලවූහෙයින් ශබ්දයන් ඇඳිනගන්නාවූ විඥානය ඒ ශ්‍රොත්‍රප්‍රසාද සංඛ්‍යාත ශ්‍රොත්‍රායතනය නිසා පවත්නේ යි. එසේම සංසාරයෙහි දෙන ලද්දාවූ ගන්ධදානමය කාමාවචර කුශලකර්මයන්ගේ බලයෙන් මේ ආත්මයෙහි පහලවූ මහාභූතයන්ගේ ප්‍රසාදතෛලය නාසා සිදුර ඇතුලත එළුකුරයකට බඳු සටහන් ඇති ප්‍රදෙශයෙහි පැතිර පවත්නේය. ජිව්හායතනය" යනු සංසාරයෙහි දෙනලද රසදානමය කාමාවචර කුශල කර්මබලයෙන් මේ ආත්මයෙහි පහලවූ මහාභූතයන්ගේ ප්‍රසාදතෛලය කුල්ලකට බඳු සටහන් ඇති සසම්භාර ජිව්හාවගේ මුදුනෙහි පිහිටියාවූ තෙලුම්මල්පෙති අගක් බඳුවූ සටහන් ඇති රසදිව්වයයි ව්‍යවහාරවූ කුඩාමස්වැදැල්ලෙහි පැතිර පවත්නේය. ඒ ජිහ්වායතනසංඛ්‍යාත ජිහ්වාප්‍රසාදය රසදාන මය කුශලකර්මබලයෙන්පහලවූහෙයින් රසාලම්බණය හැඳිනගන් නාවූජිව්හාවිඥාන සංඛ්‍යාත චිත්තයාගේ පැවැත්මට උපකාර වන් නේයි. ගබ්භසෙය්‍යක සත්ත්‍වයන්ගේ කායායතන මනායතනවය ප්‍රතිසන්ධිකර්මයෙන් චක්ඛු සොත ඝාණ ජිව්හා යන ආයතනයෝ සතරදෙන යටකී නියායෙන් කර්ම සතරකින් ද පහල වෙත්මැයි ඔපපාතිකසංසෙදජ සත්ත්‍වයන්ට විනාහි උත්කෘෂ්ටකාමාවචර කුශ ලකර්මබලයෙන් ප්‍රතිසන්ධි විඥානය හා සමග මේ ෂඩායතන යෝම එකක්‍ෂණිකව පහල වෙත් මැයි. අකුශලකර්මබලයෙන් අපායාදියෙහි උපදිනා සත්ත්‍වයන්ට ද, ඒ ඒ ගතියට සුදුසු පරිද්දෙන් ඒ ඒ භවයෙහි ලැබියයුතු ආයතනයෝ ප්‍රතිසන්ධිවිඥානය හා සමග එකක්‍ෂණිකව පහල වෙත් මැයි මෙසේ තාම රූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයන්ගේ පහලවන ක්‍රමය දතයුතුයි.

---

"සළායතන පච්චයා ඵස්සො" යන පදයෙහි විභාග කෙසේ යත්? ඒ චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන ආයතන යන් හෙතුකොටගෙණ චක්ඛුසම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය, යන සයාකාර ස්පර්ශය පහල වෙයි. ඒ කෙසේ පහල වන්නේද යත්? චක්ඛායතනය රූපාලම්බණයෙහි වැද ගැන්මෙන් චක්ඛුසම්ඵස්සයද, ශ්‍රොත්‍රායතනය ශබ්දාලම්බණයෙහි වැද ගැන්මෙන් සොතසම්ඵස්සයද, ඝාණායතනය ගන්ධාලම්බණයෙහි වැද ගැන්මෙන් ඝාණසම්ඵස්සයද, ජිව්හායතනය රසාලම්බණයෙහි වැද ගැන්මෙන් ජිව්හාසම්ඵස්සය ද, කායායතනය ඵොට්ඨබ්බායතනයෙහි වැද ගැන්මෙන් කායසම්ඵස්සය ද, මනායතනය ධර්මාලම්බණයෙහි වැදගැන්මෙන් මනොසම්ඵස්සය ද; හටගන්නේය යි දතයුතුයි.

"ඵස්සපච්චයා වෙදනා" යන පදයෙහි විස්තර කෙසේ යත්? ඒ සයාකාර ස්පර්ශයන් හෙතුකොටගෙණ චක්ඛුසම්ඵස්සජා වෙදනාදි සයාකාරවෙදනාව හටගන්නේයි. එහෙයින් ඵස්සවෙදනා දෙක නිශ්චර්මගාවියෙකුට බඳු උපමා ඇත්තේය යි දක්වන ලද්දේය. මේ චක්ඛුසම්ඵස්සාදී ස්පර්ශයන් සයදෙන නො ලැබෙන්නේ වී නම් සත්වයෙක්හට ජීවත් නො විය හැක්කේමය එහෙයින් චතුර්විධාහාරයන් අතුරෙන් ඵස්සාහාරය යි මේ ස්පර්ශයට ව්‍යවහාර කෙරෙත්. යම්සේ මනුෂ්‍යයකුගේ ජීවත්වීමට කබලීකාරාහාරය සංඛ්‍යාත ආහාරඔජාව උපකාර වන්නේ ද එපරිද්දෙන් ම රූපාලම්බණයක් දැකීමය, ශබ්දාලම්බණයක් ඇසීමය, ගන්ධාලම්බණයක් සිඹීමය, රසාලම්බණයක් රසවිඳ ගැණීමය, ස්පර්ශාලම්බණයන් වැද ගැණීමය,ධර්මාලම්බණයන් මෙනෙහි කිරීමය යනමේ සයාකාර ස්පර්ශ සංඛ්‍යාත ආහාරය ද කබලීකාරාහාරය මෙන් ම සත්වයන්ගේ ජීවත්වීමට උපකාර වන්නේ යි. නොහොත් එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනු වෙදනා චෛතසිකයෝ තුමූ වෙදනා නම් වෙ යි. සඞ්ඛාර-විඤ්ඤාණ-නාම රූප-ඵස්ස-වෙදනා යන මේ ධර්මයෝ පස්දෙන විප්‍රකාරයකින් බෙදා දැක්වූ හෙයින් පළමුවන ක්‍රමය වනාහි පටිච්චසමුප්පාද විභඞ්ගපාලියෙහි සුත්තන්ත භාජනීයෙහි ආවා වූ ක්‍රමය යි. පශ්චිමක්‍රමය වනාහි එම පාලියෙහි ම අභිධර්මභාජනීය ක්‍රමය හා ධාතුකථාපාලියෙහි ආවාවූ ක්‍රමය යි.

"වෙදනා පච්චයා තණ්හා" යන පදයෙහි විභාග කෙසේ යත්? "තණ්හා" යනු ලොභ මූලික සිත් අටෙහි යෙදුනාවූ ලොභ

චෛතසිකයෝ අටදෙන මේ පටිච්චසමුප්පාදයෙහි තණ්හා නම් වෙයි, ඒ තෘෂ්ණා තොමෝ පඤ්චකාම ගුණයෙහි ඇලෙන කාම තෘෂ්ණාවය, රූපාරූප භවයෙහි ඇලෙන ශාස්වතදෘෂ්ටිය සමග හටගත් භවතෘෂ්ණාවය, උච්ඡේද දෘෂ්ටිය සමග හටගත් විභව තෘෂ්ණාවයයි ත්‍රිවිධාකාර වන්නේයි. පළමු පළමු හටගත් ලෝභ මූලික චිත්තයන් නිශ්‍රය කොට ගෙණ පසුව හටගන්නාවූ බල වත් ලෝභ මූලික සිත් අටෙහි යෙදුනු බලවත් වූ ලෝභ චෛත සිකය ද එම ලෝභ මූලික චිත්තයන් අතුරෙන් දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශල් සතරෙහි යෙදුනු දෘෂ්ටිචෛතසිකයෝ සතරදෙන ද යනමේ දැඩිලෝභය හා දැඩිවූ දෘෂ්ටිය ද යන ධර්මයෝ දෙදෙන උපාදාන නම් වේත්. මෙසේ වේදනා ප්‍රත්‍යයෙන් පළමු පළමු හටගන්නාවූ ලෝභ මූලික චිත්තයෙහි තෘෂ්ණාව ද, පසු පසුව හටගන්නා වූ බලවත් ලෝභමූලික චිත්තයෙහි හටගන්නාවූ ලෝභ දිඨි දෙදෙන ද, උපාදානනම් වන හෙයින් "වේදනා පච්චයා තණ්හා–තණ්හාපච්චයා උපාදානං" යනු කීහ.

ඒ බලවත් ලෝභ දිඨි දෙදෙන හෙතුකොටගෙණ කර්ම භවය උපප්‍රාප්තිභවය යි කියන ලද ද්විප්‍රකාරභවය හටගන්නා හෙයින් "උපාදාන පච්චයා භවො" යි කීහ. ඒ ද්විප්‍රකාර භවයන් අතුරෙන් සතලොස් ලෞකික කුශල්ය, දොලොස් අකුශල්ය,යන එකුන්තිස් චිත්තයෙහි යෙදුනු චෙතනාවෝ එකුන්තිස්දෙන කර්මභව නම් වෙයි. දෙතිස් ලෞකික විපාක චිත්තය, තත්සම්ප්‍ර යුක්තවූ පන්තිස් චෛතසිකය, කර්මජරූපයෝ විසිදෙනය යන මෙතෙක් ධර්මයෝ තුමූ උපපත්තිභව නම් වේ. ඒ උපපත්තිභවය වනාහි කාමභවය, රූපභවය, අරූපභවය, සඤ්ඤීභවය, අසඤ්ඤී භවය, නෙවසඤ්ඤීනාසඤ්ඤීභවය, එකවොකාරභවය, චතුවොකාරභවය, පඤ්චවොකාරභවයයි නව වැදෑරුම්වේ.

"කාමභවය" යනු එකොළොස් කාමභූමියයි. රූපභවය යනු සොළොස් රූපාවචර භූමිය යි. අරූපභවය යනු සතර අරූතලය යි. "සඤ්ඤීභවය" යනු එකොළොස් කාමභූමිය, අසංඥතලය හැර අවශෙෂ පසළොස් රූතලය ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය යන මෙතෙක් භූමිහු සඤ්ඤීභව නම් වෙයි. "අසඤ්ඤීභවය" යනු එකම අසඤ්ඤී තලයයි. "නෙවසඤ්ඤීනාසඤ්ඤී භවය" යනු භවාග්‍ර සංඛ්‍යාත සතරවෙනි අරූතලයයි. එකවොකාරභවය යනු අසංඥතලයයි. චතුවොකාර භවය" යනු සතර අරූතලයයි. "පඤ්චවොකාරභවය" යනු අවශෙෂ පසළොස් බ්‍රහ්මභූමිය හා එකොළොස් කාමභූමි

යසි. මේ නවසත්ථානය වනාහි උපපත්තිභවයයි කියාද, නව සත්තාවාසයයි කියාද, ව්‍යවහාර කෙරෙත්. මෙසේ දැඩිවූ තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත උපාදානයන්ගේ උපකාරයෙන් එකුන්තිස් කුශලාකුශල චේතනා සංඛ්‍යාතවූ කර්මභවය හා එකුන්තිස් චේතනාවන්ගේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දීමට සුදුසු එක්තිස් තලයකින් යුක්තවූ නවසත්තාවාසය යි කියනලද උපපත්ති භවය පහල වෙයි.

"භවපච්චයා ජාති" යන්නෙහි භවශබ්දයෙන් උපපත්ති භවය හැර කර්මභවය පමණක් ගතයුතුයි. එහෙයින් එකුන්තිස් චේතනා සංඛ්‍යාත කර්මභවයාගේ උපකාරයෙන් එක්භවයෙක්හි ඇතුලත්වූ ස්කන්ධපරම්පරාවගේ පළමුවන හටගැණීම් සඞ්ඛ්‍යාත ජාතිය පහළ වෙයි. ඒ ජාතිය වනාහි "ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති" යනාදී පර්‍ය්‍යාය වචනයන්ගෙන් ව්‍යවහාර කෙරෙත්.

"ජාතිපච්චයා ජරාමරණං" යන්නෙහි අභිප්‍රාය මෙසේයි:— භවයෙහි හටගත් ස්කන්ධ සඞ්ඛ්‍යාත ආත්මභාවයාගේ දත් වැටීමය, හිසකේ පැසීමය, ඇඟ රැලි නැගීමය, ලේ මස් විනාශවීගොස් සැරයටියක් පිළිසරණකොට ගැණීමය, ශරීරය වෙව්ලීමය, පාව තත් උත්තානසෙය්‍යක ළදරුවෙකු මෙන් ඇඳක් පිට උඩුබැලිව සයනය කිරීමය, යනාදී ලක්ෂණයන්ගෙන් යුක්තවූ ජරාව හා එක් භවයකින් වෙන්කරණ ලද ස්කන්ධයන්ගේ බිඳීමය, භවයෙන් ගිලිහීමය, "චුති චවනතා භේදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා" යනාදී නොයෙක් පර්‍ය්‍යාය නාමයෙන් මරණය ව්‍යවහාර කෙරෙත්. "ජාතිපච්චයා ජරාමරණං" යනුවෙන් ද්වන්ද සමාසය මෙන් කොට "සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්සුපායාසා" යන දෙවෙනි ද්වන්දසමාස පදයකින් කුමක් හෙයින් වදාළේද යත්? ජාතිහුගේ ප්‍රධාන ඵලය උපන්නාවූ කිසි සත්වයෙක්හට නො වැළැක්විය හැකි බැවින් ඒ ධර්මයෝ දෙදෙන එක් සමාසයක් කොට බුදු පසේබුදු මහරහත් ආදී ඇතැම් උත්තම සත්වයන්ට නො ලැබෙන්නාවූ "සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්සුපායාසා" යන ධර්මයෝ එක් සමාසයක් කොට ද වදාළේයි. මෙසේ මේ ධර්මයන්ගේ ප්‍රධාන අප්‍රධාන මුඛ්‍ය අමුඛ්‍ය භාව සඞ්ඛ්‍යාතවූ විරුද්ධ විශභාගභාවය හෙතුකොටගෙණ එකම සමාස පදයක් නො වදළේයයි දතයුතුයි.

මේ ජාති ජරා මරණ අර්ථයෝ තුන්දෙන 'ජාති ද්වීහි ඛන්ධෙහි' යනාදීවූ ධාතුකථා පාලියෙහි වදාළාක්මෙන් සඞ්ඛත ලක්ෂණවූ උප්පාදට්ඨිති භඞ්ග සඞ්ඛ්‍යාත අප්‍රකට ජාතිය හා ජරා මරණයෝ ද

ගතයුත්තාහුය. හෙවත් සියලු නාමරූප ධර්මයන්ගේ උප්පාදස්ථිති භඞ්ග සංඛ්‍යාතවූ නිතර ඉපදීමය, නිතර සිටීමය, නිතර බිඳීම යයි කියනලද අප්‍රකට ජාති ජරා මරණයෝ වනාහි ලෝකයෙහි ජාති ජරා මරණ යයි නොසලකන හෙයින් ත්‍රිවිධ සංඛත ලක්ෂණයයි කියනලද “උප්පාදො පඤ්ඤායති වයො පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති” යනුවෙන් සූත්‍රාන්තයෙහි වදාළ ජාති ජරා මරණයෝ මේ පටිච්චසමුප්පාදයෙහි ගතයුත්තාහුය. මෙහි වනාහි ලෝකයෙහි ප්‍රකටවූ සත්ත්වයාගේ උත්පත්තිය හා “ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා” යනාදීන් දක්වනලද ජරාවද, “චුති චවනතා භෙදො” යනාදීන් වර්ණිතා කරණලද මරණයද මෙහි ලැබෙන්නේයි. සච්චවිභඞ්ගයෙහි:— පටිච්චසමුප්පාදවිභඞ්ගය, සම්මොහවිනොදනී අර්ථකථාවය, විශුද්ධිමාර්ග අර්ථකථාවය, යන ස්ථානත්‍රයෙහි ආවාවූ විස්තරකථාව ඉගෙණ ගතයුතුයි. සීලක්ඛන්ධ වර්ගයෙහි බ්‍රහ්මජාලසූත්‍රාන්ත කථාටීකාවන්හි “ජාතීති පනෙත්ථ සවිකාරා පඨමක්ඛන්ධා දට්ඨබ්බා” යනු කීහ. එහි අර්ථ නම්:—එත්ථ පන, මේ පටිච්චසමුප්පාදපාලියෙහි වනාහි; සවිකාරා, ජාතිරූප සංඛ්‍යාතවූ විකාර රූපය සමග හටගත්තාවූ; පඤ්චක්ඛන්ධා, පඤ්චස්කන්ධයෝ; ජාතීති දට්ඨබ්බා, ජාතියයි දත යුත්තීය. ද්වාදසාඞ්ගපටිච්චසමුප්පාදයෙහි නාමය හා රූපය එක්කොට ගෙණ නාම රූප සංඛ්‍යාතවූ සතරවෙනි අඞ්ගය හටගත්තාක්මෙන් ජරාව හා මරණය එක්කොට ගෙණ ජරා මරණ සංඛ්‍යාතවූ දොළොස්වන අඞ්ගය හටගත්තේයි. බ්‍රහ්මභූමියෙහි වනාහි ජාති ඇත්තේ නමුදු සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්සුපායාසයෝ නැත්තාහු වෙත්. කුමක් හෙයිනයත්? ඒ ධර්මයන් කාමතෘෂ්ණාව පිළිබඳව හටගන්නා හෙයිනි. ශොකාදීහු තුමූ ජාතියගේ මුඛ්‍යඵලය නොවන හෙයින් වෙනම අඞ්ගයක් වශයෙන් නො දක්වන ලදහ. එසේ හෙයින් සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්සුපායාසයෝ වනාහි ජරා මරණ සංඛ්‍යාත දොළොස්වන අඞ්ගයෙහිම ඇතුලත් කටයුත්තාහු යයි අර්ථකථාචාරීහු කියත්. සොකාදීහු වනාහි කුමක් හෙයින් කියන ලදහුද යත්? “සොකාදයො චෙත්ථ භවචක්කස්ස අවිච්ඡෙද දස්සනත්ථං වුත්තා” යනු අටුවා බැවින් සොකාදීන්ගේ හටගැණීම කාරණකොට ගෙණ ඒ ශොකාදීහු ප්‍රත්‍යයකොට ගෙණ අවිද්‍යාව හටගන්නා හෙයින් පටිච්චසමුප්පාද චක්‍රයාගේ නොසිඳ පැවතීම දක්වනු පිණිස සොකාදීහු වදාරණ ලද්දාහු යයි දත යුතුයි.

අවිද්‍යාව වනාහි ප්‍රත්‍යයක් නැතිව හටගන්නේවී නම් භවචක්‍රය සිඳින්නේ වෙයි. ක්ලේශවෘත්තය, කර්මවෘත්තය, විපාක

වෘත්තය යන ත්‍රිවිධ වෘත්තයන් අතුරෙන් මේ අවිද්‍යා සඞ්ඛ්‍යාත ක්ලේශවෘත්තය ආදියෙහි තබා දේශනා කෙළේයි. එතකුදු වුවත් “ආසවසමුදයා අවිජ්ජාසමුදයො” යනාදී දේශනා පෙළෙහි ආ ක්‍රමයෙන් චතුරාශ්‍රවයන් හේතුකොටගෙණ නැවත අවිද්‍යාව හටගන්නා හෙයින් ඒ ආශ්‍රවයන් හා අවිද්‍යාව සම්බන්ධ වන්නේයි. ජරා මරණ සඞ්ඛ්‍යාතවූ අඞ්ගයට ඇතුළත් වන්නාවූ සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස-උපායාසයන් අතුරෙන් දොම්නස් සහගත දෙසිතෙහි යෙදුනාවූ වේදනා චෛතසික තෙමේ සොක නම් වෙයි. “දොමනස්සය” යනුද එට නමකි. ඥාති මිත්‍ර අඹුදරු ආදීන්ගේ විනාශයෙන් හටගන්නාවූ විප්‍රලාප චිත්තජ ශබ්ද තෙමේ පරිදෙව නම් වේ. දුක්ඛසහගත කායවිඥානයෙහි යෙදුනු එකම දුක්ඛ වේදනාව දුක්ඛ නම් වෙයි. දෝසමූලික දෙසිතෙහි යෙදුනු ද්වේෂ චෛතසිකය උපායාස නම් වෙයි. මෙසේ එකම දෝසමූලික චිත්තයෙහි යෙදෙන වේදනා චෛතසිකය දොමනස්සයයි කියාද එම චිත්තයෙහි යෙදෙන ද්වේෂ චෛතසික තෙමේ උපායාස යයිද නම් වෙයි. මෙසේ ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ අවබොධ කටයුතුයි.

යථොක්ත ක්‍රමයෙන් පටිච්චසමුප්පාදයෙහි අතීතාදී කාලත්‍රයක් ඇති හෙයින් “තයො අද්ධා ද්වාදසඞ්ගානි වීසතාකාරා තිසන්ධි චතුසඞ්ඛෙපා තීණි වට්ටානි ද්වෙමූලානි ච වෙදිතබ්බානි-යනාදිය කීහ. එහි අද්ධත්‍රය නම්:—අතීත-අනාගත-වර්තමාන” කාලත්‍රයයි දතයුතුයි. අතීත අද්ධව නම්:—අවිද්‍යාසංස්කාරයෝ අතීත අද්ධව නම් වෙයි. ජාති-ජරා-මරණ-යන තුන අනාගත අද්ධව නම් වෙයි. මධ්‍යයෙහි ධර්මයෝ අටදෙන ප්‍රත්‍යුත්පන්න අද්ධව නම් වෙයි. අවිද්‍යා සංස්කාර, විඥාන, නාම, රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ යන දොළොස්දෙන ද්වාදස අඞ්ගයෝ නම් වෙත්. මේ පටිච්චසමුප්පාදයෙහි වනාහි ඒ ද්වාදස අඞ්ගයන්ගෙන් අධිකවූ සොකය ආදිකොට ඇත්තාවූ උපායාසය අවසන්කොට ඇත්තාවූ ධර්මයෝ තුමූ ජාතිහුගේ අමුඛ්‍යඵලය දක්වනු පිණිස කියනලද්දේ යයි දතයුතුයි.

ද්වාදශ අඞ්ගයන් අතුරෙන් අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ගැණීමෙන් තදන්‍යාවෘත්තන්‍යායෙන් හෙවත් එකාබද්ධව පවත්නා හෙයින් තෘෂ්ණා, උපාදාන, භවයෝද ගන්නා ලද්දාහු වෙත්. ඒ තෘෂ්ණා උපාදාන භවයන්ගේ ගැණීම හේතුකොට ගෙණ යට කී තදන්‍යාවෘත්තන්‍යායෙන් අවිද්‍යා-සංස්කාරයෝද ගන්නා ලද්දාහු

වෙත්. ජාති, ජරා, මරණයන්ගේ ගැණීමෙන් විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා යන ධර්‍ම පඤ්චකයද ගන්නා ලද්දේයි. මෙසේ නන්ද්‍යාවර්‍තනයෙන් නොකියන ලද්දවූ ධර්‍මයන්ගේ ගැණීම වන හෙයින් අතීතභවයෙහි හෙතූහු පස්දෙනය දුන් ප්‍රත්‍යුත්පන්නභවයෙහි ඵලපඤ්චකය, ප්‍රත්‍යුත්පන්න භවයෙහි හෙතුපඤ්චකය, අනාගතභවයෙහි ඵලපඤ්චකයයි යන මේ ආකාරයෝ විස්සක්ද වෙත්. ඒ හෙතුඵලයන්ගේ සම්බන්ධය තුන් ස්ථානයක වන හෙයින් සන්ධිත්‍රයක්ද වෙත්. ඒ සන්ධිත්‍රයෙන් වෙන් කරණ ලද්දවූ සංක්ෂෙපයෝ සතරක්ද වෙත්. අවිද්‍යාවය, තෘෂ්ණාවය, උපාදානය, යන මොව්හු තුන්දෙන ක්ලෙශවර්‍තන නම් වෙයි කර්‍මභව යයි කියනලද්දවූ භවයාගේ එක් ප්‍රදෙශයෙක් හා සංස්කාරයෝද කර්‍මවර්‍තන නම් වෙයි. උපපත්තිභව සංඛ්‍යාත වූ භවයාගේ එකදෙශයක් හා විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා-ජාති-ජරා-මරණයෝ තුමූ විපාකවර්‍තන නම් වෙයි. මෙසේ ත්‍රිවිධවර්‍තනයෝ දතයුත්තාහුය. අවිද්‍යා-තෘෂ්ණා දෙදෙන මේ භවචක්‍රයාගේ මූලයෝ නම් වෙත්. හෙවත් පූර්‍වාන්තයට අවිද්‍යාව හා අපරාන්තයට භවතෘෂ්ණාවද මුල් වන්නාහුය. ඒ ද්විප්‍රකාර මූලයන්ගේ අර්‍හත්මාර්‍ගය සංඛ්‍යාතවූ අසනි ප්‍රහාරයෙන් විනාශකරණ හෙයින් වර්‍තන සංඛ්‍යාතවූ සියලු දුක්ඛය නිරුද්ධවෙයි. ජරා මරණ සංඛ්‍යාතවූ මූර්ඡාව හෙතුකොට හෙණ හෙවත් නැවත නැවත උපදනා හෙයින් ඒ හෙතුකොට ගෙණ අවිද්‍යාව පවත්නේයි.

මේ පටිච්චසමුප්පාදස්ථානයෙහි අවිද්‍යා තොමෝ සමුදයසත්‍ය නම් වෙයි. සංස්කාර තෙමේ අවිද්‍යා සංඛ්‍යාතවූ සමුදය සත්‍යයෙන් පහළවන්නාවූ විපාකභූතවූ සමුදයසත්‍ය නම් වෙයි. විඥාන තෙමේ සංස්කාර සංඛ්‍යාතවූ සමුදයසත්‍යයෙන් හටගන්නාවූ දුඃඛසත්‍යනම් වෙයි. නාමරූප තෙමේ විඥාන සංඛ්‍යාතවූ දුඃඛ සත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. සළායතන තෙමේ නාමරූප සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හට ගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. ඵස්ස තෙමේ තෙමේ සළායතන සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. වේදනා තොමෝ ඵස්ස සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. තෘෂ්ණා තොමෝ වේදනා සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ සමුදයසත්‍ය නම් වෙයි. උපාදාන තෙමේ තෘෂ්ණා සංඛ්‍යාතවූ සමුදය සත්‍යයෙන් හටගන්නාවූ විපාකභූත

වූ සමුදයසත්‍ය නම් වෙයි. භව තෙමේ උපාදාන සංඛ්‍යාතවූ සමුදය සත්‍යයෙන් හටගන්නාවූ සමුදයසත්‍යය දුඃඛසත්‍යයෝ නම් වෙත්. ජාතිතොමෝ කර්මභව සංඛ්‍යාතවූ සමුදයසත්‍යයෙන් හටගන්නාවූ දුඃඛසත්‍ය නම් වෙයි. ජරාමරණ තෙමේ ජාති සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛ සත්‍ය නම් වේ. මේ පටිච්චසමුප්පාදයෙහි මෙසේ දක්වනලද්දවූ සත්‍යවිභාගය වනාහි පටිච්චසමුප්පාදවිභඞ්ග, අභිධම්මභාජනී පාලිය ආශ්‍රයකොට ගෙණ සම්මොහවිනොදනී නම් අටුවාවෙහි ආවාවූ සූත්‍රාන්තභාජනීනය හා සදෘශවූ විභාගයයි දත යුතුයි.

අවිද්‍යා තොමෝ රූපධර්මය-නාමධර්මය-චතුස්සත්‍යය-යනාදී වූ ධර්මයන් නො දක්නා හෙයින් අන්ධයෙකුගේ රූපයන් නොදැකීමක් මෙන් දතයුතුයි. සංස්කාර තෙමේ විෂමවූ භූමියෙහි ඒ අන්ධයාගේ පය පැකිලීමක් මෙන් දතයුතුයි. විඥාණ තෙමේ ඒ අන්ධයාගේ පය පැකිලීමෙන් උඩුබැලිව වැටීමක් මෙන් දත යුතුයි. නාමරූප තෙමේ ඒ අන්ධයාගේ වැටීම හෙතුකොට ගෙණ ශරීරයෙහි හටගත් ගඩක් මෙන් දත යුතුයි. ෂඩායතන තෙමේ පළමුවෙන් හටගත් ඒ ගඩෙහි නැවත හටගන්නාවූ බිබිලි සයක් මෙන් දතයුතුයි. ස්පර්ශ තෙමේ පළමුවෙන් හටගත් ඒ ගඩ හා නැවත හටගන්නාවූ ඒ බිබිලි සයද ඇස් අන්ධවූ හෙයින් යම් කැණු කටු ආදියක හැපීමක් මෙන් දතයුතුයි. වෙදනා තොමෝ ඒ කැණු කටු ආදියෙහි හැපීමෙන් හටගත් බලවත්වූ දුකක්මෙන් දතයුත්තීය. තෘෂ්ණා තොමෝ ඒ ගඩයට පිළියම් කරණු කැමැත්තක් මෙන් දතයුත්තීය. උපාදාන තෙමේ බලවත්වූ වෙදනාව ඉවසාගත නොහී අපථ්‍යවූ විෂ බෙහෙදක් ගැණීමක් මෙන් දතයුතුයි. භවතෙමේ අපථ්‍යවූ විෂබෙහෙත ගඩයෙහි ආලෙප කිරීමක් මෙන් දතයුතුයි. ජාති තොමෝ ඒ අපථ්‍යවූ විෂ බෙහෙත ආලෙප කිරීමෙන් ඒ ගඩ මහත්වීමක් මෙන් දතයුත්තීය. ජරා මරණ තෙමේ ඒ මහත්වූ ගඩ පිපිරීමක් මෙන් දත යුතුයි.

තවද මේ පටිච්චසමුප්පාදයෙහි එකත්තනය, නානත්තනය, අබ්‍යාපාරනය, එවංධම්මතානය, යන සතරන්‍යාය ක්‍රමයකින් දතයුතුයි. ඔවුන් අතුරෙන් "එකත්තනය" යනු හෙතුඵල දෙදෙනාගේ සම්බන්ධය ඇති හෙයින් බිජුවට තෙමේ වෘක්ෂයාගේ භව ගැණීම එලවයි. ඒ බිජුවට තෙමේ වෘක්ෂයාගේ හටගැණීම් සංඛ්‍යාතවූ හෙතුඵලදෙදෙනාගේ එකත්වය ඇතිවාක් මෙන්ම අවිද්‍යාව හෙතුකොටගෙණ සංස්කාරය ද; සංස්කාරහෙතුවෙන්

විඥානයද; යනාදී ක්‍රමයෙන් හේතුඵල දෙදෙනාගේ එකසම්බන්ධයෙන් හටගැණීම එකත්වනය නම් වෙයි. "නානත්වනය" යනු අවිද්‍යාසංස්කාරාදීහු තුමූ පරම්පරාව නො සිඳ පවත්නාහු තමුදු ඔවුන්ට ඔවුනොවුන් වෙනස් වන්නාහු මැයි. හෙවත් අවිද්‍යාව ස්වභාව ප්‍රතිච්ඡාදක ලක්ෂණයෙන් යුක්තවෙයි. සංස්කාරය රාශීකරණ ලක්ෂණයෙන් යුක්තවෙයි. මේ ආදී ක්‍රමයෙන් අවිද්‍යාදී ද්වාදශාඞ්ගයන්ගේ ලක්ෂණය හා කෘත්‍යයද ආසන්න කාරණය හා ඵලයද ඔවුනොවුන්ට ඔවුනොවුන් වෙනස්ව පවත්නාහු වෙති. මේ නානත්වනයයි. "අව්‍යාපාරනය" යනු සංස්කාරාදී විපාකය මා විසින් උපදවනු ලබන්නෙමි යි—අවිද්‍යාවගේ කිසි ව්‍යාපාරයක් නැත්තේයි. මේ අවිද්‍යාවට කී නයින් ම අවශේෂ එකොළොස් අඞ්ගයන්ගේද ව්‍යාපාරයක් හෝ (උත්සාහයක්) හෝ නැත්තේයි. ඒ ඒ ස්වභාවය නියම වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ හටගැණීම් මාත්‍රයක් අව්‍යාපාර නම් වෙයි, "එවං ධම්මතානය" යනු මෙසේ ව්‍යාපාරයක් නැත්තේ තමුදු හේතුවෙන් ඵලය හටගන්නේ තමුදු අනික් හේතුවකින් අනික් ඵලයක්හුගේ හටගැණීමක් හෝ අනියම වශයෙන් නො වන්නේමය. හෙවත් කිරෙන් දී හටගැණීමක් මෙන් ද, කිරෙන් තලතෙල් හට නො ගන්නාක්මෙන් ද, තලඇටයෙන් තලතෙල් හට ගන්නාක් මෙන්ද, වැලියෙන් තෙල් හට නො ගැණීමක් මෙන්ද අවිද්‍යාදී හේතූන් කාරණකොටගෙණ සංස්කාරාදි සුදුසු ඵලයක් හටගන්නේ මය. හෙවත් අවිද්‍යාවෙන් කුශලාකුශල කර්මයන් මුත් අනිත් ධර්මයක් නූපදනා හෙයින්ද ඒ ඒ හේතූහුගේ ඒ ඒ ඵලය නියම වශයෙන් හටගන්නා හෙයින් ඒ හටගැණීම "එවං ධම්මතානය" නම් වෙයි. මෙසේ අවිද්‍යාදී ද්වාදශාඞ්ගය, විසි ආකාරය, ත්‍රිසන්ධිය, වෘත්තයෝ තුන්දෙනය, සංක්ෂේපයෝ සතර දෙනය, සත්‍යයෝ දෙදෙනය, යනාදීවූ විභාගය වෙන් වෙන් කොට අවබෝධ කටයුත්තේ යි.

මේ පටිච්චසමුප්පාද සංඛ්‍යාත වූ භවචක්‍රය අවබෝධ නො කරණ තාක් කල් මුළුල්ලෙහි. සංසාරය නො ඉක්ම වන්නේය යි දතයුතුයි. එහෙයින් එතස්සචානන්ද! ධම්මස්ස අඤ්ඤාණා අනනුබොධා එවමිමං පජා තන්තාකුලකජාතා ගුලාගණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති" යනු දීඝනිකාය මහානිදාන සූත්‍රයෙහි දේශනා කොට වදාළේ යි. එහි අර්ථ මෙසේ යි. ආනන්ද! ආනන්දයෙනි! එතස්ස ධම්මස්ස, ඒ ප්‍රතීත්‍ය සමුත්පාදධර්මය; අඤ්ඤාණා, නො

දැනීමෙන් අනනුබෝධා, අවබෝධ නො කිරීමෙන්; අසංපජා, මේ ප්‍රජා තොමෝ; එවං, මෙසේ; තන්තාකුලකජාතා, අවුල් වූ නූල්වැලක් මෙන් වෙයි. ගුලාගණ්ඨිකජාතා, ගුල නම් පක්ෂීන්ගේ කැදැල්ලකට බඳු වූවා වෙයි. මුඤ්ජබබ්බජභූතා, මුදුතණ බබුස්තණයෙන් හඹරණ ලද්දා වූ රැහැණකට බඳුවෙයි. මෙසේ වූ ප්‍රජා තොමෝ "අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති" යනු සම්බන්ධයි. නාමරූප සංඛ්‍යාතවූ භවචක්‍රයෙහි හටගන්නාවූ පූර්ව කොටිය නො පෙණෙන්නා වූ වෘතධර්ම සංඛ්‍යාත පටිච්චසමුප්පාද ධර්මචක්‍රයෙහි කාලත්‍රය, ද්වාදසාඞ්ගය, විසත්‍යාකාරය, සන්ධිත්‍රය, සංක්ෂේප සතරය, වෘතයෝ තුන්දෙනය, මූලයෝ දෙදෙනය, සත්‍යයෝ දෙදෙනය, යනමේ විශේෂ විභාග දත යුත්තේයි.

ඒ පටිච්චසමුප්පාදයෙහි "අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව," යන අතීතහෙතු පඤ්චකය යි කියන ලද්දා වූ ආකාර පසෙක. "විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා" සංඛ්‍යාතවූ ප්‍රත්‍යුත්පන්නඵල පසෙකැයි කියන ලද්දාවූ ආකාර පසෙක. තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සංඛාර" සංඛ්‍යාත වූ ප්‍රත්‍යුත්පන්නහෙතු පසෙකැයි කියන ලද්දාවූ ආකාර පසෙක. "ජාති, ජරා මරණ" සංඛ්‍යාතවූ ශක්ති ස්වභාව ගැණීම් වශයෙන් ගන්නා ලද්දාවූ" විඤ්ඤාණ නාමරූප, සළායතන, ඵස්ස වෙදනා" සංඛ්‍යාතවූ අනාගත ඵලපඤ්චකයයි කියන ලද්දාවූ ආකාර පසෙක, මෙසේ විංශත්‍යාකාරය දතයුතුයි.

මෙසේ මේ හෙතුඵලයන්ගේ හා ඵලහෙතූන්ගේ ද, නැවත ත් ඵලහෙතූන්ගේ ද සම්බන්ධත්‍රය සන්ධිත්‍රය යි. මේ හෙතු ඵල පඤ්චකයන්ගේ චතුෂ්කය සතර සංක්ෂේපය යි. "ජාති ජරා මරණ" යනු ප්‍රකට ජාති ප්‍රකට ජරා ප්‍රකට මරණද ගෙණ විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වෙදනාවන්ගේ උත්පාදස්ථිතිභඞ්ග යන ලක්ෂණත්‍රයද ගෙණ ජාති ජරා මරණය යි දතයුතු යි. අතීත හෙතූන් පස්දෙනා අතුරෙන් අවිජ්ජාසංඛාර දෙදෙන පටිච්චසමුප්පාදපාලියෙහි වදාරණ ලද්දේයි. තණ්හා, උපාදාන, භව, යන තුන්දෙන අතීතාර්ථයෙහි නොවදාළේ තමුදු දිව්‍ය මනුෂ්‍යයන්ගේ සියලු උපභෝග පරිභෝග සම්පත්තීන්ගේ අනිත්‍යය දුඃඛය අනාත්මස්වභාවය අශුභස්වභාවය විපරිණාම ස්වභාවය යන මේ ස්වභාවයන්ගේ හටගැන්ම අවිද්‍යාවෙන් වැසී තිබෙන හෙයින් දිව්‍ය මනුෂ්‍යයන්ගේ ස්වර්ගී සම්පත් ආදියෙහි ඇලීම තණ්හා නම් වේ ඒ තණ්හාව දියුණු කල්හි උපාදාන නම් වෙයි. ඒ උපාදානය හෙතුකොටගෙණ කුශලාකුශලයන්ගේ රැස් කිරීම

භවනම් වෙයි. මෙසේ අවිද්‍යා-සංස්කාර දෙදෙන සෘජුව දෙශනා කළ හෙයින් තෘෂ්ණා-උපාදාන-භවයෝ ද ඒ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගෙන්ම ලැබෙන්නේය.

මේ අතීත හෙතූන් අතුරෙන් “තණ්හා, උපාදාන, භව” යන තුන්දෙන අවිද්‍යා-සංස්කාරයන් මෙන්ම පූර්වභවයෙහි හට ගත් හේතුධර්මය යි දතයුතුයි. එහෙයින් සම්මොහ විනොදනී අටුවාවෙහි:-“පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉති ඉමෙ පඤ්චධම්මා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා” යනුවෙන් පටිසම්භිදා මාර්ගයෙන් උදුරා ගෙණ සාධක වශයෙන් උදාහරණ කෙළේ යි. එහි අර්ථ මෙසේයි. පුරිම කම්ම භවස්මිං, පූර්වවූ කර්මභවය රැස් කරන්නා වූ කල්හී, මොහො, මුළා බැව් සංඛ්‍යාත මොහ තෙමේ; අවිජ්ජා, අවිද්‍යා නම් වෙයි. ආයූහනා, රැස්කිරීම් සංඛ්‍යාත වූ පූර්වපක්ෂයෙහි පැවති චෙතනා තොමෝ; සංඛාරා, සංස්කාරයෝ නම් වෙත්. නිකන්ති, රැස් කරණ ලද්දාවූ කර්මයාගේ විපාකවූ උපප්‍රාප්තිභවයෙහි ඇලීම, තණ්හා, තෘෂ්ණා නම් වෙයි. උපගමනං, දෘඪවශයෙන් අල්වා ගැණීම, උපාදානං, උපාදාන නම් වෙයි. චෙතනා, මුඤ්චනචෙතනාව පටන් පසු භාගයෙහි හටගන්නා වූ චෙතනා තොමෝ; භවො, භවනම් වෙයි. ඉති ඉමෙ පඤ්චධම්මා, මෙසේ මේ පඤ්චප්‍රකාරවූ ධර්මයෝ තුමූ; පුරිමකම්මභවස්මිං, පූර්වජාතියෙහි කර්මය රැස් කරන්නාවූ කල්හී; ඉධ පටිසන්ධියා, මේ භවයෙහි ප්‍රතිසන්ධිහුගේ; පච්චයා හොන්ති, ප්‍රත්‍යයෝ වෙත්. මේ අතීතහෙතු පස්දෙනා අතුරෙන් “සංඛාර භව” යන දෙදෙනාගේ විශෙෂ නම්:-දනක් දෙම්හයි කල්පනා කොට මසක් හෝ අවුරුද්දක් හෝ මුළුල්ලෙහි දානවස්තූආදිය සකස්කරන්නා වූ කල්හි නිරතුරු උපදින්නා වූ කාමාවචර කුශල චිත්ත සම්බන්ධවූ පූර්වචෙතනා තොමෝ සංස්කාර නම් වෙ යි. ඒ දානය පිළිගන්වන්නාවූ කල්හී උපදින්නාවූ මුඤ්චන චෙතනා තොමෝ භව නම් වෙයි. මේ එක් ක්‍රමයකි.

තවද එකම චිත්තවීථියෙහි සත්ජවනයන් අතුරෙන් පළමුවන දෙවන තුන්වන සතරවන පස්වන සවන ජවනයන් සම්බන්ධවූ චෙතනා තොමෝ සංස්කාර නම් වෙයි. සත්වන ජවනය සම්බන්ධවූ චෙතනා තොමෝ භව නම් වෙයි. මේද එක් ක්‍රමයක.

තවද යම්කිසි ලෞකික කුශලාකුශල චෙතනා කෙනෙක් වෙත්ද, ඒ සියලුම ලෞකික කුශලාකුශල චෙතනාවෝ තුමූ භව

නම් වෙයි. ඒ චිත්තයෙහි යෙදෙන්නාවූ අවශෙෂවූ ස්පර්ශාදි චෛතසික ධර්මයන් හා සමග යෙදුනාවූ චිත්තක්ෂණයෝ සංඛාර නම් වෙත්–යන මේ අර්ථය පටිසම්භිදා මාර්ගයෙහි ආයේයි.

තවද යම්කිසි ලෞකික කුශලාකුශල කෙනෙක් චේතද ඒ සියලු චේතනාවෝ සංස්කාර නම් වෙත්. ඒ චේතනාව හා එක්ව යෙදුනාවූ අවශෙෂ චිත්තචෛතසිකයෝ තුමූ භව නම් වෙත් මේ අර්ථය වනාහි පටිච්චසමුප්පාද විභඞ්ග පාළියෙහි ආයේය. ප්‍රත්‍යුත්පන්නඵලපඤ්චකයයතු පටිච්චසමුප්පාද පාලියෙහිසෘජුව වදාලේයි. ඒමෙසේයි. "ඉධ පටිසන්ධිවිඤ්ඤාණං, ඔක්කන්ති නාම රූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉති ඉමෙ පඤ්චධම්මා ඉධුප්පත්ති භවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා"ති" යනු කියා. ඉධ, මේ ප්‍රත්‍යුත්පන්නභවයෙහි; පටිසන්ධි, පූර්වපශ්චිමභවවය එක්ක් මෙන් ගලපන්නාවූ පටිසන්ධි සිත් තෙමේ; විඤ්ඤාණං, විඤ්ඤාණ නම්වේ. ඔක්කන්ති, අවුත් ඇතුලත් වීමක් මෙන් නාමරූපධර්මයන් මව්කුස්හි බැස ගැන්ම; නාමරූපං, නාමරූප නම් වේ. පසාදො, චක්ෂුරාදී පඤ්ච ප්‍රකාර ආයතන තෙමේ; ආයතනං, ආයතන නම්වේ. ඵුට්ඨො, අරමුණට නැගීමක් මෙන් හටගන්නාවූ ස්පර්ශචෛතසිකතෙමේ; ඵස්සො, ඵස්ස නම් වේ. වෙදයිතං, ස්පර්ශය හා සමග හටගන්නාවූ වේදනා චෛතසික තෙමේ; වෙදනා, වේදනා නම්වේ. ඉති ඉමෙ පඤ්චධම්මා, මේ පඤ්චප්‍රකාරවූ ධර්මයෝ තුමූ; පුරෙ කතස්ස පූර්වභවයෙහි රැස් කරණ ලද්දාවූ; කම්මස්ස පච්චයා, කර්මයාගේ හෙතුහු වෙත්. ඉධ, මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි; උප්පත්ති භවස්මිං, උපපත්තිභව සංඛ්‍යාතවූ මේ ලැබුන භවයෙහි;හොන්ති වෙත්. අතීත පඤ්චහෙතුව දක්වූ සන්ධානයෙහි මෙන්; ඉති ඉමෙ පඤ්චධම්මා, මේ පඤ්චප්‍රකාර ධර්මයෝ තුමූ; පච්චයා, ප්‍රත්‍යයෝ වෙත් යයි අර්ථ කොදිය යුතුතේයි

මේ සන්ධානය වනාහි ශබ්ද වශයෙන් සමානවූ අර්ථ වශයෙන් අසමානවූ පාඨයකැයි දතයුතුයි. "කම්මස්ස පච්චයා" යන්නෙහි පළමුවෙනි අර්ථය අභෙදභෙදූප චාරවශයෙන් ගත යුතුයි. විකල්ප වශයෙන් "පච්චයා" යන පදයාගේ අර්ථය උපකාර කිරීම් සඞ්ඛ්‍යාතවූ ශක්තිහෙතුවයයි දතයුතුයි. විතීයාර්ථය වනාහි ශබ්දනීතිකාරකකාණ්ඩයෙහි දක්වන ලද්දාවූ "අන්නස්ස හෙතු අන්නස්ස කාරණා"යනාදී උදාහරණයෙහි මෙන්"කම්මස්ස" යන්නෙහි ෂෂ්ඨීවිභක්තිය කරණාර්ථයෙහි වන්නේයයි දත යුතුයි. ප්‍රත්‍යුත්පන්න හෙතුන් පස්දෙනා අතුරෙන්" තෘෂ්ණා,

"උපාදාන, භව" යන තුන්දෙන මෙන් අවිද්‍යා-සංස්කාරයෝ ද මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි හටගන්නාවූ ධර්මයෝ ය යි දතයුතුයි. එහෙයින් "ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො-අවිජ්ජා ආයූහනා-සඞ්ඛාරා, නිකන්ති-තණ්හා, උපගමනං-උපාදානං, චෙතනා-භවො, ඉති ඉමෙ පඤ්චධම්මා කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා" යනුවෙන් පටිසම්භිදා මාර්ගයෙහි වදාරණ ලද්දේයි. ඉධ, ප්‍රත්‍යුත්පන්නභවයෙහි; ආයතනානං, චක්ෂුරාදී ආයතනයන්ගේ; පරිපක්කත්තා, මිහිකිරීම් වන හෙයින් හෙවත් මිහිකිරීම හේතුකොටගෙණ; මොහො, හටගන්නා නො දැනීම නො දැකීම මුළාකිරීමයයි කියන ලද්දාවූ මෝහ තෙම; අවිජ්ජා, අවිද්‍යා නම් වේ; ආයූහනා, පූර්වචෙතනාදී රැස්කරන්නාවූ චෙතනා තොමෝ; සඞ්ඛාරා, සඞ්ඛාර නම් වෙත්. නිකන්ති, රැස් කරණලද කර්මයාගේ විපාකභූත උපප්‍රාප්තිභවයෙහි ඇලීම් සඞ්ඛ්‍යාත තෘෂ්ණා තොමෝ; තණ්හා, තණ්හා නම්වේ. උපගමනං, දෘෂ්ටි වශයෙන් ළං කොට ගැනීම හෙවත් දෘෂ්ටි වශයෙන් ආමර්ශනය කොට ගැණීම; උපාදානං, උපාදාන නම් වේ. චෙතනා, දන් දෙන්නාවූ කල්හි හටගන්නාවූ මූලක චෙතනාදී වූ පසුපසුව හට ගන්නාවූ චෙතනා තොමෝ; භවො, භව නම් වේ. ඉති ඉමෙ පඤ්චධම්මා, මෙසේ මේ පඤ්චප්‍රකාර වූ ධර්මයෝ තුමූ, ඉධ, මේ ප්‍රත්‍යුත්පන්නභවයෙහි; කම්මභවස්මිං, කර්මභවයෙහි; "කයිරමානෙ" යනු පාඨශේෂයයි. කයිරමානෙ, රැස් කරණ ලද කල්හි "ඉමෙ පඤ්චධම්මා" යන්නෙහිද, "පච්චයා" යන්නෙහිද සම්බන්ධයි. ආයතිං පටිසන්ධියා, මතු භවයෙහි පටිසන්ධියගේ; පච්චයා, උපකාරප්‍රත්‍යයෝයි.

පටිච්චසමුප්පාද පාලියෙහි වනාහි:-"තණ්හා, උපාදාන, භව" සඞ්ඛ්‍යාතවූ මේ ප්‍රත්‍යුත්පන්නහේතුහු තුන්දෙනම ආයේයි. අවිජ්ජා-සඞ්ඛාර ප්‍රත්‍යුත්පන්නහේතුහු දෙදෙන නො ආයේ යි. මූලචෙතනා සඞ්ඛ්‍යාත වූ භවය ගැණීමෙන් පූර්වචෙතනා සංඛ්‍යාතවූ සංස්කාරය ද නොහොත් සත්වෙනි ජවනචෙතනා සංඛ්‍යාත වූ භවය ගැණීමෙන් ප්‍රථමපිතිකාදී ෂට්ජවනචෙතනා සංඛ්‍යාතවූ සංස්කාරය ද, නොහොත් ලෞකික කුශලාකුශල චෙතනා සංඛ්‍යාතවූ භවය ගැණීමෙන් ඒ චෙතනා සම්ප්‍රයුක්තවූ චිත්තෝත්පාද සංඛ්‍යාත වූ සංස්කාරයද, නොහොත් ලෞකික කුශලාකුශල චිත්තෝත්පාද සංඛ්‍යාතවූ භවය ගැණීමෙන් ඒ චිත්තෝත්පාදයන් හා සැපියුතුවූ චෙතනා සංඛ්‍යාතවූ සංස්කාරයද, තණ්හා-උපාදානයන් ගැණීමෙන් ඔවුන් හා සම්ප්‍රයුක්තවූ

අවිද්‍යාවද, නොහොත් යම් අවිද්‍යාවක් කරණකොටගෙණ මූලා වීමෙන් කර්මය රැස්කරන්නේ වේ ද, ඒ කර්මයාගේ හෙතුභූතවූ අවිද්‍යාවද ගන්නා ලද හෙයින් ප්‍රත්‍යොත්පන්න හෙතුපඤ්චකය ගන්නේයි.

අවිද්‍යා-සංස්කාර යන දෙදෙන අතීතකාලයයි කුමක් හෙයින් කියන ලද්දාහු ද යත්? පූර්ව පූර්වභවයෙහි හටගත්තා වූ ධර්මරාශියක් වන හෙයින් අතීත කාලයයි කියත්, "විඥාන, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව" යන මේ ධර්මයෝ අටදෙන ප්‍රත්‍යොත්පන්න කාලයයි කුමක් හෙයින් කියන ලදහු ද යත්? දැන් මේ භවයෙහි හටගන්නාවූ ධර්මරාශියක් වනහෙයින් ප්‍රත්‍යොත්පන්න කාලයයි කියත්. "ජාති ජරාමරණ" යන ධර්මයෝ තිදෙන අනාගත කාලයයි කුමක් හෙයින් කියන ලදහු ද යත්? මතු භවයෙහි හටගන්නාවූ ධර්ම සමූහයක් වන හෙයින් අනාගත කාලයයි කියත්. මෙසේ කාලත්‍රයක් ඇත්තේයි,

අවිද්‍යා-සංස්කාර දෙදෙනා එක් සංක්ෂෙපයෙක් වෙයි. විඥාන, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන පඤ්චකය එක් සංක්ෂෙපයෙක් වෙයි. "තණ්හා, උපාදාන, භව" යන මේ තුන් දෙන එක් සංක්ෂෙපයෙක් වෙයි. "ජාති, ජරාමරණ" යන තිදෙන එක් සංක්ෂෙපයෙක් වෙයි. මෙසේ සතර සංක්ෂෙපයෙක් ඇත්තේ වෙයි. පළමුවෙනි සංක්ෂෙපය අතීතසංක්ෂෙපය වෙයි. දෙවෙනි සංක්ෂෙපය ප්‍රත්‍යොත්පන්න ඵල සංක්ෂෙපය වෙයි. තුන්වෙනි සංක්ෂෙපය ප්‍රත්‍යොත්පන්න හෙතුසංක්ෂෙපය වෙයි. සතරවෙනි සංක්ෂෙපය අනාගත ඵල සංක්ෂෙපය වෙයි.

සංස්කාරය හා විඥානයාගේ අතර එක් සන්ධියෙක. වේදනා-තණ්හා දෙදෙන අතර එක් සන්ධියෙක. භව-ජාති දෙදෙනාගේ අතර එක් සන්ධියෙකැයි මෙසේ සන්ධිත්‍රයක් වෙයි. පළමුවෙනි සන්ධිය අතීත හෙතුව හා ප්‍රත්‍යොත්පන්න ඵලයාගේ සම්බන්ධයයි. දෙවෙනි සන්ධිය ප්‍රත්‍යොත්පන්න ඵලය හා ප්‍රත්‍යොත්පන්න හෙතුහුගේ සම්බන්ධයයි. තුන්වෙනි සන්ධිය ප්‍රත්‍යොත්පන්න හෙතුන්ගේ හා අනාගත ඵලයාගේ සම්බන්ධයයි.

අවිද්‍යාතොමෝ පටිච්චසමුප්පාද පූර්වාන්තයෙහි ප්‍රධාන හෙතුව වන හෙයින් එක් මූලයෙක් වෙයි. තෘෂ්ණා තොමෝ පටිච්ච සමුප්පාදයාගේ අපරාන්තයෙහි ප්‍රධාන හෙතුව වන හෙයින් එක් මූලයෙක් වෙයි. මෙසේ පටිච්චසමුප්පාදයාගේ මූල දෙදෙන දතයුත්තාහුය.

අවිද්‍යාවය, තෘෂ්ණාවය, උපාදානය යන මේ ධර්මයෝ තුන්දෙන ක්ලේශ වෘත්තයයි. සංස්කාරය, කර්මභවය, යන මේ දෙදෙන කර්මවෘත්තයයි. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා උපපත්තිභව, ජාති, ජරා, මරණ යන මේ ධර්මයෝ අට දෙන විපාක වෘත්තයයි. මෙසේ පටිච්චසමුප්පාදයාගේ වෘත්තයෝ තුන්දෙන දතයුත්තාහුය.

පටිච්චසමුප්පාද ද්වාදශාඞ්ගයන් අතුරෙන් දොළොස් අකුශල චිත්තයෙහි යෙදුනු මෝහ චෛතසිකය අවිද්‍යා නම්වූ ලෞකික කුශලාකුශලචිත්තයෙහි යෙදුනු චේතනා චෛතසිකයෝ එකුන්තිස්දෙන සඞ්ඛාර නම් වෙයි. ඒ සඞ්ඛාර තෙමේ "පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසඞ්ඛාර, ආනෙඤ්ජාභිසංඛාර" යයි ත්‍රිවිධාකාර වේ. ඔවුන් අතුරෙන් අටමහා කුශලචිත්තය, රූපාවචර කුශල චිත්තයෝ පස්දෙනය යන තෙළෙස් චිත්තයෙහි යෙදුනාවූ චේතනාවෝ තෙළෙස්දෙන පුඤ්ඤාභිසංඛාර නම් වේ. දොළොස් අකුශල චිත්තයෙහි යෙදුනාවූ චේතනාවෝ දොළොස්දෙන අපුඤ්ඤාභිසංඛාර නම් වේ. අරූපාවචර කුශලචිත්තයෙහි යෙදුනාවූ චේතනාවෝ සතරදෙන ආනෙඤ්ජාභිසංඛාර නම් වේ. මේ එක් ක්‍රමයකි. විකල්පවශයෙන් එකුන් අනූවක් චිත්තයෙහි යෙදුනාවූ හෙවත් සතිපට්ඨානසූත්‍රයෙහි වදාළාවූ සරාග, සදෝස, සමෝහාදිවූ එකුන් අනූවක් චිත්තයෙහි යෙදුනාවූ චේතනාවෝ එකානූව සංඛාර නම් වෙත්.

සංස්කාර ප්‍රත්‍යයෙන් හටගන්නාවූ ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි විපාක විඥානයෝ දෙතිස්දෙන විඤ්ඤාණ නම් වේ. නොහොත් එකානූවක් චිත්තයෝම විඤ්ඤාණ නම් වේ. ඒ විඤ්ඤාණ තෙමේ සහජාත විඤ්ඤාණය, අභිසංඛාර විඤ්ඤාණය, පච්ඡාජාත විඤ්ඤාණ යයි ත්‍රිවිධාකාර වේ. ඒ ත්‍රිවිධාකාර විඤ්ඤාණයන් අතුරෙන් සම්ප්‍රයුක්ත නාමස්කන්ධයෝය, චිත්තජරූපයෝය, ප්‍රතිසන්ධිකර්මජ රූපය යනමොවුන්ට උපකාරවන්නාවූ ප්‍රත්‍යුත්පන්නවූ එකානූවක් චිත්තය සහජාත විඤ්ඤාණ නම්වේ. විපාකනාමස්කන්ධයෝය, ප්‍රතිසන්ධිකර්මජරූපය, අසංඥසත්ව කර්මජරූපය, ප්‍රවෘත්ති කර්මජරූපය, යන මොවුන් උපදවන අතීත කුශලාකුශල සිත් තෙමේ අභිසංඛාර විඤ්ඤාණ නම්වේ. පූර්ව පූර්ව චිත්තය හා එකොත්පාදව රූපයාගේ ඨිතිකාලයට පැමිණියාවූ එකජකාය, ද්විජකාය, තිජකාය, චතුජකාය යන රූපධර්මයන්ට උපකාරවන්නාවූ සතර අරූපාවචර විපාකය හැර පශ්චිම පශ්චිමවූ පන්සැත්තෑවක් චිත්තය පච්ඡාජාත විඤ්ඤාණ නම්වේ.

ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි වශයෙන් පවත්නා ලෞකික විපාක චිත්ත යෙහි යෙදුනු චෛතසික නාමස්කන්‍ධයෝ තුන්දෙනාය. අට ළොස් කර්‍මජරූපය, පසළොස් චිත්තජරූපය, යන මෙතෙක් ධර්‍ම යෝතුමූ විඥ්ඥාණ ප්‍රත්‍යයෙන් හටගත් නාමරූප නම්වෙත්. නොහොත් එකානූවක් චිත්තයෙහි යෙදුනාවූ දෙපණස් චෛතසිකය චතුජකාය සංඛ්‍යාතවූ කර්‍ම-චිත්ත-ඍතු-ආහාර යන සතරින් හටගත්තාවූ අටවිසිරූපය යන මෙතෙක් ධර්‍මයෝ තුමූ විඥ්ඥාණ ප්‍රත්‍යයෙන් හටගන්නාවූ නාමරූපය නම් වෙත්.

චක්ඛායතනය, ශෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, යන අධ්‍යාත්මිකායතනයෝ සදෙන නාමරූප ප්‍රත්‍යයෙන් හටගන්නාවූ සළායතනයෝ නම් වෙත්.

ලෞකික විපාක චිත්තයෙහි යෙදුනු ස්පර්ශචෛතසික සංඛ්‍යාතවූ චක්ඛුසම්ඵස්සය, සෝතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය, යන මේ ස්පර්ශයෝ සදෙන ෂඩායතන ප්‍රත්‍යයෙන් හටගත් ස්පර්ශය නම් වේ. නොහොත් එකානූවක් ස්පර්ශචෛතසිකය යි කියන ලද චක්ඛුසම්ඵස්සය ආදී කොට ඇති මනොසම්ඵස්සය, අවසන් කොට ඇත්තාවූ එකුන් අනූවක් ස්පර්ශයෝ තුමූ ඵස්ස නම්වෙත්.

දෙතිස් ලෞකික විපාක චිත්තයෙහි යෙදුනාවූ වේදනා චෛතසිකයෝ දෙතිස්දෙන හෝ එකුන්අනූවක් චිත්තයෙහි යෙදුනු වේදනා චෛතසිකයෝ එකුන්අනූදෙන ස්පර්ශප්‍රත්‍ය යෙන් හටගත් වේදනා නම්වේ

"සංඛාර, විඤ්ඤාණ, නාමරූප, ඵස්ස, වේදනා" යන ධර්‍ම යෝ පස්දෙන දෙයාකාරයකින් බෙදූ දක්වූ හෙයින් පළමුවන ක්‍රමය වනාහී පටිච්චසමුප්පාද විභඞ්ග සූත්‍රාන්ත භාජනීයෙහි ආවාවූ ක්‍රමයයි දතයුතුයි. පශ්චිම ක්‍රමයෙහි වනාහී එම පටිච්ච සමුප්පාදවිභඞ්ගපාලියෙහි නොහොත් ධාතු කථා පාලියෙහි ආ වාවූ ක්‍රමයයි දතයුතුයි. සච්චවිභඞ්ගය, පටිච්චසමුප්පාදවිභඞ්ගය, සම්මොහවිනොදනී අටුවාවය, විශුද්ධිමාර්ග අටුවාවය, යනාදී අර්ථ කථා ටීකාවන්ගෙන් මෙහි විශේෂ විභාග දතයුත්තේයි.

---

## (ප)

හෙතුපච්චයො, (බුග ඇසතු ආදී වෘක්ෂයන්ගේ මූලය ඒ වෘක්ෂයන්ගේ සපිරව පිහිටීමට උපකාර වන්නාක් මෙන් මොන

වට පිහිටීම සිඬකරන්නා වූ) හෙතු ආදී ධර්මයන් සදෙනාගේ උප කාරය ද; ආරම්මණපච්චයො, (රුකැන් සැරයටි ආදීන් දුර්වලවූ වන්ගේ නැගිටීමාදී කෘත්‍යය සිඬ කිරීමට උපකාර වන්නවුන් මෙන් චිත්තචෛතසික ධර්මයන්ගේ නැගී සිටීම හා පැවතීමට උපකාර වන්නාවූ) රූපාදී ආරම්මණයන්ගේ උපකාරබව ද; අධිපති පච්චයො, (සක්විතිරජ තෙමේ අවශෙෂ රජ-රජමහාමාත්‍යාදීන්ගේ ශක්තිය මැඩ පවත්වා රටවාසීන්ගේ සුඛසිඬිය පිණිස අධිපතිභාවයෙන් උපකාර වන්නාක් මෙන් අන්‍ය ධර්මයන්ගේ අධිපතිභාවය මැඩ පවත්වා අධිපතිභාවයෙන් උපකාර වන්නා වූ අධිපතිප්‍රත්‍යයද; අනන්තරපච්චයො, (සක්විති රජහුගේ දිවඞ්ගත වීම් පුත්‍රරත්නයට අභිෂෙක කිරීම පිණිස උපකාර වන්නාක් මෙන් අනන්තරභාවයෙන් උපකාර වන්නා වූ අනන්තර ප්‍රත්‍යය ද; සමනන්තර පච්චයො, සක්විතිරජහුගේ පැවිදි වීම පුත්‍රරත්නයට රාජ්‍යලාභය පිණිස උපකාර වන්නාක් මෙන් තොනොත් මහතෙරුන් වහන්සේගේ සංඝසභාවයෙන් නැගිට යාම අනුතෙරුන් වහන්සේගේ මහාසථවිරභාවයට උපකාර වන්නාක් මෙන් මොනවට අතරක් නැතිවීම් වශයෙන් උපකාර වන්නාවූ) සමනන්තර ප්‍රත්‍යය ද; සහජාතපච්චයො, ප්‍රදීපවර්ති සාව දැල්වීම හා සමග ආලොකය පැතිර යාමට උපකාර වන්නාක් මෙන් එක්ව හටගැණීම් වශයෙන් උපකාර වන්නාවූ) සහජාතප්‍රත්‍යය ද; අඤ්ඤමඤ්ඤ පච්චයො, (ත්‍රිදණ්ඩකාය හෙවත් පාතුණක් ඇත්තා වූ පීඨය පිහිටා සිටීමට එක් දණ්ඩක් අනික් දණ්ඩකට ද එක් පාදයක් අනික් පාදයකට ද උපකාර වන්නාක් මෙන් ඔවුනොවුන්ගේ පිහිටා සිටීමට ඔවුනොවුන්ගේ උපකාර සංඛ්‍යාත වූ) අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය ද; නිස්සය පච්චයො, (වෘක්ෂලතාදීන්ගේ පිහිටීමට මහාපෘථුවිය පිහිටවන්නාක් මෙන් ද, සිතියම් අක්ෂරාදිය පිහිටා සිටීමට වස්ත්‍රතාලපත්‍රාදිය උපකාර වන්නාක් මෙන් බලවත් නිශ්‍රය වශයෙන් උපකාර වන්නා වූ) නිශ්‍රය ප්‍රත්‍යය ද; උපනිස්සය පච්චයො, (වර්ෂාසාරමස්ගී වස්නා වූ ජලවර්ෂාව නිසා පවත්නාවූ වෘක්ෂසත්වාදීන්ට හා හිමාලය පර්වතය ආශ්‍රය කරන්නාවූ වෘක්ෂලතාදීන්ට හිමරාශිය උපකාර වන්නාක් මෙන්ද බලවත්වූ නිශ්‍රය වශයෙන් උපකාර වන්නාවූ උපනිශ්‍රය ප්‍රත්‍යය ද; පුරෙජාතපච්චයො, (ප්‍රථම කල්පයෙහි පහළවූ චන්ද්‍ර සූර්‍ය්‍යාදීහු තමාගේ ප්‍රකටව ඇත්තාවූ කාලමෙහි ආලොකය නිශ්‍රය කොට ඇති සත්වයන්ට උපකාර වන්නාක් මෙන් පෙරටුව ඉපදීම් වශයෙන් උපකාර වන්නාවූ) පුරෙජාත ප්‍රත්‍යය ද; පච්ඡා ජාතපච්චයො. (ගිජුලිහිණි පැටවුන්ට ඇත්තාවූ

ආහාරතෘෂ්ණාතුරයෝ පසුව කටගන්නාවූ ඔවුනොවුන්ගේ ශරීරයන්ට උපකාර වන්නාක් මෙන් ප්‍රත්‍යොත්පන්නධර්මය පෙරටුව ඉපිද ප්‍රත්‍යය ධර්මය පසුව ඉපදීමෙන් උපකාර වන්නා වූ) පච්ඡාජාතප්‍රත්‍යය ද; ආසෙවනපච්චයො, (පූර්ව පූර්වව සුවඳ ගල්වන ලද චන්දනකල්කාදිය පසුපසුව ගල්වන්නා වූ චන්දනාදියෙන් සුගන්ධබහුලත්වය වන්නාක් මෙන් ද; පළමු පළමු උගන්නා ලද ග්‍රන්ථය පසුපසුව උගන්නාවූ ග්‍රන්ථයන්ට උපකාර වන්නාක් මෙන් නැවත නැවත සෙවනය කිරීමෙන් උපකාර වන්නාවූ) ආසෙවන ප්‍රත්‍යය ද; කම්මපච්චයො, (මොනවට අව් ගස්වා කොටුගුල් ආදියෙහි සුරැකිව තබනලද බීජය අංකුරය හටගැණීම පිණිස සකස් කිරීම් වශයෙන් උපකාර වන්නාක් මෙන් ඵලධර්මයාගේ හට ගැණීමපිණිස සකස්කිරීම් වශයෙන් උපකාරවන්නාවූ) කර්මප්‍රත්‍යයද; විපාකපච්චයො, (සිහිල් වූ මන්දමාරුතය සිහිල් වූ ස්ථානයේ උන් පුරුෂයෙකුහට ශරීරව්‍යාධා සන්සිඳවීම පිණිස උපකාර) වන්නාක් මෙන් නිරුත්සාහශාන්තභාවයෙන් උපකාර වන්නාවූ විපාකප්‍රත්‍යයද; ආහාරපච්චයො, (පසුව දෙන්නා වූ බලුකාරුව පුරාණගෘහය සපිරව පිහිටා සිටීමට උපකාර වන්නාක් මෙන් උපස්තම්භ වශයෙන් පැවැත්වීම් වශයෙන් හෝ උපකාර වන්නාවූ) ආහාර ප්‍රත්‍යය ද; ඉන්ද්‍රියපච්චයො, (එක් රජෙක් යටතෙහි නොයෙක් රාජකාර්‍ය්‍යයෙහි යෙදුනු රාජාමාත්‍යයෝ තුමූ ඔවුනොවුන්ගේ බලය මැඩ නො පවත්වා තමතමන්ගේ ස්ථානයෙහි ඊශ්වරභාවයෙන් උපකාර කරන්නාක් මෙන් අන්‍යවූ ධර්මයන්ගේ ඊශ්වරභාවය මැඩ නො පවත්වා තමතමාගේ ස්ථානයෙහි ඊශ්වරභාවය කරන්නාවූ) ඉන්ද්‍රියප්‍රත්‍යය ද; ඣානපච්චයො, (පර්වතයක් මුදුනට හෝ වෘක්ෂයක් මුදුනට හෝ නැගී බලන පුරුෂ තෙම දූරසමීපස්ථානය දැකීම කරණකොටගෙණ ඒ දැකීමෙහි අභිමත වූ පුරුෂයන්ට උපකාර වන්නාක් මෙන් ලං කොට බැලීම් වශයෙන් උපකාර වන්නාවූ) ධ්‍යානප්‍රත්‍යයද; මග්ගපච්චයො; (මෙතරින් එතරට තරණය කරන පුරුෂ තෙම මෙතරින් නික්ම යාමට හෙතු වන්නාක් මෙන් ද; එතරින් මෙතරට තරණය කරන පුරුෂ තෙමේ එතරින් නික්ම යාමට උපකාර වන්නාක් මෙන් ද නික්මයාම් වශයෙන් උපකාර වන්නා වූ) මාර්ග ප්‍රත්‍යය ද; සම්පයුත්තපච්චයො, (කිරි ගිතෙල් මී සකුරු යන චතුමධුරරස තෙමේ ඔවුනොවුන් සම්බන්ධවීම් වශයෙන් උපකාර වන්නාක් මෙන් එක්ව යෙදීම් වශයෙන් උපකාර වන්නාවූ) සම්ප්‍රයුක්තප්‍රත්‍යය ද; විප්පයුත්තපච්චයො, (මධුර-අම්බිල-කටුක-ලවන තිත්ත-කසට යන ෂට්රසය ඔවුනොවුන් මිශ්‍ර නො වීම්

වශයෙන් ඔවුනොවුන්ගේ රසයට උපකාර වන්නාක් මෙන් විප්පයුක්තවශයෙන් උපකාර වන්නා වූ) විප්පයුත්තප්‍රත්‍යය ද; අත්ථිපච්චයො, (හිමාලය පර්වතය තෙමේ වෘක්ෂලතාදීන්ගේ වැඩීම පිණිස තමාගේ විද්‍යමාන භාවයෙන් උපකාර කිරීමක් මෙන් ප්‍රකටව ඇත්තාවූ හෙවත් විද්‍යමානභාවයෙන් උපකාර කරන්නාවූ) අස්තිප්‍රත්‍යය ද; නත්ථිපච්චයො, (රාත්‍රියගේ ගෙවීම සූර්යයාගේ පහලවීමට උපකාර වන්නාක් මෙන් ද තෙල් පහණක් නිවීයාම අන්ධකාරයාගේ පැතිරීමට උපකාර වන්නාක් මෙන්ද; අවිද්‍යමාන භාවයෙන් හෙවත නාස්තිභාවයෙන් උපකාර වන්නාවූ) නාස්තිප්‍රත්‍යයද; විගතපච්චයො, (සූර්යාලොකය පහවීයාම චන්ද්‍රාලොකය පහලවීමට උපකාර වන්නාක් මෙන් පහවීම් වශයෙන් උපකාර වන්නාවූ) විගත ප්‍රත්‍යයද; අවිගතපච්චයො, (මහාසමුද්‍රය තෙමේ තමා නිසා පවත්නා වූ මත්ස්‍යාදීන්ට හා සමුද්‍රය ආශ්‍රය කරන්නා වූ දිව්‍ය අසුරයන්ට ද ප්‍රීති සෞමනස්‍යය ඉපදීම පිණිස තමාගේ පහ නො වීමෙන් උපකාර වන්නාක් මෙන් තමාගේ සවභා වශයෙන් පහ නො වීම් වශයෙන් උපකාර වන්නාවූ) අවිගත ප්‍රත්‍යයද; ඉති, මෙසේ; චතුවීසතිපච්චයා සූවිසි ප්‍රත්‍යධර්මයෝ තුමූ; මහාපකරණෙ, අනන්තනයසමන්තපට්ඨාන මහාප්‍රකරණයෙහි; උද්දෙසභාවෙන ඨිතා, උද්දෙසභාවයෙන් සිටියාහුය. ඉතො, උද්දෙශනයින් අන්‍ය වූ නිර්දේශනය දක්වමි:—

ඡධා නාමන්තු-පෙ-පච්චයා කථං. නාමං, නාමතෙමේ; නාමරූපිනං, නාමරූප ධර්මයන්ට; පඤ්චධා පච්චයො හොති, පස් ආකාරයකින් උපකාර වෙයි. පුන, නැවත; නාමං, නාම තෙමේ; රූපස්ස, රූපයට; එකධා පච්චයො හොති, එක් ආකාරයකින් උපකාරවෙයි. ච, නාමප්‍රත්‍යයෙන් අන්‍යවූ රූප ප්‍රත්‍යය දක්වමි:—රූපං, රූප තෙමේ; නාමස්ස, නාමයට; එකධා, එක්ප්‍රකාරයකින්; පච්චයො හොති, උපකාර වෙයි. පඤ්ඤත්ති නාමරූපානි, ප්‍රඥප්තිනාමරූපයෝ තුන්දෙන; නාමස්ස, නාමයට; දුවිධා, විප්‍රකාරයකින්; පච්චයා හොන්ති, උපකාරවෙත්. ච, සුඛ නයින් අන්‍යවූ මිශ්‍රකනයද කියමි:-වයං, නාමරූපවය; වයස්ස, නාමරූපවයයට; නවධා පච්චයො හොති, නවප්‍රකාරය කින් උපකාර වෙයි. ඉති, මෙසේ; පච්චයා, ප්‍රත්‍යධර්මයෝ තුමූ හෙවත් උපකාරකධර්මයෝ තුමූ; ඡබ්බිධා ඨිතා, සයාකාරයකින් සිටියාහුය. කථං? කෙසේ ද යත්? ච, යනු තත්ප්‍රකටීකරණාර්ථයෙහි නිපාතයි.

අනන්තරනිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා, අනතුරුව නිරුද්ධවූ එකුන් අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ තුමූ; පච්චුප්පන්නානං, තමහට අනතුරුව හටගන්නාවූ චිත්තචෙතසිකානං ධම්මානං, එකුන්අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ; අනන්තර-සමනන්තර-නත්ථි-විගතවසෙන, අනන්තර ශක්තිය, සමනන්තර ශක්තිය, නත්ථි ශක්තිය, විගත ශක්තිය, යන අනන්තරාකාර ප්‍රත්‍යයන්ගේ ශක්තියෙන්; පච්චයා හොන්ති, උපකාර වෙත්. පුරිමා ජවනාති, පළමු උපන් ජවනයෝ මාර්ග ඵලජවනයන් වර්ජිත කොට ඇති එක්පණස් ජවන්හුය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ; පච්ඡිමානං ජවනානං, පසුව උපදින ජවනයන්ට; ආසෙවනවසෙන ච, ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන්ද; පච්චයා හොන්ති, උපකාරවෙත්. සහජාතා චිත්තචෙතසිකා ධම්මා, එක්ව හටගත් චිත්ත චෛතසිකධර්මයෝ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට; සම්පයුත්තවසෙන ඉතිච, සම්ප්‍රයුක්ත වශයෙන්දැයි; පච්චයා හොන්ති, උපකාරවෙත්; ඉති, මෙසේ; නාමං, නාමතෙම්; නාමස්ස එව, නාමයහටම; ඡධා, සයාකාරයකින්; පච්චයො හොති උපකාරවේ.

හෙතුඣානමග්ගඞ්ගානි, හෙතුධර්මධ්‍යානාඞ්ගධර්ම මාර්ගාඞ්ග ධර්මයෝ තුමූ; සහජාතානං නාමරූපානං, එක්ව හටගත් නාම රූපයන්ට; හෙතාදිවසෙන, හෙතුප්‍රත්‍යාදීන්ගේ වශයෙන්; පච්චයා හොන්ති, උපකාරවෙත්. සහජාතා, එක්ව හටගත්; චෙතනා, එකුන් අනූවක් චිත්තයෙහි යෙදුනු එකුන්අනූවක් චෙතනාවෝ තුමූ; සහජාතානං, එක්වහටගත්; නාමරූපානං, එකුන්අනූවක් චිත්තය චෙතනාවර්ජිතවූ එක්පණස් චෛතසිකය; චිත්තජ රූපය පටිසන්ධිකර්මජරූපය යන මොවුන්ට; කම්මවසෙන, කර්මප්‍රත්‍ය වශයෙන්; පච්චයොහොති, උපකාරවෙයි. නානාක්ඛණිකා, වෙනස් වෙනස්වූ කාලයෙහි හටගත් හෙවත් අතීතකාලිකවූ; චෙතනා, කුශලාකුශල චෙතනාවෝ තෙතිස්දෙන; කම්මාභිනිබ්බත්තානං, කර්ම සඞ්ඛ්‍යාත තමා හෙතුකොටගෙණ උපන්නාවූ; නාමරූපානං, සතිස් විපාක නාමස්කන්ධයෝය; පටිසන්ධිකර්මජරූපය අසංඥසත්වකර්මජරූපය ප්‍රවෘත්තිකර්මජරූපය යන මොවුන්ට; කම්මවසෙන, නානාක්ෂණික කර්මශක්තියෙන්; පච්චයො හොති, උපකාර වේ. විපාකක්ඛන්ධා, සතිස් විපාක නාමස්කන්ධයෝ තුමූ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ටද; සහජාතානං, එක්ව හටගත්; රූපානඤ්ච, චිත්තජරූපය පටිසන්ධිකර්මජරූපය යන මොවුන්ටද, විපාකවසෙන, විපාකශක්තියෙන්; පච්චයා හොන්ති, උපකාර

වෙත්. ඉති, මෙසේ; නාමං, නාමතෙමේ; නාමරූපානං, නාමරූපයන්ට; පඤ්චධා, පස්ප්‍රකාරයකින්; පච්චයො හොති, පසවේ; පච්ඡාජාතා, පසුපසුව හටගත්; චිත්තචෙතසිකා ධම්මා, පඤ්චවොකාරභූමියෙහි හටගන්නා කල්හි අරූපවිපාක සතර වර්ජිතකොට ඇති ප්‍රථමභවාඞ්ගාදී පසුපසුව හටගන්නාවූ අසූපස් චිත්තය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ තුමූ; පුරෙජාතස්ස, පෙරටුව හටගත්; ඉමස්ස කායස්ස, ප්‍රතිසන්ධි ආදී මේ පූර්වපූර්වචිත්තයන් හා සමග එකට උපදනා රූපයාගේ ස්ථිතිකාලයට පැමිණියාවූ එකජකාය ද්විජකාය ත්‍රිජකාය චතුජකාය යන මොවුන්ට; පච්ඡාජාතවසෙන, පච්ඡාජාතශක්තියෙන්; පච්චයා හොන්ති, පසහු වෙත්. ඉති, මෙසේ; නාමං, නාමතෙමේ; රූපස්ස, රූපයට; එකධාව, එක් ප්‍රකාරයකින්ම; පච්චයො හොති, පසවේ. ඡවත්ථූනි, ෂට්වස්තූහු; තොහොත් මනුඤ්ඤක-අමනුඤ්ඤක-මජ්ඣිමායුක වශයෙන් ත්‍රිවිධාකාර වස්තූන් අතුරෙන් මජ්ඣිමායුකව එක් අත්තභාවයක්හුගේ උත්පාදක්ෂණය හා සමග එකොත්පාදවූ චක්ඛුවත්ථුය සොතවත්ථුය ඝාණවත්ථුය ජිව්හාවත්ථුය කායවත්ථුය ප්‍රතිසන්ධ්‍යාදී පූර්වපූර්වචිත්තයන් හා සමග එකොත්පාදවූ හෘදයවස්තුවය නිරොධසමාපත්තියෙන් නැගී සිටිනා කල්හි පූර්වයෙන් හටගත් හෘදයවස්තුවය මරණාසන්න කාලයෙහි චුතිචිත්තක්ෂණයෙහි පටන් ආපසු ගිණූ කල්හි සතළොස්වන චිත්තයෙහි උත්පාදක්ෂණය හා සමග එකොත්පාදවූ හෘදයවස්තුවද මෙසේ සවැදෑරුම්වූ වස්තුරූපයෝ; පවත්තියං, ප්‍රවෘත්තිකාලයෙහි; සත්තන්නං විඤ්ඤාණධාතූනං, සප්තවිඥානධාතූන්ට, පුරෙජාතවසෙන, වස්තුපුරෙජාතශක්තියෙන්; පච්චයා හොන්ති, පසහුවෙත්: පඤ්චාලම්බණානිච, රූපාදී පස්අරමුණුද; පඤ්චවිඤ්ඤාණවීථියා, චක්ෂුර්විඥානාදී පඤ්චවිඤ්ඤාණවීථියෙහි; පුරෙජාතවසෙන, පුරෙජාතප්‍රත්‍යය වශයෙන්; පච්චයා හොන්ති, පසහුවෙත්. ඉති, මෙසේ; රූපං, රූපයතෙම; නාමස්ස, නාමයහට; එකධාව, එක්ප්‍රකාරයකින්ම; පච්චයො හොති, පසවේ.

ආලම්බණවසෙන ච, රූපාදී අරමුණු විසින්ද; උපනිස්සයවසෙනච, බලවත් නිශ්‍රය විසින්ද; ඉති, මෙසේ; ද්විධා, ද්විප්‍රකාරයකින්; පඤ්ඤත්ති නාමරූපානි, ප්‍රඥප්තිනාමරූපයෝ; නාමස්ස එව, නාමයටම; පච්චයා හොන්ති, පසහු වෙත්.

තත්ථ, ඒ ප්‍රඥප්ති නාමරූපයන් අතුරෙන්; ආලම්බණං, අරමුණ තෙමෙ; රූපාදිවසෙන, රූපාදිවශයෙන්; ඡබ්බිධා හොති; සවැදෑරුම් වේ.

උපනිස්සයො පන, උපනිශ්‍රය ප්‍රත්‍යයතෙම වනාහි; ආලම්බණූපනිස්සයො ච, ආරම්මණූපනිශ්‍රයද; අනන්තරූප නිස්සයො ච, අනන්තරූප නිශ්‍රයද, පකතූපනිස්සයොච ඉති, ප්‍රකෘතොපනිශ්‍රය දැයි; තිවිධො හොති, ත්‍රිවිධ වේ.

රාගාදයො පන ධම්මා ච, රාගාදී ධර්මයෝද වනාහි; සද්ධාදයො ච ධම්මා, ශ්‍රද්ධාදීවූ ධර්මයෝද; සුඛඤ්ච, සුඛයද; දුක්ඛඤ්ච, දුක්ඛයද; භොජනඤ්ච, භොජනද; උතුච, හෙමන්තාදී ඍතුද; සෙනාසනඤ්ච, සෙනසුනද; යථාරහං, සුදුසුපරිද්දෙන්; අජ්ඣත්තඤ්ච, තමාගේ සතන්හිද; බහිද්ධාච, බැහැරද; කුසලාදිධම්මානං, කුශලාදිධර්මයන්ටද; කම්මං, කුශලාදීකර්මයතෙම; විපාකානඤ්ච, විපාකයන්ටද; පකතූපනිස්සයෙන පච්චයො හොති, ප්‍රකෘතොප නිශ්‍රයෙන් පස වේ. ඉති, මෙසේ පකතූපනිස්සයො, ප්‍රකෘතොප නිශ්‍රය ප්‍රත්‍යයතෙම; බහුධා හොති, බහුප්‍රකාරයෙන් වේ.

අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතවසෙන ඉති, අධිපති ප්‍රත්‍යයද, සහජාත ප්‍රත්‍යයද, අන්‍යොන්‍ය ප්‍රත්‍යයද, නිශ්‍රය ප්‍රත්‍යයද, ආහාර ප්‍රත්‍යයද, ඉන්ද්‍රිය ප්‍රත්‍යයද, විප්‍රයුක්ත ප්‍රත්‍යයද, අස්ති ප්‍රත්‍යයද, අවිගතප්‍රත්‍යයද යන මොවුන්ගේ වශයෙන්දැයි; යථාරහං, සුදුසු පරිද්දෙන්; නවධා, නවප්‍රකාරයකින්; නාමරූපානි, නම් රූ දෙදෙන; නාමරූපානං, නාමරූපයන්ට; පච්චයා හොන්ති, ප්‍රත්‍යයෝ වෙත්.

තත්ථ, ඒ අධිපති ප්‍රත්‍යයාදී නවදෙන අතුරෙන්; ගරුකතං ආලම්බණං, ගරුකොට ගන්නාලද අරමුණතෙම; ආලම්බණාධිපතිවසෙන, ආරම්මණාධිපතිවශයෙන්; නාමානඤ්ච, නාමයන්ටද; චතුබ්බිධොපි සහජාතාධිපති, සිව්වැදෑරුම්වූද සහජාතාධිපති ප්‍රත්‍යයතෙම; සහජාතවසෙන, සහජාත විසින්; සහජාතානං නාමරූපානඤ්ච ඉති, සහජාත නාමරූපයන්ටද; අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේයයි; අධිපතිපච්චයො දුවිධො හොති, අධිපති ප්‍රත්‍යය තෙම දෙවැදෑරුම් වේ.

චිත්තචෙතසිකා ධම්මා, චිත්ත චෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; සහජාතරූපානඤ්ච, සහජාත රූපයන්ටද; මහාභූතා, පඨවි ආදී සතරමහාභූතයෝ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; උපාදාරූපානඤ්ච, සූවිසි උපාදාය රූපයන්ටද; පටිසන්ධික්ඛණෙ, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි; වත්ථුවිපාකා, හෘදයාදී වස්තු හා විපාක විඥානයෝ; අඤ්ඤමඤ්ඤංච, ඔවු

නොවුන්ටද; සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේයයි; ඉති, මෙසේ; සහජාතපච්චයො තිවිධො හොති, සහජාත ප්‍රත්‍යය තෙම; ත්‍රිවිධ වේ.

චිත්ත චෙතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; මහාභූතා, සතර මහාභූතයෝ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; පටිසන්ධික්ඛණෙ, ප්‍රතිසන්ධික්ෂණයෙහි; වත්ථුවිපාකා, වස්තුවිපාකයෝ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; අන්‍යොන්‍ය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි; අඤ්ඤමඤ්ඤපච්චයො තිවිධො හොති, අන්‍යොන්‍ය ප්‍රත්‍යය තෙවැදෑරුම් වේ.

චිත්තචෙතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; සහජාතරූපානඤ්ච, සහජාත රූපයන්ටද; මහාභූතා, මහාභූතයෝ; උපාදාරූපානඤ්ච, උපාදාය රූපයන්ටද; ඡවත්ථූනි, හෘදයාදි ෂට්වස්තූහු; සත්තන්නං විඤ්ඤාණධාතූනං ඉතිච, සප්තවිඥානධාතූන්ටද; නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි නිස්සය පච්චයො තිවිධො හොති, නිසපස තෙවැදෑරුම් වේ.

කබලීකාරො ආහාරො, කබලීකාරාහාරය තෙම; ඉමස්ස කායස්ස, මේ රූපකායටද; අරූපිනො ආහාරා, ඵස්සාදි නාමාහාරයෝ; සහජාතානං නාමරූපානං ඉතිච, සහජාතවූ නාමරූපයන්ටද; ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි. ආහාර පච්චයො ද්විධො හොති, අහරපස දෙවැදෑරුම් වේ.

පඤ්චපසාදා, චක්ෂුරාදි පඤ්චප්‍රසාදයෝ; පඤ්චන්නං විඤ්ඤාණානඤ්ච, චක්ෂුර්විඥානාදි පඤ්චවිඥානයන්ටද; රූපජීවිතින්ද්‍රියං, රූපජීවිතින්ද්‍රියතෙම; උපාදින්නරූපානඤ්ච, කර්මජරූපයන්ටද; අරූපිනො ඉන්ද්‍රියා, නාමෙන්ද්‍රියයෝ තුමූ; සහජාතානං නාමරූපානං ඉතිච, සහජාත නාමරූපයන්ටද; ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි; ඉන්ද්‍රියපච්චයො තිවිධො හොති, ඉඳුරුපස තෙවැදෑරුම් වේ.

ඔක්කන්තික්ඛණෙ, ප්‍රතිසන්ධික්ෂණයෙහි; වත්ථු, කායාදි වස්තු තෙම; විපාකානඤ්ච, විපාකයන්ටද; චිත්තචෙතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; සහජාත රූපානඤ්ච, සහජාත රූපයන්ටද, සහජාත වසෙන, සහජාතවශයෙන් ප්‍රත්‍යය වේ,

පච්ඡාජාතා, පසුව හටගත්තාවූ; චිත්ත චෙතසිකාධම්මා, චිත්ත චෛතසික ධර්මයෝ තුමූ; පුරෙජාතස්ස, පූර්වයෙහි හටගත්තාවූ; ඉමස්සකායස්ස, මේ කයට; පච්ඡාජාතවසෙන, පසුව හටගැණීම් වශයෙන් ප්‍රත්‍යය වේ. ඡවත්ථූනි, හෘදයාදී ෂට්වස්තූහු; පවත්තියං, පුවත්හි; සත්තන්නං විඤ්ඤාණධාතූනං, සත්විඥානධාතූන්ට; පුරෙජාතවසෙන, පෙරදෑවිසින්; විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි; විප්පයුත්තපච්චයො තිවිධො හොති, විප්‍රයුක්ත ප්‍රත්‍යය තෙම ත්‍රිවිධ වේ.

සබ්බථා, සර්වප්‍රකාරයෙන්; (වුත්තා, මාවිසින් කියනලද; තිවිධං, තුන්වැදෑරුම්වූ;) සහජාතඤ්ච, සහජාත ප්‍රත්‍යයද; (දුවිධං, ද්විප්‍රකාරවූ;) පුරෙජාතඤ්ච, පුරෙජාත ප්‍රත්‍යයද; පච්ඡාජාතඤ්ච, පච්ඡාජාත ප්‍රත්‍යයද; කබලීකාරො ආහාරො; කබලීකාර ආහාරප්‍රත්‍යයද; රූපජීවිතඤ්ච, රූපජීවිතෙන්ද්‍රියයද; ඉති, මෙසේ පංචවිධො, පස්වැදෑරුම්වූ; අයං ධම්මො, මේ ප්‍රත්‍යය ධර්ම තෙමේ, අත්ථිපච්චයො හොති, අස්තිප්‍රත්‍යය නම්වේ. අවිගතපච්චයොච, අවිගතප්‍රත්‍යය නමුදුවෙයි.

පූර්වාර්ථයෙහි විස්තරාර්ථය දක්වමි:—නොහොත් නීතාර්ථයෙන් අන්‍ය වූ නෙයාර්ථය දක්වමි:—සබ්බෙපි පච්චයා, සියලු සූවිසි ප්‍රත්‍යයෝම; ආරම්මණූපනිස්සය කම්මත්ථි පච්චයෙසු ච, ආරම්මණප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය කර්මප්‍රත්‍යය අස්තිප්‍රත්‍යය යන මේ සතර ප්‍රත්‍යයෙහිද, සමොධානං ගච්ඡන්ති; එකීභාවයට හෙවත් සංග්‍රහයට යෙත්. පන, විශෙෂාර්ථයක් දක්වමි:—එත්ථ, මේ ප්‍රස්ථාන ක්‍රමයෙහි; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; මයාවුත්තං, මාවිසින් කියනලද්දාවූ; සහජාතරූපන්ති, "සහජාතරූපං" යනු පවත්තෙ, ප්‍රවෘත්තිකාලයෙහි; චිත්තසමුට්ඨානානඤ්ච, සිතින් හටගත් රූපයන්ගේද; පටිසන්ධියං, ප්‍රතිසන්ධිකාලයෙහි; කටත්තා රූපානඤ්ච වසෙන, කර්මජරූපයන්ගේද වශයෙන්; දුවිධං හොති, ද්විප්‍රකාර වන්නේයයි; වෙදිතබ්බං, දතයුත්තේයි.

ඉති, (එවං යථාවුත්තනයෙන,) යම් යම් කියනලද ක්‍රමයකින්; සම්භවා, සම්භවවන පරිද්දෙන්; ඉති තෙකාලිකා ධම්මා කාලමුත්තා ච සම්භවා —පෙ— චතුවීසති සබ්බථාති තෙකාලිකාච, අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න කාලත්‍රයවර්තීවූද; කාලවිමුත්තාච, කාලත්‍රයෙන් මිදුනාවූද; අජ්ඣත්තඤ්ච අධ්‍යාත්මසන්තානයෙහි හටගත්තාවූද; බහිද්ධාච, බහිද්ධාසන්තානයෙහි හටගත්තාවූද; තථා, එපරිද්දෙන්; සඞ්ඛතාච, ප්‍රත්‍යොත්පන්නවූද; අසඞ්ඛතාච, ප්‍රත්‍යොත්පන්න නුවූද; ධම්මා, ධර්මයෝ තුමූ; පඤ්ඤත්ති

නාමරූපානං වසෙන, ප්‍රඥප්ති නාමරූපයන්ගේ වශයෙන්; ඨිතා සිටියාහුය; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; පට්ඨානෙ, අනන්තනයසමන්ත මහාප්‍රස්ථානප්‍රකරණයෙහි; පච්චයානාම, ප්‍රත්‍යයෝ නම්; චතුවීසති, සූවිසිදෙනෙක්; ඨිතා, සිටියාහු වෙත්; හෙවත් පවත්නාහු වෙත්.

තත්ථ, ඒ ප්‍රඥප්තිනාමරූපයන් අතුරෙන්; රූපධම්මා, රූපධර්මයෝ; රූපක්ඛන්ධො ච, රූපස්කන්ධයම වේ; චිත්තචෙතසික සංඛාතා, චිත්තචෛතසිකයයි කියනලද්දාවූ; අරූපිනො, නාමභූතවූ; චත්තාරො ඛන්ධා ච, සතරස්කන්ධයෝද; නිබ්බානංච, නිර්වාණයද; ඉති, මෙසේ; පඤ්චවිධම්පි, පඤ්චප්‍රකාර ධර්මයද; අරූපන්ති ච, අරූපයයි කියාද; නාමන්ති ච, නාමයයි කියාද; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. පන, නාමරූපයෙන්: අන්‍යවූ ප්‍රඥප්තිය දක්වමි:—“තතො” යනු “තෙහි” යනාර්ථයි, තෙහි නාමරූපෙහි, ඒ නාමරූපයන් කෙරෙන් අවශිෂ්ටවූ; පඤ්ඤත්ති, ප්‍රඥප්ති තොමෝ; පඤ්ඤපියත්තා, ප්‍රභෙද වශයෙන් හඟවනු ලබන හෙයින්; පඤ්ඤත්තීතිච, අර්ථ ප්‍රඥප්තියයි කියාද; නොහොත් වාච්‍යප්‍රඥප්තියයි කියාද; පඤ්ඤාපනතො, ප්‍රභෙදවශයෙන් හඟවන හෙයින්, පඤ්ඤත්තීතිච, ශබ්ද ප්‍රඥප්තියයි කියාද නොහොත් වාචකප්‍රඥප්තියයි කියාද; ඉති, මෙසේ; දුවිධා හොති, විප්‍රකාර වෙයි.

කථං? (හොති) කෙසේ වේද යත්? පන, විස්තරකෙරෙමි:— තං තං භූතවිපරිනාමාකාරං, ඒ ඒ පෘථුවීආදී මහාභූතයන්ගේ විපරිනාකාරය හෙවත් පෙරළෙන්නාවූ ආකාරය; උපාදාය, නිශ්‍රය කොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා, පණවනලද්දාවූ හෙවත් ප්‍රභෙද වශයෙන් හඟවන ලද්දාවූ; භූමිපබ්බතාදිකා ච, පෘථුවී පර්වතාදීවූ; සන්තාන ප්‍රඥප්තියද; සම්භාර සන්නිවෙසාකාරං, දැවදඬු ගල් ආදීවූ උපකරණයන්ගේ; රචනා ආකාරය; උපාදාය, නිශ්‍රයකොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා, පණවන ලද්දාවූ හෙවත් ප්‍රභෙද වශයෙන් හඟවන ලද්දාවූ; ගෙහරථසකටාදිකාච, ගෘහය රථය ගැලය සටය පටය යනාදීවූ සමූහප්‍රඥප්තියද; ඛන්ධපඤ්චකං, ස්කන්ධපඤ්චකය; උපාදාය, නිශ්‍රයකොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා, පණවනලද්දාවූ; පුරිස පුග්ගලාදිකා ච, පුරුෂයාය, පුද්ගලයාය යනාදිවූ ජාතිප්‍රඥප්තියද; චන්දාවත්තනාදිකං, සඳුහිරු නක්ෂත්‍ර තාරකාවන්ගේ මහාමෙරුපර්යන්තයෙහි දක්ෂිණාවෘතව පෙරළීයාම් ආදීවූ ආකාරය; උපාදාය, නිශ්‍රයකොට ගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා, පණවනලද්දාවූ; දිසාකාලාදිකාච, පූර්

පශ්චිමාදී දිශාප්‍රඥප්තිය සන්ධ්‍යාදී කාලප්‍රඥප්තිය බත් වෙසක් ආදී මාසප්‍රඥප්තියද; අසම්ඵුට්ඨාකාරං, ඒ ඒ රූපකලාපයෝ තුමූ සපර්ශ නොකරණ ලද්දාවූ ඡිද්‍රවිවරාදීවූ ආකාරය; උපාදාය, නිශ්‍රය කොටගෙණ; තථා තථා, ඒ ඒ ආරම්මණයෙන්; පඤ්ඤත්තා, පණවන ලද්දාවූ; කූපගුහාදිකා ච ලිං ගල්ලෙන් සිදුරු ආදීවූ ආකාශ ප්‍රඥප්තියද; තං තං භූතනිමිත්තං, ඒ ඒ ආකාරයෙන් වැටහෙන්නාවූ පෘථිවිකසිණාදි නිමිත්තද; භාවනාවිසෙසං, පරිකර්මාදී වශයෙන් ප්‍රභේදවූ භාවනාපරම්පරා සඞ්ඛ්‍යාත විශේෂයද; උපාදාය නිශ්‍රයකොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා; පණවන ලද්දාවූ; කසිණ නිමිත්තාදිකාච, කසිණ නිමිති-අසුභ නිමිති-උග්ගහනිමිති-ප්‍රතිභාගනිමිති-ආදීවූ නිමිත්ත ප්‍රඥප්තියද; ඉති, මෙසේ; එවමාදිප්පභෙදා, මේ ආදී ප්‍රභේද ඇත්තාවූ; පරමත්ථතො, අවිපරීතාර්ථවශයෙන්; අවිජ්ජමානාපි, ප්‍රකටව නැත්තාවූද; අත්ථච්ඡායාකාරෙන, පරමාර්ථධර්මයාගේ ඡායාලොකයකට බඳු ආකාරයෙන්; චිත්තුප්පාදානං, චිත්තචෛතසිකයන්ගේ ආලම්බණභූතා, අරමුණුවූ අර්ථප්‍රඥප්තිය; තං තං උපාදාය, ඒ ඒ ආකාරය නිශ්‍රයකොටගෙණ; උපනිධාය, ඒ ඒ ආකාරය ලං කොට; කාරණං කත්වා, ඒ ඒ ආකාරය කාරණයක් කොට; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පරිකප්පියමානා, කල්පනාකරණලබන්නී; සංඛායති, සංඛ්‍යාවට ගන්නා ලැබේද හෙවත් ගණනට ගන්නා ලැබේද; සමඤ්ඤායති, සම්මතකරණු ලැබේද; වොහරීයති, ව්‍යවහාර කරණු ලැබේද; පඤ්ඤාපීයති, ප්‍රභේදවශයෙන් හඟවනු ලැබේද; ඉති තස්මා, එසේ හෙයින්; පඤ්ඤත්තීති, ප්‍රඥප්තියයි කියාද හෙවත් අර්ථප්‍රඥප්තියයි කියා හෝ; පවුච්චති, ප්‍රභේද වශයෙන් කියනු ලැබේ. අයං පඤ්ඤත්ති, මේ ප්‍රඥප්ති තොමෝ; පඤ්ඤාපියත්තා, ප්‍රභේද වශයෙන් හඟවනු ලබන හෙයින්; පඤ්ඤත්ති නාම, අර්ථප්‍රඥප්ති නම් වේ; නොහොත් වාච්‍යප්‍රඥප්ති නම් වේ.

පන, අර්ථප්‍රඥප්තියෙන් අන්‍යවූ; ශබ්දප්‍රඥප්තිය දක්වම්:— පඤ්ඤාපනතො, ප්‍රභේද වශයෙන් හඟවන හෙයින්; පඤ්ඤත්ති, ශබ්දප්‍රඥප්තිය; නාම-නාමකම්මාදිනාමෙන, නාමය නාමකර්මය යනාදී නාමවශයෙන්; හෙවත් නාමය නාමකර්මය නාමධෙය්‍යය නිරුක්තිය ව්‍යඤ්ජනය අභිලාපයයි කියනලද්දාවූ සවැදෑරුම් නාමයෙන් නොහොත් අර්ථයෙහි නමන්නාවූ නාමයයි කියනලද නාමාර්ථයෙහි නැමීමෙන් ප්‍රකාශකරණලද නාමකර්මය අර්ථයෙහි නැමීමෙන් තබන ලද්දේයයි කියනලද්දාවූ නාමධෙය්‍යය නිරුක්ත් කොට කියනලද විග්‍රහ සංඛ්‍යාතවූ නිරුක්ති අර්ථය ප්‍රකාශකරණ

වාක්‍ය සංඛ්‍යාත ව්‍යංජනය අභිමුඛ අර්ථය වාචකවත්තාවූ ශබ්ද සංඛ්‍යාතවූ අභිලාපයයි කියනලද සහාකාර නාමයෙන්; පරිදීපිතා, ප්‍රකාශ කරණ ලද්දීය. සා, සහාකාර නාමයකින් දක්වන ලද්දාවූ ශබ්ද ප්‍රඥප්ති තොමෝ; විජ්ජමානපඤ්ඤත්ති ච, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමාන පඤ්ඤත්ති ච, පරමාර්ථ වශයෙන් ප්‍රකට නැත්තාවූ ප්‍රඥප්තියද; විජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති ච, පරමාර්ථවශයෙන් ප්‍රකටවඇතිව නැතිවන හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති ච, පරමාර්ථ වශයෙන් ප්‍රකටනැතිව ඇතිවන හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකට ඇත්තාවූ ප්‍රඥප්තියද; විජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති ච, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති ච; පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති හෙයින් නැත්තාවූ ප්‍රඥප්තියද, ඉති, මෙසේ; ඡබ්බිධා හොති, සවැදෑරුම් වූවා වෙයි.

පන, විස්තර කෙරෙම්:—තත්‍ථ, ඒ සවැදෑරුම් ප්‍රඥප්තීන් අතුරෙන්; යදා, යම් කලෙක්හි; එතාය, ඒ රූප වේදනාදිවූ ශබ්ද ප්‍රඥප්තිය කරණකොට ගෙණ; පරමත්‍ථතො, පරමාර්ථ වශයෙන්; විජ්ජමානං, ප්‍රකටව ඇති; රූපවේදනාදිං, රූපවේදනාදිය; පඤ්ඤපෙන්ති, පණවත්ද; තදා, එකල්හි; අයං, මේ රූපවේදනාදී ප්‍රඥප්ති තොමෝ; විජ්ජමානපඤ්ඤත්තිඉති, පරමාර්ථ වශයෙන් විද්‍යමානවූ ශබ්දප්‍රඥප්තියයි; පවුච්චති, ප්‍රභේද වශයෙන් කියනු ලැබේ. පන, විද්‍යමාන ප්‍රඥප්තියෙන් අන්‍යවූ; අවිද්‍යමාන ප්‍රඥප්තිය දක්වම්:—යදා, යම් කාලෙක්හි; එතාය ච, භූමිපබ්බතාදී ශබ්දප්‍රඥප්තිය කාරණකොට ගෙණ; පරමත්‍ථතො, පරමාර්ථ වශයෙන්; අවිජ්ජමානං, ප්‍රකටව නැති; භූමිපබ්බතාදිං, භූමිපර්වතාදිය; පඤ්ඤපෙන්ති, ප්‍රභේද වශයෙන් හඟවත්ද; තදා, එකල්හි; අයං, මේ භූමිපර්වතාදීවූ ප්‍රඥප්තිය; අවිජ්ජමානපඤ්ඤත්තිඉති, අවිද්‍යමාන ප්‍රඥප්තියයි; පවුච්චති, ප්‍රභේද වශයෙන් කියනුලැබේ, පන, ඔවුන්ගෙන් අන්‍යවූ මිශ්‍රකනය දක්වම්:—උභින්නං, විද්‍යමාන ප්‍රඥප්ති අවිද්‍යමාන ප්‍රඥප්ති දෙදෙනාගේ; වොමිස්සකවසෙන, මිශ්‍රකිරීම් වශයෙන්; සෙසා, විද්‍යමානප්‍රඥප්ති-අවිද්‍යමානප්‍රඥප්ති දෙදෙනාගෙන් අවශිෂ්ටවූ; විජ්ජමානෙන අවිජ්ජමාන ප්‍රඥප්තිය අවිජ්ජමානෙන විජ්ජමානප්‍රඥප්තිය-විජ්ජමානෙන විජ්ජමාන ප්‍රඥප්තිය—අවිජ්ජමානෙන අවිජ්ජමානප්‍රඥප්තිය යන සතර දෙන; යථාක්කමං, පිළිවෙළින්; ඡළභිඤ්ඤෙ, "ඡ අභිඤ්ඤා යස්ස සො ඡළභිඤ්ඤො" යනු විග්‍රහ බැවින් ෂට්අභිඥාවය; ඉත්‍ථිසද්දො,

සත්‍රීන්ගේ ශබ්දය; චක්ඛුවිඤ්ඤාණං, "චක්ඛුස්මිං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං" යනු විග්‍රහ බැවින් චක්ෂුවස්තුව නිසා හටගන්නා වූ විඤ්ඤාණය; රාජපුත්තො, "රඤ්ඤො පුත්තො රාජපුත්තො" යනු විග්‍රහ බැවින් රජහුගේ පුත්‍රතෙමේ යයි ද; ඉති, වෙදිතබ්බො, මෙසේ දතයුත්තේය.

වචීඝොසානුසාරෙන-පෙ-නිමිත්තාති. වචීඝොසානුසාරෙන, භූමිපබ්බතරූපවෙදනාදී වාඞ්මය ශබ්දය අරමුණු කොටගෙණ; පවත්තාය, හටගත්තාවූ; සොතවිඤ්ඤාණවීථියා, ශ්‍රොත්‍ර විඥාන වීථිය; තදනුවර්තික මනොද්වාර වීථිය යන දෙදෙනාගේ; අනො නොත් මූලටීකාචාර්යාභිමත වශයෙන් හෙවත් ශ්‍රොත්‍ර ද්වාරවීථිය තදනුවර්තිකමනොද්වාරවීථිය සුද්ධමනොද්වාරවීථිය යන වීථිවීථි තුන්දෙනාගේ; පච්ඡානන්තරුප්පන්නමනොද්වාරස්ස, හටගැණීමට අනතුරු තන්හි නාම ප්‍රඥප්තිය සාලපනාකරණ කාරණා ඇත්තාවූ මනොද්වාරවිඤ්ඤාණපරම්පරාවගේ නොහොත් හටගැණීමට අනතුරුව හටගත්තාවූ ඒ භූමිපබ්බත රූපවෙදනාදී නාම තෙමේ පෘථුවි පර්වත රූපවෙදනාදීවූ අර්ථයාගේ නාමයයි කියා පූර්වයෙහි දැනගන්නාලද චිරූ ප්‍රථමකල්පික ප්‍රඥවන්තයන්ගේ සංකෙත ප්‍රඥප්තිය නිශ්‍රය කොට ගත්තාවූ මනොද්වාරික විඥාණපරම්පරාවට; ගොචරා, අරමුණුවූ මනොද්වාරික විඥානපරම්පරාවෙන්; පරං, මත්තෙහි; යස්ස, යම් සම්මුති පරමාර්ථවශයෙන්; තතො, ඒ භූමිපබ්බතරූපවෙදනාදීවූ නාම ප්‍රඥප්තිය ගන්නාවූ ප්‍රභෙදවූ භූමිපබ්බතරූපවෙදනාදීවූ නාම ප්‍රඥප්තියට; අනුසාරෙන, අනුවර්තනයෙන්; අත්ථා, සම්මුතිපරමාර්ථවශයෙන් ප්‍රභෙදවූ භූමිපර්වතවෙදනාදීවූ අර්ථප්‍රඥප්තීහු තුමූ; විඤ්ඤායන්ති, දැනගනු ලැබෙත්ද; සා අයං පඤ්ඤත්ති, ඒ භූමිපර්වතරූපවෙදනාදී අක්ෂරාවලි සංඛ්‍යාත නාම ප්‍රඥප්තිය; ලොකසඞ්කෙතනිම්මිතා, ප්‍රථම කල්පික නුවණැත්තන්ගේ සංකෙත ප්‍රඥප්ති වශයෙන් සිද්ධවූවා යයි; විඤ්ඤෙය්‍යා, දතයුත්තීය.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්මාර්ථ සංග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; පච්චයසඞ්ගහවිභාගො නාම, ප්‍රත්‍යය සංග්‍රහවිභාගනම්වූ; අට්ඨමො පරිච්ඡෙදො, අටවෙනි පරිච්ඡෙදය; ඉති, මෙසේ සම්පූර්ණ වූයේය.

## අටවෙනි පරිච්ඡේදය නිමි.

## (භා)

ඒ සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් "ඡධා නාමනාමු නාමසස" යනාදී පාඨය කී හෙයින් නාමධර්මය නාමධර්මයට සයාකාරයකින් ද; නාමරූප දෙදෙන එකතුව නාමරූප දෙදෙනාහට පස්ආකාරයකින්ද, උපකාර වේ. නාමධර්ම තෙමේ රූපයටද, රූපධර්ම තෙමේ නාමයටද, එක් ආකාරයකින් උපකාර වේ. ප්‍රඥප්ති නාම රූප දෙදෙන වනාහි නාමයට දෙයාකාරයකින්ද, නාමරූප දෙදෙන නාමරූපදෙදෙනාහට නවාකාරයකින්ද උපකාර වෙත්. මෙසේ සූවිසි ප්‍රත්‍යයධර්මයෝ සයාකාරයකින් උපකාර වෙත්. "නාමය නාමධර්මයට උපකාර වන්නේයයි" යනු අනන්තර ප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, නත්ථිප්‍රත්‍යය, විගතප්‍රත්‍යය, ආසෙවන ප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, යනමේ සයාකාරයකින් නාමධර්මය නාමධර්මයට උපකාරවෙයි. "නාමධර්ම තෙමේ නාමරූපදෙදෙනාහට පස්ආකාරයකින් උපකාර වන්නේ කෙසේද යත්? හෙතු ප්‍රත්‍යය, ධ්‍යානප්‍රත්‍යය, මාර්ගප්‍රත්‍යය, කර්මප්‍රත්‍යය, විපාකප්‍රත්‍යය යන පස් ආකාරයකින් නාමයතෙම නාමරූපයන්ට උපකාරවේ. නාමධර්මය තෙමේ රූපධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය යන එකම ආකාරයකින් උපකාර වෙයි. රූපධර්ම තෙමේ නාමධර්මයට පුරෙජාතප්‍රත්‍යයෙන් උපකාර වෙයි. ප්‍රඥප්තිනාමරූප දෙදෙන තුමූ නාමධර්මයට ආලම්බණවශයෙන් හා උපනිස්සය වශයෙන්දැයි යන දෙයාකාරයෙන් උපකාර වෙත්.

ඒ ආලම්බණ උපනිස්සය දෙදෙන අතුරෙන් අරමුණතෙම රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම වශයෙන් සවැදෑරුම් වෙයි. උපනිශ්‍රය ප්‍රත්‍යය තෙම වනාහි ආරම්මණූපනිශ්‍රයද අනන්තරූප නිශ්‍රයද ප්‍රකෘතොපනිශ්‍රයදැයි කියා තුන්වැදෑරුම් වේ. ඒ තුන අතුරෙන් ගරුවශයෙන් ගන්නාලද අරමුණම ආරම්මණූපනිශ්‍රය නම්වේ. අනතුරුව නිරුද්ධවී ගියාවූ චිත්තචෛතසික ධර්මයෝ අනන්තරූපනිශ්‍රය නම්.

රාගද්වෙෂාදී වූ ධර්මයෝ ද ශ්‍රද්ධාශීලාදී වූ ධර්මයෝ ද සැපය ද දුක ද බාලකල්‍යාණ පුද්ගල සෙවනය ද යහපත් අයහපත් බොජුන ද සැප නො සැප සෘතුවද සැප නොසැප සෙනසුන ද සුදුසු පරිද්දෙන් තමාගේ වශයෙන් ද බාහිර වූ අනුන්ගේ වශයෙන්ද කුශලාදී ධර්මයන් ප්‍රත්‍යයවේ. කුශලාකුශල කර්මය තෙම විපාකයන්ටද ප්‍රත්‍යය වේ තුයි ප්‍රකෘතොපනිශ්‍රයප්‍රත්‍යය මෙසේ බහු ප්‍රකාරයෙන්වේ.

නාමරූපදෙදෙන වනාහි නාමරූපසඳදෙනාහට අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත, යන නවාකාරයකින් උපකාර වෙත්. ඒ ප්‍රඥප්ති ධර්මයන් අතුරෙන්ද පෘථුවි පර්වතාදී ශබ්දප්‍රඥප්තිය ද, ගෙහරථ සකටාදී සමූහ ප්‍රඥප්තියද, ස්ත්‍රී පුරුෂ සත්ව පුද්ගලාදී ප්‍රඥප්තියද, චන්ද්‍රාවර්තනාදියෙන් ගවගන්නාවූ දිසාප්‍රඥප්තියද, කසිණ අසුභාදී වූ නිමිත්ත ප්‍රඥප්තිය ද, යන ප්‍රඥප්තිහු තුමූ පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකට නැතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියයි කියාද, මෙසේ ප්‍රඥප්තිය සවැදෑරුම්වේ. ඒ සවැදෑරුම් ප්‍රඥප්තීන් අතුරෙන් රූපවේදනාදී නාමයෝ තුමූ පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. භූමිපර්වත වෘක්ෂලතාදී ප්‍රඥප්ති සංඛ්‍යාතවූ නාමයෝ තුමූ පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම්වේ. ෂඩභිඥලාභී පුද්ගලයා යන ප්‍රඥප්තියෙහි ෂඩ්අභිඥව යනු පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ධර්මයෝ සදෙනෙක් වෙති. එතකුදුවුවත් මේ ධර්මයන් සඳහා ලැබුවාවූ සත්වපුද්ගලාදී කිසිවෙක් ප්‍රකටව නැති හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම්වෙ. "ඉත්ථි සද්දො" යන්නෙහි ස්ත්‍රියයි යම් ස්වභාව ධර්මයක් ප්‍රකටව නැත්තේයි. එතකුදුවුවත් ශබ්ද සංඛ්‍යාතවූ ධර්මයක් ප්‍රකටව ඇති බැවින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. "චක්ඛුවිඤ්ඤාණං" යන ශබ්දයෙහි චක්ඛු යන ධර්මයක්ද විඤ්ඤාණං යන ධර්මයක්ද පරමාර්ථයෙහි ඇත්තේයි. එහෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. "රාජපුත්තො" යන ශබ්දයෙහි පරමාර්ථ වශයෙන් රාජ නම් වූ ද පුත්‍ර නම් වූ ද කෙනෙක් නැත්තේය. එහෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම් වේ.

වාක්ශබ්දානුසාරයෙන් ගවගත් ශ්‍රොත්‍රවිඥාන වීථියට අනතුරුව උපන් නාමග්‍රහණ මනොවාරයට ගොචර වූ අර්ථ

වූ යම් නාම ප්‍රඥප්තියක්හුගේ අනුසාරයෙන් අනුචින්තනයෙන් ඒ නාමග්‍රහණයෙන් මත්තෙහි සම්මුති පරමාර්ථ භේද ඇති අර්ථයෝ දතහැකි ලැබෙත්ද අර්ථය ඇඟවීමට හේතුවූ පණ්ඩිත ලෝකයාගේ සලකුණෙන් සිපදවන ලද්දාවූ අර්ථය ඇඟවීම ඇති ඒ මේ නාමප්‍රඥප්ති තොමෝ නැතවතුන් විසින් දතයුත් තීය. මෙහි "සොතවිඤ්ඤාණ වීථියා" යන මේ පෙදින් තදනුවර්තික මනොද්වාර වීථි තොමෝ ද සංග්‍රහකරන ලද්දීවෙයි. එහෙයින් "ගො-ණො" යන ශබ්ද දෙකින් හෙවත් අක්ෂරවලයෙන් එකි එකී ශබ්දයක් අරබ ශ්‍රොත්‍රද්වාර වීථිය තදනුවර්තික මනොද්වාර වීථිය යන දෙදෙනාගේ වශයෙන් ප්‍රත්‍යොත්පන්න අතීතාරම්මණ ඇති ජවනවාරයෝ දෙදෙනෙක් දෙදෙනෙක් වෙත්. එයින් මත්තෙහි අක්ෂරාවලිගෘත නාමය අගවත් නාවූ එක් ජවන වාරයෙක, එයින් මත්තෙහි අර්ථාවබොධක එක් ජවන වාරයෙක්දැයි මෙසේ චිත්තවීථිහු සදෙනෙක් ලැබෙත්හුයි මෙසේ අල්පාක්ෂර බහ්වාක්ෂර වශයෙන් වීථි ගණනා තොමෝ දතයුත් තීය, මේ ක්‍රමයෙන් රූප ගන්ධාදී ආරම්මණයන්හිදු එක් විඤ්ඤාණවීථියක්ද එක්තදනුවර්තික වීථියක්ද එක් නාමඥාපක වීථියක්ද, එක් අර්ථාවබොධක වීථියක්දැයි මෙසේ චිත්තවීථිහු සතර දෙනෙක් ලැබෙත්යයි දතයුත්තීය.

අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි ප්‍රත්‍යසඞ්ග්‍රහ විභාග නම්වූ

## අටවෙනි පරිච්ඡේදය නිමියේයි.

---

සමථවිපස්සනානං-පෙ-යථාකකමං.

(ස)

ඉතොපරං, මේ ප්‍රත්‍යසංග්‍රහයෙන් මත්තෙහි; සමථ විපස්සනානං, සමථවිදර්ශනායයි කියන ලද්දාවූ තොහොත් නීවරණ ප්‍රධාන කෙලශයන් සන්සිඳුවන අර්ථයෙන් සමථවූද අනිත්‍ය දුඃඛ අනාත්ම සංඛ්‍යාතවූ විවිධාකාරයෙන් දක්කයුතු හෙයින් විදර්ශනා නම් වූද; භාවනානං, ද්විප්‍රකාර වූ භාවනාවන්ගේ; දුවිධං අපි, ද්විප්‍රකාරවූද; කම්මට්ඨානං, කර්මස්ථානය තොහොත් ද්විප්‍රකාරවූ භාවනාකර්මයට ස්ථානවන හෙයින් කර්මස්ථාන නම් වූ පෘථුවීකසිණාදිවූ ප්‍රඥප්තිය ත්‍රෛභූමික සංස්කාර සංඛ්‍යාතවූ ආලම්බණය තොහොත් පසුපසු වූ භාවනාකර්මයට ආසන්න කාරණ වන හෙයින් පූර්වපූර්වවූ භාවනාවන්ගේ පරම්පරා සංඛ්‍යාතවූ කර්මස්ථානය තොහොත් ධ්‍යානසුඛ ඵලසුඛ නිර්වාණසුඛාදීන්ට

කාරණාවූ භාවනා සඞ්ඛ්‍යාතවූ කර්මස්ථානය, යථාක්කමං, පිළි වෙළින්; අහං, යනු අධ්‍යාහාරයි. පවක්ඛාමි, ප්‍රභෙද වශයෙන් කියමි.

තත්‍ථ, ඒ සමථ භාවනා විදර්ශනා භාවනාවන් අතුරෙන්; සමථසඞ්ගහෙ, සමථසංග්‍රහයෙහි; තාව, පළමුකොට; "එවං විභාගො වෙදිතබ්බො" යනු පාඨශෙෂයි. දසකසිණානි ච, දස කිසුණ්කෙනෙක්ද; දසඅසුභා ච, දසඅසුභ කෙනෙක් ද; දසඅනු ස්සතියො ච, දසඅනුසි කෙනෙක්ද; චතස්සො අප්පමඤ්ඤායො ච, සතර අප්‍රමාණ්‍ය කෙනෙක්ද; එකා සඤ්ඤා ච, හුදු සංඥවෙක් ද; එකං වවත්‍ථානං ච, හුදු ව්‍යවස්ථාපනයෙක්ද; චත්තාරො ආරූ ප්පා ච, සතර ආරූප්‍යයෝද, ඉති, මෙසේ; සත්තවිධෙන, සත්ප්‍රකා රයකින්; සමථකම්මට්ඨාන සඞ්ගහො, සමථකර්මස්ථාන සංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි.

රාගචරිතාච, රාගප්‍රකෘතියෙක්ද; නොහොත් රාගයෙහි රමණය කිරීමද; හෙවත් සෙසු ධර්මයන් කෙරෙන් රාගාධික වීම ද; දොසචරිතාච, ද්වෙෂප්‍රකෘතියද; නොහොත් ද්වෙෂය අධික බවද; මොහචරිතාච, මොහප්‍රකෘතියද; සද්ධාචරිතාච, ශ්‍රද්ධාප්‍රකෘ තියද; බුද්ධිචරිතාච, බුද්ධිප්‍රකෘතියද; හෙවත් නුවණැති බවද; විතක්කචරිතාච, විතර්කප්‍රකෘතියද; නොහොත් නන්අරමුණු කල්පනා කිරීමද; ඉති, මෙසේ ඡබ්බිධෙන, සයාකාරයකින්; චරි තසඞ්ගහො, චරිතසංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි.

පරිකම්මභාවනා ච, පිරිකම් භාවනාවද; නොහොත් සකස් කරන්නාවූ භාවනාවද හෙවත් අර්පණාභාවනාවගේ පූර්වභාගයෙහි හටගන්නාවූ කාමාවචර භාවනාවද; උපචාරභාවනා ච, උපචාර භාවනාවද නොහොත් තදඞ්ගප්‍රහාණයෙන් නීවරණයන් දුරු කළ තැන් පටන් ගොත්‍රභූ චිත්තය අවසන්කොට ඇත්තාවූ කාමාවචරභාවනාවද; අප්පණාභාවනා ච. අර්පනාවනාවද; නොහොත් මහද්ගත බවට පැමිණියාවූ අර්පනාභාවනාවද; ඉති, මෙසේ; තිස්සො භාවනා, භාවනාවෝ තුන් දෙනෙක්; වෙදිතබ්බා, දතයුත්තාහුය.

පරිකම්මනිමිත්තඤ්ච, පිරියම් නිමිත්තද; නොහොත් පඨවි පඨවි යනාදි වශයෙන් භාවනාකිරීමය පරිකර්මභාවනාවගේ අර මුණුවූ කසිණමණ්ඩලාදිවූ පරිකර්ම නිමිත්තද; උග්ගහනිමිත්තඤ්ච, උග්ගහනිමිත්තද නොහොත් ඇසින් දක්නාලද කලක් මෙන් මනොද්වාරික කුශල ජවනයන් විසින් ගන්නාලද අරමුණක්වූ

කසිණමණ්ඩලාදිවූ උග්ගහ නිමිත්තද; නොහොත් චක්ඛුවිඤ්ඤාණයෙන් දක්නාලද්දක් වැනිවූ මනොද්වාරික කුශලජවනයන් විසින් ගන්නාවූ යොගීපුද්ගලයාගේ අරමුණුවූ කසිණමණ්ඩලාදී උග්ගහ නිමිත්තද; පටිභාගනිමිත්තංච, ප්‍රතිභාගනිමිත්තද නොහොත් උග්ගහනිමිත්ත හා සදෘශවූ නීලවර්ණාදී කසිණදෝෂයන්ගෙන් මිදුනාවූ උපචාර අර්පණාභාවනාවන්ට අරමුණුවූ කසිණමණ්ඩල සඞ්ඛ්‍යාත ප්‍රතිභාග නිමිත්තද; ඉති, මෙසේ; තීණිනිමිත්තානි ච, නිමිති තුන්දෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

කථං?, කෙසේ දතයුත්තාහුද? යත්; පඨවීකසිණංච, මහා පෘථිවියම එකදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථකසිණ නම්වූ පෘථිවී කසිණයද; ආපොකසිණංච, ජලයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවර නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථ වශයෙන් කසිණ නම්වූ ආපොකසිණයද; තෙජොකසිණංච, වහ්නියම එක් ප්‍රදෙශයෙක්හි නො සිට කෙළවරක් නැති පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ තෙජොකසිණයද; වායොකසිණංච, වාතයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ වායොකසිණයද; නීලකසිණංච, නීලවර්ණයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ නීලකසිණයද; පීතකසිණංච, සුවර්ණවර්ණමය එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙහි කසිණ නම්වූ පීතකසිණයද; ලොහිත කසිණංච, රක්තවර්ණයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් කසිණ නම්වූ ලොහිතකසිණයද; ඔදාතකසිණංච, සෙවතවර්ණයම එක් ප්‍රදේශයෙක්හි නො සිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ ඔදාතකසිණයද; ආකාශකසිණංච, පිරිසිඳගන්නාලද ආකාසයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ සපරිච්ඡින්න ආකාශ කසිණයද; ආලොක කසිණංච, බිත්තිකවුළු ආදියෙන් වැටහෙන්නාවූ චන්ද්‍රසූර්‍ය්‍යාදීන්ගේ ආලොකයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ ආලොක කසිණයද; ඉති ඉමානි, මේ කසිණයෝ තුමූ; දසකසිණානි නාම, දසකසිණයෝ නම් වෙත්. (නොහොත්) ඉති ඉමානි දස, මොව්හු දසදෙන; කසිණානි නාම, කසිණයෝ නම් වෙති.

උද්ධුමාතකංච, මළදවසෙන් පසුව වාතයෙන් පිරුණාවූ සම්පසුමබිසක් මෙන් ඉදිමීමෙන් පිළිකුල්වූ මළසිරුරද; විනීලකංච,

ශ්වේතරක්තවර්ණාදිය හා මිශ්‍රවූ බොහෝ සෙයින් නීලවර්ණය ඇති හෙයින් පිළිකුල් කටයුතු මලසිරුරද; විපුබ්බකච, පූයාව වැගිරීමෙන් පිළිකුල් කටයුතුවූ මලසිරුරද; විච්ඡිද්දකච, මධ්‍යයෙන් සිඳීමෙන් පිළිකුල් කටයුතුවූ මලසිරුරද; වික්ඛායිතකච, සොන සිගාලාදීන් විසින් නොයෙක් ප්‍රකාරයෙන් කඩා කන බැවින් පිළිකුල් කටයුතුවූ මල සිරුරද; වික්ඛිත්තකච, සොනසිගාලාදීන් විසින් අනෙකප්‍රකාරයෙන් කඩකඩ කොට දමන ලදුව පිළිකුල් කටයුතුවූ මලසිරුරද; හතවික්ඛිත්තකච, කාකපදාකාර ආවුදයෙන් ඇන දමන ලදුව පිළිකුල් කටයුතුවූ මලසිරුරද; ලොහිතකච, වැගිරෙන්නාවූ ලෙහෙ ඇති බැවින් පිළිකුල් ඇති මලසිරුරද; පුළුවකච, පනුවන්ගෙන් පිරියිය හෙයින් පිළිකුල් කටයුතුවූ මලකුණද; අට්ඨිකච, පිළිකුල් කටයුතුවූ ඇටසැකිල්ලද නොහොත් හුදු ඇටයක්ද; ඉතිඉමෙ දස, මේ දස ප්‍රකාරවූ ශරීරයෝ තුමූ; අසුභා නාම, අසුභනම් වෙත්.

බුද්ධානුස්සති ච, අරහං යනාදී බුදුහුගේ නවපෙදෙහි සඞ්ගෘහිතවූ ගුණසමූහය නැවත නැවත මෙනෙහි කිරීමද; ධම්මානුස්සතිච, ස්වාක්ඛාතතාදිවූ නවලොකොත්තර ධර්මයාගේ සවැදෑරුම්වූ ගුණසමූහය නැවත නැවත මෙනෙහි කිරීමද; සඞ්ඝානුස්සති ච, අෂ්ටාර්‍ය පුද්ගල මහාසඞ්ඝයාගේ සුප්‍රතිපන්නතාදීවූ නවවිධ ගුණ නැවත නැවත මෙනෙහි කිරීමද; සීලානුස්සතිච, තමාගේ සන්තානයෙහි විද්‍යමානවූ ශීලගුණය නැවත නැවත මෙනෙහි කිරීමද; චාගානුස්සතිච, තම තමාගේ ත්‍යාගධර්මය නැවත නැවත මෙනෙහි කිරීමද; දෙවතානුස්සතිච, ශ්‍රද්ධාදී ගුණයෙන් සම්පූර්ණවූ දෙවතාවෝ තුමූ දෙවත්වයට පැමිණියාහුද යම් ගුණයෝ තුමූ මා කෙරෙහිද විද්‍යමානයයි මෙසේ දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබා දෙවියන්ගේ ශ්‍රද්ධාදී ගුණය හා සදෘශවූ තමාගේ ශ්‍රද්ධාදී ගුණය නැවත නැවත සිහිකිරීමද; උපසමානුස්සතිච, නිර්වාණ ධර්මයාගේ රාගක්ඛය විරාග තණ්හක්ඛය යනාදී ගුණයන් නැවත නැවත සිහිකිරීමද; මරණානුස්සතිච, පූර්වයෙහි මෙබඳු මෙබඳු ගුණයෙන් සම්පූර්ණවූ මහාසම්මතාදී නරෙන්ද්‍රයන් පටන් ලොව්තුරා සර්වඥයන් වහන්සේ දක්වා සියල්ලෝම මරණයට පත්වූහ. ඒ මරණයද ඒකාන්තයෙන් මටත් වන්නේයයි මෙසේ මරණය නැවත නැවත මෙනෙහි කිරීමද; කායගතාසතිච, හිසකේ ආදිවූ දෙතිස් කුණපය වර්ණ ගන්ධ සංස්ථාන ඔකාසාදී වශයෙන් පිළිකුලැයි නැවත නැවත මෙනෙහි කිරීමද; ආනාපානසතිච, ඇතුලට ගන්නාවූ වාතය හා පිටතට ගන්නාවූ වාතය අරමුණුකොට මෙනෙහි

කිරීමද; යන ඉති ඉමා දස, මොව්හු දසදෙන අනුස්සතියෝනාම, නැවත නැවත මෙනෙහි කරණ හෙයින් අනුස්සති නම් වෙත්.

මෙත්තා ච, අනන්ත සුඛිත දුක්ඛිත සත්වප්‍රඥප්තිය අරමුණු කොට ගෙණ සමවූ මිත්‍රධර්මය පැවැත්වීමද; කරුණා ච, අනන්ත වූ දුක්ඛිත සත්වප්‍රඥප්තිය අරමුණුකොට ගෙණ අනුකම්පා කරන්නාවූ කාරුණ්‍යභාවනාවද; මුදිතා ච, අනන්තවූ සුඛිත සත්වප්‍රඥප්තිය අරමුණුකොට ගෙණ සතුටුවීමද; උපෙක්ඛාච, අනන්තවූ සුඛිත දුක්ඛිත සත්වප්‍රඥප්තිය අරමුණුකොට මධ්‍යස්තව නැරඹීම්ද; ඉති ඉමාචතස්සො, මේ භාවනාවෝ සතරදෙන තුමූ; අප්පමඤ්ඤායො නාම, ප්‍රමාණාතික්‍රාන්ත සත්වවිෂයෙහි පවත්වන හෙයින් අප්‍රමාණ නම්. බ්‍රහ්මවිහාරෙතිච, බ්‍රහ්මයන්ගේ හා බුද්ධාදීන්ගේ ඉරියව් පැවැත්වීම වනහෙයින් බ්‍රහ්මවිහාරයයි කියාද; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ,

ආහාරෙ, තමා විසින් ගිලින ලද ආහාරයෙහි; පටික්කූල සඤ්ඤා, පිළිකුල්ය යි යන සංඥාව; එකා සඤ්ඤා නාම, එක් සංඥා නම්. චතුධාතුවවත්ථානං, පඨවී-ආපො-තෙජො-වායො-යන සතරධාතුව වෙන් කිරීම; එකං වවත්ථානං නාම, එකම වවත්ථාන නම. ආකාසානඤ්චායතනාදයො ආකාසානඤ්චායතනාදීහු තුමූ නොහොත් සතර ආයතනයෝ තුමූ; චත්තාරො ආරුප්පා නාම, ආරුප්පයෝ සතරදෙන නම්වෙති. ඉති, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙනුදු; සමථනිද්දෙසෙ, සමථයන්ගේ දැක්වීමෙහි; චත්තාළීසකම්මට්ඨානානි භවන්ති, සතළිස් කර්මස්ථානකෙනෙක් වෙති. පන, විශෙෂාර්ථයක් දක්වමි:—

චරිතාසු, සවැදෑරුම් චරිතයන් අතුරෙන්; රාගචරිතස්ස, රාගප්‍රකෘති ඇත්තා වූ පුද්ගලයාහට නොහොත් රාගබහුල වූ පුරුෂයාහට; දසඅසුභාච, දසඅසුභකර්මස්ථානයෝ ද; කායගතාසති සංඛාතා, හිසකේ ආදිවූ කායකොට්ඨාසයෙහි ස්මෘතිය යි කියන ලද්දාවූ; කොට්ඨාසභාවනා ච, හිසකේ ආදී වූ කායකොට්ඨාසයෙහි වැඩීම් සංඛ්‍යාත වූ භාවනාව ද; සප්පායා, සත්ප්‍රාය වෙති. චතස්සො අප්පමඤ්ඤායො, සතර අප්‍රාමාණ්‍ය ධර්මයෝ ද; නීලාදීනි, නීලපීත ලොහිතාවදාත සංඛ්‍යාත වූ; චත්තාරි කසිණානි, සතර වර්ණකසිණයෝද; දොසචරිතස්ස, වෙෂ ප්‍රකෘති වූ නොහොත් වෙෂ බහුලයාහට; සප්පායානි, යොග්‍ය වූවාහු වෙති. ආනාපානං, ආනාපානස්මෘතිය; මොහචරිතස්ස, මොහප්‍රකෘති ඇත්තාහට ද; විතක්කචරිතස්ස ච, විතර්කප්‍රකෘති ඇත්තා වූ පුද්ගලයාහට ද; සප්පායං, යොග්‍යවේ. බුද්ධානුස්සති ආදයො, බුද්ධානුස්සති-ධම්මානුස්සති—සඞ්ඝානුස්සති-සීලානුස්සති -චාගානු

ස්සති-දෙවතානුස්සතිය යි කියන ලද; ඡ, අනුස්සතීහු සදෙන; සද්ධාචරිතස්ස, ශ්‍රද්ධාචරිතයාහට සප්පායා, සැපයෙත්. මරණ-උපසම-සඤ්ඤා, මරණානුස්මෘති උපසමානුස්මෘති, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව ය; වවත්ථානානි, චතුධාතු ව්‍යවස්ථානය යන මොව්හු; බුද්ධිචරිතස්ස, බුද්ධිප්‍රකෘති ඇත්තාවූ පුද්ගලයාහට; සප්පායානි, යොග්‍ය වෙත්. පන, අසාධාරණයෙන් අන්‍ය වූ සාධාරණ ක්‍රමය කියමි:—සෙසානි, කියන ලද්දවුන් කෙරෙන් අවශිෂ්ටවූ, සබ්බානිපි, සියලු ම, කම්මට්ඨානානි, දශප්‍රකාරවූ කර්මස්ථානයෝ තුමූ හෙවත් පඨවි ආපො තෙජො වායො ආකාස ආලොක වශයෙන් සැවැදෑරුම් වූ කසිණයෝය. සතර ආරූප්පයෝ ය යි කියන ලද්දු වූ දශකර්මස්ථානයෝ තුමූ; සබ්බසමපි, සියලු චරිත ඇති පුද්ගලයන්ට ම; සප්පායානි, යොග්‍ය වූවාහු වෙත්. තත්‍රාපි, ඒ කර්මස්ථානයන් අතුරෙ තුදු; කසිණෙසු, සවැදෑරුම් කසිණයන් අතුරෙන්; පුථුලං, මහත් වූ කසිණ මණ්ඩල තෙමේ; මොහචරිතස්ස, මොහචරිතයාහට; සප්පායං, යොග්‍යය; ඛුද්දකං, කුඩාවූ කසිණ මණ්ඩල තෙමේ; විතක්කචරිතස්සෙව, විතර්කබහුලයාහටම; සප්පායං, යොග්‍ය යි.

අයං, මේ කියන ලද්දේ වනාහි; එත්ථ, මේ සමථනිර්දේශයෙහි; සප්පාය භෙදො, යොග්‍ය වූ ප්‍රභෙදය යි.

## සත්ප්‍රාය භෙදය නිමි.

—— o:o ——

පන, සප්පායභෙදයෙන් අන්‍යවූ භාවනාභෙදය කියමි:—භාවනාසු, භාවනාවන් අතුරෙන්; සබ්බත්ථාපි, සියලු සමසතළිස් කර්මස්ථානයෙහිද; පරිකම්මභාවනා, පරිකර්මභාවනාව; ලබ්භතෙව, ලැබිය යුතු මැ යි. බුද්ධානුස්සතිආදිසු, බුද්ධානුස්මෘති ආදීවූ; අට්ඨසු කම්මට්ඨානෙසු, කර්මස්ථාන අටෙක්හි ද; සඤ්ඤා-වවත්ථානෙසුච ඉති, ආහාරෙ පටික්කූලසඤ්ඤා චතුධාතුවවත්ථානයෙහිදැයි; ඉති, මෙසේ; දසසු කම්මට්ඨානෙසු, දසකර්මස්ථානයෙහි; උපචාරභාවනාව, උපචාරභාවනා මාත්‍රයක් ම; සම්පජ්ජති, පැමිණේ. නත්ථි අප්පණා භාවනා, අර්පණාභාවනාතොමෝ නැත්තීය. සෙසෙසු කියන ලද කර්මස්ථානදසදෙනාංගෙන් අවශිෂ්ටවූ; සමතිංසකම්මට්ඨානෙසු පන, සමතිස් කර්මස්ථානයෙහි වනාහි; අප්පණාභාවනාපි, අර්පණා භාවනා තොමෝ ද; සම්පජ්ජති, පැමිණෙයි. හෙවත් සිඛණවසි තත්‍රාපි, ඒ සමතිස් කර්මස්ථානයන් අතුරෙ තුදු; දසකසිණානිච, දසකසිණප්‍රඥප්තීහුද; ආනාපානංච, ආනාපානසතිය ද; පඤ්චකජ්ඣානිකානි, රූපාවචරධ්‍යාන පස ම ලැබිය යුත්තාහුය. දස

අසුභා ච, දසඅසුභයෝ ද; කායගතාසති ච, කායගතාසතිය ද; පඨමජ්ඣානිකා, රූපාවචරප්‍රථමධ්‍යානය ම ලැබිය යුත්තාහුය. මෙත්තාදයො, මෙත්තා-කරුණා-මුදිතා යන බ්‍රහ්මවිහාරයෝ; තයො, තුන්දෙන; චතුක්කජ්ඣානිකා, ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යානයෝ ලැබිය යුත්තාහු වෙත්. උපෙක්ඛා උපෙක්ෂාබ්‍රහ්මවිහාරභාවනා තොමෝ; පඤ්චමජ්ඣානිකා, පඤ්චම ධ්‍යානය ම ලැබිය යුත්තීවෙයි. ඉති, මෙසේ; ඡබ්බීසතිකම්මට්ඨානානි, සවිසි කර්මස්ථානයෝ ඇමූ; රූපාවචරජ්ඣානිකානි, රූපාවචරධ්‍යානයෝම ලැබිය යුත්තාහු වෙත්. පන, රූපාවචරධ්‍යානාලම්බනයෙන් අන්‍යවූ අරූපධ්‍යානාලම්බනය කියම්:—චත්තාරො ආරුප්පා, ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතන වශයෙන් සතරාකාර වූ අරූපයෝ තුමූ; අරූපජ්ඣානිකා, අරූපධ්‍යානාරම්මණයෝ නම්වෙත්.

අයං, මේ කියන ලද්දේ වනාහි; එත්ථ, මේ සමථනිද්දේශයෙහි; භාවනා භෙදෙ, භාවනාවන්ගේ ප්‍රභෙද ක්‍රමය යි.

## භාවනා භෙදය නිමි.

———o:o———

පන, භාවනාභෙදයෙන් අන්‍යවූ නිමිත්ත භෙදය කියම්:— හෙවත් තොරතුර කියම්:-නිමිත්තෙසු, නිමිත්තයන් අතුරෙන්; පරිකම්මනිමිත්තඤ්ච, පරිකර්මනිමිත්ත ද; හෙවත් "පඨවි පඨවි" යනාදීන් භාවනා කරන්නා වූ පරිකර්මභාවනාවගේ අරමුණු වූ කසිණමණ්ඩලාදිය සංඛ්‍යාත පරිකර්මනිමිත්ත ද; උග්ගහනිමිත්තඤ්ච උද්ග්‍රහනිමිත්ත ද නොහොත් චක්ෂුර්විඥානයෙන් දක්නා ලද් දක් මෙන් මනොද්වාරිකකුශල ජවනයන් විසින් ගන්නා ලද්දා වූ කසිණමණ්ඩලාදිය සංඛ්‍යාත උද්ග්‍රහනිමිත්ත ද; සබ්බත්ථාපි, සියලුම සමසතළිස් කර්මස්ථානයෙහි ම: යථාරහං, සුදුසු පරිද්දෙන්; පරියායෙන, පරියාය වශයෙන් හෙවත් උපචාර වශයෙන්; ලබ්භන්ති එව, ලැබෙත් මැ යි. පන, ලැබිය යුත්තෙන් අන්‍ය වූ නො ලැබිය යුත්ත දක්වම්:—පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්තය නොහොත් උද්ග්‍රහනිමිත්තට බඳුවූ නීලවර්ණාදී කසිණ දෝෂයන්ගෙන් මිදුනාවූ උපචාර අර්පණාභාවනාවන්ට අරමුණු වන්නාවූ කසිණමණ්ඩලාදි සංඛ්‍යාත ප්‍රතිභාගනිමිත්තය; කසිණාසුභකොට්ඨාස ආනාපානෙසෙව, දසකසිණප්‍රඥප්තිය දසඅසුභ ප්‍රඥප්තිය හිසකේ ආදීවූ කායකොට්ඨාස ප්‍රඥප්තිය ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය යන දෙවිස්සෙහිම; ලබ්භති, ලැබිය යුත්තේය; හි, ඒ එසේමැයි. තත්ථ, එදෙවිසිප්‍රඥප්තියෙහි; පටිභාගනිමිත්තං,

ප්‍රතිභාගනිමිත්ත; ආරබ්භ, අරමුණු කොට ගෙණ; උපචාර සමාධිච, උපචාර සමාධිය ද; අප්පණාසමාධි ච, අර්පණාසමාධිය ද; පවත්තන්ති, හටගණිත්. කථං? (පවත්තන්ති,) කෙසේ හටගත් නාහුද? යත්; හි, විස්තර කෙරෙම්:-ආදිකම්මිකස්ස, පළමු කොට කර්මස්ථානභාවනා වඩන්නා වූ; පඨවී මණ්ඩලාදීසු, පෘථුවී කසිණ මණ්ඩලාදීයෙහි; නිමිත්තං උග්ගණ්හන්තස්ස, අරමුණ ගන්නාවූ යොගාවචර පුද්ගලයාහට හෙවත් පුද්ගලයාගේ; තං ආලම්බණං, ඒ පෘථුවීකසිණාදි අරමුණ; පරිකම්මනිමිත්තන්ති, පරිකර්ම නිමිත්තය යි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. සා ච භාවනා,ඒභාවනා තොමෝ ද;පරිකම්මභාවනා නාම,පරිකර්ම භාවනා නම්වේ. පන, පරිකර්මනිමිත්තෙන් අන්‍යවූ උද්ග්‍රහනිමිත්ත දක්වම්:-යදා, යම් කාලෙක්හි; තං නිමිත්තං, ඒ පරිකර්මනිමිත්තය යි කියනලද්දාවූ පෘථුවීකසිණමණ්ඩලාදී අරමුණ නොහොත් අරමුණු තෙමේ; චිත්තෙන, මනොද්වාරික සිත කරණකොටගෙණ; සමුග්ගහිතං හොති, මොනවට ගන්නා ලද්දේ වේද; චක්ඛුනා, චක්ෂුප්‍රසාදයෙන් නොහොත් චක්ෂුර්විඥාන චිත්තයෙන්; පස්සන්තස්සෙව, දක්නෙක් හටමෙන්; මනොද්වාරස්ස, මනොද්වාරයට හෙවත් මනොද්වාරික චිත්තවීථියට, ආපාථං, හමුබවට; ආගතං, පැමිණෙන්නේ වේ ද; තදා, එකල්හි; තමෙව ආලම්බණං, පෘථුවීකසිණාදී අරමුණම; උග්ගහනිමිත්තං නාම, උග්ගහනිමිත්ත නම්වේ. සා ච භාවනා, ඒ භාවනා තොමෝද; සමාධියති, මොනවට පිහිටයි.

පන, උග්ගහනිමිත්තෙන් අන්‍යවූ ප්‍රතිභාගනිමිත්ත කියම්:-තථා සමාහිතස්ස, ඒ ආකාරයෙන් පිහිටියා වූ හෙවත් මොනවට එකඟවූ සිත් ඇති යොගාවචරයාහට ; තතො පරං, ඒ උග්ගහ නිමිත්ත වැටහීමෙන් මත්තෙහි; තස්මිං උග්ගහනිමිත්තෙ, ඒ උද්ග්‍රහනිමිත්තයෙහි; පරිකම්මසමාධිනා, පරිකර්මසමාධිය කරණ කොටගෙණ;භාවනං අනුයුඤ්ජන්තස්ස, භාවනාවට නැවත නැවත උත්සාහ කරන්නාවූ: එතස්ස, ඒ යොගී පුද්ගලයාහට; යදා, යම් කාලෙක්හි; තප්පටිභාගං, ඒ උද්ග්‍රහනිමිත්ත හා සදෘශවූ; වත්ථුධම්මවිමුච්චිතං, දෙසැත්තෑවක් පරමාර්ථ ධර්මයන්ගෙන් මිදුනාවූ හෙවත් කසිණමණ්ඩලයෙහි ඇත්තාවූ කසිණදොෂයන්ගෙන් මිදුනාවූ; පඤ්ඤත්තිසංඛාතං, ප්‍රඥප්තිය යි කියන ලද්දාවූ; භාවනාමයං,භාවනාවෙන් නිපන්නාවූ; ආලම්බණං, පෘථුවීකසිණමණ්ඩලාදී අරමුණ; චිත්තෙ, මනොද්වාරික චිත්තයෙහි; සන්නිසින්නං, මොනවට රැස්වූයේ; සමප්පිතං, මොනවටපිහිටියේ; හොති, වේද; තදා, එකල්හි; තං පටිභාගනිමිත්තං, ඒ ප්‍රතිභාගනිමිත්තය; සමු

ප්පන්නාති, මෝහවට පහළවූයේයයි; පවුච්චති, ප්‍රභේද වශයෙන් කියනු ලැබේ.

තතො පඪාය, ඒ ප්‍රතිභාගනිමිත්ත වැටහුනු තැන් පටන්; පරිපන්ථවිප්පහීණා, සතුරැනීවරණ සංඛ්‍යාත භය නසන ලද්දාවූ; කාමාවචරසමාධි සංඛාතා, කාමාවචර සමාධිය යි කියන ලද්දාවූ; උපචාරභාවනා, උපචාරභාවනා තොමෝ; නිප්ඵන්නා නාම හොති, නිපන්නීනම් වෙයි. හෙවත් සම්පූර්ණවූවානම් වෙයි.

තතො පරං, ඒ උපචාරභාවනාවගේ සම්පූර්ණ වීමෙන් මත්තෙහි, තමෙව පටිභාගනිමිත්තං, ඒ ප්‍රතිභාගනිමිත්තම; උපචාර සමාධිනා, උපචාරසමාධිය කරණකොටගෙණ; සමාසෙවනතාය මෝහවට සෙවුනාවූ යෝගාවචර පුද්ගලයාහට, රූපාවචර පඨමජ්ඣානං, රූපාවචර ප්‍රථමධ්‍යාන තොමේ; අප්පෙති, අර්පණා වශයෙන් පිහිටයි.

තතො පරං, ඒ ප්‍රථමධ්‍යානය ලැබීමෙන් මත්තෙහි; තමෙව පඨමජ්ඣානං, ඒ ප්‍රථමධ්‍යානයම; ආවජ්ජනව, ආවර්ජනා වශීභාවයද; නොහොත් ප්‍රථම ධ්‍යානයාගේ පඤ්චාඞ්ගයන් අතුරෙන් එකෙකී අරමුණෙහි හටගන්නාවූ මනොද්වාරාවර්ජනයට අනතුරැ තන්හි සතරවරක් හෝ පස්වරක් හෝ කාමාවචරජවන් ඉපිද දෙතුන් වරකට අධිකවූ භවාඞ්ගපාතනය නොවී මතු මතු ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා කිරීම් වශයෙන් හටගැණිම් සංඛ්‍යාත ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා කිරීමෙහි පොහොසත් වූ යෝගී පුද්ගලයාගේ ශක්තියද; සමාපජ්ජනව, සමාපජ්ජනවශිතාවය ද යෙවත් ධ්‍යානයට සමවදිනු කැමති යෝගීහුගේ සවනාව සංඛ්‍යාතවූ හෙවත් සමවදිනු කැමති චිත්තයට අනතුරැ තන්හි දෙතුන් භවාඞ්ගයකින් අධික.විය නොදී හටගන්නාවූ මනොද්වාරාවර්ජනයට අනතුරැ තන්හි ධ්‍යානයට සමවැදීමෙහි පොහොසත්වූ යෝගී පුද්ගලයාගේ ශක්තියද; අධිඪානව, අධිඪානවශිතාවයද; නොහොත් සැඩපහර බසින්නාවූ ගඞ්ගාමෙක්හි ජලශ්‍රෝතය නවත්වනු පිණිස සරසට බඳනාවූ මහත්වූ මියරක් මෙන් භවාඞ්ගපරම්පරාව සිඳ සිතින් නියමකර ගන්නා කාලය මුලුල්ලෙහි අතරතුර භවාඞ්ග නොඉපද ධ්‍යානචිත්තය ඉපදවීමෙහි පොහොසත් බැව් සංඛ්‍යාත අධිෂ්ඨානවශිතාවයද; උඨානව, උඨානවශිතාවයද හෙවත් ධ්‍යානයට සමවැදීමට මත්තෙන් මම අසවල් කාලයෙහි ධ්‍යානයෙන් නැගිටිමියි සිතින් කර ගත් නියමය නොයික්මවා ධ්‍යානයෙන් නැගී සිටීමෙහි පොහොසත් බැව් සංඛ්‍යාත යෝගීපුද්ගලයාගේ ශක්තියද; පච්චවෙක්ඛනාව, පච්චවෙක්ඛනා වශිතාවයද; හෙවත් ප්‍රථමධ්‍යානයෙහි ධ්‍යානාඞ්ගපච

ගයන් අතුරෙහි; එකෙකී ධ්‍යානාඞ්ග සංඛ්‍යාත අරමුණෙහි හට ගත් මනොවාරාවර්ජනයට අනතුරු තත්හි සතරපස් කාමාවචර ජවනයක් හා දෙතුන් භවාඞ්ගයක්ද උපදවා මතු මතු ධ්‍යානාඞ්ග යද එසේම ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමෙහි පොහොසත් වූ යොගී පුද්ගලයාගේ ශක්තිය ද; ඉති, මෙසේ; ඉමාහි පඤ්චහි වසිතාහි, මේ පඤ්ච ප්‍රකාරවශිතාවන් කරණකොටගෙණ; වසීභූතං කත්වා, ධ්‍යානය තමාගේ වශගමයෙහි පවත්වා; විතක්කාදිකං, විතර්කය ආදීකොට ඇති; ඔළාරිකඞ්ගප්පහාණාය, ඖදාරිකාඞ්ගයන් ප්‍රහාණය කිරීම පිණිස, විචාරාදි සුඛුමංගුප්පත්තියා, විචාරාදී සියුම් අඞ්ගයන් නිපදවීම පිණිස; පදහතො, නැවත නැවත "පඨවී පඨවී" යනාදීන් පරිකර්මභාවනා කරන යොගීපුද්ගලයාහට; යථාක්කමං, පිළිවෙළින්; දුතියජ්ඣානාදයො, ද්විතීයධ්‍යානාදීහු තුමූ; යථාරහං, සුදුසු පරිද්දෙන්; අප්පෙනති, අර්පණා වශයෙන් උපදිත්.

ඉච්චෙවං, (ඉති එවං යථාවුත්තනයෙන) යම් යම් කියනලද ක්‍රමයකින්; පඨවිකසිණාදිසු, පෘථිවි කසිණය ආදිකොට ඇති තොහොත් දසකසිණ ප්‍රඥප්තිය දසඅසුභ ප්‍රඥප්තිය හිසකේ ආදී කායකොට්ඨාසප්‍රඥප්තිය ආශ්වාස ප්‍රශ්වාසප්‍රඥප්තියයි කියනලද; වාවීසතිකම්මට්ඨානෙසු, දෙවිසි කර්මස්ථානයෙහි; පටිභාගනිමිත්තං ප්‍රතිභාගනිමිත්තය; උපලබ්භති, ලැබිය යුත්තේයි.

පන, අඤ්ඤානන්තරයක් කියම්:—අවසෙසෙසු, කියනලද දෙවිසි කර්මස්ථානයන්ගෙන් අවශිෂ්ටවූ අටළොස් කර්මස්ථානයන් අතුරෙන්; අප්පමඤ්ඤා, අප්‍රමාණ්‍යයෝ; සත්තපඤ්ඤත්තියං, සුඛිත දුක්ඛිතසත්වප්‍රඥප්තියෙහි; පවත්තන්ති, හටගන්නාහුය. පන, රූපාලම්බණයෙන් අන්‍යවූ අරූපාලම්බණය දක්වම්:—නොහොත් රූපධ්‍යානයෙන් ලැබියයුතු ආලම්බණයෙන් අන්‍යවූ අරූපධ්‍යානාලම්බණය දක්වම්:—ආකාසවජ්ජිත කසිණෙසු, ආකාශ කසිණය පිළින් තොරකොට ඇති නවකසිණයන් අතුරෙන්; යංකිඤ්චිකසිණං, යම්කිසි කසුණක් තොහොත් යම්කිසි කසිණාලොකයක් අභිමතස්ථානයෙහි පතුරුවා; උග්ඝාටෙත්වා, ඒ කසිණාලොකය උගුළුවා; ලද්ධමාකාසං, ලබනලද අනන්තාකාශ ප්‍රඥප්තිය; අනන්තවසෙන, "අනන්තො ආකාසො අනන්තො ආකාසො" යනුවෙන්; පරිකම්මං කරොන්තස්ස, නැවත නැවත පිරියම් භාවනාකරන්නාවූ යොගී පුද්ගලයාහට; පඨමාරුප්පං, ප්‍රථමාරූප්‍ය තෙමේ; අප්පෙති, අර්පණා වශයෙන් උපදනේයි. තමෙව පඨමාරුප්පවිඤ්ඤාණං, ඒ ප්‍රථමාරූප්‍ය විඥානයම හෙවත් ආකාශානඤ්චායතනධ්‍යානචිත්තයම; අනන්තවසෙන, අනන්ත වශයෙන්; පරිකම්මං කරොන්තස්ස, "අනන්තං විඤ්ඤාණං අනන්තං

විඤ්ඤාණං" යනුවෙන් නැවත නැවත පිරියම් භාවනා කරන්නාවූ යෝගීපුද්ගලයාහට; දුතියාරුප්පං, දුතියාරූප්ප තෙමේ; හෙවත් විඤ්ඤාණඤ්චායතනධ්‍යාන තෙමේ; අප්පෙති, අර්පණා වශයෙන් උපදී. පන, අන්‍යාන්තරයක් කියම්:—හෙවත් ද්විතීයාරූප්‍යධ්‍යානයෙන් අන්‍යවූ තෘතීයාරූප්‍යධ්‍යානය කියම්:—තමෙව පඨමාරුප්පවිඤ්ඤාණාභාවං, ඒ ප්‍රථමාරූප්‍යවිඥානයාගේ නැති බැව් සඞ්ඛ්‍යාත නත්‍ථිභාව ප්‍රඥප්තියම; "නත්‍ථිකිඤ්චීති, නත්‍ථිකිඤ්චි-නත්‍ථිකිඤ්චි" යනුවෙන්; පරිකම්මං කරොන්තස්ස, නැවත නැවත පිරියම් භාවනාකරණ යෝගී පුද්ගලයාහට; තතියාරුප්පං, තෘතීයාරූප්‍යධ්‍යාන තෙමේ හෙවත් ආකිඤ්චඤ්ඤායතන තෙමේ; අප්පෙති, අර්පණා වශයෙන් උපදනේ යි. තතියාරුප්පං, තෘතීයාරූප්‍යවිඥානය; සන්තමේතං පණීතමේතං, "එතං සන්තං එතං පණීතං ඉති, එතං සන්තං එතං පණීතං" යනුවෙන්; පරිකම්මං කරොන්තස්ස, පිරියම් භාවනාකරන්නාවූ යෝගී පුද්ගලයාහට; චතුත්ථාරුප්පං, චතුර්ථාරූප්‍යධ්‍යාන තෙමේ හෙවත් නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන තෙමේ; අප්පෙති, අර්පණා වශයෙන් පිහිටයි.

අවසෙසෙසු, කියන ලද සමතිස් කර්මස්ථානයන්ගෙන් අවශිෂ්ටවූ; දසසු කම්මට්ඨානෙසු ච, බුද්ධගුණ-ධම්මගුණ-සඞ්ඝගුණ-සීලගුණ- චාගගුණ-දෙවතාගුණ-නිර්වාණගුණ-මරණානුස්මෘති-ප්‍රතිකූලසංඥා-ධාතුව්‍යවස්ථානයයි කියන ලද දසකර්මස්ථානයෙහිද; බුද්ධගුණාදිකං, බුදුගුණ ආදී කොට ඇති; ආලම්බණං ආරබ්භ, අරමුණක් එල්බ ගෙණ; පරිකම්මං කත්වා "සො භගවා ඉතිපි අරහං" "සො භගවා ඉතිපි සම්මාසම්බුද්ධො" යනාදී ක්‍රමයෙන් නැවත නැවත පිරියම් භාවනා කොට; තස්මිං නිමිත්තෙ, ඒ බුද්ධගුණාදී අරමුණ; සාධුකමුග්ගහිතෙ, මොනවට ගන්නා ලද කල්හි; තත්‍ථෙව, ඒ බුද්ධගුණාදී අරමුණෙහිම; පරිකම්මඤ්ච, "සො භගවා ඉතිපි අරහං" යනාදී වශයෙන් නැවත නැවත කරන්නාවූ පරිකර්මභාවනාවද; සමාධියති, මොනවට පිහිටයි. උපචාරෙච, උපචාරසමාධියද; සම්පජ්ජති, සමෘද්ධවෙයි. පන, විශෙෂාර්ථයක් කියම්:-අභිඤ්ඤාවසෙන, අභිඥාවන්ගේ වශයෙන්; පවත්තමානං, හටගණු ලබන්නා වූ; රූපාවචර පඤ්චමජ්ඣානං, රූපාවචර පඤ්චමධ්‍යාන තෙමේ; අභිඤ්ඤාපාදක පඤ්චමජ්ඣානා, අභිඥාවගේ පාදයක් වැනිවූ රූපාවචර පඤ්චමධ්‍යානයෙන්; වුට්ඨහිත්වා, නැගිට; අධිට්ඨෙය්‍යාදිකං, අධිෂ්ඨානාදිය; හෙවත් අධිෂ්ඨාන කටයුතුවූ නිර්මිත කටයුතුවූ සියදහස් ගණන් කුමාරරූපාදිය; ආවජ්ජිත්වා, ආවර්ජනා කොට; පරිකම්මං කරොන්තස්ස, "සතං හොමි සහස්සං හොමි" යනාදි ක්‍රමයෙන් නැවත නැවත පිරියම්

භාවනා කරන්නාවූ යොගීපුද්ගලයාහට; රූපාදීසු ආලම්බණෙසු, රූපාදී සවැදෑරම් අරමුණෙහි; යථාරහං, සුදුසු පරිද්දෙන්; අප්පෙති, අර්පණා වශයෙන් උපදනේයි. පූර්වවාක්‍යයෙහි අවශිෂ්ටාර්ථය දක්වමි: —

අභිඤ්ඤා ච නාම, අභිඥා නම් වනාහි; නොහොත් විශිෂ්ට වශයෙන්ද දතයුතු ඥානය වනාහි; ඉද්ධිවිධං, ඉර්ධිවිධ අභිඥාව ද; නොහොත් නානාප්‍රකාර ඉර්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වීම් වශයෙන් උපදවන්නාවූ ඉර්ධිවිධ අභිඥාවද; දිබ්බසොතං, දිව්‍ය ශ්‍රොත්‍ර අභිඥාවද හෙවත් දෙවියන්ගේ කණ බඳුවූ මෙහි සිට දිව්‍ය බ්‍රහ්මලොකයෙහි ශබ්දය පවා ඇසීමෙහි පොහොසත් වූ දිව්‍යශ්‍රොත්‍ර අභිඥාවද; පරචිත්තවිජානනා, මෙරමා සිත් දැන ගන්නාවූ අභිඥාවද; පුබ්බෙනිවාසානුස්සති, පූර්වෙනිවාසානුස්මෘති ඥානයද; හෙවත් පෙර විසූ කඳපිළිවෙළ දැන ගන්නා ස්මෘතිය හා සමග පැවති අභිඥාවද; දිබ්බචක්ඛු, දිව්‍යංචක්ෂුරභිඥානයද; නොහොත් දෙවියන්ගේ ඇසට බඳුවූ මේ මනුෂ්‍ය ලොකයෙහි සිට දිව්‍යබ්‍රහ්මලොකයෙහි පවා ඇත්තාවූ නීලපීතාදී රූපයන් දක්න හැකිවූ දිව්‍යං චක්ෂුරභිඥානය ද; ඉති, මෙසේ; පචධා හොති, පස් ප්‍රකාර වෙයි.

එත්ථ, මේ සමථකර්මස්ථාන ක්‍රමයෙහි; අයං, මේ කියන ලද්දේ වනාහි; ගොචර භෙදො, ආලම්බණයන්ගේ ප්‍රභෙදයයි. සමථකම්මට්ඨානනයො, සමථකර්මස්ථානක්‍රම තෙමේ; නිට්ඨිතො එව, නිමාවට පැමිණියේමය.

## සමථකර්මස්ථාන පදාර්ථ නිමි.

——o——

## (ඟ)

ඒ සමසතළිස් කර්මස්ථානයන් අතුරෙන් දසඅසුභය, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාවය, කායගතාසතිය, යන දොළොස් කර්මස්ථානයෝ පිළිකුල් ආකාරයෙන් නො වැටහෙන බැවින් ෂට්කාමස්වර්ගයෙහි නැත්තාහු මැයි. අවශෙෂවූ අටවිසි කර්මස්ථානයෝ වනාහි සදිව්‍යලොකයෙහි ඇත්තාහුමය. එතකුදුවුවත් බොහෝසෙයින් දෙවියන්ගේ ධ්‍යානඉපදවීමෙහි වායොකසිණයම අරමුණුවෙත්. කල්ප විනාශකාලයෙහි අවීචිය පටන් සියලු අපායභූමියෙහි හා පෘථුවියෙහි වාසයකරන්නාවූ සියලුසත්වයෝම අපරාපරියවෙදනීය කර්මබලයෙන් දිව්‍යලොකයෙහි ඉපිද ඒ දිව්‍ය

ලෝක විනාශය ලංවූ කල්හි වායොකසිණයෙන් චතුර්ථධ්‍යානය උපදවා වෙහප්ඵලය දක්වා උපදනා බව විශුද්ධිමාර්ගයෙහි ආයේසි කුමක් හෙයින් සියලු දෙවියෝ ම වායොකසිණයෙන් ධ්‍යාන උපදවන්නාහුද යත්? සැපයෙහි ඇළුනාවුන්ට වායොකසිණයට වඩා සුකරවූ කර්මස්ථානයෙක් නැත්තේය. එහෙයින් සියලු දෙවියෝම බොහෝසෙයින් වායොකසිණයෙන්ම ධ්‍යාන උපදවන්නාහු වෙති. ඒ සදිව්‍යලොකයෙහි නො ලැබෙන්නාවූ දොළොස් කර්මස්ථානයන් කෙරෙහි ආනාපානසති කර්මස්ථානය බැහැරලෙස් කර්මස්ථාන තෙතෙක් සොළොස් රූපාවචර බ්‍රහ්මලොකයෙහි නැත්තේසි. එහෙයින් බ්‍රහ්මලොකයෙහි අවශෙෂවූ සත්විසි කර්මස්ථානයෝම ඇත්තාහුය. අසංඥ සත්වතලයෙහි වනාහි සර්ව ප්‍රකාරයෙන්ම කර්මස්ථානයෙක් නැත්තේසි. සතර අරූපාවචර භූමියෙහි අකාශානඤ්චායතනාදී සතර අරූපකර්මස්ථානයෝ ම ඇත්තාහුය. අවශෙෂවූ සයිස් කර්මස්ථාන කෙතෙක් නැත්තාහුය. මනුෂ්‍යලොකයෙහි වනාහි සතළිස් කර්මස්ථානයෝ ම ඇත්තාහුය. එහෙයින් අභිධර්මාවතාර නම් අර්ථකථා සංග්‍රහයෙහි:-

## ගාථා

අසුභානි දසාහාර සඤ්ඤා කායගතාසති
දෙවෙසු නප්පවත්තන්ති ද්වාදසෙතානි සබ්බදා.
තානි ද්වාදසචෙතානි ආනාපාන සතීපිච
තෙරසෙව පනෙතානි බ්‍රහ්මලොකෙ න විජ්ජරෙ.
ඨපෙත්වා චතුරාරුප්පෙ නත්ථි කිඤ්චි අරූපිසු
මනුස්සලොකෙ සබ්බානි පවත්තන්ති න සංසයො.

එහි අර්ථ සුබොධයි. මේ ගාථාවෙන් වාචොද්ගතකිරීමෙන් ග්‍රහණධාරණය සුකරවේ. ඒ සතළිස් කර්මස්ථානයන් අතුරෙන් දසකසිණප්‍රඥප්තිය, දසඅසුභප්‍රඥප්තිය, කායගතාසතියට අරමුණු වන්නාවූ දෙතිස් කායකොට්ඨාශ ප්‍රඥප්තිය, ආනාපානසතියට අරමුණු වන්නාවූ ආශ්වාසප්‍රශ්වාස වාතය, මෛත්‍රී-කරුණා-මුදිතා-උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාරයන්ට අරමුණු වන්නාවූ අප්‍රමාණවූ දුඃඛිත සුඛිත සත්වප්‍රඥප්තිය, ආකාශානඤ්චායතනයට අරමුණු වන්නාවූ ආකාශකසිණය හැර අවශෙෂ නව කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයකින් උපදවා ගත්තාවූ කසිණාලොකය ආකාශයෙහි අභිමත ප්‍රදෙශයක පතුරුවා ඒ කසිණාලොකය උද්ඝාටණය කොට ලබන ලද්දාවූ ආකාශප්‍රඥප්තිය, විඤ්ඤාණඤ්චායතනධ්‍යානයට අරමුණු වන්නාවූ මේ භවයෙහි හෝ පූර්වභවයෙහි හෝ ස්වකීයසන්තානයෙහි උපදවන

ලද විරූ ආකාසානඤ්චායතන කුශලය මේ භවයෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි හටගත් විරූ ආකාසානඤ්චායතන ක්‍රියා සංඛ්‍යාතවූ මහද්ගත ධර්මාලම්බනය, ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයට අරමුණු වන්නාවූ ආකාසානඤ්චායතන කුශල ක්‍රියාවන්ගේ නැති බැව්යයි කියන ලද නත්ථිභාව ප්‍රඥප්තිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට අරමුණු වන මේ භවයෙහි හෝ පූර්වභවයෙහි හෝ හට ගත් විරූ ආකිඤ්චඤ්ඤායතනකුශලය, මේ භවයෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි හටගත් විරූ ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සංඛ්‍යාත මහද්ගතධර්මාලම්බනය, යන මේ සමතිස් කර්මස්ථානයෙහිම පරිකර්ම-උපචාර-අර්පණාධ්‍යාන භාවනා සංඛ්‍යාතවූ ත්‍රිවිධභාවනාව ලැබිය යුතු හෙයින් ඒ සමතිස් කර්මස්ථානයෙහි මහද්ගතධ්‍යානය ලැබිය යුත්තේයි. ඔවුන් කෙරෙන් අවශිෂ්ටවූ බුද්ධානුස්සති ආදිවූ මරණානුස්සතිය අවසන්කොට ඇත්තාවූ අනුස්සතීහු අටය, ආහාරෙ පටික්කූලසඤ්ඤාවය, චතුධාතුවවත්ථානයයි කියන ලද්දවූ දසකර්මස්ථානයෙහි උපචාරභාවනාව මුත් අර්පණා භාවනාව නොලැබිය යුතු හෙයින් මේ දසකර්මස්ථානයෙහි මහද්ගතධ්‍යානය නොලැබිය හැක්කේය. එසේ වී නම් ඒ කර්මස්ථානයන් දසදෙනාගෙන් කවර ප්‍රයෝජනයෙක්ද යත්? මාර්ගඵල ලබනු කැමති යෝගාවචරයන්ගේ සිත මනාකොට පිහිටුවීමෙන් උපචාරසමාධිය ලබා මාර්ගඵලයන්ගේ ලැබීම සුකර වෙත්. එහෙයින් අභිධර්මාර්ථසංග්‍රහයෙහි "භාවනාසු පන සබ්බත්ථාපි පරිකම්මභාවනා ලබ්භතෙව තත්ථ අප්පනා බුද්ධානුස්සති ආදිසු අට්ඨසු සඤ්ඤාවවත්ථානෙසු චාති, දසසු කම්මට්ඨානෙසු උපචාර භාවනාව සම්පජ්ජති නත්ථි අප්පනා, සෙසෙසු සමතිංසකම්මට්ඨානෙසු අප්පනාභාවනාපි සම්පජ්ජතී" යනාදිය සිහිකටයුතුයි. නිමිත්තත්‍රය, භාවනාත්‍රය, යනමොවුන්ගේ විශේෂය විශුද්ධිමාර්ගයෙහි ආ නයින් භාවනාවෙහි යෙදිය යුත්තේයි.

අනාගතයෙහි කර්මස්ථාන දායක අර්ථකථාචාර්ය ත්‍රිපිටක, ද්විපිටක, එකපිටකධර, සංගීතිභාණකයන් නැතී වන බව්දුන ප්‍රතිසම්භිදාප්‍රාප්තමහරහතුන් විසින් සකස්කරණලද භාවනාක්‍රමය විසුද්ධිමාර්ගයෙහි සඞ්ගෘහිත බැවින් වර්තමාන කාලයෙහි එම විශුද්ධිමාර්ග අටුවාව කර්මස්ථානදායක ආචාර්යවරයෙකැයි සලකා පළමුකොට ශීලවිශුද්ධිය මස්තකප්‍රාප්තකොට තදනන්තරව ධ්‍යානභාවනා කිරීමෙහි උත්සාහ වැඩිය යුතුයි. එහෙයින් සංක්ෂෙපමාත්‍රයක් මෙහි දක්වනු ලැබේ.

පූර්වභවයෙහි බුදුවරයෙකුගේ ශාසනයෙහි හෝ කර්මවාදී ක්‍රියාවාදී ශාසනයන් පිටත්හි අරකාදී ශාස්තෘන් වැනි බාහිර

ශාස්ත්‍රශාසනයක හෝ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් හෝ ශාසනප්‍රව්‍රජ්‍යාවෙන් හෝ පැවිදිව පෘථිවීකසිණයෙහි මහද්ගතධ්‍යානලාභිව උපනිශ්‍රය අධිකාර ඇත්තාවූ කෘතපුණ්‍යයන්ට පෘථිවීකසිණ මණ්ඩලය නොකොට ම එදවස් සී සානා ලද කුඹුරෙක හෝ ගොයම් මඬිනා කමතෙක හෝ "පඨවී පඨවී" යයි භාවනා වඩා උග්ගහනිමිත්ත ප්‍රතිභාගනිමිත්තයන් ලැබීමෙන් ධ්‍යානය ලැබිය හැක්කේමය. එබඳු පිණැත්තන්ට කර්මස්ථානදායක ආචාර්යයන් ගෙන් ප්‍රයෝජනයක් නැත්තේය. පූර්වභවයෙහි බුද්ධශාසනයක හෝ බාහිරශාස්ත්‍රශාසනයක හෝ ධ්‍යාන ඉපදවීමෙන් කළාවූ අධිකාර නැත්තේ නම් එබඳු යෝගාවචරයා විසින් ආචාරීන් සමීප යෙහි හෝ විශුද්ධිමාර්ගීය ආචාර්යයෙක් මෙන් කොට හෝ දෙන ලද්දවූ ක්‍රමය හෙවත් ආචාරීන් විසින් උගන්වන ක්‍රමය කොස ගක් පමණ කුඩු නොපිරිසිහලා අරුණුවන් මැටිගෙණ අතිශයින් කුඩා කසිණමණ්ඩලය එක්වියත්සතරඟුලක්ද, අතිශයින් මහත්වූ කසිණමණ්ඩලය ගොයම් මඬනාවූ කළවිටක් පමණද කටයුත්තේය.

ඒ කසිණමණ්ඩලය වනාහි ගල්අතකින් හෝ සක්ගෙඩි ආදියෙන් හෝ පිරිමැද සමකොට දෙරියන්සතරක් පමණවූ අත්පස ඇතුලෙහි ඒ කසිණමණ්ඩලය මුහුණ බැලීමට තබන්නාවූ ආදර්ශමණ්ඩලයක් මෙන් තමාගේ මුහුණට කෙලින් තබා ඇසිපිය ගැසීම හෝ ඇස් හරවා බැලීම හෝ නොකොට සම්ව ඇස් දෙක විවෘත කොට ඒ කසිණනිමිත්ත ගෙණ භාවනා කටයුත්තේයි. එසේ භාවනා වඩන කල්හි කසිණමණ්ඩලයෙහි අරුණු වන් පැහැය මෙන් කොට නොගෙණ පෘථිවීකසිණමණ්ඩලයෙහි පෘථිවිධාතුහුගේ කර්කශලක්ෂණය කල්පනා නොකොට එකාන්ත යෙන් වර්ණය නොසික්මවා අරුණුවන් පෘථිවිය යන ලෝක ව්‍යවහාර නාමප්‍රඥප්තියෙහි සිත නවත්වා ලෝකයෙහි පෘථිවියයි පණවන ලද්දවූ සසම්භාර පෘථිවි නම නොහොත් ශුද්ධාෂ්ටකයෙන් යුක් පෘථිවිධාතුවම "පඨවි පඨවී" යි වැඩිය යුත්තේයි.

එසේ වඩන්නාවූ කල්හි කලින් කල ඇස හරිමින්ද, කලින් කල ඇස පියමින්ද, උග්ගහනිමිත්ත උපදීම දක්වා නොයෙක් සියදහස් ගණන් වාරයෙහි "පඨවී පඨවී" යයි වචනයෙන් කියමින් ප්‍රකෘති ඇසින් දක්නා ලද පෘථිවීකසිණ ආලම්බනතෙමේ පරිකර්මනිමිත්ත නම්වේ. ඒ පරිකර්මනිමිත්තෙහි වඩන භාවනාව පරිකර්මභාවනා නම්වේ. මෙසේ නැවත නැවත භාවනා කරණ යෝගාවචරයාහට යම් කලෙක ඇස වසා ප්‍රත්‍යවේක්ෂා කරණ කල්හි ඇස හැර බලන්නාවූ කාලය මෙන් ඒ පෘථිවීකසිණ අර

මුණු තෙමේ සවප්නයෙන් දකින්නාක් මෙන් මනොද්වාරයෙහි වැටහෙන්නේවේද එකල්හි උග්ගහනිමිත්ත උපන්නේ නම්වෙයි ඒ උග්ගහනිමිත්ත බලා කරණ භාවනාවද පරිකර්ම භාවනානම්වේ.

ඒ උද්ග්‍රහනිමිත්ත උපන් කාලය පටන් ඒ කසිණමණ්ඩලය දෙස නොබලා තමන් ඉන්නාවූ ඇතුළුගබඩාදියක හෝ ගල් ගුහාදියකට හෝ පැමිණ "නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා" යි ක්‍රමයෙන් පද්මාසනයෙන් වැඩහිඳ පිටකටුව කෙලින් තබා ආශ්වාසය සපර්ශී වන්නාවූ උත්තරොෂ්ඨයෙහි සිහිය එලවා තබා ඒ මනොද්වාරයෙහි වැටහුන උද්ග්‍රහනිමිත්ත අරමුණුකොටගෙණ "පඨවී පඨවී" යනාදීන් වැඩිය යුත්තේයි. එසේ භාවනා කරණ කල්හි යම් උපද්‍රවයක් හෙතුකොටගෙණ ඒ උද්ග්‍රහනිමිත්ත අතුරුදන් වීනම් නැවතක් කසිණමණ්ඩලය කරා අවුත් පෙර මෙන් භාවනා වඩා උද්ග්‍රහනිමිත්ත උපදවා ගෙණ තමාගේ සෙනාසනයට පැමිණ සුවසේ හිඳ නැවත නැවත භාවනා වැඩියයුත්තේයි.

මෙසේ භාවනා වඩන යොගාවචරයාහට ක්‍රමයෙන් කාමච්ඡන්දාදී නීවරණධර්මයෝ තුමූ දිය සෙවලින් ගැවසී ගත් ජලයෙහි තිරතුරු සවාදිය ඔබා දිය උකාගැණීමෙන් දියසෙවල් ආදිය ඈත් වන්නාක් මෙන් නීවරණකෙලශයෝ ක්‍රමයෙන් ඈත් වන්නාහු වෙති. උපචාරසමාධියෙන් සිත එකාග්‍රවෙයි. ප්‍රතිභාගනිමිත්තද හටගන්නේ වෙයි. මෙසේ නීවරණයන් ඈත්ව ගොස් ප්‍රතිභාගනිමිත්ත හටගන්නා කල්හි කරණ භාවනා තොමෝ උපචාර භාවනා නම් වෙයි. ඒ භාවනාවෙන් හටගන්නා කාමාවචර කුශලචිත්තවීථියෙහි යෙදුනාවූ එකාග්‍රතාවෝ උපචාරසමාධි නම් වෙත්. උද්ග්‍රහනිමිත්තය ප්‍රතිභාගනිමිත්තය යන දෙදෙනාගේ වෙනස නම්:—

අරුණුවන්මැටියෙන් සකස්කරණලද කසිණමණ්ඩලයෙහි යම් යම් දොෂයෙක් විද්‍යමාන වෙත් නම් උද්ග්‍රහනිමිත්තෙහිද ඒ දොෂයෝ පෙනෙන්නාහුමය. ප්‍රතිභාගනිමිත්ත වනාහි පසුම්බියකින් මෑත්කොට ගන්නා කැඩපතක් මෙන්ද, ඔප්නගන ලද සක්ගෙඩියක් මෙන්ද, ඒ උද්ග්‍රහනිමිත්ත විවෘත කොට ගෙණ කණමැදිරි ආලොකයක් පමණවූ ඒ උද්ග්‍රහනිමිත්තට වඩා සියක් වර දහස්වර පිරිසිදුවූ දෙසැත්තෑවක් පරමාර්ථධර්මයන්ගෙන් මිදුනාවූ භාවනාමය සිතින් හටගත් ආලොකයක් වෙයි. එසේ වැටහෙන්නාවූ පෘථිවීකසිණ පුද්ගලපති සංඛ්‍යාත ප්‍රතිභාගනිමිත්තාඛ්‍යවූ ධර්මාලම්බණය උපන් යොගාවචර තෙමේ සක්විතිකුමරුවෙකු ගර්භයෙහි පිහිටි මදේකු මෙන් ඒ ප්‍රතිභාගනිමිත්ත මහත් ගෞරවයෙන් ආරක්ෂා කරන්නේවේ. කුමක් හෙයින යත්?

ඒ ප්‍රතිභාගනිමිත්ත අරමුණු කොට ගෙණ පවාහිඳා අෂ්ටසමාපත්ති හා සතරමග සතර ඵලය ලැබීමට ඒ ප්‍රතිභාගනිමිත්ත එකාන්තයෙන් උපකාර වන්නේයි.

ඉක්බිති ඒ ප්‍රතිභාගනිමිත්ත වඩම් සිතා "පඨවි පඨවි" යනාදීන් භාවනා කරණ කල්හි එකාංගුලමාත්‍රයක් හෝ ද්වංගුලමාත්‍රයක් හෝ මහත්ව වැඩෙයි. එපමණ වැඩුනාවූ ප්‍රතිභාගනිමිත්තපරිත්තාලම්බණ නම්වෙයි. ශූර්පමාත්‍ර හෙවත් කුල්ලක් පමණවූ හෝ සරාවමාත්‍රවූ හෝ ඒ ප්‍රතිභාගනිමිත්තම මහද්ගතාලම්බණ නම්වෙයි. එතැන් පටන් චක්‍රවාටය වැසෙන තාක් වඩන ලද්දාවූ කසිණාලෝකය අප්‍රමාණාලම්බණ නම්වෙයි මෙසේ උපදවා ගන්නාලද පෘථිවීකසිණප්‍රඥප්ති ප්‍රතිභාගනිමිති ධර්මාලම්බණය අරමුණු කොටගෙණ ප්‍රථමධ්‍යානය ලබම්වා යන ධ්‍යානනිකාන්තිය උපදවා ගෙණ "පඨවි පඨවි" යනාදීන් භාවනා වඩන කල්හි ඒ අරමුණ ආවර්ජනා කරන්නාවූ මනොද්වාරාවර්ජන චිත්තය හා "පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ" යන නම් ඇත්තාවූ උපචාරසමාධි ඥානසම්ප්‍රයුක්ත මහාකුශල චිත්තක්ෂණ සතරක් පිළිවෙළින් ඉපිද පස්වෙනුව විතර්ක-විචාර-ප්‍රීති-සුඛ-එකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාඞ්ගපඤ්චකයකින් යුක්තවූ ප්‍රථමධ්‍යානඅර්පණාචිත්තය උපදනේයි. ඒ චිත්තයම අර්පණාවය, අර්පණාසමාධියයි කියා ව්‍යවහාර කෙරෙත්.

මේ ධ්‍යානචිත්තයෙහි යෙදුනාවූ අඞ්ගයෝ පස්දෙන ක්‍රමයෙන් පඤ්චනීවරණධර්මයන් දවන අර්ථයෙන් හා කසිණප්‍රතිභාගනිමිත්ත ලංකොට බලන අර්ථයෙන් ධ්‍යානයයි ව්‍යවහාර කෙරෙත්. ඒ අර්පණාචිත්තයට අනතුරුව භවාඞ්ගචිත්තක්ෂණ කීපයක් ඉපිද නැවත භවාඞ්ග-භවාඞ්ගචලන-භවංගුපච්ඡේද-මනොද්වාරාවර්ජනය ඉපිද තදනන්තරව ප්‍රත්‍යවෙක්ෂාජවන චිත්තයන්ගෙන් ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ විතර්කය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ එක් වීථියක්ද, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන සතර ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් ප්‍රත්‍යවෙක්ෂාජවනවීථි සතරක්ද, නැවත ධ්‍යානාඞ්ගපඤ්චකයම එක්කොට ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ එක් වීථියෙක්දැයි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා වීථිහු සදෙනෙක් වෙත්. තදනන්තරව ඒ පෘථිවීකසිණාලම්බණයෙහි සමාපත්ති වීථිහුද ක්‍රමයෙන් උපදනාහු වෙත්, මේ ක්‍රමය නිශ්‍රය කොට ආපොකසිණාදී සියලු කර්මස්ථානයෙහි නිමිත්තත්‍රය හා භාවනාත්‍රයද ලැබෙන සැටි දතයුතුයි.

සමථකර්මස්ථාන වීථියයි.

—— — ° — ——

(ප)

පන, සමථකර්මස්ථානයෙන් අන්‍යවූ විදර්ශනාකර්මස්ථානය කියම්:- විපස්සනාකම්මට්ඨානෙ, විදර්ශනාකර්මස්ථානයෙහි; සීලවිසුද්ධිච, චතුපාරිසුද්ධිශීලයාගේ පිරිසිදු බවද; චිත්තවිසුද්ධිච, උපචාර සමාධි අර්පණාසමාධි චිත්තයාගේ පිරිසුදු බවද; දිට්ඨිවිසුද්ධිච, ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානයන්ගේ වශයෙන් නාමරූපයන් පරිග්‍රහ කරන්නාවූ ඥානයාගේ පිරිසුදුබවද; කංඛාවිතරණවිසුද්ධිච, නාමරූපයන්ගේ හෙතුව පරිග්‍රහ කිරීම්වශයෙන් ශොඩශවිධකාංක්‍ෂාව එතර කරන්නාවූ ඥානයාගේ පිරිසුදු බවද; මග්ගාමග්ග ඤාණදස්සනවිසුද්ධිච, විදර්ශනාව කෙලෙසීමට කාරණාවූ දසවැදෑරුම් උපක්ලෙශයන් පරිග්‍රහ කිරීම් වශයෙන් මේ මාර්ගය මේ අමාර්ගයයි දක්මෙහි පොහොසත්වූ ඥානයාගේ පිරිසුදු බවද; පටිපදාඤාණදස්සනවිසුද්ධිච, උදයව්‍යය ඥානයාගේ පටන් සත්‍යානුලොමඥානය දක්වා නවමහා විදර්ශනාඥානයයි කියනලද්දාවූ මාර්ග සංඛ්‍යාතවූ ඥානදර්ශනවිසුද්ධිහුගේ ප්‍රතිසංඛ්‍යාන ඥානයාගේ පිරිසුදු බවද; ඤාණදස්සනවිසුද්ධිච, අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණය දක්මෙහි පොහොසත්වූ මාර්ගඥානයාගේ පිරිසුදු බවද; ඉති, මෙසේ; සත්තවිධෙන, සප්තප්‍රකාරයකින්; විසුද්ධිසඞ්ගහො, විසුද්ධිසංග්‍රහය; වෙදිතබ්බො, දතයුත්තේයි.

අනිච්චලක්ඛණච, දතයුතුවූ අනෛකාන්ත බවද; දුක්ඛලක්ඛණච, දතයුතුවූ දුඃඛලක්‍ෂණයද; අනත්තලක්ඛණච, දතයුතුවූ ආත්මයක් නොවේයි යන ලක්‍ෂයද; ඉති, මෙසේ; තීණිලක්ඛණානි, ලක්‍ෂණයෝ තුන්දෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

අනිච්චානුපස්සනාච, අනිත්‍ය බව නැවත නැවත දැකීමද; දුක්ඛානුපස්සනාච, දුක් බව නැවත නැවත දැකීමද; අනත්තානුපස්සනාච, ආත්මයක් නොවන බව නැවත නැවත දැකීමද; ඉති, මෙසේ; තිස්සො අනුපස්සනා, අනුපස්සනාවෝ තුන්දෙන; වෙදිතබ්බා, දතයුත්තාහුය.

සම්මසනඤාණච, ස්කන්ධාදීහු සමූහපරම්පරා වශයෙන් නුවනින් ඇල්වීම් වශයෙන් හටගන්නාවූ සම්මර්ශනඥානයද; උදයව්‍යයඤාණච, හටගැණීම් විනාශවීම් සඞ්ඛ්‍යාත උදයව්‍යය දෙක නැවත නැවත දැකීම් වශයෙන් හටගන්නා උදයව්‍යයඥානයද; භඞ්ගඤාණච, හටගැණීම හැර විනාශයෙහි පැවති ඥානයද; භයඤාණච, සංස්කාරයන් භයවශයෙන් නැවත නැවත දැකීම්වශයෙන් හටගන්නාවූ භයඥානයද; ආදීනවඤාණච, දක්නාලද භය ඇත්තාවූ සංස්කාරයන් අයුණු වශයෙන් දක්නාවූ හෙවත් දොෂ වශයෙන් වැටහෙන ආදීනවඥානයද; නිබ්බි

ද ඤාණච, දක්නාලද ආදීනව ඇති සංස්කාරයෙහි කලකිරීම් වශයෙන් හටගන්නා නිර්විදාඥානයද; මුඤ්චිතුකම්‍යතාඥාණංච, කලකිරුණාවූ සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති බැව් ඇති මුඤ්චිතුකම්‍යතාඥානයද; පටිසඞ්ඛාඥාණංච, මිදීමට ඇත්තාවූ හෙතුහුගේ සම්පූර්ණත්වය පිණිස නැවත සංස්කාරයන් පරිග්‍රහ කිරීම්වශයෙන් හටගන්නා පටිසඞ්ඛානඥානයද; සඞ්ඛාරුපෙක්ඛාඥාණංච, සංස්කාරධර්මයෙහි භයවීමක් හෝ ඇලීමක් හෝ නැති මධ්‍යස්ථාකාරයෙන් හටගන්නාවූ ඥාණයද; අනුලොමඤාණංච, ඉක්ම ගියාවූ නවවිදර්ශනඥානයන්ගේ කෘත්‍යය සිඩ කිරීමද; මත්තෙහි ඉපදියයුතු සත්තිස්බොධිපාක්ෂික ධර්මයන් හා ගැලපීමය යන විකෘත්‍යය සිඩකරන්නාවූ අනුලොමඥානයද; ඉති, මෙසේ; දසවිපස්සනාඤාණානි, විදර්ශනාඥානයෝ දසදෙනෙක්; වෙදිතබ්බානි, දත යුත්තාහුය.

සුඤ්ඤතො විමොක්ඛොච, ආත්මයෙන් හිස්වූ හෙයින් සංයොජනාදීන්ගෙන් මිදෙන්නාවූ මාර්ගයද; අනිමිත්තො විමොක්ඛොච, නිත්‍යය නිමිත්තාදිය නැතිහෙයින් සංයොජනාදීන්ගෙන් මිදෙන්නාවූ මාර්ගයද; අප්පණිහිතො විමොක්ඛොච, තෘෂ්ණා සංඛ්‍යාතවූ ප්‍රාර්ථනා නැති හෙයින් සංයොජනාදීන්ගෙන් මිදෙන මාර්ගයද; ඉති, මෙසේ; තයො විමොක්ඛා, මේ විමොක්ෂ සංඛ්‍යාත මාර්ගයෝ තුන්දෙනෙක්; වෙදිතබ්බා, දතයුත්තාහුය.

සුඤ්ඤතානුපස්සනාච, ආත්මයෙන් හිස් බව නැවත නැවත දැකීමද; අනිමිත්තානුපස්සනාච, නිත්‍යනිමිත්තාදිය නැති බව නැවත නැවත දැකීම ද; අප්පණිහිතානුපස්සනාච, තෘෂ්ණා සංඛ්‍යාත ප්‍රාර්ථනාවෙන් වෙන් බව නැවත නැවත දැකීමද; ඉති, මෙසේ; තීණි විමොක්ඛමුඛානිච, සංයොජනාදීන්ගෙන් මිදුනාවූ මාර්ගයාගේ හෙතුහු තුන්දෙන; වෙදිතබ්බානි, දත යුත්තාහුය.

කථං? වෙදිතබ්බානි, කෙසේ දතයුත්තාහුද යත්? පාතිමොක්ඛසංවරසීලංච, තමා රක්නාහු සතරඅපායාදී දුකින් මුදවන්නාවූ කායදුශ්චරිතාදිය මුවහ කිරීමය, කායකර්ම-වචීකර්මයන් මොනවට. තවන චෙතනාවද, ඉන්ද්‍රියසංවරසීලංච, චක්ඛුන්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිහ්වින්ද්‍රිය කායින්ද්‍රිය මනින්ද්‍රියයන් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-ධර්මාලම්බණයන් කෙරෙන් මොනවට ආරක්ෂාකිරීම් වශයෙන් කායකර්ම-වචීකර්මයන් මොනවට තැබීම් ලක්ෂණ කොට ඇත්තාවූ චෙතනාවද; ආජීවපාරිසුද්ධිසීලංච, මිත්‍යාජීවයෙන් වැලකීමෙන් දිවි පැවැත්වීම් වශයෙන් හටගන්

නාවූ කුශලධර්මයන් රක්‍ෂා කරන්නාවූ චේතනාවද; පච්චයසන්නිස්සිතසීලඤ්ච, චීවරාදී සිව්පසය පරිභොග කිරීම මේ සංසාරවෘත්තයෙන් එතරවීම් සඞ්ඛ්‍යාතවූ ඵලය ඇති හෙයින් "පටිසඞ්ඛා යොනිසො" යනාදී වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් කුශලධර්මයන් මොනවට ආරක්‍ෂා කරණ චේතනාවද; ඉති, මෙසේ; චතුපාරිසුද්ධිසීලං, සතරවැදෑරුම් වූ පාරිසුද්ධිසීල තෙමේ නොහොත් ඇවැත් දෙසීමය ඉඳුරන් රැකීමය දැහැමින් සෙවීමය නැවත නැවත නුවනින් පස්විකීමය යන මොවුන්ගේ වශයෙන් පිරිසිදු බැව් ඵලවත කුශලධර්මයන්ගේ පිහිටීමට ආධාරචේතනා තොමෝ; **සීලවිසුද්ධිනාම**, සීලවිසුද්ධි නම්වේ.

**උපචාරසමාධිච**, අර්පණාධ්‍යානයාගේ සමීපයෙහි හටගත් නාවූ එකාග්‍රතාවද; **අප්පණාසමාධිච**, අර්පණාධ්‍යානයෙහි හටගත් නාවූ එකාග්‍රතාවද; ඉති, මෙසේ; දුවිධොපි සමාධි, ද්විප්‍රකාරවූද සමාධි තෙමේ නොහොත් සිත එකඟකිරීම; **චිත්තවිසුද්ධි නාම**, චිත්තවිසුද්ධි නම්වේ. හෙවත් චිත්තය නීවරණයන්ගෙන් වෙන්වූ බවට පැමිණවීමෙන් පිරිසුදු කරණ හෙයින් චිත්තවිසුද්ධි නම්වේ.

**ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වසෙන**, ලක්‍ෂණය රසය පච්චුපට්ඨානය පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන් නොහොත් ත්‍රෛභූමිකධර්මයන්ගේ සාධාරණ බැව් සඞ්ඛ්‍යාතවූ ලක්‍ෂණය, කෘත්‍යය සංඛ්‍යාතවූ රසය, වැටහෙන්නාවූ ආකාර සංඛ්‍යාතවූ පච්චුපට්ඨානය, සමීපයෙහි පවත්නාවූ හෙතු සංඛ්‍යාතවූ පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන් නොහොත් ත්‍රෛභූමික ධර්මයන්ගේ ස්වභාව සංඛ්‍යාතවූ ලක්‍ෂණය, සම්පූර්ණ බැව් සංඛ්‍යාත රසය, ඵල සංඛ්‍යාතවූ පච්චුපට්ඨානය, ආසන්නකාරණා සංඛ්‍යාතවූ පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන්; නාමරූපපරිග්ගහො නාමරූපය සමමර්ශනය කිරීම හෙවත් නාමරූපධර්මය නුවනින් අල්ලා පිරිමැදීම; **දිට්ඨිවිසුද්ධිනාම**, දිට්ඨිවිසුද්ධි නම් වේ.

ච, අතිකුදු විසුද්ධියක් දක්වමි:—තෙසමෙව, ඒ නාමරූප ධර්මයන්ගේම; **පච්චයපරිග්ගහො**, මේ ධර්මය මෙනම් හෙතුවකින් හටගන්නේයයි යනාදී ඒ ඒ ධර්මයන්ගේ හෙතුව නුවනින් අල්වා පිරිමැදීම; **කඞ්ඛාවිතරණවිසුද්ධි නාම**. කඞ්ඛාවිතරණවිසුද්ධි නම් වේ. නොහොත් ෂොඩශවිධකාංක්‍ෂාව එතර කළහැකිවූ ඥානයාගේ පිරිසිදු බව නම්වේ.

පන, කඞ්ඛාවිතරණවිසුද්ධියෙන් අන්‍යවූ මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය කියමි:—තතො, ඒ නාමරූපධර්මයන්ගේ හෙතුව

පරිග්‍රහ කිරීමෙන්; පරං, මත්තෙහි; තථා පරිග්ගහිතෙසු, ඒ ඒ ආකාරයෙන් සම්මර්ශනය කොට ගන්නා ලද්දාවූ හෙවත් වෙන් වෙන්වූ ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන් සම්මර්ශනයකොට ගන්නා ලද්දාවූ; සප්පච්චයෙසු, ප්‍රත්‍යය සමග හටගන්නාවූ; අතීතාදිභෙදභින්නෙසු, අතීතාදි ප්‍රභෙදයෙන් වෙනස්වූ; තෙභූමක සංඛාරෙසු, භූමිත්‍රයෙහි හටගන්නාවූ සංස්කාරයෙහි; ඛන්ධාදිනයමාරබ්භ, ස්කන්ධාදී ක්‍රමය අරමුණු කොටගෙණ; කලාපවසෙන, සමූහපරම්පරා වශයෙන් හෙවත් රූපකලාපාදීන්ගේ වශයෙන්; සංඛිපිත්වා, සංක්ෂෙපකොට; ඛයට්ඨෙන, ගෙවෙන්නාවූ ස්වභාවයට පැමිණෙන හෙයින්; අනිච්චං, අනිත්‍ය නම් වෙයි. හෙවත් එකාන්තයයි නොසිතිය යුත්තේය; භයට්ඨෙන, භය සංඛ්‍යාතවූ හෙතුවෙන්; දුක්ඛං, දුක්ඛ නම්වෙයි. හෙවත් දුකෙක් ඉවසිය යුත්තේය. අසාරකට්ඨෙන, ආත්ම සංඛ්‍යාතවූ හරය නැති හෙයින්; අනත්තා, අනාත්ම නම්වෙයි. හෙවත් මම ද මාගේ ද නොවෙයි. ඉති, මෙසේ; අද්ධාන වසෙන වා, අතීතාදී කාලයන්ගේ වශයෙන් හෝ; සන්තතිවසෙන වා, අතීතාදීවූ ධර්මපරම්පරා වශයෙන් හෝ; ඛණවසෙනවා, අතීතාදී ක්ෂණ වශයෙන් හෝ; සම්මසනඤාණෙන, සම්මර්ශනඥානයෙන් හෙවත් නාමරූපධර්මයන් අල්ලීමයුතු නුවණින්; ලක්ඛණත්තයං, ලක්ෂණත්‍රය; සම්මසන්තස්ස ච, සම්මර්ශනය කරන්නාවූ යොගීපුද්ගලයාගේද; තෙසෙව ච, ඒ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් කෙරෙහිම; පච්චය වසෙන ච, ප්‍රත්‍යයන්ගේ වශයෙන්ද, ඛණවසෙන ච, ක්ෂණයන්ගේ වශයෙන්ද; උදයබ්බයඤාණෙන, උදයව්‍යය ඥාණයෙන් හෙවත් සියලුධර්මයන්ගේ උප්පාද-භඞ්ග දෙක දැනගන්නාවූ නුවණ කරණ කොටගෙණ; උදයබ්බයං, ධර්මයන්ගේ උප්පාද-භඞ්ගවය; සමනුපස්සන්තස්ස ච, නැවත නැවත මොනවට දක්නාවූ යොගීපුද්ගලයාගේද; නොනොත් යොගීපුද්ගලයාහට:—

ඔභාසො ච, විදර්ශනා සිතින් හටගන්නාවූ ශරීරයෙන් නික්මෙන්නාවූ ආලොක සංඛ්‍යාතවූ ඔභාසයද; පීති ච, විදර්ශනා චිත්තය සමග හටගන්නාවූ ඛුද්දක-ඛණික-ඔක්කන්තිකා-උබ්බෙග ඵරණ සංඛ්‍යාතවූ පඤ්චප්‍රකාර ප්‍රීතියද හෙවත් ස්වල්පමාත්‍රවූ ප්‍රීතියද, එකෙණෙහි හටගන්නා ප්‍රීතියද, සමුද්‍ර තෙර රැළමෙන් කයට වැද වැද බිඳෙන ප්‍රීතියද, කය උඩට නගා අහස්හි පැනයන පමණට පැමිණියාවූ බලවත් ප්‍රීතියද, සකල ශරීරයෙහි පැතිරෙන්නා වූ ප්‍රීතියදයි කියනලද පඤ්චප්‍රකාර ප්‍රීතියද; පස්සද්ධි ච, කායචිත්තදෙදෙනාගේ කෙලශ විඩා සන්හිඳවීම ලක්ෂණ කොට ඇත්තාවූ කායපස්සද්ධිචිත්තපස්සද්ධීන්ගේ වශයෙන් හට

ගන්නාවූ විප්‍රකාර පස්සද්ධියද; අධිමොක්ඛොව, බලවත්වූ ශ්‍රද්ධෙන්ද්‍රිය සංඛ්‍යාත ඇදහිල්ලද; පග්ගහොව, සම්‍යක්ප්‍රධානවූ කෘත්‍යය සිද්ධකරන්නාවූ විරියසම්බොජ්ඣඞ්ග සංඛ්‍යාත රුකුල්දීමද; සුඛං, අතිප්‍රණීතවූ සැපයද; නොහොත් විදර්ශනාචිත්තය හා සම්ප්‍රයුක්තවූ චෛතසික සැපයද; ඤාණං, වජ්‍රපාණිහු විසින් විදුනා ලද අසනිචක්‍රයකට බඳුවූ හෙවත් වජ්‍රායුධයෙන් පැහැරීමක් බඳුවූ ත්‍රිලක්ෂණය දන්නා ඥානයද; උපට්ඨානං, සතිපට්ඨාන සංඛ්‍යාත චිරකෘතාදීන් නැවත සිහිකිරීමට පොහොසත්වූ සම්‍යක්ස්මෘතිහුගේ එළඹ සිටීමද, උපෙක්ඛාව, සම්ප්‍රයුක්තධර්මයන් හා සමව හටගත් උපෙක්ෂාසම්බොජ්ඣඞ්ග සංඛ්‍යාත තත්‍රමජ්ඣත්තතාපෙක්ෂාව හා මනොද්වාරාවර්ජනාචිත්තය සමඟ උපන් චේතනා සංඛ්‍යාතවූ ආවර්ජනූපෙක්ෂාවද යන විප්‍රකාර උපෙක්ෂාවද; නිකන්තිව, ඔභාසය මුල්කොට ඇති ධර්ම නවය උපන්කල්හි මට මින් පූර්වභාගයෙහි මෙබඳු ස්වභාව ඇත්තාවූ ආලෝකාදියක් නූපන් විරූය. ඒකාන්තයෙන් මට මාර්ගය උපන්නේ වනැයි යනාදීන් ඔභාසාදියෙහි හටගන්නාවූ සියුම් තෘෂ්ණාවද; ඉති මෙසේ:

ඔභාසාදී විපස්සනූපක්කිලෙස පරිපන්ථපරිග්ගහවසෙන, ඔභාසාදිවූ විදර්ශනෝපක්ලේශ සංඛ්‍යාතවූ සතුරන් නුවණින් ගැණීම් වශයෙන් නොහොත් මට මේ උපන්නේ මාර්ගය නොවේයි විදර්ශනා උපක්ලේශයයි දැන ගැණීම් වශයෙන්; මග්ගාමග්ගලක්ඛණවවත්ථානං, මාර්ගයාගේ හා අමාර්ගයාගේ ලක්ෂණ පිරිසිඳ ගැන ගන්නාවූ ඥානය; මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි නාම, මාර්ගාමාර්ගඥාන දර්ශනවිසුද්ධි නම්වේ.

පන, ප්‍රතිපදාඥානදර්ශන විසුද්ධිය කියමි:— පරිපන්ථවිමුත්තස්ස, දශප්‍රකාරවිදර්ශනා උපක්ලේශයන්ගෙන් මිදුනාවූ; තස්ස, ඒ යොගීපුද්ගලයාගේ; උදයබ්බයඤාණතො පට්ඨාය, උදයව්‍යය ඥානය උපන් තැන් පටන්, යාවානුලොමා, සත්‍යානුලොම ඥානය දක්වා; තිලක්ඛණං, ලක්ෂණත්‍රය; විපස්සනාපරම්පරාය, විදර්ශනාවගේ පරම්පරා වශයෙන්; පටිපජ්ජන්තස්ස, පිළිපදනාවූ යොගීපුද්ගලයාගේ; නවවිපස්සනාඤාණානි, නවප්‍රකාරවූ විදර්ශනාඥානයෝ; පටිපදාඤාණදස්සනවිසුද්ධි නාම, ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධිනම්වේ. හෙවත් උදයව්‍යය ඥානය පටන් සත්‍යානුලොමඥානය දක්වා නවප්‍රකාරවූ විදර්ශනාඥානයයි කියන ලද මාර්ග සංඛ්‍යාතවූ ඤාණදස්සනවිසුද්ධිහුගේ ප්‍රතිපත්තියක්වූ ඥානදර්ශනයාගේ පිරිසිදු බව නම් වෙයි.

පන, ඤාණදස්සන විසුද්ධිය කියමි:-එවං, මෙසේ; පටිපජ්ජන්තස්ස, පිළිපදනාවූ ඒ පුද්ගලයානට; විපස්සනාපරිපාකං,

විදර්ශනා සංඛ්‍යාත සංස්කාරොපෙක්ෂාඥානයාගේ මිහිකිරීම; ආගම්ම, ලැබ; ඉදානි, දැන් වනාහි; අප්පණා උප්පජ්ජිස්සතීති, අර්ප්‍රණිත අර්පණා සංඛ්‍යාතවූ ලොකොත්තර මාර්ගතෙමේ ඉතිකින් උපදනේයයි; (වත්තබ්බක්ඛණෙ) කියයුතු ක්ෂණයෙහි; භවඞ්ගං වොච්ඡින්දිත්වා, භවාඞ්ගප්‍රවාහය සිඳ ගෙණ; උප්පන්නමනොවාරාවජ්ජනානන්තරං, උපන් මනොවාරාවජීනචිත්තයට අනතුරුව තන්හි; ද්වෙ තීණි විපස්සනාචිත්තානි, දෙතුන් විදර්ශනා සිත් කෙනෙක් තුමූ; යං කිඤ්චි අනිච්චාදිලක්ඛණං, යම් කිසි අනිත්‍යාදීවූ ලක්ෂණයක් හෙවත් බුදුවන මහතානන්ට අනිත්‍යාදී ලක්ෂණත්‍රයම හෝ අවශෙෂ පසේබුදුරහත් ආදී ආර්යයන්ට ලක්ෂණත්‍රයෙන් එකක් හෝ; ආරබ්භ, අරමුණු කොට ගෙණ; පරිකම්මොපචාරානුලොමනාමෙන, පරිකර්මය උපචාරය අනුලොමය යන නමින්; පවත්තන්ති, හටගත්තාහු වෙත්. යා, සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථව දක්නාවූ යම් ප්‍රඥාවක් තොමෝ; සිඛාප්පත්තා, විදර්ශනාවගේ මුදුනට පැමිණියාවේද; සානුලොමා, සත්‍යානුලොම ඥානය සමග හටගත්තාවූ; සංඛාරුපෙක්ඛා, සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථව දක්නාවූ ඒ සංස්කාරොපෙක්ෂා තොමෝ; වුට්ඨානගාමිනීවිපස්සනාතිච, ව්‍යුත්ථානගාමිනී විදර්ශනායයි තොහොත් අපායාදියෙන් හා සංස්කාරනිමිත්තාදියෙන්ද නැගිටීමයයි කියන ලද මාර්ගයට පැමිණීමට කාරණාවූ විදර්ශනායයි; පවුච්චති, කියනු ලැබේ; තතො පරං, ඒ ව්‍යුත්ථානගාමිනී විදර්ශනා ජවනචිත්තයන් දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ හෝ ඉපදීමෙන් මත්තෙහි; ගොත්‍රභූචිත්තං, ගොත්‍රභූ සිත්තෙමේ; නිබ්බානමාලම්බිත්වා, නිවන් එල්බගෙණ; පුථුජ්ජනගොත්තං, පෘථග්ජනයන්ගේ ගොත්‍රය; අභිභවන්තංච, මැඩපවත්වමින්ද; අරියගොත්තං, ආර්යයන්ගේවංශයට; අභිසම්භොන්තංච, පමුණුවමින්ද, හෙවත් ආර්යගොත්‍රය වඩමින්ද; පවත්තති, හටගන්නේයි. තස්සානන්තරමෙව, ඒ ගොත්‍රභූචිත්තයට අනතුරුව තන්හිම; මග්ගො, ශ්‍රොතාපත්තිමාර්ගී තෙමේ; දුක්ඛසච්චං, පරිජානන්තො, දුඃඛසත්‍යය වෙන් වෙන් කොට දැන ගණිමින්; සමුදයසච්චං පජහන්තො, සමුදයසත්‍යය දුරුකරමින්; නිරොධසච්චං සච්ඡිකරොන්තො, නිරොධසත්‍යය පසක් කරමින්; මග්ගසච්චං, මාර්ගසත්‍යය; භාවනා වසෙන, වැඩීම් වශයෙන්; අප්පණාවීථිං, අර්පණාවීථියට; ඔතරති, බස්නේයි. තතො පරං, ඒ ශ්‍රොතාපත්තිමාර්ගචිත්තයෙන් මත්තෙහි; ද්වෙ තීණි ඵලචිත්තානි, දෙතුන් ඵල සිත් කෙනෙක් තුමූ; පවත්තිත්වා, හටගෙණ; "තීණි ඵලචිත්තානි" යනු "චිත්තං තිණ්ණං ඵල චිත්තානං" යනාර්ථයි. දෙවරක් හෝ තුන්වරක්

හෝ සෝතාපත්ති ඵලචිත්තයන්ගේ "පවත්තිකා" යන්නෙහි කා ප්‍රත්‍යය හෙතුවර්ථවාචකයි. පවත්තිකා, හටගන්නාහෙයින්; භවඞ්ගපාතොව හොති, භවාඞ්ගපාතයම වෙයි. පුන, නැවත; භවඞ්ගං වොච්ඡින්දිත්වා, භවාඞ්ගය සිඳ ගෙණ; පච්චවෙක්ඛණ ඤාණානි, ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝ නොහොත් මාර්ගඵලනිර්වාණ යන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ ඥානයෝ; පවත්තන්ති හටගන් නාහු වෙත්.

පණ්ඩිතො, ප්‍රාඥවූ ආර්ය පුද්ගල තෙමේ; මග්ගඤ්ච, මාර්ගයද; ඵලඤ්ච, ඵලයද; නිබ්බානඤ්ච, නිර්වාණයද; පච්චවෙක්ඛති, ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. හීනෙ, ප්‍රහීණ කරණ ලද්දාවූ; කිලෙසෙච, කෙලශයන්ද; සෙසෙච අප්‍රහීණකෙලශයන්ද; පච්චවෙක්ඛතිවා, ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ හෝ වෙයි. නවා, ප්‍රත්‍යවෙක්ෂා නොකරන්නේ හෝ වෙයි.

එවං, (ඉති වුත්තනයෙන) මෙසේ කියන ලද ක්‍රමයෙන්, ඡබ්බිසුද්ධිකමෙන, ෂට්විශුද්ධීන්ගේ පිළිවෙළින්; භාවෙතබ්බො; වැඩිය යුතුවූ, චතුබ්බිධො මග්ගො, සතරවැදෑරුම් මාර්ගය; ඤාණදස්සනවිශුද්ධි නාම, ඤාණදස්සනවිසුද්ධි නම් වෙයි හෙවත් නිර්වාණය දත යුතුවූ මාර්ගඥානයාගේ පිරිසුදු බැව් සංඛ්‍යාතවූ මාර්ග ඥාන නම්වේයයි. පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ.

එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි; අයං, මේ කියන ලද්දාවූ; ක්‍රම තෙමේ; විසුද්ධිභෙදො, සප්තවිසුද්ධීන්ගේ ප්‍රභෙදයයි.

---

තත්ථ, ඒ අනිච්චානුපස්සනාදීවූ උද්දෙශයෙහි නොහොත් ඒ විදර්ශනාත්‍රය විමොක්ෂත්‍රය යන ධර්මයන් අතුරෙන්; අත්තාභිනිවෙසං, මමය මාගේයයි ගන්නාලද දෘෂ්ග්‍රාහය; මුඤ්චන්ති, මුදන්නාවූ; අනත්තානුපස්සනා, මාගේ නොවේයයි නැවත නැවත දැකීම ඇති 'අනාත්මානුදර්ශනා තොමෝ; සුඤ්ඤතානුපස්සනා නාම, සුඤ්ඤතානුපස්සනා නම් වූ නොහොත් ආත්මයෙන් සිස් වූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්වූ; විමොක්ඛමුඛං හොති, විමොක්ෂමුඛය වෙයි, හෙවත් ප්‍රතිපක්ෂවූ ආත්මාභිනිවෙෂයෙන් මුදවන්නාවූ මාර්ගඵලයන්ගේ හෙතුවවෙයි. විපල්ලාස නිමිත්තං, විපල්ලාස නිමිත්තය නොහොත් සඤ්ඤාවිපල්ලාස-චිත්ත විපල්ලාස-දිට්ඨිවිපල්ලාස සඞ්ඛ්‍යාතවූ නිමිත්තය නොහොත් විපරීත වීමට කාරණාවූ සංඥා-චිත්ත-දෘෂ්ටි සඞ්ඛ්‍යාතවූ හෙතුව; මුඤ්චන්ති, මුදන්නාවූ; අනිච්චානුපස්සනා, අනිත්‍යයයි නැවත නැවත දැකීම ඇති අනිත්‍යානුදර්ශනා තොමෝ; අනිමිත්තානුපස්සනා නාම

අනිමිත්තානුපස්සනා නම්වූ නොහොත් විපල්ලාසනිමිත්තෙන් පහවූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්; විමොක්ඛමුඛං හොති, විමොක්ෂමුඛය වෙයි. හෙවත් ප්‍රතිපක්ෂවූ විපල්ලාසමුඛයෙන් මුදවන්නාවූ මාර්ගඵලයන්ගේ හෙතුව වෙයි. තණ්හා, පණිධිං, කාමරූපාරූප සඞ්ඛ්‍යාතවූ භවත්‍රයෙහි ඇලෙන්නාවූ තෘෂ්ණා සඞ්ඛ්‍යාත ප්‍රාර්ථනාව; මුඤ්චන්ති, මුදන්නාවූ; දුක්ඛානුපස්සනා, දුකැයි නැවත නැවත දැකීම ඇති දුක්ඛානුදර්ශනා තොමෝ; අප්පණිහිතානුපස්සනා නාම, අප්‍රණිහිතානුදර්ශනා නම්වූ නොහොත් ප්‍රාර්ථනායයි කියන ලද තෘෂ්ණාවෙන් පහවූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්; විමොක්ඛමුඛං හොති, විමොක්ෂමුඛය වෙයි. හෙවත් ප්‍රතිපක්ෂවූ තෘෂ්ණා ප්‍රාර්ථනාවෙන් මිදුනාවූ මාර්ගඵලයන්ගේ හෙතුව වෙයි. තස්මා, එහෙයින්; වුට්ඨානගාමිනී විපස්සනා, ව්‍යුත්ථානගාමිනී විදර්ශනා තොමෝම; අනත්තතො, අනාත්ම වශයෙන්; යදි විපස්සති, ඉදින් දක්නේ නම් "එවං සති" යනු පාඨශෙෂයි. එවං සති, මෙසේ අනාත්මවශයෙන් දැකීම ඇති කල්හි; මග්ගො, අනතුරුව උපදනා ලොකොත්තර මාර්ගතෙමේ; සුඤ්ඤතො විමොක්ඛො නාම හොති, සුඤ්ඤත විමොක්ෂ නම් වෙයි. වුට්ඨානගාමිනී විපස්සනා, ව්‍යුත්ථානගාමිනී විදර්ශනා තොමෝ; යදි අනිච්චතො විපස්සති, ඉදින් අනිත්‍ය වශයෙන් දක්නේ වේ නම්; (එවං සති, මෙසේ අනිත්‍ය වශයෙන් දැකීමක් ඇති කල්හි) මග්ගො, ලොකොත්තරමාර්ග තෙමේ; අනිමිත්තො විමොක්ඛො නාම, අනිමිත්තවිමොක්ෂ නම්වෙයි. වුට්ඨානගාමිනී විපස්සනා, වුට්ඨානගාමිනී විදර්ශනා තොමෝ; දුක්ඛතො, දුක් වශයෙන්; යදි විපස්සති, ඉදින් දක්නේ වීනම්, එවං සති, මෙසේ දුක් වශයෙන් දැකීමක් ඇති කල්හි; මග්ගො, ලොකොත්තරමාර්ග තෙමේ; අප්පණිහිතො විමොක්ඛො නාම, අප්‍රණිහිතවිමොක්ෂ නම්වෙයි. ඉති ච, මෙසේ ද; මග්ගො, ලොකොත්තරමාර්ග තෙමේ; විපස්සනාගමනවසෙන, විදර්ශනා සඞ්ඛ්‍යාතවූ පැමිණීමගේ හෙතු වශයෙන්; තීණි නාමානි, සුඤ්ඤතවිමොක්ෂය අප්‍රණිහිතවිමොක්ෂය අනිමිත්තවිමොක්ෂය යි යන නාමයන් තුන්දෙනෙකුන්; ලභති, ලබයි. මග්ගවීථියං, මාර්ගවීථියෙහි; ඵලච, දෙතුන්වරක් හටගන්නාවූ ඵල සිත් තෙමේ; මග්ගාගමනවසෙන, මාර්ග සඞ්ඛ්‍යාතවූ පැමිණීමගේ වශයෙන්; තථා, එසේම; තීණි නාමානි ලභති, නාමයන් තුන්දෙනෙකුන් ලබයි. පන, විශෙෂාර්ථයක් කියම්:—ඵලසමාපත්තිවීථියං, ඵලසමාපත්තිවීථියෙහි; යථාවුත්තනයෙන, යථොක්තනයින්; විපස්සන්තානං, විදර්ශනා වඩන්නාවූ ඵලසත්පුද්ගලයන් සතරදෙනාහට; උප්පජ්ජ

මානං, උපදිනු ලබන්නාවූ; යථාසකං ඵලං පි, යම් යම් පරිද්දෙකින් ලබනලද මාර්ගසඞ්ඛ්‍යාතවූ හේතූහුගේ ඵලයද; විපස්සනාගමන වසෙන, විදර්ශනා සඞ්ඛ්‍යාතවූ පැමිණීම් වශයෙන් සුඤ්ඤතාදි විමොක්ඛාති ච, සූන්‍යතාදී විමොක්ෂයයිද; පවුච්චති, කියනු ලැබේ. පන, අසාධාරණයෙන් අන්‍යවූ සාධාරණය කියම්:-සබ්බත්ථ, සියලු මාර්ගවීථිඵලසමාපත්ති වීථියෙහි; සබ්බෙසං, සියලු මාර්ගඵලයන්ට; නාමත්තයම්පි, නාමත්‍රයද; හෙවත් සුඤ්ඤත-අනිමිත්ත-අප්පණිහිත විමොක්ෂය යන නාමත්‍රයද; ආලම්බණවසෙන ච, අරමුණු ගැණීම් වශයෙන්ද; සරස වසෙන ච, රාගාදීන්ගෙන් හිස්වීම ආදී තමතමාගේ කෘත්‍යය වශයෙන්ද; සමමෙව ච, සදෘශවන්නේ මැයි.

එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි; අයං, මේ කියනලද්දේ වනාහී; විමොක්ඛභෙදො, විමොක්ෂයන්ගේ ප්‍රභෙද ක්‍රමය යි.

—o:o—

පන, විමොක්ෂභෙදයෙන් අන්‍යවූ පුද්ගලභෙදය කියමි:—එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි තොහොත් මේ සතර මාර්ගයන් අතුරෙන්; සොතාපත්තිමග්ගං භාවෙත්වා, සෝවාන්මාර්ගය වඩා; දිට්ඨි විචිකිච්ඡා පහාණෙන, දිට්ඨිවිචිකිච්ඡාවන්ගේ ප්‍රහාණය හෙතුකොට ගෙණ; පහීණාපායගමනො, ප්‍රහාණවූ අපායගමන් ඇති; සත්තක්ඛත්තුපරමො, සත්තක්ඛත්තුපරම නම්වූ; හෙවත් මනුෂ්‍යලොක දිව්‍යලොකයෙහි සත් වරක්ම ප්‍රතිසන්ධිගැණීම ඇති; සොතාපන්නො නාමහොති, සෝවාන් පුද්ගල නම් වේයි. සකදාගාමිමග්ගං භාවෙත්වා, සකෘදාගාමිමාර්ගය වඩා; රාගදොසමොහානං, රාගද්වේෂ මෝහයන්; තනුකරත්තා, තුනී කළ හෙයින්; සකදාගාමි නාමහොති, සකෘදාගාමී නම්වෙයි සකිදෙව, එක් වරක්ම; ඉමං ලොකං, මේ මිනිස්ලොවට; ආගන්තා හොති, එන්නෙක් වෙයි අනාගාමිමග්ගං භාවෙත්වා අනාගාමිමාර්ගය වඩා, කාමරාගව්‍යාපාදානං, කාමරාගව්‍යාපාදයන්; අනවසෙසප්පහාණෙන, ඉතිරි නොකොට නැසීමෙන්, අනාගාමි නාමහොති, අනාගාමී නම්වෙයි. ඉත්ථත්තං, මේ කාමධාතුවට; අනාගන්තා හොති, ප්‍රතිසන්ධිවශයෙන් නොඑන්නෙක් වෙයි. අරහත්තමග්ගං භාවෙත්වා, අර්හත්මාර්ගය වඩා, අනවසෙසකිලෙසප්පහාණෙන, ඉතිරි නොකොට කෙලෙසුන් නැසීමෙන්; ඛීණාසවො, ගෙවන ලද ආශ්‍රවයන් ඇත්තාවූ; ලොකෙ, ත්‍රිවිධලොකයෙහි; අග්ගදක්ඛිණෙය්‍යො; උතුම් දක්ෂිණාව පිළිගැණීමට සුදුසුවූ හෙවත් පරලොව අදහා දෙන ලද දක්ෂිණාව පිළිගැණීමට සුදුසුවූ; අරහා නාම හොති, මහරහත් නම් වෙයි.

එත්ථ, මේ විදර්ශනා කර්මස්ථානයෙහි; අයං, මේ කියන ලද්දේ; පුග්ගලභෙදො, පුද්ගල භෙදයයි.

—— o:o ——

පන, පුද්ගලභෙදයෙන් අන්‍යවූ සමාපත්තිභෙදය කියමි:- එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි හෙවත් නිරොධසමාපත්ති ඵලසමාපත්තීන් අතුරෙන් ඵලසමාපත්තීහු තුමූ; සබ්බෙසම්පි, සියලු ඵලස්ථ පුද්ගලයන්ටම; යථාසකඵල වසෙන, තමතමාට අයත්වූ ඵලයාගේ වශයෙන්; සාධාරණාව, සාධාරණම වෙත්. පන, සාධාරණයෙන් අන්‍යවූ අසාධාරණය කියමි:- නිරොධසමාපත්ති සමාපජ්ජනං, නිරොධසමාපත්තියට සමවැදීම හෙවත් චිත්තචෛතසික චිත්තජ රූපයන්ගේ නිරුද්ධකිරීම සඞ්ඛ්‍යාතවූ නිරොධයට සමවැදීම; අනාගාමීනච්චෙව, කාමරූපභූමියෙහි පිහිටියාවූ අෂ්ටසමාපත්තිලාභී අනාගාමී පුද්ගලයන්ට හා; අරහන්තානම්, එබඳුවූ රහතුන්ටද; ලබ්භති, ලැබිය යුතුයි. තත්ථ, ඒ නිරොධසමාපත්තියෙහි; යථාක්කමං, පිළිවෙළින්; පඨමජ්ඣානාදි මහග්ගතසමාපත්තිං සමාපජ්ජිත්වා, ප්‍රථමධ්‍යානාදී මහද්ගතසමාපත්තීන්ට සමවැද; වුට්ඨාය, එම ධ්‍යානසමාපත්තියෙන් නැගිට; තත්ථ ගතෙ, ඒ ධ්‍යාන සමාපත්තියෙහි අන්තර්ගතවූ; සඞ්ඛාරධම්මෙ, සංස්කාරධර්මයන්; තත්ථ තත්ථෙව, ඒ ඒ ධ්‍යානයෙහිම; විපස්සන්තො, විදර්ශනාකරන්නාවූ අනාගාමී රහත් පුද්ගල තෙමේ; යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා, ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන කුශල ක්‍රියාව දක්වා ගොස් හෙවත් සමවැදීම් වශයෙන් ගොස්; තතො පරං, එයින් මත්තෙහි; අධිට්ඨෙය්‍යාදිකං, අධිෂ්ඨාන කටයුතු දෑ හෙවත් ශරීරය අසම්බද්ධවූ තමාගේ පාසිවුරු ආදී පරිෂ්කාර විහාරාදිය ගිනි සොරභයාදියෙන් විනාශ නොවේවයි අධිෂ්ඨාන කිරීමය, සඞ්ඝයාගේ ප්‍රතිමානනය හෙවත් අඩගෑම ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, බුදුන්ගේ ආමන්ත්‍රණය ප්‍රත්‍යවෙක්ෂා කිරීමය සත්දවසක් ඇතුලත කර්මජරූපයන් උපදවන්නාවූ ජීවිතෙන්ද්‍රිය රූපකලාප විනාශ නොවේවයි. අධිෂ්ඨාන කොට; පුබ්බකිච්චං කත්වා, සතර පූර්වකෘත්‍යයකොට; නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, අනාගාමීහු නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශල ධ්‍යානයට හා රහත්හු එම ක්‍රියා ධ්‍යානයටද; සමාපජ්ජති, සමවදනේයි. ද්වින්නං අප්පනාජවනානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශල ක්‍රියා ජවනයන් දෙදෙනෙකුන්ගෙන්; පරතො, මත්තෙහි; තස්ස, ඒ ආර්‍ය පුද්ගලයාගේ; චිත්තසන්තති, චිත්තපරම්පරා තොමෝ; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිඳේ. තතො, ඒ චිත්ත පරම්පරාවගේ සිඳීමෙන්

මත්තෙහි; නිරොධසමාපන්නො නාම හොති, නිරොධයට සමවන්නේ නම් වෙයි. පන, අන්‍යාර්ථයක් කියම්:-වුට්ඨානකාලෙ, නිරොධසමාපත්තියෙන් නැගිටිනා කල්හි; අනාගාමිනො, අනාගාමී පුද්ගලයාහට; අනාගාමි ඵලචිත්තං, අනාගාමී ඵලචිත්තයද; අරහතො, රහත්හට; අරහත්තඵලචිත්තං, අර්හත්ඵලචිත්තයද; එකවාරමෙව පවත්තිත්වා, එක් වරක්ම පැවත; භවඞ්ගපාතො හොති, භවාඞ්ගපාතය වෙයි. තතො පරං, ඒ භවාඞ්ගපාතයෙන් මත්තෙහි; පච්චවෙක්ඛණඤාණං, ප්‍රත්‍යවෙක්ෂාජවන චිත්තය උපදියි.

එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි; අයං, මේ කියනලද්දේ වනාහි; සමාපත්තිභෙදො, සමාපත්තීන්ගේ ප්‍රභෙදයයි.

විපස්සනා කම්මට්ඨානනයො, විදර්ශනා කර්මස්ථානක්‍රම තෙමේ; නිට්ඨිතො, නිෂ්ඨාවට පැමිණියේ මැයි.

---

පන, විශෙෂාර්ථයක් කියම්:-හෙවත් ප්‍රයෝජනය දක්වම්:-සාසනෙ, නෛර්යාණික ශාසනයෙහි; පටිපත්තිරසස්සාදං, ධ්‍යානසුඛ-ඵලසුඛ සඞ්ඛ්‍යාතවූ ප්‍රතිපත්තීන්ගේ රසාස්වාදය, පත්ථයන්තෙන, ප්‍රාර්ථනා කරන්නාවූ කුලපුත්‍රයා විසින්; ඉච්චෙවං, යම් කියන ලද ක්‍රමයෙන්; උත්තමං, උතුම්වූ හෙවත් නීවරණක්ලෙශයන් පහකිරීමෙහි පොහොසත්වූ; භාවනාවයං, සමථභාවනා-විදර්ශනාභාවනා සංඛ්‍යාත භාවනාවය; භාවෙතබ්බං, වැඩිය යුත්තේයි.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්මාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයෙහි; කම්මට්ඨානසඞ්ගහවිභාගො නාම, කර්මස්ථානසංග්‍රහ විභාග නම්වූ; නවමො පරිච්ඡෙදො, නවවන පරිච්ඡේදය; ඉති, මෙසේ; සම්පූර්ණ කරණ ලද්දේයි.

---

චාරිත්තසොභිත, මනා සිරිතින් හෙබියාවූ; විසාලකුලොදයෙන, ප්‍රසිද්ධ කුලයෙහි උපන්නාවූ; සද්ධාභිවුඩ්ඪ, ශ්‍රද්ධාවෙන් වැඩුනාවූ; පරිසුද්ධගුණොදයෙන, පිරිසුදු ගුණයන්ගේ පහළවීම ඇත්තාවූ; නම්බව්හයෙන, නම්බ නම් උපාසකයා විසින්; පරානුකම්පං පණිධාය, පරානුකම්පා පිණිස; යං පත්ථිතං, යම් ප්‍රකරණයක් කළහොත් යහපතැයි ප්‍රාර්ථනා කරණ ලද්දේද; තං, ඒ ප්‍රකරණය; පරිනිට්ඨිතං, හාත්පසින් සම්පූර්ණ කාරණ ලද්දේයි.

විපුලෙන, බොහෝවූ; තෙන පුඤ්ඤෙන, මේ පොතකළ ඒ පිණෙන්; පඤ්ඤාවදාත, ආසීමාගීප්‍රඥාවෙන් පිරිසුදුවූ; ගුණ

ශොභිත, සීලාදිගුණයෙන් හෙබියාවූ; ලජ්ජී භික්ඛූ, ලජ්ජා ඇති භික්ෂූහු; ධඤ්ඤාධිවාසං, ධන්‍යයන්ට වාසස්ථානවූ නොහොත් ශ්‍රී කාන්තාවට අධිවාසස්ථානවූ; උදිතොදිතං, අතිප්‍රසිඬවූ; තුම්බූල සොමං, තුම්බූලසොම නම් විහාරය; පුඤ්ඤවිභවොදයං, පුණ්‍යසම්පත්තියට උදය සංඛ්‍යාතවූ; මඞ්ගලායං, මඞ්ගල්‍යය පිණිස; ආයු ගන්තං, කල්පාන්තය දක්වා; මඤ්ඤන්තු, හඟිත්වා.

අනුරුද්ධාචරියෙන, අනුරුද්ධාචාර්‍ය්‍යයන් වහන්සේ විසින්; රචිතං, රචනා කරණලද; අභිධම්මත්ථ සඞ්ගහං නාම, අභිධර්මාර්ථ සංග්‍රහ නම්වූ; පකරණං, ප්‍රකරණය තෙම; ඉති නිට්ඨිතං, මෙසේ සම්පූර්ණ වූයේයි.

—o—

## (භා)

සමසතළිස් "තො" ප්‍රත්‍යයාගේ අර්ථ මෙසේයි:—"රූපං අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝමූලකතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො බ්‍යාධිධම්මතො මරණධම්මතො සොකධම්මතො පරිදෙවධම්මතො උපායාසධම්මතො සංකිලෙසික ධම්මතො"ති යනු සමසතළිස් "තො" ප්‍රත්‍යයයි.

එහි අර්ථ මෙසේයි:—රූපං රූපස්කන්ධය; අනිච්චතො, අනෙකාන්ත වශයෙන්ද; දුක්ඛතො, දුක් වශයෙන්ද; රොගතො, අටඅනූවක් රොගයන්ගේ උත්පත්තිස්ථාන වශයෙන්ද; ගණ්ඩතො, කෙලශ සංඛ්‍යාත පූයා වහනය වන හෙයින් ගඩක් වශයෙන්ද; සල්ලතො, තෘෂ්ණාදෘෂ්ටීන් කාරණකොටගෙණ; විදුනාර්ථයෙන් හුලක් වශයෙන්ද; අඝතො, අභිවෘද්ධිසැපයක් නැත්තාවූ අකුශලයන්ගේ උත්පත්තිස්ථානවූ සාධු සත්පුරුෂයන් විසින් ගරහන ලද්දාවූ වස්තුවක් වශයෙන්ද; ආබාධතො, රොගයන්ගේ හටගැණීම් වශයෙන්ද; පරතො, තමාගේ වශයට නොපැමිණීම් වශයෙන්ද; පලොකතො, ජරා-ව්‍යාධි-මරණයන්ගෙන් විනාශ විය හැකි වශයෙන්ද; ඊතිතො, බොහෝවූ විනාශයක් එලවීම් වශයෙන්ද; උපද්දවතො, දෙතිස් කම්කටුළු ආදීන්ගේ හටගැණීම් වශයෙන්ද; භයතො, සියලුම භය හට ගැණීමට ස්ථාන වශයෙන්ද; උපසග්ගතො, අයහපත්වූ නිමිති

වශයෙන්ද; චලතො, ජරා-ව්‍යාධි-මරණයන්ගෙන් චචලවීම් වශයෙන්ද; පභංගුතො, තමාගේ උත්සාහය මෙරමාගේ උත්සාහය ප්‍රකෘතිස්වභාවය යන මේ ත්‍රිවිධාකාරයෙන් විනාශවීම් වශයෙන්ද; අධුවතො, සදාකාලික නොවීම් වශයෙන්ද; අතාණතො හයින් පහවීමට ස්ථාන නොවන හෙයින්ද; අලෙනතො, සියලු භය ඉක්ම වීම පිණිස ඇගවීමට ස්ථාන නොවන හෙයින්ද; අසරණතො, තමා නිශ්‍රයකොට ගන්නවුන්ට පිහිට නොවිය හැකි වශයෙන්ද; රිත්තතො, දෘෂ්ටිවශයෙන් කල්පනා කරණ ලද්දාවූ සදාකාලික ආත්මයෙන් හිස්වූ හෙයින්ද; තුච්ඡතො, එසේම ආත්ම හිස්වූ දුකින් පිරිවරා ගත් හෙයින්ද; සුඤ්ඤතො, ආත්මයෙන් ශූන්‍යවූ හෙයින්ද; අනත්තතො, ආත්ම සංඛ්‍යාත සාරය නැති බැවින්ද; ආදීනවතො, අනෙකාන්ත බවය දුක් බවය විපරීත බවය යනාදී ආදීනවය ඇති හෙයින්ද, විපරිනාම ධම්මතො, ජරා-ව්‍යාධි-මරණාදියෙන් පෙරළෙන්නාවූ ස්වභාව ඇති හෙයින්ද; අසාරකතො, ආත්මාදී කිසි සාරධර්මයක් නැති හෙයින්ද; අඝමූලකතො, අඝ සංඛ්‍යාතවූ අකුශලයන්ගේ හට ගැණීමට මූල්වන හෙයින්ද; වධකතො, වැලිකෙළියෙහි පටන් මිත්‍රව පසුපස්සෙහි යන මිත්‍රවධකයෙකු මෙන්ද; විභවතො, විභවදෘෂ්ටි-විභවතණ්හාවන්ගේ හටගැණීමට කාරණා වශයෙන්ද; සාසවතො, චතුරාශ්‍රවයන්ට අරමුණුවීම් වශයෙන්ද; සංඛතතො, හෙතුධර්මයන් උපදවන ලද හෙයින්ද; මාරාමිසතො, මෘත්‍යුමාර ක්ලේශමාරාදීන්ගේ ආමිශයක් වශයෙන්ද; ජාතිධම්මතො, ඉපදීම ස්වභාවකොට ඇතිහෙයින්ද; ජරාධම්මතො, දිරීම ස්වභාව කොට ඇති හෙයින්ද; ව්‍යාධිධම්මතො, ලෙඩවීම ස්වභාව කොට ඇතිහෙයින්ද; මරණධම්මතො, මැරීම ස්වභාවකොට ඇතිහෙයින්ද; සොකධම්මතො, ශොකකිරීම ස්වභාව කොට ඇති හෙයින්ද; පරිදෙව ධම්මතො, වැළපීම ස්වභාව කොට ඇති හෙයින්ද; උපායාස ධම්මතො, බලවත් ආයාස ඇති බැව් ස්වභාව කොට ඇති හෙයින්ද; සංකිලෙසික ධම්මතො, බලවත්වූ තැවීම ස්වභාව කොට ඇති හෙයින්ද නොහොත් කෙලෙසීම ඇති හෙයින්ද පස්සති, විවිධාකාරයෙන් දක්නේ වෙයි.

මේ සතළිස් "තො" ප්‍රත්‍යය ඇති විදර්ශනාභාවනාව වනාහි පටිසම්භිදා මාර්ගපාලියෙහි විදර්ශනාකථායෙහිද, විශුද්ධිමාර්ගයෙහි සම්මර්ශනඥානකථායෙහිද සමානව ආයේයි. මහානිද්දේසපාලියෙහි "තො" ප්‍රත්‍යය දෙසාළිසක් ආයේයි. ඒ කෙසේ යත්? "අසරණතො" යන පදයට අනතුරුව "අසරණීභූතතො" යන පදයද; ආදීනවතො යන දෙපදයක්ද දක්නා ලැබෙයි. මේ සත

ලිස් ආකාරයෙන් දැකීම වනාහි සමසතලිස් විදර්ශනාඥානයයි කියාද; සමසතලිස් විදර්ශනාකර්මස්ථානයයි කියාද; සමසතලිස් අනුලොමක්ෂාන්තිඥානයයි කියාද ව්‍යවහාර කරණු ලැබේ. රූප ස්කන්ධය මේ සතලිස් ආකාරයෙන් බලන්නාක්මෙන් වෙදනා ස්කන්ධය, සංඥාස්කන්ධය, සම්පර්ශ චෛතසික නම්වූ සංස්කාර ස්කන්ධය, විඥානස්කන්ධය, යන සතර නාමස්කන්ධයද, සතලිස් සතලිස් ආකාරයෙන් වෙන වෙනම බැලිය යුත්තේයි.

මේ පඤ්චස්කන්ධයෙහි සමසතලිස් ආකාරයෙන් බලන හෙයින් විදර්ශනාකර්මස්ථානයෝ දෙසීයකැයි කියාද, අනුලොම ක්ෂාන්තිඥානයෝ දෙසියයකැයි කියාද ව්‍යවහාර කරණ ලද්දේයි. ඒ "තො" ප්‍රත්‍යය සමසාලිස් පඤ්චස්කන්ධයෙහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රයට නගා විදර්ශනා කිරීම පිණිස දෙශනා කළ හෙයින් අනිච්චතො, පලොකතො, චලතො, පභඞ්ගුතො, අධුවතො, විපරිනාමධම්මතො, අසාරකතො, විභවතො සඞ්ඛතතො, මරණධම්මතො, යනමේ දසපදය අනිත්‍යලක්ෂණය අනිත්‍යානුදර්ශනය යනමේ විප්‍රකාරය පිණිස දෙශනාකළ හෙයින් ඒ දශප්‍රකාරවූ "තො" ප්‍රත්‍යයාන්තයෝ දසදෙන ස්කන්ධ පඤ්චකය හා ගුණ කොට අනිත්‍යානුපස්සනාවෝ පණස්දෙනෙක් වෙත්. පරතො, රිත්තතො, තුච්ඡතො සුඤ්ඤතො, අනත්තතො යන පස්පදය අනාත්මලක්ෂණ අනාත්මානුපස්සනාව පිණිස දෙශනාකළ හෙයින් ඒ "තො" ප්‍රත්‍යයාන්තපඤ්චකය පඤ්චස්කන්ධයෙන් ගුණිතකොට අනත්තානුපස්සනාවෝ පස්විසිදෙනෙක් වෙත්. අවශෙෂවූ දුක්ඛතො රොගතො යනාදීවූ "තො" ප්‍රත්‍යයාන්ත පස්විසිපදයෝ තුමූ; දුක්ඛලක්ඛණං, දුක්ඛානුපස්සනාව පිණිස දෙශනා කළ හෙයින් ඒ පස්විසිපදය පඤ්චස්කන්ධයෙන් ගුණිතකොට දුක්ඛානුපස්සනාවෝ එක්සියපස්විස්සක්වෙත්. මෙසේ අනිත්‍යානුපස්සනා ඥානයෝ පණසක, දුක්ඛානුපස්සනාඥානයෝ එක්සිය පස්විස්සෙක, අනත්තානුපස්සනාඥානයෝ පස්විස්සෙකැයි යන මොවුන්ගේ වශයෙන් විදර්ශනඥාන සංඛ්‍යාතවූ අනුලොමක්ෂාන්තිඥාන දෙසියය හටගන්නා ක්‍රමය විශුද්ධිමාර්ගයෙහි ප්‍රකාශකෙළේයි.

මෙසේ අනිත්‍ය-දුක්ඛ-අනාත්මවූ නාමරූපධර්ම දෙදෙනා අතුරෙන් නැවක් නිශ්‍රය කොටගෙණ සමුද්‍රයෙහි ගමන් කරන්නාවූ මනුෂ්‍යයෝ තුමූ ඒ නැව නිසා පවත්නාක් මෙන්ද, ඒ නැව මිනිසුන්ගේ උපකාරයෙන් පවත්නාක් මෙන්ද, මේ රූප ස්කන්ධය නිශ්‍රයකොටගෙණ චිත්තචෛතසික සංඛ්‍යාතවූ නාම

කාය පවතී, ඒ නැව පදින්නාවූද; පළපත අල්ලන්නාවූද මිනිසුන් හේතුකොටගෙණ ඒ නැව මහාසමුද්‍රයෙහි ගමන් කරන්නාක්මෙන් චිත්ත චෛතසිකවූ නාමස්කන්ධ සතර කාරණා කොටගෙණ රූපස්කන්ධය පවතී. රූපස්කන්ධය නැවකටද, වේදනා-සඤ්ඤා-සංඛාර යන ස්කන්ධ තුණ නැව්පදිනා පුරුෂයන්ටද, විඤ්ඤාණස්කන්ධය පළපත අල්ලන්නාවූ මහනැවියාටද උපමා වන බැවින් ඒ නැව නිසා පුරුෂයෝ සතරදෙනාද, ඒ පුරුෂයන් නිශ්‍රයකොටගෙණ නැවද, ඔවුනොවුන්ට ඔවුනොවුන් උපකාර වීමෙන් පවත්නා හෙයින් යම් ක්‍ෂණයෙක්හි නැව විනාශවීනම් ඒ පුරුෂයෝ සතරදෙනාද, ඒ පුරුෂයන් විනාශවී නම් නැවද එකාන්තයෙන් විනාශ වන්නේයි. එහෙයින් පුරාතනාචාරීන් විසින්:—

## ගාථා.

යථාපි නාවං නිස්සාය මනුස්සා යන්ති අණ්ණවෙ;
එවමෙව රූපං නිස්සාය නාමකායො පවත්තති.

යථාපි මනුස්සෙ නිස්සාය නාවා ගච්ඡති අණ්ණවෙ;
එවමෙව නාමං නිස්සාය රූපකායො පවත්තති.

යමකං නාමං රූපඤ්ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා;
එකස්මිං හි භිජ්ජමානෙ උභො භිජ්ජන්ති පච්චයා.

යනු වදාළේයි.

කන්නු? සත්තොති පච්චෙසි මාරදිට්ඨිගතන්නු තෙ
සුද්ධසඞ්ඛාර පුඤ්ජොයං නයිධ සත්තූප ලබ්භති.

යනුද දෙශනා කෙළේයි.

## පදාර්ථ.

භික්ඛු, පඤ්චස්කන්ධයන් අතුරෙන්; කං, කවර ස්කන්ධයක්; සත්තොති, සත්වයයි කියා; ජානාසි නු; දැනගන්නේද යත්? පඤ්චස්කන්ධයන් අතුරෙන් එක් ස්කන්ධය කුඩු සත්වයයි නොගත යුතුයයි කී නියායි. අඤ්ඤා, පඤ්චස්කන්ධයෙන් අන්‍යවූ; එකො සත්තො, එක්තර සත්වයෙක් තෙමේ; අත්ථීති, ඇතැයි කියා; පච්චෙසි, හඟින්නෙහිවී නම්; තෙ, තොපට; මාරදිට්ඨි ගතං හොති, වශවර්ති මාරයාගේ ආයුධ සංඛ්‍යාතවූ මිථ්‍යාදෘෂ්ටිය වන්නේයි. අයං, මේ සත්ව තෙමේ වනාහි; සුද්ධසඞ්ඛාරපුඤ්ජො, ආත්ම සඞ්ඛ්‍යාත සාරයෙන් හිස්වූ හුදු සංස්කාර රාශියක් වෙයි. ඉධ, මේ පඤ්චස්කන්ධ සංඛ්‍යාතවූ නාමරූපධර්මයෙහි; සත්තො සත්වයෙකු; න උපලබ්භති, නොලැබිය යුත්තේයි.

## ගාථා.

**යථාපි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති**
**එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති.**

අඞ්ගසම්භාරා, රථචක්‍ර රථනෙමි ආදීවූ අවයවයන් හෙතු කොටගෙණ; රථො ඉති සද්දො, රථය යන ව්‍යවහාර ප්‍රඥප්තිය; හොති යථා, යම්සේවේද; එවං, එපරිද්දෙන්; ඛන්ධෙසු සන්තෙසු, පඤ්චස්කන්ධයන් විද්‍යමානකල්හී; සත්තොති, සත්ත්ව යන ප්‍රඥප්තිය; හොති, වේයි.

මේ ගාථාවෙහි අභිප්‍රාය මෙසේයි:—නිම්වළලු දවඅක්ෂරදී රථාවයවයන් නිසා රථය යන ශබ්ද ව්‍යවහාරය ඇතිවේද, ඒ අවයවයන්ගෙන් අන්‍යවූ රථයක් නම් නැත්තේවේද, එපරිද්දෙන්ම රූපාදී ස්කන්ධපඤ්චකය එක් ප්‍රකාරයකින් රැශීභූතවූ කල්හී "බ්‍රහ්ම" යන ප්‍රඥප්තියද, අනික් ප්‍රකාරයකින් රැශීභූතවූ කල්හි "දෙවතා" යන ප්‍රඥප්තියද, අනික් ප්‍රකාරයකින් රැශිභූතවූ කල්හී මනුෂ්‍ය යන ප්‍රඥප්තියද, එසේම ස්ත්‍රිය, පුරුෂයාය, රජහුය, කුමාරිය, යනාදී සියලු ප්‍රඥප්තීහු පවතිත්. ඒ පඤ්චස්කන්ධය වෙන්ව ගිය කල්හී ස්ත්‍රී පුරුෂාදී සියලු ප්‍රඥප්තීහුම විනාශ වෙති. මේ ආදී ක්‍රමයෙන් විදර්ශනාභාවනාව පුරුදු කිරීමෙන් යම් කලෙක ආත්මදෘෂ්ටිය විනාශවේද, එකල්හී සතර අපා දොර වසන ලද්දාවූ සම්බොධිපරායණවූ චූලසොතාපන්න නම් වන බව "ඉමිනා පන ඤාණෙන සමන්නාගතො විපස්සකො බුද්ධසාසනෙ ලද්ධස්සාසො ලද්ධපතිට්ඨො නියතගතිකො චූලසොතාපන්නො නාම හොති" යි. විශුද්ධිමාර්ග-කඞ්ඛාවිතරණ විසුද්ධියෙහි දක්වනලදී.

මේ ඥානය වනාහි:-කඞ්ඛාවිතරණ විසුද්ධිඤාණය, ධම්මට්ඨිති ඤාණය, සම්මාදස්සනඤාණය, ධම්මානුපස්සනාඤාණය යන සතර නාමයකින් යුක්තවූ විදර්ශනාඥානය උපන්නාවූ යොගාවචර තෙමේ ඊට අනතුරුව එකාන්තයෙන් සෝවාන් මාර්ගඥානය ලැබිය යුතු හෙයින් චූලසොතාපන්නයයි ව්‍යවහාර කෙරෙත්, යම්සේ මහත්වූ ආවාටමුඛයක් දෙසට වේගයෙන් දිවන පුරුෂයෙක් ආවාට මුඛයෙහි නොනැවතිය හැකිව ආවාටයෙහි වැටෙන්නාක්මෙන්ම මේ ඥානය උපන් යොගාවචර තෙමේ සෝවාන් මාර්ගයට නොපැමිණ මේ ඥානයෙහි නොනවත්නේයයි දත යුතුයි.

විදර්ශනාකර්මස්ථානයෙහි සීලවිසුද්ධි ආදීවූ සප්තවිසුද්ධියක් සම්පාදනය කටයුතුයි. ඒ කර්මස්ථාන වැඩීමට පූර්වභාගයෙහි සීල

විසුද්ධි සංඛ්‍යාතවූ සීලයාගේ පිරිසිදු බව සැපයිය යුත්තේය. ඊට අනතුරුව චිත්තයාගේ පිරිසිදුබව සැපයිය යුත්තේය. තදනන්තරව දෘෂ්ටීහුගේ පිරිසිදු බවද, ඊට අනතුරුව සැකය එතරකිරීමද, තදනන්තරව මාර්ගය ද්‍රෝහි අමාර්ගයද්‍රෝහි විමංසනය කරමින් උපදින මග්ගා මග්ගඥාණදස්සන විසුද්ධියද, සැපයිය යුත්තේය. ඊට අනතුරුව ඒ මාර්ගයාගේ ප්‍රතිපදාව පිරිසිදුකට යුතුයි. තදනන්තරව සෝවාන් ආදී මාර්ගඥානය ඉපදවිය යුතුයි.

මේ සප්තවිශුද්ධීන් අතුරෙන් සීලවිසුද්ධි ආදී සදෙන ලෞකිකගුණධර්ම වෙයි. ඥාණදස්සන විසුද්ධිය ලෝකෝත්තර වෙයි. ඒ පූර්වභාගවූ ෂට්විශුද්ධියෙන් සම්පූර්ණවූ කල්හි අනිත්‍යලක්ෂණය දුඃඛලක්ෂණය අනාත්මලක්ෂණයයි කියා ලක්ෂණත්‍රයක්ද; අනිත්‍යානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනායයි අනුපස්සනාවෝ තුන්දෙනෙක් වෙති. මෙසේ ලක්ෂණත්‍රය ආරෝපණය කොට ත්‍රෛභූමිකධර්මයන් නැවත නැවත දක්නා කල්හි ලබන ලද්දාවූ ඥානයෝ වනාහි සම්මශීනඥානය, උදයව්‍යයඥානය, භඞ්ගඥානය, භයඥානය, ආදීනවඥානය, නිර්විද්‍යාඥානය, මුච්තුකම්‍යතාඥානය, පටිසංඛාඥානය, සංඛාරුපෙක්ඛාඥානය, අනුලෝමඥානය, යන දශවිධවිදර්ශනාඥාන කෙනෙක් ඒ මාර්ගඥානයට පූර්වභාගයෙහි උපදනාහු වෙති.

ඒ ත්‍රිවිධ විදර්ශනාවන් හෙතුකොටගෙණ ලබන ලද්දාවූ විමොක්ෂය වනාහි සුඤ්ඤතවිමොක්ෂය, අනිමිත්තවිමොක්ෂය, අප්පණිහිතවිමොක්ෂයයි ත්‍රිවිධාකාරවෙයි. සුඤ්ඤතානුපස්සනාය, අනිමිත්තානුපස්සනාය, අප්පණිහිතානුපස්සනායයි අනුපස්සනාවෝ තුන්දෙනෙක් වෙත්. මේ විදර්ශනාඥානය හා විමොක්ෂත්‍රයද අනුපස්සනාවෝ තුන්දෙනද එකම මාර්ගවීථියෙහි ලැබෙන පරිදි අවබොධ කටයුතුයි. හේ කෙසේ යත්? “අනිච්චං, දුක්ඛං අනත්තා” යනුවෙන් තිලකුණු භාවනා කරන්නාවූ ආර්‍යයන්ට ඒ ලක්ෂණත්‍රයෙන් එකක්ව වැටහී අධිගමලාභය වන්නේයි. ඉදින් අනිත්‍යයයි වැටහී මාර්ගය ලබන්නේවී නම් ගොත්‍රභූචිත්තයට පූර්වභාගයෙහි උපදනා අනුලෝමචිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥාචෛතසිකය අනිත්‍යානුපස්සනා–විමොක්ෂමුඛ නම් වෙයි. ගොත්‍රභූචිත්තයට අනතුරුව ලබන්නාවූ මාර්ගචිත්තය අනිමිත්තවිමොක්ෂ නම් වෙයි. මෙසේම සෙසු දෙපදයෙහිද අනුපස්සනාවන්ගේහා විමොක්ෂයන්ගේ ද නම් ලබන්නාවූ ක්‍රමය අවබොධ කටයුතුයි.

ඒ සප්තවිශුද්ධීන් අතුරෙන් “සීලවිසුද්ධිය” යනු භික්ෂූන්ට වනාහි ප්‍රාතිමොක්ෂයෙහි ආවාවූ සප්තාපත්තිස්කන්ධය එක් දුකුළා

ඇවතකුදු මදීනය නොකොට උග්‍රවූ ඝෝරවූ විෂ ඇත්තාවූ සර්පයෙකු මෙන් මහත් උත්සාහයෙන් ශීලය සම්පූර්ණ කිරීම භික්ෂුසීලවිසුද්ධියයි. හෙරණුන්ට වනාහි දසසිල්-දසපරිජි-දසසික-දසනාසනා-දසදඬුවම් යනාදී සමපණස් සංවර හා සෙඛියා-වත්තක්ඛන්ධකයෙහි ආවාවූ සියලු සීලයන්ගේ පරිපූර්ණ කිරීම හෙරණසීලයයි. ගෘහස්ථඋපාසකයන්ට වනාහි පංචසීලය-දසප්‍රකාර දුශ්චරිතය යනාදීවූ සියලු සංවරය ගිනිගොඩක් මෙන් වැටහී මහත් උත්සාහයෙන් සීලයන් රැස් කිරීම ගෘහස්ථ සීලයයි.

මෙසේ ප්‍රාතිමෝක්ෂසංවර සීලය පුරා තදනන්තරව චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මනො යන සදොර රජුන්ගේ භාණ්ඩාගාරය රක්නාවූ රාජපුරුෂයන් මෙන් මහත් භයින් රක්ෂා කිරීම ඉන්ද්‍රියසංවරසීල නම්වෙයි. භික්ෂුසාමණේරයන් විසින් අෂ්ටකුලදූෂණයෙන් හා එක්විසි අන්වෙෂනයෙන් ලබනලද සිව්පසයගිනිකෙණ දිලියෙන මහත්වූ යවටක් මෙන් අත්හැර සපදානචාරිකාවෙන් දැහැමෙන් ලබන ලද සිව්පසය පරිභොග කිරීම ආජීවපාරිසුද්ධි ශීලයයි. ගෘහස්ථයන් විසින් ත්‍රිවිධකායකර්මය, චතුර්විධවාක්කර්ම යන සප්තදුශ්චරිතයෙන් ලබන ලද පසය දුරින් දුරුකොට දැහැමින් සෙමින් ලබන ලද්දාවූ ප්‍රත්‍යයපරිභොග කිරීම ආජීවපාරිසුද්ධිසීලයයි. භික්ෂුසාමණේරයන් විසින් "පටිසංඛා යොනිසො" යනාදීන් ප්‍රත්‍යවෙක්ෂා කොට සිව්පසපරිභොගය ප්‍රත්‍යයසන්නිශ්‍රිත සීලයයි. ගෘහස්ථයන් විසින් ආහාරෙ පටික්කූල සංඥාදීන්ගේ වශයෙන් ආහාරයෙහි තෘෂ්ණාවෙන් නොඇලී පරිභොග කිරීම ගෘහස්ථ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයයි. මෙසේ මේසතරාකාර සීලයෙහි සංවර නිෂ්ඨාකිරීම සීලවිසුද්ධි නම් වෙයි දතයුතුයි.

"චිත්තවිසුද්ධිය" යනු උපචාරසමාධි අර්පණාසමාධීහුයි. උපචාරසමාධිය යනු ධ්‍යානමාර්ග ඵලයන්ගේ සමීපයට පැමිණියාවූ කාමාවචර භාවනාමය පුණ්‍යක්‍රියාවයි. උපචාර අර්පණාසමාධීන්ගේ වශයෙන් කාමච්ඡන්දාදී පංචනීවරණධර්මයන් විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් වලක්වා සිත පිරිසුදු කිරීම චිත්තවිසුද්ධියයි.

"දිට්ඨිවිසුද්ධි" යනු ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන්ගේ වශයෙන් වේදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ සංඛ්‍යාතවූ තෙපණස් නාමධර්මය හා විකාර වන අර්ථයෙන් රූපනම්වූ අටළොසක් ප්‍රභෙදවූ රූපධර්මයන්ගේද යනමේ එක්සැත්තෑවක් නාමරූපධර්මයන් අතුරෙන් ස්පර්ශ තෙමේ අරමුණෙහි වැදගැන්ම

ලක්‍ෂණකොට ඇත්තේය. යනාදී වශයෙන් ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන්ගේ වශයෙන් එකී එකී ධර්මයක් පාසා නුවණින් පරීක්‍ෂා කරණ කල්හි අනෙකාන්ත බැවින් අනිත්‍යය, දුක් උපදවන හෙයින් දුක්ඛය, වශයෙහි නොපවත්නා බැවින් අනාත්මයයි මෙසේ ත්‍රිලක්‍ෂණාරෝපණය කොට නාමරූපධර්මයන් කෙරෙහි නිත්‍යය සුඛය ආත්මය යන විපරීත දෘෂ්ටි පහකරණ අර්ථයෙන් දිට්ඨිවිසුද්ධි නම්වෙයි.

“කඞ්ඛාවිතරණ විසුද්ධි” යනු මේ නාමරූප ධර්මවය ශක්‍ර බ්‍රහ්මසුයාම සන්තුසිතාදී මහානුභාවසම්පන්න දෙවියෙකු විසින් මවන ලද්දේ නොවෙයි. ස්ත්‍රීපුරුෂ සත්වජීවාදී ප්‍රඥප්තිමාත්‍රයක අවිද්‍යාව ආදිකොට ඇති ජරාමරණය අවසන් කොට ඇති අඟ දොළසකින් යුක්තවූ විසි ආකාරයකින් හා සන්ධිත්‍රයකින්ද, සතර සංක්‍ෂෙපයකින් හා වෘත්තත්‍රයකින්ද, මූලවයකින්ද යුක්ත වූ හෙතුඵල සම්බන්ධයෙන් පවත්නාවූ ධර්මපුඤ්ජමාත්‍රයෙක්මය. ඊශ්වරාදී දෙවියෙකු විසින් හෝ ආත්මාදිකාරකයෙක් විසින් හෝ කරණ ලද්දේත් නොවෙයි. පූර්වජාතියෙන් මේ ජාතියට ආවේද හෝ මේ ජාතියෙන් අතික් ජාතියට යන්නේද හෝ යි යනාදීන් පැවති සොළොස් වැදෑරුම් සැකය දුරු කිරීමෙන් පිරිසුදු කරන්නාවූ ඥානය කාංඛාවිතරණ විසුද්ධි නම්වේ.

මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය යනු ඒ කාංඛාවිතරණ විසුද්ධියෙන් මත්තෙහි ඒ ඒ ආකාරයෙන් නුවණින් ගන්නාලද අතීතාදී භෙදභින්නවූ සප්‍රත්‍යයවූ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් කෙරෙහි ස්කන්ධාදී නය පටන් කලාප වශයෙන් හකුළුවා ගෙවී යන අර්ථයෙන් අනිත්‍ය නම්වෙයි. භය කරණ අර්ථයෙන් දුක් නම් වෙයි. ආත්මසාර විරහිත හෙයින් නිස්සාර වෙයි. මෙසේ කාල වශයෙන් හා සන්තති වශයෙන්ද උප්පාදඨිතිභඞ්ග සංඛ්‍යාතවූ ක්‍ෂණයන්ගේ වශයෙන්ද, ලක්‍ෂණත්‍රය බලන්නාවූ යොගාවචරයාහට ඒ විදර්ශනානුභාවයෙන් ශරීරයෙන් නික්මෙන්නාවූ ආලෝකය, අතිශයින් සතුටු වන්නාවූ ප්‍රීතිය, කාය චිත්ත දෙදෙනාගේ සන්සිඳීම වන්නාවූ පස්සද්ධිය, අරමුණු නිශ්චය කරණ අධිමොක්‍ෂය, චිත්තයට සංග්‍රහ කරන්නාවූ ප්‍රග්‍රහය, කායචිත්ත දෙදෙනාගේ සැපය, විදර්ශනාවෙහි ආරෝපණය කළාවූ ඥානය ප්‍රධානවූ උපස්ථානය, මැදහත්ව නැරඹීම් සංඛ්‍යාතවූ උපෙක්‍ෂාවය, සියුම් තෘෂ්ණා සංඛ්‍යාතවූ නිකාන්තිය යන මේ විදර්ශනාවට අන්තරාය කරවූ උපක්ලේශයන්, දසදෙන උපන් කල්හි මේ වනාහී මාර්ගය නොවෙයි, එකාන්තයෙන් විදර්ශනා

වගේ උපක්ලේශයයි දැන ගන්නාවූ ඥානය මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි නම් වෙයි.

පටිපදාඤාණදස්සනවිසුද්ධිය යනු ඒ විදර්ශනා උපක්ලේශයන්ගෙන් චිත්තය මිදුනු කල්හි උදයව්‍යයඥානය පටන් අනුලෝමඥානය දක්වා ක්‍රමයෙන් පරිග්‍රහ කරන්නාවූ ඥාණයාගේ පිරිසුදු බව පටිපදාඤාණදස්සන විසුද්ධි නම්වේ.

ඤාණදස්සනවිසුද්ධිය යනු යටකී ක්ලේශ සංඛ්‍යාත උපක්ලේශයන්ගෙන් මිදුනාවූ විදර්ශනා ඥානය මිහිකිරීමට පැමිණි කල්හි මනොද්වාරාවර්ජන සිතක් ඉපිද අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන් අතුරෙන් එක්තරා ලක්ෂණයක් අරමුණුකොටගෙණ උපචාර-අනුලෝම යන චිත්තක්ෂණයක් ඉපිද පෘථග්ජන ගොත්‍රය මඩිමින් ආර්‍ය්‍යගොත්‍රය වඩමින් ගොත්‍රභූ සිත එක් වරක් උපදී. තදනන්තරව ශ්‍රොතාපත්තිමාර්ග සිත් තෙමේ දුඃඛසත්‍යය වෙන් වෙන් කොට දැකීමය, සමුදය සත්‍යය දුරුකිරීමය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන සතර මාර්ග කෘත්‍යය සිඩකෙරෙමින් මාර්ගචිත්තය අර්පණාවීථියට බස්නේයි. තදනන්තරව සෝවාන් ඵල සිත් තෙමේ දෙවරක් හෝ තුන් වරක් හෝ ඉපද භවාඞ්ග ශ්‍රොතයෙහි වැටේ.

දශවිධ විදර්ශනාඥානයාගේ අභිප්‍රාය කෙසේය යත්?

යම් පුද්ගලයෙක් තෙමේ ආචාර්‍ය්‍යයන් සමීපයෙහි නාමරූපදෙක ඉගෙණ පඤ්චස්කන්ධය, ෂට්ද්වාරය, ෂඩාලම්බණය, ෂට්විඥානය, ෂට්ස්පර්ශය, ෂට්වෙදනාය, ෂට්සංඥාය, ෂට්චෙතනාය, ෂට්තෘෂ්ණාවය, විතර්ක සඤෙදනය, විචාර සඤෙදනය, ධාතු සඤෙදනය, දසකසිණය, ද්වත්තිංසාකාරය, දොළොස් ආයතනය, අටළොස් ධාතුය, චතුස්සත්‍යය, ඉන්ද්‍රිය නවය, භව තුනය, නවසත්තාවාසය, ධ්‍යානඅටය, පටිච්චසමුප්පාදධර්මදොළොසය, යනමේ ධර්මසමුදායාගේ සියලු විභාග ඉගෙණ අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රයෙහි පැවති සියලු නාමරූප ධර්මසමුදාය ලක්ෂණත්‍රයාරොපණය කොට නුවණින් මෙනෙහි කිරීම සම්මර්ශනඥානනම්වෙයි.

එසේ සම්මර්ශනය කරනකල්හි නාමරූපධර්මයන්ගේ හට ගැණීම හා විනාශවීම දැකීම්වශයෙන් උපදින ඥානය උදයව්‍යය ඥාන නම් වෙයි.

තදනන්තරව නාමරූපධර්මයන්ගේ උත්පත්තිය හැර භඞ්ග මාත්‍රයක් දක්නා කල්හි නොහොත් සියලු ධර්මයන්ගේ විනාශය දක්නා කල්හි උපදනා ඥානය භඞ්ගඥාන නම් වෙයි,

ඊට අනතුරු සියලු සංස්කාර ධර්මයන් ඉපිද ඉපිද විනාශ වීම් දැකීම් වශයෙන් උපදනා ඥානය භංගඥාන නම්වෙයි.

තදනන්තරව සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්මයන ලක්‍ෂණත්‍රයෙන් යුක්තව පැවතීම් වශයෙන් දක්නාඥානය ආදීනව ඥානය නම්වෙයි.

එබඳු ආදීනව ඇති ඒ සංස්කාරධර්මයන් කෙරෙහි කල කිරීම් වශයෙන් උපදනා ඥානය නිර්විදඥාන නම්වෙයි.

ඉක්බිති ඒ ආදීනවයන්ගෙන් යුක්තවූ සංස්කාරධර්මයන් ගෙන් දැලට අසුවූ පක්‍ෂියෙක් ඒ දැලින් මිදීමට කැමැත්තක් මෙන් උපදනා ඥානය මුඤ්චිතුකම්‍යතාඥාන නම්වෙයි.

තදනන්තරව මේ සංස්කාර ධර්මයන්ගෙන් කෙසේ මිදෙන්නෙම් ද්‍ෙහෝයි කල්පනා කිරීම් වශයෙන් උපදනා ඥානය පටිසංඛාඥාණනම්වෙයි.

ඒ පටිසංඛාඥාණයෙහි ඇලීමක් හෝ බියවීමක් හෝ කාරණයක් නොවෙයි. සියලු සත්වයෝම කර්මස්වකීය කොට ඇත්තාහුයයි මැදහත්ව කැරඹීම් වශයෙන් උපදනා ඥානය සංඛාරුපෙක්ඛාඤාණ නම් වෙයි.

ඒ සංඛාරුපෙක්ඛාඤාණය ඉපදීමෙන් මත්තෙහි සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතරඍද්ධි පාදය, පචෙන්ද්‍රියය, පචබලය, සප්තබොධ්‍යඞ්ගය, ආර්‍යඅෂ්ටාංගිකමාර්ගයයි කියනලද සත්තිස් බෝධිපාක්‍ෂික ධර්මයන්ගේ ලැබීමට උත්සාහ කිරීම් වශයෙන් උපදනා ඥානය අනුලෝම ඥානනම්වෙයි. මෙසේ දශවිදර්ශනාඥානය දතයුතුයි.

විමොක්‍ෂයෝ තුන්දෙනය යතු:-සියලු සංස්කාරධර්මයන් ආත්මසාරයෙන් සිස්වූයේයයි භාවනා කරන්නාවූ යොගාවචරයෝ තුමූ ආත්ම සංඛ්‍යාත නිමිත්තෙන් හෙවත් කාරණයෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදර්ශනාභාවනාව සුඤ්ඤතවිමොක්‍ෂ නම්වෙයි.

සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යහයි විදර්ශනාවඩන පුද්ගලයන් ඒකාන්තය නිත්‍යය යන විපරීතනිමිත්තෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදර්ශනා භාවනාව අනිමිත්ත විමොක්ඛ නම්වෙයි.

සියලු සංස්කාරධර්මය දුක්යයි විදසුන්වඩන යොගාවචරයන් පචකාම සැපය උතුම් සැපයයි ඇලෙන තෘෂ්ණාවෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදර්ශනාව අප්පණිහිත විමොක්‍ෂ නම් වෙයි. මෙසේ විමොක්‍ෂත්‍රය දතයුතුයි.

පුද්ගලභෙදය යනු කෙසේද යත්? සෝවාන් මාර්ග වඩන ආර්‍යපුද්ගල තෙම දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශල් සිත් සතරය, විචිකිච්ඡාසහගත අකුශලය, යන අකුශල් පස සමුච්ඡේදප්‍රහාණ වශයෙන්ද, අපායගමනීයවූ සෙසු අකුශලයන්ගේ අපායගමනීය ශක්තිය තුනී කරණ හෙයින් ඒ සෝවාන් තෙමේ නැවත අපායොත්පත්තියට නොපැමිණෙන්නාවූ සම්බොධිපරායණ සෝවාන් පුද්ගල නම්වෙයි. ඒ සෝවාන් පුද්ගල තෙමේ එකබීජිය, කොලංකොලය, සත්තක්ඛත්තුපරමයයි ත්‍රිවිධාකාරයි. සකෘදාගාමිමාර්ගය වඩන ආර්‍ය තෙම සප්තකාමස්වර්ගයෙහි ඖදාරික විපාක දිය හැකිවූ කාමරාගව්‍යාපාදයන්ගේ තුනී බවකිරීමෙන් මේ මිනිස් ලොවට එක්වරක්ම එන සුළු බැවින් සකෘදාගාමි නම්වේයි. අනාගාමිමාර්ගය වඩන ආර්‍යපුද්ගල තෙමේ කාමරාගව්‍යාපාදයන් නිරවශෙෂයෙන් ප්‍රහාණය කිරීමෙන් නැවත කාමධාතුවට නොපැමිණෙන හෙයින් අනාගාමී නම්වෙයි.අර්හත්මාර්ගය වඩන ආර්‍ය පුද්ගල තෙමේ “රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා” යන පංචඋද්ධම්භාගිය සංයෝජන ප්‍රධානවූ එක්දහස් පන්සියයක් කෙලෙසුන් නිරවශෙෂයෙන් නසන හෙයින් සියලු ලෝවැස්සන්ගේ පූජාවන් පිළිගැණීමට සුදුසුවූ අර්හත් නම්වෙයි. මෙසේ සෝවාන් ආදී සතරමාර්ග සතරඵලය යන ප්‍රභෙදයෙන් ධර්මවශයෙන් පුද්ගලයෝ අටදෙනෙක් වෙත්.

## මේ පුද්ගල භෙදයයි.

——०ः०——

සමාපත්තිභෙදය යනු මේ අෂ්ටාර්‍ය පුද්ගලයන්ට අයත් සමාපත්තීනු වනාහි ඵලසමවතය නිරොධ සමවතයයි ද්විප්‍රකාර වෙයි. සෝවාන් පුද්ගල තෙමේ සෝවාන් මාර්ගවීථියෙහිම මාර්ගයට අනතුරුවම ඵලසථ නම් වෙයි. ඒ ඵලසථ ආර්‍යපුද්ගල තෙමේ සකෘදාගාමි මාර්ගය ලැබීම දක්වා අභිමත කාලයෙහි ඉහාත්මයෙහි නිවන් සැපවිඳීම් වශයෙන් විදර්ශනාභාවනාවෙන්ම ගොස් සෝවාන් ඵල සිත උපදවයි, ඉක්බිති අතරතුර භවාඞ්ගයක් නූපදවා අහොරාත්‍රියක් මුළුල්ලෙහිදු ගඞ්ගාප්‍රවාහයක් බස්නා කලක් මෙන් සෝවාන් ඵල සිත් නිපදවයි. සෙසු මාර්ගත්‍රයෙහිද මෙසේ මැයි.

නිරොධසමාපත්තිය වනාහි සියුම්වූ කාමරාගය ඇති බැවින් සෝවාන් සකෘදාගාමි දෙදෙනාහට නොලැබෙයි. අනාගාමී අර්හත් යන දෙදෙන වනාහි අෂ්ටසමාපත්තිලාභීනොවූ ශුෂ්කවිදර්ශකයෝ

නම් ඔවුන්ටද නිරොධසමාපත්තිය නොලැබේ. අනාගාමිඅර්හත් පුද්ගලයෝ දෙදෙන වනාහි අෂ්ටසමාපත්තිලාභීවූවාහුනම් ඔවුන්ට නිරොධසමාපත්තිය ලැබෙන්නේයි. ඒකෙසේ ලැබෙන්නේදයත්? සමාපත්තිලාභී අනාගාමි පුද්ගල තෙමේ පළමු කොට අධිෂ්ඨානාදී පූර්වකෘත්‍යයකොට නිමවා රූපාවචර ප්‍රථමධ්‍යානයට සමවැද එයින් නැගිට ඒ ධ්‍යානධර්ම අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කොට ක්‍රමයෙන් චතුෂ්ක නයින් චතුර්ථධ්‍යානය දක්වා සමවදිමින් ගොස් ආකාශානඤ්චායතන ධ්‍යානය පටන් ත්‍රිවිධ අරූප ධ්‍යානයටද සමවැද නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට දෙවරක් සමවැද සතරනාමස්කන්ධය නිරුධ කරයි. ඉක්බිති ඒ ආර්‍ය්‍ය තෙමේ නිරොධයට සමවින්නේයයි කියත්. ඉක්බිති සතියක් මුලුල්ලෙහි සතර නාමස්කන්ධයන්ගෙන් තොරව ඉඳ යථාපරිච්ඡින්න කාලයෙහි නිරොධයෙන් නැගිටිනු කැමති කල්හි අනාගාමී ඵල චිත්තය එක් වරක් ඉපිද එතැන් පටන් භවාඞ්ගය පටන් ගන්නේයි. අර්හත් පුද්ගලයාගේ නිරොධයෙහි ක්‍රියා සිත් හා අර්හත් ඵල සිත් මාත්‍රයක් වෙනසි.

## මේ සමාපත්ති භෙදයයි.

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි කර්මස්ථාන සංග්‍රහ විභාග නම්වූ
නවවෙනි පරිච්ඡේදය නිමි.

—— o ——

අනුරුද්ධාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් රචනා කරණ ලද අභිධර්මාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයෙහි පරමාර්ථ ප්‍රදීපනම් පදාර්ථ සහිත විස්තර භාවසන්නය නිමි.

## සිවමස්තු.

පූතිමච්ඡං කුසග්ගෙන
යො නරො උපනය්හති;
කුසාපි පූතිං වායන්ති
එවං බාලූපසෙවනා.

ඉමිනා පුඤ්ඤකම්මෙන
යාව නිබ්බානපත්තියා;
සතං සමාගමො හොතු
මා ඔව බාලසමාගමො.